THE ORIGINAL JESUS

Elmar R. Gruber & Holger Kersten

ජේසුස් වහන්සේ සහ බුදු දහම

පරිවර්තනය

කේ. ඒ. එන්. පෙරේරා

ජේසුස් වහන්සේ සහ බුද්ධදහම

ප්‍රථම මුද්‍රණය - 2001 දෙසැම්බර්
දෙවන මුද්‍රණය - 2002 අගෝස්තු
තෙවන මුද්‍රණය - 2004 ඔක්තෝම්බර්
සිව්වන මුද්‍රණය - 2009 මැයි

© සියලුම හිමිකම් ප්‍රකාශකයින් සතුය.

ISBN - 955 - 573 - 173 - x

පරිගණක පිටු සැකසුම : සරසවි ප්‍රකාශකයෝ
පිටකවරය : සමන් ඉන්දික ලොකුකලුගේ (සරසවි ප්‍රකාශකයෝ)
මුද්‍රණය : සිකුරු පොත් ප්‍රකාශකයෝ
144, වෙනිවැල්කොළ, පොල්ගස්ඕවිට.

කතුවරයන් පිළිබඳ ......

ආචාර්ය එල්මාර් ආර්. ග්‍රෲබර්

විශ්ව විද්‍යාලයේ දී හෙතෙම මනෝ විද්‍යාව, දර්ශනය සහ මානව වංශ ශාස්ත්‍රය (Ethnography) යන විෂයයන් හදාරා ඇත. පොත්පත් රාශියක් ලියා ඇති ග්‍රෲබර් විසින් පළකරන ලද පර්යේෂණ වලින් අනාවරණය කර ගත් කරුණු රාශියක් විද්‍යාත්මක සඟරාවල පුවත් ලෙස පළකර තිබේ. පිටපත් විශාල සංඛ්‍යාවක් ලොව පුරා අලෙවි වූ මහත් විවාදයට තුඩුදුන් 'ද ජීසස් කොන්ස්පිරසි' (The Jesus Conspiracy) නමැති කෘතිය රචනා කිරීමේදී ඔහු හොල්ගර් කර්ස්ටන් සමග සම කර්තෘත්වය දැරීය.

හොල්ගර් කර්ස්ටන්

ජර්මනියේ ෆ්‍රයිබර්ග් විශ්ව විද්‍යාලයේදී දේවධර්ම වේදය (Theology) සහ ශික්ෂණ ශාස්ත්‍රය (Pedagogics) උගත් හොල්ගර් කර්ස්ටන් මහතා ආගමික ඉතිහාසය පිළිබඳ විශේෂඥ දැනීමක් ඇති කතුවරයෙකි. ඔහු විසින් ලියන ලද අනෙකුත් පොත් අතර එල්මාර් ආර්. ග්‍රෲබර් සමඟ ලියූ 'ද ජීසස් කොන්ස්පිරසි' (The Jesus Conspiracy) සහ 'ජීසස් ලිව්ඩ් ඉන් ඉන්ඩියා' (Jesus Lived in India) නමැති ග්‍රන්ථ ද වේ. පිටපත් විශාල සංඛ්‍යාවක් ලොව පුරා අලෙවි වූ භාෂා 30 කට වඩා වැඩි ගණනකට පරිවර්තනය කර ඇති ලෝක ප්‍රසිද්ධ ග්‍රන්ථයක් වන 'ජීසස් ලිව්ඩ් ඉන් ඉන්ඩියා' නැමැති පොත "ජේසු තුමන් දඹදිව විසූ වගයි" යනුවෙන් සිංහල භාෂාවෙන්ද ප්‍රකාශයට පත් කර තිබේ (සරසවි ප්‍රකාශනයකි).

පරිවර්තක පිළිබඳ කෙටි හැඳින්වීමක්

- ලංකා විශ්ව විද්‍යාලයේ උපාධිධරයකු වන කේ. ඒ. එන්. පෙරේරා මහතා 1969 වර්ෂයේදී ජාත්‍යන්තර සමාගමක පරිපාලන සංවර්ධන නිලධාරියකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. පසුව 1980 වර්ෂයේ දී හෙතෙම විධායක නිලධාරියකු වශයෙන් එයාර් ලංකා ගුවන් සේවයට බැඳුණි.

- එයාර් ලංකා ගුවන් සමාගමේ තීරු බදු රහිත වෙළඳ සේවා අංශයේ කළමනාකරු වශයෙන් ඔහු දීර්ඝ කාලයක් සේවය කළේය. පසුව එම තනතුරට අමතරව ගුවන් සමාගමේ සත්කාර සේවා අංශයේ (Inflight Services) වැඩ බලන කළමනාකාර තනතුරද ඔහු වෙත පැවරුණි.

- 1999 වර්ෂයේ අග භාගයේදී ගුවන් සේවයෙන් විශ්‍රාම ගත් කේ. ඒ. එන්. පෙරේරා මහතා සිය විවේක කාලය සිංහල පාඨකයින්ගේ අභිවෘද්ධිය පිණිස පොත්පත් පරිවර්තනය සඳහා කැප කිරීමට තීරණය කළේය.

- පරිවර්තනය ඔහුට අලුත් දෙයක් නොවේ. මාර්ග ආයතනය විසින් 1974 වර්ෂයේදී පළකරනු ලැබූ 'ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව හා කෘෂිකාර්මික විපර්යාසය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්" (A Comparative Study of Population and Agricultural Changes in Sri Lanka) නමැති කෘතිය සිංහලට පරිවර්තනය කරන ලද්දේ කේ. ඒ. එන්. පෙරේරා මහතා විසිනි. එය ඔහුගේ පළමු පරිවර්තන කෘතියවේ. ඊට අමතරව (ඒ අවදියේම) 'ගුනාර් මර්ඩාල්' නමැති සුප්‍රසිද්ධ ආර්ථික විද්‍යාඥයා විසින් ලියන ලද 'ඒෂියන් ඩ්‍රාමා' (Asian Drama) නමැති ආසියාවේ ආර්ථික තත්ත්වය පිළිබඳ විග්‍රහ කරනු ලබන සුප්‍රසිද්ධ කෘතියේ සමහර කොටස් මාර්ග ආයතනය වෙනුවෙන් ඔහු විසින් සිංහලට පරිවර්තනය කරනු ලැබීය.

- 'ජේසුස් වහන්සේ සහ බුදු දහම" නැමති මෙම කෘතියට අමතරව ඔහු විසින් කීර්තිමත් දාර්ශනිකයකු වූ බර්ට්රන්ඩ් රසල් නමැති ඉංග්‍රීසි ජාතික පඬිවරයා විසින් රචිත 'ඔන් එඩියුකේෂන්' (On Education) නමැති අධ්‍යාපනය සම්බන්ධයෙන් පළ කරනු ලැබූ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයද සිංහලට පරිවර්තනය කර තිබේ.

පිළිගැන්වීම

පොත් පරිවර්තනය කිරීම සඳහා මා තුළ බලාපොරොත්තුවක් සේයාවක් හෝ නොතිබූ අවදියක, එනම් දැනට දසක තුනකට පමණ ඉහත දී ඒ සඳහා මා තුළ සැඟව තිබූ හැකියාව ඉවෙන් මෙන් වටහා ගෙන එම හැකියාව පුබුදුවාලීමට කටයුතු කළ, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සැබෑ ගුරුවරයකු ලෙස හැඳින්විය හැකි, තම ජීවිත කාලය පුරාම ගුරුවරයකු සහ පරිවර්තකයකු වශයෙන් අමිල සේවයක් ඉටු කළ, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ සහ මහරගම විද්‍යාකර විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙස සේවය කළ, දැනට වසර කීපයකට පෙර අප අතරින් වියෝ වූ එස්. ගුණසේකර ගුරු පියාණන්ගේ නාමයට මේ පොත උපහාරයක් වේවා.

කතුවරයන්ගේ ස්තුතිය

මෙම පර්යේෂණය කිරීමේදී බොහෝ දෙනෙක් ඔවුන්ගේ අගනා සහයෝගය ලබා දෙමින් අපට මහත් සේ උපකාර කළහ. මෙහිදී මහාචාර්ය අහමඩ් හසන් ඩානි, මහාචාර්ය ෆ්ලොරන්ටිනෝ ගාර්සියා-මාර්ටිනෙස්, මහාචාර්ය හැන්ස්-ජෝකිම් ක්ලිම්කයිට්, ආචාර්ය හැන්ස් වුල්ෆ්ගෑන්ග් ෂූමාන්, ආචාර්ය ගුන්තර් ෂ්වාර්ස් යන විද්වතුන්ටත් පැරීසියේ සර්ව් ආයතනයටත්, (Centre Sevres), ලීප්සිග් විශ්ව විද්‍යාලයේ පුස්තකාලයේ අත්පිටපත් අංශයටත් අපේ විශේෂ ස්තුතිය හිමිවේ. ක්‍රිස්තියානි ආගමේ සහ බෞද්ධාගමේ දක්නට ලැබෙන ත්‍රිත්වය පිළිබඳ අදහස්වල ඇති සමානකම්, වෛදික ආර්යයන්ගේ ඉතිහාසය පිළිබඳව මෑතකදී කරන ලද පර්යේෂණ, කොච්චින්හි ජීවත්වන යුදෙව් ජාතිකයින් සහ තෝමස් පිළිබඳව පවතින ජනප්‍රවාද ඇතුළත් නූතන ඉන්දීය සංස්කෘතික සම්ප්‍රදායන් සහ ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳව තමා විසින් කරන ලද පර්යේෂණ කෘතිවල අත්පිටපත් කියවා බැලීම සඳහා අපට ඉඩ සලසා දුන් ගොට්බාම් මහතාටත්, මෙහි අත්පිටපත හොඳින් සකස් කර ගැනීම සඳහා වෙහෙස නොබලා අපට අවවාද අනුශාසනා කරමින් නිර්මාණාත්මක අදහස් රාශියක් ඉදිරිපත් කළ එල්මාර් ආර්. ගෲබර් මහතාගේ ආදරණීය බිරිඳවන ඩැග්මාර් මහත්මියටත් අපේ විශේෂ ස්තුතිය හිමිවේ.

මෙම පොතේ ඇතුළත් රූප රාමු සපයා දීමෙන් උපකාරී වූ පහත දැක්වෙන පුද්ගලයින්ට සහ ආයතන වලට අපේ ස්තුතිය හිමිවේ : ඒ. එච්. ඩානි 26, 27, ඊ. ආර්. ගෲබර්, 2-5, 8, 11-16, 21-25, 30, 31, 33-36, එච්. කර්ස්ටන් 17-20, 32, එච්. ඩබ්ලිව්. ෂූමාන්, 1, 6, 7, 28, ප්‍රංශයේ බෝඩ්ලි කටුගෙය 9, 10, එෆ්. පෙට්රි 29.

ඓතිහාසික වශයෙන් ජීවත්වූ ජේසුස් වහන්සේ පිළිබඳවත්, උන්වහන්සේගේ ඉගැන්වීම් වල ඇතුළත් බෞද්ධ බලපෑම පිළිබඳවත් කරනු ලබන පර්යේෂණ වඩා අර්ථාන්විත කිරීම සඳහා මෙන්ම, ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පුද්ගලයින්ට එම පර්යේෂණ මගින් සොයාගත් කරුණු ලබා ගැනීම පහසුකිරීම සඳහා ද නසරීන් ඉන්ස්ටිටියුට් නමින් ආයතනයක් ෆ්‍රයිබර්ග් නගරයේ පිහිටුවා තිබේ. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබාගැනීමට අවශ්‍ය පාඨකයින්ට පහත දැක්වෙන ලිපිනයෙන් ඒ පිළිබඳ විස්තර ලබාගත හැකිය.

DIE GESELLSCHAFT DER NAZARENER
C/O HOLGER KERSTEN
POSTFACH 961, 79009 FREIBURG
GERMANY

කතුවරයන්ගේ හැඳින්වීම (ප්‍රස්තාවනාව)

වර්තමානයේ බටහිර රටවල බුදු දහම කෙරෙහි පවතින උනන්දුව මිනිසුන් තුළ පවතින අතෘප්තිකර ආශාවන් පෙන්නුම් කරන ආගමික විලාසිතාවක් ලෙස සලකා කතෝලික පල්ලිය විසින් එය නොසලකා හැර තිබේ. ආධ්‍යාත්මික විමුක්තිය සලසා ගැනීම පිණිස මිනිසුන් යොමුවීමට හේතුවන කරුණු පිළිබඳ වැටහීමක් පල්ලියට නොමැත. කෙසේ වෙතත්, මිනිසුන් බුදු දහම කෙරෙහි යොමුවීමෙන් ක්‍රිස්තියානි සම්ප්‍රදාය කෙරෙහි ඔවුන් තුළ පවතින කලකිරීම සහ බුදු දහම පිළිගත හැකි යථාභූත ආගමක් ලෙස ඔවුන් විශ්වාස කරන බව මේ ආකාරයෙන් බුදු දහම කෙරෙහි වඩ වඩාත් යොමුවීමෙන් පැහැදිලි වේ.

පල්ලිය විසින් අපට ඉදිරිපත් කර ඇති කරුණු වලින් ජේසුස් වහන්සේ පිළිබඳ සැබෑ ස්වරූපය පැහැදිලි නොවේ. එය ජේසුස් වහන්සේගේ ජීවන චරිතය පිළිබඳ විසිර පවතින සැබෑ තොරතුරු පමණක් නොව සාවද්‍ය තොරතුරුත් උන්වහන්සේ විසින් කරන ලද ප්‍රකාශ මෙන්ම උන්වහන්සේ වෙත ආරෝපණය කරන ලද ව්‍යාජ ප්‍රකාශ ද පදනම් කරගෙන ක්‍රිස්තියානි ලේඛකයින් විසින් ගොඩනගන ලද චරිතයකි. එම තොරතුරු ජේසුස් වහන්සේගේ ජීවන චරිතය පදනම් කර ලියා ඇති බව පල්ලිය විසින් ප්‍රකාශ කරන නමුත් එය කෘත්‍රිම සාහිත්‍යමය ප්‍රබන්ධයක් බව පෙනේ. ඓතිහාසික වශයෙන් ජීවත්වූ ජේසුස් වහන්සේ සහ උන්වහන්සේ තුළ පැවති චේතනාවන් අද සැඟවී ගොස් තිබේ. උන්වහන්සේගේ සැබෑ ස්වරූපය ඉතිහාසයේ අවුරුදු දෙදහසක් පමණ වූ කාලයක් තිස්සේ පල්ලිය විසින් සායම් තට්ටු ආලේප කිරීම නිසා යටපත් වී ඇති සිතුවමක් වැනිය. මුල් නිර්මාණයට හානියක් සිදු නොවන පරිදි එම සායම් තට්ටු එකින් එක ප්‍රවේශමෙන් ඉවත් කළහොත් එහි මුලින් යොදා තිබූ මූලික වර්ණ ක්‍රමානුකූලව මතුකර ගැනීමට හැකිවනු ඇත. එහෙත් එම වර්ණ ක්‍රිස්තියානි පල්ලිය විසින් අපට පෙන්වා දී තිබෙන වර්ණ වලට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්ය.

එක්තරා සෙන් බෞද්ධ භික්ෂුවක් ආශ්‍රමාධිපති යතීන්ද්‍රයන් ඉදිරියේ සිටගෙන බයිබලයේ සඳහන් කන්ද උඩ දේශනාව කියවූ ආකාරය ජපානයේ පිහිටි සෙන් ආගමික ආශ්‍රමයක දීර්ඝ කාලයක් වාසය කළ ජැන්විලම් වැන් ඩි වෙටරින් (Janwillem van de Wetering) නැමැති ලන්දේසි ජාතික ලේඛකයා විසින් සඳහන් කර තිබේ. එම ආශ්‍රමාධිපති යතීන්ද්‍රයන් වහන්සේ අකුරු කියවීමට හෝ ලිවීමට නොදත් අතර ක්‍රිස්තියානි ආගම පිළිබඳව කිසි දිනෙක අසා නොතිබුණි. සාවධානව

එයට ඇහුම් කන්දුන් උන්වහන්සේ මහත් සතුටට පත්වූහ. මද වේලාවක් නිශ්ශබ්දව සිට අවසානයේදී උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ : "මම විසින් කියවන ලද මෙම දේශනය ලියන ලද්දේ කවරෙක් විසින්දැ'යි මම නොදනිමි. එය ලියා ඇත්තේ කවරෙකු විසින් වුවත් ඒ පුද්ගලයා එක්කෝ බුදුකෙනෙකු හෝ බෝධිසත්වයකු විය යුතුය. මා විසින් මෙහි සිටින භික්ෂූන්ට ඉගැන්වීමට උත්සාහ කරන ඉගැන්වීම් වල හරය එහි ඇතුළත් වී තිබේ."

කන්ද උඩ දේශනාවේ සංක්ෂිප්තව දක්වා ඇති ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්, බුදු දහම පිළිබඳ වැටහීමක් ඇති පුද්ගලයින්ට එම දේශනාව සහ බෞද්ධ ඉගැන්වීම් අතර පවතින ආධ්‍යාත්මික සම්බන්ධතාවය සිහිපත් කරවයි. කෙසේ වෙතත් බෞද්ධ චින්තනය සහ නව තෙස්තමේන්තුවේ දැක්වෙන සමහර කථා ප්‍රවෘත්ති ජේසුස් වහන්සේ විසින් ධර්මය දේශනා කිරීමේදී යොදා ගනු ලැබූ උපමා කථා සහ ප්‍රකාශ අතර පවතින සමානකම් නව සොයා ගැනීමක් නොවේ. එවැනි සමානකම් කෙරෙහි විද්වතුන්ගේ අවධානය යොමුවූයේ දහනව වැනි ශතවර්ෂයේ මුල් යුගයේදී තරම් ඈත කාලයේදීය. එහෙත් එම සමානකම් ඇතිවූයේ කෙසේද කියා ඔවුන්ට සිතාගත නොහැකි විය. විවිධ අංශ සම්බන්ධයෙන් පවතින සමානකම් කොතරම් චිත්තාකර්ෂණීයද යත්, ක්‍රිස්තියානි ආගම කෙරෙහි බෞද්ධාගම සෘජුවම බලපා ඇති බව බොහෝ දෙනෙකුට පැහැදිලි විය.

ඉන්දීය උපමා කථා සහ වෙනත් කථා ප්‍රවෘත්ති බටහිර රටවලට සම්ප්‍රාප්තවීම සහ වර්තමානය දක්වා එම කථා ප්‍රවෘත්ති ජීවමාන ව්‍යවහාරයේ පවතින ආකාරය පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණ වල නියැලුණු සුප්‍රසිද්ධ ඉන්දු ආර්ය භාෂා පිළිබඳ විශේෂඥයකු වූ ජර්මන් ජාතික මැක්ස් මුලර් පඬිවරයා විසින් පෙන්වා දී තිබේ. පරණ තෙස්තමේන්තුවේ ඉන්දීය බලපෑම් දක්නට ලැබෙන බව ඔහු ප්‍රකාශ කළේය. උදාහරණයක් වශයෙන් මොනරා පිළිබඳ ඔහු කර ඇති විග්‍රහය ඉදිරිපත් කළ හැකිය. කෙසේ වෙතත් උද්යෝගීමත් ක්‍රිස්තු භක්තිකයකු වූ මැක්ස් මුලර් ධර්මය ප්‍රචාරය කිරීම සඳහා ඔහු තුළ පැවති බලවත් උනන්දුව හේතුකොට ගෙන කාලයක් යනතුරුම ක්‍රිස්තියානි ආගම කෙරෙහි ඉන්දියානු අදහස් බලපා තිබෙන බව පිළිගැනීමට සූදානම් වූයේ නැත. අවස්ථා රාශියකදී එසේ සිදුවී තිබේ. ක්‍රිස්තියානි ආගමේ ප්‍රභවය පිළිබඳව කරුණු ලබන උත්සාහයන්වලදී පුද්ගලයින් තුළ පවතින ආගමික ප්‍රචණ්ඩත්වය බලපාන ආකාරයත් ජේසුස් වහන්සේ නැමති පුද්ගලයා ස්වර්ගයෙන් බැස මහ පොළවට පැමිණීම සහ උන්වහන්සේගේ ඉගැන්වීම පිළිබඳව කරුණු ලබන ඕනෑම වාස්තවික පරීක්ෂණයක් අවහිර කිරීමට සහ සමහරවිට

ඒවා ආරම්භයේදීම නවතා දැමීම සඳහා කටයුතු කිරීමටත්, බටහිර රටවල ජීවත්වන අපේ ක්‍රිස්තියානි හැඩ ගැසීම කොතරම් දුරට බලපාන්නේද යන කාරණයත් ඉන් පැහැදිලි වේ.

ජේසුස් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයකු ලෙස සැලකුවිට ශුභාරංචියේ ඇතුළත් බොහෝ තොරතුරු විසිතුරු අලංකාර වර්ණනා සහ මනඃකල්පිත කථා ප්‍රවෘත්ති ලෙස සැලකිය නොහැකිද? ක්‍රිස්තියානි ආගමේ ඇතුළත් මූලික ඉගැන්වීම කෙරෙහි වෙනත් ආගමික ආභාෂය ලැබී තිබෙන බව පැහැදිලි කිරීමෙන් ආගම කෙලසීමක් සිදුවේද? ක්‍රිස්තියානි ආගම කෙරෙහි ඉන්දීය බලපෑම් ඇතිවීම කෙරෙහි හේතු වූ ඓතිහාසික නාලිකා පිළිබඳව සොයා බැලීමට මැක්ස් මුලර් තම මුළු ජීවිත කාලය පුරාම නිරර්ථක උත්සාහයක යෙදුණේය. එහෙත් දැඩිලෙස සංශයවාදී අදහස්වල එල්බ ගෙන සිටි මෙම පුද්ගලයාට අවසානයේදී එවැනි බලපෑමක් ඇතිවී තිබෙන බව පිළිගැනීම හැර වෙනත් විකල්පයක් නොතිබුණි. එහෙත් ඔහු ඒ බව පිළිගත්තේ කොන්දේසි විරහිතව නොවේ.

අද ඒ පිළිබඳ පවතින සාක්ෂි බොහෝය. උදාහරණයක් වශයෙන් ජොහාන්ගේ ශුභාරංචියේ* වැකියක් වැකියක් පාසා බෞද්ධ අදහස් දක්නට ලැබේ. බෞද්ධ අදහස් කොතරම් ප්‍රමාණයක් එහි ඇතුළත් වී තිබේද යත් දේවධර්මවේදියකුවූ (Theologian) ජේ. එඩ්ගාර් බෲන්ස් (J. Edgar Bruns) එම තේමාව මුල් කරගෙන "ශාන්ත ජොහාන්ගේ ක්‍රිස්තියානි බුදුදහම" (The Christian Buddhism of St John) නමින් පොතක් පවා පළ කිරීමට ඉදිරිපත් විය. එය ක්‍රිස්තු භක්තිකයින් මෙන්ම පල්ලිය ද මවිතයට පත්කිරීමට හේතුවිය. ඔවුන් තුළ ඇතිවූ එම මවිතය වැඩිකල් නොගොස් විස්මයක් බවට පරිවර්තනය විය. උදාහරණයක් වශයෙන් "යමෙක් ධර්මය දකීද හේ මා දකී" යනුවෙන් බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ. එම ප්‍රකාශයෙන් ධ්වනිත වන අදහසම "මා දකින තැනැත්තේ මා එවා වදාළ තැනැත්තාන් වහන්සේ දකී" යනුවෙන් ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කළ බව ජොහාන් තම ශුභාරංචියේ සඳහන් කර තිබේ. (ජොහාන් 12 : 45) එපමණක් නොව බුදුදහමට අනුව ධර්මය යනුවෙන් අදහස් කරන්නේ ලෝකය පාලනය වන විශ්ව නියමය වේ. එය ක්‍රිස්තියානි ආගමේ දැක්වෙන ධර්මය (Word) යනු දෙවියන් වහන්සේගේ වචනය (The Logos) යනුවෙන් ප්‍රකාශ කරන දෙවියන් වහන්සේ පිළිබඳ පවතින සංකල්පයට අනුරූප වේ. ජොහාන්ගේ ශුභාරංචියේ පොත ආරම්භ කර තිබෙන්නේ

* ශුභාරංචිය : සුබ අස්න, යහපත් පණිවිඩය යන අර්ථය දේ. ජේසුස් වහන්සේ පිළිබඳ පුවත උන්වහන්සේ ලොවට ප්‍රකාශ කළ විමුක්ති මාර්ගය ඉන් අදහස් කෙරේ. මතෙව්, මාක්, ලූක් සහ ජොහාන් යනුවෙන් ශුභාරංචියේ පොත් හතරක් බයිබලයේ නව තෙස්තමේන්තුවේ ඇතුළත් වේ.

"ධර්මය දෙවියන් වහන්සේව සිටි සේක" (The Word was God) යනුවෙනි.

මෙහිදී නව තෙස්තමේන්තුවේ ඇතුළත් කර තිබෙන බෞද්ධ ඉගැන්වීම් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමට අප උත්සාහ දරන හෙයින් ජේසුස් වහන්සේගෙන් අනිවාර්යයෙන්ම තීරණාත්මක ප්‍රශ්නයක් ඇසීමට සිදුවේ. එනම් ආගම යනුවෙන් ඔබ වහන්සේ අදහස් කරන්නේ කුමක්ද? යන ප්‍රශ්නයයි. බුද්ධිමය ඉතිහාසය නැමති වංගගිරිය හරහා යන මෙම චින්තනාකර්ෂණීය ගමන මගින් නව තෙස්තමේන්තුවේ දක්නට ලැබෙන බෞද්ධ ලක්ෂණ අහම්බෙන් ඇතිවූ ඒවා නොවන බව අනාවරණය වේ. එම අදහස් මුලින්ම පතුරුවා හරින ලද්දේ ජේසුස් වහන්සේ විසිනි. එනිසා ජේසුස් වහන්සේ යනු ක්‍රිස්තියානි ආගමිකයකු නොව බෞද්ධයකු බව අපට මෙහිදී සෘජුවම ප්‍රකාශ කළ හැකිය.

කෙසේ වෙතත් විශ්වාස කළ නොහැකි ලෙස පෙනීයන මෙම අදහස විශ්වාස කළ හැකිවන ලෙසත්, වටහාගත නොහැකි ලෙස පෙනීයන මෙම ප්‍රකාශය වටහා ගැනීමට හැකිවන ලෙසත් පියවරෙන් පියවර ක්‍රමානුකූලව ඒ පිළිබඳව කරුණු සොයා බලමු. ජේසුස් වහන්සේගේ ප්‍රතිරූපයට පසුකාලීනව එකතු කරන ලද පුරාණෝක්ති, දේවධර්මය පිළිබඳ කරුණු, කාව්‍යමය වර්ණනා සහ ප්‍රබන්ධ කථා එකින් එක ඉවත් කිරීමෙන් අනතුරුව උන්වහන්සේගේ පෞරුෂය සහ සැබෑ ඉගැන්වීම් මතුකර සැබෑ ජේසුස් වහන්සේ යනු කවරෙක්දැයි සොයා බලමු.

පරිවර්තකගේ පෙරවදන

ආගම සහ දර්ශනවාද බිහිවූයේ මිනිසා බිහි වී බොහෝ කාලයකට පසුවය. මිනිස් ශිෂ්ටාචාරය ක්‍රමයෙන් වැඩි දියුණු වී මානව චින්තනයේ නිම් වළලු පුළුල් වන විට ඉතිහාසයේ විවිධ යුගවල දී පහළ වූ ශ්‍රේෂ්ඨ යුග පුරුෂයන් විසින් විවිධ ආගම් සහ දර්ශනවාද ලෝකයට හඳුන්වා දෙන ලදී. ලෝකය සහ එහි පැවැත්ම පිළිබඳවත්, අප ජීවත් වන විශ්වය තුළ මිනිසාට හිමි තැන පිළිබඳවත් තර්කානුකූලව අවබෝධ කර ගැනීමේ අපූර්ව හැකියාවක් මෙම දාර්ශනිකයින්ට සහ ආගම් කතුවරුන්ට තිබිණි. ඔවුන් ඉදිරිපත් කළ දර්ශන සහ මතවාද ඊට පසුව එළඹුණු සහවර්ෂවලදීත් අද දක්වාත් මානව චින්තනය හැඩගැස්වීම කෙරෙහි තීරණාත්මක ලෙස බලපෑවේය. මේ වූකලී මානව චින්තනයේ ඇති වූ බලවත් විප්ලවයක් ලෙස හැඳින්විය හැකිය.

අද ලෝකයේ ජනගහනයෙන් සියයට අනූවකට වඩා අදහන ප්‍රධාන ආගම් පහක් තිබේ. ඒවා නම්, බුද්ධාගම, ක්‍රිස්තියානි ආගම, හින්දු ආගම, ඉස්ලාම් ධර්මය සහ චීනයේ කොන්ෆියුසියස් දර්ශනය වේ. අනිත් ආගම් මෙන් නොව, බුද්ධාගම සහ ක්‍රිස්තියානි ආගම ලෝක ව්‍යාප්ත ආගම් ලෙස සැලකේ. බුද්ධාගම සහ ක්‍රිස්තියානි ආගම බොහෝ දුරට තුලනාත්මක ඇගයීම්වලට භාජන කර තිබෙන්නේ මේ හේතුව නිසා විය හැකිය.

අවුරුදු දෙදහසකට වඩා වැඩි කාලයක් පෙරදිග පිළිබිඹුවක් සහ අපරදිග රටවල පැවැති ආධ්‍යාත්මික චින්තනයේ පැහැදිලි ප්‍රකාශනයක් මෙම ආගම් දෙකේ දක්නට ලැබේ. ඉහත කී අනිකුත් ආගම් මෙන් නොව, බුදු දහම සහ ක්‍රිස්තියානි ආගම විශාල බිම් ප්‍රදේශයක් කේන්ද්‍රකොට පවතින ප්‍රාදේශීය ආගම් නොවේ. මෙම ආගම් දෙකම කාලය, දේශය, භාෂා, ජාති, කුල වැනි පටු සීමාවන් අභිභවා සමස්ත ලෝකය පුරා පැතිර තිබේ. දේශ සීමා, ජාතිය, භාෂාව වැනි කරුණු ආගමක් පිළිගැනීම කෙරෙහි බාධාවක් ලෙස ක්‍රියා නොකරන බව ඉන් පෙනී යයි.

එපමණක් නොව වර්තමානයේ, මෙම ආගම් දෙක අදහන බහුතරයක් එම ආගම් වල ශාස්තෘවරුන් අයත් වූ ජාතියට, රටට හෝ භාෂාවට අයත් නොවීමද මෙහිදී විශේෂ අවධානය යොමුවිය යුතු කරුණකි. බුදුන් වහන්සේ යනු ඉන්දියාවේ පිහිටි කුඩා ප්‍රාන්ත රාජ්‍යයක් වූ නේපාලයේ උපන් ඉන්දු ආර්ය ජාතිකයෙකි. නමුත් බුදු දහම අදහන වැඩි බහුතරයක් අද ජීවත් වන්නේ සෙසු ආසියාතික රටවලය. ජේසුස්

වහන්සේ සහ උන්වහන්සේගේ අපෝස්තලුවරුන් සියලු දෙනම යුදෙව් ජාතිකයෝ වූහ. එහෙත් අද ක්‍රිස්තියානි ආගම අදහන බහුතරයක් අයත් වන්නේ ඉන්දු-ජර්මන් ප්‍රභවයක් ඇති භාෂා කථා කරන යුරෝපීය ජාතීන්ටය. අලුත් ආගමක් බොහෝ විට විදේශිකයින් විසින් මහත් උනන්දුවකින් සහ උද්‍යෝගයකින් යුක්තව පිළිගන්නා බව ඉන් පෙනී යයි. ඊට හේතුව එවැනි ආගම් තුළ කිසියම් අලුත් පණිවුඩයක් සහ ඔවුන්ගේ චින්තනයට නව ජීවයක් ලබා දිය හැකි විශේෂ ශක්තියක් තිබෙන හෙයිනි.

මෙවැනි පසුබිමක් තුළ බුදුන් වහන්සේ වේවා, ක්‍රිස්තුස් වහන්සේ වේවා කිසියම් ආගමික ශාස්තෘවරයකු විසින් දේශනා කරනු ලැබූ ධර්මය සහ ඉදිරිපත් කරනු ලැබූ දර්ශනය කිසියම් රටකට, කිසියම් ජන කොටසකට හෝ කිසියම් භාෂාවක් කථා කරන ජනතාවකට පමණක් අයත් වූවක් නොවන බව පැහැදිලි වනු ඇත. මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සහ සදාචාරාත්මක හැඩගැස්වීම සඳහා උපකාරී වූ එම ආගම සහ දර්ශනවාද සමස්ත මානව වර්ගයා සතු බුද්ධිමය උරුමයකි. එම දර්ශනවාද පිළිබඳව කරුණු සොයා බලා ඒවායේ ඇතුළත් ඉගැන්වීම් තම ජීවිතයට එකතු කර ගැනීමේදීත්, ලෝකයේ පැවැත්ම පිළිබඳ අවබෝධ කර ගැනීමේදීත් ඒ පිළිබඳ විමර්ශනය කිරීමේ අයිතිය සෑම කෙනෙකුටම තිබිය යුතුය.

සියලුම ආගම් ඒවායේ ඓතිහාසික පරිණාමයේදී, විශේෂයෙන්ම එම ආගමික ශාස්තෘවරුන් බිහිවූ රටෙන් ඔබ්බට පැතිර යෑමේදී උන්වහන්සේලාගේ මුල් ඉගැන්වීම් කිසියම් ප්‍රමාණයකට වෙනස් වී ඒවාට පරිබාහිර වූ වෙනත් කරුණු එකතුවීම අනිවාර්යයෙන්ම සිදු වන්නකි. විවිධ යුගවල විවිධ රටවල පැවැති තත්ත්වයන් සහ අවශ්‍යතාවන් හේතුකොට ගෙන මුල් ඉගැන්වීම්වල යම් යම් වෙනස්වීම් සිදු විය. එම ඓතිහාසික ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස මුල් ඉගැන්වීම් බොහෝ දුරට වෙනස් වී ශාස්තෘන් වහන්සේලාගේ චරිත අද්භූත ගුණාංග සහ අතිශයෝක්ති වර්ණනාවලින් විසිතුරු ලෙස සරසන ලදී. අටුවාචාරීන් සහ ධර්ම ග්‍රන්ථ රචනාකළ පුද්ගලයින්ගේ අදහස් පවා ඒ තුළට ඇතුළු විය. මේ නිසා විවිධ ආගමික නිකාය සහ විවිධ ආගමික කණ්ඩායම් බිහිවිය. උදාහරණයක් වශයෙන් විමුක්තිය සාක්ෂාත් කර ගත හැක්කේ ලෝකයේ සහ සත්වයාගේ පැවැත්ම පිළිබඳ ස්වයං අවබෝධයක් තුළින් පමණක් බව මුල් බුදු දහමින් උගන්වනු ලැබීය. නමුත් පසු කාලයේදී මහායාන බුදු දහමේ වර්ධනයත් සමඟ මනුෂ්‍යයාට තනිවම විමුක්තිය සලසා ගැනීම දුෂ්කර බවත්, එය අමිතාභ නම් වූ දෙව්ලොව වැඩ වාසය කරන බුදුවරයකුගේ පිහිටෙන් පහසුවෙන් ලබා ගත හැකිය යන විශ්වාසය

ජපානය වැනි රටවල වර්ධනය විය.

"දි ඔරිජිනල් ජීසස් - ද බුඩිස්ට් සෝසස් ඔෆ් ක්‍රිස්ටියැනිටි" (The Original Jesus - the Buddhist Sources of Christianity) නමැති මෙම කෘතියෙහි කතුවරයින් විසින් උත්සාහ කර තිබෙන්නේ ජේසුස් වහන්සේගේ මුල් ඉගැන්වීම් මතුකර දැක්වීමටය. උන් වහන්සේගේ ඉගැන්වීම් බොහොමයක් අද ක්‍රිස්තියානි ආගමේ දැක්වෙන ඉගැන්වීම්වලට වඩා වෙනස් බවත්, ඒවා වඩාත් සමීප වන්නේ බුදු දහමේ දැක්වෙන ඉගැන්වීම්වලට බවත් ඔවුන්ගේ අදහස වේ. නූතනයේ ව්‍යවහාර වන විචාර පූර්වක අධ්‍යයන ක්‍රම සහ තුලනාත්මක විමර්ශන ක්‍රම උපයෝගී කර ගනිමින් ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් සහ බුදු දහම අතර, විශේෂයෙන්ම ඒවායේ ඇතුළත් සදාචාරාත්මක ඉගැන්වීම්වල බොහෝ සමානකම් පවතින බව විවිධ උදාහරණ මගින් පෙන්වාදී තිබේ. එවැනි සමානකම් පැවැතීම පුදුමයට හේතුවක් නොවේ. මෙහිදී සංයුක්ත නිකායේ පුප්ඵ සූත්‍රයේ දැක්වෙන පහත සඳහන් පාඨය කෙරෙහි මගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

"යං භික්ඛවෙ, නත්ථි සම්මතං ලොකෙ පණ්ඩිතානං අහම්පිතං නත්ථීති වදාමි. යං භික්ඛවෙ, අත්ථි සම්මතං ලොකෙ පණ්ඩිතා නං අහම්පිතං අත්ථීති වදාමි."

එහි අර්ථය මෙසේය:

"මහණෙනි, ලොව පණ්ඩිතයින් විසින් යමක් නැතැයි සම්මත නම් මම ද එය නැතැයි කියමි. මහණෙනි, ලොව යමක් පණ්ඩිතයින් විසින් යමක් ඇතැයි සම්මත නම් මම ද එය ඇතැයි කියමි."

කවර රටක බිහි වුවත්, කුමන යුගයක බිහි වුවත් කවර ආගමක හෝ දර්ශනයක නාමයෙන් හැඳින්වුවත් ප්‍රාඥයෝ බොහෝ කරුණු සම්බන්ධයෙන් සමාන අදහස් දරති. ඔවුන්ගේ චින්තනය සහ අනුශාසනා සත්‍යයට එකඟය.

ශ්‍රේෂ්ඨ ශාස්තෘවරුන්ගේ චින්තනයේ වෙනස්කම්වලට වඩා සමානකම් දක්නට ලැබෙන බව ඒ පිළිබඳව තුලනාත්මකව කරුණු හැදෑරීමේදී පැහැදිලි වේ. එපමණක් නොව, බුදු දහම පහළ වූයේ ජේසුස් වහන්සේ බිහිවීමට වසර පන්සියයකට පමණ පූර්වයෙනි. අතීතයේදී පෙරදිග සහ අපරදිග රටවල් අතර කිට්ටු වෙළඳ සහ සංස්කෘතික සම්බන්ධතා පැවැති බවත්, එකී සම්බන්ධතා ජේසුස් වහන්සේ බිහිවූ අවදියේදී ඉතා උසස් මට්ටමක තිබූ බවත් පෙනේ. එසේ නම් සුවිශේෂ දාර්ශනිකයකු වූ ජේසුස් වහන්සේ තමන් වහන්සේට පූර්වයෙන්

වීනු වෙනත් ශාස්තෘවරුන්ගේ දර්ශන වාද පිළිබඳ අධ්‍යයනය කිරීම පුදුමයට කරුණක් නොවේ.

මෙම පරිවර්තනය කිරීමේ භාරදූර වගකීම මා බාරගත්තේ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් සහ බුදු දහම අතර පවතින කතුවරයා විසින් පෙන්වා දී ඇති විශ්මිත සමානකම් පිළිබඳ අවබෝධයක් සාමාන්‍ය පාඨකයාටද ලබාදීමේ අභිලාෂයෙනි. මෙහි සිංහල පරිවර්තනය 'ජේසුස් වහන්සේ සහ බුදු දහම' යනුවෙන් නම් කරන ලද්දේ එම සමානකම් සහ මුල් කෘතියේ උප මාතෘකා පාඨය ලෙස යොදා ඇති 'ද බුඩිස්ට් සෝර්ස් ඔෆ් ක්‍රිස්ටියැනිටි' හෙවත් ක්‍රිස්තියානි ආගමේ දක්නට ඇති බෞද්ධ බලපෑම් යන පාඨය ද සැලකිල්ලට ගැනීමෙනි.

මිනිසුන් තුළ විවිධ ලබ්ධීන් සහ සමයාන්තර පිළිබඳව බොහෝ විට අගතියක් පවතින්නේ ඔවුන් ඒවා තුලනාත්මකව අධ්‍යයනය කර නොමැති හෙයිනි. තමා අදහන ආගම පමණක් ශ්‍රේෂ්ඨය යන පිළිගැනීම නිසා ඔවුහු කිසියම් දෘෂ්ටිමය රාමුවක් තුළ කොටුවෙති. එම රාමුවෙන් ඔබ්බට විහිදෙන කරුණු පිළිගැනීම කෙසේ වෙතත් ඒවා පිළිබඳ සලකා බැලීමේදී වාස්තවික ප්‍රවේශයක් (Objective Approach) අනුගමනය කිරීමට හෝ ඔවුන් බොහෝ විට නැඹුරුවක් නොදක්වන්නේ මේ නිසාය. එහි ප්‍රතිඵලය වශයෙන් වෙනත් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් ලඝුකොට සැලකීම හෝ ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමට හෝ ඔවුහු උනන්දුවක් නොදක්වති. මිනිසා ජීවත් විය යුත්තේ ආගම් සඳහා නොව, ආගම් පවතින්නේ මිනිසා සඳහා බවත්, ඒවායේ ඇතුළත් ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගැනීමෙන් මිනිස් ජීවිතය වඩා අර්ථවත් කර ගැනීමට හැකිවන බවත් එවිට අවබෝධ වනු ඇත. විවිධ ආගමික කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය අවබෝධය, ගෞරවය සහ පිළිගැනීම වර්ධනය කළ හැක්කේ ආගමික වශයෙන් හුදකලාව කටයුතු කිරීමෙන් නොව විවිධ සමයාන්තර පිළිබඳව තුලනාත්මක ඇගයීම කිරීමෙන් පමණි. බුදු දහම සහ ක්‍රිස්තියානිය අතර විශේෂයෙන්ම ඒවායේ ඇතුළත් සදාචාරාත්මක ක්‍රම පද්ධතියේ වෙනස්කම් වලට වඩා සමානකම් පවතින බව අවබෝධ කරගත් විට බෞද්ධයන් සහ ක්‍රිස්තු භක්තිකයින් අතර පවතින ආගමික සහනශීලීත්වය සහ අන්‍යෝන්‍ය අවබෝධය තවදුරටත් වර්ධනය වීමට එය පිටිවහලක් වනු ඇතැයි මම අවංකව විශ්වාස කරමි.

පරිවර්තනය යනු භාරදූර වගකීමකි. එය සමහර විට අලුතින් පොතක් ලියනවාට වඩා දුෂ්කර වූ කාර්යයකි. විශේෂයෙන්ම බුදුසමයේ සහ ක්‍රිස්තු දහමේ ඇතුළත් ඉගැන්වීම් පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් ඇතුළත් මෙවැනි ශාස්ත්‍රීය ග්‍රන්ථයක් පරිවර්තනය කිරීම ඊටත් වඩා

දුෂ්කරය. කෙසේ වෙතත්, ආගම් සහ විවිධ දර්ශනවාද පිළිබඳව මා තුළ දීර්ඝ කාලයක් පැවති උනන්දුව සහ ඒ පිළිබඳ පොත පත කියවා තිබීම නිසා එම කාර්යය කිරීම පහසු විය. මුල් කෘතියේ ඇතුළත් විවිධ ආගමික මූලාශ්‍රවලින් උපුටා දක්වා ඇති කොටස් ඒවායේ දැනට පවතින පිළිගත් සිංහල පරිවර්තන අනුසාරයෙන් හැකිතාක් දුරට සම්මත ආගමික සම්ප්‍රදායට අනුකූලව පාඨකයාට පහසුවෙන් කියවා තේරුම් ගත හැකි සරල ශෛලියකින් පරිවර්තනය කිරීමට උත්සාහ කළෙමි. ජේසුස් වහන්සේගේ දේශනා ඇතුළත් 'Q' යනුවෙන් හැඳින්වෙන මූලාශ්‍රයෙන් උපුටා දක්වන ලද කොටස් ශුද්ධ බයිබලයේ මතෙව් සහ ලූක්ගේ ශුභාරංචියේ පොත්වල අන්තර්ගත වී තිබේ. එම පොත් ඉතා ප්‍රවේශමෙන් කියවා එම කොටස් වෙන්කර බයිබලයේ සිංහල පරිවර්තනයට අනුකූලව පරිවර්තනය කළ බව මෙහිදී සඳහන් කළ යුතුය. බයිබලයෙන් උපුටා දක්වා ඇති වෙනත් පාඨ පරිවර්තනය කිරීමේදී මෙම ක්‍රමයම අනුගමනය කරන ලදී. එමෙන්ම ධම්මපදය, ජාතක පොත, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, සහ උදානවග්ගය වැනි බෞද්ධ මූලාශ්‍රවලින් උපුටා දක්වන ලද කොටස් සම්බන්ධයෙන්ද, ඒවායේ පිළිගත් සිංහල පරිවර්තන කීපයක් ඇසුරු කරමින් සරල බසින් ඉදිරිපත් කිරීමට කටයුතු කළෙමි.

සිංහල පරිවර්තනය එළි දැක්වීමේදී නන් අයුරින් සහයෝගය දුන්, ඒ සඳහා උපකාර කළ පිරිස මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුතුය. මේ පරිවර්තනය කිරීමේ භාරධූර වගකීම මට පවරා එය ප්‍රකාශයට පත් කළ සරසවි සමූහ ව්‍යාපාරයේ අධිපති එච්. ඩී. ප්‍රේමසිරි මහතාටත්, 1996 වර්ෂයේදී පමණ මෙම පොත කෙරෙහි මගේ අවධානය යොමු කළ නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයකු වන හේමචන්ද්‍ර රණසිංහ මහතාටත්, මුල් අත් පිටපත යතුරු ලියනය කරදුන් ජේ. එල්ලාවල මහතාටත්, පරිගණක සෝදුපත් කියවා පොත මුද්‍රණය කිරීමට කටයුතු කළ සරසවි ප්‍රකාශන සමාගමේ කළමනාකාර සිරි අල්මේදා මහතාටත්, පරිගණක අකුරු සංයෝජනය කර දුන් එම ආයතනයේ සන්ධ්‍යා කුමාරි ලියනගේ මහත්මියටත්, මුද්‍රණ කටයුතු අලංකාර ලෙස කරදුන් සිකුරු මුද්‍රණ ආයතනයටත් මගේ අවංක ස්තූතිය හිමි වේ.

මෙහි දී මගේ විශේෂ කෘතඥතාව හිමි විය යුතු තවත් පුද්ගලයන් දෙදෙනකු වෙයි. සිංහල පරිවර්තනයේ අත් පිටපත කීපවරක් කියවා එය පාඨකයාට පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි සංස්කරණය කිරීමේදී තම වටිනා කාලය කැප කරමින් මහත් වෙහෙසක් දරමින් කටයුතු කළ මා හිතවත් විශ්‍රාමලත් විදුහල්පති නන්දසේන වත්තේගම ආචාර්ය මහතාටත්, පරිවර්තනය කරනු ලැබූ කොටස් නැවත නැවත කියවමින්,

මා ඒවා කියවීමේදී ඊට සාවධානව ඇහුම්කන් දෙමින් එකී කොටස් සරල සුගම ශෛලියකින් ඉදිරිපත් කිරීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කරමින් බොහෝ අවස්ථාවලදී එම කොටස් පිටපත් කර දෙමින් පරිවර්තනය කෙරෙහි මා උනන්දු කරවූ මගේ ආදරණීය බිරිඳ රමණීටත් මගේ කෘතඥතාව හිමිවේ.

තෙවැනි සංස්කරණය පිළිබඳ පරිවර්තකගෙන්

බොහෝ පරිවර්තන කෘති පිළිබඳ පාඨකයන්ගේ වැඩි අවධානයක් යොමු නොවන යුගයක ජේසුස් වහන්සේ සහ බුදු දහම නම් වූ මෙම කෘතියේ දෙවැනි මුද්‍රණයෙන් අනතුරුව තෙවැනි සංස්කරණයක්ද සහිතව යළි පාඨකයන් අතට පත් කිරීමට ප්‍රකාශකයන් කටයුතු කිරීම ගැන මම බෙහෙවින් සතුටුවෙමි. මෙම සංස්කරණයේදී පරිවර්තනයේ මූලික අර්ථයට හානියක් නොවන අන්දමින් ඉතා සුළු වෙනස්කම් කිහිපයක් පමණක් කර ඇතිබව සඳහන් කළ යුතුය.

ආගමික සංස්ථාවක මූලික කාර්ය භාරය විය යුත්තේ හොඳ නරක තෝරා බේරාදී සමාජය යහමගට යොමු කර වීමය. එසේ කිරීමේදී විවිධ පුද්ගලයන්ගේ පෞද්ගලික අභිමතාර්ථ සමාජය කෙරෙහි බද්ධ කිරීමෙන් වැළකී සිටීමට ප්‍රවේශම් විය යුතුය. එසේම කිසියම් ආගමක් අධිකාරිය ලත් සුළු පිරිසකට පමණක් අයත් වූවක් නොවන බවද අප සිහි තබාගත යුතුය. ආගම් සහ දර්ශනවාද සමස්ත මානව වර්ගයා සතු බුද්ධිමය උරුමයකි. ඒවායේ ඇතුළත් ඉගැන්වීම් හොඳින් විමර්ශනය කර එම ඉගැන්වීම් පිළිගැනීමේ හෝ නොපිළිගැනීමේ අයිතිය මිනිසුන්ට තිබිය යුතුවේ. එය මුදලට, බලයට හෝ නීතියට යටවූ ක්‍රියාවලියක් නොවිය යුතුය. සැබෑ ධර්මය කුමක්දැයි තේරුම් ගැනීමට තරම් බුද්ධියක් හා අවබෝධයක් වත්මන් සමාජය සතුය.

මෙහිදී අවශ්‍යවන්නේ මිනිසුන්ට සැබෑ ධර්මය වටහා දීමත් ආගම් පිළිබඳ තුලනාත්මක අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය වටාපිටාව සකස්කර දීමත් පමණි.

'ජේසුස් වහන්සේ සහ බුද්දහම' නම් වූ මෙම කෘතිය එම අවබෝධය ඇතිකර ගැනීම සඳහා මහත් පිටිවහලක් වන බව මගේ අවංක විශ්වාසයයි.

කේ. ඒ. එන්. පෙරේරා
11 දොලලන්ද වත්ත
තලවතුගොඩ
දුරකථනය : 2775036

පටුන

කතුවරයන්ගේ ස්තුතිය vi
කතුවරයන්ගේ හැඳින්වීම vii
පරිවර්තකගේ පෙරවදන xi

පළමුවන කොටස
ඉන්දියාව සහ බටහිර රටවල් අතර පැවති සම්බන්ධතා
ජේසුස් වහන්සේ පිළිබඳ අප්‍රකට තොරතුරු 3
ගෞතම බුදුන් වහන්සේ පරම සත්‍යය අවබෝධ කරගැනීම 14
බයිබලයේ දැක්වෙන ඉන්දියානු ඉගැන්වීම් 32
මහා පිබිදීම 43
දියුණු ශිෂ්ටාචාර බිහිවීම 48
මොනරු, රත්තරන් සහ වඳුරු, ඇත් දළ සහ සොලමන් රජතුමාගේ ඉන්දියානු චාරිකා 61
පයිතගරස්ගේ ඉන්දියානු දර්ශනය 74
ඇලෙක්සැන්ඩර් ඉන්දු නිම්නයේදී 82
අශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරය : බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ලොව පුරා පැතිරීම 92

දෙවන කොටස
ජේසුස් වහන්සේ නම් වූ බුද්ධ ශ්‍රාවකයා
සිදුහත් කුමාරයාගේ සහ ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ දක්නට ලැබෙන සමානකම් 113
අසිත තවුසා සහ සිමියොන් 121
පුනර්භවය පිළිබඳ ඉගැන්වීම 127
වනජ තවුසන් සහ දිවැසිවරුන් 134
ජේසුස් වහන්සේ විසින් ප්‍රාතිහාර්ය දැක්වීම 140
ළිඳ ළඟ සිටි ස්ත්‍රිය 146
සුභාරංචියේ නැතිවූ කොටස් නැවත සොයාගැනීම 157
ජේසුස් වහන්සේගේ ජීවිතයේ පැතිකඩක් 165
ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා 169
ජේසුස් වහන්සේ සහ බෞද්ධ මූලාශ්‍ර 175
ජේසුස් වහන්සේ එළිදරව්ව පිළිබඳ දිවැසිවරයකු බවට පත්කිරීම 209
බුද්දහමේ දැක්වෙන මාරයා යක්ෂයාගේ වේශයෙන් කිතු සමය තුළට ප්‍රවිෂ්ටවීම 222
ජේසුස් වහන්සේට ස්නාවක ජොහන් ජෝර්දානයේදී හමුවීම 233

තුන්වන කොටස

ජේසුස්වහන්සේ බිහිවීමට පෙර හා පසු පැවති ආගමික පරිසරය

බුදු දහම බටහිර රටවල ව්‍යාප්ත වීම	251
ඊජිප්තියානු බෞද්ධයෝ : ථේරවාදීන් සහ තෙරපියුටාවරු	258
ජේසුස්වහන්සේ සහ බෝධිසත්ව සංකල්පය	273
එසීන්වරුන්ගේ සම්බන්ධතාව	284
කුම්රාන් ආගමික ප්‍රජාව පිළිබඳ අප්‍රකට තොරතුරු	299
කුම්රාන් සමාජය විසින් ජේසුස්වහන්සේ පිළිබඳ මිථ්‍යාකථා ගොඩනැගීම	318
ක්‍රිස්තියානියේ දක්වෙන ඉන්දියානු ලක්ෂණ : පූජකයන්, පල්ලි සහ ගැලවුම්කරුවන්	332
දාර්ශනික ඥානය	341
බුද්ධ ජේසුස් සංකල්පය	351
සමාප්තිය	359
Notes	363
Bibliography	370
උප ග්‍රන්ථ	379
ස්ථාන නාම සූචිය	389
පුද්ගල නාම සූචිය	394
විෂයනාම සූචිය	399

පළමුවන කොටස

ඉන්දියාව සහ බටහිර රටවල් අතර පැවති සම්බන්ධතා

ජේසුස් වහන්සේ පිළිබඳ අප්‍රකට තොරතුරු

නාසරෙත්හි විසූ ජේසුස් වහන්සේ නම් වූ පුද්ගලයා තරම් බටහිර ලෝකයේ රටවල මහත් ආන්දෝලනයක් ඇතිකළ සහ අප්‍රමාණ පොත් පත් සංඛ්‍යාවක් ලිවීම සඳහා විෂයවූ, එමෙන්ම උණුසුම් සහ උද්යෝගිමත් සාකච්ඡා සහ වාද විවාද වලට තුඩු දුන් වෙනත් චරිතයක් නොමැති තරම්ය. එතෙකුදු වුවත්, ඓතිහාසික වශයෙන් සලකා බැලීමේදී ජේසුස් වහන්සේගේ පෞරුෂයේ සැබෑ ස්වරූපය තවමත් අඳුරු පටලයකින් වැසී තිබෙන බව කිව යුතුය. අවුරුදු එක් දහස් පන්සියයක් පමණ කාලයක් තිස්සේ ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අපට ලැබී තිබෙන්නේ ක්‍රිස්තු ලබ්ධිය නගා සිටුවීම සහ මිනිසුන් ක්‍රිස්තියානියට හරවා ගැනීමේ පරමාර්ථය මුල් කරගෙන ක්‍රිස්තියානි පල්ලිය විසින් නිල වශයෙන් අනුදන්නා ලද ධර්මයට අනුකූලව උන්වහන්සේ පිළිබඳව ලියා ඇති විස්තර තොරතුරු පමණි. මේ පිළිබඳව විචාරාත්මකව සලකා බැලූ චින්තකයෝ මෑතදී යුරෝපයේ පහළ වූහ. දහහත්වන සහ දහඅටවන ශතවර්ෂ වලදී යුරෝපයේ ඇතිවූ විද්‍යා පුනර්ජීවනයත් සමඟ ජේසුස් වහන්සේ නමින් පුද්ගලයෙක් නාසරෙත්හි සැබැවින්ම විසුවේ ද යන කාරණය පිළිබඳව සැක පහළ කරමින් පළමුවරට පොත පත ප්‍රසිද්ධියට පත්කරන ලදී. එවැනි අදහස් මූලික වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ ප්‍රංශයේ විසූ ක්‍රිස්තියානි විරෝධී චින්තන ප්‍රවාහයට අයත් වූ වොල්ටෙයාර් (Voltaire) සහ හොල්බච් (Holbach) නම් වූ චින්තකයින් විසිනි. ක්‍රිස්තියානි ධර්මය ඇත්ත වශයෙන්ම ස්ථාපිත කරන ලද්දේ ජේසුස් වහන්සේ විසින් ද යන කාරණය පිළිබඳව සැක පහළ කරමින් ජර්මන් ජාතික චින්තකයකු වූ ගොතේ (Goethe) පවා මෙම සාකච්ඡා වලට අවතීර්ණ විය. ක්‍රිස්තියානි ධර්මයේ දක්වෙන ඉගැන්වීම් ජේසුස් වහන්සේගේ ගෝලයින් විසින් නිර්මාණය කරනු ලැබ, ඒවා උන් වහන්සේගේ දේශනා වශයෙන් ඉදිරිපත් කර ඇති බව ගොතේගේ අදහස විය.

19 වැනි ශතවර්ෂයේදී ප්‍රථම වරට නව තෙස්තමේන්තුව ශාස්ත්‍රීය වශයෙන් විමර්ශනයට භාජනය කරනු ලැබීය. එය ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ ක්‍රමානුකූල ලෙස විමර්ශනය කිරීමේ ක්‍රියාවලියේ ආරම්භය වූ අතර ජර්මන් ප්‍රොතෙස්තන්තු දේවධර්මවේදී නිකාය (German Protestant Theology) එම විමර්ශන ක්‍රියාවලියේ මූලිකත්වය ගත්හ. ඔවුන්ගේ චෝදනාව වූයේ කතෝලික පල්ලිය විසින් ක්‍රිස්තු ධර්මය සාවද්‍ය ලෙස විකෘති කර ඇති බවය. තවද ජේසුස් වහන්සේ විසින් අපේක්ෂිත පරමාර්ථය කතෝලික පල්ලිය විසින් උන්වහන්සේගේ ඉගැන්වීම් ලෙස ඉදිරිපත් කර ඇති කරුණු වලට වඩා වෙනස් බව ප්‍රකාශ කරමින් ඔවුහු

එම මතය සනාථ කිරීම සඳහා කරුණු ඉදිරිපත් කළහ. නාසරෙත්හි විසූ ජේසුස් වහන්සේ නැමති පුද්ගලයා පිළිබඳ සැබෑ තතු පහදා දීම මේ සඳහා ආරම්භයක් ලෙස යොදාගත හැකි බව කල්පනා කරන ලදී. 1835 වර්ෂයේදී ඩේවිඩ් ස්ට්‍රවුස් (David Strauss) විසින් මේ සම්බන්ධයෙන් විශාල බලපෑමක් ඇති කරනු ලැබූ "ජේසුස් වහන්සේගේ ජීවිතය" (The Life of Jesus) නම් වූ පොත ප්‍රකාශයට පත්කරන ලදී. මෙතෙක් පිළිගෙන තිබූ අදහස් සමග කිසියම් සම්මුතියකට එළඹීමට පවා නොහැකිවන තරමට විවාදාත්මක වූත්, තර්කානුකූල වූත්, මත ඉදිරිපත් කරමින් ඔහු ශුභාරංචියේ පොත්වල ඓතිහාසික සත්‍යතාවය නිර්දය විවේචනයට ලක් කළේය. ශුභාරංචියේ පොත්වල දක්නට ලැබෙන්නේ බයිබලයේ පැරණි තෙස්තමේන්තුවේ ආභාෂය ලැබ ජේසුස් නැමති පුද්ගලයා පිළිබඳව ගොඩ නගා ඇති ජනප්‍රවාද සහ ධාර්මික කථා ප්‍රවෘත්ති වලට වඩා වැඩි යමක් නොවන බව ස්ට්‍රවුස් ප්‍රකාශ කළේය. එවැනි විරෝධතාවයන් 19 වැනි ශතවර්ෂයේ මැද භාගයේදී තවදුරටත් එල්ල වන්නට පටන් ගත්තේය. නව තෙස්තමේන්තුවේ දැක්වෙන ප්‍රධාන චරිතය හුදෙක් මිථ්‍යා ප්‍රවාදයක් බව ප්‍රකාශ කරමින් ජේසුස් වහන්සේ නැමති පුද්ගලයා පිළිබඳ ඓතිහාසික පර්යේෂණ කිරීම බෲනෝ බෝවර් (Bruno Bauer) විසින් අත්හැර දමන ලදී. ජේසුස් වහන්සේගේ සහ ශාන්ත පාවුලු තුමන්ගේ චරිත කල්පිත ප්‍රබන්ධ වලට වඩා වැඩි යමක් නොවන බවත් ක්‍රිස්තියානිය යනු යුදෙව්, ග්‍රීක් සහ රෝමන් ආගමික සම්ප්‍රදායන්ගේ සම්මිශ්‍රණයක් තුළින් කිසියම් අන්තගාමී ආගමික කණ්ඩායමක් විසින් ඉහත කී චරිත දෙක වටා ගොඩනගනු ලැබූ ආගමක් බවත් ඔහු ප්‍රකාශ කළේය.

මෙම ක්ෂේත්‍රය පිළිබඳව සුප්‍රසිද්ධ පර්යේෂකයකු මෙන්ම වෛද්‍යවරයකු සහ දේව ධර්මවේදියකු වූ ඇල්බට් ෂ්වයිසර් (Albert Schweizer) එවැනි විවේචන සහ තීරණ නිසා අධෛර්යයට පත්වූයේ නැත. ඔහුගේ අදහස වූයේ ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳව පර්යේෂණ පැවැත්වීම ආගමික අවබෝධය තුළින් ක්‍රියාවට නංවන ලද වඩාත් උද්යෝගීමත් කාර්යයක් බවය. උන්වහන්සේගේ ජීවිතය පිළිබඳව ඓතිහාසික වශයෙන් සලකා බැලීමේදී අද අපට මුහුණ පෑමට සිදුවී ඇති මුද්‍රිතය බාධක තවදුරටත් නොසලකා හැරීමට නුපුළුවන. ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳව පර්යේෂණ කිරීම ක්‍රිස්තියානි පල්ලියේ සත්‍යවාදීභාවය සහතික කිරීම සහ සත්‍යය වෙනුවෙන් කරන්නා වූ දුෂ්කර වූත් ආකූලශීලි වූත් කාර්යයක් බව ඇල්බට් ෂ්වයිසර් කල්පනා කළේය.

මේ වනවිට ජේසුස් වහන්සේ පිළිබඳව ලියැවී ඇති ලේඛන සංඛ්‍යාව අසූ දහසකට වඩා වැඩිය. නමුත් උන්වහන්සේ ඓතිහාසික

චරිතයක් ලෙස හඳුන්වා දීමේදී එකී ලේඛන මගින් සිදුකර ඇත්තේ අතිශයින් මධ්‍යස්ථ වූ බලපෑමක් පමණි. ජේසුස් වහන්සේ යනු කවරෙක්ද? ඔහු උපන්නේ කවදාද? ඔහු මොන විධියේ පුද්ගලයකු විද? ඔහු කුරුසියේ ඇනගසා මරණයට පත්කළේ කවදාද? ඔහු මිය ගියේ කවදාද? කෙසේද? කොතැනකදීද? මෙම ප්‍රශ්න වලට පිළිතුරු සෙවීම විසඳිය නොහැකි ගැටළුවක් බවට පත් වී තිබේ. ක්‍රිස්තු වර්ෂයෙන් පසුව එළඹුන පළමුවැනි සහ දෙවැනි ශත වර්ෂ වලදී ලියන ලද පොත් පත් වල ජේසුස් වහන්සේ නමින් මනුෂ්‍යයෙකු ජීවත්ව සිටි බව පෙන්නුම් කරන කිසිදු සඳහනක් දක්නට නොමැත. ඊට පසු කාලයේදී ලියැවී ඇති මූලාශ්‍ර සියල්ලම පාහේ ජේසුස් වහන්සේ ගැලවුම් කාරයකු වශයෙන් සහ දෙවියන් වහන්සේගේ පුත්‍රයා වශයෙන් පිළිගනු ලබන විශ්වාසය මත පදනම් වූ සම්පූර්ණයෙන්ම පාහේ දේවධර්මයට අනුකූලව කරන ලද රචනා වේ. එනිසා ඇත්ත වශයෙන්ම අපක්ෂපාති ලිඛිත සාක්ෂියක් ප්‍රායෝගික වශයෙන් දක්නට නොලැබේ. අද පවා උගතුන්ට ජේසුස් වහන්සේ උපන්නේ කවර වර්ෂයකදී ද යන්න නිශ්චිතව ප්‍රකාශ කිරීමට නොහැකිය. කෙසේ වෙතත් ජේසුස් වහන්සේ උපත ලැබුයේ හෙරෝද් රජතුමාගේ රාජ්‍ය සමයේදී බව (ක්‍රි. පූ. 37 - 4) අප නිසැකව දන්නා හෙයින් එතුමා උපදින්නට ඇත්තේ ක්‍රි. පූ. 4-7 වර්ෂවලදී බව අනුමාන කෙරේ. ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් පුද්ගලයකුගේ චරිතය හැඩගැස්වීම කෙරෙහි අතිශයින් වැදගත් තැනක් ගන්නා කාලපරිච්ඡේදය වූ ළමා විය හෝ තුරුණු විය පිළිබඳ තොරතුරු ශුභාරංචියේ කිසි තැනක දක්නට නොලැබේ. ජේසුස් වහන්සේ විසින් පොදුවේ සමාජය කෙරෙහි බලපෑමක් ඇති කරන ලද කෙටි කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු වල පවා උන්වහන්සේගේ චරිතය පිළිබඳ සඳහන් කර තිබෙන තොරතුරු ඉතාමත් විරලය. ජේසුස් වහන්සේ ජීවත් වූ කාලයේ විසූ ඉතිහාසඥයින් විසින් උන්වහන්සේ පිළිබඳ කිසිවක් නොදැන සිටි බව හෝ යටත් පිරිසෙයින් උන්වහන්සේ පිළිබඳ සඳහන් කිරීම වැදගත් ලෙස නොසැලකූ බව පෙනේ. ශුභාරංචියේ සඳහන් කර ඇති උන්වහන්සේ විසින් සිදුකරන ලද විශ්මයජනක ප්‍රාතිහාර්යයන් සහ අසාමාන්‍ය සිදුවීම් වාර්තා කිරීම සඳහා තත්කාලීනව විසූ ඉතිහාසඥයින් උනන්දුවක් දක්වා නැත්තේ ඇයි?

ජේසුස් වහන්සේගේ සමකාලීනයකු වූ ක්‍රි. පූ. 20 - ක්‍රි. ව. 50 කාලය තුළ ජීවත්වූ ෆිලෝ ජුදාස් (Philo Judaeus) විසින් රචිත ඉතිහාසය, දර්ශනය සහ ආගම පිළිබඳ වැදගත් කරුණු සඳහන් ලේඛන පනහක් පමණ නොනැසී පවතී. එම ලිපි ලේඛන වල පිලාත් (Pilate) පිළිබඳව විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර තිබෙන නමුත් ජේසුස් වහන්සේ

පිළිබඳ කිසිම සඳහනක් කර නොමැත. මේ නිසා ක්‍රිස්තියානි ආගමට සම්බන්ධ නොවූ අපක්ෂපාතී මූලාශ්‍රයකින් උන්වහන්සේ පිළිබඳ තොරතුරු අපට ලබා ගත හැක්කේ ක්‍රි. ව. දෙවන ශතවර්ෂයේදී පමණි. ටැසිටස් (Tacitus) නැමති රෝම ඉතිහාසඥයා විසින් ක්‍රි. ව. 117 - 119 වර්ෂවලදී ලියන ලද ඇනල්ස් (Annals) නමැති ග්‍රන්ථයේ ටයිබේරියස් (Tiberius) අධිරාජයාගේ පාලන සමයේදී පොන්ටියස් (Pontius) නමැති ආණ්ඩුකාරයා විසින් ජීවිතක්ෂයට පත්කරන ලදැයි සැලකෙන එක්තරා ක්‍රිස්තවරයකුගේ (Christ) නමින් ක්‍රිස්තියානි ආගමිකයින් විසින් පිහිටුවන ලද මිථ්‍යා දෘෂ්ටික ආගමික නිකායක් පිළිබඳව සඳහන් කර තිබේ. ක්‍රි. ව. දෙවන ශතවර්ෂයේදී ප්‍රචලිතව පැවති කථා ප්‍රවෘත්ති මත පදනම් වී ඇති එම වාර්තාව ලියා තිබෙන්නේ ජේසුස් වහන්සේ කුරුසියේ ඇන ගැසීමෙන් අවුරුදු අසූවක් හෝ අනූවක් පමණ ගතවූ පසුවය. ක්‍රි. ව. 110 දී කනිෂ්ඨ ප්ලිනි (Pliny the Younger) විසින් ට්‍රාජන් අධිරාජයා (Trajan) වෙත යවන ලද ලිපියක බිත්නියා (Bithnia) වල සිටි ක්‍රිස්තියානි ආගමිකයින් පිළිබඳව සඳහන් කර තිබේ. නමුත් එම ආගමික නිකායේ නිර්මාතෘවරයා පිළිබඳ කිසිම තොරතුරක් එහි දක්වා නැත. හේඩ්රියන් (Hadrian) අධිරාජයාගේ ප්‍රධාන අමාත්‍යවරයා වූ (Head of Chancellery) සුටෝනියස්ට (Suetonius) (ක්‍රි. ව. 70 - 140) රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට ඇතුල්වීමට සහ එහි ආරක්ෂා සහිතව තබා තිබූ කලින් රාජ්‍ය පාලනය කරණු ලැබූ අධිරාජයන්ගේ කාලපරිච්ඡේද වලට අදාළ වැදගත් සිදුවීම් පිළිබඳ වටිනා ලියකියවිලි පරීක්ෂා කර බැලීමට අවසර තිබුණි. ක්ලෝඩියස් අධිරාජයාගේ පාලන සමයේදී (ක්‍රි. ව. 41 - 54) යුදෙව් ජාතිකයින් කිසියම් ක්‍රයිස්තවරයකුගේ පෙළඹවීම නිසා කලබල ඇති කළ බවත්, එනිසා අධිරාජයා විසින් ඔවුන් රෝමයෙන් පළවා හරිනු ලැබූ බවත් සුටෝනියස් විසින් වාර්තාකර තිබේ. යටත් පිරිසෙයින් ක්‍රි. ව. 50 දී පමණ ක්‍රිස්තියානි ආගම පිළිගත් භක්තිමතුන් සිටි බව එම වාර්තාවෙන් පැහැදිලි වේ.

ෆ්ලේවියස් ජෝසෆස් (Flavius Josephus) යනුවෙන් නම නම වෙනස් කර රෝම පුරවැසිභාවය ලබාගත් ජෝසප් බෙන් මතායස් (Joseph Ben Mathias) නමැති යුදෙව් ජාතික ඉතිහාසඥයකු ක්‍රි. පූ. 37 - ක්‍රි. ව. 100 අතරතුර කාලයේදී වාසය කළේය. ඔහු යුදෙව් නොවන පාඨකයින්ගේ දැන ගැනීම පිණිස තමා අයත් වූ යුදෙව් ජාතිය පිළිබඳ කරුණු පහදාදීම සඳහා ලෝකය මැවීමේ පටන් නීරෝ අධිරාජයාගේ පාලන සමයේ ආරම්භය දක්වා කාලපරිච්ඡේදය ඇතුළත් කරමින් ක්‍රි. ව. 93 දී පමණ ජුවිශ් ඇන්ටික්විටීස් (Jewish Antiquities) හෙවත් යුදෙව්වන්ගේ ඉතිහාසය නැමති පොත පළකරන ලදී. ජේසුස් වහන්සේ ජීවත් වූ කාලයේ පැවති

දේශපාලන සහ සමාජ තත්වය පිළිබඳවද ඔහු විසින් දීර්ඝ විස්තරයක් කර තිබේ. එමෙන්ම ස්නාවක ජොහන් (John the Baptists) හෙරෝද් (Herod) සහ පිලාත් පිළිබඳව එහි සඳහන් කර තිබේ. ජේම්ස් නම් වූ පුද්ගලයෙකු ගල් ගසා මරා දැමීම පිළිබඳ සිද්ධියක් පිළිබඳව විස්තර කිරීමේදී ජේසුස් නමැති පුද්ගලයකු පිළිබඳව ද සඳහන් කර තිබේ. මිනිසුන් විසින් ක්‍රිස්තුස් වහන්සේ යයි හඳුන්වනු ලැබූ එකී ජේසුස් නමැති පුද්ගලයා තම සහෝදරයා බව ඔහු තවදුරටත් සඳහන් කර ඇත.

යුදෙව් ජාතිකයින්ගේ ඉතිහාසය පිළිබඳව ලියා ඇති 18 වන පොතේ මෙසේ සඳහන් වේ. "ජේසුස් වහන්සේ මනුෂ්‍යයකු ලෙස හැඳින්විය හැකි නම් ජේසුස් නමැති බුද්ධිමත් මනුෂ්‍යයකු මේ කාලයේදී ජීවත් විය. ඔහු අපූර්ව ක්‍රියා සිදු කළේය. ඔහු සත්‍යය දැනගැනීමට කැමති මිනිසුන්ගේ ගුරුවරයෙකු විය. ඔහු බොහෝ යුදෙව් ජාතිකයින් මෙන්ම ග්‍රීක් ජාතිකයින්ද තමා වෙත නතුකර ගත්තේය. ක්‍රිස්තුස් වහන්සේ නම් ඔහු විය." කෙසේ වෙතත් ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්ය පෑ සාර්ථක ගුරුවරයෙකු ලෙස ඉදිරිපත් කර ඇති "ෆ්ලේවියස්ගේ සාක්ෂිය" (The Testimony of Flavius) නැමති සුප්‍රසිද්ධ ග්‍රන්ථය ජෝසෆස් විසින් ලියන ලද්දක් විය නොහැකිය. ඉතිහාසයේ මුල් යුගයේදී ජෝසෆස්ට ඉතිහාසඥයකු ලෙස විශාල පිළිගැනීමක් තිබුණි. ඉතිහාසය පිළිබඳව නිවැරදි තොරතුරු වාර්තා කරනු ලැබූ ජෝසෆස් වැනි ලේඛකයකු ලවා ජේසුස් වහන්සේ පිළිබඳ වාර්තා කිරීමේ ඇති අවශ්‍යතාවය සහ වැදගත්කම දේවධර්ම ආචාර්යවරු හොඳින් අවබෝධ කරගෙන සිටියහ. ඉහත කී ලේඛනයේ අඩංගු කරුණු යුදෙව් ජාතිකයකු වූ ජෝසෆස්ගේ අදහස් හා නොගැළපෙන නමුත් ජේසුස් වහන්සේ පිළිබඳ කරුණු ඉදිරිපත් කරන වාර්තාවක් ලෙස එම ලේඛනය තුන් වන ශත වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබීය. ජේසුස් වහන්සේ ක්‍රයිස්තවරයකු සහ අතිමානුෂික පුද්ගලයකු ලෙස හඳුන්වා තිබීමෙන් එය පල්ලියට සම්බන්ධ ලේඛකයකුගේ ග්‍රාම්‍ය ක්‍රියාවක් බව පෙනේ. ජේසුස් වහන්සේ ක්‍රයිස්තවරයකු බව ජෝසෆස් විශ්වාස නොකළ බව තමා හොඳින් දැනසිටි බව ඔරිගන් (Origen) නමැති දේවධර්මාචාර්ය වරයා විසින් ප්‍රකාශකර තිබෙන හෙයින් ඉහත කී වාර්තාව ජෝසෆස් විසින් ලියන ලද්දේ යැයි සිතිය නොහැක.

ඉතිහාසඥයකුගේ කාර්යයේ ඇති දුෂ්කරතාවය පැහැදිලි කරන උදාහරණයකට අපි මෙහිදී මුහුණ පා සිටිමු. අතීතයේදී ලියන ලද ශ්‍රේෂ්ඨ ලිපි ලේඛන වල අන්තර්ගත කරුණු වෙනස්කර ඒවා විකෘති කර ඉදිරිපත් කිරීමට ක්‍රිස්තියානි පල්ලිය වෙනුවෙන් සේවය කළ ලේඛකයින් නව සහස්‍රකයේ මුල් ශතවර්ෂවලදී ක්‍රියා කළේය. එසේ වෙනස් කරනු ලැබූ

ලේඛනවල පිටපත් සියයක් උගත් දේවධර්මාචාර්ය වරුන් අතට පත්විය. කිසියම් අදහසක් ජනප්‍රිය කිරීම සඳහා ප්‍රචාරණයේ ඇති වැදගත්කම ඒ කාලයේදී පවා හොඳින් දැන සිටි කරුණකි. ඒ සඳහා බහුල වශයෙන් යොදා ගන්නා ලද ක්‍රම වේදය වූයේ ප්‍රසිද්ධියට පාත්‍රව සිටි ක්‍රිස්තු ලබ්ධිය නොපිළිගත්, නො ඒසේ නම් පල්ලියට සම්බන්ධව නොසිටි ලේඛකයින් ක්‍රිස්තු ලබ්ධිය ප්‍රචලිත කිරීම සඳහා මරණපර සාක්ෂිකරුවන් (Posthumous Witnesses) ලෙස යොදා ගැනීමය. විශේෂයෙන්ම ඓතිහාසික සිදුවීම් ඉතා නිවැරදිව වාර්තා කිරීම පිළිබඳ උසස් කීර්තියක් දැරූ ඉතිහාසඥයින්ගේ ලේඛන මේ සඳහා උපයෝගීකර ගන්නා ලදී. ආගමික පණිවිඩයක ඓතිහාසික සත්‍යතාවය තහවුරු කිරීම සඳහා මධ්‍යස්ථ සාක්ෂිකරුවන් ලෙස ඔවුන් යොදා ගැනීම වඩාත් යෝග්‍ය විය. මෙසේ දක්ෂ පිටපත් කරුවන් විසින් සකස් කරන ලද ඉතා ප්‍රතිකෘතීන් (Replica) ලොව පුරා ප්‍රසිද්ධ කරන ලදී. මුල් පිටපත් වලට කිසිසේත්ම සමාන නොවූ එකී පිටපත් විකෘති කරණ ලද ප්‍රචාරාත්මක ලේඛනවිය. මෙකී ව්‍යාජ ලේඛන එසේ වෙනස් කෙරුනු ලැබූ ඒවායේ මුල් පිටපත් වලට වඩා ක්‍රිස්තියානිය විශ්වාස නොකරන පුද්ගලයින් සහ ආගමික දෘෂ්ටියේ තරයේ එල්බ ගත් පුද්ගලයින් කෙරෙහි, විශේෂයෙන්ම උගතුන් කෙරෙහි දැඩි බලපෑමක් ඇති කිරීමට හේතුවිය. මෙකී ලේඛන වල පෙළ (Text) විචාරාත්මකව සලකා බැලීමේදී ඒවා ලියනු ලැබූ ලේඛකයින්ගේ රචනා ශෛලිය, ඔවුන් ජීවත් වූ කාලය, වටපිටාව හෝ ඔවුන්ගේ චින්තනය සමග නොගැළපෙන කොටස් ඒවාට ඇතුළත් කර ඇති බව පෙනී යන නිසා එකී ලේඛන පල්ලිය විසින් වැරදි සහගත ලෙස ඉදිරිපත් කර ඇති බව පැහැදිලිවේ.

ජොසාෆස්ගේ සමකාලීනයකු මෙන්ම යුදෙව් ජාතික ලේඛකයකු වූ ජස්ටස් (Justus) නැමති පුද්ගලයකු ජේසුස් වහන්සේ නිතර වාසය කළ බව සැලකෙන කැපර්නෙහම් (Capernaum) නැමති ස්ථානයට තුදුරින් පිහිටි ටයිබීරියාස්වල (Tiberias) වාසය කළේය. ඔහු මෝසස් ගේ කාලයේ පටන් තමා ජීවත් වූ කාලය දක්වා වූ කාලපරිච්ඡේදය ඇතුළත් කර ඉතිහාස පොතක් ලියුවේය. එම පොතේ කිසිම තැනක ජේසුස් වහන්සේ පිළිබඳ කිසිම සඳහනක් කර නොමැත. දැඩි ක්‍රිස්තියානි විරෝධී පුද්ගලයකු වූ සෙල්සස් (Celsus) නමැති පුද්ගලයෙකු විසින් ජේසුස් වහන්සේ පිළිබඳ කරුණු කීපයක් සඳහන් කර තිබුණත් ඒවා කිසිසේත්ම උත්කෘෂ්ටවූ පුතිස්සවරයකු සම්බන්ධයෙන් කරන ලද ප්‍රශංසාත්මක ප්‍රකාශ නොවේ. මෙසේ ජේසුස් වහන්සේ පිළිබඳව ඓතිහාසික වශයෙන් පර්යේෂණ කිරීම සඳහා අපට ඉතිරිව ඇති එකම මූලාශ්‍රය ලෙස පවතින්නේ නව තෙස්තමේන්තුව යනුවෙන් හැඳින්වෙන ලේඛන සංග්‍රහය පමණි.

නව තෙස්තමේන්තුව මතෙව්, මාක්, ලූක් සහ ජොහන් යනුවෙන් කොටස් සතරකින් සමන්විත වේ. ක්‍රිස්තු ධර්මය ස්ථාපිත වීමට පෙර පැවති විවිධ මුල් ක්‍රිස්තියානි ජන සමාජ වල භාවිතා වූ ලේඛන විශාල සංඛ්‍යාවක් අතරින් අත්තනෝමතිකව තෝරාගන්නා ලද ලිඛිත කරුණු සමූහයක් ඒවාට ඇතුළත් වේ. ක්‍රිස්තියානි ආගමික ව්‍යාපාරයේ මුල් අවධියේදී මත භේදයට තුඩුදුන් පොත් පත් කොතරම් විශාල සංඛ්‍යාවක් පැවතිණිද යත් ඒ හේතු කොටගෙන මිනිසුන්ගේ ආගමික භක්තිය විවිධ කොටස්වලට කැඩීයාම වැළැක්වීම සඳහා යොදා ගත හැකි ඒකායන මාර්ගය ලෙස ක්‍රිස්තියානි ධර්මය පිළිබඳව ලියා ඇති සියලු ලේඛන එක්තැන් කොට අසත්‍ය යැයි සැලකෙන කොටස් ඉවත් කර විනාශ කර දැමීම බව එවකට සංවිධානය වෙමින් තිබූ ක්‍රිස්තියානි පල්ලියට පෙනී ගියේය. ප්‍රේරිත පියතුමකු (Apostolic Father) වශයෙන් පිළිගැනීමට පාත්‍ර වූ හියරාපෝලිස් (Hierapolis) නගරයේ ජීවත් වූ පැපියස් (Papias) නම් පූජකතුමා මෙම කාර්යය කිරීමට උත්සාහ කළ නමුත් විවිධ ක්‍රිස්තියානි සංගම්වලින් පැන නැගුණු විරෝධතා හේතුකොට ගෙන එම උත්සාහය අසාර්ථක විය. සිරියානු හෝ ග්‍රීක් භාෂාවෙන් ලියනු ලැබූ ශුභාරංචියේ පළමු වර්ග කිරීම ඩයටිසරන් (Diatesseron) නමින් හඳුන්වනු ලැබීය. ග්‍රීක් භාෂාවේ 'සිව් වැදෑරුම්' යන අර්ථය හැඟවීම සඳහා ඩයටිසරන් නමැති වචනය යොදනු ලැබේ. මෙම වර්ග කිරීම ක්‍රි. ව. 170 දී පමණ ටේෂියන් (Tatian) නමැති පුද්ගලයකු විසින් කරන ලදී. නමුත් ඒ සඳහා පොදු පිළිගැනීමක් ලබාගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් දෙවන ශත වර්ෂය අවසානයේදී ලියොන් නගරයේ විසූ ඉරේනියස් නැමැති බිෂොප්වරයා (Bishop Irenaeus) ඉහත සඳහන් කරණු ලැබූ ශුභාරංචියේ පොත් හතර, මුනිවරයින්ගේ නාමාවලියට ඇතුළත් කිරීමට සමත්විය. එතැන් සිට ඒ එක් එක් ශුභාරංචිය ජේසුස් වහන්සේගේ ගෝලයින් විසින් ප්‍රකාශ කරන ලද බවට පවතින විශ්වාසයේ ඇති සත්‍යතාවය තහවුරු කිරීම සඳහා යොදාගත හැකි නිර්ණායකයක් ලෙස පිළිගන්නා ලදී. ශුභාරංචියේ මෙම කොටස් හතර ලැබුණේ කවදාද? කෙසේද? කියා නිර්ණය කිරීම ඒ කාලයේදී පමණක් නොව දැනුත් දුෂ්කර වීම නිසා එවැනි උපකල්පනයකට එළඹීමේදී ගැටළු සහගත තත්වයකට මුහුණ පෑමට සිදුවේ. ඒවායේ මුල් පිටපත් හෝ මුල් පිටපත් සම්බන්ධයෙන් කලින් කරන ලද කිසිම සඳහනක් නොමැත. ඒ පිළිබඳව ආසන්න වශයෙන් හෝ දින වකවානු නියම කිරීම පවා දුෂ්කරය. මාක්ගේ ශුභාරංචිය පිළිබඳව කරන ලද පර්යේෂණ වලට අනුව එය ක්‍රි. ව. 70 පසුව් වර්ෂ කීපයකට පසුව, එනම් මැතිව් සහ ලූක්ගේ ශුභාරංචියට වඩා අවුරුදු 20 කට පෙර, ලියා ඇති බව පෙනේ. ජොහන්ගේ ශුභාරංචිය

සඳහන් කර තිබෙන්නේ ක්‍රි. ව. දෙවන ශතවර්ෂයේ ආරම්භයේදීය. ක්‍රි. ව. 30 දී පමණ ජේසුස් වහන්සේ කුරුසිය මත තබා ඇන ගැසීමේ සිද්ධියට අනතුරුව උන්වහන්සේ විසින් ඉටුකරන ලද සේවය පිළිබඳව ලියා ඇති පළමු ලිඛිත වාර්තා අතරතුරදී පරම්පරා දෙක තුනක කාලයක් ගතවී ඇත.

මතෙව් සහ ලූක් විසින් ලියා ඇති ශුභාරංචියේ පොත් වල ඇතුළත් බොහෝ කරුණු ලබාගෙන තිබෙන්නේ මාක්ගේ ශුභාරංචියෙනි. එනිසා මතෙව්, මාක් හා ලූක් ගේ ශුභාරංචිය පිළිබඳ පොත්වල බොහෝ දුරට සමානකම් දක්නට ලැබේ. ඊට අමතරව ජේසුස් වහන්සේ විසින් දේශනා කරන ලද මාක් නොදැන සිටි සමහර ධර්ම කරුණුවල එකතුවක් මතෙව් සහ ලූක්ගේ ශුභාරංචියේ පොත්වල ඇතුළත් කර තිබේ. එම ප්‍රකාශ 'දේශනා මූලාශ්‍ර' (Sayings Source) යනුවෙන් හඳුන්වනු ලැබේ. ඒ පිළිබඳව පසු අවස්ථාවකදී විස්තරාත්මකව සලකා බලනු ලැබේ. ශුභාරංචියේ මුල් පොත් තුනේ කතුවරයින් ඒවා රචනා කර තිබෙන්නේ පැහැදිලි වශයෙන් එකිනෙකට වෙනස් පරමාර්ථයන් පෙරදැරි කර ගෙන බව පෙනී යයි. මතෙව්ගේ ශුභාරංචියට අනුව ජේසුස් වහන්සේ යනු මෝසස් විසින් දේශනා කරනු ලැබූ ධර්මයේ පරිසමාප්තිය ලෙසත් අනාගත වක්තෘන් (දිවැසිවරුන්) විසින් ප්‍රකාශ කරනු ලැබූ යුදෙව් ජාතිකයන්ගේ ගැලවුම්කාරයා ලෙසත් ඉදිරිපත් කර තිබේ. ලූක් ප්‍රධාන වශයෙන් ග්‍රීක් සහ රෝමන්වරු කෙරෙහි නැඹුරුවක් දක්වා තිබෙන අතර ජේසුස් වහන්සේ යනු කිසියම් ජන කොටසක ගැලවුම්කාරයකු නොව සමස්ත මානව වර්ගයාගේම ගැලවුම්කරුවකු වශයෙන් නිරූපණය කර තිබේ. ලූක් විසින් ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ ලියා ඇති විස්තරවල උන්වහන්සේ පිළිබඳ ඓතිහාසික සිදුවීම් ඇතුළත් කර තිබුණත් ශුභාරංචියේ පොතෙහි දක්වා ඇති තොරතුරු වලින් උන්වහන්සේගේ ජීවන චරිතය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මවාගත නොහැකිය.

ශුභාරංචිය රචනා කළ කතුවරයින්ට ජේසුස් වහන්සේ පිළිබඳ පැහැදිලි චරිතාපදානයක් ලිවීමට වුවමනාවක් තිබුණත් ඒ සඳහා ඔවුන්ට තම අභිමතය පරිදි උපයෝගී කරගත හැකි විශ්වසනීය තොරතුරු තිබෙන්නට ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයක් පමණි. මුල් ක්‍රිස්තියානි ජනසමාජවල පවා එවැනි තොරතුරු නොතිබුණි. ජේසුස් වහන්සේ නැමති පුද්ගලයාගේ ඓතිහාසික චරිතය ක්‍රිස්තියානින් විසින් නොසලකා හැර තිබුණි.

ජොහාන්ගේ ශුභාරංචිය ජේසුස්වහන්සේගේ ජීවිතය පිළිබඳ අතීතයේදී ලියනු ලැබූ සියලු ආගමික වාර්තා අතුරින් ඉතා මෑතකදී

ලියන ලද විස්තරය වේ. ජොහාන්ගේ ශුභාරංචිය පිළිබඳව ක්‍රිස්තියානි ලියවිලි තුළ මුල්වරට සඳහන් වන්නේ දෙවන ශත වර්ෂයේ මැද භාගයේදීය. ඉංග්‍රීසි ජාතික ඉතිහාසඥයකු වූ ග්‍රෙන්ෆෙල් (Grenfell) විසින් සොයා ගනු ලැබූ පැරණි ග්‍රීක් පැපිරස් ලියවිල්ලකට අනුව එය ක්‍රි. ව. දෙවන ශතවර්ෂයේ මුල් කාලයේදී ලියා ඇති බව පෙනේ. ශුභාරංචිය පිළිබඳ මුල් පොත් තුනේ අන්තර්ගත කරුණු පදනම් කරගෙන ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ විශ්වසනීය තොරතුරු ඇතුළත් කරමින් ජොහාන්ගේ ශුභාරංචිය ලියා තිබේ. ජොහාන්ගේ ශුභාරංචියේ ජේසුස් වහන්සේ දක්වා ඇත්තේ ගුඪවාදී දර්ශනයක් ඉදිරිපත් කළ දේශකයකු වශයෙනි. එහි කතුවරයා ජේසුස් වහන්සේගේ ප්‍රියතම ගෝලයා වූ ජොහාන් බව ඉරේනියස් සඳහන් කර තිබේ. කෙසේ වෙතත් ගැලීලියේ වීළු සාමාන්‍ය ධීවරයෙකු වූ ජොහාන්ට දර්ශනය හෝ ග්‍රීක් භාෂාව පිළිබඳ ඉගෙන ගැනීමට අවස්ථාවක් නො ලැබීම නිසා ජොහාන් එම ශුභාරංචියේ කතුවරයා බවට කර ඇති ප්‍රකාශය පිළිගැනීමට නොහැකිය.

පාවුලුතුමන් (Paul) විසින් ලියන ලදැ'යි සැලකෙන ලියවිලි ශුභාරංචියේ පොත්වලට වඩා පැරණිය. ජේසුස් වහන්සේ පිළිබඳව ලියා ඇති මුල් ලේඛන ඊට අයත් වේ. පොහොසත් යුදෙව් පවුලකින් පැවත ආ පාවුලුතුමා සෝල් (Saul) නම් වූ තම මුල් නම 'පාවුලු' (Paul) ලෙස වෙනස් කර තම පියාගේ උපකාරයෙන් රෝමයේ පුරවැසිභාවය ලබා ගත්තේය. පරිසිවරුන්ගේ සම්ප්‍රදායට අනුව ඇතිදැඩිවුනු ඔහුට උසස් අධ්‍යාපනයක් ලැබුණි. ඔහුට ග්‍රීක් භාෂාව පිළිබඳ උසස් දැනීමක් මෙන්ම මනා පරිචයක්ද තිබුණු අතර ඔහු සාහිත්‍යය සහ දර්ශනය යන විෂයයන්ද හොඳින් හදාරා තිබුණි. වයස අවුරුදු 20 පමණ වනවිට පළමුවන ගමාලියල්* (Gamaliel) ගේ ශිෂ්‍යයකු ලෙස දේවධර්මය හැදෑරීම සඳහා ඔහු ජෙරුසලමට පිටත්ව ගියේය. ස්වීය විශ්වාස වල දැඩිලෙස එල්බගත්, පටුමත දැරූ, නීති ගරුක පුද්ගලයකු වූ හෙතෙම මුල් ක්‍රිස්තියානි නිකායිකයින් සමඟ නිර්දය ලෙස වාද කළේය. ජෙරුසලම් නගරයේ ප්‍රාකාරයෙන් ඔබ්බේ වාසය කළ ජේසුස් වහන්සේගේ අනුගාමිකයින්ට වද හිංසා පැමිණවීම සඳහා ඔහු ප්‍රධාන පූජක තුමාගෙන් විශේෂ අවසරයක් ඉල්ලා සිටීමට පවා කටයුතු කළේය. ඔහු විසින් එසේ කරන ලද්දේ යුදෙව් ආගමික ධූරාවලිය තුළ තමා පිළිබඳ යහපත් හැඟීමක් ඇතිකර ගැනීමට එමගින් අවස්ථාවක් සැලසෙන බව පෙනී ගිය හෙයිනි. කෙසේ වෙතත්, ලේඛන වල සඳහන් කර ඇති අන්දමට දෙවියන් වහන්සේ ඩැමස්කස් නගරයේ දොරටුව ඉදිරිපිටදී ඔහුට විද්‍යාමාන වීම

* යුදෙව් මන්ත්‍රණ සභාවේ සභිකයෙකුවූ සුප්‍රසිද්ධ යුදෙව් ජාතික ආචාර්ය වරයෙකි.

හේතුවෙන් ඔහු ජේසුස් වහන්සේගේ විශ්වාසවන්ත ශ්‍රාවකයකු බවට පත්වූ බව කියවේ. සමහර විට එකල මතුවෙමින් තිබූ ආගමික ව්‍යාපාරයේ ආධ්‍යාත්මික නායකයා වීමට තිබූ අවස්ථාව සැලකිල්ලට ගනිමින් ඔහු ක්‍රිස්තියානි ආගම වැළඳ ගන්නට ඇත.

පාවුලුතුමා විසින් ලියන ලද'යි සැලකෙන හසුන් පත් විශාල සංඛ්‍යාවක් (Epistles) ව්‍යාජ ලේඛන බවත්, එසේ නැතිනම් සැබෑ ලේඛන ස්වල්පයක් එක් රැස්කර ඒවාට විවිධ කරුණු එකතු කර පැලැස්තර දමා සකස් කරන ලද ලේඛන බවද ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වූ නූතන පර්යේෂකයින් විසින් අනාවරණය කර තිබේ. එපීසවරුන් (Ephesians) සහ කොලොස්සිවරුන් (Colossians) වෙත යවන ලද දෙවන හසුන් දැඩි මතභේදයට ලක්ව ඇති අතර තිමෝතියස් (Timothy), තීතස් (Titus) සහ හෙබ්‍රෙව්වරුන් (Hebrews) වෙත යවන ලද හසුන් ව්‍යාජ ඒවා බව පෙනී ගොස් තිබේ. පාවුලු තුමාගේ හසුන් පත් වලින් ඉදිරිපත් කර ඇති ආගමික ඉගැන්වීම් ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා වශයෙන් පර්යේෂකයින් විසින් හඳුනාගෙන ඇති කරුණු වලට වඩා බොහෝ දුරට වෙනස්ය. ඒ පිළිබඳව පසුව විස්තරාත්මකව සලකා බලනු ලැබේ.

ක්‍රිස්තියානිය යනුවෙන් අද අදහන ආගමේ ඇතුළත් කර තිබෙන්නේ ජේසුස් වහන්සේගේ සැබෑ දේශනාවල අන්තර්ගත ඉගැන්වීම් නොවේ. එය පාවුලු තුමා විසින් ප්‍රසිද්ධ කරන ලද දේව ධර්මයකි (Theology). එය ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ව්‍යාජ ලෙස වෙනස් කර සියල්ලෝම පව්කාරයින් බවත්, දෙවියන් වහන්සේගේ පුත්‍රයා මනුෂ්‍යයා පාපයෙන් ගලවාගැනීම පිණිස කුරුසිය මත දිවි පිදූ බවත්, විමුක්තිය සලසාගත හැක්කේ පූජකවරුන්ගෙන් සමන්විත වූ ධුරාවලිය තුළින් බවත් උගන්වන දේව ධර්මයකි. දෙවියන්ගේ පළමු දරුවා බිලිදීම සහ ඔහුගේ ශරීරය විශ්වාසවන්තයින්ට බෙදීම පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් මෙම දේව ධර්මය පදනම් වී ඇත්තේ අසල් වැසියාට ප්‍රේම කිරීමට උගන්වන ජේසුස් වහන්සේ ගේ දේශනා මත නොව සෑම පියෙක්ම තම පළමු දරුවා දෙවියන්ට බිලිදිය යුතුයැයි විශ්වාස කරනු ලැබූ පුරාණයේ මධ්‍යධරණී ප්‍රදේශවල ජීවත්වූ මිනිසුන් සහ මුල් සෙමිටික් ගෝත්‍රික ජනයා අතර පැවති ඇදහීම් සහ විශ්වාස මතය.

එඩුවර්ඩ් ග්‍රිම් (Eduard Grimm) නමැති දේව ධර්මවේදියා මෙසේ කියා තිබේ: 'ක්‍රිස්තු භක්තිකයින් තුළ මෙකී ඉගැන්වීම් කෙතරම් ගැඹුරට කාවැදී තිබුණත් ඉන් පලක් නැත. සැබෑ ජේසුස් වහන්සේ ඒ පිළිබඳව කිසිවක් දැන සිටියේ නැත.'[1] විල්හෙල්ම් නෙස්ලේ (Wihelm Nestle) නැමති ආගමික ඉතිහාසඥයා එම අදහස පහත දැක්වෙන පරිදි වෙනත් වචන

වලින් ප්‍රකාශකර තිබේ: "ක්‍රිස්තියානිය යනු ශාන්ත පාවුලුතුමන් විසින් පිහිටුවනු ලැබූ ආගමකි. එමගින් ජේසුස් වහන්සේගේ ධර්මය වෙනුවට ජේසුස් වහන්සේ පිළිබඳ ධර්මයක් ඉදිරිපත් කර ඇත."[2] එනිසා එය පාවුලු තුමාගේ ආගම වශයෙන් හැඳින්වීම වඩා යෝග්‍යය. මෙසේ පාවුලු තුමාගේ ආගම යනු ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම් වැරදි ලෙස අර්ථ නිරූපණය කිරීමක් සහ ව්‍යාජ ලෙස යොදාගැනීමකි. නූතන දේව ධර්මවේදී පර්යේෂණ මගින් ද ඒ බව පිළිගෙන තිබේ: ක්‍රිස්තියානියේ දක්නට ලැබෙන සෑම සුන්දර අංගයක්ම ජේසුස් වහන්සේගේය. අසුන්දර වූ සියලුම දේ පාවුලු තුමාගේය."[3]

ක්‍රිස්තියානි ආගමට සම්බන්ධ අනෙකුත් ප්‍රසිද්ධ චරිත පිළිබඳ තොරතුරු මුල් කාලයේ පටන් දින වකවානු සහිතව සවිස්තරව ඉදිරිපත් කර තිබුණත් ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් පවතින්නේ එතරම් වැදගත් නොවූ ඉතා විරල ලෙස සඳහන් කරන ලද වාක්‍ය කීපයක් පමණි. නව තෙස්තමේන්තුව පිළිබඳව ශාස්ත්‍රීය පර්යේෂණ කළ විශේෂඥයකු වූ අර්න්ස්ට් කේස්මාන් (Ernst Kasemann) විසින් ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ කරනු ලැබූ පර්යේෂණ වලින් සොයාගත් කරුණු නිහතමානීව පහත දැක්වෙන පරිදි සම්පිණ්ඩනය කර දක්වා ඇත: "කන්ද උඩ දේශනාවේ වචන ස්වල්පයක්, ජේසුස් වහන්සේ සහ පරිසිවරුන් අතර ඇතිවන මතභේදය, උපදේශ කථා කීපයක් සහ විසිරී පවත්නා වෙනත් කරුණු කීපයක් ඓතිහාසික වශයෙන් ජීවත් වූ ජේසුස් වහන්සේට අයත් බව විශ්වාස කළ හැකිය."[4] මේ සම්බන්ධයෙන් විචාරාත්මකව කරුණු පරීක්ෂාකර බැලූ රුඩොල්ෆ් බුල්ට්මාන් (Rudolf Bultmann) නමැති දේව ධර්ම වේදියාගේ නිගමනය නම් ජේසුස් වහන්සේගේ පෞර්ෂය සහ ජීවිතය පිළිබඳව පැහැදිලි චිත්‍රයක් මවා ගැනීමට අපට තවදුරටත් නොහැකි බවය.

එසේ නම් අප කුමක් කළයුතුද? ඉතිහාසයේ අඳුරින් වැසී ඇති ඓතිහාසික වශයෙන් ජීවත් වූ ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ අප්‍රකට තොරතුරු මතු කර ගැනීම පිළිබඳ බලාපොරොත්තු අත්හැර දැමිය යුතුද? එවැන්නක් කිරීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැත. මෑත දශක වලදී පොත් පත් වල පෙළ පිළිබඳ හෙවත් සන්දර්භ විශයික විග්‍රහ කිරීම් (Textual Analysis) සහ පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් ක්ෂේත්‍රවල බොහෝ නව සොයා ගැනීම් කර තිබේ. අපට එම සොයා ගැනීම් කේස්මාන් විසින් දුක්මුසු ස්වරයකින් යුතුව ප්‍රකාශ කරන ලද "ජේසුස් වහන්සේ සම්බන්ධ විසිර ඇති වෙනත් බොහෝ කරුණු" සමග සම්බන්ධ කළ හැකිවේ. ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා කීපය සහ උන්වහන්සේ තුළ පැවති තීක්ෂණ බුද්ධිය, ජේසුස් වහන්සේ සම්බන්ධව මුල් යුගයේ

පැවති සමත් විද්‍යාත්මක ලක්ෂණ සමග ඒකරාශි කර ඒවා එකිනෙකට ගැළපීමෙන් පැහැදිලි චිත්‍රයක් නිර්මාණය කළහැකි වන පරිදි බද්ධ කිරීමට හැකිවනු ඇත. නමුත් එම චිත්‍රය පාවුලු තුමාගේ ආගම වූ ක්‍රිස්තියානි පල්ලිය මගින් දැනට අවුරුදු දෙදහසක් පමණ කාලයක් තිස්සේ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ලෙස ඉදිරිපත් කරන ලද චිත්‍රය සමග කිසි ලෙසකින් නොගැළපෙනු ඇත. ජේසුස් වහන්සේ විසින් දේශනා කරන ලද සැබෑ වචන කියවන ඕනෑම කෙනෙකුට සියල්ලෝම පව්කාරයින්ය, පව්කැපීම සඳහා මරණයට පත්වීම සහ මළවුන්ගෙන් උත්ථානවීම පිළිබඳ කිසිවක් හමුනොවනු ඇත. ඒ වෙනුවට තම අසල්වැසියාට ප්‍රේම කිරීම සහ ස්වර්ග රාජ්‍යය නිර්මාණය කිරීම පිළිබඳ බොහෝ දේ දැන ගැනීමට හැකි වනු ඇත. ඈත අතීතයේදී පෙරදිග පැවති ඥානාලෝකය පිළිබඳ කිසියම් දැනීමක් ඇති ඕනෑම කෙනෙකුට ජේසුස් වහන්සේ ඉපදීමට අවුරුදු 500 කට පමණ පෙර ඉන්දියාවේ ගංගා නම් ගං නිම්නය ආශ්‍රිත ප්‍රදේශවල සැරිසරමින් මීට සමාන පණිවිඩයක් ලෝකයට ප්‍රකාශ කළ සිද්ධාර්ථ ගෞතම නොහොත් ගෞතම බුදුන් වහන්සේ නම් වූ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු ජීවත්වූ බව දැනගැනීමට හැකිවනු ඇත.

ගෞතම බුදුන්වහන්සේ

ඈත අතීතයේ පටන් ඉන්දියානු ආගමික චින්තනය අනේක විධ දේවතා සහ අති මහත් දේව සමූහයක් පිළිබඳ පැවති විශ්වාස මගින් හැඩගැස්වනු ලැබීය. වෛදික ආගමේ මුල් අවස්ථාවේදී බ්‍රාහ්මණයින්ට ආගම සම්බන්ධයෙන් එතරම් විශේෂවූ අධිකාරී බලයක් නොතිබුණි. මූලික වශයෙන් ඔවුන්ට පැවරී තිබූ කාර්යය වූයේ වේද ස්තෝත්‍ර ගායනා කිරීම පමණි. එහෙත් කල් යාමේදී බ්‍රාහ්මණ වංශිකයින් අයත්වූ පූජක පක්ෂයට ආගම කෙරෙහි විශාල බලපෑමක් කළ හැකි විය. ජීවිතයේ සතුට, දරු සම්පත්, කීර්තිය සහ ධනය ලබා ගත හැක්කේ දෙවියන් සමග නිවැරදි ආකාරයෙන් සහවාසතාවයක් පවත්වා ගැනීමෙන් පමණක්ය යන අදහස මිනිසුන් තුළ වර්ධනය කරමින් ඔවුහු අඳුරු ආධ්‍යාත්මික උරුමයක ආරක්ෂකයින් සේ පෙනී සිටියහ. දෙවියන් සමග කිට්ටු සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට කටයුතු කළ හැක්කේ බ්‍රාහ්මණයින්ට පමණක් බවත් ඔවුන්ට එසේ කිරීමට හැකිවී තිබෙන්නේ දෙවියන් උදෙසා වේද ස්තෝත්‍ර ගායනය, යාග හෝම පැවැත්වීම සහ පුද පූජා පැවැත්වීම පිළිබඳ නිවැරදි ක්‍රියා පරිපාටිය පිළිබඳ ඔවුන් තුළ තිබූ දැනීම නිසා බව

සාමාන්‍ය පිළිගැනීම විය. ඔවුන් විසින් අනුදත් පුද පූජා පැවැත්වීමෙන් මිස විමුක්තිය ලබාගත හැකි වෙනත් ක්‍රියා මාර්ගයක් නොමැති බව ඔවුහු තරයේ ප්‍රකාශ කළහ. එපමණක් නොව මිනිසුන් අතර පැවති වෘක්ෂ, කඳු, ගංගා ආදිය වන්දනා කිරීම සහ ඇතිවෙමින් නැතිවෙමින් කෙළවරක් නැතිව දිව යන සංසාර චක්‍රය තුළ පවතින පූජනීයත්වය පිළිබඳ විශ්වාස ඔවුහු තම පුද පූජා සහ වන්දනා කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් කළහ. ක්‍රි. පූ. 6 වන ශතවර්ෂයේදී පැරණි ගෝත්‍රික ජන සමාජ අභාවයට ගොස් ඒ වෙනුවට ප්‍රදේශ රාජ්‍ය සහ සමූහාණ්ඩු බිහිවිය. ඒ සමගම පෙර නොවූ විරූ පරිදි සෞභාග්‍යයෙන් ආඪ්‍ය ජනතාවකගෙන් සමන්විත වූ නගර බිහිවිය. මිනිස්සු ආගම සම්බන්ධයෙන් මෙතෙක් පැවති වෛදික මත සහ බ්‍රාහ්මණයින්ගේ අදහස් පිළිබඳව ප්‍රශ්න කිරීමට පටන් ගත්හ. ඒ වන විට බ්‍රාහ්මණ වංශිකයින් විසින් අත්කර ගෙන තිබූ බලය සහ ඔවුන් ගේ පාලනය පිළිබඳ පුළුල් ලෙස පැතිර ගිය දැඩි අප්‍රසන්නබවක් ජනතාව තුළ ඇතිවන්නට පටන් ගත්තේය.

මේ වෙනස්වීම් හේතු කොට ගෙන බොහෝ දෙනෙක් විවිධ කරුණු පිළිබඳ ගැඹුරින් කල්පනා කිරීමට පටන් ගත්හ. ඔවුන්ගේ සිතිවිලි විශ්මය ජනක ලෙස නූතන අදහස් හා ගැලපුණි. අලුත් නාගරික සංස්කෘතියක් බිහිවීම නිසා ලැබුණු ධනය නිසා ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ ජීවිත පෙර පැවති මට්ටමට වඩා උසස් තත්වයකට පත්විණිද? ජීවිතයේ සතුට ලබාගත හැකි සැබෑ මාර්ගය ඇත්ත වශයෙන්ම වැටී ඇත්තේ දෙවියන් උදෙසා පවත්වන අභිචාර පූජා විධි සහ පිළිපූජා පැවැත්වීම තුළද? ප්‍රඥාව (Wisdom) සහ ප්‍රතිවේධය (Insight) ලබාගත හැක්කේ වේද ග්‍රන්ථ කියවීමේ වරප්‍රසාදය ලැබූ බ්‍රාහ්මණ වංශයේ උපන් පුද්ගලයින්ට පමණක්ද? බොහෝ දෙනෙකුට, විශේෂයෙන්ම පහත් කුල වලට අයත් යයි සැලකෙන පුද්ගලයින්ට හෝ කිසියම් කුලයකට අයත් නොවූ සාමාන්‍ය ජනතාවට මෙලොවදී තමන්ගේ සමාජ තත්වය උසස් කර ගැනීමට කිසිසේත් බලාපොරොත්තු විය නොහැකි විය. එපමණක් නොව මරණින් පසු අනාගත භවයක් පිළිබඳව පවතින සැකසිලිදායක විශ්වාසය සහ පූජකයින් විසින් පවත්වනු ලබන කෙළවරක් නැති පුද පූජා මගින් ද ඔවුන්ට කිසියම් ආකාරයක සැබෑ බලාපොරොත්තුවක් ඇතිකර ගැනීමට අවස්ථාවක් නොලැබුණි. දෙවියන් සොයා ගිය පුද්ගලයින් ශත වර්ෂ ගණනාවක් තිස්සේ ගංගා නම් ගං ඉවුරේ ජීවත්ව සිටියහ. මේ කාලය වන විට ඔවුන්ගේ සංඛ්‍යාව පැහැදිලි ලෙස වැඩි වන්නට පටන් ගත්තේය. වචනයෙන් විස්තර කළ නොහැකි තරමට වික්ෂිප්ත තත්වයක පසු වූ ඔවුහු බ්‍රාහ්මණයින් සහ ඔවුන්ගේ ආශ්‍රම නොසලකා හැර තනියම ආධ්‍යාත්මික විමුක්තිය සොයා යාමට පටන්

ගත්හ. ලෞකික ජීවිතයෙන් ලබාගත හැකි ප්‍රයෝජනයක් නොමැති බව බොහෝ දෙනෙකුගේ විශ්වාසය විය. එනිසා ඔවුහු දුකින් පිරුණු ජීවිතය දෙස උපේක්ෂා සහගතව බැලීමටත්, ලෞකික පැවැත්ම ජයගැනීම සඳහා තවුස් ජීවිත පත කිරීමටත් පුරුදු වූහ. ඔවුන්ගේ ඒකායන පරමාර්ථය මූලේ ශරීරය තුළ සිරවී තිබෙන ආත්මය නැමති ජීවයේ ප්‍රකෘතියට විමුක්තිය ලබාදීමය. ඒ සඳහා අවශ්‍යයෙන්ම ගිහි ගෙය අත්හැරිය යුතු බව බොහෝ දෙනෙක් විශ්වාස කළහ. ආධ්‍යාත්මික පූර්ණත්වය ලබාගැනීම සඳහා යන්නාවූ දීර්ඝවූත්, දුෂ්කරවූත් මේ ගමනට කිසිම මිනිස් සම්බන්ධතාවයක් විසින් බාධා නොකළ යුතුය. තමන් විසින් කරනු ලබන කිසිම ක්‍රියාවක් හෝ ප්‍රාණඝාත කිරීම නිසා සිදුවන අකුසල් වලින් සිත් අසහනයට පත්කර නොගැනීමට හැකිවන පරිදි අකුසල් ක්‍රියාවලින් වැළකී සිටීමට ඔවුහු තරයේ අධිෂ්ඨාන කර ගත්හ. මෙසේ ගිහි සැප අතහැර දමා හුදකලා ස්ථානයකට වී සාගින්න, පිපාසය, ඇවි උණුසුම සහ සීතල, ආශාවන් සහ තෘෂ්ණාව සමඟ උදාසීනව සටන් කරමින් සම්මත ව්‍යවහාරයේ යථාර්ථය ලෙස හඳුන්වන මහා මායාව (Great Illusion) ජයගැනීම සඳහා භාවනානුයෝගීව සිත් යොමුකළහ.

මෙසේ සාම්ප්‍රදායික ආගමික විශ්වාස වලින් බැහැරවී විවිධ විමුක්ති මාර්ග අනුගමනය කළාවූ කොටස් (Religious drop-outs) එනම් දෛවවාදීන්* (Fatalists), භෞතික වාදීන් (Materialists), දේවවේදීන් (theists), සර්වේශ්වරවාදීන් (Panthiests)** ගංගානම් ගං නිම්නය පුරා දක්නට ලැබුණි. ඔවුන්ගෙන් සමහරෙක් සිත අරමුණු කිරීම (ධාරණ), භාවනා කිරීම (ධ්‍යාන) සහ කිසියම් අරමුණක දැහැන්ගතවීම (සමාධි) වැනි භාවනා ක්‍රම පුහුණු කළහ. භාවනාක්‍රම තුළින් ලබාගත හැකියයි විශ්වාස කරනු ලැබූ ධ්‍යාන බල (Magical Powers) ලබා ගැනීම ඔවුන්ගේ පරමාර්ථය විය. පූර්වේනිවාසානුස්මෘතිය*** පරචිත්ත විජානනය**** සාගින්න සහ පිපාසය නැති කිරීම, අනාගතයේදී සිදුවන දේ පිළිබඳව දැනගැනීම, කෙනෙක් නොපෙනී සිටීමට සැලැස්වීම හෝ පුද්ගලයකුගේ විඥානය ශරීරයෙන් ඉවත්කර වෙනත් ශරීරයකට ගමන් කිරීමට සැලැස්වීම, ඇතැමුට සමාන ශක්තියක් ලබා ගැනීම, විශ්ව නියමය, ලෝක නිර්මාණයේ පූර්ණත්වය (Wholeness of Creation) එම ශක්ති වලින් සමහරෙකි.

විවිධ තරාතිරමේ පුද්ගලයින්ගෙන් සමන්විත වූ මෙම උද්යෝගීමත්

* දෛවය වැලැක්විය නොහැකිය යන විශ්වාසය

** ලෝකයත් දෙවියන් වහන්සේත් එකම යන මතය

*** පෙර විසූ කඳ පිළිවෙල පිළිබඳ දැනීම

**** වෙනත් පුද්ගලයින්ගේ සිතිවිලි සහ අදහස් දැනගැනීමට හැකි ඥානය

ආධ්‍යාත්මික ගවේෂකයින් සහ විමුක්තිය සොයා ගිය පිරිසට ශාක්‍ය ජනපදයේ රජ පෙලපතින් පැවත ආ සිදුහත් කුමාරයා ද ඇතුළත් විය. "ශාක්‍ය වංශයේ ප්‍රාඥයා" යන අර්ථය දෙන "ශාක්‍යමුනි" යන නමින්ද එතුමා හඳුන්වනු ලැබිය. එකල ගණනය කළ නොහැකි තරම් සංඛ්‍යාවක් වූ බොහෝ දෙනෙක් විසින් කළ පරිදි සිදුහත් කුමරාද ගිහිගෙය අතහැර මිනිසාගේ පැවැත්ම (භවය) පිළිබඳ මූලික ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට පටන් ගත්තේය.

වර්තමාන නේපාලය යනුවෙන් හැඳින්වෙන රටේ පිහිටි කුඩා ගෝත්‍රික රාජධානියක සිට සිදුහත් කුමාරයා මගධ දේශයට (වර්තමාන ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තය) පැමිණියේය. ජනප්‍රවාදයේ එන ඉක්ෂ්වාකු රජතුමාගේ පරපුරට අයත් වූ ශුද්ධෝදන රජතුමා මෙතුමාගේ පියා විය. ශුද්ධෝදන රජතුමාගේ බිසව - මායා දේවිය - දරු ප්‍රසූතිය සඳහා කාලය සම්පූර්ණ වූ විට එකල පැවති චාරිත්‍රානුකූලව සිය මාපියන්ගේ නිවසට යාම පිණිස තම සහෝදරිය සමඟ දෝලාවක නැගී පිටත්වූවාය. අතරමගදී කපිලවස්තු නුවරට ආසන්නයේ පිහිටි මලින් ගැවසී ගත් ලුම්බිනි සල් උයන දැකීමෙන් උද්දාමයට පත් දේවිය සුළු විවේකයක් සඳහා එතැන මඳක් නතර වූවාය. එහිදී ඇයට විලිරුදා ඇතිවිය. සල් අත්තක් සිය අතින් අල්ලා ගෙන සිටියදී ඇය (මායා දේවිය) දරුවකු ප්‍රසූත කළාය. මෙය සිදුවූයේ ක්‍රි. පූ. 563 වර්ෂයේදී යැයි සඳහන් වේ.[5]

දරු ප්‍රසූතියෙන් දින කීපයක් ඇවෑමෙන් මායා දේවිය මිය ගියාය. අනතුරුව ඇගේ සොහොයුරියක වූ මහා ප්‍රජාපතී ගෝතමී ළදරු සිද්ධාර්ථ කුමරුවා රැක බලා ගත්තාය. තම පුතා එක්කෝ චක්‍රවර්තී රජෙකු හෝ එසේ නැතිනම් ගිහිගෙය අතහැර ගොස් සකල ලෝක සත්වයා දුකින් මුදවා ගැනීම පිණිස කටයුතු කරන ගැලවුම් කාරයකු වන බවට අනාවැකියක් පළකර තිබීම නිසා ශුද්ධෝදන රජතුමා තම පුතා බාහිර ලෝකයෙන් වෙන්කර සියලු සැප සම්පත් මධ්‍යයේ මාලිගාව තුළම වැඩෙන්නට සැලැස්විය. කුමරුවාගේ සිත ආගමික ප්‍රශ්න කෙරෙහි යොමුවීම වැළැක්වීම සඳහා 'දුක' පිළිබඳ හැඟීමක් ඇතිවිය හැකි කිසිවක් ඔහුගේ ඇස නොගැටෙන ලෙස මුරකාවල් යොදන ලදී. බරණැස් නුවරින් ගෙන ආ සඳුන් තෙල් ගල්වා වටිනා දුහුල් සළුවලින් ඔහුගේ ශරීරය සරසන ලදී. දිවා රාත්‍රී දෙකේම සේවකයකු විසින් ඔහුගේ හිසට උඩින් ශ්වේතවර්ණ ඡත්‍රයක් ඔසවන ලදී. තම අභිමතය පරිදි ග්‍රීෂ්ම, ශීත සහ වර්ෂා සෘතුවලදී පාවිච්චි කිරීම සඳහා ඔහුට ප්‍රාසාද තුනක් තිබුණි. මාලිගය තුළ රැඳී සිටි කාලය තුළදී කාන්තාවන් විසින් වාදනය කරනලද මිහිරි සංගීතයෙන් කුමරුවා පිනවීමට කටයුතු සලසන ලදී. සිදුහත් කුමරු තම නෑනා වූ යශෝධරා ගෝපා කුමරිය සමඟ ලා බාල වියේදීම විවාහ

දිවියට ඇතුළත් විය. ඔහුට සුන්දර කාන්තාවන්ගෙන් පිරිගිය අන්තඃපුරයක්ද තිබුණි. මේ කිසිවක් ඔහු තුළ සතුටක් ඇති කිරීමට සමත් වූයේ නැත. සියලු සැප සම්පත් වලින් ආඪ්‍ය වූ නමුත් ප්‍රාර්ථනාවන්ගෙන් තොරවූ ජීවිතයකින් ඔහුට සතුටක් නොලැබුණි. ඒ වෙනුවට සෑම සුන්දර දෙයකම සහ සියලු සැප සම්පත්වල පවතින අනිත්‍ය ස්වභාවය ඔහුට නිතර කල්පනා වන්නට පටන් ගත්තේය. මාලිගාවෙන් පිටතට ගිය අවස්ථා හතරකදී ඔහුට පිළිවෙළින් සිව් දිනක් තුළ වයෝවෘද්ධ මිනිසෙක්, රෝගී පුද්ගලයෙක්, මළමිනියක් සහ පැවිද්දෙකු මුන ගැසුණු බව ජනප්‍රවාදයේ සඳහන් වේ. වයසට යෑමෙන් ලෙඩදුක් වැළඳීමෙන් සහ අවසානයේදී මරණයට පත්වීමෙන් තොරවූ කිසියම් වෙනස් නොවන සත්වයක් පැවතිය හැකිද යන ප්‍රශ්නය කුමරුවාගේ සිත තුළ පහළවිය. සිව්වන දිනයේ පෙරළා මාලිගයට පැමිණීමේදී තම අගමෙහෙසියවූ යශෝධරා දේවිය පුතෙකු බිහිකළ බව (රාහුල කුමරු) ඔහුට දැනගන්නට ලැබුණි. එහෙත් ලෞකික වූ සියලු සුන්දර දේ අත්හැර යාම සඳහා ගෙන තිබූ තීරණය වෙනස් කිරීමට කුමරුට නොහැකිවිය. පුතෙකු බිහිවීම නිසා ඇතිවන බැඳීම පවා එම තීරණය වෙනස් කිරීමට සමත් නොවීය. මෙසේ සිදුහත් කුමරු විසිනව වැනි වියේදී තම පියා, දේවිය සහ දරුවාද ඇතුළු සියලු සැප සම්පත් අතහැර දමා කිසිවෙකුට නොදන්වා රහසේම මාලිගයෙන් පිටව ගියේය. ඔහු ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට ඇතුළත් විය. පසු කාලයේදී බුදුන් වහන්සේ අනුව යමින් පැවිදි ජීවිතයට ඇතුල් වූ සියලු දෙනාටම සරණ වූ මුල්ගල හෙවත් පළමු තීරණය වූයේ සිදුහත් කුමරු මෙසේ ගිහි ගෙයින් නික්මීමයි. තම රථාචාර්යයා වූ ඡන්න ඇමති සමඟ නික්මුණු සිදුහත් කුමරු රාජධානි තුනක් පසුකර අනෝමා ගං තීරය වෙත පැමිණ පැළඳ සිටි සියලු රජ ඇඳුම් සහ ආභරණ ඉවතලා කෙස් රැවුල් කපා කහවත් හැඳ පොරවා පා ගමනින් පිටත්ව ගියේය.

සිද්ධාර්ථ ගෞතමයින්ද ගංගා නම් ගං නිම්නයේ පිටිසර බද ප්‍රදේශවල විමුක්තිය සොයමින් සැරි සැරූ බොහෝ දෙනෙකුන් අතරින් කෙනෙක් විය. පළමුවෙන්ම ඔහුට ආලාර කාලාම නම් වූ ගුරුවරයකු හමුවිය. ඔහුගේ ධර්මය ඉගෙන ගත් පසු තවත් ඉගෙනීමට දෙයක් ඉතිරිව නොමැති බව සිදුහත් තවුසාට පෙනී ගියේය. ඔහුගේ දෙවන ගුරුවරයා වූ උද්දක රාමපුත්තද සිදුහත් තවුසා තමා වෙත වැඩි කලක් රඳවා ගැනීමට නොහැකිවිය. එකල විසූ සුප්‍රසිද්ධ දාර්ශනිකයින් දෙදෙනෙකු වූ මෙම තවුසන් දෙදෙනාම උත්සාහ කළේ ආකිඤ්චඤ්ඤායතනය සහ නේවසඤ්ඤානාසඤ්ඤායතනය නම් වූ රූප සහ සිතිවිලි වලින් තොරවූ අරූපධ්‍යාන උපදවා ගැනීමටය. එකී ධ්‍යාන උපදවා ගැනීම තුළ තමා

සොයායන සත්‍යයේ කිසියම් ප්‍රකාශනයක් තිබෙන නමුත් පරම සත්‍යය එය නොවන බව සිද්ධාර්ථ ගෞතමයන්ට පෙනී ගියේය. එමගින් සත්වයාගේ නැවත ඉපදීම හෙවත් භවය නැතිකළ නොහැකිය. ඒ නිසා සත්වයා දුකට හෙළන නැවත ඉපදීම තවදුරටත් සිදුවන බව එතුමාට අවබෝධ විය. කෙසේවෙතත්, තමා සොයාගියේ සසර දුක් කෙළවර කිරීමට හේතුවන පුද්ගලයාගේ නැවත නැවත ඉපදීම සහ මරණයට පත්වීම වළක්වන නිවන් මාර්ගය නිසා හේ එතැන් සිට තනිවම සත්‍යය සෙවීමට තීරණය කොට එතැනින් හුදකලාවම පිටත්ව ගියේය.

සත්‍යය සොයමින් සිදුහත් තවුසා බොහෝ කාලයක් ඇවිද්දේය. එසේ ගමන් කිරීමේදී උන්වහන්සේ එකල විසූ ප්‍රසිද්ධ ගුරුවරු, යෝගීන් සහ දාර්ශනිකයින් වෙත ගියහ. අවසානයේදී තම හිතවතුන් පස් දෙනෙකු සමඟ අද බුද්ධගයාව නමින් හැඳින්වෙන නේරංජනා ගං ඉවුරේ පිහිටි උරුවෙල් දනව්වට පැමිණියේය. එතැන් සිට පුරා අවුරුදු හයක් ශරීරයට දැඩි දුක් දෙමින් දුෂ්කර ක්‍රියා කරමින් උග්‍ර තපස් රැක්කේය. දීර්ඝ කාලයක් නිරාහාරව සිටීම නිසා උන්වහන්සේගේ ශරීරය කෙට්ටු වී ඇස් ගිලී ගියේය. ඉළ ඇට මතුවිය. මේ අවස්ථාවේදී තමා කුඩා කාලයේදී වප් මඟුල් උත්සව දින දඹ රුකක් සෙවණෙහි වාඩි වී ධ්‍යානයට සමවැදී ආනාපාන සතිය වඩමින් ප්‍රථම ධ්‍යානය වැඩූ අයුරු ඔහුට සිහිපත් විය.

සිදුහත් තවුසා ගඟ අසබඩ වාඩිවී සිටින විට අසල පිහිටි නියං ගමක අධිපතියාගේ දියණිය වූ සුජාතාව විසින් උන්වහන්සේට කිරි පිඬු පාත්‍රයක් පිළිගන්වනු ලැබීය. උන්වහන්සේ එය පිළිගත්සේක. සත්‍යය අවබෝධකර ගත හැක්කේ ශරීරයට දුක් දීමෙන් හා උග්‍ර තපස් ව්‍රත රැකීමෙන් නොවන බවත් සත්‍යාවබෝධය යනු ආධ්‍යාත්මය හා සම්බන්ධ කරුණක් බවත් උන්වහන්සේට අවබෝධ විය. එම අවබෝධය තරයේ සිහි තබාගෙන සිදුහත් තවුසා ගඟ තරණය කර එහා ඉවුරට ගොස් ඇසටු රුකක් වෙත ළඟාවිය. සත්‍යය අවබෝධ කර ගෙන මිස මෙතනින් නැවත නොනැගිටිමි'යි යන දැඩි අධිෂ්ඨානය පෙරදැරි කරගෙන එම ඇසටු රුක පාමුල හිඳ ගත්තේය.

"සත්‍යය අසන, සත්‍යය දකින, ඒ පිළිබඳව නුවණැසින් බලන්නාහට නිර්වාණ සංඛ්‍යාත උපධි විවේකය සුවයෙකි. මෙලොව කිසිම ප්‍රාණියෙකුට හිංසා නොකිරීම සුවයෙකි. ලෝකයෙහි පහවූ රාග ඇති බවද කාමයන් ඉක්මවා යාම ද සුවයෙකි. මම වෙමි'යි යන මානයාගේ (අස්මිමානය) නැති කිරීම ඒකාන්තයෙන් පරම සුවයෙකි." යන මේ සත්‍යය මේ කාලය තුළදී සිද්ධාර්ථ ගෞතමයින්ට අවබෝධ විය.

සත් සතිය ආරම්භයේ වෙසක් පුන් පොහෝ දින සිද්ධාර්ථ

ශාක්‍යමුනියෝ පරම සත්‍යය අවබෝධ කළහ. සියලු සංස්කාරයන්ගේ පහළවීම, සසර පැවැත්ම සහ පුද්ගලයාගේ ඉපදීමට හේතු වූ කරුණු අවබෝධ කරගෙන අනුත්තර සම්‍යක් සම්බෝධියට හෙවත් බුද්ධත්වයට පත්විය. යාම තුනක් ඇතුළතදී උන්වහන්සේ පෙර විසූ කඳ පිළිවෙළ දැකිය හැකි පූර්වෙනිවාසානුස්මෘති ඥානයත්, සත්වයන්ගේ චුති උත්පත්ති පිළිබඳව පැහැදිලිව දැකිය හැකි චුතූපපාත ඥානයත් උපදවා ගත්හ. උන්වහන්සේ චතුරාර්ය සත්‍යය අවබෝධකර කාම තණ්හා, භව තණ්හා සහ විභව තණ්හා යනුවෙන් හැඳින්වෙන භවයට හේතු වූ මූලික අකුසල් තුන ප්‍රහීණ කළහ.

බුද්ධත්වයට පත්වීමෙන් පසු උන්වහන්සේ අර්හත් ඵල සමාපත්තියට සමවැදී විමුක්ති සුව විඳිමින් පුරා සතියක් බෝමැඩ මුල එක පලඟින් විසූ සේක (රූපරාමුව 1). සිදුහත් තවුසා විසින් දරණු ලැබූ සියලු උත්සාහයන්හි සඵල භාවය හෝ නිෂ්ඵල භාවය තීරණය වන්නේ බුද්ධත්වයට පත්වීමෙන් පසු එහා එළඹෙන කාලය තුළදී සිදුවන කරුණු හේතුකොටගෙන වීම නිසා මේ අවස්ථාවේදී මාරයා උන්වහන්සේ පෙළඹවීමට උත්සාහ කළ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. පෞද්ගලිකව තමා ලැබූ විමුක්තිය (පච්චේක බුද්ධ) පිළිබඳව උන්වහන්සේ සෑහීමට පත්වූහ. මුල්දී තමා අවබෝධ කරගත් සත්‍යය දේශනා කිරීමට හෝ ශාස්තෘවරයකු වශයෙන් ක්‍රියා කිරීමේ අදහසක් උන්වහන්සේ තුළ නොවීය. කෙසේ වෙතත්, බුද්ධත්වය ලබාගැනීමෙන් පසු කළ යුත්තේ කුමක්දැයි කල්පනා කරමින් සිටියදී සහම්පතී බ්‍රහ්මයා උන්වහන්සේ වෙත එළඹ අවබෝධකරගත් සත්‍යය තමන්ට පමණක් සීමාකොට නොතබා එය වටහා ගැනීමට ශක්තිය ඇති පුද්ගලයින්ගේ යහපත පිණිස දේශනා කරන ලෙස ආරාධනා කළහ. සත්‍යය දේශනා කිරීම නිසා තමන්ට ඇතිවිය හැකි අනතුර තේරුම්ගත් මාරයා අප්‍රමාදීව පිරිනිවන් පෑමෙන් ලබාගත හැකි විමුක්ති සුවය පිළිබඳ වර්ණනා කරමින් උන්වහන්සේ රැවටීමට උත්සාහ කළේය. නමුත් බුදුන්වහන්සේ තමා විසින් පසක් කරගත් සදාතනික සත්‍යය එය ඇසීමට කැමති ලෝ වැසියන්ගේ යහපත පිණිස දේශනා කිරීමට තීරණය කර බෝමැඩ මුලින් නැගී සිටියහ. මෙසේ උන්වහන්සේ සියල්ල දත් හෙවත් සම්මා සම්බුද්ධ නම් වූහ.

උන්වහන්සේ බුද්ධගයාවේ සිට බරණැස ඉසිපතනයෙහි පිහිටි මිගදායට වැඩියහ. බුදුවීමට ප්‍රථම ශරීරයට දුක් දෙමින් උග්‍ර තපස් රැකීම නවතා දැමීම නිසා කලකට පෙර තමා අතහැර ගිය පස්වග මහණුන් එහිදී උන්වහන්සේට හමුවිය. එහිදී උන්වහන්සේ ධම්ම චක්කප්පවත්තන සූත්‍රය නම්වූ සුප්‍රසිද්ධ ඓතිහාසික බරණැස් ධර්ම දේශනාව පැවැත්වීමෙන් පසු පස්වග මහණුන් උන්වහන්සේගේ පළමු ශ්‍රාවකයින්

බවට පත්විය. මෙසේ ධර්මය ප්‍රචාරය කිරීම සඳහා පළමු අඩිතාලම වැටිණ (රූප රාමුව 2). බුදුන් වහන්සේ තම මුල් ශ්‍රාවකයින් පස් නමට මෙසේ උපදෙස් දුන්හ: "මහණෙනි, විමුක්තිය සොයා යන කිසිවකු විසින් (පැවිද්දකු) නොසෙවිය යුතු අන්ත දෙකක් තිබේ. ඒ කවර නම් අන්ත දෙකක්ද? එක් අතකින් හීන වූත්, ග්‍රාම්‍ය වූත්, පුහුදුන් ගතියක් වූත්, උතුම් නොවූත්, අවැඩදායක වූත් යම් මේ කාමයන්හි ඇලී ගැලීමක් වේද (කාමසුඛල්ලිකානුයෝගෝ), අනෙක් අතින් දුක් වූත්, උතුම් නොවූත්, අවැඩ පිණිස පවත්නාවූත් ශරීරයට වුවමනා නැති වෙහෙස දීමෙහි යෙදේද (අත්තකිලමථානුයොගෝ) යන මේ අන්ත දෙකය. මහණෙනි, මේ අන්ත දෙකට නොපැමිණි තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදා මාර්ගය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය. මහණෙනි, එකී මධ්‍යම ප්‍රතිපදාව මගින් නුවණැස ඇති කරන්නීය, ඥානය පහළ කරන්නීය, කෙලෙස් නසනු පිණිස සත්‍යය අවබෝධය පිණිස සම්බෝධිය - නිවන - පිණිස හේතුවන්නේය."

තමන් වහන්සේ විසින් උරුවෙල් දනව්වේදී අවබෝධකර ගත් චතුරාර්ය සත්‍යය පිළිබඳ වැටහීමක් තිබීම මධ්‍යම ප්‍රතිපදාව පිළිපැදීම සඳහා පැවතිය යුතු පූර්ව අවශ්‍යතාවයක් බව උන්වහන්සේ ප්‍රකාශ කළහ. එනම් දුක්ඛ සත්‍යය, දුක්ඛ සමුදය සත්‍යය, දුක්ඛ නිරෝධ සත්‍යය සහ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා යන සත්‍ය සතරය. වෙනත් වචන වලින් විස්තර කරන හොත් ඉහත කී ආර්ය සත්‍ය සතරේ අර්ථය සැකෙවින් මෙසේ දැක්විය හැකිය:

1. භවය හා සම්බන්ධවූ සියලුම දේ දුකය. සියලු සැප සම්පත් සදාකාලික වර්තනාකමකින් තොරය. අස්ථිරය.

2. දුකට මුල්වූ හේතුවක් තිබේ. ඒ අනුව ලොව සෑම දෙයක්ම හේතුඵල ධර්මතාවයකට අනුව නිරන්තරයෙන් එකක් අනිකේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන චක්‍රීය ක්‍රියාවලියකට අනුව (පටිච්ච සමුප්පන්නව) සිදුවේ.

3. දුකට හේතුව සොයා දැනගත හැකිය.

4. ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අනුව පිළිපැදීමෙන් දුක නැති කළ හැකිය.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වල හරය වේ. බෞද්ධ ජීවන ක්‍රමය, ආචාර විද්‍යාත්මක ආකල්ප සහ ආගමික ප්‍රතිපදා සියල්ලම ආර්ය අෂ්ඨාංගික මාර්ගය මත පදනම් වී තිබේ. ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අනුව පුද්ගලයකු විසින් නිවැරදි දැකීම, නිවැරදි

කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්ත, නිවැරදි දිවි පෙවෙත, නිවැරදි උත්සාහය, යහපත් සිහිය සහ යහපත් සමාධිය වැඩිය යුතුවේ.

යහපත් දැකීම යනුවෙන් අදහස් වන්නේ චතුරාර්ය සත්‍යය සහ සත්වයකු/පුද්ගලයෙකු යනුවෙන් ප්‍රපංචයක් (impersonality of existence) නොමැති බව අවබෝධ කර ගැනීමය. යහපත් කල්පනාව යන්නෙන් මූලික වශයෙන් අදහස් කරන්නේ ලෞකික වස්තූන් කෙරෙහි ඇති ආශාව ප්‍රහීණ කිරීම සහ පණ ඇති සත්වයින්ට හිංසා පීඩා කිරීමෙන් වැළකී සිටීමය. යහපත් සිහිය ගෞතම බුදුන් වහන්සේගේ ධර්මයේ කේන්ද්‍රීය සංකල්පයකි. එය භාවනාවට පමණක් සීමා නොකොට බෞද්ධයකුගේ එදිනෙදා ජීවිතයට සම්බන්ධවූ මුළු ජීවිතය පුරාම පැතිර පවතින අංගයක් විය යුතුය. තමාගේ ශරීරය, හැඟීම සහ සිතිවිලි පිළිබඳ නිරන්තරයෙන් එළඹ සිටි සිහියෙන් (Smriti) යුක්තව සිටීම ඉන් අදහස් වේ.

බුදුන් වහන්සේ ලොව පහළවීමට පෙර ඉන්දියාව පුරා පුළුල් ලෙස පැතිර තිබූ විශ්වාසය වූයේ කිසි විටෙක වෙනස් නොවන, නිරපේක්ෂ ස්වභාවයක් උසුලන පරමාත්මය (බ්‍රහ්මන්) හා සර්ව සම වූ පෞද්ගලික ආත්මයක් (ආත්මන්) සෑම පුද්ගලයෙකු තුළම පවතින බවය. ආත්මන් සහ බ්‍රහ්මන් අවකාශය සහ කාලය පිළිබඳ සීමා ඉක්මවා පැතිර යන හෙයින් ඒවා වචනයෙන් විස්තර කළ නොහැකි විය. බුදුන් වහන්සේට ධර්මය දේශනා කිරීමට සිදුවූයේ එවැනි විශ්වාසවලින් යුක්ත වූ පරිසරයක් තුළය. සදාකාලිකවූත් වෙනස් නොවන්නාවූත් ආත්මයක් තිබේය යන විශ්වාසය උන්වහන්සේ බැහැර කළහ. ඒ වෙනුවට උන්වහන්සේ භවය යනු වෙනස්වීම සහ දුක මුඛ්‍ය ලක්ෂණය ලෙස පවතින කෙළවරක් දැකිය නොහැකි නිරන්තර ප්‍රවාහයක් ලෙස පෙන්නුම් කර දුන්හ. හින්දු ආගමේ පවතින විශ්වාසයට අනුව සදාතනික බ්‍රහ්මයකු සමඟ එකතුවීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් වුවත් එවැනි බ්‍රහ්මයකු සමඟ එකතුවීමෙන් තොරව සත්වයා කෙළවරක් දැකිය නොහැකි සංසාරයේ නැවත නැවත ඉපදෙමින් සැරිසරයි. අනිත්‍යතාවයෙන් පලායාමේ මාර්ගයක් හෝ සදාතනිකවූත්, වෙනස් නොවන්නාවූත් ආත්මයක් පිළිබඳ විශ්වාසයක එල්බ ගෙන විමුක්තිය සොයා යැමෙන් අනිත්‍ය භාවය මගහරවා ගත හැකියයි හෝ බුදුන් වහන්සේ දේශනා කළේ නැත. ඇත්ත වශයෙන්ම පුද්ගලයකු තුළ අභ්‍යන්තර වශයෙන් හෝ බාහිර වශයෙන් විශ්වය තුළ හෝ එහි පදනම වශයෙන් වෙනස් නොවන ආත්මයක් තිබේය යන විශ්වාසය උන්වහන්සේ මුළුමනින්ම බැහැර කළහ. ඒ වෙනුවට උන්වහන්සේ අනාත්ම වාදයක් දේශනා කළහ.

බුදුන් වහන්සේගේ සමස්ත ඉගැන්වීම් පද්ධතියම (ධර්මය) මූලික වශයෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ගැබ්වී තිබේ. බුද්ධාගමේ හරය වටහා ගැනීම සඳහා කෙනෙකු නිතර නිතර එම මාර්ගය සිහියට නගා ගත යුතුවේ. යම්සේ කන්ද උඩ දේශනාව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වල හරය වශයෙන් පවතීද එපරිද්දෙන්ම ආර්ය අෂ්ටාංගික මාර්ගය බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වල කේන්ද්‍රය වශයෙන් පවතී.

ආර්ය අෂ්ටාංගික මාර්ගය පළමුවරට දේශනා කිරීම සහ පස්වග මහණුන් සංඝ සංස්ථාවේ මුල් සාමාජිකයින් වශයෙන් පත්වන විට බුදුන් වහන්සේගේ වයස අවුරුදු 36 ක් විය. එතැන් සිට පුරා පන්සාලිස් වසක් තිස්සේ උන්වහන්සේ ඉන්දියාව පුරා දහම් දෙසමින් සැරි සැරුවේය. ග්‍රීෂ්ම සෘතුවේ දැඩි උෂ්ණත්වය පවතින කාලවලදී උන්වහන්සේ වැඩි කාලයක් වැඩ වාසය කළේ රජගහ නගරයට ඔබ්බෙන් පිහිටි ගිජ්ජකූට පර්වතයෙහිය (Vulture's Rock). උන්වහන්සේගෙන් ධර්මය ඇසීම පිණිස බොහෝ දෙනා දස දෙසින් ගිජ්ජකූට පර්වතයට පැමිණියහ.

සංඝ සංස්ථාවට ඕනෑම කෙනෙකුට ඇතුළත් වීමට ඉඩ ලැබුණේ නැත. බුදුන් වහන්සේ භික්ෂුභාවය ලබා දුන්නේ ඊට අදාළ විනය නීති වලට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය තරම්වූ මානසික හැකියාවක් ඇතැයි උන්වහන්සේට හැඟී ගිය පුද්ගලයින්ට පමණි. ධර්මය කෙරෙහි පැහැදුනු අනෙක් බොහෝ පුද්ගලයින් තමන්ට හුරු පුරුදු ගිහි ජීවිතයම ගත කළහ. ඔවුහු ගිහි ශ්‍රාවකයින් බවට පත්වූ අතර ඔවුන් විසින් පිළිපැදිය යුතුවූ නීතිරීති එතරම් තදබල ඒවා නොවිය. වෙනත් කුලවලට අයත් පුද්ගලයින් මෙන්ම ශාක්‍ය වංශය වැනි උසස් කුලවලට අයත් පුද්ගලයින්ද ඇතුළුව සමාජයේ සෑම මට්ටමකටම පුද්ගලයින් ශාක්‍යමුනි බුදුන් වහන්සේගේ ශ්‍රාවකයින් වූහ. කෝසල රාජ්‍යයේ පාලකයා වූ ප්‍රසේනජිත් කොසොල් රජතුමාත් මගධ දේශයේ පාලකයා වූ බිම්බිසාර රජතුමාත් ඔහුගේ පුත් අජාසත් රජුත් උන්වහන්සේ ශ්‍රේෂ්ඨත්වයෙන් සැලකූ ශ්‍රාවකයෝ වූහ. සත්‍යය අවබෝධ කරගත් මුල් අවධියේදීම වංශවතුන් තුළ ධර්මය කෙරෙහි උන්වහන්සේ විසින් ඇති කරනු ලැබූ උනන්දුව හේතුවෙන් ඔවුන්ගේ නොමසුරු සහයෝගය ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආරාම ඉදිකරදීම පමණක් නොව සංඝ සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මද ආරක්ෂා කරනු ලැබීය.

භාග්‍යවතුන් වහන්සේ නිතර වැඩ වාසය කිරීමට කැමැත්තක් දැක් වූ ශ්‍රාවස්ති නගරය ආසන්නයේ පිහිටි ජේත නැමැති රාජ කුමාරයාට අයත් වූ උයන ධනවත් සිටුවරයකු විසින් මිලදී ගෙන බුදුන්

වහන්සේට පූජා කරනු ලැබීය.

තම නිවසට වැඩම කරනු ලැබූ අවස්ථාවකදී උන්වහන්සේ තම පියාත්, සුළු පියාත්, පුතාත්, ඥාති සහෝදරයින් දෙදෙනෙකු වූ ආනන්ද සහ දේවදත්ත නම් වූ කුමරුවන්ද බුද්ධාගමට හරවා ගත්හ. පසුව ආනන්ද සහ දේවදත්ත යන කුමරුවන් දෙදෙනා උන්වහන්සේගේ ජීවිතය සම්බන්ධයෙන් කැපී පෙනෙන බලපෑමක් ඇති කළහ. ආනන්ද හිමියන් තථාගතයන් වහන්සේට ඉතා සමීපව සිට නිරතුරුව උන්වහන්සේගේ උවමනා එපාකම් සොයා බලමින් දැඩි කැපවීමකින් සහ අවංක චේතනාවෙන් යුක්තව උන්වහන්සේගේ ඉගැන්වීම් වලට අනුව කටයුතු කළේය. එහෙත් උන්නතිකාමයෙන් සහ දුෂ්ට චේතනාවෙන් වෙලීගිය දේවදත්ත, බුදුන් වහන්සේ විසින් තම ශාසනයට භාරකාරයකු නම් කිරීමට සූදානම් නොවූ නිසා උන්වහන්සේ මැරවීමටත් සංඝයා භේද කිරීමටත් කටයුතු කළේය.

බුදුන් වහන්සේ තම ධර්මය ග්‍රන්ථාරූඪ කළේ නැත. ධර්මදේශනා කිරීම සඳහා උන්වහන්සේ ප්‍රාදේශීය උප භාෂාවක් වූ මාගධී භාෂාව ව්‍යවහාර කළ බව අනුමාන කළ හැකිය. උන්වහන්සේගේ දේශනා සංස්කෘත භාෂාවෙන් සූත්‍ර යනුවෙන්ද පාලි භාෂාවෙන් සුත්ත නමින්ද හැඳින්වේ. උන්වහන්සේ සිය දේශනා පවත්වනු ලැබූයේ කාව්‍යමය ශෛලියකිනි. ඒවා බොහෝවිට වෙසෙසකරවූ, ඒකාකාරීවූ ශෛලියකින් දේශනා කර ඇති බව නූතන පාඨකයකුට පෙනී යා හැකිය. ඒවා නිරන්තරයෙන්ම වෙහෙස ඇතිකරවනසුළු පුනරුක්ති දෝෂයෙන් යුක්තය. කෙසේ වෙතත්, උන්වහන්සේ ජීවත්වූ යුගයේදී කියවීමට හෝ ලිවීමට හැකිවූයේ ඉතා සුළු පිරිසකට පමණක් බව තේරුම් ගැනීමෙන්, එම දේශනා මුඛ පරම්පරාගතව දීර්ඝ කාලයක් පවත්වා ගැනීමේ ඇති අවශ්‍යතාවය පැහැදිලිවනු ඇත. උන්වහන්සේ ධර්මය දේශනා කළේ ඒවා පහසුවෙන් ඉගෙන ගැනීමට හැකි පරිදිය. තමා අවබෝධ කරගත් ධර්මය දුකින් පෙළෙන සියලු සත්වයාටම වටහා දීම පිණිස එය දස දිසාවේම ප්‍රචාරය කරන ලෙස උන්වහන්සේ තම ශ්‍රාවකයින්ට නියම කළහ. මෙසේ බුදුන් වහන්සේ ලෝකයේ පළමු ධර්මදූත මෙහෙය (මිෂනාරි ව්‍යාපාරය) ස්ථාපිත කළහ. බොහෝ දුරට එවැනි ධර්මදූත සේවාවන සාර්ථකත්වය රඳාපවතින්නේ ධර්මයේ මුල් අර්ථය හැකි තරම් දුරට නොවෙනස්ව දිගටම පවත්වාගෙන යා හැකි මුඛ පරම්පරාගත සම්ප්‍රදායක් පවත්වාගැනීම මතය.

බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් නොබෝ දිනකට පසු සංඝයා වහන්සේලා රජගහ නුවරට එක්රැස් වූහ. එහිදී බුදුන් වහන්සේගේ

ප්‍රියතම ශිෂ්‍යයා වූ ආනන්ද ස්ථවිරයෝ තම ශාස්තෘවරයා විසින් දේශනා කරන ලද සූත්‍ර වචනයක් වචනයක් පාසා කට පාඩමින් කියවූයේය. බුද්ධාගමේ හරය ලෙස සැලකිය හැකි සූත්‍ර පිටකය අද අපට ලැබී තිබෙන්නේ ආනන්ද ස්ථවිරයන් තුළ පැවති මෙම අද්විතීය මතකය හේතුකොට ගෙනය. රහතන් වහන්සේලා 500 නමක් ඉදිරිපත් වී තම ශාස්තෘවරයා විසින් දේශනා කරන ලද ධර්මය කටපාඩමින් කියවමින් සජ්ඣායනා කරමින් ධර්ම සංගායනාවක් පැවැත්වූ ආකාරය අශ්වඝෝෂ විසින් ලියන ලද 'බුදුන් වහන්සේගේ ජීවිතය' (Life of Buddha) නමැති පොතේ විස්තර කර තිබේ. වේභාර පර්වතයේ උතුරු දිග බෑවුමේ ස්ථානයක රැස්වූ රහතන් වහන්සේලා බුදුන් වහන්සේ දේශනා කළ සියලුම සූත්‍ර සම්බන්ධයෙන් ආනන්ද ස්ථවිරයන් මුල සිට අග දක්වා සාක්ෂි දැරිය යුතු බවට කථිකාකර ගත්හ. මුලදී ආනන්ද ස්ථවිරයින් මෙම ධර්ම සංගායනාවට සහභාගීකර නොගැනීමට පවා තීරණය කර තිබුණි. එයට හේතුව උන්වහන්සේ බුදුරජාණන් වහන්සේගේ සිරුර ආදාහනය කිරීමෙන් පසු ශේෂවූ ධාතු කොටස් මහජන ප්‍රදර්ශනය පිණිස තබා එමගින් ශ්‍රාවකයන් තුළ පැවති ආධ්‍යාත්මික ආකල්පය උද්දීපනය කිරීමට ක්‍රියා කළ හෙයිනි.[1] කෙසේ වෙතත් ධර්ම සංගායනාව පැවැත්වීමට පෙර දින මධ්‍යම රාත්‍රියේදී ආනන්ද හිමියන් මහත් වීර්යයෙන් යුක්තව භාවනානුයෝගීව සිට රහත් ඵලයට පැමිණියේය. ඉන්පසු පනවා තිබූ අසුනෙහි වාඩිවී බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද සියලුම සූත්‍ර දේශනා ඒවා දේශනා කළ ස්ථානය, වේලාව සහ දේශනා කරන ලද්දේ කවරෙකු උදෙසාද යන සියලු කරුණු ඇතුළත්ව කට පාඩමින් කීවේය. අද ග්‍රන්ථාරූඪ කර ඇති මෙම සූත්‍ර දේශනා සියල්ලම ආරම්භ වන්නේ "මා විසින් මෙසේ අසන ලදී" යන ආරම්භක වාක්‍යය ඛණ්ඩයකිනි. සම්පූර්ණ සූත්‍ර පිටකය ලියා ඇත්තේ මෙම ශෛලියට අනුවය.

සූත්‍ර පිටකය, විනය පිටකය සහ අභිධර්ම පිටකය බුද්ධාගමට අයත් ධර්ම ග්‍රන්ථ වේ. ඒවා ලියා තිබෙන්නේ මධ්‍ය ඉන්දීය ප්‍රාදේශීය භාෂාවක් වූ පාලි භාෂාවෙන් නිසා එයට පාලි ත්‍රිපිටකය යැයිද කියනු ලැබේ. මෙම අති විශාල ධර්ම සංග්‍රහය ත්‍රිපිටකය යනුවෙන් හඳුන්වන්නේ ධර්මය පුස්කොළ තීරුවල ලියා එක් එක් පිටකයට අයත් පුස්කොළ තීරු වෙන වෙනම භාජන තුනක තැන්පත් කර තිබූ හෙයිනි. මෙම සංග්‍රහයට අයත් වූ ඉතා මෑතකදී එකතු කරන ලද කොටස් ග්‍රන්ථාරූඪ කරන ලද්දේ ක්‍රි. පූ. පළමුවන ශත වර්ෂයේදීය. සංඝයා වහන්සේලා සහ භික්ෂුණීන් විසින් පිළිපැදිය යුතුවූ නීති රීති ඇතුළත් විනය පිටකය පැරණිතම පිටකය වශයෙන් හැඳින්විය හැකිය. ලංකාවේ බෞද්ධ ලේඛන පරිශීලනය කරුණු ලැබූ හර්මන් ඕල්ඩන්බර්ග් (Hermann Oldenberg)

විනය සම්බන්ධයෙන් පවතින මුල් ග්‍රන්ථය බුදුන් වහන්සේ ජීවත්වූ කාලය තරම් ඈතට දිවෙන බව කල්පනා කරයි. ඇවැත් ප්‍රකාශ කිරීමේ ක්‍රමය සහ නියම කළයුතු දඬුවම් පිළිබඳ විස්තර ඇතුළත් පාතිමොක්ෂ ශීලය යනුවෙන් හැඳින්වෙන මෙම විනය සංග්‍රහය සමහරවිට බුදුන් වහන්සේ තම ශ්‍රාවකයින් සමග පවත්වන්නට යෙදුනු විනය කරුණු විභාග කළ අවස්ථා වලදී බිහිවන්නට ඇතැයි කල්පනා කළ හැකිය. මෙම සංග්‍රහයේ පෙළ (විනය පිටකය) යටත්පිරිසෙයින් බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් නොබෝ දිනකට පසුව හෝ ග්‍රන්ථාරූඪ කරන්නට ඇත. මුල් බුදු දහමේ පැවති නිර්මල ස්වරූපය විනය පිටකයෙන් පිලිබිඹු වෙන බව ඒ පිළිබඳ අධ්‍යයනය කර ඇති විශේෂඥයෝ විශ්වාස කරති. පාතිමොක්ෂ නීති පිළිබඳව සංඝයා වහන්සේ තුළ දැනීමක් තිබූ බව සමහර පැරණි සූත්‍ර වලින් පැහැදිලි වේ.

බුදුන් වහන්සේගේ ඉගැන්වීම් සංස්කෘත භාෂාවෙන් ධර්මය යනුවෙන්ද පාලි භාෂාවෙන් 'ධම්ම' යනුවෙන්ද හැඳින්වේ. ධර්මය යනුවෙන් හැඳින්වෙන මෙම තීරණාත්මක බෞද්ධ සංකල්පයට අර්ථ රාශියක් තිබේ. 'ධර්ම' යන වචනයෙන් ලෝක නියාමය, අප ජීවත්වන ලෝකය පාලනය වන විශ්ව නියාමය යන අදහස් ගම්‍ය වේ. බුදුන් වහන්සේගේ ඉගැන්වීම්ද 'ධර්මයට' ඇතුළත් වේ. ඊට හේතුව උන්වහන්සේද විශ්ව නියාමයට අනුව සත්‍යය දේශනා කර තිබෙන හෙයිනි. විශ්ව නියාමය ක්‍රියාත්මක වීමේදී සියලු සංස්කාරයන්ගේ විද්‍යමානවීම සහ සංසිද්ධීන්හි පැවැත්ම සිදුවන ආකාරය උන්වහන්සේ දේශනාකර තිබේ. එය විශ්වාස කරන පුද්ගලයා ධර්මයේ සරණ සොයා යයි. බෞද්ධ භාවනා ක්‍රමය පුහුණු කරන පුද්ගලයින් විසින් ධර්මය අවබෝධ කර ගැනීමට උත්සාහ කරනු ලැබේ. සම්මත ව්‍යවහාරයේ පිළිගත් යෙදුම වූ 'ධර්මය' යන සංස්කෘත වචනය මෙම පොතේ යෙදීමටත් පාලි වචනය වන 'ධම්ම' යන වචනය පාලි පෙළ උපුටා දක්වන අවස්ථාවලදී පමණක් යෙදීමටත් අපි බලාපොරොත්තු වෙමු.

බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශත වර්ෂ කීපයකට පසු උන්වහන්සේගේ ඉගැන්වීම් සමස්ත ඉන්දියාව පුරා පැතිර ගොස් අවසානයේදී දකුණු සහ නැගෙනහිර ආසියාවටද පැතිර ගියේය. කෙසේ වෙතත් මුල්දී බුදු දහම නිසා පසු බැස තිබූ හින්දු ආගම නැවත වරක් ඉන්දියානු උප මහාද්වීපයේ හිස ඔසවමින් එයට අහිමිව ගිය බලය ආපසු ලබා ගත්තේය. බ්‍රාහ්මණයින් සහ බෞද්ධ භික්ෂූන් අතර ශත වර්ෂ කීපයක් තිස්සේ පැවති ගැටුමෙන් අවසානයේදී බ්‍රාහ්මණයෝ ජයගත්හ. 11 වන ශත වර්ෂයේදී මුස්ලිම් ජාතිකයින් බටහිර දෙසින් ඉන්දියාව ආක්‍රමණය කළහ. එනිසා බුදුන් වහන්සේ උපන් දේශයෙන්

උන්වහන්සේගේ ඉගැන්වීම් නැතිවී යාමට හේතු විය. බුද්ධාගම ඉන්දියානු උප මහාද්වීපයේ දුරස්ථ ප්‍රදේශ කීපයකට පමණක් සීමා විය. එතැන් පටන් හින්දූන් විසින් බුදුන් වහන්සේ යනු විෂ්ණු දෙවියන්ගේ අවතාරයක් ලෙස සලකා උන්වහන්සේට ගෞරව කරනු ලැබීය.

ඒ කාලයේදී අලුත් ආගමක් හඳුන්වාදීම සඳහා ක්‍රියා කළ එකම ශාස්තෘවරයා බුදුන් වහන්සේ පමණක් නොවූහ. කෙසේ වෙතත්, බුද්ධ ධර්මයේ ඇති වර්තමාන වැදගත්කම අනුව සලකා බැලීමේදී වඩා සාර්ථක ශාස්තෘවරයා වූයේ බුදුන් වහන්සේ බව නිසැකවම ප්‍රකාශ කළ හැකිය. එකල විසූ අනෙකුත් ශාස්තෘවරුන් අතරින් වඩා වැදගත් පුද්ගලයින් දෙදෙනකු ලෙස බුදුන්වහන්සේගේ සමකාලීනයින් වූ 'ගෝසාල' සහ 'මහාවීර' හැඳින්වීමට පුළුවන. ජීවිතයේ සියලු දෙයක්ම දෛවය අනුව කලින් තීරණය වී ඇති බවත් විමුක්තිය ලබාගත හැක්කේ ජීවිතයට සතුටින් මුහුණ දීමෙන් පමණක් බවත් ගෝසාලගේ ඉගැන්වීම විය. ඔහු විසින් හඳුන්වා දුන් ආජීවක සමාජය වැදගත් ආගමික ව්‍යාපාරයක් බවට පත්වූ නමුත් මධ්‍යතන යුගයේදී එය අභාවයට ගියේය.

මහාවීර විසින් ඇති කරනු ලැබූ ජෛන සමාජය එහි අනුගාමිකයින් සුළු පිරිසක්ද සමග අද දක්වාත් නොනැසී පවතී. මහාවීරගේ ජීවිතය සහ අදහස් බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වලට බොහෝ දුරට සමානකමක් පෙන්නුම් කරයි. එවැනි දර්ශනයක් තේරුම් ගැනීමට හැකි පරිසරයක් එකල පැවති බව ඉන් පෙනී යයි. ගෞතමයන් මෙන්ම මහාවීරද රජ පෙළපතකින් පැවත ආ කුමාරයකු විය. ඔහු වයස අවුරුදු 30 දී සත්‍යය සොයනු පිණිස රජ මාලිගයෙන් පිටවී ගිහිගෙය අතහැර පැවිදි ජීවිතයට ඇතුල් විය (රූපරාමුව 11). අන්තිමේදී තුග වෘක්ෂයක් පාමුලදී සත්‍යය අවබෝධකර 'ජින' (තමා විසින් තමා ජයගැනීම) තත්වයට පත්වන තුරු මෙතුමා වර්ෂ දොළහක් පමණ කාලයක් උතුරු ඉන්දියානු තැනිතලාවේ සැරි සරමින් සත්‍යය සෙවූහ. ජෛනයින් (ජින ශ්‍රාවකයින්) වශයෙන් තමුන්ම හඳුන්වා ගනු ලබන භික්ෂූන්ගෙන් සහ ගිහි ශ්‍රාවකයින් ගෙන් සමන්විත වූ හොඳින් සංවිධානය වූ ආගමික සමාජයක් බිහිකර අවුරුදු 30ක් ධර්ම ප්‍රචාරය කිරීමෙන් පසු මහාවීර මිය ගියේය.

ගෞතම බුදුන් වහන්සේ සහ මහාවීර යන දෙදෙනාම එකම කාලයකදී ජීවත් වෙමින් සමාජය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළහ. ඔවුන් දෙදෙනාම නිතර මගධයේ අගනුවර වූ රජගහ නුවරදී දක්නට ලැබිණ. පුරාණ ඉන්දියාවේ පැවති මහා නගර දහසයෙන් එකක් ලෙස සැලකෙන රජගහ නුවර ඒ කාලයේදී පාලනය කරනු ලැබුවේ මෙම

ශාස්තෘන් වහන්සේලා දෙදෙනාට ඉතා ගෞරවයෙන් සත්කාර කරණු ලැබූ බිම්බිසාර රජතුමා විසිනි. අප ජීවත්වන සහස්‍රකයේ මුල් ශත වර්ෂවලදී ලෝකයේ පැවති ශ්‍රේෂ්ඨතම අතිපුරාණ වූත් විශ්ව විද්‍යාලවලින් එකක් වූ නාලන්දා විශ්ව විද්‍යාලය පිහිටා තිබුණේ ඊට කිලෝමීටර් කිහිපයකට ඔබ්බෙනි. ශත වර්ෂ හතක පමණ කාලයක් එය දකුණු ආසියාවේ බුද්ධිමය කේන්ද්‍රය වශයෙන් පැවතුණි. දස දහසකට වඩා අධික ශිෂ්‍ය පිරිසකගෙන් සහ දෙදහසකට වඩා අධික ආචාර්යවරු සංඛ්‍යාවකින්ද සමන්විත වූ මෙහි වෛද්‍ය විද්‍යාව, ස්වභාවික විද්‍යාව, ගණිතය සහ දර්ශන ශාස්ත්‍රය වැනි විෂයයන් උගන්වනු ලැබීය. එහි සිටි රතු පැහැති සිවුරු හැඳගත් භික්ෂූන් වහන්සේලා යුධ භටයින් යැයි වරදවා වටහාගත් ඉන්දියාවට බටහිර දෙසින් කඩා වැදුනු මුස්ලිම් ආක්‍රමණික හමුදාවක් විසින් 1199 වර්ෂයේදී මෙම විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලි ගිනිබත් කරනු ලැබිය. පොත් පත් වල අත්පිටපත් දස ලක්ෂ නවයක් පමණ ගබඩාකර තිබූ පුස්තකාලය මාස හයක පමණ කාලයක් තිස්සේ ගිනිබත් වෙමින් තිබූ බව කියනු ලැබේ. කිසියම් මතභේදයක් හේතුකොට ගෙන එක්තරා බ්‍රාහ්මණයින් පිරිසක් විසින් මෙම ස්ථානය දෙවන වරටත් ගිනිබත් කරන තුරු භික්ෂූන් වහන්සේලා පළමු ගින්නෙන් පසු තවත් අවුරුදු 50 ක් එහි ඉගැන්වීම කටයුතු කරගෙන ගියහ.

සුදු වස්ත්‍රයෙන් සැරසී, පාත්‍රයක් හැරමිටියක් සහ කෘමි සතුන් පලවා හැරීම සඳහා මොනර පිලෙන් කල මුස්නයක් අතැතිව ගමන් කරන ජෛන භික්ෂූන් සහ භික්ෂුනීන්, අදත් අධික උෂ්ණත්වයකින් හා වියළි බවින් යුක්ත, දූවිල්ලෙන් වැසීගිය වර්තමාන ඉන්දියාවේ ගුජරාට් සහ රාජස්ථාන් ප්‍රාන්තවල දැකිය හැකි සුලභ දර්ශනයකි. තමන් ඇවිදින විට කෘමි සතුන් පයට පෑගීම වැළැක්වීම පිණිස ඔවුන් ගමන් කරන මාර්ගය ප්‍රවේසමෙන් මොනර පිල් වලින් පිස දමනු ලැබේ. ආශ්වාස කිරීමේදී ක්ෂුද්‍ර ප්‍රාණීන් ශරීරය තුළට ඇතුල්වීම වැළැක්වීම සඳහා බොහෝ දෙනෙක් තම මුඛය වටා සිහින් රෙදි පටියක් (මුඛවාඩමක්) පටා බැඳ ගනිති. සසර දුකින් මිදී විමුක්තිය ලබා ගැනීම සඳහා සසර පැවැත්ම පිළිබඳ සත්‍යය සොයමින් ඔවුහු සංචාරක එඬේරුන් මෙන් සෑම වර්ෂයකම මාස අටක පමණ කාලයක් තැනින් තැනට ගමන් කළහ. ජූලි සහ ඔක්තෝබර් මාසවල පවතින වර්ෂා සෘතුවේදී ඔවුන් ජෛන ආගමිකයින් විසින් තම පූජකයින් සඳහා ඉදිකරනු ලැබූ ආවාසවල ගත කරති. කිරි ගරුඬ පාෂාණයෙන් නිර්මාණය කර තිබෙන මෙම සුවිසල් ආවාස පෙවල් ජෛනාගමේ ශ්‍රාවකයින්ගේ ඉසුරුමත්භාවය මොනවට සියාපයි.

බුදුන් වහන්සේගේ සහ මහාවීරගේ සාර්ථකත්වයට හේතුවූයේ බ්‍රාහ්මණයින් නියෝජනය කරනු ලැබූ හින්දු ආගම මෙන් නොව ඔවුන් දේශනා කළ ධර්මය පුද පූජා වලින් ගහන නොවීමය. මෙම අලුත් ඉගැන්වීම් වල වරප්‍රසාද ලත් පන්තියක් දෙසට යොමුවූ නැඹුරුවක් තිබෙන බව පෙනී ගියත්, ඒවා සාමාන්‍ය ජනතාව කෙරෙහිද ආකර්ෂණයක් ඇති කළේය. ඉන්දියාවේ විශ්‍ර කුලහීන පුද්ගලයින්ට දිග් විජය කළ නව පාලකයින් වහලුන්ට මෙන් සලකනු ලැබුවා වූත්, අනාදිමත් කාලයක සිට මිනිසුන් විවිධ කුලවලට බෙදී ගියාවූත්, එපමණක් නොව මුල් ද්‍රවිඩ පදිංචිකරුවන් කුලයකට අයත් නැති පුද්ගලයින් ලෙස නම් කරන ලද්දාවූත්, රටක මෙම නව ඉගැන්වීම් මගින් ඉදිරිපත් කරනු ලැබූ මූලික අදහස සාමාජික වශයෙන් විප්ලවකාරී ස්වරූපයක් ගත්තේය. ශත වර්ෂ ගණනාවක් තිස්සේ කුලභේදය මත දැඩි ලෙස සංවිධානය වූ සමාජ ක්‍රමයක් වෙනස් කිරීමට අලුත් ඉගැන්වීම් වලට හැකිවීම සමාජයේ ප්‍රබල තත්වයක් දැරූ බ්‍රාහ්මණයින්ට සහ ක්ෂත්‍රිය වංශිකයින්ට මුහුණ පෑමට සිදුවූ අභියෝගයක් ලෙස පෙනී යන්නට ඇත. බුදුන් වහන්සේ හෝ මහාවීර අනුගමනය කරනු ලැබුයේ වී නම් ක්ෂත්‍රිය වංශිකයින්ට අවි බිම තබා පුද්ගල විමුක්තිය සොයනු පිණිස තමන්ගේ සම්පූර්ණ කාලය කැප කිරීමට සිදුවනු ඇත. පාලක පන්තියට තමන් වෙත පැවරුනු සම්ප්‍රදායික කටයුතු වලින් වැළකී සිටීමට සිදුවනු ඇත. එවැනි මතයක් සමාජයේ බලවත් කොටසක් වූ සුළු පිරිසකට පෙනී ගියේ භයානක විප්ලවකාරී අදහසක් ලෙසය. බුදුන් වහන්සේ සහ මහාවීර විසින් ඉදිරිපත් කරනු ලැබූ විමුක්ති මාර්ගය සාමකාමීවූත්, මෛත්‍රී සහගතවූත්, ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමෙන් සලසාගත යුතු බව ප්‍රසිද්ධ කරනු නො ලැබුවේ නම්, නිසැකවම ඉන්දු ආර්ය ප්‍රභූ පන්තියේ විරෝධතාවය ඔවුන් වෙත එල්ල වන්නට ඉඩ තිබුණි. කෙසේ වෙතත් කලින් රාජ්‍ය යටත් කරගත් ක්ෂත්‍රිය වංශයට අයත් පාලක පන්තිය ඔවුන්ගේ ම දුර්වලතා නිසා ක්‍රම ක්‍රමයෙන් පරිහානියට පත්වූහ. ශත වර්ෂ ගණනාවක් තිස්සේ නිරන්තරයෙන් පැවති ආරවුල් සහ පවුල් අතර පැවති මතභේද හේතු කොටගෙන ඔවුන් පරිහානියට පත්වූ අතර දේශපාලන ක්ෂේත්‍රයේ ඔවුන් සතුව පැවති බලයද ක්‍රමයෙන් ගිලිහී ගියේය. මගධ දේශයේ පාලනය ලබා ගැනීම සඳහා කුඩා රාජ්‍ය විශාල සංඛ්‍යාවක් අතර නිරන්තරයෙන් පැවති පීඩනය සහ සටන් නිසා දැඩි වෙහෙසට පත්ව සිටි සාමාන්‍ය ජනතාව සාමාජීය සහ ආධ්‍යාත්මික වශයෙන් පුනර්ජීවයක් අපේක්ෂා කළහ. මෙසේ ආගමික මෙන්ම දේශපාලන අර්ථයකින්ද සලකා බැලීමේදී මෙම නව ඉගැන්වීම් ක්‍රම ක්‍රමයෙන් පිරිහී ගිය ආර්ය උරුමය තුළ ඇතිවූ හිදැස පිරවීම සඳහා ලැබුණු නව ජීවයක් වැනි විය.

සැම පුද්ගලයෙක්ම උපතින් සමාන බව බුදුන් වහන්සේ දේශනා කළ සේක. එකී සමානාත්මතාවය ක්‍රියාවට නැගිය යුත්තේ ආධ්‍යාත්මික වශයෙන් ජීවිතය තුළට එකී බලා සසරින් එතෙර වී නිවන් අවබෝධ කර ගැනීම පිණිසය. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය මුල් කොටගත් සංසාර නමැති සාගරයේ ගිලී දුක් විඳින සත්වයා මුහුණ දී ඇති ප්‍රශ්නයට බුදුන් වහන්සේගේ ඉගැන්වීම මගින් පිළිතුරක් ලැබී ඇත. දුක් ඇතිවන්නේ තෘෂ්ණාව සහ අවිද්‍යාව නිසාය. දුකින් පිරුණු සසරින් මිදී නිවන් අවබෝධකර විමුක්තිය සලසා ගැනීම සඳහා ආරම්භයක් ඇති කර ගත හැක්කේ මෙම සත්‍ය වටහා ගැනීම තුළිනි.

ක්‍රි. පූ. හතරවන ශතවර්ෂයේ මැද භාගය වනවිට බුදු සමය විවිධ ගුරුකුල වලට බෙදී යාමේ ක්‍රියාවලිය ආරම්භව තිබුණි. සමහර නිකායිකයින් බුදුන් වහන්සේගේ සත්‍ය ඉගැන්වීම ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කළහ. ආගමික අංගයට නැඹුරුවූ සමහර පිරිස් කිසියම් ක්‍රමයකට අනුව ධර්මය ඒකරාශි කිරීමට කටයුතු කළහ. විශාලා මහ නුවරදී රැස්වූ සංඝයා බුදුන් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳව පොදු එකඟතාවයකට එළඹීමට උත්සාහයක් දැරූහ. ඉන්දියාවේ බොහෝ මිනිසුන් තුළ පැවති විවිධ ආගමික මත මතාන්තර ඒකාබද්ධ කිරීම එතරම් පහසු නොවන බව ඒ වනවිටත් පෙනී ගොස් තිබුණි. රාජ්‍ය අනුග්‍රහය නැතිවී යාම නිසා අමනාපයට පත්වූ බෞද්ධ වේශයෙන් පෙනීසිටි බ්‍රාහ්මණයින් විසින් නොමග යවන සුළු යම් යම් කරුණු බුද්ධාගමට ඇතුල් කරන්නට ඇතැයි කල්පනා කරනු ලැබේ.

විනය නීති උල්ලංඝනය කිරීම විශේෂ ධර්ම සංගායනාවක් පැවැත්වීමට හේතුවිය. භික්ෂූන් වහන්සේලා කීප නමක් ගිහි ශ්‍රාවකයන්ගෙන් රන් සහ රිදී පිළිගෙන තිබුණි. සුරාපානය කළහ. දන් වැළඳීම පිළිබඳව පනවා තිබූ විනය නීති (උපෝසථ) නොසලකා හරින ලදී. ඉහත කී චෝදනා එල්ල කළ ආනන්ද ස්ථවිරයන්ගේ ශිෂ්‍යයකු වූ යස තෙරුණුවෝ රහතන් වහන්සේලා හත්සිය නමක් විශාලා මහනුවරට රැස් කළහ. එහිදී වැරදි කළ භික්ෂූන්ට චෝදනා එල්ල කළ අතර ඔවුන් එකී චෝදනා පිළිගෙන අනෙක් අනුගාමිකයන්ගෙන් කැඩී ගොස් වෙනම ම නිකායක් පිහිටුවා ගත්හ. මෙසේ ඇතිවූ සංඝභේදය අශෝක රජතුමාගේ කාලයේදී පවත්වන ලැබූ තුන්වන ධර්ම සංගායනාවේදී තවදුරටත් පුළුල්ව ගොස් ස්ථවිර සහ මහාසාංඝික නිකායන් දෙක අතර බරපතල මතභේද ඇතිකිරීමට හේතු විය. මේ නිසා සංඝයා නිකාය වශයෙන් බෙදී යාමට හේතු වූ පදනම වැටුණි. අවුරුදු 300 කට පසුව බුද්ධාගම හීනයාන සහ මහායාන වශයෙන් පුළුල් කොටස් දෙකකට බෙදී ගියේය. හීනයානය 'ස්ථවිර' නිකායෙන් බිඳී ආ අතර මහායානය මහාසාංඝික මත මතාන්තර

වල තවත් වර්ධනයක් පෙන්නුම් කළේය.

මෙම වෙනස්වීම් නිසා ක්‍රි. පූ. 4 වන ශත වර්ෂය වනවිට බුද්ධාගම ගිහි ශ්‍රාවකයින්ද විශාල සංඛ්‍යාවක් ඇතුළුව සැලකිය යුතු ආගමික ව්‍යාපාරයක් බවට පත් වී තිබුණි. තම ශාස්තෘවරයාගේ පරමාදර්ශය අනුගමනය කරමින් භික්ෂූන් වහන්සේලා සහ රහතන් වහන්සේලා බුදුන් වහන්සේගේ පණිවිඩය ප්‍රකාශ කිරීම සඳහා ආගමික සංස්කෘතියක් ගොඩනගමින් බොහෝ දුර වැඩම කළහ. මෙසේ ආගමකට ආවේණික වූ ගුණාංග එහි විද්‍යමාන වන්නට පටන් ගත්තේය. හිසට වහලක් නොමැතිව කහ සිවුරු හැඳ පාත්‍රයක් අතින් ගත් භික්ෂූහු බුදුන් වහන්සේගේ ධර්මය දේශනා කරමින් ගම් නියම්ගම් වලට වැඩම කළහ. ඔවුහු තථාගතයන් වහන්සේගේ දේශනා වලින් පැහැදිලි කර ඇති චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, ප්‍රඥාව, ශීලය සහ භාවනාව වැනි කරුණු මිනිසුන්ට පැහැදිලිකර දුන්හ. මෙසේ උන්වහන්සේ දේශනා කළ පණිවිඩය ශීඝ්‍රයෙන් පැතිරී ගිය අතර එසේ සරණ ගිය ශ්‍රාවකයන්ගේ සංඛ්‍යාව මගධ දේශයේ සීමා වලින් ඔබ්බටද විහිදී ගියේය.

බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 400 පසු පිහිටුවාගනු ලැබූ හීනයානය සහ මහායානය බුද්ධාගමේ ඉතා වැදගත් ගුරුකුල දෙකක් ලෙස පැවතියේය. හීනයාන බුදු දහම අභිධර්මයේ දැක්වෙන ගැඹුරු දාර්ශනික කරුණු විමර්ශනය කිරීමට (Metaphysical Speculation) කාලය මිඩංගු නොකර ලෝකය සහ සත්වයා විඳින දුක යථාර්ථවාදීව දැකීමට නැඹුරු වූවා පමණක් නොව විමුක්තිය ලබාගත හැක්කේ භික්ෂුවක් ලෙස ජීවත්වීමෙන් පමණක් යැයි ඉගැන්වූහ. මෙසේ හීනයානය සමාජයේ උසස් පිරිසක් වූ ඉතා සුළු කොටසකගේ ආගමක් බවට පත්විය. ඒ අනුව නිර්වාණය අවබෝධකරගත හැක්කේ ගිහිගෙය සහ මිනිස් සම්බන්ධතා අත්හැර දැමිය හැකි සුළු පිරිසකට පමණක්ය යන්න මේ නිසා උපතින් සියල්ලෝම සමානය යන බුදුන් වහන්සේගේ ඉගැන්වීමේ අර්ථය නැවත වරක් නැතිවී ගියේය. මහායානය මගින් විමුක්තිය පිළිබඳ පැවති බෞද්ධ අදහස් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී කළේය. බුද්ධ විඥානය (බුද්ධත්වයට පත්වීමේ හැකියාව) අපට බාහිර වශයෙන් දක්නට නො ලැබුනත් සෑම මනුෂ්‍යයකු තුළම එය පවතින බව පිළිගන්නා මහායාන බුද්ධාගම මගින් විමුක්තිය සලසා ගත හැකි මාර්ග රාශියක් පෙන්වා දී තිබේ.

මහායාන ක්‍රමය පළමුවන සහස්‍රකය ආරම්භයේදී ගන්ධාර දේශයේ වර්ධනය විය. ගන්ධාර දේශය පිහිටා තිබෙන්නේ ඉන්දු නිම්නයේ මධ්‍ය ප්‍රදේශයට අයත් පෙෂවාර් (Peshawar) සහ ශ්‍රී නගර් (Sri Nagar) අතර

පිහිටි ප්‍රදේශයේය. මේ ප්‍රදේශය හරහා බැබිලෝනියන්වරු, පර්සියවරු සහ ග්‍රීකයින් ඇතුළත් බටහිර සංස්කෘතීන් සමඟ ඉන්දියාව දීර්ඝ කාලයක් තිස්සේ සම්බන්ධතාම් ඇති කර ගෙන තිබුණි. මහායානය උතුරු ඉන්දියාවේ බුදු දහම වශයෙන්ද, හීනයානය දකුණු ඉන්දීය බුදු දහම යනුවෙන්ද හඳුන්වනු ලැබීය. මහායාන ගුප්ත වාදීන්ට (Mystics) අනුව පියවි ඇසට පෙනෙන ලෝකය සහ මිනිසුන් විඳින දුක යනු මායාවකි. ලෝකයේ පවතින එකම යථාර්ථය වන්නේ සෑම ප්‍රපංචයක්ම විනිවිදවූත්, ගුණවිරහිත නොවූත්, මුල් තත්වයකින් ප්‍රභවය වන බවය. මහායාන ක්‍රමයට අනුව විමුක්තිය ලබාගත හැක්කේ සියලු සත්වයා කෙරෙහි අසීමිත ලෙස කරුණාව සහ මෛත්‍රිය පැතිරවීමෙනි. හීනයානය මගින් පුද්ගල විමුක්තිය සලසා ගැනීම අවධාරණය කරනු ලබන අතර මහායාන බෞද්ධයින් විමුක්තිය සොයා යන්නේ අන් අයගේ විමුක්තිය සලසා දීම සඳහා දායක වීමේ පරමාර්ථයෙනි. එම අදහස බෝධිසත්ව සංකල්පය තුළ මූර්තිමත් වී තිබේ. බෝධි සත්වයකු (බුදුවීමට පෙරුම්පුරන්නා) යනු බෞද්ධ විමුක්ති මාර්ගය සම්පූර්ණ කරනු ලැබූ එහෙත් ස්වාර්ථය නො සලකා නිවන් සලසා ගැනීම ප්‍රමාද කරනු ලැබූ මනුෂ්‍යයෙකි. සියළු සත්වයින්ම නිවන් දකින තුරු තෙතෙම ස්වේච්ඡාවෙන් සසර ඉපදීමට තීරණය කරයි. ඉතා ගැඹුරු ප්‍රඥාවකින් හා බුද්ධියකින් හෙබි බෝධි සත්වයන්ගේ කටයුතු සත්වයා කෙරෙහි පැතිර ගිය මෛත්‍රීය හා අනුකම්පාව මත සිදුවේ. මූලික වශයෙන් බුදු දහම ක්‍රිස්තියානි ආගම සමඟ සංසන්දනය කර බැලීම සඳහා අවස්ථාවක් ලැබෙන්නේ බෞද්ධ ඉගැන්වීම් වල ඇති වී තිබෙන ඉහත කී වෙනස් වීමය. ජීවිතයේ සදාචාරාත්මක දියුණුවක් ඇති කිරීම සඳහා ජේසුස් වහන්සේ දේශනා කළ සෑම කරුණක්ම බුදුන් වහන්සේගේ ඉගැන්වීම් තුළ ද දක්නට ලැබේ. ජේසුස් වහන්සේ දේශනා කළ සෑම දෙයක්ම මහායාන බුද්ධාගමේද ඇතුළත් වේ.

බයිබලයේ දැක්වෙන ඉන්දියානු ඉගැන්වීම්

සාම්ප්‍රදායිකව සලකා බැලීමේදී අද්භූත කථාන්තරවල ආරම්භය ඇති වූයේ පෙරදිග රටවලය. පෙරදිග කථාවල දක්නට ලැබෙන අපූර්ව විචිත්‍රත්වය එම කථා කියවන ඕනෑම පාඨකයකු වශී කිරීමට සමත්වේ. කථාවක් කියවා ගෙන යන අතරවාරයේදී කථාවේ ඉතා උච්චතම අවස්ථාවේදී පවා කථාකරුවා විසින් ඉතාමත් සැහැල්ලුවෙන් යුක්තව විචිත්‍රත්වයෙන් සහ සුන්දරත්වයෙන් පරිපූර්ණ වූ විස්තරාත්මක වර්ණනා

ඇතුළත් කිරීම හේතු කොටගෙන එම කථා කියවන පාඨකයා තුළ සමහරවිට සියල්ල ඉතාමත් සෙමින් සිදුවන අලුත් ලෝකයකට පිවිස ඇතැයි යන හැඟීමක් ඇතිවේ. සාම්ප්‍රදායික පෙරදිග කථා කලාවේ ස්වභාවය පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි හොඳම උදාහරණයක් ලෙස අරාබි නිසොල්ලාසයේ එක් දහස් එක් රැයෙහි එන කථා දැක්වීමට පුළුවන. ඈත අතීතයේ පටන් ඉන්දියාවේ කථා කීමේ කලාව ඉතා උසස් මට්ටමක පැවතුණි. ඒ පිළිබඳව කිසියම් අවබෝධයක් ඇති කර ගැනීම සඳහා කළ යුත්තේ රාමායනය හෝ මහාභාරතය වැනි සුප්‍රසිද්ධ වීර කාව්‍යයක් කියවා බැලීම පමණි. එම වීර කාව්‍ය අපූර්ව උපදේශ සහ විස්මිත කථා වලින් පිරී තිබේ. සංස්කෘත සාහිත්‍යයේ ඇතුළත් ඉහත කී ගුණාංග පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි එමෙන්ම සංස්කෘත සාහිත්‍යය කෙරෙහි ආලෝකයක් හෙළිය හැකි එවැනි වෙනත් රචනා නොමැති තරම්ය. උපමා කථා, සුරංගනා කථා, උපාඛ්‍යාන හෙවත් කෙටි කථා ප්‍රවෘත්ති, වීරකථා, සහ ශ්‍රද්ධාව උපදවන ජනප්‍රවාද යනාදිය පහසුවෙන් මතකතබා ගත හැකිවීම නිසා ඒවා උපදේශාත්මක කථා වශයෙන් බෞද්ධයින් අතර ජනප්‍රිය විය. තැනින් තැනට ගමන් කරමින් ධර්මය දේශනා කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලා යම් යම් කරුණු පහසුවෙන් තේරුම් කරදීම සඳහා එම කථා වස්තු උපයෝගී කර ගත්හ. එවැනි කථා වස්තු බොහොමයක් ජාතක කථාවල දක්නට ලැබේ. බුදුන් වහන්සේගේ පූර්ව ආත්ම භාවයන් සම්බන්ධයෙන් පවතින ජනප්‍රවාද ජාතක කථා යනුවෙන් හැඳින්වේ. සමහරවිට එම ජාතක කථාවල අතීතය ක්‍රිස්තු පූර්ව සතරවන ශත වර්ෂය තරම් ඈතට දිවයයි. පසු කාලයේදී ඉන්දියාවේ බුදු දහම පිරිහීමට පත් වූ පසු බ්‍රාහ්මණයින් විසින් බෞද්ධ කථා වස්තු තම ප්‍රයෝජනය පිණිස අනුවර්තනය කර ගත්හ. එවැනි උපමා කථා විශාල ප්‍රමාණයක් පංචතන්ත්‍රය සහ හිතෝපදේශය යනුවෙන් හැඳින්වෙන සුප්‍රසිද්ධ සංස්කෘත කථා සංග්‍රහයන් දෙකේ ඇතුළත් කර තිබේ. මෙහිදී මුලින් සඳහන් කළ පංචතන්ත්‍රය විශ්ව සාහිත්‍යයේ ඉතා වැදගත් නිර්මාණයක් ලෙස සැලකේ.’

සංචාරක කණ්ඩායම් තවලම් නැවතුම් වූ ගාල්වල නතර වී ගිනි මැලයක් දල්වා ඒ වටා හිඳගෙන කථා ඇසීමෙන් සහ ගීත ගායනා කිරීමෙන් රාත්‍රී කාලය ප්‍රීතියෙන් ගත කළහ. බොහෝ දෙනෙක් තමන්ට අසන්නට ලැබුණු විවිධ කථා ප්‍රවෘත්ති විවිධ ශ්‍රාවකයන් ඉදිරියේ නිතර නිතර කියමින් ඒවා ඉතා ඈත පිහිටි දුරු රටවලට ගෙන ගියහ. විවිධ රටවල පැවති ප්‍රාදේශීය සංස්කෘති වල බලපෑම නිසා වඩාත් සිත් ගන්නා පරිදි පෝෂණය වූ එම කථා විවිධ භූමි ප්‍රදේශ සහ යුග චකවාතු හරහා පැතිර ගියේය. විවිධ ප්‍රාදේශීය ව්‍යවහාර සහ සමකාලීන රුචිකත්වයට

අනුව ජීවයේ ප්‍රභාගයද වෙනස් විය. නමුත් එම කථා ප්‍රවෘත්ති වල අන්තර්ගත මූලික හරය සහ එමගින් මූලික වශයෙන් අපේක්ෂා කරණු ලැබූ සදාචාරාත්මක ඉගැන්වීම් වෙනස් වූයේ නැත.

සමහර ඉන්දියානු කථා ක්‍රම ක්‍රමයෙන් සුළු ආසියාව (Asia Minor), ග්‍රීසිය සහ රෝමය හරහා නූතන ඉතාලිය, ජර්මනිය, එංගලන්තය සහ ප්‍රංශය වැනි රටවලට ව්‍යාප්තව ගිය ආකාරය ඉන්දු ආර්ය භාෂා පිළිබඳ සුප්‍රකට විශේෂඥයකු වූ මැක්ස් මුලර් පඬිවරයා විසින් පෙන්වා දී තිබේ.[9] ලා ෆොන්ටේන්ගේ (La Fontaine's) සුප්‍රසිද්ධ උපමා කථා සහ ග්‍රිම් සහෝදරයින්ගේ (Grimm Brothers) සුරංගනා කථාවල ඉතා නී පැරණි ඉන්දියානු කථා වෙනස් ස්වරූපයකින් ඉදිරිපත් කර ඇති ආකාරය පවා එතුමා විසින් පැහැදිලි කර තිබේ.

නව තෙස්තමේන්තුවේ පැරණිතම කොටස් රචනා කරන ලද්දේ ක්‍රි.ව. පළමුවන ශත වර්ෂයේ අගභාගයේදීය. දේවධර්මවේදීන් විසින් බොහෝ වෙනස්කම් කිරීමෙන් අනතුරුව එකී කොටස් අද පවත්නා ස්වරූපයෙන් ඉදිරිපත් කරණ ලද්දේ ක්‍රි. ව. සතරවන ශත වර්ෂයේදීය. ඉන්දියානු කථා නැමැති මහා ප්‍රවාහය බටහිර රටවලට පැතිර ගියේ ඊට බොහෝ කාලයකට පෙරය. එපමණක් නොව ඉන්දියානු ආගමික අදහස් පලස්තීනයේ සහ වෙනත් බටහිර රටවල ඊට බොහෝ කාලයකට පෙර ව්‍යාප්තව තිබුණි.

කෙසේ වෙතත් බුද්ධ ධර්මය සහ නව තෙස්තමේන්තුව ලියා ඇති පෙළෙහි බාහිර මෙන්ම අභ්‍යන්තර වශයෙන්ද බොහෝ සමානකම් තිබෙන බව ක්‍රිස්තියානි පල්ලිය දැන සිටියේය. නමුත් එවැනි සමාන කමක් නැති බව පෙන්වීමට ඔවුන් හැකි සෑම උත්සාහයක්ම දැරූහ. එපමණක් නොව පල්ලිය විසින් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මය ලෙස ඉදිරිපත් කරනු ලැබූ ඉගැන්වීම් වලට වඩා බුද්ධාගම බොහෝ පැරණි බවත් ඔවුහු දැන සිටියහ. ඔවුන්ගේ මතය වූයේ ජේසුස් වහන්සේගේ ධර්මය වෙනත් ශාස්තෘවරයකුගේ ඉගැන්වීම් ඔස්සේ කරන ලද දේශනාවක් නොවන බවත්, උන්වහන්සේගේ ඉගැන්වීම් වෙනත් ආගම් සමග සංසන්දනය කළ හැකි දර්ශනයක්, මතවාදයක් හෝ ආගමක් හෝ නොවන බවය: එය මනුෂ්‍ය වේශයෙන් පෙනීසිටි තම පුත්‍රයා විසින් ඉදිරිපත් කරණු ලැබූ දෙවියන් වහන්සේගේ වචනය මිස වෙන කිසිවක් නොවන බවය. එසේ ප්‍රකාශ කිරීමෙන් ජේසුස් වහන්සේගේ පණිවිඩයේ සදාකාලික වශයෙන් පවතින උත්කෘෂ්ට සහ අද්විතීය භාවයක් තහවුරු කිරීමට කටයුතු කරන ලදී. වෙනත් ඉගැන්වීම් වල ක්‍රිස්තියානි ආගමට සමානකමක් දක්නට ලැබේ නම් එවැනි සමානකමක් ඇතිවිය

හැක්කේ අහම්බෙන් හෝ ක්‍රිස්තියානි ආගමේ බලපෑම නිසා හෝ විය හැකි බව ඔවුන්ගේ අදහස විය.

යුරෝපයේ ජීවත් වූ ක්‍රිස්තියානි ආගමිකයින්ට ලෝකයේ වෙනත් රටවල ජීවත්වන මිනිසුන් සතුව තිබූ ආගමික විශ්වාස සහ මත මතාන්තර සම්භාරය පිළිබඳව කිසියම් අදහසක් ඇති කර ගැනීම සඳහා අවුරුදු දෙදහසක් පමණ කාලයක් ගතවිය. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රීතිමත් පණිවිඩය මගින් පමණක් විමුක්තිය ලබාගත යුතු වූ මිලේච්ඡ මිනිසුන් ජීවත්වන රටවලින් යුරෝපය වට වී ඇතිබව ඔවුන්ගේ විශ්වාසය විය. එහෙත් එය එසේ නොවන බව ඔවුන් අවබෝධකර ගත්තේ විදේශීය රටවල් පිළිබඳ තොරතුරු යුරෝපයට රැගෙන ආ සංචාරකයන් මාර්ගයෙනි. පළමු වතාවට පෙරදිග පැවති ආගම් පිළිබඳ සැහෙන දැනීමක් ඔවුන් ලබා ගත් අතර එම ආගම්වලට අයත් ශුද්ධ ග්‍රන්ථ කියවීමේ අවස්ථාව ඔවුන්ට ලැබුණි. එම ආගම් සහ ක්‍රිස්තියානිය අතර පවතින සම්බන්ධතාවය සොයා බැලීම සඳහා නැවත වරක් ඔවුන්ගේ අවධානය යොමුවිය. ක්‍රිස්තියානි උරුමය වෙනුවෙන් පෙනී සිටි පුද්ගලයින් බුදු දහම සහ ක්‍රිස්තියානි ආගම අතර දක්නට ලැබෙන සමානකම් දෙවියන් වහන්සේ විසින් වෙනත් පුද්ගලයින් සඳහා ප්‍රාරම්භක යුගයේදී කරන ලද හෙළිදරව්වක නෂ්ටාවශේෂ ලෙස ඔවුහු හඳුන්වා දුන්හ. එහෙත් ලෝකයේ පවතින්නේ එකම ධර්මතාවයක් (Great Religious Law) පමණක් බව බුද්ධාගමේ අනුගාමිකයින් ස්ථිර ලෙස ප්‍රකාශ කළහ.

18 වන ශත වර්ෂයේදී යුරෝපයේ ඇති වූ පුනර්ජීවයත් සමග උදා වූ විද්‍යාත්මක වාතාවරණය තුළ හෙළිදරව්ව පිළිබඳ විශ්වාසයට පැවති පූජනීයත්වය අහිමිවිය. ඒ පිළිබඳ නව උපන්‍යාසයන් (Hypothesis) ඉදිරිපත් කරන ලදී. ක්‍රිස්තියානි ආගම වෙනත් ආගම් වලින් කරුණු ණයට ගෙන තිබෙන බව ප්‍රකාශ කරමින් නව මත ඉදිරිපත් විය. නමුත් එය එතරම් අලුත් දෙයක් නොවීය. බුද්ධිමය අදහස්, විශේෂයෙන්ම වැදගත් සදාචාරාත්මක හෝ කලාත්මක සංකල්ප වෙනත් මූලාශ්‍ර වලින් ණයට ගැනීම පුරාණ සම්භාව්‍ය යුගවලදී මහත් සේ සාකච්ඡාවට භාජනය වූ කරුණක් විය. ක්‍රි. පූ. 170 - 150 අතර ග්‍රීසියේ රජ කළ VI වන ටොලමි පිලොමීටර් රජතුමාගේ කාලයේදී ග්‍රීසියේ බුද්ධිමය කටයුතු පිළිබඳ කේන්ද්‍රය වශයෙන් පැවති ඇලෙක්සැන්ඩ්‍රියා නගරයේ ඇරිස්ටෝබියුලස් (Aristobulus) නම් උගත් යුදෙව් ජාතිකයෙක් වාසය කළේය. ඇරිස්ටෝටල්ගේ අනුප්‍රාප්තිකයින් විසින් ඉදිරිපත් කළ දර්ශනය බයිබලයේ පැරණි තෙස්තමේන්තුවේ ඇතුළත් මෝසස් සහ අනෙකුත් දිවැසිවරුන්ගේ ඉගැන්වීම මත පදනම් වී ඇති බව දැනට අභාවයට ගොස් තිබෙන පොතක් මගින් පැහැදිලි කිරීමට ඔහු උත්සාහ කළ බව

සඳහන් වේ. ඇරිස්ටෝටිලුගේ විසින් ලියන ලද නිරුක්ති නියමය (Derivation Theory) පිළිගත් අදහසකි. ජේසුස් වහන්සේගේ සමකාලීනයකු වූ ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ ෆිලෝ (Philo) වැනි බුද්ධිමතකු පවා මනුෂ්‍ය වර්ගයාගේ සැබෑ ශාස්තෘවරයා මෝසස් බවත්, ග්‍රීක් දාර්ශනිකයින් ඔවුන්ගේ වැටහීමට අනුව යහපත් සහ අයහපත් යැයි සලකනු ලැබූ කරුණු මෝසස්ගේ දේශනාවලින් උකහා ගන්නා ලද'යි යන අදහස පුන පුනා ප්‍රකාශ කරණු ලැබීය. මෙවැනි ප්‍රකාශ ක්‍රි. පූ. 140 පමණ වනවිට ඊට සත වර්ෂයකට පමණ පෙර මියගිය හෝමර් විසින් පිබිල් නැමති යුදෙව් ජාතිකයාගේ කවි සොරා ගන්නා ලද'යි ප්‍රකාශ කිරීමට තරම් හාස්‍යජනක තත්වයකට ඇද වැටුණි.

නව තෙස්තමේන්තුව රචනා කිරීමේදී ඉන්දියානු අදහස් යොදා ගැනීමට ඇති ඉඩකඩ පිළිබඳ සලකා බැලීම ආරම්භ වූ කාලයේදී ඉන්දියාව සමග පැවති ඓතිහාසික සම්බන්ධතා පිළිබඳව එතරම් දැනීමක් ඔවුන්ට නොතිබුණි. එම අවබෝධය නව තෙස්තමේන්තුවේ දක්නට ලැබෙන විදේශීය ආභාෂය පිළිබඳව සොයා බැලීම සඳහා න්‍යායයන් කීපයක් ගොඩ නැගීමට හේතුවිය.

1772 වර්ෂයේ පටන් ඉන්දියාවේ විසූ ඉංග්‍රීසි ජාතිකයින් යටතේ සේවය කළ ඉතා උසස් අධ්‍යාපනයක් ලැබූ හැනෝවර් ජාතිකයකුවූ ෆ්‍රාන්සස් විල්ෆර්ඩ් (Frances Wilford) ඉන්දියාව සහ බටහිර රටවල් අතර පැවති අන්තර් සම්බන්ධතාවයන් පිළිබඳව සොයා බැලීම සඳහා කටයුතු කළ මුල් පුද්ගලයින්ගෙන් කෙනෙක් විය. එම සම්බන්ධතා පිළිබඳ අද අප සතු දැනීම අනුව සලකා බැලීමේදී ඔහු විසින් ඉදිරිපත් කර ඇති කරුණු සහ නිරුක්ති පිළිබඳ විග්‍රහයන් පැහැදිලි වග විභාගයකින් තොරව කරන ලද පදනම් විරහිත විග්‍රහයන් බව පෙනීයයි. ඔහු ප්‍රිතු (Prithu) නෝවාට (Noah) සමාන කරණු ලැබූ අතර ඩියුකැලියන් (Deucalion) යන වචනය සංස්කෘත භාෂාවේ එන දේව-කාල-යවන නමැති පදයෙන් බිඳී ඇති බව ප්‍රකාශ කළේය. සාලිවාහන නමින් හැඳින්වූ එක්තරා පුද්ගලයකු සහ ක්‍රිස්තුස් වහන්සේ අතර පැවති සම්බන්ධතාවයක් ගැන ඔහු විසින් සඳහන් කර තිබේ. ඒ කාලයේදී අති විශාල ඉන්දියානු අදහස් සම්භාරය පිළිබඳව පර්යේෂණ කර තිබුණේ ඉතා සුළු වශයෙනි. කෙනෙකුට විශ්වාස කිරීමට පවා අපහසු මිථ්‍යා විශ්වාස වලින් පිරීගිය ඉන්දියාවේ පැවති විවිධ ආගම් වල ඇතුළත් කරුණු හෝ ඒ පිළිබඳව ලියා ඇති පොත් පත් සංඛ්‍යාව අප්‍රමාණ වීම නිසා ඒවා ලියන ලද කාලය, ඒවායේ ඇති වැදගත්කම සලකා බලමින් සහ එමගින් කර ඇති බලපෑම් කිසියම් සැලැස්මකට අනුව නිවැරදි ආකාරයකට පිළියෙල කිරීම ඒ සම්බන්ධයෙන් හොඳ දැනීමක් ඇති කෙනෙකුට වුවද

ඉටු කිරීම දුෂ්කර කාර්යයක් බව කිව යුතුය. විල්ෆර්ඩ් එවැනි ශාස්ත්‍රීය පර්යේෂණ වල යෙදුණේ නැත. මූලික වශයෙන් ඔහු විසින් කර තිබෙන්නේ පැරණි සංස්කෘත භාෂාව පිළිබඳ විශේෂඥයින් විසින් සම්පාදනය කරණු ලැබූ 'පුරාණ' ග්‍රන්ථවලින් උපුටා ගන්නා ලද කොටස් පදනම් කරගෙන තම මතය ඉදිරිපත් කිරීම පමණි. එසේම හින්දු ආගමේ ආධ්‍යාත්මික රාමුව තුළ එම කථාවලට ලැබෙන වැදගත් ස්ථානය හෝ ඒවා ලියන ලද්දේ කවර කාලයකදීද යන කරුණු පිළිබඳව ඔහු කිසිවක් සඳහන් කර නොමැත.

මේ කාලයේදී බටහිර පඬිවරු පැරණි ඉන්දියාවේ ඉතා උසස් භාෂාවක් ලෙස පැවති සංස්කෘත භාෂාව පිළිබඳ කරුණු සෙවීමට පටන් ගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් තුලනාත්මක වාග් විද්‍යාව (Comparative Philology) පිළිබඳ උද්යෝගයක් පැවති කාලපරිච්ඡේදයක් ආරම්භ විය. භාර්තුිහාරි (Bhartrihari) විසින් ලියනු ලැබූ "වෛරාග්‍ය ශතකය" සහ "නීති ශතකය" නමැති පොත් දෙක ඕලන්දයේ උපත ලැබූ 1630-1647 කාලය තුලදී කැල්විනිස්ට් මිෂනාරිවරයකු ලෙස ඉන්දියාවේ සේවය කළ ඒබ්‍රහම් රොජර් (Abraham Roger) 1651 වර්ෂයේදී ලීඩන් නගරයේදී ප්‍රසිද්ධ කරනු ලැබීය. මෙම පොත් දෙක යුරෝපයේ පළමුවරට ප්‍රසිද්ධ කරනු ලැබූ සංස්කෘත භාෂාවෙන් ලියැවුන පොත් වශයෙන් හැඳින්විය හැකිය. රොජර් විසින් ප්‍රසිද්ධ කරන ලද පොත් භාෂා කීපයකින් පළකරන ලදී. එහි ජර්මන් මුද්‍රණය (Offene Tur zu dem Verborgenen Heydenthum) (සැඟවුණු මිථ්‍යා දෘෂ්ටිය තේරුම් ගැනීමට දොර විවෘතයි) නමින් 1663 දී පළවිය. ජොහාන් ගොට්ෆ්‍රීඩ් හර්ඩර් (Johann Gottfried Herder) නමැති පඬිවරයා විසින් ලියන ලද Gedanken einiger Brahmanen (සමහර බ්‍රාහ්මී චින්තන) නමැති ග්‍රන්ථයේ ඉහත කී සංස්කෘත පොත්වල ඇතුළත් උපදේශාත්මක කථා ප්‍රවෘත්ති පිළිබඳව සඳහන් කර තිබීමේ හේතුවෙන් ඒවායේ ඇතුළත් කරුණු බුද්ධිමය සාහිත්‍යයට ඇතුල්විය.

ක්‍රිස්තියානි ආගම සහ ඉන්දියානු ආගමික විශ්වාස අතර අපූර්ව සමාන කමක් තිබෙන බව විද්වතුන්ට පෙනී ගියේය. ඇත්ත වශයෙන්ම මෙහිදී ආරම්භයක් වශයෙන් සියලුම ආගමික සත්‍යයන් ප්‍රභවය විය හැක්කේ පැරණි තෙස්තමේන්තුවෙන් පමණක් යැයි බොහෝ බටහිර චින්තකයින් අතර අප්‍රකාශිත එකගත්වයක් පැවතුනි. හින්දු ආගම බයිබලයේ පැරණි තෙස්තමේන්තුව මත පදනම් වී ඇති බව ඔවුහු ප්‍රකාශ කළහ. එහෙත් පැරණි තෙස්තමේන්තුව සහ නව තෙස්තමේන්තුව ලියා තිබෙන්නේ හින්දු ආගමෙන් සහ බුද්ධාගමෙන් ලබාගත් බොහෝ කරුණු ඇසුරින් බව ප්‍රකාශ කරමින් ඊට ප්‍රතිවිරුද්ධ අදහසක් 1779 වර්ෂයේදී ලන්ඩන් නුවරදී ප්‍රසිද්ධ කරනු ලැබූ පොතක් මගින් පළමුවරට ඉදිරිපත්

කරනු ලැබීය.[11]

ඉන්දියානු පොත් පත්වල අත් පිටපත් ඒවා රචිත කාලය සහ ඒවායේ ඇතුළත් ආගමික මතිමතාන්තරවල ස්වභාවය පිළිබඳව විද්වතුන් විසින් වැඩි වැඩියෙන් කරුණු පැහැදිලි කිරීමේ හේතුවෙන් ක්‍රිස්තියානි ආගම සහ ඉන්දීය ආගම් අතර පැහැදිලි සමානකම් තිබෙන බව බොහෝ දෙනෙකුට පෙනී ගියේය. බයිබලය රචනා කළ ක්‍රිස්තියානි කතුවරයින් විසින් ඉන්දීය පොත් පත්වලින්, විශේෂයෙන්ම බෞද්ධ ග්‍රන්ථ වලින් අදහස් ලබා ගැනීමට තිබූ ඉඩ කඩ පිළිබඳව පෙරට වඩා ප්‍රසිද්ධියේ සාකච්ඡා කරනු ලැබීය. මේ සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම මුලින්ම ආරම්භවූයේ ඉතා උද්වේගකාරී ස්වරූපයකිනි. කෙසේ වෙතත් දහනව වැනි ශත වර්ෂය තුළදී එම පර්යේෂණ කටයුතු ආදානග්‍රාහී මතවල බලපෑමට යටත් නොවූ ඒ පිළිබඳ අවංක උනන්දුවකින් කටයුතු කළ පෞද්ගලික පර්යේෂකයින් විසින් පිළිගත හැකි විද්‍යාත්මක පදනමක් මත සිදුකිරීමට කටයුතු කරන ලදී.

සුප්‍රසිද්ධ ජර්මන් දාර්ශනිකයකු වූ ආතර් ශොපන්හවර් (Arthur Schopenhauer) (1788-1860) විසින් මේ සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණ මෙහිදී ඉතා වැදගත් ස්ථානයක් උසුලයි. බුදු දහමේ ඇතුළත් ලෞකික සම්පත් අත්හැරිය යුතුය යන අප්‍රකාශිත හැඟීම ඔහු විසින් ඉදිරිපත් කරන ලද අශුභවාදී දර්ශනය සාධාරණීකරණය කිරීම සඳහා ශොපන්හවර්ට මහත් රුකුලක් විය. බයිබලයේ නව තෙස්තමේන්තුව ලියා තිබෙන්නේ ඉන්දියානු මූලාශ්‍ර විශේෂයෙන්ම බෞද්ධ මූලාශ්‍ර ඇසුරින් බව ශොපන්හවර් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. නව තෙස්තමේන්තුවේ ඇතුළත් සියලුම වැදගත් අංග ඉන්දීය පුරෝගාමී ග්‍රන්ථවල ඇතුළත් කරුණු වලට විශ්මය ජනක අයුරින් සමාන බව ඔහු ප්‍රකාශ කළේය. ජීවිතය දෙස අවිස් ලෙස බැලීමේ ආකල්පය, ආචාර ධර්ම පද්ධතිය, පැලවුනු පිදුම් අශුභවාදී ආකල්ප, දෙවියන් මනුෂ්‍ය ස්වරූපයෙන් ලොව පහළවීම වැනි අදහස් නෛසර්ගික වශයෙන් ඉන්දියානු අදහස් බව ඔහු ප්‍රකාශ කළේය. එපමණක් නොව, බ්‍රාහ්මණ ආගමත්, බුද්ධාගමත් නව තෙස්තමේන්තුවත් මූලික වශයෙන් සමාන බව ශොපන්හවර් ප්‍රකාශ කළේය.

ශොපන්හවර් ඉන්දියාව සහ ක්‍රිස්තියානිය පිළිබඳ තම සිතුවිලි ලේඛන ගතකළ කාලයේදීම ඉසාක් ජේකබ් ස්මිට් (Isaak Jakob Schmidt) නමැති රුසියන් රාජ්‍යදූතයකු (1772-1847) මධ්‍යම ආසියාවේ කැල්මුක් (Calmuck) හි සරෙප්ටා (Sarepta) නැමැති ස්ථානයට පැමිණියේය. මොංගෝලියානු සහ ටිබෙට් භාෂා සහ සාහිත්‍යය පිළිබඳ ගැඹුරු

අවබෝධයක් ඉතා ඉක්මනින් ලබාගත් ඔහු බයිබලයේ කොටස් මොංගෝලියානු භාෂාවට අයත් උප භාෂාවක් වූ කැල්මුක් භාෂාවට පරිවර්තනය කළේය. මොස්කව් නුවර ඇතිවූ ගින්නකදී ඔහු සතුව පැවති වටිනා අත්පිටපත් වල එකතුවක් විනාශ වී යාම නිසා ඔහුගේ අධ්‍යයන කටයුතු වලට විශාල වශයෙන් බාධා පැමිණියේය. කෙසේ වෙතත් පළමුවන ශතවර්ෂයේ මුල් ආරම්භයේදී ඇලෙක්සැන්ඩ්‍රියාව සහ සිරියාව අතර පිහිටි ප්‍රදේශවල බිහිවූ ක්‍රිස්තියානි සහ නොස්ටික් (gnostic) සංකල්පය (ලෝකෝත්තර ඥානය) බුද්ධ ධර්මයට කිට්ටු සම්බන්ධයක් තිබෙන බව පැහැදිලි කරමින් ඔහු ඉතා වැදගත් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් රචනා කළේය. එය අද දක්වාත් මේ සම්බන්ධයෙන් කරන ලද හොඳ අත්හදා බැලීමක් ලෙස සලකනු ලැබේ.[12] බෞද්ධ බලපෑම යටතේ ඔහු විසින් ශොපන්හවර් පිළිබඳ ලියන ලද ලිපි ලේඛන මගින් බටහිර දර්ශනයට විශාල සේවයක් සැලසී ඇත. මෙම තේමාව ඔස්සේ කරනු ලැබූ සියලුම පරීක්ෂණ තුලනාත්මක වශයෙන් පරිපූර්ණවූත්, විද්‍යාත්මක වශයෙන් අවංකවූත්, අධ්‍යයනයන් වූයේ නම් එය පුදුමයට හේතුවිය හැකිය. ඇත්ත වශයෙන්ම ඒවා ආගමික මතභේදයන් හේතුකොට ගෙන අපක්ෂපාතී සහ සාධාරණ විද්‍යාත්මක පර්යේෂණද, එසේ නැත්නම් හුදෙක් ප්‍රචාරාත්මක වැඩ පිළිවෙළවල්ද, යන්න පිළිබඳව පැහැදිලි අදහසක් ඇතිකර ගැනීම දුෂ්කර වී තිබේ.

කල්කටාවට නුදුරින් පිහිටි චන්ද්‍රනගර් නැමැති ප්‍රංශ යටත් විජිතයේ විනිශ්චයකාරවරයෙකු වශයෙන් කලක් සේවය කළ ලුවී ජැකොලියට් (Louis Jacolliot) නමැති පුද්ගලයා විසින් බයිබලයේ සමහර අංශවල දක්නට ලැබෙන ඉන්දීය මූලාශ්‍ර පිළිබඳව පොතක් ලිවේය. එය ඉතා ඉක්මනින් ප්‍රසිද්ධියට පත්විය. 1869 වර්ෂයේදී පළ කරනු ලැබූ "La Bible dans l'Inde" නැමැති එම පොතේ සඳහන් කරුණු බොහෝ දෙනෙකුගේ ප්‍රසාදයට හේතු වූ අතර සමහරෙක් කෝපාවිෂ්ටව එම අදහස් දැඩි ලෙස විවේචනය කළහ. කෙසේ වෙතත් එම පොත බුදු දහම සහ ක්‍රිස්තියානිය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ වඩා තීව්‍ර ශාස්ත්‍රීය සාකච්ඡාවක් ඇති කිරීමට හේතුවිය. සමහරෙක් එම සාකච්ඡාවට සහභාගී වූයේ ඔහුගේ අදහස් නිෂ්ප්‍රභ කිරීමේ පරමාර්ථයෙනි. මෙම සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් දහ නව වැනි ශත වර්ෂයේ අවසාන දශක දෙකේ සිට පළමුවන ලෝක යුද්ධය දක්වා වූ කාලය මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වඩාත් ඵලදායී පර්යේෂණ සිදු කරනු ලැබූ අවධියක් බවට පත්විය.

ක්‍රිස්තියානි භක්තිකයින්ට ඇදහිය නොහැකි තරමට බයිබලය ලියූ කතුවරයින් විසින් ඉන්දීය මූලාශ්‍ර වලින් කරුණු ණයට ගෙන ඇතිබව ස්ථිරවම ප්‍රකාශ කරමින් ජැකොලියට් ශාස්ත්‍රීය ලෝකයට අභියෝගයක්

ඉදිරිපත් කළේය. බ්‍රහ්මයා විසින් මුල්ම මිනිසාවූ 'ආදිම' (Adima) සහ ඔහුගේ සහකාරිය වූ 'හේවා' (Heva) මවා ඔවුන්ට ශ්‍රී ලංකා දූපත පදිංචිය සඳහා වෙන්කර දුන්බව කියවෙන බ්‍රාහ්මණ ආගමේ සඳහන් මැවීම පිළිබඳ මිථ්‍යාව ඔහු ඉදිරිපත් කළේය. සංස්කෘත භාෂාවෙන් 'ආදිම' යනුවෙන් අදහස් කරන්නේ 'මුල්' හෙවත් 'පළමු' යන අර්ථයයි. ඈඩම් (Adam) යන හීබෲ වචනයේ එවැනි අර්ථයක් නොමැත. ඇත්ත වශයෙන්ම ඉහත කී කරුණු ඇතුළත් පොත පත සාක්ෂි වශයෙන් නොහැර දක්වමින් ඉදිරිපත් කර ඇති එම සොයාගැනීම් වලින් අදහස් කරන ලද්දේ කරුණු එතරම් හොඳක් පාඨකයාට ඒවා ඒත්තු ගැන්වීමත්, විද්වතුන් ලවා එම සොයාගැනීම් වල ඇති නිරවද්‍යතාවය පරීක්ෂා කරවීමත්ය. මැවීම පිළිබඳ වූ මෙම විස්තරය දක්නට ලැබෙන්නේ භවිෂ්‍යත්-පුරාණ (Bhavisyat-Purana) නමැති වේද ග්‍රන්ථයේය. 1897 වසරේදී බොම්බායේදී ප්‍රසිද්ධ කරන ලද මෙම පුරාණ ග්‍රන්ථවල පාරාදීසයේ මුල් පුද්ගලයන්ගේ පටන් මහා ජල ගැල්ම දක්වාත් වූ පරණ තෙස්තමේන්තුවේ සමස්ත ආරම්භයත් ඇතුළත් වී තිබේ. එහි නෝආ (Noah) සඳහන් කර තිබෙන්නේ නුයුහා (Nyuha) යනුවෙනි. මෙහිදී ජැකොලියට් නිවැරදිද? බයිබලයේ මුල් පිටුවල තිබෙන්නේ යුදෙව් ජාතිකයින්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සකස් කර ගන්නා ලද බ්‍රාහ්මණ ග්‍රන්ථවල අඩංගු කරුණුද? සත්‍යය එය නොවේ. 'පුරාණ ග්‍රන්ථ' යනු අතීතයෙන්ම නම්‍ය වූ සාහිත්‍ය නිර්මාණ වුවත් ඒවා කාලානුරූපව අනුවර්තනය කරනු ලබන බවත් බාහිර (Alien) කරුණු ඒවාට ඇතුළත් කර ඇති බවත් අද දක්වා විහිදෙන අනාගත වාක්‍ය ඛණ්ඩ ඒවාට ඇතුළත් කර ඇති බවත් එම ග්‍රන්ථ පිළිබඳ දැනීමක් ඇති හැම කෙනෙක්ම දන්නා කාරණයකි. ඉතා පැරණි ග්‍රන්ථයක් ලෙස සැලකෙන "භවිෂ්‍යත්-පුරාණයේ" (Bhavisyal-Purana) ක්‍රි. පූ. 400 පටන් පැවති අතර ඊට අයත්වූ දීර්ඝ ඉතිහාසය මුළුල්ලේදී එය කලින් කලට අලුත් කරමින් ඉදිරිපත්කර ඇත. එහි 1897 වර්ෂයේ සංස්කරණයට ජෙන්ගිස් ඛාන් (Genghis Khan) (1155-1224), ටිමූර් (Timur) (1336-1405), කබීර් (Kabir) (දහසය වැනි ශතවර්ෂය), අක්බාර් රජතුමා (1556-1605) සහ රුසියාවේ සාර් රජතුමා පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. බයිබලයේ දැක්වෙන මැවීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය ඊට ඇතුළත් කර තිබෙන්නේ මෑතකදී විය හැකිය. එනිසා එම ග්‍රන්ථ වල චිරස්ථිතිය සඳහා කටයුතු කරන කතුවරයින්ට ඒවාට අලුත් විස්තර ඇතුළත් කිරීමෙන් රවටීමක් කරන්නේ යැයි චෝදනා නැගිය යුතු නොවේ. ආගමික සම්ප්‍රදායට අයත් පොත් පත්වලින් කරුණු ණයට ගැනීම ලේඛන රීතියේ දක්නට ලැබෙන නිතර සිදුවන සාමාන්‍ය දෙයකි.[10]

ජැකොලියට් තම විවේචන කාලය සංස්කෘත සහ හින්දු ශුද්ධ ග්‍රන්ථ

කියවීම සඳහා කැප කළේය. එහෙත් ඔහු බ්‍රාහ්මණයින් සමඟ කරනු ලැබූ සාකච්ඡාවලින් පමණක් බොහෝ අදහස් ලබාගැනීමේ වරද සිදුකළේය. ඔහු සමඟ සංවාදයේ යෙදුනු කපටි බ්‍රාහ්මණයෝ ව්‍යාජ කරුණු ඉදිරිපත් කරමින් ජැකොලියට් මුලා කළහ. ඔහු වේදග්‍රන්ථ වලින් උපුටා දක්වා ඇති බවට සඳහන් සමහර කරුණු කිසිම වේදග්‍රන්ථයක දක්නට නොලැබේ. එපමණක් නොව, තම සොයා ගැනීම් අපූර්ව ලෙස සලකා ඒවා සංස්කෘත වචන වල නිරුක්ති විග්‍රහයක් ලෙස විචිත්‍ර ලෙස ඉදිරිපත් කර ඇත. නමුත් ඔහු විසින් ඉදිරිපත් කර ඇති සමහර වචන සංස්කෘත භාෂාවට අයත් නොවේ. සමහර වචන සංස්කෘත භාෂාවේ වචන වුවත් ඒවායේ අර්ථය ඔහු අදහස් කළ අර්ථයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්ය.

මෙසේ, මෙම ක්ෂේත්‍රය පිළිබඳ කරුණු සෙවීම සඳහා පැවති අවිචාරවත් උද්‍යෝගය නිසා විශ්වාස කිරීමට පවා අපහසුවූ කරුණු ඉදිරිපත් කරමින් පොත පත පළකිරීමට හේතුවිය. පැරණි ඊජිප්තු, පර්සියන්, ග්‍රීක්, රෝමන්, යුදෙව් සහ ජර්මන් ශිෂ්ටාචාරවල දක්නට ලැබෙන වැදගත් ලක්ෂණවල ප්‍රභවය ඇතිවූයේ ඉන්දියාවේ බවත්, එපමණක් නොව මෝසස් පවා ඉන්දියානු ඉගැන්වීම් වල ඇතුළත් කරුණු දැනගත්තේ ඔහු ඊජිප්තුවේ වාසය කළ කාලයේදී බව සඳහන් කරමින් ටී. ජේ. පලාන්ජ් විසින් ක්‍රිස්තුස් වහන්සේ ඉන්දියානු ජාතිකයෙක්ද? යනුවෙන් මතභේදයට තුඩුදෙන අන්දමේ මාතෘකාවක් (Christus-Ein-Inder?) යටතේ පොතක් ප්‍රසිද්ධ කළේය.

අනෙක් අතට ජැකොලියට් විසින් මෙම ගැටලුව සම්බන්ධයෙන් මධ්‍යස්ථ පර්යේෂණ පැවැත්වීම සඳහා හේතුවක් ඉදිරිපත් කළේය. මේ සම්බන්ධයෙන් මූලිකත්වය ගත් පුද්ගලයින් අතුරෙන් ලිප්සිග් විශ්වවිද්‍යාලයයේ දර්ශන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයා වූ රුඩෝල්ෆ් සෙයිඩල් (Rudolf Seydel) (1835-1892) වැදගත් තැනක් උසුලයි. ෂොපන්හවර්ගේ කෘති ඉතා විශිෂ්ට අන්දමින් විග්‍රහ කර ඉදිරිපත් කිරීම නිසා ඔහු මහත් ප්‍රසිද්ධියට පත්විය. ඉතා උසස් ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක්[4] ඉදිරිපත් කරමින් ශුද්ධ ලියකියවිලි බෞද්ධ ග්‍රන්ථ වලින් ණයට ගත් කරුණුවලින් පිරී තිබෙන බව පෙන්නුම් කිරීමට ඔහු සමත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ ඉගැන්වීම් අනුව සකස් කරනු ලැබූ ක්‍රිස්තියානි ග්‍රන්ථයක් පදනම් කරගෙන නව තෙස්තමේන්තුව ලියා ඇති බව සෙයිඩල් නිගමනය කළේය. ක්‍රිස්තියානි ශුභාරංචිය ලිවීමට පෙර පවා සිරියාවේ සහ පලස්තීනයේ බෞද්ධ පොත පත ව්‍යවහාරයේ පැවති බවත් එකී ග්‍රන්ථ ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් විසින් තම අදහස් වලට ගැළපෙන පරිදි අනුවර්තනය කරගත් බවත් ඉන් අදහස් වේ.

මෙය විද්වතුන්ට මුහුණ දීමට සිදුවූ විශාල අභියෝගයක් විය. ජැකොලියට් සහ ඔහුගේ අනුගාමිකයින්ගේ අදහස් මෙන් නොව සෙයිඩල්ගේ සොයාගැනීම පහසුවෙන් ප්‍රතික්ෂේප කළ නොහැකි විය. මේ පිළිබඳව තර්කානුකූලව කරුණු විමසා නොබැලූ බොහෝ විද්වතුන්ගේ අදහස වූයේ ක්‍රිස්තියානියේ මූලික විශ්වාස පිළිබඳ ප්‍රශ්න කිරීම ආගම කෙලෙසීමක් බවය. ඒ අනුව සෙයිඩල් විසින් කර ඇත්තේ ක්‍රිස්තියානි පර්යේෂකයකු විසින් පූජනීයත්වයෙන් සැලකිය යුතු සීමාවන් අභිබවා යාමකි. උදාහරණයක් වශයෙන් කිසිම ගැටලුවකින් තොරව පයිතගරස් ඉසීම ලබාගත්තේ ඉන්දියානු ඉගැන්වීම් තුළින් බව ඉන්දු ආර්ය ඉතිහාසය පිළිබඳ විශේෂඥයකුවූ ලියෝපෝල්ඩ් වොන් ශ්‍රොඩර් (Leopold von Schroeder) විසින් පිළිගත්තද, ක්‍රිස්තියානි ආගම කෙරෙහි බුද්ධාගමේ බලපෑමක් ඇති වී තිබෙන බව පිළිගැනීමට ඔහු මැලිවූයේය. එපමණක් නොව සෙයිඩල් විසින් ඉදිරිපත් කර ඇති න්‍යායයන් වියරුවෙන් කරන ලද ප්‍රකාශ ලෙස සලකා ඔහු ඒවා ප්‍රතික්ෂේප කළේය. ආගමික විශ්වාස සම්බන්ධයෙන් පවත්නා අගතිය මැඩ පවත්වා ගැනීම කෙතරම් දුෂ්කරද යන බව ශ්‍රෝඩර් විසින් එවැනි අදහස් දැරීමෙන් පැහැදිලි වේ. එපමණක් නොව බටහිර සංස්කෘතියේ දීර්ඝ කාලයක් තිස්සේ මුල් බැසගෙන තිබූ පුද්ගල විශ්වාස අභියෝගයට ලක් කිරීම නිසා ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයේ තීව්‍රතාවය කෙතරම්ද යන්න ඉන් පැහැදිලි වේ. වාසනාවකට මෙන් සෙයිඩල්ගේ අදහස් පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතුයයි ප්‍රකාශ කරමින් තවත් විද්වත්හු කීප දෙනෙක්ම ඒ පිළිබඳ අවධානය යොමු කළහ. නමුත් ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබූ ඉන්දියානු මූලාශ්‍ර වලින් ඍජුව ගත් කරුණුවල වැදගත් කම පිළිබඳව ඔවුන් කළ ඇගයීම් එකිනෙකට වෙනස් වුවත්, බොහෝ දෙනෙක් සෙයිඩල්ගේ සොයා ගැනීම් පිළිගත්හ. ජී. ඒ. වැන්ඩන් බර්ග් වැන් අයිසින්ගර් (G. A. van den Bergh van Eysinga), රිචඩ් ගාබේ (Richard Garbe) සහ හිල්කෝ වියර්ඩෝ ෂෝමේරස් (Hilko Wiardo Schomerus) වැනි විද්වතුන් විසින් ලියා ඇති පර්යේෂණාත්මක ග්‍රන්ථ මේ සම්බන්ධයෙන් ඇති වඩා වැදගත්වූත් විශේෂ අවධානයට යොමු වූත් කෘති සමහරෙකි.[11] ඇමරිකානු ජාතික විද්වතෙකු වූ ඇල්බට් ජේ. එඩ්මන්ඩ්ස් (Albert J. Edmunds) විසින් සංග්‍රහයක් ලෙස සකස් කරන ලද තුලනාත්මක ලේඛන සැබෑ අනුමිණ කෝෂ්ඨාගාරයක් ලෙස හැඳින්වීමට පුළුවන.[12] බුදු දහම, කිතු දහම මගින් පෝෂණය වී තිබෙන බව කෙලින්ම සඳහන් නොකර ඔහු බෞද්ධ ලේඛන සම්භාරයෙන් කොටස් කීපයක් තෝරාගෙන එකී කොටස් නව තෙස්තමේන්තුවේ සඳහන් කරුණු සමඟ සංසන්දනය කර ඉදිරිපත් කළේය. ඒවායේ බහුල වශයෙන් දක්නට ලැබෙන විස්මයජනක සමානකම් පිළිබඳ විග්‍රහ කිරීමේ කාර්යය ඔහු අනෙක් විද්වතුන්ට භාර කළේය.

මහා පිබිදීම

බෞද්ධ ඉගැන්වීම් යොදාගෙන ඇත්තේ කෙසේද කියා පරීක්ෂාකර බැලීමට ප්‍රථම අපි අතීතයට ගමන් කළ යුතු වෙමු. එම ගමන පැරණි ශිෂ්ටාචාරවලට අයත් වූ ශ්‍රේෂ්ඨ සංස්කෘතීන් හරහා විහිදෙන්නාවූත්, විවිධ අදහස් දැරුවාවූත්, වෙනස් ජීවන දර්ශනවලට අනුව ජීවත්වූවාවූත්, මිනිසුන් අතර පැවති අන්තර් සම්බන්ධතාවයන් සහ ඔවුනොවුන් අතර පැවති සන්නිවේදන ක්‍රම පිළිබඳ කරුණු සොයා යන්නාවූත්, දුර බැහැර රටවල වාසය කළ මිනිසුන් ඈත අතීතයේදී ජීවත්වූයේ එකිනෙකා පිළිබඳ අවබෝධයකින් යුතුවද, තමන්ට නුහුරු අදහස් ග්‍රහණය කර ගැනීමට ඔවුන්ට හැකිවිණිද, වැනි ප්‍රශ්න වලට පිළිතුරු සොයමින් යන්නාවූත් චිත්තාකර්ෂණීය ගමනකි. දැනට ශත වර්ෂ කීපයකට පෙර පැවති යුගයේදී ඈත මහාද්වීප වලට පහසුවෙන් ගමන් කළ හැකි මුහුදු මාර්ග පිළිබඳව මිනිසුන් නොදැන සිටියා පමණක් නොව එවැනි දුර බැහැර ප්‍රදේශවලට ගමන් කිරීම අන්තරාදායක සහ දුෂ්කර වූ ක්‍රියාවක් ලෙස සලකනු ලැබිය. ඒ අනුව තාක්ෂණික දියුණුව ඉතා පහත් මට්ටමක පැවති යුගවලදී දුර බැහැර රටවල් සමඟ සම්බන්ධතා පැවැත්වීම කොතරම් දුෂ්කර කාර්යයක් වන්නට ඇත්ද යනු අපට සිතාගත හැකිවේ.

ක්‍රිස්තු පූර්ව 800 සිට 200 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මිනිසාගේ බුද්ධිමය ඉතිහාසයේ අද්විතීය දියුණුවක් ඇතිවිය. සුප්‍රසිද්ධ ජර්මන් ජාතික දාර්ශනිකයකු වූ කාල් ජැස්පර්ස් (Karl Jaspers) එම දියුණුව ඇතිවූ ආකාරය ඓතිහාසික අභිරහසක් (Historical Mystery) ලෙස හඳුන්වා තිබේ. ලෝකයේ එකිනෙකට වෙන්ව පිහිටි ප්‍රදේශ තුනක එක සමාන දියුණුවක්, එනම් ඉතා උසස් මට්ටමේ බුද්ධිමය ප්‍රබෝධයක් ඇතිවූ බව අපට පෙනේ. එම බුද්ධිමය ප්‍රබෝධය ඇතිවූයේ එකිනෙකට සමාන්තරව වුවත් එය ඇතිවූයේ එකිනෙකින් වෙන් වෙන්ව ස්වායත්තතාවය[17]. ජැස්පර්ස් එම යුගය ඇක්සිස් ටයිම් (Axis Time) යනුවෙන් හඳුන්වා තිබේ. බුද්ධිමය චින්තනයේ පෙර නොවූ විරූ උසස් දියුණුවක් ඇතිවූ මෙම යුගයේදී ශ්‍රේෂ්ඨ දර්ශනවාද සහ බුදුන් වහන්සේ, කොන්ෆියුසියස්, ලාඕ සේ, ප්ලේටෝ, සොක්‍රටීස්, ශරතුස්ත්‍ර, එලිජා, ජෙරමියා වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයින් පහළ වූහ. ඔවුන් ඉදිරිපත් කළ දර්ශන සහ මතවාද ඊට පසුව එළඹුන ශතවර්ෂ වලදීත්, අද දක්වාත් මානව චින්තනය හැඩ ගැස්වීම කෙරෙහි තීරණාත්මක ලෙස බලපෑවේය. ඔවුන් සියලු දෙනාටම ලෝකය සහ එහි පැවැත්ම පිළිබඳ තර්කානුකූලව අවබෝධකර ගැනීමේ අපූර්ව හැකියාවක් තිබුණි. එමෙන්ම ලෝකයේ පවතින සෑම දෙයක්ම මූලික වශයෙන් පුද්ගල නිශ්‍රිත සහ වාස්තවික (Subject and Object), ආධ්‍යාත්මික

සහ භෞතික (Spirit and Matter), නාම හා රූප (Mind and body) වශයෙන් කොටස් දෙකකට බෙදී ඇති බවත් සැබෑ ආත්මය (true self) උපද්‍රවයන්ගෙන් පිරීගිය ලෞකික තත්වයෙන් මිදී විමුක්තිය ලබා ගැනීම සඳහා මහත් ආශාවෙන් පසුවන බවත් ඔවුන්ගේ නිගමනය විය. නිදහස සහ විමුක්තිය අපේක්ෂා කරන්නේත්, මෙලොවදීම එය සාක්ෂාත් කරගැනීමට හැකිවන්නේත් ශරීරය තුළ සැඟවී සිටින ආශාවන්ගෙන් වෙලීගිය තමා පිළිබඳ එතරම් පැහැදිලි අවබෝධයක් නොමැති සැබෑ මිනිසා විසින් පමණි.[8]

මානව විඥානයේ ඇතිවන පරිණාමය තුළින් මානව වර්ගයාගේ පරිණාමය පිළිබිඹු වන බව ප්‍රකාශ කරන අදහස චින්තාකර්ෂණීය මතයකි. ප්‍රාග් ඓතිහාසික යුගයේදී පැවති ආගමික සහ සංස්කෘතික සාධනයන්ගේ වර්ධනය පිළිබඳව සලකා බැලීමේදී ගුප්ත ලෙස පෙනී යන සමහර සිදුවීම් පැහැදිලි කර ගැනීම සඳහා ඉන් ලැබෙන්නේ මහඟු රුකුලකි. එකම අවධියකදී ලෝකයේ විවිධ රටවල එක සමාන විශ්වාස විධි ඇතිවූයේ කෙසේද? උදාහරණයක් වශයෙන් ක්‍රි. පූ. දසවන සහස්‍රකයේදී (ක්‍රි. පූ. 10,000) දඩයම් කිරීම සහ ආහාර එකතු කිරීම මත පදනම් වූ ආර්ථික රටාව වෙනුවට ලෝකය පුරා සමාජීය සහ දේශපාලන පිබිදීමක් ඇති කරමින් ජගත් මාතා පිදීම කේන්ද්‍ර කොටගත් කෘෂිකාර්මික හා නාගරික ජනාවාස සංස්කෘතියක් බිහිවීම දැක්විය හැකිය. නමුත් මෙම වෙනස්වීම් වලට භාජනය වූ විවිධ ජන කොටස් අතර කිසිම සම්බන්ධතාවයක් පැවතුණේ නැත. ස්වභාවික පරිණාමයේ ක්‍රියාවලිය සිදුවන්නේ ජීව විද්‍යාත්මක මට්ටමෙන් පමණක් නොවන බවත් එය මානව බුද්ධියේ සහ ජීව ශෛලියේද ඇතිවන ක්‍රියාවලියක් බවත් තේරුම් ගැනීමෙන් මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා ගත හැකිවේ. මානව විඥානයේ සිදුවන මෙම පරිණාමය පැහැදිලි ලෙස වෙන්කර හඳුනාගත හැකි අවස්ථා කීපයකදී සිදුවේ. සංවර්ධනය පිළිබඳ අලුත් දියුණුවක් ඇතිවූ විට එය ආගමික සංස්ථා, සමාජ සංවිධානය, කලාව සහ ගෘහ නිර්මාණ ශිල්පය වැනි විවිධ මාධ්‍ය තුළින්, කොටින් කියතොත් ශිෂ්ටාචාරයට සහ සංස්කෘතියට අදාළ විවිධ සාධනයන් තුළින් විද්‍යමාන වේ.

පරිණාමය යනු පියවරෙන් පියවර ක්‍රමානුකූලව සිදුවන ක්‍රියාවලියක්ය යන කාරණය පිළිබඳව ජැස්පර්ස් මෙහිදී සැලකිල්ලක් දක්වා නැති වුවත් අලුතින් ඇතිවූ එම ආධ්‍යාත්මික පිබිදීම ඉහත සඳහන් කළ බුද්ධිමය යුගය බිහිවීමට හේතු වන්නට ඇතැයි යනු ඔහුගේ මතය විය. ඉන් පෙර බිහිවූ දියුණු සංස්කෘතිවලට වඩා එවැනි යුගයක් පැහැදිලි දින වකවානු සහිතව වඩා නිවැරදිව හඳුනාගැනීමට පුළුවන.

ජැස්පර්ස් ගේ මෙම මතයේ කිසියම් සත්‍යයක් තිබෙන බව සැබෑය. එහෙත් බුද්ධිමය චින්තනයේ විශාල දියුණුවක් ඇතිවූ යුගයේදී විවිධ සංස්කෘතීන් අතර දක්නට ලැබෙන මෙම සහසම්බන්ධතාවය කෙතරම් දුරට අන්තර්ජාතික සම්බන්ධතා වර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන්නට ඇත්ද කියා කෙනෙකුට ප්‍රශ්න කළ හැකිය. අද ලෝකය පුරා ලැව් ගින්නක් සේ පැතිර යන විලාසිතා රැල්ල කිසියම් අප්‍රකටවූත් සමගාමීව සිදුවන්නාවූත්, ස්වායත්තව ප්‍රකාශ වන්නාවූත් ක්‍රියාවලියක් ලෙස කිසිවෙක් නොපිළිගනී. නූතන සන්නිවේදන පහසුකම් නිසා එවැනි මහා පරිමාණ ගෝලීය ප්‍රවනතාවයන් ක්ෂණිකව ඇතිවීමට අවශ්‍ය පහසුකම් සැලසී තිබේ. මෙම ක්‍රියාවලියේ ආරම්භය ඇතිවූයේ දැනට අවුරුදු දහස් ගණනකට පෙරය. දුරස්ථ ප්‍රදේශවල ජීවත් වූ මිනිසුන් අතර පෙර නොවූ විරූ අන්දමේ සම්බන්ධතාවයක් ඇති කරමින් අසාමාන්‍ය චලතාවයකින් (Mobility) යුක්තව කිසියම් නව යුගයක් නිර්මාණය වෙමින් පැවති අවධියකදී ඇක්සිස් ටයිම් යනුවෙන් හඳුන්වා ඇති මෙම චින්තන යුගය බිහිවිය. මෙම චලනතාවය ඇතිවූයේ හුදෙක් බාහිර වශයෙන් පමණක් නොවේ. එයට කැපී පෙනෙන බුද්ධිමය නම්‍යතාවයක්ද තිබුණි. බටහිර, මැදපෙරදිග, පර්සියාව, ඉන්දියාව, සහ චීනය වැනි රටවලින් ලැබී තිබෙන තොරතුරු සලකා බැලීමේදී එවැනි සමානකම් ඇතිවී තිබෙන්නේ විදේශීය සම්ප්‍රදායන්ගේ බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් යැයි නිගමනය කිරීමට තරම් අප මෙහිදී ඉක්මන් නොවිය යුතුය. කෙසේ වෙතත්, ගෝලීය මට්ටමෙන් සලකා බැලීමේදී මානව අසහනයේ (Human Unrest) පිළිබිඹුවක් ලෙස පෙනී යන මෙම නව චලනතාවය මානව විඥානයේ සිදුවන පරිණාමයේ පැතිකඩක්ද පෙන්නුම් කරන බව අප අමතක නොකළ යුතුය. මේ දෙඅංශයේම ඇතිවන වෙනස්වීම් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක කෙරෙහි බලපායි. කලින් ජීවත් වූ ගෝත්‍රික ප්‍රදේශ අතහැර දමා මිනිසුන් අලුත් පරිසරයකට සංක්‍රමණය වීම නිසා ඔවුන්ට නුහුරු නුපුරුදු ජන කොටස්, සිරිත් විරිත්, ආකල්ප, සත්ව හා ශාක ආදී අලුත් දේ පිළිබඳ දැනගැනීමට හැකිවිය. මේ නිසා ලෝකයේ විශාලත්වය පිළිබඳ අවබෝධයක් ඔවුන්ට ලැබිණි. මෙකී කරුණු හේතු කොටගෙන මිනිසාගේ චින්තන ක්ෂේත්‍රයද පුළුල් විය. මිනිසුන් විවිධ ප්‍රදේශ වලට මහා පරිමාණයෙන් සංක්‍රමණය වීම කෙරෙහි ප්‍රධාන හේතු දෙකක් බලපෑවේය. ඉන් පළමුවැන්න සාම්ප්‍රදායික විශ්වාස පිළිබඳව ඔවුන් තවදුරටත් සෑහීමකට පත් නොවීමය. දෙවැනි හේතුව වූයේ නව අභියෝග වලට මුහුණ දීමට සහ අලුත් දේ සොයා යෑම පිණිස ඔවුන් පොළඹවනු ලැබූ මානව විඥානයේ ඇති වූ මෙම මහා විප්ලවකාරී පිබිදීමය.

මිනිස් ඉතිහාසයේ එවැනි විප්ලවකාරී පිබිදීමක් ඇතිවූ හැම අවස්ථාවකදීම මිනිසුන්ගේ හැසිරීම් රටාවේ වැදගත් වෙනස්වීම් සිදුවිය. ක්‍රිස්තු පූර්ව තුන්වන සහස්‍රකයේදී විවිධ රටවල ජීවත් වූ මිනිසුන් අතර ගොඩබිම් සහ මුහුදු මාර්ග හරහා වෙළඳ සම්බන්ධතා ඇතිවීම තුලින් මෙම වෙනස්වීම් අපට දැකගත හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නයිල්, යුප්‍රටීස්, ටයිග්‍රිස්, ඉන්දු වැනි ප්‍රධාන ගංගා නිම්න ආශ්‍රිතව ඉතා වැදගත්වූත්, උසස් වූත්, ශිෂ්ටාචාර බිහිවිය. එම ශිෂ්ටාචාර අතර පැවති අන්තර්ජාතික සම්බන්ධතා බිඳවැටුණේ ක්‍රි. පූ. දෙවන සහස්‍රකයේ දෙවන භාගයේදීය. උතුරු සහ මධ්‍යම ආසියාවෙන් විශාල පරිමාණයෙන් පැමිණි ආක්‍රමණිකයින් දකුණු යුරෝපියාවේ වඩා සාරවත් වූත්, ඛනිජ ද්‍රව්‍ය වලින් පොහොසත් වූත් ප්‍රදේශවලට සංක්‍රමණය විය. මෙම ආක්‍රමණිකයෝ සමහර විට ඔවුන් ආක්‍රමණය කළ රටවල පැවති දියුණු සංස්කෘතීන් සමඟ මිශ්‍රවූහ. සමහර විට ඒවා විනාශ කර දැමූහ. මෙසේ ක්‍රි. පූ. දෙවන සහස්‍රකයේ සහ පළමු සහස්‍රකයේ ආරම්භයේදී පැමිණි නව පදිංචි කරුවෝ ස්ථිර වාසස්ථාන පිහිටුවාගෙන ක්‍රම ක්‍රමයෙන් වෙළඳ සම්බන්ධතා ආරම්භ කළහ. එම සම්බන්ධතා වඩා සමීප වීමත් ක්‍රමවත් වීමත් සමඟ මිනිස් චින්තන ඉතිහාසයේ සිදුවූ වෙනස්කම් තේරුම් ගැනීම තරමක් දුෂ්කර කාර්යයක් වේ. අපට දක්නට ලැබෙන විවිධ සංස්කෘතීන් අතර පවත්නා මෙම සමගාමී ලක්ෂණ කෙතරම් අසාමාන්‍යද, සිත්ගන්නා සුළුද යත් අපට එම සමානකම් තවදුරටත් ජැස්පර්ස් විසින් ඉදිරිපත් කරනු ලැබූ ඔහු විසින් ඇක්සිස් ටයිම් යනුවෙන් හඳුන්වනු ලැබූ මානව චින්තනයේ විශාල පිබිදීමක් ඇතිවූ යුගයේදී ඇතිවූ දියුණුව ඓතිහාසික අභිරහසක් ලෙස පිළිගත හැකිනොවේ. විවිධ සංස්කෘතීන් අන්තර්ජාතික වශයෙන් එකිනෙකට සම්බන්ධවීමේ ක්‍රියාවලිය වේගයෙන් සිදුවේ. මිනිස් චින්තනයේ මහත් පෙරළියක් සිදුවූ යුගයක ඇති වූ එම වෙනස්කම් වර්තමානයේ සිදුවෙන්නාක් මෙන් හැගේ.

ඇක්සිස් ටයිම් යනුවෙන් හැඳින්වෙන යුගයේ ආරම්භයේදී පවා ග්‍රීසියේ සිට චීනය දක්වා වූ රටවල ජීවත් වූ මිනිසුන් එකල පැවති තාක්ෂණික දැනීමට සාපේක්ෂව සලකා බලන විට විශ්වාස කිරීමට පවා අසීරු අන්දමේ පුළුල් සම්බන්ධතා පැවැත්වූහ. දකුණු චීනයේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ ඊජිප්තුවේ වෙළඳුන් වෙත ළඟාවිය. ආගමික අදහස් සහ දාර්ශනික සංකල්ප ඉතා දුර බැහැර ප්‍රදේශවලට පැතිර ගොස් නව සම්ප්‍රදායන් බිහිවීම කෙරෙහි බලපෑ මූලාශ්‍ර බවට පත්විය.

ඇක්සිස් යුගයේදී මානව චින්තනයේ ඇතිවූ මෙම පෙර නොවූ විරූ මහා පිබිදීම හේතුවෙන් ඇතිවූ භෞතික සහ ආධ්‍යාත්මික බලපෑම් නොසලකා හරිමින් හුදෙක් එය සිදුවූයේ අප්‍රකට ඓතිහාසික අභිරහසක්

නිසායැයි ප්‍රකාශ කිරීමෙන් පමණක් සෑහීමට පත්විය හැකි නොවේ. මෙහිදී වඩා තීරණාත්මක සාධකයක් වන්නේ එම යුගයේදී පහළ වූ කැපී පෙනෙන පුද්ගලයින් විසින් හඳුන්වා දෙනු ලැබූ දාර්ශනික සහ ආගමික මතවාදයන්ය. ඒවා එම යුගයේ පැවති බුද්ධිමය දියුණුව පෙන්නුම් කරයි. ජැස්පර්ස් විසින් ප්‍රකාශ කර ඇති පරිදි නිදහස සහ විමුක්තිය ළඟා කර ගැනීම සඳහාත් ස්වාර්ථයේ පමණක් ගැලී සිටීම නිසා අහිමිවූ ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය නැවත ලබා ගැනීම සඳහා මිනිසුන් තුළ පවතින දැඩි ආශාවත් එම දාර්ශනික සහ ආගමික චින්තන ක්‍රියාවලියෙන් පිළිබිඹුවේ.

මිනිසුන් මුහුණ දුන් මෙම භෞතික සහ ආධ්‍යාත්මික දියුණුවේ අනිවාර්ය ප්‍රතිඵලයක් වශයෙන් ඔවුහු සැබෑ ආධ්‍යාත්මික පදනමක් යටතේ මුලින් පැවති සහනශීලී ජීවන ක්‍රමය සහ මානසික තෘප්තිය යළි ගොඩනගා ගැනීමට අපේක්ෂා කළහ. තමන්ට හුරු පුරුදු ජීවිතය ඉවතලා අහිමිව ගිය පාරාදීසයක් සහ අතීතයේ පැවත අහිමිව ගිය ස්වර්ණමය යුග පිළිබඳ මතකය සමඟ ඔවුහු කල්පිත වශයෙන් බද්ධ වූහ. මිනිස් ඉතිහාසයේ එම කාලපරිච්ඡේදයේ සිට අහිමි වී ගිය සදාචාරාත්මක මූලධර්ම, සහ පූර්ණත්වය යළි ලබාගත හැකි ක්‍රමවේදයන් සහ බහුල වශයෙන් බුද්ධිමය මූලාශ්‍ර වලින් ණයට ගත් කරුණු අන්තර් සන්නිවේදන ක්‍රම මඟින් ප්‍රාදේශීය සංස්කෘතික පද්ධතීන් සමඟ බද්ධ කරනු ලැබිය.

මෙහිදී අප විසින් මුලින්ම පිළිතුරු සෙවිය යුත්තේ ප්‍රාග් ක්‍රිස්තියානි යුගයේදී ඉන්දියාව සහ මධ්‍යධරණී ප්‍රදේශ අතර කවර ආකාරයේ සංස්කෘතික සම්බන්ධතාවයක් පැවතියේද යන ප්‍රශ්නයටය. බුද්ධාගම සහ ක්‍රිස්තියානි ආගම අතර දක්නට ලැබෙන සමානකම් ඇතිවූ ආකාරය පැහැදිලි කරගත හැක්කේ එවැනි සම්බන්ධතා පිළිබඳ පැහැදිලි චිත්‍රයක් නිර්මාණය කරගත හැකිනම් පමණි. ඒ කාලයේදී නැගෙනහිර සහ බටහිර රටවල් අතර පැවති සම්බන්ධතාව පිළිබඳව සලකා බැලිය යුත්තේ ක්‍රිස්තුස් වහන්සේ තම ආගමික ව්‍යාපාරය දියත් කරනු ලැබූ. එමෙන්ම ක්‍රිස්තියානි ධර්මය බිහිවූ පලස්තීනය දක්වා එම සම්බන්ධතා ව්‍යාප්තව ගියේ කෙසේද යන කාරණයද සැලකිල්ලට ගනිමිනි.

ඉතිහාසය දෙස මතුපිටින් බැලීමේදී අතීතයේදී මහා බල කඳවුරු එකිනෙකින් ඉතා දුරස්ථව බොහෝ විට එකිනෙකින් වෙන්ව හුදකලාව පැවති බව පෙනේ. සාපේක්ෂ වශයෙන් රටවල් අතර පැවති මෙම හුදකලා බව වරින් වර ඇතිවූ දේශ සීමා අරගල සහ සතුරු රාජ්‍ය තුළට කඩා වැදුනු රණකාමී ආක්‍රමණ නිසා බිඳී ගියේය. පුළුල් වෙළඳ සම්බන්ධතා පැවතුනේ කිට්ටුව පිහිටි රටවල් අතර පමණි. කෙසේ වෙතත් අප

ජීවත්වන සත්ත්වයා ආරම්භ වීමට ප්‍රථම ගත වර්ෂවලදී පැවති අන්තර් ජනිත සම්බන්ධතා මතුකර ගැනීමට අවශ්‍ය තරම් සෑහෙන මූලාශ්‍ර අපට නොමැත. නමුත් ඒ සඳහා දරන පරිශ්‍රමයන් තුලින් විවිධ රටවල් අතර අතීතයේදී බොහෝ සම්බන්ධතා පැවති බව තේරුම් ගැනීමට හැකිවනු ඇත.

දියුණු ශිෂ්ටාචාර බිහිවීම

අපි අවුරුදු 5000 ක් යටගියාවට හැරී බලමු. ඒ කාලයේදී ප්‍රධාන ගංගා නිම්න ආශ්‍රිතව දියුණු ශිෂ්ටාචාර බිහිවිය. නයිල් ගංගා නිම්නය ආශ්‍රිතව ඊජිප්තු ශිෂ්ටාචාරයත්, යුප්‍රටීස්, ටයිග්‍රීස් ගංගා දෙක ආශ්‍රිතව බැබිලෝනියානු ශිෂ්ටාචාරයත් (දෙගම්මැදි රාජ්‍යය), වර්තමාන පකිස්ථානය හරහා උතුරේ සිට දකුණට ගලා බසින ඉන්දු ගංගා නිම්නය ආශ්‍රිතව ඉන්දු නිම්න ශිෂ්ටාචාරයත් බිහිවිය.

ක්‍රි. පූ. 4000 පමණ වනවිට අම්රි (Amri) නමින් හැඳින්වුනු දියුණු සංස්කෘතියක් ඉන්දු ගඟ ආශ්‍රිතව බිහිවී තිබුණි. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් හරප්පා සංස්කෘතිය බිහිවූයේ ඊට පසුවය. ක්‍රි. පූ. 3500 - ක්‍රි. පූ. 2500 දක්වා කාලපරිච්ඡේදය හරප්පා සංස්කෘතියේ ස්වර්ණමය යුගය ලෙස සැලකේ. ඒ කාලයේදී ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සිම්ලා කඳුකරයේ පිහිටි රූපර් (Rupar) නමැති ස්ථානයේ සිට නිරිත දිග පිහිටි සට්කැජන් දෝර් (Sutkagen Dor) යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශය දක්වා සැතපුම් 1000 කට වඩා වැඩි බිම් ප්‍රදේශයක පැතිර තිබුණි. ගංගා පහ යන අර්ථය ඇති අද පන්ජාබ් නමින් හැඳින්වෙන ප්‍රදේශයේ ඉහළ කොටස් ඊට අයත් විය. කතියවාර් අර්ධද්වීපය එහි දකුණු දිග දේශ සීමාව වශයෙන් පැවතුණි. මෙය අති විශාල භූමි ප්‍රදේශයකි. භූමි ප්‍රමාණය අනුව සලකා බැලීමේදී ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පැරණි ඊජිප්තු රාජධානිය මෙන් දෙගුණයක්ද, සුමේර් (Sumer) සහ අකාඩ් (Accad) අධිරාජ්‍යය මෙන් සිව්ගුණයක්ද විශාල විය. ක්‍රි. පූ. 4000 තරම් වූ ඈත කාලයේදී ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ කෘෂිකාර්මික කටයුතු කරන ලදී. ගවයින් ලවා අදින රෝද දෙකක් සහිත කරත්ත භාවිතා කරනු ලැබීය. ඉන්දු නිම්න වැසියන් බර ඇදීම සඳහා ඇතුන් යොදාගත් අතර අශ්වයින් හීලෑ කර ප්‍රයෝජනයට ගත්හ.

හරප්පා ශිෂ්ටාචාරය පැරණිතම මානව ශිෂ්ටාචාර වලින් එකකි. එය අසාමාන්‍ය ආකාරයේ අති විශාල දියුණු තත්වයක පැවතුණි.

ගුණාත්මක අතින් ඉතා උසස් තත්වයක පැවති මැටි බඳුන්, සංකීර්ණ නාගරික සැලසුම් ක්‍රම, ස්නාන පහසුකම් සහ දියුණු සනීපාරක්ෂක ක්‍රම සහ බහුල වශයෙන් විවිධ ලාංඡන සහ දියුණු අකුරු සහිත මුද්‍ර භාවිතා කිරීම ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණ විය (15 රූප රාමුව). හරප්පා යුගයේදී මිනිසුන් ගේ බුද්ධිමය සහ ආගමික ජීවිතය ඉතා උසස් මට්ටමක පැවති බව මෙම මුද්‍රා භාවිතය මගින් පෙන්නුම් කෙරේ. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මූලික ලක්ෂණ සුමේරියානු, ඊජිප්තු සහ බැබිලෝනියානු ශිෂ්ටාචාරවල දක්නට ලැබෙන ලක්ෂණවලට බොහෝ දුරට සමාන විය.

හරප්පා ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු බිහිවූ ශිෂ්ටාචාර වල පැහැදිලි පරිහානියක් දක්නට ලැබේ. හරප්පා ශිෂ්ටාචාරයට පසුව ඇතිවූ ශිෂ්ටාචාරය ජුකාර් (Jhukar) නමින් හැඳින්වේ. ජුකාර් ශිෂ්ටාචාරයට අයත් අළු හෝ දුඹුරු පැහැයෙන් යුක්ත සරල මැටි බඳුන් වලින් ඒ බව පැහැදිලි වේ. එපමණක් නොව එම යුගයට අයත් මුද්‍රා කීපයක් සොයාගෙන ඇති අතර ඒවායේ කිසිම සලකුණක් හෝ සටහනක් දක්නට නොලැබේ.

ඊජිප්තුව, මෙසපොටේමියාව සහ පන්ජාබය යන රටවල බිහිවූ උසස් සංස්කෘතීන් එකිනෙකින් බොහෝ දුරට වෙනස් විය. ඒවායේ පැවති එකිනෙකට වෙනස්වූ කලා ශෛලීන්, ගෘහ නිර්මාණ ශිල්පය, රාජ්‍ය ව්‍යුහය, ලේඛන සහ භාෂාව පිළිබඳව සලකා බැලීමේදී ඒ බව පැහැදිලිවේ. ඉහත කී ලක්ෂණ එක් එක් සංස්කෘතියට කෙතරම් විශේෂ වූවාද යත් පළමුවරට දැකීමේදී පවා ඊජිප්තියානු හයිරොග්ලිෆ්ස් (Hieroglyphs) සහ ඇසිරියානු උල්හැඩ (කූඤ්ඤාකාර) අක්ෂර (Cuneiform) වෙන්කර හඳුනාගත හැකිය. කෙසේ වෙතත්, එම ශිෂ්ටාචාරවල අපූර්ව සමාන කමක්ද දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් පිරමීඩ සහ පිරමීඩ වල කොටසක් වන සිගුරට් (Ziggurat) නමින් හැඳින්වෙන කොනක හැඩයකින් යුත් කොටස් සහ පුරාණෝක්ති වලින් ධ්වනිත වන ගුරු අරුත් (Mythological Motifs) වල දක්නට ලැබෙන සමානකම් පෙන්නුම් කළ හැකිය. පාකිස්ථානයේ කරන ලද පුරාවිද්‍යාත්මක කැනීම් වලින් සොයාගත් චිත්‍ර සහ අක්ෂර සටහන් සුප්‍රසිද්ධ සුමේරියානු ගිල්ගමේෂ් (Gilgamesh) නැමති වීර කාව්‍යය සිහිපත් කරවයි. එක් එක් ශිෂ්ටාචාරයට අයත් වැසියන් අනෙක් ශිෂ්ටාචාර පිළිබඳව කෙතරම් දුරකට දැන සිටියේද කියා අපි නොදනිමු. ඒ සම්බන්ධයෙන් අපට කළ හැක්කේ අනුමාන කිරීම පමණි. එහෙත් මෙහිදී අපට වැදගත් වන ප්‍රශ්නය වන්නේ ඉන්දියානු සංස්කෘතිය සහ බටහිර රටවල් අතර පුළුල් සම්බන්ධතාවයක් පැවතියේ කුමන කාලයේද යන්න සහ එය කවර ආකාරයේ සම්බන්ධකමක්ද යන කාරණයයි. ඉතිහාසඥයින් විසින් එම ප්‍රශ්නය නගන ලද්දේ

පැහැදිලිවම ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සහ මෙසපොටේමියානු ශිෂ්ටාචාරය අතර ඈත අතීතයේ පටන් සම්බන්ධතා පැවති බව සොයාගෙන ඇති හෙයිනි. සුප්‍රසිද්ධ ආගමික ඉතිහාසඥයකු සහ දාර්ශනිකයකු වන රාධාක්‍රිෂ්ණන් ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳව පහත සඳහන් නිගමනයට එළඹියේය: "ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සුමේර් (Sumer) හි පැවති (සුමේරියානු) සංස්කෘතියට සම්බන්ධව පැවතියේය. සුමේර් සංස්කෘතිය බැබිලෝනියානු සංස්කෘතිය බවට පරිවර්තනය විය. පසු කාලයේදී යුරෝපය විසින් උරුම කරගනු ලැබූ සම්ප්‍රදායක් ඒ තුළින් බිහිවිය."[19]

ශිෂ්ටාචාරයේ ආසියාතික ශිෂ්ටරීතිය වශයෙන් සැලකෙන සංස්කෘතීන්, බටහිර සංස්කෘතියේ ආරම්භය සහ වර්ධනය කෙරෙහි බලපෑ ආකාරය පෙන්නුම් කරන සාක්ෂි පිළිබඳව දැන් සලකා බලමු. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සහ දෙගම්මැදි ශිෂ්ටාචාරයේ ජීවත් වූ මිනිසුන් භාණ්ඩ සිල් තැබීම සඳහා භාවිතා කරණු ලැබූ මුද්‍රා ඊට සාක්ෂි දරයි. 1923 වර්ෂයේ සරත් කාලයේදී යුප්‍රටීස් ගඟට නුදුරුව පිහිටි කිෂ් (Kish) නැමති ස්ථානයේ සිදුකරන ලද පුරා විද්‍යාත්මක කැනීම්වලදී එම ප්‍රදේශයට අයත් නොවූ මුද්‍රාවක් සොයාගනු ලැබීය. එය ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මුද්‍රාවක් බවත්, යටත් පිරිසෙයින් ක්‍රි. පූ. 2000 තරම් පැරණි බවත් පුරාවිද්‍යාඥයෝ නිරණය කළහ.[20] ඉන්දුනිම්න ශිෂ්ටාචාරයට අයත් එම මුද්‍රාව ගොඩබිමින් සැතපුම් 1200 පමණ දුරින් පිහිටි මෙසපොටේමියාවට පැමිණියේ කෙසේද? ඉතා දුර ප්‍රදේශයක පිහිටි ශිෂ්ටාචාරයකට අයත් මෙම මුද්‍රාව දෙගම්මැදි රටේ තිබී සොයාගැනීමේ ඇති වැදගත්කම කුමක්ද? විවිධ ශිෂ්ටාචාර අතර සංස්කෘතික වශයෙන් පවතින සමානකම් වෙන් වෙන්ව පමණක් නොව ඒවා අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතා නිසාද ඇතිවන බව පෙන්නුම් කිරීම නිසා මෙම සොයාගැනීම අතිශයින් වැදගත් වේ.

කෙසේ වෙතත්, මෙසේ සොයාගන්නා ලද තනි මුද්‍රාවකින් ශිෂ්ටාචාර අතර පැවති සමස්ත ජීවන ක්‍රමයේ පැවති සමානකම් පිළිබඳව පැහැදිලි කළ නොහැකිබව අමුතුවෙන් කිවයුතු නැත. වාසනාවකට මෙන් මෙම පුරාවිද්‍යාත්මක පර්යේෂණ විවිධ පුද්ගලයින් විසින් දිගටම කරගෙන යනු ලැබීය. පුරාවිද්‍යාඥයින් විසින් දකුණු බැබිලෝනියාවේ පිහිටි ලගාෂ් (Lagash), උම්මා (Umma), ටෙල් අස්මර් (Tell Asmer), අග්‍රාබ් (Agrab), ඌර් (Ur) සහ සූසා (Susa) යන ස්ථානවලින් ඉහත සඳහන් කළ මුද්‍රාවට සමාන තවත් මුද්‍රා කීපයක් සොයාගනු ලැබීය. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මුද්‍රාවේ ප්‍රාදේශීය අනුකරණයක් ලෙස සැලකිය හැකි ප්‍රාග් සාර්ගොනිඩ් (Pre-Sargonid) යුගයට (ක්‍රි. පූ. 2500)

අයත් මුද්‍රාවක් ඌර් ප්‍රදේශයෙන් සොයා ගනු ලැබීය. එවැනි මුද්‍රා කීපයක ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට පමණක් විශේෂ වූ අකුරු සහ චිත්‍ර සටහන් දක්නට ලැබේ. ඒ අතර ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ බහුල වශයෙන් භාවිතවූ මත්ස්‍ය සංකේතය සහ ඉතා දික්ව විහිදුන හුයක් වැනි අතපය සහිත හිසෙන් රශ්මිය විහිදෙන පුරුෂයකුගේ රූපයක් දැක්වෙන මුද්‍රා කීපයක්ද තිබේ. මෙම සංකේත මොහෙන්දෙජාරෝ සහ ඉන්දු නිම්නයේ වෙනත් ස්ථානවල කරන ලද කැනීම් වලින් සොයාගත් මුද්‍රාවලට ආවේනික සලකුණු වේ. එතරම් දිග්වූ අතපය සහිත අපූරු රූප බැබිලෝනියානු මුද්‍රාවල දක්නට නොලැබේ. එනිසා එය නිසැකයෙන්ම ඉන්දියානු මුද්‍රාවක් හෝ ඉන්දියානු බලපෑම අනුව නිර්මාණය කරන ලද මුද්‍රාවක් බව පෙනේ.

ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් අකුරු සහ රූප වලට බොහෝ දුරට සමාන සංකේත සහිත ඝන මැටියෙන් තැනූ කුඩා බීකරයක් (වතුර බොන භාජනයක්) සහ ගඩොලක කොටසක් 1926 වර්ෂයේදී ඌර් ප්‍රදේශයේ දී කරන ලද කැනීම් වලින් හමුවිය. සමහර මුද්‍රාවල ජ්‍යෝති ශාස්ත්‍රයට සම්බන්ධ සිත් ඇද ගන්නා සුළු සංකල්ප රූප දක්නට ලැබේ. එම මුද්‍රා අතර උරහිසට ඉහළින් තරු දෙකක් සහ ගෝනුස්සකුගේ රූපය සහිත වතුර ගෙන යන පුද්ගලයකුගේ රූපයක්ද දක්නට ලැබේ. ගෝනුස්සා ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් රූප සටහන් වල දක්නට ලැබෙන චිත්‍රයකි. දෙගම්මැදි ප්‍රදේශයෙන් සොයා ගනු ලැබූ ග්‍රහරාශි චක්‍රය (Zodiac) දැක්වෙන මුද්‍රා අතර ඉලිප්සියානු හැඩයේ මුද්‍රා බහුලව දක්නට ලැබේ. එපමණක් නොව, ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට ආවේනික වූ සංකේත දහයකට නොඅඩු සංඛ්‍යාවක් ඇතුළත් මුද්‍රා සෑදීම සඳහා පාවිච්චි කරනු ලැබූ සම චතුරස්‍රාකාර මුද්‍රා අච්චුවක් උම්මා (Umma) නැමති ස්ථානයෙන් සොයාගෙන තිබේ.[21]

සමහරවිට ජ්‍යෝතිෂ ශාස්ත්‍රය පිළිබඳ දැනීම මුල් යුගවලදී වෙනත් රටකින් ලබාගෙන තිබෙන බව මෙම සොයාගැනීම් වලින් පෙනේ. සාමාන්‍යයෙන් ජ්‍යෝතිෂ ශාස්ත්‍රයේ නිජබිම වශයෙන් සලකනු ලැබුවේ මෙසපොටේමියාවය. එහෙත් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ජ්‍යෝතිෂ ශාස්ත්‍රයට අදාළ සංකේත සහිත මුද්‍රා සොයාගැනීමෙන් පසු සුප්‍රසිද්ධ බැබිලෝනියානු ජ්‍යෝතිෂ ශාස්ත්‍රයට අයත් මූලික ලක්ෂණ බොහෝ විට හරප්පා සංස්කෘතියෙන් ප්‍රභවය වන්නට ඇතැයි සිතිය හැකිය. සමහර මුද්‍රාවල ඔබ්බවා ඇති සංකල්ප රූප සහ අක්ෂර වල සමාන කමක් නොමැති වුවත් ඒවායේ හැඩය සහ නිර්මාණය කිරීම සඳහා යොදාගෙන ඇති මූල ද්‍රව්‍යවල සමාන කමක් දක්නට ලැබේ. මෙසපොටේමියානු මුද්‍රා ලා කහ පැහැති මතුපිටක් සහිත අළු පැහැයෙන් යුක්තවූ පැණිගල්

(Soapstone) නමින් හැඳින්වෙන ගල් විශේෂයකින් සාදා තිබේ. ඒවායේ යට පැත්ත තරමක් උස්ව පිහිටන සේ ගෝලාකාර හැඩයකින් යුක්තව නිර්මාණය කර තිබේ. එවැනි මුද්‍රා ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට පමණක් අයත්වූ ඒවාවේ.

මෙසපොතේමියාවෙන් සොයා ගන්නා ලද පැරණිතම ඉන්දීය මුද්‍රා ඌර් හි තුන්වන රාජවංශය පැවති කාලය තරම් (ක්‍රි. පූ. 2047-1939) ඈතට විහිදේ. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් යැයි සැලකිය හැකි මුදුමාල, මැටියෙන් නිර්මාණය කරන ලද රූප සහ අඳු කැට වැනි වෙනත් පුරාවස්තු රැසක් මෙම මුද්‍රා සමඟ තිබී සොයාගෙන ඇත.[22] ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සහ බැබිලෝනියාව අතර ක්‍රි. පූ. 2000 පෙර යුගයේදී නිරන්තර වෙළඳ සම්බන්ධතා පැවති බව මෙම සොයාගැනීම් වලින් පැහැදිලි වේ. ඒ අවධියේදී ඉන්දු නිම්න ශිෂ්ටාචාරය (ක්‍රි. පූ. පළමු සහස්‍රකයේ මුල් භාගය) ඉතා උසස් මට්ටමක පැවතුණි. එය බැබිලෝනියාවේ ඉසින්-ලාර්සා (Isin-Larsa-Babylon) යුගයට පෙර පැවති කාලපරිච්ඡේදය විය.

නමුත් පූර්ව ආසියාවේ පැවති ශිෂ්ටාචාර වලට අයත් පුරා වස්තු කිසිවක් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත්ව තිබූ ප්‍රදේශවලින් හමුවී නැත. ඒ නිසා මෙම ප්‍රදේශ දෙක අතර පැවති සම්බන්ධතා පිළිබඳව වඩා නිවැරදි තක්සේරුවක් කිරීමේදී යම් යම් ගැටළුවලට මුහුණ පෑමට සිදුවිය. මෙසපොතේමියාව, ඊජිප්තුව සහ ක්‍රීටය යන රටවල පැවති පැරණි ශිෂ්ටාචාර වලට අයත් මානව කෘති (Artefacts) කීපයක් සොයාගෙන තිබුණත් ඒවා යුප්‍රටීස් ගඟ ආශ්‍රිත ප්‍රදේශයෙන් සොයා ගනු ලැබූ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මුද්‍රා ප්‍රමාණය හා සසඳා බැලීමේදී සංඛ්‍යාත්මක වශයෙන් ප්‍රමාණවත් නොවේ.[23] ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වාසය කළ මිනිසුන් උද්‍යෝගිමත් වෙළඳුන් වූ බවත් ඔවුන් දුර බැහැර ප්‍රදේශවලට ගොස් වෙළඳාම් කළ බවත්, අතීතයේදී මෙම ප්‍රදේශ දෙක අතර පැවති සම්බන්ධතා, විශේෂයෙන්ම ඉන්දු නිම්න වැසියන්ගේ උද්‍යෝගය නිසා ඇතිවූ බවත් ඉන් පැහැදිලිවේ.[24]

මේ අනුව ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සහ පූර්ව ආසියාවේ රටවල සංස්කෘතීන් අතර පැවති සම්බන්ධතා පිළිබඳව අප සලකා බැලිය යුත්තේ කෙසේද? මෙම ශිෂ්ටාචාර දෙක අතර අතීතයේ පැවති සම්බන්ධතා සහ මුල් නාගරික ශිෂ්ටාචාර වර්ධනය වූ ආකාරය පැහැදිලි කළ හැකි පදනමක් මෙසපොතේමියාව සහ පන්ජාබය අතර පිහිටි මහා භූමි ප්‍රදේශය තුළ පිහිටි ස්ථානවල කරණ ලද කැනීම් වලින් මතුකරගත් පුරාවස්තු වලින් සැපයේ. මෙම ශිෂ්ටාචාර වර්ධනය වීම කෙරෙහි එලම් (elamites)

සංස්කෘතියේ තිබූ වැදගත්කම බොහෝ කාලයක් අඩු තක්සේරුවට ලක් කොට තිබුණි. එලම්වරු ජීවත්වූයේ අද ඉරානය නමින් හැඳින්වෙන යුප්‍රටීස් සහ ටයිග්‍රීස් යනුවෙන් හැඳින්වෙන ගංගා දෙක හමුවන ස්ථානයට ඊසාන දෙසිනි. එලම් සංස්කෘතිය කෙරෙහි බැබිලෝනියාව විශාල බලපෑමක් ඇති කළ බවත්, එලම්වරු ජීවත්වූ ප්‍රදේශවලට බැබිලෝනියානු ජාතිකයින් නිතර පහරදුන් බවත් සඳහන් වේ. ප්‍රාග්-එලම් (Pre-Elamite) සංස්කෘතිය බිහිවූයේ ක්‍රි. පූ. 4 වන සහස්‍රකයේදීය. වෙනත් වචන වලින් කියතොත් පැරණි ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සහ අම්රි ශිෂ්ටාචාරය ඇතිවීමට අවුරුදු 200-400 කට පමණ කලින්ය. එලම් සංස්කෘතිය ඉතා උසස් තත්වයක පැවති බව පුරාවිද්‍යාත්මක සොයාගැනීම් මගින් පැහැදිලි වී තිබේ. එලම් ශිෂ්ටාචාරයට අයත් වූ ප්‍රදේශය පිහිටා තිබුණේ ඉන් පසුව බිහිවූ හරප්පා ශිෂ්ටාචාරය පැවති ප්‍රදේශයට සැතපුම් 600 ක් පමණ ඈතිනි.[25] ප්‍රාග්-එලම් ශිෂ්ටාචාරයට අයත් වැදගත් පුරාවස්තු ගිනිකොන දිග ඉරානයෙන් සහ බලුකිස්ථානය යන රටවලින් සොයාගෙන තිබේ. උදාහරණයක් වශයෙන් ඛනිජ ද්‍රව්‍ය සකස්කර අපනයන කිරීම මූලික ආර්ථික කටයුත්තක් ලෙස කරනු ලැබූ, ඒ හේතුව නිසාම සමෘද්ධිමත් ප්‍රදේශයක් බවට පත්වූ දියුණු සංස්කෘතියක් ක්‍රි. පූ. 4500 - 3300 කාලයේදී පැවති බව තෙපෙ යහ්යා (Tepe Yahya) නැමති ස්ථානයේ කරන ලද කැනීම් වලින් පැහැදිලි වේ. එලම් උස්බිම් වල මිනිරන්, තඹ, ටින්, රිදී, කිරි ගරුඬ, ඩියෝරයිට් (Diorite), ඔබසිඩියන් (Obsidian) වැනි ඛනිජ සම්පත්, දැව සහ අශ්වයින්ද බහුලව තිබුණි. සාපේක්ෂ වශයෙන් සලකා බැලීමේදී මෙසපොතේමියාව ඛනිජ ද්‍රව්‍ය සහ අනෙකුත් ස්වභාවික සම්පත් වලින් එතරම් පොහොසත් රටක් නොවිය. එනිසා මෙසපොතේමියාවේ දියුණුව රඳාපැවතියේ එලම් රාජ්‍යයෙන් ආයාත කරනු ලැබූ භාණ්ඩ මතය. ක්‍රි. පූ. 2300 තරම් අතීතයේදී පමණ සාර්ගොන් රාජ සමයේ පටන් බැබිලෝනියන්වරු එලම් රාජ්‍යය යටත් කර එය බැබිලෝනියානු අධිරාජ්‍යයේ කොටසක් බවට පත්කර ගැනීම සඳහා නිරන්තර උත්සාහයක් දරනු ලැබුවේ කවර හේතුවක් නිසාද යන්න මෙයින් පැහැදිලි වේ. කෙසේ වෙතත් බැබිලෝනියාවට කිසිවිටෙක එලම් රාජ්‍යය යටත් කර ගැනීමට නොහැකි විය. නමුත් එලම් රාජ්‍යයේ නිෂ්පාදනය කරනු ලැබූ භාණ්ඩ සඳහා පැවති විශාල ඉල්ලුම මෙසපොතේමියාවේ ඉතා දියුණු නාගරික සංස්කෘතියක් බිහිවීමටත්, චමත්කාරජනක සාමාජීය සහ දේශපාලන වෙනස්වීම් ඇතිවීමටත් හේතුවිය.

ප්‍රාග්-එලම් සංස්කෘතිය ඉන් පසුව බිහිවූ හරප්පා ශිෂ්ටාචාරයේ දියුණුව කෙරෙහිද සෘජු බලපෑමක් ඇතිකර තිබෙන බව පෙනේ.

මුල්කාලයේ සිටි පුරාවිද්‍යාඥයින්ට සහ ඉතිහාසඥයින්ට හැකිවූයේ හරප්පා ශිෂ්ටාචාරයේ ඇතිවූ සීඝ්‍ර දියුණුව පිළිබඳ විශ්මිත ආකාරයෙන් විස්තර වර්ණනා කිරීමට පමණි. එය වර්ධනය වූයේ කෙසේද? යන ආකාරය පැහැදිලි කිරීමට බොහෝ කාලයක් ගතවන තුරු ඔවුනු අපොහොසත් වූහ. නමුත් ප්‍රාග්-එලම් සංස්කෘතියට අයත් පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් නිසා සහ වර්ෂ ගණනාවක් තිස්සේ ඉතා නොදියුණු තත්වයක පැවති, හදිසියේම ඉතා දියුණු ශිෂ්ටාචාරයක් හරප්පාවේ ඇතිවූයේ කෙසේද? යන කාරණය පැහැදිලි කිරීමට දැන් හැකි වී තිබේ. තෙපෙ යහ්‍යා (Tepe Yahya), බම්පූර් (Bumpur), සාර්-ඉ-සොක්ටා (Shar-I-Sokta), ටල්-ඉ-ඉබ්ලිස් (Tal-I-Iblis) සහ ෂාඩාඩ් (Shahdad) වැනි බලුකිස්ථානයේ පිහිටි නගරවල වැසියන් සමග පවත්වනු ලැබූ වාණිජ සහ සංස්කෘතික සම්බන්ධතා නිසා එය දියුණුවට පත්විය. හරප්පා ශිෂ්ටාචාරය සමග පැවති අන්‍යොන්‍ය වෙළඳ සම්බන්ධතා වල ප්‍රතිඵලයක් වශයෙන් ඉන්දු ගංගා නිම්නයට නැගෙනහිරින් කුල්ලි (Kulli), අම්රි (Amri), කොට් ඩිජි (Kot Diji), මුන්ඩිගැක් (Mundigak) සහ සාහ්-ඉ-ටුම්ප් (Shah-i-Tump) වැනි නගර බිහිවිය. එම සම්බන්ධතා හරප්පා ශිෂ්ටාචාරයේ උසස් දියුණුවක් ඇතිවීමට හේතුවිය.

මෙසපොටේමියාව සහ ඉන්දු නිම්න ශිෂ්ටාචාරය අතර පැවති වාණිජ සම්බන්ධතා පැහැදිලි කරන සාක්ෂි සාපේක්ෂ වශයෙන් අඩු වීමට හේතු දැන් සොයා ගෙන තිබේ. ගොඩබිම හරහා වැටී තිබූ වෙළඳ මාර්ග විහිදී තිබුණේ එලම් රාජ්‍යය හරහාය. එකී සමෘද්ධිමත් වෙළඳ මධ්‍යස්ථාන වල පාලනය තමන්ගෙන් පැහැර ගැනීමට එලම්වරු කිසි දිනක ඉඩ නොදුන්හ. භාණ්ඩ හුවමාරුව සිදුවූයේ මෙම ශිෂ්ටාචාර දෙක අතර පැවති සෘජු සම්බන්ධතා මත නොව ගොඩබිම් මාර්ග ඔස්සේ වෙළඳ කටයුතු සිදු කළ ඉතා කී අතරමැදියන් මාර්ගයෙනි. එනිසා එලම් රාජ්‍යයේ නාවික වරායන් දක්නට නො ලැබීම පුදුමයක් නොවේ. ඔවුන් වෙළඳාම ගොඩබිමට පමණක් සීමා කළ බව පෙනේ. එය අතීතයේදී පිහිටි දිග ආසියාවේ රටවල් අතර අන්තර් සංස්කෘතික සම්බන්ධතා ඇතිවීම කෙරෙහිද බලපෑවේය. මේ නිසා ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වැසියන්ට යුප්‍රටීස්, ටයිග්‍රිස් ගංගා ආශ්‍රිත ප්‍රදේශවල වාසය කළ තම වාණිජ හවුල් කරුවන්ගේ පහසුව සඳහා සෘජු වෙළඳ මාර්ගයක් ඇති කරලීම පිණිස පර්සියන් බොක්ක හරහා මුහුදු මාර්ගයක් විවෘත කිරීමට සිදුවිය. පටන් පිරිසෙයින් එම මුහුදු මාර්ගය ඔස්සේ ක්‍රි. පූ. දෙවන සහශ්‍රකයේදී (ක්‍රිස්තු පූර්ව දෙදහසේදී) පමණ වෙළඳ කටයුතු සිදුකෙරෙන්නට ඇත.[26] මුලදී මෙසේ මෙසපොටේමියාව සමග පැවති වෙළඳ සම්බන්ධතා හින්දු කුෂ් කඳුවැටිය හරහා වැටී තිබුණු කඳු කපොලු

හරහා සිදුවිය. එහෙත් නැගෙනහිර බටහිර සම්බන්ධතාවයේ අලුත් අදියරක් ඉතා ඉක්මනින් මුහුදු මාර්ග ඔස්සේ ආරම්භ වන්නට ඇත. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ජීවත් වූ මිනිසුන් සමුද්‍ර තරණය සඳහා සුමේරියන්වරු යොදාගත් නැව් වලට සමාන නැව් ප්‍රයෝජනයට ගත් බව අපි දනිමු.[27] බොම්බායට උතුරින් කැම්බේ බොක්කේ පිහිටා ඇති ලෝදල් (Lothal) නැමති ස්ථානයෙන් අවුරුදු හාර දහසකට වඩා පැරණි නාවික තටාකයක් සහිත වරාය ආශ්‍රිත විශාල නගරයක් පුරාවිද්‍යාත්මක කැනීම් මගින් මතු කර ගෙන තිබේ. එමෙන්ම, ගුජරාට් වෙරළට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශයක තිබී ඒ කාලයේදී භාවිතා කරනු ලැබූ සිරියන් සහ සයිප්‍රීයට (Cypriot) නැංගුරම් වලට බොහෝ දුරට සමාන නැංගුරම් සොයාගෙන තිබේ. මෙවැනි වරායන් මගින් හරප්පා සංස්කෘතියට අයත් මිනිසුන් මධ්‍යධරණී මුහුද දක්වා පැතිර ගිය ඈත ප්‍රදේශ සමග වෙළඳ සම්බන්ධතා පවත්වන ලද බව පෙනේ.

බැබිලෝනියන්වරු එලම් රාජ්‍යයට එල්ල කරන ලද ප්‍රහාර සමහර විට බැක්ට්‍රියාව (නූතන ඇෆ්ගනිස්ථානයේ උතුරු ප්‍රදේශය) ඉන්දු නිම්නය දක්වා විහිදෙන්නට ඇත. බිර්ස් නිම්රුඩ් (Birs Nimrud) නමැති ස්ථානයට ආසන්නයේ පිහිටි ඇසිරියානු ගොඩනැගිල්ලක් තුළ තිබී ඔටුවෙක්, අලියෙක් සහ රයිනෝසිරසයකු සමග සිටින හිරකරුවන් පිරිසක් පිළිබිඹු කරන කැටයමක් හමුවී තිබේ. මෙය පුරාණෝක්තියක දැක්වෙන කථා ප්‍රවෘත්තියක් පිළිබිඹු කරන චිත්‍රයක් විය හැකිය. ජනප්‍රවාදයේ දැක්වෙන පරිදි නිනෙවේ (Nineveh) නගරයේ නිර්මාතෘවරයා වශයෙන් සැලකෙන නිනෝ (Nino) බැක්ට්‍රියාවට සහ ඇසිරියානු දෙවි දුවක් වූ සෙමිරාමිස් (Semiramis) ඉන්දියාවට ගිය ගමනක් පිළිබඳව ටේසියාස් (Ktesias) විසින් ඊට ශතවර්ෂ කීපයකට පසුව ලියා ඇති කථා ප්‍රවෘත්ති වල සඳහන් කර තිබේ. කොෆේනේ (Kophene) හෙවත් ආර්කෝසියා (Archosia) නගරය ඉදිකරනු ලැබුවේ සෙමිරාමිස් විසින් බව කියවේ. සෙමිරාමිස් යනු ඇසිරියානු පාලකයකුගේ නමක් විය හැකිය. කොෆේනේ නගරයේ නටබුන් කන්දහාරයෙන් (ඇෆ්ගනිස්ථානය) සොයාගෙන තිබේ.

නූතන ඉරානය සහ පාකිස්ථානය අතර පිහිටි රටවල පැවති පැරණි සංස්කෘතිවල ආරම්භය පිළිබඳව මෙතෙක් නොදැන සිටි අප්‍රකට කරුණු දැන් ක්‍රම ක්‍රමයෙන් පැහැදිලි කර ගැනීමට හැකිවී තිබේ. දැනට අවුරුදු 5,000 කට ඉහත එහි ජීවත්වූ මිනිසුන් වෙනත් සංස්කෘතිවලට අයත්වූ මිනිසුන් සමග විවිධ සම්බන්ධතා ඇති කරගැනීම සඳහා දුර බැහැර රටවලට යෑමට මැලිනොවූ බව පෙනේ.

ඉන්දියාව සහ බටහිර රටවල පැවති දියුණු ශිෂ්ටාචාර අතර පැවති

සම්බන්ධතා අවුරුදු හාරදහසකට වඩා පැරණි බව පැහැදිලිය. ඒ කාලයේ පැවති සාකණික ක්‍රියාව හා සසඳා බැලීමේදී එම රටවල් අතර පැවතියේ සොයාබැලිය හැකි දුරකි. ඔවුන් භාවිතා කළ මුද්‍රාවල යොදා ඇති රූප සටහන් සහ අක්ෂර ප්‍රදෙන් වාණිජ අවශ්‍යතා සඳහා පමණක් යොදාගන්නා ලද ඒවා නොවේ. එම සටහන්වල ඊට වඩා වැඩි සංස්කෘතික වැදගත්කමක් දක්නට ලැබේ. ඒවා ඔවුන් තුළ පැවති ඉඩ විශ්වාස හා ආගමික සංකල්ප මෙන්ම ආධ්‍යාත්මික විශ්වාස පිළිබිඹු කරන මාධ්‍යයක් වශයෙන්ද යොදාගෙන තිබෙන බව සැලකිය හැකිය. කෙසේ වෙතත් එම රූප සටහන් වලින් පිළිබිඹු කෙරෙන මූර්තිමය සහ ආධ්‍යාත්මික සංකල්ප තේරුම් කර ගැනීම එතරම් පහසු නොවේ. එමෙන්ම අතීතයේ පැවති එම සම්බන්ධතා අඛණ්ඩව නොපැවතුණි. අධිරාජ්‍යයන් සහ සංස්කෘතීන් බිඳ වැටීමෙන් පසු එම සම්බන්ධතාද ක්‍රම ක්‍රමයෙන් පරිහානියට පත්විය.

ක්‍රි. පූ. දෙවන සහස්‍රකයේ මැද භාගයේදී පමණ ඉන්දු ගංගා නිම්නයේ පිහිටි නගර අතහැර දැමීමෙන් පසු හරප්පා සංස්කෘතිය අභාවයට ගියේය. එම ප්‍රදේශයට ජලය සපයාදුන් ගංගාවක් වියලීයාම නිසා අද රජස්ථානය නමින් හැඳින්වෙන ප්‍රදේශය කාන්තාරයක් බවට පත්විය. මේ කාලයේදී වෛදික ආර්යයින් බටහිර දිගින් කඩාවැදී ඉන්දියානු උප මහාද්වීපය දක්වා පැමිණියහ. අවස්ථා කීපයකදී කඩා වැදුනු මෙම ආක්‍රමණිකයින් විසින් ආගමික භක්තිය, ජීවන ක්‍රමය සහ වෛදික ආගමට අයත් පැරණි ඉඳිධ ග්‍රන්ථ සහ මහාභාරතය, රාමායනය වැනි වීර කාව්‍ය රචනා කරනු ලැබූ සංස්කෘත භාෂාව ඇතුළු සම්පූර්ණයෙන්ම අලුත් සංස්කෘතියක් හඳුන්වා දුන්හ.[28]

ඉන්දු ආර්ය භාෂාවලට සමාන භාෂා කථාකරන කැසයිට්ස් (Kassites), හූරියන් (Hurrian) සහ හිටයිට්ස් (Hittites) යනුවෙන් හැඳින්වෙන ගෝත්‍රිකයින් මැද පෙරදිග රටවල් ආක්‍රමණය කළහ. හූරියන් වරු උතුරු මෙසපොටේමියාව, නැගෙනහිර සුළු ආසියාව සහ පලස්තීනය යන රටවල් යටත් කර ගත්හ. ඉරාන කඳුකරයෙන් සංක්‍රමණය වූ කැසයිට්ස් ගෝත්‍රිකයින් බැබිලෝනියානු රාජ වංශය විනාශකර දැමූහ. හිටයිට්ස් වරු ක්‍රි. පූ. 1650 පමණ කාලයේ සිට 1250 දක්වා ඇනටෝලියාව පාලනය කළහ. ඇරමයික් (Aramaic) ගෝත්‍රිකයින්ද ක්‍රි. පූ. දෙවන සහස්‍රකයේදී එනම් කලබලකාරී තත්වයක් පැවති සමයේදී ඇමොනයිට්ස් (Ammonites), මෝබයිට්ස් (Moabites) සහ එඩොමයිට්ස් (Edomites) වැනි මැදපෙරදිග වාසය කළ වෙනත් ගෝත්‍රිකයින් මෙන් වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වූහ. සමහර විට ඒ කාලයේදී ඊශ්‍රායලයේ ජීවත් වූ ගෝත්‍රික ජනයා මධ්‍යම යුප්‍රටීස් ප්‍රදේශයෙන් පැමිණෙන්නට ඇතැයි සිතිය හැකිය. සමහර විට පරණ තෙස්තමේන්තුවේ විස්තර කර තිබෙන

ජෝෂුවා විසින් සටන් කර ඉවම අල්ලා ගැනීම පිළිබඳ කථා ප්‍රවෘත්තියේ දැක්වෙන්නේ මෙසේ ක්‍රි. පූ. දහහතර වන ශත වර්ෂයේ සිට ක්‍රි. පූ. දෙළොස්වන ශතවර්ෂය දක්වා කාලය තුළදී දිගින් දිගටම සිදුවූ මෙම සංක්‍රමණ ක්‍රියාවලිය විය හැකිය.

මෙසේ දීර්ඝ කාලයක් තිස්සේ සිදුවූ සංක්‍රමණ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් ඌර් හී පැවති තුන්වන රාජ වංශයේ පරිහානියේ සිට (ක්‍රි. පූ. 1939) ක්‍රිස්තු වර්ෂ පළමුවන සහස්‍රකයේ ආරම්භය දක්වාවූ කාලපරිච්ඡේදය තුළ පෙරදිග සහ බටහිර රටවල් අතර පැවති සම්බන්ධතා පිළිබඳ කිසිම තොරතුරක් ලැබී නැත. මිනිසුන් විශාල වශයෙන් සංක්‍රමණය වීම නිසා මේ කාලපරිච්ඡේදය විශාල පිබිදීමක් ඇතිවූ යුගයක් විය. එකල පැවති සංස්කෘතික සම්බන්ධතා පැහැදිලි කරන සාක්ෂි හිග වුවත් එවැනි සම්බන්ධතා නොපැවතුන බවක් ඉන් අදහස් නොවේ. මේ කාලයේදී දියුණු ශිෂ්ටාචාර අතර පැවති සම්බන්ධතාවලට බාධා පැමිණුනත් මූලික වශයෙන් ඉන්දු ජර්මන් ගෝත්‍රික කණ්ඩායම් ව්‍යාප්තවීම හේතුවෙන් ස්වාධීන සංස්කෘතීන් සහ ආගමික අදහස් දුරස්ථ ප්‍රදේශවලට පැතිර ගියේය. ක්‍රි. පූ. තුන්වන සහස්‍රකය අග භාගයේදී අශ්ව කරත්ත හමුදා වලින් පැමිණි ගෝත්‍රිකයින්ගේ ආක්‍රමණ සහ ඊට පසුව ක්‍රි. පූ. 1200 දී සිදුවූ අශ්වාරෝහක ගෝත්‍රිකයින්ගේ ආක්‍රමණ හේතු කොටගෙන යුරේසියානු බලය ඉරානය සහ ඉන්දියාව දක්වා විහිදී ගියේය.

මෙම විශාල බිම් ප්‍රදේශය තුළ පැවති ඒකාකාරීත්වය සැලකිල්ලට ගනිමින් සමාජ විද්‍යාඥයකු වූ ඇල්ෆ්‍රඩ් වේබර් (Alfred Weber) මතයක් ඉදිරිපත් කර තිබේ. ඔහුගේ මතයට අනුව අශ්වයා මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා යොදාගත හැකි වීම නිසා මිනිසුන්ට ලෝකයේ විශාලත්වය පිළිබඳ අවබෝධයක් ඇතිකර ගැනීමටත් පුරාණයේ පැවති දියුණු ශිෂ්ටාචාර යටත් කර ගැනීමටත් හැකිවිය. මෙම ඒකාබද්ධ ප්‍රදේශය තුළ පැවති අන්තර් සම්බන්ධතා හේතු කොට ගෙන විවිධ කරුණු පිළිබඳව නිර්භීත ලෙස සලකා බැලීමට ඔවුහු පෙළඹුනහ. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මුද්‍රාවල දක්නට ඇති ලක්ෂණ සහ සෙල්ටික් (Celtic) පුරා වස්තුවලින් පිළිබිඹුවන කරුණු අතර පවතින අපූර්ව සමානකම් පූර්ව ඉන්දු ජර්මන් සංස්කෘතියට පෙර පැවති සංස්කෘතිය ගෝල් (Gaul) සිට ඉන්දියාව දක්වා පැතිර තිබුණේ යයි උපකල්පනය කිරීමට හේතුවිය. ක්‍රි. පූ. පළමුවන සහ දෙවන ශතවර්ෂය අතර තුර කාලයට අයත් යැයි සැලකෙන ගුන්ඩෙස්ට්‍රප් කෝල්ඩ්‍රන් (Gundestrup Cauldron) හී නිර්මාණය කර ඇති බද්ධ පර්යංක ඉරියව්වෙන් වාඩිවී සිටින සර්නුනෝස් (Cemunnos) නමින් හැඳින්වෙන අං දෙකක් සහිත සෙල්ටික් දෙවියා සහ ක්‍රි. පූ. 2000 කාලයට අයත් යැයි සැලකෙන ඉන්දු නිම්නයෙන් සොයාගත් හරප්පා

මුද්‍රාවක දක්නට ලැබෙන පූර්ව ශිව දෙවියන් වශයෙන් හැඳින්වෙන පිළිරුව අතර පවතින සමානකම් ඉහත කී උපකල්පනය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති කදිම නිදසුනකි. මෙම පිළිරු දෙක අතර සමානකම් රාශියක් දක්නට ලැබේ. හිස් මුදුනේ අං දෙකක් සහිතව ඉරි සහිත සිවුරක් හැඳ සතුන් පිරිවරා ගෙන පද්මාසන ඉරියව්වෙන් වාඩිවී සිටින පිළිමයකුගේ රූපයක් 13 සහ 14 වන රූප රාමුවල දැක්වේ. මොහෙන්ජදාරෝවෙන් සොයාගනු ලැබූ මුද්‍රාවක දක්නට ලැබෙන මෙම සර්නුනොස් නමැති රූපය ඉන්දියානු පුරාණෝක්තිවල සඳහන් වන පශුපති නැමැති සත්වයින්ට අධිපති දෙවියාගේ රූපය බව සෙල්ටික් භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ විශේෂඥයකු (Celtologist) වන ජේ. වෙන්ද්‍රිස් (J. Vendryes) ප්‍රකාශ කර තිබේ.[29]

ඉන්දියානු අදහස් වලට සමාන බොහෝ ලක්ෂණ සෙල්ටික් සහ සෙල්ටෝ-අයිබීරියන් ආගමේද දක්නට ලැබේ. පුනර්භවය පිළිබඳ විශ්වාසය, නිර්මාංශ ආහාර ගැනීම, වෘක්ෂ වන්දනාව සහ ස්වස්තික ලක්ෂණය එහි ඇතුළත් වේ. ස්වස්තික ලකුණ අද බාස්ක් (Basque) නැමති ප්‍රදේශයේ පිහිටා ඇති ගොවිපල වල දොර කනුවල පවා දක්නට ලැබෙන සංකේතයකි. ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයට පමණ අයත් යැයි සැලකෙන ආගමික වන්දනාමාන සඳහා යොදා ගන්නා ලද පිළිම ලෙස සැලකිය හැකි ගලින් නිර්මාණය කරන ලද වාඩිවී සිටින පුද්ගලයින් දෙදෙනකුගේ පිළිරූ දෙකක් ප්‍රංශයේ මාර්සේ (Marseille) නගරයේ පිහිටි බෝර්ලි කෞතුකාගාරයේ (Musee Borely) තිබේ. එම පිළිරූ දෙක රොක්පර්ටුස් (Roquepertuse) නම් ස්ථානයට කිට්ටුව පිහිටා ඇති මට සිළුටු බිත්තියක් සහිත ගල් පර්වතයක් තුළට කනින ලද කුඩා ලෙනක් අසල තිබී සොයා ගනු ලැබීය. මෙම පිළිරූ දෙකේම ශීර්ෂ කැඩී ගොස් ඇත. ඒවා සෙල්ටෝ අයිබීරියානු දෙවිවරුන්ගේ පිළිරූ යැයි විද්වතුන් විශ්වාස කරන නමුත් ඒවා පැරණි බුදු පිළිමවලට ඉතා කිට්ටු සමාන කමක් පෙන්වයි. ඒවා පද්මාසන ලීලාවෙන් වැඩ සිටින බෝධිසත්ව පිළිරූ වලට සමානය. සිල්වත්කම සංකේතවත් කිරීමේ සලකුණක් වශයෙන් එම පිළිරූ වල උරහිසට ඉහළින් නවගුණ වැලක්ද අතේ වැළමිටට ඉහළින් සහ ගෙල වටා වළලු දක්වා තිබේ (රූපරාමු 9-10). එම පිළිමවල අත් පිහිටුවා ඇති ආකාරයද බුදු පිළිම වල දක්නට ලැබෙන හස්ත මුද්‍රා සිහිපත් කරවයි. ඉගැන්වීම් වල සත්‍යතාවය සහතික කරමින් එක් අතක් පොළව දෙසට යොමුවී ඇත (භූමි ස්පර්ශ මුද්‍රාව). අනික් අත පසුව ඉදිරියෙන් තබා ඇත. එය දිරිමත් කිරීම හඟවන සංඥාවකි (අභය මුද්‍රාව). එම කාලයටම අයත් සෙල්ටෝ-අයිබීරියන් ප්‍රතිමාවක ශීර්ෂයක් දකුණු ප්‍රංශයේ නුසාන ඉඹියන තිබී සොයාගෙන තිබේ.[30]

අමිරි සංස්කෘතියේ මුල් අවස්ථාවලදී (ක්‍රි. පූ. 4000) සුමේරියන්වරු පවා අයත්ව සිටි එක්තරා එක්සත් ජන සමාජයක් පූර්ව ආසියාවේ විශාල ප්‍රදේශයක පැතිරී වාසය කළ බව අනුමාන කරනු ලැබේ. ආර්යයින් ඉන්දු නිම්න ශිෂ්ටාචාරය කිසි දිනෙක ආක්‍රමණය නොකළ බවත් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වාසය කළේ ආර්යයින් බවත් ඒ පිළිබඳ පර්යේෂණ පැවැත්වූ ඉන්දියානු විද්වතුන් විශ්වාස කරයි. හරප්පා ශිෂ්ටාචාරය පැවති යුගයේදී අද තාර් කාන්තාරය වශයෙන් හැඳින්වෙන ප්‍රදේශයට ජලය සපයමින් ඉන්දු ගඟට නැගෙනහිරින් පර්සියන් බොක්කට ගලාගිය සරස්වතී නදිය ආර්යයන් විසින් ලියන ලද වේද ග්‍රන්ථවල ඔවුන්ගේ ශුද්ධවූ (Most Holy) ගංගාව වශයෙන් මහත් ගෞරවයෙන් යුක්තව සඳහන් කර තිබේ. නමුත් ආර්යයන් යැයි හඳුන්වා ඇති ඉහත කී ආක්‍රමණිකයින් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට පැමිණීමට බොහෝ කාලයකට පෙර සරස්වතී ගඟ වියළී ගොස් තිබුණි.

1930 ගණන් වලදී ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ භූගෝලීය ව්‍යාප්තිය පිළිබඳව විද්වතුන් ඉතා පැහැදිලි උපකල්පන ඉදිරිපත් කරන ලදී. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ජීවත්වූ වැසියන් විසින් භාවිතා කරන ලද මෙතෙක් කියවා තේරුම් ගැනීමට අපහසු ලිඛිත අකුරු ඈත පිහිටි ඊස්ටර් (Easter) දූපත්වල භාවිතා කරනු ලැබූ ලිඛිත අකුරු වලට බොහෝ දුරට සමාන බව පෙන්වා දීමට එමගින් උත්සාහ කරනු ලැබීය.[31]

ඉන්දු නිම්න සංස්කෘතිය පරිහානියට පත්වූ පසු ඉන්දියාවට සංක්‍රමණය වූ ආර්ය ගෝත්‍රික ජනකොටස් ආරම්භයේදී අර්ධ එඬේර ජීවිත ගත කළහ. ඔවුන් ස්ථිර වාසස්ථාන පිහිටුවා ගත්තේ තරමක් කල් ගතවූ පසුවය. ආර්යයින්ගේ පැමිණීමත් සමග මෙලොව සහ පරලොව ජීවිතය කෙරෙහි යොමු වූ විශ්වාස ඇතුළත් වෛදික ආගම ඉන්දියාවට පැමිණියේය. ජීවිතය සතුටින් ගත කරන සැටි සහ ඒ සඳහා අනුගමනය කළයුතු පූජා විධි සහ අභිචාරක්‍රම ඊට ඇතුළත් විය. ඉන්ද්‍ර වෛදික ආගමේ මහත් ගෞරවාදරයට පත්වූ දෙවියා විය. ආර්යයින් පැමිණියේ රුසියාවේ ස්ටෙප්ස් තණබිම් ප්‍රදේශයෙන් යැයි විශ්වාස කෙරේ. නමුත් එම ගෝත්‍රිකයින් මුලින් ජීවත්වූයේ ඇනටෝලියාවේ හෙවත් උතුරු ඉරානයේ බව පර්යේෂකයින් කිපදෙනෙක් විසින් මෑතදී නිගමනය කර තිබේ. අවුරුදු දෙදහසක් පමණ වූ කාලපරිච්ඡේදයක් තුළ වෛදිකයින්ගේ ව්‍යාප්තිය සහ ඔවුන්ගේ බලපෑම් තවදුරටත් නැගෙනහිර දෙසට පැතිර ගිය බව ඔවුන් විසින් රචිත කථාකම් නමින් හැඳින්වෙන වේදග්‍රන්ථයක මෙසේ දක්වා තිබේ: "ඉඩම් අත්පත් කරගනිමින් මිනිස්සු බටහිර සිට නැගෙනහිරට සංක්‍රමණය වූහ." (කථාකම් 26:2 Kathakam 26:2)

සුළු ආසියාවේ පිහිටි බොගැස්කොයි (Boghazkoi) නමැති ස්ථානයෙන් ක්‍රි. පූ. 1400 කාලය තරම් පැරණි මිතානිය (Mittani) නමැති ප්‍රදේශය පාලනය කළ රජවරුන්ගේ පාලනයට අදාළ කූඤ්ඤාක්ෂර වලින් ලියා තිබෙන ගිවිසුමක් පිළිබඳ ලේඛනයක් හමුවී තිබේ. ශතවර්ෂ කිහිපයක් තුළ පැවති ආධ්‍යාත්මික සම්බන්ධතාවල දෝංකාරය එම ගිවිසුම ලේඛනයේ ගැබ්වී තිබේ. මි-ඉට්-රා (Mi-it-ra), උර්-ව්-නා (Ur-w-na), ඉන්දර් (Indar) සහ නා-සා-අට්-ති-ඉයා (Na-sa-at-ti-ia) නැමති දෙවිවරුන්ට කරන ලද කන්නලව්වක් එම ලේඛනයේ ඇතුළත් වී තිබේ. එහි සඳහන් කර තිබෙන සියලුම දෙවිවරුන් එනම් මිත්‍ර, වරුණ, ඉන්ද්‍ර සහ නසත්‍යන් පුරාණ ඉන්දියාවේ වැසියන් විසින් පුදනු ලැබිය.[32] ඇත්ත වශයෙන්ම වෛදික ආර්යයන්ගේ පුරාණෝක්ති, ආගමික සම්ප්‍රදායන් සහ සමාජ සංවිධානය ඉරාන ජාතිකයින්, ග්‍රීක් වරු සහ පසු කාල වලදී රෝමන්, සෙල්ටික්, ජර්මන් සහ ස්ලාව් වරු තුළ පැවති එවැනි විශ්වාස සහ අභිචාර විධි වලට සමාන විය. තමන් ආර්යයන් වශයෙන් හඳුන්වාගත් පර්සියන් වරුන් භාවිත කරනු ලැබූ භාෂාව සංස්කෘත භාෂාවට වඩා වෙනස්වූයේ ඉතා සුළු වශයෙනි. 'අවෙස්ත' (Avesta) නමින් හැඳින්වෙන පැරණි ඉරානයට අයත් ශුද්ධ ග්‍රන්ථයේ සමහර කොටස් බොහෝ දුරට ඉන්දියාවේ පැරණිතම ශුද්ධ ග්‍රන්ථය වශයෙන් සලකනු ලබන 'ඍග්-වේදයට' සමානය. ඉන්දියානු දෙවියකුවූ රාම රජු සහ දිව්‍යමය පානය වශයෙන් සලකනු ලබන 'සෝම' (එය ඉරාන භාෂාවෙන් හෝම (Haoma) සහ ශුද්ධ ගංගාව ලෙස විශ්වාස කරණු ලැබූ සරස්වතී ගඟ (Haraquati) පිළිබඳවද එහි සඳහන් වේ.

පැරණි ආර්යයන්ගේ ආගමික ලේඛනවල දක්නට ලැබෙන ජ්‍යෝතිෂ ශාස්ත්‍රය පිළිබඳව සඳහන් කර තිබෙන කරුණු අධ්‍යයනය කිරීමෙන් පසු ඉන්දියානු ජාතික ජ්‍යෝතිෂ ශාස්ත්‍රඥයින් දෙදෙනෙක් වැදගත් නිගමන දෙකකට එළඹියහ. එනම්, 'රාමායනය' ලියා තිබෙන්නේ ක්‍රි. පූ. 1500 දී පමණ නූතන ඇෆ්ගනිස්ථානයේදී යැයි මහාචාර්ය ආර්. කොචර් (R. Kochar) විශ්වාස කරයි. ඔහුගේ ගණන් බැලීම් වලට අනුව 'රාමායනයට' වඩා පැරණි යැයි සැලකෙන 'වේදාංග ජ්‍යෝතිෂ' නමැති ග්‍රන්ථය ලියා තිබෙන්නේ බැබිලෝනියාවේදීය. කෙසේ වෙතත්, හයිදරාබාද්හි වාසය කරන ආචාර්ය බී. ජී. සිද්ධාර්ථන්ගේ අදහසට අනුව 'අවෙස්ත' සහ 'රාමායනය' ලියා තිබෙන්නේ බැලූ බැල්මට පෙනී යනවාට වඩා විශ්වාස කිරීමට අපහසු තරම් වූ ඈත අතීතයේදීය. එනම් ක්‍රි. පූ. 7000 පමණය. ඔහුගේ මතයට අනුව 'ඍග්-වේදය' ලියා තිබෙන්නේ ඊටත් අවුරුදු දහස් ගණනකට පෙර ඇනටෝලියාවේදීය. මෙසේ දක්වා ඇති දින වකවානු බැලූ බැල්මට පෙනීයනවාට වඩා යථාර්ථවාදී විය හැකිය. ක්‍රිස්තු පූර්ව හත්වන සහස්‍රකයට අයත් දියුණු නාගරික

ශිෂ්ටාචාරයක නටබුන් හයිඩල්බර්ග් විශ්ව විද්‍යාලයේ පර්යේෂකයින් කණ්ඩායමක් විසින් තුර්කියේ නෙවලි කෝරි (Nevali Cori) නමැති ස්ථානයෙන් සොයාගෙන තිබේ. එහි තිබී සොයා ගන්නා ලද ප්‍රතිමා අතර ජීවමාන මිනිසකුගේ ප්‍රමාණයට අනුරූප වූ 'ඍග්-වේද' සමයට අයත් පූජකයකුගේ අංග සම්පූර්ණ විලාශය පිළිබිඹු කරන පිළිරුවක්ද ඇතුළත් වේ.[33]

මොනරු, රත්තරන් සහ වටිනා දැව: සොලමන් රජතුමාගේ ඉන්දියානු චාරිකා

යුදෙව් ජාතිකයින් පිළිබඳව ඉතිහාසයේ ප්‍රථම වරට සඳහන් වන්නේ ක්‍රි. පූ. 1400 දී පමණ ඉන්දු-ජර්මන් ගෝත්‍රිකයින් ඇනටෝලියාව, පර්සියාව සහ ඉන්දියාව යන රටවල පදිංචි වූ යුගයේදීය. ඒ කාලයේදී හීබෲ ජාතික සංචාරක එඬේරුන් ක්‍රම ක්‍රමයෙන් පලස්තීනයට පැමිණ පදිංචි වූහ. ඒ වනවිට යුදෙව් ජාතිකයින් ජීවත් වූයේ නොදියුණු සංචාරක එඬේරුන් වශයෙනි. ඔවුන්ගේ සමාජ සංවිධානය ඉතා ප්‍රාථමික මට්ටමක පැවතුනි. රැකවරණය පතා ඊජිප්තුවට පැමිණි යුදෙව් ජාතිකයින් බොහෝ විට වහල් මෙහෙය සඳහා යොදාගත් බව පෙනේ. නමුත් විශිෂ්ට මානවහිතවාදී නායකත්වයකින් හෙබි මෝසස්ට යුදෙව් ජාතිකයින් පත්ව සිටි පීඩාකාරී වහල් තත්වයෙන් මුදවා ගැනීමට හැකිවිය. ඔවුන් විශ්වාස කළ බහුදේව වාදය අත්හැර දැමීම පිණිස පොළඹවා ගැනීමට මෝසස් සමත් විය. ඉතිහාසය පුරා යුදෙව් ජාතිකයින් වෙත ආධිපත්‍යය පතුරුවන ලද සංස්කෘති වල රාවය පරණ තෙස්තමේන්තුවේ මුල් පොත්වල ඉතා පැහැදිලි ලෙස දක්නට ලැබේ. පැරණි තෙස්තමේන්තුවේ පස්වන පොත වූ ද්විතීය නීති සංග්‍රහයේ (Deuteronomy) දක්වා ඇති නීතිය, මූලික වශයෙන් බැබිලෝනියාවේ පැවති හමුරාබි නීතියේ (Hammurabic Law) සරල කරන ලද විස්තරයක් බවත් සොලමන් (Solomon) හී දක්වා ඇති උපදේශ වාක්‍ය සහ ගීතිකා රාශියකට පදනම් වී ඇත්තේ පැරණි ඊජිප්තු සාහිත්‍යය බවත් ඊජිප්තු පුරාණය පිළිබඳ සුප්‍රකට විද්වතෙකුවූ ජේ. එච් බ්‍රෙස්ටෙඩ් (J. H. Breasted) ප්‍රකාශ කර තිබේ.

ඉතිහාසයේ මුල් යුගවලදී ජාතීන් අතර පැවති සම්බන්ධතා සහ වෙළඳ මාර්ග පිළිබඳ කරුණු පැහැදිලි කළ හැක්කේ උපකල්පන සහ උපන්‍යාස මගින් පමණි. කෙසේ වෙතත් එම සම්බන්ධතා වැදගත් ප්‍රතිඵල ඇති කිරීමට හේතුවිය. ක්‍රි. පූ. 15 වන ශත වර්ෂය තරම් ඈත කාලයේදී ඊජිප්තු වැසියන්ට ඈත පෙරදිග රටවල නිෂ්පාදනය කරන ලද භාණ්ඩ

පරිභෝජනය සඳහා අවශ්‍යව පැලසුණි. ඒවා නයිල් ගඟ ආශ්‍රිත ප්‍රදේශවලට පැමිණියේ පුණෙවියන් හෝ පැරණි ෆිනීෂියානු වෙළෙඳුන්ගේ මුහුදු ගමන් වල ප්‍රතිඵලයක් වශයෙනි. පුරාවිද්‍යාඥයින් විසින් ක්‍රි. පූ. 1476 වර්ෂයෙන් අවසන් වූ මිසරයේ 18 වන රාජ වංශය පැවති යුගයට අයත් සොහොන් කොත් වල පිගන් මැටියෙන් සාදන ලද චීන මල් බඳුන් සොයාගෙන තිබේ. එපමණක් නොව මිසර දේශ වාසීන් සායම් දැමීම සඳහා ඉන්දීය පාට වර්ග සහ මලමිනී (Mummies) එතීම සඳහා ඉන්දියාවේ සාදන ලද කවනි රෙදි (සිහින් සුදු පිළි වර්ගයක්) පාවිච්චි කළහ.[34]

ඉන්දියාව සහ බටහිර රටවල් අතර පැවති සම්බන්ධතා සලකා බැලීමේදී, යුදෙව් ජාතිකයින් ඈත අතීතයේ පටන් පෙරදිග රටවල් සමග සම්බන්ධතා පැවැත්වූ බව පෙනේ. ක්‍රි. පූ. 1000 දී පමණ රජකළ ඩේවිඩ් රජතුමාගේ රාජ්‍ය සමයේ සිට බයිබලයේ දැක්වෙන යෙසායා (Isaiah) නමැති දිවැසිවරයාගේ කාලය දක්වා (ක්‍රි. පූ. 740-690) පලස්තීනය සහ ඔෆීර් (Ophir) නමින් හැඳින්වූ ස්ථානයක් අතර සැලෙන වෙළඳ සම්බන්ධතා පැවති බව සඳහන් වේ. ඔෆීර් යනු ජනප්‍රවාදයේ දැක්වෙන එල්ඩොරාඩෝ (Eldorado) නමින් හැඳින්වෙන යස ඉසුරින් පිරී අප්‍රකට ප්‍රදේශයක් ලෙස සලකනු ලැබීය. ඔෆීර් හි පිහිටි තාර්ෂිෂ් (Tarshish) නමැති නගරයේ සිට රත්තරන්, සඳුන් ලී, වටිනා ගල් වර්ග, ඇත් දළ, වානරයින් සහ මොනරු හිරාම් සහ සොලමන් රජතුමාට අයත් නැව් වලින් රැගෙන එන ලදී.[35] ජනප්‍රවාදයේ සඳහන් වන ඔෆීර් යනුවෙන් හඳුන්වනු ලැබූ නගරය පිහිටි ස්ථානය සොයා ගැනීම සඳහා ඉතිහාසඥයින් මෙන්ම බයිබලය විග්‍රහ කළ පුද්ගලයින්ද ගත වර්ෂ ගණනාවක් තිස්සේ මහත් සේ වෙහෙසුණහ. එය පිහිටා ඇත්තේ අරාබිය, අප්‍රිකාව, ආසියාව සහ පීරු යන රටවලින් එකක බව ප්‍රකාශ කරමින් බොහෝ දෙනෙක් කාලයක් තිස්සේ විවිධ අදහස් දැක්වූහ. සොලමන් රජතුමාගේ මාලිගය වෙත වටිනා භාණ්ඩ රැගෙන ආ එම නැව් පැමිණි ඔෆීර් නමින් හැඳින්වූ ස්ථානය ඇත්ත වශයෙන්ම පිහිටා තිබුණේ කොතැනකද?

මේ පිළිබඳව තරමක් දුරට විස්තරාත්මකව සලකා බලමු. අතීතයේදී සොලමන් රජතුමා සහ ෆිනීෂියන් වෙළඳුන් අතර බොහෝ සම්බන්ධතා පැවතිණි. සොලමන් රජතුමාට කාර්යධුර වෙළඳුන් වූ ෆිනීසියන් වරුන්ගේ සහයෝගය ලබා ගැනීම සඳහා සෑහෙන තරම් සාධාරණ හේතු තිබුණි. එකල මධ්‍යධරණී මුහුදේ සහ ඉන් ඔබ්බට පෙරදිග දක්වා විහිදුනු මුහුදු වෙළඳාමේ ආධිපත්‍යය දරන ලද්දේ ෆිනීෂියන් වරු බව අවිවාදයෙන් පිළිගත් කරුණකි. ඔවුහු දක්ෂ වෙළඳුන් වූහ. අතීතයේදී

ෆිනීසියන්වරු තරම් නිර්භීතව මුහුදු ගමන් වල නිරත වූ වෙනත් ජාතියක් නොවීය. එපමණක් නොව, වෙනත් කිසිම ජාතියකට ෆිනීෂියන් වරුන්ට තරම් දක්ෂ නාවිකයින් නොසිටියේය. ඔවුහු මුහුදින් අප්‍රිකාව වටා ගමන් කිරීමට පවා නිර්භීත වූහ. නාවික පහසුකම් ජාලයක් සහ එකල දැන සිටි ලෝකය හරහා ඈත ප්‍රදේශවල පැතිර තිබූ නැව් තොටවල් හැර ෆිනීෂියන් වරුන්ට ජීවත්වීම සඳහා ඔවුන්ටම අයත්වූ වෙනම රටක් නොතිබුණි. ටයර් (Tyre) නැමති ෆිනීෂියානු නගරයේ සිට ඔෆීර් දක්වා පිටත්ව ගිය මුහුදු ගමන් වලදී සොලමන් රජතුමාගේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කළේ 'හිරාම්' නැමති පුද්ගලයෙකි. රතු මුහුද ආශ්‍රිත ප්‍රදේශවල ජීවත්වූ ගෝත්‍රික ජනයා මෙන් නොව හිරාම් ප්‍රවීණ නැවියෙකු විය.

ඔෆීර් දක්වා ගමන් කර ආපසු පැමිණීමට වසර තුනකට නොඅඩු කාලයක් ගත වීම නිසා ඔෆීර් පිහිටා තිබුණේ සිතා ගැනීමට පවා අපහසු වූ ඈත ප්‍රදේශයක බව පෙනේ.[36] ඔවුන් ඔෆීර් දක්වා පිටත් වූයේ එදොම් මුහුදු වෙරළේ ඒලාත් නමැති නගරයට ආසන්නයේ පිහිටි ඊජියන් - ගෝබර් (Egeon-gober, Ezjon-geber) නමැති වරායෙනි. රතු මුහුද දක්වා විහිද ගිය ගොඩබිම් තවලම් මාර්ගය වැටී තිබුණේ 'එදොම්' රට හරහා බැවින් ඩේවිඩ් රජතුමා 'එදොම්' රට යටත් කර ගත්තේය. එකල ඊශ්‍රායලයේ ආධිපත්‍යය හිමිවී තිබුණේ සොලමන් රජතුමාටය.[37] එතැන් සිට රතු මුහුද හරහා ගිනිකොන දිග ප්‍රදේශවලට ඔවුහු ගමන් කළහ. ඔවුන්ගේ ගමනාන්තය වූයේ කොතැනද? මෙතරම් අවිනිශ්චිතවූත්, අනතුරුදායකවූත් උත්සාහයක් දරමින් ඔෆීර් දක්වා ගමන්කළ නැවියන් විසින් රැගෙන එනු ලැබූ රත්තරන් පමණක් නොව අතිශයින් වටිනා අනෙකුත් භාණ්ඩ පිළිබඳවද සලකා බැලීමේදී 'ඔෆීර්' සහ 'තාර්ෂිස්' යන ස්ථාන භූගෝලීය වශයෙන් පිහිටා තිබූ තැන් පිළිබඳ කිසියම් ඉඟියක් ලැබේ. රත්හඳුන් ගස්, මොනරු සහ වානරයින් මෙසේ ගෙන්වන ලද භාණ්ඩ අතර විය. මේ සියලුම වෙළඳ භාණ්ඩ ඉන්දියාවට ආවේණික වූ ඒවා විය. වානරයින් වෙනත් ප්‍රදේශ වලින් පවා ලබාගත හැකි වුවත් සොලමන් රජතුමාට අවශ්‍යවූ උසස් වර්ගයේ රත් හඳුන් ගස් වෙනත් ප්‍රදේශයකින් ලබාගත හැකිද යන්න අවිනිශ්චිතය. එපමණක් නොව මොනරු ලබාගත හැක්කේ ඉන්දියාවෙන් පමණි. කෙසේවෙතත් මෙම වෙළඳ භාණ්ඩ තුනම ඉන්දියාවෙන් ගෙන ආ බව එම භාණ්ඩ හැඳින්වීම සඳහා බයිබලයේ යොදා ඇති හීබෘ වචන සාක්ෂි දරයි. ඒවා ඉන්දියානු වචන වලින් සෘජුව බිඳී විත් තිබේ. ඇල්මග් (Almug) යනුවෙන් හඳුන්වා ඇති ගස් වනාහි සුවඳ වත් ඉන්දියානු රත් හඳුන්ය. (සංස්කෘත භාෂාවෙන් වල්ගු - Valgu). හීබෘ භාෂාවෙන් මොනරු හැඳින්වෙන්නේ (Thukkiyim) 'තුක්කියිම්' යනුවෙනි. එය දෙමළෙන් තෝකෙයි හෝ තෝගායි (Togai)

යනුවෙන්ද සංස්කෘත භාෂාවෙන් 'සිකිම්' (Sikhim) යනුවෙන්ද හැඳින්වේ. හීබෲ භාෂාවෙන් වානරයා හැඳින්වෙන්නේ කොප් (Koph) යනුවෙනි. එය සංස්කෘත භාෂාවෙන් කපි (Kapi) යනුවෙන් හැඳින්වේ. හීබෲ භාෂාවෙන් ඇත් දළ වලට දී ඇති නාමය 'ෂෙන් හබිම්' (Shen Habbim) වන අතර එය දෙමළ භාෂාවෙන් හැඳින්වෙන්නේ 'ආබ්' (ab) යනුවෙනි.[38] පැරණි තෙස්තමේන්තුවට අයත් වංශාවලිය සහ රාජාවලිය (Chronicles and Kings) යනුවෙන් හැඳින්වෙන පොත් ඒකාබද්ධ කරනු ලැබූ කාලයේදී ඉන්දියාවෙන් මොනරු නිර්යාත කළ බවට කරුණු හෙළිවී තිබේ. එම භාණ්ඩ හැඳින්වීම සඳහා බයිබලයේ යොදා ඇති නම් සලකා බැලීමේදී පැරණි තෙස්තමේන්තුවේ සඳහන් කර ඇති අනෙකුත් වෙළඳ භාණ්ඩ ඉන්දියාවෙන් ගෙන්වා ඇති බව පැහැදිලි වේ. කෝමාරිකා වලින් වැහෙන සුවඳ ලාටු හීබෲ භාෂාවෙන් හඳුන්වන්නේ 'ආලිම්' (Ahalim) යනුවෙනි. (හිතෝපදේශ 7 : 17*, ප්‍රේමගී 4: 14**) 'ආලිම්' යන හීබෲ වචනය බිඳී ඇත්තේ අගරු (Agaru) යනුවෙන් හැඳින්වෙන සංස්කෘත වචනයෙනි.

මෙහි සඳහන් කර ඇති සමහර වෙළඳ භාණ්ඩ හැඳින්වීම සඳහා දෙමළ භාෂාවෙන් බිඳී ආ වචනද යොදා තිබේ. එතෙකුදු වුවත් ඔෆීර් යනුවෙන් හැඳින්වුනු ස්ථානය ද්‍රවිඩ ගෝත්‍රිකයින් ජීවත්වන දකුණු ඉන්දියාවේ ප්‍රදේශයක පිහිටා තිබූ බව ඉන් අදහස් නොවේ. හඳුන් ලී සහ මොනරු ඉන්දියාවේ වෙනත් ප්‍රදේශවල ජීවත්වූ ද්‍රවිඩ වෙළෙඳුන්ගේ මාර්ගයෙන් ලබාගැනීමට ඉඩ තිබුණි. හිරාම්ට අයත් නැව් ගිනිකොන දිග ඉන්දියාවේ ඉන්දු ගඟ මුහුදට වැටෙන ප්‍රදේශයේ පිහිටි වරායකට පැමිණි බව හැඟවෙන බොහෝ කරුණු තිබේ. පුරාතන ඉතිහාසය පිළිබඳ ප්‍රසිද්ධ පර්යේෂකයින් දෙදෙනෙකු වූ ක්‍රිස්ටියන් ලැසන් (Christian Lassen) සහ ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් කනින්හැම් (Sir Alexander Cunningham) නැමති පඬිවරුන් විසින් ඔෆීර් යනු පැරණි ඇබේරියාව (Aberia) බව හඳුනාගෙන තිබේ. එය සංස්කෘත භාෂාවෙන් අභීර (Abhira) යනුවෙන් හඳුන්වනු ලැබේ. අභීර යනු ඉන්දු ගංගාවේ ඩෙල්ටා ප්‍රදේශය හැඳින්වීම සඳහා යොදා තිබූ නාමයයි.[39] සොලමන් රජතුමා වෙනුවෙන් ජනප්‍රවාදයේ එන ඔෆීර් දක්වා මුහුදින් ගමන් කිරීමට ඉදිරිපත් වූ පළමුවන නැවියා සොලමන් රජතුමාගේ නියෝජිතයා වූ 'හිරාම්' යැයි අප විසින් මෙහිදී කල්පනා කළයුතු නොවේ. ක්‍රි. පූ. දෙවන සහස්‍රකය තරම් ඈත කාලයේදී ඇසිරියන්වරු නිරන්තරයෙන් ෆිනීෂියන්වරු වාසය කළ

* සුවඳලාටු වලින්ද, අගිල් වලින්ද, කුරුඳු වලින්ද මාගේ යහනට සුවඳ හැමීමි. (හිතෝපදේශය 7 : 17)

** ජටාමාංශ හා කුංකුමත්, වදකහ සහ කුරුඳුත්, සැම තවරලා ගසුත්, ගන්ධරස සහ අගිල්ද සැම ප්‍රධාන සුවඳ ද්‍රව්‍යද දරන ගස්ත් එහි වැවෙන්නේය. (ප්‍රේම ගී 4 : 14) (පරිවර්තන)

ප්‍රදේශවලට ප්‍රහාර එල්ලකර එම ස්ථාන යටත් කර ගත්හ. ඒ නිසා ෆිනීෂියානු වෙළඳුන්ට මධ්‍යධරණී මුහුදු ප්‍රදේශයේ කරනු ලැබූ වෙළඳාම් පුළුල් කරමින් අලුත් මුහුදු ප්‍රදේශ සොයා යාමට සිදුවිය. ඩේවිඩ් සහ සොලමන් වාසය කළ යුගයට පෙර රතු මුහුදේ පිහිටි වරාය පාවිච්චි කිරීම සඳහා අවසර ලබා දෙන ගිවිසුම් ෆිනීෂියන් වරු සහ එදොම් වරු අතර තිබුණි. මෙසපොටේමියාව සහ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් රටවල් සමග වෙළඳාම් කිරීම සඳහා එකල පැවති මුහුදු මාර්ග ප්‍රයෝජනයට ගැනීම නිසා ඔෆීර් දක්වා වැටී තිබුණු මුහුදු මාර්ගය පිළිබඳව ඔවුහු හොඳින් දැන සිටියහ.

මුහුදු ගමන් වලදී තමන් හොඳින් දැන සිටි ස්ථාන වලට පමණක් ගමන් කිරීම වැදගත් විය. මෝසම් සුළං පිළිබඳව ඔවුන්ට මනා අවබෝධයක් තිබීම නිසා ඔවුන් ඉන්දියානු උප මහාද්වීපයට කෙලින්ම ගමන් කළේ නැත. වෙළඳ ජාතියක් වශයෙන් තමන් ගමන් කරන මුහුදු මාර්ගය ඔස්සේ පිහිටි සියලුම වරායවල සිදු කෙරෙන ව්‍යාපාරික කටයුතු පිළිබඳ මනා අවබෝධයක් තිබූ අතර ඔවුන් සොයා ගිය දුර්ලභ ගණයේ භාණ්ඩ දුර රටවලින් රැගෙන ආ යුතුව තිබූ හෙයින් ඔෆීර් සහ තාර්ෂිස් වරාය වල සැලකිය යුතු කාලයක් ඔවුන් නතර වී සිටින්නට ඇත. හිරාම්ට අයත් නැව් රටින් පිටවී යේමන් මුහුදු තීරය ඔස්සේ ගාඩෆුයි තුඩුව (Cape Guardafui) හරහා සොකොට්‍රා දිවයින දක්වාත් ඒවන් සිට අරාබි මුහුදු කරය ඔස්සේ ඊසාන දෙසටත් යාත්‍රා කළේය. හෝර්මුස් (Hormuz) සමුද්‍ර සන්ධිය හරහා ඔවුන් පළමුව බහරේන් දූපත් වලටත් එතැන් සිට නැගෙනහිර පිහිටි ඕෆීර් සහ ටාර්ෂිස් දක්වාත් ගමන් කළහ. ටයිලොස් (Tylos) [ඇසිරියානු භාෂාවෙන් දිල්මුන් (Dilmun) හෝ ටිල්මුන් (Tilmun)] සහ ඇරඩස් (Aradus) යනුවෙන් හැඳින්වෙන පර්සියානු බොක්කේ පිහිටි දූපත් දෙක පැරණි ෆිනීෂියානු ජනාවාස දෙකක් විය. එනිසා මුහුදු ගමන් වල යෙදී සිටින අවස්ථා වලදී බහරේන්හි නතර වීම වැදගත්බව හිරාම්ට පෙනී ගියේය. එම දූපත් හරප්පා ශිෂ්ටාචාරය සහ මෙසපොටේමියාව අතර ක්‍රි. පූ. 3 වන සහස්‍රකය තරම් ඈත කාලයකදී මුහුදින් කරනු ලැබූ වෙළඳ ගමන් සම්බන්ධයෙන් වැදගත් මධ්‍යස්ථාන වශයෙන් පැවති බව, එම දූපත් වල කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම් මගින් තහවුරු වී තිබේ.[40] මෙසේ බහරේන් දූපත් නැගෙනහිර සහ බටහිර රටවල් අතර භාණ්ඩ හුවමාරු කිරීමේ වැදගත් මධ්‍යස්ථානයක් වශයෙන් පැවතුණි. ඌර් සහ ටිල්මුන් (Tilmun) අතර වෙළඳ කටයුතු වල යෙදී සිටි අලික් ටිල්මුන් (Alik Tilmun) නමැති පුද්ගලයෙකු පිළිබඳව ඇකේඩියානු (Accadian) ලේඛන වල සඳහන් වේ. ඇත්දත්, විවිධ දැව දඬු, කපු, මුතු සහ තඹ වැනි වටිනා භාණ්ඩ මක්කන් (Makkan) සහ

මෙලූහා (Meluhha) වැනි දුර බැහැර පිහිටි ප්‍රදේශ වලින් ගෙනෙන ලදී. ඌර් (Ur) හි පැවති තුන්වන රාජවංශයේ අවසාන කාලයේදී (ක්‍රි. පූ. 1963 - 1939) ඉබි-සින්ගේ (Ibbi-Sin) රාජ්‍ය සමයට අයත් පුරා විද්‍යාත්මක සොයා ගැනීම්, පොත් පත් සහ වෙළඳ වාර්තා වල දැක්වෙන කරුණු වලට අනුව මක්කන් සහ මෙලූහා යනුවෙන් හඳුන්වන ලද්දේ නැගෙනහිර බලුකිස්ථානය සහ ඉන්දු ගඟේ මෝය කට ආශ්‍රිත වෙරළ බඩ ප්‍රදේශය බව පැහැදිලිවේ. ෆිනීෂියන්වරු අත්තිමේදී නැගෙනහිර මුහුදු ගමන් සඳහා ටයිලෝස් (Tylos) සහ ඇරඩස් (Aradus) දූපත් වඩා යෝග්‍යවූ කඳවුරු ලෙස සලකා ඒවා අත්පත් කර ගත්හ.

හිරාම්ගේ නැව් ගමන් කළ ඔෆීර් නමැති ස්ථානය ඇත්ත වශයෙන්ම වරක් මක්කන්/මෙලූහා යනුවෙන් හැඳින්වූ ස්ථානයම විය. විල්මුන් සිට ඔහු එම ප්‍රදේශ සංචාරය කර තිබුණි. සුමේරියන් වරුද මේ වනවිට ඔවුන් මහත් සේ ප්‍රිය කළ ලී වර්ග. සහ විවිධ වර්ණ වලින් යුක්ත මෙලූහාහි ජීවත්වන ජනප්‍රිය පක්ෂියා වූ, මොනරු ලබාගැනීම පිණිස මෙම මුහුදු මාර්ගය ප්‍රයෝජනයට ගත්තේය. සොලමන් රජතුමාගේ රාජසභාවට මෙම භාණ්ඩ සපයාදීම හිරාම්ට පැවරුනු කාර්යය විය.

ඈත අතීතයේදී ඉතා දුර බැහැර ප්‍රදේශවලට පැතිර ගිය කිසියම් වැදගත් කමකින් යුක්ත වූ නැගෙනහිර සහ බටහිර රටවල් අතර මුහුදින් කෙරෙනු වෙළඳාම පිළිබඳ පැහැදිලි අදහසක් ඔෆීර් දක්වා ගිය මුහුදු ගමන් වලින් ලැබේ. 'ඍග්-වේදය' වැනි පැරණි වෛදික ග්‍රන්ථ වල විශාල නැව් මගින් කරන ලද මුහුදු ගමන් පිළිබඳ විස්තර සඳහන් වී තිබෙන නිසා ඔෆීර් දක්වා පිටත්ව ගිය මුහුදු ගමන් වලට ඉන්දියානුවන්ද සහභාගී වූ බව සිතිය හැකිය (ක්‍රි. පූ. 12-10 ශතවර්ෂය). සෙනාචෙරිබ් (Sennacherib) නමැති ඇසිරියානු රජතුමා තම මාලිගාවේ කුළුනු සහ දොරවල් සඳහා පාවිච්චි කරන ලද සින්ඩ් හෝ සින්දු යනුවෙන් හඳුන්වනු ලැබූ (Sind Sindu) සහ මිසු (Misu) යනුවෙන් හඳුන්වනු ලැබූ ලී වර්ග ගෙන්වාගනු ලැබුවේ මක්කන් (Makkan) වලිනි. සින්දු (Sindu) යන වචනය පැරණි බැබිලෝනියානු සහ සුමේරියානු ග්‍රන්ථවල දක්නට නොමැත. සින්දු යනු ඉන්දු ගඟ සහ එය ගලා බසින භූමි ප්‍රදේශය හැඳින්වීම සඳහා යොදා තිබෙන ඉන්දු-ආර්ය වචනයයි. ඉරානයේදී සින්ඩ් (Sind) යන වචනය හින්ඩ් (Hind) යනුවෙන් වෙනස් විය. එය ග්‍රීසියටද පැතිර ගියේය. සින්ඩ් (Sind) යන වචනය මුලින්ම ඇතිවූ රටේ මිනිසුන් හින්දූන් (Hindus) නමින් හඳුන්වනු ලැබීය. ඔවුන්ගේ ආගමික විශ්වාස හැඳින්වීම සඳහා එම නම අදත් පාවිච්චි කරනු ලැබේ. ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දිය ආක්‍රමණය පිළිබඳව පසු කාලයේදී ලියන ලද වාර්තාවල සඳහන් වන පරිදි ඉන්දු ගංගා නිම්නයේ ඉතා පොහොසත් වන සම්පතක් පැවති

බවත් එම සම්පත් වෙළඳාම සඳහා යොදාගත් බවත් පැහැදිලි වේ. එපමණක් නොව ලෙඩ සුවකිරීමේ බලයක් ඇතැයි විශ්වාස කරනු ලැබූ ෆෙරුලා ගැල්බනිෆ්ලුවා (Ferula galbaniflua) (දුම්මල ලාටු වැහෙන ගස් වර්ගයක්) නමැති ගස්වලින් වැහෙන ලාටු වලට විශාල ඉල්ලුමක් මෙසපොටේමියාවේ තිබුණි. මෙම පැළෑටිය නැගෙනහිර ඉරානයට සහ ඇෆ්ගනිස්ථානයට ආවේනිකවූ වෘක්ෂයක් විය. එය ලබාගත හැකිවූයේ එම ප්‍රදේශ වලින් පමණි. .

රටේ දකුණු ප්‍රදේශයේ ඇතිවූ කැරලි මර්ධනය කිරීම සඳහා ඇසිරියන්වරු සිදුකළ ආක්‍රමණයකදී ක්‍රි. පූ. 689 දී සෙනචෙරිබ් (Sennacherib) විසින් බැබිලෝනියාව කොල්ලකනු ලැබීය. පර්සියාවේ මීඩිස් (Medes) වරු විසින් ඇසිරියන්වරු බරපතල පරාජයට පත් කිරීමෙන් පසු (ක්‍රි. පූ. 625) චැල්ඩියන් (Chaldeans) හෝ සෙමිටික් (Semitic) එඬේර ගෝත්‍රිකයින් මෙසපොටේමියාවේ ආධිපත්‍යය ලබා ගැනීම සඳහා කටයුතු කළහ. නෙබුචඩ්නෙසර් (Nebuchadnezzar) (ක්‍රි. පූ. 604-562) ගේ නායකත්වය යටතේ ඔවුන්ගේ රාජධානිය ඊජිප්තුව දක්වා ව්‍යාප්ත කරන ලදී. අනතුරුව චැල්ඩියන් වරු ඉන්දියාව සමග කරන ලද මුහුදු වෙළඳාමද වැදගත් වර්ධනයක් ඇති විය. ක්‍රි. පූ. 7 වන ශතවර්ෂයේ පටන් දෙරට අතර මුහුදු මගින් බොහෝ සම්බන්ධතා පැවති බවට සාක්ෂි තිබේ.[41] ආර්යයන් මුහුදින් කෙරෙන වෙළඳාමේ යෙදීසිටියමුත් මේ කාලයේදී පැහැදිලිවම මුහුදු ආධිපත්‍යය දරණ ලද්දේ ද්‍රවිඩ ජාතිකයින් විසිනි. ක්‍රි. පූ. 300 දී පමණ රචිත කෘතිවල බෞද්ධායන (Baudhayana) සහ ගෞතම විසින් දේශනා කරන ලද ධර්ම සූත්‍රවල දීර්ඝ මුහුදු ගමන් වල යෙදීම පූජකයින්ට තහනම් කර තිබුණු අතර එම නීතිය කඩකිරීම සඳහා නියම කරන ලද දඬුවම වූයේ ඔවුන් කුලයෙන් පහත හෙළීමය. ආර්ය බ්‍රාහ්මණ පූජකයින් දීර්ඝ මුහුදු ගමන් යෑමෙන් වැළකී සිටියේය'යි මෙයින් නිගමනය කළයුතු නැත. උතුරේ විසූ ආර්යයන් මෙම නියෝග වලට එතරම් සැලකිල්ලක් නොදැක්වූ බව බෞද්ධායනගේ ධර්ම සූත්‍රයේ සඳහන්වේ.

ඉන්දු ගං මෝය ප්‍රදේශයේ සිට ඉන්දියානු ජාතිකයින් සේබියන් වරුන්ගේ රට හෙවත් සුකාත්‍රා දිවයිනට (දීප සුකත්‍රා) ගමන් කළ බව ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේදී නිඩෝස් (Knidos) හි වාසය කළ අගතාචයිඩ් (Agatharchides) සඳහන් කර තිබේ. ගඩාෆුයි තුඩුවට ඔබ්බෙන් පිහිටි සොකොට්‍රා දූපත ඉන්දියානුවන් හැඳින්වූයේ සුකත්‍රා දූපත යනුවෙනි. 'සුකත්‍රා' නැමති වචනයේ අර්ථය ඉතා සතුටුයි (Very happy) යනුය. මෙම ගුණවාචක පදය ෆීලික්ස් ඇරේබියා (Felix Arabia) යනුවෙන් හඳුන්වනු ලැබූ මුළු දකුණු ආරාබිය හැඳින්වීම සඳහා යොදාගනු ලැබීය.

ගිලික්ස් ඇරේබියා යන පදයේ අර්ථය වාසනාවන්ත අරාබිය යනුය. ජේසියන්ස් ප්‍රදේශයේ ඉන්දියානු ජාතිකයින් පදිංචිව සිටි වෙළඳ ජනපද තිබූ බව එහි 'නගර' යන සංස්කෘත වචනයෙන් හැඳින්වෙන ස්ථානයක් තිබීම නිසා පැහැදිලි වේ. ඒ කාලයේදී ඉන්දියානුවන් නැගෙනහිර අප්‍රිකානු වෙරළබඩ ප්‍රදේශවලත් චීනයේ මුහුදු තීරයේත් සිටියහ. බැබිලෝනියාව සහ චීනය අතර පැවති වෙළඳාමේ තැරැව්කරුවන් ලෙස ඔවුහු ක්‍රියා කළහ. 'සීන්' යනු බැබිලෝනියාවට ඉතා දුර බැහැර ප්‍රදේශයකින් පැමිණි මිනිසුන් කොටසක් බව බයිබලයේ එන ඩියුටෙරෝ යෙසායා (Deutero-Isaiah) නමැති පොතේ දැක්වේ. සීන් යනුවෙන් හැඳින්වෙන්නේ ඉන්දියානුන් විසින් කීනා (Kina) යනුවෙන් හඳුන්වනු ලැබූ චීන ජාතිකයින් විය යුතුය. චීනය සහ බැබිලෝනියාව අතර පැවති සම්බන්ධතා වලදී ඉන්දියාවද ඊට මැදිහත් විය. ඉන්දියානු අදහස් සමග සම්මිශ්‍රණය වී චැල්ඩියන් මූලාශ්‍රයකින් ජ්‍යොතිෂ ශාස්ත්‍රය සහ ඉන්ද්‍රජාල විනය දක්වා පැතිර ගිය බවත්, එය සිදුවූයේ ක්‍රි. පූ. 6ට පසු එරිත්‍රියානු මුහුදේ (Erythrean Sea) වෙළඳාම් කළ වෙළඳුන් මගින් බවත් පැවසෙන අදහසක් ඉදිරිපත් කර තිබේ. දෙගම්මැදි රාජ්‍යයේ (Land of Two rivers) පාලකයින්ට ඈත දුර පිහිටි ඉන්දියාවේ තිබූ වටිනා සම්පත් පිළිබඳ අවබෝධයක් තිබූ බවත් ඔවුන්ගේ මාලිගා විසිතුරු කිරීමට එම සම්පත් යොදාගෙන ඇති බවත් බර්ස් නිම්රුඩ් (Birs Nimrud) හි පිහිටි තම මාලිගයේ බාල්ක සඳහා නෙබුචඩ්නේසර් රජතුමා විසින් ඉන්දියානු දේවදාර ලී යොදාගෙන තිබීමෙන් පැහැදිලි වේ. ඌර් හී (Ur) පිහිටි සඳ දෙවියන් සඳහා ඉදිකරන ලද දේවස්ථානයේ (Neo-Babylonian Temple of the moon) වහලය ඉදිකිරීම සඳහා ඉන්දියානු තේක්ක ලී යොදාගෙන තිබේ.

බැබිලෝනියාව සමග පසුකාලයේදී ඇතිවූ වෙළඳාම පිළිබඳව සලකා බැලීමේදී අපට නැවත වරක් සොලමන් රජතුමා විසින් ගෙන්වා ගත් මොනරු පිළිබඳව අසන්නට ලැබේ. ඉන්දියානුවන් විසින් බාවේරු රටට (බැබිලෝනියාව) මොනරු නිර්යාත කළ බව බාවේරු ජාතකයේ සඳහන් වේ. පූර්ව ආත්ම භාවයකදී බුදුන් වහන්සේ මොනරකු ලෙස උපත ලැබූ බව බාවේරු ජාතකයේ සඳහන් වේ. බාවේරු ජාතකයට සම්බන්ධ සුප්‍රසිද්ධ කථා ප්‍රවෘත්තිය ඉතා පැරණි කථාවක් විය යුතුය. හයවන ශත වර්ෂයට පෙර පවා ඈත අතීතයේදී බැබිලෝනියාවට මොනරුන් ආයාත කළ බව අපි දනිමු. ක්‍රි. පූ. 745-727 කාල පරිච්ඡේදයේදී ඇසිරියාව පාලනය කළ තුන්වන ටිග්ලත් පිල්සර් නමැති රජතුමාට ලැබුණු කප්පම් අතර දම් සහ නිල් පැහැති පියාපත් වලින් හෙබි දෙව්ලොවින් ආ කුරුල්ලන්ද ඇතුළත් වූ බව රාජකීය වාර්තාවල සඳහන් වේ. එම කුරුල්ලන් මොනරුන් විය යුතුය.

ඇසිරියානු සහ චැල්ඩියන් (Chaldean) යුගවලදී පර්සියන් බොක්ක හරහා මෙසපොටේමියාව සහ ඉන්දියාව අතර පැවති සම්බන්ධතාවයේ තීව්‍රතාවය සහ සංස්කෘතික වශයෙන් තිබූ වැදගත්කම පෙන්නුම් කරන තවත් සාධකයක් නම් ඉන්දියානුවන් විසින් ලිඛිත අක්ෂර හැඩගස්වා ගැනීමය. උතුරු සෙමිටික් ග්‍රන්ථවල (Semitic Script) දක්නට ලැබෙන පැරණිතම අක්ෂර ස්වරූපය බ්‍රාහ්මී අක්ෂර වලද දක්නට ලැබේ. ඒවා හඳුන්වා දෙන ලද්දේ ක්‍රි. පූ. 890-750 අතර කාලපරිච්ඡේදයේදී මෙසපොටේමියාවේ සිට පැමිණි ඉන්දීය වෙළඳුන් විසිනි.[11] මෙම ලේඛන ක්‍රමය මුලදී යොදාගන්නා ලද්දේ පරිපාලන සහ වෙළඳ කටයුතු සඳහා පමණි. ක්‍රි. පූ. 250 දී පමණ බ්‍රාහ්මී අක්ෂර යම්යම් වෙනස්කම් සහිතව අංග සම්පූර්ණ හෝඩියක් ලෙස වර්ධනය වී මුළු ඉන්දියාව පුරා පැතිර ගියේය. ක්‍රි. පූ. 705-675 කාලයේදී ආකෙමෙනීස්ගේ (Achaimenes) ආධිපත්‍යය ඉරානයේ පැතිරීමත් සමග එහි රාජ්‍ය භාෂාව වශයෙන් මුළු රට පුරාම යොදා ගන්නා ලදී. යටත් පිරිසෙයින් තුන්වන සහස්‍රකයේදී ප්‍රාග් ඇරමයික් හෝඩිය ඉන්දු නිම්න ප්‍රදේශයේ භාවිත කරනු ලැබිය. එහිදී එය වැඩිදුරටත් වර්ධනය වීමෙන් කරොෂ්ඨි හෝඩිය බිහිවිය. ඇරමයික් මෙන්ම කරොෂ්ඨි අක්ෂරද ලියැවෙන්නේ වමේ සිට දකුණටය. කෙසේ වෙතත් කරොෂ්ඨි ප්‍රාදේශීය හෝඩියක් වශයෙන් පැවති අතර බ්‍රාහ්මී හෝඩිය දේවනාගරී අක්ෂර වලට ප්‍රමුඛත්වය දෙමින් නූතන ඉන්දීය හෝඩිය සකස්වීම සඳහා අවශ්‍ය පදනම සැපයිය. උතුරු සෙමිටික් අක්ෂර තම රටට හඳුන්වා දුන් ඉන්දීය වෙළඳුන් විසින් සෙමිටික් ජනප්‍රවාද ඉන්දියාවට හඳුන්වා දෙනලදී. ඉන් සමහර කථා ක්‍රි. පූ. 7-8 ශත වර්ෂවලට අයත් බ්‍රාහ්මණ (Brahmanas) යනුවෙන් හැඳින්වෙන පැරණිතම ග්‍රන්ථවල දක්නට ලැබේ. බැබිලෝනියාවේ ඇතිවූ මහා ජලගැලීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය 'ස්තපථ බ්‍රාහ්මණ' නැමති පොතේ (Stapatha-Brahmana) සඳහන් වේ. සමහර විට එම කථා ප්‍රවෘත්තිය ඉන්දියාවට ලැබෙන්නට ඇත්තේ බැබිලෝනියාව සමග පැවති මුහුදු සම්බන්ධතා හේතුවෙන් බව පෙනේ.

මෙසපොටේමියාව සමග ශත වර්ෂ ගණනාවක් මුහුදු වෙළඳාමේ යෙදීමෙන් පසු ක්‍රි. පූ. 6 වන ශත වර්ෂයේදී ඉන්දියානුවන් බැබිලෝනියාවේ ස්ථිර වාසස්ථාන පිහිටුවා ගත්හ. බැබිලෝනියාවේ බොහෝ විදේශිකයන් සිටි බව බාල් (Baal) හි ජීවත්වූ බෙරෝසස් (Berosus) නැමති චැල්ඩියන් (Chaldean) පූජකවරයකු විසින් ක්‍රි. පූ. තුන් වන ශතවර්ෂයේදී ලියන ලද සුප්‍රසිද්ධ පුරාවෘත්තයේ සඳහන් වේ. එය අහම්බෙන් සිදුවූ දෙයක් නොවේ. කලින් එහි පැවති දේවස්ථාන සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් ලබා තිබූ මෙම නගරය ඉතා ඉක්මනින් ලෝකයේ තිබූ විශාලතම වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්විය.

නෙබුචද්නේසර් රජතුමා විසින් එය නැවත ගොඩනගා අලංකාර ලෙස විසිතුරු කර ආශ්චර්යමත් නගරයක් බවට පත් කළේය.

මීට කලින් ශත වර්ෂවලදී දෙගම්මැදි රටේ වැසියන් සහ යුදෙව්වන් අතර පැවතියේ ආර්ථික සම්බන්ධතා වලට වඩා දේශපාලන සම්බන්ධතාවයන්ය. ක්‍රි. පූ. නව වන ශතවර්ෂයේ මැද භාගයේදී නව ජීවනයක් ලැබූ ඇසිරියන් අධිරාජ්‍යයා පලස්තීනයට සහ සිරියාවට පහර දුන්නේය. ඉන්දියාවෙන් අලි ඇතුන් ගෙන්වාගත් ක්‍රි. පූ. 859-824 කාලයේ රජ කළ තුන්වන ශල්මනේසර් ඊශ්‍රායලයට සහ ජුදා දේශයට තර්ජනයක් එල්ල කළේය. කෙසේ වෙතත් ක්‍රි. පූ. 18 වන ශතවර්ෂයේදී ඇරමයික්හි විවිධ ගෝත්‍ර අතර බලය සඳහා අරගල පැවතුනත් මේ රටවල් දෙකම දියුණුවට පත්විය. නැවත තුන්වන තිග්ලත් පිලසර් රජතුමා යටතේ ඇසිරියන්වරු ඊශ්‍රායලය සහ ජුදා දේශය යටත් කර එහි වැසියන් ඇසිරියාවේ වහලුන් ලෙස සේවයේ යොදාගත්හ.

චැල්ඩියන් වරු දෙගම්මැදි රට පාලනය කළ සමයේදී බයිබලයේ ඓතිහාසිකත්වය සම්බන්ධයෙන් පමණක් නොව යුදෙව් ආගමික අදහස් වල පරිවර්තනයක් ඇතිවීම කෙරෙහි තීරණාත්මක ලෙස බලපෑ සිදුවීමක් විය. ක්‍රි. පූ. 587 දී නෙබුචද්නේසර් රජතුමා ජෙරුසලම යටත් කරගෙන එහි සිටි යුදෙව් ජාතිකයින් බොහෝ දෙනෙක් වහලුන් වශයෙන් අවුරුදු 50 කට බැබිලෝනියාවට පිටුවහල් කරනු ලැබිය (ක්‍රි. පූ. 586-536). එකල පැවති පුද්ගලයකුගේ ආයුෂ අපේක්ෂාව අනුව අවුරුදු 50 ක් යනු පරම්පරා දෙකක් පමණ වූ කාලපරිච්ඡේදයකි. පිටුවහල් කරනු ලැබීමෙන් අවුරුදු 50 පසු නැවත පලස්තීනයට පෙරලා පැමිණි යුදෙව්වන්ගෙන් බොහෝ දෙනෙක් එම කාලය තුලදී බැබිලෝනියාවේ උපන් අයවූහ. බැබිලෝනියානු ජීවන ක්‍රමයට හුරුවී සිටි ඔවුන් හැදී වැඩුනේ විවිධ ජන කොටස්වලට අයත් මිනිසුන් ජීවත්වූ ලෝකයට විවෘත වූ සමෘද්ධිමත් නාගරික පරිසරයක් තුළය. බැබිලෝනියාවේ උපත ලැබූ මෙම ඊශ්‍රායල් දරුවන් විදේශ බලපෑමට යටත් නොවී ජීවත්වීමට කෙතරම් උත්සාහ කළත් ඔවුන්ට තමන් යටත් කරනු ලැබූ පාලකයාගේ අණ පිළිපැදීමට සිදුවිය.

බැබිලෝනියාවේ ජීවත්වූ කාලයේදී ඔවුහු නිරන්තරයෙන්ම විදේශීය සංස්කෘතිවල බලපෑමට ලක්වූහ. එහිදී ඔවුන් ඉන්දියානු සංක්‍රමණිකයින් සහ වෙළඳුන් සමඟ සම්බන්ධතා නොපැවැත්වූවේ නම් එය පුදුමයට කරුණක් විය යුතුය. එකල බැබිලෝනියාවේ ප්‍රචලිතව තිබූ ඉන්දියානු මෙන්ම වෙනත් ආසියාතික රටවලට අයත් ප්‍රවාද, කථා ප්‍රවෘත්ති සහ ජනකථා ඔවුන් උකහා නොගත්තේ නම් එය ඊටත් වඩා පුදුමයට

පත්විය යුතු කරුණක් වේ. එපමණක් නොව, එකල ඉරානයේ ප්‍රචලිතව පැවති ශරතුස්ත්‍රගේ ඉගැන්වීම් වලට ඔවුන් මහත් ඕනෑකමකින් ඇහුම්කන්දෙන්නට ඇත. ඔවුන් ශරතුස්ත්‍රගේ ඉගැන්වීම් වලට ඇහුම්කන්දුන්නේ බැබිලෝනියන් ජාතිකයින්ට විරෝධය පෑමක් වශයෙන් සහ බැබිලෝනියානු වහල් භාවයෙන් නිදහස්වීම සඳහා ඉරාන ජාතිකයින්ගේ සහයෝගය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් විය හැකිය. මෙසේ ශරතුස්ත්‍රගේ ඉගැන්වීම් ඊශ්‍රායල් ජාතිකයන්ගේ ජනප්‍රවාද වල කොටසක් බවට පත්විය.

මේ අවධියේ පටන් ඉන්දියානු, පර්සියානු සහ බැබිලෝනියානු ආභාෂය බහුල වශයෙන් යුදෙව් ලියවිලි වල දක්නට ලැබෙන අතර එම ලක්ෂණ ඔවුන්ගේ සංස්කෘතික සහ ආගමික ජීවිතයටද ඇතුලත් වී තිබේ. ඩියුටෙරෝ-යෙසායා (Deutro-Isaiah) විසින් ලියන ලදැයි සැලකෙන බයිබලයේ ඇතුළත් යෙසායාගේ කෘතියේ 40-55 පරිච්ඡේද සලකා බැලීමේදී ඒවා ලියා තිබෙන්නේ යුදෙව් ජාතිකයින් බැබිලෝනියාවට පිටුවහල් කර සිටි කාලයේදීය. 'යෙසායා' නමින් හැඳින්වෙන මෙම කතුවරයා මෙසපොටේමියාවෙන් පැමිණි අයෙකු වන අතර ඔහුගේ රචනාවල ශරතුස්ත්‍ර ආගමේ බලපෑමක් තිබෙන බව දැකිය හැකිය. යෙසායාගේ ග්‍රන්ථයේ ට්‍රිටෝ-යෙසායා (Trito-Isaiah) නමින් හැඳින්වෙන කොටසේ (යෙසායා 6:17) පර්සියානු උත්සවයක් පිළිබඳව කර ඇති විස්තරයක් පවා ඇතුළත් වේ.[43] ගැලවුම් කාරයකුගේ පැමිණීම පිළිබඳ විශ්වාසය යුදෙව් ආගමික විශ්වාසවල ප්‍රධාන අංගයක් බවට පත්වූයේ ඔවුන් මෙසේ පිටුවහල් කරනු ලැබූ ජාතියක් ලෙස ජීවත්වූ කාලයේදීය.[43] ශරතුස්ත්‍ර විසින් අනාවැකි පළකරන ලද පරිදි එම ගැලවුම්කරුවා පහළවී නපුරු බලවේගවලට විරුද්ධව විශාල සටනක් මෙහෙයවා ජයග්‍රහණය කරනු ලැබේ.

නිදහස ලැබීමෙන් පසු යුදෙව් ජාතිකයෝ සියලු දෙනම නැවත පලස්තීනයට නොපැමිණියහ. ඔවුන්ගෙන් සමහරෙක් දෙගම්මැදි රාජ්‍යයේම නතර වූහ. තවත් සමහරෙක් පෙරදිගට ගමන් කර පර්සියානු දේශ සීමාවට සහ දකුණු ඉන්දියාවට පිටත්ව ගියහ. එම රටවල සිට ඔවුහු තම මව්රට සමඟ වෙළඳාම් කටයුතු කළහ. පෙරදිග රටවල් සමඟ පැවති නිරන්තර සම්බන්ධතා නිසා කැනාන් (Canaan) සමඟ අඛණ්ඩව අදහස් හුවමාරු කරගැනීමට ඔවුන්ට හැකිවිය. උදාහරණයක් වශයෙන් එළිදරව්ව පිළිබඳ පවතින ඉරාන විශ්වාස සුළු සුළු වෙනස්කම් සහිතව බයිබලයේ එන දානියෙල්ගේ ග්‍රන්ථයේ දක්වා තිබෙන බව පෙන්වා දිය හැකිය.[44] පසු කාලයේදී ලියනු ලැබූ එස්රාගේ හතරවන පොතේ අවසාන විනිශ්චය දිනයේදී පවුල්වල වෙන්වීමක් පිළිබඳව සඳහන් කර තිබේ.

එය ඉරාන විශ්වාසවල ඇතුළත් විශේෂ ලක්ෂණයකි.

යුදෙව් ජාතිකයින් බැබිලෝනියානු ග්‍රහණයෙන් නිදහස් වූයේ ක්‍රි. පූ. 550-530 කාලය තුළදී පර්සියාව පාලනය කළ සයිරස් නැමති ඇකිමෙනීඩියන් රාජ වංශයට අයත් රජතුමාගේ මැදිහත්වීම නිසාය. සයිරස් රජතුමා ක්‍රි. පූ. 538 දී බැබිලෝනියාව ආක්‍රමණය කර මීඩිස් (Medes) සහ ලීඩියා (Lydia) නගර අල්ලාගෙන අවසානයේදී බැබිලෝනියාව යටත් කර එය පර්සියානු අධිරාජ්‍යයේ කොටසක් බවට පත් කළේය. එම අධිරාජ්‍යය ක්‍රි. පූ. 519-484 කාලයේදී පළමුවන ඩේරියස් හිස්ටැස්පස් රජු යටතේ මධ්‍යධරණී ප්‍රදේශයේ සිට ඉන්දු නිම්නය දක්වා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ගියේය. බැබිලෝනියන් සහ පර්සියන් ජාතිකයින් අතර ශතවර්ෂ ගණනාවක් පැවති වෛරය හේතු කොටගෙන ඩේරියස් රජු බැබිලෝනියාවේ කීර්තිය සහමුලින් නැතිකර දැමීම සඳහා කළහැකි සෑම දෙයක්ම කළේය. ක්‍රි. පූ. 5 වන ශත වර්ෂය අවසානයේදී යුප්‍රටීස් සහ ටයිග්‍රීස් ගංගාවලට ප්‍රවේශවීම අවහිර කිරීම සඳහා ඩේරියස් රජු ඒ හරහා වේලි බඳින ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මුහුදින් කරන ලද වෙළඳාමේදී වැදගත් වූ මෙම මාර්ග ඉක්මනින් ඇහිරී ගියේය. ඒ නිසා තම ව්‍යාපාර කටයුතු දිගටම කරගෙන යාම සඳහා චැල්ඩියන් වෙළඳුන්ට වෙනත් වරායක් සෙවීමට සිදුවිය. ගල්ෆ් (Gulf) ප්‍රදේශයට පහළින් ගෙර්හා (Gerrha) නමැති ස්ථානයේ වෙළඳ ජනපදයක් පිහිටවූ ඔවුහු එතැන් සිට ඉන්දියාව සමඟ පෙරටත් වඩා හොඳින් වෙළඳාම් කටයුතු කරගෙන ගියහ.[45] ගෙර්හා (Gerrha) හි ෆිනීෂියන් වරු සිටි ප්‍රදේශය අසල නෙබටියන්ස් (Nebataeans) ජාතිකයින්ට අයත් සෙමිටික් (Semitic) ගෝත්‍රිකයින් මෙම වෙළඳ ජනපදයෙහි පිරිසක් විය යුතුය. බැබිලෝනියාවේ සිටි ඉන්දියානු වෙළඳුන්ද මෙම ක්‍රමයම අනුගමනය කරනු නොලැබීයයි සිතීමට හේතුවක් නොමැත. ගෙර්හා (Gerrha) ජනපදය පිහිටුවන ලද්දේ පර්සියන්වරු බැබිලෝනියාව යටත් කරගැනීමෙන් පසුව බව පැහැදිලිය. සියලුම විදේශිකයින් සාරවත් මෙසපොටේමියානු ගංගා නිම්නය අතහැර නොගියෝය. බොහෝ දෙනෙක් බැබිලෝනියාවේ පැවති සහනශීලි වාතාවරණය යටතේ ජීවත්වීමට තීරණය කළහ. මෙසේ බැබිලෝනියාව ඉතා පුරාණ කාලයේ පටන් පැවති බහු සංස්කෘතික සමාජයන් ගෙන් එකක් විය. එහි බලපෑම බටහිරින් මැදපෙරදිග දක්වාත් නැගෙනහිරින් ඉන්දියාව සහ චීනය දක්වාත් පැතිරී ගියේය. ඩේරියස් රජතුමා විසින් (ක්‍රි. පූ. 423-404) බැබිලෝනියාවට පිටුවහල්කර සිටි යුදෙව් ජාතිකයින් නිදහස් කර හැරීමෙන් අවුරුදු සියයකට වඩා වැඩි කාලයක් ගතවූ පසු විවිධ ජාතීන් මෙසපොටේමියාවේ පහළ ප්‍රදේශවලට ඒකරාශි වූහ.

ආර්මේනියාව, ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය, සුළු ආසියාව සහ අරාබිය වැනි රටවලින් පැමිණි විදේශිකයින් එහි ස්ථිර පදිංචිකරුවන් බවට පත්වූහ.[46] කෙසේ වෙතත් බැබිලෝනියාවේ සමෘද්ධිමත් යුගය බොහෝ කලක සිට පිරිහෙමින් පැවතුණි. ස්ට්‍රැබෝගේ (Strabo) (ක්‍රි. පූ. 63 - ක්‍රි. ව. 26) පාලන කාලය වනවිට උදාර ඉතිහාසයක් පැවති බැබිලෝනියාව මහත් පරිහානියකට පත්ව තිබුණි.

පර්සියානු ආක්‍රමණිකයෝ බැබිලෝනියාව විනාශ කිරීමෙන් පමණක් නතර නොවූහ. ඔවුහු ඊජිප්තුවද ආක්‍රමණය කළහ. එකල දේශපාලන සහ ආර්ථික වශයෙන් පැවති අර්බුද තත්වයෙන් ප්‍රයෝජනගත් යේමන් වෙළඳුන් එරිත්‍රියානු මුහුදේ ප්‍රධාන වෙළඳුන් බවට පත්වූහ. ඉන්දියාව සහ නිරක්ෂය ආශ්‍රිතව පිහිටි අප්‍රිකානු රටවල් සමඟ කළ වෙළඳාමෙන් වැඩි කොටසක් අයත්වූයේ මවුසා (Mouza), ඒඩන් (Aden) සහ කේන් (Kane) හි විසූ ව්‍යාපාරිකයින්ටය. එකල රතු මුහුදේ නාවික කටයුතු පාලනය කරනු ලැබුවේ දැනට අභාවයට ගොස් ඇති ජන කොට්ඨාසයක් විසිනි. එම ජන කොට්ඨාසය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාක්ෂි තියඩෝර් බෙන්ට් (Theodore Bent) විසින් මැෂෝනාලන්තයෙන් (සිම්බාබ්වේ) සහ රතු මුහුදට ආසන්න ප්‍රදේශ වලින් සොයා ගෙන තිබේ. පසු කාලයේදී මවුසා වල විසූ වෙළඳුන් ඇසේනියාවේ (Azania) (නූතන සෝමාලියාව) වෙළඳ බලය අල්ලා ගත්හ. සේබියන් වරු ඉන්දියාවේ ජනාවාස පිහිටුවූහ. ග්‍රීක් ජාතිකයින් ඉන්දියාවට පැමිණි විට ඔවුන්ට ඉන්දියාවේ බටහිර වෙරළේ පිහිටා තිබූ සේබියන් බලකොටු සහ වැඩපොළවල් දැක ගැනීමට හැකිවිය.[47]

පස්වන ශත වර්ෂය වනවිට ඉන්දියාව සමඟ පැවති වෙළඳාම අලුත් මුහුණුවරක් ගත්තේය. ඒ කාලයේදී ඉන්දියාවෙන් ග්‍රීසියට රැගෙන ආ සමහර භාණ්ඩ ඒවායේ මුල් ඉන්දියානු නම් වලින්ම ග්‍රීසියේදීත් හඳුන්වනු ලැබූ බව අපට පෙනේ. ඉන්දියාවේ ප්‍රධාන නිර්යාත භාණ්ඩයක්වූ සහල් සොෆොක්ලීස් (Sophocles) ගේ කාලයේදී පෝෂණය සඳහා බහුල වශයෙන් භාවිතා කරන ලද ආහාරය විය. සහල් හැඳින්වීම සඳහා පාවිච්චි කරනු ලැබූ ග්‍රීක් වචනය ඒ සඳහා පාවිච්චි කර ඇති අරිසි (Arisi) යන දෙමළ වචනයට සමානය. ඇරිස්ටොෆේන් (Aristophanes) නිතර මොනරු ගැන සඳහන් කර තිබේ. මීට කලින් පෙන්වා දී ඇති පරිදි මොනරු සහ ඉන්දියන් හඳුන් ලී හඳුන්වනු ලබන දෙමළ නම්වලින් පලස්තීනයේද ව්‍යවහාරවේ. ක්‍රි. පූ. 430 දී පමණ වැඩිපුර විස්තර සපයා දීමකින් තොරව සහල් සහ මොනරු පිළිබඳව ග්‍රීක් ග්‍රන්ථවල සඳහන් කර තිබේ. ඒවා සාමාන්‍ය භාවිතයේ පැවති වෙළඳ භාණ්ඩ වීම නිසා ඒ පිළිබඳව වැඩි විස්තර සඳහන් කිරීම අනවශ්‍ය බව

ඔවුන් කල්පනා කරන්නට ඇත. එම නම් ග්‍රීසියේ සාමාන්‍ය ව්‍යවහාරයේ පැවති වචන ලෙස පවතින්නට ඇත. ඇතන්ස් නුවර වැසියන් ඉන්දියන් භාණ්ඩ ඒවා හැඳින්වූ ඉන්දීය නම් වලින්ම දැන සිටීම මෙහිදී ඉතා වැදගත් වේ. මන්ද අප විසින් සලකා බලනු ලබන මෙම කාලපරිච්ඡේදය බුදුන් වහන්සේගේ පරිනිර්වාණයට පසුව ආරම්භ වූ යුගයට අයත් වන හෙයිනි. ඒනිසා මෙහිදී අපට මතභේදයට තුඩු දිය හැකි ප්‍රශ්නයක් නැගීමට පිළිවන. එනම් බුදුන්වහන්සේගේ ධර්මය මුල් වරට ඇතන්ස් නුවර වාසීන්ට දැන ගැනීමට හැකිවූයේ දුරස්ථ ඉන්දියාව සමඟ පැවති මෙම වෙළඳ සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙන්ද? යන්නයි.

පයිතගරස්ගේ ඉන්දියානු දර්ශනය

ක්‍රිස්තු පූර්ව පස්වන ශත වර්ෂය දක්වා ඉන්දියාව සහ බටහිර රටවල් අතර පැවති වැදගත් සංස්කෘතික සහ වෙළඳ සම්බන්ධතා පිළිබඳව අපි මීට පෙර කථා කළෙමු. මේ සම්බන්ධයෙන් පවතින වාර්තා සුලභ නොවූවත් ඉතා වැදගත් සම්බන්ධතා පැවති බව සහ විශ්වාස නොකළ හැකි තරම් ඉන්දියානු ඉගැන්වීම් බටහිර රටවල් විසින් ණයට ගෙන ඇති බව අපට තේරුම් ගැනීමට පුළුවන. එම සම්බන්ධතා එකල පැවති මධ්‍යධරණී සංස්කෘතියට, එනම් ග්‍රීක් සංස්කෘතියට අයත් මිනිසුන්ගේ බුද්ධිමය සහ ආධ්‍යාත්මික ජීවිතය කෙරෙහි කෙතරම් දුරට බලපැවැත්වූවා දැයි සොයා බැලීමේදී අපට විශ්මයජනක නිගමනයන්ට පවා එළඹීමට හැකිවනු ඇත. ග්‍රීක් දර්ශනය පිළිබඳ දෘෂ්ටි කෝණයකින් බැලීමේදී ඉන්දියාව සමඟ පැවති සම්බන්ධතා හේතුකොට ගෙන ග්‍රීක් දර්ශන ක්ෂේත්‍රයේ සිදුවී ඇති බලපෑම සියලුම වෙළඳ සම්බන්ධතා නිසා ඇතිවූ බලපෑමට වඩා වැදගත් බව පෙනේ.

ග්‍රීසියේ විසූ ස්වභාවධර්මවාදී දාර්ශනිකයින් (Nature Philsophers) අතිශයින්ම ඉන්දියානු අදහස් ලෙස පෙනී යන දාර්ශනික මත දැරූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් තේල්ස් (Thales), එම්පිඩොක්ලීස් (Empedocles), ඇනෙක්සගෝරස් (Anaxagoras), ඩිමොක්‍රිටස් (Democritus), පයිතගරස් (Pythagoras) වැනි බොහෝ දාර්ශනිකයින් දර්ශනය හැදෑරීම සඳහා අතීතයේදී පෙරදිගට පැමිණි බව විශ්වාස කෙරේ. පසු කාලයේදී ප්ලේටෝගේ (Plato) ඉගැන්වීම් වල (ක්‍රි. පූ. 427-347) සහ උපනිෂද් ග්‍රන්ථ වල දැක්වෙන කරුණු අතර කිසියම් සමාන කමක් තිබෙන බව පෙනේ. ආත්මය සංසරණය වන බව ප්‍රකාශ කරන අදහස ප්ලේටෝ විසින් දරන ලදී.

ලෝකයේ පැවැත්ම හා සම්බන්ධ වී ඇති සියල්ල ජලයෙන් ප්‍රභවය වූ බව මිලිටස් (Miletus) හි වාසය කළ තේල්ස් (ක්‍රි. පූ. 650-560) නමැති දාර්ශනිකයා විශ්වාස කළේය. සමස්ත ලෝකයම ඇතිවූයේ ප්‍රාථමික ජලයෙන් බව පවසන පුරාණෝක්ති වල දැක්වෙන අදහස වෛදික යුගයේදී ඉන්දියාවේ ප්‍රචලිතව තිබුණි. මිලිටස් හි වාසය කළ ඇනැක්සිමැන්ඩර් (Anaximander) (ක්‍රි. පූ. 610-540) ට අනුව සෑම දෙයකම පදනම වූයේ ඇතිව නැතිව නැවත මුලින් පැවති තත්වයටම පත්වන සදාකාලික වූත් අපරිමිත වූත් අනිර්නය වූත් මූල ද්‍රව්‍යයකිනි. සාංඛ්‍ය දර්ශනය (Samkhya Doctrine) යනුවෙන් හැඳින්වෙන ඉන්දීය දර්ශනයේ මීට සමාන අදහසක් දෙන ප්‍රකෘතිය (Prakriti) යන වචනය ඇතුළත් වේ. ඉන් අදහස් වන්නේ විසිර පවතින සියලුම භෞතික වස්තූන් කිසියම් ප්‍රාථමික ධාතුවකින් ප්‍රභවය වන බවත් අවසානයේදී නැවත එම තත්වයටම පත්වෙන බවත්ය. මධ්‍යස්ථවූත්, තාර්කිකවූත් බොහෝ දුරට විද්‍යාත්මක චින්තන ක්‍රමයක්වූත් සාංඛ්‍ය දර්ශනය යනු බුද්ධාගම, ජෛන ආගම සහ විවිධ යෝගක්‍රම ඇතිවීම කෙරෙහි බලපෑ පුරාණ ඉන්දියාවේ පැවති ප්‍රාග් වෛදික අදහස්වල ඇතිවූ දාර්ශනික වර්ධනයකි. මෙම දර්ශනයේ මූලික අංග ශ්වේතාස්වතාර (Shvetashvatara), සහ මෛත්‍රායනි උපනිශද් (Maitrayani Upanishads) ග්‍රන්ථ වල දක්නට ලැබේ.

ක්‍රි. පූ. (550 - 480) කාලපරිච්ඡේදය තුළ ජීවත් වූ හෙරක්ලිටස් අපට පෙනෙන ලෝකයේ නිරන්තරයෙන් සිදුවන වෙනස්වීම සහ පරිවර්තනය සැඟවුනු අරුත් සහිත සුප්‍රසිද්ධ ආප්ත පදයකින් ප්‍රකාශ කර තිබේ. එනම් 'සියල්ල අනිත්‍යය' බවය. සාංඛ්‍ය ඉගැන්වීම් වල දැක්වෙන නිරන්තරයෙන් සිදුවන මෙම වෙනස්වීම සහ ප්‍රතිනිර්මාණය පිළිබඳ අදහස මීට වඩා කෙටියෙන් දැක්විය නොහැකිය.

ඊලියානු දර්ශනය (Eleatic) නමින් හැඳින්වෙන ගුරුකුලයේ නිර්මාතෘවරයා වූ සෙනොෆෝන් ගේ (Xenophanes) ඉගැන්වීම් ජනප්‍රිය ආගම් කෙරෙහි ඔහු තුළ පැවති දැඩි සැකය මත පදනම් විය. ඔහුට සමකාලීනව ඉන්දියාවේ විසූ ගෞතම බුදුන් වහන්සේද ඊට සමාන චින්තන ක්‍රමයක් තුළින් තමන් වහන්සේගේ දර්ශනය ඉදිරිපත් කළේය. මේ දාර්ශනිකයන් දෙදෙනාම එකල පැවති ජනප්‍රිය විශ්වාස පිළිබඳව සෑහීමට පත්නොවූ අතර තමා විසින්ම ප්‍රත්‍යවේක්ෂණය කිරීම තුළින් සමාන නිගමනයන්ට එළඹුනහ. මෙලොව සිටිය හැක්කේ එක් දෙවියකු පමණක් බවත් ඔහු අන් සියලුම දෙවි මිනිසුන්ට වඩා ඉහළින් සිටින බවත් සෙනොෆෝන්ගේ විශ්වාසය විය. එම දෙවියාට ඇත්තේ එක් ඇසක් සහ එක් සිතක් පමණක් බවත් ඔහු තුළ පවත්නා ආධ්‍යාත්මික ප්‍රතිවේදය මගින් ඔහු අනායාසයෙන් සෑම දෙයක් කෙරෙහිම ආධිපත්‍යය

පතුරුවන බවත් ඔහුගේ විශ්වාසය විය. මෙම අවබෝධය බුදුන් වහන්සේ සම්බන්ධයෙන් වෙනස් ස්වරූපයක් ගත්තේය. තමා සියලු දෙවි මිනිසුන්ටම වඩා ශ්‍රේෂ්ඨතම පුද්ගලයා බවත් අවබෝධ කළයුතු සියල්ල අවබෝධකර උත්තරීතර තත්වයට පත්වූ බවත් සියල්ල දැකීමේ නුවණ (සමන්ත චක්ෂු) තමා සතු බවත් උන්වහන්සේ ප්‍රකාශ කළහ.[48]

ඇත්ත වශයෙන්ම ඊලියාතු දර්ශනයේ ඉගැන්වීම මූලික වශයෙන් ප්‍රාග් බෞද්ධ යුගයට අයත් උපනිෂද් ග්‍රන්ථවල සඳහන්වන ඉගැන්වීම වලට සමානය. එකම සත්‍යයක් පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති මෙම ක්‍රම වේදයන් දෙක අතර විශ්මිත සමාන කමක් පවතින බව ඉන්දු ආර්ය භාෂා පිළිබඳ විශේෂඥයකු වන රිචඩ් ගාර්බ් (Richard Garbe) විසින් පෙන්වා දී තිබේ.[49] සමස්ත ඉන්ද්‍රිය ගෝචර ලෝකයම මායාවක් බව ප්‍රකාශ කළ පාර්මෙනිඩෙස් (Parmenides) (ක්‍රි. පූ. 515 - 455) ගේ දර්ශනයේ ඉන්දීය ඉගැන්වීම් වල දෝංකාරය පැහැදිලිව දක්නට පුළුවන. යථාර්ථය යනු අනන්තවූත්, නොබිඳිය හැකිවූත්, සර්ව ව්‍යාප්තිවූත් තත්වයකි. මූලික ලක්ෂණ අතින් එම අදහස් දැනට ඉතිරිව තිබෙන පැරණිතම ඉන්දීය අදහස් ඇතුළත් වේදාන්ත දර්ශනය සහ උපනිෂද් ග්‍රන්ථවල දැක්වෙන අදහස් සමග හොඳින් ගැළපේ. "ශූන්‍යතාවයෙන් ශූන්‍යතාවය ඇතිවේ. ශූන්‍යත්වය විනාශ කළ නොහැකිය." යන ඩිමොක්‍රිටස් නමැති ග්‍රීක් දාර්ශනිකයා ගේ මුඛ්‍ය ප්‍රකාශය සාංඛ්‍ය දර්ශනයේ වචනයක් පාසා දක්නට හැකිය.

පුද්ගලයෙකු තමා පිළිබඳව ස්වයං විමර්ශනයක යෙදිය යුතුය යන අදහස උපනිෂද් ග්‍රන්ථවලත් සමහර ග්‍රීක් දාර්ශනිකයින් අතරත් දක්නට ලැබෙන තවත් සමාන කමකි. අධ්‍යාත්මික අවබෝධයක් ඇතිකර ගැනීමේ පරමාර්ථයෙන් ක්‍රමානුකූලව තමා පිළිබඳ අවබෝධය (Self Investigation) ඇතිකර ගැනීම සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම පිණිස යෝග ක්‍රම හඳුන්වා දෙනු ලැබීය. තමා පිළිබඳ වටහා ගැනීම බටහිර රටවල සදාචාරාත්මක වගකීමක් ලෙස සලකනු ලැබීය. "ඔබ ඔබම තේරුම් ගන්න" (Know Thyself) යනුවෙන් තේල්ස් සහ සොක්‍රටීස් (ක්‍රි. පූ. 470 - 339) යන දාර්ශනිකයින් දෙදෙනාම ප්‍රකාශ කළහ. 'මම මා පිළිබඳව පර්යේෂණ කරමි'යි යනුවෙන් හෙරැක්ලිටස් ස්වභාව ධර්මය පිළිබඳ විමර්ශනයක යෙදුණු ග්‍රීක් දාර්ශනිකයින්ට පිළිතුරු දුන්නේය.

විවිධ දාර්ශනික අදහස් අතර පවතින මෙම සමානකම් ඇතිවී තිබෙන්නේ ඇක්සිස් යුගයේ ඇතිවූ ගුප්ත බලපෑම නිසා යැයි අපට පිළිගත නොහැකිය. පයිතගරස්ගේ (ක්‍රි. පූ. 570-480) ඉගැන්වීම සහ ඔහුගේ ජීවිතය පිළිබඳව සලකා බලන විට ඉන්දියානු අදහස් පිළිබඳ දැනීමකින්

තොරව එම අදහස් ඇතිවූයේ ඇක්සිස් යුගය හා පැවති ගුප්ත සමගාමීත්වයක් නිසායැයි පිළිගැනීම දුෂ්කරය.

ඉන්දියාව සමග පයිතගරස් පැවැත්වූ බොහෝ සම්බන්ධතා පිළිබඳව ලියෝපෝල්ඩ් වොන් ශ්‍රෝඩර් (Leopold von Schroeder) නමැති ඉන්දු-ආර්ය භාෂා පිළිබඳ විශේෂඥයා විසින් කරන ලද චමත්කාර ජනක අධ්‍යයනය මගින් පෙන්වා දී තිබේ.[50] පුනර්භවය පිළිබඳ අදහස ඔහුගේ ඉගැන්වීම් වල ඇතුළත් කැපී පෙනෙන අදහසකි. පයිතගරස්ට පෙර යුගයේදී පුනර්භවය පිළිබඳ අදහස ග්‍රීසියට සම්පූර්ණයෙන්ම නුහුරු වූ අදහසක් විය. හෙරඩෝටස්ට පසුව බිහිවූ බොහෝ ලේඛකයින් පුනර්භවය පිළිබඳ අදහසේ ප්‍රභවය ඇතිවූයේ ඊජිප්තුවේ යැයි විශ්වාස කළහ. පයිතගරස් ඊජිප්තුවෙන් 'ශුද්ධ ග්‍රන්ථයක්' (hieros logos) රැගෙන ආ බව ඇබ්ඩෙරා වල හෙකටියස් (Hekateus of Abdera) විශ්වාස කළේය. පයිතගරස්ට ශත වර්ෂ දෙකකට පසු මහා ඇලෙක්සැන්ඩර් ඉන්දියාවේ ඉන්දු ගංගා නිම්නයට ළඟා වූ අවස්ථාවේදී ඔහු සිතුවේ තමා පැමිණ සිටින්නේ ඉහළ ඊජිප්තුවේ නයිල් ගග අසබඩ ප්‍රදේශයට බවය. ඉහත සඳහන් කරන ලද හෙකටියස් ගේ විශ්වාසයද භූගෝල විද්‍යාත්මක කරුණු පිළිබඳව එකල එතරම් දැනීමක් නොතිබීම නිසා ඇති වූවක් විය හැකිය. පුනර්භවය පිළිබඳ අදහස ඊජිප්තුවේ නොතිබූ නිසා පුනර්භවය පිළිබඳ අදහස් පයිතගරස් ලබාගත්තේ ඊජිප්තුවෙන් නොවන බව නිසැකය. කෙසේ වෙතත් ඊජිප්තුව බොහෝ බහුශ්‍රැත පුද්ගලයින්ගෙන් යුක්තවූ රටක් ලෙස අතීතයේදී සලකනු ලැබීය. තමන්ට තේරුම්ගත නොහැකි සියලුම අදහස් වල ප්‍රභවය ඇතිවූයේ ඊජිප්තුවේ යැයි කල්පනා කිරීමට මිනිසුන් නැඹුරු විය. එදිනෙදා ජීවිතය හා සම්බන්ධ ආගමික විශ්වාස අතර ඉතා වැදගත් තැනක් ගත් ආත්මය, සත්ව සහ වෙනත් ස්වරූප වලින් නැවත ඇතිවන බව ප්‍රකාශ කරන පුනර්භවය පිළිබඳ සංකල්පය පැවතුණේ ඉන්දියාවේ පමණි. මෙම අදහස පයිතගරස්ට ලබාගත හැකිව තිබුණේ ඉන්දියානුවන්ගෙන් පමණක් යැයි ලියෝපෝල්ඩ් වොන් ශ්‍රෝඩර් ගේ නිගමනය වේ.[51]

පයිතගරස් පෙරදිග රටවල සංචාරය කර ඇති බව පුරාණයේ ප්‍රචලිතව පැවති අදහස් වලින් පැහැදිලි වේ. පයිතගරස් ඉන්දියානු බ්‍රාහ්මණයින් සමග සාකච්ඡා පැවත් වූ බවත් එසේ කිරීමෙන් මිනිස් සිත සහ ශරීරයේ පැවැත්ම පිළිබඳව ගැඹුරු දැනීමක් ලබාගත් බවත් ක්‍රි. පූ. පළමු වන ශතවර්ෂයේදී විසූ ඇලෙක්සැන්ඩර් පොලිහිස්ටර් (Alexander Polyhistor) විසින් වාර්තා කර තිබේ. පයිතගරස් ඉන්දියාවට ගොස් එහිදී උගත් බ්‍රාහ්මණයින් හමුවී ඔවුන්ගෙන් බොහෝ උපදෙස් ලබාගත් බව කියවෙන කථා පිළිබඳව සුප්‍රසිද්ධ විද්වතක ව

ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ ක්ලෙමන්ට් නමැති පඬිවරයා (ක්‍රි. ව. 150-214) සඳහන් කර තිබේ.[31]

පයිතගරස් ජීවත් වූ කාලයේදීම බිහිවූ සාංඛ්‍ය නම් වූ ඉන්දියානු දර්ශනවාදය සහ බුද්ධාගම මගින් සංසාර විමුක්තිය ලබාගැනීම පිළිබඳව අවධාරණය කරයි. සාංඛ්‍ය දර්ශනයට අනුව ආත්මය ශරීරයට හිර වී ඇතිබව විශ්වාස කෙරේ. එය නැවත නැවත ශාරීරික වශයෙන් පහළවීමෙන් දුක ඇතිවේ. ආත්මය ගලවාගත හැක්කේත් එය නැවත පහළවීමෙන් දුක ඇතිවේ. ආත්මය ගලවාගත හැක්කේත් මේ තත්වය හොඳින් ශාරීරික වශයෙන් පහළවීම වළක්වාගත හැක්කේත් මේ තත්වය හොඳින් අවබෝධ කර ගැනීමෙනි. ආත්මය ශරීරයට බැඳී ඇති බවත් දඬුවමක් වශයෙන් එය ශරීරය තුළ වැළලී ඇති බවත් පයිතගරස් විශ්වාස කළේය. ඔහු ශරීරය දුටුවේ සිරගෙයක් ලෙසය. එම්පිඩොක්ලීස් (ක්‍රි. පූ. 500 - 430) නම් "ඇඩ්මොනිෂන්ස් කන්සර්නින් එම්බොඩිමන්ට් ඔෆ් ද සෝල් බැනිෂ්ඩ් ටු ද අර්ත්" (Admonitions concerning Embodiment of the soul, Banished to the Earth) නමැති පොතෙහි ආත්මය යනු ශරීරයට ලැබී ඇති "පිටස්තර ඇඳුමක්" ලෙස හඳුන්වා දී තිබේ. ඔහු එම අදහස් ලබාගෙන ඇත්තේ පාර්මෙනයිඩීස් සහ පයිතගරස්ගේ දර්ශන වලිනි. එම්පිඩොක්ලීස්ට අනුව ශරීරයට ආත්මයක් ලැබී තිබෙන්නේ පව් රැස් කිරීම නිසාය. කෙසේ වෙතත් මරණින් පසු ආත්මය විශ්වයට එකතුවීම, එය වාවරස් යනුවෙන් හැඳින්වෙන තත්වයට පත්වීම හෝ මානව සහ සත්ව ස්වරූපයෙන් නැවත පහළවීම හෝ සිදුවේ. ආත්මය සංසරණය වීම පිළිබඳ මෙම විශ්වාසය එම්පිඩෝක්ලීස් විසින් විකසන න්‍යායකට (Theory of Development) සම්බන්ධ කර ඉදිරිපත් කළේය. ඒ අනුව කලින් නොපැවති කිසිවක් ඇතිවිය නොහැකිය. එමෙන්ම පැවති කිසිම දෙයක් නැතිවී යා නොහැකිය. මෙයද සාංඛ්‍ය චින්තනය ආවේනික වූ මැවීම පිළිබඳව පැවති අනිර්මිත වූත්, අනන්තවූත් යථාර්ථය පිළිබඳ අදහසට (සත්කාර්ය වාදය Sat-Karya-Vada) බොහෝ දුරට සමානය.

පුද්ගලයකුගේ නැවත ඉපදීම පූර්ව කර්මානුරූපව සිදුවන බව ඉන්දියාවේ පැවති විශ්වාසය විය. බ්‍රාහ්මණ විශ්වාස වලට අනුව හොඳින් ජීවත් වූ ආත්මයකට දෙව්ලොව හෝ සඳමත ඉසිඳ වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට හැකිවේ. පයිතගරස්ද මෙම විශ්වාසය පිළිබඳව දැන සිටියේය. ආශිර්වාද ලත් පුද්ගලයින් සඳ මත උපත ලබන බව ඔවුන්ගේ විශ්වාසය විය.

බුදුන් වහන්සේට මෙන්ම පයිතගරස්ටද පූර්ව ආත්මභාවයන් පිළිබඳ මතකයක් තිබුණි. තමා තුන් වරක් ඉයුෆෝබස් (Euphorbus) ලෙසත්, අනතුරුව පිරැන්ඩර් (Pyrander) ලෙසත්, තවත් අවස්ථාවකදී

හර්මීස් (Hermes) ගේ පුතා ලෙසත් උපත ලැබූ බව පයිතගරස් ප්‍රකාශ කර තිබේ. පූර්ව ජන්මයන් පිළිබඳ මතකය ඔහුට ලබා දුන්නේ හර්මීස් විසින් බවද සඳහන් වේ.

පයිතගරස් විසින් දරන ලද ඉන්දීය විශ්වාසයන්ට සමාන එකම අදහස පුනර්භවය පිළිබඳව පැවති විශ්වාසය පමණක් නම් එය ඔහු තුළ විශේෂ කුතුහලයක් ඇතිකිරීමට හේතු වූ කරුණක් ලෙස සැලකිය හැකිය. කෙසේ වෙතත් ඉන්දියාවේ පමණක් ඇතිවිය හැකි විශේෂ ලක්ෂණ කීපයක් ගතානුගතිකත්වයෙන් තොර වූ මෙම දාර්ශනිකයාගේ චින්තනයට ඇතුළත් වූ බව පෙනීයයි. තම අනුගාමිකයින් නිර්මාංශාහාර පමණක් අනුභව කළ යුතු යැයි ඔහු නියම කළේය. ඔහු මස් අනුභව කිරීම පමණක් නොව ඇට වර්ග අනුභව කිරීමද ප්‍රතික්ෂේප කළේය. ඇට වර්ග ප්‍රතික්ෂේප කිරීම සඳහා කොහෙත්ම පැහැදිලි හේතුවක් දැක්විය නොහැකිය. එසේ නම් ඇට වර්ග අනුභව කිරීම ඔහු තහනම් කළේ ඇයි? ඉන්දියාවේ මස් කෑම සාමාන්‍යයෙන් තහනම් නොවීය. නමුත් බ්‍රාහ්මණ යුගවලදී නිර්මාංශාහාර ගැනීම කෙරෙහි විශාල පිළිගැනීමක් තිබුණි. යජුර්වේදයට අයත් පැරණිම ග්‍රන්ථයක් වන 'මෛත්‍රායානි සංහිතාවේ' (Maitrayani-Samhita) (ක්‍රි. පූ. 10 වන ශතවර්ෂය) පුද පූජා පවත්වන මිනිසුන් විසින් අනුගමනය කළයුතු පහත සඳහන් නියමය දක්නට ලැබේ: "ඔහු කිසිම ඇට වර්ගයක් අනුභව නොකළ යුතුය. මන්ද ඇට වර්ග අවශ්‍ය තරම් පිරිසිදු නොමැති හෙයිනි." (I, 4 : 10) කඨකම් (Kathakam) නමින් හැඳින්වෙන වේද ග්‍රන්ථයේ ඇට වර්ග අනුභව කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කර තිබේ. ඇට වර්ග අපිරිසිදු බවත් එනිසා ඒවා පුද පූජා සඳහා යොදා නොගත යුතු බවත් තයිත්තිරිය-සංහිතාවේ (Taittiriya-Samhita) සඳහන් වේ. මෙම සමානකම් කොතරම් දුරට අසාමාන්‍යද, අමුතුද යත් ඒවා හුදු අදහස්වල සම්පාතයක් (Coincidence) නිසා පමණක් ඇතිවිය නොහැකිබව මධ්‍යස්ථ පර්යේෂකයකු වූ ලියෝපෝල්ඩ් වොන් ශ්‍රෝඩර් විශ්වාස කරයි.[32]

පයිතගරස්ගේ ගුරුකුලය විසින් පංච මහා භූතයින් පිළිබඳ ඉගැන්වීම ව්‍යාප්ත කරනු ලැබිය. එය ප්‍රධාන කොටස් පහකින් (five regular bodies) සමන්විත හා සම්බන්ධව පැවති බව මුල් කාලයේ පැවති පිළිගැනීම විය. පයිතගරස්ගේ අනුගාමිකයින්ට අනුව ඊතරය (Ether) එහි පස්වන මූලාංගය විය. 'ඊතරය' අනෙක් අංග හතර ආවරණය කරයි. පංච මහාභූතයින් පිළිබඳ අදහස ඉන්දියාවේ ප්‍රචලිතව තිබූ අතර එම පයිතගරස් විසින් එම අදහස ඉන්දියාවෙන් ලබාගත් බව පෙනී යයි. එම අදහස කපිල විසින් ඉදිරිපත් කල සාංඛ්‍ය දර්ශනයේ ක්‍රමවත් ලෙස ඉදිරිපත් කර තිබේ. බුදුන් වහන්සේද පංච මහා භූතයින් පිළිබඳ මූලික

අදහස තම දර්ශනයට ඇතුළත් කර විඥානය එහි සයවන මූලාංගය වශයෙන් ඇතුළත් කළ බව පැවසේ.

පයිතගරස්ගේ දර්ශනයේ අපට දක්නට ලැබෙන්නේ මෙම සමානකම් පමණක් නොවේ. ආත්මය සංසරණය වීම, ඇට වර්ග කෑම තහනම් කිරීම සහ පංච මහාභූතයින් පිළිබඳ ඉගැන්වීම් වලට අමතරව ඉන්දියානු අදහස් සහ පයිතගරස්ගේ ඉගැන්වීම් අතර පහත සඳහන් සමානකම්ද දක්නට ලැබේ.

1. අහස, පොළව සහ අවකාශය අතර පැහැදිලි වෙනසක් පැවතීම.
2. දිව්‍ය ලෝකයේ දෙවියන්ද, මහ පොළවේ මනුෂ්‍යයින්ද, අවකාශයේ භූතයින්ද ජීවත්වන බව
3. අමරණීයවූත්, ආධ්‍යාත්මිකවූත් ඉන්ද්‍රියන් සහ ශරීරය සමඟ දිරාපත්වන හොතික ඉන්ද්‍රියන් පැවතීම.
4. රළු හොතික ශරීරය සහ සියුම් දිව්‍යමය ශරීරය අතර වෙනසක් පැවතීම.
5. සාංඛ්‍ය දර්ශනයේ මෙන් දෙවියන් පිළිබඳ සංකල්පයක් නොතිබීම එය ලෝකය පිළිබඳව පවතින අදේවවාදි දෘෂ්ටියකි.

පයිතගරස් ග්‍රීක් සම්ප්‍රදායට වඩා වෙනස් මත දැරූ ගුප්තවාදි අදහස් පිළිගත් අනුගාමිකයින් පිරිසක් බිහිකළ දාර්ශනිකයකු වශයෙන් ප්‍රසිද්ධ විය. ඔහු තම ගුප්ත ඉගැන්වීම් වාචිකව පතුරුවා හැරියේය. ඔහුගේ ආගමික දර්ශනය පිළිගත් අනුගාමිකයින් ස්වරූපය අතින් එකල ඉන්දියාවේ බහුලව පැවති භික්ෂු සමාජයට බොහෝ දුරට සමාන විය. ගණිත විද්‍යාවේ එන අංක පයිතගරස්ගේ ඉගැන්වීම් වල වැදගත් තැනක් ගත්තේය. එකී අංක වලට ගුප්ත වටිනාකම් ආරෝපණය කරන ලදී. ගණිත විෂයය ඉගෙනගත් සෑම කෙනෙකුටම පයිතගරස්ගේ නම මතක තිබෙන්නේ ගණිතයේ දක්වෙන සමහර ප්‍රමේයයන් පයිතගරස්ගේ ප්‍රමේයය (Pythagoras's Theorem) යනුවෙන් හඳුන්වා ඇති නිසාය.[34] මෙම ගැඹුරු ගණිතමය නියමයන් ඇත්ත වශයෙන්ම සොයාගන්නා ලද්දේ පයිතගරස් විසින්ද? සත්‍යය එය නොවේ. පයිතගරස්ගේ ප්‍රමේයය සහ ගණිතයේ දක්නට ලැබෙන අපරිමේය විශාලත්වයන් (Irrational Magnitudes) පිළිබඳ නියම වල මුල් ආරම්භය ඇතිවූයේ ඉන්දියාවේ බව සුප්‍රසිද්ධ ගණිතඥයකුවූ මොරිස් කැන්ටර් රූපසටහන් මගින් පැහැදිලිකර දී තිබේ.[35] පයිතගරස් මෙම ගණිතමය කරුණු ලබාගත්තේ ඉන්දියාවෙන් බව කැන්ටර් කිසි විටෙක සෘජුව ප්‍රකාශ කර නොමැත. එහෙත් පූජකයින්ට පූජාසන සකස් කිරීමේදී ඒවායේ දිශානතිය ගණනය කිරීම පහසු වීම සඳහා වේද ග්‍රන්ථ වල සවිස්තර ජ්‍යාමිතික සටහන් ඇතුළත් කර තිබෙන

බව ඔහු පැහැදිලිව පෙන්වා දී තිබේ. පූජාසන ඉදිකිරීමේදී පාද් කෝණය නිවැරදිව පිහිටුවිය යුතුවිය. වේද ග්‍රන්ථ වල දක්වා තිබෙන මෙම ක්‍රමවේදය නිවැරදි බවත් එය නිවැරදිව යොදාගත හැකිවන්නේ පයිතගරස්ගේ නියමය පිළිබඳව දැනීමක් තිබේ නම් පමණක් බවත් කැන්ටර් නිගමනය කළේය. පයිතගරස් ඉපදීමට ශත වර්ෂ කීපයකට පෙර වෛදික පූජකයින් පයිතගරස්ගේ ප්‍රමේයය වශයෙන් හැඳින්වෙන ගණිත නියමයන් පිළිබඳව දැන සිටි බවත් එකී නියමයන් පයිතගරස්ට වඩා හොඳින් විග්‍රහ කිරීමට ඔවුන්ට හැකිවූ බවත් ශුල්ව සූත්‍රවලින් (The Shulvasutras) පැහැදිලිවේ. මෙම නියමයන් පූජකවරු විසින් සොයාගත් ප්‍රාසංගික සාධනයක් (Incidental Achievement) පමණක් නොවිය. ඒවා පුරාණ ඉන්දිය ජ්‍යාමිතියේ ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකළ ගණිතමය නියමයන් විය.

අවසාන වශයෙන් දක්නට ලැබෙන තවත් අපූර්ව සමානත්වයක් කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. 'සාංඛ්‍ය' යන වචනය එය බිඳ ආ 'සාංඛ්‍ය' යන වචනයෙන් වෙනස් වන්නේ ස්වර දෙකකිනි. එහි අර්ථය 'සාංඛ්‍ය' යනුය. මෙසේ සම්ඛ්‍යා යනුවෙන් අදහස් වන්නේ පයිතගරස් මෙන් අංක පිළිබඳවූ දාර්ශනිකයකු යන්නය.

පයිතගරස් ක්‍රමයෙහි ඉන්දියානු අදහස් වලට සමාන විශේෂයෙන්ම සාංඛ්‍ය ඉගැන්වීම් වලට සමාන අංග ලක්ෂණ රාශියක් දක්නට ලැබෙන හෙයින් පයිතගරස් ඉන්දියාව සමඟ සම්බන්ධකම් පැවැත්වූ බව නිගමනය කිරීමට පුළුවන. ඔහු තම දැනීම ලබාගත්තේ ග්‍රීසියට පැමිණි සංචාරක බ්‍රාහ්මණයකුගෙන්ද එසේ නැතහොත් ඔහු ඉන්දියාවට ගොස් අධ්‍යයනය කළේද යන කාරණය නිර්නය කිරීමට නුපුළුවන. කෙසේ වෙතත් ඔහු ඉන්දියාවට යන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. එමෙන්ම එය නිරන්තරයෙන් සත්‍යය සොයා යමින් අලුත් දේ පිළිබඳ විමර්ශනය කරමින් කටයුතු කළ පුද්ගලයෙකු වූ ඔහුගේ නොඉවසිලිමත් පෞරුෂය හා හොඳින් ගැළපේ. දැනීම ලබාගැනීම සඳහා ඔහු තුළ තිබූ දැඩි ආශාව තම රටේදී ඉටුකර කර ගැනීමට නොහැකිවූ නිසා නුහුරු මිනිසුන් අතරට ගොස් අලුත් දැනීම සෙවීම සඳහා පයිතගරස් දුර රටවලට පිටත්ව යන්නට ඇති බව ලියෝපෝල්ඩ් වොන් ශ්‍රෝඩර් උපකල්පනය කරයි. ඉන්දියානු දර්ශනවාද පිළිබඳ උසස් දැනීමක් ලබාගත් පයිතගරස් බටහිර ලෝකයට පෙරළා පැමිණ "ඉගෙනීමේ අංකුර ප්‍රතිරෝපණය කරමින් දර්ශනවාදී ගුරුකුලයක් පිහිටුවිය. එමගින් සිදුවූ දිගු කාලීන වශයෙන් ග්‍රීක් සංස්කෘතිය සහ සමස්තයක් වශයෙන් බටහිර සංස්කෘතිය කෙරෙහිත් පයිතගරස් ඇති කළ වැදගත් බලපෑම පිළිබඳ සම්පූර්ණයෙන් අවබෝධ කරගනු ලැබුවේ ශතවර්ෂ කීපයක් ගතවූ පසුවය."[36]

අලෙක්සැන්ඩර් ඉන්දු නිම්නයේදී

අතීතයේ රටවල් යටත් කළ මහා ආක්‍රමණිකයින් ඔවුන් අල්ලාගත් රටවල වාසය කළ මිනිසුන් සතු වූ දැනීම සෙවීම සඳහාද කටයුතු කළහ. ඇත්ත වශයෙන්ම, ඔවුන්ගේ අවධානය යොමුවූයේ භූදෙස් වස්තුව කොල්ලකෑ ගැනීම සහ ජාතීන් යටත්කර ගැනීම කෙරෙහි පමණක් නොවේ. කිසියම් ආකාරයක විද්‍යාත්මක උනන්දුවක් සහ අලුත් දේවල් සොයායෑමේ ආශාවක්ද ඔවුන් තුළ තිබුණි. බැබිලෝනියාව යටත් කර එය විනාශ කර දැමූ පළමුවැනි ඩේරියස් හිස්ටැස්පස් නැමති ආකිමෙනීඩියානු කුමරා ඉන්දු ගංගාව අවට පිහිටි ප්‍රදේශ තම රාජ්‍යයට ඈඳා ගැනීමෙන් පමණක් සෑහීමට පත් වූයේ නැත. ඔහු විසින් යටත් කරගත් මෙම අලුත් ප්‍රදේශය පිළිබඳ වැඩිදුර විස්තර තොරතුරු දැනගැනීමට ඔහුට වුවමනා විය. එම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා ඔහු ක්‍රි. පූ. 520 දී පමණ කැරියන්ඩාවේ ස්කයිලැක්ස් නමැති පුද්ගලයා යටතේ ඉන්දු ගංගාවේ මෝයකට ආශ්‍රිත ප්‍රදේශය ගවේෂණය කිරීම සඳහා ගවේෂකයින් කණ්ඩායමක් පිටත්කර යවන ලදී. ස්කයිලැක්ස් එම කණ්ඩායම සමග ඉන්දු ගඟ ඔස්සේ දකුණට ගමන් කර අරාබියානු මුහුදු තීරය ඔස්සේ සුවස් දක්වා පැමිණියේය. මෙම ගවේෂණය සඳහා ඔහුට මාස 30 ක් පමණ ගතවිය. ඒ සඳහා එතරම් දීර්ඝ කාලයක් ගතවූයේ ගවේෂණය කරන අතරවාරයේදී ඒ සඳහා යොදාගන්නා ලද නැව් තැනීමටද සිදුවූ හෙයිනි. අවාසනාවකට මෙන් ස්කයිලැක්ස් විසින් මෙම ගවේෂණය පිළිබඳව ලියන ලද ගමන් විස්තරය ඇතුළත් වැදගත් ලේඛන අද දක්නට නොලැබේ. මෙම ගමනේදී ඔහු ලැබූ අත්දැකීම් පිළිබඳ තොරතුරු අපට දැනගත හැක්කේ ක්‍රි. පූ. 490 - 425 කාලයේදී හැලිකානසස්හි (Halicarnassus) වාසය කළ ඉතිහාසයේ පියා වශයෙන් සලකනු ලබන හෙරඩෝටස් ගේ මාර්ගයෙනි. එමෙන්ම ඉන්දියාව ගැන ස්කයිලැක්ස් සොයාගත් කරුණු ඇරිස්ටෝටල් විසින් රචිත "රජුන් පිළිබඳ තොරතුරු"(on the status of kings), ඇතෙනොයොස් (Athenaios) විසින් රචිත "පස සහ වෘක්ෂලතා" (Soils & Flora) සහ ෆිලෝස්ට්‍රේටෝස් (Philostratos) විසින් ලියන ලද "අද්භූත මිනිස්සු" (Mythical Peoples) වැනි පොත්වලද සඳහන් වේ.

ස්කයිලැක්ස්ගේ සමකාලීනයකු වූ මිලිටස් (Miletus) හි වාසය කළ හෙකටෙයිස් (Hekataios) විසින් ලියන ලැබූ මහ පොළව පිළිබඳ විස්තරය (Description of the earth) භූගෝල විද්‍යාත්මක සහ මානව වංශ පිළිබඳ (Geographic & ethnographic knowledge) තොරතුරු ලබා ගැනීම සඳහා ශත වර්ෂ කීපයක් තිස්සේ ප්‍රයෝජනයට ගත් වැදගත්

පොතක් ලෙස පැවතුණි. බොහෝ රටවල සංචාරය කර ඇති දේශපාලන වශයෙන් ක්‍රියාකාරී ඉතිහාසඥයකු වූ හෙකටෙයිස් විසින් රටවල් පාලනය කළ පාලකයින්ගේ පවුල් පිළිබඳ වංශාවලියක් සහ විස්තරාත්මක මාර්ගෝපදේශක ග්‍රන්ථයක්ද රචනා කළේය. ගන්ධාර දේශයේ පදිංචිකරුවන් පිළිබඳවද ඔහු විස්තර ලියා තිබේ. II ආර්ටැක්සර්සීස් නෙමන් (Artaxerxes II Mnemon) (ක්‍රි. පූ. 404-358) රජතුමාගේ රාජ්‍ය සභාවේ පෞද්ගලික වෛද්‍යවරයා වශයෙන් අවුරුදු 17 සේවය කළ කේරියාවේ (Caria) නිඩෝස් (Knidos) හි වාසය කළ පුද්ගලයකු වූ ක්ටේසියාස් (Ktesias) ගෙන් ඉන්දියාව පිළිබඳ විස්තරාත්මක තොරතුරු පසුකාලයක ග්‍රීසියට ලැබුණි. පෙරලා සියරටට පැමිණීමෙන් පසු ඔහු විසින් 'ඉන්ඩිකා' (Indica) සහ 'පර්සිකා' (Persica) නමින් පොත් දෙකක් ලියන ලදී. එම පොත්වල මානව වංශ පිළිබඳ අපූර්ව තොරතුරු, එම ප්‍රදේශයට ආවේණික ඉතිහාසය, එවකට දැන සිටි ලෝකයේ කෙළවර ජීවත්වූ ගෝත්‍රිකයන් පිළිබඳ විස්තර සහ ඊට අමතරව ඉහළ ඉන්දු නිම්නයේ මිනිසුන්ගේ ශරීර සනීපාරක්ෂාව, ඇඳුම්, වෙළඳාම සහ වෘක්ෂලතාදිය පිළිබඳ ඔහු විසින් නිරීක්ෂණය කරන ලද චමත්කාරජනකවූත් නිවැරදිවූත් කරුණු ඇතුළත් කර තිබේ.[37] ආර්ටැක්සර්සීස් (Artaxerxes) ගේ කාලයේදී ඉන්දියාව සහ පර්සියාව අතර ඉතා කිට්ටු සම්බන්ධතාවක් පැවතුණි. පැරණි ගොඩබිම් මාර්ග එකල හොඳින් පැවති අතර පර්සියානු ජාතික ආකිමෙනිඩ්ස් (Achaemenids) පන්ජාබය දක්වා වූ ප්‍රදේශය පාලනය කළේය. පළමුවන ඩේරියස් හිස්ටැස්ටස් රජුගේ (Darius Hystaspes) මුල් ශිලා ලේඛනවල ගන්ධාර දේශය පිළිබඳව සඳහන් කර තිබේ. ඒ කාලයේදී ජීවිතයේ විවිධ අංග කෙරෙහි පැවති බටහිර බලපෑම ඉන් පැහැදිලි වේ. ඉන්දු නිම්නයේ පහළ කොටස පර්සියාවේ ප්‍රාන්ත රජුන් යටතේ පැවතිණි. ඉන්දියාව යටත් කරගත් ඩේරියස් රජතුමාට ඉන්දියාව විසින් ගෙවිය යුතුවූ අධික කප්පම් පිළිබඳව හෙරඩෝටස් විසින් වාර්තා කර තිබේ.

ආකිමෙනිඩ්ස් රාජවංශයේ ආධිපත්‍යය පැවති අවසාන ශතවර්ෂ දෙක ඇතුළත් කාල පරිච්ඡේදය තුළදී විවිධ සංස්කෘතීන් අතර නිරන්තර සම්බන්ධතාවයන් පැවතුණි. එම අධිරාජ්‍යයේ බලපෑම විශාල පෙදෙසක් පුරා පැතිර තිබුණි. ඉන්දියාව, ඊජිප්තුව, සිරියාව සුළු ආසියාව සහ මෙසපොටේමියාව යන රටවල් ඉරාන අධිරාජ්‍යය යටතේ එක්සත්ව පැවතුණි. එකිනෙකට වෙනස්වූ බොහෝ ගෝත්‍රික කණ්ඩායම් අතර පැවති සම්බන්ධතා සංස්කෘතික වශයෙන් වැදගත් වූ බොහෝ හමුවීම් වලට මග පෑදුවේය. ක්‍රි. පූ. 486 - ක්‍රි. ව. 465 කාලයේදී සර්සීස් (Xerxes) ගේ නායකත්වය යටතේ ඉන්දියානු බල ඇණියක් මඩින් තර්මොපයිලී කපොල්ල හරහා ග්‍රීසියට පහර දෙන ලදී. එහිදී ඇතන්ස් නුවර පරාජයට

පත්විය. ක්‍රි. පූ. 336-331 දී තුන්වන ඩේරියස් රජතුමා ඇලෙක්සැන්ඩර්ගේ බිහිසුණු හමුදාවලට එරෙහිව ඉන්දියානු හමුදා ඉදිරියට මෙහෙයවන ලදී.

ක්‍රි. පූ. 327-324 කාලයේදී මහා ඇලෙක්සැන්ඩර් විසින් සිදුකළ සුප්‍රසිද්ධ ආක්‍රමණය හේතුකොට ගෙන ඉන්දියාව පිළිබඳ පැවති දැනීම සම්පූර්ණයෙන්ම නව මුහුණුවරක් ගත්තේය. මෙම ආක්‍රමණයේ නායකයා වූ ඇලෙක්සැන්ඩර් අවසානයේදී ඉතා ශෝචනීය ලෙස මරණයට පත්විය. එම ආක්‍රමණය සහ එහිදී යොදාගත් සටන්ක්‍රම පිළිබඳ විස්තර ක්‍රි. ව. 95 - ක්‍රි. ව. 175 කාලයේදී ජීවත්වූ ෆ්ලේවියස් අරියනෝස් සහ ක්‍රි. ව. පළමුවන ශත වර්ෂයේ විසූ සර්ටියස් රූෆස් සහ ඩියඩෝරස් සිකුලස් විසින් වාර්තා කර තිබේ. මෙම ඉන්දියානු ආක්‍රමණයෙන් ඇලෙක්සැන්ඩර් බලාපොරොත්තු වූයේ ප්‍රබල මැසිඩෝනියානු හමුදාවට ලෝක ආධිපත්‍යය ලබා ගැනීමය. එහිදී බලවත් පර්සියානු අධිරාජ්‍යයාවූ තුන්වන ඩේරියස් රජතුමා පරාජයට පත්විය. ඇලෙක්සැන්ඩර් විසින් එවකට දැනසිටි ලෝකයේ ඉතිරිව තිබූ ප්‍රදේශ සියල්ලම සීමා මිනිය නොහැකිවූ තම අධිරාජ්‍යයට අයත්කර ගැනීම සඳහා ඔහු තවදුරටත් ඉදිරියට ගියේය. ග්‍රීක් භාෂාවෙන් 'ඔයිකුමීන්' (Oikumene) යනුවෙන් හැඳින්වුන එවකට ජනාවාසවූ ලෝකයේ නැගෙනහිර සහ දකුණු දිග සීමාවන්ට ළඟාවීම ඔහුගේ එකම අභිප්‍රාය විය. මෙසේ තම රටේ විසූ පැරණි භූගෝල විද්‍යාඥයින් විසින් හඳුන්වනු ලැබූ මධ්‍යම ඉන්දු ගංගා නිම්නයට ඔහු පැමිණියේය.

ක්‍රි. පූ. 327 වන අවුරුද්දේදී දම්වැලක පුරුක් මෙන් ඉදිකරනු ලැබූ බලකොටු සහිත නගර රාශියක් මගින් ඇලෙක්සැන්ඩර් බටහිර සමග පැවති සම්බන්ධතා තර කළේය. එම වර්ෂය අවසානයේදී ඔහු බැක්ට්‍රියාවේ සිට ඉන්දියානු දේශ සීමාවට ළඟා විය. ඔහු සතුවූ සිවුම් රාජ්‍ය තාන්ත්‍රික ඥානය නිසා සටන් කිරීමකින් තොරව රටවල් යටත් කර ගනිමින් වේගයෙන් ඉදිරියට යාමට ඔහුට හැකිවිය. ක්‍රි. පූ. 327 වර්ෂයේදී 120,000 වූ පාබල සේනාවක් සහ 15,000 වූ අශ්වාරෝහක හමුදාවක් සමග හින්දු කුශ් කඳුවැටිය තරණය කර ක්‍රි. පූ. 326 වසර ආරම්භයේදී ඔහු ඉන්දු නිම්න ප්‍රදේශයට සම්ප්‍රාප්ත විය.

අසල් වැසි රාජ්‍ය ස්වභාවික සතුරන් ලෙසත්, දුරින් පිහිටි රාජ්‍ය ස්වභාවික මිතුරන් ලෙසත් සැලකීම පුරාණ ඉන්දියාවේ පැවති අදහසකි. ඒ අනුව ඇලෙක්සැන්ඩර්ගේ ආධිපත්‍යය පිළිගැනීමෙන් අසල් වැසි රටවල පාලන බලය තමාට ලබාගත හැකිවේයැයි එවකට තක්සිලාවේ පාලකයාවූ අම්භි (Ambhi) බලාපොරොත්තු විය. ඇලෙක්සැන්ඩර්ගේ පාලනය පිළිගැනීමට තමා කැමති බව දන්වමින්

ඔහු ඇලෙක්සැන්ඩර් වෙත දූතයින් පිටත්කර හැරියේය. මේ නිසා වටිනා ගොඩනැගිලි යුද්ධයෙන් විනාශවීම වැළකිණි.

ජයග්‍රාහී ලීලාවෙන් තක්සිලාවට ඇතුල්වීමට පෙර ඇලෙක්සැන්ඩර්ට ස්වොට් (Swat) නිම්නය තරණය කිරීමට සිදුවිය. එම ප්‍රදේශය පාලනය කරන ලද්දේ ජයග්‍රහණය හෝ මරණය එකම විකල්පය වශයෙන් තෝරා ගත් අස්වකාස් (Asvakas) නමැති රෞද්‍ර කඳුකර ගෝත්‍රිකයින් විසිනි. මෑතකදී සෝවියට් හමුදාව ඇෆ්ගනිස්ථානයේ කඳුවුරු බැඳ සිටි අවස්ථාවේදී කඳුකර වැසියන් අධිෂ්ඨාන ශක්තියෙන් සහ දැඩි ප්‍රතිභියෙන් (Persistence) යුක්තව ක්‍රියා කළ ආකාරය කෙනෙකුට මතක් කරගත හැකිනම් ඉහත කී ප්‍රදේශයේදී ඇලෙක්සැන්ඩර්ට මුහුණ දීමට සිදුවූ අභියෝගය පිළිබඳ කිසියම් අදහසක් ඇතිකර ගැනීමට හැකිවනු ඇත. ඒ කාලයේදී ඇලෙක්සැන්ඩර්ගේ වාසනා චක්‍රයේ නැගීමක් දක්නට ලැබුණි. එම බාධකය ජයගැනීමට ඔහුට හැකිවිය. ඉන්දු ගඟ තරණය කළ විගස ඔහු තක්සිලාවේ රජතුමාට අයත් හමුදා භටයින් 5,000 ක සහයෝගය ඇතිව පෞරව (Poros) රාජ්‍යයට විරුද්ධව සටන් කරමින් තවදුරටත් නැගෙනහිර දෙසට ගමන් කළේය. ඇලෙක්සැන්ඩර් ඉතා සූක්ෂම ලෙස උපක්‍රමශීලීව පෞරව රාජ්‍යයේ පොරවයින්ට අයත්වූ විශාල හමුදාව පරාජයට පත් කිරීමට සමත්විය. තව දුරටත් ඉදිරියට ඇදුන ග්‍රීක් හමුදාව චේනබ් (Chenab) සහ රවි (Ravi) (ග්‍රීක් Hydraotes) යන ගංගා තරණය කර බීස් Beas (ග්‍රීක් Hyphasis) දක්වාත් එතැනින් අද උතුරු ඉන්දියානු නගර වන අම්රිත්සාර් (Amritsar) සහ ජුලුන්දූර් (Jullundur) නගර අතර පිහිටි ප්‍රදේශයට ගියහ. ඇලෙක්සැන්ඩර්ගේ එකම අභිප්‍රාය වූයේ එවකට ජනාවාස වූ ලෝකයේ කෙලවරට ළඟාවීමය. පර්සියානු අධිරාජ්‍යයට අයත් මෙම දුරස්ථ ප්‍රාන්ත යටත් කර ගැනීමෙන් පසු තම පරමාර්ථය ඉටුවී ඇතිබව ඔහු කල්පනා කළේය. එපමණක් නොව නයිල් නිම්නය දක්වා තරම් ඈතට තමා පැමිණ ඇති බව ඔහු විශ්වාස කළේය. ඉන්දු ගංගාවේ සහ හයිඩැස්පස් (Hydaspes) යන ගංගාවල ග්‍රීකයෝ කිඹුලන් දුටහ. තවත් ගංගාවක් වූ ඇකිසීන්ස්හි (Akesines) නෙළුම් මල් දුටහ. ඔවුන් දැන සිටියේ කිඹුලන් වාසය කරන්නේත් නෙළුම් මල් වැඩෙන්නේත් නයිල් ගඟේ පමණක් බවය. ලෝක භූගෝලය සහ තමා පැමිණ සිටින ස්ථානය පිළිබඳ වටහාගැනීම සඳහා අවශ්‍ය තරම් තොරතුරු ඇලෙක්සැන්ඩර් ජීවත්වූ කාලයේදී නොතිබූ බව මෙයින් පෙනීයයි.

එම ප්‍රදේශයේ ජීවත් වූ වැසියන් විසින් ඉන් ඔබ්බට නැගෙනහිර දෙසට සීමා මිනිය නොහැකි තරම් විශාල වූ බිම් ප්‍රදේශයක මිනිසුන් වාසය කරන බවත්, ඔවුන් සතුවූ විශාල අලි රංචු සිටින බවත්, එපමණක්

නොව එම දිශාවටම ගලායන ගඟක් තිබෙන බවත් ප්‍රකාශ කළ විට නමා නයිල් ගඟේ ආරම්භය සිදුවන අතු ගංගාවකට හෝ ඔසිනුම් වශයෙන් හැඳින්වූ නමා දැන සිටි ලෝකයේ නැගෙනහිර සීමාවට ළඟා වී නොමැති බව ඔහු දැන ගත්තේ එවිටය.[38] ඇලෙක්සැන්ඩර් නතර කිරීම කිසිවකුට නොහැකි විය. තවදුරටත් ඉදිරියට යාමට ඔහුට උවමනාවිය. නමුත් ඒ අවස්ථාව වනවිට අවුරුදු කිහිපයක් යුද වැදීමෙන් පසු මැසිඩෝනියානු හමුදාව මහත් වෙහෙසට පත්ව සිටියේය. හමුදාව ඔහුගේ අණට විරුද්ධව නැගී සිටිමින් ආපසු හැරී එන ලෙස ඔහුට බල කළේය. අවසානයේදී ක්‍රි. පූ. 325 ශරත් සෘතුවේදී ඇලෙක්සැන්ඩර් ඉන්දියානු ප්‍රදේශය අතහැර මාස 20 කට පසු පර්සියාව වෙත පැමිණියේය. ඊට වසරකට පසු ඔහු බැබිලෝනියාවේදී මිය ගියේය.

මීට ශත වර්ෂ දෙකකට පෙර ආකෙමිනිඩ්ස් රාජවංශයේ ඩේරියස් කුමරු විසින් ස්කයිලැක්ස් නමැති පුද්ගලයකු නතර කර ආ පරිදිම ඇලෙක්සැන්ඩර්ද නියර්කෝස් (Nearchos) නමැති පළපුරුදු නැවියෙකු ඉන්දියාවේ නතර කර තම හමුදා සමග සියරට බලා ගොඩබිම් මාර්ග ඔස්සේ පිටත් විය. නියර්කොස් ආපසු පැමිණීමේදී ඉන්දු ගඟ ඔස්සේ ගොඩ බිමින් දකුණු දෙසට ගමන් කර එතැන් සිට මුහුදින් ගමන් කිරීමට කටයුතු සූදානම් කර තිබුණි. කෙසේ වෙතත් එකල නිරිතදිග මෝසම් සුළං හැමීම නිසා බටහිර දෙසට නැව් ගමනාගමනය කිරීම එතරම් හිතකර නොවීය. නමුත් ග්‍රීක් භාෂාවෙන් ප්ලිඒඩ්ස් (Pleiades) යනුවෙන් හැඳින්වෙන කාල පරිච්ඡේදය, එනම් ශීත සෘතුව ආරම්භයේ සිට දක්ෂිණායනය (Solstice) දක්වාවූ කාල පරිච්ඡේදය, තුළදී එම මුහුදු ප්‍රදේශය තරණය කළහැකි බව ඇලෙක්සැන්ඩර් දැන සිටියේය. සුළං දිශාව වෙනස් වී නොවැම්බර් මාසයේ පටන් හිතකර ඊසාන දිග සුළං ආරම්භ වන තුරු නියර්කොස්ට ඉන්දියාවේ රැඳී සිටීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් ඉන්දියානුවන්ගෙන් එල්ල වූ ප්‍රහාර හේතුකොට ගෙන සැප්තැම්බර් මාසය ආරම්භයේදීම ඔහුට ඉන් පිට වීමට සිදුවිය. ඔහු ඉන්දු ගංගාවේ දකුණු ප්‍රදේශයේ පිහිටි සයිලෙනොපොලිස් (Xylenopolis 'wood town') (ලී නගරය) ආසන්නයෙන් තම නැව් මුහුදට දියත් කළේය. මෙම නගරයට දී තිබෙන නමින් ඉන්දු නිම්නයේ සිට නිර්යාත කරනු ලැබූ වටිනා දැව පිළිබඳ අදහසක් ලැබේ. නියර්කොස් ක්‍රොකැලා (Krokala) නමින් හැඳින්වෙන වැලි සහිත දූපතකට මුලින්ම ගොඩ බැස්සේය. ජ්‍යෙෂ්ඨ ප්ලිනි (ක්‍රි. ව. 23-79) විසින් ලියන ලද සුප්‍රසිද්ධ "නැචුරලිස් හිස්ටෝරියා" (Naturalis Historia) නමැති ග්‍රන්ථයෙහි නියර්කෝස්ගේ කාලයේ පටන් ඉන්දියාව දක්වා වැටී තිබූ මුහුදු මාර්ග පිළිබඳ සිත් ගන්නා සුලු විස්තරයක් ඉදිරිපත් කර තිබේ. ජුනි සිට සැප්තැම්බර් දක්වා අරාබියේ පිහිටි සයගෘම්

තුඩුවේ (Cape Syagrum) සිට ෆැවෝනියස් (Favonius) හෙවත් හිපැලිස් (Hippalis) නමින් හැඳින්වූ නිරිතදිග මෝසම් සුළං වල ආධාරයෙන් ඉන්දු ගඟේ මෝය ප්‍රදේශයට ළඟාවිය හැකිබව ප්ලිනි (Pliny) සඳහන් කර තිබේ.

ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දියානු ආක්‍රමණය පිළිබඳ තොරතුරු පැරණි ඉන්දියානු මූලාශ්‍ර කිසිවක සඳහන් කර නොතිබීම එතරම් පුදුම වීමට කරුණක් නොවේ. පෞරවයන්ට (Poros) විරුද්ධව කරනු ලැබූ සටන හැරුණුවිට කිසිම සටනක් නොකර සියලුම ප්‍රදේශ යටත් කර ගැනීම නිසා එය හොඳින් පැහැදිලි වේ. තවදුරටත් එකී ප්‍රදේශ සුපුරුදු ලෙස ඉන්දියානු පාලකයින් විසින්ම පාලනය කරනු ලැබීම නිසා ඒවායේ ජීවත්වූ මිනිසුන්ට කිසි වෙනසක් නොදැනුණි. පර්සියානු ප්‍රාන්ත රජවරු ඉවත් කර ඒ වෙනුවට ග්‍රීක් ආණ්ඩුකාරයින් පත් කරන ලදී. කෙසේ වෙතත්, ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දියානු ආක්‍රමණයට බොහෝ කාලයකට පෙර ග්‍රීක් ජාතිකයින් සහ ග්‍රීසිය හැඳින්වීම සඳහා 'යවන' හෝ 'යෝන' වැනි නම් ඉන්දියානු වාර්තාවල යොදා තිබේ. එම වචන බිඳීවිත් තිබෙන්නේ ග්‍රීක් ප්‍රදේශවල භාවිතා වන හෙලනීසියානු වචන වලිනි. මෙය ග්‍රීසිය පිළිබඳ පුරාණ ඉන්දියානුවන් තුළ පැහැදිලි අවබෝධයක් තිබුණු බව පෙන්වන පැහැදිලි සාක්ෂියකි.[39]

ඇලෙක්සැන්ඩර්ගෙන් පසු ඉන්දු නිම්න ප්‍රදේශය විශාල වෙනස් වීමකට භාජනය විය. ඔහු විසින් නගර විශාල සංඛ්‍යාවක් පිහිටවනු ලැබිය. බලකොටු විශාල සංඛ්‍යාවක් ආරක්ෂා වී තිබුණි. ඔහු විසින් පත් කරනු ලැබූ පීතොන් (Peithon) නැමැති ආණ්ඩුකාර වරයකු මගින් පහළ ඉන්දු ප්‍රදේශයත්, ෆිලිප්පෝස් (Philippos) නමැති ආණ්ඩුකාරවරයකු මගින් තක්ෂිලාවත් පාලනය කරනු ලැබිය. ග්‍රීකයින් සහ ඉන්දියානුවන් අතර බලය සඳහා මතභේද ඇතිවීම නිසා දශකයක් පමණ කාලයක් සාමකාමී දේශපාලන වාතාවරණයක් නොපැවතුණි. ඇලෙක්සැන්ඩර්ගේ අධිරාජ්‍යයේ විශාල ප්‍රදේශයක් උරුමවූ සෙලුසිඩ් (Seleucids) ට අයත් ප්‍රදේශය ඊජියන් (Aegean) ප්‍රදේශයේ සිට ඇරකෝසියා (Arachosia) සහ ඉන්දු නිම්නය දක්වා ව්‍යාප්තව තිබුණි. එම ප්‍රදේශවල මායිමෙහි කුඩා ග්‍රීක ප්‍රාදේශීය රාජ්‍ය බිහිවිය. එම ප්‍රාදේශීය රාජ්‍ය සහ පන්ජාබ් ප්‍රදේශය අතර ශතවර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ දැඩි අන්තර් (සංස්කෘතික) ගැටුම් පැවතුණි. එම ප්‍රාන්ත රාජ්‍යවල කුමාරයින් විසින් නිකුත් කරන ලද කාසි වලින් විවිධ රටවල් අතර පැවති සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ අදහසක් ඇතිකර ගත හැකිය. එම කාසි වල විස්තර දක්වා ඇත්තේ සමාන්තරයෙන් භාෂා දෙකකින්, එනම් ග්‍රීක් සහ කරෝෂ්ති

(Karoshthi) යන භාෂා වලිනි. රටවල් යටත් කරගැනීම පමණක් ඇලෙක්සැන්ඩර්ගේ අභිප්‍රාය නොවීය. ඔහුගේ පරිවාර කණ්ඩායමට බුද්ධිමත් ප්‍රතිභාපූර්ණ ලේඛකයින් මෙන්ම දුරස්ත රටවල සදාචාර සිරිත් විරිත් සහ ආගම් පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වූ පුද්ගලයින්ද ඇතුළත් විය.

ක්‍රි. පූ. 317 පසු ඉන්දු ප්‍රදේශයට සාමය උදාවිය. කීර්තිමත් මෞර්ය රාජ වංශයේ නිර්මාතෘවරයා වූ චන්ද්‍රගුප්ත මෞර්ය නැමැති ඉන්දියානු රජතුමා මෙම ප්‍රදේශය යටත් කර එය තම අධිරාජ්‍යයට ඈඳා ගත්තේය. පුරුවිස්, පර්සියාව සහ මිඩිස් (Medes) අතර ප්‍රදේශය වසා පැතුරුණු ඇලෙක්සැන්ඩර්ගේ රාජධානියේ අනුප්‍රාප්තිකයා වූ ක්‍රි. පූ. 358-281 කාලයේ රජකළ පළමුවන සෙලියුකස් නිකේටර් (Seleucus I Nicator) චන්ද්‍රගුප්ත මෞර්ය විසින් තක්ෂිලා නගරයට ආසන්නයේ ඇතිවූ සටනකින් පරාජයට පත් කළේය. තමාට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා පිළිබඳව සෙලියුකස්ට (Seleucus) අවබෝධයක් තිබූ නිසා ඔහු චන්ද්‍රගුප්ත සමඟ සමගි සන්ධානයකට එළඹීමට තීරණය කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉන්දියාව සහ බටහිර රටවල් අතර පැවති සම්බන්ධතාවේ නව අදියරයක් ආරම්භ විය. මේ නිසා ඉන්දියාව හා ග්‍රීසිය අතර අඛණ්ඩ දේශපාලන සම්බන්ධතා ඇතිවූ අතර සෙලියුකස්ගේ රාජ දූතයෙකුවූ මෙගැස්තිනීස් (Megasthenes) ක්‍රි. පූ. 300 වර්ෂයේදී පමණ පාටලීපුත්‍ර (නූතන පැට්නා) නගරයේ පිහිටි ඉන්දියානු රාජ සභාවට එවන ලදී. මෙසේ ග්‍රීක-ඉන්දියානු සම්බන්ධතා තවදුරටත් ආරක්ෂාවී වැඩි දියුණු විය. චන්ද්‍රගුප්තට පසු රජකමට පත්වූ බිංදුසාර (ක්‍රි. පූ. 298-277) රජතුමා සහ ග්‍රීසියේ ඇන්ටිඔකස් (Antiochus) (ක්‍රි. පූ. 280-261) අතර සුහද ලිපි හුවමාරුවක් සිදුවිය.[60] තමාට කෑමට දිඹුල් සහ වාදකිරීම සඳහා කථාවේ දක්ෂ චතුර විතණ්ඩ වාදියෙක් එවන ලෙස ග්‍රීක රජුගෙන් බිංදුසාර ඉල්ලා සිටියේය. ග්‍රීක දර්ශනය පිළිබඳව කරුණු දැන ගැනීමට ඉන්දියානු පාලකයාට අවශ්‍ය විය. නමුත් විතණ්ඩ වාදියෙකු තම රටෙන් සොයාගත නොහැකි බව ඇන්ටිඔකස් විසින් දන්වා යවා ඩෙයිමකොස් (Deimachos) නමැති ග්‍රීක් රාජ දූතයෙකු බිංදුසාර රජතුමා වෙත යවන ලදී. මෞර්ය රජවරු කෲර අන්දමින් රට පාලනය කරනු ලැබූ නමුත් පුළුල් දැනීම, උසස් දාර්ශනික සහ ආගමික සාකච්ඡාවන් ප්‍රිය කළහ. මේ නිසා මෞර්ය යුගයේ සිට ඉන්දියානු රාජ සභාවේ සේවය කළ තානාපතිවරු හුදු දේශපාලනඥයින් පමණක් නොවූහ. ඔවුහු උසස් අධ්‍යාපනයක් ලත්, නිසැකවම ඇති කුතුහලයකින් යුක්තව තමා සේවය කරන රටේ පවතින සිරිත් විරිත් සහ සිතුම් පැතුම් වලට අනුකූලවූ කටයුතු කළ පුද්ගලයෝ වූහ.

ඇලෙක්සැන්ඩර් තම බලකොටු අත් හැර දමා ගංගා පහේ රටෙන් (පන්ජාබ් දේශයෙන්) ඉවත් වීමට පටන් ගන්නා විට බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 160 ක් ගතවී තිබුණි. මේ අවස්ථාව වනවිට බුද්ධ ශාසනය සංගායනා දෙකකින් පසු හොඳින් සංවිධානය වී තිබුණි. ඉන් එක් සංගායනාවක් බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් නොබෝ දිනකින් ක්‍රි. පූ. 480 දී සිදුවූ අතර දෙවැන්න ක්‍රි. පූ. 380 දී පමණ සිදුවිය. මේ කාලය වනවිට බුදුන් වහන්සේගේ ඉගැන්වීම් හොඳින් ආරක්ෂා වී ව්‍යාප්තව තිබුණි. මෙම දීර්ඝ කාලය තුළදී තථාගතයන් වහන්සේගේ පණිවිඩය ගංගානම් ගංගාවේ පහළ ප්‍රදේශයේ පිහිටි මගධ සහ විදේහ (Videha) අවට පිහිටි රාජ්‍යයේ විශාල කොටසක පැතිර තිබුණි. එපමණක් නොව එය පංජාබ්, මහාරාෂ්ට්‍ර සහ ශ්‍රී ලංකාව වැනි ප්‍රදේශවලටද ශීඝ්‍රයෙන් පැතිර ගොස් තිබුණි. බුදුන් වහන්සේ විසින් පෙන්වා දෙන ලද පැවිදි ජීවිතයට ඇතුල් වූ භික්ෂූන් මහා ගංගා ඔස්සේ කඳුකර ප්‍රදේශ වලටත් ඉන්දු ගඟ සහ එහි අතු ගංගා ආශ්‍රිතව පැවති පුරාණයේ සංස්කෘතික වශයෙන් වැදගත්වූ ප්‍රදේශවලටත් වැඩම කළහ.

තක්ෂිලා සහ ස්වොට් නිම්න ප්‍රදේශයේදී ඇලෙක්සැන්ඩර්ට බෞද්ධ ශ්‍රමණයින් හමුවිය. ගන්ධාරයේදී ඇලෙක්සැන්ඩර්ට මුණගැසුනු ශ්‍රමණයින් 'සාමණෙයි' හෝ 'සමණෙයොයි' (Sarmanai or Samanaioi) යනුවෙන් හඳුන්වනු ලැබූ බවත්, ඔවුන් ශුද්ධ වෘක්ෂයක් සේ සලකන ඇසතු ගස් මුල වාඩිවී සිටින බවත් ඒ පිළිබඳව තොරතුරු රැගෙන ආ පුද්ගලයින් ඇලෙක්සැන්ඩර්ට දැන්වූහ.[61] එම තාපසයින් ශ්‍රමණයින් (shramanas) විය යුතුය. 'ශ්‍රමණ' යනු පිඬුසිඟා යමින් ජීවත්වන බෞද්ධ භික්ෂූන් වහන්සේලා හැඳින්වීමට යොදන පදයකි. එපමණක් නොවේ, ඇසටු වෘක්ෂය පූජනීයත්වයෙන් සලකනු ලබන්නේ බෞද්ධයින් විසින් පමණි. ඊට හේතුව බුදුන් වහන්සේ බුද්ධත්වය ලබාගත්තේ එවැනි ගසක් පාමුලදී වීමය. එවැනි තාපසයකු කලනොස් (Kalanos) යනුවෙන් හැඳින්වීමට ග්‍රීකයින් පුරුදුව සිටියහ. එයට හේතුවූයේ එම තවුසා විසින් කල්‍යානම් (Kalyanam) යන වචනයෙන් ඔවුන්ට නිතර ආමන්ත්‍රණය කිරීමට පුරුදුව සිටීම නිසාය. කලනෝස් ඇලෙක්සැන්ඩර්ගේ හමුදාව බලා සිටියදීම සෙහොනක් මතට පැන තම ශරීරයට ගිනි තබා ගත් බව සඳහන් වේ.

එකල පැවති ඉන්දීය ජන ජීවිතය පිළිබඳ බොහෝ තොරතුරු අපට ලැබී ඇත්තේ සෙලුසිඩ් රජතුමාගේ (Seleucid) ගේ දූතයකු වශයෙන් චන්ද්‍රගුප්තගේ රාජ සභාවේ සේවය කළ මෙගැස්තිනීස් විසින් ලියන ලද තොරතුරු මාර්ගයෙනි. ඔහු විසින් වාර්තා කර ඇති බොහෝ කරුණු

අතර බ්‍රාහ්මණයින් විසින් බලපවත්වන ලද ආධිපත්‍යය පිළිබඳ තොරතුරු අඩංගු වේ. එමෙන්ම බෞද්ධ ශ්‍රමණයින් (sarmanas) පිළිබඳ තොරතුරුද ඒවායේ අඩංගුවේ. කීර්තිමත් මෞර්ය රාජවංශයේ නිර්මාතෘවරයා චන්ද්‍රගුප්ත බව අපි මුලින් ප්‍රකාශ කෙළෙමු. ක්‍රි. පූ. 320 දී පමණ ගංගානම් ගඟේ නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි පැරණි දේශපාලන මධ්‍යස්ථානය වූ මගධය පාලනය කළ නන්ද රාජ වංශය බලයෙන් පහ කරදමා ඔහු බලය අල්ලා ගත්තේය. ඊසාන දිග පිහිටි පන්ජාබයත් අද ඇෆ්ගනිස්ථානය සහ බලුකිස්ථානය නමින් හැඳින්වෙන රටවල්ද ඇතුළත් බිම් ප්‍රදේශ ඔහු තම රාජ්‍යයට ඈඳා ගත්තේය. උපායෙහි දක්ෂ පුද්ගලයකු වූ කෞටිල්‍ය නම් වූ තම ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුශාසනා පරිදි ඔහු විශාල ප්‍රදේශයක් පුරා පැතිර තිබූ පළමු ඉන්දීය අධිරාජ්‍යය තුළ නිර්දය දේශපාලන සංස්කෘතියක් ඇති කළේය. ඉතා සැලකිල්ලකින් යුතුව ශ්‍රේණිගත කරනු ලැබූ නිලධාරී ධුරාවලියකින් යුක්ත වූ අතිශයින් කාර්යක්ෂම වූ පාලන ක්‍රමයක් ඇති කළේය. එම නිලධාරීන් තුළ පැවති ප්‍රවීනත්වය මෙගැස්තිනීස් පවා විස්මයට පත් කිරීමට හේතු විය. රාජ්‍ය පාලනය පිළිබඳ එකල ලියනු ලැබූ සුප්‍රසිද්ධ 'අර්ථශාස්ත්‍රය' (Arthashastra) නමැති ග්‍රන්ථයට අනුව කෙටි කාලයක් තුළදී ඉතා උසස් තත්වයක පැවති පාලන තන්ත්‍රයක් ඇතිකිරීමට ඔහු සමත් විය. බොහෝ දුරට 'අර්ථශාස්ත්‍රය' නමැති ග්‍රන්ථයද කෞටිල්‍ය විසින්ම ලියන ලදැයි සිතිය හැකිය. පරම රාජ්‍ය බලය සහ එම බලය ව්‍යාප්ත කිරීම සහ ආරක්ෂාකර ගැනීම සම්බන්ධයෙන් එහි ඉදිරිපත් කර ඇති තාර්කික මතවාද මැකියවෙලි විසින් රචිත 'කුමාරයා' (II Principe) නැමති පොත හා සැසඳීමට පුළුවන.

රටක් පාලනය කිරීම යනු දණ්ඩ නීතිය ක්‍රියාත්මක කිරීම බව අර්ථශාස්ත්‍රයේ පැහැදිලිවම නිර්වචනය කර තිබේ. දණ්ඩ නීතිය යනු දඬුවම් දීමේ ක්‍රමයයි. මුල් මෞර්ය රජවරු එය අකුරටම ක්‍රියාත්මක කළහ. ඔවුන්ගේ රාජ සමය අතිශයින්ම කෲර යුගයක් විය. චන්ද්‍රගුප්තගේ පුත්‍ර වූ බින්දුසාරට අමිත්‍රඝාතක හෙවත් 'සතුරන් නසන්නා' නම් වූ අන්වර්ථ නාමයක් පවා පටබැඳ තිබුණි.

මගධ දේශය දීර්ඝ කාලයක් තිස්සේ ආගම් වලට කේන්ද්‍රස්ථානයක් ලෙස පැවතුණි. උග්‍ර තපස් ව්‍රත පිළිපැදීම සහ පණ ඇති සියලු දෙයට ගරුකිරීම පිළිබඳ තම පණිවිඩය දේශනා කරමින් මහාවීර ඊට අවුරුදු 200 කලින් එහි වාසය කළේය. මහත් ගෞරවයට පාත්‍ර වූත්, මිනිසුන් විසින් වන්දනාමාන කරනු ලැබුවාවූත්, බුදුන් වහන්සේ වැඩසිටි ස්ථාන රාශියක් එහි අලුත් අගනුවර වූ පාටලීපුත්‍ර නගරයේ පිහිටා තිබේ. ඒවා නම් උන්වහන්සේ බුද්ධත්වයට පත්වූ බුද්ධගයාව (Bodh Gaya), පළමුවෙන්

දහම් දෙසූ ස්ථානය වූ ඉසිපතනය (වර්තමාන සාරානාත්), පිරිනිවන් පෑ කුසිනාරා (නූතන කාසි-kasia), මගධයේ කලින් අගනුවරවූ, පළමු ධර්ම සංගායනාව පවත්වනු ලැබුවාවූ 'රජගහ', සහ අවසාන වශයෙන් දෙවන ධර්ම සංගායනාව පවත්වනු ලැබූ වෛශාලි (නූතන බසාර්-Basarh) යන ස්ථානවේ.

පළමු මෞර්ය රජු තුළ පැවති ආත්ම විශ්වාසය පැහැදිලි කරන ලක්ෂණයක් නම් බ්‍රාහ්මණ නොවූ ආගම් කෙරෙහි ඔහු තුළ තිබූ විශේෂ නැමැත්තය. තම රාජධානියේ දීර්ඝ කාලයක් පැවති සාගතයක් හේතුවෙන් බලය අහිමිවීම නිසා බලාපොරොත්තු සුන්වූ නිසා චන්ද්‍රගුප්ත මෞර්ය රජකම අතහැර තම ජීවිතයේ අවසාන අවුරුදු 12 ජෛන භික්ෂුවක් මෙන් ජීවත්වූ බව සඳහන් වේ. අධිරාජ්‍යයේ පැවති එක්සත්කම, බුදු දහම සහ ජෛනාගම ඇසුරින් නිරන්තරයෙන් පවත්වාගෙන ගිය බුද්ධිමය සහ ආගමික ප්‍රබෝධය මෞර්ය රාජවංශය සමග බිහිවූ නව යුගයේ විශේෂ ලක්ෂණ විය.

මෞර්ය රජ පෙළපතේ තුන්වන පාලකයා වූ අශෝකවර්ධන හෙවත් අශෝක රජතුමාගෙන් බුදුදහමේ දියුණුවට විශාල රුකුලක් ලැබුණි. තමා ප්‍රියදර්ශන (ඇසීමට ප්‍රිය) හෝ දේවානම්ප්‍රිය (දෙවියන්ට ප්‍රියවූ) යනුවෙන් හඳුන්වනු ලැබීමට අශෝක රජතුමා ප්‍රිය කළේය. ක්‍රි. පූ. 272-232 දක්වා කාලය තුළ අශෝක තම පාලනය යටතේ සමස්ත ඉන්දියාවම එක්සේසත් කළේය. අශෝක බෞද්ධ දර්ශනය වෙත නැඹුරු වූයේ තම සීයා වූ චන්ද්‍රගුප්ත මෙන් කෲර පාලකයකුසේ බලය පසු පස හඹාගොස් දීර්ඝ කාලයක් රාජ්‍ය පාලනය කර අවසානයේදී ඇතිවූ පසුතැවිලි වීමක් නිසා නොවේ. ශාක්‍ය වංශයේ උපන් බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ඔහු කල්තියාම තේරුම් ගත්තේය. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් පතුරුවා හැරීමට ඔහු තම සම්පූර්ණ ශක්තිය කැප කළේය. බුදු දහම තම රටවැසියන් අතර පමණක් නොව, අසල් වැසි රටවලත්, එවකට ලෝකය වශයෙන් දැන සිටි සියලුම රටවල ජීවත්වන ජනයා අතරත් පැතිරවීමට ඔහු ක්‍රියා කළේය. ඔවුන් කොතරම් දුර බැහැර ප්‍රදේශවල ජීවත්වූවත් බුදුන් වහන්සේගේ ප්‍රීතිමත් පණිවිඩය උන් වහන්සේ විසින් තම ශ්‍රාවකයන්ට නියම කළ පරිදි ප්‍රචාරය කිරීම ඔහුගේ එකම අභිලාෂය විය.

කෙසේ වෙතත් අශෝකගේ ජීවිතය කෲරත්වයෙන් තොරවූවක් නොවේ. ඔහු මුලදී සාමය වෙනුවෙන් පෙනී සිටි පුද්ගලයකු නොවිය. තථාගතයන් වහන්සේගේ ඉගැන්වීම් තම රට වැසියන්ගෙන් සමස්ත මිනිස් වර්ගයාගේත් විමුක්තියට හේතුවන බව ඔහු විසින් අවබෝධකර

ගැනීම දෛවෝපගත සිදුවීමකි. අශෝකට දිවිත්ව චරිතයක් තිබුණි. ඔහු තුළ පැවති ශූරත්වය ඉතිහාසඥයින් විසින් අසාධාරණ ලෙස ඔහු වෙත ආරෝපණය කරන ලද්දක් නොවේ. තම පියා වූ බින්දුසාර තරුණ වියේදීම ඔහු විශාල හමුදාවක් සමග තක්ෂිලාවට සටන් කිරීම සඳහා පිටත් කර යවනු ලැබීය. රාජධානියට වයඹ දිගින් පිහිටි ප්‍රදේශවල කැරලි ඇතිකළ දරුණු විප්ලවකාරී ගෝත්‍රික ජනයා මර්දනය කිරීම ඔහුට පැවරුණු කාර්යය විය. ඇලෙක්සැන්ඩර් ඉන්දියාව ආක්‍රමණය කළ අවස්ථාවේදී කටයුතු කළ පරිදිම බුද්ධිමත් ජනකොටසක් වූ ගන්ධාර වැසියන් අශෝකට විරෝධය නොපෙන්වීම නිසා ඔවුන්ගේ සුන්දර නගරය විනාශයට පත් නොවී ආරක්ෂා කර ගැනීමට හැකිවිය. තක්ෂිලාව ජයගැනීම නිසා අශෝක තුළ බලයට ආශාවක් ඇතිවිය. ඔහු ඇති දැඩි වූ පරිසරය මගින් බලය භුක්ති විඳීම සඳහා අවශ්‍ය පුහුණුවක් ඔහුට ලැබී තිබුණි. ඔහුගේ ක්ෂණික උවමනාව වූයේ තම පියාගෙන් රාජ්‍යය පැහැරගෙන ඔහු මරා දැමීමය. කෙසේ වෙතත් බල අරගලය පිළිබඳ හොඳින් දැන සිටි රජතුමා තම පුත් අශෝක ඉතා දුරස්ථ ප්‍රදේශයක පිහිටි උදේනි නුවර යුවරජ තනතුරට පත් කර යවන ලදී. බිංදුසාර රජතුමාගේ මරණයට නොබෝ දිනකට පෙර තක්ෂිලා වැසියන් නැවත වරක් කැරලි ගැසූ අවස්ථාවේදී අධිරාජයා විසින් තමාගෙන් පසු රාජ්‍යය ලබා දීමට පොරොන්දුව සිටි සුසීම නම් වූ තම වැඩිමහල් පුත්‍රයා එය මැඩලීම සඳහා පිටත්කර හරින ලදී. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් අශෝක වහාම පාටලීපුත්‍ර නගරයට පැමිණ තම පියා මිය ගිය පසු රාජ්‍ය බලය අල්ලා ගත්තේය. මෞර්ය රාජවංශයේ නව පාලකයා වශයෙන් ඔහු විසින් කරන ලද පළමු කාර්යයෙන්ම ඔහු මෞර්ය රාජ වංශයේ සැබෑ පුත්‍රයෙක් බව රට වැසියාට පෙනී යන්නට ඇත. ඔහු තම එක කුස උපන් තිස්ස නමැති කුමාරයා හැර තමන් කෙරෙහි විරෝධය දැක්වූ සුසීම ඇතුළු අනෙක් සියලුම සහෝදරයින් මරණයට පත් කළේය. තමාගේ පාලනයේ සිව්වන වසරේදී ඔහු පාටලීපුත්‍ර නගරයේදී රාජාභිෂේකයට පත්විය. එම වර්ෂයේදීම ඔහු බ්‍රාහ්මණ විශ්වාස ඉවතලා බුදු දහම වැළඳගත්තේය.

අශෝක රජතුමාගේ දූත සේවය : බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ලොව පුරා පැතිරීම

අශෝක රජු විසින් බුදු දහම වැළඳ ගැනීම පිළිබඳ විවිධ ජනප්‍රවාද තිබේ. රාජ්‍ය බලය අත්පත් කර ගැනීමේදී ඔහු විසින් මරණයට පත්

කරන ලද සුමන නම් තම වැඩිමහල් සොහොයුරාගේ පුත්‍රයාවූ නිග්‍රෝධ ස්වාමීන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙන් පසු ඒ ගැන පැහැදී බුදුදහම වැළඳ ගත් බව එක් ජනප්‍රවාදයකින් කියැවේ. තවත් ජනප්‍රවාදයකට අනුව බෞද්ධ භික්ෂුවකට වධහිංසා පමුණුවනු ලැබූ අවස්ථාවකදී එම භික්ෂුව හැසුරුණු සන්සුන් ලීලාව දැකීමෙන් ඒ ගැන පැහැදී බුදු දහම වැළඳගත් බව කියවේ.

කෙසේ වෙතත් මෙතුමා බුදු දහම වැළඳ ගැනීමට සැබෑ හේතුව වශයෙන් අද ඔරිස්සාව නමින් හැඳින්වෙන කාලිංග රාජ්‍යයට එරෙහිව ඔහු විසින් දියත් කරන ලද දරුණු සංග්‍රාමය හේතු වූ බව අපට සිතිය හැක. අශෝක රජතුමා තමා විසින් කරන ලද ක්‍රියා, පනවන ලද නියෝග, සහ ඔහුගේ සිහිවිලි සෙල්ලිපි සහ ටැම්ලිපි වල වාර්තා කොට තිබේ. සුප්‍රසිද්ධ 13 වන සෙල්ලිපියේ මෙම කුරිරු හමුදා ආක්‍රමණයෙන් ලැබූ ජයග්‍රහණය පිළිබඳව පණ්ඩිතමානී නිරවද්‍යතාවයකින් යුතුව සඳහන් කර තිබේ. මිනිසුන් එක් ලක්ෂ පනස්දහසක් රටින් පිටුවහල් කළ බවත්, ලක්ෂයක් දෙනා මරණයට පත් කරන ලද බවත්, එපමණක් නොව යුද්ධයට නිසා ඊට අමතරව තවත් විශාල සංඛ්‍යාවක් මියගිය බවත්, එහි සඳහන් කර තිබේ. තම පියා විසින් උවමනාවට වඩා සැලකිලි දක්වනු ලැබූ රජ වාසල සේවය කළ ස්වාර්ථය පමණක් සලකා කටයුතු කළ බමුණන්ගේ ක්‍රියා කලාපය කෙරෙහි අශෝක ඒවන විටත් කලකිරීමට පත්ව සිටියේය. තම පියාගේ නාගශීලීභාවයෙන් අයුතු ලෙස ප්‍රයෝජන ගත් ඔවුනු මෞර්ය පාලකයින් විසින් අනුගමනය කළ දරුණු පාලන ක්‍රමයට රුකුල් දුන්හ. අශෝක රජතුමා එකල ඉන්දියාවේ පැවති වෙනත් ඉගැන්වීම් පිළිබඳවද විමර්ශනය කරමින් සිටියේය. ජෛන හා බුද්ධ දර්ශනය මෙන් එකී ඉගැන්වීම් මගින්ද මිනිසුන්ට එරෙහිව සහ සමහර විට වෙනත් සියලු ප්‍රාණීන්ට විරුද්ධව ප්‍රචණ්ඩත්වය යොදා ගැනීම හෙළා දකින ලදී. තමාගේම කෲර ක්‍රියා වලින් කම්පනයට පත් වූ අශෝක ඉහත කී සෙල්ලිපිය මගින් තම හැඟීම් රටවැසියාට ප්‍රකාශ කිරීමට පසුබට නොවීය. කාලිංග රාජ්‍යය ඈඳා ගත් පසු "දෙවියන්ට ප්‍රිය වූ අශෝක ධර්මය කෙරෙහි දැඩි කැපවීමකින් සිටී. ධර්මයට ප්‍රිය කරයි. ධර්මය ඉගෙනගනී. මෙතෙක් යටත් නොවී තිබූ රාජ්‍යයක් වූ කාලිංග දේශය දිග් විජය කිරීමේදී සිදුවූ මිනිස් සංහාරය, මිනිසුන් මිය යෑම සහ රටින් පිටුවහල් කිරීම ගැන දේවානම් ප්‍රිය පසුතැවිලි වේ. එපමණක් නොව එම සිදුවීම ඔහු තුළ මහත් සංවේගයක් මෙන්ම මානසික පීඩනයක් ඇති කරයි." යනුවෙන් එහි සඳහන් කර තිබේ.

මෙම ශිලා ලේඛනය නිසැකවම මිනිස් ඉතිහාසයේ දක්නට ලැබෙන සියුම් හැඟීම් උපදවන සිත්කම්පා කරවන සුළු ප්‍රකාශයක් ලෙස

සැලකිය හැකිය. නිර්දය පාලකයකු තමා විසින් සිදුකරන ලද ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ පසුතැවිලි වෙමින් සදාචාර සම්පන්න නිවැරදි ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වීම ඉතිහාසයේ පෙර නොවූ විරූ සිදුවීමකි. කෙසේ වෙතත් අශෝක රජුගේ පාලනය බෞද්ධ සදාචාරය මත පදනම් වූ කොන්දේසි විරහිතව අනෙයන්ගේ ජීවිතවලට ගරු කරනු ලබන උදාර ක්‍රියාමාර්ගයක් බවට ඇත්ත වශයෙන්ම පරිවර්තනය වූවේද'යි අපට ප්‍රශ්න කළ හැකිය. සිදු වූ අසාධාරණය සඳහා කිසියම් ආකාරයකින් වන්දි ගෙවීමට ක්‍රියාකළ බවත් හෝ කාලිංග දේශයට නිදහස ලබාදුන් බවත් හෝ පිටුවහල් කරන ලද පුද්ගලයින් ආපසු ගෙන්වා ගත් බවක් කිසි තැනක සඳහන් නොවේ. ආගමික කටයුතු, සදාචාරාත්මක චර්යාව, සහ දේශපාලන කටයුතු, මෙම රාජ්‍ය පාලකයා විසින් පැහැදිලි ලෙස වෙන්කර සැලකූ බව පෙනීයයි. ඔහු විසින් පනවනු ලැබූ නියෝග සදාචාරාත්මක වශයෙන් කෙතරම් උසස් ලෙස පෙනී ගියත් ඔහු තුළ තමා කෙරෙහි පැවති ආදරය ඒවායින් ප්‍රකාශ වේ. කෙසේ වෙතත්, අශෝක රජතුමා නිසැකවම බුදු දහම මත පදනම් වූ අලුත් පාලන ක්‍රමයක් තම රාජධානිය තුළ ඇති කිරීමට උත්සාහ කළේය. එම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා ඔහු මහත් උත්සාහයක් දැරුවේය. සමහරවිට එය තම සිත සනසා ගැනීම සඳහා කරන ලද උත්සාහයක් වන්නට පිළිවන. තවද සැබෑ ජයග්‍රහණය නම් ධර්මවිජය බව ඔහු තම 13 වන සෙල්ලිපිය අවසානයේ සඳහන් කර තිබේ. එතැන් පටන් අතීතයේ සිදුවූ කෲර ක්‍රියා නිසා ඔහු තුළ ඇතිවූ දැඩි පශ්චාත්තාපය නැති කර ගැනීම සඳහා මුළු ජීවිත කාලයම ධර්මය වෙනුවෙන් කැප කළේය. සමහර විට බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ප්‍රචලිත කිරීම සඳහා දැඩි උත්සාහයක් දරන ලද්දේ ඒ සඳහා ඔහුට පෞද්ගලිකවම කැපවීමට නොහැකිවන තරම්වූ බලවත් දුෂ්කරතා පැවති නිසා වන්නට පුළුවන. දීර්ඝ කාලයක් තිස්සේ විශාල අධිරාජ්‍යයක ආධිපත්‍යය දැරූ රාජ්‍ය පාලකයෙකුට පැවරී ඇති වගකීම් සම්භාරය අති විශාලය.

දැනට අපට ලැබී ඇති බෞද්ධ පොත පත ක්‍රිස්තු පූර්ව සහ ක්‍රිස්තු වර්ෂ පළමුවන ශතවර්ෂ වලට අයත් ඒවා බව පෙනී ගියද ඊට වඩා පැරණි ධර්ම ග්‍රන්ථ පැවති බව අශෝක රජතුමාගේ 13 වන සෙල්ලිපියේ දැක්වෙන අවසන් පේළි කීපයෙන් පැහැදිලි වේ. ඊට වඩා පැරණි පිටපත් තිබූ බව හෝ වඩා නිවැරදි මුඛ පරම්පරාගත සම්ප්‍රදායක් පැවති බව ධර්ම විජය පිළිබඳව කර ඇති සඳහන අනුව අපට සිතා ගත හැකිය. අශෝක රජතුමා පැහැදිලිවම ධම්මපදයේ පහත දැක්වෙන ගාථා පාඨය අනුව ක්‍රියාකර ඇතිබව පෙනීයයි: "යමෙක් යුද්ධයකදී දස ලක්ෂයක් මිනිසුන් පරදවා ජය ගන්නේද, යමෙක් තමා ජයගන්නේද (තම සිත

පාලනය කරගෙන කෙලෙසුන් නැසීම) මෙහිදී පසුව කී පුද්ගලයාගේ ජයග්‍රහණය සැබෑ ජයග්‍රහණයක් වන්නේය. වෙනත් පුද්ගලයෙකු පැරදවීමට වඩා තමා ජය ගැනීම සැබවින්ම උතුම්ය." (ධම්මපදය 8 : 4-5)

කාලිංග රාජ්‍යයේ තම නිලධාරීන් විසින් පිළිපැදිය යුතු නියෝග ඔහු විසින් නිකුත් කරන ලදී. ඉන් පළමු නියෝගය ආරම්භ වන්නේ "සියලුම මිනිසුන් මාගේ දරුවන්ය." යන සුන්දර ප්‍රකාශයෙනි. බුදුන් වහන්සේ දේශනා කළ වචනවල දෝංකාරය මෙම ප්‍රකාශය තුළ ගැබ්වී තිබේ: "මගේ දරුවන්ට මෙලොවදීත් පරලොවදීත් යහපතක්ම වේවා! යනු මගේ ප්‍රාර්ථනයයි. සියලුම මිනිසුන්ට එසේ වේවා යනු මගේ පැතුමයි." ධර්මය පිළිබඳ තමා අනුගමනය කරන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරමින් ඔහු මුළු රට පුරාම සෙල්ලිපි පිහිටුවීය. තව ඉගැන්වීම් වල ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව ඔහු ඉතා උසස් ලෙස කතා කළේය. සියලු සත්වයාගේ ආරක්ෂාව සහතික කරන බවත් මිනිසුන්ගේ ශුභසාධනය සහ ආචාරශීලීත්වය තව දුරටත් වර්ධනය කරමින් තම රටවැසියන් යහපත් වූත් 'කාරුණිකවූත්' න්‍යායශීලිවූත්, ආචාර සම්පන්න, සීකරු සහ විනීතවූත් පුද්ගලයින් ලෙස ජීවත්වීම සඳහා දිරිමත් කරනු ලැබීය.

පුරාවිද්‍යාඥයින් විසින් අශෝක රජතුමාගේ නියෝග ඇතුළත් ශිලා ලේඛන සොයා ගැනීමේ කාර්යය අද දක්වා නිරන්තරයෙන් කරගෙන යනු ලබයි. ඒවා ලියා ඇති බොහෝ භාෂා සහ සංකේත ඉන්දියාවේ වඩාත් නැගෙනහිර ප්‍රදේශවල සිට බටහිර පිහිටා ඇති ඇෆ්ගනිස්ථානය දක්වාවූ ස්ථාන විශාල ප්‍රමාණයක පිහිටුවා තිබීම ධර්ම ප්‍රචාරය පිණිස අශෝකගේ කැපවීම පැහැදිලි කරන අගනා සාක්ෂියකි.

පණ ඇති කිසිම සත්වයෙකුට හානි කිරීමෙන් වැළකීම තේමාව කොටගත් මෛත්‍රී කිරීමේ බෞද්ධ පණිවිඩය ක්‍රියාත්මක කරන බව (අහිංසා) ගුජරාට් අර්ධද්වීපයේ පිහිටුවන ලද ගිර්නාර් සෙල්ලිපියේ සඳහන් කර තිබේ. ඔහු තම මාලිගය තුළ මස් අනුභවය සම්පූර්ණයෙන්ම පාහේ නතර කළේය. එපමණක් නොව දෙවන සහ පස්වන ශිලා ලේඛන මගින් සමහර සතුන් මැරීම හෝ කරඇඹීම (Castrate) තහනම් කරමින් නියෝග නිකුත් කළේය. "බිලිපූජා සඳහා සතුන් මැරීමෙන් හෝ සතුන්ට හිංසාවන සියලුම ක්‍රියා වලින් වැළකී සිටින්න.... ඔබේ මිතුරන්ට අවංක වන්න.... අඬදබර සහ වාදභේද වලට නොපැටලෙන්න.... ඔබ විසින් කරන ලද යහපත් දේ ගැන පමණක් කල්පනා නොකරන්න.... ඔබ විසින් කර ඇති වැරදි සිහිකරමින් ඒවා නිවැරදිකර ගැනීමට ක්‍රියා කරන්න."[62]

මෙම ප්‍රකාශය අශෝක රජතුමාගේ ශිලාලේඛන වලින් උපුටා

ගන්නා ලද බවත් නොදන්නා කෙනෙකු විසින් එය ලබාගෙන ඇත්තේ වෙනත් රටක වෙනත් යුගයක විසූ බුද්ධිමත් ශාස්තෘවරයෙකු වූ ජේසුස්වහන්සේගේ ඉගැන්වීම වලින් යයි කල්පනා කිරීමට බොහෝ දුරට ඉඩ තිබේ.

මිනිසුන්ට සහ සතුන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා පහසුකම් සලසා දීමට අශෝක රජතුමා කටයුතු කළේය. දුර රටවලින් ගෙන එනු ලැබූ බෙහෙත් පැළෑටි වගා කරන ලෙස ඔහු නියම කළේය. ඔහුගේ මර්ගෝපදේශකත්වය යටතේ දාගැබ් අසූ හාර දහසක් සහ ගණන් කළ නොහැකි තරම් වූ බෞද්ධ ආරාම විශාල සංඛ්‍යාවක් ඉදිකරන ලද බව කියනු ලැබේ. බුද්ධගයාවට ආසන්නයේ ගල් පර්වතයක පිහිටි වනගතව තිබූ ආශ්‍රම කුටි නැවත ඵලිපෙහෙළි කර භික්ෂූන්ගේ පාවිච්චිය සඳහා සකස් කර දෙන ලදී. බරාබර් (Barabar) ලෙන් නමින් හැඳින්වෙන මෙම කුටි ඊ. එම්. ෆොස්ටර් (E. M. Forster) විසින් ලියන ලද 'අ පැසේජ් ටු ඉන්ඩියා' (A passage to india) නමැති සුප්‍රසිද්ධ ඉංග්‍රීසි නවකතාව පදනම් කරගෙන නිපදවනු ලැබූ චිත්‍රපටිය මගින් මහත් ප්‍රසිද්ධියට පත් විය. අශෝකගේ පාලන සමයේ දහත්වන අවුරුද්දේදී ඔහුගේ අනුග්‍රහය යටතේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙන් මගධයේ මහා ධර්ම සංගායනාවක් පවත්වනු ලැබිය. ලෝක ඉතිහාසයට අනුව සලකා බැලීමේදී ඉන් ඇති වූ වඩා වැදගත් ප්‍රතිඵලය නම් පාථුල ලෙස ආගම් ප්‍රචාරය කිරීම සඳහා බුදුන් වහන්සේ විසින් කරන ලද ඉල්ලීම ක්‍රියාවට නැගීමය.

අශෝක රජතුමා යනු පෙරදිග පිහිටි එතරම් ප්‍රසිද්ධියක් නොතිබූ කුඩා රටක් පාලනය කළ හුදකලා පාලකයෙකු නොවිය. අන්තර් ජාතික තානාපති සම්බන්ධතාව පවත්වා ගැනීම අවශ්‍යයෙන්ම සිදුවිය යුතු යුගයක ඔහු ගෝලීය වශයෙන් වැදගත් තැනක් දැරූ විශාල අධිරාජ්‍යයක් පාලනය කළේය. II පිලඩෙල්ෆස් ටොලමි නමැති ඊජිප්තුවේ ග්‍රීක් පාලකයාගේ නියෝජිතයා ලෙස ඩයනීසියස් බින්දුසාර රජතුමාගේත් අශෝක රජතුමාගේත්, රාජ සභාවේ සේවය කළේය. එවැනි ස්ථායි අන්තර්ජාතික සම්බන්ධතා පැවති කාලයක කටයුතු කළ අශෝක රජතුමා තම දේශ සීමාවෙන් පිටත ලෝකය පුරා සිටි හිතවත් පාලකයින් වෙත බෞද්ධ ධර්මදූතයින් පිටත්කර යවා ඔවුන් ලවා ධර්ම ප්‍රචාරය කිරීමට කටයුතු යොදුවේය.

තමා විසින් ධර්මදූතයින් පිටත් කර යවනු ලැබූ රජවරුන්ගේ නම්: 13 වන ශිලාලේඛනයේ මෙසේ සඳහන් වේ. අම්තියෝක - දෙවන තිඕස් ඇන්ටිඕකස් නැමති සිරියාවේ රජතුමා (ක්‍රි. පූ. 261-246) (Amtiyoka-Antiochus II Theos); තුරමයා - ඊජිප්තුවේ දෙවන ටොලමි පිලඩෙල්ෆස්

(Turamaya - Ptolemy II Philadelphus) (ක්‍රි. පූ. 285-247); අම්තෙකිනා - හෝ අම්තිකිනි - මැසිඩෝනියාවේ ඇන්ටිගෝනස් ගොනාටාස් (ක්‍රි. පූ. 276-239) (Amtekina or Amtikini - Antigonus Gonatas); සෛරීන්හි මාග හෝ මාගස් (ක්‍රි. පූ. 300-250) Maga - Magas of Cyrene; සහ අලිකසුන්දර යන රජවරුය. 'අලිකසුන්දර' යනු ක්‍රි. පූ. 272-255 කාලයේ විසූ එපිරස් හි ඇලෙක්සැන්ඩර් (Alexander of Epirus) හෝ ක්‍රි. පූ. 252-244 කාලයේ කොරින්ත් හි විසූ ඇලෙක්සැන්ඩර් (Alexander of Corinth) විය යුතුය. දෙවන ශිලා ලේඛනයේ සඳහන් කර තිබෙන්නේ ඇන්ටිඕකස් රජතුමාගේ නම පමණි. අනෙක් රජවරු සාමන්ත රජවරු හෙවත් අසල්වැසි රටවල පාලකයන් වශයෙන් හඳුන්වාදී තිබේ. මේ නිසා අශෝක රජතුමා ග්‍රීක් පාලකයින්ගේ රාජ සභාවලට බෞද්ධ ධර්මදූතයින් යැවූ බවට සැකයක් නැත.[47] 256 කට නොඅඩු වාරගණනක් ධර්ම ප්‍රචාරය සඳහා දූතයින් පිටත් කර යැවූ බව එක් සෙල් ලිපියක සඳහන් කර තිබේ. ඔවුන් විසින් ඉටුකළ යුතු කාර්යභාරය පස්වන සෙල්ලිපියේ පැහැදිලි ලෙස දක්වා තිබේ. ඔවුන් වෙනත් ආගම් අදහන පුද්ගලයින් පිළිබඳ සැලකිලිමත් වියයුතු අතර ඔවුන්ගේ කාර්යය වන්නේ බෞද්ධයින්ගේ සුභසාධනය සහ ප්‍රයෝජනය සඳහා මෙන්ම බුද්ධ ධර්මයේද ප්‍රගතියක් ඇතිවන පරිදි එය ස්ථාපිත කිරීමය. ඔවුන් යවනයින් (ග්‍රීක්වරු), කාම්බෝජ වැසියන්, ගාන්ධාර වැසියන් සහ දේශ සීමා ප්‍රදේශ වල ජීවත්වන මිනිසුන්, යුදභටයින්, බ්‍රාහ්මණයින්, පොහොසත් මෙන්ම දුප්පත් මිනිසුන් යන සියලු දෙනා පිළිබඳවම සැලකිලිමත් විය යුතුය.

අශෝකගේ ධර්ම ප්‍රචාරක කටයුතු ක්‍රියාත්මක කරන ලද්දේ ඉන්දියාව සහ බටහිර රටවල ජීවත්වූ මිනිසුන් අතර දේශපාලන සහ ආර්ථික සම්බන්ධතා හොඳින් තහවුරු වී තිබූ කාලයකදීය. දෙගම්මැදි ප්‍රදේශයේ සහ (මෙසපොටේමියාව) අරාබියානු වෙරළ තීරය ඔස්සේ විහිදී තිබූ බිම් ප්‍රදේශවල ස්ථිර ඉන්දියානු ජනාවාස පිහිටා තිබූ බවත් දියුණුවන වෙළඳ වරායන් පිළිබඳ තොරතුරු වැඩියෙන් ලැබෙන්නට පටන් ගත් බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් කොරමැන්ඩල් සිට මලබාර් වෙරළ දක්වාත්, එතැනින් ඉන්දු ගඟේ මෝය කට ප්‍රදේශය දක්වාත්, බටහිරට නැව් ගමන් කළ බවත් සඳහන් කර තිබේ. අශෝක රජතුමා ජීවත්වූයේ වෙළඳාම ව්‍යාප්ත වීම සහ රටවල් යටත් කිරීම නිසා ඉතා උසස්වූත්, තීව්‍රවූත් බුද්ධිමය සංවාදයක් ගොඩනැගී තිබුණ ඇක්සිස් ටයිම් යනුවෙන් හඳුන්වනු ලැබූ යුගයට පසුව උදාවූ යුගයේදීය. මෙසේ නිරන්තරයෙන් පැරණි සම්ප්‍රදාය මත අලුත් චින්තන ක්‍රම බිහිවන්නට පටන් ගත්තේය. එහි ප්‍රතිඵලය වූයේ මිශ්‍ර ආගම් බිහිවීමය. හෙලනිකවාදය

(Hellenism) නමින් හඳුන්වනු ලැබූ එවැනි ආගම් මැද පෙරදිග රටවලත් ඉරානයෙන් බිහිවිය.

මහා ඇලෙක්සැන්ඩර්ගේ පටන් ටොලමිගේ රාජ්‍ය සමයේ අවසානය දක්වා වූ කාල පරිච්ඡේදය (ක්‍රි. පූ. 323-30) එනම් ග්‍රීක් ශිෂ්ටාචාරය සහ ක්‍රිස්තියානි ආගම බිහිවූ කාලය අතර පැවති අවුරුදු 300 පමණ වූ කාල පරිච්ඡේදය හැඳින්වීම සඳහා ජේ. ජී. ඩ්‍රොයිසන් (J. G. Droysen) නමැති සුප්‍රසිද්ධ ඉතිහාසඥයා විසින් 'හෙලනික වාදය' (Hellenism) නමැති වචනය යොදාගනු ලැබීය. හෙලනීසියානු සංස්කෘතිය බටහිරින් කාර්තේජ් (Carthage) සහ රෝමය දක්වාත් නැගෙනහිරින් පාර්තියාව (Parthia) සහ ඉන්දියාව දක්වාත් ව්‍යාප්තව තිබුණි. ඇලෙක්සැන්ඩර්ට පසුව පැමිණි පළමු පරම්පරාවට අයත් වූ පාලකයින් අතර අරගල ඇතිවීම නිසා මැසිඩෝනියානු රාජවංශයට අයත්වූ ටොලමි, සෙලුසිඩ් සහ ඇන්ටිගොනිඩ්ස් යන පාලකයන්ට අයත් ස්වාධීන ප්‍රාදේශීය රාජ්‍ය බිහිවිය. ක්‍රි. පූ. 280 පසු ඇටලිඩ්ස් වරු (Attalids) පාලනය කළහ. ක්‍රි. පූ. 3 වන ශතවර්ෂය අවසානයේදී බැක්ට්‍රියාව සහ ඉන්දියාවේ කොටස් පාලනය කළ ග්‍රීක් රජවරු ඇටලිඩ්ස් වරුන්ට අයත්වූහ. හෙලනීසියානු බලය පැවති ප්‍රදේශවල ග්‍රීක් ජීවන රටාව පැතිර ගියේය. මහා ඇලෙක්සැන්ඩර් සහ පළවන සෙලියුකස් (Seleucus I) විසින් ඉදි කරනු ලැබූ බොහෝ නගර හේතු කොටගෙන පෝලිස් (Polis) යනුවෙන් හැඳින්වෙන නාගරික පාලනය පිළිබඳ අදහසට පුනර්ජීවයක් ලැබුණි. පෝලිස් යනු පිළිගත් දේශපාලනික අයිතිවාසිකම් සහ යුතුකම් කොටසක් බාර වූ රටවැසියන්ගෙන් සමන්විත වූ ස්වකීය පාලනයක් පවත්වාගෙන යන්නාවූ නගර රාජ්‍යයකි. ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දියානු ආක්‍රමණයෙන් පසුව ග්‍රීක් දර්ශනය කැපී පෙනෙන ආගමක් බවට පරිවර්තනය විය. ඒ දේවධර්මයේදී ක්‍රම පද්ධතියක් බිහිවීම එහි ප්‍රකට ලක්ෂණයක් විය. ඒ කාලය වනවිට පෙරදිග සමග පැවති සම්බන්ධතා ඉහළ මට්ටමක පැවති අතර පෙරදිග දර්ශනය ඉගනීමට බටහිර බුද්ධිමතුන් දැඩි කැමැත්තක් දැක්වූහ. මෙම යුගය හෙලනීසියානු අධ්‍යාපනයේ බලපෑම යටතේ පෙරදිග සහ බටහිර සම්ප්‍රදායන් ඒකාබද්ධ වූ කාල පරිච්ඡේදයක් ලෙස ඩ්‍රොයිසන් හඳුන්වයි.[34] මෙ කාල පරිච්ඡේදය තුළදී ශිෂ්ටයැයි සම්මත රටවල ග්‍රීක් අදහස් ශීඝ්‍රයෙන් පැතිර ගියේය. එනිසා එම යුගය හෙලනික යුගය වශයෙන් හැඳින්වේ. ආගම් අතර ඒකාබද්ධතාවයක් ඇතිවීම, එනම් විවිධ ආගම් සහ එම ආගම්වල ඇතුළත් විවිධ අංග අතර සම්මිශ්‍රණයක් ඇතිවීම කෙරෙහි බලවත් ප්‍රවණතාවයක් පැවතීම, මෙම යුගයේ දක්නට ලැබුණු කැපී පෙනෙන ලක්ෂණයක් විය. නමුත් එය මතුපිටින් දක්නට ලැබුණු ඒකාබද්ධතාවයක් මිස ඒ තුළින් පැන නැගුනක් නොවීය. කෙසේ වෙතත්

පෙරදිග දර්ශනවාද දෙස විවෘතව සලකා බැලීම මෙම හෙලනීසියානු සංකලන වාදයේ විශේෂ ලක්ෂණයක් විය. මෙසේ යුරෝපියානු රටවල පෙරදිග අදහස් ව්‍යාප්තවීම නිසා යුදෙව් ජාතිකයින් විවිධ රටවලට පැතිර යාමටත් (Jewish Diaspora), විමුක්තිදායී ආගම් බිහිවීමටත් (Redemptive Religions) තුඩුදුන් වාතාවරණයක් බිහිවිය. බෞද්ධ ධර්මය ප්‍රචාරය කිරීම සඳහා මීට වඩා යෝග්‍ය අවස්ථාවක් නොවීය. ලෝකය පිළිබඳ නව සංකල්ප නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම සඳහා පෙරදිග අදහස් වලින් පෝෂණය ලැබීමට හෙලනීසියානු සංස්කෘතිය වෙනුවෙන් පෙනීසිටි පුද්ගලයින් අවස්ථාවක් එළඹෙනතුරු බලා සිටියහ.

මෞර්ය ආධිපත්‍යය පැවති කාලයේදී ගන්ධාරයේ තක්ෂිලා නුවර අන්තර්ජාතික වශයෙන් මහත් ප්‍රසිද්ධියක් ඉසිලූ නගරයක් විය. ඒ කාලයේදීම නයිල් ඩෙල්ටාවේ පිහිටි ඇලෙක්සැන්ඩ්‍රියා නගරය හෙලනීසියානු සංස්කෘතියේ බුද්ධිමය කේන්ද්‍රය වශයෙන් ඉතා උසස් තත්වයක පැවතියේය. ක්‍රි. පූ. 331 වර්ෂයේදී ඇලෙක්සැන්ඩර් විසින් ඇලෙක්සැන්ඩ්‍රියා නගරය පිහිටුවීමෙන් පසුව එය ඊජිප්තුවේ ග්‍රීක් අගනුවර බවට පත්විය. ග්‍රීක් ජනපදිකයින් මෙම නාගරික මධ්‍යස්ථානයට විශාල වශයෙන් පැමිණෙන්නට පටන් ගත්හ. ඒ නිසා එය ඊජිප්තු, යුදෙව්, අරාබි, ඉරාන සහ ඉන්දියානු ජාතිකයින්ගෙන් සැදුම් ලත් විවිධ ජනකොටස් ජීවත්වූ නගරයක් බවට පත්විය. ඇලෙක්සැන්ඩ්‍රියාව ටොලමිවරුන්ගේ අගනුවර බවට පත්විය. අධ්‍යයන කටයුතු කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කිරීමට හැකිවූ විවිධ ක්ෂෙත්‍රවලට අයත් විද්වතුන්ට නිර්ලෝභීව අනුග්‍රහය දැක්වීම නිසා මෙම නගරය ඓතිහාසික සහ සංස්කෘතික වශයෙන් ඉතා වැදගත් නගරයක් බවට පත්විය. ඔවුන්ගේ ප්‍රයෝජනය පිණිස දර්ශනවාදය පිළිබඳ පැරණි ගුරුකුලය විසින් පිළියෙල කරන ලද ආකෘතියකට අනුව මියුසියොන් (Museion) නමැති පුස්තකාලය ඉදි කරන ලදී. විද්‍යා ප්‍රගතිය සඳහා පැවති රාජ අනුග්‍රහය පෙන්නුම් කරමින් බුද්ධිමතුන් සඳහා වූ මෙම මධ්‍යස්ථානය රජවාසල හා සම්බන්ධකම් පවත්වන ලදී. බොහෝ කලාකරුවන් සහ විද්වතුන් මියුසියොන්හි නතර වී ශාස්ත්‍රීය වැඩ කටයුතු වල යෙදුනහ. ඔවුන්ට එහි නතර වී සිට දර්ශනය, ශබ්ද විද්‍යාව, සාහිත්‍යය සහ දේවධර්මය පිළිබඳව නිදහසේ අධ්‍යයන කටයුතු කිරීමට හැකිවිය. එහි මුල් ආරම්භයේ පටන්ම පොත්පත් විවේචනය කිරීම, සංස්කරණය, අර්ථ විවරණ දැක්වීම පිළිබඳ වැදගත් ශබ්ද විද්‍යාත්මක අධ්‍යයනයන් කරනු ලැබීය. මියුසියොන් පුස්තකාලය ඉතා කෙටි කාලයකදී පැපිරස් පත්‍රවල ලියන ලද පොත් පත් ලක්ෂයකට වැඩි සංඛ්‍යාවකින් සමන්විත විය. මිනිස් ඉතිහාසයේ

මෙතෙක් සිදුවූ දරුණුතම සංස්කෘතික ව්‍යසනයක් ක්‍රි. පූ. 47 වර්ෂයේදී සිදුවිය. එනම් සීසර් සමග යුද්ධය පැවති කාලයේදී මියුසියෙයොන් පුස්තකාලයේ හි ඇතිවූ ගින්නක් නිසා මෙම පොත් පත් වල අද්විතීය අත් පිටපත් විශාල ප්‍රමාණයක් ගිනිබත් විය. ටොලමි ෆිලඩෙල්ෆස් (Ptolemy II Philadelphus) යටතේ ඇලෙක්සැන්ඩ්‍රියාව නැවත වරක් (Serapeon) නමැති ස්ථානයෙහි සමෘද්ධියට පත්විය. ඔහු සෙරපියොන් පුස්තකාලයක් ඉදි කළේය. අශෝක රජතුමා හි දෙවන ව්‍යාවට කුඩා පුස්තකාලයක් ඉදි කළේය. අශෝක රජතුමා විසින් ආගම් ප්‍රචාරය සඳහා බෞද්ධ භික්ෂූන්ගෙන් සමන්විත දූත පිරිස් යවන ලද්දේ විවෘත මනසකින් යුක්ත වූ මෙම දූරදර්ශී පාලකයා වෙතටය. අනෙත් ධර්ම ප්‍රචාරක දූත පිරිස් සිරියාවේ ඇන්ටිඔකස් රජතුමා වෙත ගොඩබිම් මාර්ග ඔස්සේ පිටත් කර යවන ලදී.

අශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරයකයින් බටහිර දෙසට ගමන් කළ කාලයේදී ග්‍රීක් භූගෝල විද්‍යාඥයකු වූ ඉරැටොස්තිනීස් (Eratosthenes) ඉන්දියාවේ මායිම්, ලංකාවේ සහ ගංගා නම් ගඟේ ඩෙල්ටාවේ පිහිටීම සිතියම් වල දැක්විය. ක්‍රි. පූ. 270 දී II වන සහ මෝසම් සුළං හමන දිශාව සිතියම් වල දැක්විය. ක්‍රි. පූ. 270 දී II වන ටොලමි ඇලෙක්සැන්ඩ්‍රියා නගරයේ වීදිවල විචිත්‍ර පෙරහැරක් පවත්වා ඉන්දියානු ගැහැනුන්, ගිරවුන් සහ මොනරු ප්‍රදර්ශනය කළේය. ඔහුගේ මුනුබුරා වූ iv ටොලමි (ක්‍රි. පූ. 221-203) ඉන්දියානු ආභරණ වලින් සරසන ලද සුඛෝපභෝගී නැවකින් ගමන් කළේය. අලුත් දේ කිරීම සඳහා ඔහු තුළ පැවති දැඩි උනන්දුව සහ සංස්කෘතික සාධනයන්ගේ කූට ප්‍රාප්තිය ලෙස සලකා බුද්ධිමය ජීවිතය ලොව පුරා පතල කිරීමට තිබූ කැමැත්ත අන්තර්ජාතික වෙළඳාමේ සහ සංචාරක ව්‍යාපාරයේ ශීඝ්‍ර වර්ධනයක් ඇතිවීම කෙරෙහි බලපෑවේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රීක් විද්‍යාව කෙතරම් කෙටි කලකින් ඉන්දියාවේ ප්‍රසිද්ධියට පත්වූයේද යත් ඉන්දියානු විද්වතුන් විසින් තාරකා ශාස්ත්‍රය පිළිබඳ ගමන් මාර්ග විස්තර කිරීම සඳහා ඇලෙක්සැන්ඩ්‍රියාවේ ඒ සඳහා භාවිතා කරණු ලබන පාරිභාෂික වචන යොදාගත්හ.

ඉන්දියාව සමග කරන වෙළඳ කටයුතු කෙරෙහි ටොලමි වරු විශේෂ උනන්දුවක් දැක්වූහ. පෙරදිග කෙරෙහි ඔවුන් කෙතරම් උනන්දුවක් දැක්වූයේද යත් නයිල් ගඟේ සිට රතු මුහුද දක්වා ඇලක් තැනීම සඳහා පිඹුරු පත් පවා සකස් කරන ලදී. කෙසේ වෙතත් එම ව්‍යාප්තිය කිසි දිනෙක ක්‍රියාත්මක වූයේ නැත. නමුත් දෙවන ටොලමි ෆිලඩෙල්ෆස් දකුණු ඊජිප්තුවේ රතු මුහුදේ බෙරනිස් (Berenike) නමින් වැදගත් වරාය නගරයක් ඉදි කළේය. ක්‍රි. පූ. පළමුවන ශත වර්ෂයේදී එහි පදිංචි වූ ග්‍රීක් ජාතික වෙළෙන්දකු විසින් ලියන ලද 'Periplus Maris Erythraei' නම් වාර්තා වේ එකල පැවති වෙළඳ මාර්ග, පරිවහනය කරනු ලැබූ භාණ්ඩ,

මුහුදු ගමන් සඳහා ගතවූ කාලය, ඒ සඳහා යොදාගත් නැව් සංඛ්‍යාව සහ වෙනත් බොහෝ කරුණු පිළිබඳව නිවැරදි තොරතුරු දක්වා තිබේ. හෙලනිසියානු යුගයට අයත් මෙම වාර්තාව සහ වෙනත් බොහෝ භූගෝල විද්‍යාත්මක වාර්තා මගින් බටහිර සමග, විශේෂයෙන්ම ඇලෙක්සැන්ඩ්‍රියාව සමග පැවති ඉන්දීය සම්බන්ධතා පිළිබඳවත්, මෙහිදී අපේ විශේෂ සැලකිල්ල යොමුවන පුදෙව් ක්ෂේත්‍රය පිළිබඳවත් බොහෝ තොරතුරු ලබාගත හැකිය.

ඉන්දියානු නැව් මූලික වශයෙන් මලබාර් වෙරළේ සිසෙරස් (Zizerus), මැංගලෝර් (Mangalore) සහ නෙල්කුණ්ඩා (Nelkunda) යන ස්ථාන වලින් සහ සමහර විට ඉන්දියාවේ බටහිර වෙරළේ දකුණු දිග ප්‍රදේශයේ පිහිටි බලිතා (Balita) (වර්තමාන කැලිකට්) වරායෙන් පැමිණියේය. එම නැව් අරාබියේ පිහිටි මවුසා (Mouza) වරාය දක්වාත්, එතැනින් රතු මුහුද හරහා බෙරනයිස් (Berenike) දක්වාත් ගමන් කළේය. එතැන් සිට ඉන්දියාවෙන් රැගෙන එනු ලැබූ බඩු ඔටුවන් ලවා තේබන් (Theban) කාන්තාරය හරහා කොප්ටෝස් (Koptos) දක්වා රැගෙනවිත් නැවත නැව් මගින් නයිල් ගඟ ඔස්සේ ජූලියොපොලිස් (Juliopolis) සහ අවසානයේදී ඇලෙක්සැන්ඩ්‍රියාව දක්වා රැගෙන එන ලදී. ඇලෙක්සැන්ඩ්‍රියානු වෙළෙන්දෝ එම මාර්ගය ප්‍රයෝජනයට ගත්හ. සමහර අවස්ථාවලදී ඔවුන් දකුණු ඊජිප්තුවේ පිහිටි මයොසෝර්මෝස් නැමති වරායෙන් (Myoshormos) පිටත් වී අරාබියේ පිහිටි වරායක්වූ ලියුක් කෝම් (Leuke Kome) දක්වාත්, ඉන්දියාවේ පිහිටි මුසිරිස් වරාය (Muziris) දක්වාත් ගමන් කළහ. ඔහු විසින් සඳහන් කර ඇති මුසිරිස් යනු අද ඉන්දියාවේ බටහිර වෙරළේ පිහිටි කැන්ගනෝර් නොවේ. මුසිරිස් වරාය පිහිටා තිබුණේ කාවේරි ගඟේ ගංමෝය ආසන්නව ඉන්දියාවේ නැගෙනහිර වෙරළේය.

හෙලනික යුගයේදී පැවති වෙළඳාම පිළිබඳ පැහැදිලි විස්තරයක් ස්ට්‍රැබෝ නැමති සුප්‍රසිද්ධ භූගෝල විද්‍යාඥයා විසින් ඉදිරිපත් කර තිබේ. ක්‍රි. පූ. 24 දී පමණ ඊජිප්තුවේ වැදගත් ස්ථානයක් ඉසුයු මුහුදු වෙළඳ මාර්ග ඔස්සේ රතු මුහුද දක්වා ගමන් කළ ඒලියස් ගැලුස් (Aelius Gallus) නමැති පුද්ගලයා විසින් මයොසෝර්මෝස් නමැති වරායෙන් පමණක් නැව් දෙසීයකට වඩා වැඩි සංඛ්‍යාවක් ඉන්දියාව බලා ගමන් කළ බව සඳහන් කර තිබේ. මෙම වෙළඳ මාර්ගය ව්‍යාපාරික වශයෙන් ඵලදායී සහ ලාභදායිවූ වෙළඳ මාර්ගයක් ලෙස බොහෝ කාලයක් තිස්සේ යොදා ගන්නට ඇත.

ඉන්දියාවේ පිහිටි විවිධ නැව් තොටවල් වෙත ළඟාවිය හැකිවූ

සුම කුනක් තිබුණි. එනම්

(1) අරාබිය හරහා කර්මානියා (Karmania) සහ ගෙඩ්රෝසියා (Gedrosia) හරහා ඔස්සේ නාම්මඩියෝස් හෙවත් නර්මදා (Nammadios Narmada) නගේ පිහිටි ඉන්දු සයිතියානු (Indo-Scythian) වෙරළට සහ බරුගාසා (Barugaza) හෙවත් බ්රෝච් (Broach) දක්වාත්

(11) වොලුයි තුඩුව හෝ කේන් (Kane) නමැති වරාය නගරයේ (බටහිර සුආග්රොස් (Suagros) සිට දකුණු අරාබි මුහුද දක්වාත්, සහ

(111) මෝසම් සුළං උපයෝගී කර ගනිමින් සාගරය හරහා මුසිරිස් (Muziriz) සහ නෙල්කුන්ඩා (Nelkunda) දක්වාත්ය.

ඉන්දු ගඟ මුහුදට වැටෙන ස්ථානය ජනප්‍රිය ගමනාන්තයක් වශයෙන් දිගටම පැවතුණි. එහි බාබරිකෝන් (Barbarikon) නමැති වරාය පිහිටා තිබුණි. ඒ හරහා වැදගත් වෙළඳ නගරයක් වූ මින්නගර (Minnagara) සමග මුහුදින් සම්බන්ධතා පවත්වන ලදී. විවිධ ඉන්දියානු වෙළඳ භාණ්ඩ විශාල ප්‍රමාණයක් පිළිබඳව 'පෙරිප්ලස්' (Periplus) සඳහන් කර තිබේ. එම භාණ්ඩ වලට අන්තඃපුර සඳහා ගැහැනු ළමයින්, වහලුන් අශ්වයින්, ඉන්දියානු බටර්, පැළ වර්ග විශාල සංඛ්‍යාවක්, ඖෂධ පැළෑටි, දුම් ගස්වන ලද භාණ්ඩ, ලෝහමය භාණ්ඩ, ආභරණ සහ ඇඳුම් පැලඳුම් වැනි වෙළඳ භාණ්ඩ විශාල ප්‍රමාණයක් අයත් විය. ලෝම, කපු පුලුන්, සේද නූල් වැනි චීනයෙන් ගෙන්වනු ලැබූ භාණ්ඩ තිනායි නගරයේ (Thinai) සිට බැක්ට්‍රියාව (Bactria) සහ ඩිමුරයික් (Dimurike) සහ කාර්පසස් (Karpasus) වෙළඳ පළවල් හරහා බාබරිකෝන් (Barbarikon) සහ බරුගාසා (Barugasa) වරායවලට පරිවහනය කරනු ලැබීය. තීන්ත වර්ග, බෙංගාලයේ නිපදවූ උසස් වර්ගයේ කවනි රෙදි, හාල් සහ මහත් ප්‍රසිද්ධියට පත්ව තිබූ කොස්ටුස් (Kostus) නැමති සුවඳවත් මුල් වර්ග බාබරිකෝන් වරායෙන් නැව්ගත කරන ලදී. දැව දඬු, උක් පැණි සහ තල බරුගාසා (Barrugaza) වරායේ සිට අරාබියට රැගෙන ගියේය. ඊට දකුණු දෙසින් පිහිටි මුසිරිස් (Muziris) සහ නෙල්කුන්ඩා (Nelkunda) වල වෙළඳුන් ඇන්දළ, හුණුගල් (Coral) , මුතු (Crimson) සහ කැස්බෑවන් සපයන ලදී.

ක්‍රි. පූ. තුන්වන ශතවර්ෂය දක්වා යේමනය ඉන්දිය භාණ්ඩ සම්බන්ධ වෙළඳ මධ්‍යස්ථානය ලෙස පැවති බව පෙනේ. මෙම වෙළඳාම දීර්ඝ කාලයක් සෙමිටික් සේබියන්වරු (Semistic Sabacans) සතුවූ බව පෙනේ. සේබියන්වරු (Sabacans) ඉසුරුමත් ජන කොටසක් වූයේ මෙම වෙළඳාම නිසා විය හැකිය. ටොලමිවරුන්ගේ පාලන කාලයේදී

(Ptolemaicepoch) ඔවුන් සතුව පැවති අති විශාල නැව් පද්ධතිය සේබිවරුන්ට භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධ ආධිපත්‍යයක් දැරීමට උදව් විය. දෙවන ශතවර්ෂය වනවිට සොකොට්‍රා (Socotra) දූපත ඉන්දියාව දක්වා වැටී තිබූ නැව් මාර්ගයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය ලෙස පැවතුණි. පලස්තීන වෙළඳුන් වටිනා කුළුබඩු විශාල ප්‍රමාණයක් ලබා ගත්තේ සොකොට්‍රා වලිනි. ඉන් සමහරක් කොරමැන්ඩල් (Coromandal) සහ මලබාර් (Malabar) වෙරළින්ද පැමිණියේය.[68]

බරුගාසා වඩාත් කාර්ය බහුල වරායක් විය. එහි සිට ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක්වූ බයිතානා (Baithana) සහ ටගරා (Tagara) දක්වා මහා මාර්ග වලින් සම්බන්ධව තිබුණි. නර්මදා වලට දකුණින් පිහිටි සූර්පාරක (Shurparaka) ඈත අතීතයේ පටන් මුහුදින් කරන වෙළඳාම සම්බන්ධයෙන් බොහෝ වෙළඳුන් අතර ජනප්‍රියවූ වරායක් ලෙස පැවතුණි.

අරාබි ජාතිකයන් තැප්‍රොබේනයෙන් (ශ්‍රී ලංකාව) කුරුඳුත්, ඉන්දියාවෙන් කැසියාත් (Kasia හෝ Kassia) ආනයනය කළහ.[69] තැප්‍රොබේනය බොහෝ කාලයක් තිස්සේ වෙනත් ලෝකයක් ලෙස සලකනු ලැබීය. එහි ගල්ගුහාවල ජීවත්වූ ට්‍රොග්ලොඩයිට් (Troglodytes) යනුවෙන් හඳුන්වනු ලැබූ මුල් පදිංචිකරුවන් මුහුදු මාර්ග ඔස්සේ කුරුඳු පරිවහනය කර ඉතියෝපියාවෙන් භාර්යාවන් ගෙන්වාගත් බව ප්ලිනි සඳහන් කර තිබේ. ආපසු පැමිණීමේදී ඔවුන් වීදුරු සහ ආභරණ ද ගෙන ආ බව දකුණු ඉන්දියාවේ කරනු ලැබූ පුරාවිද්‍යාත්මක කැනීම් වලින් පැහැදිලි වේ. මේ කාලයේදී සිංහලයින්ද උද්යෝගීමත් ලෙස මුහුදු වෙළඳාමේ යෙදිසිටි බව පෙනේ. ඔවුන් ඇම්ෆෝර් (Amphorac) 75 ක් හෝ හොත් ටොන් 75 පමණ බරගෙන යා හැකි 'කට්ටමරන්' (Catamarans) යනුවෙන් හැඳින්වෙන කුඩා බෝට්ටු මුහුදු ගමන් සඳහා යොදාගත් බවත්, ඒවා පැදවීමේදී තාරකා දිශාව අනුව ගමන් නොකළ බවත් ප්ලිනි සඳහන් කර තිබේ. ඒ වෙනුවට ගොඩබිම් ප්‍රදේශ හඳුනාගැනීම සඳහා ඔවුහු බෞද්ධ පොත පතෙහි සඳහන් කර ඇති පරිදි පෙරටුව යන කුරුල්ලන් යොදාගත්හ. කොරමැන්ඩල් වෙරළේ ජීවත්වූ දෙමළ මිනිසුන්ද පළපුරුදු නැවියෝ වූහ. ආයුධ සන්නද්ධ නැව් ඔවුන් සතු වූහ. ඒවා ඔවුන් ශ්‍රී ලංකාවට, ඉන්දු-චීනයට සහ ඉන්දුනීසියාව යන රටවලට යැවූහ. මෙසේ දකුණු ඉන්දියානුවන් සහ සිංහලයන් ඈත අතීතයේදී වෙළඳාම පිණිස අරාබියට ගමන් කළ බව සිහිමට පුළුවන.

හෙලනීසියානු යුගය නිසා ඉන්දියාවේ කැළඹිලි සහිත දේශපාලන තත්වයක් ඇතිවිය. සෙලුසිඩ් (Seleucids) ගේ පාලනයෙන් නිදහස ලබාගත්

ග්‍රීක් බැක්ට්‍රියානු රාජ්‍යය ඉයුතිඩිමොස් (Euthydemos) විසින් යටත් කරගත්තේය. ඔහුගේ පුතා වූ ඩිමිට්‍රියස් (Demetrius)(ක්‍රි. පූ. 200) උතුරු ඉන්දියාවේ ප්‍රදේශ කීපයක් යටත් කර ගැනීමට සමත්විය. අන්තිමේදී ග්‍රීක් බැක්ට්‍රියන්වරු ඉන්දියාවට පහර දී පන්ජාබය අල්ලාගෙන අනතුරුව මගධය දක්වා බලය පතුරුවන ලදී. පසුව ඉරානයෙන් සිදියන් සහ පාර්තියන් (Scythians සහ Parthians) වරුන් විසින් ඔවුන් පලවා හරින තුරු එම ප්‍රදේශවල ආධිපත්‍ය දැරූහ. පළමුවන මිත්‍රිඩේට්ස් රජතුමා (Mithridates I) ගේ පාලන සමය (ක්‍රි. පූ. 150 පමණ) සහ ග්‍රීක් බැක්ට්‍රියන් රාජධානියේ අවසාන පරාජය සිදුවූ කාලයේ පටන් ඉරානය සහ මැත පෙරදිග (Near East) රටවල විශාල කොටසක් ඇතුළු ප්‍රදේශය පාර්තියන් (Parthian) පාලකයින්ගේ බලපෑමට යටත්විය. බොහෝ පාර්තියන් පාලකයින් සිරියාව, පලස්තීනය සහ ඉන්දියාව ඇතුළත් වූ ප්‍රදේශය පාලනය කළහ. ක්‍රි. පූ. 150 පමණ ඇපොලොඩෝටස් (Apollodotos) නැමැත්තෙක් ග්‍රීක් ඉන්දියානු රාජධානිය යනුවෙන් හැඳින්වෙන රාජධානියක් පිහිටුවිය. බෞද්ධ ඉතිහාසයේ ගෞරවනීය ස්ථානයක් ලබාගත් ක්‍රි. පූ 100 දී පමණ සාගල නුවර (ලාහෝර්) සිට පාලනය කළ මෙනැන්ඩ්‍රෝස් (Menandros) නොහොත් මිළිඳු රජතුමා ඇපොලොඩෝටස්ගේ අනුප්‍රාප්තිකයින් අතර වඩාත් කැපී පෙනෙන පුද්ගලයකු විය. මෙනැන්ඩ්‍රෝස් රජතුමා සහ නාගසේන නමින් හැඳින්වෙන භික්ෂුවක සමග පැවති සංවාද මාලාවක්, මිළින්ද ප්‍රශ්නය නමැති පොතේ වාර්තාකර තිබේ. මිළින්ද ප්‍රශ්නය ලෝක සාහිත්‍යයට අයත් වැදගත් කෘතියක් ලෙස බොහෝ විද්වතුන් විශ්වාස කරයි. මෙනැන්ඩ්‍රොස් විතන්ඩවාදී තාර්කික සම්ප්‍රදායේ නීත්‍යානුකූල උරුමක්කාරයා ලෙසත් ග්‍රීක් පාණ්ඩිත්‍යයේ නියම ප්‍රතිඵලයක් ලෙසත් එහි නිරූපණය කර තිබේ. තමාට විවේක තිබූ අවස්ථාවලදී ඥානාන්විත ප්‍රශ්න ඇසීමෙන් සුප්‍රසිද්ධ ශාස්තෘවරුන් සහ චින්තකයින් අපහසුතාවයකට පත්කර සරදම් කිරීම සඳහා ආගමික සංවාදයන් පැවැත්වීමට ඔහු ප්‍රිය කළේය. අවසානයේදී ධර්මය පැහැදිලි කර දීමේදී නාගසේන හිමියන් තුළ පැවති විශිෂ්ට කෞශල්‍යය කෙරෙහි මහත්සේ පැහැදී උන්වහන්සේගේ ඉගැන්වීම් වල සත්‍යතාවය සහ ශ්‍රේෂ්ඨත්වය වටහාගත් මිළිඳු රජතුමා බෞද්ධාගම වැළඳගත්තේය. මෙම ග්‍රන්ථය බුද්ධ ධර්මය පිළිබඳ විශිෂ්ට කෘතියකි.

මිළින්ද ප්‍රශ්නය ඉන්දියානු ගද්‍ය සාහිත්‍යයේ අග්‍රගණ්‍ය කෘතියක් පමණක් නොව මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙතෙක් ලියා ඇති හොඳම කෘතිය බවද, බුද්ධාගම පිළිබඳ පර්යේෂණ පැවැත්වූ ප්‍රසිද්ධ පඬිවරයකු වූ රීස් ඩේවිඩ්ස් ප්‍රකාශ කර තිබේ. මිළිඳු රජතුමාගේ කාලයට

අයත් කාසිවල බොහෝ විට සාංචි සහ බුද්ධගයාවේ ඇති බෞද්ධ ස්මාරකවල සඳහන් ධර්ම චක්‍ර සංකේතය දක්නට ලැබේ. සමහර කාසිවල නීතිගරුක යන අර්ථය දෙන 'ධාර්මික' නමැති ඉන්දියානු වචනයේ පදානුගත පරිවර්තනයක් දක්වා තිබේ. භක්තිමත් බෞද්ධයකුවූ මිළිඳු රජතුමාගේ කීර්තිය ග්‍රීසිය දක්වා පැතිර ගියේය.

මිළිඳු රජතුමාගේ අනුග්‍රහය යටතේ බුද්ධාගම ගන්ධාරයේ සිට තවදුරටත් බටහිරට හා උතුරට ව්‍යාප්ත විය. එහිදී බැක්ට්‍රියාවේ බහුල වශයෙන් පදිංචි වූ මධ්‍යම ආසියාවෙන් පැමිණි සංචාරක එඬේර ජනතාව බුදු දහම වැළඳගත්හ. ක්‍රි. පූ 86-60 දී ඇලෙක්සැන්ඩර් පොලිහිස්ටර් එහි විසූ බැක්ට්‍රියානු පූජකයන් පිළිබඳව සඳහන් කර තිබේ. බෞද්ධ භික්ෂූන් වූ මෙම පූජකයන් ඔහු විසින් හඳුන්වා තිබෙන්නේ ශමණෙයි (Samanaioi) නමිනි. මේ කාලයේදී බලසම්පන්න පාර්තියන් (Parthian) අධිරාජ්‍යය බටහිරින් සිරියාව දක්වාත්, නැගෙනහිරින් ඉන්දියාව දක්වාත් පැතිර තිබුණි. මෙම සහස්‍රකය ආරම්භයේදී ගන්ධාරයේ සිට මධ්‍යධරණී වෙරළ දක්වා වූ ගොඩබිම් මාර්ගය බැක්ට්‍රියානු අධිරාජ්‍යයේ ප්‍රදේශ හරහා විහිද තිබුණි.

මේ කාලය වනවිට වෙළඳාම යනු අහම්බෙන් සිදුවූ (ක්‍රි. පූ 27 - ක්‍රි. ව. 14) දෙයක් නොවිය. එය විධිමත් ආයතන මගින් පාලනය කරනු ලැබිය. ඔගස්ටස් යටතේ 'ද පැක්ස් රොමානා' (The Pax Romana) නමින් හැඳින්වූ ගිවිසුම මගින් අරාබි මුහුදු කොල්ලකරුවන් පාලනය කිරීමට මග පෑදුවේය. එමගින් ඉන්දියාව සහ බටහිර රටවල් අතර භාණ්ඩ හුවමාරුව සඳහා විශාල රුකුලක් ලැබුණි. මෙම ශතවර්ෂය ආරම්භයේදී රෝමන් වරුන්ට අයත් වූ බඩු ගබඩා හෝ වෙළඳ මුරපොළවල් දකුණු ඉන්දියාවේ වෙරළබඩ නගරවල පිහිටා තිබුණි. එම මුර පොළවල රෝමන් වරුන් ස්ථිරව පදිංචිව සිටියහ.[70] කොරමැන්ඩල් මුහුදු ප්‍රදේශයේ පිහිටි කාවේරිපට්නම් ප්‍රදේශයේ දෙමළ කාව්‍යයක සුප්‍රසිද්ධ මධ්‍යධරණී ප්‍රදේශවාසී වෙළඳුන් සහ දකුණු ඉන්දියාව අතර පැවති සම්බන්ධතාවයක් පිළිබඳ කතාවක් ඇතුළත්වේ. ඉන්දියාවේ අච්චු ගසන ලද අධි වටිනාකමකින් යුත් රෝමන් කාසි මේ ප්‍රදේශයෙන් සොයාගෙන තිබේ. වර්තමාන ඉන්දියාවේ ගිනිකොන දිග වෙරළේ පොන්ඩිචේරි නම් වූ ස්ථානයට ආසන්නව පිහිටා තිබූ අරිකමේඩු (Arikamedu) ඉන්දියාව සහ රෝමය අතර වෙළඳ සම්බන්ධතා පවත්වන ලද මධ්‍යස්ථානයක් විය (රූප රාමුව 15). අරිකමේඩු යන වචනය 'අරුගන්ගේ කන්ද' යන අර්ථය ඇති අරුගමේඩු නමැති වචනයෙන් බිඳී ඇතැයි පර්යේෂකයින් අනුමාන කරයි. බෞද්ධ භික්ෂූන් හැඳින්වීම සඳහා යොදාගනු ලබන අරහත් නමැති වචනයේ දෙමළ පරිවර්තනය

අරුගන් (Arugan) නම් වේ.[71] ඒ අනුව රෝමන් යුගයේදී මෙහි බෞද්ධ සමාජයක් පැවති බව විශ්වාස කිරීමට පුළුවන. අරිකමේඩු (Arikamedu) සහ වීරපට්නම් (Virapatnam) යන ස්ථානවල කරන ලද කැනීම් මගින් මධ්‍යධරණී ප්‍රදේශ වලට අයත් බොහෝ පුරා වස්තු මතු කරගෙන තිබේ. මෙවායින් බොහොමයක මුල් ආරම්භය එම භාණ්ඩ වල සටහන් කර ඇති නිෂ්පාදකයාගේ සලකුණු මගින් පැහැදිලිව තේරුම් ගත හැකිය. උදාහරණයක් වශයෙන් ටස්කනි (Tuscany) වල පිහිටි ඇරෙසෝ (Arezzo) වලින් පැමිණි ඇම්ෆෝරේ (Amphorae) නැමැති භාජන සහ මැටි බඳුන් දැක්විය හැක. ඇම්ෆෝරේ (Amphorae) යනු පටු කරක් සහ අඬුවක් සහිත ග්‍රීක් රෝමන් භාජනයකි. රෝමන් වෙළඳුන් උද්යෝගීමත්ව වෙළඳාමෙහි යෙදී සිටියේ අරිකමේඩු වල පමණක් නොවේ. විශේෂයෙන්ම ඔගස්ටස්ගේ සිට නීරෝ ගේ පාලන කාලය ඇතුළත් ග්‍රීක් අධිරාජ්‍යයේ මුල් කාල පරිච්ඡේදයට අයත් රෝම කාසි විශාල ප්‍රමාණයක් දකුණු ඉන්දියාවෙන් සොයාගෙන තිබේ. පුරාවිද්‍යාඥයින් විසින් මෑතකදී අක්කෙනපාලි (Akkenapali) නැමති ස්ථානයෙන් රිදී සහ රත්තරන් වලින් සාදන ලද රෝමන් කාසි දහයකට වඩා වැඩි සංඛ්‍යාවක් සොයා ගෙන තිබේ.[72]

ඔගස්ටස්ගේ කාලයේදී ඉන්දියානු දූත පිරිසක් රෝමයට ගියබව සඳහන්වේ. මෙම දූත පිරිසට සර්මොනොචේගස් (Zarmanochegas) නමැති බෞද්ධයෙක්ද ඇතුළත් විය. මෙම හෙලනික නාම විවිධ ආකාරයෙන් අර්ථ නිරූපණය කර තිබේ. එය භික්ෂූන්ගේ ප්‍රධානියා යන අර්ථය දෙන ඉන්දියානු ශ්‍රමනාචාර්ය නමැති වචනයෙන් බිඳී ආ එකක් යයි සමහරු කල්පනා කරති. වෙනත් පරිවර්තනයට අනුව එම වචනයේ අවසාන කොටසේ ඇතුළත් චේගස් (Chegas) යනුවෙන් අදහස් වන්නේ 'ශාක්‍ය' යන අර්ථයයි. ඒ අනුව මෙම වචනයෙන් අදහස් වන්නේ ශාක්‍යයින්ගේ භික්ෂුව හෙවත් ශාක්‍ය මුනිගේ ශ්‍රාවකයින් යන්නයි. මෙසේ සර්මොනොචේගස් යනුවෙන් සඳහන් කර තිබෙන්නේ පුද්ගලයකුගේ නමකට වඩා බෞද්ධ භික්ෂුවක් හැඳින්වීම සඳහා පොදුවේ යොදාගන්නා ලද නමක් බව සමහරු කල්පනා කරති. තමා අයත් ක්ෂේත්‍රය පිළිබඳ විශාරද ඥානයක් පැවති පුද්ගලයකු ඉන් අදහස් වේ. මීට කලින් සඳහන් කළ පරිදි ඇලෙක්සැන්ඩර්ගේ හමුදාව ඉදිරියේදී කලනෝස් නැමති භික්ෂුව විසින් කළ පරිදි මෙම භික්ෂුවද තම නග්න ශරීරය පුරා සුවඳ ගල්වා ඇතන්ස් නගරයේදී දර සෑයක් මතට නැගී ගිනිතබාගත් බව සඳහන් වේ (රූප රාමුව 22). ඔහුගේ අළු බොහෝ කාලයක් තිස්සේ ප්‍රසිද්ධියට පත්ව ඇති ස්මාරකයක තැන්පත් කර තිබීම නිසා එම භික්ෂුව මහත් ගෞරවයට පාත්‍රව සිටි පුද්ගලයකු බව පෙනේ. මිනිසුන් එම ස්මාරකය

ඉන්දියානු සොහොන වශයෙන් හැඳින්වූ බවත්, එම භික්ෂුව දිවිනසා ගැනීමේ සිද්ධිය සඳහන් කරමින් එහි ශිලා ලේඛනයක් පිහිටුවා තිබූ බවත් එම සිද්ධියෙන් වර්ෂ සියයක් ගතවූ පසු ඒ පිළිබඳ වාර්තාවක් ලියූ ප්ලූටාර්ක් (Plutarch) සඳහන් කර තිබේ.

ගිනිකොන දිග ඉන්දියාවේ පිහිටි මුසිරිස් වරාය එකල පැවති වැදගත් රෝම ජනාවාසයක් විය. ඊට ආසන්නයේ පිහිටි කොචින් හි මෙන් මෙහිද විශාල යුදෙව් ජනපදයක් පැවතුනි. එය අදත් දක්නට ලැබේ (රූප රාමුව 23). කොචින් හි ජීවත්වන යුදෙව්වන් 'සුදු' සහ 'කළු' යුදෙව්වන් වශයෙන් හැඳින්වෙන ප්‍රධාන ගෝත්‍ර දෙකකට අයත් වේ. මින් පසුව සඳහන් කළ 'කළු' යුදෙව්වන් කේරලයට පැමිණියේ ක්‍රි. පූ. 587 වර්ෂයේදීය. නෙබුචඩ්නෙස්සර් නමැති රජතුමා විසින් බැබිලෝනියාවට පැහැරගෙන එනු ලැබූ යුදෙව්වන්ගෙන් ඔවුන් පැවත එන බව ජනප්‍රවාදයේ දැක්වේ. කොචින් යුදෙව් සංගීතයේ පැරණි බැබිලෝනියානු බලපෑම දක්නට ලැබෙන බව ඒ පිළිබඳ පර්යේෂණ කළ ඇමෙරිකානු පර්යේෂකයකු විසින් සොයාගෙන තිබේ. ඔවුන්ගේ මුල් පදිංචිකරුවන් ඉන්දියාවට පැමිණියේ සොලමන්ගේ වෙළඳ නෞකා වලිනි. ක්‍රි. ව. 135 දී රෝමන්වරු ජෙරුසලම විනාශ කර දැමූ පසු තම මුතුන්මිත්තන් කොචින් වලට පලා ආ බව 'සුදු' යුදෙව්වන් විශ්වාස කරයි. මෙම යුදෙව් ජාතිකයින් ඇලෙක්සැන්ඩ්‍රියානු වෙළඳ ජනපදයකින් පැවත එන බව පෙනේ. කැරකැල්ලා (Caracalla) නමැති රෝම අධිරාජයා විසින් ක්‍රි. ව. 215 දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිදුකළ ලේ වැගිරීමකින් සිය රටට යෑමට නොහැකිවූ ඔවුහු ඉන්දියාවේ නතර වූහ.

මේ කාලයේදී මලබාර් මුහුදු තීරයේ පිහිටි මුසිරිස් (Muziris) සහ වෙනත් වරායන් හරහා ක්‍රිස්තියානි ආගමිකයින්ද ඉන්දියාවට පැමිණියේය. ඒ සම්බන්ධයෙන් පවතින පැරණිතමවූත් විශ්වාසදායක වූත් සාක්ෂිය ක්‍රි. ව. 180 දක්වා ඈතට දිවයයි. ඇලෙක්සැන්ඩ්‍රියාවේ පොන්ටේනෝස් (Pontainos) නැමති මිෂනාරිවරයා කේරලයට පැමිණි අවස්ථාවේදී එහි තිබී ඇරමයික් (Aramaic) භාෂාවෙන් ලියූ මතෙව්ගේ ශුභාරංචියේ පිටපතක් සොයා ගත්තේය. කෙසේ වෙතත් ජේසුස් වහන්සේ කුරුසියේ තබා ඇනගැසීමෙන් ස්වල්ප කාලයකට පසු ක්‍රිස්තියානිය ඉන්දියාවට පැමිණි බව ඉන්දියානු ක්‍රිස්තු භක්තිකයන් විශ්වාස කරයි. 16 වන ශතවර්ෂයේදී මලබාර් වෙරළට ගොඩබට පෘතුගීසීන් එහි තිබූ යුදෙව් ජාතිකයින්ගේ සම්මුති ශාලා (Synagogues) සහ බොහෝ පල්ලි දැකීමෙන් පුදුමයට පත්වූහ. මලවුන්ගෙන් උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේගේ තුවාල අත ගෑමට අවස්ථාව ලැබුණු උන්වහන්සේගේ ගෝලයකු විසින් ක්‍රිස්තු ධර්මය ඉන්දියාවට හඳුන්වාදුන් බව ඒවායේ කටයුතු කළ පූජකයින් විශ්වාස

කළහ. තෝමස් ක්‍රි. ව. 52 දී මුසිරිස් වරායෙන් ඉන්දියාවට පැමිණි බව කියනු ලැබේ.

තෝමස් ඉන්දියාවට පැමිණීම පිළිබඳ පවතින ජනප්‍රවාද රාශියක් තිබේ. සිරියාවට අයත්ව මෙසපොටේමියාවේ එඩෙස්සා (Edessa) නැමති ස්ථානයේදී ක්‍රි. ව. 225 දී පමණ ලියන ලද 'ඇක්ට්ස් ඔෆ් තෝමස්' (Acts of Thomas) නමැති ආගමික ලියවිල්ලේ සඳහන්වන පරිදි උත්ථානයෙන් පසු ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයින් විසින් ධර්මය ප්‍රචාරය කිරීම සඳහා ඔවුන් එකිනෙකා පිටත්ව යායුතු රටවල් පිළිබඳව තීරණය කිරීම සඳහා කුසපත් අදින ලදී. එහිදී ඉන්දියාවට යෑමට අවස්ථාව ලැබුණේ තෝමස්ටය. ඒ කාලයේදී හබන් (Habban) නමැති ඉන්දියානු වෙළෙන්දෙක් සිරියාවේ සිටියේය. නව නගරයක් නිර්මාණය කිරීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පියකු සොයා ගැනීම සඳහා ඔහු සිරියාවට යවන ලද්දේ ක්‍රි. ව. 19 - 49 කාලයේදී ගන්ධාර දේශය පාලනය කළ ගොන්ඩොෆෝරස් (Gondophares) රජතුමා විසිනි. ජේසුස් වහන්සේ හබන් ඉදිරියේ විද්‍යමාන වී තෝමස් වඩුවෙක් ලෙස ඉදිරිපත් කර ඔහුට විකුණන ලදී. හබන්ගේ වහලෙක් වශයෙන් තෝමස් ගොන්ඩොෆෝරස් රජතුමාගේ තක්ෂිලාවේ පිහිටි රජ වාසලට පැමිණියේය. ප්‍රසිද්ධ විශ්ව විද්‍යාලයක්ව පැවති තක්ෂිලාව එකල බුද්ධාගමේ බුද්ධිමය කේන්ද්‍රය වශයෙන් පැවතුණි. තෝමස් මුසිරිස් (Muziris) දක්වා නැවකින් පැමිණි බවත් එහිදී බටනලා වාදනය කරන යුදෙව් ගැහැනු ළමයින් විසින් ඔහු පිළිගත් බවත් කේරලයේ පවතින ජනප්‍රවාදයක සඳහන් වේ. එහිදී ඔහු බ්‍රාහ්මණයින් සහ යුදෙව් වෙළෙන්දන් බෞතීස්ම කර ක්‍රිස්තියානි පල්ලි හතක් එහි ඉදිකරවා අනතුරුව නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශයට පිටත්ව ගියේය. දකුණු ඉන්දියාවට පැමිණ අවුරුදු විස්සකට පසු ද්වේෂ සහගත බ්‍රාහ්මණ පූජකයින්ගේ කුමන්ත්‍රණයකට හසුවීමෙන් ඔහු මරණයට පත්විය. මැඩ්‍රාස් නගරයට ආසන්නයේ පිහිටි කන්දක් මත රාජ පුරුෂයින් විසින් ඔහු මරණයට පත්කරන ලදී.

ක්‍රිස්තුස් වහන්සේගේ මෙම ප්‍රේරිතවරයා* උතුරු ඉන්දියාවේ සිට කේරලය දක්වා මුහුදින් පැමිණෙන්නට ඇතැයි විශ්වාස කිරීමට පුළුවන. පර්සියාවේ ජීවත්වූ මුල් ක්‍රිස්තියානි ජන කොටස් ඔවුන් අදහන ආගමේ නිර්මාතෘවරයා තෝමස් බවත් ඔහු පළමුවරට ඉන්දියාවට පැමිණියේ ගොඩබිමින් බවත් සඳහන් කරයි. ඊසාන දිග ඉන්දියාවේ ග්‍රීක් බෞද්ධ කලා ශෛලිය වර්ධනය වූයේ මේ කාලයේදීය. පූර්ව ආසියාවෙන් සහ

* සේවයක් සඳහා නියම කොට යවන ලද තැනැත්තා නායකපති යන අර්ථය හැඟවේ. අපෝස්තලුවරයා යන වචනයද භාවිතවේ. ජේසුස් වහන්සේ විසින් තෝරා ගත් ශ්‍රාවකයින් දොළොස් දෙනාට නමකි.

ඊජිප්තුවෙන් කලාකරුවන් සහ කලා ශිල්පීන් විශාල ප්‍රමාණයක් නිරන්තරයෙන් මේ ප්‍රදේශයට ඇදී ආවේය. කුරුසියේ ඇන ගැසීමෙන් පසු දිවි ගලවා ගත් ජේසුස් වහන්සේ පවා ගොඩබිම් මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණි බව පෙන්නුම් කරන බොහෝ සාක්ෂි තිබේ.[71] තෝමස් ඉන්දියානු උප මහද්වීපයේ දකුණු දිග ප්‍රදේශ වල ධර්මය දේශනා කළ අතර ජේසුස් වහන්සේ ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයේ නතර විය. අවසානයේදී උන්වහන්සේ එහිදී මිය ගියේය. ශ්‍රී නගර්හි පිහිටා ඇති යුස් අසෆ් (Yuz-Asaf) නමැති ශාස්තෘවරයාගේ යැයි සැලකෙන සොහොන ඇත්ත වශයෙන්ම ජේසුස් වහන්සේගේ සොහොන යැයි විශ්වාස කරනු ලැබේ.

ක්‍රි. ව. 4 වන ශත වර්ෂයේදී සිරියානු ජාතික කිතුනුවෝ දකුණු ඉන්දියාවට මුහුදින් පැමිණියහ. පාප් වහන්සේගේ ආධිපත්‍යය පිළි නොගැනීම නිසා රෝමානු පල්ලිය මගින් ඔවුනු සිය නිජභූමියේදී මරණයට පත්කරන ලදහ. ඉන් පළමු කණ්ඩායම ක්‍රි. ව. 345 දී මුසිරිස් (Muziris) නගරයට පැමිණියේය. අද මැඩ්‍රාස් නමින් හැඳින්වෙන නගරයට කිට්ටුව පිහිටා තිබූ සොහොන ඔවුන්ට හමුවිය. ඔවුනු එහි පල්ලියක් ඉදි කළහ. ක්‍රි. ව. 1523 දී පෘතුගීසීන් විසින් මෙම පූජනීය ස්ථානය සොයාගන්නා විට ක්‍රිස්තියානි, හින්දු සහ මුස්ලිම් ආගමිකයන් ප්‍රේරිතවරයාගේ ඇඟිලි ඇට සහ ඔහුව මරණයට පත් කිරීම සඳහා පාවිච්චි කරන ලද'යි සැලකෙන හෙල්ලයේ උල් කෙළවර මහත් පූජනීයත්වයෙන් සලකනු ලැබිය.

1. ඉන්දියාවේ බුද්ධගයාවේ පිහිටි ජය ශ්‍රී මහා බෝධිය : සිදුහත් කුමරු බුද්ධත්වයට පත්වීමේදී පිරුදුන් බෝධි වෘක්ෂයේ අංකුරයකින් හටගත් මෙම බෝධි වෘක්ෂය අවුරුදු 2500 කට වඩා පැරණිය.

2. මිරණැග ඉසිපතනයේදී (සාරානාත් නුවර) බුදුන් වහන්සේ පස්වග භික්ෂූන්ට පළමු ධර්ම දේශනය පැවැත්වීම.

3. (ඉදිරි පිටුවේ, උඩ වම් පස) ශ්‍රාවස්ති නුවර අසල පිහිටි 'ජේත' උයන, ජේත කුමරුන් විසින් බුදුන් වහන්සේට පූජා කිරීම. මෙය බහරුත් (Bharuth) ස්තූපයේ නෙලා ඇති කැටයමකි.

4. (ඉදිරි පිටුවේ, උඩ, දකුණු පස) අශෝක රජතුමා විසින් සාරානාත් නුවර ඉදි කරනු ලැබූ සිංහ කුළුණ (ක්‍රි. පූ. 3 වන ශත වර්ෂය) බුදුන් වහන්සේගේ ධර්මය සිංහ නාදයකට සමාන කර තිබේ.

5. (ඉදිරි පිටුවේ, පහළ) බුදුන් වහන්සේ විසින් පළමු ධර්ම දේශනාව පැවැත්වූ ඉසිපතනයේ (සාරානාත්) ඉදිකර ඇති ධම්මික ස්තූපය.



ඔවුන්ගේ ඉගැන්වීම් වල දක්නට ලැබෙන මෙම සමානකම් ඇතිවූයේ කෙසේද? ඒවා ශුභාරංචිය ලියූ කතුවරයින් විසින් ඇතුළත් කරණ ලද කරුණුද? එසේ නැතිනම් මෙම ශාස්තෘන් වහන්සේලා දෙදෙනාම එකම දිශාවකට යොමු වූ ආධ්‍යාත්මික නැඹුරු වීමකින් යුක්ත වීම නිසා නිතැතින්ම ඇතිවූ සමානකමක්ද? ජේසුස් වහන්සේ බුදු දහම පිළිබඳව දැනගෙන සිටියේද? එහි ප්‍රතිඵලයක් වශයෙන් නව තෙස්තමේන්තුව රචනා කළ කතුවරයින් තොරතුරු ලබාගැනීම සඳහා ඉන්දියාව දෙසට නැඹුරුවීද? නව තෙස්තමේන්තුවේ දක්නට ලැබෙන බෞද්ධ ඉගැන්වීම් පිළිබඳව සලකා බැලීමේදී බෞද්ධ ග්‍රන්ථවල සඳහන්වන තොරතුරු වලින් කවර කොටසක් අලංකාර වර්ණනාද, ඒවා ලියූ කතුවරයින් විසින් එකතු කරන ලද කරුණුද, දාර්ශනික විග්‍රහයන්ද, වෙනස් කරන ලද තොරතුරුද, යන කරුණු මෙහිදී අප විසින් සැලකිය යුතු නොවේ. එසේ කළ යුතු වන්නේ අප සැබෑ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ පිළිබඳව, එනම් බුදුන් වහන්සේ නම් වූ ඓතිහාසික පුද්ගලයා සහ උන්වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය පිළිබඳව සොයා බලන්නේ නම් පමණි. නමුත් ශුභාරංචියේ සඳහන්වන කරුණු බුද්ධාගම සමඟ සංසන්දනය කිරීමේදී බෞද්ධ ග්‍රන්ථවල දැක්වෙන කරුණු ඒ ආකාරයෙන්ම, එනම් කාලයක් තිස්සේ ඒවායේ ඇතිවී තිබෙන වෙනස්කම් සහ එකතු කිරීම්ද අපට යොදා ගැනීමට පුළුවන. අනෙක් අතට ශුභාරංචියේ පොත් සහ ක්‍රිස්තියානි ධර්ම ග්‍රන්ථ රචනා කළ ලේඛකයින්ට බෞද්ධ ග්‍රන්ථ ලැබෙන්නට ඇත්තේ ඒ ආකාරයටම විය හැකිය. එපමණක් නොව ජේසුස් වහන්සේටත්, උන්වහන්සේගේ මුල් අනුගාමිකයින්ටත් බුදු දහම පිළිබඳ දැනගැනීමට හැකිවන්නට ඇත්තේ ඉහත කී විස්තර වර්ණනා සහ වෙනස්කම් සමඟ විය යුතුය.

බුද්ධාගම පිළිබඳව ලියා තිබෙන පොත්පත් සම්භාරයෙන් ක්‍රිස්තියානි ආගම බිහිවීමට සහ ජේසුස් වහන්සේ මහජනයා ඉදිරියට පැමිණීමට පෙර යුගයට අයත්වූ පොත් පත් පිළිබඳව පමණක් මෙහිදී සලකා බලනු ලැබේ. එම බෞද්ධ පොත් ලියවුනු කාලය සහ මුඛ පරම්පරාගත තොරතුරු ඇති වූ යුගය පිළිබඳව සඳහන් කරනු ලබන්නේ කිසියම් කාරණයක් අවබෝධකර ගැනීම සඳහා එසේ කිරීම අවශ්‍ය වන අවස්ථාවලදී පමණි.

වර්ෂ 1900 පමණ වනවිට ක්‍රිස්තියානි ආගමේ දක්නට ලැබෙන ඉන්දියානු මූලාශ්‍ර පිළිබඳව කරනු ලැබූ පර්යේෂණ වල ප්‍රතිඵලයක් වශයෙන් විශ්මයජනක කරුණු මතුකර ගැනීමට හැකිවිය. එය බොහෝ දුරට කළහැකි වූයේ සෙයිඩල් (Seydel) විසින් කරන ලද පර්යේෂණ හේතුවෙනි. කෙසේ වෙතත් එම පර්යේෂණ කටයුතු 1920 න් පසුව

සම්පූර්ණයෙන්ම පාහේ නවතා දමන ලදී. එවැනි පර්යේෂණ යටපත් කිරීම සඳහා කතෝලික පල්ලියේ බලපෑමද හේතුවන්නට ඇත. බුදු දහමේ එන අදහස් ශුභාරංචිය ලිවීමේදී යොදාගෙන ඇතැයි යන කාරණය පිළිගත යුතු යැයි ලියොන්-ලා ෆොවියෙර් නැමති ජේසුයිට් නිකායට (Lyon-La Fourviere Jesuit Faculty) අයත් පූජකවරයකුවූත් සුප්‍රසිද්ධ ආගමික ඉතිහාසඥයකු වූත් හෙන්රි ඩි ලුබැක් (Henri de Lubac)විසින් ප්‍රකාශ කිරීම නිසා වතිකානු පල්ලිය ඔහුට තරවටු කර ඔහු විසින් කරන ලද ප්‍රකාශ වාරණය කර නිශ්ශබ්ද කරනු ලැබීය. 1962-5 වර්ෂවලදී දෙවන වතිකානු සභාව පැවැත්වීමෙන් පසු ක්‍රිස්තියානි පල්ලිය විසින් එතෙක් වෙනත් ආගම් සම්බන්ධයෙන් අනුගමනය කරන ලද දැඩි ආකල්පය තරමක් දුරට ලිහිල් කර බුදු දහම සමඟ අන්තර් ආගමික සම්බන්ධතාවයක් ඇති කරගැනීමට කටයුතු කරන ලදී. බොහෝ කාලයක් තිස්සේ නිල වශයෙන් පසෙකට දමා තිබූ මෙම ප්‍රශ්නය කෙරෙහි නැවත වරක් විද්වතුන්ගේ අවධානය යොමුවන්නට පටන් ගත්තේ ඉන් පසුවය. මේ අතර නව පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් සහ දියුණු වාග් විද්‍යාත්මක ක්‍රමවේදයන් නිසා කරුණු විග්‍රහ කිරීමට ඇති හැකියාව පුළුල් වී තිබේ. මෙම තේමාව පිළිබඳව මෑතදී කරන ලද පර්යේෂණ මගින් ක්‍රිස්තියානියේ ආරම්භය බුදු දහම මත පදනම් වී ඇති බව මැනවින් පැහැදිලි වේ. නමුත් වෙනත් ආගමක අන්තර්ගතය නවත් ආගමක අවශ්‍යතාවයක් සපුරා ගැනීම පිණිස මෙසා විශාල ප්‍රමාණයකට අනුවර්තනය කරගෙන තිබෙන්නේ කෙසේද? යන ප්‍රශ්නයට පිළිතුරක් සොයාගැනීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණ අතර රෝයි සී. ඇමෝර් (Roy C. Amore) විසින් ලියා ඇති ග්‍රන්ථයක් (ඒ පිළිබඳව පසුව විස්තර කරනු ලැබේ) සහ සුප්‍රසිද්ධ විද්වතෙක් වන සැකරියාස් පී. තුන්ඩි විසින් ලියන ලදුව මෑතකදී ප්‍රසිද්ධ කරනු ලැබූ නවත් වැදගත් ග්‍රන්ථයක් සඳහන් කළ යුතුය.[2]

ජේසුස් වහන්සේගේ ළමාවිය සහ නවයොවුන් විය සම්බන්ධයෙන් පවතින කථා ප්‍රවෘත්ති සිද්ධාර්ථ කුමාරයාගේ ළමා විය හා සම්බන්ධ කථා ප්‍රවෘත්ති අතර පවතින සමානකම් තුන්ඩි විසින් පෙන්නුම් කර තිබේ. දහනව වැනි ශතවර්ෂයේ අවසාන භාගයේදී බ්‍රිතාන්‍යය යටතේ පැවති ඉන්දියාවේ සිවිල් සේවකයකු වශයෙන් සේවය කළ ආතර් ලිලී (Arthur Lillie) බුදුන්වහන්සේගේ සහ ජේසුස් වහන්සේගේ ජීවන කථා ප්‍රවෘත්ති වල පවතින සමානකම් දැකීමෙන් ඔහු තුළ ඇතිවූ විශ්මිත හැඟීම මෙසේ ප්‍රකාශ කළේය: "ජේසුස් වහන්සේගේ සහ බුදුන්වහන්සේගේ ජීවන චරිත නිරන්තරයෙන් එකිනෙක කෙරෙහි ආලෝකයක් හෙළයි."[3]

මූලික බෞද්ධ ග්‍රන්ථ සහ ලේඛන සම්ප්‍රදායන් ක්‍රිස්තියානි ලියකියවිලි වලට වඩා පැරණි බවත්, බහුල වශයෙන් කරුණු උපුටාගෙන

6. ශ්‍රාවකයින් නිතර බුදුන් වහන්සේ බැහැ දකිමට පැමිණි උන්වහන්සේ නිතර වැඩ වාසය කළ රජගහ නුවර ආසන්නයේ පිහිටි ගිජ්ජකූට පර්වතය.

7. බුදුන් වහන්සේ වස්සාන සමයේ වැඩ විසූ ස්ථානයක් ලෙස සැලකෙන රජගහ නුවර ආසන්නයේ පිහිටි ගිජ්ජකූට පර්වතයේ පිහිටි ලෙනකි. 'වල් ඌරු ලෙන' (Wild Boar Cave) යනුවෙන් හැඳින්වෙන මෙම ස්ථානය බෞද්ධයින් විසින් වන්දනාමාන කරනු ලබන වැදගත් සිද්ධස්ථානයකි.





8. සාරනාත් ආශ්‍රමය පිහිටි අඩවියේ සිදු කරන ලද පුරා විද්‍යාත්මක කැණීම්.

9. සහ 10· ප්‍රංශයේ 'මාර්සේ' නගරයට ආසන්නයේ තිබී සොයා ගත් ක්‍රි. පූ. 2 වන ශත වර්ෂයට අයත් බුද්ධ රූපවලට සමාන ප්‍රතිමා.

11. (ඉහළ, වම් පස) ජෛනාගමේ නිර්මාතෘවරයා වූ මහාවීර, කජුරාහෝ (Khajuraho) හි පෙළා ඇති පිළිරුවකි.

12. (ඉහළ, දකුණු පස) 2 වන සහ 3 වන ශත වර්ෂවලට අයත් ගන්ධාර සම්ප්‍රදාය අනුව නිර්මාණය කර ඇති බුදුන් වහන්සේ විසින් දම්සක් පැවැත්වීම පිළිබිඹු කරන පිළිමයකි.

13. සහ 14. (ඉදිරි පිටුව, උඩ) මේ රූප රාමුවලින් විවිධ සංස්කෘතීන් අතර පවතින විස්මය ජනක සමානකම් පෙන්නුම් කරයි.

13. ක්‍රි. පූ. 2000 තරම් පැරණි ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මුද්‍රාවක දක්නට ලැබෙන හින්දු භක්තිකයින්ගේ ගෞරවයට පාත්‍ර වූ පූර්ව ශිව (Proto-Shiva) යනුවෙන් හැඳින්වෙන දෙවියන්ගේ පිළිරුවකි.

14. ගන්ඩස්ට්‍රප් කෝල්ඩ්‍රන් (Gundustrap Cauldron) හි තිබී සොයා ගත් පළමුවන සත වර්ෂයට අයත් සර්නුනෝස් නම් වූ සෙල්ටික් දෙවියන්ගේ පිළිරුවකි.

15. (ඉදිරි පිටුව, මැද, වම්පස) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට (ක්‍රි. පූ. 2000) අයත් අකුරු සටහන් සහිත පුවරුවකි. මෙහි සඳහන් අකුරු තවමත් හඳුනාගෙන නැත.

16. (ඉදිරි පිටුව, මැද, දකුණු පස) ඉන්දියානු ඉගැන්වීම් මහා පරිමාණයෙන් බටහිර රටවලට හඳුන්වා දුන් පයිතගරස් නැමැති ග්‍රීක් දාර්ශනිකයා.

17. (ඉදිරි පිටුව, පහළ, වම් පස) අරිකමේඩු වරාය අසබඩ ප්‍රදේශයේ තිබී හමු වූ රෝමන් පහන් කැටි (පොන්ඩිචෙරි කෞතුකාගාරය).

18. (ඉදිරි පිටුව, පහළ, දකුණු පස) අරිකමේඩුවෙන් හමු වූ රෝමන් කඩුවක් (පොන්ඩිචෙරි කෞතුකාගාරය).



19. දකුණු ඉන්දියාවේ අරිකමේඩු නගරයට කිට්ටුවෙන් පිහිටි ගඟේ මෝය ප්‍රදේශය - මෙය පූර්ව ක්‍රිස්තියානි යුගවලදී පවා රෝම නැව් ගමනා ගමනය පැවැති ස්වභාවික වරායක් ලෙස පැවතුණි.

20. දකුණු ඉන්දියාවේ මැඩ්‍රාස් නගරයට ආසන්නයේ පිහිටි ශාන්ත තෝමස්තුමන්ගේ දේවස්ථානයේ අල්තාරය - මෙහි තැන්පත් කර ඇති අපෝස්තුලුවරයාගේ ධාතු වන්දනා කිරීම සඳහා බැතිමතුන් පැමිණෙන්.

21. ගිනිදළු චක්‍රයක් මැද නිර්මාණය කර ඇති ශිව නටරාජා - ජේම්ස්ගේ ලිපිවල (Epistle of James) ඇතුළත් පුනර්භවය පිළිබඳ අදහස් වලට මුල් වූ ආදර්ශය මෙය විය හැකිද?



22. මහා ඇලෙක්සැන්ඩර් රජතුමා ඉන්දියාවේදී දුටු අත්තකිලමථානු යෝගයෙහි යෙදී සිටි (ශරීරයට දැඩි දුක් දීම) ඉන්දියානු තවුසන් (ඒ රොජර්, Offene Turzu dem Verborgenen Heydenthum, 1663)

23. ප්‍රාග් ක්‍රිස්තියානි යුගයේදී ඉන්දියාවට පැමිණි යුදෙව් සංක්‍රමණිකයින්ගේ ආගමික මධ්‍යස්ථානයක් ලෙස අදත් පවතින කොචින් හි පිහිටි ධර්ම ශාලාව

24. බුදුන් වහන්සේ වැඩ සිටි බව සංකේතාත්මකව පිළිබිඹු කර ඇති හිස් වූ සිංහාසනය (දෙවන ශත වර්ෂයට අයත් අමරාවතී ගල් කැටයමකි).



25. අශෝක රජතුමා විසින් විදෙශ රටවලට පිටත්කර යවනු ලැබූ ධර්ම දූතයින්ට මග පෙන්වූ නිතිපතා නැවතුම් පළ (Staging Post) අතීතයේදී මහත් සෞභාග්‍යයෙන් ආඪ්‍යව පැවති පැල්මයිරා සෙශ්ම භූමියේ නටබුන්

26. අශෝක රජතුමාගේ ඇරමයික් මිලා ලේඛනය පිහිටා ඇති හිස් දෙකක් ඇති රාජාලි ස්තූපයේ පාදම.

27. තක්සිලාවේ පිහිටි ධර්මරාජික ස්තූපය.

28. බ්‍රාහ්මී අක්ෂරවලින් කොටා ඇති අශෝක රජතුමා විසින් සාරානාත්හි ඉදිකරන ලද ටැම්ලිපිය (ක්‍රි. පූ. 3 වන ශත වර්ෂය)

29. 1908 වර්ෂයේදී ඊජිප්තුවේ මෙම්ෆිස් නැමැති ස්ථානයේ කරන ලද කැණීම් මගින් සොයා ගත් ඉන්දියානු මූර්ති දෙකකි (ක්‍රි. පූ. 200)



30. ටොලමීගේ කාලයේදී ඇලෙක්සැන්ඩ්‍රියා නගරය - යුදෙව් ජාතිකයින් සඳහා වෙන්කර තිබූ කොටස මෙහි දකුණු පස දක්වා තිබේ.



31. (ඉදිරි පිටුව, උඩ) මෛත්‍රී බෝධිසත්වයෝ (අජන්තා ගුහා - 6, 7 ශත වර්ෂ වලට අයත් වේ)

32. (ඉදිරි පිටුව, පහළ) බුදුන් වහන්සේගේ ඉගැන්වීම් සංකේතවත් කරන නෙරවී මලක් අතැතිව බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් කණිෂ්ක රජතුමා (පළමුවන ශත වර්ෂය) බැහැ දකිමට පැමිණීම - මෙය හරාන්වල තිබී හමුවූ උළු කැටයක දක්නට ලැබෙන චිත්‍රයකි.

33.
මෛත්‍රී බෝධිසත්වයෝ (Karashahar, 6, 7 ශත වර්ෂයට අයත්ය)

34.
ජේසුස් වහන්සේ (Codex Aureus ක්‍රි. ව. 870 පමණ අයත්ය)

35.
මධ්‍යතන යුගයට අයත් පොතක දක්නට ලැබෙන ජේසුස් වහන්සේගේ චිත්‍රයකි , මෛත්‍රී බෝධිසත්වයින්ට විස්මය ජනක සමාන ලක්‍ෂණ රාශියක් මෙහි දක්නට ලැබේ.

36.
පද්මපානි බෝධිසත්වයින්ගේ පිළිරුවකි. මෙම රූපයේ සිරුරේ නෙළුම් මල් නෙලා ඇති ස්ථාන කුරුසියේ ඇණ ගැසීමේදී ජේසුස් වහන්සේගේ සිරුරේ තුවාල සිදුවූ ස්ථානවලට සමාන කමක් දක්වයි (සාරානාත්. 9 වන ශත වර්ෂය)

දෙවන කොටස

ජේසුස් නම් වූ බුද්ධ ශ්‍රාවකයා

සිද්ධාර්ථ කුමාරයාගේ සහ ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ දක්නට ලැබෙන සමානකම්

අතීතයේ ඉන්දියාව සහ බටහිර රටවල් අතර ගත වර්ෂ ගණනාවක් මුළුල්ලේ විවිධ සම්බන්ධතා පැවතුණි. ජේසුස් වහන්සේ ඉතිහාසයේ කරළියට ඒමට බොහෝ කාලයකට පෙර ඉන්දියානු දෙවිවරු, විවිධ කථා ප්‍රවෘත්ති, පුරාණෝක්ති, දර්ශනවාද සහ ආගමික චාරිත්‍ර බටහිර රටවල ප්‍රචලිතව තිබූ බව පෙනේ. මධ්‍යධරණී වෙරළබඩ ප්‍රදේශවල සහ පලස්තීනයට ආසන්නයේ පිහිටි ප්‍රදේශවල බෞද්ධ භික්ෂූන් වහන්සේලා වාසය කළ බවත්, ඉන්දියානු ඉගැන්වීම් පිළිබඳ සාකච්ඡා කිරීම එම යුගය තුළ පැවැති මාතෘකාවක් වූ බවත් අපි දුටුවෙමු.

පසු කාලයේදී ශුභාරංචිය පොත ලියූ කතුවරයින් කෙරෙහි මෙම ඉන්දියානු අදහස් බොහෝ දුරට බලපෑවේය. සොලමන් රජතුමා ජීවත්වූ කාලය තරම් ඈත යුගයක සිට යුදෙව් ජාතිකයින් ඉන්දියාව සමඟ සම්බන්ධකම් පැවැත්වූ බවත් ඒ පිළිබඳව පරණ තෙස්තමේන්තුවේ තැනින් තැන සඳහන් කර තිබෙන බවත් අපි දුටුවෙමු. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු යුදෙව් ජාතිකයින් ගෙන් කොටසක් දෙගම්මැදි රාජ්‍යයේ සහ පර්සියාවේත්, තවත් කොටසක් දකුණු ඉන්දියාවේත් නතරවූ බව සඳහන් කළෙමු. එතැන් පටන් ඊශ්‍රායල් වැසියන් සහ පෙරදිග රටවල් අතර සෘජු ලෙස බුද්ධිමය සහ ආධ්‍යාත්මික සම්බන්ධතා ඇතිවිය. ශුභාරංචිය පිළිබඳ පොත් ලියූ යුගයේදී බුදු දහමින් කරුණු උපුටා ගැනීමට හැකි පරිසරයක් නිර්මාණය වී තිබුණි. එකල ග්‍රීක් සාහිත්‍යය කෙරෙහි බෞද්ධ අදහස් කැපී පෙනෙන බලපෑමක් ඇතිකර තිබෙන බව පැහැදිලි කරදීමට අපි බලාපොරොත්තු වෙමු. එම මූලාශ්‍ර නව තෙස්තමේන්තුව ලියූ කතුවරයින් විසින් ප්‍රයෝජනයට නොගත්තේ නම් එය පුදුමයට කරුණක් විය යුතුය. මෙහිදී පුදුමයට හේතුවන කාරණය නම් බුද්ධාගමේ අදහස් ශුභාරංචිය ලිවීමේදී බහුල ලෙස යොදාගෙන තිබීමය.

ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් බුද්ධාගමේ ඇතුළත් ඉගැන්වීම් වලට බොහෝ දුරට සමාන බව ඔවුන් කල්පනා කළ බව පෙනී යන අතර සමහර විට එම ඉගැන්වීම් දේශනා කරනු ලැබුවේ ජේසුස් වහන්සේ විසින් ද නො එසේ නම් ගෞතමයාණන් වහන්සේ විසින්ද කියා තීරණය කිරීමට ඔවුන්ට නොහැකි වන්නට ඇත. ජේසුස් වහන්සේ සහ බුදුන් වහන්සේ නම් වූ මෙම ශ්‍රේෂ්ඨ ශාස්තෘවරු දෙදෙනා අතර ආධ්‍යාත්මික වශයෙන් පැවති පුදුමාකාර සමානකම් ඉතිහාසය පුරා බොහෝ කාලයක් තිස්සේ ඒ පිළිබඳ විමසිලිමත් වූ බුද්ධිමතුන්ගේ විශේෂ අවධානයට ලක්විය.

තිබෙන්නේ බටහිර රටවල් පෙරදිග රටවලින් මිස පෙරදිග රටවල් බටහිර රටවලින් නොවන බවත් තුන්ඩි ඉතා හොඳින් පෙන්නුම් කර දී තිබේ. ජේසුස් වහන්සේගේ ළමාවිය සම්බන්ධයෙන් පවතින කථා ප්‍රවෘත්ති යුදෙව් සම්ප්‍රදායට එකඟ නොවන බවත් එම කථා විදේශීය මූලාශ්‍රයක් මත පදනම් වී ඇතිබවත්, මෙම විදේශීය බලපෑම ශුභාරංචියේ පොත් වල ආරම්භයේ පටන් දක්නට ලැබෙන බවත් ඔහු නිගමනය කළේය.

පොත් පත්වල පෙළෙහි අන්තර්ගතය සවිස්තරව විශ්ලේෂණය කිරීම වැනි ශාස්ත්‍රීය පර්යේෂණ කිරීමේ නව ක්‍රමවේදයන් යොදා ගැනීමෙන් වෙනත් සංස්කෘති වලට අයත් විවිධ මූලාශ්‍ර විශාල ප්‍රමාණයක් ක්‍රිස්තියානි වෘත්තාන්ත සඳහා පදනම් කරගෙන තිබෙන බව ඔහු පෙන්වා දී තිබේ. ශුභාරංචියේ පොත් වල ව්‍යුහය හා සැකැස්ම සලකා බැලීමේදී ඒවායේ නොපැහැදිලි තැන්, අනපේක්ෂිත අවස්ථා, සදොස් පාඨ, සහ විවිධ කතුවරයින් විසින් විවිධ කාල වලදී ලියන ලද අප්‍රකාශිත මූලාශ්‍ර වල බලපෑම් දක්නට ලැබෙන බව ඔහු පෙන්වාදී තිබේ.[1] අප දන්නා පරිදි පිළිවෙලින් මැතිව්, මාක්, ලූක් සහ ජොහන් යනුවෙන් හැඳින්වෙන ශුභාරංචියේ පොත් හතර ලියා තිබෙන්නේ තනි කතුවරයෙකු විසින් නොවේ. ව්‍යවහාරයේ පැවති බොහෝ වාචික සහ ලිඛිත උප පාඨ සංස්කරණය කර ඒවා සැලකිය යුතු ප්‍රමාණයකට ප්‍රතිශෝධනය කිරීමෙන් අනුකූලව සංග්‍රහයක් ලෙස සකස්කර තිබීම නිසා ශුභාරංචියේ පොත් ලියා ඇත්තේ කතුවරයින් බොහෝ දෙනෙකු විසින් බව පැහැදිලිවේ. ග්‍රීක් සංකලන වාදය ප්‍රචලිතව තිබූ වාතාවරණයක් යටතේ ඉන්දියාවෙන් ගලා ආ බොහෝ කථා ප්‍රවෘත්ති ශුභාරංචියේ පාඨවලටත් ආගමික සාහිත්‍යයටත් ඇතුල් කරන ලදී. විශේෂයෙන්ම ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳව පවතින වෘත්තාන්ත සම්බන්ධයෙන් මේ කියමන සත්‍ය වේ.

ජේසුස් වහන්සේගේ ජීවන චරිතය ලියූ ලේඛකයින් උන්වහන්සේගේ ළමා කාලය පිළිබඳව කිසිවක් දැන සිටියේ නැත. එනිසා එය ප්‍රතිනිර්මාණය කිරීමට ඔවුන්ට සිදුවිය. ආගමේ නියෝගයන්ට අනුව ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා සහ ගැලවුම්කාරයා වශයෙන් නිරූපණය කිරීමට සිදුවිය. එනිසා ඔවුන් දෙවියන්ගේ පුත්‍රයාට ගැළපෙන ආකාරයේ අද්භූත ප්‍රවාද සහ වෘත්තාන්ත ඒ සඳහා යොදාගත්හ. මහායාන ගුරුකුලයට අයත් පොත් පත්වල මනුෂ්‍යයකු වූ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ දෙවියකු ලෙස හඳුන්වා දී තිබේ. මහායාන පොත්පත් වල දැක්වෙන විස්තර තොරතුරු ඒ සඳහා සුදුසු ආකෘතියක් සැපයුවේය. එම කථා ප්‍රවෘත්ති එකල ඇලෙක්සැන්ඩ්‍රියාව, සිරියාව සහ පලස්තීනය යන රටවල ව්‍යවහාරයේ පැවති හෙයින් ක්‍රිස්තියානි ලේඛකයින් විසින් එම

විස්තර බෞද්ධ කථාවස්තු වලින් පමණක් උපුටා ගන්නට ඇතැයි සිතීමට හේතුවක් නැතැයි තුන්ඩි සඳහන් කරයි.

ඔහුගේ නිගමනය පැහැදිලිය. එහෙත් නව තෙස්තමේන්තුවේ බොහෝ තැන්වල දක්නට ඇති බෞද්ධ අදහස් සහ ඉගැන්වීම් වල දෝංකාරය පැහැදිලි කිරීම සඳහා එවැනි කථා ප්‍රවෘත්ති සහ අදහස් ප්‍රචලිතව පැවතීම පමණක් ඒවා තෝරා ගැනීම සඳහා මුල්වූ එකම හේතුව වශයෙන් ඉදිරිපත් කළ හැකිද යන්න සැක සහිතය. මෙහිදී ශුභාරංචිය පිළිබඳ පොත් ලිවීමේදී බෞද්ධ කථා ප්‍රවෘත්ති සහ ඉගැන්වීම් තෝරා ගැනීම සඳහා වෙනත් වැදගත් හේතු තිබුණු බව අපට පෙන්වාදිය හැකිය. එමගින් ශුභාරංචියේ පොත් ලිවීම පිළිබඳ අලුත් අදහසක් ඉදිරිපත් කිරීමටත් ජේසුස් වහන්සේ නම් වූ මනුෂ්‍යයා සහ උන්වහන්සේගේ ජීවිතය හා ඉගැන්වීම් වෙත නව එළියක් විහිදුවීමටත්, ක්‍රිස්තියානි ආගමේ ආරම්භය පිළිබඳ අලුත් කරුණු රාශියක් අනාවරණය කර ගැනීමටත් හැකිවනු ඇත. කෙසේ වෙතත් ඉන්දියානු මූලාශ්‍ර මත විශේෂයෙන්ම බෞද්ධ උරුමය මත පදනම් වී ඇති ක්‍රිස්තියානි ආගමේ දක්නට ලැබෙන සාහිත්‍යමය ලක්ෂණ පිළිබඳව පළමුවෙන්ම සලකා බලමු.

තුන්ඩිගේ අදහසට අනුව ජේසුස් වහන්සේගේ ළමා කාලය නිරූපණය කිරීම සඳහා බෞද්ධ වෘත්තාන්ත යොදා ගෙන තිබේ.[2] මෙහිදී ඒ පිළිබඳව කෙටියෙන් සඳහන් කළ හැකිය. එම සමානකම් මෙම ආගම් දෙකේම පුරෝගාමීන්ට පූර්ව ජන්මයක් තිබුණේය යන විශ්වාසයෙන් ආරම්භ වේ. දෙවිවරු මනුෂ්‍ය වේශයෙන් හෝ සත්ව වේශයෙන් කලින් කලට මහපොළවට පැමිණෙන බවට පැවති පැරණි ඉන්දියානු විශ්වාසයට මහායාන බෞද්ධයෝ නව ජීවයක් ලබා දුන්හ. එසේ දෙවිවරු මහපොළවට පැමිණීම දෙවියන්ගේ අවතාරයක් ලෙස ඉන්දියානුවෝ හැඳින්වූහ. සිදුහත්කුමරු ලොව පහළවීමට ප්‍රථම තුසිත දෙව්ලොව වාසය කළබව පැවසේ. ජොහන්ගේ ශුභාරංචියේ මුල් වාක්‍ය වලින් ජේසුස් වහන්සේ යනු ධර්මයාණන්ගේ (ධර්මය) ලොව පහළවීමක් ලෙස සඳහන් කර තිබේ. ධර්මයාණෝ යනු දෙවියන් වහන්සේ හා සමාන පදයකි. ජොහන්ගේ ශුභාරංචියේ පසු අවස්ථාවක දැක්වෙන පරිදි 'ආබ්‍රහම් උපදින්නටත් පෙර මම වීමි'යි ජේසුස් වහන්සේ විසින්ම ප්‍රකාශකර තිබේ. (ජොහන් 8 : 58)

සිද්ධාර්ථ කුමාරයාගේ මෙන්ම ජේසුස් වහන්සේද රාජකීය වංශයකින් පැවත එන බව සඳහන් වේ. මතෙව් විසින් ශුභාරංචිය පිළිබඳ ලියා ඇති පොත ආරම්භ කර තිබෙන්නේ ජේසුස් වහන්සේගේ පරපුර පිළිබඳ දීර්ඝ ඓතිහාසික විස්තරයක් කරමිනි. එය සිද්ධාර්ථ කුමාරයාගේ

වංශ කථාවට බොහෝ දුරට සමාන වේ.[6] ක්‍රිස්තියානියේ සඳහන් වන ජේසුස් වහන්සේගේ නිර්මල ප්‍රතිසංධිය සහ නොකිලිටි උත්පත්තිය පිළිබඳ අදහස් වල ඡායාවක් බුද්ධාගමේද දක්නට ලැබේ. ඇසළ පුර පසළොස්වක දිනයක රාත්‍රියේදී ශුද්ධෝදන රජතුමාගේ බිසව වූ මායා දේවිය අරුම පුදුම සිහිනයක් දුටුවාය. දෙව්ලොවින් පැමිණි සුදු ඇත් පැටවෙකු සුදු පියුමක් සොඬින් ගෙන ඇගේ කුස තුළට පිවිසියේය. මෙසේ ජනප්‍රවාදයට අනුව බෝසතාණන් වහන්සේ ප්‍රවමහාවෙන් සහ සිය කැමැත්තෙන්ම මයා දේවියගේ කුසේ පිළිසිඳ ගත්තේය. නොකිලිටි උත්පත්තිය පිළිබඳ අදහස ගම්‍යවන සදාචාරාත්මක සහ අධ්‍යාත්මික පාරිශුද්ධත්වය සහ සියලු පාපයන්ගෙන් තොරවීම යන අදහස බුද්ධාගමේද පැවති බව මෙයින් පැහැදිලි වේ.

මෙහිදී පාරිශුද්ධත්වය සංකේතවත් කිරීම සඳහා ඇත් පැටවකු යොදා ගැනීමේ ඇති වැදගත්කම බටහිර රටවල ජීවත්වන පාඨකයකුට වටහා ගැනීම අපහසුය. එනිසා සුදු ඇත් පැටවා වෙනුවට ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථවල සුදු පරෙවියකු යොදාගෙන තිබීම කෙරෙහි අපේ විශේෂ සැලකිල්ල යොමුවිය යුතුය. හන්නාගේ කථාවේ මරිය තුමියගේ ගැබ් ගැනීම විස්තර කර තිබෙන්නේ බෝසතාණන් වහන්සේ මවුකුස පිළිසිඳගත් ආකාරයට සමානවය. දෙව්ලොවින් පැමිණි සුදු පරෙවියකු තමාගේ කුස තුළට ඇතුල්වන සැටි මරියතුමිය සිහිනෙන් දකී. ශුභාරංචිය ලියූ කතුවරයින් සුදු පරෙවියා හඳුන්වා ඇත්තේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ සංකේතයක් වශයෙනි. උන්වහන්සේ දෙවන වරට දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස පිළිසිඳගත් බව පෙන්වීම සඳහා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් පරෙවියකු මෙන් බැස උන්වහන්සේගේ ශරීරයට ඇතුල් වූ බව එබියොනයිට් ශුභාරංචියේ (Ebionite Gospel) සඳහන් වේ. මරියතුමියගේ කන්‍යාභාවය, නිර්මල ප්‍රතිසංධිය සහ දරුවා බිහිකිරීමට පෙරත්, බිහිකළ අවස්ථාවේදීත්, ඉන් පසුවත් ඇයගේ කන්‍යාභාවය ආරක්ෂාවී තිබීම වැනි සාමාන්‍ය බුද්ධියට නොවැටහෙන කරුණු පිළිබඳව දීර්ඝ වශයෙන් ආගමික සාකච්ඡා පවත්වා ඇතිබව අපි සියලු දෙනාම හොඳින් දනිමු. නමුත් ශුභාරංචිය ලියූ කතුවරයින් ඒ පිළිබඳ එතරම් සැලකිල්ලක් දක්වා තිබෙන බවක් දක්නට නොලැබේ. ඒවා පසු කාලයේදී පූජකවරු විසින් යම්යම් කරුණු හුවා දැක්වීම සඳහා කරනු ලැබූ උත්සාහයන්ගේ ප්‍රතිඵලවේ. කෙසේ වෙතත් ශුභාරංචියේ දැක්වෙන එම විස්තරද බෞද්ධ සම්ප්‍රදායෙන් ලබාගෙන ඇති බව පැහැදිලිවේ. මායා දේවියගේ පාරිශුද්ධත්වය පිළිබඳව බෞද්ධ පොත්වල විස්තරාත්මකව සඳහන් කර ඇති අතර බෝසතාණන් වහන්සේගේ උත්පත්තියෙන් පසුව පවා ඇය නොකිලිටිව සිටි බව

පෙන්නුම් කිරීමට වෑයම් කර තිබේ.

තමා හා විවාහ ගිවිසගෙන සිටි කාන්තාව ඔවුන් එක්වීමට පෙර ගැබ්ගෙන සිටි බැව් දැන ගැනීමෙන් ජෝසප් තුළ ඇතිවූ විසම්ප්ත භාවයත් පසුව දේවදූතයකු සිහිනෙන් ඔහුට දර්ශනය වී ඇය ගැබ්ගැනීමට හේතුව පසුබිම පැහැදිලි කර දුන් බවත්, ඔහු එය දෙගිඩියාව අවිශ්වාසයකින් තොරව පිළිගත් බවත් සඳහන් කථාව අපි අසා ඇත්තෙමු (මතෙව් 1:18). මේ සියලුම ලක්ෂණ බෝසත් ගෞතමයාණන්ගේ උපත සම්බන්ධයෙන්ද දක්නට ලැබේ. බෝධිසත්වයන් වහන්සේගේ ආශ්චර්යමත් පිළිසිඳ ගැනීම පිළිබඳව දෙවියන් විසින් ශුද්ධෝදන රජතුමාට දන්වනු ලබයි. මෙහිදී ශුද්ධෝදන රජතුමා සහ ජෝසප් යන දෙදෙනාම ධාර්මික වුත්, අවංකවූත් පුද්ගලයින් ලෙස හඳුන්වා දී තිබේ.

ජේසුස් වහන්සේගේ උපත සම්බන්ධ අවස්ථා හින්දූන් අතර පවතින ක්‍රිෂ්ණා වන්දනා කිරීමේ චාරිත්‍රය හා බැඳී පවතින පුරාණෝක්තිවල දැක්වෙන කථාවස්තු සමග විස්මිත ආකාරයෙන් ගැලපීම කෙරෙහි මෙහිදී අපේ විශේෂ අවධානය යොමුවිය යුතුය. මරිය තුමිය සිය දරුවා බිහිකළේ ඇය ජෝසප් සමග අයබදු ගෙවීම සඳහා වෙනත් නගරයකට ගමන් කරමින් සිටියදීය. යසෝධා විසින් ක්‍රිෂ්ණා බිහිකරනු ලැබුවේ ඇය තම සැමියා සමග ඊට සමාන කටයුත්තක් සඳහා ගමන් කරමින් සිටියදීය. ජේසුස් වහන්සේ මෙන්ම ක්‍රිෂ්ණ උපන්නේද එඬේරුන් අතර ගව ඔරුවකය (manger). මේ දෙදෙනාටම කෲර පාලකයකු විසින් නියෝග කරනු ලැබූ ළදරු ඝාතනයකින් බේරී පලාගොස් රටින් පිට ජීවත්වීමට සිදුවිය. ක්‍රිස්තුස් වහන්සේ යහපත් එඬේරා සහ සියල්ලටම ප්‍රේම කිරීමට උගන්වන ආගමික දේශකයාණන් වහන්සේ කෙනෙක් වශයෙන් නිරූපණය කර තිබීම (ජොහන්ගේ ශුභාරංචිය) එඬේර දෙවියකු පිළිබඳව පවතින හින්දු සම්ප්‍රදායෙන් බිඳී ආ බව හඟවන සලකුණකි.

ගෞතම බෝධිසත්වයන් පිළිසිඳ ගත් අවස්ථාවේදීත් උන්වහන්සේ බිහිවූ අවස්ථාවේදීත් මුළු ලෝකයම බබලවමින් දීප්තිමත් ආලෝකයක් පැතිරිණි. ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ කථා ප්‍රවෘත්තිවලද උන්වහන්සේ බිහිවූ විට අසිරිමත් ජනක ආලෝකයක් පැතිරගිය බව සඳහන් වේ. "දෙවියන් වහන්සේගේ තේජශ්‍රීය ඔවුන් සිසාරා බැබලිණි. ඔවුහු අතිශයින් බියට පත්වූහ" යනුවෙන් ලූක්ගේ ශුභාරංචියේ සඳහන් වේ. (ලූක් 2 : 8). වෙනත් අනුවාදයකට අනුව ඇස් නිලංකාර කිරීමට සමත් ආලෝකයක් මරියතුමිය සිටි ගුහාව තුළ පැතිර ගිය බව සඳහන් වේ.[7] මෙය පසුව ළදරු ජේසුස් කුමරුවා සිටි ගුහාව වශයෙන් වෙනස් කරන ලදී (Proto-Gospel James 14:10-12). ජේසුස් වහන්සේ උපන් අවස්ථාවේදී,

පෙරදිගින් පැමිණි ශාස්ත්‍රවන්තයන් ජෙරුසලමට අවුත් "යුදෙව්වන්ට රජව උපන් උතුමාණෝ කොහෙන්හිද? අපි එතුමාණන්ගේ තාරකාව දැක එතුමාණන්ට නමස්කාර කරනු පිණිස ආවෙමුයි" යනුවෙන් මතෙව් විසින් කරන ලද සුප්‍රසිද්ධ ප්‍රකාශය මෙහිදී අමතක නොකළ යුතුය. (මතෙව් 2:2)

බැලූ බැල්මට නොවැදගත් සේ පෙනීයන තවත් විස්තරයක් කෙරෙහි තුන්ඩ් අපේ අවධානය යොමු කරතිබේ.[8] බෞද්ධ ජනප්‍රවාද වලට අනුව අලුත බිහිවූ කුමරුවා සළුවකින් වසනු ලැබිය. එතරම් විශේෂ වැදගත් කමක් නොමැති මෙම විස්තරය මතෙව්ගේ ශුභාරංචියේ දක්නට නොමැත. නමුත් ලූක්ගේ ශුභාරංචියේ සහ Pseudo-Matthew යනුවෙන් හැඳින්වෙන ආගමික ලියවිල්ලේ ඒ ගැන සඳහන් කර තිබේ. දරුවකු උපන් විට සළුවකින් ඔතනු ලැබීම සාමාන්‍ය දෙයක් බවත් එවැනි සිදුවීමක් විස්තර කිරීම සඳහා පිටස්තර මූලාශ්‍රයකින් තොරතුරු ලබාගැනීමට වුවමනාවක් නැතැයි කෙනෙකුට කල්පනා කළ හැකිය. කෙසේ වෙතත් මෙම නොවැදගත් සිද්ධිය කෙරෙහි අවධානය යොමුකළ යුතු බව තුන්ඩ්ගේ විශ්වාසයයි. එම විස්තරය වෙනත් මූලාශ්‍රයකින් ලබා නොගත්තේ නම් එවැනි නොවැදගත් කරුණක් ලූක් සහ Pseudo-Matthew යනුවෙන් හැඳින්වෙන ශුභාරංචියේ පොත්වල පමණක් සඳහන් කර තිබෙන්නේ කුමක් නිසාද? Pseudo Matthew පිළිබඳව කල්පනාකර බැලීමේදී කතුවරයා විසින් සිද්ධාර්ථ කුමරාගේ ළමා කාලය පිළිබඳ තොරතුරු බොහෝ අවස්ථාවලදී උපුටාගෙන ඇතිබව පැහැදිලිවේ. ඒනිසා ජේසු බිළිඳා රෙදි වලින් ඔතා ගව මරුවේ තැබීම පිළිබඳ විස්තරය ඉන්දියානු ජනප්‍රවාද මත පදනම් වී ඇතිබව කල්පනා කළ හැකිය. එහි පැහැදිලි ලෙස බෞද්ධ ලේඛන වලින් උපුටාගත් බොහෝ විස්තර දක්නට ලැබේ. පින්වත් කුමරුවා දැකීමෙන් වන සතුන් හීලෑ වීම, දරුවා තුළ පවත්නා ඓශ්වර්යමත් බලය නිසා ගස්වල අතු පහළට නැමීම, වියළි පොළොවෙන් ජල උල්පත් මතුවීම සහ තරුණ කුමරුවා ඉදිරිපිට වෙනත් ආගම් වලට අයත් දේව ප්‍රතිමා බිම වැටී කැබලි වලට වෙන්වීම වැනි සිදුවීම් එසේ උපුටාගත් කථා ප්‍රවෘත්ති වලට ඇතුළත් වේ. එම කථා ප්‍රවෘත්ති උපුටා ගෙන තිබෙන්නේ 'ලලිත විස්තරයේ' දැක්වෙන ඊට සමාන කථා වස්තුවලින් සහ බුදුන් වහන්සේ පිළිබඳ ලියැවී ඇති වෙනත් චරිතාපදානයන්ගෙන් බවට කිසිම සැකයක් නැත.

සිදුහත් කුමරු උපන් සැටියේම සත් පියුම් පිට වැඩිය බව පවසෙන කථා ප්‍රවෘත්තියට අපූර්ව සමානකමක් දක්වන සිදුවීමක් ජේසුස් වහන්සේ සම්බන්ධයෙන්ද පවතී. ඉලක්කම් අතර අංක හතට බුද්ධාගමේ ඉතා වැදගත් සංකේතාත්මක වටිනා කමක් හිමිවී තිබෙන

නිසා සත්පියුම් පිට වැඩීමේ සිද්ධිය සිද්ධාර්ථ කුමරා සම්බන්ධයෙන් පවතින ජනප්‍රවාද වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. සිදුහත් කුමරු සත්පියුම් පිට වැඩම කිරීම ප්‍රාතිහාර්යයක් පෑමට උන්වහන්සේ තුළ තිබූ හැකියාව පෙන්නුම් කරන බව පෝල් මුස් (Paul Mus) විසින් පෙන්වාදී තිබේ.[9] ජේසුස් වහන්සේගේ ළමා කාලය සම්බන්ධයෙන්ද මීට සමාන කථා ප්‍රවෘත්තියක් තිබේ. දරුවා ක්‍රමයෙන් වැඩී එක්වරම නිවැරදි ආකාරයෙන් පියවර හතක් ඉදිරියට ගමන් කළ සැටි Proto-gospel of James (6:1) හි දැක්වේ. ප්‍රීති ප්‍රමෝදයට පත් දරුවාගේ මව සතුටින් මෙසේ කියයි: "දෙවියනි, ඔබට ස්තුතිවේවා! මා ඔබ දේව මාලිගයට රැගෙන යනවිට ඔබ එහි පයින් යා යුතු නොවේ." මෙම ශාස්තෘවරුන් දෙදෙනා තුළ පැවති පොළොවෙන් ඉහළට නැගී සිටීමේ හැකියාව පිළිබිඹු කරන පියවර සතක් ඇවිදීම පිළිබඳ මෙම කථා දෙක අතර පැහැදිලි ආධ්‍යාත්මික සම්බන්ධතාවයක් පවතින බව පෙනේ. මෙම කථා දෙකේම ඒවායේ මතුපිටින් දක්නට ඇති රූපක අර්ථයට වඩා ගැඹුරු අර්ථයක් ගැබ්වී තිබේ.

ජේසුස් වහන්සේගේ සහ සිද්ධාර්ථ කුමරාගේ ළමා කාලය පිළිබඳව පවතින කථා ප්‍රවෘත්ති වල පුදුම සහගත සමානකම් තිබෙන බවත්, ශුභාරංචියේ පොත්වල ඓතිහාසිකත්වය පැහැදිලි කිරීම සඳහා අනාගතයේදී ඒ පිළිබඳ කරනු ලබන පර්යේෂණ වලදී එම සමානකම් කෙරෙහි මීට වඩා වැඩි අවධානයක් යොමුකළ යුතු බවත් තුන්ඩ් ප්‍රකාශ කරයි. නව තෙස්තමේන්තුවේ සමහර කොටස් දැනටමත් සවිස්තර ලෙස අධ්‍යයනය කර ඇති අතර ඒවා ලිවීමේදී බෞද්ධ කථාවස්තු සහ තොරතුරු යොදාගෙන තිබෙන බව පෙන්වා දී තිබේ. ක්‍රිස්තු භක්තිකයින් විසින් තමා අදහන ආගමේ නෛසර්ගික ලක්ෂණ ලෙස සලකනු ලබන නව තෙස්තමේන්තුවේ ඇතුළත් සමහර කොටස් කෙරෙහි කෙතරම් දුරට බුද්ධාගම බලපා තිබේද යන කාරණය පැහැදිලි කිරීම සඳහා අප විසින් සොයාගෙන ඇති කරුණු සමහරක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමු. ජේසුස් වහන්සේ දේව මාලිගයට රැගෙනයාම සහ සිමියොන්ගේ පැමිණීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය ඊට ඇතුළත් වේ.

අසිත තවුසා සහ සිමියොන්

තරුණ සිදුහත් කුමරයන්ට වයෝවෘද්ධ තාපසයකු විසින් නමස්කාර කිරීමේ සිද්ධිය සහ ලූක්ගේ ශුභාරංචියේ දැක්වෙන දේව මාලිගයට පැමිණි සිමියොන් නමැති පුද්ගලයා පිළිබඳ කථාව අතර

ආධ්‍යාත්මික සම්බන්ධතාවයක් තිබෙන බව ක්‍රිස්තියානි සහ බෞද්ධ ලිය කියවිලි පිළිබඳ විමර්ශනය කරනු ලැබූ බොහෝ විද්වත්හු කල්පනා කරති. (ලූක් 2 : 25 - 35). මහාමේරු පර්වතයේ වාසය කරන දෙවියන් ඉපිලී ගිය මහත් සතුටකින් ගී ගයමින් නටමින් ප්‍රීති ඝෝෂා කරන හැටි අසිත තවුසා දිවැසින් දුටුවේය. එසේ ප්‍රීති ඝෝෂා පැවැත්වීමට හේතුව කවරේදැ'යි ඔවුන්ගෙන් ඇසූ විට ඔවුහු මෙසේ පිළිතුරු දුන්හ: "සියලු ලෝ වැසියන්ගේ යහපත සහ අභිවෘද්ධිය පිණිස ශ්‍රේෂ්ඨවූත්, අසම සමවූත් බෝසතාණන් වහන්සේ ලුම්බිනියේ ශාක්‍ය ජනපදයේ උපත ලැබූහ. ඒ පුවත සැලවීමෙන් පසු අපි ඉමහත් සතුටටත් අමන්දානන්දයටත් පත්වීමු." ඒ ඇසූ අසිත තවුසා ශුද්ධෝදන රජතුමාගේ මාලිගයට ගොස් අලුත උපන් දරුවා, බෝසත් කුමරුව දෝතින් අල්ලා එසවූයේය. දරුවාගේ ශරීරයේ සටහන්ව තිබූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ දුටු තාපසතුමා හඬන්නට පටන් ගත්තේය. ඔහු එසේ හැඬුයේ කුමරුවාට කිසියම් අනතුරක් විය හැකි නිසාදැ'යි රැස්ව සිටි පිරිස තාපස තුමාගෙන් ප්‍රශ්න කළහ. මෙම පින්වත් කුමරුවා මතු බුදුබවට පත්වී දුක්විඳින ජනයා කෙරෙහි අනුකම්පාවෙන් දහම් දෙසන බවත්, ලොව පුරා පතළවන ආගමක් හඳුන්වා දෙන බවත්, එසේ වුවත් උන්වහන්සේගෙන් ධර්මය ඇසීමට තමාට අවස්ථාවක් නොලැබෙන බවත්, ඉන් පෙර තමාගේ මරණය සිදුවන බැවින් හැඬූ බවත් ඔහු කීවේය.

ක්‍රිස්තුස් වහන්සේගේ පහළ වීමෙන් පසුව සහ ඊට පූර්වයෙහි ලියන ලද බුද්ධ චරිතය පිළිබඳ විස්තර වල අසිත තවුසා පිළිබඳ කථා ප්‍රවෘත්තිය දක්නට ලැබේ. යටත් පිරිසෙයින් නව සහස්‍රකය ඇරඹීමට පෙර ලියන ලද ඉතා පැරණි පාලි සූත්‍රයක් වූ 'සුත්ත නිපාතයේ නාලක සූත්‍රයේ' ඒ පිළිබඳව සඳහන් වේ. කෙසේ වෙතත් බයිබලයේ දැක්වෙන කථා ප්‍රවෘත්තිය එම කථාවේ ආභාසය ලබා ලියවුන එකක් ලෙස කල්පනා කිරීමට අවශ්‍යතාවයක් නොමැති බව සමහරු තර්ක කරති. ගෙවී ගිය යුගයක් සංකේතවත් කරනු ලබන වයෝවෘද්ධ තත්වයට පත්වූ වයසක පුද්ගලයකු විසින් නව යුගයක ආරම්භය සනිටුහන් කරනු ලබන අලුත උපන් ළදරුවකුට ආශිර්වාද කිරීම කිසියම් සංස්කෘතියකට පමණක් සීමා කළ හැකි සිදුවීමක් නොවන බවත්, එය ප්‍රසිද්ධ පුද්ගලයින් කල්පිත වශයෙන් සාහිත්‍ය කෘතිවල අතිශයෝක්තියෙන් යුක්තව වර්ණනා කරනු ලබන ඕනෑම තත්වයක් යටතේ සිදුවිය හැකි පුරාකෘතික (Archetypal) සිදුවීමක් බවත් සාමාන්‍ය පිළිගැනීමය. ඇත්ත වශයෙන්ම මෙම කථා ප්‍රවෘත්ති දෙකේම පදනම් වශයෙන් දක්නට ලැබෙන පුරාකෘතික අංගය අපට මෙහිදී බැහැර කළ නොහැකිය. සෑම යුගයකටම සහ සංස්කෘතිවලට අයත් වීර පුද්ගලයින් පිළිබඳ ජනප්‍රවාද වල එන කරුණු වලට අනුව

මෙම කථාද ලියැවී තිබේ.[10] කෙසේ වෙතත් ලූක්ගේ ශුභාරංචියේ දැක්වෙන කථාවේ විස්තර සලකා බැලීමේදී ජේසුස් වහන්සේ පිළිබඳ කර ඇති කල්පිත වර්ණනාව බෞද්ධ සම්ප්‍රදායේ එන කථාව පදනම් කරගෙන ලියා ඇතිබව පෙනීයයි.

ලූක්ගේ ශුභාරංචියට අනුව ජේසුස් වහන්සේ ඉපදී දින හතලිහකට පසුව උන්වහන්සේ දෙවියන්ට කැප කරනු වස් ජෙරුසලමේ පිහිටි දේව මාලිගාව වෙත රැගෙන එන ලදී. එකල එම නගරයේ වාසය කළ සිමියොන් නම් වූ දැහැමි වයසක පුද්ගලයකුට දෙවියන් වහන්සේ විසින් අභිෂේක කරනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දක්නට පළමු ඔහුගේ මරණය සිදු නොවන බැව් ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ඔහුට දන්වා තිබුණි. සිමියොන් දේව මාලිගයට පැමිණ ළදරු ජේසු කුමරුවන් දෝතින් වඩාගෙන ගැලවුම්කරුවාණන් දෙනෙතින් දැක ගැනීම නිසා ශාන්ත සිතින් මරණයට පත්විය හැකිබව ප්‍රකාශ කරමින් දෙවියන්ට ප්‍රශංසා කළේය.

බෞද්ධ කථාවේ සහ බයිබලයේ දැක්වෙන වෘත්තාන්තයේ දක්නට ලැබෙන සමානකම් පුදුම එළවන සුලුය.[11] මෙම කථා දෙකේම දැක්වෙන්නේ ආගම ධර්මය වෙනුවෙන් තම ජීවිතය කැප කරනු ලැබූ වයෝවෘද්ධ මිනිසුන් දෙදෙනෙකු පිළිබඳවය. ඒ දෙදෙනාටම විමුක්තිය උදා කරදෙනු ලබන දරුවකුගේ උපත පිළිබඳව දෙවියන් විසින් ප්‍රකාශ කරනු ලබයි. ඔවුන් දෙදෙනාම දරුවා දෝතින් වඩාගෙන දරුවා වැඩිවියට පත්වීමට ප්‍රථම තමන් මරණයට පත්වන බවට අනාවැකි පළ කරයි. ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙන් දේව මාලිගයට පැමිණෙන සිමියොන් දරුවා ගැලවුම්කරුවාණන් වහන්සේ ලෙස හඳුනාගනී. අසිත තවුසා සිදුහත් කුමරු මතු බුදුවන බව දෙවියන්ගෙන් දැනගනී. කිසියම් පුරාකෘතික පැහැදිලි කිරීම් වලින් ඔබ්බට සිතා බැලීමේදී මෙම කථා ප්‍රවෘත්ති දෙකේම දැක්වෙන තෝරාගත් කුමරුවන් දෙදෙනාම ඉතා පැහැදිලි ලෙස දේව ස්තෝත්‍ර මගින් ප්‍රශංසාත්මකව මහත් සේ වර්ණනා කර තිබේ. කථා ප්‍රවෘත්ති දෙකේ දක්නට ලැබෙන මෙම ස්වචාරි ලක්ෂණය (Idiosyncracy) හේතු කොටගෙන ඉන්දු ආර්ය භාෂා පිළිබඳ විශේෂඥයකු වූ සංශයවාදී අදහස් දරන රිචඩ් ගාබ් පවා මෙම සමානකම් අහම්බෙන් ඇතිවූවක් නොවන බව ප්‍රකාශ කරයි. එපමණක් නොව මුල් බෞද්ධ කථාවේ දැක්වෙන බොහෝ මූලික ලක්ෂණ බයිබලයේ සඳහන් කථාවේද ඒ ආකාරයෙන්ම නොවෙනස්ව පැවතීම ඔහු තුළ විමතියක් ඇතිවීමට හේතුවී තිබේ.[12]

දරුවකු දේව මාලිගයට ගෙනැවිත් දෙවියන්ට කැප කිරීම යුදෙව්

සම්ප්‍රදායට අනුකූල නොවීමද මෙම කථා දෙක අතර පවතින අන්‍යෝන්‍යතා සම්බන්ධතාවය පැහැදිලි කරන තවත් විශේෂ ලක්ෂණයකි. යුදෙව් මෝසස්ගේ නීතිය අනුව බලාපොරොත්තු වන්නේ මවගේ පාරිශුද්ධත්වය ඔප්පු කිරීම පමණි. එසේ කිරීමේදී පියා හෝ දරුවා දේව මාලිගයට පැමිණීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, ඉන්දියාවේ පැවති සාමාන්‍ය චාරිත්‍රයට අනුව දෙවියන්ට කරනු ලබන විශේෂ ගෞරවයක් වශයෙන් අලුත උපන් දරුවා ආගමික සිද්ධස්ථානයක් වෙත රැගෙනයාම සිරිතක් වශයෙන් පැවතුණි. සිද්ධාර්ථ කුමාරයන් තම මාපියන් විසින් සිද්ධස්ථානයක් වෙත ගෙන ආ සැටි 'ලලිත-විස්තරයේ' සඳහන් වේ. අසිත තවුසා පිළිබඳ ජනප්‍රවාදයේ එන කථාව සහ පළමු දරුවා දේව මාලිගය වෙත රැගෙන ඒමේ සිද්ධිය සාධාරණීකරණය කිරීම සඳහා එසේ කිරීම යුදෙව් සම්ප්‍රදායේ පැවති චාරිත්‍රයක් ලෙස හුවා දැක්වීමට 'ලූක්' උත්සාහ කර ඇති බව පෙනේ. මෙසේ ඔහු ඉන්දියානු මුල් කථා වස්තුව හීබෲ සම්ප්‍රදායට ගැළපෙන ලෙස සකස් කර තිබේ. එනිසා මෙම කථා ප්‍රවෘත්තියට ආරෝපණය කර ඇති යුදෙව් සාංස්කෘතික ලක්ෂණ ඉවත් කරනු ලැබුවොත් එම කථා ප්‍රවෘත්තියෙන් ඉතිරිවන්නේ අසිත තවුසා පිළිබඳ ජනප්‍රවාදයේ එන කථා ප්‍රවෘත්තියේ දැක්වෙන කේන්ද්‍රීය ලක්ෂණ පමණි. ලූක් ඉන්දියානු කථාවෙන් තොරතුරු ණයට ගෙන තිබෙන බව එම කථාදෙක අතර පවතින වාචික සමානකම් සලකා බැලීමේදී පැහැදිලි වේ. අසිත තවුසා තුළ පැවති ප්‍රඥා මහිමය දෙව්ලොවට යන ගමනක් ලෙස විස්තර කර තිබේ. සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේද මෙලොව ඉපදීමට පෙර වැඩ විසුවේ තුසිත දෙව්ලොවය. ස්ථිරසාර සැබෑ තාපසයකු දිව්‍ය ලෝකයේ වාසය කිරීම සැලකිය යුත්තේ ආධ්‍යාත්මික අත්දැකීමක් වශයෙනි. මෙසේ අසිත තවුසා ශුද්ධෝදන රජතුමාගේ මාලිගයට පැමිණියේද සෘද්ධි බලයෙනි. ලූක්ගේ ශුභාරංචියට අනුව සිමියොන් දේව මාලිගයට පැමිණියේද ශුද්ධාත්මයාණන් වහන්සේගේ පෙළඹවීම නිසාය.[13]

එපමණක් නොවේ, ලූක්ට අනුව ශුභාරංචියේ කතුවරයා එම සිද්ධි මාලාව විස්තර කිරීමේදී ඒ අතරට ලඝු ගීත හෝ ආමන්ත්‍රණ යෙදීමෙන් එම කථා ප්‍රවෘත්තිය ස්වභාවික ලෙස ගලායන ආකාරයෙන් ඉදිරිපත්කර තිබේ. මෙම ලක්ෂණය කිසියම් තාලයකට ගායනා කළ හැකි රිද්මයානුකූලව ලියා ඇති කියවීමේදී ඇතිවිය හැකි වෙහෙස නැති කිරීම සඳහා බෞද්ධ සූත්‍ර වල බොහෝ විට යොදා තිබෙන ගාථා වලට නෑකම් කියයි.

ජේසුස් වහන්සේ දේව මාලිගයේදී දෙවියන්ට කැප කිරීමේ

සිද්ධියට පසුව උන්වහන්සේ දොළොස් හැවිරිදිව කල පාස්කු මංගල්‍යයට* සහභාගී වීම සඳහා ජෙරුසලමට පැමිණි අවස්ථාවේදී අතුරුදහන්වූ බව පැවසෙන කථා ප්‍රවෘත්තියක් තිබේ (ලූක් 2-41-52). තෙදිනකට පසු ජේසුස් වහන්සේගේ මාපියන් උන්වහන්සේ දේව මාලිගාවෙහි පඬිවරයින් මැද වැඩහිඳ ඔවුන් කී දේ අසමින් ඔවුන්ගෙන් ප්‍රශ්න විචාරමින් සිටිනු දැකගති. මීට සමාන බෞද්ධ කථා ප්‍රවෘත්තියක් ලලිත විස්තරයේ දැක්වේ. ඒ අනුව තරුණ සිදුහත් කුමරු මිතුරන් සමග මාලිගයෙන් පිටතට ගිය අවස්ථාවකදී අතුරුදහන්වේ. අවසානයේදී කුමරු සමාධියට සමවැදී ගසක් මුල වාඩිවී භාවනාකරන සැටි පියා දකී. මෙය සිදුවන්නේ ඉර බැසීමට ආසන්න මොහොතකදී වුවත් ගසේ සෙවනැල්ල පුදුම සහගත ලෙස ඉර මුදුන් වී ඇති වේලාවක විහිදෙන ආකාරයට විහිදී තිබේ. එම විශ්මිත දර්ශනය දැකීමෙන් පසු පියා තම පුතාට නමස්කාර කරයි. මෙම කථා ප්‍රවෘත්ති දෙකේම පුතුයා අතුරුදහන් වීමත් ඔවුන් නැවත සොයා ගන්නා විට ආගමික කටයුතු වල යෙදී සිටින බවත් දැක්වේ.

බෞද්ධ කථා ප්‍රවෘත්තියේ ආභාෂයකින් තොරව වුවත් දොළොස් හැවිරිදි ජේසුස් කුමරුවා දේව මාලිගයේ සිටි පඬිවරුන් සමග ප්‍රශ්න කිරීම පිළිබඳව ජනප්‍රවාදයක් ඇතිවීම අපට බලාපොරොත්තු විය හැකිය. එවැනි පුද්ගලයකු පරිණත තරුණයකු හෝ බුද්ධිමත් දරුවෙකු ලෙස සාම්ප්‍රදායික විශ්වාස වලට අනුරූප වේ. ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත නිරූපණය කිරීම වටා එවැනි පුරාණෝක්ති කථා ප්‍රවෘත්ති ඉක්මනින් ගොඩනැගෙන සැටි දැනගැනීම සඳහා කළ යුත්තේ එවැනි පුද්ගලයින් බුද්ධිමත් දරුවන් ලෙස නිරූපණය කර ඇති දේව කථා වලින් පිරිහිය පුරාණෝක්ති වල දැක්වෙන කථා ප්‍රවෘත්ති කියවා බැලීමෙනි. බුදුන් වහන්සේගේ චරිතය වටා ගොඩනැගී ඇති එක් ජනප්‍රවාදයකට අනුව උන්වහන්සේ මව් කුසේ සිටියදී පවා ධර්මය ඉගැන්වූ බවත්, මෙලොව බිහිවූ මොහොතේදීම තමා මනුෂ්‍යලෝකයේ ඉපදීමට හේතුවූ පරමාර්ථය ප්‍රකාශයට පත්කළ බවත් සඳහන්වේ.

මෙහිදී දක්නට ලැබෙන තවත් සමාන කමක් නම් දරුවාගේ මව ඉතා උසස් ලෙස වර්ණනා කර තිබීමයි. සිදුහත් කුමරු මාලිගාවෙන් පිටතට ගොස් පෙරළා එන අවස්ථාවකදී තරුණ කුමරියක විසින් ගෞතමයන්ගේ රූප සම්පත්තිය සහ තේජශ්‍රීය වර්ණනා කරනු ලැබීය. එම වර්ණනාව 'නිබ්බුත පද' වශයෙන් හඳුන්වනු ලැබේ. "මෙවැන්නෙක් යම් මවකට වේ නම් ඒ නිවුණේමැයි, පියෙකුට වේ නම් හේ නිවුණේමැයි, යම් ස්ත්‍රියකට සැමියෙක් වේ නම් ඒ නිවුණාමැයි," ඉහත කී වචන

* ඊශ්‍රායල් ජාතිය මිසර දේශයේ වහල් කමින් නිදහස් වීමේ සිද්ධිය සමරන වැදගත් ආගමික උත්සවයකි.

ඇසීමෙන් සිද්ධාර්ථ ගෞතමයින් එම වචන වල ගැබ්ව ඇති ගැඹුරු අර්ථය පිළිබඳ කල්පනා කර බැලූහ. නිබ්බුත යන වචනය නිවීම, පහන්වීම යනුවෙන් අර්ථ නිරූපණය කළ හැකිය. එම වචන ඇසීමෙන් උන්වහන්සේගේ සිත 'නිවන' කෙරෙහි ඇදී ගියේය. මෙලොව පවතින අප අත්විඳින 'දුක' පිළිබඳව සලකා බැලීමේදී මෙම ගීතය හේතුකොටගෙන සැබෑ විමුක්තිය නිවන් දැකීමෙන් මිස ලබා ගත නොහැකි බව අවබෝධකර ගැනීමට හේතුවිය.

මෙම කථාව කියවන විට අපට ලූක්ගේ ශුභාරංචියේ එන (11:27-28) ජේසුස් වහන්සේ විසින් අශුද්ධාත්මයක් පලවා හැරීම පිළිබඳව කථා කරමින් සිටියදී එම සිද්ධියට සෘජු සම්බන්ධතාවයක් නොමැති කාන්තාවක් විසින් ප්‍රකාශ කරන ලද වචන සිහියට නැගේ. සමූහයා කෙරෙන් එක් ස්ත්‍රියක හඬනගා "ඔබ දැරූ කුසයද, ඔබට කිරිදුන් පියයුරුද භාග්‍යවන්තයය" උන්වහන්සේට කීවාය. උන්වහන්සේද "එසේය, දෙවියන් වහන්සේගේ වචනය අසා එය පිළිපදින අය ඊටත් වඩා භාග්‍යවන්තයයි" වදාළ සේක. එහිදීත් කර තිබෙන්නේ මවගේ ශ්‍රේෂ්ඨත්වය උසස් ලෙස වර්ණනා කිරීමය. මෙහිදී ජේසුස් වහන්සේ ඇයගේ වදන්වලට ප්‍රතිචාර දක්වා තිබෙන්නේ ගැඹුරු ආගමික උපදෙසක් ඉදිරිපත් කිරීමෙනි. මෙම කථා ප්‍රවෘත්ති දෙකටම පසුබිම වී ඇති වටපිටාව සහ එමගින් ඉදිරිපත් කර ඇති ආගමික පරමාර්ථවල පුදුමාකාර සමාන කමක් දක්නට ලැබේ. මතෙව් සහ මාක් ගේ ශුභාරංචියේ පොත්වල මෙම කථා ප්‍රවෘත්තිය දක්නට නොලැබේ. වෙනත් බාහිර විස්තර ඉදිරිපත් කිරීමකින් තොරව ඔවුන් දෙදෙනාම අශුද්ධාත්මය පලවා හැරීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය පමණක් ඉදිරිපත් කර තිබේ.

මෙසේ ලූක් විසින් ප්‍රධාන කථා ප්‍රවෘත්තියට කෙලින්ම සම්බන්ධ නැති මෙම කථාව ඉදිරිපත් කරන ලද්දේ කුමන හේතුවක් නිසාද යන කාරණය පැහැදිලි නැත. කෙසේ වෙතත්, එම සිද්ධිය ඉදිරිපත් කර තිබීමෙන් මවගේ ශ්‍රේෂ්ඨත්වය වර්ණනා කරමින් ලියන ලද ලියවිල්ලක් ඊට කලින් පැවති බව පෙනේ. ශුභාරංචියේ අනෙකුත් පොත්වල දක්නට නොලැබෙන එහෙත් ලූක්ගේ ශුභාරංචියේ පමණක් දක්නට ලැබෙන මෙම අපූර්ව ලක්ෂණයට මුල්වී ඇති හේතුව පැහැදිලි කර දිය හැක්කේ එම කථා ප්‍රවෘත්තියට පදනම්වූ මුල් ලියවිල්ල බෞද්ධ මූලාශ්‍රයක් ලෙස සැලකීමෙනි.

පුනර්භවය පිළිබඳ ඉගැන්වීම

පයිතගරස්ගේ ඉගැන්වීම පිළිබඳව සලකා බැලීමේදී පුනර්භවය පිළිබඳ අදහස් ඔහු ලබා ගත්තේ ඉන්දියාවෙන් බව අපි දුටුවෙමු. පුනර්භවය පිළිබඳ බයිබලයේ සඳහන් කර තිබූ බොහෝ කරුණු ඉවත් කර ඇති නමුත් තවමත් නව තෙස්තමේන්තුවේ බොහෝ තැන්වල එම අදහස දක්නට ලැබේ. එපමණක් නොව ක්‍රිස්තියානි නොවන මෙම සංකල්පය ජේසුස් වහන්සේ විසින්ද දේශනා කර තිබෙන බව පෙනී යයි. එය සිදුවී ඇත්තේ කෙසේද? පුනර්භවය පිළිබඳ අදහස් ඊට අඩ සහස්‍රයකට පෙර පයිතගරස් ඉන්දියානු මූලාශ්‍ර වලින් ලබාගත් පරිදි ජේසුස් වහන්සේත් එම අදහස ඉන්දියාවෙන් ලබා ගත්තේද?

බයිබලයේ සඳහන් කර ඇති පුනර්භවය පිළිබඳ අදහස් නිසි ලෙස විග්‍රහ කිරීම සඳහා එකී අදහස් වලට පදනම්වූ මූලාශ්‍ර සහ සම්ප්‍රදායන් පිළිබඳ සොයා බැලීම පිණිස වෙනම පොතක් ලිවිය යුතුවේ. මෙහිදී අපට නිශ්චිත වශයෙන්ම කිවහැකි එක් කරුණක් තිබේ. එනම් පුනර්ජන්මය පිළිබඳ අදහස මනුෂ්‍ය වර්ගයා තුළ පැවති පැරණිතම විශ්වාසයක් බවය. ගල් යුගයේ ජීවත්වූ දඩයක්කාරයින් ඇදහූ ආගම් මගින් එම අදහස ශ්‍රමණවාදය (Shamansm) තුළට ඇතුල්විය.[14] පසුව එය සංචාරක එඬේරුන් අතර පැවති ජගන්මාතා පිදීමේ චාරිත්‍රයක් වශයෙන් සහ අනතුරුව මැත පෙරදිග රටවල ඇතිවූ ගුප්ත ආගම් තුළින් ව්‍යවහාරයට පැමිණියේය. මුල්කාලයේදී පුනර්භවය පිළිබඳ විශ්වාසය ඉන්දියාවේදී ඊට ආවේනික වූ ආකාරයට වර්ධනය වූ අතර එය නිරන්තරයෙන්ම ආගම හා බැඳුනු කේන්ද්‍රීය ලක්ෂණයක් වශයෙන් පැවතිණි. හෙලනීසියානු යුගවලදී දුරපෙරදිග පැවති අදහස් වලට විවෘතවීම නිසා පුනර්භවය පුනරුත්පත්තිය පිළිබඳ ඉන්දියානු අදහස් පලස්තීනයේ ප්‍රසිද්ධවන්නට පටන් ගත්තේය. මූලික වශයෙන් එකී ඉගැන්වීම ඒ පිළිබඳව මහත් උනන්දුවකින් සාකච්ඡා කරනු ලැබූ ඇලෙක්සින්ද්‍රියාව හරහා පැතිර යන්නට ඇත. පයිතගරස්ගේ අදහස්වල පුනර්ජීවනයක් ඒ කාලයේදීත් ඇතිවිය. එනිසා පුනර්භවය පිළිබඳ විශ්වාසය කෙරෙහි හෙලනිසියානු බුද්ධිමතුන් තුළ උනන්දුවක් ඇතිවීම පුදුමයට හේතුවක් නොවේ.

මේ නිසා පුනර්භවය සහ ආත්මය සංක්‍රමණය වීම පිළිබඳ අදහස සාමාන්‍ය යුදෙව් ජනතාව අතර මුල්බැස ගෙන තිබූ ජනප්‍රිය විශ්වාසයක් බව කෙනෙකුට කිව හැකිය. ඒ බව නව තෙස්තමේන්තුවේ සඳහන් වන ප්‍රකාශ ගණනාවකින්ම පැහැදිලි කළ හැකිය. වරක් උත්පත්තියෙන්ම

අන්ධව උපන් මිනිසකු පිළිබඳව ජේසුස් වහන්සේගේ ගෝලයින් විසින් උන්වහන්සේගෙන් අසනු ලැබූ ප්‍රශ්නය, එනම් එම මිනිසා අන්ධව ඉපදී ඇත්තේ ඔහු විසින් හෝ ඔහුගේ මාපියන් විසින් පව් කරන ලද නිසාද යන්න පිළිබඳව මඳක් සිතා බලන්න (ජොහාන් 9 : 2). පව් කරන ලද නිසා ඔහු අන්ධව ඉපදී ඇතැ'යි යන උපකල්පනය පිළිගත හොත් පූර්ව ජන්මයකදී පව් කරන ලද බවත්, කර්මය යනුවෙන් හැඳින්වෙන ඉන්දියානු අදහස ඊට ඇතුළත් වන බවත් ඉන් හැඟේ. කර්මය යන වචනයෙන් අදහස් වන්නේ ක්‍රියා හෙවත් කරන ලද දේය. පුනර්භවය පිළිබඳ ඉන්දියානු සංකල්පය මගින් කම්ම ඵලය පිළිබඳව එනම් (පුනර්භවය) අකුසල ක්‍රියා ඒවා සිදුකළ පුද්ගලයාගේ මෙලොව ජීවිතය කෙරෙහි බලපාන බව විශේෂයෙන්ම අවධාරණය කරයි. බුදුන්වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳව එළඹ සිටි සිහියෙන් යුතුව කටයුතු කිරීම කෙරෙහි, එනම් අප කරන සියලුම ක්‍රියා පිළිබඳව විශේෂයෙන්ම යමක් ක්‍රියාවට නැඟීමට පෙර සිදුවන අපේ සිතිවිලි සහ ප්‍රකාශ කරන වචන පිළිබඳව හොඳින් සිතාබැලීම කෙරෙහි මුල් තැන දී තිබෙන්නේ මේ හේතුව නිසාය.

නව තෙස්තමේන්තුවේ දක්නට ලැබෙන පුනර්භවය පිළිබඳ ප්‍රකට විශ්වාසය මුල් යුගවල ජීවත්වූ යුදෙව්වන්ට නුරුවූවක් නොවීය. හෙලනිසියානු දර්ශනය මගින් එම අදහස එහි බලපෑමට යටත්වූ සෙන්නු තුළ පැතිර ගියේය. පුනර්භවය නමැති සංකල්පය (ගිල්ගුල්) යුදෙව් සමාජ තුළ මුල් බැස ගත්තේ අප ජීවත්වන සහස්‍රකය ආරම්භයේදීය. නැවත නැවත මැරී මැරී උපදින කිසියම් නිශ්චිත යුදෙව් ආත්ම සංඛ්‍යාවක් දෙවියන් වහන්සේ විසින් මවන ලදැ'යි යන උපකල්පනය යටතේ පව් කිරීම නිසා ඊට ලැබෙන දඬුවමක් වශයෙන් එකී ආත්මයන් සත්ව ශරීර තුළින් නැවත උපදී. මෙම විශ්වාසයට අනුව විමුක්තිය ලබාගැනීම සඳහා මනුෂ්‍යයකුට දීර්ඝ කාලයක් තිස්සේ සිදුවන ආත්මය සංක්‍රමණය වීමේ ක්‍රියාවලියකට යටත්වීමට සිදුවේ. විමුක්තිය ලබාගත හැක්කේ ලෞකික දියුණුවේ වර්ධනය සාක්ෂාත් කරගැනීමෙන් පමණි යන අදහස තුළ ඉන්දීය සහ බෞද්ධ ආභාෂයක් තිබෙන බව පෙනීයයි. මෙම අදහස් මුල්වරට යුදෙව් ඉගැන්වීම් වලට ඇතුල් වූයේ හෙලනිසියානු යුගයේදීය.

ජීවිතය පිළිබඳ ජේසුස් වහන්සේ දැරූ අදහස් අතර නිසැකවම පුනර්භවය පිළිබඳ අදහසට වැදගත් තැනක් ලැබුණු බව පෙනේ. එයින් කරුණු දෙකක් පැහැදිලි වේ. එක්කෝ ජේසුස් වහන්සේ හෙලනිසියානු දර්ශනය ප්‍රගුණ කළ ගුරුවරයෙකු වූ බවත්, දාර්ශනික ප්‍රවේශයක් වශයෙන් උන්වහන්සේ පුනර්භවය පිළිබඳ සංකල්පය උපයෝගීකර ගත් බව හෝ එසේ නැතිනම් එය උන්වහන්සේ ඉන්දියානු මූලාශ්‍ර වලින් ලබාගත් අදහසක් බවය. කෙසේ වෙතත් පුනර්භවය පිළිබඳව ඉගැන්වීම්

උන්වහන්සේගේ ඉගැන්වීම්වලට සම්බන්ධ කර ඇති ආකාරය සහ විමුක්තිය ලබා ගැනීම සඳහා එය මූලික අංගයක් වශයෙන් යොදාගෙන ඇති ආකාරය සලකා බැලීමේදී එම විශ්වාසය ඉන්දියානු මූලාශ්‍ර වලින් ලබාගෙන ඇති බව බොහෝ දුරට විශ්වාස කිරීමට ඉඩ තිබේ. ජේසුස් වහන්සේ විසින් පුනර්ජන්මය පිළිබඳ අදහස පලස්තීන වැසියන්ට දේශනා කළ ද එම අදහස සදාචාරාත්මක ඉගැන්වීම වලට ඇතුළත් කර තිබෙන්නේත්, පිළිගැනීමට පාත්‍ර වී තිබෙන්නේත් ඉන්දියාවේ පමණි. ජේසුස් වහන්සේ විසින් දේශනා කරන ලද බෞද්ධ ඉගැන්වීම යුදෙව්වන්ට අමුතු අදහස් ලෙස හැඟී ගියේ මේ කාරණය නිසාය.

පුනර්භවය පිළිබඳ නව තෙස්තමේන්තුවේ බොහෝ තැන්වල සඳහන් වේ.[11] පුනර්භවය පිළිබඳ ප්‍රශ්නය ඉතා පැහැදිලි ස්ථාවරයක් පෙන්නුම් කරමින් ජේසුස් වහන්සේ තමන්ගේ පූර්ව ජන්මයන් සහ නැවත ඉපදීම පිළිබඳව කථා කළහ. ("ඒබ්‍රහම්ට පෙර මම වීමි" ජොහාන් 8 :58) යනුවෙන් පූර්ව ජන්මයක් පිළිබඳව උන්වහන්සේ විසින් ඉතාමත් පැහැදිලි ලෙස කර ඇති ප්‍රකාශය බුදුන් වහන්සේගේ ජීවිතය පිළිබඳව ලියැවී ඇති පැරණිතම වෘත්තාන්තයට එනම් බුදුන් වහන්සේගේ පූර්ව ජන්මයන් පිළිබඳව සඳහන් කර ඇති නිධාන කථා වලට සමාන කමක් පෙන්නුම් කරයි.

පුනර්භවය පිළිබඳ ජේසුස් වහන්සේ දැරූ අදහස් පැහැදිලි කරන ඉතාමත් වැදගත් ප්‍රකාශ කීපයක් නව තෙස්තමේන්තුවේ ජොහාන්ගේ ශුභාරංචියේ (ජොහාන් 3:1-4, 7:9-11) ආරක්ෂා වී තිබේ. එහෙත් අවාසනාවකට මෙන් පරිවර්තනය කිරීමේදී සිදුවී ඇති වැරදි නිසා ඒවායේ අර්ථය බොහෝ දුරට විකෘති වී ඇත. කෙසේ වෙතත්, ගුන්තර් ශ්වොර්ස්ගේ (Gunther Schwarz's) සුපරීක්ෂාකාරී උත්සාහය නිසා එවැනි වැරදි බොහොමයක් මගහරවා ගැනීමට හැකිවී තිබේ. ප්‍රකාශන බොහොමයක දේවධර්ම වේදීන් ග්‍රීක් පරිවර්තන වෙනුවට ශුභාරංචිය පිළිබඳ වූ මුල් ඇරමයික් ග්‍රන්ථ නව ජර්මන් අනුවාදය සඳහා පදනම් කර ගැනීමට කටයුතු කළහ. වර්ෂ ගණනාවක් තිස්සේ කරන ලද මෙම උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් ජීසස් ඉවැන්ජිලියම් (Jesus Evangelium) හෙවත් ජේසුස් වහන්සේගේ ශුභාරංචිය නමැති කෘතිය බිහිවිය." ගුන්තර් ශ්වොර්ස්ගේ තම පුත්‍රයා වූ ජෝන් ශ්වොර්ස්ගේ (Jorn Schwarz) සමග එකතුවී නිර්මාණය කරන ලද මෙම කෘතියට ශුභාරංචියේ පොත් සතරත් බයිබල් නොවන මූලාශ්‍රවලින් ලබාගත් තොරතුරුත් ඇතුළත් කර තිබේ. මෙම කෘතිය ක්‍රිස්තියානිය සහ බුදු දහම අතර පවතින සමානකම් විග්‍රහ කර බැලීමේදී ඉතා වැදගත් මූලාශ්‍රයක් ලෙස උපකාරී වේ. ජීසස් ඉවැන්ජිලියම් (Jesus Evangelium) නොහොත් ජේසුස් වහන්සේගේ

ගුහාරංචිය නැමැති මෙම පොතෙන් උපුටා දක්වන කොටස් ජීසස් ඉවැන්ජිලියම් (Je. Ev.) ලෙස කෙටියෙන් දක්වනු ලැබේ.

පුනර්භවය පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම සලකා බැලීමේදී නිවැරදි පරිවර්තනයක් මගින් උන්වහන්සේ දේශනා කළ කරුණුවල සැබෑ අර්ථය පැහැදිලි කර ගැනීමට හැකිවනු ඇත. ජේසුස් වහන්සේ අපට කරුණු කියා දීමට එවන ලද ගුරුවරයකු බව දැනගත් සැන්හෙඩ්‍රින් (Sanhedrin) හි සාමාජිකයකු වූ නිකදේමුස් එක් රැයක උන් වහන්සේ බැහැදැකීමට පැමිණියේය (Je ev. 5 : 11). බයිබලයේ සාමාන්‍ය ජර්මන් පරිවර්තනයේ ඇතුළත් නිකදේමුස් රාත්‍රී කාලයේදී ජේසුස් වහන්සේ වෙත පැමිණ ක්‍රිස්තියානිය වැළඳ ගැනීම පිළිබඳ විස්තරයේ ඇතුළත් ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද'යි සැලකෙන වචනවල අර්ථය එතරම් පැහැදිලි නැත. මිනිසෙකු ස්වර්ගයෙන් නොපැමිණියහොත් ඔහුට දෙවියන්ගේ රාජ්‍යය දැක ගැනීමට නොහැකි වනු ඇතැයි ජොහන්ගේ ශුභාරංචියේ සඳහන් කර තිබේ (ජොහන් 3:3). "මිනිසකු නැවත නූපන්නොත් ඔහුට දෙවියන්ගේ රාජ්‍යය දැක ගත නොහැකිය." පුනර්ජන්මය පිළිබඳ අදහස සම්බන්ධයෙන් පවතින සියලුම කරුණු යටපත් කිරීම සඳහා පසු කාලයේදී පල්ලිය දැඩි කැපවීමකින් යුතුව ක්‍රියා කළේය. නමුත් එම කරුණු සම්පූර්ණයෙන්ම ඉවත්කිරීමට ඔවුහු අපොහොසත් වූහ. අලුතින් එක්රැස් කර නිවැරදිව පරිවර්තනය කරනු ලැබූ ජේසුස් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශ සලකා බැලීමේදී උන්වහන්සේගේ බලාපොරොත්තු යළිත් පැහැදිලිවේ. නිකදේමුස් ජේසුස් වහන්සේගෙන් මෙසේ ප්‍රශ්න කරයි: "ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීම සඳහා ම විසින් කුමක් කල යුතුද?" ජේසුස් වහන්සේගේ පිළිතුර වූයේ "මම ඔබට මෙසේ කියමි. මිනිසකු නැවත නැවත නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට ඇතුල් වීමට නොහැකිය." නිකදේමුස් නැවත කථා කරමින් මෙසේ ප්‍රශ්න කරයි: "මිනිසකු වයසට ගිය විට නැවත නැවතත් උපදින්නේ කෙසේද? ඔහුට නැවත වරක් මව් කුසෙක පිළිසිඳ ගෙන නැවත ඉපදීමට හැකිවේද?" ජේසුස් වහන්සේ මෙසේ පිළිතුරු දුන්සේක: "පුදුම නොවන්න. ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. ඔබ නැවත නැවත ඉපදිය යුතුය." (Je ev 5 : 12-16)

මෙහිදී සැලකිල්ල යොමු වන්නේ මනුෂ්‍යයාගේ පැවැත්මේ ආරම්භය සහ අවසානය වශයෙන් ස්වර්ග රාජ්‍යයට නැවත ඇතුල් වීම පිළිබඳ ප්‍රශ්නයකි. එම ප්‍රශ්නය දෙස අප බැලිය යුත්තේ ජේසුස් වහන්සේ විසින් ජෝන් ද බැප්ටිස්ට් සහ එලිජා නැවත ඉපදී ඇති බවට කර තිබෙන ප්‍රකාශ (මතෙව් 11 : 13-15, 17 : 10-13, මාර්ක් 9 : 11-13) සහ තමන් වහන්සේම නැවත උපන් එලිජා, ජෙරමියා හෝ වෙනත්

දිවැසිවරුන් ලෙස හඳුන්වා දෙමින් කර ඇති ප්‍රකාශ සඳහන් බයිබලයේ දැක්වෙන තොරතුරු වලට අනුවය. ඒ අනුව ජේසුස් වහන්සේ විසින් සඳහන් කර තිබෙන්නේ පුනර්භවය පිළිබඳව පවතින ඉන්දියානු අදහස වූ පුද්ගලයා කායික වශයෙන් නැවත ඉපදීම බවට කිසිම සැකයක් නැත. එම පසුබිම යටතේ මේ පිළිබඳව සලකා බැලීමේදී මතෙව්ගේ ශුභාරංචියේ ජර්මන් පරිවර්තනයේ දක්නට ලැබෙන මුඛ්‍ය අර්ථය විකෘති කිරීමට හේතුවූ සුළුකට වරදක් (මතෙව් 18 : 3) නිවැරදි කළ යුතුවේ. "ඔබ වෙනස්වී කුඩා දරුවන් මෙන් නො වුවහොත් යනුවෙන්" ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලදැයි එහි සඳහන් වේ. නමුත් එහි නිවැරදි පරිවර්තනය විය යුත්තේ "ඔබ නැවත නූපන්නොත් ඔබට ස්වර්ග රාජ්‍යයට ඇතුල්විය නොහැකිය යනුවෙනි.""

අප විසින් ඉදිරියේදී නිතර නිතර සඳහන් කිරීමට බලාපොරොත්තුවන තෝමස්ගේ ශුභාරංචියේ දක්නට ලැබෙන ප්‍රකාශ කීපයකින් පැහැදිලිව මෙම අදහස ප්‍රකාශ වේ." ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක: "ඔබ ආරම්භය සොයාගෙන තිබේද, අවසානය පිළිබඳ ප්‍රශ්න කළ හැක්කේ එවිට පමණි. මන්ද ආරම්භය ඇත්තේ කොතැනකද අවසානයද එතැනම ඇත." (තෝමස් 18). මෙම අදහස තෝමස්ගේ 19 වන ප්‍රකාශයේ වඩාත් සරලව දක්වා තිබේ. තමන් වහන්සේ පහළවීමට පෙර ජීවත්වූ අය ආශිර්වාද ලද්දන් බව ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ බව එහි සඳහන් වේ (තෝමස් 49). ජේසුස් වහන්සේ මෙසේ කීහ: "හුදකලාවූත්, තෝරා ගත්තාවූත් පුද්ගලයින් ආශිර්වාද ලද්දෝ වෙති. මන්ද ඔවුන් ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීමට වරම් ලැබ ඇති නිසාය. ඔබ පැමිණියේ එහි සිටය. නැවත ඔබ ස්වර්ග රාජ්‍යයට ඇතුල් වන්නේය."

පැරණි ඉන්දියාවේ ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති විශ්වාසය වූයේ තමාට හිමි දිව්‍යමය ආත්මභාවයක් ලබා ගැනීම සඳහා තිබිය යුතු ආධ්‍යාත්මික පූර්ණත්වය සලසා ගැනීම පිණිස මනුෂ්‍යයකු බොහෝ වාර ගණනක් මනුෂ්‍ය ලෝකයේ නැවත නැවත ඉපදිය යුතු බවය. එසේ දිව්‍යමය ආත්මභාවයක් ලැබීම ආත්මය මුල් ප්‍රකෘතිය හෙවත් බ්‍රහ්මත්වයට (උත්තරීතර දිව්‍යමය තත්වයට) පත්වීමක් ලෙස ප්‍රාග් බෞද්ධ යුගයේ බිහිවූ උපනිෂද් ග්‍රන්ථ වල දැක්වේ. සර්ව බලධාරී දෙවියකු හෝ වෙනස් නොවන ආත්මයක් පැවතීම පිළිබඳ අදහස බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කළ සේක. උන්වහන්සේට අනුව ජීවිතයේ අවසාන පරමාර්ථය වූයේ 'නිවන' සාක්ෂාත් කර ගැනීමය. එනම් සත්ත්වයා සංසාර සාගරයේ ඉපදීම තුළින් වෙන් වෙන් වශයෙන් සහ අහම්බෙන් සිදුවන්නාවූ අඛණ්ඩ ප්‍රවාහය නතර කිරීමය. බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු උන්වහන්සේගේ ශ්‍රාවකයින් ලෝකයේ පැවැත්ම පිළිබඳවූ එම විප්ලවීය අදහස තරමක්

දුරට වෙනස් කළහ. ඔවුන් එසේ කරන්නට ඇත්තේ තම අති පූජනීය ශාස්තෘවරයාගේ අභාවයෙන් පසු උන්වහන්සේ සමස්ත පැවැත්මෙන් සදහටම ඉවත්ව ගොස් ඇතැයි යන අදහස පිළිගැනීම ඔවුන්ට දුෂ්කර වූ නිසා විය හැකිය. මෙසේ ආත්ම වාදය නැවත වරක් ඊට ගැළපෙන දර්ශනවාදයක්ද සමඟ අභිධර්මයේ සමහර කොටස් හරහා බුදු සමය තුළට පැල දොරින් ඇතුල්විය. බුදුන් වහන්සේ නිවන් පුරයට වැඩිය බවත් 'නිර්වාණය' යනු අපරිමිත සැපතින් පිරිගිය තත්වයක් ලෙසත් හඳුන්වනු ලැබිය. ජේසුස් වහන්සේ තම ධර්ම ප්‍රචාරක කටයුතු වල යෙදී සිටි කාලය වනවිට මෙම ඉගැන්වීම් බුදු සමයේ බලවත් ගුරු කුලයක්වූ මහායාන බුදු දහම හරහා පුළුල් ලෙස පැතිර ගොස් තිබුණි. බුදුවරු ලොව පහළ වීමට ප්‍රථම දිව්‍ය ලෝක වල වාසය කරන බවත්, පරිනිර්වාණයෙන් පසු නැවත දෙව් ලොව උපදින බවත් නැවත උන්වහන්සේලා සිය කැමැත්තෙන්ම මෙලොව පහළවන තුරු එම දිව්‍ය ලෝක වල වාසය කරන බවත් විශ්වාස කරන ලදී. පුනර්භවය අනුව සලකා බැලීමේදී ජේසුස් වහන්සේ දේශනා කළ ස්වර්ග රාජ්‍යය මහායාන බෞද්ධයන් විශ්වාස කළ බුදුවරු උපදින දිව්‍ය ලෝකයම (Buddha Heaven) බව පෙනී යයි.

ජේසුස් වහන්සේ නිකදේමුස් සමඟ කළ සාකච්ඡාවේ බෞද්ධ මුහුණුවරක් දක්නට ලැබෙන්නේ එහි අන්තර්ගතයේ පමණක් නොවේ. බයිබලයේ දැක්වෙන එම සිද්ධිය වාර්තා කර ඇති පසුබිමද බුද්ධාගමේ දැක්වෙන කථා ප්‍රවෘත්ති වලට සමාන කමක් දක්වයි. ජේසුස් වහන්සේ දේශනා කළ පුනර්භවය පිළිබඳ අදහස් පිළිගත් නිකදේමුස් උන්වහන්සේ කරා එළඹියේ රාත්‍රී කාලයේදීය. නිකදේමුස් යනු එකල පාලන සභාවේ ගෞරවයට පාත්‍ර වූ පිළිගත් සාමාජිකයකු මෙන්ම පොහොසත් තරුණයකුද විය. රාත්‍රී කාලයේදී 'යස' නැමැති තරුණයකු බුදුන් වහන්සේ බැහැ දැකීමට පැමිණි බව බෞද්ධ පොත පතේ සඳහන්වේ. බුදුන් වහන්සේ යස කුල පුත්‍රයාට මෛත්‍රිය, සදාචාරශීලීත්වය, දිව්‍යමය සම්පත් සහ විමුක්තිය සලසාගත හැකි මාර්ගය පිළිබඳව කරුණු පැහැදිලිකර දීමෙන් පසු ඔහු බුද්ධාගම වැළඳ ගත්තේය. සමහර විට ශුභාරංචිය ලියූ කතුවරයාට පුනර්ජන්මය පිළිබඳ ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ අදහස් යම්යම් කරුණු ඉගැන්වීම සඳහා ඊට උචිත පසුබිමක් තුළ ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නට ඇත. ඒ සඳහා සුදුසු ආදර්ශයක් ලෙස බුදුන් වහන්සේ සහ යස කුල පුත්‍රයා පිළිබඳ කථා ප්‍රවෘත්තිය පසුබිම් කර ගන්නට ඇතයි සිතිය හැකිය. ශුභාරංචියේ පොත්වල නිතර නිතර දක්නට ලැබෙන බෞද්ධ අදහස් සමානකම් සලකා බැලීමේදී එය එසේ වීමට බොහෝ දුරට ඉඩ තිබේ.

ෂොපන්හොවර්ගේ අවධානයට ලක්වූ පුනර්ජන්මය පිළිබඳ ඉන්දියානු අදහස් වල අර්ථකථනයක් ජේම්ස්ගේ ලිපිවල (Epistle of James 3:6) දක්නට ලැබේ. ජර්මන් පරිවර්තනයේ එය දක්වා ඇත්තේ 'ජීවන චක්‍රයේ දිව ඉදීම' (Tongue Inflaming the Circle of Life) යනුවෙනි. මෙය තවත් සදොස් පරිවර්තනයකි. එය ඇත්ත වශයෙන්ම පරිවර්තනය කළ යුත්තේ ඉපදීමේ චක්‍රය හෝ සංසාර චක්‍රය යනුවෙනි. එය නැවත ඉපදීම හෙවත් සංසාර චක්‍රය නමැති ඉන්දියානු සංකල්පයේ පදානුගත පරිවර්තනයකි. 'සංසාරය' යන වචනයේ අදහස සංක්‍රමණය වීමය. ඉන් අදහස් වන්නේ ජීවිතය යනු ඉන්ද්‍රිය ගෝචර මායාවක් පසු පස හඹා යමින් සසර සැරිසැරීම බවය. සංසාර චක්‍රය පිළිබඳ චිත්‍ර රූපය ගිනිදළු වලින් පිළිබිඹු කරමින් ශිව දෙවියන් නර්තනයේ යෙදී සිටින සැටි නිරූපණය කර ඇති සුප්‍රසිද්ධ මූර්තිය (නටරාජා) මෙහිදී අපේ මතකයට නැගේ. එහි ස්වභාවික ශක්තීන් වල ස්පන්දනය සංකේතවත් කරමින් ශිව දෙවියන් වටකර ගිනි දළු චක්‍රයක් නිරූපණය කර තිබේ (රූප රාමුව 21). හින්දු විශ්වාසයට අනුව ස්වභාවික ශක්තීන්ද මිනිස් ශරීරය මෙන් නිරන්තරයෙන් ඇතිවී නැතිවී යාමේ ධර්මතාවයට යටත් වේ. මේ නිසා ජේම්ස්ගේ ලිපියේ අඩංගු කරුණු කෙරෙහි බෞද්ධ මූලාශ්‍ර බලපා ඇති බව පෙනේ. ලිපියේ අයහපත් වචන කථා කිරීමෙන් සංසාර චක්‍රය නොනැවතී ඉදිරියට ඇදියන නිසා හික්මීමෙන් යුතුව වචන කථා කිරීමේ ඇති වැදගත්කම ඉන් කියවේ. යහපත් වචන පාවිච්චි කිරීම (සම්මා වාචා) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එක් අංගයක් බව බුදුන් වහන්සේ දේශනා කළහ.

යහපත් වචනයෙන් තොරව යහපත් සිතිවිලි සහ ක්‍රියාකාරකම් සිදුකළ නොහැකි නිසා යහපත් වචනය ඇතුළු ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිපදිනු නොලබන කිසිවකුට විමුක්තිය ලබාගත නොහැකිය. එවැනි පුද්ගලයකු විසින් නැවත වරක් සංසාර චක්‍රයේ ගිනිදැල් අවුළුවනු ලබන්නේය. ජේම්ස්ගේ ලිපියේ අඩංගු කරුණු සහ බෞද්ධ කථා අතර සමානකම් දකින බොහෝ දෙනෙකුගේ අවධානය යොමු නොවූ ප්‍රකාශයක් තිබේ: "යමෙක් වචනයෙන් සංවර වන්නේද එම පුද්ගලයා පූර්ණ මිනිසකු වන්නේය. ඔහුට තමාගේ ශරීරය පාලනය කර ගැනීමට හැකිවන්නේය." (ජේම්ස් 3 : 2). වචනයෙන් සංවර නොවීම නිසා ලැබෙන දඬුවමක් ලෙස පුනර්භවය හඳුන්වා තිබීම ගෞතමයන් වහන්සේගේ ඉගැන්වීම් ඒ ආකාරයෙන්ම යොදාගැනීමකි. "බොහෝ ඇසූපිරූ තැන් ඇතිබව, කලා ශිල්ප උගත්බව, අන්දොරින් හික්මීම සහ යහපත් වචන ප්‍රකාශ කිරීම යන මේවා උතුම් මංගල කරුණු බව මංගල සූත්‍රයේ දැක්වේ. (මංගල සූත්‍රය 5 :4). ජේම්ස්ගේ ලිපියේ දක්වා තිබෙන්නේද

ධම්මපදයේ ක්‍රෝධ වග්ගයේ දක්වා ඇති ගාථා පාඨවල එන පහත දැක්වෙන අදහස් ඒවායේ අනුපිළිවෙල වෙනස් කරමිනි: කයෙන් කෙරෙන වැරදි වලින් කය රැක ගත යුත්තේය. කය සංවර බවට පමුණුවා ගත යුත්තේය. කයෙන් සිදුවන දුසිරිත් හැර දමා කයෙන් යහපත් දෙයම කළ යුත්තේය. වචනයෙන් කියන වැරදි කථාබස් ආදියෙන් වචනය රැකගත යුත්තේය. වචනය මනා ලෙස සංවර බවට පමුණුවා ගත යුත්තේය. වාග් දුශ්චරිතයෙන් දුරු වෙමින් යහපත් වචනම භාවිතා කිරීමට පුහුණු විය යුත්තේය." (ධම්මපදය 17:11-12)

මෙම සමානකම් කොතරම් පැහැදිලිද යත් ජේම්ස්ට බෞද්ධ ග්‍රන්ථ හෝ බෞද්ධ වනපොත් සම්ප්‍රදාය හමුවූයේ කොසේදැයි කෙනෙකු ප්‍රශ්න කිරීමට පුළුවන. දිව, ගින්දර සහ සංසාර චක්‍රය අතර පවතින සම්බන්ධතාවය අවබෝධ කරගත හැකිවේ. අශෝක රජතුමා විසින් පනවන ලද නියෝග සලකා බැලීමෙන් මෙම ප්‍රශ්නයට පිළිතුරක් ලබාගැනීමට හැකිවනු ඇත.[18] අශෝක රජතුමා විසින් සේවයේ යොදවන ලද බෞද්ධ මිෂනාරීන් එතුමාගේ නියෝග එලෙසම ක්‍රියාවට නැගූහ. එම නියෝග ජේම්ස්ගේ ලිපිය ලියූ කතුවරයාට ක්‍රි. ව. පළමුවන ශතවර්ෂයේදී ඒ ආකාරයෙන්ම නැවත ඉදිරිපත් කිරීමට හැකිවිය.

මුල් ක්‍රිස්තියානි ජන කොටස් වලට අයත් පුද්ගලයින් ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳව දැන සිටියහ. පුනර්භවය පිළිබඳ අදහස ඔවුන් අතර පිළිගත් විශ්වාසයක් ලෙස පැවතුනි. ක්‍රි. ව. 553 දී සිදුකරන ලද ඓතිහාසික වරදක් හේතු කොටගෙන, එනම් කොන්ස්තන්තිනෝපල් නගරයේදී පවත්වනු ලැබූ පස් වන ක්‍රිස්තියානි ආගමික සම්මේලනයේදී (Ecumenical Council in Constantionople) පුනර්භවය පිළිබඳ විශ්වාසය මිථ්‍යා විශ්වාසයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලදී. එම තහනම අද දක්වාත් ක්‍රියාත්මක වේ.

ව්‍යාජ තවුසන් සහ දිවැසිවරුන්

ධම්මපදය ඛුද්දක නිකායට අයත් බෞද්ධ පොත් වලින් එකක් වන අතර මූලික වශයෙන් බෞද්ධ ආචාර ධර්ම පද්ධතිය එහි අඩංගු වී තිබේ. 'ධම්මපදය' යන වචනය 'සදාචාරාත්මක ක්‍රමය' හෝ 'ධර්ම නීතිය' යනුවෙන් පරිවර්තනය කළ හැකිවේ. එය බුදුන් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ ධර්ම කරුණුවල එකතුවක් බව බොහෝ දෙනෙකුගේ පිළිගැනීම වේ. ධම්මපදයේ අන්තර්ගත ගාථා 423 පැරණි සාහිත්‍යයට, විශේෂයෙන්ම ඉන්දීය සාහිත්‍යයට අයත් චමත්කාරජනක කාව්‍යමය ප්‍රකාශ

අතරට ගැනේ. ධම්මපදයේ ඉතා පැරණි සංග්‍රහයක් පදනම් කරගෙන ඉදිරිපත් කර ඇති සංස්කරණ කීපයක් තිබේ. ධම්මපදයේ පැරණිතම ග්‍රන්ථ ලියා තිබෙන්නේ පාලි භාෂාවෙනි. ඒ අතර ගන්ධාර ධම්මපදය යනුවෙන් හැඳින්වෙන ප්‍රාකෘත උපභාෂාවකින් ලියා ඇති ධම්මපදයේ පාඨාන්තරයක් ටිබෙට් බෞද්ධ ආශ්‍රමවල ආරක්ෂාවී තිබේ. එයට, ගන්ධාර ධම්මපදය යන නාමය යොදා ඇත්තේ බෞද්ධ සංස්කෘතියේ ඉතා උසස් තත්වයකට පත්ව තිබූ ගන්ධාර දේශය සැලකිල්ලට ගැනීමෙනි. එය මෙහිදී ගන්ධාරී ධම්මපදය යනුවෙන් හඳුන්වනු ලැබේ. බුදුදහම ප්‍රචාරය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පිටත්කර එවනු ලැබූ අශෝක රජතුමාගේ පුත් මිහිඳු මාහිමියන් විසින් ධම්පියාව නමින් එහි සිංහල පාඨාන්තරයක් සකස් කරන ලදී. අවාසනාවකට මෙන් එය දැනට අභාවයට ගොස් ඇත. උදාන වග්ගය ධම්මපදයේම විස්තරාත්මක සංග්‍රහයක් වේ. විසිරී පැවති මෙම උපදේශ පළමුවරට ධම්මපදය නමින් සංග්‍රහයක් වශයෙන් එකතු කර රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද යන්න කිසිවෙකු නොදනී. කිසියම් කථාවස්තුවක් පදනම් කරගෙන දේශනාකර තිබෙන සූත්‍ර දේශනා මෙන් නොව ධම්මපදය යනු බුදුන්වහන්සේගේ කෙටි දේශන වල එකතුවකි. බෞද්ධ සම්ප්‍රදායට අනුව ධර්ම විනයෙහි නා නා තැන්හි විසිර පැවති ගාථා සියල්ල එක්තැන් කොට ධම්මපදය යනුවෙන් සංග්‍රහයක් ලෙස සකස් කරන ලද්දේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව පවත්වනු ලැබූ පළමු ධර්ම සංගායනාවට පසුවය. කෙසේවෙතත්, ධම්මපදයේ පැරණිතම පොත් රචනා කර තිබෙන්නේ ක්‍රි. පූ. පළමුවන ශතවර්ෂයේදී බව කල්පනා කළ හැකිය. ඒ සම්බන්ධයෙන් පැවති මුඛ පරම්පරාගත සම්ප්‍රදාය සැලකිය යුතු තරම් කාලයක් පැරණි බව නිසැකවම කිව හැකිය. ධම්මපදයේ දැක්වෙන කරුණු ඒ ආකාරයෙන්ම අශෝක රජතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපිවල සඳහන් කර තිබීමෙන් ඒ බව පැහැදිලි වේ. ධම්මපදයේ උදාන වග්ගයේ ඇතුළත් සමහර කොටස් සහ සදාචාරාත්මක අදහස් විශාල ප්‍රමාණයක් ගුහාරංචියේ පොත්වල දක්නට ලැබෙන නිසා එම ග්‍රන්ථ දෙක පිළිබඳව මෙහිදී නිතර සඳහන් කිරීමට අපට සිදුවේ. ජේසුස් වහන්සේ විසින් දේශනාකර ඇති බොහෝ උපදෙස් මෙම බෞද්ධ ග්‍රන්ථ වල අඩංගු කරුණු මත පදනම් වී තිබෙන නිසා එසේ කිරීමට සෑහෙන තරම් හේතුවක් තිබේ.

සමහර කොටස්වල මෙම සමානකම් නිතර දක්නට ලැබෙන බව පෙනීයයි. උදාහරණයක් වශයෙන් උදාන වග්ගයේ 33 වන පරිච්ඡේදයේ බෞද්ධ ධර්ම මාර්ගය නිවැරදිව අනුගමනය කරන පුද්ගලයකු තුළ පැවතිය යුතු සදාචාරාත්මක ආකල්ප සහ මූලික ආධ්‍යාත්මික ගුණාංග වලට සමාන බොහෝ කරුණු ගුහාරංචියේ පොත්වල සඳහන් වී තිබෙන

බව දැක්විය හැකිය. එවැනි පුද්ගලයකු බ්‍රාහ්මණයකු වශයෙන් හැඳින්වේ. මෙහිදී බ්‍රාහ්මණයකු යන්න ධාර්මික පුද්ගලයකු ලෙස පරිවර්තනය කළ හැකිය. ධම්මපදය සහ ශුභාරංචිය අතර පවතින මෙම සමානකම් සලකා බැලීමේදී යටත් පිරිසෙයින් ශුභාරංචියේ ඇතුළත් කරුණුවලින් සමහර කොටස් මුඛ පරම්පරාගතව පැවති කරුණු වලට වඩා ලිඛිත පොත පතින් ලබාගෙන ඇතිබව පෙනීයයි.

ලූක්ගේ ශුභාරංචියේ ඇතුළත් කර නොමැති සමහර කරුණු මතෙව්ගේ ශුභාරංචියේ කන්ද උඩ දේශනාවේ සඳහන් කර තිබේ (මතෙව් 5 : 21- 48): "පැරැන්නන් මෙසේ කී බව ඔබ අසා ඇත... එහෙත් මම ඔබට කියමි" යනුවෙන් පටන් ගෙන දේශනා කර ඇති කරුණු හයක් මෙම කොටසට ඇතුළත් වේ. එනම් කෝපය, කාම මිථ්‍යාචාරය, දික්කසාදය, දිවුරීම, පළිගැනීම සහ සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම පිළිබඳ කරුණු සයක් ඊට ඇතුළත් වේ. දික්කසාදය පිළිබඳව ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කර ඇති කරුණු මාක්ගේ ශුභාරංචියේ දැක්වෙන කරුණුම නැවත ඉදිරිපත් කිරීමක් නිසා ඒවා නිසැකව පසෙකින් තැබිය හැකිය. ජේසුස් වහන්සේ විසින් දේශනා කර ඇති ඉතිරි කරුණු පහෙන් හතරක්ම, එනම්, පර පණ නැසීම, කාමමිථ්‍යාචාරය, දිවුරීම සහ කර්ම විපාකය යන කරුණු පැහැදිලි වශයෙන්ම බුදුන් වහන්සේ දේශනා කළ පන්සිල් වලින් ආභාෂය ලබා තිබෙන බව පැහැදිලිය. පර පණ නැසීමෙන්, නුදුන් දෙයක් ගැනීමෙන්, කාමයේ වරදවා හැසිරීමෙන්, මාංශ අනුභව කිරීම, බොරුකීම සහ රහමෙර පානයෙන් වැළකී සිටීම පංච ශීලයට ඇතුළත්වන බව මහා සුදත්ත සූත්‍රයේ දැක්වේ. (මහා සුදත්ත සූත්‍රය 1 : 16).

පංචශීලය තම ශ්‍රාවකයන් විසින් පිළිපැදිය යුතු මූලික උපදෙස් මාලාවක් බව බුදුන් වහන්සේ නිතර දේශනා කළහ. පංච ශීලය නිවැරදිව පිළිපැදීමෙන් බුදු දහමෙන් අපේක්ෂා කරනු ලබන පුද්ගලයකු තුළ පැවතිය යුතු සංවරබව, ආත්ම සංයමය ඇතිකරගෙන තිබේද යන කාරණය පැහැදිලි වේ. බාහිර ලෝකයට සම්බන්ධ දේ ඉවතලා අධ්‍යාත්මික ගුණ වගාවක් ඇතිකර ගැනීම පිළිබඳව කරුණු කියා දීමේදී ජේසුස් වහන්සේ විසින්ද එවැනි උපදෙස් දී තිබේ. වාග් සංවරය ඇතිකරගත යුතු බව ජේසුස් වහන්සේ අවධාරනයෙන් යුතුව දේශනා කර තිබේ. ඉන් අදහස් වන්නේ කෙනෙකු තම සිහිවිලි පාලනය කරගත යුතු බවය. මෙසේ ජේම්ස්ගේ ලිපිය අවසාන කර තිබෙන්නේ බෞද්ධ ග්‍රන්ථ වලින් උපුටාගත් උද්ධෘතයන් ඇතුළත් කරමිනි. ශුභාරංචියේ මෙම කොටසට ඇතුළත් වන්නේ බුද්ධාගමේ දැක්වෙන පංච ශීලයේ කොටස් පමණක් නොවේ. පහත සඳහන් කර ඇති වාක්‍ය ඛණ්ඩයෙන් ශුභාරංචිය සහ බෞද්ධ

ග්‍රන්ථ අතර ඊට වඩා වැඩි සමානකම් තිබෙන බව පෙනීයයි. බෞද්ධ ග්‍රන්ථ වල සඳහන් කරුණු සහ ශුභාරංචියේ සඳහන් කොටස් තේරුම් ගැනීම පහසුවීම පිණිස ඒවා එකිනෙකට ඉදිරියෙන් සංසන්දනාත්මකව දැක්වීමට අපි බලාපොරොත්තුවෙමු:

මෙලොව බොහෝ දෙනෙක් විශ්වාස කරන පරිදි මිනිසා පිරිසිදු වන්නේ දිය නෑමෙන් නොවේ. කුඩා වූ හෝ මහත් වූ හෝ සෑම ආකාරයේම පව් කිරීමෙන් වැළකී සිටින පුද්ගලයා ධාර්මික පුද්ගලයෙකි. මන්ද ඔහු පාපය පිළිකෙව් කරන හෙයිනි. (උදාන වර්ගය 33 : 13 ජටිල සූත්‍රය)	*කටට ඇතුල්වන සියල්ල උදරයට බැස වැසිකිළියට යන බව ඔබට වැටහෙන්නේ නැද්ද? එහෙත් කටින් පිටවන දේ නික්මෙන්නේ සිතින්ය. මිනිසා කෙලෙසනු ලබන්නේ එයින්ය.*
තමා කළ පවින් තෙමේ කිලිටු වෙයි. යමෙක් පව් නොකෙළේ නම් තෙතෙම පිරිසිදු බවට පත් වෙයි. පිරිසිදු බව හා අපිරිසිදු බව පවතින්නේ තමා කෙරෙහිමය. අනෙකකුට තව අයකු පිරිසිදු කිරීම හෝ අපිරිසිදු කිරීම කළ නොහැකිය. (ධම්මපදය 12 : 9)	*නපුරු චේතනාවලින් ඇතිවන මිනීමැරුම්, කාමරාග, සල්ලාලකම්, සොරකම්, බොරු සාක්ෂි සහ අපහාස නික්මෙන්නේ සිතින්ය. මිනිසා කෙලෙසනු ලබන්නේ මෙකී දේ වලිනි. එහෙත්, අත් නොසෝදා කෑමෙන් මිනිසා කෙලෙසනු නොලබන්නේය. (මතෙව් 15 : 17 - 20)*

වරදට වැටීමට හේතුව ඔබේ දකුණැස නම්, එය උගුලා ඉවත ලන්න. මුළු ශරීරය නිරයෙහි හෙළනු ලැබීමට වඩා ඔබේ අවයව වලින් එකක් නැතිවීම ඔබට යහපත. (මතෙව් 5 : 29) යනුවෙන් සිත් කාවදින බලවත් සංකල්ප රූපයක් මැවෙන පරිදි ශුභාරංචියේ කාම මිථ්‍යාචාරය පිළිබඳ විස්තර කෙරෙන කොටස් ඉදිරිපත් කර තිබේ. මේ ප්‍රකාශයට පදනම් වී ඇති පැහැදිලි බෞද්ධ පූර්වාදර්ශයක් උදාන වර්ගයේ දක්නට ලැබේ:[19]"යමෙක් ලෞකික ආශාවන් දුරුකර සියලු පාපයන්ගෙන් වෙන්වී රූපාරම්මන අරමුණු වලින් මිදී තෘෂ්ණාව මුලිනුපුටා දමයිද හේ බ්‍රාහ්මණයකු බව මම පවසමි" (උදාන වර්ගය 33-68).

ඉහත සඳහන් කරන ලද ජේසුස් වහන්සේගේ ප්‍රකාශවල දක්නට ලැබෙන මෙම සමානකම් සලකා බැලීමේදී බෞද්ධ භික්ෂූන් විසින් පිළිපැදිය යුතුවූ ශික්ෂා පද වචනයක් පාසා වෙනත් ස්වරූපයකින් නව

තෙස්තමේන්තුවේ ඇතුළත් කර තිබෙන බව පෙනී යයි. බෞද්ධ මූලාශ්‍රවල ඇතුළත් කට පාඩමින් දැන සිටිය යුතුවූ මෙම මධ්‍යස්ථ උපදෙස් සහ ශික්ෂා පද ජේසුස් වහන්සේ විසින් දේශනා කරන ලද සංක්ෂිප්ත නීති වාක්‍ය වශයෙන් ශුභාරංචියේ දක්වා තිබේ. ජේසුස් වහන්සේගේ ප්‍රකාශ කිසියම් කරුණක් වාචිකව දේශනා කිරීමේදී ඇතිවන ප්‍රතිඵලයක් ලෙස තිබෙන අතර බුද්ධාගමේ ප්‍රකාශ ලිඛිත ග්‍රන්ථයකින් ලබාගෙන ඇති බව පෙනේ. කරුණු සංසන්දනය කර බැලීමේදී මෙම වෙනස අප සිත තබා ගත යුතුය. ලිඛිත කරුණු කථාවකදී ඉදිරිපත් කරනු ලබන කරුණු සමග සංසන්දනය කිරීමේදී කරුණු ඉදිරිපත් කරනු ලබන ස්වරූපයේ ඇතිවිය හැකි වෙනස්කම් මෙහිදී සැලකිල්ලට ගත යුතුවේ. ජේසුස් වහන්සේගේ කථා විලාශය සම්බන්ධයෙන් මෙම කාරණය අදාල වේ. මන්ද උන්වහන්සේගේ කථා විලාශය උපමා අලංකාරෝක්ති වලින් පරිපූර්ණ හෙයිනි. ජේසුස් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශ පිළිබඳව සොයා බැලීමේදී මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂාකර බැලීමට අපි බලාපොරොත්තු වෙමු.

කන්ද උඩ දේශනාව පිළිබඳව මතෙව්ගේ ශුභාරංචියේ දැක්වෙන විස්තරයේ සඳහන් වන පරිදි ජේසුස් වහන්සේ විසින් ව්‍යාජ දිවැසිවරුන්ගෙන් ප්‍රවේශම්වන ලෙස කර ඇති අනතුරු හැඟවීම පංච ශීලයේ අඩංගු කරුණු මත පදනම් වී තිබේ. ව්‍යාජ දිවැසිවරුන්ගේ පිරිසිදු බව ප්‍රකට වන්නේ බාහිර පෙනුමෙන් පමණි; තමන් පූර්ණ ආධ්‍යාත්මික ගුණ වගාවෙන් යුක්ත වූ බව මවා පෙන්වන නමුත් ඔවුන් ඇත්ත වශයෙන්ම ආධ්‍යාත්මික වශයෙන් කිලුටුය; මිනිසුන් නපුරට පොළඹවනු ලබන කපටි පුද්ගලයින්ය. 'බොරු දිවැසිවරයන්ගෙන් පරෙස්සම් වන්න. පිටතින් බැටළුවෙස් ගෙන පැමිණියත් ඔවුහු ඇතුළතින් රෞද්‍ර වෘකයෝය.' (මතෙව් 7 : 15)

ජේසුස් වහන්සේ ජීවත් වූ කාලයේදී පලස්තීනයේ ව්‍යාජ දිවැසිවරු බොහෝ දෙනෙක් වාසය කළහ. ගෞතමයන් වහන්සේ ජීවත් වූ කාලයේදී මගධ දේශයේද එවැනි ව්‍යාජ තවුසන් විශාල සංඛ්‍යාවක් සිටියහ. දුවිලි තැවරුණු රළු වස්ත්‍ර වලින් සැරසී සිටි එවැනි ව්‍යාජ තවුසන්ගෙන් ප්‍රවේශම් වන ලෙස බුදුන් වහන්සේද අනතුරු අඟවනු ලැබීය:

"අඥානය, තාගේ ජටා වලින් ඇති ප්‍රයෝජනය කුමක්ද? තාගේ අඳුන් දිවි සමින් ඇති ප්‍රයෝජනය කුමක්ද? තාගේ සිත ඇතුළත කෙලෙසුන්ගෙන් ගහණය. එසේ තිබියදී සිවුරු පිරිකර ආදිය පමණක් ශුද්ධ කරන්නෙහිද?" (ධම්මපදය 26 : 12)

බාහිර පෙනුම නොව අභ්‍යන්තර ආධ්‍යාත්මික ගුණවගාව දියුණු කරගැනීම සඳහා උත්සාහ කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කිරීමේදී ව්‍යාජ තවුසන් පිළිබඳ කර ඇති මෙම චෝදනාව ගන්ධාරි ධම්මපදය නිර්මාණය කළ කතුවරයාට ඉතා වැදගත් සේ පෙනීගිය බව ඔහු විසින් ධම්මපදය සංස්කරණය කිරීමේදී එම ගාථාව ගන්ධාරි ධම්මපදයේ ආරම්භක ගාථාව වශයෙන් යොදා තිබීමෙන් මොනවට පැහැදිලි වේ. ජේසුස් වහන්සේ පලස්තීනයේ ජීවත්වූ කාලයේදී පැවති තත්වය මෙන් නොව මෙම සංස්කරණය සිදු කළ කාලය ආගමික නායකයින්, ගැලවුම්කරුවන් සහ දිවැසිවරුන්ගේ ස්වරූපයෙන් පෙනීසිටි ව්‍යාජ පුද්ගලයින්ගෙන් පිරුණු ආගමික උන්මාදයක් පැවති සමයක් වන්නට ඇත. ඒ නිසා ඇතිවිය හැකිව තිබූ අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා කතුවරයා විසින් මෙම ප්‍රකාශයට විශාල වැදගත්කමක් දෙන්නට ඇතැයි අපට සිතිය හැකිය.

ජේසුස් වහන්සේ විසින් තම ගෝලයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් කරන ලද අපූර්ව ප්‍රකාශයක් ජොහන්ගේ ශුභාරංචියේ දක්නට ලැබේ. ඒ අනුව ජේසුස් වහන්සේ නතානියෙල්ට කථා කළ විට ඔහු බියට පත්වී "ඔබ මා ගැන කෙසේ දන්නෙහිද"යි ජේසුස් වහන්සේගෙන් ඇසීය. ජේසුස් වහන්සේ නොපැහැදිලි පිළිතුරක් දෙමින් මෙසේ ප්‍රකාශ කරයි. "පිලිප් ඔබ කැඳවන්නටත් පෙර, ඇසතු ගස යට ඔබ සිටිනු මම දිටිමි"යි වදාළසේක. (ජොහන් 1:48)

ජේසුස් වහන්සේ කුමන අවස්ථාවකදී නතානියෙල් ඇසතු ගසක් යට සිටිනු දුටුවේ ඇයි? බුදුන් වහන්සේ සම්බුද්ධත්වය ලබාගත්තේ ඇසතු බෝරුක මුලදීය. ඇසතු ගස පිළිබඳ කර ඇති එම ප්‍රකාශයෙන් කර තිබෙන්නේ එම බෝධි වෘක්ෂය පිළිබඳව වක්‍රයෙන් සඳහන් කිරීමක්ද? සිදුහත් කුමරු සම්බුද්ධත්වයට පත්වූ අවස්ථාවේදී වැඩ සිටියේ උද්භිද විද්‍යාවේ ෆිකස් රිලිජිඕසා (Ficus religiosa) නමින් හැඳින්වෙන ඇසතු වෘක්ෂය (Fig Tree) පාමුලය. බයිබලයේ සඳහන්වන මෙම විස්තරය වැරදි ලෙස පරිවර්තනය කර ඇති බවත් ජේසුස් වහන්සේ ඇත්ත වශයෙන්ම නතානියෙල්ට ප්‍රකාශ කළේ තමා (ජේසුස් වහන්සේ) ඇසතු ගස පාමුල සිටියදී නතානියෙල්ව දුටුබව යැයි යනුවෙන් මතයක් ප්‍රකාශ කර තිබේ. එය සත්‍යයක් නම් ජේසුස් වහන්සේ භාවනානුයෝගී මුනි කෙනෙක් ලෙස පෙන්නුම් කිරීමට තුඩුදෙන සම්පූර්ණයෙන්ම අලුත් කථාවක් බිහිවනු ඇත. කෙසේ වෙතත් මෙහිදී පරිවර්තනයේ වරදක් සිදුකර ඇද්ද යන කාරණය පිළිබඳව ඒකාන්තයෙන්ම යමක් පැහැදිලි ලෙස කිව නොහැකිය.

ජේසුස් වහන්සේ විසින් ප්‍රාතිහාර්ය දැක්වීම

ආගම සම්බන්ධ වෛදික හා බ්‍රාහ්මණ විශ්වාසවල නාස්ථාවයේෂ රාශියක් බුද්ධසමය තුළ දක්නට ලැබේ. එම විශ්වාස සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ විසින් දේශනා කරන ලද කරුණු නොව උන් වහන්සේගේ දේශනා දැඩි විප්ලවීය (රැඩිකල්වාදී) අදහස් ලෙස කල්පනා කළ ශ්‍රාවකයන් විසින් පසුකාලයකදී උන්වහන්සේ දේශනා කළ ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේදී එකතු කරන ලද කරුණු බව පෙනේ. භික්ෂූන් වහන්සේලා විසින් ප්‍රාතිහාර්ය පෑම සහ සෘද්ධි බලය පෙන්වීම බුදුන්වහන්සේ අනුදැන වදාළේ නැත. කෙසේ වෙතත් භාවනානුයෝගී භික්ෂුවක් විසින් ලබා ගත හැකි සෘද්ධි බලය පිළිබඳව උන්වහන්සේ අම්බට්ඨ සූත්‍රයේ මෙසේ ප්‍රකාශ කළ බව සඳහන් වේ:

"හේ සෘද්ධිවිධි ඥානය ලබා නොයෙක් සෘද්ධි කරයි. ස්වභාවයෙන් එක් කෙනෙකුව සිට බොහෝ දෙනෙකු සේ පෙනෙයි. බොහෝ දෙනෙකු මෙන් සිට එක් කෙනෙකු මෙන් පෙනේ. අනුන් ඉදිරියේ පෙනී සිටියි. යළි නොපෙනී සිටියි. අහසෙහි මෙන් කිසිවෙක නොගැටී බිත්තියෙන්, පවුරෙන්, පර්වතයෙන් පිටතට විනිවිද යයි. දියෙහි ගිලෙන්නා සේ පොළොවෙහි ගිලෙයි. මතුවෙයි. පළක් බැඳ කුරුල්ලකු සේ අහසෙහි පියාඹා යයි."[30]

එවැනි සෘද්ධිබල ලැබීම පුද්ගලයකු ලබා ඇති ආධ්‍යාත්මික දියුණුවේ මට්ටම පැහැදිලි කරයි. නමුත් ප්‍රසිද්ධියේ සෘද්ධි ප්‍රාතිහාර්ය පෑ යුතුයයි ඉන් අදහස් නොවේ. බුදුන් වහන්සේ පසුකාලයකදීත්, යෝග සූත්‍ර රචනා කළ පාතංජලීත්, සෘද්ධි බලය නිසා උද්දාමයට පත් නොවී සිටීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කළහ. එවැනි අසාමාන්‍ය ප්‍රතිභාවක් පැවතීම පුද්ගලයකු විසින් බාහිර ලෝකය ජයගෙන තිබෙන බව පෙන්නුම් කරන සාධකයකි.

බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද වෙනත් සූත්‍රයක ඒ බව සංකේතාත්මකව පැහැදිලි කර තිබේ. තථාගතයන් වහන්සේට ආයාසයකින් තොරව, වෙනත් වචන වලින් කිවහොත් උත්සාහ කිරීමකින් තොරව ගංගා තරණය කිරීමට හැකිවිය. එසේ උත්සාහ නොකිරීම යනුවෙන් අදහස් වන්නේ ජලයෙන් ඉහළට නැගී ජලය මත පාවෙමින් ගමන් කිරීමට හැකිවීමය. බුදුන් වහන්සේ පා ගමනින් වඩින විට උන්වහන්සේගේ යටි පතුල කිසිවිටෙක පොළවේ නොගැටෙන බව සමහර කථාවල සඳහන් වේ. මීට සමාන කථා ප්‍රවෘත්තියක් ජේසුස් වහන්සේ සම්බන්ධයෙන්ද පවතී: "ජේසුස් වහන්සේ ඇවිදින විට

උන්වහන්සේගේ පතුල් පොළොවෙන් ඉහළට නැගී පාවෙන සැටි මම දුටුවෙමි. එනිසා උන්වහන්සේගේ පා සටහන් පොළොවේ සටහන් වේද'යි දැකීමට මම නිතර උත්සාහ කළෙමි. නමුත් කිසිම සටහනක් මට දැකින්නට නොලැබිණි." යනුවෙන් ඇපොක්‍රිෆල් ඇක්ට්ස් ඔෆ් ජොහන් නැමති ලියවිල්ලේ (Apocryphal Acts of John 93 : 9) සඳහන් කර තිබේ.

ජේසුස් වහන්සේ විසින් සිදුකරන ලද'යි කියවෙන ප්‍රසිද්ධ ප්‍රාතිහාර්යයන් දෙකක් නිසැකවම බෞද්ධ කථාවස්තු වලින් ලත් ආභාෂය මැනවින් පෙන්නුම් කරයි. එනම්, රොටි සහ මසුන් පිළිබඳවත්, ජේසුස් වහන්සේ ජලය මත ඇවිදීම පිළිබඳවත් පවතින ප්‍රාතිහාර්යයන් දෙකයි. සමහර විට රොටි සහ මසුන් සම්බන්ධ ප්‍රාතිහාර්යය පිළිබඳ කථාවස්තුව සුභාරංචියේ පොත් තුනකම සඳහන් වන්නේ මේ හේතුව නිසා විය හැකිය (මතෙව් 14 : 15-21, මාර්ක් 6 : 35 - 44, ලූක් 9 : 13 - 17). රොටි සහ මසුන් පිළිබඳ ප්‍රාතිහාර්යය ඉල්ලීස ජාතකයේ වර්තමාන කථාවේ ආභාෂය ලබා ලියා ඇතිබව පෙනේ. බුදුන් වහන්සේ තම පාත්‍රයේ තිබූ එක් පූපයකින් ශ්‍රාවකයින් පන්සිය නමකගේත්, ආශ්‍රමයට පැමිණ සිටි සියලු දෙනාගේත් කුසගිනි නිවූ බවත්, ඉන් අනතුරුව තවත් පූප විශාල සංඛ්‍යාවක් ඉතිරිවූ බවත් එහි සඳහන් වේ. සුභාරංචියේත්, බෞද්ධ කථාවේත් සඳහන්වන ප්‍රාතිහාර්යයන් සර්ව සම බවත්, කථාවස්තු දෙකේම සඳහන් කර ඇති සංඛ්‍යා අපූර්වාකාරයෙන් ගැළපෙන බවත් රිචර්ඩ් ගාර්බ් විසින් පෙන්වා දී තිබේ.[31] නව තෙස්තමේන්තුවේ දැක්වෙන කථාවස්තුවට අනුව ජේසුස් වහන්සේ රොටි පහකින් සහ මසුන් දෙදෙනෙකුගෙන් පන් දහසක් පමණ වූ පිරිසකගේ කුසගිනි නිවූහ. අවසානයේදී ඉතිරිවූ කෑබලි කූඩා දොළොසක් පිරවීමට ප්‍රමාණවත් විය. පන්සියයේ සංඛ්‍යාව බෞද්ධ පොත් පත්වල නිතර සඳහන් වී තිබේ. එය බයිබලයේ සඳහන් පන්දහසේ සංඛ්‍යාවට වඩා අඩුවීම බෞද්ධ කථාවස්තුවේ දැක්වෙන ප්‍රවෘත්තිය බයිබලයේ දැක්වෙන කථාවට වඩා පැරණි බවත් බෞද්ධ කථා වස්තුව බයිබලයේ කථාවස්තුවට පාදකවූ ආදර්ශයක් ලෙස යොදාගෙන ඇතිබවත් පෙන්නුම් කරන නොවරදින ලක්ෂණයකි.

දියමත ඇවිදීමට හැකිවීම බුදුන් වහන්සේ තුළ පැවති සෘද්ධි බලයන්ගෙන් එකක් බව පැරණිතම බෞද්ධ ග්‍රන්ථ දෙකක් වන දීඝ නිකායේ සහ මජ්ඣිම නිකායේ ඉතා පැහැදිලිව දක්වා තිබේ. ගෞතමයන් වහන්සේ ජලය මත ඉන් තරමක් ඉහළට නැගී ගංගානම් ගඟ තරණය කළ ආකාරය මහා වග්ගයේ විස්තර කර තිබේ. බුදුන් වහන්සේගේ කාලයේදී අධි මානසික ශක්තියක් ලෙස සලකනු ලැබූ ජලය මත ඇවිදීම ඉන්දියාවට අලුත් දෙයක් නොවිය. එසේ කළ හැකිවූ යෝගීන් ඉන්දියාවේ

විසූ බව වේද ග්‍රන්ථවල සඳහන් වේ.

බුදුන් වහන්සේ ජලය මත ඇවිදීම පිළිබඳ මහා වග්ගයේ සඳහන්වන කථා ප්‍රවෘත්තිය [22] අපි නැවත වරක් සලකා බලමු. මෙම කථා ප්‍රවෘත්තිය වෙනත් ආගමික කණ්ඩායමක ප්‍රධානියකු වූ කාශ්‍යප නමැති තාපසයකු බුදුන් සරණ යෑමේ සිද්ධිය හා සම්බන්ධකර ඉදිරිපත් කර තිබේ. මෙම සිද්ධිය ඇතිවූයේ දෙපා නොතෙමී ඇවිදීමට නොහැකි තරම් අධික ලෙස වැහි ඇද හැලුණු වස්සාන සෘතුවේදීය. එනිසා දුර බැහැර වැඩම නොකර සක්මන් භාවනාවේ යෙදීමට බුදුන් වහන්සේට අවශ්‍ය විය. මෙම වැදගත් භාවනා ක්‍රමය පිළිපැදීම සඳහා බෞද්ධ ආශ්‍රමවල විශේෂ සක්මන් මළු සකස්කර තිබේ. සක්මන් භාවනාව බාධාවකින් තොරව කරගෙන යෑමට පහසුවන පිණිස බුදුන් වහන්සේ අසාමාන්‍ය සෘද්ධි බලයෙන් පොළොවේ එක්තරා කොටසක් වතුර ගලා ඒම වළක්වා වියළිව තිබෙන්නට සැලැස්වූ සේක. තම ශාස්තෘවරයා කෙරෙහි විශේෂ උනන්දුවකින් කටයුතු කළ කාශ්‍යප තථාගතයන් වහන්සේ සැඩ පහරට අසුවී ගසාගෙන යාදෝයි බියෙන් තැතිගෙන ඔරුවක නැගී උන්වහන්සේ සොයා ගියේය. එවිට බුදුන්වහන්සේ තම දෙපා ජලයේ නොගැටෙන ලෙස ජලය මතුපිට සක්මන් කරන සැටි ඔහුට දැක ගැනීමට හැකිවිය. කාශ්‍යප කෙතරම් පුදුමයට පත්වූවේද යත් ඒ බව අදහාගත නොහී මෙසේ ප්‍රශ්න කළේය: "බුදුන් වහන්ස, ඔබ එතන සිටිනවාද? "එසේය කාශ්‍යප මම මෙහි සිටිමි"යි යනුවෙන් ප්‍රකාශ කරමින් බුදුන් වහන්සේ බියට පත්ව සිටි කාශ්‍යපයින් සහසා ඔරුවට ගොඩ වූහ. කාශ්‍යප සහ බුදුන්වහන්සේ අතර පැවති ධර්ම සාකච්ඡාවෙන් අනතුරුව තථාගතයන් වහන්සේ තුළ පැවති ආධ්‍යාත්මික ශ්‍රේෂ්ඨත්වය පිළිගෙන බුදුන් සරණ යෑමට වඩා වෙනත් විකල්පයක් කාශ්‍යපයන්ට නොතිබුණි.

ශ්‍රේෂ්ඨ බෞද්ධ සිද්ධස්ථානයක් වන සාංචි ස්තූපයේ දිය මත ඇවිදීම පිළිබිඹු කරන චිත්‍රයක් තෙලා තිබේ. මෙම ස්තූපය ගොඩනගන ලද්දේ ක්‍රි. පූ. පළමුවන සහ දෙවන ශතවර්ෂය අතර තුර කාලයේදීය. බුදුන් වහන්සේගේ ජීවිතය පිළිබඳ තොරතුරු පිළිබිඹු කරන මෙම කැටයම් මගින් මෙවැනි ජනප්‍රවාද ඉක්මනින් පැතිර යන බව පැහැදිලි වේ. මෙවැනි කථා ප්‍රවෘත්ති සාමාන්‍ය ජනවහරේ පැවති බව මෙම කැටයම් මගින් අනුමාන කළ හැකිය. මිනිසුන් බුදුන් වහන්සේට දැක්වූ මහත් ගෞරවය හේතු කොටගෙන ඒ කාලයේදී බුදුන් වහන්සේගේ රූපය සිතුවම් වලට යොදනු නොලැබීය. උන්වහන්සේගේ රූපය ඇතුළත් නොකර කථා ප්‍රවෘත්ති සිතුවම් කිරීම විශේෂ ලක්ෂණයක් විය. අමරාවතී ස්තූපයේ තෙලා ඇති රාහුල කුමරු බුදුන්වහන්සේ අභිමුඛයට පැමිණවීමේ

කථා ප්‍රවෘත්තිය පිළිබිඹු කරන චිත්‍රයේ (රූපරාමුව 24) මෙට්ට දමා සරසා ඇති හිස් අසුනකට සහ ඊට පහලින් තබා ඇති බුදුන්වහන්සේ එහි වැඩ සිටින බව සංකේතවත් කරන පතුල් දෙකක සටහනක් දැක්වෙන දෙපා තබන පා අසුනකට බොහෝ දෙනෙක් නමස්කාර කරන සැටි නිරූපනය කර තිබේ. බුදුන්වහන්සේ අධිෂ්ඨානශීලිව ජලය මත ඇවිදීමේ කථා ප්‍රවෘත්තිය ගංවතුර මැද තබා ඇති ගලින් කරන ලද හිස් පා අසුනක් මගින් සාංචි ස්තූපයේ නිරූපණය කර තිබේ. ඇත්ත වශයෙන්ම ගලින් කරන ලද මෙම ආසනයෙන් නිරූපණය කර තිබෙන්නේ බුදුන් වහන්සේ සෘද්ධි බලයෙන් මවන ලද සක්මන් මළුවය.

නව තෙස්තමේන්තුවේ දක්වා ඇති දියමත ඇවිදීමේ කථා ප්‍රවෘත්තිය මැදිහත් පාඨකයකුට තේරුම් ගැනීමට නොහැකි තරම් වූ අද්භූත ලක්ෂණ වලින් යුක්ත වේ. ජේසුස් වහන්සේ දියමත ඇවිදීම මාක් විසින් ප්‍රාතිහාර්යයක් ලෙස දක්වමින් සාධාරණීකරණය කිරීමට උත්සාහ කර තිබේ. ඔහු පළමුවෙන්ම අප විසින් සලකා බැලූ පරිදි බෞද්ධ ආභාෂය මත පදනම් වූ පන්දහසක් පමණ පිරිසකට ආහාර සපයාදීමේ ප්‍රාතිහාර්යය ඉදිරිපත් කළේය. නමුත් එම ප්‍රාතිහාර්ය ඔහුගේ ගෝලයින් තුළ සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට සමත් නොවූ බව පැහැදිලිය. "ඔවුන්ගේ මනස අඳුරුවී තිබිණි. මක්නිසාද යත් රොටි පිළිබඳ සිද්ධිය ඔවුන්ට අවබෝධ නොවූ බැවිනි" යනුවෙන් මාක්ගේ ශුභාරංචියේ සඳහන් වේ (මාක් 6 : 52). එනිසා ඊට වඩා සරල වෙනත් ප්‍රාතිහාර්යයක් මගින් උන්වහන්සේගේ ප්‍රාතිහාර්ය පෑමේ බලය පෙන්නුම් කිරීමට ජේසුස් වහන්සේට සිදුවිය. උන්වහන්සේ සිය ශ්‍රාවකයින් ඔරුවක නැගී යෑමට සලස්වා, ඔවුන්ගෙන් වෙන්වී යාඥා කිරීම පිණිස පිටත්ව ගියේය. තම අනුගාමිකයින් විල මැද දී සුළං දිශාවට විරුද්ධව ඔරු පදිමින් වෙහෙසෙනු දුටු උන්වහන්සේ මුහුද මත ඇවිදීමට පටන් ගත්තේය.

මාක්ගේ ශුභාරංචියේ දැක්වෙන මෙම කථා ප්‍රවෘත්තිය බාහිරව බලෙන් පටවන ලද එකක් බව පෙනේ. මන්ද එහි සඳහන් කර ඇති පරිදි මෙහිදී ජේසුස් වහන්සේ විසින් ප්‍රාතිහාර්ය දක්වා ඇත්තේ උන්වහන්සේ තුළ පැවති ප්‍රාතිහාර්ය පෑමට තිබූ හැකියාව පිළිබඳව තම ගෝලයින්ට පෙන්නුම් කිරීම සඳහාය. එසේ කිරීම ජේසුස් වහන්සේගේ පෞර්ෂය සහ අපේක්ෂාවන් සමග කිසිසේත් නොගැළපේ. ක්‍රිස්තුස්වහන්සේ වනාහි ප්‍රාතිහාර්ය මගින් මිනිසුන් පොළඹවා ගැනීමට උත්සාහ කළ පුද්ගලයකු හෝ එක් ප්‍රාතිහාර්යයකින් අනතුරුව තවත් ප්‍රාතිහාර්යයක් පානා විජ්ජාකාරයකු හෝ නොවීය.

බයිබලයේ ජර්මන් පරිවර්තනයට අනුව ජේසුස් වහන්සේ ජලය

මත ඇවිදින්නේ නැත. උන්වහන්සේ විසින් කරන ලද්දේ පෙරිපැටෙටික් (Peripatetic) යනුවෙන් හඳුන්වනු ලැබූ ඇරිස්ටෝටල්ගේ ශිෂ්‍යයින් කළ පරිදි ආවරණය කරන ලද සක්මන් මළුවක ඉහළ සිට පහළටත් නැවත ආපස්සටත් සක්මන් කිරීම පමණි. මෙම සක්මන් මළුව පෙරිපැටෝස් (Peripatos) නමින් හඳුන්වනු ලැබීය.[23] බුදුන් වහන්සේ භාවනාවට සමවැදී අදෘශ්‍යමාන මාර්ගයක් ඔස්සේ ගඟ තරණය කිරීම පිළිබඳ කථා ප්‍රවෘත්තියේ දක්වෙන සිදුවීම් වලට මෙම කථා ප්‍රවෘත්තිය බොහෝ දුරට සමානය.

ජේසුස් වහන්සේ මුහුද මත ඇවිදිනු දැක උන්වහන්සේගේ ශිෂ්‍යයෝ ඒ අවතාරයක යැයි සිතා බියවූහ. එකෙණෙහිම උන්වහන්සේ කර ඇති ප්‍රකාශය "ඒ මමය" (මාර්ක් 6 : 50, ජොහන් 6 : 20) යනුවෙන් කර ඇති ප්‍රකාශය බෞද්ධ කථාවට අපූර්ව සමාන කමක් දක්වයි. මෙහිදී මචිනයට පත් කාශ්‍යප අමතා බුදුන්වහන්සේ විසින් ප්‍රකාශ කළ වචනම ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින්ට ප්‍රකාශ කරයි.

දියමත ඇවිදීම ප්‍රාග් ක්‍රිස්තියානි යුගයේ පැවති යුදෙව් ආගමට අයත් නොවූ සම්පූර්ණයෙන්ම ආගන්තුක සිද්ධියක් බව නෝබර්ට් ක්ලාට් (Nobert Klatt) නමැති දේවධර්මවේදියා විසින් පැහැදිලිව පෙන්නුම් කර තිබේ. මෙම සිද්ධිය විග්‍රහ කිරීම සඳහා බොහෝ අර්ථ නිරූපණ දක්වන අය විසින් ජේබ්, ගීතාවලිය සහ හබකුක් නමැති බයිබලයේ සඳහන්වන පොත් වලින් උපුටා දක්වා ඇති කොටස් නව තෙස්තමේන්තුවේ සඳහන් කරුණුවලට සම්බන්ධ කළ නොහැකිය. බුදුන් වහන්සේ සහ ජේසුස් වහන්සේ දිය මත ඇවිදීම පිළිබඳ කථා ප්‍රවෘත්ති විශාල ප්‍රමාණයක් තිබෙන නිසා ක්ලාට් විසින් කර ඇති විග්‍රහයට අනුව ඒ පිළිබඳ ලැයිස්තුවක් පහත දක්වනු ලැබේ.[24]

1. බුදුන් වහන්සේ මෙන්ම ජේසුස් වහන්සේද හුදකලා ස්ථානයකට වී තනිව සිටීම.
2. ඒ අවස්ථාවේදී ශාස්තෘන් වහන්සේලා දෙනමම ආගමික කටයුතුවල යෙදී සිටීම. (යාඥා කිරීම / භාවනා කිරීම)
3. දෙදෙනාම ජලය මතුපිට ඉහළට සහ පහළට ගමන් කිරීම. පාලි සහ ග්‍රීක් රචනාවල ඒ සඳහා සමාන වචන යොදා තිබීම.
4. මේ කථා ප්‍රවෘත්ති දෙකේම දක්වා ඇති පරිදි ජලය රළ හෝ ඇඩි සැඩ පහරින් යුක්තවීම.
5. කථා ප්‍රවෘත්තිය ශ්‍රාවකයින් / කාශ්‍යප වෙත අරමුණු කිරීම.
6. මිනිසුන්ගෙන් පිරුණු ඔරුවක් ජලය මතුපිට තිබීම.

7. ජලය මත ඇවිදින පුද්ගලයා දැකීමෙන් ඔරුව තුළ සිටි පුද්ගලයින් විශ්මයට පත්වීම.
8. ජලය මතුපිට ඇවිදින පුද්ගලයා කවරෙක්දැ'යි ඔවුන් නොදැන සිටීම සහ ඔහු කවරෙක්දැ'යි ප්‍රශ්න කිරීම.
9. "ඒ මම යැ'යි" පවසමින් ජේසුස් වහන්සේ මෙන්ම බුදුන් වහන්සේද තමන් ඔවුනට හඳුන්වාදීම.
10. ඔරුවේ සිටි මිනිසුන්ට ජලය මත ඇවිදින පුද්ගලයා ඔරුවට නංවා ගැනීමට වුවමනාවීම.
11. ජේසුස් වහන්සේ සහ බුදුන් වහන්සේ ඔරුවට ගොඩවීම.

මෙසේ මෙම කථා ප්‍රවෘත්ති දෙකේ පවතින සමානකම් කොතරම් බහුලද යත් කථා දෙකම සර්ව සම බව පිළිගත යුතුය.

පේදුරු (Peter) ප්‍රේරිත වරයා දිය මත ඇවිදීමට උත්සාහ දැරූ බව මතෙව්ගේ ශුභාරංචියේ සඳහන් වේ (මතෙව් 14:28-23). නමුත් ඔහු ගිලෙන්නට පටන් ගනී. මෙම සිද්ධිය මාක් ගේ හෝ ජොහන් ගේ ශුභාරංචියේ පොත් වල දක්නට නොමැත. මෙම කථා ප්‍රවෘත්තිය සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ පූර්ව ජන්මයක් පිළිබඳ කථා ප්‍රවෘත්තියක් ඇතුළත් ශීලානිශංස ජාතකයේ වර්තමාන කථාවට විශ්මය ජනක ලෙස සමාන කමක් දක්වයි. "එක්තරා ශ්‍රාවකයෙක් බුදුන් වහන්සේ බැහැ දැකීම පිණිස පිටත්ව යන්නේ අචිරවතී ගං ඉවුරට ළඟාවෙයි. ඒ උපාසක තෙමේ පාරු පදින තොටියා නොදැක එවිට සිතන්නාහු මරු පාරු නැතැ'යි කිම්ද? බුද්ධාලම්බන ප්‍රීතියෙම්'යි සිතා දියට බැස ගල් පොත්තක යන්නාසේ නික්මුණහ. ගංගාව මධ්‍යයට පැමිණි කල ගඟ දැලයෙන් බිඳිනා රළ දැක බුද්ධාලම්බන ප්‍රීතිය අඩුවී ඔහු ගිලෙන්නට පටන් ගත්තේය. එහෙත් නැවත වරක් බුද්ධාලම්බන ප්‍රීතිය උපදවා ගැනීමෙන් නිරුපද්‍රිතව දිය පිටින් ගොස් ගඟ තරණය කර බුදුන් වහන්සේ බැහැ දුටහ."

ශීලානිශංස ජාතකයේ දක්වෙන උපාසක තැන හෝ ශුභාරංචියේ දක්වෙන පේදුරු යන දෙදෙනාටම අනායාසයෙන් රුදුරු ජල කඳ මතුපිට ඇවිදීමට නොහැකිවිය. එසේ කළ හැක්කේ චිත්ත ඒකාග්‍රතාවය සහ ඉද්ධි හක්තිය උසස් මට්ටමකට පුහුණු කළ ඇඩි අධිෂ්ඨාන ශක්තියකින් හෙබි ධ්‍යාන ලාභියෙකුට පමණි. පේදුරු ගිලෙන්නට පටන් ගත්තේ ඔහු අධිෂ්ඨාන ශක්තියෙන් ඌණවූ බැවිනි. "ඔබේ ඇදහිල්ල කෙතරම් හීනදැ'යි ජේසුස් වහන්සේ පේදුරුට අවලාද නගයි. මෙම කථා ප්‍රවෘත්ති දෙක සර්ව සම විය හැක්කේ එක් කථාවක් අනික් කථාවේ ආභාෂය ලබා තිබීම නිසාය.

ලිඳ ළඟ සිටි ස්ත්‍රිය

බුදුන් වහන්සේ සහ ජේසුස් වහන්සේ ලොව පහළවීම සාමාජීය වශයෙන් සලකා බැලීමේදී විප්ලවකාරී සිදුවීම වේ. ඊට හේතුව උන්වහන්සේලා දෙදෙනාම දීර්ඝ කාලයක් තිස්සේ සමාජයේ මුල්බැස ගෙන තිබූ කුල ක්‍රමයට විරුද්ධවූ හෙයිනි. වංශවත් රජ පරම්පරාවකින් පැවත එන සිද්ධාර්ථ ගෞතමයින් විසින් තමාට හිමි පාරම්පරික වරප්‍රසාද අත්හැර දැමීම අසාමාන්‍ය සිදුවීමකි. කෙසේ වෙතත් තමන් වහන්සේ විසින් පිහිටුවනු ලැබූ සම්බුද්ධ ශාසනයට ශ්‍රාවකයින් ඇතුළත් කර ගැනීමේදී බුදුන්වහන්සේට එම සමාජ තත්වය මහත් පිටුවහලක් විය. ඊට හේතුව ජීවිතය සහ ලෝකය පිළිබඳ උන්වහන්සේ දැරූ අදහස් පුද්ගලයින් අතර මතභේදයට තුඩුදිය හැකිවූයේ වී නමුත් එය එසේ නොවී සමාජයේ ප්‍රමුඛස්ථයක් දැරූ රාජ රාජ මහාමාත්‍යවරුන් හා ප්‍රභූන් ලවා උන්වහන්සේගේ දර්ශනය පිළිබඳ උනන්දුවෙන් කරුණු සිතා බැලීමට හැකිවූ හෙයිනි. අඥානයින් සහ අවබෝධයෙන් තොරවූ පුද්ගලයින් ආශ්‍රය නොකරණ ලෙසත් ඥානවන්ත පුද්ගලයන් පමණක් ආශ්‍රය කරන ලෙසත් බුදුන්වහන්සේ තම ශ්‍රාවකයින්ට අනුශාසනා කළහ.[25] නමුත් කිසිම පුද්ගලයකු හෙළාදැකිය යුතු යැයි උන්වහන්සේ ඉන් අදහස් කළේ නැත. එය පුද්ගලයකුගේ ආධ්‍යාත්මික ගුණ වගාවට ඇතිවිය හැකි බාධක වළක්වා ගැනීම සඳහා දෙන ලද උපදේශයක් පමණක් විය. "කෙනෙකුට ඥානවන්තවූත්, සෘජුවූත්, නිවැරදිවූත් මිතුරකු ලැබුනොත් ඔහු එම මිතුරා ඇසුරු කළ යුතුය. සියලු දුසිරිත් දුරු කළ යුතුය. අනුන් ගැන සැලකිලිමත් විය යුතුය. කෘතගුණ සැලකිය යුතුය. සෘජුවූත් පිරිසිදුවූත් එවැනි මිත්‍රයකු නොලැබුනහොත් තමා සතු මහා රාජ්‍යයක් අත්හැර දමනු ලබන අධිරාජයකු මෙන් සියලු දුසිරිත් දුරලා හුදකලාව විසිය යුතුය. (උදාන වග්ගය 14 : 13-14)

කෙසේ වෙතත් බුදුන්වහන්සේ හැම විටම මිනිසුන්ගේ තත්වය, පරම්පරාව හෝ කුලය පිළිබඳ නොසලකා හැමදෙනාටම එක සමාන ලෙස සැලකූහ. බුදුන් වහන්සේ තුළ පැවති මෙම සමානාත්මතා ගුණයට සම කළ හැක්කේ ජේසුස් වහන්සේ පමණි. සමාජයේ උසස් යැයි සම්මත පුද්ගලයින්ට වඩා අඩු වරප්‍රසාද ලත් කොටස් කෙරෙහි අනුකම්පා කිරීම, අලසයින්, තක්කඩියන්, බදු එකතු කරන්නන් සහ වෛශ්‍යාවන් කෙරෙහි පවා සානුකම්පිකව අවධානය යොමුකිරීම ගැන ජේසුස් වහන්සේ සමහරුන්ගේ අවලාදයට ලක්වූහ. කෙසේ වෙතත් උන්වහන්සේ තුළ පැවති මෙම ආකල්පය උන්වහන්සේ දේශනා කළ ධර්මයේ කේන්ද්‍රීය ලක්ෂණයක් නොවීය. සමාජයේ ජීවත්වූ පහත් යැයි සම්මත පුද්ගලයින්

කෙරෙහි අවධානය යොමුකිරීමෙන් උන්වහන්සේ බලාපොරොත්තුවූයේ තමන් පමණක් පිරිසිදු වූත්, නොකැළැල්වූත් පුද්ගලයින් ලෙස සලකා අහංකාර පරවශව සෙසු පුද්ගලයින්ට ගර්හා කරනු ලැබූ පරිසිවරුන්ට පාඩමක් ඉගැන්වීමටය. බුදුන් වහන්සේ පවා නිතර අවධාරණය කරමින් ප්‍රකාශ කළ "සියල්ලෝම සමානය" යන අදහස ප්‍රායෝගිකව පෙන්නුම් කිරීමට ජේසුස් වහන්සේට අවශ්‍ය විය. පටු අදහස් දරණ පුද්ගලයින් ඇසුරු කිරීම සඳහා වුවමනාවට වඩා කාලය මිඩංගු නොකිරීමට බුදුන් වහන්සේ වග බලාගත් අතර ජේසුස් වහන්සේ එවැනි පුද්ගලයින් පිළිබඳ සමාජීය අත්හදා බැලීමක් කිරීම කෙරෙහි තම අවධානය යොමු කරනු ලැබීය.

බුදුන් වහන්සේ වරක් දන් පිළිගැන්වීම සඳහා අභිසාරිකාවක් විසින් කරන ලද ආරාධනයක් පිළිගැනීම ප්‍රභූ පැලැන්තියේ පුද්ගලයන්ගේ දැඩි කෝපයට හේතුවිය. බුදුන් වහන්සේ ඔවුන්ගේ ආරාධනය ප්‍රතික්ෂේපකර අභිසරුලියකගේ ඇරයුම පිළිගත්තේ කෙසේද? බොහෝ අවස්ථාවලදී ගෞතමයන් වහන්සේ ප්‍රභූවරුන්ගේ ආරාධනාද පිළිගෙන දානය සඳහා වැඩම කළහ. එම ආරාධනා පිළිගැනීමේදී උන්වහන්සේ සමාජයේ අඩු වරප්‍රසාද ලත් පුද්ගලයින්ට මුල්තැන දීමේ ක්‍රියා පිළිවෙළක් අනුගමනය කළේ නැත. මානව සම්බන්ධතා කෙරෙහි උන්වහන්සේ දැක්වූ ආකල්පය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම දැඩි අපක්ෂපාති මුහුණු වරක් ගත්තේය. නමුත් ජේසුස් වහන්සේ සමහර අවස්ථාවලදී ආගමික බලධාරීන් කෙරෙහි දැඩි විප්ලවකාරීවූත්, අනම්‍යවූත් ආකල්පයක් දැක්වූහ. බුදුන් වහන්සේ තුළ පැවති ඉහත කී ගුණාංගය උන්වහන්සේගේ අග්‍ර ශ්‍රාවකයකු වූ ආනන්ද ස්ථවිරයන් සම්බන්ධයෙන් පවතින කථා ප්‍රවෘත්තියකින් මැනවින් පැහැදිලිවේ. ආනන්ද ස්ථවිරයන් පිටිසරබද ප්‍රදේශයක ගමන් කරමින් සිටි අවස්ථාවකදී ළිඳකින් වතුර අදිමින් සිටි ප්‍රකෘති නැමැති සැඬොල් කුලයට අයත් යුවතියක් උන්වහන්සේට හමුවිය. උන්වහන්සේ ඇගෙන් බීමට වතුර ස්වල්පයක් ඉල්ලයි. සැඬොල් කුලයට අයත් පුද්ගලයින්ට ශ්‍රමණයකු වෙත ළඟාවීමට අවසර නැති බව ඇය ආනන්ද ස්ථවිරයින්ට පවසයි. ආනන්ද ස්ථවිරයෝ ඇයට මෙසේ පිළිතුරු දෙයි. 'නැගණියනි, මා ඔබගේ කුලය හෝ පවුල පිළිබඳව ප්‍රශ්න නොකෙළෙමි. මා ඔබෙන් ඇසුවේ බීමට වතුර ස්වල්පයක් දියහැකිදැ'යි පමණි. (දිව්‍යාවදානය 217)

මාතංගි යුවතිය අයත්වූ චණ්ඩාල කුලය එකල ඉන්දියාවේ පැවති පහත්ම කුලය විය. බ්‍රාහ්මණයින් චණ්ඩාල කුලයට අයත් වූවන්ට සලකන ලද්දේ දැඩි අවඥාවෙනි. චණ්ඩාල කුලයට අයත් වූවකුගෙන් ඔවුනු කිසි දිනක වතුර බිඳක් හෝ ඉල්ලා නොගත්හ. සැඬොලකුගේ සෙවනැල්ල පවා බ්‍රාහ්මණයකු දූෂ්‍ය කිරීමට ප්‍රමාණවත් විය. බුදුදෙව් දේශයේ පැවති

සමාජ ක්‍රමය සහ ඓතිහාසික පසුබිම ඉන්දියාවේ පැවති තත්වයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වුවත්, සමාරියේ පදිංචිකරුවන්, පිලිස්තීනවරු සහ සෙයර්හි ජීවත්වූ මිනිසුන් යුදෙව් ජාතිකයන් අවඥාවෙන් යුක්තව පහත් කොට සලකනු ලැබූහ. ජෙරුසලමේ පැවති දූෂණයෙන් පිරුණු ආගමික නරාවලෙන් ඉවත්වී සමාරි වැසියන් විසින් ගැරිසිම් කන්දේ පිදුම් කිරීම සඳහා දේවස්ථානයක් පිහිටුවා ගෙන ඔවුන් සතු ආගමික වත් පිළිවෙත් ආරක්ෂාකර ගැනීමට උත්සාහ කළහ. එම ක්‍රියාව පරිසි ප්‍රධානීන්ගේ දැඩි කෝපයට හේතුවිය. එතැන් පටන් සමාරි වැසියන් අතිශයින් පිළිකුල් කටයුතු ජනකොටසක් ලෙස සලකනු ලැබිය. ඒ බව දෙවන ශත වර්ෂය ආරම්භයේදී රචිත 'උපදේශකයා හෙවත් සිරක් නමැති බයිබලයේ' ඇතුළත් පොතේ දැක්වෙන පහත සඳහන් ප්‍රකාශයෙන් පැහැදිලි වේ. "මගේ සිත පිළිකුල් කරණ මනුෂ්‍ය ජාති දෙකක් ඇත්තේය. තුන්වැන්න මනුෂ්‍ය ජාතියක් ලෙස සැලකිය නොහැකිය. ඔවුන් නම් සෙයිර් කඳුකරයේ වාසය කරන්නෝ, පිලිස්තිවරු සහ සිකෙම්හි (සමාරියේ) වාසය කරන අමන ජනයාය" (50:52)

ආනන්ද ස්ථවිරයන් සහ ප්‍රාකෘති සම්බන්ධ කථාවට සමානකමක් දක්වන දීර්ඝ කථා ප්‍රවෘත්තියක් නව තෙස්තමේන්තුවේ දක්නට ලැබේ. සමාරියේ සිකාර්නම් නගරය ආසන්නයේ පිහිටි ජාකොබ්ගේ ළිඳ අසලදී වතුර අදිමින් සිටි සමාරි ස්ත්‍රියක් ජේසුස් වහන්සේට හමුවේ (මේ කථා ප්‍රවෘත්තිය දක්නට ලැබෙන්නේ ජොහන්ගේ ශුභාරංචියේය (ජොහන් 4 : 5 - 42)) ජේසුස්වහන්සේ වතුර අදිමින් සිටි සමාරි ස්ත්‍රියගෙන් බීමට වතුර ස්වල්පයක් ඉල්ලයි. උසස් කුලයකට අයත් පුද්ගලයෙකු චකිතයකින් තොරව සමාජයේ අවඥාවට පාත්‍ර වූ පහත් යැයි සම්මත කුලයකට අයත් පුද්ගලයකුගෙන් වතුර ඉල්ලීමේදී මාතංගි ස්ත්‍රිය තුළ ඇතිවූ විම්හිතයට සමාන විම්හිතයක් සමාරි ස්ත්‍රිය තුළද ඇතිවූ බව ඇය ඊට දුන් පිළිතුරෙහි ගැබ්වී තිබේ. 'යුදෙව්වකු වන ඔබ සමාරිය ස්ත්‍රියක් වන මගෙන් බොන්නට වතුර ඉල්ලන්නේ කෙසේද'යි ඇය ප්‍රශ්න කරයි. මේ අවස්ථාවේදී ආනන්ද ස්ථවිරයන් පිළිතුරු දුන් ආකාරයටම ජේසුස් වහන්සේ විසින්ද උන්වහන්සේට ආවේනික වූ සරලවූත් සියලු අගතියෙන් තොරවූත් කෙටි පිළිතුරක් සරල උපමා කථාවක් මගින් දෙනු ඇතැ'යි පාඨකයා බලාපොරොත්තු විය හැකිය. එහෙත් සිදුවී ඇත්තේ ඊට වඩා හාත්පසින්ම වෙනස් දෙයකි. ජේසුස්වහන්සේ විසින් "මට වතුර ටිකක් දෙන්නැ'යි ඔබට කියන්නේ කවරෙක්ද කියා ඔබ දැන සිටියෙහි නම්, ඔබ ඔහුගෙන් බීමට යමක් ඉල්ලනු ඇත. එවිට ඔහු ඔබට ජීවන ජලය දෙනු ඇතැ'යි යනුවෙන් ව්‍යංගාර්ථයෙන් යුක්ත නොපැහැදිලි පිළිතුරක්ද තිබේ. එම පිළිතුර ජොහන්ට

ආවේනික වූ ක්‍රමයට කරුණු පහදමිනි. සරලවූත් නාට්‍යමය ආකාරයෙන් ඉදිරිපත් කර ඇත්තාවූත් මෙම විශේෂ කථා ප්‍රවෘත්තිය හදිසියේම ධර්මය පැහැදිලි කර දීමේ තොරතුරු විස්තරයක් ඉදිරිපත් කිරීම සඳහා එක්වරටම අනපේක්ෂිතව යොදාගෙන තිබේ. එහි සඳහන් කර ඇති සියලුම විස්තර වලින් පෙනීයන්නේ ශුභාරංචියේ කතුවරයා විසින් පුරාණෝක්තිවල දැක්වෙන ක්‍රිස්තුවරයකු පිළිබඳ ඔහු තුළ පැවති අදහස් ඉදිරිපත් කිරීම සඳහා මෙහිදී කිසියම් විස්තර මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු ඉදිරිපත් කර තිබෙන බවය. ජේසුස් වහන්සේ යනු අගතිගාමී අදහස්වලින් තොරවූ පුද්ගලයකු බව ජොහන් දැන සිටි බවත්, මෙම තේමාව ඇතුළත් කථා ප්‍රවෘත්තිය පහසුවෙන් මතක තබා ගැනීමට හැකිවන පරිදි ඔහු ඉන්දියානු කථා ප්‍රවෘත්තියක් යොදාගෙන ඇතිබවත් කෙනෙකුට සිතාගත හැකිය.

සරල කථා ප්‍රවෘත්ති සහ සරල සැසඳීම් මගින් ධර්මය දේශනා කිරීම ජේසුස් වහන්සේට ආවේනිකවූ ගති ලක්ෂණයක් ලෙස සැලකීමට ක්‍රිස්තියානි පරිසරයක වෙසෙන අපි හුරු පුරුදුවී සිටිමු. ජීවිත පරිඥානයෙන් යුතුව එවැනි සරල කථා ප්‍රවෘත්ති මගින් කරුණු අවබෝධකර දීමට උන්වහන්සේ තුළ පැවති හැකියාව සහ බුද්ධි ප්‍රභාව ඉන්විදහා දක්වයි. ඇත්ත වශයෙන්ම උන්වහන්සේ තුළ පැවති මෙම නිපුණත්වය පැහැදිලි කරන කථා ප්‍රවෘත්ති රාශියක් තිබේ. එනිසා සෑම පුද්ගලයකු විසින්ම ජේසුස් වහන්සේ විසින් දේශනා කරන ලද'යි අදා කාලයේ පටන් දැඩි භක්තියකින් යුතුව පිළිගෙන තිබූ ඇතැම් කථා ප්‍රවෘත්ති සහ උපදෙස් ඇත්ත වශයෙන්ම උන්වහන්සේ විසින් දේශනා කරන ලද හෝ භක්තිමත් ශ්‍රාවකයින් විසින් ගොතන ලද ඒවා නොවන බවත්, එකී කථා ප්‍රවෘත්ති වචනයක් වචනයක් පාසා බෞද්ධ සම්ප්‍රදායේ ආභාෂය ලබා ලියා තිබෙන බවත් දැන ගැනීම සමහරවිට ඔවුන් තුළ කිසියම් සිත් වේදනාවක් ඇති කිරීමට හේතු විය හැකිය.

මාක් සහ ලූක්ගේ ශුභාරංචියේ එන වැන්දඹුවගේ පඬුර (මාක් 12 : 41-44, ලූක් 21 : 1-4) පිළිබඳ කථා ප්‍රවෘත්තිය ඉන්දියානු ආභාෂය ලබා ලියා ඇති එවැනි කථාවකි. එම කථාවේ ඇති සරල බව සහ ජීවමාන බව නිසා ඊට පදනම් වී ඇති බෞද්ධ පූර්වාදර්ශයන්හි දැක්වෙන සමානකම් පිළිබඳ පුළුල් ලෙස පර්යේෂණ පවත්වා තිබේ. ලිප්සිග් විශ්ව විද්‍යාලයේ ආගමික ඉතිහාසය පිළිබඳ මහාචාර්යවරයකු වූ හැන්ස් හාස් මෙම මාතෘකාව පිළිබඳව ග්‍රන්ථයක් ලියා ඇත.[26] ජෙරුසලමේ භාණ්ඩාගාරයේ තබා තිබූ සම්මාදන් පෙට්ටියට මිනිසුන් මුදල් දමනු ජේසුස් වහන්සේ බලා සිටි බව නව තෙස්තමේන්තුවේ සඳහන් වේ. එක් දිළිඳු වැන්දඹුවක් පැමිණ එයට සතයක් පමණක් වටිනා තඹ සල්ලි දෙකක් දැමුවාය.[27]

පෙට්ටියට දමන කාසි පරීක්ෂාකර බලා ලද පරිත්‍යාගයේ වටිනාකම ප්‍රකාශ කිරීමේ වගකීම පැවරුන පූජකවරයකු සම්මාදන් පෙට්ටිය අසල සිටියේය. මෙහිදී ඕනෑම කෙනෙකුට කිසියම් පුද්ගලයකු විසින් එය තුළට දමනු ලැබූ මුදල් ප්‍රමාණය කොපමණදැයි දැනගත හැකිය. එය පොහොසත් පුද්ගලයකුට තම පොහොසත්කම ප්‍රදර්ශනය කිරීමට කදිම අවස්ථාවකි. දිළිඳු වැන්දඹුවට එය ලැජ්ජාවට කරුණකි. ජේසුස් වහන්සේට අවස්ථාවකි. දිළිඳු වැන්දඹුවට එය ලැජ්ජාවට කරුණකි. ජේසුස් වහන්සේට එය තම ශ්‍රාවකයින්ට උපදෙස් දීමට ලැබුණු මහගු අවස්ථාවකි.[28] එය තම ශ්‍රාවකයින්ට උපදෙස් දීමට ලැබුණු මහගු අවස්ථාවකි. පොහොසත් මිනිසෙකු තමා දිළින්දෙකු විසින් කරන සුළු පරිත්‍යාගයක් පොහොසත් මිනිසෙකු තමා ළඟ ඇති වැඩිපුර මුදල් වලින් කරනු ලබන විශාල පරිත්‍යාගයකට වඩා වටිනා බව ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින්ට ඉගැන්වූහ. එවැනි පාඩමක් ඉගැන්වීම සඳහා දිළිඳු වැන්දඹුව තම සත දෙකක් පමණක් දැමූ බව සඳහන් කිරීමට ශුභාරංචියේ කථා ප්‍රවෘත්තිය ලියූ කතුවරුන්ට කිසිම හේතුවක් නොමැත. මෙම කථා ප්‍රවෘත්තිය ඉදිරිපත් කර තිබෙන්නේ උපදේශ වාක්‍යයක් වැඩිදුර පැහැදිලි කිරීමක් වශයෙන් නම් දිළිඳු වැන්දඹුව විසින් සතයක් සම්මාදන් පෙට්ටියට දමනු ඇතැ'යි කෙනෙකුට බලාපොරොත්තු විය හැකිය. එසේ කිරීමෙන් ඇයගේ පරිත්‍යාගය පොහොසත් පුද්ගලයකුගේ පරිත්‍යාගයට වඩා උසස් බව ප්‍රකාශ කරන්නට තිබුණි. එපමණක් නොවේ, මෙම කථා ප්‍රවෘත්තියට ප්‍රස්තුත වී ඇත්තේ කිසියම් දුප්පත් පුද්ගලයකු නොව දිළිඳු වැන්දඹුවකි.

මීට සමාන බෞද්ධ කථා ප්‍රවෘත්තියක් තිබේ. එම කථා ප්‍රවෘත්තියට අනුව එක් දුප්පත් වැන්දඹු කාන්තාවක් බොහෝ දෙනෙක් රැස්වී ආගමික කටයුත්තක යෙදී සිටින ස්ථානයකට පැමිණේ. එහිදී ඇයට කෑමට ආහාර ලැබේ. බොහෝ දෙනා වටිනා වස්තූන් පූජාකරන සැටි දකින ඇය තමන්ට කිසිවක් පූජාකිරීමට නොහැකිවීම ගැන මහත් සේ කනගාටු වේ. ඒ අවස්ථාවේදී ගොම ගොඩක තිබූ අහුලාගත් තඹ කාසි දෙකක් තමා සන්තකව තිබෙන බව සිහිපත් වේ. මහත් ශ්‍රද්ධාවකින් යුක්තව ඇය එම තඹ කාසි දෙක පූජා කරයි. ඉන් ඇගේ සිතේ පහළ වූ ශ්‍රද්ධා සිසිවිලි තේරුම් ගත් රහතන් වහන්සේ නමක් පොහොසත් මිනිසුන් විසින් පූජා කරන ලද වටිනා පූජා භාණ්ඩ වලට වඩා මෙම දිළිඳු වැන්දඹුවගේ සිතේ පහළවූ ශ්‍රද්ධා චේතනාව උසස් බව විදහා දක්වමින් ගාථා ධර්මයක් දේශනා කරයි.

මෙම තේමාව පැහැදිලි කරන කථා ප්‍රවෘත්ති රාශියක් බෞද්ධ සම්ප්‍රදායේ දක්නට ලැබේ. සමස්තයක් වශයෙන් මේ පිළිබඳ පවතින බෞද්ධ කථා ප්‍රවෘත්ති එකම සිද්ධියක් විවිධ අවස්ථාවලදී විවිධාකාරයෙන් ඉදිරිපත් කර ඇති සංගීත නිර්මාණයට සමාන කළ හැකිය. එක් දුප්පත් මහලු ස්ත්‍රියක් තමන් සිඟා කා උපයාගත් මුදල් වියදම් කර බුදුන් වහන්සේ

උදෙසා පහනක් දැල්වීම පිණිස තෙල් මිලදී ගැනීම පිළිබඳ කථා ප්‍රවෘත්තියෙන්ද කෙනෙකු විසින් කරන ලද පරිත්‍යාගයක වටිනාකම මැනිය යුත්තේ එහි මුදල් අගය අනුව නොව දායකයාගේ කැපවීම හෙවත් ඔහු තුළ පවතින ශ්‍රද්ධා චේතනාව අනුවය යන අදහස පැහැදිලි කෙරේ. රජුන් විසින් දල්වන ලද බොහෝ පහන් වලින් විහිදෙන ආලෝකයට වැඩි ආලෝකයක් ඇය විසින් දල්වන ලද තනි පහනෙන් විහිදේ.[29] තවත් කථා ප්‍රවෘත්තියකට අනුව දුප්පත් කාන්තාවක් තම දෝතින් පුදන මල් ස්වල්පයක් පොහොසත් මිනිසුන් විසින් බුදුන් උදෙසා පූජාකරනු ලබන ධාන්‍ය බුසල් දස දහසකට වඩා වටිනා බව ප්‍රකාශ කෙරේ. බොහෝ බෞද්ධ කථාවස්තු වල දුප්පත් මිනිසුන් විසින් ශ්‍රද්ධාවෙන් කරනු ලබන පූජාවල අගය විස්තර කර තිබේ. කුසල් කිරීමෙන් ලැබිය හැකි සැප සම්පත් පිළිබඳව එම කථාවල දක්වේ. ඉහත සඳහන් කළ රහතන් වහන්සේ නමකට තඹ කාසි දෙකක් පූජා කළ දුප්පත් වැන්දඹුව සිය නිවස බලා පිටත්ව යන අතරමගදී මිය ගිය සිය බිසව භූමිදාන කර මාලිගය කරා ගමන් කරන රජතුමාට හමුවේ. රජතුමා ඇය තම නව බිසව වශයෙන් තෝරා ගනී.

බෞද්ධ කථා වස්තුව සහ ශුභාරංචියේ දැක්වෙන විස්තර වල අන්තර්ගතය, අභිප්‍රාය සහ රචනා විලාශය අතර පවතින සමානකම් කෙතරම් සිත් කාවදින සුලුද යත් මහාචාර්ය හැන්ස් හෑස් තම අධ්‍යයනය සමාප්ත කර තිබෙන්නේ පහත සඳහන් ප්‍රකාශය කරමිනි.

මේ කාරණය අප විසින් තේරුම් ගත යුත්තේ ජේසුස් වහන්සේ විසින් කාව්‍යමය විලාශයෙන් දේශනා කළ ඉගැන්වීම් අනුව සකස් කරන ලද උන්වහන්සේගේ ජීවන චරිතය පිළිබඳ කථා ප්‍රවෘත්ති වශයෙන් හෝ වෙනස් කරන ලද උපදේශ කථා වශයෙන් නොව මුල් ක්‍රිස්තියානි ආගම තුළට පිටතින් පැමිණි ජනප්‍රවාද වශයෙනි. එම කථා ප්‍රවෘත්ති ක්‍රිස්තියානි ආගමට ඇතුල් වූයේ බෞද්ධ සම්ප්‍රදාය තුළින් බව විශ්වාස කිරීමට හේතු තිබේ. එවා ශාස්තෘන් වහන්සේගේ ජීවිතයේ ඇතිවූ සරල සිදුවීම් ලෙස යහපත් චේතනාවෙන් යුක්තව ඉදිරිපත් කරනු ලැබීමය . එම කථා ප්‍රවෘත්ති ලූක් විසින් ශුභාරංචිය රචනා කරන තුරු ක්‍රිස්තියානි ජන සමාජයේ දිගටම පැවතුනි. ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ ලූක්ගේ ශුභාරංචියේ දැක්වෙන කරුණු ඊට වඩා පරිපූර්ණ වූ ශුභාරංචියේ දෙවන පොත ලිවීම සඳහාද උපයෝගීකර ගන්නා ලදී.[30]

නව තෙස්තමේන්තුවේ දැක්වෙන වාක්‍යාන්තමය කථා ප්‍රවෘත්ති වලින් ණයට ගෙන ඇති කථා ප්‍රවෘත්ති කීපයක් පමණක් මෙහිදී අප විසින් තෝරා ගෙන තිබේ. රුඩොල්ෆ් සෙයිඩල් විසින් ලියන ලද මහත්

පිළිගැනීමට පාත්‍ර වූ ග්‍රන්ථයේ සමාන කථා ප්‍රවෘත්ති පනස් එකකට නොඅඩු සංඛ්‍යාවක් ඒ පිළිබඳව කරන ලද ගැඹුරු විග්‍රහයක්ද සහිතව ඉදිරිපත් කර තිබේ. දේව ධර්ම වේදියකු වන වැන්ඩන් බර්ග් වැන් අයිසින්ගර් විසින් පහත දැක්වෙන කථා ප්‍රවෘත්ති එකොළහෙන් මෙම සමානකම් විශේෂයෙන් පැහැදිලි වන බවත්, තවත් අතිරේක කථා ප්‍රවෘත්ති හයක් කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම වටිනා බවත් සඳහන් කර තිබේ. එම කථා ප්‍රවෘත්ති නම්:

1. සිමියොන් පිළිබඳ කථාව
2. දොළොස් හැවිරිදි ජේසුස් වහන්සේ දේව මාලිගයට පැමිණීම
3. මතෙව්ගේ ශුභාරංචිය සහ හෙබ්‍රෙව්වරුන් වෙත යැවූ හසුනට අනුව බෞතීස්ම කිරීම පිළිබඳ ජේසුස් වහන්සේ තුළ ඇතිවූ පැකිලීම.
4. යක්ෂයා විසින් ජේසුස් වහන්සේ පෙළඹවීමට උත්සාහ කිරීම
5. මරියතුමියගේ ආශිර්වාදය
6. වැන්දඹුවගේ පඬුර
7. ජේසුස් වහන්සේ දියමත ඇවිදීම
8. ළිඳ ළඟ වතුර අදිමින් සිටි සමාරිය ස්ත්‍රිය
9. "මා කෙරෙහි අදහන්නා තුළින් ජීවනදායක ජලධාරා ගලන්නේය." යනුවෙන් ජොහන්ගේ ශුභාරංචියේ ඇතුළත් ප්‍රකාශය (ජොහන් 7 : 38)
10. රන්කාසි පිළිබඳ උපමාව (මතෙව් 25 : 14-30, ලූක් 19 : 12-27)
11. පේදුරුගේ දෙවන ලිපියේ සඳහන් 'ලෝකය ගින්නෙන් දැවේ' යන කථා ප්‍රවෘත්තිය. (3 : 8-11)

ඉහත සඳහන් කථා ප්‍රවෘත්ති එකොළහ තරම් වැදගත් නොවූවත් තවත් කථා ප්‍රවෘත්ති හයක් ඉදිරිපත් කර ඇත. එනම්:

1. ජේසුස් වහන්සේගේ උපත පිළිබඳව දැනුම් දීම (ලූක් 1 : 29-33)
2. ජේසුස් වහන්සේ විසින් මුල් ශ්‍රාවක පිරිස තෝරා ගැනීම (ජොහාන් 1 : 35-43)
3. නතානියෙල් පිළිබඳ ප්‍රකාශය
4. නාස්තිකාර පුත්‍රයා පිළිබඳ කථාව (ලූක් 15 : 11-32)
5. අන්ධව උපන් මිනිසා පිළිබඳ කථා ප්‍රවෘත්තිය
6. ජේසුස් වහන්සේගේ රූප විපර්යාසය (මතෙව් 17 : 1-13, මාක් 9 : 2-13, ලූක් 9 : 28-36)

මෙම කථා ප්‍රවෘත්ති සංශයවාදී ලෙස සලකා බැලීමේදී ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් පවතින ජීවන ප්‍රවෘත්ති, උපදේශ කථා සහ කථා ප්‍රවෘත්ති හුදු මනඃකල්පිත තොරතුරු ලෙස උපකල්පනය කළ යුතුද? බෞද්ධ කථාවස්තු වලින් පමණක් නොව වෙනත් මූලාශ්‍ර වලින්ද එවැනි තොරතුරු ණයට ගෙන තිබෙන බව නිසැකවම ප්‍රකාශ කළ හැකිය. ශුභාරංචිය රචනා කළ කතුවරයින් පුළුල් ක්ෂේත්‍රයක් තුළ හෙලනිසියානු උරුමයෙන් ආභාසය ලැබූ බව පැහැදිලි වේ. ඔවුහු පුළුල් ක්ෂේත්‍රයක් තුළ පැතිර තිබූ ලිඛිත කථා ප්‍රවෘත්ති සහ විස්තර මෙන්ම විවිධ ජාතීන්ට අයත් සම්ප්‍රදායන්ගෙන්ද නිදහසේ කරුණු උකහා ගත්හ. ක්‍රිස්තියානිය මගින් තොරතුරු ණයට ගෙන තිබෙන ආකාරය සලකා බැලීමේදී ජේසුස් වහන්සේ ගැලවුම්කාරයාණන් ලෙස නිරූපණය කිරීම පිණිස යුදෙව් ශුද්ධ ග්‍රන්ථ සහ විශේෂයෙන්ම දිවැසිවරුන් පිළිබඳව සඳහන් කිරීම අවශ්‍ය විය. ශුභාරංචිය රචනා කිරීමේ වගකීම පැවරුණු ජේසුස් වහන්සේ සම්බන්ධ ආගමික ව්‍යාපාරයේ නියෝජිතයින් මූලික වශයෙන් උනන්දුවක් දක්වන ලද්දේ ස්වතන්ත්‍රවාදී අලුත් ආගමක් ස්ථාපිත කිරීමට නොව එකල පැවති යුදෙව් ආගම ප්‍රතිසංස්කරණය කිරීම බව පෙනේ. කෙසේ වෙතත්, ජේසුස් වහන්සේගේ චරිතාපදානය රචනා කිරීම විවිධ සම්ප්‍රදායන්ට අයත් කථා ප්‍රවෘත්ති මාලාවක් පිළිවෙළකින් තොරව ගොනු කිරීමෙන් පමණක් කළ හැකි කාර්යයක් නොවේ. එය විවිධ සම්ප්‍රදායන්ට අයත් කරුණු ඇතුළත් බහු ව්‍යුහ සංස්කෘතික ජාලයකින් තෝරාගත් කරුණු යෝග්‍ය සන්දර්භ රටාවකට අනුව අනුපිළිවෙළින් සකස් කළ යුතුවූ දුෂ්කර ශාස්ත්‍රීය ක්‍රියාවලියකි.

මාක් විසින් ශුභාරංචිය ලියා ඇති ආකාරය අනුව එම ප්‍රවේශය පැහැදිලි කළ හැකිය. ඒ අනුව ආශ්‍රිත මූලාශ්‍ර එක්තැන් කොට එකලාව වෙසෙමින් මාක් විසින් ශුභාරංචිය පිළිබඳ පොත රචනා කර තිබෙන බව පර්යේෂණ මගින් තහවුරු කර තිබේ. මෙසේ ශුභාරංචියේ පොත ලිවීමේදී මාක් විසින් ජේසුස් වහන්සේගේ සම්පූර්ණ දේශනා අඩංගු නොවූ දේශනා සංග්‍රහයක්, උපමා කථා, දිවැසිවරුන් විසින් ප්‍රකාශ කරණ ලද ඉගැන්වීම් ඇතුළත් බයිබලයේ පැරණි තෙස්තමේන්තුවේ ඇතුළත් පොත් සහ ක්‍රිස්තු ලබ්ධිය පිළිබඳ ලියා තිබූ වෙනත් ලේඛනද ආශ්‍රය කර ගන්නට ඇතැයි සිතිය හැකිය. එපමණක් නොව, යුදෙව් සහ හෙලනිසියානු ශාස්ත්‍රීය ග්‍රන්ථ මෙන්ම බෞද්ධ පොත පතද ඔහුගේ පුස්තකාලයේ තිබෙන්නට ඇත. මාක් විසින් ශුභාරංචිය ලියූ කාලය විවිධ අදහස් පිළිබඳ ජීවමාන සංවාදයක් පැවතියාවූත්, ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ පර්යේෂණ කිරීම සාමාන්‍ය සම්ප්‍රදායක්ව පැවතියාවූත් යුගයක් ලෙස ආගම් පිළිබඳ ඉතිහාසඥයකුවූ බර්ටන් එල්. මැක් විසින් හඳුන්වාදී

තිබේ.[31] මාක්ට පසුව ශුභාරංචිය පිළිබඳ පොත් ලියූ මතෙව්, සහ ලූක්ට මාක් විසින් ලියන ලද ශුභාරංචිය පිළිබඳ පොතේ අඩංගු කරුණු ඔවුන්ට අභිමත පරිදි ප්‍රයෝජනයට ගැනීමට හැකිවිය. මාක් මෙන්ම මේ දෙදෙනාද විවිධ මූලාශ්‍ර වලින් කරුණු තෝරාගෙන ශුභාරංචියේ පොත් ලියා ඇතිබව පෙනේ. එපමණක් නොව, පුරාණ ක්‍රිස්තියානි දර්ශනවාදය (Gnosticism) සහ මහායාන බුද්ධ ධර්මය හා සම්බන්ධ ඇතැම් කරුණු ඇතුළත් කරමින් තමාටම ආවේනිකවූ සම්ප්‍රදායකට හැකම් කියන, පසුකාලයේදී ජොහන් විසින් ලියන ලද ශුභාරංචියේ පොත සම්බන්ධයෙන්ද මේ කාරණය සත්‍යවේ. ඒ පිළිබඳ වැඩිදුර විස්තර පසුව සලකා බලනු ලැබේ.

ශුභාරංචිය පිළිබඳ පොත් ලියූ කතුවරයින් බුදුන් වහන්සේ පිළිබඳව පවතින ජනප්‍රවාද ඒ සඳහා සෘජුවම යොදාගෙන නොමැති බවත්, බෞද්ධ කථාවල ඇතුළත් තේමාව සහ රාමුව ප්‍රයෝජනයට ගෙන ක්‍රිස්තියානිව ආවේනික වූ කාව්‍යමය ශෛලියකින් ලියා තිබූ ක්‍රිස්තියානි ආගම පිළිබඳ ලියන ලද ශුභාරංචියේ වෙනත් කෘතියකින් එම ප්‍රවෘත්ති උපුටාගෙන තිබෙන බවත් ප්‍රකාශ කරණ සෙයිඩල්ගේ මතය පදනම් විරහිත අදහසක් නොවේ.[32] කෙසේ වෙතත්, ඒ සඳහා යොදාගෙන ඇති කථා ප්‍රවෘත්තිවල පවතින විවිධත්වය සහ ඒ එක් එක් ප්‍රවෘත්තිය ශුභාරංචියේ පොත් වල ඇතුළත් කර තිබෙන අනුපිළිවෙළ සලකා බැලීමේදී එවැනි ක්‍රිස්තියානි බෞද්ධ ශුභාරංචිය පිළිබඳ පොතක් (Christian Buddhist Gospel) පැවතිය නොහැකිබව පෙන්නුම් කරයි. බෞද්ධ කථා ප්‍රවෘත්ති නව තෙස්තමේන්තුවේ ඇතුළත් කර ඇති බවට සැකයක් නැත. නමුත් බෞද්ධ කථා ප්‍රවෘත්ති නව තෙස්තමේන්තුවේ ඇතුළත් කර තිබෙන්නේ කෙසේද යන කාරණය හෝ වෙනත් සම්ප්‍රදායකට අයත් කථා ප්‍රවෘත්ති ඇතුළත් නොකර බෞද්ධ සම්ප්‍රදායේ එන කථා ප්‍රවෘත්ති පමණක් ඒ සඳහා යොදාගෙන තිබෙන්නේ කුමක් නිසාද යන කාරණය පිළිබඳව මෙතෙක් සතුටුදායක පැහැදිලි කිරීමක් කර නොමැත. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් විසින් උන්වහන්සේගේ ඉගැන්වීම් වලට සහ ක්‍රිස්තියානි ආගමට බෞද්ධ සම්ප්‍රදාය සම්බන්ධ කර ඇත්තේ කෙසේද? මෙය හුදෙක් ශාස්ත්‍රීය කරුණු සම්බන්ධයෙන් පවතින ගැටලුවක් පමණක් නම් එවිට ජේසුස් වහන්සේ නමැති පුද්ගලයා සහ ක්‍රිස්තියානිය පිළිබඳ පවතින සමානකම් වලට ලැබෙන්නේ ද්විතීය වැදගත් කමක් පමණි. එසේ නම් ශුභාරංචිය රචනා කිරීමේදී විශේෂයෙන්ම එකී ආගමික පොත්පත් ලිවීමේදී යොදාගෙන ඇති ශාස්ත්‍රීය ව්‍යූහය පිළිබඳව තේරුම් ගත යුතුවේ.

නූතන අධ්‍යයනයන්ට අනුව ලොව සතු සමස්ත ශාස්ත්‍රීය සම්ප්‍රදාය සකස් වී ඇත්තේ උද්ධෘත පාඨ, විවිධ සම්ප්‍රදායන්ගෙන් ලබාගෙන

හැඩගස්වා ගනු ලැබූ මාතිකා (Motifs) වෙනස් රචනාවලින් සොරාගත් කරුණු, සැබෑ මෙන්ම ව්‍යාජ පිටපත්, ණයට ගත් කරුණු, වෙනස් කරන ලද කරුණු, නිවැරදිව මෙන්ම වැරදි ලෙස කරන ලද පරිවර්තනයන්ගෙන් කොටස් එකතුකර ලිඛිත රචනා වලින් බව පැහැදිලිය. එසේ නම් බෞද්ධ කථා ප්‍රවෘත්ති ක්‍රිස්තියානි පොත්වලට ඇතුළත් වූයේ කෙසේද?

ඒවායින් සමහරක් ශුභාරංචියේ පොත් සහ ආගමික තොරතුරු රචනා කළ කතුවරයින් විසින් නිසැකවම ලිඛිත ග්‍රන්ථ වලින් සහ මුඛ පරම්පරාගතව පැවති කථා ප්‍රවෘත්ති වලින් ලබාගෙන ඇතිබව පෙනේ. ක්‍රිස්තියානි ආගමේ පුරාණෝක්ති පිළිබඳ කථා සම්භාරය සකස් කිරීම සඳහා බෞද්ධ මූලාශ්‍ර යෝග්‍යවීම නිසා වෙනත් මූලාශ්‍ර සමග බෞද්ධ මූලාශ්‍ර ඒ සඳහා යොදාගන්නට ඇත. ඒ පිළිබඳ තවදුරටත් සොයාබැලීම යෝග්‍ය වේ. බෞද්ධ කථා ප්‍රවෘත්ති මෙතරම් විශාල ප්‍රමාණයක් යොදාගෙන ඇත්තේ කෙසේද? ආගම සහ දර්ශනය සම්බන්ධයෙන් දක්වන ලද හෙලනීසියානු ආකල්පය හා බැඳුනු සාමාන්‍ය නැඹුරුවේ කොටසක් වශයෙන් එය සිදුවන්නට ඇතැයි කෙනෙකුට උපකල්පනය කළ හැකිය.

එකල විසූ බුද්ධිමතුන් ඔවුන් ඉදිරිපත් කළ දර්ශනවාදී සංකල්පය ගොඩ නැගීම සඳහා ඉන්ද්‍රියානු දාර්ශනික අදහස් යොදාගත්හ. එකී දර්ශනවාද අතුරින් බුදුදහම වඩා යෝග්‍ය මතවාදයක් විය. පසුකාලයේදී ප්ලේටෝ සහ පයිතගරස් විසින් ඉදිරිපත් කරණ ලද විශ්වය පිළිබඳ තොරතුරු සහ පුරාණෝක්ති වල දක්වෙන මහා පරිමාණීය ලක්ෂණ ඇතුළත් කරුණු පැහැදිලි කළ හැකි සංකල්පයන් ඉන්ද්‍රියානු දර්ශනවාදී අදහස්වල ඇතුළත්විය. කෙසේ වෙතත් බෞද්ධ කථාවස්තු බහුල වශයෙන් යොදාගැනීම පිළිබඳව පර්යේෂණ කිරීමේදී එකී කථාවස්තු, ඒවායේ ප්‍රභවය පිළිබඳ පැහැදිලි අවබෝධයකින් යුතුව ක්‍රිස්තියානි පොත්වල සිතාමතාම ඇතුළත් කරන්නට ඇති ඉඩකඩ පිළිබඳවද සිත් තබාගත යුතුය. කෙසේ වෙතත් නව තෙස්තමේන්තුවේ ඇතුළත් බොහෝ කොටස් ණයට ගත් කථා ප්‍රවෘත්ති වලින් සහ එකිනෙකින් වෙනස්වූ විවිධ කථා ප්‍රවෘත්ති එකතු කර ලියා ඇත්නම් මෙහිදී අපට තීරණාත්මක ප්‍රශ්නයකට මුහුණ දීමට සිදුවේ. එනම් ඓතිහාසික වශයෙන් ජීවත්වූ ජේසුස් වහන්සේ පිළිබඳ අප දන්නා කරුණු මොනවාද? ජේසුස් වහන්සේ පිළිබඳව දක්වා ඇති කරුණු වලින් කොපමණ ප්‍රමාණයක් ගොතන ලද කථා ප්‍රවෘත්තිද? කවර ප්‍රමාණයක් සත්‍ය කථා ප්‍රවෘත්තිද? මෙහිදී ඉදිරිපත් කරන ලද ණයට ගෙන ඇති කරුණු සලකා බැලීමේදී ක්‍රිස්තුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ පවතින කථා ප්‍රවෘත්ති සහ ක්‍රිස්තු භක්තිකයින් විසින් ජේසුස් වහන්සේගේ ජීවිතයට සම්බන්ධයැයි සලකනු ලබන සියලුම වැදගත්

සිදුවීම් පිළිබඳ කථා ප්‍රවෘත්ති සියල්ලම පාහේ බොහෝ දුරට සැබෑ කරුණු හා අනුරූප නොවේ. මිනිස්සු පන්දහසකට ප්‍රාතිහාර්ය බලයෙන් ආහාර සපයා දීම කිසි දිනක සිදුවූ සිද්ධියක් නොවේ. ජේසුස් වහන්සේ කිසි දිනක ජලය මතුපිට ඇවිද්දේ නැත. කිසි දිනක සමාරියේ ස්ත්‍රියක් ජාකොබ්ගේ ළිඳ ළඟදී උන්වහන්සේට හමුවූයේ නැත. දිළිඳු වැන්දඹුවක් විසින් පඬුරක් ප්‍රදානකිරීමේ වැදගත්කම පිළිබඳ උන්වහන්සේ දහම් දෙසුවේ නැත. බෞද්ධ සම්ප්‍රදායට අනුව යමින් ජේසුස් වහන්සේ විසින් කර ඇති ධර්ම දේශනා ඇගයිය යුත්තේ කෙසේද? එම දේශනා ඉන්දියානු මූලාශ්‍ර පදනම් කරගෙන පසුව ඇතුළත් කරන ලද කරුණු බවට වඩා වැඩි යමක් නොවේද? මෙහිදී අප මුහුණ පා ඇති විශාල අභියෝගය නම් එම ප්‍රශ්නයට පිළිතුරු සපයා ගැනීමය. පැහැදිලිවම බුදුන් වහන්සේගේ දේශනා වලට කැපීපෙනෙන සමානකමක් දක්නට ඇත්තේ ජේසුස් වහන්සේ විසින් කර ඇති ප්‍රකාශ වල නිසා එම ප්‍රශ්න වලට ලබාදෙන පිළිතුරු ඉතා වැදගත්වනු ඇත. මේ පොතේ ප්‍රස්තාවනාවේ සඳහන් කර ඇති ජොහන්ගේ ශුභාරංචියේ පොතෙන් උපුටා දක්වන ලද කොටස ගැන සිතා බලන්න. පුනර්භවය පිළිබඳ ජේසුස් වහන්සේගේ සදාචාරාත්මක ඉගැන්වීම්, වෘාජ දැරූ අදහස්, උන්වහන්සේගේ සදාචාරාත්මක ඉගැන්වීම්, වෘාජ දිවැසිවරුන් පිළිබඳ කරන ලද අනතුරු හැඟවීම් ඔබේ මතකයට නගාගන්න. එසේත් නැතිනම් උන්වහන්සේ තම ශ්‍රාවකයින්ට දෙනු ලැබූ පහත සඳහන් උපදෙස් සලකා බලන්න: "මාගේ මේ සහෝදරයින්ගෙන් ඉතාම සුලු තැනැත්තාට වුවද ඔබ එසේ කළා නම් ඔබ එය කළේ මටය". (මතෙව් 25 : 40) එම අදහසම බුදුන් වහන්සේ මෙසේ ප්‍රකාශ කර තිබේ: "මහණෙනි, යමෙක් මට උපකාර කිරීමට කැමැත්තේද හේ දුබලයන්ට උපකාර කළ යුතුවේ." (මහාවග්ග 8-26 : 3). ජේසුස් වහන්සේ විසින් එවැනි ප්‍රකාශ ඉදිරිපත් කරමින් බෞද්ධ ඉගැන්වීම් ප්‍රචලිත කරන ලද්දේ නම් ඇතිවිය හැකි තත්වය කුමක්ද? එවිට බෞද්ධ කථා ප්‍රවෘත්ති ඇතුළත් කර තිබීම සලකා බැලිය යුත්තේ සම්පූර්ණයෙන්ම වෙනත් දෘෂ්ටි කෝණයකිනි.

ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ සැබෑ සිදුවීම් තේරුම් ගත හැක්කේ උන්වහන්සේගේ සැබෑ දේශනා තෝරා බේරා ගැනීමෙන් පමණි. බෞද්ධ අදහස් සහ කථා ප්‍රවෘත්ති නව තෙස්තමේන්තුවේ පොත්වල ඇතුළත් වී තිබෙන්නේ ඒවා ලියැවුණු කාලවල පැවති ආගමික අවශ්‍යතාවයන් ශුභාරංචිය පිළිබඳ පොත් ලියූ කතුවරයින් කෙරෙහි බලපෑ නිසාද, නොඑසේ නම් එම අදහස් ජේසුස් වහන්සේ විසින් ඉදිරිපත් කරනු ලැබූ නිසාද, යන කාරණය පිළිබඳව තීරණය කළ හැක්කේ එසේ කටයුතු කිරීමෙන් පමණි.

ශුභාරංචියේ නැතිවූ කොටස් නැවත සොයාගැනීම

ක්‍රිස්තියානි ආගමේ ආරම්භය පිළිබඳ අප සතු විසිරී පවතින දැනීම තවදුරටත් පුළුල් කළ හැකි තොරතුරු පැරණි නටබුන්, පුරා විද්‍යාත්මක කැනීම් හෝ ලෙන් ආශ්‍රිත පැරණි ලිඛිත සාධක තුළින් සොයා ගැනීමේ වාසනාව බොහෝ විට අප සතු වී නැත. කෙසේ වෙතත් 19 වන ශත වර්ෂයේ අගභාගයේදී මැද පෙරදිග පිහිටි කයිරෝ නගරයෙන් සහ 1940 දී ඊජිප්තුවේ නැග් හැමඩි (Nag Hammadi) නමැති ස්ථානයෙන් සොයා ගන්නා ලද ක්‍රිස්තියානි ආගම පිළිබඳ ලේඛන සහ මළ මුහුද ප්‍රදේශයේ පිහිටි කුම්රාන් ලෙන්වල තිබී සොයාගත් ශුභාරංචිය පිළිබඳ ලියන ලද යුදෙව් ග්‍රන්ථවල අත්පිටපත් ක්‍රිස්තියානි ආගම සම්බන්ධයෙන් මහත් ආන්දෝලනයක් ඇති කිරීමට තුඩුදුන් සුප්‍රසිද්ධ ඓතිහාසික අත්පිටපත් ගණයෙහි ලා සැලකේ. එකී ලේඛන වල අන්තර්ගත කරුණු අනුසාරයෙන් ජේසුස් වහන්සේ ජීවත්වූ වටාපිටාව පිළිබඳව වරින් වර විශිෂ්ට අර්ථ කථන ඉදිරිපත් කරමින් එම ලේඛන වල ඇති වැදගත්කම පිළිබඳව අද දක්වාත් සාකච්ඡා වෙමින් පවතී. එම සොයාගැනීම පිළිබඳව පමණක් පර්යේෂණ කිරීම සඳහා සම්පූර්ණයෙන්ම කැපවූ පුස්තකාල පවා පිහිටුවා තිබේ.

දැනට අභාවයට ගොස් ඇති හෝ අමතකව ගිය හෝ අප නොදන්නා අප්‍රකට ලේඛන පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා හැමවිටම පුරාවිද්‍යාත්මක කැනීම් සිදුකිරීම අවශ්‍ය නොවේ. සමහර විට නිදහසේ සිදුකරන අධ්‍යයන කටයුතු මගින් කෙනෙකුට එවැනි අප්‍රකට තොරතුරු අනාවරණය කරගැනීමට පුළුවන. ලේඛන විග්‍රහ කිරීමේ නූතන විද්‍යාත්මක ක්‍රම වේදයන් උපයෝගීකර ගැනීමෙන් කිසියම් ලේඛනයක් විවිධ ආකාරයෙන් පරීක්ෂාවට ලක් කළ හැකිය. එසේ කිරීමෙන් සමහර විට ඒවා තුළ සැඟවී ඇති උප පාඨ මෙන්ම එම නිර්මාණවල පදනම වශයෙන් යොදාගෙන ඇති මූලාශ්‍ර පිළිබඳ කරුණු ද අනාවරණය කරගැනීමට පුළුවන. කීප වාරයක් සංස්කරණය කර තිබීම නිසා සාමාන්‍ය පාඨකයකුට එම ලේඛන තුළ සැඟවී ඇති ඉහත සඳහන් කරණ ලද කරුණු තේරුම් ගැනීමට නොහැකිවනු ඇත. මෙම කරුණ උපමාවක් අනුසාරයෙන් දක්වන්නේ නම් රූපවාහිනියේ තිරය මත දිස්වන චිත්‍රයක දීප්තිය අඩු වැඩි කරණු ලබන දුරස්ථ පාලකය සම්පූර්ණයෙන්ම වසා දැමූ පසුවත් චිත්‍රය අඳුරු තිරය මත අඛණ්ඩව පතිතවන අයුරින් පෙන්නුම් කළ හැකිය. එම චිත්‍රය අපේ පියවි ඇසට නොපෙනේ. එපරිද්දෙන්ම ඉහත කී ලේඛන වල මුල් පිටපත් කීප වාරයක් සංස්කරණය

කර තිබීමේ හේතුවෙන් ඒවායේ මුල් ස්වරූපය තව දුරටත් හඳුනාගත නොහැකි පරිදි වෙනස් වී තිබේ. කෙසේ වෙතත්, නැවත වරක් චිත්‍රයේ දීප්තිය පාලනය කරමින් ඒ තුළ සැඟවී ඇති තොරතුරු අනාවරණය කරගත හැකි ක්‍රම වේදයන් ඒ පිළිබඳ පළපුරුද්දක් ඇති විද්වතුන් විසින් සොයාගෙන තිබේ.

ශුභාරංචියේ පොත් අතුරින් වඩාත් පැරණිතම පොත කුමක්ද යන කාරණය තීරණය කිරීමේදී ඒ පිළිබඳ කටයුතු කළ පර්යේෂකයින් විසින් විශ්මයජනක සොයාගැනීමක් සිදුකර තිබේ. ඓතිහාසික වශයෙන් ශුභාරංචියේ පොත් ලියූ කතුවරයින් ජීවත්වූ කාලය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට අපට නොහැකිය. ඒ පිළිබඳව යම් යම් කරුණු අනාවරණය කර ගත හැක්කේ ශුභාරංචියේ පොත් වල පෙළ පිළිබඳව විග්‍රහ කර බැලීමෙන් පමණි. ජොහන්ගේ ශුභාරංචියේ ආගමික ඉගැන්වීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා තිබීම නිසා එය වෙනත් විවිධ ආගමික බලපෑම් පැවති කාලයක ලියා ඇති බවත් එනිසාම වඩාත් මෑතකදී ලියන ලද බවත් සිතිය හැකිය. මතෙව් (නව තෙස්තමේන්තුවේ දැක්වෙන අනුපිළිවෙළ අනුව ශුභාරංචියේ පොත් ලියූ පළමු කතුවරයා), මාක් සහ ලූක් යන කතුවරයින් විසින් රචනා කරන ලද ශුභාරංචියේ පොත් තුන එකිනෙකට සම්බන්ධය. මෙම පොත් තුනේම එක්තරා ප්‍රමාණයකට අලංකාරෝක්ති ඇතුලත් කරමින් ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ කථා ප්‍රවෘත්ති සියියම් සමාන ආකාරයකින් ඉදිරිපත් කර තිබේ. ඒවායේ දැක්වෙන කථා ප්‍රවෘත්ති සහ විස්තර තොරතුරු තුලනාත්මකව සලකා බැලීමට හැකිවීම නිසා එම පොත් තුන ශුභාරංචියේ සාරාත්මක පොත් (Synoptic Gospels) යනුවෙන් හඳුන්වනු ලැබේ. එවැනි තුලනාත්මක අධ්‍යයනයන් මගින් ඉතා වැදගත් සමානකම් දෙකක් පෙන්නුම් කරයි. ඉන් පළමුවැන්න නම්, මතෙව් සහ මාක් විසින් රචනා කරන ලද ශුභාරංචියේ පොත්වල කථා ප්‍රවෘත්ති ඉදිරිපත් කර ඇති අනුපිළිවෙළ එකිනෙකට සමාන වන්නේ ඔවුන් විසින් මාක් ගේ ශුභාරංචිය පිළිබඳ පොතේ දැක්වෙන කථා ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදී පමණි. ශුභාරංචියේ පැරණිතම පොත මාක්ගේ ශුභාරංචිය බවත් ශුභාරංචියේ අනෙක් පොත් දෙක (මතෙව් සහ ලූක්) ලියූ කතුවරයින් විසින් ඒ පිළිබඳව දැන සිටිය බවත් ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳව ඔවුන් තම කථා ප්‍රවෘත්ති රචනා කරන ලද්දේ මාක්ට පසුව බවත් ඉන් පැහැදිලි වේ. නමුත් මාක්ගේ ශුභාරංචිය ලියා ඇත්තේ ක්‍රි. ව. 60 දශකයේ අවසානයේදී යැයි බොහෝ දෙනෙකු දරන අදහස තවදුරටත් පිළිගත නොහැකිය. යුදෙව් යුද්ධය පැවති කාලයේ (66-73 ක්‍රි. ව.) සිදුවූ සිදුවීම් පිළිබඳව එහි සඳහන්වන හෙයින් සමහරවිට එය ක්‍රි. ව. 70 දශකයේ මැද භාගයේදී

රචනා කරන්නට ඇතැයි සිතිය හැකිය. කෙසේ වෙතත්, ක්‍රි. ව. 95 දී පමණ රචනා කරන ලද මතෙව් සහ ලූක්ගේ ශුභාරංචිය පිළිබඳ පොත් දෙකේ ජේසුස්වහන්සේ විසින් කරනලද ප්‍රකාශ-උපමා කථා, බුද්ධිමත් උපදේශ, අනුශාසනා සහ පසුතැවිලිවීම පිළිබඳ කථා ප්‍රවෘත්ති-ඇතුළත් වේ. එම කථා ප්‍රවෘත්ති වලින් සමහරක් මැතිව් සහ මාක්ගේ ශුභාරංචියේ පොත්වල ඇතුළත් කර තිබෙන නමුත් ඒවා කිසිවක් ලූක්ගේ ශුභාරංචියේ දක්නට නොලැබේ. ඒ අනුව මතෙව් සහ ලූක්ට ශුභාරංචියේ පොත් ලිවීමේදී මාර්ක්ගේ ශුභාරංචියට අමතරව තම අභිමතය පරිදි කරුණු උපුටා ගැනීමට හැකි වෙනත් මූලාශ්‍රයක් පැවති බව පෙනීයයි. වර්තමාන විද්වතුන් විසින් එම මූලාශ්‍රය Q යනුවෙන් හඳුන්වනු ලැබේ. Q යනු ජර්මන් භාෂාවෙන් මූලාශ්‍රය යන අර්ථය දෙන ක්වෙල් (Quelle) නමැති වචනයේ කෙටි යෙදුමකි.

ශුභාරංචියේ පොත්වල දැක්වෙන කථා ප්‍රවෘත්ති විග්‍රහ කිරීමේදී ඒවා රචිත කාලයේ පැවති සමාජ තත්වය පිළිබඳවද අප සිහිතබා ගතයුතුය. මාක්ගේ ශුභාරංචිය පිළිබඳ පොත ලියන ලද්දේ ජේසුස් වහන්සේ කුරුසිය මත ඇන ගැසීමෙන් සහ උන්වහන්සේගේ මාර්ගෝපදේශකත්වය අවසාන වීමෙන් අවුරුදු හතළිහකටත් වැඩි කලක් ගතවීමෙන් පසුවය. මතෙව් සහ ලූක්ගේ ශුභාරංචිය ලියන ලද්දේ ඊට තවත් විසි අවුරුද්දක් ගතවීමෙන් පසුවය. ශුභාරංචිය ලියූ කතුවරයින්ගේ දෘෂ්ටි කෝණයෙන් බැලීමේදී ඔවුන්ගේ එම කාර්යය සමාන කළ හැක්කේ වර්තමානයේ ජීවත්වන ලේඛකයකු විසින් 1920 දශකයේ අවසාන භාගය සහ 1930 දශකයේ ආරම්භය අතර පැවති ඉතා කෙටි කාලපරිච්ඡේදයක් තුළදී මහත් ආන්දෝලනයක් ඇති කරමින් ජීවත්වූ පුද්ගලයකු පිළිබඳව 1970 දශකයේ පසු භාගයේදී ලියන ලද කෙටි විස්තරයක් සහ තොරතුරු ඇතුළත් වෙනත් ලේඛන කීපයක් පමණක් ප්‍රයෝජනයට ගනිමින් චරිතාපදානයක් ලිවීමේ කාර්යයටය. මුද්‍රිත තොරතුරු, පුවත්පත් හෝ රූපවාහිනී වාර්තා ආදිය එකල නොතිබූ බව සිහියට නගාගත හොත් එවැනි කරුණක් පිළිබඳව වාර්තා කිරීම සඳහා පවතින ඉඩකඩ කොතරම් සීමාසහිතද යන කාරණය පැහැදිලිවනු ඇත. වෙනත් වචන වලින් කියතොත් ශුභාරංචිය ලියූ කතුවරයින්ට ජේසුස් වහන්සේ පිළිබඳ ගොතන ලද කරුණු මොනවාද, සැබෑ කරුණු මොනවාද යන්න පරීක්ෂාකර බැලීමට හැකියාවක් නොතිබුණි. ඒ නිසා ඔවුන් බොහෝ දුරට Q මූලාශ්‍රයේ ඇතුළත් තොරතුරු පදනම් කර ගනිමින් ශුභාරංචිය පිළිබඳ පොත් රචනා කර තිබෙන බව පැහැදිලිය. එසේ නොවන්නට ශුභාරංචියේ පොත් අතර සාරාත්මක සම්ප්‍රදායක් ඇතිවන්නට හෝ Q වශයෙන් හැඳින්වෙන මූලාශ්‍රයේ අන්තර්ගත ජේසුස් වහන්සේගේ

ප්‍රකාශ කිසිදිනක අනාවරණය කර ගැනීමට අවස්ථාවක් නොලැබෙන්නට තිබුණි. එම මූලාශ්‍රවලින් කරුණු උපුටාගැනීමේදී ඒවායේ මුල් පිටපත් වල අන්තර්ගතයට හානියක් නොවන පරිදි එය කෙතරම් දුරට පදානුගතව කර තිබේද යන් ඒ බව එම කථා ප්‍රවෘත්තිවල පැහැදිලිවම දක්නට ලැබෙන ප්‍රතිවිරෝධී අදහස් වලින් යුක්ත කරුණු පවා ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර තිබීමෙන් පැහැදිලි වේ. ඒ නිසා වඩාත් නිවැරදි විග්‍රහයක් මගින් මෙම කතුවරයින් දෙදෙනාම මාක්ගේ ශුභාරංචිය පිළිබඳ පොතේ සහ Q යනුවෙන් හඳුන්වනු ලබන මූලාශ්‍රයේ වෙනත් අනුවාදයකින් කරුණු ලබාගෙන ඇතිබව පෙනේ. මතෙව් සහ ලූක් විසින් ලියන ලද ශුභාරංචිය පිළිබඳ පොත් දෙකේ දක්නට ලැබෙන මෙම ද්විත්ව සම්ප්‍රදාය අතර පවතින වෙනස්කම් Q මූලාශ්‍රය සම්බන්ධයෙන් පැවතුනි. එය ලිඛිත පිටපතේ සහ මුඛ පරම්පරාගත සම්ප්‍රදායන්ගේ සම්මිශ්‍රණයක් මගින් සිදුවී ඇතිබව පෙනේ.

මාක්ගේ ශුභාරංචියට වඩා පැරණි Q යනුවෙන් හඳුන්වා ඇති මෙම මූලාශ්‍රය ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් අතර ව්‍යවහාරයේ පැවති බව බොහෝ ඉතිහාසඥයින් සහ දේවධර්මවේදීන් විසින් පිළිගෙන තිබේ. ජේසුස් වහන්සේ කුරුසිය මත තබා ඇණ ගැසීමේ මහා විපත්තියෙන් පසු උන්වහන්සේගේ දේශනා ප්‍රථම වරට ශ්‍රාවකයින් විසින් ග්‍රන්ථාරූඪ කරන්නට ඇතැයි සිතිය හැක. මෙසේ ජේසුස් වහන්සේගේ දේශනා ඇතුළත් කර ලියන ලද ශුභාරංචිය පිළිබඳ මුල් පොත Q යනුවෙන් හැඳින්වෙන මෙම මූලාශ්‍රය බව පෙනීයයි. එහි ඇතුළත් ඉගැන්වීම් සමහරක් නව තෙස්තමේන්තුවේ පොත්වල ඇතුළත් කර තිබෙන අතර ඒවා දැන් ක්‍රමානුකූලව වෙන්කර ගනිමින් පවතී. මෙය ඉතා වැදගත් සොයා ගැනීමකි. මන්ද Q මූලාශ්‍රයේ ඇතුළත් කරුණු විග්‍රහ කිරීමෙන් ජේසුස් වහන්සේ සම්බන්ධව ක්‍රියාත්මක වූ ආගමික ව්‍යාපාරයේ චින්තනය, චර්යාව සහ සමාජ විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ ගැඹුරු අවබෝධයක් පමණක් නොව ජේසුස් වහන්සේ විසින් තම ශ්‍රාවකයින්ට කරනු ලැබූ අනුශාසනා පිළිබඳ සොයා බැලීමටද, අපට එමගින් ඉඩ සැලසෙන හෙයිනි. මතෙව් සහ ලූක් විසින් එම මූලාශ්‍රයේ අන්තර්ගත කරුණු ජේසුස් වහන්සේගේ ජීවිතය සහ උන්වහන්සේ විසින් ඉටුකරන ලද සේවාව පිළිබඳ කථාවස්තු ඔවුන් විසින් ලියන ලද ශුභාරංචියේ පොත්වලට ඇතුල් නොකරන ලද්දේ නම් ජේසුස් වහන්සේගේ දේශනා ඇතුළත්ව තිබූ Q යනුවෙන් හඳුන්වනු ලැබූ එම දේශනා සංග්‍රහයේ අන්තර්ගත කරුණු අභිබවා යාමට ඉඩ තිබුණි. එපමණක් නොව ක්‍රිස්තියානි ආගම බිහිවීමට බොහෝ කාලයකට පෙර පැවති එකී මූලාශ්‍රය හා බැඳුනු ආගමික ව්‍යාපාරය පිළිබඳ තොරතුරු කිසිවක් දැනගැනීමට අවස්ථාවක් නොලැබෙන්නට ඉඩ තිබුණි.

ශුභාරංචියේ පොත්වල සඳහන් කරුණු අතුරින් Q යනුවෙන් හැඳින්වෙන මූලාශ්‍රයට අයත් කරුණු පමණක් වෙන්කර ගැනීමෙන් අපට ඉගෙන ගත හැක්කේ කුමක්ද? පළමුවෙන්ම ජේසුස් වහන්සේගේ මුල් ශ්‍රාවකයින් උන්වහන්සේගේ දේශනා ඇතුළත් එක් ධර්ම සංග්‍රහයකින් පමණක් සෑහීමට පත්වූ බව පෙන්නුම් කෙරේ. තමන් ජීවත්වන්නේ අධර්මය රජයන ලෝකයක බව තේරුම් ගැනීමට ඔවුන්ට ශුභාරංචියේ කරුණු ඇතුළත් වෙනත් පොත් අවශ්‍ය නොවීය. හෙලනිසියානු යුගයේදී එවැනි තත්වයක් පැවතීම අසාමාන්‍ය සිදුවීමක් නොවේ. ප්‍රාඥයන්ගේ අනුශාසනා ඇතුළත් විවිධ පොත පත ව්‍යවහාරයේ පැවතුන අතර ඒවා ඔවුන්ගේ ශ්‍රාවකයින් අතර හුවමාරු වන්නට ඇත. ශුභාරංචිය පිළිබඳ වෘත්තාන්තමය පොත් ලියනු ලැබූ ඊට පසුකාලයේදී පවා ජේසුස් වහන්සේගේ ආගමික ව්‍යාපාරය හා සම්බන්ධවූ දේශනා එකතුවක් ව්‍යවහාරයේ පැවතුන අතර ඒවා ස්වාධීන දේශනා එකතුවක් සේ පැවත ආ බව පෙනේ. අප විසින් මීට කලින් සඳහන් කරන ලද තොමස්ගේ ශුභාරංචිය පිළිබඳ පොතෙන් ඒ බව පැහැදිලිවේ. තෝමස්ගේ ශුභාරංචිය යනු 1946 වර්ෂයේදී ලක්සෝර් (Luxor) නමැති ස්ථානයට නුදුරින් පිහිටි නැග් හැමඩි (Nag Hamadi) නමැති ස්ථානයේ සොහොන් කොතක තිබී ඊජිප්තුවේ ගොවියකු විසින් සොයාගන්නා ලද ආගමික ලියවිල්ලකි. ඒ සමගම කොප්ටික් (Coptic) භාෂාවෙන් රචිත (මධ්‍ය ඊජිප්තු භාෂාව) පැරණි ක්‍රිස්තියානි දර්ශනය සම්බන්ධ පොත්පත් අතර තිබී කුඩා ධර්ම පත්‍රිකා 48 ක්ද සොයාගනු ලැබිය. ශුභාරංචිය පිළිබඳ පැවති එම පොත පිළිබඳව අප එතෙක් දැනසිටියේ මුල් ක්‍රිස්තියානි ග්‍රන්ථ රචනාකරන ලද කතුවරයින්ගේ ලියකියවිලි මාර්ගයෙන් පමණි.

තෝමස්ගේ ශුභාරංචිය යනු ජේසුස් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශ 114 ක් ඇතුළත් දේශන සංග්‍රහයකි. එහි සංයුතිය එතරම් පැහැදිලි නැත. Q මූලාශ්‍රයේ ව්‍යුහය බොහෝ දුරට තෝමස්ගේ ශුභාරංචියට සමාන වීමට පුළුවන. ඇත්ත වශයෙන්ම Q මූලාශ්‍රයේ ඇතුළත් බොහෝ ප්‍රකාශ තෝමස්ගේ ශුභාරංචියේද දක්නට ලැබේ. ඒ නිසා තෝමස්ගේ ශුභාරංචිය යනු පැහැදිලිවම Q මූලාශ්‍රයේම විකාශනයක් බවත්, එහි අන්තර්ගත කරුණුවල මූලික ස්වරූපය වෙනස් කිරීමකින් තොරව ජේසුස් වහන්සේගේ මුල් ශ්‍රාවකයින් විසින් ඒවා මුල් ස්වරූපයෙන්ම පවත්වාගනු ලැබූ උන්වහන්සේ දේශනාවල එකතුවක් බවත් පැහැදිලිය. තෝමස්ගේ ශුභාරංචියේ ඇතුළත් බොහෝ උපදේශ ශුභාරංචියේ ඇතුළත් උපදේශ තරම් විකාශනය වී නොමැත. මුඛ පරම්පරාගතව පැවති එකී දේශනා වල මුල් ස්වරූපය එයින් පැහැදිලි වේ. ජේසුස් වහන්සේ ගේ මුල් දේශනා යළි ගොඩනැගීමේදී තොමස්ගේ ශුභාරංචිය අද අත්වාම එතරම්

වැදගත් සේ නොසලකන්නේත් එය එතරම් ප්‍රසිද්ධ නොවූ මූලාශ්‍රයක් ලෙස පවතින්නේත් මේ හේතුව නිසාය. උදාහරණයක් වශයෙන් වෙනත් කිසිම ශුභාරංචියේ පොතක සඳහන් නොවන ප්‍රකාශ එහි ආරක්ෂා වී තිබේ. නමුත් Q මූලාශ්‍රයේ දැක්වෙන බොහෝ කරුණුවලට සමානකමක් දක්වන තෝමස්ගේ ශුභාරංචියේ දැක්වෙන කරුණු ඒවායේ ව්‍යුහය හා අන්තර්ගතය අනින් ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා වලට බොහෝ දුරට සමාන බැව් පෙනීයයි. ඒ නිසා ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා මොනවාදැයි සොයා යාමේදී අප ශුභාරංචියේ පොත්වල දැක්වෙන කරුණු කෙරෙහි පමණක් විශ්වාසය තැබිය යුතු නොවේ. උන්වහන්සේගේ සැබෑ දේශනා අපට සොයාගත හැක්කේ පල්ලියේ බලපෑම මත මිථ්‍යාදෘෂ්ටික ප්‍රකාශ ලෙස හංවඩුගසා ඉවත්කරන ලද ලේඛන වලිනි.

ක්‍රිස්තියානියට පදනම් වී ඇති බෞද්ධ මූලාශ්‍ර සම්බන්ධයෙන් එක් කරුණක් විශේෂයෙන් කැපී පෙනේ. එනම් තෝමස්ගේ ශුභාරංචිය හුදෙක් Q මූලාශ්‍රයේ දැක්වෙන කරුණු වලට ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පෙන්නුම් කරනවා පමණක් නොව එය බෞද්ධ අදහස් වලින් පිරී පවතී. මේ ශත වර්ෂය ආරම්භයේදී පමණ ග්‍රීක්, කොප්ටික් සහ අරාබි භාෂාවලින් ලියැවුණු පැපිරස් ලේඛන විශාල ප්‍රමාණයක කොටස් ඊජිප්තුවේ ඔක්සිරින් කෝස් (Oxyrhynchos)-නූතන එල්බෙනිසා (El Benesa)-වලින් සොයාගනු ලැබීය. තෝමස්ගේ ශුභාරංචියේ දැක්වෙන විස්තරවල බොහෝ කොටස් එම ලේඛන වල ඇතුළත්ව තිබේ. එසී එක් ලේඛනයක ඉන්දියානු පසුබිමක් තුළ ගොතනලද කථා ප්‍රවෘත්තියක් මත පදනම්වූ නාට්‍යයක් ඇතුළත් කර තිබේ.

තෝමස්ගේ ශුභාරංචියේ ඉන්දියානු කථා ප්‍රවෘත්ති ඇතුළත් වී තිබීම අහඹුවෙන් සිදුවූ දෙයක් විය නොහැකිය. නැග් හැමඩි නමැති ස්ථානයෙන් සොයාගත් ලේඛනයේ සඳහන් වන්නේ මුල් ක්‍රිස්තියානි ආගමිකයින් අතර ප්‍රචලිතව පැවති නොස්ටික් චින්තනයට අයත් කරුණුය. මෙම ක්‍රිස්තියානි ආගමිකයින් ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් අතර, විමුක්තිය ලබාගත හැක්කේ පූජකවරයින් සහ බිෂොප් වරුන්ගේ ධුරාවලිය යටතේ පාලනය වන ක්‍රමයක් අනුගමනය කිරීම තුළය යන අදහස ප්‍රතික්ෂේප කළහ. ඒ වෙනුවට ඉන්දියාවේ සිටින බෞද්ධයින් සහ යෝගීන් මෙන් ගුප්ත සහ භාවනානුයෝගී ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් විමුක්තිය සලසා ගැනීමට ඔවුහු ක්‍රියා කළහ. තෝමස්ගේ ශුභාරංචියේ සඳහන් කර ඇති ජේසුස් වහන්සේ විසින් කරන ලද බොහෝ ප්‍රකාශ කියවීමේදී සිහිපත්වන්නේ කතෝලික පල්ලියේ ශුද්ධවූ පාවුල් තුමාගේ දේවධර්මයට වඩා ඉන්දියානු සහ සෙන් බෞද්ධ දර්ශනයේ ඇතුළත් ඉගැන්වීම්ය. ඇමරිකානු ජාතික ආගමික කටයුතු පිළිබඳ විද්‍යාර්ථිනියක

වන ඉලේන් පැජල්ස් (Elaine Pagels) මහත්මිය නැග් හැමඩි නමැති ස්ථානයේ තිබී සොයාගත් ආගමික ලේඛන සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විශිෂ්ට ප්‍රකාශනයේ මෙසේ සඳහන් කර තිබේ: "ශාස්තෘන් වහන්සේලාගේ නම් වෙනස් කරනු ලැබුවහොත් තෝමස්ගේ ශුභාරංචියේ ඇතුළත් ජීවමාන ජේසුස් වහන්සේ විසින් දේශනා කරන ලදැයි සඳහන් කර ඇති කරුණු ජීවමාන බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදැයි පැහැදිලිව කිවහැකි බව සමහර විද්වතුන් විසින් ප්‍රකාශ කර තිබේ."[33] මේ අනුව එක්තරා කාලයකදී දකුණු ඉන්දියාවේ ජීවත්වූ ක්‍රිස්තියානි ආගමිකයින් තෝමස්ගේ ශුභාරංචිය භාවිත කරනු ලැබූ බවත්, එහි විසූ බෞද්ධයින් දකුණු ඉන්දියාවේ විසූ තෝමස්ගේ ශුභාරංචිය පිළිගත් ක්‍රිස්තියානි ආගමිකයින් හා සම්බන්ධතා පැවැත්වූ බවත් එඩවඩ් කොන්සි නමැති බ්‍රිතාන්‍ය ජාතික බෞද්ධ පඬිවරයා විසින් අනුමාන කිරීම පුදුමයට කරුණක් නොවේ.[34] අදත් දකුණු ඉන්දියානු ක්‍රිස්තු භක්තිකයින් ඔවුන් හඳුන්වා ගන්නේ තෝමස් ක්‍රිස්තියානින් වශයෙනි.

විසිවන ශතවර්ෂයේ ආරම්භයේදී පමණ Q මූලාශ්‍රය පිළිබඳව මහත් උනන්දුවකින් පර්යේෂණ පවත්වනු ලැබුවත්, පසුව එම පර්යේෂණ සියල්ල යටපත්වී ගියේය. 1970 දශකයේදී නැවත වරක් එම පර්යේෂණ ආරම්භ කිරීමත් සමග ජේසුස් වහන්සේගේ පෞරුෂය සහ උන්වහන්සේගේ ශ්‍රාවක පිරිසේ සංයුතිය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගත හැකි අලුත් කරුණු රාශියක් අනාවරණය කර ගැනීමට හැකිවිය. එනිසා Q මූලාශ්‍රය සකස් වී ඇති ආකාරය පිළිබඳව කෙටියෙන් සලකා බලමු. එහි අන්තර්ගතය කැපී පෙනෙන කොටස් තුනකට බෙදිය හැකිය. ඒවා නම් බුද්ධිමය දේශනා (Wisdom Discourse), අනාගත වාක්‍ය සහ එළිදරව්ව පිළිබඳ ප්‍රකාශ (Prophetic and Apocalyptic Declarations) සහ ඉතා අඩු ප්‍රමාණයකින් ඇතුළත් කර තිබෙන චරිතාපදාන කථා ප්‍රවෘත්ති (Biographical Material) වේ. Q මූලාශ්‍රය රචනා කරන අවධියේදී ලෝක විනාශය ඉක්මනින්ම සිදුවේය යන විශ්වාසය ඊට ශත වර්ෂ දෙකකට පමණ පෙර සිට යුදෙව් ආගමිකයින් අතර මුල් බැසගෙන තිබුණි. එනිසා එම විශ්වාසය Q මූලාශ්‍රය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කිරීම නිසැකය. මෙහිදී පැන නගින ප්‍රශ්නය නම් ජේසුස් වහන්සේට සම්බන්ධව පැවති සැබෑ සම්ප්‍රදාය කුමක්ද? යන කාරණයයි. අනාගත වාක්‍ය කීම Q මූලාශ්‍රය කෙරෙහි තීරණාත්මක ලෙස බලපා තිබෙන බව සමහරු කල්පනා කරති. බුද්ධිමය සම්ප්‍රදාය ඒ කෙරෙහි බලපෑ බව තවත් සමහරෙක් කල්පනා කරති. මෑතදී කරන ලද පර්යේෂණ මගින් මෙම ප්‍රශ්නය කෙරෙහි කිසියම් ආලෝකයක් විහිදී ඇත. Q මූලාශ්‍රය එහි අන්තර්ගතය, ව්‍යුහය සහ පරමාර්ථය අනුව සලකා බැලීමේදී පැහැදිලිව

වෙන්කර හඳුනාගත හැකි කොටස් තුනකින් යුක්තවූ බව පෙන්නුම් කරයි. Q මූලාශ්‍රය වෙනස් කාල පරිච්ඡේද තුනකදී සංස්කරණය කිරීමෙන් සහ නැවත සකස් කිරීමෙන් පෝෂණය කර ඇති බව එයින් පැහැදිලිවේ.[35] එට ජේසුස් වහන්සේ Q මූලාශ්‍රයේ පැරණිම පොත Q^1 වශයෙන් හැඳින්වේ. එට ජේසුස් වහන්සේ විසින් දේශනා කරන ලද බුද්ධිමය කරුණු පමණක් ඇතුළත් වේ. එයට අනාගත වාක්‍ය සහ එළිදරව්ව පිළිබඳ විස්තර ඇතුළත් කර තිබෙන්නේ පසුකාලයකදීය. එය Q^2 ලෙස හැඳින්වේ. ජේසුස් වහන්සේ පාපයට පෙළඹවීමේ කථා ප්‍රවෘත්තිය සහ වෙනත් අතිරේක තොරතුරු රාශියක් Q ඇතුළත් Q^3 වශයෙන් හැඳින්වෙන මූලාශ්‍රය මෑත යුගයකට අයත්වේ. Q මූලාශ්‍රයේ ඇතුළත් මෙම ස්ථර තුන පහත දැක්වෙන පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිය.

Q¹ මෙම පළමු ස්ථරයට ජේසුස් වහන්සේගේ දේශනා හයක් ඇතුළත් වේ. එම දේශනා ඊජිප්තියානු පැරණි පෙරදිග හා හෙලනීසියානු සාහිත්‍යයට ඇතුළත් වී තිබෙන උන්වහන්සේ නම ශ්‍රාවකයින්ට කරන ලද අනුශාසනා බව පෙනී යයි. Q^1 වශයෙන් හඳුන්වා ඇති මෙම සංග්‍රහයේ කැපී පෙනෙන ලක්ෂණයක් නම් එහි බොහෝ සම්මත සම්ප්‍රදායන්ට එරෙහිවූ ආචාර ධර්ම පිළිබඳ රැඩිකල් අදහස් ඇතුළත් වී තිබීමය.

Q² මෙම ස්ථරයේ ඇතුළත් කරුණු Q^1 මූලාශ්‍රයේ ඇතුළත් කරුණු වලට වඩා පැහැදිලි වෙනසක් පෙන්නුම් කරයි. එයට අනාගත වාක්‍ය සහ එළිදරව්ව පිළිබඳ කරුණු ඇතුළත් වේ. "මෙම පරම්පරාවට" මුහුණ පෑමට සිදුවන තත්වය සහ අවසාන විනිශ්චය පිළිබඳ කරුණු එහි සඳහන් වේ. "මෙම පරම්පරාව" යනුවෙන් අදහස් කර තිබෙන්නේ ජේසුස් වහන්සේගේ දේශනා වලට ඇහුම්කන් නොදුන් යුදෙව් ජාතිකයින් හැඳින්වීම පිණිසය.

මෙහි දැක්වෙන ගැලීලියානු නගර වලට එරෙහිව කර ඇති ප්‍රකාශ පැහැදිලි වශයෙන් දිවැසිවරුන්ගේ ප්‍රකාශ වල අනුකරණයක් ලෙස හැඳින්විය හැකිය.[36]

Q³ මෙම අවසාන සංස්කරණයට ජේසුස් වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂා කිරීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය ඇතුළු චරිතාපදාන කථා ඇතුළත් කරමින් ජේසුස් වහන්සේගේ දේශනා වලට ඌණ පූර්ණයක් කර තිබේ.

මෙම සංස්කරණ තුන මගින් Q මූලාශ්‍රයේ ඇතුළත් කරුණු ඒකාබද්ධ කරනු ලැබ ඒවා ක්‍රමානුකූල ආගමික මුහුණුවරක් ලබාදී තිබේ.

යුදෙව් යුද්ධයට පසු කාලයේදී ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් විසින් ව්‍යවහාර කරනු ලැබුවාවූත්, අනතුරුව පසුකාලයේදී මතෙව් සහ ලූක් විසින් ශුභාරංචියේ පොත් ලිවීම සඳහා පදනම් කරගත්තාවූත් Q යනුවෙන් හැඳින්වෙන මෙම මූලාශ්‍රය පසුකාලයේදී ජේසුස් වහන්සේගේ දේශනා සහ උන්වහන්සේ පිළිබඳ කථා ප්‍රවෘත්ති ඇතුල් කොට ලියන ලද සුසංගත ලේඛනයක් වශයෙන් පැවතුණි.[37] අවසාන සංස්කරණය ශුභාරංචිය පිළිබඳ පොත් ලියූ කතුවරයින් සහ ඔවුන්ගේ අනුගාමිකයින් විසින් බොහෝ දුරට සමාන අනුපිළිවෙළකට ඉදිරිපත් කර ඇති කථා ප්‍රවෘත්ති වල දක්නට ලැබෙන වාචික සමානකම් මගින් ඒ බව පැහැදිලි වේ. එට අමතරව වාග් විද්‍යාත්මක පර්යේෂණ මගින් සොයාගත් කරුණුවලට අනුව Q යනුවෙන් හැඳින්වෙන මෙම මූලාශ්‍රය ග්‍රීක් භාෂාවෙන් ලියා තිබෙන්නට ඇති බවත් එකී මූලාශ්‍රයේ වචන යොදා ඇති පිළිවෙළ ලූක්ගේ සහ මතෙව්ගේ ශුභාරංචියේ වඩා හොඳින් ආරක්ෂා වී ඇති බවත් පෙනීයයි.

ජේසුස් වහන්සේගේ ජීවිතයේ පැතිකඩක්

ජේසුස් වහන්සේ පිළිබඳ පවතින ඓතිහාසික වශයෙන් විවාදයට තුඩු නොදෙන වාර්තා ඇත්තේ කොපමණ සුළු ප්‍රමාණයක්ද යත් මෙම වර්තා මූලාශ්‍රයේ අන්තර්ගත කරුණු විග්‍රහ කිරීමෙන් උන්වහන්සේගේ පෞරුෂය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇතිකර ගැනීමට හැකිවනු ඇත. උන්වහන්සේගේ ඉගැන්වීම් වල මූලික අංග ලක්ෂණ එහි අන්තර්ගත වී ඇතැයි විශ්වාස කෙරේ. කෙසේ වෙතත් එහි ඇතුළත් කරුණු විග්‍රහ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජේසුස් වහන්සේ පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් සලකා බැලීමට පුරුදු විය. සමහරු උන්වහන්සේ විප්ලවකාරී අදහස් ප්‍රකාශ කළ ධර්ම දේශකයෙක් ලෙස හැඳින්වූහ.[38] සමහරු උන්වහන්සේ දුටුවේ ආගමික මෙහෙවරක් සඳහා දුර්ස්ථානයන්හී රහස් රැස්වීම් පවත්වමින් බුද්ධිමතුන්ගේ නිකායක් පවා පිහිටුවා ගෙන[40] යුදෙව් ධර්මාචාර්ය වරුන් යොදාගත් ප්‍රචාරක ක්‍රම අනුගමනය කරමින් ධර්ම ප්‍රචාරය කරනු ලැබූ බුද්ධිමය ශාස්තෘන් වහන්සේ කෙනෙක් වශයෙනි.[39] සමහරු උන්වහන්සේ හෙලනීසියානු දාර්ශනිකයෙක්[41] ලෙසත් යුදෙව් ව්‍යාපාරයේ නායකයා[42] හෝ පවත්නා ආයතනික ව්‍යුහයට එරෙහිව උපමා කථා අනුසාරයෙන් අදහස් ප්‍රකාශ කළ සාමකාමී විප්ලවකාරයෙකු[43] වශයෙන් හඳුන්වන ලදී.

එසේ නම් ජේසුස් වහන්සේ යනු කවරෙක්ද? උන්වහන්සේ

දාර්ශනිකයෙක්ද? බුද්ධිමත් ශාස්තෘවරයෙක්ද? එළිදරව්ව පිළිබඳ දිවැසිවරයෙක්ද? ආගමික නිර්මාතෘවරයෙක්ද, තැනින් තැන ඇවිදිමින් ධර්මය දේශනා කළ දේශකයාණන් වහන්සේ කෙනෙක්ද? එසේත් නැතිනම් පිණ්ඩපාතික ශ්‍රමණයෙක්ද? ශුභාරංචියේ ඇතුළත් තොරතුරු වලට අනුව අප ජේසුස් වහන්සේ පිළිබඳව දන්නේ අනුන් වෙනුවෙන් දුක් විඳ මනුෂ්‍ය වර්ගයාගේ විමුක්තිය පිණිස කුරුසිය මත දිවිපිදූ මිය ගිය දෙවියන් වහන්සේගේ පුත්‍රයා, ලෝක විනාශයේදී සහ අවසාන විනිශ්චය සිදුකරනු ලබන්නාවූ දෙවියන් වහන්සේ විසින් එවනලද ගැලවුම් කාරයාණන් වහන්සේ ලෙසය.

ජේසුස් වහන්සේ නමැති සැබෑ මිනිසා තමා එවැනි පුද්ගලයකු බව ප්‍රකාශ කළේද? ජේසුස් වහන්සේ පිළිබඳව පවතින මෙම චිත්‍රය තමන් ආගමික මෙහෙවරක් සඳහා තෝරා ගන්නා ලද ගුරුකුලයක් ලෙස කල්පනා කරනු ලැබූ කිසියම් ආගමික නිකායක් විසින් හිතාමතා ගොතන ලද්දාවූ කෘත්‍රිම නිර්මාණයක්ද? Q මූලාශ්‍රය සකස්කර තිබෙන්නේ ජේසුස් වහන්සේ විසින් ආරම්භ කරන ලද ආගමික සම්ප්‍රදාය දිගටම පවත්වා ගෙන යනු ලැබූ උන්වහන්සේගේ ශ්‍රාවකයින් විසිනි. උන්වහන්සේගේ දේශනා එක්රැස් කිරීම නිසා Q මූලාශ්‍රය විශේෂයෙන් Q[1] වශයෙන් හැඳින්වෙන මූලාශ්‍රය මගින් මෙම සම්ප්‍රදායේ ඇති වටිනාකම තක්සේරු කිරීමට හැකිවී තිබේ.

Q මූලාශ්‍රයේ සම්පූර්ණ පෙළ කියවීමේදී එක් කරුණක් පැහැදිලිවේ. එනම් එම දේශනා සංග්‍රහය භාවිතා කරනු ලැබූ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් ක්‍රිස්තියානි ආගමිකයින් නොවූ බවයි. ඔවුන් ජේසුස් වහන්සේ දුටුවේ ගැලවුම් කරුවකු වශයෙන් හෝ ක්‍රයිස්තුවරයකු ලෙස නොවේ. එමෙන්ම උන්වහන්සේගේ ඉගැන්වීම් යුදෙව් ආගමට විරුද්ධව එල්ල කරන ලද පහරක් ලෙස ඔවුනු නොසැලකූහ. උන්වහන්සේගේ මරණය දෙවියන්ගේ කැමැත්ත මත සිදුවූවක් හෝ විමුක්තිය උදාකිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ඔවුනු නොසැලකූහ. ඔවුන් කිසිවෙක් ජේසුස් වහන්සේ යනු අනාගතයේදී බිහිවන නව ලෝකයක් පාලනය කිරීම සඳහා මරණයෙන් උත්ථානවූ පුද්ගලයකු බව විශ්වාස නොකළහ.[44] ඔවුන් උන්වහන්සේ දුටුවේ දුෂ්කර කාල පරිච්ඡේදවලදී ජීවත්වීමට අවශ්‍ය ආධ්‍යාත්මික මාර්ගෝපදේශකත්වය ලබාදුන් අසාමාන්‍ය ගණයේ ශාස්තෘවරයකු වශයෙනි.[45]

ජේසුස් වහන්සේ පිළිබඳ මෙම චිත්‍රය ශුභාරංචියේ දැක්වෙන වෘත්තාන්ත කථා ප්‍රවෘත්ති මගින් නිරූපණය කර ඇති ජේසුස් වහන්සේ පිළිබඳ චිත්‍රයට හාත්පසින්ම වෙනස්වේ. ශුභාරංචියේ දැක්වෙන චරිත

කථා වලට අනුව ජේසුස් වහන්සේ පහළවූයේ යුදෙව් ආගම ප්‍රතිසංස්කරණය කිරීම සඳහාය. යුදෙව් ජාතිකයින්ගේ ගැලවුම්කාරයා වශයෙන් උන්වහන්සේ යුදෙව් ධර්මාචාර්යවරුන් සහ පරිසිවරුන් විවේචනය කළහ. තමන් තුළ පැවති දිව්‍යමය බලමහිමයෙන් උන්වහන්සේ ජෙරුසලමේ පිහිටි දේවමාලිගයේ තිබූ දූෂණ නැතිකර දමා එය විනාශ වන බවට අනාවැකි පළ කළහ. තමන් විසින් කරන ලද පව් පිළිබඳ පසුතැවිලි වීමෙන් සහ නිවැරදි මාර්ගයට යොමුවීමෙන් අනාගතයේ බිහිවන දෙවියන්ගේ රාජ්‍යයෙහි විශේෂ ස්ථානයක් නොවැරදීම ලබාගත හැකිබව උන්වහන්සේ තම ශ්‍රාවකයින්ට ප්‍රකාශ කළහ. නමුත් මේ කිසිවක් Q යනුවෙන් හැඳින්වෙන ශුභාරංචියේ දක්නට නොලැබේ. එසේම උන්වහන්සේට විශේෂයෙන්ම තෝරාගත් ශ්‍රාවකයින් පිරිසක් සිටි බව හෝ යුදෙව් ආගම හෝ දේශපාලනය පිළිබඳ ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළක් පැවති බව හෝ උන්වහන්සේ ජෙරුසලමේ බලධාරීන් සමඟ අරගලකාරී වාතාවරණයක් ඇතිකරගත් බව හෝ එහි සඳහන් නොවේ. එපමණක් නොව ලෝකයාගේ විමුක්තිය සඳහා හෝ ලෝකයේ පවතින අසාධාරණය තුරන් කිරීම සඳහා කැපවීමකින් යුතුව කටයුතු කළේ වී නමුත් ඒ සඳහා උන්වහන්සේ තම ජීවිතය පරිත්‍යාග කළ බවත් හෝ ජෙරුසලමේ පළමු පල්ලිය පිහිටුවීමට ක්‍රියා කළ බවත් එහි සඳහන් නොවේ.[46]

තමන් විසින් ඉදිරියට ගෙන යා යුත්තේ කවර ආකාරයේ ආගමික මෙහෙවරක්දැ'යි යන කාරණය පිළිබඳව උන්වහන්සේගේ ශ්‍රාවකයින් දැන සිටි බවක් නොපෙනේ. කෙසේ වෙතත් පවත්නා ලෝකය වෙනස් කළ යුතු බව හෝ නව ආගමක් බිහිකළ යුතු බව ඔවුනු විශ්වාස නොකළහ. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා සහ ගැලවුම්කාරයාය යන සම්ප්‍රදායික විශ්වාසය උන්වහන්සේගේ මුල් ශ්‍රාවකයින් අතර නොතිබූ බව Q මූලාශ්‍රයේ දැක්වෙන විස්තරවලින් පැහැදිලිවේ. කෙසේ වෙතත් එසේ විශ්වාස කරනු ලැබූ කණ්ඩායම්ද සිටියහ. නමුත් පසුකාලයේදී ස්වාධීනව බිහිවූ එවැනි ආගමික කණ්ඩායම් සහ Q මූලාශ්‍රයේ ඇතුළත් ඉගැන්වීම් පිළිගත් පුද්ගලයින් අතර කිසිම සම්බන්ධතාවයක් නොතිබුණි. එමෙන්ම ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් සහ අභිප්‍රායන් පිළිබඳ ඔවුන්ට එතරම් අවබෝධයක් නොවීය.

මෙහිදී ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම් ආරක්ෂා වී ඇත්තේ Q මූලාශ්‍රයේ පමණක් යැයි නිගමනය කිරීම වැරදිය. උන්වහන්සේගේ දේශනා සහ ප්‍රකාශ සාරාත්මක ශුභාරංචියේ පොත්වල එනම් මතෙව් සහ මාක්ගේ ශුභාරංචියේ ඇතුළත් විශේෂ කථා ප්‍රවෘත්ති වලත් ජොහන්ගේ ශුභාරංචියේත්, එළිදරව්ව පිළිබඳ ලියා ඇති ලේඛනවලත්

විශේෂයෙන්ම තෝමස්ගේ ශුභාරංචියේත් ඇතුළත් වී තිබෙන බව අපි දනිමු. සංස්කරණය කරන ලද Q^2 සහ Q^3 වශයෙන් හඳුන්වා ඇති මූලාශ්‍රවල දැක්වෙන කරුණු සමග සලකා බැලීමේදී Q^1 වශයෙන් හැඳින්වෙන මූලාශ්‍රය ජේසුස් වහන්සේ වෙත ආරෝපණය කර ඇති වෙනත් ප්‍රකාශ ඇගයීම සඳහා යොදාගත හැකි වැදගත් නිර්ණායකයක් ලෙස යොදාගත හැකිය. Q මූලාශ්‍රයෙන් පිටස්තරව පවතින වෙනත් මූලාශ්‍ර වල සඳහන් කර ඇති ජේසුස් වහන්සේගේ සැබෑ ප්‍රකාශ වෙන් කර හඳුනා ගැනීම සඳහා කැලිෆෝර්නියාවේ සොනෝමා හි පිහිටුවා ඇති වෙස්ටාර් නමැති ආයතනයේ (Westar Institute in Sonoma, California) පිහිටි 'ජීසස් සෙමිනාර්' (Jesus Seminar) නමැති සංවිධානය විසින් අතිශය දුෂ්කර කාර්යයක නියැලී සිටී. නව තෙස්තමේන්තුවේ ඇතුළත් විස්තර ප්‍රවෘත්තිවලින් පමණක් නොව ජේසුස් වහන්සේගේ දේශනා ආරක්ෂාවී පවතින එළිදරව්ව පිළිබඳ වෙනත් ලියකියවිලි වල අන්තර්ගත කරුණු වලින්ද ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා තෝරා බේරා ගැනීම මෙම සංවිධානයේ පරමාර්ථය වේ.

මෙම පරීක්ෂණ මඟින් පළමුවෙන් කරන ලද්දාවූත්, විශ්මයජනකවූත් සොයාගැනීම වූයේ ජේසුස් වහන්සේ හෝ Q මූලාශ්‍රය ගුරුතන්හි තබාගත් පුද්ගලයින් ක්‍රිස්තියානි ආගමිකයින් නොවූ බවය. ජේසුස් වහන්සේගේ මුල් ශ්‍රාවකයින් හා ක්‍රිස්තු ලබ්ධිය අතර පැවතියේ ඉතා සුළු සමානත්වයක් බව Q මූලාශ්‍රයෙන් පැහැදිලි වේ. Q මූලාශ්‍රයේ පැරණිතම ස්ථරයේ අන්තර්ගත ජේසුස් වහන්සේගේ දේශනා එකතුව කියවීමෙන් ඒ බව මැනවින් පැහැදිලි වේ. කන්ද උඩ දේශනාවේ සමහර කොටස් මෙම සංග්‍රහයේ ඇතුළත් ජේසුස් වහන්සේගේ වැදගත් දේශනා අතරට අයත් වේ. එමෙන්ම Q1 මූලාශ්‍රයේ දැක්වෙන අනෙකුත් කොටස් සදාචාරාත්මක ඉගැන්වීම්වලට නෑකම් කියයි.

ජෝන් ක්ලොපන්බර්ග් (John Kloppenborg) විසින් ඉතා මෑතකදී කරන ලද ශාස්ත්‍රීය විග්‍රහයකට අනුව බර්ටන් එල්. මැක් (Burton L. Mack) විසින් රචනා කරන ලද කියවා පහසුවෙන් තේරුම්ගත හැකි Q^1 මූලාශ්‍රයේ සම්පූර්ණ පෙළෙහි නව සංස්කරණය පහත සඳහන් කර ඇති ජේසුස් වහන්සේගේ දේශනා නැමති උප මාතෘකාව යටතේ ඉදිරිපත් කර තිබේ.[47] Q මූලාශ්‍රය නමින් හැඳින්වෙන මෙම ශුභාරංචිය පිළිබඳ පොතට කුඩා ඡේද 62 ක් ඇතුළත් වේ. මෙහිදී අප ඉදිරිපත් කර ඇති ඡේද විසි එක Q මූලාශ්‍රයේ පැරණිතම ස්ථරයට අයත් වේ. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් විසින් ආදරයෙන් හා ගෞරවයෙන් ගුරුතන්හි තබාගත් ශුභාරංචියේ මුල් පොතවූ Q මූලාශ්‍රයේ අඩංගු කරුණු Q^1 යනුවෙන් හඳුන්වා ඇති මෙම මූලාශ්‍රයේ ඇතුළත් වේ.

අපට ලැබී ඇති ජේසුස් වහන්සේගේ මෙම සැබෑ දේශනා කියවීමේදී උන්වහන්සේ පිළිබඳ අප දන්නවායැ'යි සිතා සිටින සියලුම දේ මොහොතකට අමතක කිරීම යෝග්‍යය. ජේසුස් වහන්සේ යනු මළවුන්ගෙන් උත්ථාන වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාය. උන්වහන්සේ පැමිණියේ කුරුසියමත දිවිපිදීමෙන් මනුෂ්‍ය වර්ගයා පාපයෙන් මුදාගැනීම පිණිසය යන විශ්වාසය මොහොතකට අමතක කරන්න. පූර්ව විනිශ්චයන්ට එළඹීමෙන් සහ අප විසින් කියවා ඇති අපට හුරු කථා ප්‍රවෘත්තිවල බලපෑමකින් තොරව මෙහි දැක්වෙන කරුණු පිළිබඳ ස්වාධීනව සිතා බලන්න. ජේසුස් වහන්සේගේ සැබෑ වචන වලට ඇහුම්කන් දෙන්න.

ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා

ජේසුස් වහන්සේගේ ඉගැන්වීම මෙවාය. එකල උන්වහන්සේ රැස්ව සිටි සෙනඟ දැක තම ශ්‍රාවකයින්ට මෙසේ වදාළ සේක.

"දිළින්දෝ භාග්‍යවන්තයෝය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔවුන්ගේය. සාගින්නෙන් පෙළෙන්නෝ භාග්‍ය වන්තයෝය. මන්ද දෙවියන් වහන්සේ ඔවුන් පෝෂණය කරනු ලබන හෙයිනි. කඳුළු හෙලන්නෝ භාග්‍යවන්තයෝය. මන්ද ඔවුන් සිනාසෙනු ඇත."

"මම ඔබට මෙසේ කියමි. ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට සාප කරන්නාවුන්ට ආශිර්වාද කරන්න.
ඔබට ගැරහුම් කරන්නන් උදෙසා යාච්ඤා කරන්න.
යමෙක් ඔබේ කම්මුලට පහරක් ගැසුවොත් ඔහුට ඔබේ අනිත් කම්මුලත් පාන්න. යමෙක් ඔබේ කබාය උදුරාගත හොත් ඔහුට ඔබේ කමිසයද දෙන්න. ඔබෙන් ඉල්ලන හැමටම දෙන්න. යමෙක් ඔබ සතු දේ පැහැර ගතහොත් ඔහුගෙන් ඒවා යළි නොඉල්ලන්න.
අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමතිද ඔබත් ඔවුන්ට ඒ දේම කරන්න.
ඔබට ප්‍රේම කරන්නන්ට පමණක් ඔබ ප්‍රේම කරන්නේ නම් ඉන් ඔබට ලැබෙන්නේ කවරනම් ප්‍රශංසාවක්ද? අයබදු රැස්කරන්නෝ පවා ඔවුන්ට ප්‍රේම කරන්නන්ට ප්‍රේම කරති. එය එසේ නොවේද? ඔබ ඔබේ සහෝදරයින් පමණක් වැළඳගන්නේ නම් අන් අය කරන දෙයට වඩා ඔබ කරන දෙයෙහි ඇති වෙනස කුමක්ද? සැම දෙනාම එසේ කරනු නොලබන්නේද? ඔබ නැවත අයකර ගැනීමේ බලාපොරොත්තුවෙන් ණයට දෙන්නහු නම් ඉන් ඔබට කවර නම් ප්‍රශංසාවක් වේද? පව්කාරයෝ පවා නැවත අයකර ගැනීමේ බලාපොරොත්තුවකින් තොරව ස්වකීය වර්ගයාට ණය දෙති. ඔබ එසේ නොකරන්න.

ඒ වෙනුවට ඔබේ සතුරාට පවා ප්‍රේම කරන්න. යහපත සලසන්න.
නැවත අය කර ගැනීමේ බලාපොරොත්තුවෙන් තොරව ණය දෙන්න.
එසේ කිරීමෙන් ඔබට ලැබෙන විපාක මහත් වේ. එවිට ඔබ දෙවියන්
වහන්සේගේ දරුවන් වන්නුය.
මන්ද දෙවියන් වහන්සේ නපුරුවුන්, යහපත් වුන් හැමදෙනාටම
එකසේ හිරු එළිය උදාකරවන හෙයිනි. සාධාරණවුන් අසාධාරණවුන
'හැම දෙනාටම එකසේ වර්ෂාව ලබාදෙන හෙයිනි."

"දෙවියන් වහන්සේ දයානුකම්පාව ඇතිව සිටින්නාක් මෙන් ඔබද
දයානුකම්පා ඇතිව සිටින්න.
අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් විනිශ්චය කරනු
නොලැබේ. මන්ද ඒ සඳහා ඔබ යොදාගන්නා මිම්ම ඔබව විනිශ්චය
කිරීම සඳහාද යොදාගනු ලබන හෙයිනි."

"අන්ධයකුට මඟ පෙන්වීමට තවත් අන්ධයකුට හැකිද? එසේ කිරීමෙන්
ඔවුන් දෙදෙනාම වළක වැටෙන්නේ නැද්ද? ගෝලයකු ගුරුවරයාට
වඩා උසස් නොවේ. ගෝලයකු තම ගුරුවරයා හා සමවීම
ප්‍රමාණවත්වේ."

"ඔබ ඔබේ ඇසෙහි තිබෙන ලී කොටය නොදැක ඔබේ සහෝදරයාගේ
ඇසෙහි තිබෙන ලී පතුර සෙවීමට පෙළඹෙන්නේ කෙසේද? ඔබේ
ඇසේ තිබෙන ලී කොටය නොදකින ඔබ, "සහෝදරය, ඔබේ ඇසේ
ඇති තිබෙන ලී පතුර ඉවත ලන්නට ඉඩ දෙන්නැයි" ඔබට කෙසේ
කිවහැකිද? එම්බා කෛරාටිකය, පළමුව ඔබේ ඇසේ තිබෙන ලී
කොටස ඉවත ලන්න. එවිට ඔබට සහෝදරයාගේ ඇසෙහි තිබෙන
ලී පතුර ඉවත්කළ හැකිවනු ඇත.'

"හොඳ ගසක නරක ඵල හට නොගනී, නරක ගසක හොඳ ඵල හට
නොගනී. කටු ගසකින් අත්තික්කා ඵල හෝ ගොකටු පඳුරකින් මිදිඵල
නෙළාගත හැකිද? සෑම ගසක්ම එහි ඵල වලින් හඳුනාගත හැකිවේ."
යහපත් මිනිසා තම සිතෙහි නිදන් කළ යහපත් සිතිවිලි වලින් යහපත්
ක්‍රියාද, අයහපත් මිනිසා අයහපත් සිතිවිලි වලින් අයහපත් ක්‍රියාද
සිදුකරයි. මන්ද වචනයෙන් පිටවන්නේ සිතෙහි පහළවන සිතිවිලි
නිසාය."

"මා කියන දේ නොකර ඔබ මට 'ස්වාමීනි, ස්වාමීනි'යි කියා
අමතන්නේ මන්ද?
මාගේ අනුශාසනා වලට කන්දී ඒවා පිළිපදින අය පර්වතයක් මත
ගෙයක් ඉදිකරනු ලැබූ පුද්ගලයකුට සමානය. වැසි වැස සැඩපහර
නිවසට වැදුණු නමුත් නිවස බිඳ වැටුණේ නැත. මන්ද එය මනා

අත්තිවාරමක් මත ඉදිකොට තිබුණු හෙයිනි.
එහෙත් මා පවසන වචන අසා ඒ අනුව පිළිපදිනු නොලබන්නෝ
වැල්ලේ ගෙයක් ඉදිකළ මිනිසකුට සමානය. වැසි වැස සැඩ පහර
ගෙට වැදීමෙන් එය පොළවට පතිතවිය. ඒ ගෙට සිදුවූ විනාශය
අතිවිශාලය."

එක් මිනිසෙක් ජේසුස් වහන්සේ අමතා මෙසේ කීවේය. "ඔබ වහන්සේ
යන ඕනෑම තැනකට මමත් ඔබ වහන්සේ අනුව එන්නෙමි." ජේසුස්
වහන්සේ ඔහුට පිළිතුරු දෙමින් "හිවලුන්ට බෙන ඇත. අහසෙහි
සැරිසරන කුරුල්ලන්ට කැදලි ඇත. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට
හිස තබා ගැනීමටවත් තැනක් නැතැයි" පැවසුහ.
"තවත් මිනිසෙක් "ස්වාමීනි, පළමුකොට මාගේ මියගිය පියා භූමිදාන
කරනු පිණිස මට යාමට අවසර දුන මැනව"යි කීය. උන්වහන්සේ
පිළිතුරු දෙමින් "මළවුන්ගේ භූමිදානය මළවුන්ම කළාවේ" යැයි
පැවසුහ.
තවත් කෙනෙක් "ස්වාමීනි, මමද ඔබ වහන්සේ අනුව එන්නෙමි.
එහෙත් පළමුකොට මාගේ ගෙදර උදවියගෙන් සමුගෙන එමට මට
අවසර දුන මැනවැ"යි කීවේය. එවිට ජේසුස් වහන්සේ ඔහුට පිළිතුරු
දෙමින් "නඟුලට අතතබා ආපසු හැරී බලන කිසිවෙක් දෙවියන්
වහන්සේගේ රාජ්‍යයට සුදුසු නැතැ"යි ඔහුට ප්‍රකාශ කළහ.

උන්වහන්සේ මෙසේ පැවසුහ. "අස්වැන්න නම් සශ්‍රීකය, නමුත්
මෙහෙකරුවන් විරලය. එබැවින් අස්වැන්න කැපීමට මෙහෙකරුවන්
එවන ලෙස අස්වැන්න හිමියාගෙන් ඉල්ලා සිටින්න.
දැන් පිටත්වන්න, වෘකවලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන්
මම ඔබ පිටත්කර යවන සැටි බලන්න.
ඔබ චාරිකාවේ යෙදෙන විට මුදල් හෝ මල්ලක් හෝ පාවහන් හෝ
සැරයටියක් රැගෙන නොයන්න. මඟදී හමුවන කිසිවකුට ආචාර
කිරීම සඳහා ප්‍රමාද නොවන්න.
ඔබ යම්කිසි ගෙදරකට ඇතුළු වූ කල පළමුකොට "මේ ගෙදරට
සාමය උදාවේවා" යයි පතන්න.
සාමය ලැබීමට සුදුස්සෙක් එහි සිටීනම් ඔබේ පැතුම පිළිගනු ඇත.
(ඉන් අදහස් වන්නේ ඔබගේ සාම පැතුම ඔහු පිට රැඳෙනු ඇත යන්නය.)
නැතහොත් ඔබේ සාම පැතුම ඔබ වෙත පෙරළා එනු ඇත.
එම නිවසේ පදිංචිකරුවුන් දෙන දෙයක් කමින් බොමින් ඒ ගෙදරම
නැවතී සිටින්න. මන්ද මෙහෙකරුවා සිය වේතනය ලැබිය යුතු
හෙයිනි. ගෙයින් ගෙට නොයන්න.
ඔබ යම් නුවරකට ඇතුල් වූ කල ඔවුන් ඔබ පිළිගතහොත් (නුවර

වැසියන්ට ඔබ ඉදිරියේ තබන දේ වළඳන්න. එම නිවසෙහි රෝගීන් සිටී නම් ඔවුන් කෙරෙහි සැලකිල්ල යොමුකරන්න. "දෙවියන්ගේ රාජ්‍යය ඔවුන් වෙත පැමිණ ඇතිබව ඔවුන්ට ප්‍රකාශ කරන්න."

එහෙත් යම් නුවරකට ඔබ ඇතුළු වූ කල ඔවුන් ඔබ නොපිළිගතහොත් ඔබ එතැනින් පිටවී යන කල ඔබේ පාදවල වැකුණු දූවිලි ගසා මෙසේ කියන්න: "කෙසේ වුවත් දෙවියන්ගේ රාජ්‍යය ඔබ වෙත ළංව ඇතිබව ස්ථිරව කියමි.

ඔබ යාච්ඤා කරන කරන විට මෙසේ කියන්න
"පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා.
ඔබගේ රාජ්‍යය පැමිණේවා.
අපේ දිනපතා භෝජනය අපට දුන මැනව
අපේ ණය සමාකළ මැනව. මන්ද අපට ණය ගැති හැමට අප සමාකරන බැවිනි. අප පරීක්ෂාවට නොපමුණුවනු මැනව"
"ඉල්ලන්න, එය ඔබට දෙනු ලැබේ. සොයන්න, එය ඔබට සම්බවේ.
තට්ටුකරන්න, ඔබට දොර අරිනු ලැබේ.
මන්ද ඉල්ලන හැමටම ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටු කරන්නාට දොර ඇරේ.
ඔබ අතුරින් කවර නම් පියෙක් තම පුත්‍රයා පාන් ගෙඩියක් ඉල්ලූ විට පාන් වෙනුවට ඔහුට ගල්ගෙඩියක් දෙයිද? මාළුවෙක් ඉල්ලූවිට සර්පයෙක් දෙයිද? මෙසේ යහපත් නොවූ ඔබ ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්නට දන්නාහුනම් ස්වර්ගයේ වැඩ සිටින පියාණන් වහන්සේ උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්නන්ට කොපමණ වැඩියෙන් යහපත් දේ ඔවුන්ට ලබා දෙන්නාහුද?"

"අනාවරණය නොවන සැඟවුන කිසිවක් හෝ එළිදරව් නොවන රහසක් නොමැත.
මා ඔබට අඳුරේදී පැවසූ දෙය එළියට විත් කථාකරන්න. ඔබේ කණට කොඳුරා කියන ලද දෙය පියසි මුදුනෙන් පළකරන්න."

"ශරීරය මරාදැමුවත් ආත්මය නසා නොදැමිය හැකි අයට බිය නොවන්න. ඇටවු දෙකකට ගේ කුරුල්ලන් පස්දෙනෙක් මිලයට ගත හැකි නොවේද? දෙවියන් වහන්සේගේ දැන ගැනීමෙන් තොරව උන්ගෙන් කිසිවෙක් පොළවට නොවැටේ. ඔබේ හිසේ ඇති කෙස් ගස් සියල්ලම පවා ගණන් කොට තිබේ. එනිසා බිය නොවන්න. ඔබ ගේ කුරුල්ලන් රංචුවකට වඩා අගනේය."

සෙනග අතරින් එක් තැනැත්තෙක් කථාකොට, "ගුරුදේවයිනි, මා සමග අපේ උරුමය බෙදා ගන්නා ලෙස මගේ සහෝදරයාට කිව මැනවැයි උන්වහන්සේට කීය. එහෙත් උන්වහන්සේ කථා කරමින්

"මිත්‍රය මා ඔබේ නඩුකාරයා හෝ නීතිඥයා වශයෙන් පත්කරනු ලැබුවේ කවරෙක් විසින්දැ"යි ඔහුගෙන් ඇසීය.

උන්වහන්සේ උපමාවක් කියමින් මෙසේ පැවසූහ. "එක් පොහොසත් මිනිසකුගේ වතුපිටිවල බොහෝ ඵලදාව ඇතිවිය. එවිට ඔහුට මෙවැනි සිතිවිල්ලක් පහළවිය. මම කුමක් කරම්ද? මාගේ භවභෝග රැස්කර තබන්නට ඉඩකඩ නැත. මම මෙසේ කරමි. මාගේ අටුකොටු කඩාදමා වඩා විශාල අටුකොටු තනා සියලු ධන ධාන්‍ය ඒ තුළ රැස් කොට තබමි. එවිට මම මගේ ආත්මයට මෙසේ කියමි. 'වසර ගණනාවකට සෑහෙන තරම් අගනා වස්තු සම්භාරයක් මෙහි රැස් කොට තිබේ. විවේක සුවයෙන් ඒවා කා බී ප්‍රීතිවන්න'. එහෙත් දෙවියන් වහන්සේ ඔහුට කථා කොට, "අඥානය, අද රාත්‍රියේදී ඔබගේ ප්‍රාණය නිරුද්ධවේ. එවිට ඔබ රැස්කර ගත් දෙය කවරෙකුට අයිති වන්නේද"යි ඇසූ සේක. "දෙවියන් ඉදිරියෙහි පොහොසත් නොවී තමා සඳහාම වස්තු රැස්කර ගන්නා අයට අත්වෙන ඉරණම මෙසේ වේ යැ"යි ප්‍රකාශ කළ සේක."

"මම ඔබට මෙසේ කියමි. කුමක් කරම්ද? කියා ජීවිතය ගැනවත්, කුමක් අඳිම්ද කියා ශරීරය ගැනවත් කරදර නොවන්න. කෑමට වඩා ජීවිතයත්, ඇඳුමට වඩා ශරීරයත් උතුම් නොවන්නේද?
කපුටන් ගැන කල්පනා කරන්න. උන් වපුරන්නේවත්, අස්වැන්න කපන්නේවත්, ධාන්‍ය අටුකොටුවල ගබඩා කරන්නේවත් නැත. දෙවියන් වහන්සේ උන් පෝෂණය කරන සේක. ඔබ පක්ෂීන්ට වඩා කොතරම් අගනේද? සිත් තැවුල් වීමෙන් ජීවත්වන කාලය එක් දිනකින් හෝ දික් කර ගත හැක්කේ ඔබ අතරින් කවරෙකුටද? එසේ නම් ඔබ ඇඳුම් ගැන කරදර වන්නේ ඇයි? මානෙල් මල් ගැන කල්පනා කර බලන්න. ඒවා නූල් කටින්නේවත් වියන්නේවත් නැත. එහෙත් තමාගේ සකල ශෝභාශ්‍රීයෙන් සැරසී සිටි සොලමොන් රජතුමා පවා මානෙල් මලක් සේ විරාජමාන නොවීය. ශ්‍රද්ධා හීන තැනැත්තෙනි, අද කෙතෙහි වැඩී හෙට උදුනෙහි දමා පුලුස්සා දමන තණ පවා දෙවියන් වහන්සේ මෙසේ සුන්දර ලෙස සරසන්නේ නම් ඊට කොපමණ වැඩියෙන් උන්වහන්සේ ඔබ සරසන සේක්ද?
එබැවින් 'අප කුමක් කන්නේද කියාවත් අප කුමක් බොන්නේද කියාවත්, අප කුමක් අඳින්නේද කියාවත්' සිතමින් කරදර නොවන්න.
මේ සියල්ල ලෝකයේ ජීවත්වන සියලු දෙනා විසින්ම සරනු ලැබේ.
මේ දේවල් සියල්ලම ඔබට අවශ්‍ය බව ඔබේ පියාණන් වහන්සේ දන්නා සේක. එනිසා උන්වහන්සේගේ රාජ්‍යය සොයා යන්න. එවිට මේ සියලු දේ ඔබට ලැබෙනු ඇත.

"ඔබ සතු දේ විකුණා දන් දෙන්න. කාටුත් නොකන මල නොබැඳෙන, සොරුන්ට පැමිණ සොරකම් කළ නොහැකි සම්පත් ඔබ වෙනුවෙන් ස්වර්ග රාජ්‍යයේ රැස් කර තබන්න. මන්ද ඔබගේ වස්තුව කොතැනද ඔබේ සිතත් එතැනය."

උන්වහන්සේ කථාකොට මෙසේ ප්‍රකාශ කළහ. 'දෙවියන් වහන්සේගේ රාජ්‍යය කුමකට සමානද? එය මා කුමකට උපමා කරම්ද? එය එක්තරා මිනිසකු තම වත්තෙහි රෝපණය කළ අබ ඇටයකට සමානය. එය වැඩී මහ ගසක් විය. අහසේ පැරිසරන කුරුල්ලෝ පැමිණ එහි අතුවල කූඩු තනාගත්හ. උන්වහන්සේ යළිත් කථා කොට "දෙවියන් වහන්සේගේ රාජ්‍යය, ස්ත්‍රියක විසින් පිටිනැළි තුනක් ගෙන ඒවා මුළුමනින් පිපෙන තෙක් ඒ තුළට දමන ලද මුහුන් පිඩකට සමානයැයි ප්‍රකාශ කළහ."

"තමා ගැනම පාරට්ටු කරගන්නා පුද්ගලයා සෑම කෙනෙකුගේම අවමානයට පාත්‍රවනු ඇත. නිහතමානී පුද්ගලයා ප්‍රශංසාවට පාත්‍රවනු ඇත."

"එක් ගෘහපතියෙක් මහා භෝජන සංග්‍රහයක් පිළියෙළ කර ඊට සහභාගී වන ලෙස බොහෝ දෙනෙකුට ආරාධනය කළේය. භෝජන වේලාව පැමිණෙත්ම ඔහු දැන් සියල්ල සූදානම්, පැමිණෙන්නයැ'යි ආරාධිතයින්ට දැන්වීම සඳහා සිය දාසයා පිටත්කර හැරියේය. නමුත් ඔවුන් සියලු දෙනාම භෝජන සංග්‍රහයට පැමිණිය නොහැකි බව ප්‍රකාශ කරමින් නිදහසට කරුණු කියන්නට පටන් ගත්හ. පළමුවැන්නා "මම කෙතක් මිලදී ගත්තෙමි. එය බැලීමට යාමට අවශ්‍යය. මට සමා වන මෙන් ඉල්ලමි'යි ඔහුට කීවේය. තව කෙනෙක්, 'මම ගොනුන් පස් බානක් මිලදී ගතිමි. මට දැන් ඔවුන් පරීක්ෂාකර බැලීමට තිබේ. මට සමාවන ලෙස ඉල්ලමි'යි කීවේය. තවත් කෙනෙක් 'මම ස්ත්‍රියක විවාහකර ගත්තෙමි. එබැවින් පැමිණිය නොහැකිය'යි කීවේය. ඒ දාසයා පෙරළා පැමිණ සිය ස්වාමියාට එපුවත් දැන්වීය. එබස් ඇසූ ගෘහපතියා කෝපයට පත්ව "වහාම නුවර වීදිවලට ගොස් ඔබට හමුවන තරම් මිනිසුන් මෙහි රැගෙන එව'යි දාසයාට අණ කළේය. එවිට දාසයා නුවර මාවත් වලට ගොස් එහිදී ඔහුට හමුවූ සියලු දෙනාම කැඳවාගෙන ආවේය. මෙසේ මුළු ගෙයම අමුත්තන්ගෙන් පිරී ගියේය."

"තම පියා හෝ මව හෝ අත් නොහරින කිසිවෙකුට මගෙන් ඉගෙනීමට නොහැකිවනු ඇත. තම පුත්‍රයා හෝ දියණිය අත් නොහරින කිසිවෙකුට මගේ ගෝලයකු විය නොහැකිය.

කුරුසිය දරාගෙන මා අනුව නොඑන කිසිවෙකුට මාගේ ගෝලයකු විය නොහැකිය.

තම ජීවිතය ආරක්ෂාකර ගැනීමට වෙහෙසවන පුද්ගලයකුට ජීවිතය අහිමිවනු ඇත. එහෙත් මා උදෙසා ජීවිතය අහිමි කරගන්නා පුද්ගලයකුගේ ජීවිතය නොනැසී පවතිනු ඇත."

"ලුණු හොඳ දෙයකි. එහෙත් එහි ඇති ලුණු ගතිය නැති වුවහොත් එය නැවත ලබාගන්නේ කෙසේද? එවිට ඉන් පොළොවටවත් කසල ගොඩටවත් වැඩක් නැත. එවිට මිනිස්සු ඒවා ඉවත දමති."

(බර්ටන් එල්. මැක් විසින් ලියන ලද නැතිවූ ශුභාරංචිය හෙවත් Q මූලාශ්‍රය සහ ක්‍රිස්තියානි ආගමේ මුල් ආරම්භය නැමැති පොතෙන් උපුටාගන්නා ලදී. From 'The lost gospel: The Book of Q and Christian Origins, Element Books, Shaftesbury, 1993)

ජේසුස් වහන්සේ සහ බෞද්ධ මූලාශ්‍ර

මීට කලින් පරිච්ඡේදයේ දක්වනු ලැබූ ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා ඒවායේ ශෛලියට සහ අන්තර්ගතයට හානියක් නොවන පරිදි ඒකාබද්ධ කොට සංග්‍රහයක් වශයෙන් සකස් කර තිබේ. එම දේශනාවලට අනුව විමුක්තිය අපේක්ෂා කරන්නවුන් විසින් පිළිපැදිය යුතු පවුල් බැඳීම් අත්හැරීම, ස්වකැමැත්තෙන් ගිහිගෙය අත්හැරීම, පාරිශුද්ධත්වය පිළිබඳව පැවති සම්මත විශ්වාස ඉවත දැමීම, ජීවත්වීමේදී සහ වස්ත්‍රාභරණ පැළඳීමේදී සරල ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම සහ ආහාර සීමායාමේදී නිහතමානීවීම වැනි කරුණු පිළිබඳව උන්වහන්සේ අදහස් දක්වා තිබේ. එහෙත් සංකීර්ණ ආගමික සංකල්ප හෝ එළිදරව්ව පිළිබඳ කරන ලද අනතුරු හැඟවීමේ කිසිම ප්‍රකාශයක් ඒවා අතර දක්නට නොලැබේ. Q' වශයෙන් සඳහන් කර ඇති මූලාශ්‍රයේ දැක්වෙන ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා කොතරම් සරලද, පැහැදිලිද යත් ඒ පිළිබඳව පර්යේෂණ පැවැත්වූ පුද්ගලයින් උන්වහන්සේගේ එම ප්‍රකාශ ශ්වානවාදීන් (Cynics) යනුවෙන් හඳුන්වනු ලැබූ ග්‍රීක් දාර්ශනිකයින්ගේ මතවාද සමග සංසන්දනය කිරීමට පවා පෙළඹුනහ. ඔවුහු ජේසුස් වහන්සේ වතුර පීප්පයක් තුළ ජීවත්වූ ඩයොජිනීස් (Diogenes) වැනි ශ්වානවාදී ග්‍රීක් දාර්ශනිකයින්ට සමාන කළහ.

ආගමික ඉතිහාසඥයකුවූ බර්ටන් එල්. මැක් වැනි විද්වතුන් ජේසුස් වහන්සේ යනු හෙලනිසියානු සභ්‍යත්වයේ ආභාෂය ලැබූ ශ්වානවාදීන් වශයෙන් හඳුන්වනු ලැබූ ග්‍රීක් දර්ශනවාදී පසුබිම තුළ හිඳිවූ

බුද්ධිමය ශාස්තෘවරයකු ලෙස හඳුන්වා දී තිබේ. Q' මූලාශ්‍රයේ අඩංගු කරුණු මතුපිටින් සලකා බැලීමේදී එම අදහසේ කිසියම් සත්‍යයක් තිබෙන බව පෙනේ. ජේසුස් වහන්සේ විසින් කරන ලද "මළවුන්ගේ භූමදානය මළවුන්ටම කළාවේ" වැන්න, කෙනෙක් දැඩි අපහසුතාවයට පත් කිරීමට හේතුවන ප්‍රකාශ කිරීම සහ "කිසිවෙක් ඔබේ කබාය උදුරාගනහොත් ඔහුට ඔබේ කමිසයද දෙන්න" වැනි සමාජය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි අවදානම් සහිත මත දැරීම සලකා බැලීමේදී එම අදහස තහවුරු වන බව පෙනේ. උන්වහන්සේ විසින් කරන ලද බොහෝ ප්‍රකාශ කියවීමේදී ශ්වනවාදී දාර්ශනිකයන් වශයෙන් හැඳින්වූ ග්‍රීක් චින්තකයින් තුළ පැවති ආකල්ප, සීමිත අවශ්‍යතා, නිහතමානී පැවතුම්, සහ සම්ප්‍රදායික විශ්වාස බැහැර කිරීම වැනි කරුණු සිහියට නැගේ. උන්වහන්සේගේ දේශනා වල දක්නට ලැබෙන වාගාලංකාරය (Rhetoric) පවා එකී දාර්ශනිකයින් සිහිපත් කරයි.

වාග් විද්‍යාත්මකව සලකා බැලීමේදී උන්වහන්සේගේ ඉගැන්වීම අතිශයින්ම ඒකාග්‍රවූත් සංක්ෂිප්තවූත් ප්‍රකාශවලින් යුක්තවේ. ඒවාට සිද්ධාන්ත, ආප්ත පද, උපාඛ්‍යාන (කෙටි කථා ප්‍රවෘත්ති), උපදේශ කථා සහ මෙෂාලිම් (Meshalim) යනුවෙන් හැඳින්වෙන ඉතා කෙටිවූත්, සුපරීක්ෂාකාරීව නිර්මාණය කරන ලද්දවූත් ප්‍රකාශ ඇතුළත් වේ.[48] ශ්වනවාදී දාර්ශනිකයෝ ජීවිතය පිළිබඳ ගැඹුරු නියමයන් සහ ශාස්ත්‍රීය අදහස් සංහුන්වූත් හුරුබුහුටි වූත් ආකාරයෙන් ඉදිරිපත් කිරීම සඳහා ඉහත දැක්වූ ආකෘති නිර්මාණය කළහ. තොරෙස් නම් පැවති ආකෘති පරිපූර්ණත්වයට පත් කළහ.

එකල ජීවත්වූ දාර්ශනිකයින්ගෙන් සමහරෙක් ඔවුන්ගේ දර්ශනවාද ඉගැන්වීම සඳහා මෙම ක්‍රමවේදය අනුගමනය කළ බව පල්ලියේ පූජකවරු දැන සිටියහ. එහෙත් ජේසුස් වහන්සේ අනෙකුත් ලෞකික ශාස්තෘවරයින් අතුරින් කෙනෙක් ලෙස සැලකීම වැළැක්වීම සඳහා ජස්ටින් නැමති පූජකවරයා විසින් උන්වහන්සේ අනුගමනය කළ දේශනා ශෛලිය දෙවියන්ගේ ආනුභාවය නිසා ඇතිවූවක් බව ප්‍රකාශ කරමින් එයට දිව්‍යමය බලයක් ආරෝපණය කිරීමට උත්සාහ කළේය. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් උන්වහන්සේ භාෂාව හැසිරවීමේදී අසාමාන්‍ය නිපුනත්වයකින් හෙබි සත්‍යය දේශනා කළ ශාස්තෘවරයකු හෙවත් සැබෑ ශාස්තෘවරයකු ලෙස සැලකූහ.

ශුභාරංචියේ සෑම පොතකම උන්වහන්සේ අමතා තිබෙන්නේ "ගුරුදේවයිනි" යනුවෙනි. මාක්ගේ ශුභාරංචියේ ජර්මන් පරිවර්තනයේ (මාක් 12:14) මෙසේ සඳහන් වේ. "ගුරුදේවයිනි,... ඔබ දෙවියන්

වහන්සේගේ මාර්ගය සැබෑ ලෙස පෙන්වා දෙන සේක." තෝමස්ගේ ශුභාරංචියේ ජේසුස් වහන්සේ ප්‍රාඥයකු හා දාර්ශනිකයකු වශයෙන් හඳුන්වා තිබේ. (තෝමස් 13)

ජේසුස් වහන්සේ තුළ පැවති භාෂාව හැසිරවීමේ මෙම අසාමාන්‍ය කුසලතාවය මගින් උන්වහන්සේ මිනිසුන් මවිතයට පත් කළ බවට කිසිම සැකයක් නැත. ශ්‍රාවකයන්ට තම ඉගැන්වීම කටපාඩම් කර මතකයේ රඳවා ගැනීම පහසුවීම පිණිස උන්වහන්සේ කාව්‍යමය භාෂාවකින් ධර්මය දේශනා කළහ. ඒ සඳහා උන්වහන්සේ කාව්‍යමය ආකෘති හතරක් යොදාගෙන තිබේ. ඒවා නම් වාක්‍ය ව්‍යුහයේ අංගසමතාවය, ඵලිසමය, වචන භාවිතය, සහ රිද්මය වේ.[49] ශ්‍රාවකයින් නිරතුරුවම අවධියෙන් තබාගැනීම සඳහා උන්වහන්සේ මෙම කථා විලාසය උපයෝගී කර ගත්හ. උන්වහන්සේ තම පණිවිඩය ඉදිරිපත් කිරීමේදී දැඩි විසංසන්දනයන් සහ අතිශයෝක්තියෙන් යුක්ත ප්‍රකාශ යොදාගෙන තිබෙන්නේ ඒ නිසාය.

කෙසේ වෙතත්, ජේසුස් වහන්සේ පලස්තීනයේ වාසය කළ හෙලනිසියානු ආභාෂය ලත් ශ්වනවාදී දාර්ශනිකයකුට සමාන කිරීමෙන් උන්වහන්සේ පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇතිකර ගැනීමට හෝ උන්වහන්සේගේ ඉගැන්වීම් වල අන්තර්ගතය සහ එකී ඉගැන්වීම් මගින් සිදුකර ඇති බලපෑම් පිළිබඳ සාධාරණත්වය ඉටු කිරීමට නොහැකිය. එකල පලස්තීනයේ දර්ශනය ඉගැන්වීම සඳහා බොහෝවිට කෙටි ආප්ත පද යොදාගැනීම සිරිතක්ව පැවතුණි. ජේසුස් වහන්සේ එවැනි පරිසරයක් පැවති රටක ක්‍රියාකාරී (සක්‍රීය) ශාස්තෘවරයකු ලෙස කටයුතු කළහ.

ශ්වනවාදී හෙලනිසියානු දාර්ශනිකයින් මෙන් උන්වහන්සේද දහම් දෙසීම සඳහා එම කථා ශෛලිය යොදාගත්හ. එසේ කිරීමෙන් උන්වහන්සේ බලාපොරොත්තු වූ පරමාර්ථ ග්‍රීක් දාර්ශනිකයින් අපේක්ෂා කළ පරමාර්ථ වලට වඩා වෙනස් නොවීය. එනම් සාම්ප්‍රදායික සමාජ ක්‍රමය වෙනස්කර ප්‍රබල සදාචාරාත්මක ක්‍රම පද්ධතියක් මත නවසමාජ ක්‍රමයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය ඉගැන්වීම් කෙටි ආප්ත පද (Maxims) අනුසාරයෙන් ඉදිරිපත් කිරීමය. සමහර අංග අතින් සලකා බැලීමේදී ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම් පුරාතනයේ විඥ දාර්ශනිකයන් තුළ පැවති ව්‍යවහාර බුද්ධියට සම කළ හැකිය. නමුත් ඔවුන් විසින් වැදගත් ලෙස සැලකූ අධ්‍යාපනය, චරිත වර්ධනය, හැසිරීම් විධි, මිත්‍ර සම්බන්ධතා, කාන්තාවන් සහ පවුල සමග පැවතිය යුතු ආකාරය, ජනවාර්ගික කරුණු, දේශපාලන සම්බන්ධතා සහ සාමාන්‍ය බුද්ධිය වැනි මාතෘකා පිළිබඳ තොරතුරු උන්වහන්සේගේ දේශනා තුළ බොහෝ දුරට දක්නට නොලැබේ.[50]

ගැලීල සහ ජුඩෙයා අතර පාලුකරයේ ගම් දනව් වල සැරිසරමින් ධර්මය දේශනා කළ මෙම අසාමාන්‍ය ශාස්තෘවරයා විසින් උපයෝගී කර ගන්නා ලද උපදේශ කථා කෙනෙකුට අපූර්ව ප්‍රකාශ ලෙස පෙනියන්නට ඇත. නමුත් එම කථාතුළ ශ්වභාවාදී දාර්ශනිකයින්ගේ ප්‍රකාශවල ඇතුළත් ලෞකිකත්වය පිළිබඳ ප්‍රයෝග සහිත ප්‍රකාශ කිසිවක් දක්නට නොලැබේ. ඒ වෙනුවට එම දේශනාවල මිනිසුන්ගේ නිදිගත් ආත්මය පුබුදුවා විමුක්තිය ලබා ගැනීම පිණිස ඔවුන් තුළ පැවති දැඩි අභිලාෂය ඉටුකර දීම පිණිස යොමුවූ දැඩි කැපවීමක් සහ පතළාවූ මෛත්‍රී සහගත චේතනාවක් ගැබ් වී තිබේ. උන්වහන්සේගේ දේශනා ඇසීමට මිනිසුන් විශාල වශයෙන් ඇදී ආවේ ඒ නිසාය. ජේසුස් වහන්සේ මිනිසුන්ගේ මනසයේ රැඳුණේ ඒ නිසාය. සමාජීය සහ මනෝ විද්‍යානුකූල දෘෂ්ටි කෝණයකින් සලකා බැලීමේදී උන්වහන්සේගේ දේශනා විප්ලවකාරී ඉගැන්වීම් විය. එමෙන්ම ඒවා බෞද්ධ ඉගැන්වීම් වේ.

Q මූලාශ්‍රය සහ බෞද්ධ ග්‍රන්ථ අතර දක්නට ලැබෙන අපූර්ව සමානකම් පළමුවරට පෙන්වා දෙන ලද්දේ ආගමික ඉතිහාසඥයෙකු වූ රෝයි සී. ඇමෝර් විසිනි (Roy C. Amore).[31] පසුකාලයේදී ශුභාරංචියේ පොත් ලියූ කතුවරයින්ට මෙන්ම ජේසුස් වහන්සේටද බෞද්ධ මූලාශ්‍ර මෙන්ම සාම්ප්‍රදායික යුදෙව් පොත පත පරිහරණය කිරීමට අවස්ථාව ලැබුණු බවත් ඒවායේ බලපෑම උන්වහන්සේ විසින් දැරූ සමහර අදහස් කෙරෙහි දක්නට ලැබෙන බවත් ඔහු කල්පනා කරයි. මෙ සම්බන්ධයෙන් ඇමෝර් විසින් ලියන ලද කෘතිය 1978 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලදී. ඒ වනවිට Q මූලාශ්‍රයේ ස්ථර තුනකින් සමන්විත වූ අනුවර්තනයක් තිබෙන බව දැන සිටියේ නැත. එනිසා Q මූලාශ්‍රයේ දැක්වෙන ජේසුස් වහන්සේගේ සමහර දේශනා විශ්මය ජනක ලෙස බෞද්ධ ඉගැන්වීම් වලට සමාන වීමටත් සමහර දේශනා එසේ නොවීමටත් හේතුවූ කරුණු පැහැදිලි කිරීමට ඔහුට නොහැකි විය. නමුත් එම සමානකම් ඇතිවීමට හේතුව අපි දැන් දනිමු. ශ්‍රාවකයින්ගේ අවශ්‍යතාවලට අනුකූලව පසුකාලීනව ජේසුස් වහන්සේගේ දේශනාවලට යම් යම් කරුණු එකතු කරන ලදී. එසේ අලුතින් එකතු කරන ලද කරුණුද ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා වශයෙන් සලකනු ලැබිය. එම කරුණු එකතු කිරීමට පාදකවූ හේතු පැහැදිලි කරදිය යුත්තේ එකල පලස්තීනයේ පැවති විශේෂ තත්වය සලකා බැලීමෙන් පමණි. ජේසුස් වහන්සේට ආරෝපණය කර ඇති එම ප්‍රකාශ හා බෞද්ධ අදහස් අතර කිසිම සම්බන්ධතාවයක් නොමැත. ජේසුස් වහන්සේගේ සැබෑ දේශනාවල අඩංගු බෞද්ධ සම්ප්‍රදායෙන් ණයට ගත් කොටස් Q[1] වශයෙන් හැඳින්වෙන මූලාශ්‍රයේ ඇතුළත් කර තිබේ.

එම දේශනා බෞද්ධ මූලාශ්‍ර සමග තුලනාත්මකව සලකා බලමු. සමහර අවස්ථාවලදී ජේසුස් වහන්සේ පවා බෞද්ධ දේශනාවේ ඇතුළත් කථා ප්‍රවෘත්තිවල දක්නට ලැබෙන කාව්‍යමය ලක්‍ෂණ ඒ ආකාරයෙන්ම යොදාගෙන තිබීම මෙහිදී අපේ විශේෂ සැලකිල්ල යොමුවිය යුතු කරුණකි. සමහර බෞද්ධ සූත්‍ර ලියා තිබෙන්නේ ගාථා වලිනි. තම ඉගැන්වීම් ශ්‍රාවකයින්ට පහසුවෙන් මතකයේ රඳවා ගැනීමට හැකිවනසේ ජේසුස් වහන්සේ එම ශෛලිය අනුගමනය කරමින් තම දේශනා සංක්ෂිප්තව සිත් කාවදින අයුරින් සහ පැහැදිලිව ප්‍රකාශ කිරීමට සමර්ථ වූහ. බුද්ධාගමේ සහ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වල දක්නට ලැබෙන මෙම කාව්‍යමය ලක්ෂණ ඒවා පරිවර්තනය කිරීමේදී බොහෝ දුරට අඩු වී තිබුණත්, මුල් දේශනාවල පැවති ප්‍රකාශන ශක්තියේ දීප්තිමත් භාවය තවමත් ආරක්‍ෂා වී තිබේ.

මෙහිදී ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා මූලික වශයෙන් බෞද්ධ සදාචාරාත්මක ඉගැන්වීම් ඇතුළත් ධම්මපදයේ සහ උදාන වග්ගයේ ඇතුළත් කරුණු සමග සංසන්දනය කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මෙහිදී ඉදිරිපත් කර ඇති කරුණු සංසන්දනය කිරීම පහසුවීම පිණිස බෞද්ධ මූලාශ්‍ර වලින් උපුටා ගත් කොටස් Q[1] මූලාශ්‍රයෙන් උපුටා දක්වා ඇති කොටස් සමග එකිනෙකට ඉදිරියෙන් දක්වා තිබේ. බර්ටන් එල්. මැක් විසින් සංස්කරණය කරන ලද Q[1] මූලාශ්‍රයෙන් උපුටාගත් කොටස් QS යන කෙටි යෙදුමෙන් හඳුන්වා තිබේ.

ජේසුස් වහන්සේගේ දේශනාවල සාරය වශයෙන් බොහෝ දෙනා විශ්වාස කරනු ලබන ආශිර්වාද ලද්දවුන් පිළිබඳව උන්වහන්සේ විසින් කර ඇති ප්‍රකාශ සහ කන්ද උඩ දේශනාවේ ඇතුළත් ප්‍රධාන දේශනා වලට අනුරූපවූ ඉතාමත් පැහැදිලි බෞද්ධ පූර්වාදර්ශ තිබෙන බව පෙනේ.

'කම්සුව සෙවීමෙහි උත්සාහ නැති අපි කම්සුව සෙවීමෙහි උත්සාහ ඇතියන් අතර ඉතා සුවසේ ජීවත් වෙමු. කම්සුව සෙවීමෙහි උත්සුක වූවන් මැද අපි අනුත්සුකව වසමු.

යම්බඳුවූ අපට රාගාදී පලිබෝධයක් නැද්ද එසේවූ අපි ඉතා සුවසේ ජීවත්වෙමු. ආභස්සර දෙවියන් මෙන් සමාපත්තියෙන් ඇතිවන සුවය වළඳන්නෝ වන්නාමු.

දිළින්දෝ භාග්‍යවන්තයෝය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔවුන්ගේය. සාගින්නෙන් පෙළෙන්නෝ භාග්‍යවන්තයෝය. මන්ද දෙවියන් වහන්සේ ඔවුන් පෝෂණය කරනු ලබන හෙයිනි. කඳුළු හෙලන්නෝ භාග්‍ය වන්තයෝය. මන්ද ඔවුන් සිනාසෙනු ඇත.

(QS 8)

කෙලෙස් ලෙඩින් ආතුර වූවන් මැද අපි කෙලෙස් ලෙඩ නැත්තෝ ඉතා සුවසේ ජීවත්වෙමු. ක්ලේශාතුර මිනිසුන් මැද ක්ලේශාතුර නොවීන් මිදී වාසය කරමු."
(ගන්ධාරී ධම්මපදය 167)

මේ අදහසම ධම්මපදයේ සුඛ වර්ගයේ පළමු ගාථාවේ දක්නට ලැබේ. මෙහිදී බුදුන් වහන්සේ අවිහිංසාවේ ඇති වැදගත්කම පැහැදිලි කරමින් සතුරාට පවා මෛත්‍රී කරන ලෙස අනුශාසනා කරමින් ඉදිරිපත් කර ඇති සදාචාරාත්මක ඉගැන්වීම විශේෂයෙන් කැපීපෙනේ.

"වෛර දුරැලූ අපි වෛර නොදැරූ වූවන් අතරෙහි ඉතා සුවසේ ජීවත්වමු. වෛරී මිනිසුන් මැද අවෛරීව වෙසෙමු."
(ගන්ධාරී ධම්මපදය 167)

"පස් පව් කරමින් හැම දෙනා කෙරෙහි වෛරීව වෙසෙන මිනිසුන් අතර වෙසෙන අපි කිසිවෙකු හටත් එබඳු අවැඩක් නොකරමින් අවෛරීව ඒකාන්තයෙන්ම සැපසේ වෙසෙමු.
විවිධ කෙලෙස් ගිනිවලින් ආතුර වෙමින් වෙසෙන මිනිසුන් අතර ජීවත්වන අපි ඒ කෙලෙස් ගිනි වලින් ආතුර නොවී ඒකාන්තයෙන්ම සැපසේ වෙසෙමු.
කාමසැප සොයා ඒ වෙනුවෙන්ම වෙහෙසෙන මිනිසුන් අතර ජීවත්වන අපි එවන් කාමසුව නොසොයමින් එහෙත් ඒකාන්තයෙන්ම සැපසේ ජීවත්වෙමු.
විවිධ කෙලෙස් ගිනිවලින් පීඩිතව වෙසෙන මේ මිනිසුන් අතුරෙහි

"මම ඔබට මෙසේ කියමි. ඔබේ සතුරාට ප්‍රේම කරන්න. ඔබට ගැරහුම් කරන්නන් උදෙසා යාච්ඤා කරන්න.
කෙනෙක් ඔබේ කම්මුලට පහරක් ගැසුවොත් ඔහුට ඔබේ අනෙක් කම්මුලත් පාන්න.
කිසිවෙක් ඔබේ කබාය උදුරාගතහොත් ඔහුට ඔබේ කමිසයද දෙන්න. ඔබෙන් ඉල්ලන හැමටම දෙන්න. යමෙක් ඔබ සතු දේ පැහැර ගතහොත් ඔහුගෙන් ඒවා යළි නොඉල්ලන්න.
අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමතිද ඔබත් ඔවුන්ට ඒ දේම කරන්න."

ජීවත්වන අපි එබඳු කෙලෙස් ගිනිවලින් තොරවෙමින් ප්‍රීතියම අනුභව කරමින් ජීවත්වන ආභස්සර බඹලෝ වැසියන් මෙන් ඒකාන්තයෙන්ම සැපසේ ජීවත්වෙමු.
(ධම්මපදය සුඛවග්ගය 15 : 1-4)

මෙලොව කිසි කලෙකත් වෛරයෙන් වෛරය නොසන්සිඳෙන්නේය. වෛරය සන්සිඳෙන්නේ වෛර නොකිරීමෙන් හෙවත් මෛත්‍රී කිරීමෙන්ය. මෙය සනාතන ධර්මයකි."
(ධම්මපදය - යමකවග්ගය 1-5)

"ක්‍රෝධය ක්‍රෝධ නොකිරීමෙන් ජයගත යුත්තේය. අසත්පුරුෂකම සත්පුරුෂ කමින් ජයගත යුත්තේය. මසුරුකම දානයෙන් ජයගත යුත්තේය. අසත්‍යය සත්‍ය වචනයෙන් ජයගත යුත්තේය. සත්‍ය වචන ප්‍රකාශ කරන්න. කිසිවෙකු කෙරෙහි කිසි විටෙක කෝප නොවන්න. ඉල්ලනු ලබන්නාහට ස්වල්ප වූ නමුත් දෙයක් දෙන්න. මේ ගුණ දහම් තුන පිරීමෙන් දෙවියන් සමීපයට යාහැකි වන්නේය."
(ගන්ධාරී ධම්ම පදය 280-281)

"ඔබට ප්‍රේම කරන්නන්ට පමණක් ඔබ ප්‍රේම කරන්නේ නම් ඉන් ඔබට ලැබෙන්නේ කවරනම් ප්‍රශංසාවක්ද? අයබදු රැස් කරන්නෝ පවා ඔවුන්ට ප්‍රේම කරන්නන්ට ප්‍රේම කරති. එය එසේ නොවේද? ඔබ ඔබේ සහෝදරයින් පමණක් වැළඳ ගන්නේ නම් අන් අය කරන දෙයට වඩා ඔබ කරන දෙයෙහි ඇති වෙනස කුමක්ද? සැම දෙනම එසේ කරනු නොලබන්නේද? ඔබ නැවත අයකර ගැනීමේ බලාපොරොත්තුවෙන් ණයට දෙන්නාහු නම් ඉන් ඔබට කවර නම් ප්‍රශංසාවක් වේද? පව්කාරයෝ පවා නැවත අයකර ගැනීමේ බලාපොරොත්තුවෙන් ස්වකීය වර්ගයාට ණය දෙති.

"යමෙක් සත්ව හිංසා නොකෙරේද, ප්‍රාණ ඝාතයෙන් වැළකී සිටීද, හේ බ්‍රාහ්මණයෙකු යැයි කියනු ලැබේ.
යමෙකුට අනුන්ගේ නින්දා අපහාස සහ හිංසා පීඩාදිය ඉවසා සිටීමට හැකිනම්, එසේම ඒ කිසිවකු හටවත් ක්‍රෝධ නොකර සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රිය පතුරුවන්නේ නම්

ඒ වෙනුවට ඔබේ සතුරාට පවා ප්‍රේම කරන්න. යහපත සලසන්න. නැවත අයකර ගැනීමේ බලාපොරොත්තුවකින් තොරව ණය දෙන්න. එසේ කිරීමෙන් ඔබට ලැබෙන ඵල විපාක මහත් වේ. එවිට ඔබ දෙවියන් වහන්සේගේ දරුවන්

තම ඒ පුද්ගලයා බ්‍රාහ්මණයකු ලෙස හැඳින්විය හැකිය."
(උදාන වර්ගය 33:45-46)

වන්නාහුය. මන්ද දෙවියන් වහන්සේ නපුරුවුන්, යහපත්වුන් හැම දෙනාටම එකසේ හිරු එළිය උදාකරවන හෙයිනි. සාධාරණ වූත් අසාධාරණවූත් හැම දෙනාටම එකසේ වර්ෂාව ලබාදෙන හෙයිනි." (QS 9)

මෙසේ විවිධ අංශවලින් දක්නට ලැබෙන සමානකම් පුදුමසහගතය. ජේසුස් වහන්සේ තුළ පැවති දූරදර්ශී ඥානය පිළිබිඹු කරන "ඔබේ සතුරාට පවා ප්‍රේම කරන්න." යනුවෙන් කර ඇති අනුශාසනාවෙන් සහ බුදුන් වහන්සේගේ දේශනාවේ ඇතුළත් "වෛරයෙන් වෛරය නොසන්සිඳේ" යන ප්‍රකාශයෙන්ද කියවෙන්නේ එකම අදහසකි. බයිබලයේ නව තෙස්තමේන්තුවේ ඇතුළත් ජේසුස් වහන්සේගේ ප්‍රකාශ අතුරින් නිතර උපුටා දක්වා ඇති 'ඔබේ සතුරාට පවා ප්‍රේම කරන්න' යන ප්‍රකාශය උන්වහන්සේගේ ඉගැන්වීම් වල කැපී පෙනෙන ලක්ෂණයක් පිළිබිඹු කරයි. 'තමන්ගේ සතුරාට ප්‍රේමකරන්න' යනුවෙන් ජේසුස් වහන්සේ විසින් ඉදිරිපත් කර ඇති මෙම අභියෝගය බුදුන් වහන්සේ විසින් සනාතන ධර්මයක් (අතීතයේ සිට පැවත එන උතුමන් වෙත පවතින ගුණයක්) ලෙස අනුදැන වදාරා ඇත. "මෙලොව කිසි කලෙක වෛරයෙන් වෛරය නොසන්සිඳෙන්නේය. වෛරය සන්සිඳෙන්නේ වෛර නොකිරීමෙන් හෙවත් මෛත්‍රී කිරීමෙන්ය."

දෙවනුව කෙනෙක් ඔබෙන් යමක් ඉල්ලා සිටියොත් එවැනි පුද්ගලයකුට යමක් දෙන ලෙස ජේසුස් වහන්සේ මෙන්ම බුදුන් වහන්සේද ප්‍රකාශ කළහ. ජේසුස් වහන්සේ මෙසේ කියා තිබේ: 'ඔබෙන් යමක් ඉල්ලන ඕනෑම කෙනෙකුට දෙන්න'. එම අදහස "ඉල්ලනු ලබන්නාට ස්වල්පවූ හෝ දෙයක් දෙන්න" යනුවෙන් බුදුන් වහන්සේ ප්‍රකාශ කර තිබේ. එම උපදේශය ඉදිරිපත් කර තිබෙන ආකාරය මෙහිදී අපේ විශේෂ සැලකිල්ලට භාජනය විය යුතුය. ජේසුස් වහන්සේ සහ බුදුන් වහන්සේ විසින් (දන්) දීමේදී එය ලැබීමට සුදුසු, දුප්පත්වුන්, දුර්වලවුන් රෝගීවුන් පුද්ගලයින්ට දන්දීම සඳහා මිනිසුන් උනන්දු කරවනු ඇතැයි කෙනෙකු බලාපොරොත්තු වීමට පුළුවන. නමුත් මේ අවස්ථා දෙකේදීම සිදුවී තිබෙන්නේ ලබන්නා එය ලැබීමට සුදුසුවුවත්, නොවුවත් ඉල්ලූ වහාම ඔහුට යමක් දිය යුතු බව ප්‍රකාශ කර තිබීමය.

තුන්වනුව මෙහිදී ජේසුස් වහන්සේද තම ඉන්දියානු පුරෝගාමියා වූ බුදුන් වහන්සේගේ නිගමනයට එළඹී තිබේ. එනම් කොන්දේසි විරහිතව

අනුන්ට ප්‍රේම කරන තැනැත්තා දෙවියන් වහන්සේගේ දරුවෙක් බවට පත්වේ. බුදුන් වහන්සේට අනුව එම ගුණ දහම් පිරීමෙන් දෙවියන් සමීපයට යා හැකි වන්නේය.

ඉහත දක්වා ඇති විස්තර තොරතුරු සහ නිගමනයන්ද ඇතුළත් ජේසුස් වහන්සේගේ දේශනා සහ බෞද්ධ ඉගැන්වීම් අතර දක්නට ලැබෙන සමානකම් ඇතිවී තිබෙන්නේ ජේසුස් වහන්සේ විසින් එකී මුලික බෞද්ධ ඉගැන්වීම් ගැඹුරින් අධ්‍යයනය කර ඒවා පිළිපදින ලැබූ නිසා බව සිතිය හැකිය. මෙම සමානකම් සලකාබැලීමේදී ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා ඉහත කී ගාථා ඛණ්ඩ ඇතුළත් ධම්ම පදයේ ලිඛිත පිටපතක් පවා ප්‍රයෝජනයට ගන්නට ඇතැයි සිතිය හැකිය.

මෙම බෞද්ධ සදාචාරාත්මක අදහස් ඉන්දීය වීර කාව්‍ය වලද දක්නට ලැබේ. මහා භාරතය සහ පංචතන්ත්‍රය වැනි ඉන්දීය වීර කාව්‍යවල ඇතුළත් බුදුන් වහන්සේගේ මෙම ශ්‍රේෂ්ඨ උපදේශය සංස්කෘත සාහිත්‍යයේ දක්නට ලැබෙන සුප්‍රසිද්ධ අදහසකි. 'ධර්මය හොඳින් අසා උගත් ධර්ම කරුණු හොඳින් සිහිතබා ගන්න. ඔබ අප්‍රිය කරන කිසිවක් අනුන්ට නොකරන්න.' යන උපදේශය පෙරදිගින් බටහිරට ගලා ආ කථාවස්තු ප්‍රවාහය තුළ ගැබ්වී තිබෙන්නට ඇති බවත් එම අදහස් ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද 'අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමතිද, ඔබත් ඔවුන්ට ඒ දේම කරන්න' යන උපදේශය කෙරෙහි බලපාන්නට ඇතැයි සිතිය හැකිය.

ජේසුස් වහන්සේ බෞද්ධ කථා ප්‍රවෘත්ති අධ්‍යයනය කර ඇති බව ගන්ධාරී ධම්මපදය Q සහ S යනුවෙන් හැඳින්වෙන මූලාශ්‍රයේ ඇතුළත් පහත දැක්වෙන ප්‍රකාශය සසඳා බැලීමෙන් පැහැදිලි කළ හැකිය.

"අනුන්ගේ විලෝමයන් හෝ අනුන් කළ නොකළ දේ ගැන නොසොයන්න. තමා විසින් කරන ලද යහපත් මෙන්ම අයහපත් දෙයෙහි පමණක් ගුණ දොස් විමසන්න."
(ගන්ධාරී ධම්මපදය 271-272)

"අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් විනිශ්චය කරනු නොලැබේ. මන්ද අනුන් විනිශ්චය කිරීම සඳහා ඔබ යොදා ගන්නා මිම්ම ඔබව විනිශ්චය කිරීම සඳහාද යොදා ගනු ලබන හෙයිනි." (QS 10)

ඉහත උපුටා දක්වා ඇති ගාථාවේ පාලි පාඨය (ධම්මපදය 4:7) සලකා බලන්න. මෙහිදී "ප්‍රත්‍යාවේක්ෂණය කරන්න" යන අර්ථය ගෙනදෙන "අවෙක්ඛෙය්‍ය" යන ක්‍රියා පදය යොදා ඇති අතර එහි සංස්කෘත පාඨයේ 'තේරුම් ගන්නවා', 'දකිනවා' යන අර්ථ දෙන

"සමීක්ෂා" යන වචනය යොදා තිබේ. මෙහිදී යොදා තිබෙන පාලි සහ සංස්කෘත වචන දෙකෙන්ම යමක් ඇගයීමේදී "පැහැදිලි ලෙස විභාග කිරීම" යන අදහස ධ්වනිත වේ.

QS 10 මූලාශ්‍රයේ මුල් කොටස් ඒවා පළමුවෙන්ම රචනා කරන ලද ඇරමයික් භාෂාවෙන් පරිවර්තනය කිරීමේදී සිදුවී ඇති වරදක් නිවැරදි කළවිට එහි නියම අර්ථය මෙසේ දැක්වේ: "ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ සර්ව සම්පූර්ණව සිටින්නාක් මෙන් ඔබද සර්ව සම්පූර්ණවන්න." ("මතෙව් 6 : 48; මාක් 6 : 36) මීට සමාන ප්‍රකාශයක් ධම්මපදයේ ඇත්තේ. 'තොප විසින් වීර්යය කටයුතුය. බුදුවරු වූකලී මග කියා දෙන්නෝ පමණක් වෙති." මේ අවස්ථා දෙකේදීම ප්‍රකාශ කර තිබෙන්නේ ආධ්‍යාත්මික දියුණුව සලසා ගැනීමේ වගකීම පෞද්ගලිකව තමාවෙත පැවරී තිබෙන බවත්, ශාන්ත පාවුලු තුමාගේ ඉගැන්වීම වල ඉදිරිපත් කර ඇති පරිදි විමුක්තිය සලසා ගැනීම කිසියම් බාහිර බලවේගයක පිහිට නිසා සිදුවන දෙයක් නොවන බවත්ය. මෙහිදී දෙවියන් වහන්සේ හෝ වේවා බුදුන් වහන්සේ හෝ වේවා විමුක්තිය සාක්ෂාත් කරගත් තැනැත්තේ සිටින්නේ වෙනත් තලයකය.

එක් අන්ධයකු විසින් තවත් අන්ධයකුට මගපෙන්වීම පිළිබඳව පවතින කථා ප්‍රවෘත්තියට සමාන කමක් දක්වන සුප්‍රසිද්ධ ඉන්දියානු (බෞද්ධ) කථාවක් තිබේ.

"එසේ නම් වාසෙට්ඨය, ත්‍රිවේදය උගත් ඒ බ්‍රාහ්මණයින් එකිනෙකා අත් අල්ලා ගෙන යන අන්ධයින් රැළක් වැන්න. මුලින් යන්නාත් පාර නොදනී. මැදින් යන්නාත් පාර නොදනී. අවසානයෙහි යන්නාත් පාර නොදනී." (තේවිජ්ජ සූත්‍රය - දීඝනිකාය 13 : 15)

"අන්ධයකුට මග පෙන්වීමට තවත් අන්ධයකුට හැකිද? එසේ කිරීමෙන් ඔවුන් දෙදෙනාම වළක වැටෙන්නේ නැතිද? ගෝලයකු තමාගේ ගුරුවරයාට වඩා උසස් නොවේ. ගෝලයකු තම ගුරුවරයා හා සමවීම ප්‍රමාණවත්ය." (QS 11)

මෙහිදී අන්ධයින් යනුවෙන් හඳුන්වාදී තිබෙන්නේ තවමත් ආර්ය මාර්ගය වටහා නොගත් පුද්ගලයින්ය. බුදුන් වහන්සේ එම සංකල්ප රූපය යොදාගෙන තිබෙන්නේ බ්‍රාහ්මණයින් ත්‍රිවේදය ඉගෙන ගත්තේ වී නමුත් ඔවුන් යථාර්ථය තේරුම් නොගත් පුද්ගලයන් බවත්, ඒ නිසා ඔවුන් අනායන්ට මග කියා දීමට සුදුසු ගුරුවරුන් නොවන බවත් පැහැදිලි කරදීම පිණිසය. උපදේශයක් දීමේදී පැවතියුතු සංක්ෂිප්ත ස්වරූපය ජේසුස් වහන්සේ විසින් එම අදහස ප්‍රකාශකර ඇති සන්දර්භය තුළ

දක්නට හැකිය. එක් අතකින් අන්ධයකු විසින් තවත් අන්ධයකුට මග පෙන්වීම නිරර්ථක ක්‍රියාවක් බවත්, අනෙක් අතට සම්බන්ධතා පැවැත්විය යුත්තේ සත්‍යය අවබෝධකර ගත් සැබෑ ගුරුවරුන් සමග පමණක් බවත් ඉන් කියවේ. බුදුන් වහන්සේට අනුව වේද ග්‍රන්ථවල දැක්වෙන වචන වල එල්බගත් බ්‍රාහ්මණයින් පෘතග්ජන ශ්‍රාවකයන්ට ඉගැන්වීම සඳහා යෝග්‍ය ගුරුවරු නොවේ. එය අන්ධයකු විසින් තවත් අන්ධයකුට මග පෙන්වීම වැනිය. ශ්‍රාවකයා සහ ගුරුවරයා පිළිබඳව පවතින මෙම කථා ප්‍රවෘත්තිය ජේසුස් වහන්සේ ඒ ආකාරයෙන්ම යොදාගෙන තිබේ.

කෙනෙක් තමා නිවැරදි බව පෙන්නුම් කිරීමේ අදහසින් අනායන්ගේ දොස් දැකීමේ වංක ක්‍රියා පිළිවෙත හෙළාදැකීම සඳහා යොදාගත හැකි තවත් උපදේශයක් ධම්මපදයෙන් ලබාගෙන තිබෙන බව පැහැදිලිය. ජේසුස් වහන්සේ විසින් එම අදහස උන්වහන්සේට ආවේනික වූ සරලවූත් සංක්ෂිප්ත වූත් ආකාරයෙන් සිත්කාවදින ලෙස ඉදිරිපත් කර තිබේ.

එම අදහස දැක්වෙන ධම්මපදයේ ගාථාව සුපරීක්ෂාකාරීව රචනා කර තිබෙන අතර ජේසුස් වහන්සේගේ උපදේශය උන්වහන්සේගේම වචන වලින් ඉදිරිපත් කර තිබෙන බව පෙනේ. ජේසුස් වහන්සේ මුල් බෞද්ධ කථා ප්‍රවෘත්තියේ දැක්වෙන උපදේශය වඩා විචිත්‍රවූත්, ප්‍රකාශන ශක්තියෙන් අනූනවූත්, සිත් කාවදින ආකාරයෙනුත් ඉදිරිපත් කර තිබෙන බව කෙනෙකුට හැඟීයනු ඇත. උන්වහන්සේ විසින් කරන ලද දේශනා ලිඛිත ග්‍රන්ථවලින් උපුටාගෙන තිබෙනම් ඒවා නිසැකවම කාලයටත් එම යුගයේ ජීවත්වූ මිනිසුන්ගේ රුචියටත් ගැළපෙන ආකාරයෙන් අනුවර්තනය කිරීමට සිදුවේ. කිසියම් අදහසක් සංක්ෂිප්තව සහ සිත් කාවදින අයුරින් ප්‍රකාශ කිරීමේ අපූර්ව හැකියාවක් ජේසුස් වහන්සේට තිබුණි.

"අනුන්ගේ වරද සුළු වුවද එය දැකීම ඉතාමත් පහසුය. තමන්ගේ වරද මහත් වුවද එය දැකීම ඉතාමත් අපහසුය. එහෙයින් අඥාන පුද්ගල තෙමේ සුළු වුවද අනුන්ගේ වරද උස් තැනක සිට බොල් පොලන අයකු මෙන් හැම දෙනා වෙත පතුරුවන්නේය. එනෙකුදු වුවත් සිය සිරුර අනුපහර ආදියෙන් වසා තබන කපටි ලිහිණි වැද්දකු මෙන්

"ඔබ ඔබේ ඇසෙහි තිබෙන ලී කොටය නොදැක ඔබේ සහෝදරයාගේ ඇසෙහි තිබෙන ලී පතුර සෙවීමට පෙළඹෙන්නේ කෙසේද? ඔබේ ඇසේ තිබෙන ලී කොටය නොදකින ඔබ, "සහෝදරය, ඔබේ ඇසේ ඇති තිබෙන ලී පතුර ඉවත ලන්නට ඉඩදෙන්නැයි" ඔබට කෙසේ කිවහැකිද? එම්බා කෛරාටිකය, පළමුවෙන්ම ඔබේ ඇසේ තිබෙන

තමන්ගේ වරද වසා තැබීමට උත්සාහ ගන්නේය."
(ධම්මපදය 18:18)

"අනුන්ගේ දොස් දැකීම පහසුය. තමන්ගේ දොස් දැකීම අපහසුය. අනුන්ගේ වරද බොල් පොලන අයකු මෙන් පතුරුවන්නේය. එනිසා අනුන්ගේ වරද දැකීම පහසුය. දුදු කෙළියෙහි යෙදෙන පුද්ගලයා තමාගේ අදුනැටය සඟවා තම ප්‍රතිවාදියාගේ අදු නැටයේ වටිනාකම් පෙන්නුම් කරන්නාක් මෙන් ඔහු තම වරද සඟවයි." "අනුන්ගේ වරද නිතර නිතර පෙන්වමින් නිතර නිතර චෝදනා කරයි. එවැනි පුද්ගලයකු හරි වැරදි වටහා ගැනීමට නොහැකිවීමෙන් තමාටම අනර්ථයක් කරගනී."
(උදාන වර්ග 27:1)

ලී කොටය ඉවත ලන්න. එවිට ඔබට ඔබේ සහෝදරයාගේ ඇසෙහි තිබෙන ලී පතුර ඉවත් කළ හැකි වනු ඇත."
(QS 12)

බෞද්ධ මූලාශ්‍රයේ සඳහන් කරුණු වඩා පැහැදිලිවත් මධ්‍යස්ථවූත් ආකාරයෙන් ඉදිරිපත් කර තිබෙන පැට් ජීසස් ඉවැන්ජලි'සම් හෙවත් ජේසුස්ගේ ශුභාරංචිය (Jesus-Evangelism) නැමති පොතෙන් පරිවර්තනය කර උපුටා දක්වා ඇති පහත දැක්වෙන කොටසින් පැහැදිලි වේ.

"තොප තගේ සගයාගේ අදහස්වල අඩුපාඩු පමණක් දකින්නේ මන්ද? මන්ද? තගේ අදහස ඇවරිල්ලෙන් පිරී තිබෙන බව නොදකින්නේ මන්ද? තගේ සගයා අමතා, සගය, 'ඔබේ අදහස්වල ඇති වරද නිවරද කිරීමට ඉඩදෙන්නැ'යි කෙසේ නම් තොපට කිව හැකිද? බලව, තගේ අදහස් කොතරම් ඇවරිලි සහගද? එම්බා කෛරාටිකය, පළමුව තගේ අදහස්වල ඇති ඇවරිලි සහගත බව නැතිකර ගනුව. එවිට තොපට තගේ සගයාගේ වැරදි නිවැරදි කිරීමට හැකි වනු ඇත (JeEv 11:25-25).

බුදු දහමේ දැක්වෙන ඉගැන්වීම් වල ආභාෂය ලබා ඇති Q' යනුවෙන් හැඳින්වෙන මූලාශ්‍රයේ කරුණු ඇතුළත් ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම් වලට අනුව තම සහෝදරයාගේ ඇසේ ඇති ඇති ලී

පතුර පිළිබඳව කියවෙන උපදේශයට පාදකවී ඇති මූලික අදහස ඉහත උපුටා දක්වන ලද බෞද්ධ ඉගැන්වීම වලින් ලබා ගන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. එහි උගන්වා ඇති කරුණු වල පුද්ගලයකු විසින් ඉටුකළ යුතු වැදගත් සදාචාරාත්මක වගකීමක් පිළිබඳව සඳහන් කර තිබේ. එම වගකීම ඉටුකළ හැක්කේ අනෙක් පුද්ගලයින්ගේ වැරදි සෙවීම තුළින් නොව තමා පිළිබඳ එළඹ සිටි සිහියෙන් යුක්තව ජීවත්වීමෙන් පමණි. කෙනෙක් තමා තුළ පහළවන සිතිවිලි අභිගාමී හැඟීම් සහ දුර්වලකම් පිළිබඳව අවබෝධකරගෙන ඒවා නිරන්තරයෙන් ස්වයං පරීක්ෂාවට භාජනය කිරීම එවැනි වැදගත් චර්යාවක් පවත්වා ගැනීම සඳහා පැවතිය යුතු පූර්ව අවශ්‍යතාවයකි.

වෙනත් ඉන්දියානු පොත් පත් වලද මීට සමාන අදහස් ඇතුළත් වී තිබෙන්නේ මේ හේතුව නිසාය. මෙම අදහස ශ්‍රේෂ්ඨ ඉන්දීය මහා කාව්‍යයක් වන මහාභාරතයේ මෙසේ දැක්වේ: "ඔබ අනායයන් තුළ පවතින අබැටක් පමණක් වූ ඉතා සුළු වරද පවා දකී. නමුත් බෙලි ඵලයක් තරම් විශාලවූ ඔබේ වැරදි අමතක කිරීමට ඔබ උත්සාහ කරයි" (මහා භාරතය 1, 96 : 1). අබ ඇටය සහ බෙලි ඵලය මගින් ඉදිරිපත් කර ඇති මෙම සංකල්පය රූපය ලී කොටය සහ ලී පතුර පිළිබඳ උපමාවෙන්ද ධ්වනිත වන හෙයින්, සමහර විට ජේසුස් වහන්සේ පවා මහාභාරතයේ දැක්වෙන මෙම කථාව පිළිබඳව දැන සිටින්නට ඇතැයි සිතීමට පුළුවන.

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දැක්වෙන මූලික අංග ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා යොදා ගැනීමේදී පුද්ගලයකු තුළ පැවතිය යුතු අවංකකම පිළිබඳව කර ඇති ප්‍රකාශ පිළිබඳව දැන් සලකා බලමු.

"පුද්ගලයකු විසින් කරනු ලබන යහපත් හෝ අයහපත් වූ සියලුම ක්‍රියා පිළිබඳව සැලකිලිමත් විය යුතුය. මන්ද සෑම ක්‍රියාවකටම විපාකයක් ලැබෙන හෙයිනි."
(උදාන වර්ගය 9:8)

"අයහපත් පුද්ගලයා තමාගේ වචන පාලනය කර ගැනීමට අපොහොසත්ව බොරු කියයි. නපුරු වචන පාවිච්චි කරමින් සත්‍යය ප්‍රතික්ෂේප කරන්නා

"හොඳ ගසකින් නරක ඵල හට නොගනී. නරක ගසක හොඳ ඵල හට නොගනී. කටු ගසකින් අත්තික්කා ඵල හෝ කොහොටු පඳුරකින් මිදි ඵල නෙලාගත හැකිද? සෑම ගසක්ම එහි ඵල වලින් හඳුනාගත හැකිවේ.

යහපත් මිනිසා තම සිතෙහි නිදන්කළ යහපත් සිතුවිලි වලින් යහපත් ක්‍රියාද අයහපත් මිනිසා අයහපත් සිතිවිලි වලින් අයහපත් ක්‍රියාද සිදුකරයි. මන්ද වචනයෙන්

ඇත වන්නයෙක් නොවේ." (උදාන වග්ගය 8:9)

පිට වන්නේ සිතෙහි පහළවන සිතිවිලි හෙයිනි." (QS 13)

යමෙක් කථාකිරීමේදී වචන පාවිච්චි කරන ආකාරය පවා ඔහුගේ හෝ ඇයගේ ආධ්‍යාත්මික ආකල්පය පැහැදිලි කරන බව ඉහතින් සඳහන් කළ ජේසුස්ගේ ශුභාරංචියේ පරිවර්තනයෙන් පැහැදිලි වේ. "යමෙක් යහපත් සිතිවිලි නිසා යහපත් වචන කථාකරයි. අයහපත් සිතිවිලි හේතු කොටගෙන අයහපත් වචන කථා කරයි. මනසේ ඇතිවන සිතිවිලි වචනයෙන් පිටවේ." (JeEv 11:33-34)

ජේසුස් වහන්සේගේ ඉගැන්වීම මගින් කර ඇත්තේ හුදෙක් නිවැරදිව ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය සිහිපත් කරවීම පමණක් නොවේ. එය ඉන්දියානු විශ්වාසයක් වූ 'කර්මය' පිළිබඳව පවතින විශ්වාසය හා බැඳී පවතී. අපේ වචන සහ ක්‍රියා පිටුපසින් ඇති චේතනාවට විශේෂ තැනක් ලැබෙන බව ඉන් ප්‍රකාශ වේ. අපේ ආකල්ප වල ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලබන ප්‍රකාශ සහ ක්‍රියාකාරකම් වෙන් වෙන්ව සිදුවන චලිතයන් (Motions) නොව නිරන්තරයෙන් සිදුවන සමුච්චිත ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. වෙනත් වචන වලින් කියතොත් අප විසින් කියනු ලබන හෝ කරනු ලබන සෑම දෙයකම විපාකය වළක්වා ගත නොහැකිය. එය ඉබේ අහෝසි වී නොයයි. නිරන්තරයෙන් එහි විපාක ලැබේ.

මෙසේ ජේසුස් වහන්සේ පුද්ගලයකුගේ පෞර්ෂ වර්ධනයේ පැවතිය යුතු අංගයක් වශයෙන් බුදුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට උගන්වනු ලැබූ සම්මා වාචා, සම්මා කම්මන්ත සහ සම්මා ආජීව යනුවෙන් හැඳින්වෙන ආර්ය අෂ්ටාංගික මාර්ගයේ වැදගත් අංග තුනක් කෙරෙහි අවධානය යොමුකර තිබේ. ඒ සඳහා 'ගස' නමැති සංකල්ප රූපය ඉතා හොඳින් තෝරාගෙන තිබේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුව පිළිපැදීමෙන් ජීවිතය ගසක් මෙන් වර්ධනය වන්නේ නම් එහි හටගන්නා ඵලද යහපත් වේ. මීට සමාන ආකාරයට එපරිද්දෙන්ම සෑම ක්‍රියාවකටම විපාකයක් ලැබෙන බව 'කර්මය' පිළිබඳ සංකල්පයෙන් ඉගැන්වේ. මෙලොව ජීවිතයේදීත් පරලොව ජීවිතයේදීත් චරිතය සහ දෛවය හැඩ ගැස්වීම කෙරෙහි බලපාන පුද්ගලයකුගේ පෞර්ෂය නමැති කෝෂ්ඨාගාරය තුළ කර්ම රැස් වේ. කර්මයේ පවතින මෙම නොවැළැක්විය හැකි ස්වභාවය පිළිබඳ අදහස් ජේසුස් වහන්සේගේ ප්‍රකාශයෙන් උද්දීපනය වේ. එය උදාන වග්ගයේ එන පහත දැක්වෙන ගාථාවේ දෝංකාරයක් වැනිය. "ජීවිතය මරණයෙන් කෙළවර වන්නේය. උපන් සත්වයෝ සියලු දෙනාම මරණය උරුම කොට ඇත්තාහ. එපරිද්දෙන්ම අප කරන සියලු කුසල් හා අකුසල් ක්‍රියා වලට ඒ සඳහා ලැබිය යුතු කර්ම විපාක ලැබේ." (උදාන වග්ගය 1:23)

ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශනාව බුදුන් වහන්සේගේ සදාචාරාත්මක ඉගැන්වීම් වලට බොහෝ දුරට සමානකමක් දක්වන බව නව තෙස්තමේන්තුව පිළිබඳ සුප්‍රසිද්ධ විද්වතකු වූ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ බර්නට් හිල්මන් ස්ට්‍රීටර් (Burnett Hillman Streeter) 1930 දශකයේ මුල් භාගයේදී පැහැදිලි කරවනු ලැබිය.[9] ඔහුගේ අදහස කෙතරම් දුරට නිවැරදිද යන්න මෙහි දක්වා ඇති සමානකම් වලින් (QS 8-13) පැහැදිලි වේ. ඒ සියල්ල ඇතුළත් වී තිබෙන්නේ කන්ද උඩ දේශනාවේ හරය වශයෙන් පවතින Q^1 මූලාශ්‍රයෙනි. ධම්මපදයේ ගාථා පාඨ සමග සංසන්දනය කර ඇති පහත සඳහන් කොටස් උපුටාගන්නා ලද්දේ එම මූලාශ්‍රයෙනි.

"යම්සේ මනාලෙස සෙවිලි නොකළ ගෙය වැස්සට තෙමේද එපරිද්දෙන්ම දියුණු නොකළ සිත තුළට සරාගික හැඟීම් පහසුවෙන් ඇතුළු වේ. යම්සේ මනාලෙස සෙවිලි කළ ගෙය වැස්සට නොතෙමේද එපරිද්දෙන් මැනවින් දියුණු කළ සිතට රාගාදී කෙලෙස් යති ඇතුළු නොවේ." (ධම්ම පදය 1 : 13-14)

"මා කියන දේ නොකර ඔබ මට 'ස්වාමීනි, ස්වාමීනි' කියා අමතන්නේ මන්ද? මාගේ අනුශාසනා වලට කන්දී ඒවා පිළිපදින අය පර්වතයක් මත ගෙයක් ඉදිකරනු ලැබූ පුද්ගලයකුට සමානය. වැසි වැස සැඩ පහර නිවසට වැදුණි. එහෙත් එය බිඳ වැටුණේ නැත. මන්ද එය මනා අත්තිවාරමක් මත ඉදිකොට තිබුණු හෙයිනි.

එහෙත් මා පවසන දේ අසා ඒ අනුව පිළිපදිනු නොලබන්නේ නම්, ඒ තැනැත්තා වැල්ලේ ගෙයක් ඉදිකළ තැනැත්තෙකුට සමානය. වැසි වැස සැඩපහර වැදී එය පොළොවට පතිත විය. එම ගෙට සිදුවූ විනාශය අති විශාලය." (QS 14)

මනාසේ සෙවිලි නොකළ ගෙයක් වැස්සට තෙමීම පිළිබඳ සංකල්ප රූපය ඉන්දියානු පරිසරයට ගැළපේ. නමුත් එම සංකල්ප රූපය පලස්තීනයට ගැළපෙන ආකාරයට අනුවර්තනය කරගැනීමට ජේසුස් වහන්සේට සිදුවිය. කෙසේ වෙතත් එම උදාහරණයෙන් ඉදිරිපත් කරන ලද මූලික සංකල්ප රූපය මෙහිදී ආරක්ෂා වී තිබේ. විනාශයට හේතුව වශයෙන් දක්වා ඇත්තේ වර්ෂාවයි. එය අධික වර්ෂාපතනයකට පසුව

ගංගා පිටාර ගැලීම නිසා සිදුවන ක්‍රියාවක් ලෙස ඉදිරිපත් කර තිබේ. ධම්මපදයේ දැක්වෙන මනාසේ සෙවිලි කළ සහ එසේ සෙවිලි නොකළ ගෙය පිළිබඳ උදාහරණයට උදාන වග්ගයේ කතුවරයා කැමැත්තක් දක්වා තිබෙන බව එම සංකල්ප රූපය උදාන වග්ගයේ 31 වන පරිච්ඡේදයේ දැක්වෙන ගාථා එකොළහක (31 : 12-22) සඳහන් කර තිබීමෙන් පැහැදිලි වේ. නිවැරදි ආධ්‍යාත්මික ආකල්පය සහ මනාසේ සෙවිලි කරන ලද ගෙයක් මෙන් ඒ සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නිවැරදි ක්‍රියා මාර්ගය පැහැදිලි කිරීම සඳහා එම සංකල්ප රූපය විවිධාකාරයෙන් නිතර නිතර යොදාගෙන තිබේ.

පිණ්ඩපාතික බෞද්ධ භික්ෂූන් වහන්සේලාට දෙන ලද උපදෙස් ඇතුළත් මහා වග්ගයේ කොටසක (මහා වග්ගය 1:26) QS මූලාශ්‍රයේ 14 වන කොටසේ දැක්වෙන මෙම සංකල්ප රූපයම තරමක් වෙනස්කර 'ගෙය' වෙනුවට ගලක් උපමා කරගෙන යොදා තිබේ. එහි බුදුන් වහන්සේගේ ධර්මයට අනුකූලව ජීවත්වන පුද්ගලයා සුළඟට හා වර්ෂාවට ඔරොත්තු දීමට ශක්තියක් ඇති නොසෙල්වෙන ගලකට සමාන කර තිබේ.

ධම්මපදයේ ආරම්භයේ බුදු දහමේ 'ජුදාස්' ලෙස හඳුන්වා දිය හැකි දේවදත්තයකු අරමුණු කර දේශනා කරන ලද ගාථාවක් තිබේ. නමුත් එම ගාථාවෙන් කියවෙන කාරණය නම් උගත්කම ගැන උද්දාමයට පත් වෙමින් ආධ්‍යාත්මික වර්ධනය සඳහා ක්‍රියා නොකරන දේවදත්තයකු වැනි ඕනෑම කෙනෙක් සම්බන්ධයෙන් හෝ ජේසුස් වහන්සේට අනුව උන්වහන්සේගේ දේශනා අසා ඒ අනුව නොපිළිපදිනු ලබන ඕනෑම පුද්ගලයකු සම්බන්ධයෙන් යොදාගත හැකිවේ. යම් කෙනෙක් ධර්මය බොහෝ කොට දැන ඉගෙන ගෙන එය ප්‍රකාශ කරමින් හැසිරුනත් ඒ කිසිවක් තමා වෙත ලබා කර නොගන්නා, එහෙයින්ම පමාව වෙසෙන ඒ මිනිස් තෙම අනුන්ගේ ගවයන් ගණ බලා ගන්නා ගොපල්ලකුසේ ශ්‍රමණ ගුණයනට හිමිකරුවෙක් නොවන්නේය. (ධම්මපදය 1:19)

මෙහි සඳහන් කර ඇති ශ්‍රමණ ජීවිතයට ඇතුල්වීමෙන් විමුක්තිය සොයා යන පුද්ගලයකු විසින් ලබාගත යුතු ආධ්‍යාත්මික වර්ධනයේ අවස්ථා හතරක් තිබේ. එනම් පළමුව හේ සෝතාපත්ති මාර්ගයට පිළිපන් පුද්ගලයකු විය යුතුය. අනතුරුව මරණයෙන් පසු එක් ආත්මභාවයකදී පමණක් නැවත ඉපදීමට හේතුවන සකෘදාගාමී තත්වයටත් ඉන්පසු නැවත නූපදීමට හේතුවන අනාගාමී සහ අවසාන වශයෙන් 'රහත්' තත්වයටත් පත්වීමය.

එළඹසිටි සිහියෙන් යුක්තව සිටීම පිළිබඳ අදහස බෞද්ධ ජීවන

ක්‍රමයේ කේන්ද්‍රීය ලක්ෂණයක් වශයෙන් නිතර සඳහන් කර තිබේ. ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද උපදේශ කථා තේරුම් ගත යුත්තේ කෙසේද, එපරිද්දෙන්ම බුදුන්වහන්සේ සහ රහතන් වහන්සේලා විසින් දේශනා කරන ලද ධර්මය කෙරෙහි සැලකිලිමත් විමද ඊට ඇතුළත් වේ. ජේසුස්වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද ශක්තිමත් හෝ දුර්වල අත්තිවාරමක් මත ගෙයක් තැනීම පිළිබඳ උපමා කථාවෙන් මතුකර ඇති තේමාව බොහෝ බෞද්ධ කථා ප්‍රවෘත්තිවල සඳහන් කර තිබේ. පහත සඳහන් ගාථාවෙන් ඒ බව පැහැදිලිවේ: 'යම්කිසි පුද්ගලයෙක් ධර්මය හොඳින් ඉගෙන, ඒ අනුව පිළිපදිනු නොලබන්නේ නම් හේ ධර්මය දැනගත් පුද්ගලයකු වන්නේ නැත. මන්ද ඒ අනුව නොපිළිපැදීමෙන් ඔහු ධර්මයට නිග්‍රහ කරනු ලබන හෙයිනි.' (උදාන වග්ගය22:6)

තම ශ්‍රාවකයින් සසුන් ගත කිරීමේදී ගිහි ජීවිතයේ ඇති බැඳීම් වලින් විනිර්මුක්තව කටයුතු කිරීමේ අවශ්‍යතාවය ඔවුන්ට ඒත්තු ගැන්වීම ජේසුස් වහන්සේ සහ බුදුන් වහන්සේ මුහුණ පෑ ප්‍රධාන ගැටලුව විය. බාහිර ලෝකයේ පවතින ගැටළු වලින් මිදිය හැක්කේ චිත්තවේගීවුන්, බුද්ධිමත්වුන් සියලු ලෞකික බැඳීම් වලින් ඉවත් වීමෙන් පමණි.

"සිහි කල්පනා ඇත්තෝ තමා ලබා ඇති ධ්‍යාන භාවනාදියෙහිම යෙදෙනු කැමති වෙති. ඔවුහු පස්කම් සුවයෙහි නො ඇලෙති. තවද ගොදුරු අවසන් කර විලහැර පියා යන හංසයින්මෙන් සියලු කාමයන්හි ඇල්ම දුරු කොට වෙසෙති.

යම් කෙනෙකු වෙත රැස් කිරීම නැත්තේවේද, ආහාර පිළිබඳ පිරිසිඳ දත්තේත් වේද, සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත යනුවෙන් හැඳින්වෙන නිවන ගොදුරු කොට ඇත්තේවේද, අහසෙහි කුරුල්ලන් ගිය මග මෙන් ඔවුන්ගේ ගතිය කිසිවෙකුටත් දත නොහැක්කේය."
(ධම්මපදය 7 : 2-3)

"එක් මිනිසෙක් ජේසුස් වහන්සේ අමතා මෙසේ කීවේය. 'ඔබ වහන්සේ යන ඕනෑම තැනකට මමත් ඔබ වහන්සේ අනුව එන්නෙමි.' ජේසුස් වහන්සේ ඔහුට පිළිතුරු දෙමින් 'හිවලුන්ට බෙනද අහසෙහි සැරිසරන කුරුල්ලන්ට කැදලිද ඇත. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට හිස තබා ගැනීමටවත් තැනක් නැතැ'යි ප්‍රකාශ කළහ. තවත් මිනිසෙක් 'ස්වාමීනි පළමු කොට මාගේ මියගිය පියා භූමිදාන කරණු පිණිස මට යාමට අවසර දුන මැනවැ'යි කීය. උන්වහන්සේ පිළිතුරු දෙමින් 'මළවුන්ගේ භූමිදානය මළවුන්ම කළාවේ යැ'යි ප්‍රකාශ කළහ. තවත් කෙනෙක්, 'ස්වාමීනි, මම ද ඔබ අනුව එන්නෙමි, එහෙත් පළමුකොට මාගේ ගෙදර උදවියගෙන්

"යමෙක් ලෞකික බැඳීම් ඉවතලා සියලු කෙලෙස් ප්‍රහීණ කොට බැඳීම් වලින් තොරව වෙසේද හේ බ්‍රාහ්මණයෙකුයැයි මම පවසමි".
(උදාන වර්ගය 33:52)

සමුගෙන ඒමට අවසර දුන මැනව'යි කීවේය. එවිට ජේසුස්වහන්සේ ඔහුට පිළිතුරු දෙමින් 'නඟුලට අත තබා ආපසු හැරී බලන කිසිවෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට සුදුසු නැතැ'යි ඔහුට ප්‍රකාශ කළ සේක."
(QS 19)

මෙහිදී පළමුවෙන්ම 'මනුෂ්‍ය පුත්‍රයා' යනුවෙන් සඳහන් කර ඇති එම වාක්‍ය ඛණ්ඩයේ අර්ථය පැහැදිලි කරගත යුතුය. එය බයිබලයේ එන දානියෙල්ගේ පොතේ සඳහන් කර ඇති වලාකුළු අතරින් ඔහුට දර්ශනයවූ ගැලවුම් කාරයා පිළිබඳ සිද්ධිය මනුෂ්‍ය පුත්‍රයා ලෙස වැරදි ලෙස අර්ථ නිරූපණය කිරීමකි.[34] දානියෙල්ගේ පොතේ මෙසේ සඳහන් වේ: 'තවදුරටත් බලාසිටියදී මම රාත්‍රී දර්ශන වලදී සිහිනෙන් මෙසේ දිටිමි. මනුෂ්‍ය පුත්‍රයා වැනි කෙනෙක් අහසේ වලාකුළු පිරිවරා අවුත් පෞරාණිකයාණන් වෙත එළඹුණේය." (දානියෙල් 7:13). ලෝක විනිශ්චය සඳහා ගැලවුම්කාරයාණන් වහන්සේ මනුෂ්‍ය ස්වරූපයෙන් පහළ වන බව යුදෙව් ජාතිකයින් තුළ පැවති එළිදරව්ව පිළිබඳ විශ්වාසයේ අංගයක් විය. ඒ අනුව මෙහිදී සිදුවී ඇත්තේ "මනුෂ්‍ය පුත්‍රයා" එළිදරව්ව පිළිබඳ විශ්වාසයේ එන ගැලවුම්කාරයා වශයෙන් වරදවා තේරුම් ගැනීමකි.[35] පසුකාලයේදී ජේසුස් වහන්සේගේ දේශනා ඉදිරිපත් කිරීමේදී ඒවා සංස්කරණය කළ පුද්ගලයින් මරණය සහ පරලොව ජීවිතය පිළිබඳව උන්වහන්සේගේ ප්‍රකාශ වල දැක්වෙන 'මම' නමැති උත්තම පුරුෂ නාම පදය වෙනුවට මනුෂ්‍ය පුත්‍රයා යන පදය යොදන ලදී. ජේසුස් වහන්සේ ගැලවුම්කාරයාණන් ලෙස මිනිසුන් විශ්වාස කළ බව ඔවුන්ගේ පිළිගැනීම විය. QS 19 වශයෙන් ඉහත උපුටා දක්වන කොටස සංස්කරණය කළ යුතුව තිබුණේ "හිවලුන්ට බෙන ඇත. අහසේ සැරිසරන කුරුල්ලන්ට කැදලි ඇත. එහෙත් මට හිසතබා ගැනීමට වත් තැනක් නැත" යනුවෙනි.

ජේසුස් වහන්සේට ජීවත්වීම සඳහා නිවහනක් නොමැති බවත්, මුළු ලොවම උන්වහන්සේට නිවහන වී ඇති බවත් පෙන්නුම් කිරීම සඳහා යොදා ඇති සංකල්ප රූපය විශිෂ්ට එකකි. එය ගිහිගෙය අත්හැර දැමීම යනුවෙන් හැඳින්වෙන බෞද්ධ සංකල්පය මෙහිදී සත්ව ලෝකය සම්බන්ධ උපදේශ කථාවක් මගින් පැහැදිලිකර තිබේ. එවැනි කථා ඉන්දියාවේ ඉතා සුලබය. අප විසින් මීට කලින් පෙන්වාදී ඇති පරිදි එවැනි කථා බෙහොමයක් බටහිරට ගලා ආවේය. ස්ථිර වාසස්ථානයක් නොමැතිව තැනින් තැන ඇවිදිමින් දහම් දෙසූ තවුසන්ගේ මූලාදර්ශය

ලෙස බුදුන් වහන්සේ සැලකීමට ප්‍රථම ශිව දෙවියන් කැදැල්ලක් නැතිව විසූ බව ශ්වේතාශ්වතාර-උපනිෂද්හි (Shvetashvatara-Upanishad) සඳහන් වේ: "ඔබ මහත් භක්තියෙන් යුතුව වැඳුම් පිදුම් කරන්නාවූ සියල්ල නිර්මාණය කරන්නාවූත්, විනාශ කර දමන්නාවූත් ශිව දෙවියන්ට වාසය පිණිස කැදැල්ලක් නැති තැනැත්තන් වහන්සේ යැ'යි කියනු ලැබේ."

බෞද්ධ භික්ෂූන් ගිහිගෙය අතහැර අනිස් ලෙස ජීවත් වේ. ඔවුන් මෙසේ ස්ථිර පදිංචියක් නොමැතිව තැනින් තැන සැරිසරමින් ජීවත්වීම මෙලොව ජීවිතය උසස් ස්විඥානක තත්වයකට පත්කිරීම සහ එයට දාර්ශනික වටිනාකමක් ලබාදීම සඳහා දරන ප්‍රයත්නයක් වේ. ජීවිතය යනු නිරන්තරයෙන් වෙනස්වන තත්වයකට වඩා වැඩියමක් නොවේ. බෞද්ධ දර්ශනයට අනුව එය සංසාර චක්‍රය තුළ සිදුවන දුකින් පිරුණු එක් ජීවිතයකින් තවත් ජීවිතයකට පරිවර්තනය වීමේ ක්‍රියාවලියකි. සසර සැරි සරන තුරා සිදුවන මෙම ක්‍රියාවලියේදී පුද්ගලයකු විසින් අයිති කරගෙන සිටින, අල්ලාගෙන සිටින, නිර්මාණය කරනු ලබන, ආදරයෙන් ආරක්ෂා කරනු ලබන, සහ රැකබලා ගන්නා කිසිවක් ස්ථිර නැත. දුකින් පිරුණු සංසාර චක්‍රයෙන් මිදීම සඳහා අවශ්‍යයෙන්ම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දැක්වෙන දෙවන අවස්ථාව පිළිබඳව, එනම් සම්මා සංකප්පය හෙවත් සියලු බැඳීම් වලින් මිදීම පිළිබඳ අවබෝධයක් ඇතිකර ගත යුතුය. බුදුන් වහන්සේ දේශනා කළ මාර්ගය අනුගමනය කිරීමට කැමති සෑම කෙනෙක් විසින්ම මෙම පූර්ව අවශ්‍යතාවය වටහාගෙන ඒ අනුව පිළිපැදිය යුතුවේ. ජේසුස් වහන්සේද එපරිද්දෙන්ම මෙම අවශ්‍යතාවය අවධාරණය කළහ. උන්වහන්සේගේ ශ්‍රාවකයකු වියහැකි වූයේ තමා සතු සියල්ල අත්හැර දමා උන්වහන්සේ අනුව ගමන් කිරීමට හැකිවූ පුද්ගලයින්ට පමණි. (මතෙව් 19:21). ඒ නිසා එම තේමාව පැහැදිලි කරන උපමා කථා සහ ආප්ත පද Q^1 මූලාශ්‍රයේ සංග්‍රහ කර ඇති ජේසුස් වහන්සේගේ ප්‍රකාශ අඩංගු දේශනාවල නිතර හමුවේ. ඒ පිළිබඳව පහදා දිය හැක්කේ බෞද්ධ පූර්වාදර්ශ වලට අනුවය.

භෞතික සම්පත්, කීර්ති ප්‍රශංසා සහ සුඛ වේදනාවලින් පිරුණු ජීවිතයක් අත්හැර දැමීම සඳහා මිනිසුන් පොළඹවා ගත හැක්කේ එවැනි අභිනිෂ්ක්‍රමණයක් මගින් ලබාගත හැකි ආධ්‍යාත්මික ප්‍රතිලාභ සහතික කිරීමෙන් පමණි. ඒ බව උදාන වග්ගයේ සිත්කාවදින අයුරින් මෙසේ ප්‍රකාශ කර තිබේ: "බොහෝ දෙනා විසින් සැපත් ලෙස සලකන ලෞකික ජීවිතය ශ්‍රාවකයකු විසින් තම ආධ්‍යාත්මික විමුක්තිය සලසා ගැනීම පිණිස අත්හල යුතුවේ. කෙනෙක් තමාට බොහෝ වැඩදායක වන්නේ කුමක්දැයි අවබෝධකර ගතහොත් ඔහු තම අභිවෘද්ධිය සලසා ගැනීම පිණිස යොමුවනු ඇත." (උදාන වග්ග 23:9). බුදුන්වහන්සේ සහ ජේසුස්

වහන්සේ තුළ පැවති කරුණු වටහාදීමේ අසාමාන්‍ය නිපුණත්වයත්, තීක්ෂණ බුද්ධියත් උන්වහන්සේලා ගත කළ ආදර්ශමත් ජීවිතයත් හේතුකොට ගෙන ආධ්‍යාත්මික මාර්ගයකට යොමුවීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳව තම ශ්‍රාවකයින්ට අවබෝධකර දීමට උන්වහන්සේලා සමත්වූහ.

එවැනි රූක්ෂ ප්‍රතිපත්ති පිරීමෙන් ලෞකික සැප සම්පත් නොව දිව්‍යමය සැප සම්පත් ලැබිය හැකිබව ජේසුස් වහන්සේ දේශනා කළහ. එම ආධ්‍යාත්මික සම්පත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අටවැනි අංගය වන සම්මා සමාධිය හෙවත් යහපත් සිහිය වශයෙන් හැඳින්විය හැකිය. මෙහිදී බාහිර ලෝකය පිළිබඳව පවතින බැඳීම් ඉවතලා ආධ්‍යාත්මික වර්ධනය පිණිස සිත එක අරමුණක මනාකොට පිහිටුවීම අදහස්වේ. කෙසේ වෙතත්, බුදුන් වහන්සේ ලොව පහළවීමට ශතවර්ෂ ගණනකට පෙර ඉන්දියාවේ පැවති 'භාවනාව' පිළිබඳ සංකල්පය ඒ ආකාරයෙන්ම පලස්තීනයේ වැසියන්ට හඳුන්වාදීමට නොහැකිවිය. භාවනාව පලස්තීනයට සම්පූර්ණයෙන්ම පාහේ අලුත් වූ අදහසක් විය. බුදුන් වහන්සේ මෙන්ම ජේසුස් වහන්සේත් භාවනාව පිළිබඳ සංකල්පය එය පුද්ගලයකුගේ සමස්ත ජීවන රටාව කෙරෙහිම බලපාන අයුරින් පුළුල් සන්දර්භයක් තුළ ඉදිරිපත් කර තිබේ. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වල ඇති බෞද්ධ පදනම විමුක්තිය සඳහා ලෞකික සම්පත් සියල්ල අතහැර දැමිය යුතුය යන උන්වහන්සේ දැරූ දැඩි ස්ථාවරය තුළ පැහැදිලි ලෙස දක්නට ලැබේ. තම ශ්‍රාවකයින්ට බෞද්ධ භික්ෂූන් මෙන් ස්ථිර වාසස්ථානයක් නැතිව තැනින් තැන සැරිසරමින් ජීවත්වන ලෙස කරන ලද නියෝගය ජේසුස් වහන්සේ බෞද්ධයකු බව පෙන්නුම් කරයි.

"මිනිසුන් රැස්කළ යුත්තේ ශ්‍රද්ධා සම්පත්තියයි. මන්ද සැබෑ කුසලය කිසිවකුට පැහැර ගත නොහැකි හෙයිනි. ඒවා සොර සතුරන් විසින් පැහැර ගනී යැයි බියවීමට හේතුවක් නොමැත. එවැනි ශ්‍රද්ධා සම්පත්තියෙන් යුක්ත ශ්‍රාවකයකුගේ ඇසුර ලැබීම ප්‍රඥාවන්ත පුද්ගලයකුගේ සැප පිණිස වන්නේය."
(උදාන වර්ගය 10 : 11)

"ඔබ සතු දේ විකුණා දන් දෙන්න. කාවුන් නොකන, මල නොබැඳෙන, සොරුන්ට පැමිණ සොරකම් කළ නොහැකි සම්පත් ඔබ වෙනුවෙන් ස්වර්ග රාජ්‍යයේ රැස්කර තබන්න. මන්ද ඔබගේ වස්තුව කොතැනද, ඔබේ සිතත් එතැනය." (QS 40)

ප්‍රඥාවන්ත පුද්ගලයා මෙලොව ජීවිතයේදී ශ්‍රද්ධා බුද්ධියෙන් යුක්තව බුද්ධාදී ආර්යයන් විසින් ප්‍රකාශ කරන ලද ධර්මයෙහිම ඇලෙයි. ශ්‍රද්ධාව හා බුද්ධිය ඔවුන්ගේ සම්පත් වන්නේය. අනෙක් සියලුම සැප සම්පත් ඔවුනු ඉවත දමති.
(උදාන වර්ගය 10 : 9)

"විනාශයට පත් නොවන, කාවුන් විසින් කා දමා විනාශ කළ නොහෙන, කීටයින් (පණුවන්ගේ) ගෙන් විනාශ නොවන සදාකාලිකව පවත්නා සම්පත් පමණක් සොයන්න."
(තෝමස් 76)

බුද්ධාගමට අනුව ශ්‍රද්ධා සම්පත්තිය සහ ශ්‍රද්ධා බුද්ධිය මෙලොවදී ලැබිය හැකි උසස්ම සැපත වේ. එම සම්පත් ජේසුස් වහන්සේ විසින් ස්වර්ග සම්පත් ලෙස හඳුන්වනු ලැබිය. ඉන්ද්‍රිය ගෝචර ලෝකයෙන් ඔබ්බට විහිදෙන ස්වර්ග සම්පත් අප විසින් රැස්කළ යුතුය. එසේ කිරීමෙන් සදාකාලිකවූත් වෙනස් නොවන්නාවූත් තත්වයට පත්විය යුතුය. ඒ බව නිවැරදිව වටහාගෙන ඒ අනුව පිළිපැදිය යුතු බවත් ගිහිගෙය අත්හැර දමා භික්ෂුවක මෙන් ජීවත්විය යුතු බවත් බුදුන් වහන්සේ අවධාරණයෙන් ප්‍රකාශ කළහ. ජේසුස් වහන්සේද එපරිද්දෙන්ම ඒ බව අවධාරණය කළ නමුත් උන්වහන්සේට පවුල් ජීවිතය සහ දරු පරම්පරාවේ පැවැත්ම ඉතා වැදගත් සේ සලකනු ලැබූ යුදෙව් සමාජයේ පැවති සම්ප්‍රදායන්ගේ බලපෑමට යටත් වීමට සිදුවිය. මාපියන්ට, නැදෑයින්ට, මළවුන්ට, ඉඩ කඩම් සහ සතුන් කෙරෙහි ඇති බැඳීම් අත්හැර දමන ලෙස උන්වහන්සේ විසින් කරන ලද ඉල්ලීමට දැඩි විරෝධතා එල්ලවන්නට ඇත. එම තේමාව පිළිබඳ උන්වහන්සේ කළ දේශනා හුදෙක් එකල පැවති සදාචාරය පිළිබඳ විශ්වාස වලට එරෙහිව යුධ ප්‍රකාශ කිරීමක් බඳුවිය. එය උන්වහන්සේගේ ඉගැන්වීම් පිළිගැනීමට සූදානම් වූ පුද්ගලයින්ට පවා තේරුම්ගත නොහැකි වූත්, ඔවුන් කෝපයට පත්කිරීමට හේතුවූත් අභියෝගයක් විය. පවුල් බැඳීම් ඉවත ලා ගිහි ජීවිතය අත්හැරිය යුතු බව ප්‍රකාශ කරන බෞද්ධ උපදේශය ජේසුස් වහන්සේ විසින් 'අනිත්‍ය තත්වයට මුහුණ දීම' යනුවෙන් සංක්ෂිප්තව දක්වා තිබේ. (තෝමස් 42)

ලෞකික බැඳීම් අත්හැර දැමීම, ගිහිගෙය අතහැර දමා නිවැරදි ආධ්‍යාත්මික මාර්ගය කෙරෙහි යොමුවීම (ශ්‍රද්ධා සම්පත්තිය) පිළිබඳව ජේසුස් වහන්සේ විසින් ඉදිරිපත් කර තිබෙන පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවේ බොහෝ තැන්වල සඳහන් කර තිබීමෙන් එම කථාවට බෞද්ධ කථාවස්තුවල ආභාෂය ලැබී තිබෙන බව පෙනේ. ඊට සමාන කථාවස්තුවක් මජ්ඣිම නිකායේ දක්නට ලැබේ. එම කථාවේ සිදුවීම් වල අනුපිළිවෙළ පවා එහි මැනවින් ආරක්ෂා වී තිබේ. එම කථාවට

අනුව පළමුව මියගිය රජ කෙනෙකුගේ දේපළ උරුමය පිළිබඳ ඇතිවූ මතභේදයක් පිළිබඳ සාකච්ඡා කෙරේ. ඊට පසුව ලෞකික සම්පත් කිසිවක් ස්ථිර නැතිබවත් එනිසා එසී සම්පත් වලට ආශා කිරීම නිශ්ඵල බවත් ප්‍රකාශ වේ.

"උරුම ඇත්තෝ ඔහුගේ වස්තුව සඳහා කලහ කර ගනිති. මරණයට පත්වූ තැනැත්තේ තමා සතු සියල්ල හැරදමා පරලොව යයි. ධනයෙන් කිසිවක් ගෙන නොයයි. දරුවෙද් භාර්යාවෙද් වස්තුවද් බලයද් හැර දමා යති. වස්තුව නිසා දීර්ඝායුෂ නොලබයි. ජරාවට පත්වීම (මහලු වයස) නොවළක්වයි. එනිසා ප්‍රඥාව ධනයට වඩා උතුම්ය. මන්ද එය රහත් ඵලයට පැමිණීමට මග පාදා දෙන හෙයිනි". (රට්ඨපාල සූත්‍රය, මජ්ඣිම නිකාය 82)

"මට පුත්තු සිටිති'යිද මට වස්තු සම්පත් ඇතැයි'ද සිතමින් මෝඩ පුද්ගලයෝ වැනසීමට පැමිණෙති. එහෙත් තමාට තමාවත් නැත. කෙසේ නම් පුත්තු හෝ වස්තු හෝ සම්පත් වේද?
මිනිසුන් කොතරම් ලෞකික වස්තුව රැස්කර ගත්තේ වී නමුත් ඔවුන් අවසානයේදී මරණයට පත්වන්නාහුය. සියලු සැප සම්පත් නැතිවී යයි. ගොඩනගනු ලබන සියල්ල විනාශයට පත්වේ. සියලු සම්බන්ධතා වෙන්වීම උරුම කොට ඇත්තේය. ජීවිතය මරණයෙන් කෙළවර වේ."
(උදාන වර්ගය 1:20-22)

"සෙනග අතරින් එක් තැනැත්තෙක් කථාකොට 'ගුරුදේවයිනි, මා සමඟ අපේ උරුමය බෙදා ගන්නා ලෙස මාගේ සහෝදරයාට කිව මැනව'යි උන්වහන්සේට කීය. එහෙත් උන්වහන්සේ කථා කරමින් 'මිත්‍රය මා ඔබගේ නඩුකාරයා හෝ නීතිඥයා වශයෙන් පත්කරනු ලැබුවේ කවරෙක් විසින්ද'යි ඔහුගෙන් ඇසීය."

"උන්වහන්සේ උපමාවක් කියමින් මෙසේ වදාළසේක. 'එක් පොහොසත් මිනිසෙකුගේ වතුපිටිවල බොහෝ ඵලදාව ඇතිවිය. එවිට ඔහුට මෙවැනි සිතිවිල්ලක් ඇතිවිය. 'මම කුමක් කරම්ද? මාගේ භවබෝග රැස්කර තබන්නට ඉඩකඩ නැත. මම මෙසේ කරමි. මාගේ අටුකොටු කඩාදමා වඩා විශාල අටුකොටු තනා සියලු ධන ධාන්‍ය ඒ තුළ රැස් කොට තබමි. එවිට මම මගේ ආත්මයට මෙසේ කියමි. "වසර ගණනාවකට සෑහෙන තරම් අගනා වස්තු සම්භාරයක් මෙහි රැස් කොට තිබේ. විවේක සුවයෙන් ඒවා කාබී ප්‍රීතිවන්න." එහෙත් දෙවියන් වහන්සේ ඔහුට කථා කොට 'අඥානය, අද රාත්‍රියේදී ඔබගේ ප්‍රාණය නිරුද්ධ වේ. එවිට ඔබ රැස්කර ගත් දෙය කවරෙකුට අයිති වන්නේද'යි ඇසූ සේක.

දෙවියන් ඉදිරියෙහි පොහොසත් නොවී තමා සඳහාම වස්තු රැස්කර ගන්නා අයට අත්වෙන ඉරණම මෙසේ වේ යැයි ප්‍රකාශ කළසේක. (QS 38)

ජේසුස් වහන්සේගේ ප්‍රකාශයේ සහ බෞද්ධ කථාවේ දක්නට ලැබෙන දෙවන සමාන ලක්ෂණය නම් ලෞකික සැප සම්පත්වල ඇති නිස්සාරත්වය උපමා කථාවක් මගින් පැහැදිලි කර තිබීමය. බෞද්ධ ඉගැන්වීම් වල උපමා කථා යොදාගෙන තිබෙන්නේ ඉතා විරල වශයෙනි. බුදුන් වහන්සේ බොහෝ විට තම ශ්‍රාවකයින් විසින් පිළිපැදිය යුතු උපදෙස් ඉදිරිපත් කරන ලද්දේ කාව්‍යමය ලක්ෂණ වලින් අනූන වූ ගාථා පාඨ මගිනි. බොහෝවිට සාකච්ඡා සහ දේශනා මගිනි. ජේසුස් වහන්සේ උපමා කථා අනුසාරයෙන් තම අදහස් ප්‍රකාශ කළහ. නමුත් සාපේක්ෂ වශයෙන් සලකා බැලීමේදී Q[1] මූලාශ්‍රයේ උපමා කථා එතරම් යොදාගෙන නොමැත. ඒ වෙනුවට සිත් ඇදගන්නාසුලු ආප්ත පද යොදාගෙන තිබේ. කෙසේ වෙතත් ධර්මය රචනා කිරීමේදී අනුගමනය කර ඇති සම්ප්‍රදාය සලකා බැලීමේදී ජේසුස් වහන්සේගේ ඉගැන්වීම සඳහා උපමා කථා වඩාත් යෝග්‍ය මාධ්‍යයක්වූ බව පෙනේ. අලංකාරෝක්ති වලින් යුක්තව භාෂාව හැසිරවීමේ අපූර්ව කුශලතාවය හේතුකොට ගෙන විචිත්‍ර චිත්ත රූප මැවෙන අයුරින් අදහස් ප්‍රකාශ කිරීමේ අසාමාන්‍ය හැකියාවක් උන්වහන්සේට තිබුණි. ශ්‍රාවකයින්ට තම ඉගැන්වීම් පහසුවෙන් මතකයේ රඳවා ගැනීමට හැකිවන පරිදි උපමා කථා යොදා ගැනීම යෝග්‍ය මාධ්‍යයක් විය.

මෙහිදී සියලු ලෞකික බැඳීම් ඉවතලා ගිහිගෙය හැර ගොස් ගම් නියම් ගම්වල සැරිසරමින් ධර්මය දේශනා කරන බෞද්ධ භික්ෂූන් මෙන් තමන් වහන්සේගේ ඉගැන්වීම් ප්‍රචාරය කරන ලෙස ජේසුස් වහන්සේ විසින් තම ශ්‍රාවකයන්ට අනුශාසනා කරමින් ඔවුන් විසින් පිළිපැදිය යුතුවූ උපදෙස් ඉදිරිපත් කර ඇති ආකාරය විශිෂ්ටය.

"තමා ලත් දෙය පහත් කොට නොසිතන්න. අනුන් ලද දෙයට ඇලුම් නොකරන්න. අනුන් ලබන දෑයෙහි ඇලුම් කරන භික්ෂුව චිත්ත සමාධියක් නොලබයි."
(ධම්මපදය 25:6)

"දැන් පිටත්වන්න. වෘකවලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් මම ඔබ පිටත්කර යවන සැටි බලන්න. ඔබ චාරිකාවේ යෙදෙනවිට මුදල් හෝ මල්ලක් හෝ පාවහන් හෝ සැරයටියක් රැගෙන නොයන්න. මගදී හමුවන කිසිවකුට ආචාර කිරීම

"අඥානවන්ත පුද්ගලයා අඥදිවයන්, ලෝභී, සේලාම් තියනු ලබන සහ කලහකාරී පුද්ගයින්ගේ ඇසුර ප්‍රියනොකරන්නේය. ප්‍රඥාවන්තයා හැම විටම අයහපත් ඇසුර දුරු කරයි". (උදාන වග්ගය 25:1)

සඳහා ප්‍රමාද නොවන්න. ඔබ යම්කිසි ගෙදරකට ඇතුළු වූ කල පළමුකොට "මේ ගෙදරට සාමය උදාවේවා" යයි පතන්න. සාමය ලැබීමට සුදුස්සෙක් එහි සිටිනම් ඔබේ පැතුම පිළිගනු ඇත. (මින් අදහස් වන්නේ ඔබගේ සාම පැතුම ඔහු පිට රැඳෙනු ඇත යන්නය.) නැතහොත් ඔබේ සාම පැතුම ඔබ වෙත පෙරලා එනු ඇත. ඔවුන් දෙන දෙයක් කමින් බොමින් ඒ ගෙදරම නැවතී සිටින්න. මන්ද මෙහෙකරුවා සිය වේතනය ලැබිය යුතු හෙයිනි. ගෙදරින් ගෙදරට නොයන්න. ඔබ යම් නුවරකට ඇතුල් වූ කල ඔවුන් ඔබ පිළිගනහොත් ඔබ ඉදිරියේ තබන ලද දේ වළඳන්න. එහි සිටින රෝගීන් කෙරෙහි සැලකිල්ල යොමුකරන්න. දෙවියන්ගේ රාජ්‍ය ඔවුන් වෙත පැමිණ ඇතිබව ඔවුන්ට ප්‍රකාශ කරන්න. එහෙත් යම් නුවරකට ඔබ ඇතුළුවූ කල ඔවුන් ඔබ නොපිළිගනහොත් ඔබ ඉන් පිටවී යන කල ඔබේ පාදවල වැකුණු දූවිලි ගසා දමන්න. කෙසේ වුවත් දෙවියන්ගේ රාජ්‍යය ඔවුන් වෙත ළංව ඇතිබව ප්‍රකාශ කරන්න." (QS 20)

"ඔබේ පැතුම පිළිනොගනු ලැබුවහොත් එය (ඔබේ සාම පැතුම) ඔබ වෙත පෙරලා එනු ඇත" යන අපූර්ව ප්‍රකාශය පිළිබඳව තරමක් කල්පනාකර බැලීම වටී. 'සාමය උදාවේවා' යනුවෙන් ජේසුස් වහන්සේගේ

ශ්‍රාවකයින් විසින් කරනු ලබන පැතුම හුදු සුභාශිංසනයක් පමණක් නොව කිසියම් ආධ්‍යාත්මික ශක්තියක් මුදාහැරීමක් ද වේ. ඇත්ත වශයෙන්ම එම ප්‍රකාශයේ දෙවන කොටසේ මෙසේ දැක්වේ: "සාමය ලැබීමට සුදුසු යමෙක් එහි සිටී නම් ඔබේ සාම පැතුම පිළිගනු ඇත." ඉන් අදහස් වන්නේ ඔබේ පැතුම ඔහු පිට රැඳෙනු ඇත යනුයි. කිසියම් භාවනායෝගී සෘද්ධි බලයකින් සිදුකරන්නාක් මෙන් සැබැවින්ම ඔවුන් සතුවූ සාමය උදාකර දිය හැකි විශේෂ බලයක් පතුරුවා හරින ලෙස උන්වහන්සේ තම ශ්‍රාවකයින්ගෙන් බලාපොරොත්තු වූයේද? ඔවුන්ගේ පැතුම ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත් නැවත අධ්‍යාත්මික සමාධියට සම්වැදී සන්සුන්ව සිටීමට ඔවුන්ට පුළුවන් වනු ඇත.

ජේසුස් වහන්සේ විසින් තම ශ්‍රාවකයින් පිණ්ඩපාතී ශ්‍රමණයින් සේ ජීවත්වීම සඳහා උනන්දු කරවීම හැම අතින්ම බුදුන් වහන්සේ ගේ ඉගැන්වීම් වලට අනුකූලවේ. බුදුන් වහන්සේගේ ශ්‍රාවකයෝ මුදල් පරිහරණය කිරීමෙන් සහ පරිෂ්කාරයන් පිළිගැනීමෙන් වැළකී ධර්ම ප්‍රචාරය සඳහා පිණ්ඩපාතී භික්ෂූන් ලෙස පිටත්ව ගියහ. මොනයම් හේතුවක් නිසා හෝ ඔවුන් ධර්මය ප්‍රචාරය කිරීමෙන් වැළකී නොසිටිය යුතුය. හැමවිටම තමන් වෙත පිළිගැන්වූ දන් වැළඳිය යුතු විය. මෙම නියෝගය පිළිපදිමින් පිලුණු වූ සූකර මද්දවයක් වැළඳීමෙන් බුදුන්වහන්සේගේ පරිනිර්වාණය පවා සිදුවිය. එය වැළඳීමෙන් පරිනිර්වාණය සිදුවිය හැකිබව දැන සිටියේ වී නමුත් උන්වහන්සේ එම දානය ප්‍රතික්ෂේප නොකළහ.

ධර්මය කෙරෙහි විවිධ පුද්ගලයන් දක්වන ආකල්පයට අනුව ඔවුන් කෙරෙහි පැවතිය යුතු බව ජේසුස් වහන්සේ විසින් උපදෙස් දී තිබීම කෙරෙහි මෙහිදී අපේ සැලකිල්ල යොමුවිය යුතුය. ධර්ම ප්‍රචාරයේ යෙදී සිටින තම ශ්‍රාවකයින් කිසිවකු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ඒ ගැන නොසලකා ඔවුන් ඉදිරියටම ගමන් කළ යුතුවිය. ජේසුස් වහන්සේ නොහික්මුනු පුද්ගලයින්ගේ සමාගමය නොසෙවිය. ඔවුන් සමඟ එකට විසීම හෝ ඔවුන්ට කරුණු පහදාදීම ප්‍රතික්ෂේප කළහ. නොහික්මුනු පුද්ගලයන් තමාවෙත නතුකර ගැනීමට බුදුන් වහන්සේ සහ ජේසුස් වහන්සේ උත්සාහ කළේ නැත. ශ්‍රාවකයෙකුට තමාට ඇසුරු කිරීමට සුදුසු, තමාට වඩා ගුණවත් පුද්ගලයකු හෝ සමානයකු හෝ සොයාගත නොහැකිවේ නම්, හේ හුදකලාව වාසය කළ යුතුය. බාලයන් ඇසුරු කිරීමෙන් කවර හෝ යහපතක් සිදුනොවන හෙයිනි'යි යනුවෙන් ධම්ම පදයේ දැක්වේ. (ධම්මපදය 5 : 3 බාලවර්ගය)

යම්කිසි තැනකදී ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් පිළිගනු නොලැබූ හෝ තේරුම් ගනු නොලැබූ අවස්ථාවලදී ඔවුන් එතැනින්

පිටත්ව ගියේ ඔවුන්ගේ පාදවල වැකුණු දූවිලි ගසා දමමිනි. කෙසේ වෙතත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය (මෙය ධර්මයට සමානය) ඔවුන් වෙත ළං ව ඇතිබව ඒ පිළිබඳව අවබෝධයක් නොමැති මිනිසුන්ට දැනගන්නට සලස්වන ලදී. පසුකාලයකදී ආප්ත පද මගින් ඉගැන්වීමේ සම්ප්‍රදාය සෙන් බුදුදහම මගින් කූටප්‍රාප්තියට පත් විය. ඒ සඳහා කෝන්ස් (Koans) යනුවෙන් හැඳින්වෙන ප්‍රහේලිකා වල ස්වරූපය ගත් කෙටි ආප්ත පද මගින් ඉහත කී අදහස දර්ශනීය ලෙස ඉදිරිපත් කර තිබේ. “ඔබ තේරුම් ගන්නත් සියල්ල (සත්‍යය) එසේම පවතී. ඔබ තේරුම් නොගන්නත් සියල්ල (සත්‍යය) එසේම පවතී.”

තම ශ්‍රාවකයින් ධර්ම ප්‍රචාරය සඳහා පිටත් කර යැවීමේදී ඔවුන් විශේෂ පුද්ගලයන් මෙන් පෙනී නොසිටිය යුතු බැව් බුදුන් වහන්සේ හැම විටම අවධාරණයෙන් ප්‍රකාශ කළහ. ඔවුන් නිහතමානී විය යුතුය. තමන් සතු ඥානය, ආධ්‍යාත්මික ප්‍රතිවේදය හෝ සෘද්ධි බලය ප්‍රදර්ශනය කිරීමෙන් වැළකී සිටිය යුතුය. ප්‍රසිද්ධියේ ගමන් කරනවිට හිස පහතට නමාගෙන ගමන් කළ යුතුයැයි භික්ෂූන්ට නියම කර තිබුණි. විමුක්තිය සාක්ෂාත් කරගත හැක්කේ එවැනි නිහතමානී ආකල්පයක් තුළින් පමණි. එම ආකල්පයේ දෝංකාරය ජේසුස් වහන්සේගේ දේශනාවේද දක්නට ලැබේ. “තමා ගැනම පාරට්ටුකර ගන්නා සැම කෙනෙක්ම අවමානයට පාත්‍රවනු ඇත. නිහතමානී පුද්ගලයා ප්‍රසංශාවට ලක්වනු ඇත.” යනුවෙන් උන්වහන්සේ ප්‍රකාශ කළහ. (QS 50)

තැනින් තැන ඇවිදිමින් වාසය කළ තවුසන් ඉන්දියාවේ නිතර දක්නට ලැබුණි. බුදුන් වහන්සේ ජීවත්වූ කාලයේදී බ්‍රාහ්මණ ආගම අතහැර දමා විමුක්තිය සොයා යාම ප්‍රචලිතව තිබුණි. එනිසා මෙම හුදකලා ප්‍රව්‍රජ්‍යා මාර්ගයට මිනිසුන් යොමුකරවීම සඳහා බුදුන් වහන්සේට මිනිසුන් තුළ පැවති බිය නැති කිරීමට විශේෂ අවශ්‍යතාවයක් නොතිබුණි. උග්‍ර තපස් වුත රැකීම හෝ විශේෂ යමක් උන්වහන්සේ තම අනුගාමිකයන් ගෙන් බලාපොරොත්තු නොවූහ. කෙසේ වෙතත් පුද්ගලයකුගේ නිදහසට බාධාවක් විය හැකි ලෞකික ආශාවන් සහ බැඳීම් අත්හරින ලෙස උන්වහන්සේ තම ශ්‍රාවකයින්ට නිතර අනුශාසනා කළහ. භාවනානුයෝගීව සිටින අවස්ථාවලදී හැර අනෙක් අවස්ථාවලදී ඔවුන් තුළ අනාරක්ෂිත හැඟීමක් ඇතිවිය හැකි නිසා තමන්ට රැකවරණය සැලසෙන යෝග්‍ය පරිසරයක ජීවත්වන ලෙස උන්වහන්සේ ඔවුන්ට උපදෙස් දුන්හ. මොනයම් හෝ දෙයක් පිළිබඳව පසුතැවිලිවීම නිශ්ඵල ක්‍රියාවක් බව උන්වහන්සේ ප්‍රකාශ කළහ. ලද දෙයින් සතුටුවීම සහ තමන් මුහුණ පාන ඕනෑම තත්වයක් යටතේ සතුටින් ජීවත්වීමට හැකිවන සේ ඔවුන්ට පුහුණුවක් ලබාදෙන ලදී. හෙට දවසේ කුමක් සිදුවේද කියා විත්තාපර

වීම හෝ ආහාර සහ වස්ත්‍ර පිළිබඳව කරදරවීම නිරර්ථක ක්‍රියාවක් බවත් එසේ කිරීම ලෞකික සැප සම්පත් කෙරෙහි පුද්ගලයකු තුළ ඇති බැඳීම පෙන්නුම් කරන ලක්ෂණයක් බවත් උන්වහන්සේ ප්‍රකාශ කළහ. ඔවුන් ශාන්තවූත්, තැන්පත්වූත්, ලද දෙයින් සතුටු වන්නාවූත් පුද්ගලයින් වශයෙන් බියෙන් තොරව ජීවත්විය යුතු බවට බෞද්ධ පොත පතේ බොහෝ උදාහරණ දක්වා තිබේ. “බුද්ධාදී සත්පුරුෂයෝ අනිත්‍ය වූ සියල්ලෙහිම ඇල්ම අත්හරිත්! එසේවූ ඔවුන් තමන් කැමති දේ ලබාගැනීමේ අදහසින් නොදොඩති. ඒ නුවණැත්තෝ සැප දුක් දෙකෙහිම වෙනසක් නොදක්වති.” (ධම්මපදය 6:8). ජේසුස් වහන්සේට තමා ජීවත්වූ රටේ පැවති සම්ප්‍රදායට පටහැනිව කටයුතු කළ නොහැකි විය. උන්වහන්සේ ජීවත්වූ කාලයේ පැවතුණේ හුදකලා තාපස සමාජ පමණි.

ඇන්කරයිට්ස් (Anchorites) නමින් හැඳින්වෙන සන්න්‍යාසින්ගේ සම්ප්‍රදාය වර්ධනය වූයේ පසුකාලීන ශතවර්ෂවලදීය. එනිසා තම ශ්‍රාවකයින්ට බැඳීම්, වස්තුව, තත්වය හෝ පිළිගැනීම ඉවතලා ගිහිගෙය අත්හැර දමා තැනින් තැන ඇවිදින පිණ්ඩපාතී ශ්‍රමණයින් ලෙස ජීවත්වීමේ ඇති වටිනාකම තේරුම් කරදීම සඳහා උන්වහන්සේට මහත් වෙහෙසක් දැරීමට සිදුවිය. මේ නිසා බියට පත් පුද්ගලයින්ගේ බලාපොරොත්තු සුන්වීම වළක්වා ලීම සඳහා ඔවුන් අස්වසාලීමට පවා උන්වහන්සේට සිදුවිය. Q^{1} මූලාශ්‍රයේ දැක්වෙන පසුතැවිලි නොවී ජීවත්වීමෙන් ලබාගත හැකි සැනසීම පිළිබඳව සඳහන් කරමින් උන්වහන්සේ විසින් කර ඇති සුන්දර දේශනාව ඊට කදිම නිදසුනකි. සැබෑ ශ්‍රමණයකු යනු ලෞකික ආශාවලින් තොරවූ පුද්ගලයෙකි. එවැනි පුද්ගලයකු තුළ පැවතිය යුතු තැන්පත් ස්වභාවය පෙන්නුම් කරන බෞද්ධ බලපෑම Q^{1} මූලාශ්‍රයෙන් උපුටා දක්වන ලද පහත දැක්වෙන ප්‍රකාශයෙන් පැහැදිලිවේ.

“යමෙක් කිසිවක් කෙරෙහි ශෝක නොකරන්නෙහිද සත්‍යයෙහි සහ ධර්මයේ පිහිටා කටයුතු කරන්නේද හේ සියලු දුක් නිමකර සංසාර සාගරයෙන් එතෙර වන්නේය.” (මහා පරිනිබ්බාන සූත්‍රය 3:66)

“යම් කෙනෙකු වෙත රැස් කිරීමේ තැනැත්තේවේද, ආහාර පිළිබඳ පිරිසිඳ දන්නේවේද, සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත යනුවෙන්

“මම ඔබට මෙසේ කියමි. කුමක් කමිද, කියා ජීවිතය ගැනවත්, කුමක් අඳිමිද, කියා ශරීරය ගැනවත් පසුතැවිලි නොවන්න. කෑමට වඩා ජීවිතයත්, ඇඳුමට වඩා ශරීරයත් උතුම් නොවන්නේද? කපුටන් ගැන කල්පනා කරන්න. උන් වපුරන්නේවත්, අස්වැන්න කපන්නේවත්, ධාන්‍ය අටුකොටුවල ගබඩා කරන්නේවත් නැත. දෙවියන් වහන්සේ උන් පෝෂණය කරන සේක.

හැඳින්වෙන රාගාදියෙන් මිදුනු නිවන අරමුණුවේද අහසෙහි කුරුල්ලන් ගිය මග මෙන් ඔවුන්ගේ ගතිය කිසිවකුටත් දත නොහැක්කේය.
යම් කෙනෙකුගේ කාමාදී ආශ්‍රවයන් සම්පූර්ණයෙන්ම ප්‍රහාණයට පත්වූයේවේද, ආහාරයෙහි ඇලුම් නැත්තේ වේද, සුඤ්ඤත, අනිමිත්ත හා අප්පණිහිත යනුවෙන් හැඳින්වෙන නිර්වාණය යනමිනට ගෝචරවේද, ඔහුගේ සසර ගතියක් කිසිවකුටත් දැනගත නොහැකිය. අහසෙහි පියාඹන පක්ෂියකුගේ පිය සටහන නොපිහිටන්නාක් මෙනි.
(ධම්මපදය 7:3-4)

ඔබ පක්ෂීන්ට වඩා කොතරම් අගනේද? සිත්තැවුල් වීමෙන් ජීවත්වන කාලය එක් දිනයකින් හෝ දික් කර ගත හැක්කේ ඔබ අතරින් කවරෙකුටද?
එසේ නම් ඔබ ඇඳුම් ගැන කරදර වන්නේ ඇයි? මානෙල් මල් ගැන කල්පනා කර බලන්න. ඒවා නූල් කටින්නේවත් වියන්නේවත් නැත. එහෙත් තමාගේ සකල ශෝභාශ්‍රීයෙන් සැරසී සිටි සලමොන් රජු පවා මානෙල් මලක් සේ විරාජමාන නොවීය. ශ්‍රද්ධා හීන තැනැත්තෙනි, අද කෙතෙහි වැඩී හෙට උදුනෙහි දමා පුළුස්සා දමන තණ, දෙවියන් වහන්සේ සුන්දර ලෙස සරසන්නේ නම් ඊට කොපමණ වැඩියෙන් උන්වහන්සේ ඔබ නොසරන සේක්ද?
එබැවින් අප කුමක් කන්නේද කියාවත්, අප කුමක් බොන්නේද කියාවත්, අප කුමක් අඳින්නේද කියාවත්, සිතමින් පසුතැවිලි නොවන්න. මේ සියල්ල ලෝකයේ ජීවත්වන සියලු දෙනා විසින්ම කරනු ලැබේ.
මේ දේවල් සියල්ලම ඔබට අවශ්‍ය බව ඔබේ පියාණන් වහන්සේ දන්නා සේක. එනිසා උන්වහන්සේගේ රාජ්‍යය සොයා යන්න. එවිට මේ සියලු දේ ඔබට ලැබෙනු ඇත. (QS 39)

ජේසුස් වහන්සේගේ එක් දේශනාවක ජර්මන් පරිවර්තනයේ සිදුවී ඇති වරදක් නිසා මතෙව් සහ ලූක් ගේ ශුභාරංචියේ දැක්වෙන "පසුතැවිලි

වීමෙන් තමාගේ ආයු ප්‍රමාණය දික්කර ගන්නට ඔබ අතුරෙන් කවරෙකුට පුළුවන්ද? (මතෙව් 6:27 ලූක් 12:25) යනුවෙන් දැක්වෙන ප්‍රකාශය පහත දැක්වෙන පරිදි නිවැරදි විය යුතුය. "ඔබගේ ඇට සැකිල්ලට තවත් එක ඇටයක් එකතු කර ගන්නට ඔබ අතුරින් කවරෙකුට පුළුවන්ද" (JeEv 45:7) මීට සමාන අදහසක් උපමා අලංකාර වලින් යුක්තව තෝමස්ගේ ශුභාරංචිය පදනම් කරගෙන ඉජිප්තියානු පැපිරස් ලියවිල්ලක සඳහන් කර තිබේ. එම අදහස බයිබලයේ ඉංග්‍රීසි පාඨාන්තරයේ දැක්වෙන අදහසට වඩාත් කිට්ටුය. "ඔබේ ආරෝහ සම්පත්තියට කිසිවක් එකතු කළ හැක්කේ කවරෙකුටද? එසේ කළ හැක්කේ ඔබට ඔබගේ කබාය දෙනු ලබන පුද්ගලයා විසිනි. (POxy 655-I : 1-17) පසුව ඇලෙක්සැන්ඩ්‍රියාවේ ඔරිගන් සහ ක්ලෙමන්ට් වැනි පියතුමන්ලා විසින් ජේසුස් වහන්සේගේ ඉහත දක්වන ලද උද්ධෘතය මෙසේ ඉදිරිපත් කර තිබේ: "ඔබට ලැබිය හැකි උසස්ම සැනසීම ඉල්ලන්න. එවිට ඔබට සුළු සැනසීමක් හෝ ලැබෙනු ඇත."[33] ආර්ය අෂ්ටාංගික මාර්ගයට අනුව ජීවත්වන පුද්ගලයාට අවශ්‍ය සියලු ලෞකික සැප සම්පත් ලැබෙන්නේය යන බෞද්ධ අදහස මෙහි ගැබ් වී තිබේ.

එවැනි මාර්ගයක් අනුගමනය කිරීම දුෂ්කර කාර්යයක් විය හැකිය. නමුත් ආධ්‍යාත්මික පූර්ණත්වය සලසා ගැනීම සඳහා එසේ කළ යුතුවේ. ජේසුස් වහන්සේ එම අදහස පුද්ගලයකු විසින් නොසෙවිය යුතුවූ ජීවිතය සහ කුරුසිය දරා ගැනීම පිළිබඳ දේශනාවේ ඉදිරිපත් කර තිබේ. (QS-52). තම ශ්‍රාවකයන් විසින් පිළිපැදිය යුතු යැයි ජේසුස් වහන්සේ විසින් නියම කරනු ලැබූ පෙර නොවූ විරූ මෙම දුෂ්කර ක්‍රියා පිළිවෙළට පදනම්වූ මුල් බෞද්ධ අදහස් වැරදි පරිවර්තනයක් නිසා තරමක් දුරට නොපැහැදිලි ස්වරූපයක් ගෙන තිබුනත් ජේසුස් වහන්සේ විසින් බලාපොරොත්තුවූ කාරණය තේරුම් ගැනීමට ඉන් අපහසුතාවයක් ඇති නොවේ. ලූක්ගේ ශුභාරංචියට අනුව එම මාර්ගයට අවතීර්ණ වීමට කැමති ශ්‍රාවකයින්ට ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ.

"යමෙක් මා අනුව එන්න කැමැත්තේද, හේ ස්වාර්ථය අතහැර දිනපතා සිය කුරුසිය දරාගෙන මා අනුව ආවාවේ." (ලූක් 9:23). මෙහිදී 'කුරුසිය' යන වචනය යොදා තිබෙන්නේ වැරදි පරිවර්තනයක් හේතුවෙනි. එහිදී සැබවින්ම යෙදිය යුතු නිවැරදි වචනය විය යුත්තේ ද්විත්වාර්ථ දෙන වියගහ (Yoke) යන වචනය වේ. බරගෙන යාමේදී උරහිස හරහා තබන වක්වූ දණ්ඩක් සහ හරකුන් කරත්තයේ බැඳීම සඳහා යොදාගනු ලබන 'බෝම්බුව' හෙවත් හරකාගේ ගෙලමතට සිටිනසේ සකස් කර ඇති කරත්තයේ කොටස යන ද්විත්වාර්ථය දෙන වියගහ යන්නයි. ජේසුස් වහන්සේ අනුව ගමන් කිරීමට කැමති පුද්ගලයකු විසින්

උන්වහන්සේගේ ධර්මය නමැති වියගහට කරදිය යුතුවේ. එම අදහස මතෙව්ගේ ශුභාරංචියේ (1:28) දක්වා තිබේ: "මගේ වියගහ කරට ගෙන මගෙන් ඉගෙන ගන්න". මේ සඳහා යුදෙව් ධර්මාචාර්ය වරුන්ගේ ලේඛනවල යොදා ඇති අහපනත් නමැති වියගහ යන අර්ථය දෙන Ol miswot නමැති වචනයේ 'යුතුකම' යන අර්ථය ගැබ්ව තිබේ.

මෙහි දක්නට ලැබෙන දෙවන පරිවර්තන දෝෂය වන්නේ ස්වාර්ථය අත්හැර දැමීම සඳහා කර ඇති ඉල්ලීමයි. හීබෲ භාෂාවේ ඒ සඳහා යොදා ඇති සම්පූර්ණ ප්‍රකාශයේ නිවැරදි පරිවර්තනය මෙසේ විය යුතුය: "යමෙක් මා අනුව එන්නට කැමැත්තේද ඔහුට තමාගැන මනා අවබෝධයක් තිබිය යුතුය. එමෙන්ම මාගේ වියගහ දැරීමට සූදානම් විය යුතුය".[58]

මෙසේ නිවැරදි කරන ලද පරිවර්තනයේ දැක්වෙන වචන වල සැබෑ අර්ථය ධම්මපදයේ එන ඊට සමාන අර්ථය ගෙන දෙන ගාථාවක ඇතුළත්ව තිබේ.

"පිළිසාම් ලාබල තිස්සුවන් නමින් මෙම බුදු සසුනෙහි මනාව පෙදුණේ වේ නම් (ධර්මයේ විය ගහ දැරුවේ වේ නම්) හෙතෙම වළාවෙන් මිදුණු පුන්සඳ මඬලක් මෙන් ඒකාන්තයෙන්ම මුළු ලොවම බබළවන්නේය."
(ධම්මපදය 25:23)

"යමෙක් මා අනුව එන්නට කැමැත්තේද ඔහුට තමා ගැන මනා අවබෝධයක් තිබිය යුතුය. මාගේ වියගහ දැරීමට සූදානම් විය යුතුය. (ධර්මය මනා කොට පිළිපැදිය යුතුය)"

සඳොස් පරිවර්තනය මඟින් ස්වාර්ථය අත්හැර කුරුසිය දරා ගත යුතුබව අවධාරණය කර තිබීම නිසා ජේසුස් වහන්සේ දේශනා කළ ධර්ම මාර්ගය අනුගමනය කිරීම වනාහී අතිශයින් දුෂ්කරවූත්, නෛෂ්ක්‍රම්‍යයෙන් පිරුණාවූත් අයිතිවාසිකම් සැප සම්පත් ආදිය අත්හැරීමට සිදුවන්නාවූත් අති මානුෂීය කාර්යයක් ලෙස පෙනීයාමට හේතුවිය. ආධ්‍යාත්මික විමුක්තිය සලසා ගැනීමේ වගකීම බහුතරයක් වූ භක්තිමතුන්ට අහිමිකර ඔවුන් කෙරෙහි තම බලය පතුරුවා හැරීම පහසුවන ලෙස පල්ලිය විසින් ස්වාර්ථය අත්හැරීම පිළිබඳ යුතුකම අවධාරණය කරනලදී. බුදුන් වහන්සේ සහ ජේසුස් වහන්සේ විසින් උගන්වා ඇති පරිදි තම ආධ්‍යාත්මික විමුක්තිය සඳහා පෞද්ගලිකව වගකීම බාරගෙන ආත්ම විශ්වාසය මත කටයුතු කරන පුද්ගලයකුට බලය මුල්කරගත් එවැනි පල්ලියකින් පලක් නැත. එවැනි පුද්ගලයින් ජේසුස් වහන්සේගේ කැමැත්තට අනුව කටයුතු කරනබව පිළිගතහොත්

අතිපූජ්‍ය පූජක ධුරාවලිය දෙවියන් වහන්සේගේ මහ පොළොවේ වැඩ වසන නියෝජිතයන් ලෙස පල්ලිය විසින් කර ඇති ස්වයං යුක්ති සාධනය (Self-Justification) ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට සිදුවේ. කෙසේ වෙතත් ජේසුස් වහන්සේ විසින් දේශනාකර ඇත්තේ ඊට සම්පූර්ණයෙන්ම වෙනස් ක්‍රියා පිළිවෙළකි. එනම් පුද්ගලයකුගේ ජීවිතයේ ක්‍රියාකාරකම් සහ චින්තනය පිළිබඳ වගකීම ප්‍රවර්ධනය කිරීම පිණිස බාහිර බලවේගයන් කෙරෙහි විශ්වාසය නොතබා ස්වයං අවබෝධයෙන් යුක්තව කටයුතු කළ යුතු බවය. එහෙත් කුරුසිය දරාගැනීම යනුවෙන් කර ඇති ප්‍රකාශයෙන් ක්‍රිස්තු භක්තිකයන්ගේ සිත්තුළ මැවෙන තමා විසින් කර ගසාගෙන යන දැවැන්ත කුරුසියේ බරින් ඇද වැටෙන්නට යන ජේසුස් වහන්සේ පිළිබඳවූ සංකල්ප රූපයෙන් එවැනි අදහසක් ගම්‍ය නොවේ. කෙනෙකුට ස්වයං අවබෝධයක් ඇති කරගත හැක්කේ ධර්මය නමැති වියගහට කරදීමෙනි. එය ඉවසිය නොහැකි විශාල බරක් නොවේ. නැවත වරක් එම ප්‍රකාශයේ මුල් ස්වරූපය තෝමස්ගේ ශුභාරංචියේ ආරක්ෂා වී තිබේ: "ජේසුස් වහන්සේ මෙසේ කීහ. මා වෙත එන්න. මන්ද මගේ වියගහ කර ගැසීම පහසුය. මගේ නීතිය මෘදුය. එනිසා ඔබට සහනය සලසා ගැනීමට හැකිවනු ඇත." (තෝමස් 90)

ස්වයං අවබෝධය ඇතිකර ගැනීම සඳහා කර ඇති ආයාචනය අතිශයින්ම බුද්ධාගමට ආවේණිකවූ ලක්ෂණයකි. සුප්‍රසිද්ධ සෙන් ගුරුවරයකුවූ ඩෝජන් සෙන්ජි (Dogen Zenji) ගේ ප්‍රකාශයකට අනුව "බුද්ධ ධර්මය අධ්‍යයනය කිරීම යනු තමා පිළිබඳ අධ්‍යයනය කිරීමකි. තමා පිළිබඳ අධ්‍යයනය කිරීම යනු තමා අමතක කරදැමීමකි." අවසානයේදී මමත්වය නැතිකිරීමට හේතුවන ලෝකයේ පැවැත්ම සහ යථා ස්වභාවය පිළිබඳව ස්වයං අවබෝධයක් ඇතිකර ගැනීම බුද්ධාගමේ මූලික පරමාර්ථයකි. එසේ කිරීමෙන් තොරව බුද්ධාගම අවබෝධකර ගැනීම දුෂ්කරය. ඒ බව උදාන වග්ගයේ (23:10-21) පැහැදිලි ලෙස විස්තර කර තිබේ. පේළි 12 කින් යුත් ගාථා දෙකක් උදාන වග්ගයේ මෙම කොටසට අයත්වේ. එහි එක් එක් ගාථාවේ අවසාන පේළි දෙකෙන් මමත්වය ඇතිවන්නේ අස්මිමානය නිසා බව වටහාගත් ඥානවන්ත පුද්ගලයා ප්‍රශංසාවට ලක් කර තිබේ.

ජේසුස් වහන්සේගේ දේශනා වල ඇතුළත් බොහෝ ඉගැන්වීම් වල ස්වයං අවබෝධය පුද්ගලයකු තුළ පැවතිය යුතු මූලික පූර්ව අවශ්‍යතාවයක් බව සඳහන්වේ. උන්වහන්සේ දේශනා කළ උපදෙස් සදාචාරාත්මක චර්යාව සඳහා යොදාගත හැකි බොහෝ අනුශාසනා ලෙස පෙනී ගියත් ආධ්‍යාත්මික ප්‍රවර්ධනයක් ඇතිකර ගැනීම සඳහා එම ඉගැන්වීම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය උන්වහන්සේ

හැමවිටම පෙන්වා දුන්හ. එසේ කිරීමෙන් තොරව පුද්ගලයකුට සදාචාරාත්මක වශයෙන් නිර්මල ජීවිතයක් ගතකළ නොහැකිය. උන්වහන්සේ විසින් 'සෛරාටික' නම හෙළාදැක තිබෙන ආකාරය තේරුම් ගැනීම පිණිස ඔබේ සහෝදරයාගේ ඇසේ තිබෙන ලී පතුර සෙවීමට පෙළඹෙන්නේ කෙසේද? (QS 12) යනුවෙන් කර තිබෙන ප්‍රකාශය සහ හොඳ ගසකින් නරක ඵල හට නොගනී යනුවෙන් අවංකවීම සඳහා කරන ලද ආයාචනය පිළිබඳව සලකා බලන්න.

ජේසුස් වහන්සේ පෙන්වා දුන් ධර්ම මාර්ගය අනුගමනය කිරීම සඳහා පැවතිය යුතු පූර්ව අවශ්‍යතාවයක් ලෙස ස්වයං අවබෝධයක් ඇතිකර ගතයුතු බවට උන්වහන්සේ විසින් කර තිබෙන ආයාචනය පිළිබඳව සියුම් ලෙස කල්පනා කිරීමේදී ස්වයං අවබෝධයේ පදනම වශයෙන් සලකනු ලබන මූලික බෞද්ධ ඉගැන්වීමක් වන සතිය (මනා සිහියෙන් යුක්තවීම) පිළිබඳ අදහස මෙහිදී කැපී පෙනේ. බුදු දහමේ දැක්වෙන පරිදි 'සතිය' වැඩීම යනුවෙන් අදහස් වන්නේ එදිනෙදා ජීවිතයේදී ස්වයංක්‍රීයව සිදුවන ආශ්වාස ප්‍රාශ්වාස කිරීම, ඇවිදීම වැනි ක්‍රියාද ඇතුළු සෑම ක්‍රියාවක් පිළිබඳවම අවබෝධයකින් සිටීමත්, සැබෑ නිරීක්ෂකයකු තුළ පැවතිය යුතු භාවනානුයෝගී ආකල්පයක් ඇතිකර ගැනීමත්ය. බුදුන් වහන්සේ 'සතිය' වැඩීම සඳහා අනුගමනය කළයුතු නිවැරදි ක්‍රියාමාර්ගය පැහැදිලි කරමින් උපදෙස් මාලාවක් දී තිබේ. ඒවා සතිපට්ඨාන සූත්‍රයේ ඇතුළත් වේ. බෞද්ධ භාවනා ක්‍රමයේ පදනම වූ සතිපට්ඨානය මූලික වශයෙන් ථෙරවාදී බෞද්ධ ගුරුකුලය මගින් අද දක්වා පුහුණු කරනු ලැබේ.

සතිපට්ඨාන භාවනාව හොඳින් වැඩීමෙන්, බහුල වශයෙන් පුහුණු කිරීමෙන් නොපැහැදිලි සියලු දේ පැහැදිලි කරගැනීමටත්, අවිඥානකව පවතින සියලු දේ සවිඥානක තත්වයටත්, අප්‍රකට සියලු දේ ප්‍රතිවේධය බවටත් පෙරලා ගත හැකිවේ.

මේ සම්බන්ධයෙන් ජේසුස් වහන්සේ දැරූ බෞද්ධ අදහස් තෝමස්ගේ ශුභාරංචියේ ඇතුළත් වී තිබේ. ඒ බව මීට කලින් උපුටා දක්වන ලද ජේසුස් වහන්සේගේ 'සැහැල්ලු වියගහ' (Gentle Yoke) සහ මෘදු නීති රීති (Mild Rules) පිළිබඳව සඳහන් කර ඇති වාක්‍ය ඛණ්ඩය අවසානයේ දක්වා ඇති "එවිට ඔබට සහනය සලසාගත හැකිවනු ඇත" යනුවෙන් කර තිබෙන ප්‍රකාශයෙන් පැහැදිලි වේ (තෝමස් 90). බාහිර සහ අභ්‍යන්තර වශයෙන් පැවැත්මේ ඇති මායාකාරී (රැවටිලි සහගත) බැමි වලින් මිදීම තරම් සතිපට්ඨාන භාවනාව වැඩීමෙන් ලබාගත හැකි වෙනත් සහනයක් තිබේද? තෝමස්ගේ ශුභාරංචියට අනුව ජේසුස්

වහන්සේ මෙසේ කියා තිබේ: "ඔබ ඉදිරියේ සිටින දෙවියන් පිළිබඳව විමසිල්ලෙන් සිටින්න. මන්ද හෙළි නොවන, සැඟවුන කිසිවක් නොමැති හෙයිනි." ඔක්සිරින්කෝස් (Oxyrhynchos) නමැති ස්ථානයේ තිබී හමුවූ පැපිරස් ලියවිල්ලක එම ප්‍රකාශය තරමක් වෙනස් ආකාරයකට මෙසේ දක්වා තිබේ: "ඔබේ දෘෂ්ටිපථය තුළ ඇති සියල්ල පිළිබඳව විමසිල්ලෙන් සිටින්න." (POxy 654:27-31). ජේසුස් වහන්සේ විසින් දේශනා කර ඇති බෞද්ධ ඉගැන්වීම ප්‍රායෝගිකව නිතර අනුගමනය කරන පුද්ගලයකුට අනාවරණය නොවන සැඟවුන කිසිවක් හෝ එළිදරව් නොවන රහසක් තිබිය නොහැකිය." (QS 35). ඒ සඳහා කළ යුත්තේ ඉතා සුළුවූ හෝ සෑම දෙයකම යථා ස්වභාවය ඇති සැටියෙන් තේරුම් ගැනීම පමණි. සරල ලෙස පෙනීයන එවැනි ක්‍රමවේදයක් අනුගමනය කරන ඕනෑම පුද්ගලයකුට සියල්ල වටහා ගැනීමට හැකිවනු ඇත. එය සතිපට්ඨානය ක්‍රියාවට නැංවීමට වඩා වැඩි යමක් නොවේ.

ඉන්ද්‍රියානු චින්තනය සමඟ කිට්ටු සම්බන්ධතාවයක් පැවති බව පැහැදිලි කරන සම්මා සතිය සහ ස්වයං අවබෝධය ඇතිකර ගැනීම සඳහා අනුගමනය කළයුතු උපදෙස් රාශියක් තෝමස්ගේ ශුභාරංචියේ සඳහන් කර ඇති ජේසුස් වහන්සේගේ දේශනා වල දැක්වේ. බුදුන් වහන්සේ ලොව පහළ වීමටත් පෙර ස්වයං අවබෝධය ඇතිකර ගැනීම ඉන්දියාවේ ඉතා උසස් කොට සලකනු ලැබීය. ස්වයං අවබෝධයක් ඇතිකර ගැනීමේ වැදගත්කම උපනිෂද් ග්‍රන්ථවල පවා සඳහන් කර තිබේ.

බුදුන් වහන්සේ බ්‍රාහ්මණ ආගමේ විශ්වාසවලට විරුද්ධ වූණේ යම්සේද එපරිද්දෙන්ම ආගමික ක්ෂේත්‍රයේ තම බලය පවත්වා ගැනීමේ අටියෙන් සෑම කෙනෙකුටම සැබෑ දැනීම ලබා ගැනීමට ඇති ඉඩකඩ අවුරා ආගම සම්බන්ධ සියලු තනතුරු බදාගෙන කටයුතු කළ ජුඩයිසිස් යනුවෙන් හඳුන්වනු ලැබූ යුදෙව් ධර්මාචාර්යවරුන්ට ජේසුස් වහන්සේ විරෝධය ප්‍රකාශ කළහ. උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කර තිබේ:"පරිසිවරු සහ ධර්මාචාර්ය වරු දැනීමේ යතුරු තමන් වෙත සඟවා තබාගෙන ඇත. එම දැනීමෙන් ඔවුන් ප්‍රයෝජන සලසා ගන්නේවත්, එයින් ප්‍රයෝජන ගැනීමට කැමතිවූවන්ට එසේ කිරීමට ඉඩදෙන්නේවත් නැත. නමුත් ඔබ සර්පයින් මෙන් බුද්ධිමත් වන්න. පරෙවියන් මෙන් අහිංසක වන්න." (තෝමස් 39)

ආගමික ප්‍රතිවේධය යනු කෙනෙක් පෞද්ගලිකව තමන් විසින්ම සත්‍යය අවබෝධකර ගැනීම බවත් ඒ සඳහා පරිශ්‍රමයක් දරන ඕනෑම කෙනෙකුට සත්‍යය අවබෝධකර ගත හැකි බවත් ප්‍රකාශ කිරීම නිසා ජේසුස් වහන්සේ මෙන්ම බුදුන් වහන්සේද බලවත් පූජක පැලැන්තියේ උදහසට ලක්වූහ.

"යමෙක් සැබෑ ලෝකය (ලෝකයේ සැබෑ තත්වය) වටහා නොගෙන ලෝකය අතහැර යන්නේද,එවැනි පුද්ගලයකුගෙන් සැලසෙන සේවය අල්පය. එය ඔහු විසින් පරිශීලනය නොකරන ලද වේද ග්‍රන්ථයක් හෝ අවසන් නොකර අත්හැර දමන ලද කාර්යයක් වැනිය."
(බ්‍රිහාඩ්-අරණ්‍යක-උපනිෂද්)

"ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ: යමෙක් සියල්ල දන්නේ වී නමුත්, තමා පිළිබඳ අවබෝධ කර ගැනීමට අපොහොසත් වේ නම් සියල්ල පිළිබඳව ඇති දැනීම ඔහුට අහිමි වේ." (තෝමස් 67)

ඉහත දක්වන ලද උපනිෂද් ග්‍රන්ථයෙන් උපුටා දක්වන ලද කොටසේ සඳහන් වන 'සැබෑ ලෝකය' යන පදයෙන් ආධ්‍යාත්මික, අන්තර් ලෝකය, ආත්මය යන අර්ථ හැඟවේ. යමෙක් භාවනා කිරීමෙන් සහ ආගමානුකූලව පිළිපැදීමෙන් තමා පිළිබඳව නිවැරදි අවබෝධයක් ඇතිකර ගතහොත් යථාර්ථය තේරුම් ගැනීමටත්, එසේ කිරීමෙන් දෙවියන් හා සර්වසම වීමටත් හැකිවේ. ජොහන්ගේ ශුභාරංචියට අනුව දෙවියන් වහන්සේ හා සමාන වියහැකිය යන උපකල්පනය සාම්ප්‍රදායික ක්‍රිස්තු භක්තිකයින් කුපිත කිරීමට හේතු වූ ආගම් විරෝධී ප්‍රකාශයක් ලෙස සලකන ලද නමුත් එය එසේ විය හැකි බව ජේසුස් වහන්සේගේ ස්ථිර විශ්වාසය විය. ජොහන්ගේ ශුභාරංචියේ සඳහන් කර ඇති පරිදි එකල ජෙරුසලමේදී පවත්වනු ලැබූ කැපකිරීමේ මංගල්‍යයේදී ජේසුස්වහන්සේ විසින් ඉහත කී ඉන්දිය අදහස ප්‍රකාශ කිරීම නිසා දේවාපහාසයක් කරණු ලැබුවේ යැ'යි උන්වහන්සේට චෝදනාවක් එල්ලවිය. ඒ අවස්ථාවේදී උන්වහන්සේ සාම්ප්‍රදායික මතදැරූ යුදෙව්වන්ගේ ගල්පහරින් බේරුණේ මහත් අසීරුවෙනි. ආත්මය සහ බ්‍රහ්මත්වය සමග සහවාසතාවයට පත්විය හැකියයි ප්‍රකාශ කරන ඉන්දියානු අදහස "මාත් මාගේ පියාණන් වහන්සේ යනු එක් කෙනෙකි" (ජොහන් 10:30) යනුවෙන් ජේසුස් වහන්සේ විසින් කර ඇති නිර්භය ප්‍රකාශයේ ඇතුළත් වී තිබේ. එසේ ප්‍රකාශ කිරීමෙන් උන්වහන්සේ බලාපොරොත්තු වූයේ තමන් වහන්සේ දෙවියන්ගේ පුත්‍රයා ලෙස හඳුන්වාදීමට නොව නිවැරදි මාර්ගයේ ගමන් කිරීමෙන් ඕනෑම කෙනෙකුට නියත වශයෙන්ම පරමාත්මය සමග එක්විය හැකිබව පෙන්වාදීමටය. සෑම කෙනෙක්ම දෙවියන් වහන්සේගේ සාමාන්‍යයෝය'යි (God's Equal) ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ බව ශුභාරංචියේ පොත් ලියූ කතුවරයින්ද සඳහන් කර තිබේ. "ඔබ දෙවිවරුයයි කීමි'යි ඔබේ ව්‍යවස්ථාවලියේ ලියා තිබෙනවා නොවේද?" (ජොහන් 10:34) යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රශ්න කළ බව ජොහන්ගේ ශුභාරංචියේ සඳහන් වේ.

එම ප්‍රකාශය කිරීමෙන් පසු උන්වහන්සේට සාම්ප්‍රදායික මත දැරූ යුදෙව්වන්ගේ ගල්පහරින් බේරීම සඳහා ආරක්ෂාව සෙවීමට සිදුවිය.

Q' යනුවෙන් හැඳින්වෙන මූලාශ්‍රයේ ඇතුළත් දේශනාවලින් අපූර්ව කාරණයක් පැහැදිලිවේ. එනම් පසු කාලයේදී ජේසුස් වහන්සේ විසින් දේශනා කරන ලද'යි උන්වහන්සේ වෙත ආරෝපණය කරන ලද ප්‍රකාශවලට වඩා උන්වහන්සේ විසින් කරන ලද සැබෑ දේශනාවල බෞද්ධ පොත් පත්වල සඳහන් කරුණු වලට සමානකමක් දක්වන පැහැදිලිවූත් සිත් ගන්නා සුලුවූත් අදහස් නිතර දක්නට ලැබෙන බවය. එපමණක් නොව සැබෑ ජේසුස් වහන්සේ බෞද්ධ අදහස් ඉගැන්වූහ. ගිහිගෙය අත්හැර තැනින් තැන ඇවිදිමින් ධර්මය දේශනා කළ බෞද්ධ භික්ෂුවකගේ ජීවිතයට සමාන ජීවිතයක් ගතකළහ. බෞද්ධ විමුක්ති මාර්ගය අනුගමනය කරන ලෙස තම ශ්‍රාවකයින්ට අනුශාසනා කළහ.

ජේසුස් වහන්සේ එළිදරව්ව පිළිබඳ දිවැසිවරයකු* බවට පත්කිරීම

ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින්ගෙන් වෙන් වී ගොස් බොහෝ කාලයකට පසු උන්වහන්සේගේ ශ්‍රාවකයින් Q මූලාශ්‍රයේ දෙවෙනි ස්ථරයේ ඇතුළත් දේශනා (Sayings) එක්තැන් කොට සංග්‍රහයක් ලෙස සකස් කරන ලදී. යුදෙව් යුද්ධය ඇතිවූ කාලය වනතෙක් (ක්‍රි. ව. 66-73) ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් Q යනුවෙන් හඳුන්වා ඇති මූලාශ්‍රය තම ශාස්තෘවරයාගේ දේශනා ඇතුළත් ශුභාරංචියේ එකම ලියවිල්ල ලෙස සලකා එය ආරක්ෂාකර ගත්හ. ජේසුස් වහන්සේ යනු සාම්ප්‍රදායික බැඳීම්වලින් තොරවූ, විමුක්තිය අපේක්ෂාවෙන් සිටි දුක් විඳින ජනතාව කෙරෙහි පැතිර ගිය අනුකම්පාවෙන් කටයුතු කළ දූරදර්ශී දාර්ශනික ශාස්තෘවරයකු වූහ. එහෙත් ඉතා සුළු පිරිසක්ව සිටි උන්වහන්සේගේ අනුගාමිකයින් ජුදා සහ ගැලීලී අතර පිහිටි ප්‍රදේශය පුරා විසිර සිටියහ. යුද්ධය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී පීඩාකාරී තත්වය උග්‍රවීම නිසා ඔවුන්ගේ ආගමික ව්‍යාපාරයට මහජනතාව එතරම් ප්‍රතිචාරයක් දැක්වූයේ නැත. එනිසා තමන් අයත්වූ ආගමික කණ්ඩායමේ සහ තම ශාස්තෘවරයාගේ ඉගැන්වීම් වල ආරක්ෂාව පැතීමට ඔවුන්ට සිදුවිය.

එම කාල පරිච්ඡේදය තුළ පැවති ආගමික සහ දේශපාලන

* දෙවියන් වහන්සේ විසින් එළිදරව් කරන ලද පණිවිඩයක් ලොවට ප්‍රකාශ කරන තැනැත්තා

සංවිධාන සහ ඇතිවූ සිදුවීම පිළිබඳ තොරතුරු සැඟෙන ප්‍රමාණයක් ෆ්ලේවියස් ජෝසෆස්ගේ වාර්තාවල ඇතුළත් වී තිබේ. උදාහරණයක් වශයෙන් ජනතාව කුපිත කරවන ආකාරයේ කථා පවත්වමින් ඔවුන් කැරලි ගැසීමට පොළඹවමින් ක්‍රියාකළා පමණක් නොව තමන් දේවාශීර්වාදය ලැබූ පුද්ගලයින් ලෙස මවා පෙන්වූ වංචාකාරී පුද්ගලයින් කොටසක් එකල විසූ බව ජෝසෆස් තම වාර්තාවල සඳහන් කර තිබේ.” නොහික්මුණු ජනකොටස් පොළඹවා ගැනීමට ඔවුන්ට හැකිවිය. තමන් ගැලවුම්කාරයින් ලෙස සලකා ගෞරව කරනු ලැබූ අනුගාමිකයින් පිරිසක් ඇති කර ගැනීමටද ඔවුහු සමත්වූහ. ඔවුහු මිනිසුන් පාළුකරයට කැඳවාගෙන ගොස් කුපිත කරවූහ. විදේශ ආධිපත්‍යයෙන් මුදවාගත හැකිබව පෙන්නුම් කරන ප්‍රාතිහාර්ය සලකුණු (Miraculous Signs) පෙන්නුම් කළහ. ඉතිහාසයේ ඉන් පෙර යුගවලදී සිදුවූ පරිදි නැවත වරක් විශාල පිරිසක් සමග කාන්තාරයට පලායෑමට ඔවුන්ට අවශ්‍යවූ බව පෙනේ. මෙසේ තමන් දිවැසිවරුන් යයි කියාගත් පුද්ගලයින් දස දෙසින් පැමිණියහ. ත්‍රස්තවාදයේ 'කඩිගුල' යනුවෙන් හැඳින්වූ ගේලියෙන්ද, ජුදා දේශයෙන්ද, මහජන අප්‍රසාදයට පත්ව සිටි සමරිටන්වරු ජීවත්වූ ප්‍රදේශවලින්ද, පීඩිත ජනතාව කෙරෙහි බලපෑමක් ඇති කිරීමට සමත්වූ අදහස් ශීඝ්‍රයෙන් පැතිරගිය ඊජිප්තුවෙන්ද එවැනි දිවැසිවරු පැමිණියහ. ගරිල්ලා කණ්ඩායමක නායකයකු වූ ප්‍රාතිහාර්ය පෑ හැකි පුද්ගලයකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටි තමා දිවැසිවරයකු බව කියාගත් පුද්ගලයකු එකල වාසය කළ බව ජෝසෆස් සඳහන් කර තිබේ. ඔහු එම ඉන්ද්‍රජාල ඉගෙන ගත්තේ ඊජිප්තුවේදී තම පියාගෙන් බවත් එහි තවදුරටත් සඳහන්කර තිබේ.

එවැනි දිවැසිවරු මිනීමරු කල්ලිවල පවා නායකත්වය දැරූබව රෝමන්වරු කල්පනා කළහ. බයිබලයේ 'ක්‍රියා' යනුවෙන් හඳුන්වන පොතේ සඳහන් කර ඇති පරිදි පාවුළු තුමා අත්අඩංගුවට ගත් අවස්ථාවේදී සේනාධිනායක තුමා ඔහු සිකේරියානු (Sicarian) ත්‍රස්ත කල්ලියේ මිසර ජාතික නායකයා බවට සැක පහළ කළේය. තිනිසිකරුවන් ලෙස හඳුන්වනු ලැබූ "සිකේරියන්වරු" යනු ආගමික මාර්ගය අතහැර දමා අවි ආයුධ ගත් සෙලට් (Zealots) නමින් හඳුන්වනු ලැබූ ත්‍රස්තවාදී කල්ලියට අයත් වඩාත් අපකීර්තියට පාත්‍රව සිටි කැරලිකාර කණ්ඩායමක් විය. ඔවුහු පර්සිවරු අතර සිටි කපටි පාතාල කල්ලියක් වූහ. ද්වේෂයෙන් පිරිගිය මූලධර්මවාදීන් වූ සෙලට්වරු තම විරුද්ධවාදීන් සමග නිතර සටනට සූදානම්ව සිටියහ. ඒ අතින් ඔවුන් දෙවෙනි වූයේ තමන් ඇඳ සිටි ලෝගුව තුළ නිරතුරුවම ආයුධ සඟවා තබාගෙන අවස්ථාවක් ලද නැමවිටම තම දේශපාලන විරුද්ධවාදීන් විනාශ කර දැමූ සිකේරියන්

වරුන්ට පමණි. සේනාධිනායකයා විසින් පාවුළු තුමා සිරභාරයට ගන්නා ලද්දේ ඔහු මිසර ජාතික ත්‍රස්තවාදී කණ්ඩායමක නායකයා ලෙස වරදවා තේරුම් ගැනීම නිසාය. එම මිසර ජාතිකයාට තිස් දහසකට නොඅඩු අනුගාමිකයින් පිරිසක් සිටිය බවත් එම අනුගාමිකයින් සමග ඔහු පළමුව පාළුකරයටත්, අනතුරුව ඔලීව කන්දටත් පිටත්ව ගිය බව ජෝසෆස් සඳහන් කර තිබේ.[38]

එතැන් සිට ඔහු තීරණාත්මක සටනක් මෙහෙයවා ජෙරුසලම යටත්කර ගැනීමට සැලසුම් කළේය. බයිබලයේ පැරණි තෙස්තමේන්තුවේ ඇතුළත් 'ජෝෂුවා' නමැති පොතේ සඳහන්වන 'ජෝෂුවා' නමැති කීර්තිමත් යුධ සේනාධිපතියා විසින් අතීතයේදී කළ පරිදි මෙම මිසර ජාතික ත්‍රස්තවාදී නායකයා 'ජෝෂුවා' නමින් පෙනී සිටිමින් මිනිසුන්ගේ අයිතිවාසිකම් දිනාගැනීම සඳහා සටන් කිරීමට ඉදිරිපත් විය. පරණ තෙස්තමේන්තුවේ සඳහන්වන පරිදි ජෝෂුවාගේ හමුදාව බැටළු අං හොරණෑ පිඹිමින් කිසිම බාධාවකින් තොරව ජේරිකෝ නුවරට කඩා වැදුණේ යම්සේද එපරිද්දෙන් තම අනසක යටතේ ජෙරුසලමේ පවුරු බිඳ දැමිය හැකිවේය'යි ඔහු කල්පනා කළේය. නමුත් ඔහු සැලසුම් කළ කිසිවක් සාර්ථක නොවීය. ෆීලික්ස් නැමති රෝම ආණ්ඩුකාරයා විසින් ත්‍රස්තවාදී මිසර හමුදාව සමූල ඝාතනය කරන ලදී.

තවත් එවැනි දිවැසිවරයෙක් පැරණි තෙස්තමේන්තුවේ සඳහන්වන පරිදි අතීතයේදී ජෝෂුවාගේ නායකත්වය යටතේ ඉශ්‍රායල් ජාතිකයින් ගිවිසුම් කරඬුව* (Arc of the Covenant) රැගෙන පාද තෙත් නොවන සේ ජෝර්දාන් ගඟ හරහා ගමන් කළ පරිදි (ජෝෂුවා 3:1-17) ගඟ බෙදා වෙන්කර දෙන බවට පොරොන්දු වෙමින් ජෝර්දාන් ගංගා මිටියාවතේ සැරිසැරුවේය. ජෝර්දානයේ විසූ කීර්තිමත් දිවැසිවරයකුවූ ස්නාපක ජොහාන්ට මුහුණ පෑමට සිදුවූ පරිදි මෙම දිවැසිවරයාද අත්අඩංගුවට ගෙන රෝමයේ සිරගෙදරට යවන ලදී. අවසානයේදී ඔහුගේ හිස ගසා දමා මරණයට පත් කරනු ලැබිය.[39]

එය අතිශයින්ම බිහිසුණු කාල පරිච්ඡේදයක් විය. බොහෝ කැරලි කෝලාහල නිතර සිදුවිය. පාලක පක්ෂය විසින් එම කැරලි කෝලාහල නිර්දය ලෙස මැඩ පැවැත්වීම සුලභ සිදුවීමක් විය. ජනතාව පොළඹවමින් කටයුතු කළ දිවැසිවරු බොහෝ දෙනෙක් පුරාණෝක්ති කථාවල සඳහන් ඊශ්‍රායල් ජාතිකයින් විසින් විමුක්තියේ සංකේතය ලෙස සලකනු ලැබූ කනාන් දේශයට විරුද්ධව සටන් මෙහෙයවනු ලැබූ ජෝෂුවා බෙන් නන් (Joshua ben Nun) නමැති වීරචරිතයේ ප්‍රතිරූපය මිනිසුන්ට සිහිපත්

* දෙවියන් වහන්සේ දුන් දස පනත කොටු ගල් පුවරු තැන්පත් කර ඇති රන් ආලේප කරන ලද කරඬුව හෙවත් පෙට්ටිය

කිරීමට සමත්විය. 'ජොෂුවා' නමැති නාමේ ග්‍රීක් පරිවර්තනය ජේසුස් නම් වේ. 'ජා' (Jah) යන්නෙන් විමුක්තිය යන අර්ථය ගෙනදේ[69]. 'ජොෂුවා' යන නම තම රට විදේශ ආධිපත්‍යයෙන් මුදවාගත හැකි පුද්ගලයකුගේ මූලාදර්ශය ලෙස යුදෙව් ජාතිකයින්ගේ මතකයේ රැඳී තිබුණි. පුනර්භවය විශ්වාස කරනු ලැබූ හෙලනිසියානු සංස්කෘතික පසුබිම යටතේ වරින් වර බිහිවූ උසස් පෞරුෂයකින් හෙබි මහා පුරුෂයින් දෙවියන් වහන්සේ විසින් තෝරාගත් පුද්ගලයින්ගේ ආත්මය නැවත පහළවීමක් ලෙස විශ්වාස කිරීමට මිනිසුන් පෙළඹුනහ. එවැනි නායකයින්, වචනයේ සැබෑ අර්ථයෙන්ම ජොෂුවාගේ අවතාරය හෙවත් නැවත පහළවීමක් ලෙස ඔවුන්ගේ අනුගාමිකයෝ විශ්වාස කළහ. ඒ නිසා 'ජේසුස්' නමැති නාමපදය එකල පුද්ගලයකු හැඳින්වීම සඳහා භාවිතා කළ වචනයකට වඩා දිව්‍යානුභාවයෙන් පහළවූ විමුක්තිදායකයකු හැඳින්වීම සඳහා යොදාගන්නා ලද 'ගුණවාචී' පදයක් හෝ 'පදවි නාමයක්' බව පෙනේ. ඒ නිසා 'ජේසුස්' යනු ජේසුස් වහන්සේගේ සැබෑ නමද, නො එසේ නම් එම නාමය උන්වහන්සේට තම ශ්‍රාවකයින් විසින් ආරෝපණය කරන ලද්දක්ද යන සැකය අප තුළ ඇතිවේ. සමහරවිට යුදෙව් යුද්ධ පැවති කාලයේදී නැවත උපන් ජොෂුවා/ජේසුස්වරු බහුලව සිටි සමයකදී එය බොහෝ දුරට සිදුවීමට ඉඩතිබේ. කෙසේ වෙතත්, ක්‍රිස්තියානි ආගමේ සඳහන් විමුක්තිදායකයාණන් වූ ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයට හානියක් නොවන පරිදි දේව ධර්මවේදීන් විසින් මෙම කාරණය සැලකිල්ලට ගෙන තිබෙන්නේ ප්‍රධාන මාතෘකාවක් ලෙස නොව ප්‍රධාන මාතෘකාවකට එකතු කරන ලද පාදක සටහනක් (Foot note) වශයෙනි.

Q^2 සහ Q^1 මූලාශ්‍රවල සඳහන්වන ජේසුස් වහන්සේ පිළිබඳ තොරතුරු සහ ශුභාරංචියේ පොත්වල ඇතුළත් අනෙකුත් සියලුම කරුණු යුදෙව් යුද්ධය පැවති සමයේ බිහිවූ ගැලවුම්කරුවකුගේ පැමිණීම පිළිබඳ අපේක්ෂාවෙන් පිරීගිය සංකේතවත් රාමුවට මැනවින් ගැළපෙන බව පෙනේ. ඉහත කී ශුභාරංචියේ පොත්වල ජේසුස් වහන්සේ පවා එවැනි ව්‍යාජ දිවැසිවරුන් මෙන් ක්‍රියා කර ඇති අවස්ථා පැහැදිලි කරණ කථා වස්තු ඇතුළත් කර තිබේ. මතෙව්ගේ ශුභාරංචියේ සඳහන් වන පරිදි උන්වහන්සේ සෙනග පාළුකරයට ගෙන ගොස් (මතෙව් 15:33) පරණ තෙස්තමේන්තුවේ සඳහන් පූර්වාදර්ශයන් සිහිපත් කරමින් උන්වහන්සේ තුළ දිව්‍යමය බලමහිමයක් පවතින බව පෙන්නුම් කළහ. ප්‍රාතිහාර්ය බලයෙන් දෙව්ලොවින් ආහාර ලැබෙන බව පෙන්නුම් කිරීම සඳහා කෑමට තිබූ රොටි ප්‍රමාණය වැඩිකර ගත්හ. වෙනත් ජේසුස්වරු මෙන්ම නව තෙස්තමේන්තුවේ එන ජේසුස් වහන්සේද ජෙරුසලමට ආසන්නව පිහිටි ඔලිව කන්දට ගොස් තම ශ්‍රාවකයන්ට ලෝක විනාශය පිළිබඳ

පෙර ලකුණු දේශනා කළහ. (මතෙව් 24: 3-36)

මෙහිදී ජේසුස් වහන්සේ පිළිබඳව පවතින සම්ප්‍රදායික කථා ප්‍රවෘත්ති කොතරම් දුරට ඓතිහාසික වශයෙන් විශ්වසනීය තත්වයක පවතීද යන ප්‍රශ්නය නැගිය යුතුවේ. Q මූලාශ්‍රයේ ඇතුළත් ඉගැන්වීම පිළිපදිනු ලැබූ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් තම ශාස්තෘවරයා වෙනත් කැරලිකාර දිවැසි වරුන්ගෙන් වෙන්කර දැක්වීම සඳහා උන්වහන්සේ 'ජේසුස්' යනුවෙන් හඳුන්වනු ලැබුවේද? එය සත්‍යයක් ලෙස පිළිගතහොත් උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයට ඉන් විශාල හානියක් සිදුවේ. එනම් උන්වහන්සේද හුදෙක් ලෝක විනාශය අත ළඟට පැමිණ තිබෙන බවත්, අවසානයේදී ඊශ්‍රායලය පමණක් විදේශීය ආධිපත්‍යයෙන් මුදවාගත හැකිය යන විශ්වාසයෙන් පොළඹවනු ලැබූ වෙනත් කාල්පනික දෘෂ්ටිවාදියකුගේ ගණයට වැටීමය. එවැනි චිත්‍රයක් Q මූලාශ්‍රයේ දැක්වෙන අනුකම්පාවෙන් හා දයාවෙන් පිරුණු සැබෑ සාමවාදියකු වූ ජේසුස් වහන්සේගේ චරිතයට නොගැළපේ. Q මූලාශ්‍රයේ ඉගැන්වීම් පිළිපදිනු ලැබූ පුද්ගලයින් ඔවුන්ගේ ආගමික ව්‍යාපාරය ඉදිරියට ගෙනයාමේ බලාපොරොත්තුවෙන් ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් යුගයේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි වෙනස් කළ බව අපට සිතිය හැකිය. ජේසුස් වහන්සේ විසින් සමහර නගර සහ ජන කොටස් සම්පූර්ණයෙන්ම විනාශකර දමන බවට තර්ජනාත්මක ලෙස තරවටු කළ බව සඳහන් කර තිබෙන්නේ ඒ නිසා විය හැකිය. මෙසේ Q^1 යනුවෙන් හැඳින්වෙන ලියවිල්ලේ සහ කන්දඋඩ දේශනාවේ අන්තර්ගත ඉගැන්වීම් වලට සම්පූර්ණයෙන්ම පටහැනි කලහකාරී ජේසුස් කෙනෙකු ඔවුහු නිර්මාණය කළහ. අතීතයටත් බලපාන ආකාරයට ඊට වසර ගණනාවකට පෙර ඊශ්‍රායලයේ ජීවත්වූ ධාර්මික පුද්ගලයින්ගේ අවසාන ජයග්‍රහණය සහතික කරනු ලැබුවාවූත්, එමෙන්ම තෝරාගත් පුද්ගලයින් පිරිසකගේ පමණක් අවසානය තීන්දු කරනු ලබන්නාවූත්, ශ්‍රේෂ්ඨතමවූත්, එකම දිවැසිවරයා ලෙස ජේසුස් වහන්සේගේ චරිතය නිරූපණය කිරීම ඔවුන්ගේ අපේක්ෂාව විය.

Q^1 මූලාශ්‍රයේ සිට Q^2 මූලාශ්‍රය දක්වා මාරු වීමේදී සංචාරක ශ්‍රාවකයින්ගෙන් සමන්විතවූ ජේසුස් වහන්සේ පිළිබඳවූ මුල් ආගමික ව්‍යාපාරය මෙසේ එළිදරව්ව පිළිබඳ ආගමික නිකායක් බවට පරිවර්තනය වූ බව පෙනේ. තම ආගමික ව්‍යාපාරය අසාර්ථක වීම නිසා ඉච්ඡාභංගත්වයට පත්වූ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෝ ක්‍රම ක්‍රමයෙන් සංචාරක දිවැසිවරුන් බවට පරිවර්තනය වූහ. ඒ බව ඔවුන්ගේ ශුද්ධ ග්‍රන්ථවල සිදුකර ඇති ඊට අනුරූපී වෙනස්කම් වලින් පැහැදිලි වේ. කෙසේ වෙතත් ඔවුන්ගේ පරමාර්ථය වූයේ වෙනත් උදෝෂිමත් ජනකාන්ත නායකයින් මෙන් දේශපාලන ආධිපත්‍යය ලබා ගැනීම නොව

තමන් විශ්වාස කළ පරිදි දෙවියන්ගේ පුත්‍රයන් ලෙස සලකනු ලැබූ සමාජයේ වරප්‍රසාද නොලත් පුද්ගල කණ්ඩායම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමය. භයානක යුද්ධයක් ඉක්මනින් සිදුවීමේ පෙර නිමිති පහළවීම නිසා දෙවියන්ගේ පාලනයක් වහා බිහිවනු ඇතැයි විශ්වාස කළ ඔවුහු ඒ සඳහා දෙවියන් වහන්සේගේ දරුවන් ඒකරාශී කර පෙළගැස්වීම සඳහා බලවත් පරිශ්‍රමයක යෙදුනහ. එම ක්‍රියාවලිය හේතුකොට ගෙන ජේසුස් වහන්සේගේ මුල් ඉගැන්වීම් පසු පසට තල්ලු වී යාමටත් ක්‍රිස්තියානිය නමින් අලුත් ආගමක් බිහිවීමටත් පටන් ගත්තේය.

වෙනත් දිවැසිවරුන් මෙන් ජේසුස් වහන්සේ විසින්ද සෙනඟ පාළුකරයට ගෙන ගොස් ආහාර සඳහා ඔවුන්ට රොටි සපයාදීම සහ දිය මත ඇවිදීම පිළිබඳවූ ප්‍රාතිහාර්ය ජනක කථා ප්‍රවෘත්ති මෙම අදහස පැහැදිලි කරදීම සඳහා ඉදිරිපත් කළ හැකි එක් උදාහරණයකි. මේ කථාවස්තු දෙකම බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන කථා ප්‍රවෘත්ති වලින් ණයට ගෙන ඇති බව අපි මීට කලින් දුටුවෙමු. එනිසා එම කථා ප්‍රවෘත්ති පලස්තීනයේ සිදුවූ සැබෑ සිදුවීම් වලට සම්බන්ධ නැත. ඒවා ඉන්දියානු මූලාශ්‍ර වලින් ලබාගෙන ජේසුස් වහන්සේගේ චරිත කථාවට එකතු කරනලද සාහිත්‍යමය කථා ප්‍රවෘත්ති වේ. එම කථා ප්‍රවෘත්ති එකල සමාජය විසින් විශ්වාස කරනු ලැබූ නව ජොෂුවා දිවැසිවරුන්ගේ ඉගැන්වීම් සමඟ හොඳින් ගැළපේ.

මෙසේ දැඩි මතධාරී ආගමික නායකයකුගේ අවශ්‍යතාවයක් පැවති සමාජයකට ගැළපෙන පරිදි ශ්‍රේෂ්ඨ බෞද්ධ ශාස්තෘවරයකු වූ ජේසුස් වහන්සේගේ චරිත කථාව නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භවිය. අප මුලදී දුටු ජේසුස් වහන්සේ තම සතුරන්ටත් ප්‍රේමකරන ලෙස දේශනා කළ සේක. නමුත් මෙම අලුත් ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් නොපිළිගත් නගරවලට විරුද්ධව වියරු වැටී කෝපයෙන් මොරදුන්හ. දේව විනිශ්චය දිනයේදී අනෙක් නගරවලට වඩා සොදොම් (Sodom) රටට පමණක් සහනශීලී දඬුවමක් ලැබෙන්නේයයි ප්‍රකාශ කළහ. (QS 21)

සැබෑ ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ට කාරුණික වන ලෙසත් අනුන් විනිශ්චය කිරීමෙන් වැළකී සිටින ලෙසත් දේශනා කළහ. නමුත් අලුතින් නිර්මාණය කරන ලද ජේසුස් වහන්සේ කෝපයෙන් මොරදුන්හ. 'එම්බා කපර්නවුම, ඔබ ස්වර්ගය උසට ප්‍රශංසා කරනු ලබන්නේයයි සිතන්නෙහුද? නැත, ඔබ පාතාලය දක්වා පහත හෙළනු ලබන්නේය'යි (QS 22) කපර්නවුම් හී වැසියන්ට නිර්දය ලෙස තරවටු කළහ. (QS 22)

පුද්ගලයකුගේ උරුමය පිළිබඳ විනිශ්චය කිරීම ප්‍රතික්ෂේප කළ

සැබෑ ජේසුස් වහන්සේ (QS 38) මේ අවස්ථාව වනවිට 'එක් පරම්පරාවක්' හෙළා දකිනු ලැබූ නායකයකු බවට පරිවර්තනය කර තිබුණි. උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළබව සඳහන් වේ: "බලවත් පුද්ගලයෙක් තම මාලිගය ආරක්ෂා කරයි. ඔහුගේ වස්තුව ආරක්ෂා සහිතය. නමුත් ඊට වඩා බලවත් පුද්ගලයෙක් පැමිණ ඔහුට පහරදී ඔහු යටපත් කරයි. ඊට පසු වඩා බලවත් පුද්ගලයා ඔහුගේ වස්තුව කොල්ලකන්නේය". (QS 28)

මෙහිදී සිදුවී තිබෙන්නේ කුමක්ද? අප කලින් දුටු පරිදි (QS 20) ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා උන්වහන්සේගේ ශ්‍රාවකයන් ඈත ගම් දනව් වලට පිටත් කර යැවූහ. බොහෝ අවස්ථාවලදී මහජනතාව ඔවුන් ප්‍රතික්ෂේප කර පලවා හරිනු ලැබූහ. එසේ වන්නට ඇත්තේ දුෂ්කර කාල වලදී තවත් එක් ආගමික කණ්ඩායමක් මගින් විමුක්තිය දේශනා කරනු ලැබීමෙන් ඔවුන් මහත්සේ වෙහෙසට පත්ව සිටි නිසා වන්නට පුළුවන. රෝමන් පාලනය යටතේ දැඩි ලෙස පීඩනයට ලක්ව සිටි අවධියක තම සතුරාට ප්‍රේම කළ හැක්කේ කාටද? මෙසේ තම ඉගැන්වීම් කෙරෙහි එතරම් මහජන ආකර්ෂණයක් නො මැතිවීම ගැන Q සාමාජිකයන් පසුතැවිලි වූහ. ගලීලයේ සහ ජෙරුසලමේ සෙනඟ තමන් වහන්සේගේ අනුශාසනාව පරිදි මනස්තාපනය නොවීම ගැන ජේසුස් වහන්සේ පවා පසුතැවිලි වූ බව ශුභාරංචියේ සඳහන් වේ. (මතෙව් 11:20-24, 23:37-39, ලූක් 19:41-44) ජේසුස් වහන්සේ වැනි බලවත් පෞරුෂයකින් හෙබි පුද්ගලයකුගේ සහයෝගය නොමැතිවීම නිසා ඉච්ඡාභංගත්වයට පත්වූ උන්වහන්සේගේ ශ්‍රාවකයින් තම ආගමික පණිවිඩය ප්‍රචාරය කිරීම සඳහා අලුත් තත්වයට සහ යුගයේ අවශ්‍යතාවයට ගැළපෙන අලුත් මාර්ග සෙවූහ. සමාජ විද්‍යාත්මක සහ මනෝ විද්‍යාත්මක පර්යේෂණ වලින් පෙන්වාදී තිබෙන අපූරු සිසියම් ආගමික කණ්ඩායමක පැවැත්ම කෙරෙහි බලපාන කරුණු පිළිබඳවත්, එකී කණ්ඩායම් මගින් අපේක්ෂිත පරමාර්ථය සාධනය කරගැනීමට අපොහොසත් වීමෙන් ඊට අයත් සාමාජිකයින්ට මුහුණ පෑමට සිදුවන ඉරණම පිළිබඳවත් අපි දනිමු. එවිට තම විශ්වාසය පිළිබඳව කැලඹීමට පත්වනු වෙනුවට මිනිසුන් පෙර නොවූ අන්දමේ දැඩි උද්යෝගයකින් යුක්තව අලුත් ක්‍රමවේදයන් මගින් තම විශ්වාසය තහවුරු කිරීමට මහත් උත්සාහයක් දරනු ලැබේ."

Q අනුගාමිකයින් මුහුණ පෑ තත්වය මෙයයි. ඔවුන්ට නැවත වරක් ඊට අවුරුදු 30 කට පමණ පෙර පෙරළිකාරී ඉගැන්වීම් මගින් නිවැරදි මාර්ගය පෙන්වාදුන් තම ජනකාන්ත ශාස්තෘවරයා සිහිවිය. ඔවුහු තමන් මුහුණ පා සිටි බලාපොරොත්තු කඩවූ තත්වයෙන් මිදීමට හැකි හැම දෙයක්ම කළහ. ඒ අනුව ජේසුස් වහන්සේ දෙවියන් විශ්වාස නො කරන පරම්පරාව දැඩි විනිශ්චයට භාජනය කරන බවත්, බලවත් සතුරකුට එරෙහිව යුදෙව්

ජාතිකයින් අවසාන සටනක් මෙහෙයවන බවත්, එනම් රෝමවරුන්ට විරුද්ධව භයානක යුද්ධයක් සිදුවන බවත් ප්‍රකාශ කළ දිවැසිවරයකු ලෙස හඳුන්වා දෙමින් තම ශාස්තෘවරයා පිළිබඳ මිථ්‍යා කථා ප්‍රවෘත්ති ගොඩ නැඟූහ. එහෙත් එවැනි දිවැසිවරයකු ජෝර්දානයේ කිසි කලෙක ජීවත් නොවීය. කෙසේ වෙතත් අනෙක් සියලුම දිවැසිවරුන්ට වඩා උන් වහන්සේ බලසම්පන්න පුද්ගලයකු ලෙස හුවා දැක්වීම ඔවුන්ගේ අරමුණ විය. පැරණි තෙස්තමේන්තුවේ සඳහන් කර තිබූ ගැලවුම්කාරයා පහළ වූයේ මේ ආකාරයටය. මෙම මිථ්‍යා ප්‍රබන්ධය නිර්මාණය කළ පුද්ගලයින්ද ඔවුන්ගේ සැනසීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළහ. දෙවියන්ගේ පුත්‍රයා අනුගමනය කරන ධාර්මික පුද්ගලයින් අවසානයේදී මරණයෙන් උත්ථානව් දෙවියන් වහන්සේ සමඟ එක්වන්නේය.

ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ මිථ්‍යාව ගොඩනගමින් පොතපත ලියූ මුල් යුගයේ ලේඛකයින්ද නිසැකවම Q අනුගාමිකයින් මුහුණ පෑ බලාපොරොත්තු සුන්වූ තත්වයට පත්වන්නට ඇත. ඔවුන්ට අවශ්‍ය වූයේ ජේසුස් වහන්සේගේ පණිවිඩය ව්‍යාප්ත කිරීමට නොව තමන්ගේ අදහස් විශ්‍යාව පිළිනොගැනීම නිසා ඔවුන් තුළ ඇතිවූ වෛරය පිටකර හැරීමය. බයිබලයේ 'ක්‍රියා' නමින් හැඳින්වෙන පොතේ (ක්‍රියා 6-7) දැක්වෙන ප්‍රථම ක්‍රිස්තියානි මෘතවීරයා* ලෙස සැලකෙන ස්තෙපන් (Stephen) අපෝස්තුලුවරයා විසින් කර ඇති දීර්ඝ ප්‍රකාශයෙන් ඒ බව පැහැදිලි වේ. දෙවියන්ගේ අපේක්ෂාවන්ට පිටුපා ක්‍රියා කරන යුදෙව් ජාතිකයන්ට අවලාද නගමින් ස්තෙපන් තම කාලයෙන් වැඩි කොටසක් ගත කරයි. එහිදී ජේසුස් වහන්සේ ගැන සඳහන් කර තිබෙන්නේ එම දීර්ඝ විස්තරයේ අවසාන වාක්‍ය දෙකක පමණි. වෙනත් දිවැසිවරුන් මෙන් ජේසුස් වහන්සේද වරදවා තේරුම් ගෙන මරණයට පත්කළ බව එහි සඳහන් කර තිබේ. මනුෂ්‍ය පුත්‍රයාණන් ඔහුට හදිසියේ දර්ශනය වන අවස්ථාව දක්වා ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් ස්තෙපන්ට කීමට තිබුණේ එපමණකි. එයද ඔහු බයිබලයේ දානියෙල්ගේ පොතෙන් ගත් අදහසක් බව පෙනේ.[42]

ජේසුස් වහන්සේ පහළවීමෙන් පසු උන්වහන්සේගේ මුල් දේශනා එකතුකර Q^1 වශයෙන් හඳුන්වා ඇති සංග්‍රහයක් අනතුරුව මිථ්‍යාකථා ප්‍රවෘත්තිද ඇතුළත් උන්වහන්සේගේ මුල් ජීවන චරිතය පිළිබඳ තොරතුරුත් ලියා තිබුණි. එසේ නම් Q^1 සිට Q^2 ලියන ලද කාලය සලකා බැලීමේදී සාපේක්ෂ වශයෙන් මෙතරම් කෙටි කාලයක් තුළදී උන්වහන්සේගේ ජීවන චරිතය පිළිබඳ තොරතුරු වල සැලකිය යුතු වෙනස්කම් සිදුකළ

* භක්තිය හෝ ප්‍රතිපත්තිය නිසා දිවි පුදන්නා

හැකිද යන ප්‍රශ්නය පැනනගී. ඓතිහාසික වශයෙන් වැදගත් පුද්ගලයින් පිළිබඳ ජනප්‍රවාද කෙතරම් වේගයකින් ගොඩ නැඟෙනවාද යන්න අපි අත්දැකීමෙන් දනිමු. ඊට එක් උදාහරණයක් ලෙස තෝමස් බෙකට්ගේ චරිත කථාව ඉදිරිපත් කළ හැකිය. 1170 වර්ෂයේ දෙසැම්බර් 29 දින ඔහු ජීවිතක්ෂයට පත්කළ අවස්ථාවේදී ඔහුගේ මිනීවළ වටකරගෙන ලෙඩ සුව කිරීමේ ලබ්ධියක් ගොඩ නැඟුණි. 1173 පෙබරවාරි 21 වනදා ඔහුගේ නම මුනිවරයින්ගේ නාමාවලියට පවා ඇතුළත් කරන ලදී. ඔහු විසින් මළවුන් නැගිටුවනු ලැබූ ආකාරයත්, සැරයටියේ මිටින් ඔබා පොළොවෙන් උඩට වතුර විදින්නට සැලැස්වූ බවත්, ඔහු මුහුණ පෑ බිහිසුණු මරණය පිළිබඳවත්, ඊට කලින් අනාවැකි පළකර තිබූ බවත් ජනප්‍රවාදයට එක්වූ කථා අතර විය.[43]

විවිධ මතවාද බිහිවන කලබලකාරී කාලපරිච්ඡේද වලදී මිනිසුන් විවිධ ආගම් වලට හරවා ගැනීම වඩාත් පහසුය. අර්බුදකාරී අවස්ථාවලදී විවිධ ආගමික නිකායන් බිහිවීම සාමාන්‍ය ලක්ෂණයකි. ජේසුස් වහන්සේගේ ධර්මය ප්‍රචාරය කළ පිරිස පැරණි ගුහාරංචියේ ඇතුළත් දේශනාවලට අලුත් කථා ප්‍රවෘත්ති ඈඳූල් කළහ. ඔවුන්ගේ ආගමික ප්‍රචාරක කටයුතු වලට බාධා කළ සමාජ ස්ථර වලට තරවටු කිරීමේ අදහසින් සකස් කළ කථා ප්‍රවෘත්ති ඉදිරිපත් කරමින් ඔවුහු ගුහාරංචියේ ඇතුළත් කරුණු තවදුරටත් Q^1 මූලාශ්‍රයේ දැක්වෙන පරිදි බොද්ධ ශාස්තෘවරයකුවූ ජේසුස් වහන්සේ වෙනුවට 'මේ පරම්පරාව' කෙරෙහි එළිදරව්වේ සඳහන් සාපයන් එල්ලකරනු ලැබූ ද්වේශ සහගතවූත් අනුකම්පා විරහිත වූත් දිවැසිවරයකු ලෙස හඳුන්වා දෙනු ලැබීය.

එසේනමුදු වුවත්, එම ලේඛකයෝ සාම්ප්‍රදායික වශයෙන් උන්වහන්සේ පිළිබඳව පැවති කථා ප්‍රවෘත්තිද උපයෝගී කර ගත්හ. සමහර විට එම කථා ප්‍රවෘත්ති ඔවුන්ට ලැබෙන්නට ඇත්තේ ඉතා මෑතකදී විය යුතුය. ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් රටපුරාම පැතිර සිටි බව අපි අද දනිමු. සංචාරක ආගමික ශ්‍රාවකයන් මෙන් ජීවත්විය යුතුය යන උන්වහන්සේගේ උපදේශය අනුගාමිකයෝ සියලු දෙනාම පිළිනොගත්හ. සමහරෙක් තමන් ජීවත්වූ ගම් දනව්වල රැඳී සිටියහ. සමහර විට ජේසුස් වහන්සේ අනුගමනය කළ උගත් පුද්ගලයින් ඩෙකපෝලිස් (Decapolis) යනුවෙන් හැඳින්වුණු ග්‍රීක් නගරවල ජීවත්වූහ. යුද්ධ කාලයේදී උන්වහන්සේගේ දේශනා පිළිබඳ අලුත් තොරතුරු ඔවුන් සොයාගත්හ. ඒවා මුල් කාලයේදී රචිත සංග්‍රහ වලින් ලබාගත් නිසා එම තොරතුරු සත්‍ය බව ඔවුන්ට පෙනීයන්නට ඇත. එම කථා ප්‍රවෘත්ති දුරස්ථ ප්‍රදේශවල විසිරී පැවති නිසා ඒවා කලින් රචනා කරන ලද Q^1 සංග්‍රහයට ඇතුල්වී නොතිබුණි. නමුත් පසුකාලීනව එම කථා ප්‍රවෘත්ති

දිව්‍යසිව්වරුන්ගේ සහ එළිදරව්ව පිළිබඳ තොරතුරු සමග ගුහාරංචියේ පොත්වල ඇතුළත් කර තිබේ.

මේ හේතුව නිසා Q මූලාශ්‍රයට පසු කාලයේදී ඇතුළත් කර තිබෙන කථා ප්‍රවෘත්ති බෞද්ධ කථාවස්තු වලට සමානකම් දක්වයි. එහි සඳහන්වන දාර්ශනික ඉගැන්වීම් ඒවායේ ව්‍යුහය සහ තේමාව අනුව සලකා බැලීමේදී Q² සංග්‍රහයේ දැක්වෙන කරුණු වලට බොහෝ දුරට සමානබව පෙනේ. Q^1 සංග්‍රහයේ එන "පහන සහ ඇස" පිළිබඳ උපමා කථාව මේ සම්බන්ධයෙන් සලකා බැලීම වැදගත් වේ.

"යමෙක් හොඳ නරක කුසල අකුසල පිළිබඳ වූ ධර්මය පිරිසිදු දන්නේ වේද හේ ඇස් ඇත්තාවූත් පහනක් ඒගෙන යන්නාවූත් පුද්ගලයකු වැනිවේ. මන්ද ඔහුට හැම දෙයක්ම පැහැදිලිව පෙනේ. එවැනි පුද්ගලයකු ප්‍රඥාවන්තයකු ලෙස සැලකේ."
(උදාන වග්ග 22-4)

"යම්සේ මහ මග පසෙක දමන ලද කසළ ගොඩක හටගත් නෙළුම් පද්‍රක මනරම් වූ සුවඳ විහිදුවන පද්මයන් පිපෙන්නේ වේද, එපරිද්දෙන්ම මේ අන්ධභූත පුහුදුන් ලෝකය නැමැති කසළ ගොඩෙහි පහළවන සම්මා සම්බුද්ධ රජුන්ගේ ශ්‍රාවකයා නැමැති පද්මය තම ප්‍රඥාව හා ගුණය නිසා සියලු ලොව බබලවයි."
(ගන්ධාරී ධම්ම පදය 303-304)

"කිසිවෙක් පහනක් දල්වා එය පහන් රුකක් මත තබනු මිස බඳුනක් යට නොතබයි. ඒ, නිවසේ සිටින අයට එළිය දීම සඳහාය.
ඔබේ සිරුරට පහන ඔබේ ඇසය. ඔබේ ඇස් පෙනීම හොඳනම් ඔබේ මුළු සිරුරම ආලෝකමත් වේ. ඔබේ ඇස් පෙනීම දුර්වල නම් ඔබේ මුළු සිරුරම අඳුරු වේ. ඔබ තුළ ඇති ආලෝකය අඳුරු නම් එම අන්ධකාරය කොතරම් ඝන විය හැකිද?" (QS 33)

කිසියම් නිශ්චිත අරමුණක් කරා යොමුවූ ජේසුස් වහන්සේ අනුගමනය කළ තනි ආගමික කණ්ඩායමක් නොතිබූ බව මේ අවස්ථාවේදී සඳහන් කිරීම යෝග්‍යය. දේශනා මූලාශ්‍රවල දැක්වෙන කරුණු යොදාගෙන තිබෙන ආකාරය පරීක්ෂා කර බැලීමේදී ජේසුස් වහන්සේ මුල් කරගත් වෙන් වෙන් වශයෙන් බිහිවූ ස්වාධීන ආගමික කණ්ඩායම් පැවති බව පැහැදිලි වේ. තම ආගමික ව්‍යාපාරයෙන් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීයාම නිසා Q සාමාජිකයන් එළිදරව්ව පිළිබඳ අනාගත වාක්‍ය වලට යොමුවූ අතර තෝමස්ගේ ගුහාරංචිය ගුරුකන්හිලා සැලකූ කණ්ඩායම ජේසුස් වහන්සේ ශ්‍රේෂ්ඨ ගුඪ ශාස්තෘවරයෙකු ලෙස හඳුන්වා දුන්හ. මෙහිදී මුලින් සඳහන් කළ කණ්ඩායම සැබෑ ජේසුස් වහන්සේ විසින් දේශනාකළ බෞද්ධ ඉගැන්වීම් වෙනස්කර ඒ වෙනුවට දිව්‍යසිව්වරුන්ගේ ප්‍රකාශ සහ එළිදරව්ව පිළිබඳවූ තොරතුරු ඇතුළත් දේශනා සංග්‍රහයක් ඉදිරිපත් කළහ. මෙහිදී දෙවනුව සඳහන් කරනු ලැබූ කණ්ඩායම සැලකිය යුතු ඉන්දියානු ආභාසයක් පෙන්නුම් කරමින් ගුහාරංචියේ ඇතුළත් කරුණු වලට රූපාකාර්ථ සහ ගුප්තාර්ථ වලින් යුක්ත කථා ප්‍රවෘත්ති ඇතුළත් කළහ. නිවැරදි දැකීම යනු යම්කිසි පුද්ගලයකු ලෞකික සැප සම්පත් අත්හැරීම කෙරෙහි යොමුකරවන ආත්ම අවබෝධය බව ජේසුස් වහන්සේ උගන්වා තිබෙන බව තෝමස්ගේ ගුහාරංචියේ සඳහන් වේ. මෙම කණ්ඩායමට අයත් ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් දිව්‍යසිව්වරුන්ගේ ප්‍රකාශ සහ එළිදරව්වේ එන මනුෂ්‍ය පුත්‍රයා පිළිබඳ අදහස පිළිනොගත්හ. ජේසුස් වහන්සේ පිළිබඳ ඔවුන් තුළ පැවති අදහස "අවතාර" යනුවෙන් හැඳින්වෙන ඉන්දියානු සංකල්පය සිහිපත් කරයි. මිනිසුන්ට ආත්ම අවබෝධය ලබාදීම සඳහා අවශ්‍ය දිව්‍යමය ඥානය ජේසුස් වහන්සේ තුළින් මූර්තිමත්ව තිබෙන බව ඉන් අදහස් වේ. තෝමස්ගේ ගුහාරංචියේ දැක්වෙන පුරාණෝක්තියෙන් කියවෙන්නේ අඳුරුවූත් අරුත් ශූන්‍යවූත් ලෝකයක ප්‍රඥාව මනුෂ්‍ය වේශයෙන් පිළිබිඹුවන බවය.[34]

"පහනේ" උපමාවෙන් දැක්වෙන ආලෝකය සහ අඳුර පිළිබඳව ඉගැන්වෙන දේව ධර්මය තෝමස්ගේ ගුහාරංචියේ පැහැදිලි ලෙස දක්වා තිබේ. ඒ අනුව ජේසුස් වහන්සේ ආලෝකය තුළින් පැමිණි පණිවිඩකරුවෙකි. ආලෝකයේ දේව දූතයෙකි. මෙම දේශනා එකතුව ප්‍රතිශෝධනය කිරීමේදී ආලෝකය පිළිබඳ පාර භෞතික අදහස ඉන්දියානු චින්තනය හා මිශ්‍ර වී තිබෙන බව පෙනේ.

"ප්‍රඥාවන්තයිනි, අකුසල ධර්මයන් අත්හැර දමා කුසල ධර්ම (ආලෝකය) දියුණුකර ගනිව්. කෙලෙසුන් ඉවත් කර චිත්ත විවේකය සලසා ගනිව්"
(ධම්මපදය 4-12 පණ්ඩිත වර්ගය)

"මේ ලෝකයා නුවණ නැමැති ඇස් නැති හෙයින් අන්ධයන් හා සමාන වෙයි. එහෙත් ඔවුන් අතර යමෙක් එහි යථා ස්වරූපය දක්නේ වේ නම් ඒ ටික දෙනා පමණක්

"ඒ නිසා මම ඔබට මෙසේ කියමි. 'යමෙක් මිථ්‍යා විශ්වාස වලින් තොරවූවේද, ඔහුට පූර්ණ ආලෝකය ලැබෙනු ඇත. යමෙක් මාගේ ධර්මය පිළිබඳ සැක උපදවන්නේද හේ අඳුරට පත්වනු ඇත." (තෝමස් 61)

ඇලෙන් හිඳියන කුරුල්ලන් මෙන් පුගතිගාමී වෙති." (ධම්මපදය 13:8)

Q^2 මූලාශ්‍රයේ ඇතුළත් කර ඇති ජේසුස් වහන්සේගේ සැබෑ දේශනාවලින් උපුටාගත් සමහර ප්‍රකාශවල අන්තර්ගතය පසුකාලයේදී අනතුරු හැඟවීමේ ස්වරූපයෙන් වෙනස්කර තිබෙන සැටි පහත සඳහන් උද්ධෘතයන්ගෙන් පැහැදිලි වේ.

"කපුටෙකු මෙන් ගසා කෑමෙහි සමත් අනුන්ගේ ගුණ මකනසුලු වූ කය, වචනය සහ සිත යන තුන්දොරින් කිලිටු වූ ලජ්ජා භයෙන් තොර පුද්ගලයාට කෙසේ හෝ ජීවත්වීම එතරම් අපහසු නොවේ. එහෙත්, පාපයෙහි ලජ්ජා භය දෙක ඇත්තාහු, නිරතුරුව පින්කමෙහි ඇලුණවූ, ගසාකෑම් ආදියෙහි නුරුඹුනුවී නොවූ පිරිසිදු දිවි පැවතුම් ඇති සිවසස් දන්නවුන්ට ජීවත්වීම ඉතාමත් අපහසුය."
(ධම්මපදය 18:10-11 මලවර්ගය)

"පටු දොරටුවෙන් ඇතුල්වීමට උත්සාහ කරන්න. බොහෝ දෙනෙක් එයින් ඇතුල්වීමට උත්සාහ කරති. නමුත් ඔවුන්ට එසේ කළ නොහැකි බව මම ප්‍රකාශ කරමි. ගෙදර ස්වාමියා දොර වැසූ පසු ඔබ පිටත සිට දොරට තට්ටු කරමින් 'අපි ඔබ සමග කෑවෙමු, බීවෙමු, ඔබ අපේ වීදිවලදී අපට ඉගැන්වූ සේක'යි කියන්නාහුය. එහෙත් ඔහු කථා කොට 'නුඹලා කොතැනින් ආවාහුද'යි මම නොදනිමි. අදමිටුකම් කරන නුඹලා සියලු දෙනාම මා කෙරෙන් පලායව් යයි කියන්නේය." (QS 47)

මතෙව්ගේ ශුභාරංචියේ සඳහන් කර ඇති 'පටු දොරින් ඇතුල් වන්න' (මතෙව් 7:13:14) යනුවෙන් කර ඇති දේශනාවේ අන්තර්ගතයට සර්ව සමවූ ගාථා දෙකක් ධම්මපදයේ එකම තැනක අනුපිළිවෙළින් ඇතුළත් කර තිබෙන බව ඇමෝර් විසින් පෙන්වා දී තිබේ.[60] "අහිතකරවූත් අයහපත ගෙනදෙන්නා වූත් නරකදේ කිරීම පහසුය. යමක් හිත වැඩ පිණිස වේ නම්, යහපත ගෙන දෙන්නේ වේ නම්, එබඳු දේ කිරීම ඉතාමත් අපහසුය. යම්කිසි මෝඩ පුද්ගලයෙක් පාපීවූද, වැරදි සහගතවූද දැකීම නිසා දැහැමින් ජීවත්වන ආර්යවූ රහත් උතුමන්ගේ දහම් මග හෙලා දක්නේ වේ නම් ඒ හේතුවෙන් ඒ තැනැත්තා විනාශයට පත්වන්නේය. ඒ කෙසේදයත් උණ බට කෙසෙල් ආදිය ඵල දරන්නාක් මෙනි." (ධම්මපදය ආත්ම වර්ගය 12:7-8)

Q මූලාශ්‍රයේ අනුපිළිවෙළින් දක්නට ලැබෙන ගාථා දෙකක් මතෙව්ගේ ශුභාරංචියේ ඒ ආකාරයෙන්ම යොදාතිබීම නිසා යටත්

පිරිසෙයින් Q මූලාශ්‍රයේ කොටසක හෝ පාලි ධම්මපදයේ කරුණු ඇතුළත්ව තිබෙන්නට ඇතැයි යන අදහස තහවුරු වන බව ඇමෝර් උපකල්පනය කරයි. මතෙව් විසින් ශුභාරංචියේ ඇතුළත් කර ඇති මෙම ගාථා දෙක අපට හමුවන්නේ ධම්මපදයේ පමණි. එම ගාථා ගන්ධාරි ධම්මපදයේ හෝ උදාන වග්ගයේ හෝ දක්නට නොලැබේ. මේ කාරණය වෙනත් ආකාරයකින් පැහැදිලි කරන්නේ නම් ජේසුස් වහන්සේ පාලි ධම්මපදය පිළිබඳව දැනසිටි බවත් එපමණක් නොව එහි දැක්වෙන සමහර උපදේශාත්මක කරුණු ඉදිරිපත් කර තිබූ ගාථාවල අනුපිළිවෙළ පවා නොවෙනස්ව පවත්වා ගත් බවත් එහි අනුපිළිවෙළ උන්වහන්සේගේ ශ්‍රාවකයින් විසින්ද ධර්මය රචනා කිරීමේදී ඒ අයුරින්ම ආරක්ෂාකළ බවත් සිතිය හැක.

කිසිවෙකුට ස්වාමිවරු දෙදෙනෙකුට සේවය කළ නොහැකිය. යන ජේසුස් වහන්සේගේ ප්‍රකාශයද මාර්ග දෙකක් අනුගමනය නොකළ යුතුය යන තේමාවටම අයත් වේ. එම ප්‍රකාශය ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා සිහිපත් කරවයි.

"ලාභ ලබන පිළිවෙළ එකකි. නිවනට යන මග වෙනත් එකකි. බුදුරදුන්ගේ ශ්‍රාවක භික්ෂුව මේ දෙමග මැනවින් වටහාගෙන සත්කාර සම්මාන ලැබීම පිණිස කටයුතු කිරීමට කැමති නොවන්නේය. විවේකයම සොයන්නේය."
(ධම්මපදය 5:16 බාලවර්ගය)

"ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කරන්නට කිසිම සේවකයෙකුට නුපුළුවන. මන්ද ඔහු එක් කෙනෙකුට වෛර කරන්නේය. අනෙක් අයට ප්‍රේම කරන්නේය. නොහොත් එක් කෙනෙකුට ලැදිවන්නේය. අනික් අය හෙළා දකින්නේය. දෙවියන් වහන්සේටත් වස්තුවටත් එක්වර සේවය කිරීමට ඔබට නොහැකිය." (QS 55)

ස්වාමිවරු දෙදෙනෙකුට සේවය කිරීම පිළිබඳ උපදේශය තෝමස්ගේ ශුභාරංචියේ මෙසේ සඳහන් කර තිබේ: ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක. "මිනිසකුට එකවර අසුන් දෙදෙනකුගේ පිටට නැගිය නොහැකිය. දුනු දෙකක් විදිය නොහැකිය". (තෝමස් 47:1). අසුපිට නැගුනු දුනුවායකු පිළිබඳ සංකල්ප රූපය බොහෝදුරට ඉන්දියානු ලක්ෂණ වලින් යුක්තය. පුරාණෝක්තිවල සඳහන් වන රණ විරුවන් පිළිබඳ බොහෝ කථා ප්‍රවෘත්ති ඉන්දියානු සාහිත්‍යයේ දක්නට ලැබේ. ඊට අමතරව පැරණි ඉන්දියානු සම්ප්‍රදායට අනුව දිව්‍යමය ආශීර්වාදයෙන් අත් රාශියක් ලැබීම නිසා එකවර දුනු දෙකක් ඇදීමට හැකිවූ දෙවියන් ගෙන් මිනිසුන් වෙන්කොට හඳුනාගත යුතුය.

බුදුදහමේ දැක්වෙන මාරයා යක්ෂයාගේ වේශයෙන් කිතු සමයට පැමිණීම

යුදෙව් යුද්ධය අවසාන වනවිට ජෙරුසලම විනාශයට පත්ව තිබුණි. වෙනත් බාහිර සතුරු තර්ජන නැවතුණි. යුද්ධයෙන් දිවි ගලවාගත් පලස්තීන වැසියෝ තම අයිතිවාසිකම් තහවුරු කර ගැනීම සඳහා නව ක්‍රියා මාර්ග සෙවූහ. මෙවැනි පසුබිමක් යටතේ ජේසුස් වහන්සේ සම්බන්ධ ආගමික ව්‍යාපාරයද ස්වතන්ත්‍ර සම්ප්‍රදායක් ලෙස වර්ධනය වන්නට පටන් ගත්තේය. යුද්ධයෙන් පසු ඉතිරි වූයේ සම්පූර්ණයෙන්ම විනාශවී ගිය පරිසරයකි. ශත වර්ෂ ගණනාවක් තිස්සේ යුදෙව් ජාතිකයින් වෙත විදේශීය සංස්කෘතික අංග බලෙන් පටවා තිබුණි. ඔවුන්ගේ පරම පූජ්‍ය ශුද්ධ නගරයද ඒ වනවිට නටබුන් ගොඩක් බවට පත් වී අවසානය. එක් අතකින් බලනවිට මහත් ව්‍යසනයක් ලෙස පෙනී යන මෙම තත්වය වෙනත් කෝණයකින් බැලීමේදී අලුත් ආරම්භයක් සඳහා ලැබුණ අවස්ථාවක්ද විය. එකල ජේසුස් වහන්සේ පිළිබඳ ආගමික ව්‍යාපාරයේ ප්‍රමුඛ පෙළේ නියෝජිතයින් තම සංවිධානයේ ව්‍යුහය පුළුල් කිරීමට කටයුතු කළහ. විනාශ වී ගිය අත්තිවාරමක් මත නව ආධ්‍යාත්මික මධ්‍යස්ථානයක් ගොඩනැගිය යුතුවිය. යුද්ධය පැවති කාලය තුළදී 'එළිදරව්ව' පිළිබඳ කරුණු ශුභාරංචියේ පොත්වලට ඇතුල් කරන ලදී. ඉහත සඳහන් කළ කරුණුද ඇතුළත් ශුභාරංචියේ දේශනා අලුත් ආගමික විශ්වාසයක් ගොඩනැගීම සඳහා පදනම් වශයෙන් යොදාගනු ලැබිය. මෙම අලුත් විශ්වාසය තුළින් බලාපොරොත්තු වූයේ තවදුරටත් ජේසුස් වහන්සේගේ සැබෑ දේශනාවල සඳහන් කර ඇති ඊශ්‍රායෙල් වංශයේ නැතිවූ බැටළු පෝතකයාගේ විමුක්තිය සලසාදීම පමණක් නොවේ (මතෙව් 10:6). ඒ වෙනුවට මෙම අලුත් ආගමික ව්‍යාපාරය සියලු ආගම් සහ ජාතිවලට අයත් පුද්ගලයින්ගේ විමුක්තිය සලසාදීම අරමුණු කරගත් විශ්වාසයක් බවට පත් කිරීමය.

එම පරමාර්ථය ඉටුකර ගැනීම පිණිස උන්වහන්සේගේ ජීවන ප්‍රවෘත්ති ඇතුළත් චරිතාපදානයක් ලිවීම අවශ්‍ය විය. එහෙත් ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳව උන්වහන්සේගේ ශ්‍රාවකයින් දැන සිටියේ කරුණු ස්වල්පයක් පමණක් නිසා එතුමා පිළිබඳ එවැනි ජීවන චරිතයක් ගොඩනැගීම එතරම් පහසු කාර්යයක් නොවීය. ඔවුන්ට කළ හැකි වූයේ උන්වහන්සේගේ දේශනා වලට සුළු සුළු වෙනස්කම් කීපයක් කිරීම සහ වෙනත් විස්තර තොරතුරු ස්වල්පයක් එකතුකිරීම පමණි. එම විස්තර තොරතුරු Q^1 සහ Q^2 මූලාශ්‍ර රචනා කරනු ලැබූ සම්ප්‍රදාය සමග කිට්ටුවෙන්

බැඳී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජේසුස් වහන්සේ පිළිබඳ පවතින පුරාණෝක්ති වලට නොපැහැදිලි අභව්‍ය කථා ප්‍රවෘත්ති පවා ඇතුළත් කරනු ලැබිය. එම තොරතුරු ලිවීමේ කාර්යය භාරගන්නා ලද්දේ ජේසුස් වහන්සේ පිළිබඳ ආගමික ව්‍යාපාරයට එතරම් සම්බන්ධතාවයක් නොතිබූ පසුකාලයේදී ශුභාරංචිය පිළිබඳ පොත් ලියන ලද කතුවරයින් විසිනි. එකල ජේසුස් වහන්සේ පිළිබඳ ජීවන චරිතයක් ලිවූ සිරියාවේ විසූ මාක් පිළිබඳව Q අනුගාමිකයින් දැන සිටියේ නැත. තමන් අයත් වූ ආගමික කණ්ඩායම තුළ හුවමාරු වූ තොරතුරු කෙරෙහි පමණක් ඔවුහු විශ්වාසය තැබූහ. එම තොරතුරු ඉතාමත් අල්ප විය. කෙසේ වෙතත් අලුත් කථා ප්‍රවෘත්ති රාශියක් Q මූලාශ්‍රයට ඇතුල්කර තිබුණි. මෙහිදී එම තොරතුරු කෙරෙහි අපේ අවධානය යොමුකළ යුතුවේ. පාළුකරයේදී යක්ෂයා විසින් ජේසුස් වහන්සේ පරීක්ෂා කිරීමේ සිද්ධිය උන්වහන්සේගේ ජීවන චරිතය සම්බන්ධයෙන් පවතින Q මූලාශ්‍රයට පසුව එකතු කරන ලද Q^1 තොරතුරු අතුරින් වඩා වැදගත් කථා ප්‍රවෘත්තිය ලෙස සැලකිය හැකිය.

යථෝක්ත කථා ප්‍රවෘත්තිය හේතු කොටගෙන Q මූලාශ්‍රය පිළිබඳව පර්යේෂණ පැවැත්වීමේදී මහත් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවිය. Q මූලාශ්‍රයේ ඇතුළත් අනෙක් කරුණු සමග සසඳා බැලීමේදී මෙම කථා ප්‍රවෘත්තියෙන් ප්‍රකාශවන්නේ සම්පූර්ණයෙන්ම වෙනස් කාරණයක් බැවින් එය Q මූලාශ්‍රයට අයත් කථාවක්ය යන අදහස පවා පිළිගැනීම සමහර විද්වත්හු ප්‍රතික්ෂේප කළහ. එනිසා මතෙව් සහ ලූක් විසින් එම කථා ප්‍රවෘත්ති වෙනත් මූලාශ්‍රයකින් උපුටා ගන්නට ඇතැයි බොහෝ දෙනෙක් කල්පනා කළහ. කෙසේ වෙතත් මතෙව් සහ ලූක් විසින් ඉදිරිපත් කර ඇති කථා ප්‍රවෘත්තිවල දේශනා විලාශයෙන් ඉදිරිපත් කර ඇති කොටස් බොහෝ දුරට Q මූලාශ්‍රය හා සැසඳෙන නිසා මෙම කථා ප්‍රවෘත්තියද Q මූලාශ්‍රයෙන් උපුටාගන්නට ඇතැයි කල්පනා කළ හැකිය.[illegible]

ශුභාරංචිය පුරා දක්නට ලැබෙන ප්‍රාතිහාර්ය සහ රෝගීන් සුව කිරීම පිළිබඳ කථා ප්‍රවෘත්තිවලට වඩා ජේසුස් වහන්සේගේ චරිතය පිළිබඳ මෙම විශේෂ කථා ප්‍රවෘත්තිය උන් වහන්සේගේ අනුගාමිකයන් අතර භාවිත වූයේ කුමක් නිසාද? එම ප්‍රශ්නයට දිය හැකි පිළිතුර සරලය. එමෙන්ම පුදුම සහගතය. Q අනුගාමිකයින් ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳව ඊට වඩා වැඩි දෙයක් දැන සිටියේ නැත. යුද්ධය ආරම්භවීමට පෙර උන්වහන්සේගේ ජීවිතය පිළිබඳව පැවති තොරතුරු ඔවුන්ට අහිමි වන්නට ඇත. කෙසේ වෙතත් Q^1 මූලාශ්‍රයට යම්යම් අතිරේක තොරතුරු ඇතුළත් කිරීමට ඔවුන්ට හැකිවිය. එම තොරතුරු අන්තර්ගත කර තිබෙන්නේ ඒවා රචනා කරන ලද ශ්‍රාවකයින් නියෝජනය කළ සමාජ

වටාපිටාවට අනුකූලවය. ඒ නිසා එබඳු තොරතුරු වලින් වැඩි කොටසක් ජේසුස් වහන්සේගේ චරිතය පිළිබඳ සැබෑ තොරතුරු විය නොහැකිය. කෙසේ වෙතත් ජේසුස් වහන්සේ තුළ පැවති බෞද්ධ ආභාෂය පිළිබඳ යම් අවබෝධයක් තිබුණු පුද්ගලයින් ඔවුන් අතර සිටින්නට ඇත. එනිසා චරිතාපදානයක් නිර්මාණය කිරීමේ කාර්යයේ නියැළී සිටි ශ්‍රාවකයින් බෞද්ධ ජනප්‍රවාදයේ ඇතුළත් කථා ප්‍රවෘත්ති ඒ සඳහා උපයෝගී කර ගනිමින් ජේසුස් වහන්සේගේ චරිතයද විචිත්‍ර කථා ප්‍රවෘත්ති වලින් සරසන ලද බව සිතිය හැක. ශුභාරංචියේ ඇතුළත් ස්නාවක ජොහන්ගේ දේශනාවට පසුව එකතුකර ඇති යක්ෂයා විසින් ජේසුස් වහන්සේ පරීක්ෂා කිරීමේ කථා ප්‍රවෘත්තිය සලකා බැලීමේදී මාර පරාජය පිළිබඳ බෞද්ධ කථා ප්‍රවෘත්තිය ඒ ආකාරයෙන්ම යොදා ගෙන ඇති බව පැහැදිලිය. එය නිසැකවම බුදු දහමින් ආභාෂය ලබා ලියා ඇති කථා ප්‍රවෘත්තියක් බව ඒ පිළිබඳ විමසිලිමත් වූ බොහෝ පර්යේෂකයෝ විශ්වාස කරති.

බුද්ධත්වයට පත්වූ විගස සිද්ධාර්ථ ගෞතමයන්ගේ සිතෙහි පහළ වූ සිතුවිලි උන්වහන්සේගේ ජීවන චරිතයේ විශේෂ අවස්ථාවක් පිළිබිඹු කරයි. එනම් තමා විසින් පසක් කරගත් ගැඹුරු ධර්මය පුහුදුන් ජනයාට අවබෝධ කරගත හැකිවේද'යි යන උන්වහන්සේ තුළ ඇතිවූ චකිතය හේතුකොට ගෙන මෙම ගැඹුරු ධර්මය ලෝකයාට අහිමි වී යාමේ තත්වයක් උදාවිය. පසුකාලයේදී බුද්ධාගම හීනයාන සහ මහායාන වශයෙන් ගුරුකුල දෙකකට බෙදීමටද මෙම තත්වය හේතුවිය. ජේසුස් වහන්සේ යක්ෂයා විසින් පාපයට පෙළඹවීමේ කථා ප්‍රවෘත්තියට සමාන කථා ප්‍රවෘත්තියක් මහා පරිනිබ්බාන සූත්‍රයේ දැක්වේ. බුද්ධත්වය අවබෝධ කර ගැනීම ක්ෂණිකව දිලුන ආලෝකයකට (ආලෝකෝ උදපාදි) උපමා කර තිබේ. පාපයට පොළඹවන්නා හෙවත් මාරයා ධර්මය බහුජනතාව අතර පැතිරීම වැළැක්වීමේ අදහසින් බුදුන් වහන්සේට පිරිනිවන් පාන ලෙස ඇරයුම් කරයි. මෙලොව ජීවත්වන පෘතග්ජන මිනිසුන්ට ලෞකික ආශාවන් මැඩපවත්වා ගැනීම දුෂ්කර නිසා තමන්වහන්සේ අවබෝධ කරගත් ධර්මය ඔවුන්ට දේශනා කළයුතුද යන තීරණය පිළිබඳව උන්වහන්සේ තුළ පැවති අවිනිශ්චිත හැඟීම මාරයාගේ ආයාචනය මගින් ධ්වනිත වන බව කෙනෙකුට උපකල්පනය කළ හැකිය. මෙසේ උන්වහන්සේ පිරිනිවන් පෑ යුතුද, එසේ නැතිනම් තමන් අවබෝධකළ ධර්මය දේශනා කළයුතුද? යන්න පිළිබඳව පැහැදිලි තීරණයකට එළඹී නොසිටියහ. උන්වහන්සේගේ සිතතුළ මෙවැනි අදහසක් පහළවිය: "මා විසින් මේ ගැඹුරු ධර්මය අවබෝධ කරගන්නා ලද්දේ මහත් ආයාසයකිනි. ඒ ධර්මය ම විසින් දේශනා කරනු ලබන්නේ කෙසේද? කෙලෙස් වලින් සහ රාග, ද්වේෂ, මෝහයෙන් මඩිනු ලැබූ මිනිසුන්ට වටහා ගැනීම

පහසු නොවේ. එය පටිසෝතගාමී මාර්ගයකි. මැනවින් පිළිසිඳ ගත්තාවූත්, ගැඹුරුවූත්, අවබෝධකර ගැනීමට දුෂ්කරවූත්, සියුම්වූත්, මෙම ගැඹුරු ධර්මය රාගයෙන් මත්ව, මෝහයෙන් මැඩුනාවූ ජනයාට අවබෝධකර ගැනීම දුෂ්කරය." (මහාවග්ගය 5:3)

එය පෞද්ගලිකව සත්‍යය අවබෝධ කර ගැනීම සහ පොදු යහපත සඳහා කැපවීමත්, පුද්ගල විමුක්තිය සලසා ගැනීම සහ තමන් අවබෝධකර ගත් ධර්මය විමුක්තිය සලසා ගැනීමට කැමති පුද්ගලයින්ගේ අභිවෘද්ධිය පතා දේශනා කිරීමත් අතර පවතින තීරණයකි. උන්වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය සාම්ප්‍රදායික වශයෙන් එවකට ව්‍යවහාරයේ පැවති බ්‍රාහ්මණ ඇදහිලි වලට වඩා ශ්‍රේෂ්ඨය යන පිළිගැනීම මත තමන් වහන්සේ පසක් කරගත් ධර්මය දේශනා කිරීමේ තීරණයට එළඹියහ. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේට ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කරනු ලැබුවේ බ්‍රාහ්මණ ආගමේ ශ්‍රේෂ්ඨතම දෙවියා වන බ්‍රහ්මයා සහම්පති විසිනි. "ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස, දහම් දෙසන සේක්වා! සුගතයන් වහන්ස! දහම් දෙසන සේක්වා! දහම් නොඇසීමෙන් මිනිස්සු පිරිහෙති. ඔවුනු දහම් අවබෝධ කරන්නෝ වන්නාහ" (මජ්ඣිම නිකාය 1, 395). සහම්පති බ්‍රහ්මයා විසින් ධර්මය දේශනා කිරීම සඳහා ඇරයුම් කිරීමට කලින් උන්වහන්සේ විසින් අවබෝධ කළ එම ගැඹුරු සත්‍යය ඉන් පෙර අසන්නට නොලැබුණු ධර්මයක් බවත්, එය එතෙක් පිළිගත් සම්මතයන්ට පටහැනි වූ (පටිසෝතගාමී) ධර්මයක් බවත්, කෙලෙස් වලින් පිරුණු පෘතග්ජන මිනිසුන්ට එය තේරුම්කර දීම දුෂ්කර බවත්, උන්වහන්සේ අවබෝධකර ගෙන සිටියහ. අවසානයේදී එම සියුම් ධර්මය දේශනා කිරීමට උන්වහන්සේ තීරණය කළහ. සිත් ගන්නාසුලු අයුරින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් කළ විස්තරය ජේසුස් වහන්සේද තම පණිවිඩය දේශනා කරන බවට පොරොන්දු වෙමින් කරන ලද ප්‍රකාශයේ ඊට සමාන ආකාරයෙන් දක්වා තිබේ. එම ප්‍රකාශය කොරින්තියන් වරු වෙත යවන ලද පළමු ලිපියේ ඇතුළත් වේ (1 කොරි 2:9). එම ප්‍රකාශය කරන ලද්දේ කවරෙක් විසින්ද කියා එහි සඳහන් කර නොමැත. නමුත් එම ප්‍රකාශය කරන ලද්දේ කවරෙක් විසින්ද යන කාරණය තෝමස්ගේ ශුභාරංචියේ පැහැදිලි ලෙස සඳහන් කර තිබේ. ඒ අනුව ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක: "කිසිවකු කවදාවත් ඇසින් නොදුටු, කනින් නොඇසූ, කිසිම අතකින් ස්පර්ශ නොකළාවූ, සිතින් නොසිතූ ධර්මයක් දේශනා කරමි." (තෝමස් 17)

බුද්ධත්වය ලබාගත් මොහොතේ බුදුන් වහන්සේ තුළ ඇතිවූ මෙම චකිතය උන්වහන්සේ සැබෑ මනුෂ්‍යයකු බව පෙන්නුම් කරයි. ඒ නිසා බුද්ධත්වය පිළිබඳ අප තුළ වැරදි අවබෝධයක් ඇතිවීමට අවකාශයක්

නොමැත. මෙහිදී බුද්ධත්වයට පත්වූ පුද්ගලයකුට තමා විසින් පිළිගට කළයුත්තේ කුමක්ද යන කාරණය තේරුම්කර ගැනීමට නොහැකිවූයේ මන්ද? යන සාධාරණ ප්‍රශ්නය කෙනෙකුට නැගිය හැකිවේ. කෙසේ වෙතත් බුද්ධත්වය යනු සර්වඥතා ඥානය සඳහා ලැබෙන බලපත්‍රයක් නොවන බව එම කථා ප්‍රවෘත්තියෙන් පැහැදිලි වේ. බුද්ධත්වයට පත්වූ පුද්ගලයකු විසින් පවා යම් යම් විකල්ප තීරණ ගැනීමට ඉඩ ඇති බව ඉන් හැඟවේ. ඒ නිසා පාප්වහන්සේගේ අධිකාරීත්වය යටතේ කතෝලික පල්ලිය විසින් මිනිසුන්ට ඒත්තු ගන්වා ඇති පරිදි තීරණ ගැනීමේදී සර්ව නිර්දෝෂී තත්වයක් පිළිබඳ ප්‍රශ්නයක් මෙහිදී පැන නොනගී. සමහරවිට බටහිර ලෝකයේ ප්‍රචලිත ක්‍රිස්තියානි විශ්වාස වලට අනුව හැඩගැසී ඇති අප තුළ 'බුද්ධත්වය' පිළිබඳ එතරම් පැහැදිලි අවබෝධයක් නොමැති වීමට මේ කාරණය හේතු වන්නට පුළුවන.

මෙහිදී 'මාරයා' ගෙන් සංකේතවත් කර තිබෙන්නේ ඉන්ද්‍රිය ගෝචර ලෞකික ජීවිතයයි. බුදුන් වහන්සේ විසින් ජය ගැනීමට උත්සාහ කරන ලද්දේ එම ඉන්ද්‍රිය ගෝචර ලෞකික තත්වයයි. බුදුරජාණන් වහන්සේ පොළඹවා ගැනීමට අපොහොසත් වීම නිසා මාරයාගේ දූවරුන් තිදෙනා වූ තණ්හා, රතී, රගා (තෘෂ්ණාව, ආශාව සහ රාගය) බුදුන් වහන්සේ වෙත පැමිණ උන්වහන්සේ පොළඹවා ගැනීමට උත්සාහ කරයි. ඔවුන් විවිධ වයස් වලට අයත් කාන්තාවන්ගේ ස්වරූප වලින් පෙනී සිටි. එහෙත් බුදුන් වහන්සේගේ අවධානය ධර්ම මාර්ගයෙන් ඉවතට හරවා ගැනීමට ඔවුන් අපොහොසත් වේ. බුද්ධත්වයට පත්වීමට කලින්ද 'බුද්ධත්වයට පත්වී මිස මේ අස්නෙන් නොනැගිටිමි'යි තරයේ අධිෂ්ඨාන කර භාවනානුයෝගීව වැඩ විසූ ගෞතමයන් වහන්සේ එතැනින් පලවා හැරීම සඳහා මාරයා තම සේනාව සමඟ ගර්ජන කරමින් පැමිණි බව පොත පතෙහි සඳහන් වේ. ඉන්ද්‍රිය ගෝචර ලෞකික ජීවිතය සංකේතවත් කරමින් මාරයා බුදුන් වහන්සේගේ ජීවිත කාලය මුළුල්ලේම උන්වහන්සේ සොයා පැමිණි බව ජනප්‍රවාදයේ සඳහන් වේ. මාරයා එම කාර්යයෙහි යෙදී සිටින සැටි සිද්ධාර්ථ කුමාරයාගේ ජීවන චරිතයේ මුල් කොටස් වලදී අපට හමුවේ. කුමරුවා අනාගතයේදී බුද්ධත්වයට පත්වීම නැවැත්වීම සඳහා ගිහිගෙය හැරයෑමෙන් වැළැක්වීමට උත්සාහ කිරීම සහ නිතර සිදුහත් කුමරුට ලෞකික සහ දිව්‍යමය සැප සම්පත් වල ඇති වටිනාකම හුවා දක්වමින් ලෞකිකත්වය කෙරෙහි පෙළඹවීමට කරන ලද උත්සාහයන් මේ අතර වේ.[47] මේ නිසා මාරයා ගැන පමණක් කියවෙන සූත්‍ර රාශියක් සූත්‍රපිටකයේ ඇතුළත් වේ. මාර සංයුක්තය නමින් හැඳින්වෙන මෙම සූත්‍රවල භික්ෂූන් සහ භික්ෂුණීන් වහන්සේලා පමණක් නොව බුදුන් වහන්සේ පවා මුළාකර ධර්ම මාර්ගයෙන් ඉවතට යොමු

කරවීම සඳහා විවිධ පෙළඹවීම් කරමින් මාරයා දරන නිරන්තර උත්සාහය පැහැදිලි කර තිබේ. මෙහිදී මාරයා පිළිබඳව අප තේරුම් ගත යුත්තේ එය කිසියම් සිද්ධියක් සිත් කාවදින අයුරින් ඉදිරිපත් කිරීම සඳහා යොදාගන්නා ලද පුරාණෝක්ති වල සඳහන් මනඃකල්පිත සංකල්ප රූපකයක් ලෙසය. එවැනි මිථ්‍යා සංකල්පයක් සුර සහ අසුර ලෝක පිළිබඳව අතිශයෝක්තියෙන් සඳහන් වන ඉන්දියානු ආගමික චින්තනය හා හොඳින් ගැළපේ. බෞද්ධ මනෝවිද්‍යාවට අනුව පුද්ගලයකු සිටී යන වැරදි සංකල්පය ගොඩ නැගීමට හේතුවන කාරණා පහක්, එනම් රූප, වේදනා, සංඥා, සංඛාර සහ විඥාන යන උපාදානස්කන්ධ පහ හැඳින්වීම සඳහා මාරයා පිළිබඳ සංකල්ප රූපය යොදාගෙන තිබෙන බව පෙනේ. මාරයාගේ උපායට හසු නොවනු පිණිස භික්ෂූන් විසින් ඉහත කී පංච උපාදානස්කන්ධ පිළිබඳ යථාවබෝධයක් ඇති කර ගත යුතුය.

මෙහිදී සංයුක්තනිකායේ මාර සංයුක්තයේ රජ්ජ සූත්‍රයේ දැක්වෙන කථා ප්‍රවෘත්තිය සහ Q[3] යනුවෙන් හැඳින්වෙන මූලාශ්‍රයේ දැක්වෙන ජේසුස් වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂා කිරීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය දැන් අපි සලකා බලමු.

"එක් සමයක භාග්‍යවතුන් වහන්සේ කෝසල ජනපදයෙහි හිමවත් පෙදෙසෙහි වන කුටියක වසති. තනිව විවේකීව සිටි භාග්‍යවතුන් වහන්සේට හිංසා නොකොට, හිංසා නොකරවා, පැහැර නොගෙන, පැහැර නොගන්වා, ශෝක නොකොට, ශෝක නොකරමින් දැහැමින් රජය කරවිය හැකිදෝ කියා අදහසක් ඇතිවිය.

ඉක්බිති පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේගේ සිතෙහි පහළවූ අදහස සිතින් දැන උන්වහන්සේ වෙත පැමිණ, 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, නොනසා, නොනස්වා දැහැමින් රජය කරවනු මැනවි. හිංසා නොකොට,

"එකල යක්ෂයා විසින් ජේසුස් වහන්සේ පරීක්ෂා කරනු ලබන පිණිස ශුද්ධාත්මයාණන් විසින් පාළුකරයට පමුණුවනු ලැබූ සේක.[48] දින සතළිසක් නිරාහාරව සිටි නිසා උන්වහන්සේට සාගිනි ඇතිවිය. එවිට යක්ෂයා උන්වහන්සේ වෙත අවුත්, 'ඔබ වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මේ ගල්ගෙඩි, පාන් ගෙඩි වන්නට අණ කළ මැනවැ'යි කීය. ජේසුස් වහන්සේ උත්තර දෙමින්, 'මිනිසා ජීවත්වන්නේ කෑමෙන් පමණක් නොවේ' කියා ලියා ඇතැයි වදාළ සේක. එවිට යක්ෂයා උන්වහන්සේ ජෙරුසලමට කැඳවාගෙන ගොස්, දේව මාලිගාවේ ඉහළම තැන

හිංසා නොකරවමින්, පැහැර නොගෙන, පැහැර නොගන්වා, ශෝක නොකොට ශෝක නොකරමින් දැහැමින් රජ්‍ය කරවනු මැනවි. සුගතයන් වහන්සේ රජ්‍ය කරවනු මැනවි'යි සැල කළේය.
භාගවතුන් වහන්සේ :
'මාරය, තුමක් දැක' ස්වාමීනි, දැහැමින් රජ්‍ය කරවන්නැ'යි මට කියන්නෙහිද?'
මාරයා :
"ස්වාමීනි, භාගවතුන් වහන්සේ විසින් සතර සෘද්ධිපාද වඩන ලදී. සම්පූර්ණ කරන ලදී. ඉදින් ඔබ වහන්සේ කැමැති නම් හිමාලය පර්වතය රත්රන්මය කියා සිතුවොත් එය රන් පර්වතයක් ම වන්නේය."
භාගවතුන් වහන්සේ :
'රත්රනින් හෝ රිදියෙන් ම නිර්මාණය වූ පර්වතයක් තිබුණත් නැණවතකුට ඉන් ඇති ඵලය කුමක්ද? පස්කම් සැප හේතුවෙන් දුක ඇති වෙයි කියා යමෙක් දුක දකී නම් ඔහු කෙසේ නම් පස්කම් සැපතට යොමු වෙයිද?'යි පිළිතුරු දුන්සේක. ඉක්බිති පවිටු මාර තෙමේ 'භාගවතුන් වහන්සේ මා දනී. සුගතයන් වහන්සේ මා දනී' යයි දුකට පත්ව නොසතුටු සිත් ඇත්තේ පිටත්ව ගියේය."
(සංයුත්තනිකාය - මාර සංයුත්තය)

පිහිටි නොතමුදුනේ සිටින්නට සලස්වා 'ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතනින් පහතට පනින්න, මන්ද උන්වහන්සේ ඔබව ආරක්ෂා කරන ලෙස සිය දූතයන්ට අණදෙනු ඇතැයිද? ඔබේ පාද කිසිසේත් ගලක නොවදින පිණිස ඔවුහු සිය අත්වලින් ඔබ උසුලනු ඇතැයිද, ලියා තියන හෙයිනි.' නමුත් ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් 'තාගේ දෙවි ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්නේ'යි කියාත් ලියා තිබේ යැයි වදාළ සේක.

යළිත් යක්ෂයා උන් වහන්සේ ඉතා උස් කඳු මුදුනක් වෙත කැඳවාගෙන ගොස් ලෝකයේ පවතින සියලු රට රාජ්‍යයන් සහ ඒවායේ යසශ්‍රීය උන්වහන්සේට පෙන්වා 'ඔබ දනින් වැටී මට නමස්කාර කරන්නේ නම් මේ සියල්ල ඔබට දෙන්නෙමි'යි උන්වහන්සේට කීය. එවිට ජේසුස් වහන්සේ තරවටු කරමින් 'තුඹේ දෙවි ස්වාමීන්ට පමණක් නමස්කාර කරන්න. උන්වහන්සේට පමණක් සේවය කරන්න" යනුවෙන් ලියා ඇතැයි වදාළ සේක.
එවිට යක්ෂයා උන්වහන්සේ අතහැර ගියේය. (QS 6)

මෙම කථා ප්‍රවෘත්ති දෙක අතර පවතින කැපී පෙනෙන සමානකම් රාශියක් තිබෙන අතර ඒ පිළිබඳව මෙහිදී සලකා බැලීම වැදගත් වේ. Q

මූලාශ්‍රයේ දැක්වෙන යක්ෂයා සහ බෞද්ධ කථා ප්‍රවෘත්තියේ දැක්වෙන මාරයා පැමිණෙන්නේ උත්කෘෂ්ට සිදුවීම් දෙකකට පසුවය. යක්ෂයා ජේසුස් වහන්සේ වෙත පැමිණෙන්නේ උන්වහන්සේගේ බෞතිස්ම ස්නාපනයට සහ ඉන් අනතුරුව ස්වර්ගයෙන් හඬක් නික්මීමෙන් පසුවය. බෞද්ධ කථා ප්‍රවෘත්තියට අනුව මාරයා පැමිණියේ බුදුන් වහන්සේ නේරංජනා ගඟෙන් ස්නානය කර බෝමැඩ පාමුලදී සර්වඥතා ඥානය ලබා ගැනීම සහ ඒ සමගම දෙව්ලොව දෙවියන් මහත්සේ ප්‍රීති උත්සව පවත්වනු ලැබූ අවස්ථාවකදීය. ඒ මොහොතේදී බුදුන් වහන්සේ මෙන්ම ජේසුස් වහන්සේද උන්වහන්සේලාගේ ජීවිතයේ වැදගත් සන්ධිස්ථානයකට පැමිණ සිටියහ. බුදුන් වහන්සේ තමන් අවබෝධ කරගත් ගැඹුරු ධර්මය පෞද්ගලික විමුක්තිය සඳහා පමණක් යොදාගත යුතුද, නොඑසේ නම් පොදු ජනතාවගේ යහපත පිණිස දේශනා කළ යුතුද යන අවිනිශ්චිත තීරණයකට මුහුණ පා සිටියහ. එය ජේසුස් වහන්සේ ප්‍රසිද්ධියේ මහජනයා ඉදිරියට පැමිණි පළමු අවස්ථාව විය. ඒ අවස්ථාවේදී උන්වහන්සේ එළිදරව්ව පිළිබඳ දිවැසිවරයකු වූ අනුගාමිකයින් විශාල සංඛ්‍යාවක් පිරිවරා සිටි ස්නාවක ජොහන් ගෙන් වෙන්ව බුදුන් වහන්සේ මෙන් හුදකලා ස්ථානයක විවේකීව වැඩ විසූ අවස්ථාවක් විය. පිටතින් පැමිණි උපායශීලී යක්ෂයා/මාරයා විසින් මෙම ශාස්තෘවරයින් දෙදෙනාම පෙළඹවීමට උත්සාහ කරනු ලැබුයේ උන්වහන්සේලා මෙසේ විවේකී සුවයෙන් පසුවෙමින් අනාගතයේදී ඉටු කළ යුතු වැඩපිළිවෙළ පිළිබඳව මෙනෙහි කරමින් සිටි අවස්ථාවකදීය. පාපයට පෙළඹවීම සඳහා පැමිණි යක්ෂයා සමග ක්‍රිස්තුස් වහන්සේත්, මාරයා සමග බුදුන් වහන්සේත් සංවාදයකට එළඹියහ. දින කීපයක් නිරාහාරව සිටි නිසා ශාස්තෘන් වහන්සේලා දෙදෙනාම පසු වූයේ දුර්වල තත්වයකය. බෞද්ධ කථා ප්‍රවෘත්ති වලට අනුව මාරයා ලෞකිකවූත් ඉන්ද්‍රිය ගෝචරවූත් ලෝකය සංකේතවත් කරයි. ජොහන්ගේ ශුභාරංචියට අනුව යක්ෂයා යනු 'මේ ලෝකයේ අධිපතියාය.' (ජොහන් 12:31) ඒ බව ශුභාරංචියේ කතුවරයා ජේසුස් වහන්සේ පිලාත් ඉදිරියේදී කරනු ලැබූ "මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති නැත." යන ප්‍රකාශයෙන් තවදුරටත් පැහැදිලි කර දක්වා ඇත. (ජොහන් 18-36). පාපයට පොළඹවන්නා හෙවත් යක්ෂයා සහ මාරයා පරාජයට පත්ව පලාගිය බවත්, නැවත වඩා සුදුසු අවස්ථාවක් පැමිණෙන තුරු ඔවුන්ට බලා සිටීමට සිදුවූ බවත් කථා ප්‍රවෘත්ති දෙකේම සඳහන් වේ.

"නිරතුරුවම බෝධි සත්වයන් වහන්සේ පසුපස යමින් සුදුසු අවස්ථාවක් එළඹෙන තුරු

"යක්ෂයා මෙකී පරීක්ෂණ නිමවා සුදුසු අවස්ථාවක් යළිත් එළඹෙනතුරු උන්වහන්සේ අත් හැර

මාරයා සාවුරුද්දක් බලා සිටියේය. නමුත් මාරයාගේ එම උත්සාහය කිසි දිනක සාර්ථක වූයේ නැත. ඒ සඳහා අවස්ථාවක් එළඹුන විට පවා බලාපොරොත්තු සුන්වීමෙන් මාරයා කේන්තියෙන් පලා ගියේය." (ලලිත විස්තරය xviii)

ගියේය." (ලූක් 4:13)

දේව මාලිගයේ කොත මුදුනේ සිට පහළට පැනීමට සලස්වා ජේසුස් වහන්සේ දෙවන වරටත් පෙළඹවීමට කරන ලද උත්සාහය සාමාන්‍යයෙන් යුදෙව් සම්ප්‍රදායට එකඟ නොවේ. මෙහිදී පැරණි තෙස්තමේන්තුවෙන් උපුටා ගෙන ඇති සියලු විස්තර ගොතන ලද කරුණු වේ. එවැනි අසාමාන්‍ය ක්‍රියාවන් මගින් ජේසුස් වහන්සේගේ දිව්‍යමය බලය පෙන්නුම් කළ හැක්කේ කෙසේද? උග්‍ර ආගම් උන්මාදයකින් පෙලුනු 'සිමන් මාගස් නමැති පුද්ගලයා විසින් ප්‍රදර්ශනය කරන ලද'යි සැලකෙන පරිදි කිසියම් සෘද්ධි බලයක් අනිසි ලෙස යොදා ගැනීමක් එන් අදහස් වේ. එවැනි ආකාරයේ පෙළඹවීමක් පිළිබඳ කථා ප්‍රවෘත්තියක් බොහෝ දුරට අහසින් ගමන් කිරීමට පවා හැකියාවක් ඇතැ'යි සැලකෙන ඉන්දියානු ශාස්තෘවරයින් සම්බන්ධයෙන් යොදා ගැනීම වඩා යෝග්‍යය බව පෙනී යයි.

මතෙව්ගේ ශුභාරංචියේ දක්වා ඇති පරිදි යක්ෂයා විසින් අවසාන වරට ජේසුස් වහන්සේගේ නොසැලෙන ආත්ම විශ්වාසය පරීක්ෂා කිරීම සඳහා ලෝකයේ ආධිපත්‍යය පිරිනමන බව ප්‍රකාශ කළ විට උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. එපරිද්දෙන්ම මාරයා විසින් ගෞතමයන් වහන්සේ පොළඹවා ගැනීමට ක්‍රියාකළ සැටි නිධාන කථාවේ සඳහන් වේ.[30] තරුණ සිදුහත් කුමරා නගරයේ දොරටුවෙන් පිටතට ගමන් කරමින් සිටියදී මාරයා එතුමා ඉදිරියට පැමිණ දින හතක් ඇතුළතදී චක්‍රවර්ති රජකම ලබාදෙන බවත් එවිට කුමරුවා මුළු ලෝකයේම පාලකයා වන බවත් මාරයා ප්‍රකාශ කරයි. චක්‍රවර්ති රජකම ලැබෙන බව තමා දන්නා බවත්, රජකමට වඩා බුද්ධත්වය ලබා ගැනීම තමාගේ අභිප්‍රාය බවත් උන්වහන්සේ මාරයාට පිළිතුරු දෙමින් ප්‍රකාශ කළහ. මාරයාගේ මෙම පෙළඹවීම ගෞතමයන් වහන්සේගේ අනාගතය සම්බන්ධයෙන් පළකර තිබූ අනාවැකි සමඟ හොඳින් ගැළපේ. අප මීන් පෙර සඳහන් කළ පරිදි සිදුහත් කුමරු මෙලොව බිහිවූ අවස්ථාවේදී එතුමා අනාගතයේදී චක්‍රවර්ති රජෙක් වන බවත් එසේ නොවුනහොත් බුදුවන බවත් අසිත තවුසා අනාවැකියක් පළකර තිබුණි. පසුකාලයේදී

ධර්මානුකූල ජීවිතයක් ගත කිරීම බුදු දහමේ දැක්වෙන මූලික සදාචාරාත්මක ඉගැන්වීමක් විය. ඒ බව ධම්මපදයේ පැහැදිලිව දක්වා තිබේ. QS 52 ඇතුළත් කර ඇති ජේසුස් වහන්සේ තුළ පැවති ධම්මපදයේ අදහස් වලට සමාන සිතුවිලි ශුභාරංචියේ සාරාත්මක පොත් ලියූ කතුවරයින් විසින් යොදාගෙන තිබේ.

"මුළු මහ පොළොවෙහි රජකමටත් (සක්විති රජකමටත්) වඩා, දෙව්ලොව දෙව් සැප ලැබීමටත් වඩා, සියලු ලෝකයන්හී අධිපති කමටත් වඩා සෝවාන් ඵලය උතුම් වේ." (ධම්මපදය 13:12 ලෝක වග්ගය)

"යමෙක් මුළු ලෝකයම ජය ගත්තත් තමා පාලනය කර නොගතහොත් ඉන් කවර නම් ඵලයක්ද? ඔහු එය නැති කර ගන්නා වැනිවේ. (ලූක් 9:25) යමෙක් මුළු ලෝකයම දිනා ගත්තත් තමා ජයගත නොහේ නම් ඔහුට කිනම් ප්‍රයෝජනයක් අත්වේද?" (මතෙව් 16:26, මාක් 8:36)

මෙහි දක්නට ලැබෙන සමානකම් අතිශයින් වැදගත් වේ. ප්‍රථමයෙන්ම මීට කලින් QS 52 වශයෙන් සඳහන් කළ ජේසුස් වහන්සේගේ ප්‍රකාශයට ඉහත සී උද්ධෘතයන් ඒවායේ අන්තර්ගතය සහ ව්‍යුහය අතින් ඉතා කිට්ටු සමානත්වයක් පෙන්නුම් කරයි. එනිසා එම ප්‍රකාශ ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා බව උපකල්පනය කළ හැකිය. එම කරුණු පිළිබඳව මාක් විසින් දැන ගෙන සිටීම එම උපකල්පනයට බාධාවක් නොවේ. එම කථා ප්‍රවෘත්ති Q^1 මූලාශ්‍රයේ ඇතුළත්ව තිබෙන්නට ඇති බවත් එනිසා මාක් විසින් එම ප්‍රකාශ Q^1 මූලාශ්‍රයෙන් උපුටා ගන්නට ඇති බව සිතීමට පුළුවන. එනිසා QS 52 ඇතුළත් ප්‍රකාශයේ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් විසින් පිළිපැදිය යුතු ආකාරය විස්තර කර තිබේ. ඔවුන් සියලු පවුල් බැඳීම් ඉවත දමා පැමිණිය යුතුබව ප්‍රකාශ කරන අලුත් මාතෘකාවක් එයට පාදකවී තිබේ. "තම පියා හෝ මව හෝ අත්නොහරින කිසිවෙකුට මගෙන් ඉගෙනීමට නොහැකිවනු ඇත. තම පුතුයා හෝ දියණිය අත් නොහරින කිසිවකුට මාගේ ගෝලයකු විය නොහැකිය." යි ජේසුස් වහන්සේ ප්‍රකාශ කරයි. ඉන්පසු උන්වහන්සේ තම අනාගත ශ්‍රාවකයින්ට තමන් පිළිබඳව ආත්ම අවබෝධයකින් යුක්තව තමන් වහන්සේගේ 'පියගහ'ට කර දෙන ලෙස ආයාචනය කරයි. මීට කලින් උපුටා දක්වා ඇති "යමෙක් මුළු ලෝකයම ලබා ගත්තත් තමා ජයගත නොහේනම් ඔහුට කිනම් ප්‍රයෝජනයක් අත්වේද" යන ප්‍රකාශය කර ඇත්තේ ඉන් අනතුරුවය. එම ප්‍රකාශයෙන් උන්වහන්සේ අදහස් කරනු ලැබුයේ ලෞකික සැප සම්පත් කෙරෙහි පමණක් තැබුරුවීමෙන්

මිනිසුන්ට ඔවුන්ගේ ජීවිතවල සැබෑ අර්ථය අහිමි වන බවය. මෙහිදී 'ජීවිත වල සැබෑ අර්ථය' යනුවෙන් අදහස් කර තිබෙන්නේ ආධ්‍යාත්මික වශයෙන් විමුක්තිය ලබාගැනීම කෙරෙහි යොමුවූ ජීවන මාර්ගයකි. ධම්මපදයෙන් උපුටා දක්වා ඇති ගාථාවෙන් ප්‍රකාශ වන්නේද එම අදහසමය. සෝවාන් මාර්ගය යනු විමුක්ති මාර්ගය මිස වෙන කිසිවක් නොවේ. 'සොතාපන්න' නැමැති පාලි වචනයෙන්, ධර්ම මාර්ගයට පිළිපන් පුද්ගලයා යන අර්ථය ගෙන දේ. එවැනි පුද්ගලයකු අනිවාර්යෙන්ම අනාගත භවයකදී රහත් ඵලයට පැමිණීම ඒකාන්තය.

ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත්වූ මොහොතේත් ඉන් පසුවත් උන්වහන්සේ ලෞකිකත්වය කෙරෙහි නම්මවා ගැනීමට මාරයා කිප වාරයක්ම උත්සාහ කළේය. මෙම කථා ප්‍රවෘත්තිය පුද්ගලිකව තමන්ගේ විමුක්තිය පමණක් සලකා ගැනීම සහ දුකින් පෙළෙන සියලු සත්වයින් දුකින් මුදා ගැනීම සඳහා ධර්මය දේශනා කිරීම පිළිබඳ තීරණයට එළඹීම පිළිබඳ අවස්ථාව සමඟ මැනවින් ගැළපේ. නමුත් යක්ෂයා විසින් ජේසුස් වහන්සේ පාපයට පෙළඹවීමට තැත් කිරීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය ශුභාරංචියේ පොත් වලට ඇතුළත් කරන ලද්දේ කවර හේතුවක් නිසාදැයි වටහා ගැනීම තරමක් අසීරුය. ධර්මය දේශනා කළයුතුද නැද්ද යන කාරණය පිළිබඳ ගෞතමයන් වහන්සේ තුළ එක්තරා අවස්ථාවකදී යම්කිසි සැකයක් පැවතුණි. නමුත් බයිබලයේ එන කථා ප්‍රවෘත්තියට අනුව ජේසුස් වහන්සේ තුළ එවැනි සැකයක් නොවීය. ජේසුස් වහන්සේ පෙළඹවීමට යක්ෂයා උත්සාහ කළේ බෞතිස්ම ස්නාපනයෙන් පසු උන්වහන්සේ දෙවියන්ගේ පුත්‍රයා බව ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුවය. එසේ නම් උන්වහන්සේට ලෝකාධිපත්‍යය ලබාදෙන බවට නිරර්ථක පොරොන්දුවක් දෙන්නේ ඇයි? එපමණක් නොව ලෝකාධිපත්‍යය පිළිබඳව යුදෙව් ජාතිකයන් අතර පැවති විශ්වාසය දිවැසිවරුන්ගේ සහ එළිදරව්ව පිළිබඳ ප්‍රකාශවල සඳහන් කර තිබුණේ දේශපාලන ආධිපත්‍යයකට වඩා ලෝක විනිශ්චයේදී ලබාගත හැකි ආධ්‍යාත්මික ශක්තියක් වශයෙනි. දේශපාලන ක්ෂේත්‍රයේ ඊශ්‍රායලයට හිමිවූයේ ද්විතීයක තත්වයකි. එය ශත වර්ෂ ගණනාවක් තිස්සේ අඛණ්ඩව විවිධ ජාතීන්ගේ පාලනයට යටත්ව පැවතියේය. එබඳු රටක වසන පුද්ගලයකුට ලෝකාධිපත්‍යය ලබාදීමේ පොරොන්දුවක් දීම පිළිබඳ කථා ප්‍රවෘත්තියක් ඇතුළත් කර තිබීම විශ්වාස කළ නොහැකිවා පමණක් නොව තේරුම් ගැනීමද අසීරුය.

නමුත් ඉන්දියාවේ පැවතියේ ඊට වඩා හාත්පසින්ම වෙනස් තත්වයකි. ලෝක පාලකයකු හෙවත් චක්‍රවර්තී රාජ සංකල්පය ඉන්දියාවේ ප්‍රචලිතව පැවති මතයකි. මෞර්ය අධිරාජ්‍යයේ නිර්මාතෘ වරයා වූ

චන්ද්‍රගුප්ත මෞර්ය තම අධිරාජ්‍යය ඉන්දියාවේ විශාල ප්‍රදේශයක ව්‍යාප්ත කරන ලදී. ඔහු චක්‍රවර්ති රජෙකුගේ මූර්තියක් බඳු විය. චක්‍රවර්ති නමැති වචනයෙන් අදහස් වන්නේ ජයග්‍රාහී විලාසයකින් රාජකීය රථ සේනාවට සමස්ත ලෝකය පුරා ගමන් කරවීම හෙවත් එමගින් තම බලය ප්‍රදර්ශනය කිරීමය. බුදු දහමේ මෙම අදහස ආගමික සන්දර්භයක් තුළ යොදාගෙන තිබේ. එනම් සත්‍යය හා යුක්තිය රජයන ලෝකයක් නිර්මාණය කිරීම හෙවත් දම්සක් පැවැත්වීමය.

පසු කාලයේදී බුදු පිළිමය නිර්මාණය කළ මූර්ති ශිල්පීන් හස්ත මුද්‍රා දැක්වීමේදී එක් හස්තයක් පිළිමය දෙසටත් අනෙක් හස්තය ඉදිරිපසටත් සිටිනසේ තෙලා තිබේ. දම්සක් පැවැත්ම නිරූපණය කරන මේ ඉරියව්ව ධම්ම චක්ක මුද්‍රාව නමින් හැඳින්වේ.

ජේසුස් වහන්සේගේ දේශනා සියල්ල සලකා බැලීමෙන් උන්වහන්සේගේ ශ්‍රාවකයින් විසින් නිර්මාණය කරන ලද මාතෘකා වල (Motif) දක්නට ලැබෙන බෞද්ධ ලක්ෂණ තේරුම් ගැනීම පහසු වේ. එක් අතකින් සලකා බැලීමේදී බෞද්ධාගම ප්‍රගුණ කළ අය උන්වහන්සේගේ ශ්‍රාවකයන් අතර සිටින්නට ඇතැයි කල්පනා කිරීමට පවා පුළුවන. එම ශ්‍රාවකයින් ජේසුස් වහන්සේ බුදු කෙනෙකු ලෙස සලකා ගෞතමයන් වහන්සේගේ ජීවන චරිතය පිළිබඳ පුරාණෝක්ති වල දැක්වෙන කථා ප්‍රවෘත්ති ජේසුස් වහන්සේගේ චරිතය ගොඩනැංවීම සඳහා යොදාගත හැකියයි කල්පනා කරන්නට ඇත. යක්ෂයා විසින් ජේසුස් වහන්සේ පරීක්ෂාකිරීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය උන්වහන්සේගේ ශ්‍රාවකයන් විසින් ශුභාරංචියේ පොත් වලට ඇතුල් කරන්නට ඇත්තේ එවැනි පසුබිමක් තුළ වන්නට පුළුවන.

ජේසුස් වහන්සේට ස්නාවක ජොහන් ජෝර්දානයේදී හමුවීම

ජේසුස් වහන්සේ පිළිබඳ තොරතුරු ලබාගත හැකි වාර්තා Q මූලාශ්‍රයේ ඇතුළත් වී තිබේ. උන්වහන්සේගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණ එහිදී අපට හමුවේ. කෙසේ වෙතත් එතුමාගේ ජීවන චරිතය පිළිබඳව අපට දැනගත හැක්කේ ඉතාමත් සීමිත තොරතුරු ප්‍රමාණයක් පමණි. ජේසුස් වහන්සේගේ ළමාවිය පිළිබඳ කිසිම තොරතුරක් එහි සඳහන් කර නොමැත. ශුභාරංචියේ පොත්වල සහ එළිදරව්ව පිළිබඳ ප්‍රකාශ වල ඇතුළත් කරුණු පිළිබඳව හොඳින් පරීක්ෂාකර බැලීමේදී ඒවා වෙනත් බාහිර මූලාශ්‍රවලින් ආභාෂය ලබා

ඇති අතර විශේෂයෙන්ම, ඉන්දියානු කථා ප්‍රවෘත්ති වලින් පෝෂණය ලබා නිර්මාණය කර ඇති බව පෙනීයයි. Q මූලාශ්‍රයේ දක්නට ලැබෙන ජේසුස් වහන්සේගේ ජීවිතයට සම්බන්ධව එකම සිද්ධිය ලෙස සැලකිය හැක්කේ ස්නාවක ජොහන් නමින් හැඳින්වෙන දිවැසිවරයාගේ හමුවීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය පමණි. එය ප්‍රදෙව් ප්‍රද්ධය පැවති සමයේදී Q මූලාශ්‍රයට එකතු කරන ලද කථා ප්‍රවෘත්තියක් බව පෙනේ. එම කථා ප්‍රවෘත්තියද ඉදිරිපත් කර ඇත්තේ වක්‍ර ආකාරයකිනි.

ජේසුස් වහන්සේ පළමුවරට මහජනයා අතරට පැමිණීමේ සිද්ධිය බුදුන් වහන්සේ සම්බන්ධයෙන් පවතින කථා ප්‍රවෘත්තියකට බොහෝ දුරට සමාන කමක් පෙන්නුම් කරයි. ජේසුස් වහන්සේ මහජනයා ඉදිරියට පැමිණෙන්නේ උග්‍ර තපස් ව්‍රත ආරක්ෂා කරන මහස්නාපනයට* පත්වූ දිවැසිවරයකු ලෙස එවකට ප්‍රසිද්ධියක් ඉසිලූ ස්නාවක ජොහන්ගේ ශ්‍රාවකයකු වශයෙනි. සිද්ධාර්ථ කුමාරයාද ගිහිගෙයින් නික්ම සත්‍යය සොයමින් විවිධ ශාස්තෘන් වහන්සේලා වෙත ගියහ. අවසානයේදී සිද්ධාර්ථ කුමාරයා උද්දක රාමපුත්‍ර නමැති තවුසා වෙත ගොස් එතුමාගේ දර්ශනය ඉගෙන ගත්තේය. ජොහන් ජේසුස් වහන්සේට සලකන ලද්දේ යම් ආකාරයකටද එපරිද්දෙන්ම උද්දකාරාම තවුසා බෝසතාණන් වහන්සේට ඇදුරු තනතුර දී අතවැසියන් පවා පවරා දීමට කැමති විය. එනිසා උද්දකාරාම පුත්‍ර තවුසා බෝසතාණන් වහන්සේගේ 'ජොහන්' ලෙස හැඳින්වීමට පුළුවන. ජේසුස් වහන්සේ බෞතීස්ම කිරීමෙන් පසු ජොහන්ගෙන් වෙන් වී ගියේ යම්සේද එපරිද්දෙන්ම උද්දකරාමපුත්‍ර තවුසාගේ ඉගැන්වීම් සත්‍යාවබෝධය සහ විමුක්තිය සලසා ගැනීමට පිටිවහලක් නොවන බව වටහාගත් බෝසතාණන් වහන්සේ මෙම ගුරුවරයාගෙන් සමුගෙන එතැනින් බැහැර විය. සත්‍යය අවබෝධ කරගැනීම පිණිස උග්‍ර තපස් රැකීම පිණිස උන්වහන්සේ හුදකලා ප්‍රදේශයකට වැඩම කළහ. ජොහන් විසින් බෞතීස්ම කරවීමෙන් පසු ජේසුස් වහන්සේද පාළුකරයට වැඩමකර නිරාහාරව සිටියහ. උද්දකාරාම තාපසයාගේ අනුගාමිකයින් පස් දෙනෙක් බෝසතාණන් වහන්සේ සමග පැමිණියහ. ඒ ආකාරයෙන්ම ජේසුස් වහන්සේගේ මුල් ශ්‍රාවකයින් බවට පත්වූයේ ස්නාවක ජොහන්ගේ අනුගාමිකයින්ය (ජොහන් 1:35-39). උග්‍ර තවුස් දම් පිරීමෙන් තම ඉෂ්ටාර්ථය සපුරාගත නොහැකි බව ප්‍රත්‍යක්ෂකර ගැනීමෙන් පසු උන්වහන්සේ ශරීරයට අධික ලෙස දුක් දීමෙන් විමුක්තිය සෙවීමේ උත්සාහය අතහැර දමා ඇතැයි සිතූ

* පශ්චාත්තාපවීම හෙවත් පව් ගැන තැවීම යන අර්ථය දෙන ග්‍රීක් "මෙටනොයියා" යන වචනයේ සිදී ආ වචනයකි. දෙවියන් වහන්සේ වෙත හැරී උන්වහන්සේ කෙරෙහි සිත ස්ථිරව පිහිටුවා ගැනීම මින් අදහස් වේ.

පස්වග මහණුන් උන්වහන්සේ හැර ගියහ. මෙම කථා ප්‍රවෘත්තිය නව තෙස්තමේන්තුවේ මතෙව්ගේ ශුභාරංචියේ දැක්වෙන පහත දැක්වෙන සිද්ධිය සිහිපත් කරවයි. "ජොහන් කමින් බොමින් ආවේ නැත.... මනුෂ්‍ය පුත්‍රයාණෝ කමින් බොමින් ආ සේක" (ජොහන් 11:16-19). බුද්ධත්වයට පත්වූ පසු පස්වග මහණුන් වාසය කළ ඉසිපතනයට වැඩම කර ධර්මය අවබෝධ කරවූ සේක. බුදුන් වහන්සේගෙන් බණ ඇසූ පළමු පිරිස වූයේ පස්වග මහණුන්ය.

මෙම කථා ප්‍රවෘත්ති වල එන පුද්ගල චරිතවල දැක්වෙන සමානකම් එතරම් පැහැදිලි නැත. නමුත් එම සිදුවීම් වල අපූර්ව සමානකමක් තිබෙන බව පෙනේ. මීට කලින් ශුභාරංචිය පිළිබඳ පොත්වල ජේසුස් වහන්සේ හඳුන්වා දී තිබුණේ පාළුකරයෙහි ජීවත්වූ ආදර්ශමත් දිවැසිවරයකුවූ ජොහන් මෙන් නොව පිරිසේ කමින් බොමින් ජීවත්වූ පුද්ගලයකු වශයෙනි. එවැනි පසුබිමක් තුළ බෞතීස්ම ස්නාපනයට පසු ජේසුස් වහන්සේ පාළුකරයට ගොස් නිරාහාරව සිටීම ශුභාරංචියේ සඳහන් කර ඇති තවත් නොගැළපෙන සිදුවීමක් ලෙස පෙනේ. විවිධ සම්ප්‍රදායන්ට අයත් චරිත විස්තර වල මිශ්‍රණයක් මෙම කථා ප්‍රවෘත්තියට ඇතුළත් වී තිබෙන බව පෙනේ. මෙහිදී එක් අතකින් ජොහන්ගේ අනුගාමිකයින් විසින් සපයා දුන් තොරතුරු සහ ශුභාරංචියේ පොත් ලියූ කතුවරයින් විසින් ජේසුස් වහන්සේගේ චරිතය විසිතුරු විස්තර තොරතුරු වලින් පිරවීම සඳහා බෞද්ධ මූලාශ්‍රවලින් උපුටා ගත් කථා ප්‍රවෘත්තිද ඇතුළුව අතිරේක තොරතුරු රාශියක් ඊට ඇතුළත් කර තිබෙන බව පෙනේ. මෙහිදී අප විසින් සලකා බලනු ලබන්නේ ක්‍රිස්තියානි ආගමේ ඉතිහාසය පිළිබඳ ඉතා වැදගත් කාරණයක් පිළිබඳවය. ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතයේ තිහේ දශකයේ මැද භාගයේදී පමණ තම පණිවිඩය දේශනා කිරීම පිණිස ස්නාවක ජොහන්ගේ බලපෑමෙන් මිදී නිදහස්වීමට කලින් පැවති ආගමික පරිසරය එයින් විස්තර වේ. ශුභාරංචියේ පොත්වල දැක්වෙන පරිදි ජොහන් එකල විසූ ඉතා වැදගත් ස්ථානයක් ඉසුලූ පුද්ගලයකු බව පෙනී යයි. එකල ජේසුස් වහන්සේ ජීවත්වූයේ කිසියම් ප්‍රසිද්ධියක් නොතිබූ අප්‍රකට පුද්ගලයකු වශයෙනි. නමුත් ජොහන් එකල විසූ සුප්‍රකට දිවැසිවරයකු විය. ජේසුස් වහන්සේ සහ ස්නාවක ජොහන් හමුවීම විස්තර කරන මෙම කථා ප්‍රවෘත්තියේ දක්නට ලැබෙන බෞද්ධ තොරතුරු පිළිබඳව අප සලකා බැලිය යුත්තේ ඒවා කොතරම් දුරට එකී අවස්ථාවට ගැළපේද, නොඑසේ නම් එම කථා ප්‍රවෘත්තිවලින් දැක්වෙන්නේ සැබෑ සිදුවීම්ද කියා සොයාබැලීමට නොවේ. එම කථා ප්‍රවෘත්ති වැදගත් වන්නේ එමගින් සම්ප්‍රදායන් දෙකක හමුවීම පැහැදිලි කිරීමට සහ ජේසුස් වහන්සේ පිළිබඳ මතකය තහවුරු කිරීමට උපකාරී වන හෙයිනි.

ස්නාවක ජොහන් ජීවත් වූ පසුබිම තුළම ජේසුස් වහන්සේගේ චරිතය නිර්මාණය කළයුතු බවත්, ඒ සමගම උන්වහන්සේගේ පෞරුෂය බුදුන් වහන්සේගේ ජීවන චරිතය හා සම්බන්ධ කථා ප්‍රවෘත්ති වලින් සැරසිය යුතුබවත් ඔවුහු කල්පනා කළහ.

Q මූලාශ්‍රයේ ස්නාවක ජොහන් හඳුන්වා දී තිබෙන්නේ බැතිමතුන් බෞතිස්ම ස්නාපනය* කරන්නා (The Baptist) සහ පුද්ගලයින් මනස්තාපනය කිරීමට සලස්වන්නාවූත්, ආගමට හරවා ගන්නාවූත් කාරුණික දිවැසිවරයකු ලෙසය. ඊට පසු ජේසුස් වහන්සේ සහ කපර්නවුම්හි ශතාධිපතියා (යුධ භටයා) පිළිබඳ කථා ප්‍රවෘත්තිය දැක්වේ. ජේසුස් වහන්සේ වැනි වැදගත් පුද්ගලයකු තම නිවසට පැමිණීමට තරම් තමා නොවටිනා බව මෙහිදී යුද භටයා ප්‍රකාශ කරයි. එනිසා ඔහුගේ කැමැත්ත පරිදි උන්වහන්සේ යුද භටයාගේ නිවසට නොගොස් එහි සිටි අංශභාග රෝගයෙන් පෙළෙමින් සිටි ඔහුගේ මෙහෙකරුවා සුවපත් කරයි. ජේසුස් වහන්සේ විසින් පුද්ගලයින් සුවපත් කිරීමේ මෙහෙය පිළිබඳව සිරගෙදර සිටි ජොහන්ට දැනගන්නට ලැබේ. ජේසුස් වහන්සේ යනු ශුද්ධ ලියවිල්ලේ එළිදරව්වේ සඳහන් කර ඇති පැමිණීමට සිටින ගැලවුම්කාරයාද! නැතහොත් වෙනත් ගැලවුම්කාරයකුගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටිය යුතුදැයි දැනගැනීම පිණිස ජොහන් තම ගෝලයින් ජේසුස් වහන්සේ වෙත පිටත්කර යවයි. එවිට ජේසුස් වහන්සේ රැස්ව සිටි සෙනග අමතා ජොහන් යනු මිනිසුන් අතර පහළවූ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා බවත්, ඔහු දිවැසිවරයකු පමණක් නොව ශුද්ධ ලියවිලිවල සඳහන් කර ඇති ක්‍රිස්තුවරයාගේ පැමිණීම පිළිබඳ පූර්ව නිමිත්ත ප්‍රකාශ කරන්නා බවත් ප්‍රකාශ කරයි. තාපසයකු වන ජොහන්ට අවමන් කිරීම ගැනත්, තාපසයකු නොවූ තමන් වහන්සේට කෑදර පුද්ගලයකු සහ බේබද්දෙකු යැයි චෝදනා කිරීම ගැනත් ජේසුස් වහන්සේ මේ (වර්තමාන) පරම්පරාවට තදින් තරවටු කරයි. අවසානයේදී උන්වහන්සේ ගැලීලියේ මනස්තාපනය නොවූ මිනිසුන් ජීවත්වූ නගරවලටද වරද තබමින් කතා කරයි.

Q^2 මූලාශ්‍රය මගින් ජේසුස් වහන්සේගේ දේශනාවලට මුල්දී එකතු කරන ලද විස්තර කරුණු කීපයක් නිසා වැදගත්වේ. මෙම තොරතුරු ප්‍රබන්ධිත නිර්මාණ ලෙස මොහොතකට සිතා ගනිමු. එම කථා ප්‍රවෘත්තිවල ඓතිහාසික පසුබිම පහත දැක්වෙන පරිදි ගොඩනැගිය හැකිය. ස්නාවක ජොහන් එකල විසූ සුප්‍රකට දිවැසිවරයකු විය. එකල ජෙරුසලමේත් මුළු ජුදා දේශයේ සහ ජෝර්දාන් අවට ප්‍රදේශවල වැසියෝ

* ළදරුවෙකු හෝ වැඩිහිටියෙකු ක්‍රිස්තියානි සභාවට ඇතුළත් කිරීමේදී සිදු කරනු ලබන සත්කර්මයකි.

ඔහු වෙත පැමිණ පාපෝච්චාරණය කරමින් ජෝර්දාන් ගංගාව අසලදී ඔහු අතින් බව්තීස්ම ස්නාපනය ලැබූහ. (මතෙව් 3:5) එසේම බැතිමතුන් ජෝර්දාන් ගංගාවේ ජලයේ ඔබා බව්තීස්ම ස්නාපනය කරනු ලැබූ ස්ථානය පිහිටා තිබුණේ විවිධ ආගමික නිකායන්ට අයත්වූ යුදෙව් ජාතික ආගමික කණ්ඩායම් කීපයක් වාසය කළ කුම්රාන් නමැති ස්ථානයේ සිට පැය තුනකින් පමණ පා ගමනින් යා හැකිවූ කාන්තාරයේ පිහිටි ගෝර් දිස්ත්‍රික්කයේය. කුම්රාන්හි පැවති ආගමික නිකායන් මගින් අනුගමනය කරනු ලැබූ ඇදහිලි ක්‍රම ස්නාවක ජොහන් විසින් අනුගමනය කරනු ලැබූ ක්‍රම වලට බොහෝ දුරට සමාන විය. දියේ ඔබා බෞතීස්ම කිරීම මගින් බැතිමතුන් පිරිසිදු කිරීම කුම්රාන් හි පැවති චාරිත්‍රයක් විය. එයින් අදහස් කරන ලද්දේ යම්සේ ඔවුන් ජලයෙන් පිරිසිදු කරනු ලබන්නේද, එපරිද්දෙන්ම දෙවියන් වහන්සේ විසින්ද ශුද්ධවූ ජලය ඉසීමෙන් ඔවුන් පිරිසිදු කරනු ලබන බවත්, එසේ කිරීම තුළින් ආගමික කණ්ඩායමට ඇතුළුවීමට සුදුසුකම් ලබන බවත් ඔවුන්ට අවබෝධ කරවීමය. ජොහන් කුම්රාන් ආගමික නිකායට අයත්වූ සාමාජිකයකුව සිටි බවත්, ස්වතන්ත්‍ර ආගමික සම්ප්‍රදායක් ගොඩ නැගීමට ප්‍රථම ඔහු කුම්රාන් සමාජයේ ආගමික කටයුතු වලට එක්තරා අන්දමකින් බාහිර වශයෙන් හෝ සම්බන්ධව සිටින්නට ඇති බවත් සිතිය හැකිය.

ඔහු විසින් ප්‍රකාශ කළ ආගමික පණිවිඩය ශුද්ධ වූ ලියකියවිලි වල සඳහන් වන ගැලවුම්කාරයකුගේ පහළවීම ප්‍රකාශ කරන එළිදරව්ව පිළිබඳ පණිවිඩයක් විය. ලෝක විනාශය අත ළඟ බවත් ඊට පසු දෙවියන්ගේ රාජ්‍යයක් බිහිවන බවත්, තමාට වඩා ශ්‍රේෂ්ඨවූත්, බලවත්වූත්, වටිනාවූත්, ගැලවුම්කාරයකු පහළවන බවත් ඔහු ස්ථිර ලෙස ප්‍රකාශ කළේය. කුම්රාන් වැසියෝද දෙවියන්ගේ රාජ්‍යය සහ ඒරොන් සහ ඊශ්‍රායල් ප්‍රදේශවල ගැලවුම්කරුවන් දෙදෙනෙකුගේ පහළවීම පිළිබඳ බලාපොරොත්තුවෙන් සිටියහ. කෙසේ වෙතත් ස්නාවක තෙමේ කුම්රාන් ආගමික නිකායට එතරම් අනුග්‍රහයක් දැක්වූයේ නැත. ඔහු මිනිසුන්ට මනස්තාපනය වී පිරිසිදු වන ලෙස කියා සිටියේය. ඔවුන්ට බව්තීස්ම ස්නාපනය ලබාදී පිටත් කර යැවීය.

ඒ කාලයේදී යුදෙව් ජාතිකයින් විසින් කිසියම් පුද්ගලයකු ශ්‍රේෂ්ඨ දිවැසිවරයකු ලෙස සලකනු ලැබුවේද, ඔහු අන් කිසිවකු නොව ස්නාවක ජොහන් විය. ඔහුගේ ආගමික ව්‍යාපාරය තුළින් ශුද්ධ ලියවිලි වල සඳහන් කර තිබූ ගැලවුම්කාරයාණන් ඉක්මනින්ම පැමිණෙනු ඇතැයි මිනිස්සු බලාපොරොත්තු වූහ. අසාධාරණය සහ අකටයුතුකම් නිර්දය ලෙස හෙළා දකිමින් කටයුතු කළ දිවැසිවරයකුවූ ස්නාවක ජොහන්ගේ කීර්තිය කොතරම් දුර පැතිර ගියේද යත් ඒවා ගැලීලිය සහ පෙරෙයියා (Paraea)

පාලකයා වූ හෙරෝද් ඇන්ටිපස්ට පවා දැන ගන්නට ලැබුණි. ජොහන් තමාට තර්ජනයක් විය හැකි බව හැඟී ගිය නිසා හෙරෝද් ඔහු සිරභාරයට ගෙන පසුව මරා දැමුවේය. එනිසා මේ අවස්ථාවේදී යම් කිසිවෙකුට විශේෂයෙන්ම ආගමික ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සුදුසු අවස්ථාවක් බලාපොරොත්තුවෙන් සිටි කෙනෙකුට ස්නාවක ජොහන්ට වඩා වැදගත්වූ පුද්ගලයකු ප්‍රසිද්ධියට පත්කිරීමට වුවමනා වූයේ නම් එසේ ප්‍රසිද්ධියට පත්කරනු ලබන පුද්ගලයාගේ ශ්‍රේෂ්ඨත්වය ජොහන් ලවාම ප්‍රකාශ කරවීම ප්‍රඥාගෝචර ක්‍රියාවක් විය. Q[2] මූලාශ්‍රයට එකතු කරන ලද කථා ප්‍රවෘත්ති වලින් කර තිබෙන්නේ එම කාර්යයයි. ඒ අනුව ස්නාවක ජොහන් ශ්‍රේෂ්ඨ දිවැසිවරයකු ලෙස හඳුන්වා දෙමින් මහත් ප්‍රශංසාවට ලක් කර තිබේ. එපමණක් නොව ජේසුස් වහන්සේ තමන්ට වඩා ශ්‍රේෂ්ඨ පුද්ගලයකු බවත් උන්වහන්සේ විසින් කරන ලද ප්‍රාතිහාර්ය පිළිබඳ විස්තර තොරතුරු ඇසීමෙන් ඔහු පුදුමයට පත්වූ බවත් එහි සඳහන් වේ. ඊට අමතරව ජේසුස් වහන්සේ ලවා ජොහන් පිළිබඳ ප්‍රශංසාත්මකව කථා කරවමින් ජොහන් යනු ජේසුස් වහන්සේගේ පැමිණීම පිළිබඳ පෙරනිමිති පළකරන්නා ලෙස හඳුන්වා දෙමින් විසිතුරු වර්ණනාවක් කර තිබේ. ඒ අනුව සලකා බැලීමේදී ස්නාවක ජොහන් කළ පරිදි ජේසුස් වහන්සේද අසාධාරණය සහ අයුක්තිය හෙළා දකිමින් කථා කළ බව පැහැදිලි කිරීම සඳහා කථා ප්‍රවෘත්ති ඉදිරිපත් කර තිබීම තර්කානුකූලය.

කරුණු මේ ආකාරයෙන් සලකා බැලීමේදී මේ සම්පූර්ණ කථාවම ගැලවුම්කාරයකුගේ ආගමනය අපේක්ෂාවෙන් සිටි මිනිසුන්ට පිළිගත හැකි වන අයුරු ජේසුස් වහන්සේගේ චරිතය නිර්මාණය කිරීම සඳහා ලියන ලද සාර්ථක ප්‍රබන්ධ කථාවක් ලෙස කෙනෙකුට හැඟෙන්නට පුළුවන. යුදෙව් යුද්ධය පැවති කාලයේදී මෙම තොරතුරු ශුභාරංචියේ පොත් වලට ඇතුළත් කරන ලද්දේ එවැනි පරමාර්ථයක් මුල් කරගෙනද? සමහර විට එය එසේ වන්නට පුළුවන. බෞද්ධ ශ්‍රාවකයකු වූ ජේසුස් වහන්සේ ක්‍රිස්තියානි ආගමේ ගැලවුම්කාරයකු බවට පරිවර්තනය කරනු ලැබූ තීරණාත්මක අවස්ථාව මෙය විය. එපමණක් නොව එය සම්පූර්ණයෙන්ම ගොතන ලද ප්‍රබන්ධ කථාවක් නොව සත්‍ය සිදුවීම් පවා ඊට ඇතුළත් කර තිබෙන බව මෙම කථා ප්‍රවෘත්තියෙන් පැහැදිලි වේ.

ජේසුස් වහන්සේ යනු ඇත්ත වශයෙන්ම පැමිණෙන්ට සිටි ගැලවුම් කාරයාද නැද්ද යන කාරණය පිළිබඳව ජොහන් විසින් තම ගෝලයින්ට යොමුකළ ප්‍රශ්නය (මතෙව් 11:3) එවැනි සිද්ධියක් සැබැවින්ම ඇතිවූ බව පෙන්වන ලකුණකි. එවැනි සිද්ධියක් ඇති නොවූයේ නම් ජොහන්ගේ සිතේ එවැනි සැකයක් පහළවූ බව සඳහන් කිරීමට හේතුවක්

නොමැත. ජේසුස් වහන්සේ ගැලවුම්කාරයා බව ස්නාවක ජොහන් විසින් උන්වහන්සේ හමුවූ පළමු අවස්ථාවේදීම ප්‍රකාශ කරන්නට තිබුණි. එසේ කරනු ලැබූයේ නම් එය ඔවුන් බලාපොරොත්තු වූ පරමාර්ථයට වඩාත් හිතකර වීම නියතය. ජොහන්ගේ සිතේ පැවති එම සැකය ඔහුගේ අනුගාමිකයින්ද දැන සිටින්නට ඇත. ඒ නිසා එය නොසලකා හැරීමට නුපුළුවන් විය. තවත් හේතුවක් නිසා එසේ කළ නොහැකිවිය. ජොහන්ගේ ගෝලයින් ජේසුස් වහන්සේගේ අලුත් ගෝලයින් බවට හරවා ගැනීමට ඔවුන්ට වුවමනා විය.

මේ කාලය වනවිට ජේසුස් වහන්සේට වයස අවුරුදු තිහකට වඩා තරමක් වැඩිවිය. උන්වහන්සේ පළමුවරට ස්නාවක ජොහන්ගේ ශ්‍රාවයින් සමඟ කටයුතු කළ බවත්, තම සතුරාට පවා ප්‍රේමකිරීම, ස්වයං අවබෝධයක් ඇති කර ගැනීම, ආධ්‍යාත්මික මාර්ගයක් අනුගමනය කිරීම වැනි උන්වහන්සේ දැරූ පෙරලිකාරී බෞද්ධ අදහස් හේතු කොටගෙන උන්වහන්සේ විශේෂ වෙනසක් බලාපොරොත්තුවෙන් ජෙරිදානයට පිටත්ව ගිය වන්දනා නඩයේ විශේෂ අවධානයට ලක්වන්නට ඇති බව අපට නිගමනය කළ හැකිය. මෙසේ ස්නාවක ජොහන්ට අමතරව පෙරලිකාර අදහස් ප්‍රකාශ කරමින් ජේසුස් නම් වූ අපූරු පුද්ගලයෙක් හදිසියේ මතුවිය. ස්නාවක ජොහන්ගේ අනුගාමිකයින්ගෙන් සමහරෙක් ජේසුස් වහන්සේ වෙත ඇදී යන්නට ඇත. ජොහන්ගේ ශුභාරංචියට අනුව (ජොහන් 1:35-39) ජේසුස් වහන්සේගේ මුල් ශ්‍රාවකයින් වූයේ ඔවුන්ය. ස්නාවක ආගමික නිකායක සාමාජිකයින් වූ ජොහන්ගේ ගෝලයින් ජේසුස් වහන්සේ විසින් දේශනා කළ මෙම අලුත් බෞද්ධ ඉගැන්වීම පිළිගනු ලැබුවේ නම්, මෙම අලුත් ශ්‍රාවක පිරිසට ඇතුළත් කර ගැනීම පිණිස සමාන අදහස් දැරූ පුද්ගලයින් අතුරින් තව තවත් ශ්‍රාවකයින් සොයාගැනීමට ඔවුන් කටයුතු කළ බව තේරුම් ගැනීම පහසුය. එවැනි අනුගාමිකයින්ට මේ අලුත් ශාස්තෘවරයාගේ ඉගැන්වීම් පිළිගැනීම යෝග්‍ය බව ඒත්තු ගැන්විය හැක්කේ ඒ සඳහා තම නායකයා (ජොහන්) මැදිහත් කර ගැනීම මගින් පමණි. ඒ නිසා ස්නාවක ජොහන් සහ ජේසුස් වහන්සේ අතර අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාට ගෞරව කරනු ලැබූ බව ප්‍රකාශ කරන කථා ප්‍රවෘත්තිය ගොතන ලදී. ජේසුස් වහන්සේ විසින් ප්‍රාතිහාර්ය පෑම පිළිබඳව ජොහන්ගේ ගෝලයින් කොතරම් කලබලයට පත්වූවේද යන් ජොහන් තුළ සැකයක් ඇතිවිය. ඒ නිසා ඔහු තම ගෝලයින් කරුණු පරීක්ෂාකර බැලීම සඳහා පිටත්කර හරින ලදී.

Q අනුගාමිකයින් ජොහන්ගේ බෞතිස්ම නිකායට අයත්ව සිටි පුද්ගලයින් තමන් වෙත හරවා ගැනීම පිණිස බොහෝ කාලයක් අසාර්ථක උත්සාහයක් දරා පසුව ඔවුන් සමඟ සම්බන්ධකම් පවත්වමින් ඔවුන්

දැරූ එළිදැරව්ව පිළිබඳ අපේක්ෂාවන් පිළිගෙන ක්‍රියාකළ බව සිතිය හැකිය. කෙසේ වෙතත් ජේසුස් වහන්සේගේ ආගමික ව්‍යාපාරය මගින් වටිනා වස්තුවක් සේ ආරක්ෂා කරගත් උන්වහන්සේගේ දේශනා ඇතුළත් Q[1] මූලාශ්‍රය ශුභාරංචියේ විස්තර ඇතුළත් එකම පොත ලෙස බෞතිස්ම නිකාය නොපිළිගත්හ. මැන්ඩියන් නිකායිකයින් මෙන් බෞතිස්ම නිකායකයින්ද තම අති පූජ්‍ය ශාස්තෘවරයා ලෙස සලකනු ලැබුවේ ජොහන්ය. යුදෙව් යුද්ධය පැවති අර්බුදකාරී යුගයේදී බැප්ටිස්ට් නිකායට අයත් වැදගත් තැන් ඉසුලූ සාමාජිකයින් තම නිකායට හරවා ගෙන ඔවුන් ලවා ශුභාරංචියේ සඳහන් ජොහන්ගේ කථා ප්‍රවෘත්තියට විශේෂ තැනක් ලබා දී තම ශක්තිය වර්ධනය කර ගැනීමට උත්සාහ කළහ. ජේසුස් වහන්සේ ජොහන්ගේ අනුගාමිකයකු වූ බවත්, උන්වහන්සේ ජොහන් ඉතා උසස් කොට සැලකූ බවත් ශුභාරංචියේ සටහන් කරන ලදී. "මම ඔබට කියමි. මව් කුසින් බිහිවූ කිසිවෙක් ජොහන්ට වඩා ශ්‍රේෂ්ඨ නොවේ. (QS 17). ජේසුස් වහන්සේ විසින් ශ්‍රේෂ්ඨතම පුද්ගලයා ලෙස හඳුනාගත් මෙම සුප්‍රකට දිවැසිවරයා විසින් අනතුරුව ජේසුස් වහන්සේ යනු ගැලවුම්කාරයා ලෙස හඳුන්වාදී තිබේ. මෙසේ ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් උන්වහන්සේ ජොහන් විසින්ම ප්‍රකාශ කරනු ලැබූ ගැලවුම්කාරයා ලෙස බෞතිස්ම නිකායිකයින්ට ඉදිරිපත් කරයි. ජේසුස් වහන්සේ ගැලවුම්කාරයා ලෙස නොපිළිගැනීමෙන් ඔවුන්ට සිදුවිය හැකි අනර්ථය පිළිබඳ කිසියම් සැඟවුන අනතුරු හැඟවීමක් මේ ප්‍රකාශය තුළ ගැබ්ව තිබේ. කිසිම මිනිසෙක් ජොහන්ට වඩා ශ්‍රේෂ්ඨ නොවේය යනුවෙන් ජේසුස් වහන්සේ විසින් කර ඇති ප්‍රකාශයට අනතුරුව මෙසේද සඳහන් කර තිබේ: "එහෙත් ස්වර්ග රාජ්‍යයේ සිටින ඉතා සුළු තැනැත්තේ වුවද ඔහුට වඩා උතුම්ය" (QS 17). දෙවියන්ගේ රාජ්‍යයට ඇතුළත්විය හැක්කේ ජේසුස් වහන්සේගේ අනුගාමිකයින්ට පමණි. ඒ නිසා බෞතිස්ම නිකායිකයින් වෙතද ඔවුහු අත දිගු කළහ: දෙවියන්ගේ රාජ්‍යයට ඇතුල්වීම සඳහා අප සමඟ එකතු වන්න. ඔබේ ශාස්තෘවරයා වූ ජොහන් විසින් පෙන්නුම් කරනු ලැබූ මාර්ගයේ ගමන් කරන්න. ගැලවුම් කාරයාණන්ගේ ආගමනය සමඟ බිහිවූ ආගමික කණ්ඩායමට ඉක්මනින් එකතු වන්න යනු එම පණිවිඩයයි.

එම ජනප්‍රවාද වලට පසුබිම් වූ මුල් මූලාශ්‍රයන් ඇසුරු කරගෙන ඒක්වරම Q නිකායිකයින්ට වැදගත්වූ සම්ප්‍රදායක් බිහිවන්නට පටන් ගත්තේය. ජේසුස් වහන්සේ බෞතිස්ම කරනු ලැබීම පිළිබඳ නව තෙස්තමේන්තුවේ සඳහන් කථා ප්‍රවෘත්තිය එසේ බිහිවූ සම්ප්‍රදායේ විකාශනයක් බව පහසුවෙන් තේරුම් ගැනීමට පුළුවන. ශුභාරංචියේ දක්වා ඇති ස්නාපක ජොහන් සහ ජේසුස් වහන්සේ අතර පැවති කිට්ටු

සම්බන්ධතාවය විස්තර කරන කථා ප්‍රවෘත්තිය පාඨකයා වෙතෙසට පත් කරවන සුලුය. තම ආගමික ව්‍යාපාරයේ ආරම්භයේ පටන්ම ශුභාරංචියේ කතුවරයින් තම ශ්‍රාවකයින්ට උපදෙස් දීමේදී ජොහන් යොදාගත් වචන තරවටු කිරීමේ ස්වරයෙන් සහ විසිතුරු වර්ණනා ඉදිරිපත් කිරීමේ විලාශයෙන් ජේසුස් වහන්සේ සම්බන්ධයෙන්ද යොදාගෙන තිබේ. බෞතිස්ම ස්නාපනය පිළිබඳ කිසිම සඳහනක් Q මූලාශ්‍රය ගුරුතන්ත්‍රිලා සැලකූ ආගමික සම්ප්‍රදාය තුළ දක්නට නොලැබේ. එසේ නම් ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබූ බව සඳහන් කථා ප්‍රවෘත්තිය විශ්වාස කළ හැකිද? ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය ඇත්ත වශයෙන්ම ක්‍රිස්තියානි දේවධර්මය මහත් අසීරු තත්ත්වයකට පත් කරනු ලබන සිදු වීමකි. ජොහන් විසින් මැතිමතුන් බෞතීස්ම කරනු ලැබුයේ ඔවුන්ගේ පව් කමා කරවීම සඳහාය. (මාක් 1:4). එසේ නම් ජේසුස් වහන්සේ බෞතිස්ම කරනු ලැබුයේ කුමක් නිසාද? පව් කමාකර ගතයුතු හෝ විමුක්තිය පිණිස ගැලවුම් කරුවකුගේ පිහිට පතන ආගමික නිකායකට චාරිත්‍රානුකූලව ඇතුල්වූ 'ජේසුස්' කෙනෙක් ක්‍රිස්තියානි ආගමට පිළිගත හැකි නොවේ. ඒ නිසා ජේසුස් වහන්සේගේ බෞතිස්ම ස්නාපනය ගැලවුම් කාරයාණන් තැප කිරීමේ චාරිත්‍රයක් ලෙස අර්ථ නිරූපණය කරන ලදී.

ජේසුස් වහන්සේ සහ ජොහන් අතර හෝ එසේ නැතිනම් ඔවුන්ගේ අනුගාමිකයින් අතර සැබෑ ලෙස පැවති ගැටලු සහගත තත්වයක් මතකයේ රඳවමින් ජේසුස් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය පිළිබඳ විවිධ ජනප්‍රවාද ගොඩ නැගී තිබේ. එය පසුකාලයේදී බිහිවූ විවිධ ක්‍රිස්තියානි ආගමික කණ්ඩායම් අතර බෞතීස්ම ස්නාපනය කිරීමේ චාරිත්‍රයට වැදගත් ස්ථානයක් හිමිවීම නිසා බෞතීස්ම කිරීම අතීතයටත් බලපාන ආකාරයට ආගම තුළ පිළිගත හැකි තත්වයකට පත් කිරීමට කරන ලද උත්සාහයක් වීමට පුළුවන. කෙසේ වෙතත් Q මූලාශ්‍රයේ හෝ මාර්කියොන් (Marcion) විසින් ලියන ලද පැරණිතම ක්‍රිස්තියානි ශුභාරංචියේ ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනය ලැබූ බව සඳහන් නොවේ.[71] ජේසුස් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයකු බෞතීස්ම කිරීමට තරම් තමා වටිනා පුද්ගලයකු නොවන බව ප්‍රකාශ කරමින් උන්වහන්සේ බෞතීස්ම කිරීමට ජොහන් පවා මුලදී මැලිවූ බව එබියොනිටික් (Ebionitic) ශුභාරංචියේ සඳහන් වේ.[72] හෙබ්‍රෙව් වරුන්ගේ ශුභාරංචිය (Apocryphal Gospel of the Hebrews) නමැති ශුභාරංචිය පිළිබඳ පොතේ පවා බෞතීස්ම කිරීම පිළිබඳ මීට සමාන ගැටලු රාශියක් දක්නට ලැබේ. එහි සඳහන් කර ඇති ආකාරයට බෞතීස්ම කිරීම අනවශ්‍ය බව ජේසුස් වහන්සේ කල්පනා කළ අතර බෞතීස්ම ස්නාපනය ලැබිය යුතුබව උන්වහන්සේගේ ශ්‍රාවකයින් දැරූ අදහසක් විය.

ජේසුස් වහන්සේ සැබවින්ම ජෝර්දානයේ ස්නාවකයින් (Baptist) අතරට පැමිණියේ නම් (උන්වහන්සේ පැමිණි බව පෙන්නුම් කරන බොහෝ කරුණු තිබේ.) තම ඉගැන්වීම් ශ්‍රවණය කිරීම සඳහා මිනිසුන් පෙළ ගස්වා ගැනීම පහසුවන පිණිස බෞතීස්ම ස්නාපනය ලැබීමට තීරණය කරන්නට ඇතැයි සිතිය හැකිය. පරිසිවරුන්, ධර්මාචාර්යවරුන් සහ සම්මත මතධාරීන් ජේසුස් වහන්සේ කෙරෙහි එතරම් සැලකිල්ලක් දැක්වූ බව සිතිය නොහැකිය. උන් වහන්සේගේ දේශනා ඇසීමට වඩාත් සුදුසු ශ්‍රාවකයින් වූයේ නව ආධ්‍යාත්මික විමුක්තියක් අපේක්ෂා කළ විස්තර කළ නොහැකි තරම්වූ දැඩි අසහනයකින් පෙළෙමින් ජීවත්වූ දිවැසිවරුන් පසුපස යමින් අනාජේතිකර ජීවිත ගත කළ සාමාන්‍ය ජනතාවය. ජේසුස් වහන්සේට එහිදී ජොහාන් හමුවූවාද නැද්ද යන කාරණය එතරම් පැහැදිලි නැත. නමුත් ජොහාන් උන්වහන්සේ ගැන දැන සිටි බවත් ජොහාන්ගේ ගෝලයින් සමහරවිට බෞතීස්ම ස්නාපනය ලබා ගන්නා ලෙස ජේසුස් වහන්සේට ආයාචනා කරන්නට ඇති බවත් ඒ සම්බන්ධයෙන් පවතින පරස්පර විරෝධී කථාප්‍රවෘත්ති වලින් හැඟේ.

ජොහාන් වටා සිටි ආගමික කණ්ඩායමේ නීත්‍යානුකූල අනුප්‍රාප්තිකයින්වූ මැන්ඩියන් (Mandaeans) නිකායිකයින් විසින් ජේසුස් වහන්සේ යනු තමන් මුලින් අයත්ව සිටි ආගමික කණ්ඩායම අත්හැර ගිය පුද්ගලයකු (Apostate) ලෙස සලකනු ලැබීම මෙහිදී වැදගත් වේ. තමාගේම වූ ස්වතන්ත්‍ර ආගමක් ස්ථාපිත කිරීම මගින් ජේසුස් වහන්සේ ඔවුන්ට අසාධාරණයක් කර තිබෙන බව මැන්ඩියන් නිකායිකයින් කල්පනා කරයි. ඒ නිසා, ඔවුන් විසින් ඉතා වැදගත් ආගමික ග්‍රන්ථයක් ලෙස සලකන ජොහාන්ගේ ශුභාරංචියේ ස්නාවක ජොහාන් විසින් ජේසුස් වහන්සේ බෞතීස්ම කරන ලද්දේ අකමැත්තෙන් බව සඳහන් කර තිබේ.[73]

මෙම කථාප්‍රවෘත්තියේ මුල් ස්වරූපය එබියොනොටික් මතෙව් (Ebionitic Mathew) යනුවෙන් හැඳින්වෙන ශුභාරංචියට වඩා පැරණිවූ හෙබ්‍රෙව් (හීබෲ) ශුභාරංචියේ දක්නට ලැබේ. ආගමික බලපෑම නිසා එතරම් වෙනස්කම් කර ඇති බවක් නොපෙනේ. එහි සඳහන් කර ඇති පරිදි ජොහාන් ජේසුස් වහන්සේ විසින් හෝ ජේසුස් වහන්සේ ජොහාන් විසින් හෝ බෞතීස්ම කිරීමෙන් පසුව පවා ජොහාන් තම ශ්‍රාවකයින් පිරිවරා සිටීමෙන් ඒ බව පැහැදිලි වේ. ශුභාරංචියට අනුව ජොහාන් යනු ගැලවුම් කාරයාගේ ආගමනය දැනුම් දෙන පුද්ගලයකු පමණක් (Only the Precursor) නිසා ඇත්ත වශයෙන්ම සිදුවිය යුතුව තිබුණේ ඔහුගේ ගෝලයින්ද, ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් බවට පත්වීමය. ස්නාවක

ජොහාන් මැචේරස් නමැති ස්ථානයේදී (Machaerus) සිරභාරයට ගැනීමෙන් පසුව පවා ජේසුස් යනු ඇත්ත වශයෙන්ම පැමිණීමට සිටි ගැලවුම් කාරයාද නැද්ද යන සැකය ඔහු තුළ පහළවිය. එම කරුණ මගින් බෞතීස්ම ස්නාපනය පිළිබඳ කථා ප්‍රවෘත්තියේ ඇති ව්‍යාකූලබව මැනවින් පැහැදිලි වේ.

ඈත අතීතයේ බෞද්ධ පදනමක පිහිටා කටයුතු කළ එසීන් සම්ප්‍රදාය තුළ ආරක්ෂා වී පැවති ලෝකය පිළිබඳ දර්ශනය සහ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වල අන්තර්ගත මෛත්‍රිය පිළිබඳ පණිවිඩය මැනවින් ග්‍රහණය කර එය තම ආගමික දර්ශනය සමග ඒකාබද්ධ කිරීමට යටත් පිරිසෙයින් කුම්රාන් ආගමික සමාජයේ පසුකාලීන පරම්පරාවට හැකිවිය. මහජනයා ඉදිරියේ පළමුවරට පෙනී සිටීමට පෙර ජේසුස් වහන්සේ ජෝර්දානයේ විසූ ස්නාවකවරු සමග ජීවත්වූහ. දැඩි යුදෙව් විරෝධී අදහස් දැරූ පුද්ගලයින් කොටසක් වීම නිසා එම පිරිස යුදෙව් ආගමෙන්ද වෙන්ව සිටියහ. යුදෙව්වන් අතර පැවති ජලයෙන් පිරිසිදු වීමේ චාරිත්‍රය බෞතීස්ම කිරීම පිණිස යොදා ගනුලබන උතුම් ආගමික පිළිවෙතක් ලෙස යොදා ගනු ලැබූහ. මෙම ස්නාවකයෝ (බැප්ටිස්වරු) පැරණි ක්‍රිස්තියානි දර්ශනවාදී සමූහයකට අයත් කොටසක් වූහ. ජේසුස් වහන්සේ තම ගෝලයකු ලෙස බෞතීස්ම කිරීමට ජොහාන්ට අවශ්‍යවූ නමුත් ජොහාන් සහ ඔහුට වඩා ප්‍රතිවිරුද්ධ මත දැරූ මෙම චින්තකයා අතර මත ගැටුමක් ඇතිවිය. එම මතභේදය පාඑකරයේ විසූ දිවැසිවරයාගේ අදහස් වලට එකඟ නොවූ ගතානුගතිකත්වයෙන් තොරවූ ජොහාන්ගේ අනුගාමිකයින් සමහරෙක් ජේසුස් වහන්සේ වෙත යොමු වීමට හේතු වන්නට ඇත. Q මූලාශ්‍රයේ සඳහන් කර ඇති කරුණු වලින් පැහැදිලි වන පරිදි එවැන්නක් සිදුවිය හැකි බව විශ්වාස කිරීමට ප්‍රවණ. එපමණක් නොව Q මූලාශ්‍රයට පසුව ලියනු ලැබූ Q^1 හා Q^2 වශයෙන් හැඳින්වෙන මූලාශ්‍ර දෙකේ ඇතුළත් ගොතන ලද කථා ප්‍රවෘත්ති වලින් සමන්විත ජේසුස් වහන්සේගේ ජීවන චරිතය සමගද එය හොඳින් ගැළපේ.- මතෙව්ගේ ශුභාරංචිය ලියන අවධියේදී බෞතීස්ම කිරීම පිළිබඳ සිද්ධිය විවිධ ලියවිලි වල ඇතුළත්ව තිබීම නිසා එම සිද්ධිය පිළිබඳ කථා ප්‍රවෘත්තිය තව දුරටත් යටපත් කළ නොහැකි විය. ජොහාන් යනු ජේසුස් වහන්සේගේ පැමිණීම පිළිබඳව ප්‍රවෘත්තිය ප්‍රකාශයට පමුණුවන්නා හෙවත් පෙරමග දක්වන්නා වශයෙන් හඳුන්වා දී තිබෙන්නේ දේවධර්ම වේදීන් විසින් මෙම කථා ප්‍රවෘත්තියට කරන ලද ප්‍රතිශෝධනයක ප්‍රතිඵලයක් වශයෙනි. එය ආගමික ගවේෂකයින්ට හිසරදයක් වී ඇති ජේසුස් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය පිළිබඳ පරස්පර විරෝධී කථා ප්‍රවෘත්ති බිහිවීමට හේතුවිය. ශුභාරංචියේ දක්වා ඇති පරිදි ජේසුස්

වහන්සේ ඇත්ත වශයෙන්ම ජොහන් විසින් බෞතීස්ම කරනු ලැබුයේ වී නම්, පසුව මේ පැමිණෙන්නට සිටින තැනැත්තන් වහන්සේද කියා ඔහු තුළ සැකයක් ඇතිවූයේ කෙසේද? එපමණක් නොව බෞතීස්ම ස්නාපනය සිදුවූ මොහොතෙහි ස්වර්ගය විවර වී "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාය, මම ඔබ කෙරෙහි ඉතා පැහැදී සිටිමි" යනුවෙන් අපූර්ව වචන පවසමින් හඬක් පිටවූයේ කෙසේද? මේ සම්බන්ධයෙන් කිවහැක්කේ බෞතීස්ම ස්නාපනය කරණු ලැබූ අවස්ථාවේදී එවැනි සිද්ධියක් ඇති නොවූ බව හෝ ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනයක් නොලැබූ බවය.

පුද්ගලයකුගේ පාරිශුද්ධත්වය පෙන්නුම් කිරීම සඳහා බෞතීස්ම කිරීම වැනි බාහිර ආගමික චාරිත්‍රයක් සිදුකිරීම අවශ්‍ය යැයි ජේසුස් වහන්සේ විශ්වාස නොකළ බව Q^2 මූලාශ්‍රයේ සඳහන් තවත් කරුණකින් පැහැදිලි වේ. එය හමුවන්නේ ජේසුස් වහන්සේ විසින් පරිසිවරුන්ට චෝදනා කළ බව සඳහන්වන කථා ප්‍රවෘත්තියකය. එම කථා ප්‍රවෘත්තියේ අන්තර්ගතය සලකා බැලීමේදී එය ජේසුස් වහන්සේ ගේ සැබෑ ප්‍රකාශයක් බවත් ඊට සමාන බෞද්ධ කථා ප්‍රවෘත්තියක් තිබෙන බවත් පෙනේ. ජේසුස් වහන්සේගේ දේශනා ශුද්ධය පැවති කාලයේදී Q අනුගාමිකයින් විසින් විවිධ පරමාර්ථ සඳහා අනුවර්තනය කරන ලදී. මෙම ප්‍රකාශයද එම සම්ප්‍රදාය අනුගමනය කරමින් ප්‍රතිශෝධනය කර ජේසුස් වහන්සේ කෝප්පයට පත්ව කරන ලද ප්‍රකාශයක ස්වරූපයෙන් ඉදිරිපත් කර තිබේ.

"අඥානය, තොපගේ දිගු කේශ කලාපයෙන් කවරනම් ප්‍රයෝජනයක්ද? සම්වලින් සාදන ලද තොපගේ වස්ත්‍ර වලින් කවර ප්‍රයෝජනයක්ද? තොපගේ ඇතුළත අඳුරින් වැසී පවතී. තොප පිටත පමණක් පිරිසිදු කරන්නෙහිය." (උදාන 33:8)

"අඥානය, තොපගේ ජටා දැරීමෙන් කවර නම් ප්‍රයෝජනයක් වේද? තොපගේ අඳුන් දිවි සම් දැරීමෙන් හෝ කවර ප්‍රයෝජනයක් වන්නේද? තොපගේ අභ්‍යන්තරය කෙලෙසුන් ගෙන් ගහණ වූයේ වෙයි. එහෙත් තොප පිටත පමණක් පිරිමදින්නෙහිය."
(ධම්මපදය 26:12 බ්‍රාහ්මණ වග්ගය)

"පරිසිවරුනි, තොපට සිදුවන විපතක මහත! මන්ද තොප කෝප්පය සහ පිඟාන පිටතින් පමණක් පවිත්‍ර කරන්නාහුය. එහෙත් තොපේ ඇතුළත තෘෂ්ණාවෙන් කාමමිථ්‍යාවෙන් පිරී තිබේ. ඇතුළත පිරිසිදු කර ගනුව. එවිට තොපේ පිටතද පිරිසිදු වනු ඇත. එමෙන් පරිසිවරුනි. තොපට වන විපතක මහත! තොප ධර්ම ශාලාවේදී ප්‍රධාන ආසන වලටත්, වෙළඳ පොළවලදී ගෞරවාචාර ලැබීමටත් ප්‍රිය කරති. තොපට සිදුවන විපතක මහත! මන්ද තොප පිටතින් ශෝභන ලෙස පෙනෙන ඇතුළත කැලිකසල පිරුණු සොහොන්කොත් වැනි හෙයිනි." (QS 34)

මෙහිදී පුද්ගලයකුගේ ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය සහ එය වචනයෙන් සහ ක්‍රියාවෙන් ප්‍රකාශ කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කර දීම සඳහා ජේසුස් වහන්සේ පරිසිවරුන් විසින් පිටතින් පමණක් පිරිසිදු කරනු ලබන එහෙත් ඇතුළතින් අපිරිසිදු කෝප්පය සංකේතයක් වශයෙන් යොදාගෙන තිබේ. මෙම තේමාව Q^1 මූලාශ්‍රයේ විවිධ අයුරින් ඉදිරිපත් කර තිබෙන සැටි අපි දුටුවෙමු. සැබෑ ආධ්‍යාත්මික ශ්‍රේෂ්ඨත්වය යනු බාහිර ආටෝපය හා සම්බන්ධ කාරණයක් නොවන බවත්, ඒ සඳහා උග්‍ර තපස් රැකීම අනවශ්‍ය බවත්, පාරිශුද්ධිය පිණිස චාරිත්‍ර විධි පිළිපැදීම හෝ කැප කිරීම් අනවශ්‍ය බවත් ජේසුස් වහන්සේ මිනිසුන්ට නිරතුරුව පෙන්වා දුන්හ. සැබෑ ආධ්‍යාත්මික ශ්‍රේෂ්ඨත්වයක් ඇතිකර ගැනීම පිණිස පිළිපැදිය යුතු මූලික කරුණු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඇතුළත්වේ.

මෙහිදී හෙබ්‍රෙව් ශුභාරංචියේ දැක්වෙන බෞතීස්ම කිරීම පිළිබඳ කථා ප්‍රවෘත්තිය සහ ලලිත විස්තරයේ සඳහන් කථා ප්‍රවෘත්තිය අතර පවතින සමානකම් කෙරෙහි වැන් ඩන් බර්ග් වැන්අයිසිංග විසින් අපේ අවධානය යොමුකර තිබේ.[74] සිදුහත් කුමරුගේ ළමා කාලයේදී ඔහුගේ මව කුමරුවා පූජාවක් සඳහා දේවාලයට රැගෙන යයි. මුලදී කුමරු ඊට අකමැති වූවත් එකල පැවති ආගමික සම්ප්‍රදායට ගරු කරමින් ඊට එකඟවේ. මේ කථා ප්‍රවෘත්ති දෙකේම එන කථා නායකයින් මුලදී කිසියම් ආකාරයක දෙගිඩියාවකින් පසුව් අනතුරුව පවතින සම්ප්‍රදායට අනුව කටයුතු කරයි. බෞතීස්ම කිරීම පිළිබඳ සිද්ධිය සහ එම සිද්ධිය උද්දීපනය වන ආකාරයෙන් ශුභාරංචියේ පොත්වල එය ඉදිරිපත් කර තිබෙන සැටි විත්තාකර්ෂණීය වේ. මේ අවස්ථා දෙකේදීම දෙවියන් විසින් ප්‍රකාශ කරන ලද ප්‍රීතිවාක්‍යද බොහෝ දුරට සමානය. ඒ නිසා 'ලලිත විස්තරයේ' ඇතුළත් වර්ණනා වලට අනුව බෞතීස්ම ස්නාපනයද ඉදිරිපත් කර තිබෙන බව පෙනේ. ජේසුස් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය පිළිබඳ කථා ප්‍රවෘත්තිය අවසාන කර තිබෙන්නේ 'ලලිත විස්තරයේ' එන විස්තර වර්ණනාවකට සමාන අයුරිනි. බුද්ධත්වය ලැබීමෙන් පසු බුදුන් වහන්සේ දෙව් මිනිසුන් විසින් පුදනු ලබන දෙවියන්ටත් වඩා ශ්‍රේෂ්ඨ පුද්ගලයකු බවට පත්වූ බව එහි සඳහන් වේ. මෙසේ, ජේසුස් වහන්සේ කිසිදිනෙක බෞතීස්ම කරනු ලැබුවේ නැත යන අපේ උපකල්පනය සනාථ කරමින් එම සිද්ධිය පිළිබඳ පවතින සමස්ත පුරාණෝක්ති විස්තරය බුදුන් වහන්සේගේ ජීවන චරිතය හා සම්බන්ධ තොරතුරු වලට සමානකමක් පෙන්වයි.

ජේසුස් වහන්සේ පරීක්ෂාකිරීම පිණිස ජොහන්ගේ ඉල්ලීම පරිදි ඔහුගේ ගෝලයින් උන්වහන්සේ වෙත පැමිණි අවස්ථාවේදී ජේසුස්

වහන්සේ ඔවුන්ට දුන් පිළිතුර උන්වහන්සේගේ චරිතයේ විශේෂ ලක්ෂණයක් විදහා දක්වයි.

ඔවුන්ට පිළිතුරු දී ඉක්මනින් පිටත්කර හැරීමේදී උන්වහන්සේ විසින් ප්‍රකාශ කළ වචන සාමකාමී පුද්ගලයකු වශයෙන් උන්වහන්සේ තුළ පැවති සාර්ථකත්වය පෙන්නුම් කරයි. එම වචන ප්‍රකාශ කළේ ජේසුස් වහන්සේ විසින්ද නැතහොත් උන්වහන්සේගේ ගෝලයින් විසින්ද යන කාරණය මෙහිදී එතරම් පැහැදිලි නැත. මෙහිදී ප්‍රමුඛයට හේතුවන කාරණය නම් බුදුන් වහන්සේ පිළිබඳ කථා ප්‍රවෘත්ති ඊට සමාන වචන යොදා ගනිමින් විස්තර කර තිබීමය.

"අන්ධයින්ට පෙනීම ලැබුණි. ....බිහිරන්ට කන් ඇසෙන්නට පටන් ගත්තේය. රෝගීන් සුවය ලැබූහ. සාගින්නෙන් සහ පිපාසයෙන් පෙළෙන්නවුන්ට ඉන් සැනසීම ලැබුණි. මත් වූවන්ගේ මත නැතිවිය. සිහිය විකල වූවන්ට පියවි සිහිය ලැබුණි. අන්ධයින්ට නැවත පෙනීමත් බිහිරන්ට ඇසීමත් ලැබුණි." (ලලිතවිස්තරය VII)

"ජේසුස් වහන්සේ උත්තර දෙමින් 'ඔබ ගොස් අසන දකින දේ ජොහන්ට දන්වන්න. අන්ධයෝ පෙනීම ලබති. කොරු ඇවිදිති, ලාදුරු රෝගීහු පවිත්‍ර කරනු ලබති, බිහිරන්ට ඇසෙති. මළවුන් නැගිටුවනු ලබති. දිළිඳුන්ට ශුභ අස්න ප්‍රකාශ කරනු ලැබේ." (QS 16)

ජේසුස් වහන්සේට ජොහන්ගේ ගෝලයින් හමුවූයේ උන්වහන්සේ ධර්ම දේශනා කරමින් ගමින් ගමට ගමන් කරමින් සිටි අවස්ථාවකදීය. ඒ කාලයේදී උන්වහන්සේ තම ආචාරවිද්‍යාත්මක සහ සදාචාරාත්මක දේශනා තුළින් එකල පැවති ආගමික විශ්වාස නොපිළිගත් පුද්ගලයින් ඇමතීමට උත්සාහ කළහ. බාහිර පිරිසිදුකිරීම් තුළින් ලබාගත හැකි කිසිවක් නොමැතිබව බෞද්ධ ඉගැන්වීම් වල සඳහන්වේ. එපරිද්දෙන්ම උන්වහන්සේද බෞතීස්ම ස්නාපනය අනවශ්‍ය චාරිත්‍රයක් බැව් විශ්වාස කළහ. උත්සාහ කළයුත්තේ අධ්‍යාත්මික පාරිශුද්ධත්වය සලසා ගැනීම සඳහාය. Q[1] මූලාශ්‍රයේ දැක්වෙන දේශනා කෙතරම් දුරට බෞද්ධ ඉගැන්වීම් වලට සමාන ද යත් ජේසුස් වහන්සේ තම සදාචාරාත්මක අනුශාසනා සඳහා එකී අදහස් අවිධිමත් ලෙස යොදා ගෙන ඇතැයි කෙනෙකුට කිව හැකි නොවේ. උන්වහන්සේ එම අදහස් ලබාගෙන තිබෙන්නේ බෞද්ධ ඉගැන්වීම් ඇතුළත් සමස්ත දැනුම් සම්භාරය නමැති කෝෂ්ඨාගාරයෙන් බව පෙනීයයි. ඊට අවුරුදු 500 කට පෙර සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ

විසින් ගංගානම් නිම්නයේ සැරිසරමින් තම ශ්‍රාවකයින්ට දේශනා කළ ධර්මය ජේසුස්වහන්සේ විසින් පලස්තීනය පුරා දේශනා කළේ කෙසේද? ජේසුස් වහන්සේ එම දැනීම ලබාගත්තේ කොහෙන්ද? මෙම ප්‍රශ්න වලට පිළිතුරු ලබා ගැනීම සඳහා අශෝක අධිරාජයා විසින් බටහිර රටවලට පිටත්කර යවන ලද ධර්මදූතයින් පිළිබඳව විස්තරාත්මකව සලකා බලමු. අශෝක රජතුමා විසින් පිටත්කර හරිනු ලැබූ බෞද්ධ භික්ෂූන්ගෙන් පැවත එන ශ්‍රාවකයින් ජේසුස් වහන්සේ ජීවත්ව සිටි කාලයේදී ඇලෙක්සැන්ඩ්‍රියා හා සිරියාව වැනි ප්‍රදේශවල ධර්මප්‍රචාරක කටයුතුවල නියැලී සිටියේද? යන කාරණය මෙතැන් සිට පරීක්ෂාකර බලමු.

තුන්වන කොටස

ජේසුස් වහන්සේ බිහිවීමට පෙර හා ඉන්පසු පැවති ආගමික පරිසරය

බුදු දහම බටහිර රටවල ව්‍යාප්ත වීම

ක්‍රිස්තු පූර්ව තුන්වන ශත වර්ෂයේ මැද භාගයේදී පමණ අශෝක රජතුමා ධර්ම ප්‍රචාරය සඳහා විදේශ රටවලට දූතයින් පිටත් කර හැරීමෙන් පමණක් සෑහීමට පත් නොවීය. එතුමා බොහෝ දුර බැහැර පිහිටි රටවල පවා විහාර ආරාම ඉදි කළේය. එපමණක් නොව භික්ෂූන්ගේ අවශ්‍යතා මැනවින් සොයා බලා කටයුතු කිරීම, ඔවුන්ට සිදුවිය හැකි උපද්‍රව වලින් වළක්වා ගැනීම පමණක් නොව, අන්‍යයන්ගේ ජීවිතවලට ගරු කිරීම සහ සියලු සත්වයින් කෙරෙහි මෛත්‍රිය පැතිරවීම සඳහා කටයුතු කිරීම පිණිස ධර්ම මහාමාත්‍යවරු පත්කරණ ලදී. අශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරක කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් යවනයින් (ග්‍රීක්වරු) බුදු දහම වැළඳ ගත් බව 'මහාවංශය', 'දීපවංශය' සහ බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද 'සුත්ත විභංගය' නමැති පොත් වල සඳහන් වේ. හෙලනීසියානු සංස්කෘතිය බිහිවූ මුල් යුගයේදී ධර්ම ප්‍රචාරය සඳහා ග්‍රීසිය වෙත පිටත් කර හරිනු ලැබූ අත්දැකීම් වලින් පරිපූර්ණවූ ජ්‍යෙෂ්ඨ තෙරුන් වහන්සේලාගේ නම් පවා එම පොත්වල සඳහන් කර තිබේ. මහාරක්ෂිත මහ ථෙරනු ග්‍රීක් ජාතිකයින් විශාල පිරිසකට කාලකාරාම සූත්‍රාන්තය දේශනා කළ බවත්, ඒ අවස්ථාවේදී දහස් ගණන් ජනයා මාර්ග ඵලවලට පැමිණි බවත්, විශාල පිරිසක් මෙම අලුත් ආගමේ පිහිට පතා පැවිදි වූ බවත් එහි සඳහන් වේ. මොග්ගලී පුත්ත තිස්ස ස්ථවිරයින් වහන්සේ විසින් ධර්ම ප්‍රචාරය සඳහා තෝරාගන්නා ලද භික්ෂූන් අතර බෞද්ධාගම වැළඳගත් ධර්මය පිළිබඳ මනා දැනීමක් ඇති යෝනක ධම්මරක්ෂිත නම් වූ ග්‍රීක් ජාතික ස්ථවිරයින් වහන්සේ නමක්ද වූහ. උන්වහන්සේ ධර්ම ප්‍රචාරය සඳහා ඈත බටහිර පිහිටි අපරන්ත දේශයට පිටත් කර යවනු ලැබීය. එහිදී අග්ගික්ඛන්ධූපම සූත්‍රය දේශනා කළහ. ඒ අවස්ථාවේදී කාන්තාවන්ද ඇතුළු විශාල පිරිසක් බුදුදහම වැළඳගත් බව වාර්තා වේ.

අශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරක කටයුතු වල සාර්ථකත්වයට හේතුවූ ඓතිහාසික පදනමක් තිබුණි. ග්‍රීසියේ ඇතන්ස් නුවර වාසය කළ සාර්මෙනොචේගාස් වැනි බටහිර රටවල වාසය කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සහයෝගය ඒ සඳහා නොඅඩුව ලැබුණි. කෙසේ වෙතත් මෙහිදී බුද්ධ ධර්මය වැළඳගත් පුද්ගලයින්ගේ ප්‍රමාණය සලකා බැලීමේදී සංඛ්‍යාත්මක තොරතුරු අතිශයෝක්තියෙන් ඉදිරිපත් කිරීමේ ඉන්දියානු ප්‍රවණතාවය පිළිබඳවද අප සිහිතබා ගත යුතුය. කෙසේ වෙතත් මෙම සිද්ධිය අතිශයෝක්තියෙන් යුතුව ගොතන ලද කථා ප්‍රවෘත්තියක් නොවන බවත්, අශෝක රජතුමා විශේෂ උනන්දුවකින් යුක්තව ධර්ම ප්‍රචාරක

කටයුතු සිදුකරන ලද බවත් තේරුම් ගැනීමට අවුරුදු දෙදහසකට වඩා වැඩි කාලයක් ගතවිය. 1915 වර්ෂයේදී ශ්‍රීමත් ජෝන් මාර්ෂල් නමැති සුප්‍රසිද්ධ පුරාවිද්‍යාඥයා විසින් උතුරු ඉන්දු නිම්නයේ තක්ෂිලා-සර්කැප් නමැති ස්ථානයේ තිබී සාමාන්‍ය ශිලා ලේඛනවලට වඩා වෙනස් වූ ශිලා ලේඛනයක් සොයා ගනු ලැබීය. කිරි ගරුඬ පාෂාණයෙන් අටපට්ටම් හැඩයට නිර්මාණය කරන ලද කුලුනක තිබූ මෙම ශිලා ලේඛනය ලියා තිබෙන්නේ ඉරාන බලපෑමට හසුවූ ඇරමයික් භාෂාවෙනි. කලක් පර්සියාවට අයත්වූ මෙම බටහිර ප්‍රාන්ත වල ජීවත්වූ මිනිසුන් ඇරමයික් භාෂාව භාවිතා කළ බවත්, ලිවීම සඳහා කරෝෂ්ඨි අක්ෂර භාවිතා කළ බවත් මීට කලින් දැන සිටි කරුණකි. නමුත් රටේ අනෙක් ප්‍රදේශවල ලිවීම සඳහා පාවිච්චි කරන ලද්දේ බ්‍රාහ්මී අක්ෂර හෝඩියයි. දේශ සීමා ආසන්නයේ පිහිටි ප්‍රදේශවල තත්වය මීට වඩා වෙනස්විය. විවිධ නියෝග ප්‍රකාශයට පත්කිරීම සඳහා ඒ ඒ ප්‍රදේශවල ව්‍යවහාර වන විවිධ භාෂාවලට අයත් අක්ෂර භාවිත කරනලදී. සමහර නියෝග, පර්සියානු, ඉතාලි හෝ වෙනත් භාෂාවලින් ප්‍රකාශයට පත්කර තිබේ. මේ නිසා තක්ෂිලා-සර්කැප් ටැම්ලිපිය කියවීමේදී ඒ පිළිබඳ පර්යේෂණ කළ වාග් විද්‍යාඥයින්ට මහත් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවිය. එපමණක් නොව මෙම ශිලා ලේඛනය එතරම් හොඳින් සංරක්ෂණය කර නොතිබීම නිසා එහි වූ අර්ථය කොහෙත්ම කියවිය නොහැකි තරම් මැකී ගොස් තිබුණි. මුලදී මෙම ශිලා ලේඛනය කිසියම් උසස් නිලධාරියකු වෙනුවෙන් ඉදිකරන ලද සිහිවටනයක් ලෙස සලකනු ලැබීය. 1940 දශකයේ අග භාගයේදී එයින් විස්තර කර තිබෙන්නේ කිසියම් ගොඩනැගිල්ලක් බව අනුමාන කරන ලදී. එහෙත් 1958 වර්ෂයේදී තක්ෂිලා නුවරට සැතපුම් 500 ක් පමණ නිරිත දිගින් පිහිටි ඇෆ්ගනිස්ථානයට අයත් කන්දහාර් ප්‍රාන්තයේ තිබී සොයා ගන්නා ලද ඇරමයික් භාෂාවෙන් ලියන ලද වෙනත් ශිලා ලේඛනයක් හේතු කොටගෙන තක්ෂිලා ටැම්ලිපියේ ලියා තිබූ අකුරුවල අප්‍රකට තොරතුරු සොයා ගැනීමට හැකිවිය.[1] ඉතා වැදගත් සොයාගැනීමක් වූ මෙම කන්දහාර් ශිලා ලේඛනය වැදගත්කම අතින් ෂෝන් ෆ්‍රැන්සුවා චැම්පෝලියන් ට (Jean Francois Champollion) ඊජිප්තියානු හයිරෝ ලේඛනය නමින් හැඳින්වෙන අකුරු කියවා තේරුම් ගැනීමට උපකාරීවූ 'රොසෙටා ස්ටෝන්' නමින් හැඳින්වෙන ශිලා ලේඛනයට සමාන කළ හැකිය. එම ශිලා ලේඛනය ඇරමයික් සහ ග්‍රීක් යන භාෂා දෙකෙන්ම ලියා තිබේ. අශෝක ශිලා ලේඛනවල දැක්වෙන සුප්‍රසිද්ධ නියෝග මෙම ශිලා ලේඛනයේද දක්වා තිබේ. තක්ෂිලා ටැම් ලිපියේ දැක්වෙන්නේ ප්‍රාණඝාතයෙන් වැළකීම, තම පියාට කීකරුවීම, නිවැරදි ජීවන ක්‍රමයක් පවත්වා ගැනීම පිළිබඳව උපදෙස් දෙමින් අශෝක රජතුමා විසින් පිහිටුවනු ලැබූ හතරවන සෙල් ලිපියේ දැක්වෙන ප්‍රධාන

කොටසක තරමක් කෙටිවූත්, පදානුගතවූත් පරිවර්තනයක් බව 1969 වර්ෂයේදී හෙල්මුට් හම්බාක් (Helmut Humbach) නමැති ජර්මන් ජාතික පර්යේෂකයා විසින් පෙන්වා දී තිබේ.[2] මෙම ශිලා ලේඛනය තක්ෂිලා පුරාවිද්‍යාත්මක කැනීම් කරනු ලබන අඩවියේ 'එෆ්' නමින් හඳුන්වා ඇති කොටසේ (F-Block) පිහිටා ඇති බිදුන් දෙකක් සහිත ස්තූපයක්ද සහිතව බෞද්ධ භික්ෂූන් සඳහා ගොඩනංවා තිබූ ආරාමයක බිත්තියේ ඇති ගලක සටහන් කර තිබීමට හේතුව ඉන් පැහැදිලි වේ (රූපරාමුව 26). ධර්ම ප්‍රචාරය සඳහා ධර්ම දූතයින් පිටත් කර හැරීමේදී අශෝක රජතුමා එම කාර්යය කෙතරම් උනන්දුවකින් සහ සැලසුම් සහගත ලෙස ඉටුකර තිබේද කියා ඉන් පැහැදිලිවේ. ඔහු විසින් නියෝග නිකුත් කර තිබෙන්නේ හුදෙක් බුද්ධාගම ප්‍රචාරය කිරීම සඳහා පමණක් නොවේ. එතුමා තම පාලනයට සෘජුවම සම්බන්ධ නොවූ ප්‍රදේශවල පවා එකී ප්‍රදේශවල ව්‍යවහාර වූ භාෂාවලින් සහ ලිඛිත අක්ෂර වලින් නියෝග නිකුත් කර තිබේ. එතුමාගේ විදේශ ධර්මදූත සේවාවේ ව්‍යාප්තිය පිළිබඳ පැහැදිලි අදහසක් ඉන් ලැබේ. එපමණක් නොව මැතදී සොයාගත් බොහෝ අප්‍රකට කරුණු රාශියක් වටහා ගැනීමටද එනිසා හැකිවිය. අශෝක රජතුමා විසින් බටහිර දිග ප්‍රදේශවල පිහිටුවනලද එහෙත් තවමත් සොයාගෙන නැති එවැනි ශිලාලේඛන තව කොපමණ සංඛ්‍යාවක් තිබේදැයි කියා කිවහැක්කේ කාටද?

1960 ගණන්වලදී පළමුවරට ඇෆ්ගනිස්ථානයේ තිබී අශෝක ශිලා ලේඛන දෙකක් සොයාගනු ලැබීය. ඉන් එකක් සම්පූර්ණයෙන්ම ලියා තිබෙන්නේ ග්‍රීක් භාෂාවෙනි. එය මධ්‍යධරණී ප්‍රදේශවල ජීවත්වූ ග්‍රීක් භාෂාව කථාකරන වැසියන්ගේ දැන ගැනීම සඳහා පිහිටුවනු ලැබූ ශිලා ලේඛනයක් බව පැහැදිලිය. එහි සඳහන් කර තිබෙන්නේද දොළොස් වන සහ දහතුන් වන සෙල් ලිපි වල දක්වා ඇති කරුණුය. අනෙක් සෙල් ලිපියේ ඉහත කී සෙල් ලිපි වල ඉන්දියානු පෙළ ඇරමයික් භාෂාවෙන් පිටපත් කර තිබේ. මෙවැනි ඉන්දු ඇරමයික් සෙල් ලිපියක් කන්දහාර් නමැති ස්ථානයෙන්ද සොයාගෙන තිබේ. එය බොහෝ දුරට 1930 ගණන් වලදී ඇෆ්ගනිස්ථානයේ ලැග්මන් නිම්නයේ පිහිටි පුල්-ඉ-ඩරුන්ටේ (Pul-i-Darunteh) නමැති ස්ථානයේ තිබී සොයාගන්නා ලද එහෙත් ඒ කාලයේදී කියවා තේරුම් ගැනීමට නොහැකි වූ වෙනත් ශිලා ලේඛනයකට සමානය. එහෙත් 1966 වර්ෂයේදී සොයාගත් වෙනත් ශිලාලේඛනයක උපකාරයෙන් එහි දක්වා තිබෙන්නේ අශෝක රජතුමාගේ අනෙකුත් ශිලාලේඛනවල ලැබෙන කරුණු බව පැහැදිලි විය.[3]

1969 දී බෙල්ජියානු ජාතික මානව වංශ ශාස්ත්‍රය පිළිබඳ විශේෂඥයකු විසින් සම්පූර්ණයෙන්ම ඇරමයික් භාෂාවෙන් ලියන ලද

LI වශයෙන් හැඳින්වෙන බොහෝ තොරතුරු ලබා ගැනීමට උපකාරීවූ තවත් ශිලා ලේඛනයක් ලැග්මන් ප්‍රාන්තයේ තිබී සොයාගනු ලැබිය.[4] ඊට වර්ෂ කීපයකට පසු LII වශයෙන් හඳුන්වනු ලැබූ කලින් සඳහන් කරන ලද ශිලා ලේඛනයට බොහෝ දුරට සමාන ශිලා ලේඛනයක් ඊට ආසන්න ස්ථානයක තිබී සොයාගනු ලැබිය.[5] එම ශිලා ලේඛනය පිහිටා තිබුණේ බටහිර සහ පෙරදිග සම්බන්ධ කරන පැරණි වෙළඳ මාර්ගයේ සිට දැකගත හැකි ඊට දුරින් පිහිටි ගලකය. එකල වැදගත් වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස පැවති තක්ෂිලා නුවර සිට තවලම් කරුවන් විසින් බටහිර රටවලට ගමන් කිරීම සඳහා යොදාගත් වෙළඳ මාර්ගය කයිබර් දුර්ගය සහ ලැග්මන් නිම්නය හරහා වර්තමාන කාබුල් නගරය දක්වාත්, දකුණට කන්දහාර් දක්වාත්, එතැන් සිට කැස්පියන් මුහුදේ දකුණු වෙරල දක්වා විහිදී තිබුණි. එතැන් සිට තවලම් කරුවන්ට මාර්ග තුනක් ඔස්සේ බටහිර දෙසට ගමන් කළ හැකිවිය. මෙසපොටේමියාව, සිරියාව සහ ග්‍රීසිය දක්වා වැටී තිබූ ගොඩබිම් මාර්ගයේ අශෝක සෙල්ලිපි දක්නට ලැබෙන බව දැන් පැහැදිලි වේ. ඒවායේ සඳහන් කර තිබුණේ අශෝක රජතුමා විසින් දස දෙස පතුරුවා හරිනු ලැබූ බෞද්ධ ආචාර ධර්ම පමණක් නොවේ. ඒවා සෙලුසිඩ් (Seleucids), ටොලමි (Ptolomies) සහ මැසිඩෝනියන් වරුන්ට ධර්ම ප්‍රචාරය කිරීම සඳහා පිටත්කර හරිනු ලැබූ ධර්ම ප්‍රචාරකයින්ට බටහිර දෙසට ගමන් කිරීමේදී උපකාරීවූ මාර්ග සලකුණු (Sign Posts) වශයෙන්ද යොදාගෙන තිබුණි. එම මාර්ග සලකුණු ධර්ම ප්‍රචාර කටයුතු වල යෙදීමට කැමති ඕනෑම කෙනෙකුට පහසුවෙන් ගමන් කිරීමට ඉඩකඩ සලසා දුන්නේය. LI යනුවෙන් හඳුන්වා ඇති ශිලා ලේඛනයේ මෙසේ සඳහන් වේ: "මේ දිශාවේ ටැඩ්මෝර් (Tadmore) නමින් හැඳින්වෙන ස්ථානය පිහිටා තිබේ."[6] ටැඩ්මෝර් යනු පැල්මයිරාව (Palmyra) හැඳින්වීමට භාවිතා කළ පැරණි නම විය. එය සිරියාව සහ පලස්තීනය දක්වා විහිදුන තවලම් මාර්ගයේ පිහිටා තිබූ වැදගත් ස්ථානයක් විය. ලැග්මන් සිට සැතපුම් 2400 ක් පමණ දුරින් පිහිටි විශාල ක්ෂේම භූමියක්වූ තවලම් කරුවන් පමණක් ගමන් කළ පැල්මයිරා නුවරට ළඟාවිය හැකි මාර්ගය එහි පැහැදිලි ලෙස දක්වා තිබේ (රූප රාමුව 25). LI සහ LII ශිලා ලේඛනවල ඊට පහළින් දැක්වෙන ජේලි විග්‍රහ කිරීම ඉතා දුෂ්කරය. එහෙත් විවිධ ස්ථානවලට ඇති දුර ප්‍රමාණ පෙන්නුම් කරන සංඛ්‍යාත්මක තොරතුරු සඳහන් කරමින් තවලම් මාර්ගයක් පිළිබඳ විස්තර එහි ඇතුළත් කර තිබෙන බව පැහැදිලිය. එය ලියා තිබෙන්නේ ඉරාන හෝ ඇරමයික් අකුරුවලින්ද යන්න නොපැහැදිලිය. කෙසේ වෙතත් එම අකුරු කියවා ඇති ආකාරයට LII ශිලා ලේඛනයේ සඳහන් කර තිබෙන්නේ ආගමික පණිවිඩයක් රැගෙන එන පුද්ගලයකු හෝ ආගම් ප්‍රචාරකයකු පිළිබඳ තොරතුරු හෝ ගමන් මාර්ගයේ පිහිටා ඇති මාර්ග

සලකුණක් ලෙස සැලකිය හැකි බලකොටුවක් පිහිටි ස්ථානයක නමක් විය හැකිය. නමුත් එහි සඳහන් කර ඇති විස්තරය කුමක්ද කියා නිශ්චිතවම ප්‍රකාශ කළ නොහැකිය.

මෙසේ අශෝක රජතුමා බුද්ධ ධර්මය බටහිර ලෝකයේ කෙළවර පිහිටි රටවල ප්‍රචාරය කිරීම සඳහා පැල්මයිරා නගරය හරහා විහිදුන සුප්‍රසිද්ධ වෙළඳ මාර්ගය සහ යුද කටයුතු සඳහා යොදාගත් මාර්ගය (Military Route) යොදාගත්තේය. ආකිමෙනිඩ්ස් (Achaemenids) ගේ පාලන සමයේදී ඉන්දීය වෙළඳුන් මෙම මාර්ගය ප්‍රයෝජනයට ගත්බව අපි මින් පෙර සඳහන් කර ඇත්තෙමු.

ආකිමෙනිඩ්ස් රාජවංශයේ පරිහානියෙන් පසු ලියන ලද හිපොක්‍රැටික් ලේඛනයක (Hippocratic Text) ග්‍රීක් භාෂාවෙන් ගම්මිරිස් සඳහා පෙපරි (Peperi) යන වචනය සඳහන් කර තිබේ. 'පෙපරි' යනු පර්සියාවේ නිෂ්පාදනය කරන වෙළඳ භාණ්ඩයක් බවද එහි තවදුරටත් සඳහන්වේ. කෙසේ වෙතත් 'පෙපරි' යනු පිප්පලී (Pippali) නැමති ඉන්දියානු වචනය විය යුතුය. ඒ කාලයේදී පර්සියාව හරහා බොහෝ ඉන්දියානු භාණ්ඩ ග්‍රීසියට රැගෙන එනු ලැබිය. එම භාණ්ඩ ඔක්සස් (Oxus) හරහා කැස්පියන් මුහුද ආශ්‍රිත ප්‍රදේශ වලටත් එතැන් සිට පොන්ටෝස් ඉයුක්සිනෝස් (Pontos Euxeinos) නමින් හැඳින්වූ කළු මුහුද ආශ්‍රිත ප්‍රදේශයට හෝ පැල්මයිරා හරහා සිරියාවේ ප්‍රදේශවලට හෝ වඩාත් දකුණු දිගින් මෙසපොටේමියාව සහ ඇරේබියාව (Arabia) හරහා වැටී තිබූ මාර්ගයක් ඔස්සේ නැබටියන් වරුගේ (Nabataeans) රටවද රැගෙන එනු ලැබිය. ඉහත කී වෙළඳ මාර්ග ඔස්සේ ඉන්දියාවේ සිට ගෙන එන ලදැයි නිසැකවම සිතිය හැකි ඇත්දළ පොම්පෙයි (Pompeli) නමැති ස්ථානයෙන් සොයාගෙන තිබේ. ඉතා උසස් මට්ටමක පැවති ග්‍රීක්-රෝමන් සහ ග්‍රීක්-බෞද්ධ කලා ශිල්ප මෙම වෙළඳ මාර්ගයේ පිහිටි වැදගත් කේන්ද්‍රස්ථානයක්වූ පැල්මයිරා ක්ෂේමභූමියේ ශීඝ්‍රයෙන් පැතිරෙන්නට පටන් ගත්තේය.

මෙම මාර්ගය හුදෙක් වෙළඳ මාර්ගයක් පමණක් නොව ආධ්‍යාත්මික ගමන් මාර්ගයක් වශයෙන්ද යොදාගෙන තිබූ බව මෙම ප්‍රදේශයේ පිහිටුවා ඇති අශෝක ශිලා ලේඛන මගින් පැහැදිලි වේ. ධර්ම ප්‍රචාරය පිණිස බෞද්ධ ධර්මදූත සේවා පිටත්කර යැවීම බුදුන් වහන්සේ දේශනා කළ විමුක්ති මාර්ගයට අනුකූල වන බව අශෝක රජතුමා තේරුම් ගත්තේය. අශෝක රජතුමා විසින් ෂබ්ස්ගාර් නමැති ස්ථානයෙහි (Shahbazgarhi) පිහිටුවා ඇති ශිලා ලේඛනයෙහි එතුමා බෞද්ධාගම වැළඳ ගැනීමෙන් දස වසකට පසු "දේවානම්ප්‍රිය, ප්‍රියදර්ශි

රජතුමා සම්බෝධියට පැමිණියේය". යනුවෙන් සඳහන් කර තිබේ. මෙම රජතුමා සම්බෝධියට පැමිණියේය යනුවෙන් ප්‍රකාශයෙන් අදහස් කර තිබෙන්නේ කුමක්ද? ඉන්දියානු පර්යේෂකයකු වූ බන්දර්කාර් (Bhandarkar) ප්‍රකාශ කර ඇති පරිදි එහි සඳහන් කර තිබෙන්නේ අශෝක රජතුමා බෞද්ධයකු වීමෙන් පසු බුදුන් වහන්සේ බුද්ධත්වය අවබෝධකරගත් ස්ථානයක් ලෙස සැලකෙන බුද්ධගයාවට ගිය ආගමික වන්දනා ගමනක් පිළිබඳවද? රජතුමා ස්ථවිර නිකායට අයත් බෞද්ධ භික්ෂූන් හමුවීමට ගිය ගමනක් පිළිබඳ විශේෂ උනන්දුවකින් හා උද්යෝගයකින් කර ඇති දීර්ඝ විස්තරයක් මෙම ශිලා ලේඛනයේ සඳහන් කර තිබීම නිසා එම නිගමනය සමහර විට නිවැරදි විය හැකිය. එම හමුවීම ඇත්ත වශයෙන්ම සිදුවන්නට ඇත්තේ බුද්ධගයාවේදී වන්නට පුළුවන. කෙසේ වෙතත් 'සම්බෝධි' යන වචනයෙන් පුද්ගලයකු රහත් ඵලයට එළඹීමට පෙර ලබාගත යුතු ත්‍රිවිධ මාර්ග ඵල වල මූලික අවස්ථාව ලෙස සැලකෙන ප්‍රතිවේධය, ඥානය, අවබෝධය වැනි අර්ථ ගම්‍ය වේ. බුදු කෙනෙකු තුළ පවතින ඥානය යන අර්ථය එයින් ගම්‍ය නොවේ. එහෙත් බුද්ධත්වයට පත්වීමට පෙර අනුගමනය කළ යුතු ධර්ම මාර්ගය පිළිබඳ අවබෝධය ඉන් අදහස් වේ. සිද්ධාර්ථ ගෞතමයන් විසින් ආර්ය අෂ්ටාංගික මාර්ගය වශයෙන් හඳුන්වාදී තිබෙන්නේ එම ධර්ම මාර්ගය වේ. සමහර විට රාජාභිෂේකයෙන් දස වසකට පසු අනාගත අත් භවයකදී රහත් ඵලයට පැමිණීම සඳහා ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුව පිළිපැදීමට එතුමා තීරණය කළ බව ප්‍රකාශ කිරීම අශෝක රජතුමාගේ බලාපොරොත්තුව වන්නට ඇත.[8]

බුදු දහම අනුව පුද්ගලයකුගේ ආධ්‍යාත්මික නැඹුරුව සක්මන් මළුවක හෝ චෛත්‍යයක් වටා වාමාවර්තීව සක්මන් කරමින් භාවනා කිරීම සහ බුදුන් වහන්සේගේ ජීවිතයට සම්බන්ධ පූජනීය ස්ථාන වැඳපුදා ගැනීම සඳහා වන්දනා ගමන් යෑම වැනි බාහිර ක්‍රියාකාරකම් සමඟ අනුකූල වේ. ඒ නිසා අශෝක රජතුමා ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කරමින් සිද්ධස්ථාන වන්දනා කිරීම මිනිසුන්ගෙන් බලාපොරොත්තු වූ බව අපට මෙහිදී උපකල්පනය කිරීමට පුළුවන. ක්‍රිස්තු පූර්ව 249 දී අශෝක රජතුමා උපගුප්ත නම් වූ බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් සමඟ අද නේපාලය නමින් හැඳින්වෙන බුදුන් වහන්සේ උපන් ස්ථානයට දීර්ඝ වන්දනා ගමනක් ගිය බව බෞද්ධ පොත් පත්වල සඳහන් වේ. බටහිර වෙළඳ මාර්ගයේ පිහිටුවා ඇති ශිලා ලේඛනවල බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරන ලෙසත් එම ඉගැන්වීම එම වෙළඳ මාර්ගය ඔස්සේ ගමන් කරන අනෙකුත් පුද්ගලයින් වෙත පතුරුවා හරින ලෙසත් කරන ලද ඉල්ලීමක් ලෙස කෙනෙකුට සැලකිය හැකිය.

මිනිසුන් බලයෙන් බුද්ධාගමට හරවා ගැනීමට අශෝක රජතුමාට

අවශ්‍ය නොවීය. ධර්මයේ ඇති වටිනාකම පිළිබඳ පැහැදිලි අවබෝධයක් එතුමාට තිබුණි. ඔහුට වුවමනා වූයේ සත්‍යය වටහා ගැනීමට කැමති ඕනෑම කෙනෙකුට ඒ සඳහා අවස්ථාවක් සලසාදීමය. එතුමා අන්‍යයන්ගේ මත ඉවසූ අසාමාන්‍ය ගණයේ පාලකයකු විය. බුද්ධාගම වැළඳ ගැනීමෙන් පසු එතුමා දැඩි කැපවීමකින් යුතුව බුද්ධාගමේ දියුණුව සඳහා කටයුතු කළ බව සැබෑය. නමුත් අනෙක් ආගම් යටපත් කිරීමට එතුමා ක්‍රියා කළේ නැත. එවැනි ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීම වෙනුවට එතුමා බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුකූලව අනෙකුත් සියලුම ආගමික කණ්ඩායම් වලට නොමසුරු පරිත්‍යාගයන් කළේය. තමන් ගමන් කරන හැම තැනකදීම හමුවන දෙවිවරුන්ට පින් පමුණුවන ලෙස බුදුන් වහන්සේ තම ශ්‍රාවකයින්ට අනුශාසනා කළහ (මහාපරිනිබ්බාන සූත්‍රය 1:31). විවිධ ප්‍රදේශවලට පිටත්කර හරිනු ලැබූ ධර්ම දූතයින්ට අශෝක රජතුමා විසින් දෙන ලද අවවාද ද බුදුන් වහන්සේගේ අනුශාසනාවට අනුව කර තිබේ: "තමා අදහන ආගම උසස් කොට සැලකීම සහ වෙනත් ආගම් විවේචනය කිරීම පැහැදිලි හේතු දැක්වීමකින් තොරව නොකළ යුතුය" යනුවෙන් දොළොස් වන සෙල්ලිපියේ සඳහන් කර තිබේ. එපමණක් නොව "අනෙකුත් ආගම් වලට සුදුසු පරිදි ගෞරව කළ යුතුය. එසේ කිරීමෙන් යමෙක් තමා අදහන ආගම වර්ධනය කරන අතර තමා නොදන්නා ආගම් වලට ද යහපතක් කරනු ලැබේ" යනුවෙන්ද එහි සඳහන් කර තිබේ.

පසුකාලයේදී ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කරනු ලැබූ මිෂනාරිවරුන් කළ පරිදි මෙම මෞර්ය අධිරාජයා විසින් පිටත් කර හරිනු ලැබූ ධර්ම ප්‍රචාරකයින් අන් සියලු ආගම් වලට එරෙහිව එක් සමයාන්තර දහමක් පමණක් පිහිටුවීම සඳහා අවි අමෝරා ගෙන සටනට සැරසුණේ නැත. අශෝක රජතුමා විසින් ඈත රටවලට පිටත්කර යවනු ලැබූ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙනත් ආගම් වලට ප්‍රසිද්ධියේ විරුද්ධ නොවූහ. ආගම් ප්‍රචාරය කිරීමේදී අනුගමනය කළ මෙම නිහතමානී ප්‍රවේශය නිසා බටහිර රටවල ඒ සඳහා එතරම් සැලකිය යුතු සාර්ථකත්වයක් ලබාගත නොහැකිවිය. ඔවුන්ට සැලකිය යුතු ප්‍රමාණයක දුෂ්කරතාවයන්ට පවා මුහුණ පෑමට සිදුවිය. එනම් නුහුරු නුපුරුදු සිරිත් විරිත්, විශ්වාස සහ භාෂා ප්‍රාදේශීය ජන කොටස් වලට අයත් නාඳුනන මිනිසුන් කෙරෙහි පවතින සැකය වැනි බොහෝ බාධා ජය ගැනීමට ඔවුන්ට සිදුවිය.

දැඩි ඉවසීමකින් යුතුව ධර්ම ප්‍රචාරක කටයුතු කරගෙන යාම හැර ඔවුන්ට කළ හැකි අන් කිසිවක් නොවීය. විදේශ රටවලට පිටත්ව ගිය භික්ෂූන් ඔවුන් ඉන්දියාවේදී ගතකළ පුරුදු ශ්‍රමණ ජීවිතය එම රටවලදීද ගතකරන්නට ඇත. නමුත් ඔවුන් සිදුවූ අලුත් පරිසරයට ක්‍රම ක්‍රමයෙන්

අනුවර්තනය වන්නට ඇත. දොළොස්වන සෙල් ලිපියේ අශෝක රජතුමා මෙසේ සඳහන් කර තිබේ.

"සමගිය ඉතා උසස් දෙයකි. ඒ මන්ද? 'ධර්මය අසා ඒ අනුව පිළිපැදීමට කැමති අය එසේ කරත්වා! දේවානම්ප්‍රියගේ කැමැත්ත එයයි. එහෙත් මෙහිදී වැදගත් වන කාරණය කුමක්ද? සියලු ආගම් වලට අයත් වැසියන් ධර්මය හොඳින් ඉගෙන යහපත කිරීමට කටයුතු කිරීමය. එය එසේම වේවා' "

අන්‍යයන්ට ගෞරව කරන ලෙස අශෝක රජතුමා තම ධර්ම දූතයින්ට උපදෙස් දුන්හ. ඔවුන් හැමවිටම ධාර්මික විය යුතුය. යහපත් බොහෝ දේ කළයුතුය. ඔවුන් "මෛත්‍රී සහගතවූත්, ත්‍යාගශීලිවූත්, සත්‍යවාදීවූත්, සිල්වත්වූත්, පුද්ගලයින් විය යුතුය." (දෙවන සෙල් ලිපිය)

අශෝක රජතුමාගේ ශිලා ලේඛනවල අන්තර්ගතය හැමවිටම සදාචාරාත්මක උපදේශ වලින් පිරිපවති. ඒ කිසිවක ආදානග්‍රාහී අදහස් හෝ පුරාණෝක්තිවල එන අදහස් ඇතුළත් නොවේ. කන්ද උඩ දේශනාවෙන් ප්‍රසිද්ධ කරනු ලැබූ ක්‍රිස්තියානි ආගමේ පණිවිඩයද මීට සමාන ආකාරයට විමුක්තිය පිළිබඳ වචන සහ උපමා කථා අනුසාරයෙන් ඉදිරිපත් කර තිබේ. එහිදී අපට ජේසුස් වහන්සේ හමුවන්නේ ශ්‍රේෂ්ඨ සදාචාරාත්මක දර්ශනයක් ඉදිරිපත් කළ ශාස්තෘවරයකු වශයෙනි. බාහිර ආගමික පිළිවෙත් අනුගමනය කිරීම සහ ධාර්මික පුද්ගලයින් බව පිටතින් පෙන්වීම අනවශ්‍ය බවත් වඩා වැදගත් වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට අනුව ජීවත්වීම බවත් අශෝක රජතුමා සහ බෞද්ධයින් විශ්වාස කළේ යම්සේද, එපරිද්දෙන්ම බුද්ධ ධර්මයට අනුකූලව සදාචාරාත්මක ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම ජේසුස් වහන්සේද පෙන්වා දුන්හ.

ඊජිප්තියානු බෞද්ධයෝ : ථෙරවාදීන් සහ තෙරපියුටාවරු

1908 වර්ෂයේ වසන්ත සමයේ දී ඊජිප්තුවේ පිහිටි බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාත්මක විද්‍යා පීඨය මගින් මෙම්ෆිස් (Memphis) නගරයේ පුළුල් පුරාවිද්‍යාත්මක කැනීම් ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙරෙන්ටා (Merenptah) දේවස්ථානය අවට විදේශිකයින්ගේ පදිංචිය සඳහා වෙන් කරන ලද විශේෂ බිම් කොටසක් සොයා ගැනීමට පුළුවන් විය. එය ඊජිප්තුවේ 9 වන රාජ වංශය පැවති කාලයට අයත් විය. විදේශිකයින් සඳහා වෙන් කරන ලද එම බිම් කොටස ශතවර්ෂ

ගණනාවක් පැවැති බව පෙනේ. එම ප්‍රදේශය පුරා විසිර තිබූ මැටියෙන් සාදන ලද කුඩා ශීර්ෂ විශාල ප්‍රමාණයක් සොයා ගන්නා ලදී. එම ශීර්ෂ මෙම්ෆිස් නගරයට පැමිණ පදිංචි වූ විවිධ ජන කොටස්වලට අයත් පුද්ගලයින්ගේ ප්‍රතිමූර්ති ද විය. ඒ අතර තිබූ සුමේරියානු, ඇසිරියානු, සිදියන් හෝ ටිබෙට් සහ මොන්ගෝලියන් ජාතිකයින්ට අයත් මූර්ති පැහැදිලිව වෙන්කර හඳුනා ගැනීමට පුළුවන. ඒ අතර තිබූ පන්ජාබයෙන් පැමිණි ආර්ය කාන්තාවකගේ මූර්තිකාවක් (Statuette) සහ එම උරහිස මත උතුරු සළුවක් පැළඳ ඉන්දියානු ක්‍රමයට වාඩි වී සිටින පුද්ගලයකුගේ ප්‍රතිරූපයක් ද (රූප රාමුව 29) හමු විය. අශෝක රජතුමාගේ කාලයේදී මෙම්ෆිස් නුවර ඉන්දියානු ජනපදයක් පැවති බව මෙම කැනීම්වලින් පැහැදිලි විය. එය මුලින් පැවැති ප්‍රත්‍යන්ත වෙළඳ මධ්‍යස්ථානයක්ද එසේ නැතිනම් අශෝක රජතුමා විසින් එවන ලද ධර්ම දූතයින් පැමිණ පදිංචි වීම නිසා ඇතිවූවක් ද යන කාරණය මෙහිදී ස්ථිර වශයෙන් නිර්ණය කළ නොහැක.[9] මැටියෙන් සාදන ලද ඉහත කියන ලද ඉන්දියානු කාන්තාවගේ මූර්තිකාව ක්‍රි. පූ. 200 පමණ තරම් පැරණි බව සොයා ගෙන තිබේ. කෙසේ වෙතත් ඒ කාලය වනවිට අශෝක රජතුමා තම විශිෂ්ට ධර්ම දූත සේවාව ආරම්භ කර දශක කීපයක් ගතවී තිබුණි.

මෙම කැනීම් ආරම්භ කිරීමට අවුරුදු 10 කට පෙර බෞද්ධ සංකේත දැක්වෙන ටොලමේක් (Ptolemaic) කාල පරිච්ඡේදයට අයත් කැටයම් සහිත සොහොන් ගලක් ඊජිප්තුවේ ඩෙන්ඩේරා (Dendera) නැමැති ස්ථානයේ තිබී සොයා ගන්නා ලදී. මෙම සොයා ගැනීම ඊජිප්තුවේ සිටි බෞද්ධ ධර්ම ප්‍රචාරකයින්ගේ බලපෑම පෙන්නුම් කරන කදිම සාක්ෂියක් බව ෆ්ලින්ඩර්ස් පෙට්‍රි (Flinders Petrie) ප්‍රකාශ කර තිබේ.[10]

හෙලනීසියානු ආභාෂය ලැබූ රටවල පැවති සංස්කෘතික දියුණුව අශෝක රජතුමා විසින් බටහිර රටවලට පිටත් කර හරිනු ලැබූ ධර්ම දූත සේවාවල සාර්ථකත්වය කෙරෙහි මහත්සේ උපකාරී වූ ආකාරයත් මහා ඇලෙක්සැන්ඩර් රජතුමාගෙන් පසු ගොඩබිම් සහ මුහුදු මාර්ග හරහා ඊජිප්තුව සහ ඉන්දියාව අතර සන්නිවේදන කටයුතු පුළුල් ලෙස වර්ධනය වූ ආකාරයත් මෙ පොතේ පළමුවැනි කොටසේදී අපි පෙන්වා දුන්නෙමු. අශෝක රජතුමාගේ සමකාලීනයකු වූ දෙවන ටොලමි ෆිලඩෙල්පෝස් (Ptolemy 11 Philedelphos) ගේ පාලනය යටතේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ අති විශිෂ්ට දියුණුවක් ඇතිවිය. විවිධ බුද්ධිමය ගුරුකුල සහ න්‍යායයන් බහුල වශයෙන් බිහි වී ඒ එකිනෙක අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධතා මෙන්ම තරඟයද හේතුකොට ගෙන ඒවා උපරිම මට්ටම දක්වා වර්ධනය

විය. ඩියොන් ක්‍රිසොස්ටෝමොස් (Dion Chrysostomos) (ක්‍රි. පූ. 40-112) නමැති පුද්ගලයා විසින් ඉන්දියානු ජාතිකයන් තම ශ්‍රාවකයින් වශයෙන් පිළිගනිමින් කරන ලද කථාවක දී ඉන්දියන් ජාතිකයින් නව සහස්‍රකය ආරම්භ වූ මුල් අවධියේ පටන් ඇලෙක්සැන්ඩ්‍රියාවේ ජීවත් වූ බව ස්ථිර ලෙස ප්‍රකාශ කළේය.[11] විශේෂයෙන්ම එතරම් වැදගත් නගරයක් ලෙස නොපැවති මෙම්ෆිස් නගරයේ ඉන්දියානු ජාතිකයින් ජීවත්ව සිටීම නිසා ඩියොන් ක්‍රිසොස්ටෝමොස් ජීවත් වූ යුගයට බොහෝ කාලයකට පෙර ඇලෙක්සැන්ඩ්‍රියාවේ ඉන්දියානු ජන කොටස් ජීවත් වූ බවට කිසිම සැකයක් නැත. ඉන්දියානු වෙළඳුන් ඉන්දියානු ජාතිකයින් විසින්ම අවමානයට ලක් කළ බව ක්‍රිසොස්ටෝමොස් සඳහන් කර තිබේ.[12] ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ ඉන්දියානු ජාතිකයින් බෞද්ධයින් වූ බව එම ප්‍රකාශයෙන් හැඟේ. සුංග රාජ වංශයට අයත් බ්‍රාහ්මණයින් විසින් එම ඉන්දියානුවන් මිථ්‍යා දෘෂ්ටිකයින් ලෙස හඳුන්වා තිබේ. එපමණක් නොව මුහුදු ගමන් වල යෙදීම නිසා ඔවුන් අපිරිසිදු වන බව විශ්වාස කළ අතර ඒ හේතුවෙන් ආගමික වතාවත් කිරීමට නොහැකි වන නිසා මුහුදු ගමන් වල යෙදීම බ්‍රාහ්මණයින්ට තහනම් කර තිබුණි. මුහුදු ගමන්වල යෙදීම හේතුවෙන් කුලයෙන් නෙරපා දැමීමේ අවදානමට පවා මුහුණ දීමට ඔවුන්ට සිදු විය. නමුත් බෞද්ධ භික්ෂූන්ට එවැනි තහංචියක් පනවා නො තිබුණි. එනිසා බෞද්ධ භික්ෂූන්ට ඉන්දියානු වෙළඳුන් පදිංචිව සිටි ඊජිප්තු ජනාවාසවල පදිංචිවීම එතරම් දුෂ්කර කාර්යයක් නොවීය.

ගෙවීගිය සහස්‍රකයේ අග භාගය දක්වා පැවැති යුගයේදී හෙලනීසියානු ආභාසය ලැබූ රටවල් විවිධ දේශපාලනික සහ සංස්කෘතික වෙනස්වීම් වලට භාජනය විය. කෙසේ වෙතත් ඇලෙක්සැන්ඩ්‍රියාව නිරන්තරයෙන් දැනීම ලබා ගැනීමට මහත් උනන්දුවක් දැක්වූ පුද්ගලයින්, දාර්ශනිකයින්, දිවැසිවරුන්, විමුක්ති මාර්ග දේශකයින් සහ ආධ්‍යාත්මික විමුක්තිය සොයා ගිය පුද්ගලයින් ආකර්ෂණය කළ ආධ්‍යාත්මික කේන්ද්‍රස්ථානයක් වශයෙන් පැවතුණි.

ඇලෙක්සැන්ඩර් රජතුමාගේ මරණින් පසු නොයෙක් විදියේ ආගමික බල කඳවුරු බිහිවීම, සිවිල් යුද්ධ ඇතිවීම සහ ප්‍රතිවාදී කණ්ඩායම් නිසා දේශපාලන නායකයින්ගේ බලය හීනවී ගියේය. ඒ නිසා කෙතරම් උත්සාහ දැරුවත් ඔහුගේ මරණින් පසු ඔහු විසින් බිහි කළ විශාල අධිරාජ්‍යය පාලනය කිරීම ඉතා අපහසු කාර්යයක් විය. තක්ෂිලාව ආශ්‍රිත ප්‍රදේශයේ ක්‍රි. පූ. 280 දී සෙල්ටික් ආක්‍රමණයන් සිදු විය.

ක්‍රි. පූ. 260 දී කප්පඩෝසියාව (Cappadocia) නිදහස ලබා ගත්තේය. වැඩිකල් නොගොස් ඉරානයේ විශාල ප්‍රදේශයක් පාලනය කරමින් බටහිර

ඉන්දියාව දෙසට සහ සිරියාව දෙසට තම බලය ව්‍යාප්ත කරමින් ක්‍රි. පූ. 230 දී පමණ පාර්තියන්වරු නැවත වරක් වේගයෙන් හිස එසවූහ. ක්‍රි. පූ. 165 දී පමණ ඊජිප්තුවෙන් පසු කාලයේදී පලස්තිනයේත් මකාබිවරු හෙලනීසියානු බලපෑමට විරුද්ධව නැගී සිටි පරිදි පාර්තියන් වරු යටත් රටවල වාසය කළ ජනතාව තම අලුත් ස්වාමිවරුන්ට මහත් හිසරදයක් වන අයුරින් කටයුතු කළහ. කෙසේ වෙතත්, නව සහස්‍රකය ආරම්භවීමට පෙරත් ඉන් පසුත් එළඹුණු මෙම දුෂ්කර කාල පරිච්ඡේදය තුළ දී නැවත පෙනෙන දියුණුවක් ද ඇති විය. විදේශීය සංස්කෘතීන් සහ අලුත් අදහස් මෙතරම් විවෘතව පිළිගනු ලැබුවාවූත්, පෙරදිග හා අපර දිග රටවල් අතර සිටවූ සම්බන්ධතාවක් පැවැතියාවූත්, දාර්ශනික ක්‍රම පද්ධතීන් සහ මෙසා විශාල ආගම් සංඛ්‍යාවක් බිහිවුණාවූත් යුගයක් මින් පෙර නොවීය. එය සංකලනවාදී යුගයක් (Syncretism) ලෙස හැඳින්විය හැකිය. මෙම ක්‍රියාවලිය තුළ බෞද්ධයින් ඉතා වැදගත් මෙහෙයක් ඉටු කළහ.

හෙලනීසියානු යුගයේදී ඇලෙක්සැන්ඩ්‍රියා නුවර බෞද්ධ භික්ෂූන් වාසය කළ බව බෞද්ධ වංශකථාවක් වන 'මහාවංශයේ' සඳහන් වේ. බෞද්ධ ධර්මදූත කටයුතු සිදු කරනු ලැබූ යෝනක රට 'අලසන්ද' නම් නුවරක් තිබූ බව එහි පැහැදිලි ලෙස දක්වා තිබේ. අලසන්ද නමින් හඳුන්වා ඇති මෙම නගරය ඇලෙක්සැන්ඩ්‍රියාව බව සියලුම පර්යේෂකයින් විසින් පිළිගෙන තිබේ. ක්‍රි. පූ. 2 වන සියවසේ මැද භාගයේදී දුටුගැමුණු රජතුමාගේ රාජ්‍ය සමයෙහි ශ්‍රී ලංකාවෙහි රුවන්වැලි නම් වූ මහා ස්තූපයක් ගොඩනැගූ බව එහි සඳහන් කර තිබේ. එම ස්තූපය විවෘත කිරීමේ උත්සවයට බෞද්ධ භික්ෂූන් වහන්සේලා බොහෝ රටවලින් වැඩම කළහ. මහුගැන භික්ෂූන් වහන්සේ නමක් වූ මහාදේව නම් ස්ථවිරයන් වහන්සේ සාරලක්ෂ සැට දහසක් භික්ෂූන් ද රැගෙන පල්ලව බෝග්ග නම් ජනපදයෙන් ද, මහා ධම්මරක්ඛිත නම් වූ ස්ථවිරයන් වහන්සේ තවත් භික්ෂූන් තිස් දහසක්ද රැගෙන යෝනක පුර අලසන්ද නම් නුවරින්ද පැමිණි බව එහි සඳහන් වේ. මෙහිද පල්ලව දේශය සහ ඇලෙක්සැන්ඩ්‍රියාව පිළිබඳව විශේෂයෙන් සඳහන් කර තිබීම නිසා එම බෞද්ධ ජනපද බෞද්ධයින්ට කෙතරම් වැදගත්වී ද යන කාරණය පැහැදිලි වේ. මෙහිදී ඉදිරිපත් කර ඇති සංඛ්‍යා අතිශයෝක්තියෙන් යුක්ත වුවත් 'මහාවංශයේ' සඳහන් කර ඇති භික්ෂූන්ගේ සංඛ්‍යාව සලකා බැලීමේදී බෞද්ධයින් වාසය කළ මෙම රටවල් දෙක කෙතරම් වැදගත් වීද යන කාරණය පැහැදිලි වේ. පාතියන්වරු තක්ෂිලාවේ සිට බැක්ට්‍රියාව දක්වාත් එතැනින් තවදුරටත් බටහිර දෙසට පිහිටි පැල්මයිරා මාර්ගය ඔස්සේත් පැතිර සිටියහ. ඇලෙක්සැන්ඩ්‍රියාවේ වාසය කළ බෞද්ධ භික්ෂූන් මැරියටිස් විල (Lake Mareotis) ආශ්‍රිතව පැවැති නගරයක ජනපද පිහිටුවා

ගෙන සිටි බව පෙනේ.

ඊජිප්තුව අශෝක රජතුමා විසින් ධර්මදූත සේවයේ යොදවනු ලැබූ පිරිසට යානැසි වූ යෝග්‍යතම ස්ථානයක් විය. එරට පැවැති ජීවන ක්‍රමය ඔවුන්ට එතරම් නුහුරු වූවක් නොවීය. අධ්‍යාපන කටයුතු සහ ගුප්ත භාවනා ක්‍රමවල යෙදී සිටි භික්ෂූන් සහ භික්ෂුණීන් මෙම්ෆිස් නගරයේ වාසය කළහ. බඹසරව තපස් රැකීම, ඉසිස් (Isis) යනුවෙන් හැඳින්වූ පූජා විධි ක්‍රමයේ (Isis Cult) අංගයක් විය. බෞද්ධ භික්ෂූන්ට යෝග්‍ය පරිසරයක් එහි පැවතුණි.

එහෙත් ඊජිප්තුවේ විසූ මෙම බෞද්ධයින්ට සිදු වූයේ කුමක්ද? ඔවුන්ට ආවේණික වූ ලක්ෂණ සම්පූර්ණයෙන්ම නැතිවී යාමට හේතුවන පරිදි ඔවුන් වෙනත් සංස්කෘතියක් සමග මිශ්‍ර වූයේද? නැතහොත් ඔවුන් තමන් අයත් වූ සම්ප්‍රදාය ආරක්ෂා කරගනු ලැබුවේද? ජේසුස් වහන්සේ ජීවත් වූ කාලයේ සිටම ඇලෙක්සැන්ඩ්‍රියා නගරය ආසන්නයේ වාසය කළ බෞද්ධ භික්ෂූන් ට සමාන ශ්‍රාවකයින්ගෙන් සමන්විත වූ ආගමික නිකායක් පැවති බවට වටිනා තොරතුරු අපට ලැබී තිබේ. එම ආගමික නිකාය සහ බුද්ධාගම අතර පැවැති සමානකම් 19 වැනි ශත වර්ෂයේ වාසය කළ ආගමික ඉතිහාසඥයින්ගේ විශේෂ අවධානයට යොමුවිය. තෙරපියුටේ (Therapeutae) යනුවෙන් හඳුන්වනු ලැබූ මෙම ආගමික නිකාය මගින් ඇලෙක්සැන්ඩ්‍රියාවේ පැවැති යුදෙව් ආගම බෞද්ධ ඉගැන්වීම් සහ බෞද්ධ ජීවන ක්‍රමයට බොහෝ දුරට සමාන බව හෙන්රි ලෝංගේවිල් මැන්සල් (Henry Longueville Mansel) විසින් 1875 වර්ෂය තරම් ඈත කාලයේදී පෙන්වා දුන්නේය.[13] තෙරපියුටේ යනුවෙන් හැඳින්වෙන මෙම ආගමික නිකාය අශෝක රජතුමා විසින් ඊජිප්තුවේ දෙවන ටොලමි පිලඩෙල්ෆෝස් වෙත යවන ලද ධර්මදූතයින්ගෙන් පැවත එන ආගමික සංවිධානයක් ලෙස අපට සැලකිය හැකිද?

තෙරපියුටේ ආගමික සමාජය පිළිබඳ සියලු තොරතුරු දැනගැනීමේ වාසනාව අද අපට උදා වී තිබේ. මේ තොරතුරු ඇතුළත් එකම මූලාශ්‍රය නම් හෙලනීසියානු ආභාෂය ලැබූ ඇලෙක්සැන්ඩ්‍රියාවේ වාසය කළ ෆිලෝ (Philo) නමැති යුදෙව් ජාතිකයකු විසින් ලියන ලද ග්‍රන්ථයකි. ක්‍රි. පූ. 20 - ක්‍රි. ව. 50 අතර කාලයේ දී ජීවත් වූ ෆිලෝ ජේසුස් වහන්සේගේ සමකාලීනයකු විය. ඔහු විසින් ලියන ලද 'ඩී විටා කොන්ටෙම්පේල්ටිව්' (De vita contemplativa) නමැති කුඩා පොතක තෙරපියුටා ශ්‍රමණ සමාජය පිළිබඳ විස්තර කර තිබේ. ක්‍රි. ව. 4 වන ශත වර්ෂයේදී ක්‍රිස්තියානි පූජකයින් සහ ආරාමික ශ්‍රමණ සමාජ ස්ථාපිත වීමත් සමග ක්‍රිස්තියානු පල්ලිය පිළිබඳ කරුණු වාර්තා කළ ඉතිහාසඥයෝ ෆිලෝ විසින් රචනා

කරන ලද පොත සහ ථෙරපියුටා සමාජය පිළිබඳ ඔහු විසින් කර ඇති විස්තරය කෙරෙහි මහත් උනන්දුවක් දැක්වූහ. ඔවුන් ගතකළ ජීවිතය ආරාමික ප්‍රව්‍රජිතයන් විසින් පිළිපැදිය යුතු වූ නීති රීති වලට කොතරම් සමාන වීද යත් තෙරපියුටා භික්ෂූන් ක්‍රිස්තියානි පූජකයින් ලෙස ඔවුහු සැලකූහ. හය වන ශත වර්ෂය වන විට ක්‍රිස්තියානි පූජකයින් ගත කළ ආරාමික ජීවිතය ලතින් භාෂාවෙන් හඳුන්වනු ලද්දේ විටා තෙරපියුටිකා (Vita Therapeutica) යනුවෙනි. ථෙරපියුටා යනු ක්‍රිස්තියානිය ආරම්භවීමට බොහෝ කාලයකට පෙර පැවති ආගමික නිකායක් බව 18 වන ශත වර්ෂය ආරම්භ වන තුරු ඔවුන් දැන සිටියේ නැත.[14] එම වැරදි අවබෝධය නිසා ෆිලෝ විසින් ලියන ලද පොත විනාශ කර දැමීමෙන් වැළකිණ. පැරණි ලිපි ලේඛන අනුසාරයෙන් ක්‍රිස්තියානිය පිළිබඳව තමන් දරන මතය තහවුරු කිරීම සඳහා කටයුතු කළ ක්‍රිස්තියානි ආගමික ක්ෂමාලාපකයින් (Apologists) තම මතයට පටහැනි සියලු ලිපි ලේඛන විනාශ කර දැමීමට හෝ ඒවා තමන්ගේ අදහස්වලට ගැළපෙන ආකාරයට ක්‍රිස්තියානි ආගම සම්බන්ධ කරුණු ඒවාට අලුතින් ඇතුළත් කොට විකෘති කිරීමට පසුබට නොවූහ. මුල් කෘතියේ ඇතුළත් කරුණු තෝරා බේරා ගැනීම සඳහා එසේ එකතු කරන ලද හෝ විකෘති කරන ලද කරුණු ඉවත් කිරීම සඳහා විශාල පරිශ්‍රමයක් දැරිය යුතුවේ. තෙරපියුටා ආගමික සමාජයට අයත් ශ්‍රමණයින් මුල් ක්‍රිස්තියානි පූජකයින් ලෙස ෆිලෝ කිසිසේත් නොසැලකූ බව ඉහතකී ක්ෂමාලාපකයින් දැන සිටියේ නම් 'ඩී විටා කන්ටෙම්ප්ලේටිවා' නමැති ඔහු විසින් රචනා කරන ලද ග්‍රන්ථය විනාශ කර දමනවාට කිසිම සැකයක් නැත. අද්විතීය ක්‍රිස්තියානි ධර්මයට පුරෝගාමීව පැවැති කිසිවක පැවැත්ම ඔවුහු නොරිස්සූහ.

ගුහාරංචියේ පොත්වල ඇතුළත් කර තිබෙන එළිදරව්ව පිළිබඳ අනාගත වාක්‍ය මිනිසුන්ට අත් විඳීමට සිදුවන ගුප්ත ව්‍යසනයන් සහ ගැලවුම්කරුවකුගේ පැමිණීම පිළිබඳ විශ්වාස කෙතරම් දුරට උන්වහන්සේගේ සැබෑ ඉගැන්වීම් අභිභවා ඉදිරියට පැමිණ තිබේද යත් උන්වහන්සේගේ සැබෑ ඉගැන්වීම් වලින් මේ වන විට ඉතිරිව ඇත්තේ සුළු කොටසක් පමණි. එසේ ඉතිරිවී ඇති කොටස පසු පසට තල්ලුවී ගොස් සම්පූර්ණයෙන්ම අමතක වී යාමෙන් වැළකී තිබෙන්නේ එම දේශනාවල ඇතුළත් බෞද්ධ සදාචාරාත්මක පදනම දීප්තිමත්ව බැබළෙන හෙයිනි. ගුහාරංචියේ පොත්වල ඇතුළත් කුම්රාන් ආගමික සමාජයේ සහ ස්නාවක සම්ප්‍රදායට අයත් තොරතුරු ඉවත් කළහොත් ජේසුස් වහන්සේගේ සැබෑ මුහුණුවර මතුවෙනු ඇත.

ක්‍රි. පූ. පළමු වන ශත වර්ෂයේදී පසුකාලීනව බිහිවූ ක්‍රිස්තියානි ආගමේ පැවැති ලක්ෂණවලට බොහෝදුරට සමාන ලක්ෂණවලින් හෙබි

ආගමික සමාජයක් (තෙරපියුටා ශ්‍රමණ සමාජය) ඇලෙක්සැන්ඩ්‍රියා නගරයට නුදුරින් යුදෙව් ජනාවාස හා සම්බන්ධව පැවතීම යුදෙව් ආගමත්, කතෝලික පල්ලියත් දැඩි අපහසුතාවයකට පත්කළ ඓතිහාසික සාධකයක් විය. මෙම ආශ්‍රමික ආගමික සංවිධානය බොහෝදුරට බෞද්ධ භික්ෂු සමාජයට සමාන විය. අල්පේච්ඡ ජීවිතය, බ්‍රහ්මචර්යාව, නිහතමානිකම, යහපත් ක්‍රියා සහ මෛත්‍රිය පැතිරවීම එහි මූලික ලක්ෂණ වශයෙන් පැවතියේය. එවැනි සංවිධානයක් බිහිවීම කෙරෙහි බලපෑ හැකි පූර්වාදර්ශයක් හෝ පුරෝගාමී වූ වෙනත් සංවිධානයක් යුදෙව් ජාතිකයින් වාසය කළ රටවල හෝ ක්‍රිස්තියානි නොවූ ආගමික ජනසමාජ අතර නොතිබුණි.[illegible]

තෙරපියුටා ශ්‍රමණ සමාජය ලෝකය කෙරෙහි දැක්වූ ආකල්පයත් ඔවුන්ගේ දර්ශනයත් ඔවුන්ගේ ජීවන ක්‍රමයත් පිළිබඳව බලවත් සේ පැහැදී සිටි බව ෆිලෝ විවෘතවම ප්‍රකාශ කර තිබේ. මෙම ශ්‍රමණ ප්‍රජාව සතුන් වන්දනා කරන මුග්ධ වූ ඊජිප්තියානු වැසියන්ට සහ සමහර විට ග්‍රීක් දාර්ශනිකයන්ටත් වඩා ශ්‍රේෂ්ඨ බව ෆිලෝ සඳහන් කර තිබේ. ග්‍රීක් දාර්ශනිකයින් සම්බන්ධයෙන් ඔහු විසින් කර ඇති මෙම ප්‍රකාශය හෙලනිසියානු පාණ්ඩිත්‍යයට කරන ලද අපහාසයක් ලෙස පෙනී ගියත් මෙම කුඩා ආගමික ප්‍රජාව වැදගත් ආගමික සංවිධානයක් ලෙස පැවතුණේද යන කාරණය පැහැදිලි කිරීමට ඔහු තුළ පැවැති දැඩි අවශ්‍යතාවය ඉන් පිළිබිඹු වේ.

තෙරපියුටා යනු ඇලෙක්සැන්ඩ්‍රියාවේ දකුණුදිග ප්‍රදේශයේ පහත් කඳු ප්‍රදේශය ආසන්නයේ පිහිටි මැරියොටිස් විල අවට ප්‍රදේශයේ පැවැති ආගමික සංවිධානයක් ලෙස හැඳින්වීමට පුළුවන. ආගමික වත්පිළිවෙත් සහ අධ්‍යයනයන් කෙරෙහි පූර්ණ කැපවීමෙන් යුතුව කටයුතු කළ තෙරපියුටා සාමාජිකයෝ පැවිදි ජීවිත ගත කළහ. ඔවුන් මෙම ප්‍රදේශයට පමණක් සීමා වී වාසය කළ බව පෙනේ. ෆිලෝ ඔවුන් පිළිබඳව පහත දැක්වෙන කරුණු ඉදිරිපත් කර ඇත:

1. තෙරපියුටා ප්‍රජාව භික්ෂූන් සහ භික්ෂුණීන්ගෙන් සමන්විත විය.
2. ඔව්හු තම ගේදොර, සහෝදර සහෝදරියන්, දරුවන්, භාර්යාව, මා පියන්, ඥාතීන් සහ මිතුරන් ඇතුළු සියලු ලෞකික වස්තූන්ට ඇති බැඳීම් අත්හැර දැමූහ.
3. හුදකලා ජීවිතය ප්‍රිය කළ තෙරපියුටාවරු නගරයෙන් එපිට පිහිටි උයන් වතු ගම්මාන සහ පිටිසර බද ප්‍රදේශවල ජීවත්වූහ. ඔවුන් එසේ කරන ලද්දේ මිනිස් වාසය අප්‍රිය කළ නිසා නොව නොගැළපෙන පුද්ගලයින්ගේ ආශ්‍රයෙන් වැළකී සිටීම සඳහාය.
4. තෙරපියුටා භික්ෂූන්ගේ ආශ්‍රම ග්‍රීෂ්ම කාලයේ උෂ්ණත්වයෙන්ද ශීත කාලයේදී දැඩි ශීතලෙන්ද ආරක්ෂාවීම සඳහා සරල සහ වාම් අන්දමින් ඉදිකර තිබුණි.
5. ඔවුන් ජීවත්වූ ආශ්‍රමවල සෙම්නියුම් (Semneum) හෝ මොනාස්ටීරියම් (Monasterium) යනුවෙන් හඳුන්වනු ලැබූ ආගමික වතාවත් සිදු කිරීම සඳහා කුඩා ස්ථානයක් සෑම අයෙකුටම වෙන්කර තිබුණි.
6. ඔව්හු දවසකට දෙවරක් උදේ සහ සවස හිරු නගින විටදීත් හිරු බැස යන වේලාවේදීත් ආගමික කටයුතුවල යෙදී යාඥා කළහ.
7. පැරණි ශුද්ධ ග්‍රන්ථ ඔවුන් සතුව තිබිණි. ඔවුන් එම ග්‍රන්ථ හොඳින් පරිශීලනය කළහ. තාපසයින් සහ ශ්‍රමණයින් විසින් ගුරුතන්හි ලා සැලකූ ඊනොක් (Enoch) සහ ආබ්‍රහම් (Abraham) විසින් ප්‍රකාශ කරන ලද කරුණු මෙම ශුද්ධ ග්‍රන්ථවල ඇතුළත්ව තිබෙන්නට ඇතැයි ෆිලෝ උපකල්පනය කරයි. එම පොතපත පරිශීලනය කරමින් ඔව්හු ගීත සහ ස්තෝත්‍ර රචනා කළහ.
8. සෑම සතියකම සත්වන දිනයේදී ඔව්හු සියලුදෙනාම එකට රැස්වූහ. එම රැස්වීම පැවැත්වීමේදී සාමාජිකයින්ගේ ජ්‍යෙෂ්ඨත්වය නිර්ණය කරනු ලැබුවේ ඔවුන්ගේ වයස අනුව නොව ඔවුන් තෙරපියුටා ප්‍රජාව තුළ ගතකළ කාලය අනුවය. ඔව්හු ආහාර සඳහා පාන් සහ පානය පිණිස වතුර පමණක් පාවිච්චි කරනු ලැබූහ. සභාවේ සිටි ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා විසින් ධර්ම දේශනයක් පවත්වනු ලැබිය. කාන්තාවන් සහ පිරිමින් වෙන් වෙන්ව වාඩිවී සිටි අතර එම ස්ථානය උස් තාප්පයකින් වෙන් කර තිබුණි.
9. ඔවුන් සතුවූයේ සිවුරු දෙකක් පමණි.
10. සියල්ලෝම උපතින් සමාන යයි ඔවුන් විශ්වාස කළ නිසා ඔවුන්ට ආවතේවකම් කිරීම පිණිස සේවකයින් නොසිටියේය. ඔවුන් රැස් වූ අවස්ථාවල දී ආධුනික සාමාජිකයෝ (සාමණේරවරු) ආගමික ප්‍රජාව තුළ දීර්ඝ කාලයක් සේවය කළ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ගේ අවශ්‍යතා ඉටුකර දුන්හ.
11. සාන්තුවරයකුගේ තත්වයට පත්විය හැක්කේ නිර්මාංශ ආහාර අනුභව කිරීමෙන් පමණක් යයි විශ්වාස කළ මේ පිරිස් එළවළු පමණක් අනුභව කළහ.

තෙරපියුටා ශ්‍රමණ ප්‍රජාව පිළිබඳව නොදන්නා කෙනෙක් තුළ ෆිලෝ විසින් ඉහත දක්වා ඇත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගතකළ ජීවිතය පිළිබඳ විස්තරයක් ලෙස සැලකීමට පුළුවන. එහි සඳහන් කර ඇති සියලුම කරුණු බෞද්ධ භික්ෂු සමාජයේ දක්නට ලැබෙන නිශ්චිත ලක්ෂණ වේ. එසේත් නැතිනම් ෆිලෝ විසින් විස්තර කර ඇති මෙම තෙරපියුටා ප්‍රජාව යනු අශෝක රජතුමා විසින් විදේශ රටවලට පිටත්කර යවනු ලැබූ ධර්ම ප්‍රචාරක භික්ෂූන්ගෙන් පැවත එන පරපුරක්ද?

තෙරපියුටා ප්‍රජාවේ උත්කෘෂ්ට පැවැත්ම රඳා පැවැතියේ ලෞකික වස්තූන් කෙරෙහි ඇති ආශාව සම්පූර්ණයෙන්ම අත්හැර දැමීම මතය. එය බෞද්ධ විශ්වාසවලට අදාළ මූලික ඉගැන්වීමක් බව මෙහිදී අමුතුවෙන් කිව යුතු නොවේ. ෆිලෝ සඳහන් කර ඇති අන්දමට තෙරපියුටා ප්‍රජාව නාගරික ජීවිතයට වඩා පිටිසරබද හුදකලා ජීවිතය ප්‍රිය කළේ ඔවුන් මිනිස් ඇසුර පිළිකෙව් කළ නිසා නොවේ. ඔවුන්ගේ පරමාර්ථය වූයේ බුද්ධියෙන් හා මෛත්‍රියෙන් හීන වූ මිනිසුන්ගෙන් ඈත්ව සිටීමයි. "තමාට ඇසුරු කිරීමට සුදුසු තමාට වඩා ගුණවත් පුද්ගලයකු හෝ සමාන පුද්ගලයකු හෝ සොයා ගත නොහැකි වේ නම් හුදකලා වාසය දැඩිසේ අනුගමනය කරන්න. බාලයන් ඇසුරෙන් කවර හෝ යහපතක් සිදු නොවන හෙයිනි." යනුවෙන් බුදුන් වහන්සේ තම ශ්‍රාවකයින්ට අනුශාසනා කළහ. (ධම්මපදයේ බාල වග්ගය 5:2)

පණ ඇති සියලු සත්වයින්ගේ ජීවිතවලට ගරු කිරීමක් වශයෙන් බෞද්ධයින් මෙන්ම තෙරපියුටා සාමාජිකයින්ද නිර්මාංශ ආහාර අනුභව කළහ. පුද්ගලයකු විසින් වැළකී සිටිය යුතු කරුණු පිළිබඳව දේශනා කිරීමේදී බුදුන් වහන්සේ මධ්‍යස්ථ පිළිවෙතක් අනුගමනය කළහ. එහෙත් මාංශ අනුභව කිරීමෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටින ලෙස අශෝක රජතුමා අවධාරණය කළේය. අශෝක රජතුමා විසින් පිටත් කර හරින ලද ධර්ම ප්‍රචාරකයින් නිර්මාංශ ආහාර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්නට ඇති බවත් එම ප්‍රතිපත්තිය ඇලෙක්සැන්ඩ්‍රියාවේ පිහිටි ජනාවාසවල වාසය කළ බෞද්ධයින් විසින් අනුගමනය කරන්නට ඇති බවත් මෙහිදී අපට උපකල්පනය කළ හැක. තෙරපියුටා සාමාජිකයින් සහ පසුව බිහිවූ යුදෙව් තපස් වෘත හා සම්බන්ධව පැවැති නිර්මාංශ ආහාර අනුභව කිරීමේ සිරිත පැහැදිලි කළ හැක්කේ බෞද්ධ ආභාෂය අනුව පමණක් බව ආගම් පිළිබඳ ඉතිහාසඥයකු වූ රොබට්සන් ස්මිත් (Robertson Smith) විසින් 1894 වර්ෂය තරම් වූ ඈත කාලයකදී පෙන්වා දී තිබේ.[16]

තෙරපියුටා ආගමික ප්‍රජාව භික්ෂු, භික්ෂුණී යන දෙපිරිසෙන්ම

යුක්ත වීම ඔවුන් බෞද්ධයින් බව පෙන්නුම් කරන තවත් පැහැදිලි ලක්ෂණයකි. වාසය සඳහා ඉතා සරල කුඩා ආරාමයක් සාදා ගැනීමද විනය නීතිවලට (පාතිමොක්ඛ) අනුව බෞද්ධ භික්ෂූන් විසින් පිළිපැදිය යුතු වූ උපදේශ සමග හොඳින් ගැළපේ. මුල් යුගයේදී භික්ෂූන් වහන්සේලා වාසය කළ කුඩා ආරාම ආගමික සිද්ධස්ථානයක් කේන්ද්‍රකොට ඉදිකර තිබුණි. භික්ෂූන් වහන්සේලා එක්රැස් වූ ස්ථානය විහාරය නමින් හඳුන්වනු ලැබිය. කල් යාමේදී 'විහාරය' යන වචනය බෞද්ධ ආරාම හැඳින්වීම සඳහා යොදා ගන්නා ලදී. උදේ වරුවේ මෙන්ම හවස් වරුවේදීත් වන්දනාමාන කිරීම බෞද්ධයින් සඳහා නියම කරනු ලැබූ සාමාන්‍ය දින චර්යාවේ අවශ්‍ය අංගයක්ව පැවතියේය.[17] වන්දනා කිරීමේදී භාවිතා කළ යුතු බෞද්ධ ගාථා පාතිමොක්ෂයේ ඇතුළත් කර තිබේ.

බෞද්ධයින් සහ තෙරපියුටා සාමාජිකයින් ඉලක්කම් අතර අංක හතට විශේෂ තැනක් දුන්හ. ඔවුහු සෑම සතියකම හත් වැනි දිනයේදී ජ්‍යෙෂ්ඨත්වය අනුව එක්රැස් වූහ. එය බෞද්ධ භික්ෂූන් සහ ශ්‍රාවකයින් ආගමික වතාවත් සහ පුදපූජා සඳහා සතියකට එක් දිනක් බැගින් මසකට සිව් වරක් පොහොය දිනවලදී හමුවීමේ (උපෝෂථ) සම්ප්‍රදාය අනුගමනය කිරීමකි. එම දිනවලදී ගිහි ශ්‍රාවකයෝ සුදු වස්ත්‍ර ඇන්දහ. එදිනට ඔවුන් හඳුන්වනු ලැබුවේ සුදු වස්ත්‍ර හැඳගත් පුද්ගලයින් (උපාසකයින්) යනුවෙනි. එදිනට ඔවුහු ලෞකික කටයුතුවල යෙදීමෙන් හා විනෝදවීමෙන් වැළකී සිටියහ. උපෝෂථ හෙවත් මෙම සති පොහොය ථෙරවාද බුදු දහමේ ඉතා වැදගත් පූජනීය දිනයක් ලෙස සලකනු ලැබේ. එදින ගිහි ශ්‍රාවකයෝ භික්ෂූන් වහන්සේගෙන් (ථෙර) බණ ඇසීම සඳහා විහාරාරාම වලට පැමිණෙති. තෙරපියුටාවරු වයස එළඹීම හේතුකොට ගෙන 'ථෙර' නමැති තත්ත්වයට පත් නොවේ. වයසින් අඩු භික්ෂුවකට වුවද තෙරපියුටා සංඝ සමාජය තුළ දීර්ඝ කාලයක් සාමාජිකත්වය දරා තිබේ නම් 'ථෙර' නමැති තත්ත්වයට පත් විය හැකිය. බෞද්ධ සාමණේරයින් වහන්සේලාවද ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් දීර්ඝ කාලයක් සේවය කිරීමට සිදු වේ. එපමණක් නොව, භික්ෂුණීන් සහ භික්ෂූන් වෙන් වෙන්ව සිටීම සඳහා පනවන ලද විනය නීති සහ නියෝග රාශියක් තිබේ. භික්ෂුවක් හෝ භික්ෂුණීන් වහන්සේ කෙනෙකු විසින් පරිහරණය කළ හැකි සිවුරු ප්‍රමාණය සහ ඒවායේ වර්ණය පවා සීමා කරමින් සවිස්තරාත්මක නියෝග පනවා තිබේ.

ෆිලෝ විශ්ව දේශ වාසියෙක් (Cosmopolitan) මෙන්ම හෙලනීසියානු ආභාෂය ලැබූ යුදෙව්වෙක්ද විය. කෙසේ වෙතත් දෙවියන් වහන්සේ පිළිබඳ ප්‍රශ්න වලදී ඔහු තම හෙලනීසියානු අධ්‍යාපනය අමතක කර යුදෙව් සම්ප්‍රදාය අනුව කටයුතු කළේය. සමහර විට ඔහු තෙරපියුටා

ප්‍රජාව පිළිබඳ මෙතරම් උනන්දුවකින් විස්තර කර තිබෙන්නේ ඔවුන් තුළ පැවැති යුදෙව් ලක්‍ෂණ හේතුකොට ගෙන විය හැකිය. දෙවියන් වහන්සේ සහ සත්‍යය පිළිබඳව උසස් අවබෝධයක් ඇතිකර ගැනීම සඳහා ඉතා පිරිසිදු චේතනාවෙන් යුක්තව පූර්ණත්වයට (රහත් ඵලයට) පත්වීම සඳහා පාරමී දම් පුරමින් සියලු ගිහි සැප සම්පත් අත්හැර දමා කටයුතු කළ මෙම ආධ්‍යාත්මික ගවේෂකයින් (Spiritual Athletes) කෙරෙහි ඔහු මහත්සේ පැහැදී සිටි බව ඔහු විසින් කර ඇති විස්තරවලින් පැහැදිලි වේ. තෙරපියුටා සාමාජිකයින් තමා පිළිගත් ආගමික සම්ප්‍රදායට කිට්ටු ආගමික නිකායකට අයත් පුද්ගලයින් ලෙස පෙන්නුම් කිරීම සඳහා ෆිලෝ විසින් උත්සාහයක් දරා ඇතැයි මෙහිදී කෙනෙකුට වැරදි වැටහීමක් ඇති විය හැකිද? කෙසේ වෙතත් තෙරපියුටා ප්‍රජාව ඇත්ත වශයෙන්ම යුදෙව් ජාතික ශ්‍රමණයින් කොටසක්ද යන කාරණය පිළිබඳ නිශ්චිත වැටහීමක් ඔහුට නොතිබූ බව පෙනේ.

තෙරපියුටා ශ්‍රමණයින්ගේ රැස්වීම් මෙන් නොව, ග්‍රීක් දාර්ශනිකයින් විසින් පවත්වනු ලැබූ රැස්වීම් පහත් මට්ටමේ ශෝභාකාරී ප්‍රියසම්භාෂණ උත්සව ලෙස සඳහන් කරමින් ඒවා හෙලා දැකීමට ඔහුට තිබූ බලවත් වුවමනාව නිසා කිසිම දේපොල වස්තුවක් අයත් නොවූ, ජීවනෝපාය පිණිස වෘත්තියක නියැලී නොසිටියාවූ තෙරපියුටා ප්‍රජාව ජීවත් වූ ආකාරය පිළිබඳ කිසි සඳහනක් ඔහු විසින් කර නොමැත. සමහර විට ඔහු එසේ කරන්නට ඇත්තේ හිතා මතාම විය හැකිය. මන්ද එවැනි සඳහනක් කිරීම ඔවුන්ට කරන අවමානයක් ලෙසත් ඒ පිළිබඳ විස්තර කිරීම තෙරපියුටාවරු පිළිබඳව ඉදිරිපත් කිරීමට ඔහුට අවශ්‍යවූ ප්‍රතිරූපයට අදාළ නොවන බවත් කල්පනා කළ හෙයින් සමහරවිට ඒ පිළිබඳව ඔහු විසින් හිතාමතාම කිසිවක් සඳහන් නොකරන්නට ඇතැයි සිතිය හැක. ඇත්ත වශයෙන්ම ලෝකයේ වෙනත් රටවල පිණ්ඩපාතයෙන් යැපෙමින් ජීවත් වන බෞද්ධ භික්ෂූන් මෙන් තෙරපියුටා ශ්‍රමණයින්ද පිණ්ඩපාතයෙන් යැපුණාහ.

අනාගත වාක්‍ය පිළිබඳ විශ්වාසයක් ඔවුන් තුළ නොතිබූ බව ෆිලෝ තවදුරටත් සඳහන් කර තිබේ. ඒ සම්බන්ධයෙන් ඔවුහු යුදෙව් ආගමික කණ්ඩායම්වලට වඩා බොහෝදුරට වෙනස් වූහ. අනාගත වාක්‍ය පිළිබඳ විශ්වාස නොකිරීම බෞද්ධ සම්ප්‍රදායේ පැහැදිලි ලක්‍ෂණයකි. මේ නිසා ඊනොක් විසින් රචිත පොත් ඔවුන්ගේ ශුද්ධ ග්‍රන්ථ අතර තිබූ බවට ෆිලෝ විසින් කර ඇති උපකල්පනය පදනම් විරහිත බව පෙනේ. මන්ද ඊනොක් විසින් ලියා ඇති පොත්වල සඳහන් වන එළිදරව්ව පිළිබඳ සංකල්ප රූප (Apocalyptic Images) ගතවූ සහස්‍රකයේ අවසාන දශක දෙක තුළදී විවිධ යුදෙව් ආගමික කණ්ඩායම් මගින් තීව්‍ර ලෙස වර්ධනය

කර පෝෂණය කර තිබෙන හෙයිනි. එවැනි කරුණු පිළිබඳ විශ්වාසය බොහෝ දුරට අනාගතය හෙළිකරන්නාවූත්, මරණින් පසු පවත්නා ජීවිතයක් පිළිබඳ විශ්වාස කරන්නාවූත් ආගමික සම්ප්‍රදායක අංග වේ. එවැනි විශ්වාසයක් පැවතීම තෙරපියුටා ප්‍රජාවට පටහැනිය. ඔවුන්ගේ එකම අභිප්‍රාය වූයේ ස්වෝත්සාහයෙන් කටයුතු කර ආධ්‍යාත්මික ගුණ වගාවෙන් යුක්ත ධාර්මික ජීවිතයක් ගොඩනගා ගැනීමය. මෙම ආගමික නිකායට දී ඇති නම සලකා බැලීමෙන් පවා 'තෙරපියුටා' යනු බෞද්ධ භික්ෂූන් බව පෙනී යයි. ඇත්ත වශයෙන්ම 'තෙරපියුටා' යන නමේ අර්ථය පිළිබඳ පැහැදිලි වැටහීමක් ෆිලෝට තිබුණු බවක් නොපෙනේ. ආගමික කරුණු විග්‍රහ කිරීම සඳහා ව්‍යවහාරික වශයෙන් වාග් විද්‍යාව යොදා ගැනීම පිළිබඳ විශේෂඥයකු වූ සැකරියාස් තුණ්ඩි (Zacharias Thundy) විසින් කරන ලද විශිෂ්ට පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් මෑතක දී මෙම ගැටලුව නිරාකරණය කර ගත හැකි විය. 'තෙරපියුටා' යනු බෞද්ධ ප්‍රභවයක් ඇති වචනයකි.[18] ථෙරවාද යනුවෙන් හැඳින්වෙන සංස්කෘත/පාලි වචනය හෙලනීසියානුකරණය වීමෙන් තෙරපියුටා බවට පත් විය. ගන්ධාරයේ සිට බටහිර රටවලට ධර්ම ප්‍රචාරය පිණිස පිටත්ව ගිය භික්ෂූන් අයත් වූ බෞද්ධ ගුරුකුලය හැඳින්වූයේ ථෙරවාද යන නමිනි. අශෝක රජතුමා විසින් පවත්වනු ලැබූ ධර්ම සංගායනාවේදී ධර්ම ප්‍රචාරය සඳහා භික්ෂූන් විවිධ රටවලට පිටත්කර හැරිය යුතු බව තීරණය කරනු ලැබුවේ ථෙරවාදී ගුරුකුලයේ නිර්මාතෘවරයා වූ මොග්ගලී පුත්ත තිස්ස ස්ථවිරයන්ගේ යෝජනාවකට අනුවය. ඒනිසා ඈත රටවලට ධර්ම ප්‍රචාරය සඳහා පිටත්ව ගියේ ථෙරවාදී භික්ෂූන් බව සිතිය හැක. ඕෂ්ඨජ-දන්තජ අක්ෂරයක් වන *v* නමැති ඌෂ්ම අක්ෂරයට සහ *ථ* අක්ෂරයට සමාන ශබ්ද ග්‍රීක් භාෂාවේ නොමැත. එනිසා ඉන්දියානු *v* අක්ෂරය සහ *ථ* අක්ෂරය ග්‍රීක් භාෂාවේදී *p* සහ *t* බවට හැරේ. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් නමැති පූජකයා විසින් 'බුද්ධ' යන වචනය ග්‍රීක් භාෂාවට පරිවර්තනය කිරීමේදී ඉහතකී ශබ්ද විස්ථාපනය සිදු වීමෙන් එය 'බුට්ට' (Boutta) යනුවෙන් පරිවර්තනය කර තිබෙන සැටි තුණ්ඩි පෙන්වා දී තිබේ. තෙරපියුටා යන වචනයේ දක්වෙන *p* අක්ෂරය ඇත්ත වශයෙන්ම උච්චාරණය කිරීමේදී ශබ්ද නොවන '*h*' අක්ෂරය වේ. දෙමළ භාෂාවෙන් කුරුඳු හැඳින්වීම සඳහා යොදා ඇති කරුවා (Karuwa) නමැති වචනය ටෙසියාස් (Ktesias) විසින් කාර්පියෝන් (Carpion) යනුවෙන් පරිවර්තනය කර තිබෙන බව මේ කාරණය තවදුරටත් පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි තවත් උදාහරණයක් බව තුණ්ඩි සඳහන් කර තිබේ. මෙහිදී සිදුවී තිබෙන්නේ ථෙරවාදය යන වචනය සම්බන්ධයෙන් සිදු වී ඇති පරිදි *v* ශබ්දය 'ප' (*p*) වශයෙන් වෙනස්වී තිබීමය.

තෙරපියුටා සාමාජිකයින් තමන් හඳුන්වාදීම සඳහා එම වචනය යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කර දීම සඳහා මෙසේ ශබ්ද විස්ථාපනය වී තිබෙන සැටි පෙන්වා දීම සමහරවිට අනවශ්‍ය විය හැකිය. ඊජිප්තුවේ ශ්‍රමණ සමාජයක් බිහිකළ ථෙරවාදී භික්ෂූන් 'ථෙරවාද' (ජ්‍යෙෂ්ඨයින්ගේ ඉගැන්වීම) නමැති වචනයේ නිරුක්තියක් වූ ථෙරපුත්ත (ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ගේ පුත්‍රයින්) යන වචනය යොදා ගත් බව සිතා ගත හැකිය.[19] තමන් නොදන්නා විදේශ රටක පිහිටි ඇලෙක්සැන්ඩ්‍රියා නුවරට පිටත්ව යාම සඳහා දීර්ඝ වූත්, දුෂ්කර වූත්, අනතුරුදායක වූත් ගමනට බොහෝ විට සහභාගි වන්නට ඇත්තේ තරුණ භික්ෂූන් වීම නිසා ඔවුන් තමන් හඳුන්වා ගැනීම පිණිස ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ගේ පුත්‍රයින් හෙවත් ථෙරපුත්ත යනුවෙන් පදවි නාමයක් යොදා ගැනීම යෝග්‍යය. අද සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින අපට ඉතා හුරු පුරුදු 'චිකිත්සක' (Therapist) සහ චිකිත්සාව (Therapy) වැනි වචන තෙරපියුටා ප්‍රජාව විසින් ඉටු කළ ප්‍රධාන කටයුතු පැහැදිලි කර දීම සඳහා ෆිලෝ විසින් යොදා ගෙන තිබේ. ග්‍රීක් භාෂාවේ ඇතුළත් එම වචන වලින් ගම්‍ය වන අර්ථය ලැබී තිබෙන්නේ මෙම ආගමික ප්‍රජාවට දෙන ලද නම ඇසුරෙනි. මෙසේ 'ආත්මය සුවපත් කරන්නවුන්' යන අර්ථය සමග සම්බන්ධ කරමින් ෆිලෝ මෙම ආගමික කණ්ඩායම හඳුන්වාදීම සඳහා තෙරපියුටා යන නම යොදා ගෙන තිබේ. කෙසේ වෙතත් තෙරපියුටා ශ්‍රමණ සමාජයේ සැබෑ තත්ත්වය පිළිබඳව ඔහුට පැහැදිලි වැටහීමක් තිබී නැත. ඒ බව තෙරපියුටා ශ්‍රමණයින් 'යාචකයින්' සහ 'හිගන්නන්' වශයෙන් නිතර නිතර හඳුන්වා තිබීමෙන් පැහැදිලි වේ. බෞද්ධ ශ්‍රමණයකු හැඳින්වීම සඳහා යොදා ගෙන ඇති භික්ෂුව නමැති සංස්කෘත වචනයේ අදහස එයම වේ. එහි පදානුගත පරිවර්තනය යාචකයා යන වචනයෙන් 'දත් ඉල්ලන තැනැත්තා' යන අර්ථය ගෙන දේ.

ඇලෙක්සැන්ඩ්‍රියා නුවර විසූ තෙරපියුටා භික්ෂු සමාජයේ සාමාජිකයින් වූයේ අශෝක රජතුමා විසින් ධර්ම ප්‍රචාරය සඳහා ටොලමි ෆිලඩෙල්ෆොස් රජතුමා වෙත පිටත්කර යවනු ලැබූ ථෙරවාදී බෞද්ධ භික්ෂූන්ය. මිනිසුන් මෙන්ම සතුන් පවා සුවපත් කිරීමේ කාර්යභාරය ඔවුන්ට පැවරී තිබිණ. අශෝක රජතුමාගේ ගිර්නාර් ශිලා ලිපියේ මෙසේ සඳහන් කර තිබේ. "එපමණක් නොව දේවානම් ප්‍රියදර්ශී (අශෝක) විසින් ඇන්ටිඕකස් නමැති ග්‍රීක් රජතුමාගේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල සෑම තැනම වෛද්‍ය පහසුකම් සලසාදීමේ ද්විත්ව ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. මිනිසුන්ට මෙන්ම සත්වයින්ගේ ප්‍රයෝජනය සඳහා සෑම වර්ගයකම ඖෂධ සමග මිනිසුන්ට මෙන්ම සතුන්ටද වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ."

අශෝක රජතුමා විසින් ඖෂධ පැළෑටි ඉතා දුර බැහැර රටවලින් ගෙනැවිත් ඒවා කලින් නොතිබූ ප්‍රදේශවල රෝපණය කළ බවද එම ශිලා ලේඛනයේ දැක්වේ. 'ලලිත විස්තරය' ආරම්භයේදීම බුදුන්වහන්සේ 'දුකට වෙදාණ' (King of Medicine) කෙනෙක් ලෙස ඉතා උත්කර්ෂ අන්දමින් වර්ණනා කර තිබේ. ඒ බව සඳහන් කර ඇති කොටසේ ඇතුළත් ගාථාවක මෙසේ සඳහන් වේ: 'බව දුකට වෙදැදුරු වූ සම්මා සම්බුදු පියාණනි, සසර දුකින් පෙළෙන සත්වයා කෙරෙහි අනුකම්පාවෙන් ඔබ වහන්සේ සතු නොවැදෑරුම් ඔසුවෙන් ඔවුන්ට නිවන් සුව පසක් කර දී සුවපත් කරනු මැනවි.'

ධර්ම දේශනා කිරීම සහ භාවනා ක්‍රම පුහුණු කරවීම තුළින් බුදුන් වහන්සේ තම ශ්‍රාවකයින්ට විමුක්තිය උදාකරදීම සඳහා ක්‍රියා කළේ යම්සේද, එපරිද්දෙන්ම තම ශ්‍රාවකයින්ගෙන්ද දහම් දෙසීම සහ භාවනාව පුහුණු කරවීම තුළින් මිනිසුන්ට යහපත උදාකරනු දැකීම උන්වහන්සේගේ අපේක්ෂාව විය.

තෙරපියුටා ප්‍රජාව කෙරෙහි ෆිලෝ තුළ පැවති උනන්දුව ඔහු විසින් රචිත දාර්ශනික සහ ආගමික අදහස් ඇතුළත් පොතපත තුළින් හොඳින් තේරුම් ගැනීමට පුළුවන. එම පොතපත මගින් ඔහු තම චින්තනය ඉන්දියානු දර්ශනයට සමාන ආකාරයකින් විකාශනය කර තිබේ. මෙසේ පැරණි තෙස්තමේන්තුවේ දැක්වෙන දෙවියන් වහන්සේ සහ සුරදූතයින් (Angels) විද්‍යමාන වීම ඉන්ද්‍රිය ගෝචර මායාවක් (Sensory Illusion) ලෙස තේරුම් ගත යුතු බව ඔහු පැහැදිලි කර තිබේ. 'මායා' යනුවෙන් හැඳින්වෙන ඉන්දීය සංකල්පය හෙවත් ඉන්ද්‍රිය ගෝචර රැවටිලි සහිත ලෝකය ප්ලේටෝනික අදහස් (Platonic Ideas) සමග ඔහු කෙතරම් දක්ෂ ලෙස සම්බන්ධ කොට ඉදිරිපත් කොට තිබේද යත් බුදු දහමට ආවේණික වූ බොහෝ සංකල්ප ෆිලෝගේ රචනාවල දක්නට ලැබෙන බව 1828 වර්ෂය තරම් ඈත කාලයේදී අයිසැක් ජේකබ් ෂ්මිට් (Isacc Jacob Schmidt) විසින් ප්‍රකාශ කර තිබේ.[20] ෆිලෝ එම ඉන්දීය අදහස් ඉගෙන ගත්තේ ඔහු ඉතා ගෞරවයෙන් සලකනු ලැබූ තෙරපියුටා ප්‍රජාවගෙන් බව සඳහන් කරමින් අපට මෙහිදී එම ප්‍රකාශයට කිසියම් ඌණ පූරණයක් කළ හැකිය.

තෙරපියුටා ශ්‍රමණයින් ගිහි ගෙය අත් හරින බවත් එසේ කිරීමේ දී ඔවුන් නැවත තම සහෝදරයින්, දරුවන්, කාන්තාවන්, මාපියන්, සියලුම නෑදෑයින් සහ හිත මිත්‍රයන් පමණක් නොව තමන් ඉපදී, හැදී වැඩුණු රටවල් පවා අත් හරින බවත් ඒ කිසිවක් කෙරෙහි නැවත ආපසු හැරී නොබලන බවත් සඳහන් කරමින් ෆිලෝ විසින් කර තිබෙන ප්‍රකාශය

අපේ විශේෂ අවධානයට ලක් විය යුතුය.[21] එම ප්‍රකාශය පැහැදිලි කර දිය හැක්කේ බෞද්ධ සන්දර්භයක් තුළ පමණි. එසේ මානව සම්බන්ධතා විශේෂයෙන්ම තම පවුලට ඇති සම්බන්ධතා සියල්ල සම්පූර්ණයෙන්ම අත්හැර දැමීම යුදෙව් සමාජය තුළ කිසිසේත් සිදු විය හැකියයි බලාපොරොත්තු විය නොහැකිය. විසිරී ජීවත්වන යුදෙව් ජාතිකයින් ඒකරාශී කිරීම යුදෙව් ආගමේ වැදගත් තැනක් ගත්තේය. පුද්ගලයකු විසින් තම පවුලට ඇති සියලු බැඳීම් ඉවත ලා ගිහිගෙය හැර යෑම අයත් වූයේ එක් ආගමික සම්ප්‍රදායකට පමණි. ඒ බෞද්ධ සම්ප්‍රදායයි. පවුලට ඇති සියලු බැඳීම් ඉවත ලා තමා අනුව එන ලෙස තම ශ්‍රාවකයින්ට ප්‍රකාශ කළ පලස්තීනයේ විසූ එකම පුද්ගලයා වූයේ ජේසුස් වහන්සේ පමණි. ජේසුස් වහන්සේ බෞද්ධ ඉගැන්වීම් වල සඳහන් වචන තම ඉගැන්වීම් සඳහා යොදා ගත්තේ කුමක් නිසාද යන ගැටලුව පැහැදිලි කර දීමෙන් ඊට මුල් වූ හේතුව තෙරපියුටා ආගමික සමාජය තුළ සැඟවී තිබෙන බව පෙනී යයි.

ෆිලෝ විසින් කරන ලද විස්තරයේ ඇතුළත් තවත් කරුණකින් විශේෂ කාරණයක් පැහැදිලි කර ගැනීම සඳහා වටිනා ඉඟියක් ලැබේ. එනම් තෙරපියුටා ශ්‍රමණ සමාජයට ඇතුළත් වීමට කැමති පුද්ගලයින් විසින් හුදෙක් තම හැදෑයින් පමණක් නොව ඔවුන් ඉපදී, හැදී වැඩුණු රටවල් පවා අත්හැර දැමූ බව ඔහු සඳහන් කර තිබේ. ඔවුන් යුදෙව් ජාතිකයින් වී නම් තෙරපියුටා ආගමික සමාජයේ පුහුණුව ලැබීම සඳහා ආධුනිකයින් තෝරා ගන්නා ලද්දේ ඊජිප්තුවේ පිහිටි විශාල යුදෙව් ජන සමාජ වලින් බව, විශේෂයෙන්ම ක්‍රි. පූ. 3 වන ශත වර්ෂයේ සිට ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියා නුවර සහ ඒ අවට පදිංචිව සිටි යුදෙව් ජාතිකයින්ගෙන් බව අපට උපකල්පනය කිරීමට සිදුවේ. කෙසේ වෙතත් මෙම ආගමික නිකායට අයත් සාමාජිකයින්ගෙන් කීප දෙනෙක් හෝ වෙනත් රටවලින් පැමිණ සිටි බව ෆිලෝ සඳහන් කර තිබේ. ඔවුන් පැහැදිලිවම අශෝක රජතුමා විසින් ඇලෙක්සැන්ඩ්‍රියාවට පිටත් කර යවනු ලැබූ බෞද්ධ ධර්ම දූතයින්ගෙන් පැවත එන බව පෙනේ. මෙසේ ඔවුන් මුලින් අයත්ව සිටි රටවලින් පිටවී තෙරපියුටා සමාජයට පැමිණියහ.

ඇලෙක්සැන්ඩ්‍රියා නුවර පිහිටි මෙම ජනපදය වෙනස් නොවන ස්ථිතික සමාජයක් ලෙස සැලකිය යුතු නැත. මැරිඔටිස් විල අවට ප්‍රදේශයේ වාසය කළ බෞද්ධයෝ එම ප්‍රදේශයේ ජීවත් වූ වැසියන් සමඟ සම්බන්ධතා පැවැත්වූහ. ලෝකයට විවෘතව පැවති මෙම නගරය එවැනි සම්බන්ධතා සඳහා යෝග්‍ය තත්ත්වයක පැවතිණ. ඇලෙක්සැන්ඩ්‍රියා නගරයේ පිහිටි විශාල වෙළඳ ආයතනවලට උදෙස්ගිමින් ශ්‍රමණයින් නිතර පැමිණි බවත් [illegible]න් සංචාරක බෞද්ධ

භික්ෂූන් බවත් අලුත් දේවල් සොයා යෑම පිළිබඳ ඔවුන් තුළ පැවති කුතුහලය සහ ආගම ප්‍රචාරය කිරීමේ බලාපොරොත්තුවෙන් තමන් උපන් දේශය අත්හැර පැමිණි අය බවත් ප්‍රංශ ජාතික ඉතිහාසඥයකු වූ සිල්වන් ලෙවී සඳහන් කර තිබේ.[22] මෙම බෞද්ධ භික්ෂූන් විශාල වෙළඳුන්ට වඩා ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ බෞද්ධාගමිකයින්ගේ සැලකිල්ලට භාජනය වූ බව අපට කල්පනා කළ හැකිය. එම භික්ෂූන් තමන් මුලින් අයත් වූ රටවල් සමඟ නිරන්තරයෙන් පවත්වා ගනු ලැබූ සම්බන්ධතා මගින් අලුත් අදහස් පිළිබඳ දැන ගැනීමටත් අලුතින් පළ වූ පොතපත බටහිර රටවලට ගෙන්වා ගැනීමටත් කටයුතු කරන ලදී.

ජේසුස් වහන්සේ සහ බෝධිසත්ව සංකල්පය

ඉහත සඳහන් කරන ලද භික්ෂූන් ඉන්දියාවේ ගන්ධාර දේශයේ පිහිටි තක්ෂිලා නුවරින් පැමිණෙන්නට ඇතැයි සිතිය හැකිය. නාගරික ව්‍යුහය, ජනාවාස සහ වැදගත්කම අතින් තක්ෂිලා නුවර ඇලෙක්සැන්ඩ්‍රියාවට සමාන කළ හැකිය. අශෝක රජතුමා එහි ඇරමයික් භාෂාවෙන් ලියන ලද ශිලා ලේඛනයක් පිහිටුවිය. බටහිර දෙසට විහිද ගිය වෙළඳ මාර්ග ආරම්භ වූයේ එහි සිටය. ඈත අතීතයේදී තක්ෂිලා නගරය උතුරු ඉන්දියාවේ පිහිටි බෞද්ධ ආගමික මධ්‍යස්ථානයක් ලෙස පැවතුණි. එතෙකුදු වුවත් නැගෙනහිර සහ බටහිර රටවල් අතර පැවැති සම්බන්ධතා වර්ධනය වීම සඳහා තක්ෂිලා-සර්කැප් (Taxila-Sirkap) නගරයේ පැවැති ඓතිහාසික වැදගත්කම අසාධාරණ ලෙස අවතක්සේරුවට ලක් කර තිබෙන බව කිව යුතුය. නොඑසේ නම් එහි වැදගත්කම සම්පූර්ණයෙන්ම පාහේ නොසලකා හැර තිබේ.

වර්තමාන පාකිස්ථානයේ පිහිටි ඉස්ලාමාබාද් සහ රාවල්පිණ්ඩි නමින් හැඳින්වෙන නගරවල සිට සැතපුම් 30 කට වඩා අඩු දුර ප්‍රමාණයක පිහිටා ඇති තක්ෂිලාව එකල පුෂ්කරවතී නුවර (අද පෙෂාවර්) හැරුණු විට එම ප්‍රදේශයේ පැවති ඉතා වැදගත් නගරය විය. තක්ෂිලා යන නම ඇති වූයේ ජනප්‍රවාදයේ එන තක්ෂක නමැති පාලකයකුගේ නම මුල්කර ගෙනය. මෙසේ තක්ෂිලාව මුලදී හඳුන්වන ලද්දේ 'තක්ෂක කන්ද' යන අර්ථය දෙන 'තක්ෂ-ශිලා' යන නමිනි.

වැදගත් වෙළඳ මාර්ග කීපයක් මෙහිදී හමුවේ. ඉන් එක් වෙළඳ මාර්ගයක් නැගෙනහිර ඉන්දියාවේ සිට ගංගා නම් ගං නිම්නය හරහා තක්ෂිලා නුවරට සම්බන්ධවී තිබිණි. මෙගැස්තිනීස් විසින් රජ මාවත

නමින් හඳුන්වනු ලැබූ මෙම මාර්ගය පාටලීපුත්‍ර නගරයේ සිට මෞර්ය අධිරාජ්‍යයේ වයඹ දිග ප්‍රදේශ දක්වා විහිදුණි. බටහිර ආසියාවෙන් ආරම්භ වූ තවත් මාර්ගයක් බැක්ට්‍රියාව (Bactria) කපිසි (Kapisi) සහ ඔහින්ඩ් (Ohind) යනුවෙන් හැඳින්වුන නගර වලට ආසන්නයේ පිහිටි පුෂ්කරවතී නගරය සහ ඉන්දු ගඟ හරහා තක්ෂිලාවට ළඟා විය. තුන්වන මාර්ගය කාශ්මීරය සහ මධ්‍යම ආසියාවේ සිට ශ්‍රී නගර් නිම්නය, බරමුලා (Baramula) සහ මන්සෙහෙරා (Mansehera) හරහා හරිපූර් (Haripur) නිම්නය දක්වා වැටී තිබුණි. තක්ෂිලාව අධික ජනගහනයකින් යුක්ත වූ සුප්‍රසිද්ධ නගරයක් බවට පත්වීමට මෙම ප්‍රධාන වෙළඳ මාර්ග තුන මූලික වශයෙන් හේතු විය.

ක්‍රි. පූ. 522 පටන් ආකිමෙනිඩ්ස් (Archaemenids) විසින් මුදල් භාවිතා කිරීමේ ආර්ථික ක්‍රමයක් හඳුන්වා දීමෙන් පසු වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් තක්ෂිලා නුවරට තිබූ වැදගත්කම තවදුරටත් වැඩි විය. ආකිමෙනිඩ්ස් ගේ පාලන ප්‍රදේශය හරහා ඊජිප්තුව පවා ඇතුළත් දුර බැහැර පිහිටි රටවලට එය සම්බන්ධ විය. විවිධ අංශ සම්බන්ධයෙන් අලුත් දියුණුවක් ඇතිවීම කෙරෙහි තක්ෂිලා නුවර මගින් ඉඩකඩ සැලසුණි. වෙළඳාම විශාල ලෙස දිරිමත් කරමින් පළමුවරට "පුරාණ" (Puranas) නමින් හඳුන්වනු ලැබූ දික් හැඩයෙන් යුත් රිදී තහඩු මුදල් වශයෙන් පාවිච්චි කරනු ලැබුයේ තක්ෂිලා නුවරය. එම මුදල් නිකුත් කරනු ලැබුවේ වෙළඳ මණ්ඩල (Merchants Guild) මගිනි. මෙම පෞද්ගලික නීත්‍යානුකූල මුදල් භාවිතා ක්‍රමය ගන්ධාර වැසියන් විසින් සමකාලීන වශයෙන් බැබිලෝනියාවේ භාවිතා වූ ටන්කන ක්‍රමය (System of Coinage) අනුගමනය කරමින් යොදා ගත් බව සිතිය හැකිය.[23]

කෙසේ වෙතත්, තක්ෂිලා නුවර හුදෙක් වෙළඳ මධ්‍යස්ථානයක් පමණක් නොවීය. උතුරු ඉන්දියාවේ පැවති පැරණිතම නගර දෙදාහෙන් එකක් වූ තක්ෂිලාව පුරාණයේ එහි පැවති ත්‍රිවේදය, පූජා විධි සහ දෙසැට පුරාණය උගන්වනු ලැබූ කීර්තිමත් විශ්ව විද්‍යාලය හේතුකොට ගෙන බොහෝ දුර බැහැර රටවල පවා මහත් ප්‍රසිද්ධියට පත් වී තිබුණි. දැනුම සොයා ගිය පුද්ගලයින් බොහෝ ප්‍රාන්ත රාජ්‍යවල සිට තක්ෂිලාවට ඇදී ආවේය. අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් එහි පැවති වැදගත්කම බෞද්ධ ජාතක කථාවල ඉතා උත්කෘෂ්ට ලෙස වර්ණනා කර තිබේ. බොහෝ රාජ කුමාරවරු සහ වංශවත් පුද්ගලයින් මගධ දේශය වැනි දුර රටවලින් ඉගෙනීම සඳහා තක්ෂිලා නුවරට පැමිණි බව එම පාලි පොත්වල සඳහන් වේ. තරුණ බමුණන්, ක්ෂත්‍රිය කුමරුන් සහ පොහොසත් සිටු කුමාරවරු රජගහ, කාශී සහ කෝසල දේශවලින් එහි පැමිණියහ. බිම්බිසාර රජතුමාගේ සුප්‍රසිද්ධ රාජකීය වෛද්‍යවරයා වූ බුදුන් වහන්සේට

පවා ප්‍රතිකාර කළ "ජීවක" නමැති වෛද්‍යවරයා කීර්තිමත් ගුරුවරයකු යටතේ තක්ෂිලා විශ්ව විද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාව ඉගෙන ගත් ශිෂ්‍යයින් අතුරෙන් කෙනෙකි. බුදුන් වහන්සේ ජීවමානව වැඩ විසූ කාලයේදී ඇති වූ බොහෝ සිද්ධීන් වලට සම්බන්ධකමක් තිබූ කෝසල රාජ්‍යයේ පාලකයා වූ පසේනජිත් කොසොල් රජතුමා අධ්‍යාපනය ලැබුවේද තක්ෂිලා විශ්ව විද්‍යාලයෙනි.

සමකාලීන විස්තර තොරතුරු සහ පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් අනුව සලකා බැලීමේදී තක්ෂිලා නුවර පෙරදිග ඇලෙක්සැන්ඩ්‍රියාව ලෙස හැඳින්වීමට පුළුවන. ශ්‍රීමත් ජෝන් මාර්ෂල් (Sir John Marshall) විසින් කරන ලද පුරාවිද්‍යාත්මක කැනීම්වල ප්‍රතිඵලයක් වශයෙන් තක්ෂිලාවට අයත් වූ සියුම් ලෙස කැටයම් කළ ගල් වර්ග, හොඳින් ඔප මට්ටම් කළ මූර්ති, වීදුරු භාණ්ඩ සහ ක්‍රි. පූ. 6 වන ශතවර්ෂයේ පටන් භාවිත වූ කාසි සොයා ගනු ලැබීය. එම භාණ්ඩවල ගුණාත්මකභාවය ඉතා උසස් මට්ටමක පැවති අතර එය අභිභවා යාමට පසුකාලීනව එළඹි ශත වර්ෂවලදී නිෂ්පාදනය කරන ලද භාණ්ඩවලට පවා නොහැකි විය. අධ්‍යාපනික කේන්ද්‍රයක්වීම නිසා තක්ෂිලාවට අලුත් අදහස් නිරන්තරයෙන් ගලා ආවේය. නව අදහස් ප්‍රචාරය කළ පුද්ගලයින්ට හොඳ ශ්‍රාවක පිරිසක් එහිදී සොයා ගැනීමට හැකි විය. සමහර විට බුදුන් වහන්සේගේ ශ්‍රාවකයින්ද ධර්ම දේශනා කිරීම සඳහා මුල් කාලයේදී තක්ෂිලා නුවරට පැමිණෙන්නට ඇත.

මගධ දේශය පාලනය කළ මෞර්ය රජදරුවන් සහ සෙලුසිඩ් (Seleucid) පාලකයින් අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා හේතුවෙන් එකල ඉන්දියාවේ පැවති තත්ත්වය පිළිබඳ තොරතුරු වාර්තා කර තිබූ ආකාරය අප විසින් මීට කලින් සඳහන් කරනු ලැබීය. මෙගැස්තිනීස් ගෙන් ආරම්භ වූ මෙම රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ඩෙයිමකෝස් (Deimachos) සහ ඩියනීසියස් (Dionysios) විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. අවාසනාවකට මෙන් ඔවුන් විසින් ලියන ලද විස්තර වාර්තා අද අභාවයට ගොස් තිබේ. එම රාජ දූතයින් නිසැකවම තක්ෂිලාවට පැමිණෙන්නට ඇතැයි සිතිය හැකිය. එපමණක් නොව ඔවුන් ඉන්දියාවේ වාසය කළේ බුද්ධාගම ඉතා දියුණු තත්ත්වයක පැවති යුගයකදීය. එනිසා ඔවුන් විසින් ලියන ලද විස්තර වාර්තා අහිමිවීම අපේ විශේෂ කනගාටුවට හේතුවන කරුණකි. මගධ දේශයේත් ගන්ධාරයේත් එවකට ජීවත්වූ බෞද්ධයින් සමග ඔවුන් සම්බන්ධතා පවත්වන්නට ඇති බව අපට උපකල්පනය කළ හැකිය. බින්දුසාර රජතුමා සහ ඔහුගෙන් පසු රාජ ප්‍රාප්තියට පත් අශෝක රජතුමාගේ රාජසභාවේ රාජ දූතයකු ලෙස සේවය කළ ඩයනීසියස් එසේ සම්බන්ධකම් පැවතූ

විදේශීය රාජ් දූතයෙකි.

තක්සිලා නුවරට උතුරෙන් චීනය දක්වා නවත් මාර්ගයක් විහිදී තිබුණි. එය පැරණි සේද මාවතට (Silk Road) විකල්පයක් ලෙස පැවතුණි. එම විකල්ප මාර්ගය මංසේරා (Mansehra) සහ තාකොට් (Thakot)අතරින් බටහිර හිමාල ප්‍රදේශයේ සිට ඉන්දු ගඟ දක්වා විහිදී තිබුණි. එම මාර්ගය ඔස්සේ බොහෝ බෞද්ධ ගොඩනැගිලිවල නෂ්ටාවශේෂ දක්නට ලැබේ. මේවා තක්සිලා නුවර අවට පිහිටි මාර්ග ඔස්සේ බෞද්ධ භික්ෂූන් විසින් ඇති කරන ලද බලපෑම පෙන්නුම් කරන සාක්ෂි වේ. ක්‍රි. පූ. තුන්වන ශත වර්ෂයේදී මෙම උතුරුදිග මාර්ගය ඔස්සේ බුදු දහම චීනයටත්, චිං ෂි-හුඇන්-ටී (Chin Shih-huang-ti) රජතුමාගේ රජවාසලටත් හඳුන්වා දුන් බව වාර්තා වේ. එම වාර්තාවල පවතින විශේෂත්වය පිළිබඳව බොහෝ පර්යේෂකයින් සැක පහළ කර තිබුණත් නව සහස්‍රකය ආරම්භවීමට පූර්වයෙන් එළඹි ශත වර්ෂවලදී චීන ජාතිකයින් බුදු දහම පිළිබඳව දැන සිටි බවට සැකයක් නැත.[24] ක්‍රි. පූ. දෙවන ශත වර්ෂයේ පටන් චීනයේ ලියු සෑන් (Liu San) කුමරු ළඟින් ඇසුරු කළ විද්වතුන් විසින් ලියන ලද 'හුඒ-නෑන්-ෂු' (Huai-nan-tzu) වැනි පැරණි දාර්ශනික කරුණු ඇතුළත් කුඩා පොත් බුදුදහමින් ආභාෂය ලබා ලියා තිබීම ඊට කදිම සාක්ෂියකි.

කෙසේ වෙතත් අශෝක රජතුමාගේ රාජ්‍ය සමයේදී තක්සිලා නුවර අවට ප්‍රදේශයකට බෞද්ධ භික්ෂූන් වහන්සේ විශාල සංඛ්‍යාවක් වැඩම කළහ. ධර්ම සංගායනාවෙන් අනතුරුව ධර්ම ප්‍රචාරකයින් පිටත්කර යැවීමට තීරණය කළ පසු මෙම ථෙරවාදී භික්ෂූහු ධර්මය ප්‍රචාරය කිරීම සඳහා විවිධ දිශාවලට පිටත්ව ගියහ. අශෝක රජතුමාගේ දරුවන් දෙදෙනකු වූ මහින්ද කුමරු සහ සංඝමිත්තා කුමරිය ශ්‍රී ලංකාවටත්, සෝන සහ උත්තර නම් වූ භික්ෂූන් වහන්සේලා දෙනම බුරුමයටත් පිටත්ව ගියහ.[25] ඉන්දු නිම්නයේ උතුරු දිග ප්‍රදේශවලට පිටත්ව ගිය වෙනත් බොහෝ භික්ෂූන් වහන්සේලා විසින් එහි බෞද්ධ ආභාෂය ලැබූ වැදගත් සංස්කෘතියක් බිහි කළහ. බටහිර රටවලට ව්‍යාප්තව ගිය ධර්ම ප්‍රචාරක කටයුතු ආරම්භ කරන ලද්දේ එහි සිටය. නව සහස්‍රකය ආරම්භයේදී පවා මහායාන සහ ථෙරවාද ගුරුකුල වලට අයත් භික්ෂූන් වහන්සේලා මධ්‍යම ආසියාවේ පිහිටි සෝම භූමි ආශ්‍රිත නගරවල (Oasis Towns) පදිංචි වූහ. හෙලනීසියානු සංස්කෘතියේ ආභාෂය ලැබූ නව බෞද්ධ සම්ප්‍රදායක් ගන්ධාර දේශයේ සහ ස්වොට් නිම්නයේත් (Swat Valley) බිහි විය. එතැන් සිට එම සම්ප්‍රදාය ඔක්සස් (Oxus) හරහා තරිම් නිම්නයට (Tarim Basin) පැතිර ගියේය.[26] තරිම් නිම්නය පිහිටා තිබුණේ සුප්‍රසිද්ධ පැරණි සේද මාවතේ තවලම් මාර්ග ඔස්සේය. චීනයේ

පිහිටි ප්‍රාන්තයක් වන එම ප්‍රදේශය අද හැඳින්වෙන්නේ සිංකියැන් යනුවෙනි. ක්‍රි. ව. පළමු වන ශත වර්ෂයේදී බෙසික්ලික් (Bezeklik) නමින් හැඳින්වෙන බිතු සිතුවම් අඳින ලද්දේ එහිය. බුදු දහමේ ව්‍යාප්තිය සහ විවිධ ජාතීන්ට අයත් බැතිමතුන් කණ්ඩායමක් එම බිතු සිතුවම්වලින් නිරූපණය කර තිබේ. එම බැතිමතුන් කණ්ඩායමට සිරියානු ජාතිකයකු ද ඇතුළත් වේ.

බෞද්ධ භික්ෂූන්ගේ පැමිණීම නිසා තක්සිලාවේ පිහිටි බෞද්ධ ජනාවාස වඩාත් පෝෂණය විය. අශෝක රජතුමා එතුමාගේ නමින් එහි බෞද්ධ ස්ථූපයක් ඉදි කළේය. බෞද්ධ පොත්පත් වල අශෝක අධිරාජ්‍යා හඳුන්වා තිබෙන්නේ 'ධර්මරාජ්' යනුවෙනි. එනිසා මෙම ස්ථූපය 'ධර්මරාජික ස්ථූපය' (රූප රාමුව 24) නමින් හඳුන්වනු ලැබීය. තම ජීවිත කාලය තුළදී අශෝක රජතුමා විසින් සර්වඥ ධාතු රටේ විවිධ ප්‍රදේශවලට බෙදා හරිනු ලැබීය. එනිසා මෙම ස්ථූපයද සර්වඥ ධාතු නිධන් කර ඉදිකරන්නට ඇතැයි සිතිය හැකිය. මෙම ස්ථූපය තිබෙන්නේ ගර්භයක් වටාය. ගර්භයට ශක්තිය ලබාදීම සඳහා ඒ වටා ධර්ම චක්‍රය නිරූපණය වන පරිදි රෝදයක ගරාදි මෙන් විහිදෙන බිත්ති ගොඩ නගා තිබේ. චෛත්‍යය අවට සක්මන් භාවනාවේ යෙදී සිටින භික්ෂූන් වහන්සේලාට නිතර ධර්ම කරුණු සිහිපත් කරවීම එවැනි හැඩයක් යොදා ගැනීමේ බලාපොරොත්තුව විය.

මෙම ධර්මරාජික ස්ථූපය පැරණි බෞද්ධ සම්ප්‍රදායේ ඉතා වැදගත් ස්ථානයක් දැරීය. එය අවට ප්‍රදේශයේ විවිධ යුගවලට අයත් බොහෝ ආශ්‍රම සහ ස්ථූප විශාල සංඛ්‍යාවක් තිබේ. එවැනි ආශ්‍රම වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ ධර්මරාජික ස්ථූපයට සැතපුම් 1 1/4ක් නිරිත දිගින් පිහිටි කල්වන් (Kalwan) නමැති ස්ථානයේය. මෙම ආශ්‍රම වලින් බොහොමයක් පිහිටා ඇත්තේ නගර ප්‍රාකාරයට පිටතින් පිහිටි ගංගා සහ උල්පත් ජලය ලැබෙන ස්ථානවලට ආසන්නවය. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණවල යෙදෙමින් ඒවායේ අඩංගු ධර්ම කරුණු පිළිබඳ අර්ථ විවරණ කිරීම සඳහා සම්පූර්ණ කාලය මිඩංගු කළ උගත් භික්ෂූන් වහන්සේලා වැඩ විසූ බෞද්ධ ගුරුකුල රාශියක් එහි පැවැති බව එම ආශ්‍රමවලින් පෙන්නුම් කෙරේ.

මෙසේ බුද්ධ ධර්මය පිළිබඳව කරුණු විග්‍රහ කරමින් ලියා ඇති සුප්‍රසිද්ධ ශාස්ත්‍රීය ලේඛනවල එකතුවක් වූ අභිධර්ම පිටකය සම්පාදනය කර තිබෙන්නේ විවිධ ගුරුකුල වලට අයත් උගත් භික්ෂූන් වහන්සේලා විසින් ඉදිරිපත් කරන ලද එම අර්ථ විග්‍රහයන් සියල්ල සංග්‍රහයක් සේ සකස් කිරීමෙනි.

අපේ පරීක්ෂණ සඳහා තක්ෂිලා නුවරත්, ගන්ධාර දේශය වටා පිහිටි ප්‍රදේශයත් මෙතරම් වැදගත් වන්නේ කුමක් නිසාද? එක් අතකින් බලන විට බෞද්ධයින් මුලින්ම ඊජිප්තුව බලා පිටත් වූයේ එහි සිටය. අනික් අතට තෙරපියුටා ආගමික සමාජය තුළ බුදු දහම පිළිබඳ අලුත් අදහස් සහ නව ප්‍රවණතා ඇතිවීම සඳහා අවශ්‍ය තොරතුරු ලැබුණේ තක්ෂිලාවෙනි. ජේසුස් වහන්සේ සුවිශේෂ ආගමික ශාස්තෘවරයකු වීම කෙරෙහි බලපෑ කරුණු ඉන් පැහැදිලි වේ.

බෞද්ධ මහායාන ගුරු කුලය පිහිටුවනු ලැබුවේ ගන්ධාර දේශයේය. ප්‍රඥා පාරමිතාව නමින් හැඳින්වෙන පොත් පෙළක් මගින් එම ගුරුකුලය වඩා ශක්තිමත් කරනු ලැබීය. ක්‍රි. පූ 50 - ක්‍රි. ව. 150 අතර කාලයේදී ලියනු ලැබූ එම පොත් පෙළ මගින් ගූඪ ප්‍රතිවේදය (Mystical Insight) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබේ. බුද්ධිමය අවබෝධය තුළින් නිරපේක්ෂ සත්‍යය (Absolute Truth) පිළිබඳ සෑහෙන දැනීමක් ලබා ගත හැකි යයි අභිධර්මයේ ස්ථිර ලෙස දක්වා ඇති කරුණු වැරදි බව එම පොත් ලියූ කතුවරු ප්‍රකාශ කළහ. මෙහිදී මහායානය විසින් විශේෂ අවධානය යොමු කර තිබෙන්නේ බෝධිසත්ව සංකල්පය කෙරෙහිය. බෝධිසත්ව යනුවෙන් රහත් ඵලයට පැමිණි තැනැත්තා හෙවත් පෙරුම් පිරූ තැනැත්තා (Enlightened Being) යන අර්ථය ගම්‍යවේ. මෙම සංකල්පය අපේ මාතෘකාවට ඉතා වැදගත් වේ. මන්ද සැබෑ ජේසුස් වහන්සේ යනු ස්ථිර ආශ්‍රමයක් නොමැතිව තැනින් තැන ඇවිදිමින් භික්ෂුවක් මෙන් ජීවත් වෙමින් ධර්මය දේශනා කළ ශාස්තෘවරයකු පමණක් නොව ඉහත කී බෝධිසත්ව සංකල්පයට නිසැකවම මනුෂ්‍ය වේශයක් ලබා දුන් පුද්ගලයකු ද වූ හෙයිනි.

බෝධිසත්ව සංකල්පය බිහිවීම කෙරෙහි තුඩු දුන් හේතු බුද්ධසමයේ ඉතිහාසයේ මුල් අවදියේදීම ඇති විය. ඒ සඳහා පදනම වැටුණේ බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 200 කට පමණ පසුව වෛශාලී නුවර පවත්වනු ලැබූ දෙවැනි ධර්ම සංගායනාවේදීය. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ස්ථවිරයන්ගේ නිකාය සහ මහා සාංඝික නිකාය යනුවෙන් ගුරුකුල දෙකකට බෙදුණි. ස්ථවිරයින්ගේ නිකාය ජ්‍යෙෂ්ඨ භික්ෂූන් අනුගමනය කළහ. මහා සාංඝික නිකාය (මහා සංඝයා අනුගමනය කළ අය) එසේ හඳුන්වනු ලැබුවේ භික්ෂූන්ගෙන් බහුතර කොටසක් එම ගුරුකුලයට අයත් වීම නිසාය. ක්‍රි. පූ. පළමු වන ශත වර්ෂයේ දී මහා සාංඝික නිකාය තුළින් මහායානය බිහි විය.

ක්‍රි. පූ. තුන්වන ශත වර්ෂයේ මැද භාගයේදී අශෝක රජතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රමුඛ පෙළේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගංගානම්

ගං නිම්නයේ පිහිටි පැලලුප් නුවර එක්රැස් වී තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමේදී ඉහත කී නිකාය දෙක මගින් බුදුන් වහන්සේගේ ඉගැන්වීම වෙනස් ආකාරයට පවත්වාගෙන විත් තිබෙන බව උන් වහන්සේලා අවබෝධ කර ගත්හ. බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය විවිධ ආගමික පසුතලයන්ට අනුරූපව අනුවර්තනය වෙමින් බොහෝ කාලයක් තිස්සේ විවිධ අර්ථ කථනයන්ට භාජනය කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ ගුරුකුල සහ නිකායන් බිහි විය. බුදු දහමේ අනාගත හැඩගැස්ම කෙරෙහි මෙම තුන්වන ධර්ම සංගායනාව තීරණාත්මක බලපෑමක් ඇති කළේය.

බුදු දහම පිළිබඳ ඇතිවූ මෙම නව අර්ථකථනයන් තුළ බෝධිසත්ව සංකල්පය ඉතා වැදගත් ස්ථානයක් දැරීය. ප්‍රායෝගිකව සලකා බැලීමේදී බෝධිසත්වයකු යනු අභිධර්මයේ දැක්වෙන පරිදි තමාගේ විමුක්තිය පමණක් සොයා යන රහත් ඵලයට පත්වූ පුද්ගලයකු තුළ පවතින සංකල්පීය නොවන ප්‍රතිවේදය* (Non-Conceptual Wisdom) අභිභවා යන පුද්ගලයකි.[27] මහායාන විශ්වාසයට අනුව බුදුවීම සඳහා පෙරුම් පිරීමේදී බෝධිසත්වයකු විසින් සම්පූර්ණ කළ යුතු මූලික ගුණාංග හයක් තිබේ. ඒවා නම් දානය, ශීලය, ක්ෂාන්තිය, වීර්යය, ධ්‍යානය සහ ප්‍රඥාව වේ. දානය යනුවෙන් භෞතික මෙන්ම ආධ්‍යාත්මික දානය, එනම් මෛත්‍රිය පැතිරවීම අදහස් වේ. රැස්කර ගත් කුසල් තමාට පමණක් සීමා නොකොට අනික් සත්වයින්ගේ විමුක්තිය පිණිස යොදා ගැනීමට හැකිවනු පිණිස මෛත්‍රිය පැතිරවීම ඉන් අදහස් වේ. සිදුහත් ගෞතමයාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ජේසුස් වහන්සේ තරම් එම ගුණාංග යුහුසුළුව ක්‍රියාවට නැංවූ වෙනත් පුද්ගලයකු නොවිය.

නව සහස්‍රකය ආරම්භ වන විට හීනයානය සහ මහායානය අතර එතරම් කැපී පෙනෙන වෙනසක් නොතිබුණි. මහායාන අදහස් ථෙරවාදීන් අතරත් දක්නට ලැබිණි. මහායානයේ විශේෂ අංගයක් වූ බුදු පිළිමය පළමුවරට නිර්මාණය කරන ලද්දේ පළමුවෙනි කණිෂ්ක රජු දවස ගන්ධාරයේ විසූ සාර්වස්තිවාදී හීනයාන ගුරුකුලය මගිනි.[28]

උසස් බුද්ධිමය කේන්ද්‍රයක් සහ වැදගත් වෙළඳ මධ්‍යස්ථානයක් වීම හේතුකොට ගෙන තක්ෂිලා නගරය නව ආගමික අදහස් බටහිර රටවලට පතුරුවා හැරීම සඳහා ඉතා යෝග්‍ය මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කළේය. අශෝක රජතුමා විසින් පිටත්කර යවනු ලැබූ ධර්ම ප්‍රචාරක පිරිස් එහි සිට පැල්මයිරා නුවර හරහා සිරියාවට ගමන් කළහ. එතැන් සිට ඉන්දු නිම්නය ඔස්සේ වැටී තිබූ වෙළඳ මාර්ග රතු මුහුද ඔස්සේ

* සත්වයෙක් හෝ පුද්ගලයෙක් නැතිබව අවබෝධ කිරීම

පැමිණි නැව් නවතා තිබූ බාර්බරිකොන් (Barbarikon) වරාය දක්වා විහිදුණි. බෞද්ධයෝ බුදු දහම පිළිබඳ නව සංකල්ප සහ අලුත් ලියකියවිලි සිරියාවේ උතුරු දිග ප්‍රදේශවලටත් මෙසපොටේමියාවටත් විශේෂයෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රිස්තියානි ආගම සමඟ වෙන් කළ නොහැකි සම්බන්ධයක් ගොඩනගා ගෙන තිබූ එඩෙස්සාවටත් (Edessa) ගෙන ගියහ.

ඊජිප්තුවේ වාසය කළ සමාන ආගමික අදහස් දැරූ තම හිතවතුන්ගේ දැනගැනීම පිණිස ඔවුහු මුහුදු මාර්ග ඔස්සේ අලුත් අදහස් රැගෙන ආහ. ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ බෞද්ධයෝ තම මව් බිම සමඟ අඛණ්ඩ සම්බන්ධතා පවත්වාගත් අතර තක්ෂිලාව හරහා අලුත් ආගමික අදහස් පිළිබඳ දැනීමක් ලබා ගත්හ. ඒ කාලයේ පටන් ආධ්‍යාත්මික වර්ධනයේ ඇති වූ උද්‍යෝගය නිසා ආගමික අධ්‍යාපනය අතින් ඉතා උසස් දියුණුවක් ලබා තිබූ ඇලෙක්සැන්ඩ්‍රියා හා තක්ෂිලා නගර අතර අඛණ්ඩ සම්බන්ධතාවක් පැවතුණි. මැරිමටිස් විල අසබඩ විසූ තෙරපියුටා ශ්‍රමණයින් බෝධිසත්ව සංකල්පයට අනුව කටයුතු කළහ. ඒ සඳහා පැවතිය යුතු පූර්ව අවශ්‍යතාවක් ලෙස සලකනු ලැබූ සදාචාර ගුණධර්ම (බෝධිසත්ව සීලය) පුරමින් ඔවුන් ඒ අනුව (බෝධිසත්ව සංකල්පයට අනුව) ජීවත් වූහ. බෝධිසත්වයකු යනු මමත්වය නසා දැමූ නිරහංකාර පුද්ගලයකුය යන අදහස තෙරපියුටා ප්‍රජාව තුළ ව්‍යාප්තව පැවතීම හේතුකොට ගෙන සියලු සත්වයා කෙරෙහි කරුණාව සහ මෛත්‍රිය පැතිරවීම පිළිබඳ වූ බෞද්ධ ඉගැන්වීම් බටහිර රටවල ප්‍රචාරණය කිරීමට හැකි වූ බව සිල්වන් ලෙවි නමැති ඉතිහාසඥයා කල්පනා කරයි. ඒ වන විට පෙරදිග අදහස් කෙරෙහි නැඹුරුවක් දක්වූ ගැලවුම්කාරයකුගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටි හෙලනිසියානු සමාජයේ පහළ ස්ථරවලට අයත් පුද්ගලයන් කෙරෙහි මෙම ඉගැන්වීම් විශේෂයෙන් ඉලක්ක කරන ලදී. එහෙත් සමාජයේ ඉහළ ස්ථරවලට අයත් බුද්ධිමතුන් තුළ ආගම් ප්‍රචාරය පිළිබඳ එතරම් උනන්දුවක් නොතිබීම නිසා බෞද්ධ පොතපත පිළිබඳ ශාස්ත්‍රීය වශයෙන් පුනර්ජීවයක් ඇති වූයේ නැත.

ජේසුස් වහන්සේගේ තරුණ කාලය පිළිබඳ කිසිම තොරතුරක් පලස්තීන වැසියන් දැන සිටියේ නැත. ඊට හේතු වූයේ උන් වහන්සේ තරුණ කාලයේදී එහි ජීවත් නොවූ හෙයිනි. ජේසුස් වහන්සේ ළමා විය හා තරුණ විය පිළිබඳ නව තෙස්තමේන්තුවේ සඳහන් කර ඇති කථා ප්‍රවෘත්ති සියල්ලක්ම පාහේ තෝරා ගන්නා ලද කථා ප්‍රවෘත්ති මත පදනම් වී ඇති බව මීට ඉහත සඳහන් කර ඇත. මතෙව්ගේ ශුභාරංචියේ දැක්වෙන එවැනි කථාවක්, එනම් ජේසුස් වහන්සේ මිසරයට පලායාමේ සිද්ධිය, සිත්තරුන්ගේ තෙලිතුඩට හසු වූ ජනප්‍රිය තේමාවක් විය. ශුභාරංචියට

අනුව පෙරදිගින් පැමිණි ශාස්ත්‍රවන්තයින් තාරකා ශාස්ත්‍රය අනුව යුදෙව්වන්ට රජව කුමරෙක් ඉපදී ඇතිබව ප්‍රකාශ කර සිටීම නිසා බෙත්ලෙහෙම් නගරයේ උපත ලැබූ වයස අවුරුදු දෙකට අඩු සියලුම පිරිමි දරුවන් මරා දමන ලෙස හෙරෝද් රජතුමා නියෝග කර ඇති බව දෙවියන් වහන්සේගේ දූතයෙක් පැමිණ මරිය තුමියට සහ ජෝසෙප්ට අනතුරු හඟවයි. ඔව්හු ඒ වේලෙහිම ළදරු ජේසුස් කුමරාද රැගෙන මිසරයට පලාගොස් හෙරෝද් රජතුමා ගේ මරණය දක්වා වසර කීපයක් එහි ගත කරති.

රජකමට උරුමකම් ලැබූ පුද්ගලයකු විනාශ කර දැමීම සඳහා ළදරුවන් ඝාතනය කිරීම පිළිබඳ ප්‍රවෘත්ති ජනප්‍රවාදයේ සුලභව දක්නට ලැබේ. ක්‍රිෂ්ණ, මෝසස්, සෙවුස් (Zeus), පර්සියස් (Perseus), ඊඩිපස් (Oedipus), රොමියුලස් සහ ඔගස්ටස් වැනි පුද්ගලයින් පිළිබඳ පවතින කථා ප්‍රවෘත්තිවල ළදරු ඝාතනය පිළිබඳ කථා ඇතුළත් වී තිබේ. නමුත් එම කථා ප්‍රවෘත්තිවල පවතින ඓතිහාසික විශ්වසනීයත්වය පිළිබඳ මෙහිදී කිසිවක් ප්‍රකාශ කළ නොහැකිය. එපමණක් නොව, මේ කුඩා දරු පවුල මිසරයට පලාගියේ කුමක් නිසාද යන කාරණය ද එතරම් පැහැදිලි නැත. ගලීලයේ (Galilee) පිහිටි ඔවුන්ගේ නිවසට තිබුණේ සැතපුම් 60ක පමණ දුරකි. නමුත් මිසරය දක්වා යන ගමන ඊට වඩා දුරස්ථවූත්, දුෂ්කරවූත් ගමනක් විය. ඒ සඳහා ගාසා (Gaza) හරහා මුහුදු වෙරළ ඔස්සේ සැතපුම් සිය ගණනක් ගමන් කිරීමට සිදු වේ. කෙසේ වෙතත් ආරක්ෂාව පතා මෙම දුෂ්කර ස්ථානය තෝරා ගැනීමට හේතුව මතෙව් දැන සිටියේය. එනිසා "මෙසේ වූයේ මිසරයෙන් මාගේ පුත්‍රයා කැඳවා ගනිමියි"යි කියා ස්වාමීන් වහන්සේ විසින් දිවැසිවරයා කරණකොට ගෙන කියන ලද කීම ඉටුවන පිණිසය." යන පරණ තෙස්තමේන්තුවේ දැක්වෙන ප්‍රකාශයක් සත්‍යවනු පිණිස යයි සඳහන් කර තිබේ. බයිබලයේ පරණ තෙස්තමේන්තුවේ හොසියාගේ පොතේ (Hosea) (හොසියා 11:1) සඳහන් වන එම වචන පැහැදිලිවම දක්වා තිබෙන්නේ ඊශ්‍රායල් ජාතිකයින් මිසර පාලනයෙන් මුදවාගත් මෝසස් හැඳින්වීම සඳහාය. නමුත් මෙහිදී මතෙව් ශුභාරංචිය ලිවීමේදී ජනප්‍රවාදයේ දැක්වෙන ළදරු ඝාතනය පිළිබඳ කථා ප්‍රවෘත්තියත්, ශුද්ධ ලියකියවිලි වල ඇතුළත් "යුදෙව්වන් අතර සිටින මාගේ පුත්‍රයා" යනුවෙන් දැක්වෙන ප්‍රකාශයත් ජේසුස් වහන්සේ තම තරුණ කාලය මිසරයේ ගත කිරීම සාධාරණීකරණය කිරීම සඳහා යොදා ගෙන තිබේ. එසේ නොමැතිව එම කථා ප්‍රවෘත්තිය පැහැදිලි කර දිය හැකි වෙනත් ක්‍රමයක් නැත.

එම විස්තරය මෙතෙක් අප විසින් ඉදිරිපත් කරනු ලැබූ සියලු තොරතුරු හා හොඳින් ගැළපේ. ජේසුස් වහන්සේ තරුණ කාලයේදී

පලස්තීනයේ ජීවත් වූ බව පෙන්නුම් කරන කිසිම තොරතුරක් නොමැත. මන්ද තරුණ වියේ වැඩි කාලයක් උන් වහන්සේ මිසරයේ (ඊජිප්තුව) තෙරපියුටා ප්‍රජාව සමග ගත කළ හෙයිනි. මිසරයට පලායාමේ කථා ප්‍රවෘත්තිය තරුණ ජේසුස් ඇලෙක්සැන්ඩ්‍රියාවට පැමිණ එහිදී තෙරපියුටා ප්‍රජාව ඇසුරු කරමින් බුදු දහම ඉගෙන ගත් බව සැඟවීම සඳහා යොදන ලද සාහිත්‍යමය ප්‍රබන්ධයකට වඩා වැඩි යමක් නොවේ. මෙසේ ආගමික හෝ දේශපාලන ඉතිහාසයේ එන ඕනෑම වීර චරිතයක් වටා ගෙතී ඇති ඓතිහාසික සිදුවීම් ගුණ වර්ණනා සහ ව්‍යාජ අලංකාරෝක්ති වලින් ඔප් නංවා නිරූපණය කිරීමේ සම්ප්‍රදාය මෙහිදීත් ආරක්ෂා කරනු ලැබ නැවත මතු පිටට පැමිණීමක් දක්නට හැකිය.

මැරිඔටිස් විල අවට ප්‍රදේශයේ විජ්ඤ භික්ෂූන් සමග වාසය කරමින් බුදු දහම ඉගෙනීමට ජේසුස් වහන්සේට සෑහෙන කාලයක් තිබුණි. පසු කාලයේදී ජේසුස් වහන්සේ විසින් ධර්මය දේශනා කළ ආකාරය සහ උන් වහන්සේ මිනිසුන් කෙරෙහි ඇති කළ බලපෑම සලකා බැලීමේදී ජේසුස් වහන්සේ විසින් ශාක්‍ය මුනි බුදුන් වහන්සේගේ කාලමුක්ත දේශනාව (Timeless Insight) විවෘත මනසකින් යුක්තව බුද්ධිමත්ව, මනා සිහි බුද්ධියෙන් යුක්තව හදාරා ඇති බවට සැකයක් නැත. තක්ෂිලාවේ සිට මිසරය දක්වා භික්ෂූන් රැගෙන ආ නව අදහස් සහ එම අදහස් අතර සියල්ල අබිබවා නැගී පෙනුණු බෝධිසත්ව සංකල්පය කෙරෙහි නිසැකවම උන්වහන්සේගේ සිත ඇදී යන්නට ඇත. සමහර විට තරුණ ජේසුස් වහන්සේ සුවිශේෂ මනුෂ්‍යයෙකු බව භික්ෂූන් වහන්සේලාටද පෙනී යන්නට ඇත. උන්වහන්සේලාද ජේසුස් වහන්සේ බෝධිසත්වයකු ලෙස සලකා ඊට සරිලන ආගමික අධ්‍යාපනයක් ලබාදීමෙන් පසු මනුෂ්‍ය වර්ගයාගේ ඇස් අරවා ඔවුන්ගේ විමුක්තිය සලසාදීම පිණිස ප්‍රාඥයෙක් පහළ වී ඇති බව පෙනී ගිය හෙයින් ජේසුස් වහන්සේ ධර්ම දේශනා කිරීම සඳහා උන්වහන්සේ උපන් දේශයට පිටත්කර යවන්නට ඇතැ'යි සිතිය හැකිය. ජේසුස් වහන්සේ කොපමණ කාලයක් ඊජිප්තුවේ ජීවත් වූවාදැ'යි අපි නොදනිමු. එහෙත් උන්වහන්සේගේ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කර දීම සඳහා ඉන්දියාවේ කාලයක් වාසය කිරීම එතරම් වැදගත් කාරණයක් නොවූවත් සමහර විට උන්වහන්සේ ඉන්දියාවට පවා යන්නට බොහෝ දුරට ඉඩ තිබේ.[28] උන්වහන්සේගේ ජීවන සමයේදී තෙරපියුටා ප්‍රජාව තම බුද්ධ ග්‍රන්ථ හොඳින් ආරක්ෂා කර ගනිමින් බෞද්ධ විනය නීතිවලට අනුකූලව ජීවත් වූ භික්ෂූන්ගෙන් සමන්විත වූ හොඳින් සංවිධානය වූ බෞද්ධ සමාජයක් ලෙස පැවැති බව අපි දුටුවෙමු. ජේසුස් වහන්සේ යුදෙව් ජාතිකයකු වීම නිසා තම බෝධිසත්වයන් වහන්සේ උන් වහන්සේගේ ජන්ම භූමියට පිටත්කර යැවීම යෝග්‍යබව

තෙරපියුටා භික්ෂූන් කල්පනා කරන්නට ඇත. ඇත්ත වශයෙන්ම තමන් වහන්සේ "ඊශ්‍රායලයේ නැතිවූ බැටළු පෝතකයා වෙතට" එවන ලද බව උන්වහන්සේ විසින් පසු කාලයේදී ප්‍රකාශ කරනු ලැබීය. අනාදිමත් කාලයක පටන් මිසරය යුදෙව් ජාතිකයින්ට රැකවරණය සැලසූ ස්ථානයක් ලෙස පැවතුණි. එහි ඔවුන් සඳහා වෙන් කරන ලද සම්මුති ශාලා (Synagogues) සහ පාඨශාලා තිබුණි. ඉගැන්වීම සඳහා ගුරුවරුද සිටියහ. එහිදී ජේසුස් වහන්සේටද යුදෙව් ආගමට අයත් ශුද්ධ ලියකියවිලි අධ්‍යයනය කිරීමට අවස්ථාවක් ලැබුණි. ඒවා අධ්‍යයනය කරන ලෙස සමහර විට ඔහුගේ බෞද්ධ ගුරුවරු ඔහු උනන්දු කරවන්නට ඇතැයි සිතිය හැකිය. ජේසුස් වහන්සේට කටයුතු කිරීමට සිදු වූයේ යුදෙව් ජාතිකයින් සමග වීමත්, එමෙන්ම අනෙක් ආගම්වලටත්, ඒවායේ පුරෝගාමීන්ටත් ගෞරව කරන ලෙස අශෝක රජතුමා විසින් උපදෙස් දී තිබීම සලකා බැලීමේදී එවැන්නක් සිදු වීම බලාපොරොත්තු විය හැකිය. ජේසුස් වහන්සේ දොළොස් හැවිරිදි වියේදී ජෙරුසලමේ පිහිටි දේව මාලිගය තුළදී එහි සිටි පූජකයින් මවිතයට පත් කළාද නැද්ද යන කාරණය අවිනිශ්චිතය. ඊට සමාන බෞද්ධ කථා ප්‍රවෘත්තියක් තිබෙන බවත්, එමෙන්ම බුද්ධිමත් දරුවකු පිළිබඳ ප්‍රතිරූපය වීර චරිත සම්බන්ධයෙන් පවතින ජනප්‍රවාදවල දක්නට ලැබෙන ලක්ෂණයක් බවත් අප විසින් මීට කලින් පෙන්වා දී තිබේ. අනෙක් අතට උන්වහන්සේ ලද උසස් ඉගෙනීම සලකා බැලීමේදී එවැනි සිද්ධියක් ඇතිවීමට බොහෝ දුරට ඉඩ තිබේ. කෙසේ වෙතත් ක්‍රි. ව. හය වන වසරට පෙර උන්වහන්සේ නැවත ඊශ්‍රායලයට පැමිණීම එතරම් හිතකර නොවේ. ඒ වන විට උන්වහන්සේගේ වයස අවුරුදු දොළොසක් හෝ දහතුනක් වන්නට ඇත. ඒ කාලයේදී ජුදා දේශය (Judea) සහ සමාරිය (Samaria) පාලනය කරනු ලැබුවේ කෲරතර ඒකාධිපති ආණ්ඩුකාරවරයකු වශයෙන් ක්‍රියා කළ හෙරෝද් රජතුමාගේ පුත්‍රයෙකි. ඔහු ක්‍රි. ව. හය වන වර්ෂයේදී රටින් පිටුවහල් කරන ලදී.

ක්‍රි. ව. 30 දී පමණ ජේසුස් නමැති මෙම බෝධිසත්වයාට නැවත පලස්තීනයට ගොස් තම රටවැසියන්ට බුද්ධ ධර්මය ඉගැන්වීම සඳහා අවස්ථාවක් ලැබුණි. එසේ කළ යුතු වූ ආකාරය තීරණය කිරීමේදී මිසරයේදී තමන් ලැබූ ආගමික අධ්‍යාපනයෙන් පසු යුදෙව්වන්ගේ ආගමික හැඟීම් සහ අදහස් පිළිබඳ වැඩිදුර කරුණු සොයා ගැනීමට උන්වහන්සේට සිදු විය. ඒ සඳහා ගත හැකි වූ පැහැදිලි පියවර වූයේ තෙරපියුටා ප්‍රජාවට බොහෝ දුරට සමානකමක් දැක්වූ මිනිසුන් සමග කාලයක් වාසය කිරීමය. ඒ සඳහා පැවති එකම මාර්ගය වූයේ එසීන්වරුන්ට (Essenes) සම්බන්ධව කටයුතු කිරීමයි.

එසීන්වරුන්ගේ සම්බන්ධතාව

මෙහිදී එසීන්වරුන් වැදගත් වන්නේ ඇයි? ඒ කරුණු දෙකක් නිසාය. පළමුවෙන්ම අපේ මූලාශ්‍රය ලෙස සැලකෙන ෆිලෝ විසින් තෙරපියුටා සහ එසීන් යනු එකම අරමුණක් කරා යොමු වූ ආගමික කණ්ඩායම් දෙකක් ලෙස හඳුන්වා තිබේ. ෆිලෝ සඳහන් කර ඇති අන්දමට තෙරපියුටා යනු න්‍යායවාදීන් (Theoreticians) වූ අතර එසීන්වරුන් එම න්‍යාය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැංවූ නියුක්තිකයෝ (Practitioners) වූහ. එපමණක් නොව පලස්තීනයේ සහ සිරියාවේ විසූ මෙම එසීන්වරු සහ පර්සියාවේ විසූ මාගි (Magi) සහ ඉන්දියාවේ විසූ ජිම්නොසොෆිස්ට් (Gymnosophists) නමින් හඳුන්වනු ලැබූ ආගමික කණ්ඩායමක් අතර අනන්‍යතාවක් තිබූ බව ෆිලෝ ස්ථිර ලෙස ප්‍රකාශ කර තිබේ. ජිම්නොසොෆිස්ට් (Gymnosophists) යනු බ්‍රාහ්මණ හෝ බෞද්ධ වශයෙන් වෙන් කිරීමකින් තොරව ඉන්දියාවේ විසූ ප්‍රාඥයින් හැඳින්වීම සඳහා පොදුවේ යොදන ලද නමය. තෙරපියුටා සාමාජිකයින් එසීන්වරු සමඟ ආධ්‍යාත්මික සම්බන්ධතාවයක් පැවැත්වූහ. එනිසා ජේසුස් වහන්සේට මිසරයට ගොස් ඉගෙන ගන්නවාට වඩා හොඳින් එහිදී යුදෙව් ආගමික චින්තනය පිළිබඳ තොරතුරු ලබා ගැනීමටත් තමන් විසින් දේශනා කිරීමට බලාපොරොත්තු වූ ආගමික පණිවිඩය හොඳින් ග්‍රහණය කළ හැකිවූ සංවේදී ශ්‍රාවක පිරිසක් සොයා ගැනීමටත් හැකි වේයයි බලාපොරොත්තු තැබිය හැකිවිය. ජේසුස් වහන්සේ ධර්ම දේශනා කිරීම සඳහා මහජනතාව අතරට පැමිණියේ කුම්රාන් සාමාජිකයින් (Qumran) සහ ස්නාවකයින් (Baptists) ගේ මාර්ගයෙනි. වෙනත් වචනවලින් කියතොත් එසීන්වරු සමඟ සම්බන්ධව සිටි යුදෙව් ආගමික කණ්ඩායම් හරහාය. උන්වහන්සේගේ ඉගැන්වීම් පතුරුවා හැරීම සහ ඒවායේ යම් යම් වෙනස්වීම් ඇතිවීම කෙරෙහිද මෙම සම්බන්ධතා බලපෑවේය. කෙසේ වෙතත් ඒ පිළිබඳව අප ඉක්මන් නිගමනවලට එළඹිය යුතු නැත.

එසීන්වරුන්ගේ ධර්මය සහ බෞද්ධ පුරුෂාර්ථ (Buddhist Ideals) අතර දක්නට ලැබෙන සමානකම් කෙතරම්ද යත් බෞද්ධ චින්තනය එසීන් නමින් හැඳින්වූ මෙම යුදෙව් ආගමික සමාජය තුළට ඇතුල් වූයේ කෙසේද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් පොත්පත් විශාල සංඛ්‍යාවක් ලියා තිබේ. ෆිලෝ කල්පනා කරන අයුරු එය සිදු වී ඇත්තේ තෙරපියුටා ප්‍රජාව හරහාය. එසීන් යනු පාර්සිවාදයේ (Parseeism) හරය සහ බුදු දහමේ දක්වෙන විශ්ව සාධාරණ ලක්ෂණවලින් (Universal Characteristics) පෝෂණය වූ යුදෙව් ආගමික ඉගැන්වීම් බවත්, එමෙන්ම එය ක්‍රිස්තියානිය නැමැති ලෝක ව්‍යාප්ත ආගම බිහිවීමට

හේතු වූ මුල් බීජය බවත් දේවධර්ම වේදියකු වූ ඇඩොල්ෆ් හිල්ගෙන්ෆෙල්ඩ් (Adolf Hilgenfeld) ප්‍රකාශ කරයි.[30] එසීන් සමාජයට බෞද්ධ අදහස් හඳුන්වා දෙන ලද්දේ විදේශ රටවල ජීවත් වූ යුදෙව් ජාතිකයින් විසින් බවත් එකී අදහස් පසු කාලයේදී ක්‍රිස්තියානි විශ්වාස හැඩගැස්වීම කෙරෙහි බලපා ඇති බවත් ලන්දේසි ජාතික පර්යේෂකයකු වූ අර්නස්ට් ඩි බන්සන් (Ernest De Bunsen) උපකල්පනය කරයි.[31] එසේ නම් එසීන්වරු යනු කවරෙක්ද?

කුම්රාන් ලියවිලිවල අඩංගු කරුණු බොහෝ දුරට පැහැදිලි කර ඇති නිසා මෙම ප්‍රශ්නය කලින් සිදු කළාට වඩා හොඳින් පැහැදිලි කර දිය හැකි බව බොහෝ දෙනෙක් විශ්වාස කරති. කුම්රාන්හි පදිංචිව සිටි පුද්ගලයින් එසීන් සමාජයට අයත් බව බොහෝ විද්වතුන්ගේ පිළිගැනීම වේ. ඇත්ත වශයෙන්ම කුම්රාන් ලේඛනවල සංකීර්ණ කරුණු ඇතුළත් වේ. මෙහිදී අපට කළ හැක්කේ අපරදිග ආගමික සම්ප්‍රදායේ ප්‍රභවය පිළිබඳව දැනට අනාවරණය වෙමින් පවතින ඉතා වැදගත් ලක්ෂණ පමණක් ඉදිරිපත් කිරීමය.

එසීන් යන වචනයේ ප්‍රභවය පවා තවමත් සම්පූර්ණයෙන් පැහැදිලි කර නොමැත. ෆිලෝ එය එසීනොයි (Essenoi) හෝ එසයිඔි (Essaioi) යන වචනවලට සම්බන්ධ කර තිබේ. ප්ලිනි (Pliny) විසින් එය ග්‍රීක් භාෂාවේ හොසියෝස් (Hosios) නමැති වචනය සමඟ එසනි (Esseni) යනුවෙන් යොදා තිබේ. ග්‍රීක් භාෂාවේ හොසියෝස් (Hosios) යන වචනය 'ඉසි' යනුවෙන් හැඳින්වෙන ඉන්දියානු ධාතුවෙන් බිඳී තිබේ. බෞද්ධ සාහිත්‍යය පිළිබඳ විශේෂඥයකු වන සැමුවෙල් බීල් 'එසීන්' (Essenes) යන නාම පදය ඉසි (Isi) ප්‍රත්‍යයෙන් හෝ එහි බහුවචන වාචී පදය වන ඉසායෝ (Isayo) යන්නෙන් බිඳී ඒමට ඇතැයි කල්පනා කරයි.[32] මාගධී හෝ ප්‍රාකෘති භාෂාවේ (Prakrit) ඉසි යනුවෙන් සාන්තුවරයා හෝ ශුද්ධ වන්තයා යන්න අදහස් වේ. මෙම ඉසි ප්‍රත්‍යයට 'මහා' යන පදය යෙදීමෙන් 'මහේෂි' (මහා පුරුෂ) යන අර්ථය ලැබේ. එම පදවී නාමය බුදුන් වහන්සේ හැඳින්වීම සඳහා බොහෝ අවස්ථාවලදී යොදා ගෙන තිබේ. ශරතුස්ත්‍ර වාදයට (Zoroastrianism) අයත් ශුද්ධ ග්‍රන්ථයක් වූ 'අවෙස්ථ' (Avesta) නමැති කෘතියේ ඇතුළත් ශුද්ධ, ධාර්මික යන අරුත් දෙන ආෂවන් (Ashavan) නමැති වචනයෙන් 'එසීන්' යන වචනය බිඳී එන්නට ඇතැයි සමහරු කල්පනා කරති.[33] එසීන්වරුන් ඉටුකළ සුවපත් කිරීමේ කටයුතු පදනම් කර ඉදිරිපත් කර ඇති තවත් විග්‍රහයක් තිබේ. ඒ අනුව එසීන් නමැති නාම පදය සඳහා යෙදෙන ග්‍රීක් වචනයට ගැළපෙන සෙමිටික් ප්‍රභවයක් පෙන්නුම් කරමින් එය ඇරමයික් භාෂාවේ සුවපත් කරන්නා යන අර්ථය දෙන යිසින් (Yssyn) නමැති නාම පදයෙන් බිඳී

ආ බව ප්‍රකාශ කර තිබේ.[34] තෙරපියුටා සමාජය පිළිබඳව අප විසින් කරන ලද සාකච්ඡාවේදී පෙන්නුම් කළ පරිදි ධාර්මික ජීවිතයක් ගත කිරීම සහ සුවපත් කරන්නකු වශයෙන් ජීවත්වීම යනු එකිනෙකට සම්බන්ධ වූ කාරණා දෙකකි. ඒ නිසා ඊට අනුරූප වචනද එකිනෙකට සම්බන්ධ වේ. ඒ අනුව වචනයේ නිරුක්තිය පිළිබඳව ඉදිරිපත් කර ඇති මෙම විග්‍රහයන් දෙකම නිවැරදි විය හැකි බවට කරුණු ඉදිරිපත් කිරීමට පුළුවන.

එසීන් සමාජයේ ප්‍රභවය සහ කුම්රාන් වැසියන් එසීන් සමාජයේ සාමාජිකයින් වූ බව පැහැදිලි කිරීම සඳහා පර්යේෂණ පැවැත්වූ සමහර ආගමික ඉතිහාසඥයින් විසින් ඊට පුරෝගාමීවූ හැසිඩිම්වාදීන් (ශුද්ධ වන්තයින්) (Hassidim) නමින් හැඳින්වුණු ආගමික කණ්ඩායමක් පැවති බව පෙන්වා දී තිබේ. හැසිඩිම්වාදීන් යනු ක්‍රි. පූ. 2 වන ශත වර්ෂයේදී වාසය කළ හෙලනීසියානු සංස්කෘතියට විරුද්ධව කටයුතු කළ සටන්කාමී ආගමික කණ්ඩායමක් විය. පරිසි සම්ප්‍රදාය බිහිවීමට මග පෑදුවෝ හැසිඩිම්වාදීන් යයි සමහරෙක් විශ්වාස කරති. එසීන් සහ පරිසි යනුවෙන් හැඳින්වෙන සම්ප්‍රදායන් දෙකටම හේතු වූයේ හැසිඩිම්වාදීන් බව තවත් කණ්ඩායමක් කල්පනා කරයි. කෙසේ වෙතත් එසීන් යන වචනය හැසිඩිම් නමැති පදයෙන් හෝ ඒ සඳහා සිරියන් භාෂාවෙන් යොදා ඇති වචනයෙන් හෝ ප්‍රභවය වී නොමැති බව පෙනේ. මෙතෙක් පර්යේෂකයින්ට මහත් හිසරදයක්ව පැවති කුම්රාන් වැසියන් පිළිබඳව කරනු ලබන විග්‍රහය මත මෙම සාකච්ඡාවෙන් ඉදිරිපත් කර ඇති කරුණු පිළිගැනීම හෝ නොපිළිගැනීම මත රඳා පවතී.

ආධ්‍යාත්මික සුවය ලබාදීම පාපයෙන් මුදවා සුවපත් කිරීම මෙම ආගමික සමාජයේ මූලික පරමාර්ථ ලෙස පැවති බව කුම්රාන් ලේඛනවල සඳහන් වේ.[35] මෙම පරමාර්ථය විසින් ඔවුන් එසීන් සහ තෙරපියුටා සමාජවලට වඩා සමීප විය. අනෙක් අතට එසීන් යන වචනය පුද්ගල පදවි නාමයක් හැඟවීම පිණිස එම නිකායට අයත් කිසිම ලේඛනයක යොදා ගෙන නොමැත. කුම්රාන් වැසියන් තමන් හඳුන්වා ගත්තේ බෙනි සැඩොක් (Bene Sadok) හෙවත් සැඩොක්ගේ පුත්‍රයින් හෝ එබ්ජොනිම් (Ebjonim) නොහොත් දුප්පතුන්ගේ ප්‍රජාව යන නම්වලිනි. පාවුලුතුමා විසින් පිහිටුවනු ලැබූ ක්‍රිස්තියානි ආගමට අයත් නොවූ ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම් අනුගමනය කළ යුදෙව් ජාතික ක්‍රිස්තියානීන් තමන් හඳුන්වා ගැනීම සඳහා එබියොනයිට් (Ebionites) නමැති නම යොදා ගනු ලැබීය. ඒ අනුව ඉහත දෙවනුව සඳහන් කරනු ලැබූ එබ්ජොනිම් (Ebjonim) නමැති නාමය ප්‍රචලිතව පවතින්නට ඇතැයි සිතිය හැකිය. කුම්රාන් වැසියන්ගේ ධර්මදූත මෙහෙවරෙහි පරමාර්ථය ඩැමැස්කස්

ලේඛනයෙහි (Damascus Document) මෙසේ සටහන් කර තිබේ: "සැඩොක් ගේ පුත්‍රයින් ඊශ්‍රායලයේ තෝරා ගනු ලැබූ පුද්ගලයින් වන්නාහ. ඔවුන්ගේ නම් අවසාන විනිශ්චය දිනයේදී ප්‍රසිද්ධියට පත් කරනු ලබන්නාහ." (CD, Dam, IV 3:4)

ජේසුස් වහන්සේ කුම්රාන් වැසියන් සමග ජීවත් වූහ. එනිසා කුම්රාන් වැසියන්, එසීන්වරු සහ තෙරපියුටා සාමාජිකයින් අතර කිසියම් සම්බන්ධතාවක් පැවති බව තහවුරු වේ. ජේසුස් වහන්සේ මිසර දේශයේ විසූ තෙරපියුටා ප්‍රජාව ඇසුරුකිරීමෙන් අනතුරුව ආපසු පලස්තීනයට පැමිණීමේදී යොදාගත් ක්‍රියා මාර්ගය පැහැදිලි කරදීම සඳහා උන් වහන්සේගේ ශ්‍රාවකයින් තුළ පැවැති ආකල්ප වඩා හොඳින් තේරුම් ගැනීම පිණිස එම සම්බන්ධතාවය පිළිබඳව තරමක් විමසා බැලිය යුතු වේ. මෙහිදී ඇත්ත වශයෙන්ම කුම්රාන් වැසියන් සහ එසීන්වරු අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පැවතුණේද යන ප්‍රශ්නය පිළිබඳ සලකා බැලීමට පෙර මෙම ආගමික නිකායේ මුල් ආරම්භය සහ එහි පැවති වැදගත්කම නිර්ණය කිරීම සඳහා කුම්රාන් ලේඛන සහ මිසරයේ විසූ බෞද්ධයින් හා ඔවුන් අතර පැවැති සම්බන්ධතාවය පිළිබඳ කරුණු සෙවීම පසෙක තබා එසීන්වරු යනු කවරෙක්දැයි මුලින්ම සලකා බලමු.

ෆ්ලේවියස් ජොසෆස් (Flavius Josephus) විසින් ලියනු ලැබූ 'යුදෙව් යුද්ධය' (The Jewishwar) නමැති වැදගත් ඓතිහාසික කෘතියෙහි මෙසේ සඳහන් කර තිබේ: යුදෙව්වන් අතර දාර්ශනික ගුරුකුල තුනක් තිබේ. ඒවා නම් පරිසිවරු* (Pharisees), සැඩුසිවරු[33] (Sadducees) සහ එසීන් නම් වේ. පුද්ගලයකුගේ ආත්මය ශුද්ධ වූ තත්වයට පත් කිරීම මෙම ආගමික කණ්ඩායම්වලට පොදු වූ පරමාර්ථයක් ලෙස පැවතියේය. සොළොස් හැවිරිදි වියේදී මෙම ගුරුකුල තුනෙන් වඩා උසස් ගුරුකුලය කුමක්ද කියා පරීක්ෂා කර බැලීමට ෆ්ලේවියස් ජොසෆස් තීරණය කළේය. නමුත් ඒ එක් ගුරුකුලයක් හෝ එතරම් උසස් නොවන බව ඔහුගේ විශ්වාසය විය. කෙසේ වෙතත් එම එක් ආගමික ගුරුකුලයක හෝ සිදු කරන කටයුතු පිළිබඳව පූර්ණ අවබෝධයක් ඇතිකර ගැනීම සඳහා අවශ්‍ය තරම් කාලයක් හෝ ආධුනිකයකු ලෙස කටයුතු කිරීමට තරම් ඉවසීමක් ඔහුට නොතිබෙන්නට ඇත. එම ආගමික කණ්ඩායම්

* යුදෙව් විනය නීති සහ පැරණි සම්ප්‍රදායන්හි දැඩි ලෙස එල්බ ගත්, තමන් පමණක් ශුද්ධ වූවන් යැයි දක්වමින් අනුන් හෙළා දුටු ආගමික කණ්ඩායමකි. ජේසුස් වහන්සේට විපක්ෂ වූවන් අතර මොවුහු මූලිකත්වය ගත්හ.

[33] ගතානුගතික අදහස් දැරූ රදළ ප්‍රජක පංතියකි. පරලොව පිළිබඳ විශ්වාස නොකළ මොවුහු උච්ඡේදවාදීහු වූහ. ක්‍රිස්තුස් වහන්සේට විරුද්ධ වීමේදී මොවුහු තමන්ගේ පාරම්පරික සතුරන් වූ පරිසිවරු සමග එකඟ වූහ.

විසින් දරන ලද අදහස් සහ අනුගමනය කරන ලද වත්පිළිවෙත් පිළිබඳ එක්තරා ප්‍රමාණයක පෞද්ගලික වැටහීමක් ඔහුට තිබෙන්නට ඇත. නමුත් එම තොරතුරු වැඩි කොටසක් ඔහු විසින් ලබා ගන්නට ඇත්තේ තුන්වන පාර්ශ්වයක් හරහා බව සිතීමට පුළුවන. එසීන්වරුන්ට යුදෙව් ප්‍රභවයක් තිබූ බව ඔහු වාර්තා කර ඇත. ඔවුන් එකිනෙකා අතර පැවති මිත්‍රශීලී භාවය සහ ප්‍රශංසනීය ප්‍රජා හැඟීම් පිළිබඳව ඔහු විශේෂයෙන් සඳහන් කර තිබේ. ඔව්හු විවාහය එතරම් උසස් කොට නොසැලකූහ. නමුත් ඊට සම්පූර්ණයෙන් විරුද්ධ වූයේද නැත. ඔවුන් ද්‍රව්‍යමය වස්තු පිළිකුල් කළ අතර ඒවා සියල්ල ඔවුනු ආගමික සමාජයට භාර දුන්හ. ඔවුන් කිසිවක් මිලදී ගත්තේවත් විකුණුවේවත් නැත. අසරණ අන්ත දුගී භාවයක් හෝ අහංකාර වීමට හේතු විය හැකි තරම් සම්පත් ඔවුන්ට නොතිබුණි. ඔව්හු ඉන්ද්‍රිය ගෝචර සැප සම්පත් ප්‍රතික්ෂේප කළහ. ආශාවන් තෘප්තිමත් කිරීමෙන් වැළකී සිටීමත් ඒවාට වහල් නොවී සිටීමත් උසස් සදාචාරාත්මක ගුණාංග ලෙස සලකනු ලැබීය. සුවඳ විලවුන් ඇඟ ගැල්වීමෙන් වැළකී සිටි ඔව්හු සෑම විටම සුදු වස්ත්‍රයෙන් සැරසී සිටියහ. ඔවුන් ගමන් කරන විට ගුරුවරයකු ඉදිරියේ ගෞරව සම්ප්‍රයුක්තව හැසිරෙන්නාක් මෙන් වූ නිහතමානී ආකල්පයක් පෙන්නුම් කළහ. එසීන්වරු ප්‍රධාන වශයෙන් නගර වාසය මගහැර පිටිසරබද ගම් දනව්වල ජීවත් වූ බව ෆිලෝ ප්‍රකාශ කර තිබේ. එහෙත් එසීන්වරු නගර කීපයක පැතිර වාසය කළ බව ජොසෆස් සඳහන් කර තිබේ. ඔවුන් කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වී කටයුතු කළ අතර ඒ එක් එක් කණ්ඩායම් පාලනය කිරීම සඳහා නායකයකු පත්කර තිබුණි. ධර්ම ප්‍රචාරය සඳහා සංචාරයේ යෙදෙන විට ප්‍රාදේශීය ජන සමාජවලට අයත් පුද්ගලයින්ගේ දේපල පරිහරණය කිරීමට ඔවුන්ට අවසර තිබුණි. එපමණක් නොව ඔවුන් පැරණි හිතවතුන් ලෙස සලකා එම ජන සමාජවලට අයත් පුද්ගලයින් විසින් පිළිගනු ලැබීය. විවිධ ප්‍රදේශවලින් පිටත්ව ගිය සාමාජිකයින් ප්‍රාදේශීය ජන සමාජවල වාසය කළ ඔවුන්ගේ පැරණි හිතවතුන් විසින් පිළිගනු ලැබීය. ඒ අවස්ථාවලදී ඔවුන්ට අයත් දේපල පරිහරණය කිරීමේ අවසරය ඔවුන්ට තිබුණි. මෙසේ සංචාරය කිරීමේදී ඔවුන් ගමන් මල්ලක්වත් රැගෙන නොගියහ. ඔවුන් විසින් රැගෙන ගියේ අතර මගදී ඇති විය හැකි සොර සතුරු උවදුරකින් ආරක්ෂාවීම සඳහා අවශ්‍ය ආයුධයක් පමණි. එසීන්වරුන් තුළ පැවැති සාමකාමී ආකල්ප ජොසෆස් විසින් පැහැදිලි කර තිබෙනවාට වඩා හොඳින් ෆිලෝ විස්තර කර තිබේ. එසීන්වරු කිසිවිටෙක සටන් කිරීම සඳහා යොදා ගන්නා ආයුධ රැගෙන නොගිය බවත්, හිංසනය යනු දෙවියන් විශ්වාස නොකිරීම සහ ස්වභාව ධර්මයේ නීති කඩකිරීමක් ලෙස ඔවුන් සැලකූ බවත් ෆිලෝ පැහැදිලි ලෙස ප්‍රකාශ කර තිබේ.

එසීන්වරු ග්‍රාම්‍ය වූ ලෞකික කරුණු කිසිවක් පිළිබඳ ඉර නැගීමට පෙර කථා නොකළහ. ඔවුනු පුරාණ සිරිතක් අනුගමනය කරමින් සූර්යයා උදා කරන ලෙස දෙවියන්ට යාඥා කළහ. ඉන් අනතුරුව දිය නා පිරිසිදු වී ආගමික වැදගත්කමකින් යුත් පිරිවටයක් ලෙස සැලකිය හැකි ලිනන් කමායක් පැළඳ රිෆෙක්ටෝරියම් (Refectorium) නමින් හැඳින්වෙන ආගමික වතාවත් සිදු කරන පූජා කුටියක් වැනි ස්ථානයකට යයි. නිශ්ශබ්ද පිළිවෙතක් අනුගමනය කරමින් සරල ආහාර වේලක් අනුභව කර ඉන්පසු සවස් වනතුරු ආගමික කටයුතු වල යෙදේ. ඔවුන් වාසය කරන කුටි තුළ නිරන්තරයෙන් දැඩි නිශ්ශබ්දතාවක් පවතී. එම දැඩි නිසල බව පිටස්තර පුද්ගලයින් තුළ කිසියම් ගුප්ත බියක් ඇති කරවීමට සමත් බව ජොසෆස් සඳහන් කර තිබේ. එසීන්වරු තුළින් පිළිබිඹුවන ශාන්ත භාවය ඔවුන් තුළ නිරතුරුව පවතින නැත්පත්කම සහ සංයමයේ ප්‍රතිඵලයක් බව ජොසෆස් කල්පනා කරයි. අවශ්‍ය ප්‍රමාණයට වඩා ආහාර නොගෙන, මධ්‍යස්ථ වූත්, සංයමයෙන් යුක්ත වූත් ජීවිත ගත කිරීම නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් තුළ ශාන්ත පෙනුමක් දක්නට ලැබෙන බව ජොසෆස් සඳහන් කර තිබේ.

කිසිවකුට උපකාර කළ යුතුද? අනුකම්පා කළ යුතුද? යන කාරණා පිළිබඳව ඔවුන් තම අභිමතය පරිදි ක්‍රියා කළහ. ඔව්හු තම හැඟීම් දැඩිසේ පාලනය කර ගත්හ. සාමය පවත්වා ගැනීම සඳහා කළ හැකි සෑම දෙයක්ම කළහ. තම ශුද්ධ ග්‍රන්ථ ඒ පිළිබඳ විශේෂ කැපවීමකින් යුතුව පරිශීලනය කිරීම ඔවුන් යෙදී සිටි ප්‍රධාන කාර්යය විය. ඊට අමතරව ඖෂධ, පැළෑටි සහ ඛනිජ ද්‍රව්‍යවල අඩංගු ලෙඩ සුව කිරීමේ ශක්තිය පිළිබඳවද ඔවුනු පරීක්ෂණ පැවැත්වූහ.

එසීන් ආගමික නිකායට ඇතුළත්වීම සඳහා පුද්ගලයකුට වසරක ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වීමට සිදුවේ. ඒ කාලය තුළදී එසීන් සමාජයේ සාමාජිකත්වය අපේක්ෂාකරන පුද්ගලයින් තුළ ලෞකික සැප සම්පත් අත්හැරීමට ඇති හැකියාව පිළිබඳව පරීක්ෂා කර බලනු ලැබේ. ආධුනික කාල පරිච්ඡේදය සාර්ථක ලෙස අවසන් කිරීමෙන් පසු ඔවුන්ට අනිකුත් සාමාජිකයින් සමග සමීප ලෙස සම්බන්ධවීමටත් ශුද්ධ ස්නානයට (Sacred Baths) සහභාගී වීමටත් ඉඩ දෙනු ලැබේ. ඉන්පසු ඔවුන්ගේ හැසිරීම් රටාව තවත් වර්ෂ දෙකක් තුළදී ඇගයීමට භාජනය කරනු ලැබේ. නවකයකුට මෙම ආගමික සමාජය තුළ ඉතා වැදගත් අවස්ථාවක් ලෙස සැලකෙන සෙසු සාමාජිකයින් සමග එක්වී හවුලේ ආහාර අනුභව කිරීමේ (Shared Meal) අවස්ථාවට සහභාගිවීම සඳහා අවසර දීමට ප්‍රථම දේවත්වයට ගරු කිරීම, ධාර්මිකව ජීවත්වීම, ස්වේච්ඡාවෙන් හෝ බල කිරීම නිසා හෝ කිසිවකුට හානියක් කිරීමෙන්

වැළකී සිටීම, මෙන්ම එසීන් සමාජයේ බලධාරීන්ට අවංකව කටයුතු කිරීමට පොරොන්දු වන බව සහතික කරමින් දිවුරුම් දිය යුතු වේ. ඊට අමතරව සත්‍යයට ගරු කරන බවටත්, බොරුකාරයන් හෙළිදරව් කරන බවටත්, අන් සතු දෙය සොරකම් කිරීමෙන් වැළකී සිටින බවටත්, වැරදි මාර්ගවලින් ලාභ ඉපයීමට උත්සාහ කිරීමෙන් වැළකී සිටින බවටත්, ආගමික නිකායේ අනෙක් සාමාජිකයින්ගෙන් වසන් කළ යුතු රහස් නොමැත්තකු ලෙස කටයුතු කරන බවටත් පොරොන්දු විය යුතු වේ. අයුක්තිය හෙළා දැකීමටත්, සාධාරණත්වය ඉටු කිරීම සඳහා දරන උත්සාහයන්ට සහයෝගය දීමටත් පොරොන්දු විය යුතුය. දෙවියන් වහන්සේට ගෞරව කරන අතරම නීතියේ නාමයට උසස් ගෞරවය පුද කළ යුතු වේ. එසේ නොකරන ඕනෑම කෙනෙකුට ලැබෙන දඬුවම වූයේ මරණයයි.

ශාරීරික වූ කිසිවක් එසීන්වරු එතරම් වැදගත් ලෙස නොසැලකූහ. මන්ද ඒ සියල්ල වෙනස් වීමට භාජනය වන හෙයිනි. සියලු දෙනාම දෛවය මගින් පාලනය වන බව ඔවුහු විශ්වාස කළහ. ජෝසෆස් විසින් කර තිබෙන විස්තරයට අනුව ආත්මය පිළිබඳව ඔවුන් තුළ පැවති අදහස් බොහෝ දුරට ප්ලේටොනික අදහස්වලට සමානය. ආත්මය ඊතරයේ සිට පහළට පැමිණ පුද්ගලයකුගේ ශරීරය තුළට ඇතුල්වී ඒ තුළ නතර වන බව ඔවුහු විශ්වාස කළහ. පුද්ගලයකුගේ මරණින් පසු එය නැවත වරක් ඉන් මිදී ඉවතට යයි. එවිට ධාර්මික ලෙස ජීවත්වූ පුද්ගලයකුගේ ආත්මය මුහුදින් එපිට පිහිටි පරාදීසයකට (Paradise) ගමන් කරන අතර අධාර්මිකව ජීවත් වූ පුද්ගලයකුගේ ආත්මය අධික ශීතලෙන් යුක්ත වූ අඳුරු ගුහාවක් වෙත ගමන් කරයි.

මෙම විස්තරය කියවීමේදී ඒවායින් සමහරක් තෙරපියුටා ප්‍රජාව තුළ පැවති විශ්වාස වලට සමාන කමක් දක්වන අතර, සමහර විශ්වාස ඊට හාත්පසින්ම වෙනස් වේ. මෙහිදී කැපී පෙනෙන ලක්ෂණය වන්නේ එසීන්වරු අනුගමනය කළ බොහෝ සිරිත් විරිත් සහ ආකල්ප බෞද්ධයින්ගේ ජීවිතවලට සමානකමක් පෙන්නුම් කිරීමය. මෙම සමාජ දෙක සසඳා බැලීම සඳහා එකී සමානකම් බොහෝ දුරට හේතු විය.

පෞද්ගලික දේපල වස්තුව කෙරෙහි ඇල්මක් නොදැක්වීම සහ පොදු දේපල ක්‍රමයක් පවත්වා ගැනීම බෞද්ධ ගිහි විනයේ කැපී පෙනෙන අංග ලක්ෂණයකි. අශෝක රජතුමා තමා සතු සියලු වස්තුව බුද්ධ ශාසනයට පූජා කළ අතර දේපල පොදුවේ බෙදා හදා ගැනීමට රුකුල් දුන්නේය. ශරීරය තෙල් සුවඳ ගල්වා සැරසීම විශේෂයෙන්ම බෞද්ධ සංඝයා වහන්සේට තහනම් කර තිබේ. විනය පිටකයේ ගිහි ශ්‍රාවකයින්

හඳුන්වා තිබෙන්නේ හුදු හැඳගත් උපාසකයින් වශයෙනි. බෞද්ධ ආගමික සමාජ තුළ ද 'කර්ම දාන' යනුවෙන් හැඳින්වෙන පාලකයින් සිටි. ඔවුහු ආශ්‍රමයක තිබිය යුතු ජීවත්වීම සඳහා අවශ්‍ය දේ පිළිබඳව නිතර සොයා බලා කටයුතු කරති. ආගමික චාරිකාවේ යෙදුණු පුද්ගලයින් පිළිගැනීම බෞද්ධයින් අතර දක්නට ලැබෙන ලක්ෂණයකි. ආගන්තුක සත්කාරය බෞද්ධයින් තුළ දක්නට ලැබෙන විශේෂ අංගයකි. මන්ද බෞද්ධ භික්ෂූන් ධර්ම ප්‍රචාරය සඳහා දුර බැහැර ගමන් කළ හෙයිනි. උන් වහන්සේලා ආරාමවල දීර්ඝ කාලයක් වැඩ විසුයේ වස්සාන සමයේදී පමණි. එමෙන්ම ඔවුන් පිණ්ඩපාතික භික්ෂූන් වීම නිසා ජීවිකාව සඳහා කිසියම් වෘත්තියක යෙදුණේ නැත. බෞද්ධ ආශ්‍රමවල හිරු උදාවීමේදී සහ බැස යාමේදී වන්දනා ගාථා සජ්ඣායනා කළ බව පළමුවන සහශ්‍රකයේ මුල් ශත වර්ෂවලට අයත් චීන සංචාරකයින්ගේ වාර්තාවල සඳහන් වේ. ඒ සඳහා භාවිතා කරනු ලැබූ ගාථා පාතිමොක්ඛයේ ඇතුළත් වේ. පලස්තීනයේ විසූ එසීන්වරු බෞද්ධ පුරුෂාර්ථවලට අනුව ජීවත් වූ බව ඔප්පු කිරීම සඳහා මහත් ප්‍රයත්නයක් දැරූ සැමුවෙල් බීල් මෙසේ ප්‍රකාශ කර තිබේ: 'ජ්‍යෙෂ්ඨයින්ට ගෞරව කිරීම, ආධුනිකයින් පුහුණු කිරීම සහ ආගමික සමාජයෙන් නෙරපා හැරීමේදී ගතයුතු ක්‍රියා මාර්ගය පිළිබඳව එසීන්වරු අනුගමනය කළ නීතිරීති සියල්ලම බෞද්ධ විනය නීති වලට සමාන බව පෙනේ.'[38]

එසීන්වරු තුළ පැවති ලජ්ජාශීලී බවත්, නිහතමානී බවත් ආකල්පය, භික්ෂූන් වහන්සේලා ගමන් කරන හැම අවස්ථාවකදීම හිස පහතට නමා ගෙන ගමන් කළ යුතු බවට බුදුන් වහන්සේ විසින් පනවා ඇති නියමය සිහිපත් කරවයි. බෝධිසත්වයකු විසින් පිළිපැදිය යුතු ආකාරය එසීන් නීති පොතේ (Essene Rule Book) මෙසේ දක්වා තිබේ: "බෝධි සත්වයකු වන මා මගේ ජීවය සෘජුවත් අකම්පිතවත් පවත්වා ගනිමි. මිත්‍රශීලී වූත්, චපල නොවූත් පුද්ගලයෙක් වෙමි. ගෞරව නමස්කාර පූර්වක වූ පුද්ගලයෙක් වෙමි. විලි බියෙන් යුක්තවූ පුද්ගලයෙක් වෙමි. සන්සුන් ඉඳුරන් ඇත්තෙක් වෙමි. අන්‍යයන්ට සේවය කිරීම එකම අපේක්ෂාව කොට ගනිමි. සියලු යහපත් ක්‍රියාවන්හිදී මමත්වයෙන් තොර වූ පුද්ගලයෙක් වෙමි. මානය නැත්තෙක් වෙමි." (ශික්ෂා සමුච්චය.)

අන්‍යෝන්‍ය සහයෝගය, හැඟීම් පාලනය කර ගැනීම, පණ ඇති සියලු සත්වයින්ට ගෞරව කිරීම සහ ආගමික සමාජයේ සාමාජිකයින් කෙරෙහි විශ්වාසව පැවතීම වැනි මූලික මූලධර්ම බෞද්ධ අදහස් හා උපදේශ බව පෙනී යයි. නිරෝගී සෞඛ්‍යය පවත්වා ගැනීමේ පරමාර්ථය පෙරදැරි කරගෙන එසීන්වරු විසින් ස්වභාව ධර්මය පිළිබඳව අධ්‍යයනය කිරීම සමහර විට අශෝක රජතුමාගේ ධර්මදූත මෙහෙවරෙහි ප්‍රතිඵලයක්

ලෙස සිදු වන්නට ඇත. ඖෂධ පැළෑටි සහ වෛද්‍ය විද්‍යාත්මක දැනීම විවිධ රටවල පතුරුවා හැරීම සඳහා අශෝක රජතුමා මහත් උනන්දුවකින් කටයුතු කළේය.

එසීන් ආගමික නිකායේ මූලාරම්භය සහ ඔවුන් විසින් ඇති කළ බලපෑම පිළිබඳව අවුරුදු දෙසීයක් පමණ කාලයක් තිස්සේ බොහෝ අදහස් හා මත ඉදිරිපත් කර තිබේ. එසීන්වරු යනු බයිබලයේ 'නික්මයාම' නමැති පොතේ (19:6) දැක්වෙන පරිදි ඊශ්‍රායල් ජාතිකත්වය පිළිබිඹු කිරීම සඳහා පූජක රාජ්‍යයක් ගොඩනැගීම පිණිස කටයුතු කළ යුදෙව්වන් විසින් ඇතිකළ පුනර්ජීවන ව්‍යාපාරයක් (Revivalist Movement) ලෙස සමහරු සලකති. ජෙරුසලමේ ආගමික කටයුතු වල පාලනය නුසුදුසු පුද්ගලයින් අතට පත් වී තිබෙන බව ප්‍රකාශ කළ ඔවුහු ශුද්ධ වන්තයින් (Pure ones) වශයෙන් හඳුන්වනු ලැබූ කණ්ඩායමක් පිහිටුවා ගත්හ. එසීන් ආගමික නිකාය මකබීවරුන්ගේ යුගය දක්වා පැරණි බව සමහරු විශ්වාස කරති. ඒ කාලයේදී ශුද්ධවන්තයින් වශයෙන් හඳුන්වා ගනු ලැබූ ආගමික කණ්ඩායමක් ජෙරුසලමේ ආගමික කටයුතු නුසුදුසු පුද්ගලයින් අතට පත්වී ඇතැයි කල්පනා කළහ. මෙම ශුද්ධවන්තයින් පසු කාලයේදී විවිධ කොටස්වලට බෙදී ගොස් තමන්ගේම වූ ආගමික සමාජයක් පිහිටුවා ගත් බව සඳහන් වේ. කුම්රාන් ආගමික සමාජයත් මකබී යුගයේ පැවති ප්‍රශ්න හේතුකොට ගෙන බිහිවූ ආගමික කණ්ඩායමක් බව විශ්වාස කරනු ලැබේ. එනිසා එම ඓතිහාසික සිදුවීම් ගැන අපි දැන් කෙටියෙන් සලකා බලමු.

බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ඊශ්‍රායල් ජාතිකයින්ගේ වැදගත්කම පිරිහී ගියේය. තුලනාත්මකව සලකා බැලීමේදී ජන සංඛ්‍යාව අඩුවූ අතර ඔවුන් හුදකලා තත්වයක පසුවිය. තවදුරටත් ඔවුන්ට දේශපාලන වශයෙන් ස්වාධිකාරීත්ත්වයක් (Autonomy) පවත්වා ගැනීමට නුපුළුවන් විය. ආකිමෙනිඩ්ස් (Achaemenids) ගේ අධිරාජ්‍යය බිඳ වැටීමෙන් පසු ඔවුන්ට තිබූ ආරක්ෂාව නැතිවී ගියේය. රටේ දේශසීමා පිළිබඳ ගැටලු වැඩිවන්නට පටන් ගත්තේය. මිනිසුන්ට ජීවිතයේ කිසියම් නිශ්චිත අරමුණක් නොතිබුණි. විප්‍රවාසව සිටි කාලය තුළ ඇතිවූ විදේශීය බලපෑම් හේතුකොට ගෙන කලින් පැවති ආගමික සම්ප්‍රදාය බිඳ වැටෙන්නට පටන් ගත්තේය. තම ජාතික අනන්‍යතාවය නැතිවීයාමේ තර්ජනය උග්‍රවිය. බොහෝ දුරට ඔවුන් තුළ ගැලවුම් කාරයකුගේ පැමිණීම, උත්කෘෂ්ට පාලකයකුගේ බිහිවීම පිළිබඳ බලාපොරොත්තුවක් ඇතිවන්නට පටන් ගත්තේ මේ කාලයේදී විය යුතුය. එවැනි ගැලවුම් කාරයකු බිහිවී ඉතිහාසයේ මෙතෙක් පැවති අඳුරු යුගයක් අවසාන කර විමුක්තිය රජයන යුගයක් (Age of Salvation) බිහි කරනු ඇතැයි ඔවුහු බලාපොරොත්තු

වූහ. එම ගැලවුම්කරුවා දෙවියන්ගේ නියෝජිතයකු මෙන් ඔහු දෙවියන් වහන්සේ විසින් තෝරාගත් පුද්ගලයින් ලෙස සැලකෙන ඊශ්‍රායල් ජාතිකයින්ට අහිමිව ගිය උරුමය නැවත ලබාදෙනු ඇතැයිද ඔවුන් බලාපොරොත්තු විය. ක්‍රි. පූ. 332 වර්ෂයේදී මහා ඇලෙක්සැන්ඩර් රජතුමා පලස්තීනයට පැමිණි අවස්ථාවේදී එතුමා ඉතා උත්කර්ෂවත් අන්දමින් පිළිගැනීමේ සිද්ධිය අප සලකාබැලිය යුත්තේ මෙම පසුබිම තුළය. යුදෙව් ජාතිකයින් විසින් පැමිණේයැයි බලාපොරොත්තුවෙන් සිටි ගැලවුම්කරුවා ඇලෙක්සැන්ඩර් නොවූ බව මෙහිදී අමුතුවෙන් කිව යුතු නැත. නමුත් ඔවුන් නීති ගරුක පුද්ගලයින් බවට පත් කිරීමට හේතුවූ නව වෙනස්කම් ඇති කිරීමට ඇලෙක්සැන්ඩර්ට හැකිවිය. ඉන් පසුව එළඹුන කාලපරිච්ඡේද වලදී ඔවුහු දැඩි පරීක්ෂණයට භාජන කරනු ලැබූහ. ග්‍රීක චින්තනය නියෝජනය කළ විශ්වදේශ වාසියකු වූ ඇලෙක්සැන්ඩර් යුදෙව් සිරිත් විරිත්, ආචාර ධර්ම සහ ආගම් පිළිබඳ අදහස් කෙරෙහි මහත් උනන්දුවක් දැක්වූයේය. කෙසේ වෙතත් සමාරිවරුන් විසින් අදහනු ලැබූ එහෙත් සමාජයේ එතරම් පිළිගැනීමට පාත්‍රනොවූ ආගම් කෙරෙහිත් ඇලෙක්සැන්ඩර් ඒ හා සමාන සැලකිල්ලක් දැක්වූයේ මන්ද යන කාරණය තේරුම් ගැනීමට පූජක පක්ෂයට නොහැකිවිය.

ඊජිප්තුවේ බල අරගලයක් පැවති අවධියේදී පළමුවන ටොලමි රජතුමා පලස්තීනයට පැමිණි අවස්ථාවේදීත් ජනතාවගෙන් විශාල කොටසක් එතුමා මහත් හරසරින් පිළිගත්හ. ඔහු පෙරළා සිය රටට යනවිට යුදෙව් ජාතිකයින් සැලකිය යුතු ප්‍රමාණයක් ඊජිප්තුවේ පදිංචිකරවීම සඳහා රැගෙන ගියේය. හෙලනිසියානු සංස්කෘතියේ පැවති සහනශීලීත්වය පිළිබඳ අදහස්වල ආභාසය නිසා ඔහු ඊශ්‍රායල් ජාතිකයින්ට ඔවුන්ගේ ආගමික විශ්වාසවලට අනුව කටයුතු කිරීමේ පූර්ණ නිදහස ලබා දුන්නේය. එසේ කිරීමෙන් තමන්ට හිතවත් වූ ජන කොටස්වල ශක්තිය වර්ධනය කරගැනීම ඔහුගේ අපේක්ෂාව විය. එතැන් පටන් යුදෙව් ජාතිකයින් ඇලෙක්සැන්ඩ්‍රියාවේ පිළිගත් ජන කොටසක් ලෙස සලකා ඔවුන් පුරවැසියන් වශයෙන් ලියා පදිංචි කිරීම ආරම්භ කරන ලදී. ඔවුන් සඳහා ඇලෙක්සැන්ඩ්‍රියා නගරයට අයත් දිස්ත්‍රික්ක පහෙන් දිස්ත්‍රික්ක දෙකක් වෙන් කරන ලදී. යුදෙව්වන් සඳහා වෙන්කරණු ලැබූ කොටස නගරයට ඊසාන දෙසින් මැරියටිස් (Mareotis) විලේ පිහිටි වරායට ඔබ්බෙන් පිහිටා තිබුණි. (රූප රාමුව 30)

කෙසේ වෙතත් ඒ කාලයේදී ජෙරුසලම අවට ප්‍රදේශයට පමණක් සීමා වී තිබුණු ජුදා (Judea) දේශය ක්‍රි. පූ. දෙවන සත වර්ෂය ආරම්භයේදී ඉන්දියාව දක්වා පැතිර තිබූ යුදෙව් විරෝධී සෙලුසිඩ් අධිරාජ්‍යයට (Seleucid Empire) ඈඳා ගනු ලැබීය. ක්‍රි. පූ. 175-164 කාලයේදී සිටිවන

ඇන්ටිඔකස් එපිෆෙනීස් ගේ පාලන කාලයේදී විශාල අර්බුදකාරී තත්වයක් උද්ගත විය. හෙලනිසියානු සංස්කෘතිය යුදෙව්වන් වෙත බලෙන් පැටවීමට ඔහු ක්‍රියා කළේය. විවිධ විශ්වාස ඒකාබද්ධ කර සංකලනවාදී ආගමික සම්ප්‍රදායක් බිහිකර එමගින් එවකට සිදුවැටෙමින් පැවති තම අධිරාජ්‍යය තුළ අලුත් සංයෝජියක් (Renewed Cohesion) ගොඩ නැගීම ඔහුගේ බලාපොරොත්තුව වන්නට ඇත. යුගයේ අවශ්‍යතාවයන්ට ගැළපෙන ජීවන රටාවක් පවත්වා ගෙන සිටි වංශවත් යුදෙව් පැලැන්තිය ඔහුගේ මෙම උත්සාහයට සහයෝගය දුන්හ. හෙලනික වාදය (Hellenism) මඟින් මෙම නොදියුණු රටට නව බුද්ධිමය ප්‍රබෝධයක් සහ පහසු ජීවන ක්‍රමයක් සලසා දිය හැකියයි කල්පනා කළ සමාජයේ ඉහළ පැලැන්තියට අයත් පුද්ගලයින් ඒ සඳහා සම්මුතියකට එළඹීමට කැමති වූහ. එකල පූජකවරය පවා පැවරී තිබුණේ වංශවතුන්ට නිසා තම මුතුන් මිත්තන්ගෙන් උරුම වූ ආගමික සම්ප්‍රදාය ආරක්ෂා කරගෙන සිටි පූජක පක්ෂයේ සහයෝගයද ඔහුට ලැබුණි. නමුත් ප්‍රධාන පූජකතුමා වශයෙන් කටයුතු කළ තුන්වන ඔනියස් (Onias) මෙම හෙලනිසියානු බලපෑමට විරෝධය දැක්වීම නිසා ජේසන් නම් වූ ඔහුගේ සහෝදරයා විසින් ඔනියස් පන්නා දමා ඔහු එම පදවියට පත්විය. නායක පූජක පදවියට පත්වීමෙන් පසු ජේසන් විසින් කරන ලද ප්‍රථම කාර්යය වූයේ ජෙරුසලම් නගරයේ ග්‍රීක් සම්ප්‍රදායට අනුව උසස් ස්ථානයක් ඉදිකිරීමය. ජාවේත් (Jahweh) දේවස්ථානය කෙරෙහි අවඥා සහගතව කටයුතු කළ ජේසන් එහි සිදුකරනු ලැබූ බිලිපූජා නතර කර දැමීය. ජුදා දේශ සීමාවෙන් ඔබ්බෙහි පිහිටි ප්‍රදේශවල සෑම තැනකම පාහේ හෙලනිසියානු නගර සීඝ්‍රයෙන් බිහිවන්නට පටන් ගත්තේය. ජෙරුසලම් නගරයද ග්‍රීක් ආකෘතියකට අනුව නැවත ගොඩ නගන ලදී. කෙසේ වෙතත් මෙතෙක් පැවති පැරණි සම්ප්‍රදාය ආරක්ෂා කර ගත යුතුය යන හඬ පිටිසර බද ප්‍රදේශවලින් නැගෙන්නට පටන් ගත්තේය. මෙසේ හෙලනිසියානුකරණයට එරෙහිව විශාල ජාතික විරෝධතා රැල්ලක් රටපුරා පැතිරෙන්නට පටන් ගත්තේය. විටි සටන් එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය සිදුවීමක් බවට පත්වී අන්තිමේදී එය ගරිල්ලා යුද්ධයක් බවට පරිවර්තනය විය.

එහෙත් ඇන්ටිඔකස් තම උත්සාහය අත් හැරියේ නැත. ඔහු යුදෙව් බැතිමතුන් කුපිත කරවන ආකාරයේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින් ජෙරුසලමේ දේව මාලිගයේ දෙවියන් උදෙසා පුළුටු පූජා (Burnt Offerings) සිදු කළ ස්ථානයෙහි සෙවුස් ඔලිම්පිඔස් (Zeus Olympios) නමැති ග්‍රීක් දෙවියා උදෙසා අල්තාරයක් ඉදිකළේය. ක්‍රි. පූ. 167 වර්ෂයේදී චර්මඡේදනය (Circumcision) සහ මෝසස් ගේ ඉගැන්වීම් ඇතුළත් පොත් පත් ළඟ තබාගැනීම (Possession of Torah) මරණීය දණ්ඩනය ලැබිය

යුතු වරදක් බවට ප්‍රකාශ කරමින් නියෝගයක් නිකුත් කළේය. දේව මාලිගය තුළ තිබූ වස්තුව කොල්ලකාගත් ඔහු නගරයේ විශාල කොටසක් ගිනිබත් කළේය. තම ජීවිත ආරක්ෂා කර ගැනීම පිණිස බොහෝ යුදෙව් ජාතිකයින්ට කාන්තාරයට සහ කඳුකර ප්‍රදේශවලට පලායාමට සිදුවිය. ජාන්වේ ඇදහිලි ක්‍රමය (Jahweh Cult) තහනම් කර යුදෙව් ජීවන ක්‍රමයේ පැවති සුවිශේෂ අංග ලක්ෂණ තහනම් කරමින් ඔවුන් සතුව පැවති ජාතික ලක්ෂණ විනාශකර දැමීම සඳහා කරන ලද මෙම මර්දනකාරී ක්‍රියා පිළිවෙළ හේතු කොටගෙන බොහෝ කාලයක් තිස්සේ මෝදුවෙමින් පැවති ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබඳ අර්බුදය උග්‍ර අතට හැරුණි. මිනිසුන්ගේ බලාපොරොත්තු සුන්ව ගිය මෙම මර්දනකාරී යුගයේදී විශේෂයෙන්ම, තම ජාතිය ගලවා ගැනීම සඳහා බිහිවන 'මනුෂ්‍ය පුත්‍රයා' පිළිබඳ සුවිශේෂ විශ්වාසය සහ ඊශ්‍රායල් දරුවන්ගේ දුක්වේදනා පිළිබඳ කරුණු ඇතුළත් දානියෙල් සහ එනොක් විසින් රචනා කරන ලද එළිදරව් පිළිබඳ පොත් බිහිවිය." දෙවියන් වහන්සේ විසින් ලෝකයේ පවතින තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කරනු ඇතැයි ඊශ්‍රායල් වැසියෝ විශ්වාස කළහ. අවසානයේදී දේව විනිශ්චය ඉදිරියේදී මහා බලවතකුට පවා තනිව මුහුණදීමට සිදුවන බව ඔවුන් විශ්වාස කළහ. ඒ බව එනොක්ගේ පොතේ මෙසේ සඳහන් කර තිබේ: "එහිදී යුක්ති සහගත වූත් විශ්වාසවන්තවූත් අය අතරින් තෝරාගත් පුද්ගලයින් මම මගේ දෑසින් දුටුවෙමි. නියම අවස්ථාව එළැඹුන විට යුක්තිය රජයනු ඇත. යුක්තියට සහ සත්‍යයට අවසානයක් නොමැත." (එනොක් 39:6 ff)

සරණාගතයින්ගේ ප්‍රශ්නය උග්‍රවී එය මුළු රටපුරා පැතිර යනවිට මෝඩෙයි (Modein) හි විසූ මතතියාස් (Mattathias) නමැති එක් වයෝවෘද්ධ පූජකවරයෙක් අලුත් අත්හදා බැලීම් වලට විරෝධය පෑවේය. ඔහු අලුතින් ගොඩනගන ලද මිථ්‍යාදෘෂ්ටික අල්තාරය (Heathen Altar) මත පූජාවක් කිරීමට පැමිණි සමාජයේ පිළිගත් පුරවැසියකු මරා දැමුවේය. ඉන්පසු තම දරුවන් පස්දෙනා සමග එකතුවී රාජකීය කොමසාරිස් වරයාද මරණයට පත්කර අල්තාරය කඩා බිඳ දමා කඳුකරයට පලාගියේය. එහිදී ඔවුන් 'හැසිඩිම්' යනුවෙන් හඳුන්වනු ලැබූ කණ්ඩායමක් සමග එකතුවූහ. මෙම යුදෙව් මූලධර්මවාදීන් රාත්‍රී කාලයේදී රජයේ නිලධාරීන් සහ හෙලනිසියානු සංස්කෘතිය වැළඳගත් යුදෙව්වන් මරා දැමීමට පටන් ගත්තේය. විස්මය ජනක ලෙස මෙම කුඩා කණ්ඩායම සාර්ථක ප්‍රතිඵල නෙලාගත්හ. මතතියාස් සිය මරණ මංචකයේ සිටියදී ඔහුගේ තුන්වන පුත්‍රයාවූ ජුදාස් තම ව්‍යාපාරයේ නායකයා ලෙස පත්කර ගන්නා ලෙස අනුගාමිකයින්ගෙන් ඉල්ලා සිටියේය. ඔහු ජුදාස් මකබියස් (Judas Maccabeus) යනුවෙන් ප්‍රසිද්ධ විය. ඔහු විසින් දියත් කරන ලද කැරැල්ල

සිසිදිනෙක සම්පූර්ණයෙන්ම මැඩ පැවැත්විය නොහැකි විය. ක්‍රි. පූ. 164 වර්ෂයේදී ඇන්ටිඔකස් පාර්තියන් වරුන්ට එරෙහිව සටනක් මෙහෙයවමින් රටින් පිටව ගොස් සිටි අවස්ථාවකදී කැරලිකරුවෝ දරුණු ප්‍රහාරයක් එල්ල කිරීමට සූදානම් වූහ. ඇන්ටිඔකස්ගේ රාජාධිකාරයා වූ (Regent) ලයිසියස් (Lysias) එහිදී මහත් පරාජයකට පත්විය. ඒ නිසා සෙලූසියිඩ් පාලකයින්ට මර්දනකාරී ක්‍රියාපිළිවෙළ අඩුකිරීම හැර ගතහැකි වෙනත් විකල්පයක් නොවීය. ඒ අනුව ජුදාස්ට ජෙරුසලම් නගරයේ පදිංචිවීමට අවසර දෙන ලදී. ආගමික නිදහස නැවත ස්ථාපිත කරන ලදී. දක්ෂිණායනය සමයේදී (Winter Solstice) වසර තුනක් තිස්සේ කෙලසනු ලැබූ දේව මාලිගය නැවත වරක් පිරිසිදු කරනු ලැබිය. අද වාර්ෂිකව පැවැත්වෙන 'චනුක උත්සවය' (Chanukka Festival) මගින් සිහිපත් කරනු ලබන්නේ දේවමාලිගය නැවත විවෘත කරනු ලැබීමේ මෙම සිද්ධියයි.

මැදිහත් දෘෂ්ටිකෝණයකින් සලකා බැලීමේදී මකබිවරුන්ගේ කැරලි නිසා ආගමික සහනශීලීත්වයක් ඇතිකිරීමට දරන ලද උත්සාහය ව්‍යර්ථ වී ගියේය. නීතිය පිළිපැදීම විවිධ ආගමික නිකායන් යටතේ තීව්‍ර ලෙස සිදුවන්නට පටන් ගත්තේය. මෙසේ එසීන්වරු හෙලනීසියානු සම්ප්‍රදායට එරෙහිව ඇතිවූ අරගලය නිසා බිහිවූ විවිධ ආගමික කණ්ඩායම් වලින් එකක් විය.

ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේ මැද භාගයේ පටන් සෙලූසිඩ් අධිරාජ්‍යය ශීඝ්‍රයෙන් බිඳ වැටෙන්නට පටන් ගත්තේය. රෝමයද මෙම ප්‍රදේශය කෙරෙහි උනන්දුවක් දක්වන්නට පටන් ගත්තේය. ජුදා දේශය අසල්වැසි ගැලීලියේ ප්‍රදේශ දක්වා, එනම් සමාරියා මුහුදු තීරය ඔස්සේ ට්‍රාන්ස් ජෝර්ඩන්, ඉදුමියා (Idumaea) සහ හෙලනීසියානු බලපෑමට යටත්වූ ඩෙකපෝලිස් (Decapolis) දක්වා පැතිර ගියේය. දැඩි ආත්ම විශ්වාසයකින් යුතුව කටයුතු කළ ජෙරුසලමේ විසූ පූජකවරුන්ගේ නායකත්වය යටතේ සෙලූසිඩ්වරු යුදෙව් ජාතිකයින් පීඩනයට පත් කළේ යම්සේද, එපරිද්දෙන්ම යුදෙව් ජාතිකයින්ද අනෙකුත් ජාතීන් පීඩනයට පත් කළහ.

බලහත්කාරයෙන් පටවනු ලැබූ මෙම යුදෙව් ජාතිකකරණය (Judaization) නිර්දය ක්‍රියාවලියක් බවට පත්විය. ප්‍රදේශ ඈඳාගැනීම කාරේ අන්දමින් සිදුකරන ලදී. ක්‍රි. පූ 104 වර්ෂයේ පටන් පූජකත්වය (Priest-hood) සහ රාජත්වය තීරණය කරන ලද්දේ උරුමය අනුවය. මේ නිසා පරිසිවරුන්ට මෙතෙක් ඔවුන් සතුව පැවති අයිතිවාසිකම් අහිමි වී යාමේ තර්ජනයකට මුහුණ දීමට සිදුවීම නිසා ඔවුන් එම තත්වය වෙනස්කිරීමට කටයුතු කළහ. ක්‍රි. පූ. 36 වර්ෂයේදී ඇරිස්ටොබියුලස්ගේ මරණින් පසු

ප්‍රධාන පූජකවරයාගේ නිලය පවුල් කීපයකට පමණක් සීමා වී තිබුණි. නමුත් සැන්හෙන්ඩ්‍රින් (Sanhendrin) නමින් හැඳින්වූ උපදේශක සභාවක් පිහිටුවනු ලැබූ අතර එම උපදේශක සභාව ඉතා ඉක්මනින් දේශපාලන වශයෙන් විශාල බලපෑමක් ඇතිකළ හැකි ආයතනයක් බවට පත්විය.

නව සහස්‍රකය ආරම්භ වීමට දශක කීපයකට කලින් යුදෙව් ජාතිකයින් නැවත වරක් යළි වෙනස් කළ නොහැකි පරිදි විදේශ ආධිපත්‍යයට යටත් විය. රෝමන්වරු හැස්මෝනියන් (Hasmoneans) නමින් හැඳින්වූ ජුදාව පාලනය කළ රාජවංශය බලයෙන් පහකර ජුදා දේශය තම රාජ්‍යයට ඈඳාගත්හ. ඔවුහු ඉදුමේනියානු (Idumaenean) රාජවංශය පිහිටුවා හෙරෝද් (Herod) රජු එහි පාලකයා ලෙස පත්කළේය. බලයෙන් පහකරන ලද රාජවංශයේ අවසාන පාලකයා වූ ඇන්ටිගෝනෝස් (Antigonos) පාර්තියන් වරුන්ට එකතු විය. මීට කලින් මතතියාස් සහ ඔහුගේ අනුගාමිකයින් විසින් විරෝධය දක්වූ ප්‍රතිසංස්කරණ නැවත වරක් හඳුන්වා දෙනු ලැබීය. ක්‍රි. ව. 39 - ක්‍රි. පූ. 4 දක්වා කාලය තුළදී රෝමන් පාලකයින්ගේ අවශ්‍යතා නියෝජනය කරමින් හෙරෝද් (Herod) රජතුමා ග්‍රීක් ආකෘතියකට අනුව නගරය ඉදිකළේය. කෙසේ වෙතත් මේ අවස්ථාවේදී මහජනයා කලින් අවස්ථාවලදී ක්‍රියා කළ ආකාරයට වඩා සිහි බුද්ධියෙන් යුක්තව කටයුතු කළහ. හෙරෝද් රජතුමා මේ සැම කටයුත්තක්ම සිදුකළේ ඉතාමත් කල්පනාකාරීවය. ඔහු පූජකයින් ඉවසුවේය. නීතියට අනුව කටයුතු කළේය. දේව මාලිගය විසිතුරු කොට පුළුල් කළේය. කෙසේ වෙතත් නැවත වරක් මහජනයා තුළ දැඩි අවිශ්වාසයක් ගොඩ නැගෙන්නට පටන් ගත්තේය. මේ සියලුම වෙනස්කම් සිදුකර තිබෙන්නේ විදේශීය බලවේගයක නියෝග යටතේ බවත්, යුදෙව් සම්ප්‍රදායට පටහැනිව බවත් යන කාරණය සැඟවිය නොහැකිවිය.

සටන්කාමී මෙන්ම සාමකාමී ක්‍රියාපිළිවෙත් අනුගමනය කළ විවිධ යුදෙව් ආගමික කණ්ඩායම් විසින් මකබියානු යුගයේදී කළ පරිදි වර්තමානය දක්වා විහිදෙන පරිදි නැවත වරක් අනාගත වාක්‍ය සහ එළිදරව්ව පිළිබඳව ලියන්නට පටන් ගත්හ. නව සහස්‍රකය එළඹීමට පෙර පැවති දශක කීපය ඇතුළත් කාලපරිච්ඡේදයේදී තරම් ඉතිහාසයේ පෙර කිසි කලෙක ඊශ්‍රායල් ජාතිකයින් මෙතරම් තීව්‍රලෙස දෙවියන් වහන්සේගේ මැදිහත්වීම යටතේ ගැලවුම් කාරයකුගේ පැමිණීම අපේක්ෂාවෙන් නොසිටියහ.

එසීන් නමින් ආගමික කණ්ඩායමක් බිහිවීමට තරම් අවශ්‍ය හේතු මකබියානු යුගයේදී පැවතිණ. හැසිඩිම් (Hassidim) වරු මෙන්ම

එසීන්වරුද හෙලනිසියානු බලපෑමට එරෙහිව සමකාලීනව බිහිවූ ආගමික නිකායක් විය හැකිය. කෙසේ වෙතත්, ගතවූ සහස්‍රකය අවසාන වීමට අවුරුදු දෙසීයකට පමණ පෙර ඇතිවූ සිදුවීම් එසීන්වරු අනුගමනය කළ විශේෂ ජීවන ක්‍රමයට හෝ ඔවුන් තුළ පැවති යුදෙව් සම්ප්‍රදායට අයත් නොවූ විශ්වාස පැහැදිලි කිරීමට තරම් සෑහෙන හේතුවක් සපයා නොදේ. මකබියානු කැරලි ඇතිවූ යුගයේදී එසීන් ආගමික කණ්ඩායම බිහිවීමට ඉඩ තිබුණත් යුදෙව් ආගමේ වර්ධනය කෙරෙහි ඔවුන්ගෙන් කිසිම බලපෑමක් සිදුනොවූ බව බොහෝ විද්වතුන් විසින් දීර්ඝ කාලයක් ඒ පිළිබඳව පර්යේෂණ කිරීමෙන් පසු පෙන්වා දී තිබේ. එවැනි තත්වයක් ඇතිවීම කෙරෙහි බලපා ඇති ඇලෙක්සැන්ඩ්‍රියානු හෙලනික වාදය, (Alexandrian Hellenism) ඉරානියානු පර්සිවාදය (Iranian Parseeism) සහ ප්ලේටොනික (Platonic) චින්තනය, බැබිලෝනියානු අදහස් සහ පයිතගරස් චින්තනය වැනි කරුණු රාශියක් මෙම විද්වතුන් විසින් ඉදිරිපත් කර තිබේ. එම අදහස් බෞද්ධ ශ්‍රමණයින් විසින් ජීවිතය කෙරෙහි දක්වන ලද ආකල්ප හා ඉතා කිට්ටුවෙන් බැඳී තිබෙන බව අපි මීට කලින් දුටුවෙමු.

පයිතගරස් ඉන්දියානු ආගමික චින්තනය සහ ආශ්‍රමික ජීවිතය බටහිර රටවල ප්‍රායෝගිකව ක්‍රියාවට නැගුවේය. ඒ නිසා මෙම සන්දර්භය තුළ එසීන් ආගමික කණ්ඩායම කෙරෙහි පයිතගරස්ගේ අදහස් මගින් ඇතිකළ බලපෑම වැදගත්වේ. එසීන් ආගමික කණ්ඩායම තුළ දක්නට ලැබෙන මෙම සමානකම් ඉන්දියානු බලපෑම නිසා නොව භූගෝලීය වශයෙන් කිට්ටුව පිහිටි පයිතගරස්ගේ ගුරුකුලයේ බලපෑම නිසා සිදුවී තිබෙන බව වැඩි දෙනෙකුගේ පිළිගැනීමය. එසීන්වරු පයිතගරස්ගේ අනුගාමිකයින්ට සමාන කිරීම අලුත් අදහසක් නොවේ. සමකාලීනව විසූ වෘතාන්ත රචකයකුවූ (Contemporary Chronicler) ජොසෆස්ට මෙම සමානකම් පෙනී ගියේය. එම සමානකම් ඇතිවී තිබෙන්නේ ග්‍රීක දර්ශනවාදී ගුරුකුලයේ බලපෑම නිසා බව තම හෙලනිසියානු පාඨකයින්ට ප්‍රකාශ කිරීම ඔහුට අවශ්‍ය විය. උදාහරණයක් වශයෙන් පරිසිවරු, ස්ටොයික (Stoics) ගුරුකුලයට ආසන්න වශයෙන් සමාන කළ හැකිබව ඔහු කල්පනා කළේය. පයිතගරස් විසින් ග්‍රීක ජාතිකයින් පුහුණු කරනු ලැබූ ආකාරයටම එසීන් ආගමික නිකායකයින් ජීවත්වූ බව ජොසෆස් ස්ථිර ලෙස ප්‍රකාශ කර තිබේ. පයිතගරස් විසින් උගන්වන්නට ඇත්තේ ඉන්දියානු මූලාශ්‍ර ඔස්සේ සකස් කරන ලද ජීවන ක්‍රමයක් විය නොහැකිද? ෆිලෝ විසින් එසීන්වරු ඉන්දියාවේ විසූ ජිම්නොසොෆිස්ට් වරුන්ට සමාන නොකළේද? යුදෙව් සංස්කෘතිය ව්‍යාප්තව පැවති ප්‍රදේශය පුරා පැතිර සිටි ඊටම ආවේනිකවූ සවිචාරී ලක්ෂණවලින් යුක්තවූ මෙම ආගමික

ප්‍රජාව (Idoiosyncratic Religious Community) කෙරෙහි, විශේෂයෙන්ම බෞද්ධ ඉගැන්වීම් බලපා තිබෙන බවට කිසිම සැකයක් නොමැත. එමෙන්ම එම බලපෑම එසීන් සාමාජිකයින් සමග ඉතා කිට්ටු සම්බන්ධතාවයක් ගොඩනගාගෙන සිටි ඊජිප්තුවේ වාසය කළ තෙරපියුටා සමාජය හරහා සිදුවීමට බොහෝ දුරට ඉඩ තිබේ. මෙම බලපෑම එක්කෝ ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ තෙරපියුටා ප්‍රජාව මගින් ජුදා දේශයේ සිදුකළ සාර්ථක ධර්ම ප්‍රචාරක කටයුතු නිසා හෝ එසේ නැතිනම් ඇලෙක්සැන්ඩ්‍රියාවේ වාසය කළ යුදෙව් ජාතිකයින් ක්‍රි. පූ. 3 වන සත වර්ෂය තරම් ඈත කාලයේදී තෙරපියුටා ප්‍රජාවගේ ආගමික චින්තනය පලස්තීනයට රැගෙනවිත් කුඩා ආගමික කණ්ඩායම් වශයෙන් සංවිධානයවී අප්‍රකට ලෙස ජීවත්වීම නිසා සිදුවන්නට ඇත. තමන් අයත්වූ ආගමික සහ සංස්කෘතික පසුබිම අත්හැරීමකින් තොරව යුදෙව් බැතිමතුන්ගේ අවධානය තෙරපියුටා ප්‍රජාවගේ පුරුෂාර්ථ (Ideals) කෙරෙහි යොමුකරවීමට හැකිවිය. මෙසේ බුදු දහම සහ යුදෙව් ආගම යනුවෙන් එකල ලෝකයේ පැවති සමයාන්තර ආගම් දෙකක් ඒකාබද්ධ කරමින් එසීන්වරු බෞද්ධ ශ්‍රමණ සමාජයට බොහෝදුරට සමාන ආගමික ප්‍රජාවක් ඇති කළහ.

කුම්රාන් ආගමික ප්‍රජාව පිළිබඳ අප්‍රකට තොරතුරු

කුම්රාන් ලෙන් තුළ තිබී සොයාගත් සම් ලියවිලි (Scrolls) මගින් එසීන් ආගමික නිකාය පිළිබඳ එතෙක් නොදැන සිටි අප්‍රකට තොරතුරු සියල්ල අනාවරණය කර ගැනීමට හැකිවේයැයි බොහෝ දෙනෙක් බලාපොරොත්තු වූහ. නමුත් ඇත්ත වශයෙන්ම සිදුවූයේ ඊට හාත්පසින්ම විරුද්ධ දෙයකි. පළමුවෙන්ම පර්යේෂණ පැවැත්වීම සඳහා එම ලියවිලි සපයාදීමට තිබූ අකමැත්ත සහ දෙවනුව ඒවා අසම්පූර්ණ ආකාරයෙන් සපයාදීමත් නිසා ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම දුෂ්කර කාර්යයක් බවට පත්විය. එසීන් ආගමික සමාජයට අයත්වූයේ කුම්රාන් වැසියන් බව පිළිගත හොත් ඔවුන් පිළිබඳව (එසීන්වරු) ජොසෆස්, ෆිලෝ සහ ප්ලීනි විසින් ඉදිරිපත් කර ඇති විත්‍රය ප්‍රතිශෝධනය කළ යුතු වේ. එම අදහසට කුම්රාන් ලියවිලි පිළිබඳ පර්යේෂණ කළ පුද්ගලයින්ගේ සහයෝගය පවා ලැබී තිබෙන බවත්, එම සහයෝගය ලැබී තිබෙන්නේ ඔවුන් අතර ඇතිකරගත් කිසියම් එකඟත්වයක් (Consensus) නිසා බවත් මයිකල් බේජන්ට් (Michael Baigent) සහ රිචඩ් ලේ (Richerd Leigh) විසින් ලියන ලද පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය වූ පොතක සඳහන් කර තිබේ.[38]

මෙහිදී 'එකගත්වය' යනුවෙන් ඔවුන් අදහස් කර තිබෙන්නේ එම ලියවිලි පිළිබඳ පර්යේෂණ පැවැත්වූ පර්යේෂකයින් කණ්ඩායමක් ජේසුස් වහන්සේ පහළවීමට පෙර කුම්රාන් වැසියන් අතර ක්‍රිස්තියානි ධර්මයක් පැවති බවට පෙන්නුම් කරන සාක්ෂි නොමැති නිසා කුම්රාන් ලෙන් තුළ තිබී සොයාගත් සමහර ලියවිලි වතිකානුව මගින් රඳවා ගැනීමේ නියෝගයට (Diktat) එකඟ වී ඇති බවය. නමුත් එම මතය එතරම් යහපත් පදනමක් මත ඉදිරිපත් කර නොමැත. ඒ සම්බන්ධයෙන් පවතින සැබෑ තත්වය ඊට වඩා සංකීර්ණය.

කුම්රාන් ආගමික නිකාය ආරම්භ වූ ආකාරය තවමත් පැහැදිලි නැත. ඩැමැස්කස් ලේඛනය නමින් හැඳින්වෙන ලියවිල්ලේ ඇතුළත් කරුණු විවිධාකාරයෙන් අර්ථ නිරූපණය කළ හැකිය. එම ලියවිල්ල සොයා ගන්නා ලද්දේ කුම්රාන් ලෙන් තුළ තිබී නොවේ. එය 1896 වර්ෂයේදී පැරණි කයිරෝ නගරයේ පිහිටි සෙරේඉක් ජෙනිසා (Caraic Geniza) නමින් හැඳින්වෙන යුදෙව් ජාතිකයින්ට අයත් සම්මුති ශාලාවක තිබී සොලමන් ෂෙක්ටර් (Solomon Schechter) විසින් සොයා ගන්නා ලදී. එය කුම්රාන් සමාජයට අයත් වූ ලියවිල්ලක් බව පැහැදිලි කරගත හැකිවූයේ කුම්රාන් ලියවිලි සොයා ගැනීමෙන් පසුවය. නෙබුචඩ්නෙසර් රජතුමාගේ කාලයේදී (CD, Dam 1:5) පලස්තීන වැසියන් වහල් භාවයට පත්වී අවුරුදු තුන්සිය අනුවක් ගතවීමෙන් පසු ඇතිවූ කුරිරු යුගය පිළිබඳ තොරතුරු ඩැමස්කස් ලේඛනයේ ඇතුළත් වේ. එකල පැවති යම් යම් ආගමික ඇදහිලි ක්‍රමවලට විරුද්ධවූ කණ්ඩායමක් එම ආගමික කණ්ඩායම හා පැවති සියලු සම්බන්ධතා නවතා දමා ස්වෙච්ඡාවෙන්ම එයින් වෙන්වී තෝරාගත් සාමාජික පිරිසක් සමඟ අලුත් ආගමික සංවිධානයක් පිහිටුවා ගත්හ. මෙසේ කුම්රාන් සමාජය බිහිවූයේ ඉතා ශීඝ්‍රයෙන් සිදුවූ දැඩි හෙලනීසියානුකරණය වීමේ ක්‍රියාවලියට එරෙහිව නැගී ආ යුදෙව් ජාතිකයින් විසින් දියත් කරනු ලැබූ විරෝධතා ව්‍යාපාරයක් වශයෙනි.[39] ඔවුහු ක්‍රි. පූ. 170 දී පමණ ස්වාධීන ආගමික සංවිධානයක් (Autonomous Religious Party) පිහිටුවා ගත්හ. සමහරවිට එය පිහිටුවීමට ආසන්න හේතුව වන්නට ඇත්තේ ක්‍රි. පූ. 171 දී පමණ හෙලනීසියානුවාදී නායක පූජක පදවියට පත් මෙනෙලාවුස් (Menelaus) විසින් එයින් ව්‍යාපාරයට අනුග්‍රහය දක්වනු ලැබූ ඔහුට පෙර නායක පදවිය හෙබවූ III වන ඕනියස් (Onias III) මරා දැමීම විය හැකිය. (මකබිවරු 2. 4 : 31-38)[40]

ඩැමැස්කස් ලේඛනයට එම නම දී තිබෙන්නේ ආරක්ෂාව සඳහා ඔවුන් පලාගිය ස්ථානය ලෙස 'ඩැමැස්කස්' නමැති ස්ථාන නාමය එහි සඳහන් කර තිබෙන හෙයිනි. මෙහිදී 'ඩැමැස්කස්' යන වචනයේ තේරුම

පිළිබඳ විද්වතුන් විවිධ අදහස් දරයි. එයින් අදහස් කර තිබෙන්නේ උතුරු දිගින් පිහිටි ගලීලය සහ ඩෙකපොලිස් (Decapolis) වලට ඔබ්බෙන් පිහිටා ඇති ඩැමැස්කස් නගරයද? එසේ නැතිනම් ඩැමැස්කස් යනු යුදෙක් මෙම ආගමික නිකාය ආරම්භ කළ ස්ථානය හැඳින්වීම සඳහා යොදාගන්නා ලද කේතක (Code) නාමයක්ද? වාච්‍යාර්ථයෙන් සලකා බැලීමේදී ඩැමැස්කස් යන වචනයෙන් මෙම ආගමික සමාජය ඩැමැස්කස් නගරයට කිට්ටු ස්ථානයක ඔවුන් විප්‍රවාසව සිටි කාලය හැඟවීම සඳහා හෝ එම ආගමික නිකායට අයත් ඩැමැස්කස් නගරයේ විසූ කිසියම් ආගමික කණ්ඩායමක් හැඳින්වීම පිණිස යොදා ඇති නමක් බව සිතිය හැකිය. මෙසේ ඩැමැස්කස් යනු 'කේතක' නාමයක් ලෙස සැලකුවහොත් එය ඔවුන් විප්‍රවාසව සිටි කාලය තුළ ජීවත්වූ පාළුකරයෙහි පිහිටි 'කුම්රාන්' නමැති ස්ථානය හැඳින්වීම සඳහා යොදාගන්නා ලද නමක් ලෙස සැලකිය හැකිය. බයිබලයේ ඇතුළත් ආමෝස්ගේ පොතේ (ආමෝස් 5 : 27) සඳහන් කර ඇති පරිදි ඩැමැස්කස් යනුවෙන් සඳහන් කර තිබෙන්නේ බැබිලෝනියාව විය යුතුය. කුම්රාන් ආගමික කණ්ඩායම විසින් භාවිත කරනු ලැබූ සූර්ය ලිත (Solar Calendar) බැබිලෝනියාවෙන් ලබාගෙන ඇති බව පෙනී යන නිසා මෙම ආගමික කණ්ඩායමේ අලුතට ආරම්භය සහ එය බිහිවූ ස්ථානය බැබිලෝනියානු විප්‍රවාසය සිදුවූ කාලය තරම් ඈතට දිව යන බව කල්පනා කළහැකිය.

බැබිලෝනියාව සමඟ පැවති එම සම්බන්ධතාවය මෙහිදී අවතක්සේරුවට භාජන කළ යුතු නැත. බයිබලයේ දැක්වෙන යෙසායාගේ (Isaiah) පොතේ යුදෙව් ජාතිකයින් බැබිලෝනියාවේ විප්‍රවාසව සිටි යුගයේදී ලියන ලද පරිච්ඡේද 40-55 සහ ඉන් අනතුරුව ලියන ලද පරිච්ඡේද 56-66 කුම්රාන් වැසියන්ට විශේෂයෙන් වැදගත් වේ. විමුක්තියේ නව යුගයක් උදාවීම, යුද්ධයේ භූමිකාව මහත් ඉහලින් වර්ණනා කිරීම ඊට ඇතුළත් වේ. (යෙසායා 40:3). බෞතීස්ම කිරීම සඳහා විශේෂයෙන් සකස් කරන ලද ජල රැස් කර තැබීමේ භාජන (Cisterns) භාවිතා කරමින් කුම්රාන් හිදී බෞතීස්ම ස්නාපනය සිදුකිරීම, කුම්රාන් වාසීන් පදිංචිව සිටි ස්ථානයට සමීපව ස්නාවක ජොහන් (John the Baptist) බෞතීස්ම කිරීමේ යෙදී සිටීම කුම්රාන් වැසියන් මෙසපොටේමියාවෙන් රැගෙන ආ සිරිත් විරිත් ආරක්ෂාකරගත් බව පැවසෙන උපකල්පනය තවදුරටත් තහවුරු කිරීමට හේතුවේ. දෙගම්මැදි රටේ (යුප්‍රෙටීස් - ටයිග්‍රීස් ගංගා දෙක අතර පිහිටි රට) ස්නාවක ජන කොටස් බොහෝ කාලයක් තිස්සේ ජීවත්වූහ. මෙම ආගමික සමාජයේ සාමාජිකයින් යුප්‍රෙටීස් ගංගාවේ ගලායන වතුරෙන් බෞතීස්ම ස්නාපනය කරනු ලැබූ බව ක්‍රි. ව. අන්වන යන වර්ෂයේදී හිපෝලයිටස් (Hippolytus) විසින් වාර්තා කර තිබේ.

ස්නාපක ජොහන් 'නසරීනුවකු' (Nazorean) ලෙස හඳුන්වා තිබෙන්නේද බැබිලෝනියානු වචනයක් අනුව බව පෙනී යයි. පුරාණ බැබිලෝනියාවේ නසාරු (Nasaru) හෙවත් නසිරු (Nasiru) යන වචනයේ අදහස "දිව්‍යමය රහස් ආරක්ෂා කරන්නා" බව ඇසිරියානු භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ විශේෂඥයකු වූ (Assyrologist) හෙන්රිච් සිමර්න් (Heinrich Zimmern) විසින් පෙන්වා දී තිබේ. විප්‍රවාසයෙන් පසු පෙරලා පලස්තීනයට පැමිණීමේදී ඔවුන් මෙම බැබිලෝනියානු වචනයද රැගෙන එන්නට ඇතිබව පෙනීයයි.

යුදෙව් ජාතිකයින් බැබිලෝනියාවට වෛර කළ බව මෙහිදී අමුතුවෙන් කිවයුතු නැත. ඔවුන් විසින් තෝරාගත් පූජා විධි කීපයක් පමණක් බැබිලෝනියාවේ සිට සිය රටට ගෙනෙනු ලැබුවේ ඒ හේතුව නිසාය. විප්‍රවාසයෙන් පසු කුම්රාන් ආගමික සංවිධානයේ පුරෝගාමීන් තමන් නිදහස් කර ගත් පර්සියානු ජාතිකයින් ඇදහූ ශරතුස්ත්‍ර ආගමේ බොහෝ අංග ජුදා දේශයට රැගෙන ආවේය.[41] බැබිලෝනියානු විප්‍රවාස සමයේදී සමහර විට බැක්ට්‍රියාවේදී ශරතුස්ත්‍ර විසින් ඔවුන්ට විශ්වයේ පවතින ආලෝකය සහ අඳුර පිළිබඳ ද්විත්වය පැහැදිලි කරන දර්ශනයක් ඉගැන්විය. එම දර්ශනය අහුර මැස්ඩා (Ahura Mazda) ඕර්මස්ඩ් (Ohrmazd) නමින් හැඳින්වෙන ආලෝකයේ දෙවියන් (God of Light), සහ අන්ග්‍ර මෙයිනු (Angra Mainyu) හෙවත් ආහ්රිමන් (Ahriman) නමින් හැඳින්වෙන අඳුරේ දෙවියන් අතර පවතින සටනක් ලෙස ඉදිරිපත් කර තිබේ. කල්යාමේදී කුම්රාන් ලියවිලි වල දක්නට ලැබෙන සාමාන්‍ය නියමයන් බවට පත් වී ඇති මෙම ද්විත්වය පර්සියානු ඉගැන්වීම වලින් ප්‍රභවය වී තිබෙන බව නිසැකය.[42] කුම්රන් ආගමික නිකායේ ඇතුළත් වැදගත් විනය නීතිවල (Community rules), විශේෂයෙන්ම ඉරාන සහ ශරතුස්ත්‍ර ඉගැන්වීම වල බලපෑම දක්නට ලැබේ.

කුම්රාන් ලියවිලි මතුපිටින් කියවා බැලීමේදී ඒවා යුදෙව් ලියවිලි බව එක්වරටම හැඟේ. බැලූ බැල්මට ඒවායේ විදේශ බලපෑමක් නොමැතිබව පෙනේ. යුදෙව් මූලධර්මවාදී අදහස් (Jewish Fundamentalism), ආගමික නීතිය සහ දිවැසිවරුන් පිළිබඳ තොරතුරු එම ලේඛනවල මූලික වශයෙන් ඇතුළත් වී තිබේ. මෝසස්ගේ නීතිය කුම්රාන් සාමාජිකයින්ගේ සිතුවිලි සහ ක්‍රියාකාරකම් වල පදනම විය. ඔවුනු නිරතුරුවම එක් රැස්වී ශුද්ධ ග්‍රන්ථ වල සඳහන් තොරතුරු ගුරුවරයකුගේ අධීක්ෂණය යටතේ ශබ්ද නගා කියවූහ. එසේ කියවූ කොටස්වල අඩංගු කරුණු පිළිබඳව ගැඹුරින් සලකා බැලූහ. කාලීන අවශ්‍යතාවලට අනුකූලව එම කරුණු අර්ථ නිරූපණය කළහ. එම නීතිවල පිහිට පතන සෑම කෙනෙක්ම දිනපතා පැවැත්වෙන මෙම රැස්වීම වලට

නොපැමිණීමෙන් වැළකී සිටිය යුතු බව කුම්රාන් ආගමික සමාජයේ නීති රීති වල ඇතුළත්වේ. කුම්රාන් සමාජය තුළ යුදෙව් සමාජයට අයත් මෙවැනි ලක්ෂණ පැවතුනත් කුම්රාන් වැසියන් ඔවුන් අයත්වූ ආගමික කණ්ඩායම වෙනත් ආගමික කණ්ඩායම් වලට වඩා උසස් යන හැඟීමකින් යුතුව කටයුතු කළ අතර තමන් මෝසස් දේශනාකළ ධර්මයේ නිත්‍යානුකූල හිමිකරුවන් බවත්, දෙවියන් වහන්සේ හා පවත්වා ගනු ලබන නව සංධානය (New Covenant) සඳහා තෝරාගත් පිරිසක් බවත් ඔවුහු ප්‍රකාශ කළහ. මෙම නව සංධානයට ඇතුල්වීම සඳහා යුදෙව් ජාතිකයකු වශයෙන් උපත ලැබීම පමණක් ප්‍රමාණවත් නොවේ. සැබෑ ඊශ්‍රායල් දේශයක් ගොඩනැංවීම සඳහා සාමාජිකයින් විසින් පෞද්ගලිකව උත්සාහ කිරීම පමණක් නොසෑහේ. ඒ සඳහා ඔවුන්ට පරිපූර්ණවූ ආරම්භක ශක්තියක්ද තිබිය යුතුවිය.

ඔවුන්ගේ ශුද්ධ ග්‍රන්ථ මතුපිටින් කියවා බැලීමේදී ඔවුන් සාමාන්‍ය යුදෙව් ආගමික නිකායක් ලෙස පෙනී ගියත්, ඒ පිළිබඳව විචාරාක්ෂියෙන් යුක්තව සලකා බැලීමේදී කුම්රාන් ආගමික සමාජය පුනර්ජීවනවාදී ව්‍යාපාරයක් (Revivalist Movement) බවත්, එහි වර්ධනය සාම්ප්‍රදායික යුදෙව් ආගම තුළින් අවබෝධකර ගැනීමට නොහැකිබවත් පැහැදිලි වේ. කුම්රාන් ආගමික සංවිධානය මගින් සිදුකර ඇති ප්‍රතිසංස්කරණ සංඛ්‍යාව සහ එකී ප්‍රතිසංස්කරණ කෙතරම් අසාමාන්‍ය ආකාරයෙන් කර තිබේදයත් එමගින් සාම්ප්‍රදායික යුදෙව් ආගම තුළ විශාල වෙනසක් ඇතිකර තිබෙන බව පෙනීයයි. මෙසේ, කුම්රාන් සමාජය ඇතිවූ සැටි යුදෙව් ආගමික සම්ප්‍රදාය මගින් පැහැදිලි කළ නොහැකිනම් එය කළ හැක්කේ කුමන පදනමක් මතද?

සොර්බෝන් විශ්ව විද්‍යාලයේ සෙමිටික් භාෂා සහ සංස්කෘතිය පිළිබඳ මහාචාර්යවරයාවූ අන්ද්‍රේ ඩුපොන්ට්-සොමර් (Andre Dupont-Sommer) බෞද්ධ පුරාණය (Buddhist Antiquity) පිළිබඳ විශේෂඥයකු මෙන්ම කුම්රාන් ලියවිලි පිළිබඳ ප්‍රමුඛ පෙළේ පර්යේෂකයෙකුද විය. මෙම සම්ප්‍රදායන් දෙක පිළිබඳ ඔහු තුළ පැවති විශේෂඥතා ඥානය සහ බෞද්ධ සහ කුම්රාන් ආගමික නිකායිකයින් සංසන්දනය කිරීමේදී ඔහු විසින් පෙන්නුම් කර ඇති කුශලතාවය අන් කිසිවෙකුට සමකළ නොහැකි තරම් වේ. කුම්රාන් ආගමික සමාජය නිසැකවම බුදු දහමේ ආභාෂය ලබා තිබෙන බව ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමෙන් පසු ඔහු නිගමනය කළේය.[43] කුම්රාන් ආගමික කණ්ඩායම හැඳින්වීම සඳහා යොදාගන්නා ලද 'ජාචඩ්' (Jachad) වචනයත් කුම්රාන් ලියවිලි පුරා විසිරී පවතින 'ද ටෙස්ටමන්ට් ඔෆ් ද ටුවෙල් පැට්‍රියාක්ස්' (The Testament of the Twelve Patriarchs) නමින් හැඳින්වෙන ලියවිල්ලේ

ඇතුළත් බෞද්ධ අදහස්වල ඉඟියක් ඔහුගේ එම නිගමනයට අවශ්‍ය පදනම සැපයුවේය. කුම්රාන් ලියවිලි පුරා නූයක් මෙන් අඛණ්ඩව විහිදී යන වෛරය හදවතින් ඉවත්කර සියල්ලන්ටම ප්‍රේමකරන ලෙස කර ඇති ආයාචනය සියලු සත්වයින්ට මෛත්‍රීකළ යුතුය යන බෞද්ධ ඉගැන්වීම වලින් පැහැදිලි ලෙස ආභාෂය ලබා ඇති අදහසක් ලෙස ඔහු දකී.[44] (Testament of Gad 6-7). සතුන්ට මෙන්ම මිනිසුන්ද ඇතුළත් පණ ඇති සියලු සත්වයින්ට මෛත්‍රී කිරීම සහ දෙවියන් වහන්සේ උන්වහන්සේට සිට්ටුවෙන් සිටින අයට සලකන පරිදි හැම දෙනාටම එකසේ සලකන බව පැවසෙන අදහස, අශෝක රජතුමා විසින් ධර්මප්‍රචාරය සඳහා යොදවනු ලැබූ භික්ෂූන්ගේ අදහස්ද මෙහිදී විශේෂයෙන් කැපී පෙනේ. (Testament of Sebulon V : 1-3). කුම්රාන් වැසියන් යනු අප්‍රකටව ජීවත්වූ බෞද්ධයින් බව ඩූපොන්ට්-සොමර් වැනි සුප්‍රසිද්ධ විද්වතෙකු විසින් නිගමනය කිරීම අපේ පරීක්ෂණවලට විශාල ශක්තියක් වේ. එපමණක් නොව ඩූපොන්ට්-සොමර් යනු කුම්රාන් වැසියන් සහ බෞද්ධ ආභාෂයක් පැහැදිලිවම තිබූ එසීන් සාමාජිකයින් යනු එකම ආගමික කණ්ඩායමකට අයත් පුද්ගලයන් බව ස්ථිර ලෙස ප්‍රකාශ කර ඇති විද්වතුන්ගෙන් කෙනෙකි.[45] එනිසා මෙම කණ්ඩායම් දෙක (කුම්රාන් සහ එසීන්) එක්වරටම එක් කණ්ඩායමක් ලෙස සැලකීම පසෙක තබා එම අදහස පිළිබඳ මුලින් සලකා බලමු.

ප්ලිනි නමැති රෝම ඉතිහාසඥයාගේ වාර්තාවලට අනුව කුම්රාන් ජනසමාජය සහ එසීන්වරු එකම කණ්ඩායමක් ලෙස සැලකිය නොහැකිය. ප්ලිනි විසින් ලියන ලද පොත පළකරන ලද්දේ ක්‍රි. ව. 77 දීය. එහි ජෙරුසලම, එන්ගෙඩි (En Gedi) සහ ජෙරිකෝ (Jericho) යන නගරවල විනාශය පිළිබඳ වාර්තාකර තිබෙන නිසා එය ලියා තිබෙන්නේ පලස්තීන යුද්ධය පැවති සමයේදී බව පෙනේ. එහි සඳහන් කර ඇති එසීන් වරුන්ගේ ජනාවාස යුද්ධ කාලයට පසුව බිහිවූ ජනාවාස විය යුතුය. එම ස්ථානය කුම්රාන් අඩවිය විය නොහැක. මන්ද රෝමන්වරු ක්‍රි. ව. 68-69 කාලයේදී 'කුම්රාන්' හි පදිංචිකරුවන් පලවා හරින ලද හෙයිනි. පුරාවිද්‍යාත්මක කැනීම් වලට අනුව ඒ කාලයේ සිට ක්‍රි. ව. 74 දක්වා කාලය තුළ 'කුම්රාන්' අඩවියේ පදිංචිව සිටියේ යුදෙව් ජාතිකයින් නොව රෝම යුද භටයින් බව පෙනී යයි.[46]

ප්ලිනි විසින් ලතින් භාෂාවෙන් දක්වා ඇති මෙම ස්ථාන නාමය නිවැරදි ලෙස තේරුම් කරගැනීම මෙහිදී තීරණාත්මක සාධකයක් වේ. කලින් ඉතා උසස් දියුණු තත්වයක පැවති එන්ගෙඩි නගරය ඔහු විසින් පොත ලියන ලද කාලයේදී නටබුන් වී පැවති බවත්

එය පිහිටා තිබුණේ එසීන්වරු පදිංචිව සිටි ප්‍රදේශයට පහළින් බවත් සඳහන් කර තිබේ. ඒ අනුව එන්ගෙඩි නමින් හැඳින්වූ නගරය එසීන්වරු පදිංචිව සිටි ප්‍රදේශයට දකුණින් පිහිටා තිබූ බවත් ඒ හේතුවෙන් කුම්රාන් සහ එසීන් ජනාවාස පිහිටා තිබුණේ එකම ප්‍රදේශයක බවත් බොහෝ දෙනෙක් උපකල්පනය කර තිබේ. නමුත් ඇත්ත වශයෙන්ම වර්බට් කුම්රාන්[47] (Chirbet Qumran) යනුවෙන් හැඳින්වූ මෙම ස්ථානය පිහිටා තිබුණේ එන් ගෙඩි නගරයට සැතපුම් 20 ක් පමණ උතුරින් සහ ජෙරුසලමට සැතපුම් 12 ක් පමණ නැගෙනහිරිනි.[47] මෙහිදී වඩා සිට්ටුවෙන් පිහිටි එමෙන්ම සුප්‍රසිද්ධ නගරයක්වූ ජෙරුසලම පිළිබඳව සඳහන් නොකර ඊට වඩා දුරින් පිහිටි එතරම් ප්‍රසිද්ධියක් නොඉසිලූ එන් ගෙඩි නගරය පිළිබඳව ප්ලිනි සඳහන් කර තිබෙන්නේ කුමක් නිසාද? සමහර විට ඔහු ඒ පිළිබඳ සඳහන් කරන්නට ඇත්තේ විශේෂ හේතුවක් නිසා වන්නට පුළුවන. එවිට ඔහුගේ එම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයකට අර්ථ නිරූපණය කළ හැකිවේ. ඒ අනුව එසීන්වරු එන් ගෙඩි නගරයට ඉහළින් පිහිටි කඳුකර ප්‍රදේශයක ජීවත්වන්නට ඇතැයි සිතීමට පුළුවන. එම මතය පිළිගත හොත් ප්ලිනි විසින් මෙම වාර්තාව සටහන් කිරීමට දශකයකට වඩා වැඩි කාලයක සිට කුම්රාන් අඩවිය රෝමන්වරු අතට පත්ව තිබීම නිසා මුහුණ පෑ යුතු ගැටලු සහගත තත්වය මගහරවා ගැනීමටද හැකිවේ.

සුසාන භූමියක සිදුකරන ලද පුරාවිද්‍යාත්මක කැනීම් මගින් සොයාගත් තොරතුරු වලට අනුව කුම්රාන් වැසියන් සහ එසීන්වරු යනු එකම කණ්ඩායමක් ලෙස සැලකීම දුෂ්කරය. කැනීම් කරනු ලැබූ සොහොන් 43 කින් 7 ක තිබී කාන්තාවන්ගේ ඇට සැකිලිත්, තවත් සොහොන් 4 ක තිබී ළමයින්ගේ ඇටකටුත් හමුවිය. එසීන්වරුන්ට මෙන් නොව කුම්රාන් වැසියන්ට විවාහවීමට අවසර තිබුණු බව පෙනේ. බඹසර රැකීම පිළිබඳ කිසිම කුම්රාන් ලියවිල්ලක සඳහන් නොවේ.

කෙසේ වෙතත්, මෙහිදී විවාහය පිළිබඳ එතරම් දීර්ඝ ලෙස සාකච්ඡා කළ යුතු නැත. මන්ද ඒ පිළිබඳව එසීන්වරු දැරූ අදහස් පිළිබඳව ෆ්ලේවියස් ජොසෆස් නිසැකවම දැන නොසිටි හෙයිනි. එපමණක් නොව එසීන්වරු විවාහ ජීවිතයට ඇතුළත්වන බවත්, එහෙත් වර්ෂ තුනක් ගතවනතුරු ඔවුන් තම භාර්යාවන් සමග වාසය නොකරන බවත්, සඳහන් කරමින් ඩයනීසියස් බෙන් සැලිබි (Dionysios Ben Salibi) විසින් කර ඇති ප්‍රකාශය කෙරෙහි විද්වතුන් එතරම් සැලකිල්ලක් දක්වා නොමැත. තවදුරටත් බෙන් සැලිබි විසින් සඳහන් කර ඇති අන්දමට කාන්තාවන් ගැබ් ගැනීමෙන් පසු නැවත වර්ෂ තුනක කාලයක් ඔවුන් තම ස්වාමිපුරුෂයින්ගෙන් වෙන්ව ජීවත්විය යුතුවේ. මෙසේ ලිංගික

සම්බන්ධතා සඳහා අවසර දෙන ලද්දේ දරුවන් බෝ කිරීම සඳහා පමණක් බව පෙනේ.[41]

තෙරපියුටා සාමාජිකයින් සහ එසීන්වරු මෙන් කුම්රාන් වැසියන් සූර්ය වන්දනා කිරීමේ ස්තෝත්‍ර ගායනා කළබව සඳහන් විස්තර වාර්තා නොමැති වීම තවත් කැපී පෙනෙන වෙනස්කමකි. එසීන්වරු මොනයම් ආකාරයක හෝ වානිජ කටයුතු වල නොයෙදුනහ. ඔවුන්ගේ ජීවිතයේ එකම අරමුණ වූයේ ආධ්‍යාත්මික දියුණුව සලසා ගැනීමය. නමුත් කුම්රාන් වැසියෝ ඊට වඩා ප්‍රායෝගික පුද්ගලයින් වූහ. විප්‍රවාසව සිටි යුදෙව් ජාතිකයින් සමඟ පවා වෙළඳ කටයුතු කිරීමට ඔවුන්ට අවසර තිබුණු බවත් එම අවසරය ලැබුණේ ඒ සඳහා මුදලින් ගෙවීම් කරනු ලබන්නේනම් පමණක් බවත් ඩැමැස්කස් ලේඛනවල සඳහන්වේ. (CD-Dam, XIII 14:15). එසීන්වරු බිලිපූජා පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම හෙළා දුටහ. නමුත් කුම්රාන් වැසියන් විරුද්ධ වූයේ බිලිපූජා පැවැත්වූ ආකාරය සම්බන්ධයෙන් පමණි. එසීන්වරුන්ට දිවුරීම තහනම් විය. නමුත් කුම්රාන් වැසියන්ට විශේෂ අවස්ථාවලදී දිවුරීමට අවසර දී තිබුණි. එසීන්වරු මෙන් නොව කුම්රාන් වැසියෝ පැහැදිලිවම ගැලවුම් කාරයකුගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටියහ.

තවත් කැපී පෙනෙන වෙනසක් නම් මතභේදයක් ඇතිවූ අවස්ථාවකදී අවි ආයුධ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඔවුන් දැරූ ආකල්පයයි. එසීන්වරු නියත වශයෙන්ම සාමය ප්‍රියකළ කණ්ඩායමක් වූහ. ඔවුන් ආයුධ පාවිච්චි කරන ලද්දේ ස්වයං ආරක්ෂාව සඳහා පමණි. එහෙත් කුම්රාන් වැසියෝ එසේ නොවූහ. දැඩි පක්ෂග්‍රාහී පුද්ගලයින්වූ ඔවුන් සැම කෙනෙක්ම වාගේ අමනාපකර ගත්හ.

මීට කලින් සඳහන් කළ පරිදි ඉරාන ආභාෂය හේතුවෙන් කුම්රාන් ලියවිලිවල දක්නට ලැබෙන කැපී පෙනෙන ද්විත්වය මෙහිදී අපට අමතක කළ නොහැකිය. ආලෝකයේ දරුවන් අඳුරේ දරුවන්ට එරෙහිවත්, අසත්‍යයට එරෙහිව සත්‍යයත්, පාරිශුද්ධත්වයට එරෙහිව අවිවාහක ස්ත්‍රී පුරුෂයින් මෛථුනයේ යෙදීමත් වශයෙන් මෙම ද්විත්වය දක්නට ලැබේ. මෙහිදී අඳුරේ දරුවන් (Sons of Darkness) හැඳින්වීම සඳහා 'කිට්ටිම්' (Kittim) නමැති වචනය යොදා තිබේ. කුම්රාන් ආගමික නිකාය පිහිටුවන ලද්දේ අඳුරේ දරුවන් සදාකාලිකව පලවා හැරීමට බව එහි විනය නීති වල පැහැදිලිව සඳහන් කර තිබේ. ආලෝකය සහ අඳුර අතර සිදුවන අවසාන සටන බැතිමතුන් සහ මිථ්‍යාදෘෂ්ටිකයින් අතර සිදුවන ශුද්ධවූ යුද්ධයක් (Holy War) ලෙස යුද්ධය පිළිබඳ ලියවිල්ලේ (War Scroll) සඳහන් කර තිබේ. පෘථිවියේ වාසය කරන ධාර්මික හමුදාව (Righteous

Earthly Warriors) ස්වර්ගයේ වෙසෙන බලවේග සමඟ එකතුව බිලියල් (Belial) සහ ඔහුගේ කුරිරු හමුදාවේ සහයෝගය ලැබෙන අඳුර නැමති සතුරන් සමඟ සටන් කරනු ලැබේ.

ආලෝකයේ දරුවන් විප්‍රවාසයෙන් මිදී ආපසු පැමිණ ජෙරුසලම අබියස පාළු කරයෙහි කූඩාරම් ගසා කඳවුරු බැඳගත් පසු අවසාන මහා සටන ඇරඹෙනු ඇත. (1 QM 1:3). එම සටනින් පසු රජකුගේ පාලනයක් බිහිවෙනු ඇත. (1 QM VI : 6)

යුද්ධය පිළිබඳ ලියවිල්ල මධ්‍යස්ථ වාර්තාවකි. එහි විස්තර කර ඇති අපූර්ව සිදුවීම් සලකා බැලීමේදී එය බොහෝ දුරට යම් යම් කරුණු ඉගැන්වීම සඳහා යොදාගන්නා ලද ලියවිල්ලක් සේ පෙනේ. මෙම ලියවිල්ලට අයත් අත් පිටපත් වල කොටස් හතරක් කුම්රාන් ලෙන් තුළ තිබී සොයා ගැනීම නිසා ඒ බව පැහැදිලි වේ. එම ලියවිල්ල කුම්රාන් වැසියන්ගේ විශේෂ සම්මානයට පාත්‍රවූ බව පෙනේ. එහි ඉදිරිපත් කර ඇති අදහස් සහ වෙනත් කරුණු බොහෝ දුරට සෙලට් (Zealots) වරුන්ට අයත් ලියවිලිවලට සමාන වේ. එයද කුම්රාන් වැසියන් එසීන් වරුන්ට වඩා වෙනස් ආගමික කණ්ඩායමක් බව පෙන්නුම් කරන සාධකයකි. මෙම තොරතුරු ෆිලෝ සහ ජොසෆස් විසින් වාර්තා කර ඇති තොරතුරුවලට[5] වඩා වෙනස් බව පෙනී යනු ඇත.

කුම්රාන් වැසියන් පිළිබඳ කරුණු සොයා බැලීමේදී මෙම ලේඛනය ලියා ඇති කාලයද තීරණාත්මක සාධකයක් වේ. මෙය ඉතාමත් පැරණි ලේඛනයක් නම් කුම්රාන් වැසියන් කිසිදිනක සාමය ප්‍රියකළ කණ්ඩායමක් නොවූ බවත් ඔවුන් රණකාමී මෙන්ම, මූලධර්මවාදී අදහස් දරූ ආගමික නිකායක් වූ බවත්, උපකල්පනය කිරීමට අපට සිදුවේ. අවසාන සටනේදී ආලෝකයේ දරුවන් විසින් ඉටුකළ යුතු සක්‍රිය භූමිකාව පිළිබඳව සලකා බැලීමේදී යුද්ධය පිළිබඳවූ මෙම ලියවිල්ල සකස් කර තිබෙන්නේ කුම්රාන් ආගමික නිකාය පිහිටුවීමට පූර්වයෙන් බවත් එය මකාබියානු යුගයේ මුල් කාලපරිච්ඡේදය තරම් ඈතට දිවෙන බවත් සමහරු උපකල්පනය කරති. එම උපකල්පනය නිවැරදි යැයි පිළිගතහොත් 'කිට්ටිම්' යනුවෙන් හඳුන්වා ඇති 'අඳුරේ දරුවන්'ට සමාන කර තිබෙන්නේ සෙලූසිඩ් පාලනය යටතේ හෙලනිසියානු බලපෑමට යටත්වූ (Seleucid Hellenists) මිනිසුන්ය. නමුත් එය එසේ විය නොහැකිය. යුද්ධය පිළිබඳ ලියවිල්ලේ ඇතුළත් කර ඇති සවිස්තර යුද්ධමය උපදෙස් රෝමන්වරුන්ට අයත් යුද්ධය පිළිබඳ විස්තර තොරතුරු ඇතුළත් අත් පොතකින් (War Manual) ලබාගෙන තිබෙන බව පෙනේ. ඒ අනුව එය ලියා තිබෙන්නේ ක්‍රි. ව. පළමුවන ශත වර්ෂයේදී විය යුතුය. එනිසා මෙහිදී කිට්ටිම් හෙවත්

අඳුරේ දරුවන් ලෙස හඳුන්වා තිබෙන්නේ රෝමන්වරු බව පැහැදිලි වේ.

මෙයින් අදහස් වන්නේ කුමක්ද? කුම්රාන් සමාජය යනු සාමකාමී එසීන් සමාජයෙන් කැඩී ආ කිසියම් රණකාමී* නැඹුරුවක් තිබූ සාමාජිකයින්ගෙන් ආරම්භ වූ ආගමික සංවිධානයක්ද? එම ප්‍රශ්නයට පිළිතුරු සොයා ගැනීම සඳහා කුම්රාන් අඩවියෙන් ලැබී ඇති වෙනත් ලියවිලි වල ස්වභාවය සහ ඒවා ලියනලද කාලය පිළිබඳ කරුණු ස්වල්පයක් සලකා බලමු.

1990 වර්ෂයේ ග්‍රීෂ්ම සෘතුවේදී කුම්රාන් ලියවිලි වල අත්පිටපත් වලින් තෝරාගත් නියැදි 14 ක් නූතන බී. එම්. එස්. (BMS) ක්‍රමවේදය උපයෝගීකර ගනිමින් රේඩියෝ කාබන් කාල නිර්ණය කිරීමේ පරීක්ෂණයට (Radio Carbon Dating Test) භාජනය කරන ලදී. එම පරීක්ෂණය සිදුකරන ලද්දේ සූරිච් තාක්ෂණික විශ්ව විද්‍යාලය (Zurich Technical University) මගිනි.[49] එම පරීක්ෂණයට අනුව පැරණිතම නියැදිය ක්‍රි. පූ. 405-354 කාලපරිච්ඡේදයට අයත් බව තීරණය කරන ලදී. නියැදි කීපයක් ක්‍රි. පූ. 306-238 කාලපරිච්ඡේදයටත්, වඩා මෑතකදී ලියන ලද ලියවිලි ඇතුළත් නියැදිය ක්‍රි. ව. 675-765 කාලයටත් අයත් බව තීරණය කරන ලදී.[50]

එය එක්තරා ආකාරයක අසාමාන්‍යවූත්, පැටලිලි සහගතවූත් තත්වයක් උද්ගත කිරීමට හේතුවූ ප්‍රතිඵලයක් විය. ඊට හේතුව වූයේ යුදෙව් යුද්ධයෙන් කුම්රාන් නගරය විනාශ වීමෙන් පසු කිසි දිනක එම ස්ථානයේ මිනිසුන් පදිංචි වී නොසිටීමය. ජනාවාසයකින් තොරවූ එම ස්ථානයේ අවුරුදු 700 කට පසු ලියවිලි වල අත්පිටපත් ආරක්ෂාව සඳහා තැබීම පිණිස උනන්දු වූයේ කවරෙක්ද? යම් කිසිවෙක් එසේ අත් පිටපත් එහි තබන ලද්දේ නම් එම පුද්ගලයා විසින් එම ස්ථානයේ වෙනත් පුද්ගලයින් විසින්ද අත්පිටපත් තබා ඇති බව දැනසිටියේ යැයි උපකල්පනය කිරීමට අපට සිදුවේ. එසේ නැතිනම් ඔහුගේ එම ක්‍රියාව නිරර්ථක උත්සාහයක් වන්නට පුළුවන. එහෙත් ඒ කාලයේදී ඉතා වැදගත් කමක් තිබූ ලියවිලිවල අත්පිටපත් ඒවායේ ආරක්ෂාව සඳහා එහි තබන්නට ඇතැයි කල්පනා කළොත්, ඒවා සුරක්ෂිත ස්ථානයක තැන්පත් කර නැත්තේ ඇයිද යන ප්‍රශ්නය කෙනෙකුට නැගිය හැකිවේ.

යුදෙව් පාළුකරයේ පිහිටි ලෙන්තුළ ලියකියවිලි සඟවා තැබීම එකල සාමාන්‍ය ව්‍යවහාරයක්ව පැවතුනි. එය කුම්රාන් අඩවියට පමණක් සීමාවූ දෙයක් නොවිය. ක්‍රි. ව. දෙවන ශතවර්ෂයේදී සම්ලියවිලි වල අත්පිටපත් ජෙරිකෝ (Jericho) නුවරට ආසන්නයේ පිහිටි ලෙනක් තුළ තිබී හමුවූ බව ඔරිගන් (Origen) වාර්තා කර තිබේ. ජෙරිකෝ නුවරට ආසන්නව පිහිටා තිබූ ගල් විවරයක සඟවා තිබූ ලියවිලි රාශියක් අරාබි

දඩයක්කාරයකුට හමුවූ බව ක්‍රි. ව. 800 දී පමණ ජීවත්වූ පළමුවැනි තිමෝතියස් නැමති බැග්ඩෑඩ් නුවර විසූ ආච්බිෂෝප්වරයා සඳහන් කර තිබේ. ඒවා බයිබලයට සම්බන්ධ පොත් පත් බවත්, ඩේවිඩ්ගේ ගීතාවලියේ (Psalms of David) කොටස් 200 ක් ඒ අතර තිබෙන බවත් දුටු යුදෙව්වෝ මවිතයට පත්වූහ. ආගමික ලේඛන සොයාගෙන තිබෙන්නේ වාඩි කුම්රාන් (Wadi Qumran) යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශයෙන් පමණක් නොවේ. යුදෙව් කාන්තාරයේ නැගෙනහිර ප්‍රදේශයේ ශීඝ්‍ර කඳු බෑවුමක පිහිටා ඇති මුරබ්බාත් (Murabba'at), නහල් හීවර් (Nahal Hever), නහල් මිස්මාර් (Nahal Mismar) චර්බට් මර්ඩ් (Chirbet Mird) සහ සෙලට් (Zealot) වරුන්ට අයත් බලකොටුවක්ව පැවති මසාඩා (Masada) වැනි වාඩි කීපයක තිබී පැරණි පොත්පත් සොයාගනු ලැබීය. වටිනා ලියකියවිලි සහ භාණ්ඩ සඟවා ඇති ස්ථාන පිළිබඳව තඹ සන්නසක (Copper Scroll) සඳහන් කර තිබේ. එයින් කරුණු රාශියක් අනාවරණය විය. එය රචවූන් එක පෙළට නොමැති ඇඳවූ ලොකු අත් අකුරින් ලියාතිබීම, වැදගත් ඓතිහාසික ස්ථාන වල නම් සඳහන් කර තිබීම, ලේඛනයේ දෙපස තීරුවල ග්‍රීක් භාෂාවෙන් කරුණු සඳහන් කර තිබීම, වැනි කරුණු සලකා බැලීමේදී එය කිසියම් ලේඛනයක පිටපතක් නොව මුල් ලේඛනයක් බව පැහැදිලි වේ.[51] එහි "කෝලට් (Kohlat) නමැති ස්ථානයට උතුරින් පිහිටි උතුරු දිශාවට විවෘතව ඇති, එමෙන්ම සොහොන් බිමකට පහළින් පිහිටි විවරයක අවශ්‍ය සියලු තොරතුරු දිග පළල ආදී විස්තර ඇතුළත් එම භාණ්ඩ සඟවා තබා ඇති එක් එක් ස්ථානය පිළිබඳ සියලු තොරතුරු දැක්වෙන මෙම අත්පිටපතේ පිටපතක් තබා තිබේ" යනුවෙන් සඳහන්කර තිබේ. (තඹ සන්නස XII : 10-13). නිධන් වස්තු පිළිබඳ සවිස්තර තොරතුරු එනම් යුදෙව් පාළුකරයේ බොහෝ ස්ථාන වල සඟවා ඇති විවිධ පොත් පත් සහ ලියකියවිලි පිළිබඳ තොරතුරු පණ්ඩිතමානී නිරවද්‍යතාවයකින් යුක්තව වාර්තාකර තිබේ. ඉමහත් ගෞරවයට පාත්‍ර වූ ආගමික ලියවිලිවල අත් පිටපත් ඇතුළත් වටිනා වස්තු ජෙරුසලමේ සිට මළ මුහුද දක්වා විහිදී ඇති වාඩි ඔස්සේ පමණක් ළඟාවිය හැකි කාන්තාරයේ පිහිටි විවිධ ස්ථානවල සඟවා තිබෙන බව මෙම තඹ සන්නසයේ සඳහන් කර තිබේ.

මේ සියලුම කරුණු වල ඇති වැදගත්කම කුමක්ද? මෙම ලියවිලි කුම්රාන් වැසියන්ට අයත් නොවූ බවත් ඒවා චර්බට් කුම්රාන් වැසියන් හා කිසිම සම්බන්ධතාවක් නොතිබූ බවත් ඉන් හැඟීයන්නේද? මෙම ලියවිලි කුම්රාන් අඩවියේ පිහිටා ඇති ගොඩනැගිලි පරිහරණය කරමින් එහි ජීවත්වූ කිසියම් ආගමික නිකායකට අයත්වූ ලේඛනද කියා දැනගැනීම කුම්රාන් ආගමික නිකාය පිළිබඳව ඇගයීමක් කිරීමේදී ඉතාමත් වැදගත්

බව පුරාවිද්‍යාඥයකු වන රෝලන්ඩ් ඩි වෝ නැමති පියතුමා (Father Roland de Vaux) උපකල්පනය කරයි. පොත්පත් සහ ලිපි ලේඛන තබාතිබූ ස්ථානයේ විශාලත්වය පුදුම එළවන සුලුය. ලෙන් 11 ක තිබී විවිධ අත්පිටපත් 823 කට නොඅඩු සංඛ්‍යාවක්ද ලෙන් 4 ක් තුළ තිබී තවත් ලේඛන 580 ක්ද සොයාගනු ලැබීය. මේ සෑම ලේඛනයකම ඇතුළත් කර තිබෙන්නේ ආගමික කරුණුය.

ඉන් කිසිම ලේඛනයක විද්‍යාත්මක, ඓතිහාසික හෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳ කරුණු ඇතුළත් වී නැත. ලෙන් අංක 7 තුළ දක්නට ඇත්තේ ග්‍රීක් භාෂාවෙන් රචනා කරන ලද ලේඛන පමණි. පෙස්චරිම් (Pescharim) යනුවෙන් හැඳින්වෙන හීබෲ බයිබලයට අයත් ආගමික විස්තර ඇතුළත් ලේඛන මේ අතර දක්නට ලැබේ.[32] ව්‍යාජ ආගමික ලියවිලි (Pseudo- Epigraphica) කුම්රාන් ආගමික නිකායේ සාමාජිකයින් විසින් ලියා පුස්තකාලයට ඇතුළත් කරන ලද ලේඛන සහ කුම්රාන් සමාජයට පමණක් අයත් ලේඛන පවා මෙම අත්පිටපත් අතර දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් කුම්රාන් ආගමික සමාජයට අයත් නීති රීති (Rules of the Community) බයිබලයේ එන මුල් උත්පත්ති කථාව (Genesis-Apocryphon) සහ දේවමාලිගාව පිළිබඳ ලියවිල්ල (Temple Scroll) ඒ අතර තිබෙන බව දැක්විය හැකිය.[33]

මෙම අති විශාල ලේඛන සම්භාරය ලියන ලද්දේ කුම්රාන් අඩවියේ විසූ ශ්‍රමණයින් විසින්ද? එසේ නම් මෙම ජනශූන්‍ය පාළුකරයේ ශුද්ධ ග්‍රන්ථ පිටපත් කිරීමේ කාර්යයෙහි පමණක් යෙදී සිටි අත් පිටපත් කරුවන් සිය ගණනක් සිටින්නට ඇතැයි අපට උපකල්පනය කිරීමට සිදුවේ. කෙසේ වෙතත් එම ලේඛන වල දක්නට ඇති විවිධත්වය සහ විශාල සංඛ්‍යාව සලකා බැලීමේදී ඒවා විවිධ මධ්‍යස්ථාන වලින් ගෙනැවිත් එහි තැන්පත් කර තබන ලද බව පෙනීයයි. සමහර ලේඛන ජෙරුසලමෙන් පවා රැගෙන විත් තිබේ.

එපමණක් නොව තඹ සන්නස හැර කුම්රාන් අඩවියෙන් ලැබී තිබෙන අත් පිටපත් සියල්ලම මුල් ලේඛන නොවේ. ඒ කිසිම ලේඛනයක කතුවරයාගේ අත් අකුරු දක්නට නොලැබේ. ලේඛනවල පිටපත් මිස මුල් ග්‍රන්ථ නොමැති නිසා ඒවා එම ආගමික නිකායට අයත් පොත් පත් ලෙස සැලකිය හැකිද? බාර්-කොච්බා (Bar-Kochba) යුගයට (දෙවන ශත වර්ෂයේ ආරම්භය) අයත් ලිපි සහ ලේඛනවල බොහෝ මුල් පිටපත් යුදෙව් පාළුකරයෙහි පිහිටි වෙනත් ලෙන්තුළ තිබී සොයාගෙන තිබේ. නමුත් නිල ලේඛන කිසිවක් කුම්රාන් අඩවියෙන් සොයාගෙන නොමැත. දැනට සොයාගෙන ඇති ලේඛනවල කතුවරයින්ගේ අත් අකුරු දක්නට

නොලැබීමත් ඒවායේ නිල ලේඛන නොතිබීමත් නිසා මෙම සම් ලේඛන (Scrolls) අයත් වූයේ කුම්රාන් සමාජයටද නැතිනම් ඒවා ජෙරුසලමේ පිහිටි විවිධ පුස්තකාලවලින් රැගෙන විත් ආරක්ෂාව පිණිස කුම්රාන් අඩවියේ තැන්පත් කර තිබූ පොත්පත් වලින් ශේෂවූ කොටස්ද යන කාරණය විද්වතුන්ගේ සැකයට භාජනය වී තිබේ. මෙම ගැටලුව ග්‍රොනින්ජන් හී පිහිටි කුම්රාන් ආයතනය මගින් (the Qumran Institute at Groningen) ග්‍රොනින්ජන් යනුවෙන් හැඳින්වෙන උපන්‍යාසය මගින් (Groningen Hypothesis) පැහැදිලි කිරීමට උත්සාහ කර තිබේ. ඒ අනුව කුම්රාන් ලෙන්වල තිබී සොයාගත් ලේඛන සියල්ලම කුම්රාන් පුස්තකාලයට අයත් බවත් ඒවා එහිදී ලියන ලද ලේඛන නොවන බවත් තීරණය කරනු ලැබීය.

මතභේදයට තුඩුදී ඇති මෙම කරුණු සලකා බැලීමේදී කුම්රාන් ජන සමාජය පිළිබඳ අපට මවාගත හැක්කේ කුමන විධියේ චිත්‍රයක්ද? එකල පලස්තීනයේ විවිධ ආගමික කණ්ඩායම්, සංවිධාන සහ ජන සමාජ විශාල සංඛ්‍යාවක් තිබුනු බවත් එකී සංවිධාන සැදූසිවරු, පරිසිවරු සහ එසීන්වරු අයත්වූ ප්‍රධාන ආගමික සංවිධාන ගණයෙහි ලා නොසැලකූ බවත් අපි දනිමු. වෙනත් ආගමික නිකායන් රාශියක් පැවති බව ඉතිහාසයේ සඳහන් වේ. එපමණක් නොව අපට තොරතුරු ලැබී නොමැති වෙනත් බොහෝ සංවිධාන තිබූ බවත් පැහැදිලිය. ඒවා පිළිබඳ තොරතුරු කිසිදිනක අපට ලබා ගැනීමට නොහැකි වන්නටද පුළුවන. තවදුරටත් අප ජීවත්වන සහස්‍රකයේ මුල් ශතවර්ෂවලදී කුම්රාන් වැසියන් අවුරුදු 200 පමණ කාලයක් ස්වාධීන කණ්ඩායමක් වශයෙන් ජීවත්වූහ. ඒ කාලය තුළදී ඔවුන් මුල් එසීන් කණ්ඩායමට අයත්ව සිටි කාලයේදී දරනලද අදහස්වල වෙනස්කම් සිදුවන්නට ඇත.

දැනට හමුවී ඇති ලේඛනවල ඒවා මුල්වරට ලියනු ලැබූ කතුවරයින්ගේ අත් අකුරු දක්නට නොලැබීම නිසා කුම්රාන් නිකායට අයත් සාමාජිකයින්ට ඊට කලින් පැවති ගුරුකුල වලට අයත් පොත්පත් වලින් කරුණු සපයාගැනීමට සිදුවූ බව පෙනේ. එම ලියවිලිවල යුදෙව් ආගමික චින්තනය ඇතුළත් වී තිබේ. එනිසා එම ලියවිලි කුම්රාන් සමාජයට අයත්වූ ඒවා බව කිව නොහැකිය. සමහරවිට ඒවා විවිධ කාලවලදී පිටතින් ගෙනවිත් කුම්රාන් ලෙන් තුළ ආරක්ෂාව පිණිස තබන්නට ඇතිබව සිතිය හැකිය.

එම ලියවිලිවල දක්නට ලැබෙන විවිධත්වය නිසා එහි සංකලනය වූ මිශ්‍ර ජනසමාජයක් පැවති බව පෙනේ. බෞද්ධ අදහස්ද ඇතුළත් එසීන් ජන සමාජයට ආවේනිකවූ ලක්ෂණ මෙම ලේඛනවල දක්නට

ලැබේ. කුම්රාන් ජනසමාජය ඊට කලින් පැවති එසීන් ආගමික කණ්ඩායමේ චින්තනය මත පදනම් වී බිහිවී ඇතිබව ඉන් හැඟේ. තම ආගමික නිකාය ඊට කලින් පැවති විශාල ආගමික කණ්ඩායමකින් බිඳී වීත් ගොඩ නැඟුණු සංවිධානයක් බව කුම්රාන් ලේඛනවල පැහැදිලිවම සඳහන් කර තිබේ. කුම්රාන් වැසියන් යනු එසීන් ආගමික නිකායෙන් වෙන්වී එසීන්වරු නැඹුරුව සිටි දිශාවටම යොමුවූ ආගමික කණ්ඩායමක් බව ග්‍රොනින්ජන් විශ්ව විද්‍යාලයේ කුම්රාන් ලේඛන පිළිබඳ පර්යේෂණ පවත්වනු ලබන ආයතනයේ අධ්‍යක්ෂ වරයාවූ ෆ්ලොරන්ටිනෝ ගාර්සියා-මාර්ටිනෙස් කල්පනා කරයි.[34] බයිබලයේ දක්වෙන හබකුක්ගේ පොතට ලියා ඇති ටීකාවට (Commentary on Habakkuk-IQp Hab) අනුව කුම්රාන් ආගමික නිකායේ මුල් ආරම්භය ඇතිවූයේ ජොනතන් සහ සිමොන් විසින් ප්‍රධාන පූජක පදවිය දැරූ කාලපරිච්ඡේදය තුළදීය. එසීන් වරුන්ගෙන් කොටසක් ජෝන් හයිර්කානුස් (ක්‍රි. පූ. 142-104) යටතේ මුල් ආගමික සමාජයෙන් කැඩී වෙන්වී ධර්මිෂ්ඨතම පිළිබඳව ඉගැන්වූ අප්‍රකට ගුරුවරයකුගේ අනුගාමිකයින් බවට පත්වූ බව පෙනේ. තමන් විසින් පව්කර ඇති බව තේරුම්ගත් මිනිසුන් අන්ධයින් මෙන් විසි වසරක් මංමුලාවී සිටි බව ඩැමැස්කස් ලේඛනයේ සඳහන් කර තිබේ. "එවිට දෙවියන් වහන්සේ ඔවුන් තමන් විසින් කරනු ලැබූ පාප ක්‍රියා පිළිබඳව පසුතැවිලි වන බව සැලකිල්ලට ගෙන ඔවුන්ට මග පෙන්වීම සඳහා ධර්මිෂ්ඨ ශාස්තෘවරයකු ලබාදුන් සේක." (CD, Dam, 1:10 f) යනුවෙන් ඩැමැස්කස් ලේඛනයේ සඳහන් වේ.

සමහරවිට එම අප්‍රකට ධර්මිෂ්ඨ ශාස්තෘවරයා විසින් විප්‍රවාස කාලය අවසානයේදී තම ශ්‍රාවකයින් ලවා ඔවුන් මුලදී පිළිපදිනු ලැබූ ආගමික විශ්වාස අනුගමනය කිරීමට සලස්වන ලද බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් බැබිලෝනියානු සහ ශරතුස්ත්‍රවාදී දර්ශනයේ නෂ්ටාවශේෂ (Zoroastrian Relics) නැවත ඉදිරියට පැමිණ තිබෙන බවත් කල්පනා කළ හැකිය. ආගමික සමාජයේ මූලික හරය එළිදරව්ව සහ දිවැසිවරයින්ගේ ප්‍රකාශ විශාල ප්‍රමාණයක් ඇතුළත් අනම්‍යවූත් ඉතා දැඩිවූත් එකක් විය. විසි වසරක කාලයක් ස්ථිර වාසස්ථානයක් නොමැතිව විප්‍රවාසව සිටි මෙම ආගමික කණ්ඩායම තම අලුත් ශාස්තෘවරයා සමග කුම්රාන් අඩවියේ පදිංචි වූහ. ගැලවුම් කාරයකුගේ පැමිණීම ඉක්මනින් සිදුවේයැයි ඔවුහු තදින් විශ්වාස කළහ. කුම්රාන් වැසියන් තුළ පැවති විශ්වාස සහ ඇදහිලි ක්‍රම සලකා බැලීමේදී ඒවා ස්නාවක ජොහාන් විසින් අනුගමනය කරනු ලැබූ ස්නාවක ආගමික සමාජවල පැවති වත් පිළිවෙත් සහ විශ්වාස වලට බොහෝ දුරට සමාන බවත් කුම්රාන් වැසියන් එම චාරිත්‍ර විධි වැඩිදියුණු කිරීම සඳහා පිටිවහල් වූ බවත් විශ්වාස කළ හැකිය.

කුම්රාන් වැසියන් සහ එසීන් සාමාජිකයන් කණ්ඩායම් දෙකක් වශයෙන් වෙන්වූයේ මුල්කාලයේදීම විය හැකිය. ඔවුන් තමන් මුලින් අයත්ව සිටි එසීන් සමාජයෙන් වෙන්වීම සහ ඉහත කී අප්‍රකට ධර්මිෂ්ඨ ශාස්තෘවරයා අතර සම්බන්ධතාවයක් තිබුණේද'යි අපට මෙහිදී ස්ථිර වශයෙන් ප්‍රකාශ කළ නොහැකිය. කෙසේ වෙතත් කුම්රාන් සමාජයේ නික්මයාම, (Exodus) ආගමික සමාජය පාලනය කරනු ලැබූ නීතිරීති නිවු කිරීම, සහ ධර්මිෂ්ඨ ශාස්තෘවරයා පිළිබඳ විස්තර ඇතුළත් ලියවිලි සහ පොත්පත් ලියා තිබෙන්නේ බොහෝ දෙනෙක් කල්පනා කරනවාට වඩා මෑතකදී බව පෙනේ. උදාහරණයක් වශයෙන් දැඩි පරිශ්‍රමයක් දරා ප්‍රතිනිර්මාණය කර ඇති ආගමික වත් පිළිවෙත් ඇතුළත් මික්සාට් මාසේ හා-තෝරා (Miqzat - Maaseh Ha-Thora) නමැති ලේඛනය ඉදිරිපත් කළ හැකිය. එහි ඇතුළත් වී තිබෙන්නේ හැලචා (Halacha) නමින් හැඳින්වෙන කුම්රාන් පූජාවිධි නියමයන් වේ. වැඩිදුර පර්යේෂණ පැවැත්වීමකින් තොරව ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයට අයත්යැයි කාලනිර්ණය කර ඇති මෙම ලේඛනයේ බොහෝ දුරට සැදුසිවරුන්ට ආවේනික ලක්ෂණ ඇතුළත්වේ. කුම්රාන් සමාජයට අයත්වූ මුල් සාමාජිකයින් ක්‍රි. පූ. 168-164 කාලයේදී සිදුවූ මකබියානු කැරැල්ල නිසා උද්ගතවූ තත්වයට එරෙහිවූ බව එයින් පැහැදිලි වේ. විප්ලවයට පසු මකබිවරු පූජක ධූරාවලිය හෙබවූ සැඩොකයිට් (Zadokite) වරු ඉවත් කර ඒ වෙනුවට මකබිවරු පත්කර ගත්හ. එය එසේ සිදුවිනි නම් කුම්රාන් වැසියන් හා හෙලනීසියානු කරණයට එරෙහිව කටයුතු කළ මකබිවරුන්ගේ පූජක ධූරාවලිය පිළිපන් හැසිරීම් වරු අතර සම්බන්ධතාවයක් පැවතිය නොහැකිය.[35] ඇත්ත වශයෙන්ම සැදුසිවරුන්ගේ පූජාවිධි පිළිබඳ නීතිය හා පැහැදිලි සම්බන්ධතාවයක් පැවති බව පෙන්නුම් කළ හැක්කේ එහි ඇතුළත් නීති රීති විස්සෙන් එකක් මගින් පමණි.[36] එපමණක් නොව, අනෙක් සියලුම අත් පිටපත් වලට වඩා එම ලේඛනයේ යොදා ඇති හීබෲ භාෂා ව්‍යවහාරයද සම්පූර්ණයෙන්ම වෙනස්ය. එනිසා එහි දක්වෙන භාෂා සම්ප්‍රදාය ව්‍යවහාරයේ පැවති ක්‍රි. ව. පළමුවන ශතවර්ෂයේදී එය ලියන්නට ඇතැයි සිතිය හැකිය.

පුද්ගලයින් තිදෙනෙකු පිළිබඳව පවතින කථා ප්‍රවෘත්ති තුනක් කුම්රාන් ආගමික කණ්ඩායම පිළිබඳ විවිධ මත ඉදිරිපත් කිරීමට හේතුවී තිබේ. එම මත ඉදිරිපත් කර තිබෙන්නේ කුම්රාන් සමාජයේ පසු කාලය සම්බන්ධයෙනි. එම පුද්ගලයින් තිදෙනා නම් ධර්මිෂ්ඨ ශාස්තෘවරයා, බොරු කාරයා සහ නපුරු පූජකවරයාය. ධර්මිෂ්ඨ ශාස්තෘවරයා සැබැවින්ම ජීවත්වූ පුද්ගලයකු වූයේ නම් ඔහු පිළිබඳව කුම්රාන් ලියවිලි වල බොහෝ තොරතුරු ඇතුළත් විය යුතුවේ. නමුත් ඔහු පිළිබඳව

සඳහන් කර තිබෙන්නේ ඩැමැස්කස් ලේඛනයේත්, බයිබලයේ ඇතුළත් හබකුක් නැමැති පොත පිළිබඳව ලියා ඇති අටුවාවේත් Commentary on Habakkuk), Psalms-Pescher යනුවෙන් හැඳින්වෙන ගීතාවලියකත් පමණි. එම ලේඛන වල සඳහන් කර තිබෙන්නේ ඉතාමත් අල්පවූ තොරතුරු ස්වල්පයක් පමණි. පුරාණ ලේඛන ශාස්ත්‍රය පිළිබඳ පරීක්‍ෂණවලට අනුව (Palaeographic Tests) මෙම අප්‍රකට ශාස්තෘවරයා පිළිබඳව පවතින තොරතුරු වලින් වැඩි කොටසක් අපට ලැබී තිබෙන මූලාශ්‍රය වන හබකුක් නමින් හැඳින්වෙන පොතට ලියා ඇති අටුවාව ක්‍රි. ව. පළමුවන ශතවර්ෂයට අයත් බව තීරණය කර තිබේ.

'බොරුකාරයා' යනු මුල් ජන සමාජයෙන් කැඩී වෙන්වී ආ කුම්රාන් සාමාජිකයකු විය හැකිය. සමහරවිට ඔහු ධර්මිෂ්ඨ ශාස්තෘවරයාගේ අනුගාමිකයින්ට පෙනී ගිය පරිදි වැරදි මතවාදයන් ඉදිරිපත් කරන්නට ඇත. එපමණක් නොව ඔවුන්ට එරෙහිව ව්‍යාපාරයක් ගෙන යන්නටද ඇත. බොරුකාරයා අයත්වූ ජන සමාජයත්, බොරු කාරයාත් යන කණ්ඩායම් දෙකම එෆ්රේම් (Ephraim) හෙවත් සමාරිවරු (Samaria) යනුවෙන් හඳුන්වනු ලැබීය. 'නපුරු පූජකවරයා' කිසිදිනෙක කුම්රාන් සමාජයේ සාමාජිකයකු නොවීය. ඇත්ත වශයෙන්ම ඔහු ඓතිහාසික වශයෙන් සැබවින්ම ජීවත්වූ පුද්ගලයෙක්ද නැතිනම් කිසියම් කණ්ඩායමකට එරෙහිව ක්‍රියාකළ පුද්ගලයකු නිරූපණය කිරීම සඳහා යොදා ගන්නා ලද හෙලනිසියානු සාහිත්‍යයේ දක්වෙන කෲර ග්‍රීක් පාලකයකුගේ චරිතයක්ද යන කාරණය මෙහිදී ප්‍රශ්න කළ යුතුය.

ධර්මිෂ්ඨකම පිළිබඳ උගන්වන පුද්ගලයකු ඇත්ත වශයෙන්ම ආදර්ශමත් නායකයකු විය යුතුය. සමහරවිට දේව ස්තෝත්‍ර ගීතිකාව (Hymn Scroll) නමින් හැඳින්වෙන ලියවිල්ල රචනා කර තිබෙන්නේ එම ශාස්තෘවරයා විසින් බව සමහරු කල්පනා කරති. ඒ පිළිබඳ ඉඟියක් පහත දක්වෙන ප්‍රකාශයේ ඇතුළත් වේ: "ඔබ වහන්සේ විසින් මා ධර්මිෂ්ඨ පුද්ගලයින් අතුරින් තෝරාගත් පුද්ගලයකුගේ සංකේතයක් ලෙසත් අප්‍රකට කරුණු තේරුම් කරදීමේ ශාස්තෘවරයකු ලෙසත් පත්කර තිබේ." (1 QH 2 : 13). එවැනි ප්‍රකාශ මගින් දේව ස්තෝත්‍ර ගීතිකාවේ සඳහන් කර තිබෙන ආලෝකය පිළිබඳ කථා ප්‍රවෘත්තියේ ඇතුළත් පාරභෞතික අදහස් (Metaphysics of Light) ඇතුළු ගුප්ත ආගම් වල දක්වෙන කරුණු සිහියට නගයි. එය පැහැදිලිවම හෙලනිසියානු ආභාෂය පෙන්නුම් කරන ලක්‍ෂණයකි. මෙම ලියවිල්ල රචනා කර තිබෙන්නේ ධර්මිෂ්ඨ ශාස්තෘවරයා විසින් නම් ඔහු යුදෙව් ආගමික විශ්වාසයන්හි දැඩි ලෙස එල්බගත්තේ වී නමුත් හෙලනිසියානු ආභාෂය ලැබූ පුද්ගලයකුද විය යුතු බව පැහැදිලිවේ. මෙම දේව ස්තෝත්‍ර ගීතිකා ලියවිල්ල යනු යුග විනාශයක් සමග ඇතිවන

භ්‍රාසජනක තත්වයන් ඉදිරියේ මිනිසුන්ට අකම්පිතව සිටීමට පුහුණු කිරීම සඳහා ලියනලද යුදෙව් සාහිත්‍යයේ අද්විතීය ස්ථානයක් උසුලන ලේඛනයකි. එහි දක්නට ලැබෙන නවතම ලක්‍ෂණය නම් එව ඇතුළත් කර ඇති ආධ්‍යාත්මික පැවැත්ම පිළිබඳ හෙලනිසියානු ආකල්පයෙහි.[57] පැහැදිලි අරමුණකින් තොරව දීර්ඝ කාලයක් තැනින් තැනට යමින් විසිරී ජීවත්වූ කුම්රාන් ජන සමූහය ධාර්මික ශාස්තෘවරයා විසින් නිශ්චිත ස්ථානයකට යොමු කරවනු ලැබීය. එම ශාස්තෘවරයා පිළිබඳ කර තිබෙන තොරතුරු ස්වල්පය සහ එම ලියවිලි ඇතුළත් කාලය පිළිබඳ සලකා බැලීමේදී ඔහු ක්‍රි. ව. පළමුවන ශතවර්ෂයේදී ජීවත්වූ බව පෙනේ. ඔවුන් ස්ථිර වාසස්ථානයක් නැතිව තැනින් තැනට ගමන් කළ කාලය තුළදී සිදුවූයේ කුමක්ද?

කුම්රාන් නගරයට සැතපුම් 10 ක් පමණ දකුණින් මළ මුහුදේ (Dead Sea) බටහිර වෙරළේ පිහිටි එන්-එල්-ගුවීර් (EnEl-Ghuweir) නම් ස්ථානයේ කරන ලද පුරාවිද්‍යාත්මක කැනීම් මගින් කුම්රාන් වැසියන් පදිංචිව සිටි තවත් ජනාවාසයක් මතුකර ගැනීමට හැකිවිය. එම ජනාවාසයට අයත් ගොඩනැගිලිද චර්යාව කුම්රාන් අඩවියේ පැවති ගොඩනැගිලි වලට සමානය.[58] එන් ගෙඩි (En Gedi), අයින් ෆෙෂ්කා (Ein Feshkha) සහ කුම්රාන් අඩවියේ කැනීම් කළ ස්ථානය මෙන්ම මේ ස්ථානයද ක්‍රි. පූ. 40 දී පමණ සිදුවූ පාර්තියන් ආක්‍රමණ වලදී විනාශ කරනු ලැබීය. ඒ නිසා එන් ගෙඩි සහ බටහිර වෙරළේ පිහිටි වෙනත් කෝම්භූමි වල ජනගහනය ක්‍රි. පූ. 40-37 කාලයේදී ශීඝ්‍රයෙන් පහළ බැස්සේය. දශක කීපයක් එම ප්‍රදේශ අත්හැර දමා තිබුණි. ඒ කාලයේදී කුම්රාන් වැසියන් ජීවත්වූ ස්ථානය පිළිබඳ තොරතුරු ලැබී නොමැත.[59] ඩැමැස්කස් ලේඛනයේ සඳහන් කර ඇති පරිදි කුම්රාන් වැසියන් නායකයකු මෙන්ම ස්ථිර වාසස්ථානයක්ද නැතිව තැනින් තැනට ගමන් කරමින් සිටියේ මේ කාලය තුළදීද? තැනින් තැනට යෑම් නතර කර ධාර්මික ශාස්තෘවරයකුගේ නායකත්වය යටතේ ආපසු පැමිණීමෙන් අදහස් වන්නේ පළමුවැනි සහස්‍රකයේ මුල් ආරම්භයේදී ඔවුන් නැවත කුම්රාන් අඩවියට පැමිණ එහි පදිංචිවීම විය හැකිය. එය එසේ සිදුවිනි නම් ධර්මිෂ්ඨ ශාස්තෘවරයා අනුගමනය කළ අය නැවත වරක් 'කුම්රාන් අඩවියට පැමිණ පදිංචිවූ බව විශ්වාස කළ හැකිය. ඔහු අනුගමනය නොකළ කණ්ඩායම් සමහරවිට කෲර පූජකයා සහ බොරුකාරයා අනුව යන්නට ඇත. ධර්මිෂ්ඨ ශාස්තෘවරයාගේ කණ්ඩායම 'කුම්රාන් නගරයේ නැවත පදිංචිවීම කෲර පූජකයාගේ අනුගාමිකයින්ගේ විරෝධයට හේතු වන්නට ඇත. එනිසා ඔවුන් පූජනීය දිනවලදී පවා ඔවුන්ට වද හිංසා පැමිණ වූහ.[60]

ඩැමැස්කස් නැමති සේතක (Code) නාමයෙන් හඳුන්වනු ලැබූ අඩවියෙහි කුම්රාන් වැසියන් 'නව සංධානය' ඇති කළහ. 'නව සංධානය' (New Covenant) නම් වූ මේ අදහස අපට නැවත හමුවන්නේ ක්‍රිස්තියානි ආගමේ පමණි. "ඩැමැස්කස් දේශයේ නව සංධානයට අයත් වූ සාමාජිකයින්ගේ නීති රීති වලට අනුව" යනුවෙන් ඩැමැස්කස් ලේඛනයේ සඳහන් කර තිබේ. (CD Dam VI : 19)

මෙතෙක් අප විසින් ගොඩ නගන ලද කථාවෙන් කුම්රාන් ජනසමූහය පිළිබඳ පහත දැක්වෙන චිත්‍රය නිර්මාණය කළ හැකිය. කුම්රාන් වැසියෝ ආගමික භක්ති උන්මාදයෙන් පෙලුණු යුදෙව් ආගමික කණ්ඩායමක් වූහ (Religious Fanatics). ඔවුන්ගේ අප්‍රකට ආරම්භය කෙරෙහි මෙසපොටේමියානු සහ පර්සියන් අදහස් බලපෑවේය. ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේදී ඔවුහු එසීන් ජනසමාජයට අයත් කොටසක් වූහ. බෞද්ධ ආරාමික ජීවිතය සහ ආගමික සමාජය පිළිබඳ මූලික සංකල්පය ඔවුහු එසීන්වරුන්ගෙන් උගත්හ. දීර්ඝ කාලයක් තිස්සේ කුම්රාන් වාසීන් විශාල වෙනස්වීමකට භාජනය වූහ. තමන්ටම ආවේණික ආගමික කණ්ඩායමක් පිහිටුවාගෙන හුදකලාව කටයුතු කිරීම නිසා ඔවුන් මුලින් පැවති එසීන් ආගමික සමාජයට අයත් මූලික ලක්ෂණ සීඝ්‍රයෙන් වෙනස් වන්නට පටන් ගත්තේය. පාර්තියන්වරු කුම්රාන් අඩවිය විනාශකර දමා ඔවුන් එතැනින් පලවා හැරීම නිසා ඔවුන්ට ස්ථිර වාසස්ථානයක් නොමැතිව තැනින් තැනට ගොස් ජීවත්වීමට සිදුවිය. මේ කාලපරිච්ඡේදය තුළදී ඔවුහු වඩා ප්‍රචණ්ඩකාරී කණ්ඩායමක් බවට පත්වූහ. අවසානයේදී ආදර්ශමත් නායකයකුවූ මෙම ධර්මිෂ්ඨ ශාස්තෘවරයා ලෝක විනිශ්චය ආරම්භවී තිබෙන බවත් ජීරන් සහ ඊශ්‍රායල් දේශවල ගැලවුම් කාරයකු පහළ වන බවත් ප්‍රකාශ කරමින් ඔවුන් නැවත කුම්රාන් අඩවියට කැඳවාගෙන ආවේය. මෙසේ නව සහස්‍රකය ආරම්භයේදී කුම්රාන් වැසියන් නැවත වරක් ඔවුන් කලින් ජීවත්වූ පැරණි ජනාවාසවල පදිංචි වීමෙන් පසු ඔවුහු තමන් විශ්වාස කළ ද්විත්ව මතවාදයට (Dualistic Ideology) ලෝකය පිළිබඳව සෙලට්වරු දැරූ අදහස්ද එකතු කළේය. එපමණක් නොව, ඔවුහු අවසාන සටනේදී අවි ආයුධ පාවිච්චි කිරීමට පවා සූදානම් වූහ. යුදෙව් යුද්ධයට පෙර ඔවුන්ට 'කුම්රාන්' අඩවියෙන් පිටවීමට සිදුවිය. සමහරවිට මසාඩා (Masada) හිදී සිදුවූ ආකාරයටම සෙලට්වරු රණකාමී කුම්රාන් වැසියන් සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් එහි ටික කලක් පදිංචිව සිටියහ. ක්‍රි. ව. 60 ගණන්වල අවසානයට එළඹීමේදී 'කුම්රාන්' ප්‍රදේශය නැවත වරක් රෝමන්වරු යටත් කර ගත්හ. රෝමන් යුගයට අයත් යුද්ධය පිළිබඳ ලියවිල්ල (The War Scroll) එහි ඇතුළත් වාග් විද්‍යාත්මක ලක්ෂණ අනුව සලකා බැලීමේදී කුම්රාන් ජන

සමාජයේ විනය නීතිරීති ඇතුළත් ලියවිලි සහ ඩැමැස්කස් ලේඛනය ලියා ඇති භාෂා ශෛලියට වඩා වෙනස් බව පෙනේ. ඒ අනුව යුද්ධය පිළිබඳ ලියවිල්ල කුම්රාන් වැසියන් සෙලට්වරුන්ගෙන් උකහාගත් ආධ්‍යාත්මික ආකල්ප වලට අනුව රචනා කරන්නට ඇතැයි සිතිය හැකිය.

වර්බට් කුම්රාන් නමින් හැඳින්වෙන ස්ථානය වඩාත් යෝග්‍ය ආගමික ආශ්‍රමයකට වඩා බලකොටුවක් සඳහාය. එහි මුරකාවල් තර කොට සාදන ලද ආරක්ෂිත අටල්ලක් තිබේ. එහි දීර්ඝ කාලයක් තිස්සේ පිටතින් කරනු ලබන සතුරු වැටලීමකදී පාවිච්චි කළහැකි පරිදි ජලය රැස්කර තැබිය හැකි භාජන සහ වතුර ලබාගැනීමට හැකි තුම පොද තිබේ. කුම්රාන් වැසියන් අධ්‍යයන කටයුතු කළ ස්ථානවල තිබූ භාණ්ඩ වලින් ඉතිරිව ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයක් පමණි. එහි විසූ පුද්ගලයින් ඊට වඩා වැදගත් කාර්යයක යෙදී සිටියහ. එනම් අඳුරේ දරුවන් සමඟ විශාල සටනකට සූදානම්ව සිටියහ. එසීන්වරුද එම සටනට සහභාගී වූ බව රෝමන් වරුන්ගේ පාර්ශ්වයට එකතුවී ඔවුන්ගේ අණදෙන නිලධාරියකු ලෙස කටයුතු කළ ජොසෆස් සඳහන් කර තිබේ. මෙහිදී ඔහු විසින් සඳහන් කර තිබෙන්නේ කුම්රාන් වැසියන් පිළිබඳව විය යුතුය. කුම්රාන් වැසියන් තවමත් එසීන් සමාජයට අයත් වූ කොටසක් ලෙස ඔහු සිතන්නට ඇත. එනිසා පුරාවිද්‍යාඥයන් විසින් එහි තිබී තුවා ලියන මේස තුනක ශේෂවූ කොටස් සහ තීන්ත දමන බෝතල් දෙකක් පමණක් සොයාගෙන තිබීමත්, එපමණක් නොව ලිවීම සඳහා පාවිච්චි කරනු ලබන පදම් කරන ලද එකම සම් කැබැල්ලක් හෝ එහි නොතිබීමත් පුදුම වීමට හේතුවක් නොවේ. කුම්රාන් යනු ශුද්ධ ග්‍රන්ථ රචනා කිරීම සඳහා වෙන්වූ ආගමික ආශ්‍රමයක් ලෙස නොපැවතුන බවත් එය සෙලට් බලකොටුවක් ලෙස පැවති බවත් එයින් හැඟෙන බව බොහෝ දෙනෙකුගේ පිළිගැනීමය. එපමණක් නොව කුම්රාන් ලෙන් තුළ තිබී හමුවූ පරිදි බයිබලයේ දැක්වෙන සිරාක් ගේ පොතේ (Book of Sirach) හීබෲ පාඨාන්තරයක් සෙලට් වරුන්ට අයත් බලකොටුවක් වූ මසාඩා (Masada) වල තිබී හමුවිය. මෙහිදී මසාඩා සහ කුම්රාන් අතර පැවති සම්බන්ධතාවය නොසලකා හැරිය යුතු නැත. කුම්රාන් වල ප්‍රභවය වූ බවට විශ්වාස කරන මෑතකදී ප්‍රසිද්ධ කරනු ලැබූ 'සෝන්ග්ස්' ඔෆ් ද සබත් සැක්‍රිෆයිස් (Songs of the Sabbath Sacrifice) යනුවෙන් හැඳින්වෙන "සබත් දින පූජා පැවැත්වීමේදී ගායනා කළ යුතු ගීත" නමැති පොතේ කොටස් ඇත්ත වශයෙන්ම රචනාකර තිබෙන්නේ මසාඩා වලදී බව සොයාගෙන තිබේ.

මෙම තත්වය පැහැදිලි කරදීම ඉතාමත් පහසුය. යුදෙව් යුද්ධයට පෙර බෞතීස්ම කිරීම සඳහා පාවිච්චි කරනු ලැබූ ජල භාජන සහ

අධ්‍යයන කුටි ඇතුළත් ආශ්‍රමය බලකොටුවක් බවට පරිවර්තනය කරනු ලැබිය. වතුර ගැලුම් 39,800 ක ධාරිතාවක් සහිත ජල භාජන වඩාත් සුදුසු වූයේ ජලය රැස්කර තබා ගැනීම පිණිසය. හදිසි අවස්ථාවකදී අසල පිහිටි එන් ෆෙෂ්කා (En Feshkha) නමැති ස්ථානයෙන් ජලය ලබා ගැනීමට හැකිවිය. වැදගත් ලිපි ලේඛන සියල්ලම ඔවුන් පදිංචිව සිටි ස්ථානයට පිටතින් තිබූ ලෙන්වල තැන්පත් කර තිබුණි. කුම්රාන් ජන සමාජයේ විකාශනයේ විවිධ අවස්ථා වලට අයත්වූ ලේඛන ආරක්ෂා සහිතව එක් ස්ථානයක තැන්පත් කරන ලද්දේ මේ හේතුව නිසාය. සමහර විට වෙනත් ආගමික කණ්ඩායම් මගින්ද ලේඛන ආරක්ෂිතව සඟවා තැබිය හැකි මෙම ස්ථානය පිළිබඳව දැනගෙන යුද්ධය ආරම්භ වූ විට ඔවුන් සතුව පැවති ලියවිලිවල අත්පිටපත් ආරක්ෂාව සඳහා එහි ගෙනැවිත් තබන්නට ඇත.

කුම්රාන් සමාජය විසින් ජේසුස් වහන්සේ පිළිබඳ මිථ්‍යාකථා ගොඩනැගීම

මෙම පර්යේෂණයේ පරමාර්ථය කුම්රාන් ලියවිලි පිළිබඳව විස්තරාත්මකව සලකා බැලීම හෝ ඒවායේ අර්ථ නිරූපණය කිරීම නොවේ. ඒ පිළිබඳව මෙහිදී විස්තර කරනු ලැබුවේ කුම්රාන් වැසියන් සහ එසීන්වරු අතර පැවැති සම්බන්ධතාව සහ ජේසුස් වහන්සේ කුම්රාන් අඩවියට ආසන්නව පිහිටි ස්ථානයක දී ධර්ම දේශනා කිරීම සඳහා මහජනයා ඉදිරියට පැමිණීම පිළිබඳ කරුණු පැහැදිලි කරදීම සඳහා පමණි.

සමහර විට ඊජිප්තුවේ තෙරපියුටා භික්ෂූන් සමඟ වාසය කළ ජේසුස් වහන්සේ පෙරළා පලස්තීනයට පැමිණීමෙන් පසු ටික කලක් එසීන්වරු සමඟ නැවතී සිටින්නට ඇත. පසුව උන්වහන්සේ කුම්රාන් බෞතීස්ම ස්නාවකයින්ට (Baptists) එකතුවීමට තීරණය කළහ. සමහර විට උන්වහන්සේ කුම්රාන් වැසියන් සමඟ සම්බන්ධව කටයුතු කරන්නට ඇත. එකල පැවති ආගමික පසුබිම කෙරෙහි කලකිරීමට පත්ව සිටි සියලු දෙනාම ජෝර්දාන් ගඟ අවට ප්‍රදේශයේ පාළුකරයට පැමිණියහ. තමන් විසින් දේශනා කිරීමට අදහස් කළ බෞද්ධ ඉගැන්වීම්වලට ඔවුන් කන්දෙනු ඇතැයි ජේසුස් වහන්සේ බලාපොරොත්තු වූහ. උන්වහන්සේ තම පණිවුඩය යොමු කරන ලද්දේ කවුරුන් වෙතද යන කාරණය Q යනුවෙන් හැඳින්වෙන පොතේ දැක්වෙන ප්‍රකාශයකින් පැහැදිලි වේ:

"දිළින්දන්ට ශුභ ආරංචියක් තිබේ" (QS16) යනුවෙන් එහි සඳහන් කර තිබේ. තමාගේ බලාපොරොත්තුව වූයේ දිළින්දන්ට පමණක් ධර්මය දේශනා කිරීම බව උන්වහන්සේ එයින් අදහස් නොකළහ. මෙහිදී දිළින්දන් යනුවෙන් අදහස් කරන ලද්දේ කුම්රාන් වැසියන්ය. කුම්රාන් වැසියෝ තුමූ දිළින්දන් යනුවෙන් හඳුන්වා ගත්හ. එකල මහජනතාව අතර විකල නොවූ විරූ ආකාරයේ විප්ලවීය අදහස් දේශනා කිරීම නිසා ජේසුස් වහන්සේ කෙරෙහි බැතිමතුන්ගේ විශේෂ අවධානය යොමු වන්නට පටන් ගත්තේය. උන්වහන්සේ බෞතීස්ම කිරීම සහ ස්නාවකයින් විසින් උගන්වනු ලැබූ උග්‍ර තපස් ව්‍රත ප්‍රතික්ෂේප කළහ. ඒ වෙනුවට ජේසුස් වහන්සේ බුදුන් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ මැද පිළිවෙත දේශනා කරමින් මෛත්‍රී කිරීමේ සහ ශෝක නොකර සිටීමේ ඇති වැදගත්කම පෙන්වා දුන්හ. ස්නාවකයින් මෙන්ම කුම්රාන් වැසියන්ද උන් වහන්සේ වෙත ඇදී ආවේය.

කලින් ස්නාවක ජෝහන්ගේ අනුගාමිකයින්ව සිටි පුද්ගලයින් සහ ජෝහන් විසින් ස්ථාපිත කර තිබූ ආගමික සම්ප්‍රදාය පිළිගත් කුම්රාන් වැසියෝ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් බවට පත් වූහ.[11] විවිධ ආගමික නිකායවලට අයත් වූ බැතිමතුන් ජේසුස් වහන්සේ දේශනා කළ නව දර්ශනයට හරවා ගැනීම ඔවුනු කටයුතු කළහ. කුම්රාන් ආගමික කණ්ඩායම් තුළ පැවති අදහස් ශුභාරංචියේ පොත්වලට ඇතුල් කරන ලද්දේ එම ශ්‍රාවකයින් විසිනි. ජේසුස් වහන්සේගේ සැබෑ දේශනා වෙනස් කර තිබෙන ආකාරය වටහා ගැනීම පිණිස නව තෙස්තමේන්තුවේ දක්නට ලැබෙන කුම්රාන් අදහස්වල සමහර කොටස් පිළිබඳව අපි දැන් සලකා බලමු.

කුම්රාන් වැසියන් සහ ඉරාන චින්තනය අතර කිට්ටු සම්බන්ධතාවක් පැවතුණි. එනිසා ඉරාන චින්තනය කෙරෙහි බලපෑ ශරතුස්ත්‍ර ආගමේ අදහස් ක්‍රිස්තියානි ආගමේ දැක්වෙන පුරාණෝක්ති හැඩ ගැස්වීම කෙරෙහි තීරණාත්මක ලෙස බලපෑවේය. ගැලවුම් කාරයකුගේ පැමිණීම පිළිබඳ විශ්වාසය ශරතුස්ත්‍ර ආගමේ දක්නට ලැබෙන, විශේෂයෙන් කැපී පෙනෙන ලක්ෂණයකි. සත්‍යය පැහැදිලි කරදීම සඳහා ඉතිහාසයේ විවිධ අවස්ථාවලදී දෙවියන් වහන්සේ විසින් දූතයින් පිටත්කර එවන බව එහි සඳහන් වේ. ඓතිහාසික දිවැසිවරු වශයෙන් හඳුන්වා තිබෙන්නේ එවැනි පුද්ගලයින්ය. කෙසේ වෙතත්, දෙවියන් වහන්සේගේ අවසාන නියෝජිතයා හෙවත් ගැලවුම් කාරයාගේ පරාක්‍රමය ඉහත කී සියලුම දිවැසිවරුන් අභිභවනය කරමින් දීප්තිමත්ව බැබලෙන්නේය. ගැලවුම්කාරයාගේ ආගමනයත් සමඟ ලෝක විනිශ්චය

ආරම්භවේ. ගැලවුම්කාරයා දෙවියන් වහන්සේ හා සර්ව සමවේ. "ස්වාමිනි මා ඔබ හා සර්ව සමවේ." ගැලවුම්කාරයා විසින් මනුෂ්‍ය වර්ගයාට විමුක්තිය සලසා ගැනීම සඳහා අනුගමනය කළ යුතු නිවැරදි මාර්ගය පෙන්වා දෙනු ලැබේ. ඔහු ලෝකය නපුරෙන් මුදවා ගනී. නපුරු බලවේගයන්ට එරෙහිව අවසාන සටන මෙහෙයවා මරණයෙන් උත්ථානවේ. ගැලවුම්කාරයා මෙලොවට බිහිවන්නේ කන්‍යා මාතාවකගේ කුසයෙනි. එකී කන්‍යා මාතාව "සියලු දුෂ්කරතා ජයගන්නා කාන්තාවක්" ලෙස ශරතුස්ත්‍ර හඳුන්වා දී තිබේ. ආගමික පුරාණෝක්තියේ දැක්වෙන මෙම අදහස් ක්‍රිස්තියානි ආගමේ දැක්වෙන ලෝක විනිශ්චය පිළිබඳ අවසාන දින සම්බන්ධයෙන් කර ඇති බලපෑම මෙහිදී අවධාරණය කිරීම අවශ්‍ය නොවේ.

ගැලවුම්කාරයකුගේ හෝ ගැලවුම්කාරයින් දෙදෙනෙකුගේ පැමිණීම පිළිබඳ බලාපොරොත්තුව කුම්රාන් වැසියන් තුළ පැවැති සුවිශේෂ විශ්වාසයක් විය. ගැලවුම්කරුවකුගේ පහළවීම පිළිබඳව පෙරනිමිති පළකරමින් ගැලවුම්කාරයකුගේ පිළිසිඳ ගැනීම සහ ඔහුගේ උපත සිදුවන ආකාරය පිළිබඳ කුම්රාන් ලේඛනයක සඳහන් කර තිබේ. (1QSA 2:11). කුම්රාන් කණ්ඩායමට අයත්ව සිටි ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් තම ශාස්තෘවරයා මෙසේ උත්පාද වූ ගැලවුම්කාරයා ලෙස පිළිගන්නට ඇති බවත් පසු කාලයේදී ක්‍රිස්තියානි ආගමේ පුරාණෝක්ති කථා මගින් උන්වහන්සේ දෙවියන්ගේ ආනුභාවයෙන් බිහිවී, පසුව මරණයෙන් උත්ථාන වූ ගැලවුම්කරුවකු ලෙස නිරූපණය කරන්නට ඇති බවත් සිතිය හැකිය. ගැලවුම්කරුවාගේ විද්‍යමාන වීමත්, ආගමික කණ්ඩායමේ සාමාජිකයින් එකට රැස්වී මේසයක් වටා වාඩිවී පොදුවේ එකමුතුව ආහාර අනුභව කිරීමේදී (Communal meal) ඔවුන් අසුන් ගතයුතු පිළිවෙළ පිළිබඳව කුම්රාන් ලියවිලිවල සඳහන්.කර තිබෙන ආකාරය කෙරෙහිද අපේ සැලකිල්ල යොමු විය යුතුය. මෙහිදී භෝජනය සඳහා පිළියෙල කර තිබෙන පාන් සහ වයින් වලට ආශිර්වාද කර පළමු පාන් පෙත්ත ගනු ලබන්නේ පූජකවරයා විසිනි. ඒ නිසා කිසිවෙක් පූජකවරයාට කලින් පළමු පාන් පෙත්ත ගැනීම සඳහා අත දිගු නොකළ යුතුය. පූජකවරයා විසින් පළමු පාන් පෙත්ත ගැනීමෙන් පසු ඊශ්‍රායලයේ ගැලවුම්කරුවා පාන් ලබා ගැනීම සඳහා අත දිගු කර මුළු කණ්ඩායමටම පිළිවෙළින් ඔවුන්ගේ තරාතිරම අනුව ආශිර්වාද කරනු ලැබේ. (1QSA 2:17-21). නව තෙස්තමේන්තුවේ දැක්වෙන අවසාන රාත්‍රී භෝජනය (Last Supper) පිළිබඳ කථා ප්‍රවෘත්තිය කුම්රාන් වැසියන් අතර පැවති මෙම භෝජන සංග්‍රහය පැවැත්වීම පිළිබඳ ප්‍රවෘත්තිය ඒ ආකාරයෙන්ම අනුගමනය කිරීමක් බව පෙනේ. සමහර විට මෙම කථා ප්‍රවෘත්ති ඇතුළත්

කරන ලද්දේ කලින් කුම්රාන් සමාජයට ඇතුළත්ව සිට පසුව ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් බවට පත් වූ පුද්ගලයින් විසින් විය හැකිය. කුම්රාන් සාමාජිකයින් අතර පැවති පොදුවේ ආහාර අනුභව කිරීමේ චාරිත්‍රයේ පැවැති සංකේතාත්මක වැදගත්කම ඔවුන්ගේ මතකයේ රැඳී තිබෙන්නට ඇත. එපමණක් නොව එකමුතුව කටයුතු කළ මෙම කණ්ඩායම සත්‍යය වෙනුවෙන් කැපවී සිටින බවත්, උතුම් ගුණධර්මයන්ගෙන් හෙබි පරිපූර්ණ වූ ස්ථිරසාර සාමාජිකයින් දොළොස් දෙනෙකුගෙන් සමන්විත වූ බවත්, ඔවුන් විසින් රටවැසියා පාපයෙන් මුදවා ගන්නා බවත් කුම්රාන් වැසියෝ විශ්වාස කළහ. (1 QS 7, 1:4-7)

එම ලියවිලිවල සඳහන් කර ඇත්තේ මෙම කරුණු පමණක් නොවේ. 4 Q 246 වශයෙන් ලකුණු කර ඇති කුම්රාන් ලේඛනවල අත් පිටපත් වල "මුළු ලෝකයටම සාමය උදාකර දෙන දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස උන් වහන්සේගේ නාමයෙන් ප්‍රශංසා ලබන, සර්වබලධාරී දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස හඳුන්වනු ලබන, දෙවියන් වහන්සේගේ පුත්‍රයකු" පිළිබඳවද සඳහන් කර තිබේ.

කුම්රාන් වැසියන් විසින් තමන් හඳුන්වා ගැනීම සඳහා යොදා ගන්නා ලද නම් පවා මුල් අවධියේ විසූ ජේසුස් වහන්සේ අනුගමනය කළ කණ්ඩායම් සහ මුල් ක්‍රිස්තියානි අනුගාමිකයන් විසින් යොදා ගෙන තිබේ. ඔවුනු තමන් "ආශිර්වාද ලත් දිළින්දන්", "ආශිර්වාදයේ දිළින්දන්" (1QHod 5:22), "දිළින්දන්ගේ සමාජය" (4QPs 37, 2:10), "දෙවියන් වහන්සේ විසින් ගලවා ගනු ලබන දිළින්දන්" (1QMil 11:9) සහ "දිළින්දන්" (1QMil 14:7) යනුවෙන් හඳුන්වා ගත්හ. ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශනාවේ ආශිර්වාද ලද්දවුන් පිළිබඳව කර ඇති එක් ප්‍රකාශයක මෙම දිළින්දන් පිළිබඳව සඳහන් කර තිබේ.

ගුප්ත ආගම්වලට අයත් හෙලනිසියානු ආභාෂය ලැබූ බොහෝ අංග ඇලෙක්සැන්ඩ්‍රියාව හරහා කුම්රාන් වැසියන්ට ලැබුණි. එම ලක්ෂණ ඔවුන්ගේ නායකයාගේ චරිතය නිරූපණය කිරීම සඳහා යොදා ගෙන ඇති කථා ප්‍රවෘත්තිවල දැක්වේ. ධර්මිෂ්ඨ ශාස්තෘවරයාගේ අනුගාමිකයින් විසින් තම ශාස්තෘවරයා "දෙවියන් වහන්සේගේ වචනවල සැඟවුණු අර්ථ පැහැදිලි කරදීම සඳහා එවන ලද උන්වහන්සේගේ සේවකයකු සහ දිවැසිවරයකු ලෙස හැඳින්වූහ. ඔහු උත්තම ගණයේ යෝගියකු ලෙස සලකනු ලැබීය. ආගම යනු සත්‍යාවබෝධය කිරීම තුළින් ලැබෙන්නාවූ නිරාමිස ප්‍රීතිය (Ecstatic Gnostic Mystery) ලෙස සැලකීම හෙලනිසියානු සම්ප්‍රදායේ දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණයකි. දිව්‍යමය එළිදරව්වේ දැක්වෙන අඳුර පිළිබඳ අදහස යුදෙව් සම්ප්‍රදායට එකඟ

ශ්‍රී‍යාවන අතර, එය එළිදරව්ව පිළිබඳ අදහස්වලද දක්නට නොමැත.[63] ආගමික සමාජයේ විනය නීතිවලට අනුව ඊට ඇතුළත් වූ සාමාජිකයින්ට තමන් අවබෝධ කරගත් සැඟවුණු සත්‍යය පිළිබඳව ප්‍රසිද්ධියේ කථා නොකර සිටිය යුතු බවට නියෝග කර තිබේ. හෙලනිසියානු ගුප්ත ආගම්වලට අයත් කණ්ඩායම්වලට සාමාජිකයින් ඇතුළත් කර ගැනීමේදී මෙම සම්ප්‍රදාය අනුගමනය කරනු ලැබීය. තෝමස්ගේ ශුභාරංචිය ගුප්ත ග්‍රන්ථයක් ලෙස ආරක්ෂා කරගත් ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් තම ශාස්තෘවරයා අපූර්ව දේ කළ හැකි ගුප්ත දේ පිළිබඳ අධිකාරීත්වයක් පැවැති එමෙන්ම තම ගෝලයින්ටද තමන් විසින් කටයුතු කළ පරිදි ක්‍රියා කරන ලෙස උපදෙස් දුන් පුද්ගලයකු වශයෙන් ඉදිරිපත් කර තිබේ. තෝමස්ගේ ශුභාරංචියේ මෙසේ සඳහන් වේ: "ජේසුස් වහන්සේ මෙසේ පැවසූහ. ෆරිසිවරු සහ ධර්මාචාර්යවරු දැනීමේ යතුරු රැගෙන සඟවා තැබූහ. එම දැනීමෙන් ඔවුන් ප්‍රයෝජන ගත්තේවත් එයින් ප්‍රයෝජන ගැනීමට කැමති කිසිවකුට ඉඩ දුන්නේවත් නැත. නමුත් ඔබ සර්පයින් මෙන් බුද්ධිමත් විය යුතුය. පරෙවියන් මෙන් අහිංසක විය යුතුය" (තෝමස් 39).

ජේසුස් වහන්සේ පිළිබඳ කථා ප්‍රවෘත්ති කියවීමේදී උන්වහන්සේ මින්පෙර සඳහන් කළ ධර්මිෂ්ඨ ශාස්තෘවරයා බව අපට නිරන්තරයෙන් සිහිපත් වේ. ජේසුස් වහන්සේට සම්බන්ධ වූ කුම්රාන් අඩවියේ විසූ ශ්‍රාවකයින් උන්වහන්සේ මෙම ධර්මිෂ්ඨ ශාස්තෘවරයා තුළ පැවැති ගුණාංග පිළිබිඹු වන ලෙස පෙන්නුම් කිරීමට විශේෂ උනන්දුවක් දැක්වූහ. මෙහිදී ඔවුන් දෙදෙනා අතර දක්නට ලැබෙන සමානකම් පහත සඳහන් කර ඇති පරිදි සංක්ෂිප්තව දැක්වීමට පුළුවන: ධර්මිෂ්ඨ ශාස්තෘවරයා මෙන්ම ජේසුස් වහන්සේද නව සංධානයක නායකයකු (Leader of a New Covenant) වශයෙන් ඉදිරියට පැමිණ ලෝක විනාශය ආරම්භ වී තිබෙන හෙයින් තමන් ජීවත්වන පිළිවෙළ වෙනස් කර ධාර්මිකව ජීවත් වන ලෙස අවසාන පරම්පරාවට අවවාද කරමින් තමන් විසින් කරන ලද වැරදි පිළිබඳව පසුතැවෙන ලෙසත් ව්‍යවස්ථාවලිය සහ දිව්‍යාවලිය සම්පූර්ණ කරන ලෙසත් ස්වෙච්ඡාවෙන්ම ලෞකික සම්පත් අත්හැර දමන ලෙසත් ප්‍රකාශ කරයි. එපමණක් නොව උන්වහන්සේ උසස් පූජකයින් සහ ධර්මාචාර්යවරුන්ට ප්‍රසිද්ධියේ චෝදනා එල්ල කරයි. (මතෙව් 5:17). මෙම ලක්ෂණ බොහොමයක් Q^2 වශයෙන් හැඳින්වෙන දේශනා මූලාශ්‍රවල ඇතුළත් කරුණු වල වැඩිදුර විකාශනයක් බව අපි කලින් දුටුවෙමු. එවැනි විස්තර ඉදිරිපත් කර තිබෙන්නේ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් විසිනි. ජේසුස් වහන්සේගේ චරිතය ධර්මිෂ්ඨ ශාස්තෘවරයා පිළිබඳ සංකල්ප රූපය මත පදනම් කර නිරූපණය කර

ඇති බවත් පාවුළුතුමාගේ චරිතය සැලකිය යුත්තේ මිට ඉහත සඳහන් කළ කෘෂර පූජකවරයාගේ සහ බොරුකාරයාගේ චරිතවල සම්මිශ්‍රණයක් ලෙස බවත් කුම්රාන් ලියවිලිවල අත් පිටපත් පරීක්ෂා කර බැලූ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ පර්යේෂකයකු වූ ජේකබ් එල්. ටයිචර් (Jacob L. Teicher) ප්‍රකාශ කර තිබේ.[64] ඔහු විසින් කර ඇති මෙම විග්‍රහයේ විශේෂ වැදගත්කමක් තිබේ. මෙහිදී ගැලවුම්කාරයකුගේ තත්ත්වය ධර්මිෂ්ඨ ශාස්තෘවරයාටත්, ජේසුස් වහන්සේටත් ආරෝපණය කර තිබෙන බව ටයිචර් අවධාරණය කරයි. ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් සිදුවී ඇති පරිදි කුම්රාන් වැසියන් විසින් බලාපොරොත්තුව සිටි ගැලවුම්කාරයා මගින් පූජක පන්තියේ සහ රජ පෙළපතේ ඒකාබද්ධ වීමක් බලාපොරොත්තු විය. ජේසුස් වහන්සේ තම මව් පාර්ශවයෙන් ලෙවි (Levi) වරුන්ගෙන්ද පිය පාර්ශවයෙන් ජුදා (Juda) දේශයෙන්ද පැවත ආවේය. ලෝක විනිශ්චය දිනයේදී (Day of Judgement) මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් තීන්දුව ප්‍රකාශ කරනු ලබන්නේ දෙවියන් වහන්සේ විසින් නොව උන්වහන්සේ විසින් තෝරා පත් කරනු ලැබූ ජේසුස් වහන්සේ හෝ නොහොත් ධර්මිෂ්ඨ ශාස්තෘවරයා විසිනි. යුදෙව් ආගමේ දක්වෙන ඉගැන්වීම්වලට සම්පූර්ණයෙන්ම පටහැනි මෙම අදහස ක්‍රිස්තියානි ආගමේ විශේෂ ලක්ෂණයක් නොවන බවත් එය ජේසුස් වහන්සේ පිළිබඳ මිථ්‍යා කථා ගොඩනැගූ කුම්රාන් සමාජය අතහැර ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් බවට පත්වූ පුද්ගලයින් විසින් නිර්මාණය කරන ලද කථා ප්‍රවෘත්තියක් බවත් පෙනී යයි. ජේසුස් වහන්සේ කිසි විටෙක මෙහි සඳහන් කරන ලද අපූකට ධර්මිෂ්ඨ ශාස්තෘවරයා නොවූහ. ශාස්තෘවරයකු සතු ගුණාංග උන්වහන්සේ තුළ තිබුණි. කුම්රාන් ආගමික සමාජයේ පැවති ගැලවුම්කරුවකුගේ පහළවීම පිළිබඳ අපේක්ෂාවන්ට සම්බන්ධ කරනු ලැබූ නව ව්‍යවස්ථාවක (New Convenant) නිර්මාතෘවරයා වශයෙන් උන්වහන්සේ ඉතිහාසයට එක් කරනු ලැබීය. කලින් කුම්රාන් ආගමික සමාජයට අයත්ව සිටි සාමාජිකයින් සහ ශ්‍රාවකයින් අනුගමනය කළ පුද්ගලයින් ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් බවට පත් වී උන් වහන්සේගේ ආගමික ව්‍යාපාරය පවත්වා ගෙන යාමට කටයුතු කළහ. කුම්රාන් ලියවිලි පසුබිම් කරගෙන ජේසුස් වහන්සේ පිළිබඳ මිථ්‍යා කථා ගොඩනගන ලද්දේ Q සමාජයට අයත් එකී ශ්‍රාවකයින් විසිනි. එම කථා ප්‍රවෘත්ති රචනා කරන ලද්දේ ජේසුස් වහන්සේ කුරුසියේ තබා ඇණ ගැසීමෙන් දශක කීපයකට පසුවය. එනිසා එම කථා රචනා කළ ලේඛකයින් වැඩි දෙනෙක් උන්වහන්සේ කිසි දිනෙක දැක නොතිබුණි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් උපදින්නට ඇත්තේ උන්වහන්සේ ඉටු කළ ආගමික හා සමාජ සේවය අවසාන වීමෙන් පසුව බවත්, ඔවුන් යුදෙව් ආගම පැවැති කාලයේදී

ජේසුස් වහන්සේගේ Q අනුගාමිකයන් විසින් තමන් කලින් අයත්ව සිටි ආගමික කණ්ඩායමෙන් තෝරා ගත් පුද්ගලයින් බවත් ඔවුන් ලවා මෙම විස්තර තොරතුරු රචනා කිරීම සඳහා පුහුණු කරනු ලැබූ බවත් උපකල්පනය කළ හැකිය. ඔවුන්ට ජේසුස් වහන්සේ සහ ධර්මිෂ්ඨ ශාස්තෘවරයා පිළිබඳ විස්තර තොරතුරු ලිවීම පදනම් විරහිත ක්‍රියාවක් ලෙස නොපෙනෙන්නට ඇත.

අවසාන විනිශ්චය පිළිබඳව සලකා බැලීමේදී කුම්රාන් සාමාජිකයින් සහ ක්‍රිස්තියානිය අතර පැවති සම්බන්ධතාවය අනාගතයේදී වැඩිදුර පර්යේෂණ පැවැත්වීම සඳහා සුදුසු මාතෘකාවක් වනු ඇත. කුම්රාන් සාමාජිකයින්ගේ විශේෂ ගෞරවයට පාත්‍ර වූ එනොක් ගේ ලියවිලි ජේසුස් වහන්සේ පිළිබඳ ආගමික ව්‍යාපාරය මගින් ඉතා උසස් කොට සැලකූ අතර ඔවුන් විසින් තවදුරටත් එම ලේඛන වැඩි දියුණු කරන ලදී. එසේ කිරීමේදී එනොක්ගේ පොතේ සඳහන් සමහර ප්‍රකාශ ජේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ ශ්‍රාවකයින් විසින් ප්‍රකාශ කරන ලද'යි සඳහන් කිරීමට පවා ඔවුන් පසුබට නොවීය. උදාහරණයක් වශයෙන් එනොක් ගේ ප්‍රකාශයක් වන "එවිට විවිධ ජාතීන් අතර ආරවුල් ඇතිවනු ඇත. ලෝක විනාශයේදී ඔවුන් නැඟී සිටිනු ඇත" (එනොක් 99:4) යන ප්‍රකාශය ඉදිරිපත් කළ හැකිය. ජේසුස් වහන්සේ තම අවසාන දින කීපය තුළදී කරන ලද දේශනාවල මෙසේ කියා ඇතැයි සඳහන් වේ: "ජාතියක් ජාතියකට විරුද්ධවද, රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්ධවද නැඟී සිටිනු ඇත." (මාක් 13:8, ලූක් 21:10). එළිදරව්ව පිළිබඳව ජේසුස් වහන්සේ විසින් කර තිබෙන දේශනාවල දැක්වෙන සමාජ ව්‍යසනයන්, එනම් භූමි කම්පා, වසංගත, සාගත, අසාධාරණය, දුක් කම්කටොළු සහ ආපදා සියල්ල කුම්රාන් සහ එනොක් ගේ ලියවිලිවලද ඇතුළත් වේ. එම ලියවිලි සහ ශුභාරංචියේ ඇතුළත් මෙම සමානකම් කතෝලික දේවධර්මාචාර්ය වරුන්ගේ සතුටට හේතු නොවීය. මන්ද එවැනි සමානකම් නිසා තම ආගමේ නිර්මාතෘවරයාගේ සුවිශේෂත්වය පිළිබඳව සැකයක් ඇතිවන හෙයිනි. එනිසා ක්‍රි. ව. 4 වැනි ශතවර්ෂයේදී එවැනි විස්තර තොරතුරු රැසක් ශුභාරංචියේ පොත් වලින් ඉවත් කරන ලදී. එහිදී හීබෲ භාෂාවෙන් රචිත ශුභාරංචියේ පොත්වල අත් පිටපත් විශාල සංඛ්‍යාවක් විනාශ කරනු ලැබූ අතර එනොක්ගේ පොත ආගමික ලියවිලි සහ මුනිවරයින්ගේ නාමාවලියෙන් ඉවත් කරනු ලැබිය.

ජේසුස් වහන්සේගේ ඉගැන්වීම අනුගමනය කළ මුල් කුම්රාන් සාමාජිකයින් සහ ශ්‍රාවකයින් අවසාන විනිශ්චය සහ එළිදරව්ව පිළිබඳ විශ්වාසවල තරයේ එල්බ ගෙන සිටියේය. ධර්මිෂ්ඨ ශාස්තෘවරයා විසින් "අවසාන පරම්පරාව"ට ප්‍රකාශ කරනු ලැබූ අදහස් කෙරෙහි ඔවුනු

මහත්සේ විශ්වාසය තැබූහ. නමුත් ධර්මිෂ්ඨ ශාස්තෘවරයා විසින් දේශනා කළ පරිදි ගැලවුම් කාරයකුගේ පැමිණීමක් සිදු වුයේ නැත. ඒ පිළිබඳව ජේසුස් වහන්සේගේ අදහස දැනගැනීම සඳහා ඔවුන් උන්වහන්සේගේ දේශනාවලට මහත් උනන්දුවෙන් ඇහුම්කන් දෙන්නට ඇතැයි සිතිය හැකිය. එම පිරිස ජේසුස් වහන්සේ දුටුවේ පවතින සම්ප්‍රදායන්, නියෝග සහ නීත්‍යානුකූල සීමාවන් අබිබවා ක්‍රියා කළ අසාමාන්‍ය පෞරුෂයකින් හෙබි පුද්ගලයකු ලෙසය. එනිසා එළිදරව්වේ සඳහන් පොරොන්දු පුද්ගලයා (man who was promised) හෙවත් ගැලවුම්කාරයා ජේසුස් වහන්සේ යයි සැලකීමට ඔවුනු පෙළඹුණහ. එය තමන් දේශනා කළ බෞද්ධ දර්ශනයේ පණිවිඩය ජනතාව අතරට ගෙන යාමේදී උන් වහන්සේ මුහුණ පෑ ප්‍රධාන ගැටලුව විය.

ජේසුස් වහන්සේ දේශනා කළ පෙරලිකාරී ආචාර ධර්ම උන්වහන්සේගේ ශ්‍රාවකයන් තුළ එතරම් බලපෑමක් ඇති කිරීමට සමත් නොවීය. ඔවුන්ගේ අපේක්ෂාව වූයේ දෙවියන් වහන්සේ විසින් එවනු ලැබූ ගැලවුම්කරුවා විසින් තමන්ට විමුක්තිය උදාකරදේද යන කාරණය පමණි. ආරම්භයේ පටන්ම තම ශ්‍රාවකයින් තුළ පැවැති ගැලවුම්කාරයකුගේ බිහිවීම පිළිබඳ මෙම භක්ති උන්මාදයට (Messianic Fanaticism) මුහුණ දීමට ජේසුස් වහන්සේට සිදු විය. "සෙබදීගේ පුත් ජේම්ස් සහ ජොහන් උන්වහන්සේගෙන් ස්වර්ග රාජ්‍යයේ උසස් තැනක් ඔවුන්ට ලබා දෙන ලෙස ඉල්ලා සිටියහ." (මාර්ක් 10:35-37). ජේසුස් වහන්සේ නාසරෙත් නුවර පිහිටි ධර්මශාලාවට වැඩම කර අවසාන විනිශ්චයට පැමිණ ඇති බව ප්‍රකාශයට පත් කළ ආකාරයත් එහෙත් මිනිසුන් තුළ පැවති අපේක්ෂාවන් ඉටුකර දීමට තමන් වහන්සේට නොහැකි බව ප්‍රකාශ කළ ආකාරය පිළිබඳ දීර්ඝ විස්තරයක් ලූක්ගේ ශුභාරංචියේ සඳහන් වේ. (ලූක් 4: 14-30). ඒ අවස්ථාවේදී රැස්ව සිටි පිරිස තුළ පැවැති උද්‍යෝගය කෝපයක් බවට පරිවර්තනය විය. කෝපාවිෂ්ට වූ මිනිසුන් උන් වහන්සේ නුවරින් පිටතට නෙරපා ප්‍රපාතයකින් පහළට හෙලනුවස් නුවර අද්දර ගොඩනගා තිබුණු කඳු මුදුනකට ගෙන ගියහ. කඳු ප්‍රපාතයෙන් පහතට හෙලනු ලැබීමෙන් වැලකීම පිණිස උන් වහන්සේට ආරක්‍ෂා සහිත ස්ථානයකට පලායාමට සිදු විය. දෙවියන් වහන්සේ විසින් තෝරාගත් පුද්ගලයින්ගේ සියලු විරුද්ධවාදීන් මර්දනය කර ගැලවුම්කාරයා විසින් අවසාන විනිශ්චයේදී ඔවුන්ට විමුක්තිය සලසා දීම පිළිබඳ අපේක්ෂාවෙන් වෙලී ගිය ආවේගශීලී ජනතාවකට ශෝක නොකරමින් සතුරාට පවා ප්‍රේමකිරීම උගන්වන ධර්මයක් දේශනා කිරීම එතරම් පහසු කාර්යයක් නොවීය. අනාගතයේදී ඊට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් අපේක්ෂාවන්ගෙන් යුක්ත සමාජයකට අනුරූප

වනසේ එම ඉගැන්වීම සකස් කර ගත හැක්කේ කෙසේද? උන්වහන්සේගේ ඉගැන්වීම මිනිසුන්ගේ අපේක්ෂාවන් හා අනුරූප නොවූ බවත් අවසානයේදී උන් වහන්සේගේ උත්සාහය අසාර්ථක වූ බව පමණක් නොව ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම වෙනස් කර උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ කෙනෙකු (ක්‍රයිස්තවරයකු) ලෙස හඳුන්වා දී ඇති පාවුළුතුමාගේ පල්ලියට උන්වහන්සේගේ සැබෑ ඉගැන්වීම සහ ආගමික බලය හා සම්බන්ධ වූ සංකලනවාදී දේවධර්මය (Syncretist Theology of Power) අතර පවතින පරස්පර විරෝධී තත්ත්වය විසඳීමට නොහැකි විය.

ඈත අතීතයේදී බෞද්ධ පදනමක පිහිටා කටයුතු කළ එසීන් සම්ප්‍රදාය තුළ ආරක්ෂාවී පැවති ලෝකය පිළිබඳ දර්ශනය සහ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වල අන්තර්ගත මෛත්‍රිය පිළිබඳ පණිවිඩය මැනවින් ග්‍රහණය කර එය තම ආගමික දර්ශනය සමඟ ඒකාබද්ධ කිරීමට යටත් පිරිසෙයින් කුම්රාන් ආගමික සමාජයේ පසුකාලීන පරම්පරාවට හැකිවිය.

නව තෙස්තමේන්තුවේ දක්වා ඇති ජේසුස් වහන්සේගේ දේශනා බොහොමයක් කුම්රාන් ලියවිලිවල ඇතුළත්ව තිබේ. එමෙන්ම කුම්රාන් ලියවිලිවල ඇතුළත් අදහස්වලට පටහැනි කරුණුද ඒ අතර ඇත. ඒවායින් වැඩි කොටසක් ජේසුස් වහන්සේගේ ආගමික ව්‍යාපාරය ඉදිරියට ගෙන ගිය අනුගාමිකයින් විසින් පසුකාලයේදී එකතු කරන ලද කරුණු වේ. ජේසුස් වහන්සේ පවා කුම්රාන් සමාජයේ පැවති සමහර ආකල්ප සහ චර්යාවන් පිළිගත් අතර සමහර ඒවාට විරුද්ධව ද කථා කළහ. ජේසුස් වහන්සේගේ දේශනා කුම්රාන් සමාජය වෙත ඉලක්ක කරනු ලැබූ නිසා උන්වහන්සේ විසින් මෙම ක්‍රම දෙකම අනුගමනය කරන්නට ඇතැයි සිතිය හැකිය. කෙනෙක් සබත් දිනය තුළ පිළිපැදිය යුතු ආකාරය පිළිබඳව ඩැමස්කස් ලියවිල්ලේ මෙසේ සඳහන් කර තිබේ: "සබත් දිනයේදී කිසිවකු කිසිම සතෙකුට ප්‍රසූතියකදී උපකාර නොකළ යුතුය. ඌ කාණුවක හෝ ජලය රැස්කර තබන භාජනයක් තුළ වැටී සිටියද සබත් දිනයේදී ඌට උපකාර නොකළ යුතුවේ. '(CD Dam, XI 13 : 14) සහ පණ ඇති මිනිසකු වතුරට හෝ වෙනයම් තැනකට වැටුණොත් ඉණිමගක් හෝ කඹයක් ලබාදීමෙන් හෝ වෙනයම් ක්‍රමයකින් ඔහුට උදව් නොකළ යුතුය. '(CD Dam, XI : 16 : 17) සබත් දිනයේදී රෝගීන් සුවපත් කළ හැකිදැයි ජේසුස් වහන්සේගෙන් කෙනෙක් ප්‍රශ්න කළ අවස්ථාවේදී උන්වහන්සේ දුන් පිළිතුර සලකා බලන විට කුම්රාන් වැසියන් තුළ නීතිය අර්ථ නිරූපනය කිරීමේදී පැවැති මෙම කෲර වූත්, අමානුෂිකවූත් ආකල්පය උන්වහන්සේට සිහිපත් වන්නට ඇති බව ඉතාමත් පැහැදිලිය.

උන්වහන්සේ ඔවුන්ට කථා කොට "ඔබ අතරින් එක බැටළුවකු පමණක් හිමි මිනිසකු ඒ බැටළුවා සබත් දිනයක දී වළක වැටුණොත් ඌ ඔසවා ගොඩ ගන්නේ නැද්ද" යනුවෙන් ප්‍රශ්න කළේය. (මතෙව් 12:11)

තම මුල් ශ්‍රාවකයින් ඔවුන්ගේ සතුරන් කෙරෙහි දැඩි වෛරයකින් පසු වූ බව ජේසුස් වහන්සේ දැන සිටියහ. එනිසා උන් වහන්සේ තම ඓතිහාසික කඳු උඩ දේශනාවේදී නිවැරදිව ක්‍රියා කිරීම යනු කෙනෙකු තම සතුරන්ට පවා ප්‍රේම කිරීම බවත්, සියලු සත්වයින්ට ගෞරව කිරීම බවත් ප්‍රකාශ කළහ. කුම්රාන් සාමාජිකයින් තුළ අඳුරේ දරුවන් කෙරෙහි පැවති නිර්දය ආකල්පය ඒ වනවිට ඔවුන් තුළ තදින් මුල්බැස තිබුණි. බුදුන් වහන්සේ දේශනා කළ පංච ශීලයේම කොටසක් ලෙස මීට කලින් පෙන්වා දෙනු ලැබූ කඳු උඩ දේශනාවේ මතෙව්ගේ පාඨාන්තරයට ඉදිරිපත් කර ඇති පසුවදන විශේෂයෙන්ම ඔවුන් තුළ පැවැති එම ආකල්පය ඉලක්ක කොට ලියා ඇත. "නුඹේ අසල්වැසියාට ප්‍රේමකරන්න, සතුරාට වෛර කරන්නැයි කී බව ඔබ අසා ඇත." (මතෙව් 5 : 43) නමුත් පරිසිවරු සහ සැදුසිවරු අතර තම සතුරන් කෙරෙහි එවැනි තදබල වෛරයක් නොතිබුණි. එසේ නම් මෙම ප්‍රකාශය පැහැදිලිවම ඉලක්ක කර තිබෙන්නේ කුම්රාන් සාමාජිකයින් හැර වෙන කවර නම් කණ්ඩායමක් වෙතද? මතෙව්ගේ පාඨාන්තරයේ දැක්වෙන තවත් එක් කොටසක් පාලුකරයේ විසූ දිවැසිවරු මෙන්ම කුම්රාන් සාමාජිකයන් විශ්වාස කළ දේවධර්මවේදය සම්බන්ධයෙන් කරන ලද අනතුරු හැඟවීමක් ලෙස පෙනේ. "අන්න උන්වහන්සේ පාළුකරයේ සිටින සේක'යි ඔවුන් ඔබට කීවොත් පිටත්ව නොයන්න" (මතෙව් 24:26). ගැලවුම්කාරයා පාළුකරයේ පහළවන බවට කුම්රාන් වැසියන් තුළ පැවති විශ්වාසය සහ පාළුකරයේ විසූ දිවැසිවරුන්යයි කියා ගත් පුද්ගලයින් නිසා නොමග නොයන ලෙස දක්වා ඇති මෙම අනතුරු හැඟවීම කර ඇත්තේ ජේසුස් වහන්සේ විසින් හෝ උන්වහන්සේගේ අනුගාමිකයින් විසින් විය හැකිය.

මේ සම්බන්ධයෙන් ජේසුස් වහන්සේ විසින් ඉහාරාවිගේ (මතෙව් 16:18 සහ ජොහන් 1:42) යන පොත්වල සඳහන් කර ඇති 'මම පේදුරු නමැති පර්වතය මත මාගේ සභාව ගොඩනගන්නෙමි"යි යනුවෙන් කර ඇති ප්‍රකාශය වැදගත් වේ. එම ප්‍රකාශය පැහැදිලිවම කුම්රාන් භක්ති ගීතිකා ලියවිල්ලෙන් (Hymn Scroll) උපුටා ගෙන තිබෙන හෙයින් එය ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් විසින් එකතු කරන ලද්දක් බව සැලකිය හැකිය. එහි මෙසේ සඳහන් වේ: 'දෙවියන් වහන්සේ "අත්තිවාරම" ගලක් මත පිහිටුවන්නේය.' (1GH 6:25 f). මෙහිදී සභාව දෙවියන්ගේ නිර්මාණයක් ලෙස පෙන්නුම් කර තිබේ. ජෝහන් මියර්

(Johann Meier) විසින් කරන ලද පරිවර්තනයේ සහාව යන වචනයේ (swd) සහ අත්තිවාරම (yswd) යන වචනයේ එතරම් වෙනසක් දක්නට නොමැති බව පෙන්වා දී තිබේ.[96] පසුකාලීනව බිහිවූ ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් තමන්ගේ (සහාව) පල්ලිය ජේසුස් වහන්සේ විසින් ආරම්භ කරනු ලැබූ බව පෙන්වීම සඳහා ඕනෑකා ලියවිල්ලේ දැක්වෙන සැසඳීම යොදා ගෙන තිබේ.

රෝගීන්ගේ සිරුරට අත තබා ලෙඩ සුව කිරීමේ චාරිත්‍රය කුම්රාන් සාමාජිකයින් අතර ව්‍යවහාරයේ පැවතිණ. එය කුම්රාන් වැසියන් එසීන්වරු හා පැවැති සම්බන්ධතා නිසා බිහිවූ සම්ප්‍රදායේ ශේෂවූ අංගයක් ලෙස පෙනී යයි. ඇරමයික් 'Genesis Apocryphon' හි මෙසේ සඳහන් කර තිබේ: "රජතුමා වෙනුවෙන් යාඥාකර එතුමාගේ හිස මාගේ දෑතින් ස්පර්ශ කර ඔහු සුවපත් කර දෙන ලෙස ඔහු මගෙන් ඉල්ලා සිටියේය. මම මගේ දෑත රජතුමාගේ හිසමත තැබීමි. එවිට එතුමාට ආවේශ වී තිබූ නපුරු අශුද්ධාත්මය ඉවත්විය. ඔහුට සුවය ලැබුණි."[97] මහජනයා ඉදිරියට පැමිණීමෙන් පසු ජේසුස් වහන්සේ රෝගීන් සුවපත් කරන මහානුභාව සම්පන්න පුද්ගලයකු ලෙස හඳුන්වා දී තිබේ. උන්වහන්සේ මිනිසුන්ගේ ශරීර ස්පර්ශ කර ඔවුන්ට වැළඳී තිබුණු ලෙඩ රෝග, අසනීප සහ යක්ෂාවේශයන් සුවපත් කරමින් ගලීලය පුරා සැරි සැරූහ. කෙරිපූටා සමාජය සමග ගත කළ කාලයේදී උන්වහන්සේ බුදුන් වහන්සේගේ අනුශාසනාව වූ මිනිසුන් ශාරීරික මෙන්ම ආධ්‍යාත්මික වශයෙන් සුවපත් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලැබූහ. එනිසා ගලීලයට පෙරළා පැමිණීමෙන් පසු උන්වහන්සේ ලෙඩුන් සුවපත් කරමින් හිඳුවන් මෙන් සැරි සැරූහ. කෙසේ වෙතත් නව තෙස්තමේන්තුවේ සඳහන් කර තිබෙන සුවපත් කිරීම පිළිබඳ ප්‍රාතිහාර්යජනක සිද්ධීන් ගොතන ලද කථා පුවෘත්ති බව පෙනේ. රෝගීන් ස්පර්ශ කර සුවපත් කිරීමේ ක්‍රම පිළිබඳව ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් තමන් කුම්රාන් සමාජයේ සාමාජිකයින්ව සිටියදී දැන සිටියහ. නමුත් එම ශාස්තෘවරයා අන් සියලුම දාර්ශනිකයින්, දිව්‍යසිවරයින් සහ රෝගීන් සුවපත් කරන්නවුන්ට වඩා අසාමාන්‍ය වූ ශ්‍රේෂ්ඨතම පුද්ගලයකු ලෙස හුවා දැක්වීම සඳහා රෝගීන් සුවපත් කිරීමේ ක්‍රමය ආරම්භ වූයේ උන්වහන්සේගේ මුල් ශ්‍රාවකයින්ගෙන් බවට ප්‍රචාරයක් ගෙන ගියහ. ජේසුස් වහන්සේ රෝගීන් සුවපත් කරන්නකු වශයෙන් ප්‍රසිද්ධ වීමෙන් පසු උන්වහන්සේ කෙරෙහි විශේෂ අවධානය යොමු වන්නට පටන් ගත්තේය. ධර්මදූත මෙහෙය සාර්ථක කර ගැනීම සඳහා රෝගීන් සුවපත් කළ හැකි ආශ්චර්යමත් බලයක් ඇති ශාස්තෘවරයකු ලෙස උන්වහන්සේ හඳුන්වා දීම වැදගත් විය. එනිසා ඔවුහු ජේසුස් වහන්සේ විසින් ආශ්චර්යමත් ලෙස ලෙඩ සුව කිරීමේ

ආරංචිය පතුරුවා හරින ලදී. එපමණක් නොව රෝගීන් සුවපත් කිරීම පිළිබඳ කිසිවක් කිසිවකුට නොකියන ලෙස ජේසුස් වහන්සේ විසින් නියෝග කර ඇතැ'යි ඔවුහු ප්‍රසිද්ධ කළහ. (උදා : මතෙව් 8:4, 9,30). මනෝවිද්‍යානුකූලව සලකා බැලීමේදී එය අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රියා මාර්ගය වේ. ජේසුස් වහන්සේ යනු රෝගීන් සුවපත් කරනු ලැබූ සාමාන්‍ය පුද්ගලයකු නොව කිසියම් ඉන්ද්‍ර බලයකින් යුක්ත වූ පුද්ගලයකු බවත්, එවැනි පුද්ගලයකු පිළිබඳව ප්‍රසිද්ධියේ කථා නොකළ යුතු බවත් එමගින් පැහැදිලි කර දෙන ලදී.

ප්‍රාතිහාර්ය පාන මෙම පුද්ගලයා පිළිබඳ ප්‍රවෘත්තියට ඉක්මනින් ප්‍රසිද්ධ කළ හැකි හොඳම ක්‍රියා මාර්ගය එය බව මෙහිදී අමුතුවෙන් කිව යුතු නොවේ. එම තොරතුරු කිසිවකුට නොකියන ලෙස ජේසුස් වහන්සේ අණ කළ බව විශ්වාස කිරීමට අපහසුය. එවැනි තර්ජන සැබෑ ජේසුස් වහන්සේගේ චරිතය හා කිසිසේත් නොගැළපේ. එපමණක් නොව එම නියෝග පිළිනොපදිනු ලැබූ බව පැහැදිලිය. ජේසුස් වහන්සේගේ ධර්මදූත සේවාවේ මුල් අවධිය සම්බන්ධයෙන් අපට වැඩිපුර විස්තර තොරතුරු ලැබී තිබෙන්නේ උන්වහන්සේ විසින් රෝගීන් සුවපත් කිරීම පිළිබඳ කථා ප්‍රවෘත්ති සහ ඒවා ප්‍රසිද්ධ නොකරන ලෙස සඳහන් කර ඇති විස්තර වලය.

සමහර අවස්ථාවලදී උන් වහන්සේගේ ශ්‍රාවකයින් ජේසුස් වහන්සේ තුළ පැවති ප්‍රාතිහාර්ය ජනක ලෙස ලෙඩුන් සුවපත් කිරීමේ ශක්තිය කෙතරම් නොගැළපෙන අයුරින් උන්වහන්සේ වෙත ආරෝපණය කර තිබේද යන්න ගෙන්නෙසරෙත් (Gennesaret) විලේ නැගෙනහිර ඉවුරේ පිහිටි ඩෙකපෝලිස් (Decapolis) නුවරදී ඇති වූ බවට වාර්තා කර ඇති සිද්ධියකින් පැහැදිලි වේ. ඒ අනුව ජේසුස් වහන්සේ විසින් මිනිසුන් දෙදෙනෙකුට ආවේශ වූ අශුද්ධ ආත්මයන් ඔවුන්ගෙන් දුරුකර එම අශුද්ධ ආත්මයන් ඒ අසල ගොදුරු කමින් සිටි ඌරු රැලකට වැහෙන්නට සලස්වයි. දෙදහසක් පමණ වූ ඒ ඌරු රැළ කඳු ප්‍රපාතයෙන් පහළ මුහුදට වේගයෙන් දුවගොස් මුහුදේ ගිලී මිය යයි. එකෙණෙහිම කෝපයට පත් ඌරු රැළ අයිතිකරුවන් මේ අද්භූත විජ්ජාකාරයා පළවා හරින ලද බව කියවේ. (මතෙව් 8:28-34 මාර් 5:1-17, ලූක් 8:26-37). සැබෑ ජේසුස් වහන්සේ විසින් එවැනි පිළිකුල් සහගත නොමනා ක්‍රියාවක් සිදු කරනු ඇතැයි විශ්වාස කළ නොහැක. හුදෙක් මෙම කථා ප්‍රවෘත්තියෙන් පෙන්නුම් කරන්නේ තම ශාස්තෘවරයා සියල්ලන්ටම වඩා වැදගත් වූත්, බලසම්පන්න වූත් පුද්ගලයකු බව පෙන්නුම් කිරීම සඳහා කථා ප්‍රවෘත්ති නිර්මාණය කිරීම සඳහා ඔවුන් තුළ පැවැති උනන්දුවය. ප්‍රාතිහාර්ය පිළිබඳ කථා ප්‍රවෘත්ති තෝරා ගැනීමේදී අතීතයේ ජීවත් වූ එපමෙනයිඩ,

(Epimenides), පයිතගරස්, එම්පිඩොක්ලීස් සහ ප්ලේටෝ වැනි බොහෝ සුප්‍රසිද්ධ පුද්ගලයින් විසින් කරන ලද ක්‍රියා පිළිබඳ ව්‍යාවහාරයේ පැවැති කථා ප්‍රවෘත්ති ප්‍රයෝජනයට ගත්හ. ප්ලේටෝ මියගිය පසු ඔහු ඇපලෝ දෙවියන්ගේ පුත්‍රයා බව විශ්වාස කරන ලදී. එම්පිඩොක්ලීස් රෝගීන් සුවපත් කළ බවත්, මළවුන් නැගිටවූ බවත්, මාරුත දමනය කළ බවත්, අනාගතයේදී සිදුවිය හැකි දේ ප්‍රකාශ කළ බවත් සඳහන් වේ. එම ප්‍රාතිහාර්යයන් සහ ජේසුස් වහන්සේ විසින් කරන ලද'යි ප්‍රකාශ කර ඇති ප්‍රාතිහාර්යයන් අතර විශ්මයජනක සමානකම් දක්නට ලැබේ. ජේසුස් වහන්සේ පේදුරුට කථා කොට මසුන් අල්ලනු පිණිස නැවත වරක් දියඹට ගොස් දැල් හෙලන්නැ'යි කී කථා ප්‍රවෘත්තිය ගැන කල්පනා කර බලන්න. (ලූක් 5:1-7). මෙම කථාවට පදනම් වී තිබෙන්නේ පයිතගරස් විසින් ක්‍රෝටන් (Kroton) හි ධීවරයින්ට නැවත වරක් දැල් එලීමෙන් මසුන් විශාල ප්‍රමාණයක් අල්ලා ගත හැකි බව ප්‍රකාශ කළ බව පැවසෙන සිද්ධියකි.[68]

කුම්රාන් ලියවිලි සහ ධර්මිෂ්ඨ ශාස්තෘවරයා පිළිබඳ තොරතුරු වලට අමතරව රෝමන්වරුන්ට විරුද්ධව කරන ලද යුද්ධය හා සම්බන්ධ සමකාලීන වීර පුද්ගලයින්ගේ චරිත ද මෙම කථා ප්‍රවෘත්ති ගොඩනැගීමේදී ආදර්ශයට ගෙන තිබේ. උදාහරණයක් වශයෙන් ජේසුස් වහන්සේට විශ්මිත ආකාරයෙන් සමානකමින් තිබූ මෙනාවම්ට (Menachem) ක්‍රි. පූ. 66 දී අත්වූ ඉරණම පිළිබඳ ජොසෆස් විසින් කර ඇති විස්තරය පිළිබඳව අපි දනිමු. ඔහු ඩේවිඩ් ගේ පුත්‍රයා විය. සිකේරියන් (Sicarian) වරුන්ගේ නායකයා වශයෙන් ඔහු ජේසුස් වහන්සේ කළ පරිදි යුදෙව් ජාතිකයින් නැගී සිටීමට සැලැස්වූහ. බෙත්ලෙහෙම් නුවර උපත ලද ඔහු තමා රජකු බව ප්‍රකාශ කරමින් ජෙරුසලමට ගොස් එහි දේවමාලිගය අල්ලා ගත්තේය. ඔහු පසුව පාවාදෙනු ලැබ මරණයට පත් කරන ලදී. මෙම කථා ප්‍රවෘත්තිය සහ ජේසුස් වහන්සේගේ ජීවිතය අතර පවතින අපූර්ව සමානකම් කෙරෙහි අවධානය යොමු කරමින් රුඩොල්ෆ් ඔගස්ටයින් (Rudolf Augstein) මාක් විසින් ශුභාරංචිය ලිවීමේදී මෙනාවම් පිළිබඳ තොරතුරු ඒ සඳහා යොදා ගෙන තිබෙන බව කල්පනා කරයි. මෙනාවම් නමැති නමේ අර්ථය 'සහනදායකයා' (Comforter) යනු වේ. ජේසුස් වහන්සේ පිළිබඳ කථා ප්‍රවෘත්තිය ලිවීමේදී ඔහු ගැලවුම්කාරයා වෙනුවට පසුව සහනදායකයා යන නම යොදා තිබේ.[69] මෙනාවම් යනු කුම්රාන් සමාජයේ විසූ ධර්මිෂ්ඨ ශාස්තෘවරයා යයි සමහරු විශ්වාස කරති.[70] මෙම ශාස්තෘවරයා පිළිබඳව සඳහන් වන ලියවිලි ක්‍රි. ව. පළමුවන ශත වර්ෂයට අයත් නිසා ඔහු එම යුගයට අයත් සෙලට් (Zealot) කෙනෙකු වීමට බොහෝ දුරට ඉඩ තිබේ.

මේ සියලුම සමානකම් සලකා බැලීමේදී ජේසුස් වහන්සේගේ ජීවන චරිතය නිර්මාණය කර තිබෙන්නේ සටන්කාමී යුදෙව් ජන කොටස් අතර ව්‍යවහාර වූ මතවාදවලට අනුව බවත් එය පුද්ගල අද්විතීය චරිතයක් නොවන බවත් පැහැදිලි වේ. ක්‍රිස්තුවරයින් ලෙස හඳුන්වා ගත් විවිධ පුද්ගලයින් ජීවත් වූ පසුබිමත ධර්මිෂ්ඨ ශාස්තෘවරයා, මෙනාවම් වැනි තුනම ආධ්‍යාත්මික ආගමික කණ්ඩායම් මගින් නිර්මාණය කරන ලද චරිත ලෙස සැලකිය හැකිය. ජේසුස් වහන්සේ පිළිබඳව රචනා කර ඇති ලියවිලිවල විශේෂයෙන්ම Q^1 සහ Q^2 වශයෙන් හැඳින්වෙන ලියවිලිවල කුම්රාන් සහ ජොහාන්ගේ ආගමික සමාජයට අයත් තොරතුරු මෙතරම් විශාල ප්‍රමාණයක් දක්නට ලැබෙන්නේ තමන් විශ්වාස කළ ආගමික අදහස්වලට අනුව ජේසුස් වහන්සේද ගැලවුම්කාරයකු ලෙස තම මනෝ රාජ්‍යයට (Utopia) ඇතුල් කර ගැනීමට Q අනුගාමිකයින්ට අවශ්‍ය වූ හෙයිනි. මෙසේ කුම්රාන් සමාජය තුළ මුල්බැසගත් අදහස් අවසානයේදී ශුභාරංචියේ පොත්වලට ඇතුල් කරන ලදී. ක්‍රිස්තියානි ඉගැන්වීම හැඩ ගැස්වීමේ ක්‍රියාවලිය සඳහා ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම නොව, උන්වහන්සේ වෙත ආරෝපණය කරන ලද ඉගැන්වීම එකතු කිරීමේදී තම ශාස්තෘවරයා පිළිබඳ පුරාණෝක්තිවල දක්වෙන තොරතුරු ඇතුළත් ජීවන චරිතයක් ගොඩනැගීමේදී සැබෑ ජේසුස් වහන්සේගේ බෞද්ධ ඉගැන්වීම වේගයෙන් පස්සට තල්ලු විය. නමුත් උන් වහන්සේගේ බෞද්ධ ඉගැන්වීම සම්පූර්ණයෙන්ම අතුරුදහන් වී නොමැත.

ශුභාරංචියේ පොත්වල ඇතුළත් කර තිබෙන එළිදරව්ව පිළිබඳ අනාගත වාක්‍ය, මිනිසුන්ට අත් විඳීමට සිදුවන දුඃඛ ව්‍යසනයන් සහ ගැලවුම් කරුවකුගේ පැමිණීම පිළිබඳ විශ්වාස කෙතරම් දුරට උන්වහන්සේගේ සැබෑ ඉගැන්වීම අබිබවා ඉදිරියට පැමිණ තිබේද යත් උන්වහන්සේගේ සැබෑ ඉගැන්වීම වලින් මේ වන විට ඉතිරිව ඇත්තේ සුළු කොටසක් පමණි. එසේ ඉතිරි වී ඇති කොටස් පසුපසට තල්ලු වී ගොස් සම්පූර්ණයෙන්ම අමතක වී යාමෙන් වැළකී තිබෙන්නේ එම දේශනා වල ඇතුළත් බෞද්ධ සදාචාරාත්මක පදනම දීප්තිමත්ව බැබළෙන හෙයිනි. ශුභාරංචියේ පොත්වල ඇතුළත් කුම්රාන් ආගමික සමාජයේ සහ ජොහාවක සම්ප්‍රදායට අයත් තොරතුරු ඉවත් කළහොත් ජේසුස් වහන්සේගේ සැබෑ මුහුණුවර මතුවනු ඇත. එවිට පහළ වූ මහා කරුණාවකින් යුකත් වූ සැබෑ ජේසුස් වහන්සේ නමැති බෝධිසත්වයා දැක ගැනීමට හැකිවනු ඇත.

නමුත් මෙම ප්‍රාඥයාගේ බෞද්ධ ඉගැන්වීම වටහා ගැනීමට හැකි

වූයේ කාටද? එම පිරිස එතරම් විශාල නොවූ බව පැහැදිලිය. උන්වහන්සේ ළඟින් ඇසුරු කළ ගෝලයින් පවා උන්වහන්සේ වරදවා තේරුම් ගත්හ. අන්තිමේදී ඔවුන් සියලු දෙනාම ජේසුස් වහන්සේ අතරමං කළහ. එනිසා ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම් යටපත් වී ඒවා වෙනත් ආගන්තුක ලියවිලිවල ඇතුළත් කර තිබීම සහ උන්වහන්සේ ප්‍රකාශ නොකළ බොහෝ දේ සාවද්‍ය ලෙස උන්වහන්සේ වෙත ආරෝපණය කර තිබීම පුදුමයට හේතුවක් නොවේ. එම දෘෂ්ටිකෝණයෙන් සලකා බැලීමේදී ජේසුස් වහන්සේගේ ආගමික මෙහෙය පිළිබඳ කථා ප්‍රවෘත්තිය සමස්ත ඉතිහාසයේ සිදු වූ විශාලතම අසාර්ථක ධර්මදූත සේවාවක් ලෙස සැලකීමට සිදුවේ.[7] සැබෑ ජේසුස් වහන්සේ අද අපට හැඳින්වීමට සිදු වී තිබෙන්නේ තම පණිවුඩය සාර්ථක ලෙස ප්‍රචාරය කිරීමට අපොහොසත් වූ පරාජිත පුද්ගලයකු වශයෙනි. උන්වහන්සේ දේශනා කළ පණිවිඩයේ අඩංගු කරුණුවලින් මේ වනවිට ඉතිරිව ඇත්තේ ඉතා ස්වල්පයක් පමණි. උන්වහන්සේ මුහුණ පෑ පරාජය අති විශාලය. මන්ද යුදෙව් යුද්ධ සමයේදී Q අනුගාමිකයින් සහ පාවුළුතුමාගේත්, උන්වහන්සේගේ අනුගාමිකයින්ගේ හෝ තම පෞද්ගලික අපේක්ෂා ඉටුකර ගැනීම පිණිස ජේසුස් වහන්සේගේ නම ප්‍රයෝජනයට යොදාගත් පුද්ගලයින්ගේ ප්‍රචාරක කටයුතු හේතුකොට ගෙන උන් වහන්සේගේ නම ඉතිහාසයට ඇතුල් වී තිබෙන්නේ තමන් විසින් කිසි දිනෙක පිහිටුවීමට බලාපොරොත්තු නොවූ ආගමික නිර්මාතෘවරයකු සහ දෙවියන් වහන්සේ ලෙසය.

ක්‍රිස්තියානියේ දැක්වෙන ඉන්දියානු ලක්ෂණ : පූජකයින්, පල්ලි සහ ගැලවුම්කරුවන්

ක්‍රිස්තියානියේ දක්නට ලැබෙන බෞද්ධ ආභාෂය ප්‍රකටව දක්නට තිබෙන්නේ ජේසුස් වහන්සේගේ දේශනා තුළ පමණක් නොවේ. ක්‍රිස්තියානි පූජකයින්ගේ ආශ්‍රමික ජීවිතය විකාශනය වී ඇති ආකාරය සලකා බැලීමේදී ද ඒ බව මැනවින් පැහැදිලි වේ. ක්‍රිස්තියානි ආශ්‍රමික ජීවිතය කෙරෙහි හැමවිටම කතෝලික පල්ලියේ විරෝධය එල්ල විය. ඉතිහාසය මුළුල්ලේම ආශ්‍රමික ජීවිත ගත කළ බැතිමතුන්ට පල්ලියේ නිල ලත් පූජක ධූරාවලිය විසින් එල්ල කරන ලද උග්‍ර අභියෝග රැසකට මුහුණ පෑමට සිදුවිය. නිල බලයෙන් පත් වී සිටි පල්ලිය ආධ්‍යාත්මික සහ භෞතික කටයුතු පාලනය කරන පරිපාලන බලතල හිමි වූ ආයතනයක් ලෙස පැවති අතර ශ්‍රාවකයින් ලෞකික සම්පත් අත්හැර දමා මෛත්‍රිය පතුරුවමින් ගුඩවූන්, භාවනාමයවූන් ආධ්‍යාත්මික කටයුතු

වල යෙදෙමින් ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම් වලට අනුව ක්‍රියා කළහ. බැතිමතුන් කෙරෙහි එල්ලවූ එම විරෝධතා පැහැදිලි කර දිය හැක්කේ ක්‍රිස්තියානි ආගමික ජීවිතයේ ප්‍රභවය හිඳු සමය හා සම්බන්ධ වී තිබෙන හැටි පෙන්නුම් කර දීමෙනි. මෙම තේමාව මෙහිදී සලකා බලනු ලබන මූලික කරුණක් නොවේ. එනිසා මෙහිදී ඒ පිළිබඳව කළ හැක්කේ සාමාන්‍ය විස්තරයක් පමණි. නමුත් ඒ සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් කිරීම ප්‍රයෝජනවත් විය හැකිය. ආශ්‍රමික ජීවිතය නව සහස්‍රකයේ මුල් ශත වර්ෂවලදී මිසරයේ සහ සිරියාවේ වර්ධනය විය. ප්‍රධාන වශයෙන් මිසරයේ වාසය කළ තෙරපියුටාවරු එහි මුල් පුරෝගාමීන් වූහ. අප විසින් මීට කලින් පෙන්වා දී ඇති පරිදි පැරණි පල්ලිය විසින් ඔවුනු ක්‍රිස්තියානි පූජකයින් ලෙස සලකනු ලැබූහ. ඔවුන් ගතකළ ආශ්‍රමික ජීවිතය බෞද්ධ භික්ෂූන් විසින් ගත කරනු ලැබූ ආශ්‍රමික ජීවිතයට බොහෝ දුරට සමාන විය. එය දැඩි කැපවීමකින් යුතුව විමුක්තිය සොයා ගිය බොහෝ දෙනෙකුගේ ප්‍රසාදයට හේතු විය. තෙරපියුටා ආගමික නිකායේ ගුඪ ඉගැන්වීම් ඔවුන්ට අවබෝධ කරගත හැකිවූයේ සීමිත ප්‍රමාණයකට පමණි. එසේ වුවත් විමුක්තිය සලසා ගැනීම සඳහා අනිත්‍යය මූලික ලක්ෂණය ලෙස පවතින දෘශ්‍යමාන ඉන්ද්‍රිය ගෝචර ලෝකය අතහැර දමා දැඩි කැපවීමකින් යුක්තව විමුක්තිය සලසා ගැනීම සඳහා ඔවුන් විසින් ගතකළ ජීවිතය පිළිබඳ වැටහීමක් ලබාගත හැකිවිය. එම ක්‍රියාපිළිවෙළ ඔවුන් තුළ දැඩි විශ්වාසයක් ඇති කිරීමට හේතුවිය. එය එසීන් සහ කුම්රාන් සාමාජිකයින් කෙරෙහි විශාල බලපෑමක් ඇති කිරීමට සමත්විය. නොස්ටික් චින්තනයේ බලපෑමට හසුවූ පුද්ගලයින් ලෞකික සම්පත් හැරදමා එක්තරා ආකාරයක ශ්‍රමණ ජීවිතයක් ගත කළහ. බුදුන් වහන්සේ, ජේසුස් වහන්සේ සහ තෙරපියුටා සාමාජිකයින් විසින් මුලදී අනුගමනය කරන ලද උග්‍ර තපස් වෘත අනුකරණය කිරීමට උත්සාහ කල මුල් පුද්ගලයින් එම තපස් වෘත ඒ ආකාරයෙන්ම අනුගමනය කිරීමට අපොහොසත් වූහ. මාර්සියොන් (Marcion) යනු උග්‍ර තපස් වෘත අනුගමනය කිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළ ක්‍රිස්තු භක්තිකයෙක් විය. ඔහු විසින් නිර්දේශ කරන ලද උග්‍ර තපස් වෘත අනුගමනය කිරීම සහ කොන්දේසි විරහිතව ලිංගික සම්බන්ධතා අත්හැර දැමීම කෙරෙහි ක්‍රිස්තු භක්තිකයින් තුළ ඔහු කෙරෙහි බලවත් ආකර්ෂණයක් ඇති කිරීමට සමත් විය. එසේ නොවන්නට ඔහුගේ ඉගැන්වීම් ක්‍රිස්තියානි ආශ්‍රමික ජීවිතයේ ඉතිහාසය සහ කතෝලික පල්ලියේ වර්ධනය කෙරෙහි එතරම් බලපෑමක් ඇති නොකරන්නට ඉඩ තිබුණි.

සිනොපි (Sinope) නැමති නගරයේ උපත ලැබූ මාර්සියොන් ඉතා ඉක්මනින් සාර්ථක නැව් හිමියෙක් සහ වෙළෙන්දෙක් බවට පත්විය.

පොහොසත් වෙළඳ ව්‍යාපාරිකයකු වූ ඔහු ආගමික ප්‍රශ්න කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන්නට පටන් ගත්තේය. නොස්ටික් (Gnostic) අදහස් පිළිගත් මාර්සියොන් පැරණි තෙස්තමේන්තුවට ආදේශකයක් වශයෙන් ශුද්ධ ග්‍රන්ථයක්ද රචනා කළේය. නොස්ටික් වාදියකු වූ මාර්සියොන් පැරණි තෙස්තමේන්තුවේ සඳහන් කර ඇති යුදෙව් ජාතිකයින් විශ්වාස කළ දෙවියන් වහන්සේ වනාහි හුදෙක් ලෝකයේ මැවුම්කරුවා (Demiurge) ලෙස සලකනු ලැබීය. සෑම නිර්මාණයක්ම අසම්පූර්ණ නිසා මෙම දෙවියන්ද නපුරු දෙවියකු බව ඔහු ප්‍රකාශ කළේය. එපමණක් නොව ලෝකයේ මැවීම හා කිසිසේත්ම සම්බන්ධයක් නොමැති වෙනත් අප්‍රකට දෙවියකු සිටින බවත් ඔහු අයත්වන්නේ ආලෝකයෙන් පිරුණු යහපත් දිව්‍යලෝකයකට බවත් (Pure Spirits Realm of Lights) මෛත්‍රියෙන් පිරුණාවූ එම යහපත් දෙවියන් විසින් මිනිසුන් කෙරෙහි අනුකම්පාවෙන් ක්‍රිස්තුස් වහන්සේ මායාවී ශරීරයක් (Illusory Body) සහිතව, ගැලවුම්කාරයකු ලෙස මෙලොවට එවන ලද බවත් ඔහු ප්‍රකාශ කළේය. ඔහු රෝමයේ පිහිටි කතෝලික පල්ලියේ අභිවෘද්ධිය පිණිස විශාල මුදල් සම්භාරයක් පරිත්‍යාග කළේය. එහෙත් ඔහුට එම අදහස් රෝමයේ විසූ දේවධර්මවේදීන්ට ඒත්තු ගැන්වීමට නොහැකිවිය. ක්‍රි. ව. 144 දී පමණ මාර්සියොන් ක්‍රිස්තියානි සභාවෙන් තෙරපා දමා මිථ්‍යාදෘෂ්ටිකයකු ලෙස හංවඩු ගසනු ලැබීය. නමුත් ඔහු ඉන් අධෛර්යට පත්වූයේ නැත. ඔහු කතෝලික පල්ලියට විරුද්ධව ආගමික නිකායක් පිහිටුවා ගත්තේය. එම ආගමික නිකාය දෙවන ශත වර්ෂයේ මැද භාගයේදී ජස්ටින් (Justin) විසින් පිළිගනු ලැබීමෙන් පසු ලොව පුරා ව්‍යාප්ත විය. කතෝලික පල්ලිය විසින් මාර්සියොන් උග්‍ර මිථ්‍යාදෘෂ්ටිකයකු ලෙස සලකනු ලැබුවේ මුත් ඔහු විසින් ආරම්භ කරනු ලැබූ පල්ලිය මගින් ඇතිකළ අභියෝගයට මුහුණ දීමට කතෝලික පල්ලියට සිදුවිය. දෙවන සහ තුන්වන ශත වර්ෂවලදී එයට කතෝලික පල්ලියට වඩා වැඩි බලයක් පැවති අතර විශාල බලපෑමක් කිරීමටද හැකිවිය.

සුළු ආසියාවේ රටවල විසූ බොහෝ බැතිමතුන් මාර්සියොන් වටා එක් රැස්වූහ. එකල බිහිවෙමින් පැවති ක්‍රිස්තියානි ආශ්‍රමික ජන සමාජ කෙරෙහි ඔහු විසින් දේශනා කළ තපස් ව්‍රත ඇතුළත් ආගම මගින් විශාල බලපෑමක් ඇති කළේය. තුන්වන ශත වර්ෂය වනවිට සිරියානු තාපසයින් තමන්ට පුරුදු සමාජ සම්බන්ධතා සහ සාම්ප්‍රදායික ජීවන ක්‍රමය අත්හැර දමා ආරණ්‍යවාසී තාපසයින් (Anchorites) ලෙස ජීවත්වීම පිණිස පාළුකරයට පැමිණියේය.

මෙසේ හුදකලාව ජීවත්වූ තවුසන් ඈත අතීතයේ පටන් එම ප්‍රදේශයේ පැවති තපස් ව්‍රත අනුගමනය කිරීමේ පැරණි සම්ප්‍රදාය දෙස

එම් බැලුහ. ජනාවක ජොහන් පාළුකරයේ විසූ එවැනි තාපසයෙකි. මානුස් යනු තවත් එවැනි තාපසයෙකි. මානුස් පලතුරු පමණක් අනුභව කළ බවත්, කොළ අතු පැළඳ සිටි බවත්, එමෙන්ම ශරීරය පිරිසිදුව තබා ගැනීම සඳහා නිතර සීතල වතුර ස්නානය කළ බවත් ෆ්ලේවියස් ජොසෆස් සඳහන් කරයි.

තුන්වන ශත වර්ෂයේ දෙවන භාගයේදී පමණ ඇන්තනි නමැති පුද්ගලයෙක් මධ්‍යම ඊජිප්තියානු කාන්තාරයට එවැනි කණ්ඩායමක් රැගෙන ආවේය. පළමු තාපස ජනාවාසය පිහිටුවන ලද්දේ ඔහු විසිනි. එනිසා ක්‍රිස්තියානි ආගමේ ආශ්‍රමික ජීවිතයේ මුල් ආරම්භය සිදු විය. ඉන් පසු තාපස ජනපද විශාල ප්‍රමාණයක් ඊජිප්තුවේ පිහිටුවනු ලැබීය. ඉන් සමහරක් නම් හියරකාස් (Hierakas) යටතේ නයිල් ඩෙල්ටාවේ ලියොන්ටොපොලිස් නගරයේත් (Leontopolis), අමුන් (Amun) යටතේ නිට්‍රින් (Nitrin) කාන්තාරයේත්, මකාරියෝස් (Makarios) නැමති ඊජිප්තු ජාතිකයා යටතේ සේටියන් (Scetian) කාන්තාරයේත්, පැලේමොන් (Palaimon) යටතේ ඉහළ ඊජිප්තුවේත් පිහිටුවනු ලැබූ තාපස ජනාවාස වේ.

සැබෑ ආශ්‍රමික ජීවිතය ස්ථාපිත කරනු ලැබුයේ ඊජිප්තුවේ ඉහළ තීබේඩ් (Thebaid) ප්‍රදේශයෙන් පැමිණි පැකොමියෝස් (Pachomios) නැමැත්තා විසිනි. පැකොමියෝස් ක්‍රි. ව. 320 දී පැලේමොන්ගේ තාපස ජනාවාසය හා සම්බන්ධවී ඩෙන්ඩේරා (Dendera) ආසන්නයේ පිහිටි ටැබෙනිසි (Tabennisi) හි ආශ්‍රමයක් පිහිටුවන ලදී. පැකොමියෝස් තාපස සමාජ පාලනය කිරීමේදී පිළිපැදිය යුතු නීතිරීති සකස් කළේය. එම තාපසාරාමය පිහිටුවීමෙන් පසු ඔහු තවත් ආශ්‍රම අටක්ද කන්‍යාරාම (Nunneries) දෙකක්ද පිහිටුවන ලදී. අශෝක රජතුමා විසින් ධර්මදූත සේවාවේ යොදනු ලැබූ භික්ෂූන් වහන්සේලා විසින් ගතකළ ආශ්‍රමික ජීවිතයන් ඒවා පවත්වා ගැනීමේදී අනුගමනය කරනු ලැබූ නීතිරීති පළමුවරට ස්ථාපිත කරණු ලැබුවේ ඊජිප්තුවේය. ක්‍රිස්තියානි ආශ්‍රමික ජීවිතය ඊජිප්තුවෙන් ආරම්භ වී අනෙකුත් මධ්‍යධරණී රටවලට ව්‍යාප්ත විය. ආශ්‍රමික ජන සමාජ පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අදහස් ලබා ගැනීම සඳහා බැතිමතුන් විවිධ ප්‍රදේශ වලින් ඊජිප්තුවට පැමිණියහ. ආශ්‍රම පාලනය කිරීම සඳහා පැකොමියෝස් විසින් සම්පාදනය කරනු ලැබූ නීති රීති බැසිල් (Basil), කැසියන් (Cassian) සහ නුර්සියාවේ බෙනඩික්ට් (Benedict of Nursia) වැනි පුද්ගලයින්ට ආශ්‍රම පවත්වා ගත යුතු ආකාරය පිළිබඳ වැදගත් ආදර්ශයක් සපයා දුන්නේය.

එමෙන්ම ඊජිප්තියානු ආශ්‍රමික ජීවිතයේ පුරුෂාර්ථ ගෝල් (Gaul)

දක්වා ව්‍යාප්ත කරනු ලැබීය. පසු කාලයේදී බටහිර රටවල ව්‍යාප්තවූ ආශ්‍රමික සම්ප්‍රදාය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ දැඩි නීති රීති ඇතුළත් කැසියන්ගේ අදහස් ක්‍රමවත් ලෙස සකස් කරන ලද්දේ ක්‍රි. ව. 480-547 කාලය තුළ ජීවත්වූ නුර්සියාවේ බෙනඩික්ට් විසිනි. පළමුවරට එහිදී පූජකයින් ආශ්‍රමය තුළ පදිංචි විය යුතු බවට නීතියක් *(Stabilitas Loci)* පනවනු ලැබීය.

පැකොමියස්ගේ පූජකයින් අතර භාවනා කිරීම *(Practice of Meditatio)* වැදගත් තැනක් ගත්තේය.[72] ඔවුනු තම විවේක කාලය එදිනෙදා ජීවිතය පිළිබඳ එතරම් වැදගත් නොවන කටයුතු වල යෙදීමට වඩා දෙවියන්ගේ ආනුභාවයෙන් රචනා කරන ලද පොත පත පරිශීලනය කිරීම සඳහා යොදා ගත්හ. මෙහිදී තෙරපියුටා සහ එසීන්වරුන්ගේ ආභාෂය ලැබූ ක්‍රිස්තියානි සම්ප්‍රදාය ඊජිප්තුවේ සහ සිරියාවේ ආගමික ජීවිතය කෙරෙහි ව්‍යාප්තව ගොස් තිබෙන සැටි අපට පැහැදිලි ලෙස දැකගත හැකිය.[73] ආශ්‍රමික ජීවිතය ආරම්භවූ මුල් යුගයට අයත් පූජකයින් නිදි වර්ජනය කරමින් ආගමික වතාවත්වල යෙදීම ශුද්ධ ග්‍රන්ථවල ඇතුළත් කරුණු නොකඩවා ශබ්ද නගා කියවීම *(Lectio Continua)* වැනි කටයුතු වල යෙදුනහ. මෙම ආගමික වතාවත් කුම්රාන් ආගමික සමාජයේ පැවති නීතිරීති වල ඇතුළත් අණ පනත් වලට බොහෝ දුරට සමානය. (1QS 6:6-8)

ක්‍රිස්තියානි ආශ්‍රමික ජීවිතයේ පුරෝගාමීන් වූ ඊජිප්තුවේ විසූ තෙරපියුටාවරු භික්ෂුත්වය පිළිබඳව පැවති බෞද්ධ පුරුෂාර්ථ වලට අනුකූලව කටයුතු කළහ. ඉන්දියාවේ විසූ සංචාරක භික්ෂූන්ට වර්ෂා සෘතුවේදී ගම් දනව් වල සැරිසැරීම දුෂ්කරවූත්, අනතුරුදායක වූත් කටයුත්තක් විය. ඒ නිසා වර්ෂා සෘතුවේදී ඔවුන්ට ආරාමයක ජීවත්වීමට සිදුවිය. නමුත් ඊජිප්තුවේ වාසය කළ භික්ෂූන්ට ඉන්දියාවේ විසූ භික්ෂූන් මෙන් එසේ මාරුවෙන් මාරුවට සංචාරය කිරීමට සහ ආශ්‍රම තුළ කල් ගෙවීමට සිදුවූයේ නැත. ජේසුස් වහන්සේටද ආශ්‍රම ඇතුළත් ජන සමාජයක ජීවත්වීමට අවශ්‍යතාවයක් නොතිබුණි. උන්වහන්සේටද බෞද්ධ සම්ප්‍රදායට අනුකූලව ගම් දනව් වල සැරිසරමින් ධර්මදූත සේවාවේ යෙදීමට හැකිවිය. තෙරපියුටා භික්ෂූන් සහ එසීන්වරු ඉතා සරල පැල්පත් වැනි ආශ්‍රම වලත් පසුකාලයේදී කුම්රාන් වැසියන් ලෙන් තුළත් ජීවත්වූයේ ශුද්ධා හීන පුද්ගලයින්ගෙන් ඈත්ව ජීවත්වීම පිණිසය.[74]

කෙසේ වෙතත් නුර්සියාවේ බෙනඩික්ට් විසින් පස්වෙනි ශතවර්ෂයේදී පනවන ලද ආශ්‍රමික ජීවිතය පිළිබඳ නීතිරීති වල පවා

බෞද්ධ ලක්ෂණ පැහැදිලි ලෙස ඇතුළත් වී තිබේ. බෞද්ධ ආශ්‍රමික පිළිවෙත් ත්‍රී ශික්ෂා *(trishiksha)* යනුවෙන් (තෙවදෑරුම් හික්මීම) හැඳින්වේ. එයට ශීලය (සදාචාරාත්මක පුහුණුව), සමාධි (භාවනා කිරීමෙන් සිත අරමුණු කිරීම), ප්‍රඥා (ලිඛිත ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් බුද්ධිය වර්ධනය කිරීම) යන අංග තුන ඇතුළත් වේ. බෙනඩික්ටියානු පිළිවෙත් තුළද මීට සමාන අංග තුනක් ඇතුළත් වේ. ඒවා ඔපස් මානුම්. *(Opus Manum)*, ඔපස් ඩෙයි *(Opus Dei)* සහ ලෙක්ටිඕ ඩිවිනා *(Lectio Divina)* යනුවෙන් හැඳින්වේ.

ශීලය යනුවෙන් හුදෙක් සදාචාරාත්මක ජීවිතයක් ගතකිරීමට වඩා වැඩි දෙයක් අදහස් වේ. අනෙක් මිනිසුන්, සතුන් සහ අප්‍රාණවාචී වස්තූන් කෙරෙහි අප අනුගමනය කරන එදිනෙදා ජීවිතයට සම්බන්ධවූ සමස්ත චර්යා ධර්ම පද්ධතියම එයට ඇතුළත් වේ. බෙනඩික්ටියානු පූජකයින් ලෝකය කෙරෙහි දක්වන ගෞරවය ඔපස් මානුම් යනුවෙන් හැඳින්වේ.

භාවනා කිරීමේදී සහ වැඳුම් පිදුම් කිරීමේදී පවත්වාගත යුතු චිත්ත ඒකාග්‍රතාවය 'සමාධි' යනුවෙන් හැඳින්වේ. මීට සමගාමී බෙනඩික්ටියානු ක්‍රියා මාර්ගය ඔපස් ඩෙයි *(Opus Dei)* හෙවත් දිව්‍යමය සේවාව (God's Work) යනුවෙන් හැඳින්වේ. දිනපතා පවත්වන දේව මෙහෙය (Liturgy) සහ සත් ප්‍රසාද පූජාව (Mass) ඊට ඇතුළත් වේ. බුද්ධත්වය පිළිබඳ නිරන්තරයෙන්ම පැහැදිලි අවබෝධයකින් යුක්තව කටයුතු කිරීම පහසුවීම පිණිස බෞද්ධයින් අළුයම අවදි වී ආගමික වතාවත් සිදුකරන්නාක් මෙන් බෙනඩික්ටියානු පූජකයෝද ක්‍රිස්තුස් වහන්සේගේ ආගමනය කෙයි මොහොතක හෝ සිදුවේය යන බලාපොරොත්තුවෙන් අලුයම අවදි වී විවිධ සූත්‍ර සහ ශාස්ත්‍ර වල ඇතුළත් කරුණු හොඳින් පරිශීලනය කරති. එසේ ලබාගන්නා දැනීම තුළින් ලබන අවබෝධය ප්‍රඥාව වශයෙන් හැඳින්වේ. මේ ආකාරයෙන්ම *Lectio divina* යනුවෙන් අදහස් වන්නේ ශුද්ධ ග්‍රන්ථ සජ්ඣායනා කිරීමේදී ඒවාට සන්සුන්ව සහ සැලකිලිමත්ව ඇහුම්කන්දීමය. මේ අවස්ථා දෙකේදීම (ඉහත සඳහන් කරන ලද) ත්‍රිශික්ෂා අන්‍යෝන්‍ය වශයෙන් හානිපූරක ලෙස ක්‍රියා කරයි.

ක්‍රිස්තියානි ආශ්‍රමික ජීවිතය කෙරෙහි පෙරදිග බලපෑම ඇතිවූයේ අහම්බෙන් නොවේ. එය බටහිර ලෝකයේ සමස්ත ආගමික ජීවිතය කෙරෙහිම බලපෑවේය. ආශ්‍රමික ජීවිතය සමග වර්ධනය වූ පාවුළුතුමාගේ පල්ලියට එය ආරම්භ වූ මුල් ශතවර්ෂවලදී එහි පැවැත්ම ආරක්ෂාකර ගැනීම සඳහා වෙනත් බොහෝ ආගම්, දර්ශනවාද සහ ගුප්ත ආගමික ව්‍යාපාර සමඟ තරඟ කිරීමට සිදුවූයේ ඒ නිසාය.

අවසානයේදී ක්‍රි. ව. හතරවන ශත වර්ෂයේදී රෝම අධිරාජ්‍යා විසින් කතෝලික පල්ලියට පක්ෂව කරුණු කාරණා තීරණය කර ඊට රාජ අනුග්‍රහය ලබාදෙන තෙක් මෙම තරගය පැවතිණ. ඉන්පසු පාවුළු තුමා විසින් අනුදත් පල්ලියට විරුද්ධ වූ ලබ්දීන් යටපත් කරනු ලැබීය. කෙසේ වෙතත්, එසේ යටපත් කරනු ලැබූ ලබ්දීන්ට අයත්වූ විවිධ ආගමික පූජා විධි, උත්සව, දේවස්ථාන, සැක්‍රමන්ට් (Sacrament) නමින් හැඳින්වෙන විශේෂ ආගමික චාරිත්‍ර සහ පුරාණෝක්ති ක්‍රිස්තියානි ආගම තුළට ඇතුල් කරන ලදී. මෙසේ ක්‍රිස්තියානි ආගමේ ඉතිහාසයේ මුල් කාලවලදී එළිදරව්ව පිළිබඳ ප්‍රකාශ, ගුප්ත විශ්වාස, නොස්ටික් චින්තනය, ආගම් පිළිබඳ පෙරදිග පැවති අදහස් සහ සමහර විට ප්ලේටෝගේ පටන් ප්‍රොක්ලස් (Proclus) දක්වා වූ ග්‍රීක් දාර්ශනිකයින්ගේ අදහස් පවා ආගමික විශ්වාස වලට එකතු කරන ලදී.[75] මෙහිදී බුදු දහමෙන් ලබාගෙන ඇති වඩාත් කැපී පෙනෙන අංග ලක්ෂණ නම් රෝමානු කතෝලික ආගමික චතාවත් සඳහා යොදාගෙන ඇති හිසමුඩු කිරීම, නවගුණවැල්, (Rosaries), සුවඳ දුම්, ඝණ්ටාව, ධාතු වන්දනා කිරීම, ආශ්‍රම, උපසම්පදාව ලැබූ භික්ෂූන් සහ සාමණේරයන් වහන්සේලා අතරත්, භික්ෂුණීන් අතරත් පවතින වෙනස, පාපෝච්චාරණය කිරීම (Confessions) සහ බ්‍රහ්මචර්යාව (Celibacy) වැනි අංග වේ. තේරුම් ගැනීමට තරමක් දුෂ්කර 'නවගුණවැල' (Rosary) යනුවෙන් හැඳින්වෙන වචනය ජපමාලා (යාඥා කිරීමේදී භාවිතා කරන ඇට වර්ගයක්-Prayer Bead) නමින් හැඳින්වෙන ඉන්දීය වචනයේ වැරදි පරිවර්තනයකි. දීර්ඝ 'අ' ශබ්දය සහිත ජප (Japa) යන වචනයෙන් රෝස (Rose) යන අර්ථය ගම්‍ය වේ. හ්‍රස්ව 'අ' ශබ්දය සහිත ජප (Japa) යන වචනයෙන් 'යාඥාව' යන අර්ථය ගෙනදේ. නවගුණ වැලක ඇතුළත් කර ඇති ඇට සංඛ්‍යාවද බෞද්ධයන් පාවිච්චි කරන නවගුණ වැලක ඇති ඇට සංඛ්‍යාවට සමානය.[76]

චිත්‍ර ශිල්පය පිළිබඳ ඉතිහාසඥයකු වන ජේම්ස් ෆර්ගසන් (James Fergusson) මුල් ක්‍රිස්තියානි පල්ලිවල දක්නට ලැබෙන බොහෝ ලක්ෂණ, එනම් පල්ලියේ මැද කොටස (Nave) සහ ආසන අතර දෙපස මාර්ගය (Side Aisle) අර්ධ ගෝලාකාර APSE යනුවෙන් හැඳින්වෙන ඇතුළට නෙරා ඇති [illegible] සාදා ඇති ගර්භය සහ කුරුසියේ හැඩයට සකස් කරන ලද බිම් සැලැස්ම බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාෂය ලබා ඉදිකර තිබෙන බව පෙන්නුම් කරදී තිබේ. ඊට උදාහරණයක් වශයෙන් ක්‍රි. පූ. 78ට අයත් කාර්ලි (Karli) හි පිහිටා ඇති ගල් විහාරයක් ඔහු ඉදිරිපත් කරයි. එහි ඇති පූජාසනයේ දිග, පළල සහ එය සකස් කර ඇති ආකාරය නොර්විච් දේවස්ථානයේ (Norwich Cathedral) සහ කේන්හි පිහිටි ඇබේ ඔ හොම් (Abbaye Aux Hommes at Caen) නමැති

දේවස්ථානයේ තිබෙන පූජාසන වලට බොහෝ දුරට සමාන බව පෙන්වා දී තිබේ. ක්‍රිස්තියානි දේවස්ථානවල අල්තාරයක් තිබෙන අතර බෞද්ධ පන්සල් වල දාගැබක් තිබේ. රහතන් වහන්සේලාගේ ධාතු නිදන් කර ඇති උඩුවියනක් හෝ කවාකාර වැස්මක් දාගැබ යනුවෙන් හැඳින්වේ. දාගැබ තුළ රහතන් වහන්සේලාගේ ධාතු නිදන්කර ඇත්තේ යම්සේද එපරිද්දෙන්ම ශාන්තුවරයින්ගේ ධාතු අල්තාරය තුළ තැන්පත් කර තිබේ.[77]

ජේසුස් වහන්සේ පහළවීමට අවුරුදු දෙසීයකට පමණ පෙර පෙරදිග සිට ඊජිප්තුවට පැමිණි 'මිත්‍ර' වන්දනාව නමින් හඳුන්වනු ලැබූ ආගමික ව්‍යාපාරය පළමුවන සහස්‍රකය ආරම්භයේදී රෝමයටද පැතිර ගියේය.[78] එය ඉක්මනින් රෝම අධිරාජ්‍යය තුළ පැතිර ගොස් ඉතා බලසම්පන්න ආගමක් බවට පත්විය. ක්‍රිස්තියානි පල්ලිය බිහිවූ මුල් කාලයේදී මිත්‍ර වන්දනාව එයට මහත් අභියෝගයක් ලෙස පැවතුනි. 'මිත්‍ර' යනු ඉන්දීය සහ පර්සියන් පුරාණෝක්තිවල සඳහන් වන දේවතා සමූහයට අයත් එක් දෙවියෙකි. 'මිත්‍ර' යනු මිත්‍රත්වය, විවාහය සහ ගිවිසුම්වැනි මානව සම්බන්ධතාවලට අනුග්‍රහය දක්වන දිව්‍ය ලෝකය හා මනුෂ්‍ය ලෝකය ආරක්ෂා කරන බොරු කීමට හා වැරදි කිරීමට ඉඩ නොදෙන දෙවියකු ලෙස පෙරදිග ඉන්දියාවේ වන්දනයට පාත්‍ර වූ දෙවියෙකි. පර්සියන් වරු 'මිත්‍ර' හැඳින්වූයේ ආලෝකයේ දෙවියන් ගේ පණිවිඩ කරුවකු ලෙසය. හිරු උදාවත් සමග අහසේ විද්‍යමාන වන 'මිත්‍ර' සුදු අශ්වයින් සිව් දෙනෙක් විසින් ඇදගෙන යනු ලබන විසිතුරු ලෙස අලංකාර කරනු ලැබූ රථයකින් අන්තරීක්ෂය හරහා ගමන් කරයි. ඔහු ලෝකයේ පවතින ආලෝකය සහ අඳුර අතර බේරුම්කරුවකු ලෙසත් නපුරට විරුද්ධව කරන සටනේදී මනුෂ්‍ය වර්ගයාගේ මිත්‍රයකු ලෙසත්, සදාකාලික ජීවනය ලබාගැනීම සඳහා ආත්මයට මග පෙන්වන්නකු ලෙසත් සලකනු ලැබීය. ශරතුස්ත්‍ර විසින් පළකර ඇති අනාවැකියකට අනුව, හිරු දෙවියන් ලෝක විනිශ්චය ආරම්භ වූ විට මනුෂ්‍ය වේශයෙන් ලොව පහළවී සර්ව බලධාරී දෙවි කෙනෙක් මෙන් ග්‍රීක සහ රෝම ආධිපත්‍යය පැතිර තිබූ ප්‍රදේශය පුරා තම ආධිපත්‍යය පතුරුවනු ලබයි. ඒ කාලයේදීම පෙරදිග රටවල ජීවත්වන බෞද්ධයින් විශ්වාස කරන පරිදි මෛත්‍රී බෝධිසත්වයින් ලොව පහළවී සත්වයා දුකින් මුදාගනු ලබයි.

මෛත්‍රී නමැති නාමේ නිරුක්තිය පිළිබඳව සලකා බලන විට දක්නට ලැබෙන මෙම සමානකම් චිත්තාකර්ෂණීය වේ. මෛත්‍රී නමැති වචනයෙන් මිත්‍ර, කාරුණික වැනි අරුත් ගම්‍ය වේ. එය සංස්කෘත භාෂාවේ එන 'මිත්‍ර' (යාළුවා, පාක්ෂිකයා) නමැති වචනයෙන් බිඳිවිත් තිබේ. පෞද්ගලික නාමක් වශයෙන් යොදාගත හොත් 'මෛත්‍රී' යන වචනයෙන් 'මිත්‍රයාගේ පුත්‍රයා' යන අර්ථය පවා ලැබේ.[79] මෛත්‍රී මෙන්ම මිත්‍රද

ලෝක විනිශ්චය එළඹෙන තුරු දෙව්ලොව වාසය කරන බව කියවේ. නියම කාලය එළඹුන විට ඔවුහු මහපොළවට පැමිණෙති.

ජනප්‍රවාදයට අනුව ගැලවුම් කාරයා උපදින්නේ කන්‍යාවකගේ කුසයෙනි. ඔහුගේ උපත එඬේරුන් මැද සිදුවේ. ඔවුන් අලුත උපන් කුමරුවාට නමස්කාර කරයි. ලෝකයේ පවතින නපුර දුරු කිරීමේ සටන කෝටස් (Cautes) සහ කොටෝපේට්ස් (Cautopates) යන දෙවිවරු දෙදෙනා ඉදිරිපිට ගවයකු සමඟ කරන ජයග්‍රාහී සටනකින් කූටප්‍රාප්තවේ. අනතුරුව මිත්‍ර එම දෙවිවරු දෙදෙනා සමඟ දිව්‍යමය ත්‍රි මූර්තියක් ගොඩ නගයි. මිත්‍ර ස්වර්ගයට යනතෙක් මියැදෙන ගොනාගේ ශරීරයෙන් ඉරිඟු (පාන්) සහ මිදි (වයින්) සැදෙන්නට පටන් ගනී.[80] සූර්ය රථයෙන් දිව්‍ය ලෝකයට යන මිත්‍ර එහිදී ආලෝකයේ දෙවියන් විසින් ලෝක පාලකයා ලෙස සිංහාසනාරූඪ කර මළවුන් නැගිටුවා විනිශ්චය ලබාදීම සඳහා නැවත මේ ලෝකයට එවනු ලැබේ.

මෙය අතීතයේදී සිදුවූ දෙයක්ද නො එසේ නම් අනාගතයේදී සිදුවන දෙයක්ද යන කාරණය ජනප්‍රවාදයේ පැහැදිලි ලෙස සඳහන් කර නොමැත. කෙසේ වෙතත් 'මිත්‍ර' දෙවියන් විශ්වාස කරන පුද්ගලයින් කල්පනා කරන්නේ ඔහු ඉදිරියේදී පහළවන දෙවියකු බවය. මිත්‍රගේ පැමිණීම අපේක්ෂාවෙන් සෑම වර්ෂයකදීම උත්සවයක් පවත්වනු ලැබේ. සෑම වසරකම දෙසැම්බර් මස 24-25 දිනවලදී පවත්වනු ලබන මෙම උත්සවය ඔවුන් සමරන උත්සවය අතුරින් වඩා වැදගත් උත්සවය වේ. තවත් විශාල වාර්ෂික උත්සවයක් වසන්ත කාලය ආරම්භ වනවිට පවත්වයි. දෙවියන් උදෙසා සතිපතා පැවැත්වෙන පූජාව දෙවියන්ගේ දිනය ලෙස සැලකෙන සෑම ඉරිදා දිනකම පවත්වනු ලැබේ. වඩා වැදගත් අභිචාර පිළිවෙතක් නම් කුරුසියේ සලකුණ සහිතව දෙවියන්ට කැප කරනු ලැබූ සත් ප්‍රසාද පූජ පෙත්තක ස්වරූපයෙන් පිරිනමනු ලබන වයින් සහ පාන් වලින් සමන්විත වූ ආහාර වේලකි. කතෝලික පල්ලිය විසින් පවත්වනු ලබන ආගමික උත්සව වලට සමාන තවත් ආගමික උත්සව හයක්ද මිත්‍ර වන්දනාවේ ඇතුළත් විය. කෙනෙක් ආගමට ස්ථිර ලෙස ඇතුළත් කරගැනීමේදී කම්මුල් පහරක් ගැසීමේ සිරිතද (දළිම් කර්මය) ඊට ඇතුළත් විය. පූජක ධූරාවලියක් අනුව සංවිධානයවූ 'මිත්‍ර' ආගමේ ආධ්‍යාත්මික නායකයා හඳුන්වනු ලැබුයේ පියවරුන්ගේ පියා යන අර්ථය දෙන පාටර් පාට්‍රෙම් (Pater Patrem) නමැති තනතුරු නාමයෙනි. එම තනතුර රෝමන් පාප් වහන්සේට සමාන පදවියකි. පාප් වහන්සේට අයත් සාන්ත පීතර දේවස්ථානය (Church of St. Peter) ගොඩ නගන ලද්දේ මිත්‍ර ආගමට අයත් අඩවියකය.

හතරවන ශතවර්ෂය ආරම්භයේදී කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යා විසින් කතෝලික ක්‍රිස්තියානිය (Catholic Christianity) රාජ්‍ය ආගම ලෙස ප්‍රකාශයට පත් කළ අවස්ථාවේදී එකල ජනප්‍රිය වී තිබූ මිත්‍ර ආගමේ පැවති දේව මෙහෙයට අයත්වූ ක්‍රමවේදයන් ක්‍රිස්තියානි ආගමට ඇතුළු කිරීම හැර වෙනත් විකල්පයක් නොවිය. මිත්‍ර ආගමේ ප්‍රධාන මධ්‍යස්ථානය පිහිටා තිබුණේ දකුණු ජර්මනියේය. ඒ අනුව තත්කල ක්‍රිස්තුස් වහන්සේගේ උපත සැමරීමේ උත්සවය ලෙස ප්‍රකාශයට පත්කර ලදී. එතැන් පටන් කතෝලික පල්ලිය මගින් පවත්වනු ලැබූ සියලුම දේව මෙහෙයයන් ඉරිදා දිනවලදී පවත්වනු ලැබිය. මිත්‍ර ආගමේ පැවති සියලුම ආගමික වතාවත් ක්‍රිස්තියානි ආගමට ඇතුල් කරන ලදී. සත්ප්‍රසාද පූජාව යනු 'මිත්‍ර' ආගමේ පැවති ගුප්ත විශ්වාස සැමරීමට වඩා වැඩි යමක් නොවේ.[81]

දාර්ශනික ඥානය

පෙරදිග පැවති අදහස් සහ ක්‍රිස්තියානිය එකිනෙකට හමුවීම සහ එකී අදහස් ක්‍රිස්තියානිය සමග ඒකාබද්ධ වීම සිදුවූයේ ඉරාන සහ ඉන්දීය සංස්කෘතීන් හෙලනිසියානු සභ්‍යත්වය පැතිර තිබූ ප්‍රදේශවලට ක්‍රම ක්‍රමයෙන් ව්‍යාප්ත වීම හේතු කොටගෙනය. ජේසුස් වහන්සේ වටා ගොඩනැගුනු මුල් ආගමික ව්‍යාපාර මගින් කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ජේසුස් වහන්සේගේ චරිතාපදානය නිර්මාණය කිරීම සඳහා එම අදහස් සහ කථා ප්‍රවෘත්ති යොදා ගෙන තිබේ.

එවූ අදහස් පැනනැගුණු තෝතැන්න නොසිස් දර්ශනය (Gnosis) යනුවෙන් හැඳින්වේ. ශුභාරංචියේ පොත් ලියූ සමහර කතුවරයින් විසින් ඉදිරිපත් කර ඇති විස්තර තොරතුරු සහ ජේසුස් වහන්සේගේ සැබෑ දේශනාවලට සම්බන්ධ නැති බෞද්ධ කථා ප්‍රවෘත්ති ක්‍රිස්තියානි පොත්පත් වල ඇතුළත් වී තිබෙන්නේ කෙසේද යන කාරණය තේරුම් ගැනීමට එමගින් හැකිවේ.

නෝසිස් නැමති වචනය අර්ථ නිරූපනය කිරීම තරමක් අපහසුය. එය ඉතා සංකීර්ණවූත්, අතිශයින්ම චිත්තාකර්ෂණීයවූත් ආගමික ප්‍රපංචයක් (Religious Phenomenon) ලෙස හැඳින්වීමට පුළුවන. නෝසිස් නමින් හැඳින්වෙන මෙම චින්තනය බිහිවූයේ හෙලනිසියානු යුගයේදී ඊජිප්තුවේ සිට සිරියාව සහ සුළු ආසියාව හරහා හෙලනිසියානු සංකලනවාදය (Syncretistic Movement) මැදපෙරදිග රටවල පැතිර යාමේ ප්‍රතිඵලයක් වශයෙනි. පෙරදිග රටවල මෙම දර්ශනවාදය ගොඩනැගීම කෙරෙහි

ඉරාන චින්තනයේ ඇතුළත් ද්විත්වය (Iranian Dualism) පිළිබඳ විශ්වාසය බලපා තිබෙන බව පෙනේ. බැබිලෝනියාවේදී එයට ජ්‍යොතිශ් ශාස්ත්‍රයට සම්බන්ධ සංකේත භාවිතය (Astrological Symbolism) එකතුවිය. පුනර්භවය පිළිබඳ විශ්වාසය සහ දෙවියකු සහ ගැලවුම් කරුවකු බිහිවීම ඇතුළත් අනේක විධ විශ්වාස සමූහයක් එයට ඉන්දියාවෙන් ලැබුණි. ඊජිප්තුව, සිරියාව, ග්‍රීසිය සහ රෝමය යන රටවලින් අභිචාර විධි සහ ගුඪ ආගමික ලක්‍ෂණ ඊට ඇතුල් විය. යුදෙව් ආගමික සංකල්ප මගින් පුරාණෝක්තිවල සඳහන් වන 'මැවීම' පිළිබඳ කථා ප්‍රවෘත්ති එයට එකතුවිය. මෙසේ විසිර පැවතුනු විවිධ අදහස් එක්තැන් කොට ඒවා නව ප්ලේටෝවාදී සහ නව පයිතගරස්වාදී අදහස් වලට විවෘත වීමෙන් අලුත් චින්තන ක්‍රම බිහිවන්නට පටන් ගත්තේය.

'නෝසිස්' නමැති වචනයේ අර්ථය 'ඥානය' හෙවත් දැනීමය. සංස්කෘත භාෂාවෙන් 'බෝධි' (Bodhi) යනුවෙන් හැඳින්වෙන වචනයේ ග්‍රීක් පරිවර්තනය නෝසිස් වේ. බුද්ධාගම යන වචනය බිඳී විත් තිබෙන්නේ බෝධි නැමති වචනයෙනි. බෞද්ධයින් නමින් අදහන ආගම පෞද්ගලික අත්දැකීම් සහ එම අත්දැකීම් ඔස්සේ සාක්ෂාත් කරගත හැකි උසස් තත්වයක් පවතින බව වටහා ගන්නේ යම්සේද එපරිද්දෙන්ම නෝස්ටික් නමින් හැඳින්වෙන මෙම ඥානවාදීන් ඊට සමාන ආකාරයෙන් දෙවියන් වහන්සේගේ රාජ්‍යය වෙත ළඟාවීමට උත්සාහ කරයි. නෝසිස් යනු බුද්ධාගම මෙන්ම විශ්වාසය මත පදනම්වූ ආගමක් නොවේ. විශ්වාසය (*Pistis*) වෙනුවට එහි ඇත්තේ දැනීමය (*Gnosis*). ලෝකයේ සෑම දෙයකම පවතින ද්විත්වය පිළිබඳ සංකල්පය අවබෝධ කරගැනීම නෝස්ටික් චින්තනයේ පදනම වේ. මේ ලෝකය වනාහි අඳුරින් වැසීගිය අමනකවීම් සහ නපුරින් පිරීගිය ස්ථානයකි. නසෙන් දේවස්තෝත්‍රයක (Naassene Psalm) මෙසේ සඳහන් වේ: 'අවිද්‍යාව හේතුකොට ගෙන ලෝකය භීතියෙන් හා ශෝකයෙන් පිරී තිබේ.' පැරණි තෙස්තමේන්තුවේ සඳහන්වන ලෝකය මැව්වේය'යි විශ්වාස කරනු ලබන දෙවියන්ට සමානකම් ඇති නපුරු දෙවියකු විසින් මේ ලෝකය නිර්මාණය කර තිබේ. ලෝකය මැවීමේ ක්‍රියාව යහපත් දෙවියන්ගෙන් ඈත්වීමකි. ජීවයේ ආලෝකයෙන් පිරුණු ක්ෂේත්‍රය පාලනය කරනු ලබන එම අප්‍රකට යහපත් දෙවියා ලෝකය මැවීම නිසා ඇතිවූ අයහපත් තත්වයට කොහෙත්ම සම්බන්ධ නැත. කෙසේවෙතත්, මෙම යහපත් දෙවියා සතු ගුණාංග සෑම මිනිසකු තුළ බීජයක් මෙන් රෝපණය වී තිබෙන බව විශ්වාස කෙරේ.

අනේක විධවූ ලෞකික ආශාවන් අතර පෘතග්ජන මිනිසා අතරමංවී සිටී. මෙම තත්වය බෞද්ධයින් හඳුන්වන්නේ තණ්හාව හෙවත්

භවයට ඇති ආශාව, නොහොත් භව තණ්හාව වශයෙනි. ඒ නිසා ඔවුන්ට යථාර්ථය දැකීමට නොහැකි වේ. නෝස්ටික් දර්ශනවාදීන් එසේ නොවේ. ඔවුන් තමා තුළ පවතින අදෘශ්‍යමාන ආලෝකය වෙත හැඹුරු වී තමා තුළ සැඟවුන සැබෑ ආධ්‍යාත්මික ශාන්තියක් තිබෙන බව අවබෝධකරගෙන සියලු ලෞකික සැප සම්පත් හැරදමා ආධ්‍යාත්මික දියුණුව කෙරෙහි සියලු උත්සාහයන් යොමු කරනු ලැබේ. ලෞකික සැප සම්පත් වලින් පිරීගිය ගිහි ජීවිතය අතහැරදමා ආධ්‍යාත්මික ගුණවගාව වැඩි දියුණු කර ගැනීම කෙරෙහි යොමුකරවනු ලබන බුදු දහම මෙම දර්ශනවාදය බිහිවීම කෙරෙහි අනුපමේය වූ ආදර්ශයක් ලෙස ක්‍රියාකාර තිබෙන බව මෙහිදී විශේෂයෙන් කිය යුතු නොවේ. උදාහරණයක් වශයෙන් බැසිලිඩස්ගේ නෝස්ටික් චින්තන ක්‍රමය (Basilides's Gnostic System) තුළ බෞද්ධ බලපෑම් සම්පූර්ණයෙන්ම දක්නට ලැබේ.[82] මිථ්‍යාදෘෂ්ටික ආගම් දවයම් කළ හිපෝලිටස් වැනි පුද්ගලයින් නොස්ටික් දර්ශනවාද කෙරෙහි එල්ලකළ එක් චෝදනාවක් වූයේ ඒවා කෙරෙහි ඉන්දීය අදහස් බලපා තිබෙන බවය.

අතීතයේ විසූ පල්ලියට සම්බන්ධ පූජකවරුන් සැබෑ රෝමානු කතෝලික පල්ලිය ගොඩනැගීමේදී මෙම නෝස්ටික් දර්ශන මිථ්‍යා දෘෂ්ටික විශ්වාස ලෙස හෙළාදකිමින් ඒවාට එරෙහිව කටයුතු කිරීම නිසා එම දර්ශනවාද කොතරම් වැදගත් බලපෑමක් කර තිබේද යන කාරණය පැහැදිලි වේ. කෙසේ වෙතත් අවසානයේදී නෝස්ටික් දර්ශනවාදයේ ඇතුළත් සමහර විශ්වාස කතෝලික දේව ධර්මය තුළට ඇතුළත් කර ගැනීමට සිදුවිය. මෙම දේව වේදය ප්‍රධාන වශයෙන් වර්ධනය වූයේ නෝස්ටික් ඉගැන්වීම් වල මධ්‍යස්ථානය වූ ඇලෙක්සැන්ඩ්‍රියාවේය. ක්ලෙමන්ට් (150-214) සහ ඔරිගන් (185-254) වැනි පූජකවරු වාසය කලේත් ඔවුන් තම ආගමික කටයුතු මෙහෙයවනු ලැබුවේත් එහි සිටය. ක්ලෙමන්ට් නමැති පූජකතුමාට ඉන්දීය ආධ්‍යාත්මික චින්තනය පිළිබඳ වැටහීමක් තිබුණා පමණක් නොව එතුමා බුදුන් වහන්සේගේ ඉගැන්වීම පිළිබඳවද දැන සිටියේය. උදාහරණයක් වශයෙන් ආත්මය සංක්‍රමණය වීම සම්බන්ධයෙන් ඔහු විසින් කර ඇති ප්‍රකාශයකින් ඒ බව මැනවින් පැහැදිලි වේ. "ලෝකයේ පදනම දැමීමටත් පෙර අපි ජීවත් වූයෙමු. මන්ද අපි දෙවියන් වහන්සේ සමඟ ජීවත්වීම නිසා මින් පෙරද ජීවත් වූවෙමු. දෙවියන්ගේ තාර්කික නිර්මාණයන් වන අපි උන්වහන්සේගේ මාර්ගයෙන් මින් පෙරද ජීවත්වූයෙමු.[83] එක් ජීවිතයකට පසු තවත් ජීවිතයක් ඇතිවන හෙයින් ක්‍රමානුකූලවත් අඛණ්ඩවත් අප අමරණීයත්වය කරා යොමු කරවනු ලැබේ.[84]

ක්ලෙමන්ට්ගේ ශිෂ්‍යයකු මෙන්ම අනුප්‍රාප්තිකයාද වූ ඔරිගන්

සංවිධානාත්මක ක්‍රිස්තියානි දේවවේදයේ නිර්මාතෘවරයා විය. ඔහුට ඇමෝනියස් සක්කාස් (Ammonius Sakkas) නොහොත් ඇමෝනියස් ද සේකර් (Ammonius the Saker) නම්වූ ගුරුවරයෙක් සිටියේය. මෙහි දැක්වෙන 'සේකර්' නැමති නම ප්‍රභවය වී තිබෙන්නේ ක්‍රි. ව. පළමුවන ශතවර්ෂයේ මැද භාගයේදී උතුරු ඉන්දියාව යටත් කරගෙන කනිෂ්ක අධිරාජ්‍යා යටතේ බුද්ධාගමට පුනර්ජීවනයක් ලබා දුන් ඉරානයේ සිදියන් වරුන්ගෙන්ද එසේ නැතිනම් 'ශාක්‍ය' නමැති නාමින්ද යන්න පැහැදිලි නැත. එය බිඳිවිත් තිබෙන්නේ ශාක්‍ය නමැති වචනයෙන් නම් ඔහු බෞද්ධ භික්ෂූන් වහන්සේ කෙනෙක් බව සිතිය හැකිය.[33] කෙසේ වෙතත්, මුල් යුගයේ විසූ වැදගත් ක්‍රිස්තියානි දේවධර්මවේදියකු වූ ඔරිගන් ඉන්දියාව පිළිබඳ ඔහු තුළ පැවති දැනීම සාජුවම බෞද්ධ ගුරුවරයකු මාර්ගයෙන් ලබාගන්නට ඇතැයි සිතිය හැකිය.

ඔරිගන් නොස්ටික්වාදය සහ බුද්ධාගම පිළිබඳව අධ්‍යයනය කිරීමේදී බෞද්ධ පුරුෂාර්ථ කෙරෙහි මහත් ගෞරවයක් දැක්වූ ෆිලෝ ගේ අදහස් සැලකිල්ලට ගෙන තිබීම මෙහිදී විශේෂයෙන් කැපී පෙනේ. මහායාන ඉගැන්වීම් වල බුදුන්වහන්සේගේ පහළවීම පිළිබඳව සඳහන් කර ඇති විස්තර තොරතුරු පදනම් කරගෙන ඔහු දෙවියන්ගේ විද්‍යමාන වීම පිළිබඳ ක්‍රිස්තියානි ආගමේ දැක්වෙන විස්තරය ඉදිරිපත් කර තිබේ. මෙහිදී ජේසුස් වහන්සේ මනුෂ්‍යයෙක් මෙන්ම දෙවියෙක් වශයෙන්ද හඳුන්වාදෙන ආගමික න්‍යායයක් හඳුන්වාදීමට ඔහු ක්‍රමානුකූල උත්සාහයක් දරා තිබෙන බව අපට පෙනේ. එම න්‍යාය ගොඩනැගීම සඳහා යෝග්‍ය පදනමක් ජේසුස් වහන්සේගේ ආධ්‍යාත්මික නිජභූමියේ පැවතුනි. ඓතිහාසික වශයෙන් ලොව පහළවූ බුදුන් වහන්සේ ස්වභාවිකත්වය ඉක්ම වූ (Super Natural), උත්කෘෂ්ට (Transcendent), බුදුවරයකුගේ අවතාරයක් (Incarnation) ලෙස මහා සංඝිකයින්ගේ ඉගැන්වීම් වල සඳහන් වේ. එම ඉගැන්වීම් වලට අනුව මහායාන දාර්ශනිකයින් ත්‍රිකාය පිළිබඳව බුද්ධවාදය (Buddhology) ගොඩ නැගූහ. ත්‍රිකාය පිළිබඳ විශ්වාසයට අනුව බුදුන් වහන්සේට ශරීර තුනක් තිබෙන බව ඉගැන්වේ. එම ඉගැන්වීම් වලට අනුව 'ආදි බුද්ධ' නමින් හැඳින්වෙන සැබෑ බුදුන් යනු රූපකායකින් තොරවූ විශ්වයේ පවත්නා ධර්මතාවයක් ලෙස සැලකේ. ආදි බුද්ධ තත්වයෙන් 'ධ්‍යානි බුද්ධ' යනුවෙන් හැඳින්වෙන දිව්‍ය ලෝකයේ වාසය කරන පුද්ගලයකුගේ ස්වරූපයෙන් පෙනී සිටින බුදු කෙනෙක් බිහිවේ. එම ධ්‍යානි බුදුන් වහන්සේ සසර පැවැත්මේ ඇති දුක පිළිබඳව මිනිසුන්ට අවබෝධ කරදී ඔවුන් ඉන් අත්මුදවා ගැනීම පිණිස මනුෂ්‍යවේශයෙන් මහ පොළවේ උපත ලබයි. එවිට උන්වහන්සේ 'මානුෂී බුද්ධ' යනුවෙන් හැඳින්වේ, මෙම ත්‍රිකාය උපකාරයෙන්

බුදුන්වහන්සේ විවිධ ස්වරූප තුනකින් පෙනී සිටි. එම ස්වරූප තුන පහත දැක්වේ.

1. ධර්මකාය : ධර්මස්කන්ධය හෙවත් අනානුභූතික සත්‍යයෙන් යුත් නිරපේක්ෂ බුදුන් වහන්සේ හෙවත් සියලු සත්වයින්ගේ මූල තත්වය ඉන් හැඟවේ.
2. සම්භෝගකාය : සැපවිඳින ශරීරය, දිව්‍යමය බුද්ධ පරාදීසයක වැඩ වසන බුදුන් වහන්සේගේ ශරීරය
3. නිර්මාණකාය : කාය විපර්යාසය නොහොත් බුදුන් වහන්සේ විසින් ආරෝපණය කරගනු ලබන ලෞකික ස්වරූපය මින් අදහස් වේ.

බුදුවරයෙක් මෙලොව පහළවීමේදී ඇතිවී දිරාපත්වන ලෞකික ශරීරය නිර්මාණකාය යනුවෙන් අදහස් වේ. මායාවී ශරීරයක් ලෙස සැලකෙන නිර්මාණකාය බෞද්ධ පොත් පත්වල විපරිනාමයට පත්වන ශරීරයක් ලෙස හඳුන්වා දී තිබේ. මෙම අදහස ඩෝසෙටිසම්* (Docetism) යනුවෙන් හැඳින්වෙන නොස්ටික් ගුරුකුලයේ විශේෂ අවධානයට ලක්විය. ඒ අනුව ජේසුස් වහන්සේ ලොව පහළ වූයේ මායාවී ශරීරයකිනි. එයින් ව්‍යාජ ශරීරයක් හෝ සැබෑ ජේසුස් වහන්සේට වඩා වෙනස් පුද්ගලයෙක් අදහස් වන නිසා උන්වහන්සේ කුරුසියේ තබා ඇනගැසීමේ සිද්ධිය එතරම් වැදගත් නොවන බව කියවේ. පැරණි කතෝලික පල්ලියේ උග්‍ර විරුද්ධවාදියෙකු වූ මාර්කියොන්ගේ ඉගැන්වීම් වලටද ඩොසෙටික් අදහස් ඇතුළත්ව තිබේ. එවැනි අදහස් බයිබලයේ එන රෝමන්වරු (රෝමන්වරු 8:3), පිලිප්පිවරු (පිලිප්පිවරුන් 2:7:2) සහ කොරින්තිවරු (කොරින්ති 5:16) වෙත යවන ලද හසුන් වල බොහෝ තැන්වල දක්නට ලැබේ. පාවුලු තුමාගේ හසුන් වල ඇතුළත් බොහෝ කරුණු මාර්කියොන්වාදී ව්‍යාජ ලේඛන වල ඇතුළත් කොටස් බවට ප්‍රසිද්ධියේ චෝදනා එල්ල කරන අයට එම කොටස් තම මතය තහවුරු කිරීම සඳහා යොදාගනු ලැබිය. පාවුලුතුමාගේ හසුන්වල ඇතුළත් බෞද්ධ සදාචාරාත්මක ඉගැන්වීම් පැහැදිලි කර දිය හැක්කේ එම පදනම යටතේය. එකල පැවති නොස්ටික් අදහස් කෙරෙහි පැවති උනන්දුව පෙරදිග සිට බටහිරට මුඛ පරම්පරාගතව ගලා ආ ආගමික අදහස් ප්‍රවාහය නැමති මහා ගංගාවෙන් අදහස් උරාගනු ලැබූ මුදු හස්තක් මෙන් ක්‍රියා කළේය. පාවුලුතුමා විසින් රෝමන්වරුන්ට යැවූ ලිපියේ (රෝමන්වරු 12:17) මෙසේ සඳහන් වේ:

* ඩෝසෙටිසම් යනුවෙන් අධිමානුෂ ශක්තීන් පිළිබඳ ඉගැන්වීම් අදහස් වේ.

'කිසිවෙකුට නපුරට නපුර නොකරන්න'; මහාභාරතයේ (3, 198:43) 'නපුරට නපුරින් පිළිතුරු නොදෙන්න' යනුවෙන් දක්වා තිබේ. 'කෙනෙක් වපුරන දෙය ඔහුගේ අස්වැන්න වේ.' (මහාභාරතය 12, 287:44); එම අදහසටම පාවුළුතුමා විසින් ගලාතිවරුන් වෙත යවනු ලැබූ හසුනේ (ගලාතියන් 6:7) 'මිනිසෙක් තමා වපුරන දෙයම කපා ගන්නේය' යනුවෙන් දැක්වේ. බුදු කෙනෙක් ලෞකික පැවැත්මෙන් මිදී බුද්ධ පරාදීශයේ වැඩ වාසය කරන්නේ සම්භෝගකාය මගිනි. එය ශුද්ධ දේශයේ වැඩවසන බුදුන් වහන්සේගේ තේජස්වී ශරීරය වේ. මෙම අදහස නොස්ටික් චින්තනය තුළද දක්නට ලැබේ. ඒ අනුව ආත්මය වසාගෙන තිබෙන ඇඳුමක් මෙන් පවතින සැහැල්ලු ශරීරයක් අදහස් වේ.

මෙම අදහස පිළිබඳ කාව්‍යමය ප්‍රකාශනයක්ද ක්‍රිස්ටියන් ඇක්ට්ස් ඔෆ් තෝමස් නමැති ආගමික ලියවිල්ලේ (Christian Acts of Thomas) "සෝන්ග් ඔෆ් ද පර්ල්" (Song of the Pearl) ඇතුළත් වේ. බුදුකෙනෙකුගේ මෙලොව ජීවිතයට සම්බන්ධ මායාවී ශරීරය මියගිය පසුවත් උන් වහන්සේට අධිස්වභාවික ලෝකයක වැඩ වාසය කරමින් සම්භෝගකාය මගින් ඇතැම් පුද්ගලයකුට ආශිර්වාද කළ හැකිය. ජේසුස් වහන්සේගේ Q දේශනා තවදුරටත් වැඩිදියුණු කරමින් තෝමස්ගේ ශුභාරංචියේ එවැනි අදහස් වල බලපෑම් දක්නට ලැබේ: "ජේසුස් වහන්සේ මෙසේ කීහ. 'ඔබ පැමිණියේ කොහෙන්ද'යි කෙනෙක් ඔබෙන් ඇසුවොත් 'අප පැමිණියේ ආලෝකයෙනි. ආලෝකය ඇතිවන්නේ කොතනින්ද එතැනින් අපි පැමිණියෙමු'යි පිළිතුරු දෙන්න." යනුවෙන් තෝමස්ගේ ශුභාරංචියේ සඳහන් කර තිබේ. (තෝමස් 50)

බුදුවරයකුගේ සම්භෝගකාය සංජානනය කළ හැක්කේ බෝධිසත්වයකුට පමණක්ය යන මහායාන අදහස ස්වර්ග රාජ්‍යය ඔහිවීමට පෙර එය දැකිය හැකිබව පිළිගත් යුදෙව්වන් අතර පැවති විශ්වාසය පැහැදිලි කිරීම සඳහා ෆිලෝ යොදා ගත්තේය. ඔරිගන් පවා ත්‍රිකාය පිළිබඳවූ මෙම මහායාන බෞද්ධ අදහස තම දර්ශනයට ඇතුළත් කර තිබෙන බව මුල් ක්‍රිස්තියානි දේවවේදය සහ බුදු දහම අතර පැවති සම්බන්ධතා කෙරෙහි අවධානය යොමුකළ සුප්‍රසිද්ධ කතෝලික දේවධර්මවේදියකු වූ හෙන්රි ඩි ලූබැක් (Henri de Lubac) විසින් පෙන්වා දෙන ලදී. එහෙත් වනිකානු සභාව ඔහුගේ ලියවිලි තහනම් කරනු ලැබීය.[56] ඔරිගන් ජේසුස් වහන්සේගේ විද්‍යමානවීමේ දිව්‍යමය ස්වරූපය (මෙය ධර්මකායට සමානය) සහ ගැලවුම්කාරයකු ස්වරූපය (නිර්මාණකාය) වශයෙන් පැහැදිලි ලෙස වෙන්කර දැක්විය. එම වෙනස "උන්වහන්සේ එක්තරා කන්දකට වැඩම කළ අවස්ථාවේදී උන්වහන්සේගේ ශරීරය

වෙනස් තත්ත්වයකට පත්විය. රූප විපර්යාසයක් සිදුවී උන්වහන්සේ එසේ වූ අවස්ථාවේදී රැස්ව සිටි පිරිසට එම වෙනස දැකගත හැකිවිය." (මතෙව් 17:1 මාක් 9:1). එම රූප විපර්යාසය ඉතා කී සම්භෝගකායට අනුකූලවේ. බෞද්ධ මූලාශ්‍ර වලින් ලබාගත් කරුණු සැහෙන ප්‍රමාණයක් ඇතුළත් කර ඇති ඔරිගන් විසින් ලියන ලද එක් පොතක් අවසාන කර තිබෙන්නේ බුදුන් වහන්සේ විසින් කරන ලද ධර්මනීතිය (*Lotus of Good Law*) පිළිබඳ දේශනාවක් අවසානයේදී යොදාගන්නා ලද වචන ඒ ආකාරයෙන්ම යොදා ගැනීමෙනි.[57]

නව ප්ලේටෝවාදයේ නිර්මාණකරුවා වූ ප්ලෝටිනස් නමැති දාර්ශනිකයා (205-70) ඔරිගන්ගේ සමකාලීනයකු විය. ඔහු නොස්ටික් අදහස් තවදුරටත් වැඩි දියුණු කළේය. ඔහු තම චින්තනය තුළින් ඉන්දියානු දාර්ශනික අදහස් කොතරම් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබේදයත් එය සාංඛ්‍ය දර්ශනයේ වෙනස් ස්වරූපයක් ලෙස පෙනීයයි. සමහරවිට ඔහු රෝමන් අධිරාජ්‍යාවූ තුන්වන ගෝඩියන් ගේ හමුදාවට බැඳී ඉන්දියාවට ගොස් මෙම දර්ශනවාදය ඉගෙනගන්නට ඇතැයි සිතිය හැකිය.

නොස්ටික් සහ බෞද්ධ චින්තනය ක්‍රිස්තියානි සාහිත්‍යයට ඇතුළත් වී තිබෙන අතර ශුභාරංචියේ පොත් ලියූ කතුවරයින්ටද එම බලපෑමෙන් මිදීමට නොහැකිවිය. ක්‍රි. ව. 170 පමණ ඩයටිසරන් (Diatesseron) නමින් හඳුන්වනු ලබන සිරියානු හෝ ග්‍රීක් භාෂාවෙන් රචනා කරන ලද පළමු ශුභාරංචියේ පොත් එකතු කර සංග්‍රහයක් ලෙස සකස්කරන ලද්දේ ටේෂියන් (Tatian) නමැති පුද්ගලයකු විසිනි (ග්‍රීක් භාෂාවෙන් ඩයටිසරන් යනුවෙන් අදහස් කරන්නේ හතරක් මගින් යන්නය). ඉරේනියස් (Irenaeus) සඳහන් කර ඇති පරිදි ටේෂියන් යනු එන්ක්‍රැටික්ස් (Encratics) නමින් හැඳින්වූ ක්‍රිස්තියානි ආගමික නිකායක ප්‍රධානියාය. ඔවුහු විවාහ නොවූ අතර මස් කෑමෙන් වළකින ලෙස සිය අනුගාමිකයන් ගෙන් ඉල්ලා සිටියේය. ඔවුන් දෙවියන් පිළිබඳ පවතින විශ්වාසයෙන් බැහැරව ඇති බව ප්‍රකාශ කරමින් පාවුළුතුමා තිමෝතියස් වෙත යැවූ පළමුවන හසුනේ (4:1-4) කොටසක සඳහන් කරතිබේ. සමහර විට ඔවුන් විසින් අනුගමනය කරන්නට ඇත්තේ ජේසුස් වහන්සේ විසින් දැරූ ආගමික අදහස් වලට වඩාත් කිට්ටුවූ ආකල්පයක් වන්නට ඇතිබවත් ආගමික විශ්වාසයෙන් බැහැරව ගොස් සිටින්නේ පාවුළුතුමා බවත් පෙනීයයි. එන්ක්‍රැටික් වරුන්ගේ දර්ශනය කෙරෙහි ඉන්දියානු ජිම්නොසොෆිස්ට් වරුන්ගේ ආභාෂය ලැබී තිබෙන බව හිපෝලිටස් (Hippolytus) සඳහන් කරයි.[58] හිපෝලිටස් යනු බ්‍රාහ්මණයන් සහ ඔවුන්ගේ විශ්වාස පිළිබඳ විස්තරාත්මක තොරතුරු වාර්තාකරනු ලැබූ පල්ලියට සම්බන්ධ පියතුමෙකු විය. එනිසා

තමා විසින් වාර්තා කළ කරුණු පිළිබඳව ඔහු හොඳින් දැන සිටියේය.[29] එවැනි පදනමක් යටතේ ශුභාරංචියේ තොරතුරු සුසංයෝගී කිරීම පල්ලියේ බලධාරීන් පිළිගැනීමට සූදානම් වූයේ නැත.

පස්වන ශතවර්ෂයේ මුල් කාලයේදී ඩයටිසරන් නමින් හඳුන්වනු ලැබූ ශුභාරංචිය පිළිබඳ පොතේ සියලුම පිටපත් ඒ පිළිබඳව ඒෆ්‍රම් (Ephraem) විසින් ලියන ලද අටුවාවද ඇතුළුව විනාශ කර දමනු ලැබීය. වෙනත් විකල්ප පිටපත් නොමැතිබව තහවුරු වූ පසු පල්ලියට සම්බන්ධ ප්‍රධාන පෙළේ පූජකයින් විසින් ඔවුන්ට අවශ්‍ය පරිදි නොගැළපේ යයි ඔවුන්ට හැඟීගිය කොටස් විශාල ප්‍රමාණයක් ඉවත් කර නව තෙස්තමේන්තුවේ ඇතුළත් ශුභාරංචියේ පොත් රචනා කළහ. ඒවායේ ඇතුළත් කරුණු ක්‍රිස්තියානි ධර්මය ලෙස ප්‍රකාශ කරන ලදී.[30]

ශුභාරංචියේ පොත්වලින් විශාල කොටසක් රචනා කර තිබෙන්නේ බුදු දහමේ සහ ශරතුස්ත්‍රවාදයේ ඇතුළත් ඉගැන්වීම් වල ආභාෂය ලබා ඇති නෝස්ටික් අදහස් පුළුල ව්‍යාප්තව පැවති ඇලෙක්සැන්ඩ්‍රියාවේ හෝ ඊට කිට්ටු ස්ථානයකදීය. ජේසුස් වහන්සේ පිළිබඳව පැවති ආගමික ව්‍යාපාරවලට සම්බන්ධ නොවී බෞද්ධ අදහස් රාශියක් මෙම චින්තන නාලිකා ඔස්සේ ගලා ආවේය.

ජොහන්ගේ ශුභාරංචියේ එවැනි බෞද්ධ අදහස් විශේෂයෙන් කැපී පෙනේ. මෙම පොතේ ආරම්භයේදීම ඇමරිකානු පර්යේෂකයකු වූ ජේ. එඩ්ගාර් බෲන්ස් ජොහන්ගේ ශුභාරංචිය සහ දේවධර්මවේදය 'ක්‍රිස්තියානි බුද්ධාගම' (Christian Buddhism) වශයෙන් හඳුන්වනු ලැබූ බව අපි සඳහන් කෙළෙමු. එම ශුභාරංචිය ලියූ කතුවරයා බෞද්ධ තොරතුරු විශාල ප්‍රමාණයක් ඒ සඳහා උපයෝගී කරගෙන තිබෙන බව බෲන්ස්ගේ පොතෙන් පෙන්නුම් කර තිබේ. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් අතුරින් උන්වහන්සේට විශේෂයෙන් ප්‍රේමකළ තැනැත්තා පිළිබඳ චරිතය මෙහිදී විශේෂයෙන් කැපී පෙනේ. ශුභාරංචියේ අනෙක් පොත්වල කිසි තැනක ජේසුස් වහන්සේට උවටැන් කරනු ලැබූ එවැනි උපස්ථායකයකු පිළිබඳව සඳහන් නොවේ. ජොහන්ට අනුව මෙම අග්‍ර උපස්ථායකයා ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වල විශ්වසනීයත්වය තහවුරු කරනු ලබන ප්‍රධාන චරිතයකි. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින් අතුරින් තෝරාගනු ලැබූ උන්වහන්සේගේ විශේෂ ආදරයට පාත්‍ර වූ මෙම ශ්‍රාවකයා උන් වහන්සේ පිළිබඳ සැබෑ සාක්ෂියක් ලෙස පවතී. (ජොහන් 13:23). ජේසුස් වහන්සේට මුහුණ පෑමට සිදුවූ අවසාන ශෝචනීය අවස්ථාව දක්වාම ඔහු තම ශාස්තෘවරයා අත් නොහැරියේය. (ජොහන් 19:26). අවසානයේදී උන්වහන්සේට අත්වූ ඉරණම ඔහු සියැසින්ම දුටුවේය. ඒ පිළිබඳව වාර්තාකර තැබුවේය. (ජොහන් 21:24).

අතීතයේදී ජේසුස් වහන්සේ ප්‍රේමකළ තැනැත්තා වශයෙන් මෙම ශුභාරංචිය ලියූ කතුවරයා විසින් හඳුන්වා දී ඇති ශ්‍රාවකයා ශුභාරංචියේ ඇතුළත් තොරතුරු පිළිබඳ සාක්ෂි දරන පුද්ගලයකු වශයෙන් මහත් ප්‍රසිද්ධියට පත්විය. හීබෲ භාෂාවෙන් ලියන ලද මතෙව්ගේ ශුභාරංචිය ග්‍රීක් භාෂාවට පරිවර්තනය කරනු ලැබුවේ ජොහන් විසින් යැයි ප්‍රකාශ කර තිබේ.

ඉතිහාසයේ සුප්‍රසිද්ධ පුද්ගලයින්ට අග්‍ර ශ්‍රාවකයකු සිටීම සාමාන්‍ය සිරිතක්ව පැවතියේය. මෝසෙස්ට ජොසුවා නමින්ද, එලියාට එලිසා නමින්ද, ජෙරමියාට බාරුච් නමින්ද, සොක්‍රටීස්ට ප්ලේටෝ නමින්ද, පීටර්ට මාර්ක් නමින්ද, පෝල්ට ලූක් නමින්ද පසු කාලයේදී (ජනප්‍රවාදයේ සඳහන්වන පරිදි) ජොහන්ට ප්‍රෝකෝරස් නමින්ද අග්‍ර ශ්‍රාවකයකු සිටියේය. නමුත් ඔවුන්ගෙන් කිසිවෙක් තම ශාස්තෘවරයාගේ ආගමික පණිවිඩයේ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ඇපකාරයකු ලෙස ක්‍රියා නොකළහ. බොහෝවිට ඔවුන් ක්‍රියා කළේ විශ්වාසවන්ත ලේකම් වරු වශයෙනි. ජේසුස්වහන්සේට ප්‍රේමකළ මෙම හිතෛෂී ශ්‍රාවකයාට සමාන කළ හැකි වෙනත් ශ්‍රාවකයකු පිළිබඳ ආගමික සාහිත්‍යයේ සඳහන් වී ඇත්තේ එක් අවස්ථාවක පමණි. එනම් ගෞතම බුදුන් වහන්සේගේ ප්‍රියතම ශිෂ්‍යයාවූ ආනන්ද ස්ථවිරයන් වහන්සේය. බුදුන් වහන්සේගේ දේශනා නිවැරදිව ඉදිරියට පවත්වාගෙන යෑමේ වගකීම හෙවත් ධර්ම භාණ්ඩාගාරික ධුරය උන්වහන්සේ වෙත පැවරුණි.[31]

පළමුවන ධර්ම සංගායනාවේදී ආනන්ද ස්ථවිරයන් බුදුන් වහන්සේගේ සියලුම දේශනා ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කළහ. බුදුන් වහන්සේ ජීවමානව සිටියදී 'ආනන්දය, මාගේ දේශනා, තථාගතයන් වහන්සේගේ දේශනා හොඳින් සිහිතබා ගෙන ඒවා ප්‍රසිද්ධ සභාවල් ප්‍රකාශ කරන්න.' යනුවෙන් කරනලද ඉල්ලීම මැනවින් ඉටු කළහ. (අම්තපූර් - ධ්‍යාන-සූත්‍රය 1:7). බුදුන් වහන්සේ තම ශ්‍රාවකයින් සියලු දෙනා ඉදිරියේදී ආනන්ද ස්ථවිරයන් පිළිබඳව මෙසේ ප්‍රකාශ කළ සේක. "ආනන්දය, ඔබ විසින් දිගු කලක් හිතවත්, සුවදායක, එකසිතින්, අප්‍රමාණ මෛත්‍රී සහගත කාය කර්මයෙන්, වාක් කර්මයෙන්, මනෝ කර්මයෙන් තථාගතයන් වහන්සේට උපස්ථාන කරන ලදී" (මහා පරිනිබ්බාන සූත්‍රය 11:145). ජේසුස් වහන්සේ කුරුසියේ ඇන ගසනු ලැබූ අවස්ථාවේදී ජොහන් කුරුසිය ළඟ නතරවී සිටියේ යම්සේද එපරිද්දෙන්ම දෙව්දත් තෙර විසින් බුදුන් වහන්සේ මැරීම සඳහා අවසාන නිෂ්ඵල ප්‍රයත්නය දැරූ අවස්ථාවේදීත් ආනන්ද ස්ථවිරයෝ බුදුන් වහන්සේ ළඟම සිටියහ.

ජොහන්ගේ ශුභාරංචියේ මෛත්‍රී බෝධිසත්වයන් පිළිබඳ සංකල්පය

අපට නැවත හමුවේ. මෛත්‍රී බෝධිසත්වයින් යනු මහාකරුණාවෙන් අනාගතයේදී ලොව පහළවන බුදුන් වහන්සේය. ජොහන්ගේ ශුභාරංචියට අනුව තමන්ගේ නාමයෙන් සහායදායකයාණන් වහන්සේ* (Paraclete) කෙනෙක් එවන බවට ජේසුස්වහන්සේ අනාවැකියක් පළකරයි. ගෞතමයන් වහන්සේද මෛත්‍රී බුදුන් ගැන වරක් මෙසේ ප්‍රකාශ කළහ: "බුද්ධත්වයට පත්වන ඊළඟ පුද්ගලයා මෛත්‍රී බෝධි සත්වයෝය. උන්වහන්සේ මහා කරුණාවෙන් යුක්තවූ මෛත්‍රී බුදුන් වහන්සේ නමින් හඳුන්වනු ලබන්නාහ".[92] බෲන්ස් සඳහන් කර ඇති පරිදි ආනන්ද හිමියන් ශුභාරංචියේ දැක්වෙන සහායදායකයාණන් වහන්සේට සමාන කළ හැකිය. ජොහන්ගේ ශුභාරංචියේ මෙසේ දැක්වේ: "මාගේ නාමයෙන් පියාණන් වහන්සේ විසින් එවන සහායදායකයාණන් වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන් වහන්සේ සියල්ල ඔබට උගන්වමින් මා වදාළ සියල්ල ඔබට සිහිපත් කරවන සේක." (ජොහන් 14:26)

අනාගතයේදී ලොව පහළවන මෛත්‍රී බුදුන් වහන්සේ පිළිබඳ අදහස මුලින්ම ඕහිවූයේ තක්ෂිලා නගරයේදීය. එහි මෛත්‍රී නමින් බුදු කෙනෙක් පහළවන බව ප්‍රකාශකරන සම්ප්‍රදායට දීර්ඝ ඉතිහාසයක් තිබේ. එතැන් සිට එම සංකල්පය ක්‍රිස්තියානි ආගමේ මධ්‍යස්ථානවලට පැතිරුණි. මෛත්‍රී බුදුන් සහ බෝධි සත්වයින් පිළිබඳ අදහස ක්‍රිස්තියානි චින්තනය කෙරෙහි බලපා ඇති ආකාරය කලා නිර්මාණ තුළින් දැකිය හැකිය. මෛත්‍රී බෝධි සත්වයින් එක කකුලක් පොළවේ ගැටෙනසේ වාඩිවී සිටින ඉරියව්වෙන් නිර්මාණය කර තිබේ. (රූප රාමුව 31). බෞද්ධ මූර්ති ශිල්පයට අනුකූලව නිර්මාණය කර ඇති එම පිළිරුවේ දැක්වෙන ඉරියව් නියාම අවස්ථාවට එළඹිවිට දෙව්ලොවින් චුතවී මෙලොව ඉපදීමට සූදානමින් සිටින බව පිළිබිඹු කෙරේ. ගන්ධාර දේශය හා සිරියාව අතර පිහිටි ප්‍රදේශයේදී බොහෝ ආගම් එකිනෙකට හමුවිය. ජේසුස් වහන්සේ ජයග්‍රාහී ලීලාවෙන් එම ඉරියව්වෙන් වාඩිවී සිටින ආකාරය පුරාණ කාලයට සහ මධ්‍යතන යුගයේ මුල් අවස්ථාවට අයත් බයිසන්ටයින් චිත්‍රවල නිරූපණය කර තිබේ. උන්වහන්සේ වාඩිවී සිටින ඉරියව්ව, දනහිස් දෙපසට විහිදී ඇති ආකාරය සහ අත් පිහිටුවා ඇති ආකාරය (මුද්‍රා) මෛත්‍රී බෝධි සත්වයින් වැඩසිටින ඉරියව් වලට බොහෝ දුරට සමාන වේ. හස්ත මුද්‍රාව වෙනුවට ක්‍රිස්තියානි සම්ප්‍රදායට අනුකූලව ශුභාරංචියේ පොතක් උන්වහන්සේගේ අතෙහි තබා තිබේ. (රූප රාමුව 33-35)

---

* ග්‍රීක් : පරාක්ලෙටෝස් - 'උපකාර කරන' සැනසීම දෙන යන අර්ථය ඇති ශුද්ධාත්මයාණන් වහන්සේට භාවිතා කරන තවත් නමකි.

බුද්ධ ජේසුස් සංකල්පය

කතෝලික ආගම රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් පසු අධිරාජයාගේ සහ පාප් වහන්සේගේ නියෝග පිළිපැදීමට සූදානම් නොවූ ආගමික සංවිධානවලට වැඩි කලක් පැවතිය නොහැකි විය. යුරෝපයේ සමහර දුරස්ථ ප්‍රදේශවල කිහිප නොස්ටික් කණ්ඩායම් කීපයක් මධ්‍යතන යුගය දක්වා නොනැසී පැවතුණි. නමුත් එම කණ්ඩායම් පවා අවසානයේදී ඉතා කුරිරු අන්දමින් විනාශ කර දමන ලදී. සිරියාව සහ පර්සියාව වැනි රටවල පැවැති ආගමික කණ්ඩායම්වලට ශුද්ධස්තුවාදී පල්ලිය මඟින් හිංසා කිරීම නිසා ඔවුහු නැගෙනහිර දෙසට, එනම් ඉන්දියාවේ මුහුදුබඩ ප්‍රදේශ වලටත් තාරිම් නිම්නයටත් (Tarim Basin) පලාගියහ. චීනයේ පිහිටි තාරිම් නිම්නය එකල බෞද්ධාගමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් වශයෙන් පැවතියේය. එම ප්‍රදේශය අද හඳුන්වනු ලබන්නේ සිංකියෑං යනුවෙනි. මෙසේ එම ප්‍රදේශවලට අලුතින් පැමිණි නොස්ටික් ආගමික කණ්ඩායම් සහ බෞද්ධ ඉගැන්වීම් අතර සමානකම් පැවති බව 'ටර්ෆාන්' (Turfan) ක්ෂේත්‍ර භූමියේ තිබී සොයාගත් හතර වන ශතවර්ෂයට අයත් පොත්පත් වලින් පැහැදිලි වේ. ක්‍රිස්තියානි නොස්ටික් කණ්ඩායම් සහ බෞද්ධයින් එම ප්‍රදේශවල ජීවත් වූහ. එපමණක් නොව, ඔවුහු පූජනීය ස්ථාන පවා පොදුවේ පරිහරණය කළහ. ජේසුස් වහන්සේ නමැති ගැලවුම්කාරයා පිළිබඳ "ජීසස් මෙසායා සූත්‍රය" (Jesus-Messiah Sutra) නමින් බෞද්ධ සූත්‍රයක් පවා රචනා කරන ලදී. එහි බුදුන් වහන්සේ යහපත් එඬේරාගේ ජේසුස් ලෙස නිරූපණය කර තිබේ.[93] ජනප්‍රවාදයේ එන 'බාර්ලාම්' (Barlaam) සහ ජෝශප් (Joasaph) පිළිබඳ වෘතාන්තවල බුදුන් වහන්සේ කතෝලික පල්ලියේ ශාස්තෘවරයකු ලෙස හඳුන්වා දී තිබේ.

ක්‍රිස්තියානි විරෝධී ඉන්දියානු රජ කෙනෙක් පිළිබඳ අපූරු කථාවක් පළමුවරට ක්‍රි. ව. 675-749 කාලපරිච්ඡේදය තුළ විසූ ජෝන් ඩැමස්කීනස් (John Damascenus) නමැති පල්ලියේ විද්වතෙකු විසින් ඉදිරිපත් කර තිබේ. එම රජුට පුත් කුමරකු ලැබෙන බවත්, එම කුමරා ක්‍රිස්තියානි ආගමේ ඉගැන්වීම් පිළිගන්නා බවත් දෛවඥයෝ අනාවැකි පළ කළහ. එම අනාවැකි සැබෑවේයයි බියට පත් රජතුමා තම පුතා බාහිර ලෝකය සමඟ කිසිම සම්බන්ධතාවක් ඇතිවීමට ඉඩ නොදී ඇති දැඩි කරනු ලබයි. රජතුමා පුත් කුමරුවාට ලෞකික ජීවිතයකින් ලැබිය හැකි සියලු වස්තුව හා සැප සම්පත් ලබා දෙයි. එක් දිනක් රජමාලිගයට පැමිණි ක්‍රිස්තියානි පූජකයෙක් කුමරුවාට ක්‍රිස්තියානි ආගමේ ඇතුළත් පණිවුඩය

උගන්වයි. ක්‍රිස්තු ධර්මය වැළඳ බෞතිස්ම ස්නාපනය ලබා ගන්නා කුමරු ලෞකික සැප සම්පත් අත්හැර දමා තම ශාස්තෘවරයා සමග පාළුකරයට යයි. මෙම වෘතාන්තය ලලිත විස්තරයේ දැක්වෙන බුද්ධ ශාක්‍යමුනිගේ ළමා කාලය සහ තරුණ කාලය පිළිබඳ පවතින කථා ප්‍රවෘත්තියේ ක්‍රිස්තියානි අර්ථකථනයක් බව පැහැදිලිය.

මෙසේ බුදුසමය සහ ක්‍රිස්තියානිය සම්මිශ්‍රණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිරියාව සහ ඉන්දියාව අතර පිහිටි රටවල "බුද්ධ ජේසුස්" (Buddha Jesus) නමැති ස්වචාරී සංකල්පය බිහිවිය. එවැනි සංකල්පයක් ඇතිවීම අරුමයක් ලෙස අපට නොපෙනේ. එමනිසා මෙම ආගම් දෙක හොඳින් සුසංයෝගීව තිබෙන්නට ඇතැයි සිතීමට කෙනෙක් පෙළඹේ. මෙසේ දුක් විඳින ජනතාවට විමුක්තිය සලසාදීම සඳහා ධර්ම ප්‍රචාරක කටයුතු කිරීම සඳහා ජේසුස් වහන්සේ තම ආගමික මෙහෙය ආරම්භ කළ මුල් ස්ථානයටම උන්වහන්සේගේ ඉගැන්වීම් නැවත වරක් පැමිණියේය. එහෙත් එම ඉගැන්වීම් රැගෙන ආවේ ක්‍රිස්තු භක්තිකයින් විසින් නොවේ. යටත් පිරිසෙයින් ක්‍රිස්තියානි පල්ලිය විසින් පිළිගෙන ඇති අන්දමට තුන්වන ශත වර්ෂයේදී එකී ඉගැන්වීම් නැවත වරක් හඳුන්වා දෙනු ලැබුවේ කතෝලික පල්ලිය විසින් මිථ්‍යා දෘෂ්ටිකයන් ලෙස සලකනු ලැබූ 'මානි' නම් වූ ආගමික ශාස්තෘවරයාගේ අනුගාමිකයින් විසිනි. 'මානි' යනු ඉතිහාසයේ සඳහන් වන ආගමික නිර්මාතෘවරුන් අතරින් කැපී පෙනෙන ශාස්තෘවරයෙකි.

ක්‍රි. ව. 216-276 කාලයේදී වාසය කළ 'මානි' මෙසපොටේමියාවේ 'එල්කසේට්ස්' (Elchasaites) නමින් හැඳින්වූ යුදෙව් ක්‍රිස්තියානි බැප්ටිස් ආගමික සමාජයක් තුළින් බිහි වූ පුද්ගලයෙකි. ඔහු තමා සහායදායකයන් වහන්සේ ලෙස (Paraclete) සැලකුවේය. මානිච ආගම (Manichaeanism) යනුවෙන් අද අප හඳුන්වන ආගමේ නිර්මාතෘවරයා වූයේ ඔහුය. මානිච ආගම මගින් ක්‍රිස්තියානිය හා බුද්ධාගම ඒකාබද්ධ කර එම ආගම් දෙකටම වඩා උසස් ආගමක් බිහිකිරීමට මානි උත්සාහ කළේය. ඔහු තමා ජේසුස් වහන්සේගේ 'අපෝස්තුලුවරයකු' (Apostle) ලෙස හඳුන්වා ගනිමින් ධර්ම ප්‍රචාරය සඳහා දුර බැහැර ප්‍රදේශවලට පිටත්ව ගියේය. එවැනි එක් ගමනකදී ඔහු ඉන්දු නිම්නයට සහ බලුකිස්තානයට පැමිණ එම ප්‍රදේශ පාලනය කළ ප්‍රාදේශීය පාලකයා තම ආගමට හරවා ගත්තේය. ඉන්දියාවේදී ඔහුට පුනර්භවය පිළිබඳ සංකල්පය පිළිබඳව දැනගන්නට ලැබුණි. ඔහු එම සංකල්පය තම අදහස්වලට එකතු කර ගත්තේය. නොබෝ කලකින් විශාල අනුගාමිකයින් පිරිසක් ඔහු වටා රොක් වූහ. පසුකාලයේදී මානි වෙනුවෙන් ලියන ලද ස්තෝත්‍රයක ඔහුට 'බුද්ධමානි' යනුවෙන් ආමන්ත්‍රණය කර තිබේ.[34] 'බුදුන් වහන්සේගේ පහළවීම පිළිබඳ

පොත' (*Book of the coming of the Buddha*) නමැති කෘතියේ මානි යනු ජේසුස් වහන්සේගේ නැවත පහළවීමක් ලෙස සඳහන් කර තිබේ.

'මානි' යනු බුදුසමයේ සහ ක්‍රිස්තියානි ආගමේ දැක්වෙන ඉගැන්වීම් ඇතුළත් 'නොස්ටික් මානිච දර්ශන' තුළින් බිහි වූ ශාස්තෘවරයෙකි. ඔහුට බුද්ධ ජේසුස් යනුවෙන් ආමන්ත්‍රණය කරන ලදී. මානිච ආගමේ ඉගැන්වීම් වලට අනුව විමුක්තිය සලසා ගත් පුද්ගලයින් ආලෝකයේ රාජ්‍යයට යන බවත්, එය පාලනය කරනු ලබන්නේ නිර්වාණයේ රජයා විසින් බවත් සඳහන් වේ. පාරිශුද්ධත්වය, ආලෝකය, වීර්යය සහ ප්‍රඥාව යනුවෙන් හැඳින්වෙන ධර්මකාය සතරකින් සමන්විත වූ මෙම නිර්වාණයේ රජුට ආලෝකයේ පියා යැයිද කියනු ලැබේ. මෙහිදී සිදු වී තිබෙන්නේ චතුර්විධ ගුණයන්ගෙන් හෙබි දෙවියකු පිළිබඳව පවතින ඉරාන සංකල්පය බුදු දහමේ දැක්වෙන වචන යොදා විග්‍රහ කර ක්‍රිස්තියානි ආගමේ සන්දර්භය තුළට ඇතුළත් කිරීමය.

මෙහිදී ගුහාරංචියට අයත් පොතක් පිළිබඳව මෙතෙක් අවධානයට යොමු වී නොතිබුණු කාරණයක් කෙරෙහි ආගමික ඉතිහාසඥයකු වන ආර්. ඊ. ඔස්බෝන් (R. E. Osborne) අපේ සැලකිල්ල යොමුකර තිබේ. එනම් 'මතෙව්ගේ ගුහාරංචිය' ලියා තිබෙන්නේ 'එදෙස්සා' (Edessa) නමැති ස්ථානයේදී බවත්, එය ලිවීමේදී යුදෙව් ආගමේ අදහස් සහ බෞද්ධාගමේ අදහස් බෙහෙවින් බලපා ඇති බවත් ඒ පිළිබඳ පර්යේෂණ පැවැත්වූ ඔස්බෝන් ප්‍රකාශ කර තිබේ.[35] එදෙස්සා යනු ගන්ධාර දේශයේ සිට සිරියාව දක්වා වැටී තිබුණු ගොඩබිම් මාර්ගයේ පිහිටි වැදගත් වෙළඳ නගරයක් විය. එදෙස්සා සහ ඊට ආසන්නයේ පිහිටි පැල්මයිරා නුවර අතර කිට්ටු සම්බන්ධතා පැවතුණි. අශෝක රජතුමා විසින් ධර්ම ප්‍රචාරය සඳහා පිටත්කර හරිනු ලැබූ ධර්ම දූතයින් එදෙස්සාවල පදිංචි වූහ. එපමණක් නොව, එහි වැදගත් යුදෙව් සහ ක්‍රිස්තියානි ජනපද තිබුණි. විවිධ සංස්කෘතිවල සම්මිශ්‍රණයෙන් බිහි වූ සැබෑ හෙලනිස්ටික සමාජයක් එහි පැවතියේය. එහි විසූ දාර්ශනිකයින් නොස්ටික් සහ පෙරදිග ආගමික චින්තන ක්‍රම අත්හදා බැලූහ. 'Q' මූලාශ්‍රයේ ඇතුළත් තොරතුරු හැරුණුවිට මතෙව්ගේ ගුහාරංචියේ දක්නට ලැබෙන බොහෝ බෞද්ධ අදහස්වල දෝංකාරය මෙම බලපෑම නිසා සිදුවී ඇතැයි සිතිය හැකිය. මතෙව් තම ගුහාරංචිය පිළිබඳ පොතේ සඳහන් කර ඇති ජේසුස් වහන්සේ උපත ලැබූ අවස්ථාවේදී පෙරදිගින් ශාස්ත්‍රවන්තයින් පැමිණීම සහ ළදරු ජේසුස් කුමරුගේ මාපියන් ඔහුත් කැටුව මිසරයට පලායාම පිළිබඳ කථා ප්‍රවෘත්ති ඔහු ලබාගෙන තිබෙන්නේ එදෙස්සාවේ විසූ වැසියන් අතර පවතින ජනප්‍රවාදවලින් බව කෙනෙකුට සිතිය හැකිය. එපමණක් නොව, එදෙස්සාවේ ජීවත් වූ මිනිසුන් ජේසුස් වහන්සේගේ සැබෑ

ඉගැන්වීම්වල ඇතුළත් වූ බෞද්ධ බලපෑම් පිළිබඳව දැන සිටින්නට ඇතැයි සිතිය හැකිය. ළදරු සිදුහත් කුමරා බැලීමට දුර රටවල සිට සෘෂිවරු සයදෙනකු පැමිණි බවත්, ඔවුන් කුමරුවාට වැඳ නමස්කාර කර ඔහු අනාගතයේදී සක්විති රජ කෙනෙක් හෝ බුදු කෙනෙක් වන බව ප්‍රකාශ කරන සමාන කථා ප්‍රවෘත්තියක් ලලිත විස්තරයේ සඳහන්වේ. සමහර විට ශුභාරංචියේ විස්තරය ලිවීමේදී එම බෞද්ධ කථා ප්‍රවෘත්තියේ ඇතුළත් සිද්ධිය මුල් කරගන්නට ඇතැයි කෙනෙකුට සිතීමට පුළුවන.

වැඩිකල් නොගොස් ක්‍රිස්තියානි ජනප්‍රවාදවල පෙරදිගින් පැමිණි මෙම ශාස්ත්‍රවන්තයින් රජවරු ලෙස හඳුන්වා දී තිබේ. ඉන් එක් රජෙක් කැස්පර් (Casper) නම් විය. 'කැස්පර්' යනු ගුන්ඩෝෆාර් (Gundofarr) (ග්‍රීක් ගොන්ඩෝෆෙරස්-Gundophares) නමැති ආර්මීනියානු වචනයෙන් බිඳී විත් තිබේ. ගොන්ඩොෆෙරස් යනු ගන්ධාර දේශයේ රජකළ ඉන්දු පාර්තියන් රජතුමාය. තෝමස් නම් වූ ප්‍රේරිතවරයා (Apostle) මෙම රජතුමා බැහැ දැකීමට පැමිණියේය. අලුත උපන් ජේසුස් කුමරුවා බැලීමට ඉන්දියාවේ සිට බෞද්ධ රජෙකු පැමිණි බව ජනප්‍රවාදයේ සඳහන් වී තිබෙන්නේ මේ නිසාය.

මතෙව් සඳහන් කර තිබෙන කථා ප්‍රවෘත්ති වලින් සහ ඒවාට සම්බන්ධ ජනප්‍රවාදයේ එන කථා ප්‍රවෘත්ති වලින් පෙනී යන්නේ අශෝක රජතුමාගේ ධර්මදූතයින් මැත පෙරදිග රටවලට පැමිණීම පිළිබඳ සිද්ධියේ නොපැහැදිලි දෝංකාරයක්ද? එසේ නැතිනම් එම කතා ප්‍රවෘත්ති බුද්ධ ධර්මය පලස්තීනයට පැමිණීම පිළිබිඹු කරන රූපකයක් ලෙස සැලකිය හැකිද? ඩේවිඩ් ගේ පරම්පරාවේ අලුත් බුදු කෙනෙකු ඉපදී සිටින බව සඳහන් කිරීමේදී මතෙව් සැබෑ ජේසුස් වහන්සේ පිළිබඳව එදෙස්සාවේ වැසියන් තුළ පැවැති මතකය මෙහිදී සැලකිල්ලට ගෙන තිබේද? ශාස්ත්‍රවන්තයින් තිදෙනා විසින් පඩුරු වශයෙන් ගෙනෙනු ලැබූ රත්රන්, තුවරලා සහ ගන්ධ රස මගින් බුද්ධ, ධම්ම සහ සංඝ යනුවෙන් හැඳින්වෙන බුදු දහමේ දැක්වෙන ත්‍රිරත්නය සංකේතවත් වන බව පැරණි තුර්කි ලියවිල්ලක සඳහන් වේ.[96]

ක්‍රිස්තියානි සහ බෞද්ධ ඉගැන්වීම්වල ඇති තවත් සමානකමක් නම් රජතුන් කට්ටුව, ත්‍රිවිධ රත්නය වැනි ත්‍රිත්වය පිළිබඳ අදහස නිතර දක්නට ලැබීමය. තෙවැදෑරුම් ශීලය (ත්‍රිශික්ෂා) බුද්ධ ධර්මය ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය සහ පැරණි බුද්ධාගමේ පවතින අති පූජනීය ලක්ෂණ ලෙස සැලකෙන ත්‍රිවිධ රත්නය ඊට ඇතුළත් වේ. තෙරුවන් සරණයාම ථෙරවාද බුදු දහමේ කේන්ද්‍රය ලෙස අද දක්වා පවතී. ක්‍රිස්තියානි ආගමේ ත්‍රිත්වය පියා, පුත්‍රා සහ ශුද්ධෝත්තමයාණන් වහන්සේ යනුවෙන්

හැඳින්වේ. එම ත්‍රිත්වයේ ඇතුළත් දෙවන පුද්ගලයා ලෙස හැඳින්වෙන පුත්‍රා දෙවියන් වහන්සේගේ වචනයට සමාන කර තිබේ. ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තු භක්තිකයින්ට නිවැරදි මාර්ගය පෙන්වා දෙනු ලැබේ. බුදු දහමට අනුව ශ්‍රාවකයින්ගේ සමාජය සංඝ සමාජය යනුවෙන් හැඳින්වේ. දෙවියන් වහන්සේගේ වචනය යන අර්ථය ඇති 'ලෝගෝස්' (*Logos*) නමැති ග්‍රීක් වචනය සංස්කෘත භාෂාවේ දැක්වෙන 'ධර්ම' යන වචනයට සමාන වේ. 'ලෝගෝස්' යනු හෙරක්ලිටස්ගේ කාලයේ පටන් ග්‍රීක් දර්ශනයේ ඇතුළත් ව තිබූ වැදගත් සංකල්පයකි. ජොහන්ගේ ශුභාරංචියේ "ආරම්භයේදීම ධර්මය පැවතියේය" (In the Beginning was the word *Logos*) යනුවෙන් කර ඇති ප්‍රකාශය බෞද්ධ ලියවිලිවල දැක්වෙන ප්‍රකාශවලින් උපුටා ගෙන පරිවර්තනය කර ඇති බව පෙනේ. සියල්ල ධර්මය පදනම් කොට ඇත්තේය. (At the Foundation [of all things] is the Dhamma) යනුවෙන් බුදු දහමේ සඳහන් වේ. ත්‍රිකාය පිළිබඳ බුදුන්වහන්සේ ගේ ඉගැන්වීම ක්‍රිස්තියානි ආගමේ දැක්වෙන ත්‍රිත්වය පිළිබඳ සංකල්පයට බොහෝ දුරට සමානය."[97] මෙහිදී ඔහින් විසින් සඳහන් කර ඇති ත්‍රිත්වය පිළිබඳ මහා අවබෝධයකින් යුතුව සිටීමේ වැදගත්කම ප්‍රකාශ කරන ධර්මතාවය සිහිපත් වේ.

ත්‍රිකාය පිළිබඳ අදහස තුළින් බුදුවරු විශාල සංඛ්‍යාවක් සිටින බවට පවතින මහායාන විශ්වාසය වර්ධනය විය. ඒ අනුව ගංගානම් ගඟේ ඇති වැලිකැට ප්‍රමාණයටත් වඩා විශාල වූත්, අසංඛ්‍ය වූත්, බුදුවරු සංඛ්‍යාවක් සිටින බවත්, උන්වහන්සේලා කලින් කලට මිනිස් වෙසින් මෙලොව පහළවන බවත් සඳහන් වේ. උන්වහන්සේලා අතුරින් අනුත්තර වූ ධ්‍යානි බුදුවරයකු (Transcendental *Dhyani* Buddha) එක් එක් යුගයක් සඳහා අනුයුක්ත කරනු ලැබේ. එසේ අනුයුක්ත කරනු ලැබූ ධ්‍යානි බුදුවරයකු මගින් දිව්‍ය ලෝකයේ වැඩ වාසය කරන ධ්‍යානි බෝධිසත්වයකු සහ මෙලොව වැසියන්ට ධර්මය උගන්වනු ලබන බුදුවරයකු පහළ වේ. මේ මහා භද්‍ර කල්පයේදී දිව්‍ය ලෝකයේ වැඩ වාසය කරන්නේ 'අමිතාභ' (Amitabha) නමින් හැඳින්වෙන නොමිනිය හැකි ශ්‍රී විභූතියෙන් ආඪ්‍යවූ බුදුවරයෙකි. ඉතිහාසයේ සඳහන් වන සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ නමින් උන්වහන්සේ මිනිස වේශයෙන් ලොව පහළ වූහ. සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ අමිතාභ බුදුන්ගේ මෙලොව පුත්‍රයා ලෙස සැලකේ. උන්වහන්සේගේ බෝධිසත්වයන් හෙවත් ආධ්‍යාත්මික පුත්‍රයා ලෙස සලකනු ලබන්නේ අවලෝකිතේශ්වර නමින් හැඳින්වෙන දෙවියන්ය. ඔහු ලෝකයා දෙස අනුකම්පාවෙන් බලා සිටියි.

මුල් බුදු දහමේ දැක්වෙන ඉගැන්වීම් කෙතරම් දුරට වෙනස් වී

නිබෙඳ යන්න අමිතාභ වන්දනාය මගින් පැහැදිලි වේ. විමුක්තිය සලසා ගත හැක්කේ තමන්ගේම උත්සාහයෙන් පමණක් බව බුදුන් වහන්සේ දේශනා කළහ. එහෙත් වෙනත් ලොවක වාසය කරන බුදු කෙනෙකුගේ උපකාරයෙන් විමුක්තිය ඉක්මනින් සහ පහසුවෙන් ලබා ගත හැකි බව මෙම නව දර්ශනයෙන් ඉගැන්වේ.

අමිතාභ පිළිබඳ ජනප්‍රවාදය සම්බන්ධයෙන් පවතින පළමු ලිඛිත වාර්තාව ක්‍රි. පූ. පළමුවන වන ශතවර්ෂයට අයත් 'සුඛාවතීව්‍යුහ සූත්‍රය' *(Sukhavativyuha Sutra)* නමින් හැඳින්වේ. අමිතාභ බුදුන් විශ්වයේ බටහිර කෙළවරේ පිහිටි සුඛාවති හෙවත් ශුද්ධ දේශය (Pure Land) නමින් හැඳින්වෙන පාරාදීසයකට පැමිණි ආකාරය එම සූත්‍රයේ දක්වා තිබේ. මීට කලින් පැවති කල්පයක දී අමිතාභ ධර්මකාර නම් වූ භික්ෂුවක් ලෙස ජීවත් වූ බවත් ඒ කාලයේ දී බුදු බව ප්‍රාර්ථනා කර පෙරුම්දම් පුරා දුකින් තොර වූ බුද්ධ දේශයට (Buddha Land) පැමිණි බව එහි සඳහන් වේ. ප්‍රීතිමත් දේශය හෙවත් සුඛාවතී දේශය යනු එහි උත්පත්තිය ලබන සියලු දෙනාටම සත්‍යය අවබෝධ කර නිවන් දැකීමට අවස්ථාව සලසා ගත හැකි ස්ථානයක් විය යුතුය. ධර්මකාර නම් වූ ඒ භික්ෂුව අසංඛ්‍ය වාර ගණනක් බෝධි සත්ත්වයකු ලෙස ඉපදෙමින් සසර සැරිසරා අවසානයේදී විමුක්තිය සලසා ගත්තේය. එතැන් පටන් අමිතාභ සුඛාවතී නම් වූ එම බුද්ධ පාරාදීසයේ පාලකයා බවට පත්විය.

මෙලොව ජීවත්වන ඕනෑම කෙනෙකු සුඛාවතියේ ඉපදීම සඳහා අමිතාභ බුදුන්ගේ අවසරය ඉල්ලා සිටින්නේ නම් මරණින් පසු ඔහුට හෝ ඇයට එහි ඉපදීමට හැකිවේ. සුඛාවතියේ ජීවත්වන්නන්ට ආශාවන් නොමැත. දුක් විඳීමක් නොමැත. වේදනාවක් නොමැත. වස්තු සම්පත් නොමැත. ඔවුහු සියලු දෙනම නෙළුම් මල් මත ජීවත්වෙමින් නිවන් අවබෝධ කර ගැනීම පිණිස සම්පූර්ණ කාලය ගත කරති. කෙසේ වෙතත් ශුද්ධ දේශය හෙවත් සුඛාවතිය යනු නිර්වාණය නොවේ. එහි වෙසෙන සියලු දෙනම විමුක්තියේ එළිපත්තට පැමිණ සිටිති. එය ඔවුන්ගේ අවසාන ඉපදීම වේ. සුඛාවතියේ වාසය කරන සියලු දෙනාම පුරුෂයින් මෙන්ම ස්ත්‍රීන්ද අවසානයේදී අමිතාභ බුදුන්ගේ මග පෙන්වීම යටතේ නිවන් අවබෝධ කර ගනිති.

මහා කාරුණික අවලෝකිතේශ්වර බෝධි සත්වයින් මේ කාර්යය ඉටුකර දීම සඳහා අමිතාභ බුදුන්ට සහයෝගය දක්වයි. ජනප්‍රවාදයේ දැක්වෙන පරිදි ඔහුට හිස් එකොළහක්, අත් දහසක් සහ ඇස් දහසක් තිබේ. ඒවායේ උපකාරයෙන් සහ උන්වහන්සේ තුළ පවතින අසීමිත කරුණාව මගින් උන්වහන්සේ තමන් වහන්සේගේ පිහිට පතන ඕනෑම

කෙනෙකු ගලවා ගනියි. ධර්මය ඉගැන්වීම සඳහා උන්වහන්සේ තුළ පවතින කුසලතාවය හෙවත් උපාය අත් දහසින් සංකේතවත් කෙරේ. මෙලොවදී මෛත්‍රිය තුළින් ප්‍රකාශයට පත්කරනු ලබන පරමාත්මයාගේ ක්‍රියාකාරකම් උපාය යනුවෙන් හැඳින්වේ. එය වඩාත් නිවැරදිව අනුකම්පාව තුළින් ප්‍රකාශ වේ. අනුකම්පාවෙන් පිරිසිය බෝධි සත්වයින්ට දුක් විඳින මිනිස් වර්ගයාට විමුක්තිය සලසා දීම පිණිස විවිධ වෙස් ගැනීමට පුරුවන. මෙසේ ඔහු වෙනත් ආගම්වල දැක්වෙන දෙවියන්ගේ ස්වරූපයෙන් පෙනී සිටියි. උදාහරණයක් වශයෙන් හින්දු ආගමේ දැක්වෙන ශිව දෙවියන් ලෙස පෙනී සිටිමින් බෞද්ධ නොවන අයට විමුක්තිය සලසා ගත හැකි පරිදි ධර්මය වටහා ගැනීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. අමිතාභ බුදුන් යනු විමුක්තිය සලසා ගැනීම පිළිබඳ කරන මූලික සංකල්ප රූපයක් ලෙස හඳුන්වා දිය හැකි බවත් විමුක්තිය සලසා ගැනීම සඳහා පැවතිය යුතු විශේෂ ගුණාංගය වන්නේ මෛත්‍රිය බවත් ජර්මන් ජාතික බෞද්ධ විද්වතෙකු වූ හැන්ස් වුල්ෆ්ගෑං ශුමාන් (Hans Wolfgang Schumann) සඳහන් කරයි. එමගින් උන්වහන්සේ මිනිසුන්ට ඔවුන් තුළ පවතින ලෝභය, ද්වේෂය සහ මෝහය යනුවෙන් හැඳින්වෙන අකුසල මූලයන් නැති කර ගැනීමට උපකාරී වී සසරින් එතෙර වී විමුක්තිය සලසා ගැනීම පහසු කරදෙනු ලැබේ.

නිර්වාණය යනු වියුක්ත වූත්, ගූඪ වූත් ධර්මතාවයක් ලෙස තේරුම් ගැනීමට වඩා සුඛාවතියේ පවත්නා තත්ත්වය තේරුම් ගැනීම පහසුවිය. එනිසා මහායාන බුදුවරුන්ට නමස්කාර කිරීමේ සිරිත වැඩි දියුණු වීමත් සමග සුඛාවතිය නිර්වාණය සඳහා යොදාගන්නා ලද ආදේශකයක් බවට පත්විය. ශුද්ධ දේශය නම් වූ මනෝරාජ්‍යය (Utopia) පිළිබඳ සංකල්පය මගින් මිනිසුන්ට ආශාවන්ගෙන් සහ දුක් විඳීමෙන් තොර වූ ජීවිතයක ස්වභාවය පිළිබඳ කිසියම් අදහසක් ඇතිකර ගැනීමට හැකිවිය.

ශුද්ධ දේශය පිළිබඳ ඇදහීමට ඇතුළත් වී තිබෙන්නේ සුඛාවතී නමින් හැඳින්වෙන පාරාදීසය සහ අමිතාභ බුදුන් තුළ පවතින පතළවූ මහා කරුණාව පිළිබඳ දැඩි විශ්වාසයක් පවත්වා ගැනීම පමණි. ඊට වඩා වැඩි යමක් ශ්‍රාවකයින්ගෙන් සහ අනුගාමිකයින්ගෙන් අපේක්ෂා නොකළ හෙයින් එය තුන්වන ශත වර්ෂයේදී ජනප්‍රිය ආගමක් බවට පත් වී ඉන්දියාවේ සිට නැගෙනහිර ආසියාවේ රටවලට පැතිර ගියේය. හත්වන ශත වර්ෂයේ පටන් එම රටවල අමිතාභ සහ අවලෝකිතේශ්වර ජනප්‍රිය දෙවිවරුන් වශයෙන් පුදනු ලැබූහ. මෙය ක්‍රිස්තියානි ආගම තුළ ජේසුස් වහන්සේ නමැති මනුෂ්‍යයා දෙවියන්ගේ මූර්තියක් ලෙස ක්‍රමානුකූලව වර්ධනය වීමට සමාන කළ හැකිය. චීනයේ සහ ජපානයේ

අවලෝකිතේශ්වර බෝධිසත්වයින් කාරුණික දිව්‍යාංගනාවියක් ලෙස සලකා වන්දනා මාන කරනු ලැබේ. එම දිව්‍යාංගනාවිය ක්වාන්යින් (Kuan-yin) හෝ ක්වනොන් (Kwannon) යනුවෙන් හැඳින්වේ. අමිතාභ බුදුන් වහන්සේගේ අසීමිත කරුණාව සෑම කෙනෙකුටම ලැබෙන නිසා ජපානයේ අමිතාභ වන්දනා කරනු ලැබූ පුද්ගලයෝ අවසානයේදී ආශ්‍රමික ජීවිත ගත කිරීම අත්හැර දැමූහ. ටිබෙට් රටේදී ලාමා යනු බෝධිසත්වයින්ගේ ලොව පහළවීමක් ලෙස සලකනු ලැබේ. ඒ අනුව දලයි ලාමා නමැති ගරු නාමයෙන් පුදනු ලැබූ බෝධිසත්වයින් රටේ ලෞකික මෙන්ම ආධ්‍යාත්මික පාලකයා බවට පත්විය. සත්වන ශත වර්ෂයේදී එකල විසූ දලයි-ලාමා විසින් තම ශාස්තෘවරයාට පන්චෙන් ලාමා (Panchen Lama) නමැති ගෞරව නාමය පිරිනමනු ලැබ එතුමා අමිතාභ බුදුන්ගේ පුනර්භව (Reincarnation) බව ප්‍රකාශයට පත් කරන ලදී.

16 වන ශත වර්ෂයේදී ජේසුයිට්වරු විසින් මිථ්‍යා දෘෂ්ටිකයින් යැයි හඳුන්වනු ලැබූ මිනිසුන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම පිණිස ජපානයට පැමිණි විට වෙනත් ක්‍රිස්තියානි ආගමික නිකායිකයින් ඒ වනවිටත් ජපානයට පැමිණ ජනගහනයෙන් බහුතරයක් ඔවුන්ගේ ඉගැන්වීම් වෙත නම්මවා ගෙන තිබෙනු දැක මවිතයට පත් වූහ. ඇදහිල්ල පමණක් තිබිය යුතුය යන ධර්මතාව ඇතුළත් අමිතාභ වන්දනය තමන් මහත්සේ පිළිකුල් කොට සැලකූ ප්‍රොතෙස්තන්තු ආගමේ වෙනත් ස්වරූපයක් ලෙස ජේසුයිට්වරුන්ට පෙනී ගියේය. ඔවුන්ගේ එම සිතුවිල්ල සම්පූර්ණයෙන්ම වැරදි නොවේ. ක්‍රිස්තියානියේ දැක්වෙන ත්‍රිත්වය සහ බෞද්ධ දර්ශනයේ දැක්වෙන ත්‍රිවිධ රත්නය සහ නිකාය පිළිබඳ අදහස්වල පවතින සමානත්වය සලකා බැලීමේදී මෙම දර්ශනවාද දෙකම එකම මූලයකින් ප්‍රභවය වී ඇති බව පෙන්නුම් කරයි. දිව්‍ය ලෝකයේ වැඩ වාසය කරන අමිතාභ මනුෂ්‍ය වර්ගයා දුකින් මුදවා ගැනීම පිණිස ගෞතම බුදුන් වහන්සේ වශයෙන් ලොව පහළ වූයේ යම්සේද එපරිද්දෙන්ම දෙවියන් වහන්සේ තම පුතුයා ජේසුස් වහන්සේ නම් වූ ගැලවුම්කාරයාණන් වහන්සේ ලෙස ලොව පහළවීමට සැලැස්වූහ. ක්‍රිස්තියානි ආගමේ දැක්වෙන ශුද්ධාත්මයාණන් වහන්සේ මෙන් අමිතාභගේ දිව්‍යමය පුතුයා වන අවලෝකිතේශ්වර මනුෂ්‍යයින් අතරට පැමිණ ඔවුන්ගේ ශුභ සිද්ධිය පිණිස කටයුතු කරයි. ඇත්ත වශයෙන්ම මහා කරුණාවෙන් පිරී ගිය බෝධිසත්වයින් වහන්සේ අමිතාභ බුදුන්ගේ තේජස්වී පුතුයා ලෙස සුඛාවතී ව්‍යූහ සූත්‍රයේ වර්ණනා කර තිබේ. සාම්ප්‍රදායික මූර්ති ශිල්පීන් විසින් අවලෝකිතේශ්වර 'පද්මපානි' (නෙළුම් මල් සහිත අත් ඇති) බෝධිසත්වයින් ලෙස නිරූපණය කර තිබේ. එම

මූර්තිවල උන්වහන්සේගේ අත්වල සහ පාදවල තුවාල නෙළුම් මල් තබා ඇත. එම නෙළුම් මල් වලින් සංකේතවත් කර තිබෙන්නේ මරණයෙන් පසු බෝධිසත්වයකු ලෙස සලකනු ලැබූ ජේසුස් වහන්සේ කුරුසිය මත තබා ඇණ ගසනු ලැබූ අවස්ථාවේදී උන්වහන්සේගේ අත්වල සහ පාදවල ඇති වූ තුවාල දැ'යි සමහරු සැක කරති. උන්වහන්සේ අවසානයේදී ඉන්දියාවේදී මරණයට පත්විය. මරණින් පසු ජේසුස් වහන්සේ බෝධිසත්වයෙක් ලෙස සලකනු ලැබීය. (රූප රාමුව 36). අවලෝකිතේශ්වර දෙවියන්ට යාඥා කිරීමේදී 'ඕම් මානි පද්මේ හුම්' නැමැති සුප්‍රසිද්ධ යාඥා පාඨය හඬනගා කියනු ලැබේ. ඕම් සහ හුම් යන වචනවලින් ආරම්භය සහ අවසානය හැඟවෙන බවත්, ඇල්ෆා සහ ඔමේගා යන අකුරු ග්‍රීක් හෝඩියේ පළමු සහ අවසාන අකුරු නිරූපණය කරන්නේ යම්සේද එපරිද්දෙන්ම ක්‍රිස්තියානියේ දැක්වෙන පූර්ණත්වය සංකේතවත් කරමින් ඕම් සහ හුම් යන වචන දෙකින් ආරම්භය සහ අවසානය සංකේතවත් කරන බවත් ඔහු ප්‍රකාශ කරයි.[100]

සමාප්තිය

ක්‍රිස්තියානි ආගමේ බෞද්ධ ඉගැන්වීම් දක්නට ලැබෙන බවට පවතින තර්ක තවදුරටත් යටපත් කළ නොහැකි නිසා මෑතක සිට ක්‍රිස්තියානි පල්ලිය එක් අතකින් ඒ පිළිබඳ අවබෝධයක් ඇති බව පෙන්නුම් කිරීමට උත්සාහ කරන අතරම අනෙක් අතින් එවැනි සමානකම් තිබෙන බව ප්‍රකාශ කරන තර්ක වළක්වා ගැනීමටද කටයුතු කරයි. වතිකානු විශ්ව විද්‍යාලය මගින් බුදුන් වහන්සේ සහ ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව මෑතදී පළකරන ලද ග්‍රන්ථයක මෙසේ සඳහන් කර තිබේ. බුදුන් වහන්සේ දේශනා කළ සත්‍යය යනු දෙවියන් වහන්සේ විසින් හින්දුව ප්‍රකාශ කිරීමට කලින් කරන ලද සූදානම් කිරීමකි. මනුෂ්‍යයින් විසින් අවබෝධ කළ හැකි සත්‍යය ඊට ඇතුළත්වේ. නමුත් එය සාධනය කර ගැනීම සඳහා ක්‍රිස්තුස් වහන්සේ විසින් සත්‍යය එළිදරව් කළ යුතුවේ.[101] මෙහිදී සෑම මනුෂ්‍යයෙක්ම පියා, පුත්‍ර සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ නාමයෙන් බෞතීස්ම කළ යුතු බවට ජේසුස් වහන්සේ ශ්‍රාවකයින්ට නියෝග කළ බව ප්‍රකාශ කිරීමට කතුවරයා ඉක්මන්වී තිබේ. එසේ කිරීමෙන් බුදු දහම වෙත යොමුකරන ලද ආගම් ප්‍රචාරය කිරීමේ කිසියම් සැඟවුන පරමාර්ථයක් ඔහු තුළ පැවති බව පෙනී යයි.

කෙසේ වෙතත් කිසියම් ක්‍රිස්තවරයෙකු විසින් කරනු ලබන එළිදරව්වකින් තොරව තමන් විශ්වාස කරන දර්ශනය මොනයම්

ආකාරයකින් හෝ අසම්පූර්ණ නැති බව බෞද්ධයෝ දනිති. එය පුදුමයට හේතුවක් නොවේ. මන්ද ක්‍රිස්තුස් වහන්සේගේ එළිදරව්ව යනු පාවුලුතුමා විසින් කරන ලද එළිදරව්වකට වඩා වැඩියමක් නොවන හෙයිනි. කෙසේ වෙතත්, ජේසුස් වහන්සේගේ එළිදරව්වේ ඇතුළත් වී තිබෙන්නේ බෞද්ධ ඉගැන්වීමය.

ක්‍රිස්තියානි ආගම කෙරෙහි බලපා ඇති බෞද්ධ මූලාශ්‍ර ආගමික ලියකියවිලි වල ඇති කරන ලද බොහෝ වෙනස්කම් මගින් යටපත් කිරීමට උත්සාහ දරා ඇති නමුත් ක්‍රිස්තියානි ආගම කෙරෙහි බෞද්ධ මූලාශ්‍ර බලපා නැතැයි කවදුරටත් කෙනෙකුට කිව නොහැකිය. නමුත් මෙහිදී වඩා වැදගත් වන්නේ මෙම බෞද්ධ මූලාශ්‍ර මුලින්ම ක්‍රිස්තියානි ආගම තුළ අන්තර්ගත කරන ලද්දේ ජේසුස් වහන්සේ විසින්ය යන කාරණය වේ. එම සොයා ගැනීම නව තෙස්තමේන්තුවේ දක්වෙන බෞද්ධ අදහස්, එනම් ජේසුස් වහන්සේගේ සැබෑ ඉගැන්වීම් හෙවත් උන්වහන්සේගේ බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ සාකච්ඡාව සම්පූර්ණයෙන්ම අලුත් දිශාවකට යොමුකරවීමට හේතුවේ.

ක්‍රිස්තියානි ආගමත් එමගින් ඉදිරිපත් කර ඇති පණිවිඩයත් ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්ය. Q මූලාශ්‍රයේ දක්වෙන උන්වහන්සේගේ දේශනා පිළිබඳ විද්වතුන් විසින් ගැඹුරින් අධ්‍යයනය කරන තරමට ජේසුස් වහන්සේ විසින් අවබෝධ කරවීමට උත්සාහ කළ පණිවිඩයත් උන්වහන්සේගේ අනුගාමිකයින්ගේ ප්‍රචාරක කටයුතු නිසා එම පණිවිඩය ඉදිරිපත් කර ඇති ආකාරයත් අතර පවතින වෙනස හොඳින් තේරුම් ගැනීමට පුළුවන. උන්වහන්සේගේ ඉගැන්වීම් වලට සහ ජීවන චරිතයට එකතු කරන ලද්දාවූත් ගොතනු ලබන ලද්දාවූත් කථා ප්‍රවෘත්ති, ප්‍රකාශ, උපමා කථා සහ ආප්ත පද සියල්ල ඉවත් කළ පසු එක් කාරණයක් පැහැදිලි වේ. එනම්, ජේසුස් වහන්සේ නමැති ශාස්තෘවරයා සැබෑ ඉගැන්වීම් වල ගැබ්වී තිබෙන්නේ බුද්ධ ධර්මය බවය.

ඊජිප්තුවේ තෙරපියුටාවරු සමඟ වාසය කිරීමෙන් පසු පෙරළා පලස්තීනයට පැමිණි ජේසුස් වහන්සේ ධර්මය දේශනා කිරීම ආරම්භ කළහ. ජෝර්දානයේ වාසය කළ වෙනත් ආගමික නිකායිකයින් සහ ජේසුස් වහන්සේ අතර මත ගැටුමක් ඇතිවිය. උන්වහන්සේ බෞතීස්ම ස්නාපනය ප්‍රතික්ෂේප කළහ. එකල පැවති ලෝක සම්මතයට අනුකූලවූ ආගම්වල මෙන්ම විවිධ ආගමික නිකායිකයින් විසින් දැරූ අදහස් උන්වහන්සේ නොපිළිගත්හ. බුදුන් වහන්සේ මෙන්ම ජේසුස් වහන්සේත් උග්‍ර තපස් වෘත ප්‍රතික්ෂේපකර මධ්‍යම ප්‍රතිපදාව, අසීමිත ලෙස මෛත්‍රී

කිරීම සහ යථාවබෝධය, දුෂ්කර තත්වයන් සහ එළිදරව්ව පිළිබඳ විශ්වාස ඉදිරියේ නොසැලී සිටින්නට ඉගැන්වූහ. වෛරය සහ හිංසාව මෛත්‍රිය සහ ඉවසීම මගින් ජයගතයුතු බව උන්වහන්සේ දේශනා කළහ. ලෞකික පැවැත්ම සම්බන්ධයෙන් මිනිසුන් තුළ පවතින බිය ඒ පිළිබඳ සිත් තැවුල් කර ගැනීමකින් තොරව පැහැදිලි ආධ්‍යාත්මික මග පෙන්වීමක් තුළින් නැතිකර ගත හැකි ආකාරය උන්වහන්සේ පෙන්වා දුන්හ. වසන් ආටෝප වලින් සහ තමන් හුවා දැක්වීමකින් තොරව නිහතමානීව ජීවත්වන ලෙසත්, දේපල වස්තුව කෙරෙහි පවතින ආශාව දුරලා, පවුලට, හිත මිතුරන්ට ඇති බැඳීම් ඉවතලා ගිහිගෙය අතහැර පිණ්ඩපාතී ශ්‍රමණයින් මෙන් ගම් දනව් වල සැරිසරමින් සත්‍යය දේශනා කරන ලෙස උන්වහන්සේ තම ශ්‍රාවකයින්ට උපදෙස් දුන්හ.

උන්වහන්සේගේ මුල් ශ්‍රාවකයින් දැඩි උද්‍යෝගයකින් යුතුව ක්‍රියා කළහ. ජේසුස් වහන්සේ යනු තමන්ගේ ලබ්ධියට මිනිසුන් හරවා ගැනීමට කටයුතු කළ සෙසු දිව්‍යැසිවරුන්ට වඩා වෙනස්වූ සුවිශේෂ ගුණාංගයන්ගෙන් හෙබි පුද්ගලයකු වූහ. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ උන්වහන්සේ කෙරෙහි අසීමිත විශ්වාසයකින් යුක්තව සිටියහ. නමුත් ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් තේරුම් ගැනීමට ඔවුන් අපොහොසත් වූහ. ඔවුහු දැඩි ලෙස කුසිස්තවරයකුගේ හෙවත් ගැලවුම්කාරයකුගේ පහළවීම පිළිබඳ බලාපොරොත්තුවේ එල්බ සිටියහ. තම ශාස්තෘවරයා එම ගැලවුම්කාරයා වනු දැකීමත්, උන්වහන්සේගේ මාර්ගයෙන් විමුක්තිය සාධනය කර ගැනීමත් ඔවුන් තුළ පැවති එකම බලාපොරොත්තු විය. ජේසුස් වහන්සේ ජීවත්වූ කෙටි කාලපරිච්ඡේදය උන්වහන්සේ දේශනා කළ ධර්මය ශ්‍රාවකයින්ට අවබෝධ කරවීමට තරම් ප්‍රමාණවත් නොවීය. අවාසනාවන්ත අයුරින් කුරුසිය මත තබා ඇණ ගැසීමෙන් පසු ජේසුස් වහන්සේට සමාජයෙන් ඈත්ව සිටීමට සිදුවිය. නිසැකවම උන්වහන්සේගේ ජීවිතය ගලවාගත් නමුත්, තවදුරටත් පලස්තීනයේ ජීවත්වීම උන්වහන්සේගේ ජීවිතයට තර්ජනයක් විය. උන්වහන්සේ දේශනා කළ දර්ශනයේ අන්තර්ගත මූලික ඉගැන්වීම් ගම් දනව් වල පතුරුවා හැරීමට ශ්‍රාවකයෝ අසාර්ථක උත්සාහයක් දැරූහ. බොහෝ අවස්ථාවලදී ඔවුන් සමච්චලයට ලක්කොට පලවාහරින ලදී. කිසිවෙක් ඔවුන්ගේ දේශනාවලට එතරම් සැලකිල්ලක් නොදැක්වූහ. මිනිසුන්ගේ අපේක්ෂාවන් සහ ජේසුස් වහන්සේගේ දේශනා අතර පැහැදිලි සිඩැසක් ඇතිවී තිබෙන බව ධර්ම ප්‍රචාරක කටයුතු වල යෙදී සිටි ශ්‍රාවකයින්ට පෙනී ගියේය. රෝමන්වරුන්ට මුහුණ දීමට සිදුවීම නිසා ඇතිවූ විපත ගැටුම ජේසුස් වහන්සේ පිළිබඳ ආගමික ව්‍යාපාරයේ යහපතට හේතුවිය. ලෝක විනාශය ආසන්න බවත්, දෙවියන් වහන්සේගේ සාධාරණ රාජ්‍යයක් ඉක්මනින් බිහිවන බවත් විශ්වාස කරනු ලැබූ පරිසරයක් තුළ

ජේසුස් වහන්සේ එළිදරව්ව පිළිබඳ එකල පැවති විශ්වාසය තුළට ඇතුල් කරගැනීමට ඔවුන්ට හැකිවිය. ආගමික භක්ති උන්මාදයෙන් වෙලීගිය විවිධ ආගමික නිකායිකයින් උන්වහන්සේ ඔවුන්ගේ විශ්වාස තුළට ඇතුල් කර ගැනීමට ක්‍රියා කළහ. මේ හේතුව නිසා ජේසුස් වහන්සේ නමැති බෞද්ධ ශාස්තෘවරයා ගැලවුම් කාරයකු (Messiah) සහ විමුක්තිදායකයකු (Redeemer) බවට පත් කරනු ලැබීය.

ජේසුස් වහන්සේ පිළිබඳ ආගමික නිකායන් විශාල ප්‍රමාණයක් බිහිවීමත් සමඟ උන්වහන්සේ පිළිබඳ බොහෝ මිථ්‍යා කථා ප්‍රවෘත්ති ගොඩ නැඟෙන්නට පටන් ගත්තේය. එම ආගමික නිකායන් තම විශ්වාසය විවිධ ලියවිලි සහ සම්ප්‍රදායන් මත ගොඩ නැගූහ. නා නා ප්‍රකාර සමාජ පංති සහ භාෂාවන් නියෝජනය කරනු ලැබූ එවැනි ආගමික සමාජ අතිශයින්ම වෙනස් වූ සමාජයීය පරිසරයක් තුළ වර්ධනය විය. වෙනත් ඕනෑම සමාජ සංවිධානයක් ගොඩ නැඟෙන ආකාරයට එම ආගමික සංවිධානද විකාශනය වන්නට පටන් ගත්තේය. අද අප ක්‍රිස්තියානි ආගම යනුවෙන් හඳුන්වනු ලබන සංවිධාන පිහිටුවාගන්නා තෙක් එකී ආගමික සමාජ මඟින් ජේසුස් වහන්සේ පිළිබඳ විවිධ පුරාණෝක්ති ගොඩ නගාගෙන තිබුණු බව Q මූලාශ්‍රය පිළිබඳ කරන ලද පර්යේෂණ වලින් පැහැදිලි වේ. ජේසුස් වහන්සේගේ චරිතය වටා ගොඩ නැගී තිබූ එම පුරාණෝක්ති වලින් සමහරක් ක්‍රිස්තියානි සභාව මඟින් ක්‍රිස්තියානි ආගමට ඇතුළත් කරන ලදී. එසේ තෝරාගත් පුරාණෝක්ති දෙවියන් වහන්සේගේ ප්‍රකාශ. ජේසුස් වහන්සේ අනායයන් වෙනුවෙන් කුරුසිය මත මියයාම සහ මරණයෙන් උත්ථාන වීම පිළිබඳ කථා ප්‍රවෘත්ති මුල් කර ලියන ලද පාවුලුතුමාගේ හසුන් පත්වල ස්වරූපයෙන් ඉදිරිපත් කර තිබේ. පුරාණෝක්තිවල ඇතුළත් එම කථා ප්‍රවෘත්ති ක්‍රිස්තියානි පල්ලියේ පදනම බවට පත්විය. සාමාන්‍යයෙන් ක්‍රිස්තු භක්තිකයින් ජේසුස් වහන්සේ පිළිබඳ තේරුම් ගෙන ඇත්තේ එම පසුතලය යටතේය. ජේසුස් වහන්සේ පිළිබඳ මෙම මිථ්‍යාව මුලින්ම ඇතිවූයේ උතුරු සිරියාවේය. එතැන් පටන් ජේසුස් වහන්සේගේ සැබෑ ස්වරූපය පිළිබඳ මතකය කටුගා දමමින් ඒ වෙනුවට ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ ඇදහිලි ක්‍රමයක් ගොඩ නගමින් එය සාර්ථක ආගමික ව්‍යාපාරයක් ලෙස වර්ධනය විය.

මෙසේ සදාකාලිකව අමතක වී යාමේ තර්ජනයට ලක්ව තිබූ ජේසුස් වහන්සේගේ සැබෑ අපේක්ෂාවන් අද අපට ඇත්ත වශයෙන්ම මියයා නොදී උත්ථාන කළ හැකිය. ගෞතම බුදුන් වහන්සේගේ ජීවිතයේ සහ උන්වහන්සේගේ ඉගැන්වීම් තුළ ඇතුළත් සියලු ලෝක සත්වයා කෙරෙහි පැවති පතළාවූ අනුකම්පාව හේතුවෙන් මනුෂ්‍ය වර්ගයා වෙත විහිදු ගිය මෛත්‍රිය මුල් කරගත් හදගැස්ම ජේසුස් වහන්සේ තුළ පැවති බව අපට තේරුම් ගත හැකිය.

Notes

Part 1 INDIA AND THE WEST

1 Grimm (1917).
2 Nestle (1947), p. 89.
3 Overbeck (1919).
4 Quoted from *Der Spiegel* No. 14, 1966.
5 Scholars do not agree about the Buddha's exact dates. See Schumann (1988), pp. 22ff.
6 Mahavagga, I, 3, 4.
7 Samyuttanikaya, LVI, 11.
8 d'Eypernon (1946), p. 95.
9 Mylius (1988), p. 184.
10 Muller (1870). See also Walhouse (1879).
11 Holwell, *Original principles of the ancient Brahmans*, London, 1779.
12 Schmidt (1828).
13 See Schomerus (1932), p. 104.
14 Seydel (1882), ibid (1897).
15 Van Eysinga (1909), Garbe (1914), Schomerus (1932).
16 Edmunds (1902).
17 Jaspers (1949), p. 33.
18 Jaspers (1949), p. 22.
19 Radhakrishnan (1952), p. 134.
20 Gadd (1932), p. 191.
21 Scheil (1925), pp. 55f.
22 Wheeler (1968); Dales (1968).
23 See Delougaz (1952); Pigott (1948).
24 See Lemberg-Karlovsky (1972).
25 Lemberg-Karlovsky (1970).
26 See Oppenheim (1954)
27 Golzio (1983), p. 11.
28 In fact a pre-form of the classic Sanskrit that developed later.
29 Vendryes (1948).
30 Rahn (1933)
31 Heine-Geldern (1938); De Hevesy (1938).
32 See Schomerus (1932), p. 65.
33 *Illustrated Weekly of India*, Bombay 7.11.1992 and 27.2.1993; *Sunday*, Calcutta, 12. 9. 1993; *Amrit Bazar Patrika*, Calcutta 7.1.1994.
34 Dulaurier (1907), p. 132.

35 See 2 Chr 9,10; 1 Kings 9:26-28 and 10:11; on Gold from Ophir see Isaiah 13:12.
36 1 Kings 10:22.
37 See on David: 2 Sam 8:13; 1 Kings 11:15ff.; on Solomon: 1 Kings 11:14-22.
38 Kennedy (1898), pp. 254f. See also Caldwell (1913), pp. 88f.
39 Lassen, Vol. II (1949), p. 589.
40 Bibby (1969)
41 Kennedy (1898), p. 249.
42 Buhler (1896).
43 Eschatology is the doctrine of the Last Things and the end of Time.
44 Winston (1966), p. 190.
45 See Strabo, xvi, c.3, par. 3, Lassen, Vol. II (1849), pp. 601-2.
46 See Boyce (1982), p. 199.
47 See Lassen, Vol. II (1849), pp. 581-4 and pp. 593-6.
48 See Beal (1882), p. 143.
49 Garbe (1894), pp. 85-105.
50 Schroeder (1884).
51 Schroeder (1884), p. 22.
52 Clements, *Strom*. 1, 304, B.
53 Schroeder (1884), p. 37.
54 Pythagoras's Theorem says that in a right-angled triangle the square of the hypotenuse equals the sum of the squares of the other two sides.
55. Cantor (1880), pp. 540ff.
56 Schroeder (1994), p. 92.
57 See Reese (1914).
58 It is uncertain whether Alexander thus heard about the Ganges or merely about the Satledsh, which was only a few days' march away.
59 Bhandarkar (1955), pp. 27f.
60 See Raychaudhuri (1953), pp. 299f.
61 See Lassen, Vol. II (1849), p. 713.
62 Quoted from Snelling (1991), p. 106.
63 See Bhandarkar (1955), p. 43f.
64 Droysen, Vol. III (1936), p. 353.
65 Filliozat (1949).
66 McCrindle (1879).
67 Strabo, *Geograph*. II, v, 12.
68 The aloe that Nicodemus and Joseph of Arimathea used for healing Jesus also came from Socotra.
69 A spice often mentioned in *Periplus* of which there must have been many varieties.

70 Jouveau-Dubreil (1941), pp. 26-9.
71 Pattabiramin (1946), p. 5f.
72 *India Abroad*, 12 May 1989, p. 22.
73 Kersten (1994).

Part II JESUS - THE BUDDHIST

1 Amore (1985), first published in 1978.
2 Thundy (1993).
3 Lillie (1887), p. 181.
4 Thundy (1993), p. 270.
5 Thundy (1993), pp. 79-128.
6 See Seydel (1882), p. 106.
7 In the Proto-Gospel of James, Jesus is born in a cave.
8 Thundy (1993), pp. 108f.
9 See Mus (1935), pp. 475ff.
10 See Campbell (1953).
11 See Klatt (1982), p. 106.
12 Garbe (1914), pp. 49f.
13 See Thundy (1993), p. 116.
14 See Gruber (1982); Gruber (1985).
15 Otto Flink (*Schopenhauers Seelenwanderungslehre und ihre Quellen*) mentions the following passages: Mt. 14:1-2;1 Cor 15:35-55; Mt. 17:9-13; Lk 9:7.8.19; Mk. 9:9-13; Mt. 19:28-30; John 3:3 and 8. He believes the idea of karma is expressed in John 9:2-3; Mt. 19:30; Mt. 5:4.26; Mk. 10:29-31; Lk. 18:29-30.
16 Schwarz and Schwarz (1993).
17 Schwarz (1990), p. 46.
18 Philonenko (1972).
19 See Amore (1985), p. 66.
20 *Dighanikaya*, II, 87; *Majjhimanikaya* 6.
21 Garbe (1914), p. 60.
22 See Klatt (1982).
23 Klatt (1982), p. 149.
24 Klatt (1982), p. 192.
25 See the whole of section 25 of the *Udanavagga* 25:1-25.
26 Haas (1922).
27 A lepton was the smallest Greek coin.
28 Schwarz and Schwarz (1993), p. 380.
29 Beal (1882), pp. 172f.

30 Haas (1992), p. 78.
31 Mack (1987), pp. 322f.
32 Seydel (1897), p. 36.
33 Pagels (1981), p. 17.
34 Conze (1953).
35 Kloppenborg (1987); Kloppenborg (1988).
36 Kloppenborg (1987), p. 37.
37 Kloppenborg (1987), p. 87. See also Funk and Hoover (1992).
38 Hengel (1981), pp. 57-60.
39 Riesner (1988), Riesner (1991).
40 Judge (1960/61).
41 Mack (1993).
42 Borg (1984), pp. 234-7.
43 Crossan (1973); Breech (n.d.).
44 We put Jesus's 'death' in inverted commas here since we have shown elsewhere that Jesus did not die on the cross. See Kersten and Gruber (1994); Kersten (1994).
45 See Mack (1993), p. 4.
46 Mack (1993), p. 5.
47 Kloppenborg (1988); Mack (1993), pp. 73-80.
48 Gerhardsson (1991).
49 Schwarz (1991); Riesner (1988), pp. 329-404.
50 Carlston (1980).
51 Amore (1985).
52 Schwarz (1991).
53 Streeter (1932), p. 41.
54 Schwarz (1986).
55 Origen, *De oratione* 2:2; 14:1.Clement. Strom. 1:24.
56 Schwarz (1990), p. 65.
57 Flavius Josephus, *Jewish War,* II, 13:4
58 Flavius Josephus, *Jewish War,* II, 13:5.
59 Flavius Josephus, *Jewish Antiquity,* 20:5, 1.
60 See Robertson (1965), p. 80.
61 Festinger, Schachter, Riecken (1965).
62 See Piper (1989), p. 191.
63 This example comes from Aune (1991), p. 224, who cites Fontenrose (1966), pp. 15-19.
64 Mack (1993), p. 183.
65 Amore (1985), p. 163.
66 See Kloppenborg (1987), p. 246f.

67 *Nidanakatha* VII, 114; *Mahavagga*, I, 11-13.
68 Greek *diabolos* is the persecutor/accuser.
69 See Klatt (1982), p. 141.
70 See Rhys Davids (1980), pp. 83f.
71 Tertullian, *Adv. Marc.* IV, 7-8.
72 Epiphances, Haer. 30, 13. The Ebionites were a Jewish Christian sect.
73 See Lidzbarski (1915), pp. 103-9.
74 Van Eysinga (1904), p. 29.

Part III THE WAY OF THE ORIGINAL JESUS

1 Schlumberger et al. (1958).
2 Humbach (1969).
3 Beneviste et al. (1966).
4 Dupont-Sommer (1970).
5 Davary and Humbach (1974).
6 Dupont-Sommer (1980), p. 709.
7 Bhandarkar (1913).
8 Rhys Davids (1898).
9 Flinders Petrie (1908).
10 Fllinders Petrie (1898), p. 54. See also Salomon (1991), p. 736.
11 Oratio XXXII, 40. See *Dio Chrysostom* III. H. Lamar Crosby, trans. Loeb Classical Library, London, 1940, pp. 209-11.
12 Oratio XXXV, 23.
13 Mansel (1875), pp. 31f.
14 See the book by Montfaucon (1709).
15 Dupont-Sommer (1980), p. 710.
16 Smith (1894), pp. 302f.
17 Beal (1882), p. 165.
18 Thundy (1993), p. 245.
19 Thomas Gotterbarm drew our attention to that idea.
20 Schmidt (1828), p. 17.
21 Philo, *De vit. con.* 2.
22 Levi (1893), p. 47.
23 Kennedy (1898), p. 277.
24 See Zurcher (1959).
25 Muller-Hess (1913).
26 Klimkeit (1985).
27 See Dayal (1931), pp. 18f.
28 Mukherjee (1988), p. 89.

29 See Kersten (1993).
30 *Zeitschrift fur wissenschaftliche Theologie*, X, 1867, p. 110.
31 Bunsen (1880).
32 Beal (1882), p. 163.
33 Modi (1993), p. 211.
34 Vermes (1960), p. 441.
35 Vermes (1960), p. 443.
36 Beal (1882), p. 165.
37 Koch (1980), pp. 8f.
38 Baigent and Leigh (1991).
39 Talmon (1993).
40 Beckwith (1980).
41 See Winston (1966).
42 Dexinger (1993), p. 46.
43 Dupont-Sommer (1980).
44 Dupont-Sommer (1980), p. 714.
45 Dupont-Sommer (1960).
46 See Roth (1965).
47 *Chirbet* means 'ruin',
48 See Brock (1977).
49 See Kersten and Gruber (1994), pp. 55f.
50 Bonani et al. (1991).
51 Golb (1993).
52 A *pescher* (plur. *pescharim*) is a text that comments on Old Testament writings, relating them to the present day. The idea is that the Bible is a treasury of prophetic truth, which when rightly interpreted provides answers and guidelines for any contemporary situation.
53 See Dexinger (1993).
54 Garcia-Martinez and Van der Woude (1990).
55 Schiffman (1990), pp. 64-73.
56 Golb (1993), p. 97.
57 See Bardtke (1956/57).
58 Bar-Adon (1977).
59 Charlesworth (1980).
60 See 1QpHab XI:5-8. For the Wicked Priest that was a normal weekday because the people of Qumran used a different calendar from other Jews,
61 See Hjerl-Hansen (1959).
62 See Jackson (1898).
63 See Schneider (1967).
64 Teicher (1951).
65 Hjerl-Hansen (1959), p. 495.

66 Maier and Schubert (1992), p. 211.
67 1QGenAp 20,21f,29; see also Flusser (1957).
68 Porphyrios, *De vita Pythagorae*, ξ 25, Jamblichos, *De vita Pythagorica*, VIII S 36.
69 Augstein (1972), p. 362.
70 See Roth (1965).
71 As in Carl Amery (1990, pp. 108ff), inventor in his oppressive novel *Das Geheimnis der Krypta* of the science of Spaghistics, a systemat ics of losers and defeats.
72 Riesner (1991), pp. 205f.
73 See Daumas (1967).
74 Fluctuations in temperature were more bearable in the caves. The Chirbet Qumran site was only the community centre.
75 Meyer (1991), p. 438.
76 Garbe (1914), pp. 123f.
77 Quoted from Lillie (1887), p. 206.
78 According to Plutarch in 67 BC by way of Kilikien, Paul's home.
79 Monier-Williams (1889).
80 In the legend's Iranian-Indian homeland this was the sacred plant *Soma* (Old Persian *Haoma*). See Schutze (1972), p. 139.
81 Volney (1860), pp. 185f.
82 Kennedy (1902); see also Lubac (1937), p. 337.
83 Clement *Admonition* I, 6.
84 Clement *Strom.* I V 160, 3.
85 See Seeberg (1941).
86 Lubac (1937), p. 341. See also Benz (1951); Przyluski (1973).
87 Origen, *Contra Celsum*. See Lubac (1937), pp. 348f.
88 Hippolytus, *Refut.* VIII.
89 Hippolytus, *Refut.* I, 21.
90 Kee (1970), p. 250.
91 Bruns (1973/74), pp. 236f.
92 See Kern (1963).
93 See Klimkeit (1983).
94 See Band and Gabain (1930).
95 Osborne (1973/74).
96 See Rohrborn (1971). See also Klimkeit (1980).
97 See also Falk (1937)
98 Schumann (1990), p. 187.
99 *Amituo-fo* (China) and *Amida* (Japan).
100 Schumann (1980), p. 190.
101 Nguyen (1987), p. 129.

Bibiography

Amery, C. : *Das Geheimnis der Krypta*. Munich, Leipzig, 1990.
Amore, R. C. : *Two Masters, One Message*. Kuala Lumpur, 1985.
Aufhauser, J. B. : *Buddha und Jesus in ihren Paralleltexten*. Bonn, 1926.
Augstein, R. : *Jesus Menschensohg*. Munich, 1972.
Aune, D. E. : 'Oral Tradition and Aphorisms of Jesus'. In: Wansbrough, H. (Ed.) : *Jesus and the Oral Gospel Tradition*. Sheffield, 1991, pp. 211-65.
Baigent, M. and Leigh, R. : *The Dead Sea Scrolls Deception*. Munich, 1991.
Band, W. and A. von Gabain: Turkische Turfantexte III. *Sitzungsberichte der Preuss. Akad. der Wiss.* Berlin, 1930, pp.183-211.
Bar-Adon, P.: 'Another Settlement of the Judean Desert Sect at Ein el-Ghuweir on the Shores of the Dead Sea'. *Bulletin of the American Schools of Oriental Research*, 277, 1977, pp. 1-25.
Bardtke, H. : 'Das Ich des Meisters in den Hodajoth von Qumran'. *Wissenschaftliche Zeitschrift der Universitat*. Leipzig, 6, 1956/57, pp. 93-104.
Baur, F. C. : 'Apollonius von Tyana und Christus'. *Tubinger Zeitschrift fur Theologie*, 1832.
Beal, S. : *Abstract of Four Lectures in Buddhist Literature in China*. London, 1882.
Beckwith, R. T.: 'the Significance of the Calendar for Interpreting Essene Chronology and Eschatology'. *Revue de Qumran*, 38, 1980, pp. 167-202.
Beneviste, E., A. Dupont-Sommer, C. Caillat: 'Une inscription indoarameenne d' Asoka provenant de Kandahar (Afghanistan). *Journal Asiatique*, 1966, pp. 437-470.
Benz, E.: 'Indische Einflusse auf die fruhchristliche Theologie'. *Akademie der Wissenschaften und der Literatur*, Mainz: Geistes- und Sozialwiss. Klasse, Jg. 1951, Nr. 3. Wiesbaden, 1951.
Bergh van Eysinga, G. A. van den: *Indische Einflusse auf evangelische Erzahlunngen*. Gottingen, 1904.
Berve, H.: *Gestaltende Krafte der Antike*. Munich, 1949.
Bhandarkar, D. R.: *Ashoka*. Calcutta, University of Calcutta, 1955.
-: 'Sambodhi in Ashoka's Rock Edict VIII', *Indian Antiquary*, XLII, 1913, pp. 159-60.
Bibby, G.: *Looking for Dilmun*. New York, 1969.
Bonani, G., M. Broshi, I. Carmi, S. Ivy, J. Strugnell, W. Wolfli: 'Radiocarbon Dating of the Dead Sea Scrolls'. *Atiqot*, 20, 1991, pp. 27-32.

Borg, M. J.: *Conflict, Holiness and Politics in the Teachings of Jesus*. New York, 1984.
Boyce, M.: *A History of Zoroastrianism*. Vol. II. Leiden, Cologne, 1982.
Brech, J.: *The Silence of Jesus*. Toronto, n.d.
Brock S. P.: 'Some Syriac Accounts of the Jewish Sects'. In: Fischer, R. H. (Ed.), *A Tribute to Arthur Voobus: Studies in Early Christian Literature and its Environments, Primarily in the Syrian East*. Chicago, 1977, pp. 265-76.
Broshi, M.: Qumran - die archaologische Erforschung. In: J. B. Bauer, J. Fink and H. D. Galter (Ed.): *Qumran. Ein Symposion*. Graz, 1993, pp. 63-72.
Brown, W. N.: *The Indian and Christian Miracles of Walking on the Water*. Chicago, London, 1928.
Bruns, J. E.: Ananda: 'The Fourth Evangelist's model for "the disciple whom Jesus loved"?' *Studies in Religion*, 1973/74, pp. 243-63.
-: *The Christian Buddhism of St John*. New York, 1971.
Buhler, G.: *Indische Palaographie. Grundrib der Indo-Arischen Philologie und Altertumskunde*. Strasbourg, 1896.
Bunsen E. de: *The Angel-Messiah of Buddhists, Essenes, and Christians*. London, 1880.
Caldwell, R. : *A Comparative Grammar of the Dravidian or South-Indian Family of Langusges*. London, 1913.
Campbell, J. : *The Hero with a Thousand Faces*. New York, 1949.
Cantor, M.: *Vorlesungen uber Geschichte der Mathematik*. Vol I. Leipzig, 1880.
Carlston, C.: 'Proverbs, Maxims and the Historical Jesus; *Journal of Biblical Literature* 99, 1980, pp. 87-105.
Charlesworth, J. H. : 'The Origin and Subsequent History of the Authors of the Dead Sea Scrolls: Four Transitional Phases Among the Qumran Essenes'. *Revue de Qumran*, 10, 1980, pp. 213-23.
Charlesworth, M. P.: *Roman Trade with India: A Resurvey*. Studies in Roman Economic and Social History in Honor of Allan Chester Johnson. Princeton, 1951.
Chattopadhyaya, N.: *Indische Essays*. Zurich, 1883.
Conze, E.: *Der Buddhismus. Wesen und Entwicklung*. Stuttgart, 1953.
Crossan, J. D.: *In Parables*. New York, 1973.
d'Eypernon, T.: *Les paradoxes du bouddhisme*. Paris, 1946.
Dales, G.: 'Of Dice and Men'. *Journal of the American Oriental Society* 88, 1968, pp. 14-22.
Dani, A. H.: *The Historic City of Taxila*. Paris, 1986.

Daumas, F.: La Solitude des Therapeutes et les antecedents egyptiens du monachisme chretien'. In: *Philon d' Alexandrie*. Paris, 1967, pp. 347-59.

Davary, I. G. D. and Humbach, H.: 'Eine weitere aramaoiranische Inschrift der Periode des Asoka aus Afghanistan'. *Akademie der Wissenschaften und Literatur, Mainz. Abhandlungen der geistes- und sozialwissenschaftlichen Klasse*. 1974, pp. 3-16.

Dayal, H.: *The Bodhisattva Ideal in Buddhsit Sanskrit Literature*. London, 1931.

De Hevesy, G.: 'The Easter Island and the Indus Valley Scripts'. *Anthropos*, 1938.

Delougaz, P.: *Pottery from the Diyala Region*. University of Chicago Oriental Institute Publication, Vol. LXIII, Chicago, 1952.

Dexinger, F.: '45 Jahre Qumran - ein kritischer Forschungsbericht'. In : J. B. Bauer, J. Fink and H. D. Galter (Eds.), *Qumran. Ein Symposion*. Graz, 1993, pp. 29-62.

Driver, G. R.: *The Judean Scrolls*. Oxford, 1965.

Droysen, J. G.: *Geschichte des Hellenismus*, 1836. (Republished Basel 1952-4).

Dulaurier, E.: 'Etudes sur la relation des voyages faits par les Arabes et les Persans dans l'Inde et a la Chine'. *Journal Asiatique*, IVme serie, 1907, p. 132.

Dupont-Sommer, A.: *Die essenischen Schriften vom Toten Meer*. Tubingen, 1960.

-: Essenisme et Bouddhisme', *Academie des Inscriptions et Belles-Lettres*. Comptes rendus des seances de l'annee 1980, Nov-Dec., pp. 698-715.

-: 'Une nouvelle inscription arameenne d'Asoka trouvee dans la vallee du Laghman (Afghanistan). *Comptes rendus des seances de l'Academie des Inscriptions et Belles Letters*. 1970. pp. 158-73.

Edmunds, A. J.: *Buddhist and Christian Gospels now first compared*. Philadelphia, 1902.

Faber, G.: *Buddhistische und neutestamentliche Erzahlungen. Das Problem ihrer gegenseitigen Beeinflussung*. Leipzig, 1913.

Falk, M.: 'Origine dell' equazione ellenistica logos-anthropos'. *Studie materiali di storia delle religioni*, XIII, 1937, pp. 166-214.

Festinger, L., Schachter, S., Riecken, H. W.: *When Prophecy Fails*. Minneapolis, 1956.

Filliozat, J.: *La doctrine brahmanique a Rome au IIIe siecle*. Paris, 1956.

-: 'Les echanges de l'Inde et de l'empire romain aux premiers siecles de l'ere chretienne'. *Revue Historique*, 201, 1949, pp. 1-29.

Flavius Josephus: *Der judische Krieg*. Munich, 1987 (4th ed.) Trans. Hermann Endros.

Flinders Petrie, w. M.: *Dendereh*. London, 1898.

-: 'The Peoples of the Persian Empire'. *Man*, 71, 1908.

Flusser, D.: 'Healing Through the Laying on of Hands in a Dead Sea Scroll'. *Israel Exploration Journal*, 7, 1957, 107.

Fontenrose, J.: *The Ritual Theory of Myth*. Berkeley, 1966.

Funk, R. W. and Hoover, R. W.: *Five Gospels, One Jesus. What did Jesus Really Say?* Sonoma, 1992.

Gadd, C. J.: 'Seals of Ancient Indian Style Found at Ur'. *Proceedings of the British Academy*. London, 1932, pp. 191-210.

Garbe, R.: Die *Samkhya-Philosophie*. Leipzig, 1894.

-: *Indien und das Christentum. Eine Untersuchung der religionsgeschichtlichen Zusammenhange*. Tubingen, 1914.

Garcia-Martinez, F. and A. S. Van der Woude: 'A "Groningen" Hypothesis of Qumran Origins and Early History'. *Revue de Qumran*, 14, 1990, pp. 521-41.

Gerhardsson, B.: 'Illuminating the Kingdom: Narrative Meshalim in the Synoptic Gospels'. In: Wansbrough, H. (Ed.), *Jesus and the Oral Gospel Tradition*. Sheffield, 1991, pp. 266-309.

Goddard, D.: *Was Jesus Influenced by Buddhism?* Thetford, 1927.

Golb, N., Die Entdeckungen in der Wuste Judaas - neue Erklarungsversuche'. In: J. B. Bauer, J. Fink and H. D. Galter (eds.), *Qumran. Ein Symposion*. Graz, 1993.

Golzio, K.-H.: Der *Tempel im alten Mesopotamien und seine Parallelen in Indien*. Leiden, 1983.

Grim, E.: *Die Ethik Jesu*. Leipzig, 1917.

Gruber, E. R.: *Tranceformation. Schamanismus und die Auflosung der Ordnung*. Basel, 1982.

-: *Traum, Trance und Tod*. Freiburg, 1917.

Hass, H. : '*Das Scherflein der Witwe' und Seine Entsprechung im Tripitaka*. Leipzig, 1922.

Heine-Geldern, R. v.: 'Die Osterinselchrift' *Anthropos*, 1938.

Hengel, M.: *The Charismatic Leader and His Followers*. New York, 1981.

-: *Ketzergeschichte des Urchristenthums*. Leipzig, 1857.

Hjerl-Hansen, B.: 'Did Christ Know the Qumran Sect?' *Revue de Qumran*, 1, 1959, pp. 495-508.

Humbach, H.: 'Die aramaische Inschrift von Taxila'. *Akademie der*

Wissenschaften und Literatur. Mainz. Abhandlungen der geistes- und sozialwissenschaftlichen Klasse, 1969, pp. 3-13.
Jackson, A. V. W.: *Zoroaster*. New York, 1898.
Jacolliot, L.: *La Bible dans l'Inde*. Paris, 1869.
Jaspers, K.: *Vom Ursprung und Ziel der Geschichte*. Munich, 1949.
Jouveau-Dubreil: *Dupleix ou l'Inde conquise*. Pondicherry, 1941.
Judge, E. A.: 'The Early Christians as a Scholastic Community.' *Journal of Religious History, 1, 1960/61 pp. 4-15, pp. 57-65.*
Kee, H. C.: *Jesus in History: An Approach to the Study of the Gospels*. New York, 1970.
Keenan, J. P.: *The Meaning of Christ: A Mahayana Theology*. Maryknoll, 1989.
Kelber, W. H.: *Written Gospel*. Philadelphia. 1983.
Kennedy, J.: 'Buddhist Gnosticism, the System of Basilides' *Journal of the Royal Asiatic Society*, 1902, pp. 377-415.
-: The Early Commerce of Babylon with India, 700-300 B. C.' *Journal of the Royal Asiatic Society*. 1898, pp. 241-88.
Kern, H. (Trans.): *The Saddharm-Pundarika: or the Lotus of the True Law*. New York, 1963.
Kersten, H. and Gruber, E. R.: *The Jesus Conspiracy*. Shaftesbury, 1994. (2nd ed.).
Kersten, H.: *Jesus Lived in India*. Shaftesbury, 1994.
Klatt, N.: *Literarkritische Beitrage zum Problem christlich-buddhistischer Parallelen*. Cologne, 1982.
Klimkeit, H.-J.: 'Der Buddha Henoch: Qumran und Turfan'. *Zeitschrift fur Religions- und Geistesgeschichte*, 32, 1980, pp. 367-75.
Klimkeit, H.-J.: Gottes- und Selbsterfahrung in der gnostisch-buddhistischen Religionsbegegnung Zentralasiens'. *Zeitschrift fur Religions- und Geistesgeschichte*, 35, 1983, pp. 236-47.
-: 'Christian-Buddhist Encounter in Medieval Central Asia'. In: G. W. Houston (Ed.), *The Cross and the Lotus. Christianity and Buddhism in Dialogue*. Delhi, 1985, pp. 9-24.
Kloppenborg, J.: *The Formation of Q: Trajectories in Ancient Wisdom Collections*. Philadelphia, 1987.
Kloppenborg, J.: *Q Parallels: Synopsis, Critical Notes, and Concordance*. Sonoma, 1988.
Koch, K.: *Das Buch Daniel*. Darmstadt, 1980.
-: 'Buddhistisches in den apokryphen Evangelien'. In *Gurupujakaumudi*. Festgabe Zum 50jahrigen Doktorjubilaum Albrecht Webers. Leipzig, 1896.

Lassen, C.: *Indische Altertumskunde*. Bonn, Vol. I, 1847; Vol. II, 1849; Vol. III, 1858.
Lemberg-Karlovsky, C. C.: 'Trade Mechanisms in Indus-Mesopotamian Interrelations'. *Journal of the American Oriental Society*, 92, 1972, pp. 222-9.
-: 'Excavations at Tepe Yahya 1967-1969. *American School of Prehistoric Research Bulletin* 27, 1970.
Levi, S.: 'Le bouddhisme et les Grecs'. *Revue de l' Histoire des Religions*, XXIII, Paris 1893, pp. 36-49.
Lidzbarski, M.: *Das Johannesbuch der Mandaer*. Giessen, 1915.
Lillie, A.: *Buddhism in Christendom or Jesus, the Essene*. (1887), Reprint New Delhi, 1984.
Lubac, H. de: 'Textes alexandrins et bouddhiques'. *Recherches de Science religieuse*. 27, 1937, pp. 336-51.
Mack, B. L.: *The Myth of Innocence*. Philadelphia, 1987.
-: *The Lost Gospel. The Book of Q and Christian Origins*. Shaftesbury, 1993.
Maier, J. & Schubert, K.: *Die Qumran-Essener. Texte der Schriftrollen und Lebensbild*. Munich, 1991.
Mansel, H. L.: *Gnostic Heresies*. London, 1875.
McCrindle, J. W.: 'Anonymi [Arriani ut fertur] periplus maris erythraei'. *The Indian Antiquary*, 8, 1879, pp. 107-51.
McGregor Ross, H.: *The Gospel of Thomas*. Shaftesbury, 1991.
Meyer, B. F.: 'Some Consequences of Birger Gerhardsson's Account of the Origins of the Gospel Tradition?' In: Wansbrough, H. (Ed.), *Jesus and the Oral Gospel Tradition*. Sheffield, 1991, pp. 424-40.
Modi, J. J.: *Who were the Persain Magi, who Influenced the Jewish Sect of the Essene?* Festschift Moritz Winteritz, Leipzig1933, pp. 208-11.
Monier-Williams, M.: *Sanskrit-English Dictionary*. Oxford, 1889. (Repr. Delhi, 1976).
Montfaucon, B. de: *Libre de Philon de la vie contemplative...avec observations, ou l'on fait voir que les Threapeutes dont il parle etoient Chrestiens*. Paris, 1709.
Mookerji, R. K.: *Indian Shipping: A History of the Sea-Borne Trade and Maritime Activity of the Indians from the Earliest Times*. Bombay, 1957 (2nd Ed.).
Mukherjee, B. N.: *The Rise and Fall of the Kushana Empire*. Calcutta, 1988.
Muller, M.: 'On the Migration of Fables'. *The Contemporary Review*. XIV, 1870, pp. 572-98.
Mus, P.: *Barabudur. Esquisse d'une histoire de bouddhisme fondee' sur*

la critique archeologique des textes. Hanoi, 1935.
Mylius, K.: *Geschichte der altindischen Literatur.* Berne, Munich, 1988.
Nestle, W.: *Krisis des Christentums.* Stuttgart, 1947.
Neumann, K. E.: *Die letzten Tage Gotamo Buddhos. Aus dem grossen Verhor uber die Erloschung Mahaparinibbanasuttam.* Munich, 1922.
Nguyen, Van-Tot P.: *Le Bouddha et le Christ. Paralleles et resemblances dans la litterature canonique et apocryphe chretienne.* Rome, 1987.
Oppenheim, A. L.: 'The seafaring Merchants of Ur'. *Journal of the American Oriental Society,* 74, 1954, pp. 6-17.
Osborne, R. E.: 'The provenance of Matthew's gospel'. *Studies in Religion* 3, 1973/74, pp. 220-35.
Overbeck, F.: *Christentum und Kultur.* Basel, 1919.
Pagels, E.: *Versuchung durch Erkenntnis - Die gnostischen Evangelien.* Frankfurt, 1981.
Pattabiramin, M. P. Z.: *Les fouilles d' Arikamedu (Podouke).* Pondicherry, Paris, 1946.
Philonenko, M.: 'Un echo de la predication d' Ashoka dans l'epitre de Jacques'. *Ex Orbe Religionum,* Studia Geo Widengren Oblata I. Leiden, 1972, pp. 254-65.
Pigott, S.: Notes on Certain Metal Pins and a Macehead in the Harappan Culture'. *Ancient India,* I, 1948, pp. 26-40.
Piper, R. A.: *Wisdom in the Q-Tradition: The Aphoristic Teaching of Jesus.* Cambridge, 1989.
Plange, Th. J.: *Christus - ein Inder?* Stuttgart, 1906 (4th Ed.).
Przyluski, M. J.: 'Les Trois hypostases dans l'Inde et a Alexandrie'. *Melanges Franz Cumont,* 1937, pp. 925-33.
Radhakrishnan, S.: *Die Gemeinschaft des Geistes.* Darmstadt, Genf, 1952.
Rahn, O.: *Kreuzzug gegen den Gral.* Freiburg, 1933.
Raychaudhuri, H.: *Political History of Ancient India.* Calcutta, 1953.
Reese, W.: *Die griechischen Nachrichten uber Indien bis zum Feldzuge Alexanders des Grossen.* Leipzig, 1914.
Rhys Davids, T. W.: *Buddhist Birth Stories.* Vol. 1, London, 1880.
-: 'The Sambodhi in Ashoka's Eighth Edict'. *The Journal of the Royal Asiatic Society.* 1898, pp. 619-22.
Rienecker, F.: *Das Evangelium des Markus.* Wuppertal, 1971.
Riesner, R.: *Jesus als Lehrer, eine Untersuchung zum Ursprung der Evangelien-Uberlieferung.* Tubingen, 1988 (3rd Ed.).
Riesner, R.: 'Jesus as Preacher and Teacher'. In: Wansbrough, H. (Ed.), *Jesus and the Oral Gospel Tradition.* Sheffield, 1991, pp. 185-210.
Robertson, A.: *Die Ursprunge des Christentums.* Stuttgart, 1965.

Robinson, J. M. and Koester, H. (Ed.). *Trajectories Through Early Christianity.* Philadelphia, 1971.
Rohrborn, K. (Ed.): *Eine uigurische Totenmesse. Berliner Turfantexte II.* Berlin, 1971.
Roth , C.: *Geschichte der Juden.* Stuttgart, (n.d.)
-: *The Dead Sea Scrolls. A New Historical Approach.* Oxford, 1965.
Ruckstuhl, E.: *Die Chronologie der Passion und des Letzten Mahles Jesu.* Einsiedeln, 1963.
Rudolph, K.: *Die Gnosis.* Gottingen, 1990 (3rd Ed.)
Salomon, R.: 'Epigraphic Remains of Indian Traders in Egypt'. *Journal of the American Oriental Society* 111, 1991, pp. 731-6.
Scheil, V. E.: 'Un nouveau sceau hindou pseudo-sumerien'. *Revue d' Assyrologie et d' Archeologie Orientale,* 22, 1925, pp. 55f.
Schiffman, L.: 'The New Halakhic Letter (4QMMT) and the Origins of the Dead Sea Sect'. *Biblical Archeologist,* 53, 1990, pp. 64-73.
Schlumberger, D.: L. Robert, A. Dupont-Sommer, E. Beneviste, 'Une bilingue greco-arameenne d' Asoka'. *Journal Asiatique,* 1958, pp. 1-48.
Schmidt, I. J.: *Uber die Verwandtschaft der Gnostisch-Theosophischen Lehren mit den Religionssystemen des Orients, vorzuglich dem Buddhismus.* Leipzig, 1828.
Schneider, C.: Kulturgeschichte des Hellenismus. Vol. 1. Munich, 1967, pp. 898-901.
Schomerus, H. W. : *Ist die Bible von Indien abhangig?* Munich, 1932.
Schroeder, L. v.: *Pythagoras und die Inder. Eine Untersuchung uber die Herkunft und Abstammung der Pythagoreischen Lehren.* Leipzig, 1884.
Schumann, H. W.: *Der historische Buddha. Leben und Lehre des Gotama.* Cologne, 1986.
-: *Mahayana-Buddhismus. Die zweite Drehung des Dharma-Rades.* Manich, 1990.
Schutze, A.: *Mithras: Mysterien und Urchristentum.* Stuttgart, 1972.
Schwarz, G.: *Jesus 'der Menschensohn'. Aramaistische Untersuchungen zu den synoptschen Menschensohnworten Jesu.* Stuttgart, 1986.
-: *Wenn die Worte nicht stimmen. Dreissig Evangelientexte wiederhergestellt.* Munich, 1990.
-: *Fehler in der Bibel?* Munich, 1990.
-: *Die Bergpredigt - eine Falschung?* Munich, 1991.
Schwarz, G. and Schwarz, J.: *Das Jesus-Evangelium.* Munich, 1993.
Sedlar, J. W.: *India and the Greek World.* Totowa, 1980.
Seeberg, E.: 'Ammonios Sakas'. *Zeitschrift fur Kirchengeschichte,* LX, 1941.

Seydel, R.: *Das Evangelium von Jesu in seinen Verhaltnissen zu Buddha Sage und Buddha-Lehre.* Leipzig, 1882.

-: *Die Buddha-Legende und das Leben Jesu nach den Evangelien. Emeute Prufung ihres gegenseitigen Verhaltnisses.* Leipizg, 1884.

Smith, R.: *The Religion of the Semites.* London, 1894.

Snelling, J.: *Buddhismus.* Munich, 1991.

Sternbach, L.: 'Indian Wisdom and its Spread Beyond India'. *Journal of the American Oriental Society.* 92, 1972, pp. 97-123.

Streeter, B. H.: *The Buddha and the Christ.* London 1932.

Talmon, S.: 'Die Bedeutung der Qumranfunde fur die judische Religionsgeschichte'. In: J. B. Bauer, J. Fink und H. D. Galter (Ed.), *Qumran. Ein Symposion.* Graz, 1993, pp. 117-72.

Teicher, J. L.: 'Die Schriftrollen vom Toten Meer - Dokumente der judisch christlichen Sekte der Ebioniten. *Zeitschrift fur Religionswissenschaft und Geistesgeschichte,* 1951, pp. 153-209.

Thundy, Z. P.: *Buddha and Christ.* Leiden, 1993.

Vendryes, J.: *La religion des Celtes.* Paris, 1948.

Vermes, G.: 'The Etymology of "Essenes" ' . *Revue de Qumran,* 2, 1960, pp. 427-44.

Volney, C. F. von: *Die Ruinen oder Betrachungen uber die Revolutionen der Reiche.* Braunschweig, 1890 (11th Ed.)

Walhouse, M. J.: 'The Westward Spread of Some Indian Metaphors and Myths'. *The Indian Antiquary,* 8, 1879, pp. 162-4.

Wetering, J. van de: *Der leere Spiegel,* Munich, 1987.

Wheeler, M.: *The Indus Civilization.* Cambridge, 1968.

Winston, D.: 'The Iranian Component in the Bible, Apocrypha, and Qumran: A Review of the Evidence'. *History of Religions,* 1966, pp. 183-216.

Zurcher, E.: *The Buddhist Conquest of China.* Leiden, 1959.

උප ග්‍රන්ථ

ආදි බුද්ධ : *(සංස්කෘත)* පුද්ගලීකත්වයක් ආරෝපණය කරනු ලැබූ බුදුන් වහන්සේගේ 'ධර්මකාය' ශරීරය, සදාකාලිකවූත් අනුත්පාදවූත් බුද්ධත්වය පිළිබඳ මූලධර්මය

අභිධර්ම පිටකය : *(පාලි)* බෞද්ධ දර්ශනය පිළිබඳ දේශනා අඩංගු ත්‍රිපිටකයේ තුන්වන කාණ්ඩය

අමිතාභ : *(සංස්කෘත)* අචින්ත්‍යවූ ආලෝකයකින් හෙබි බුදුන් වහන්සේ/ ඓතිහාසිකව ජීවත්වූ ගෞතම බුදුන් වහන්සේගේ ස්වරූපයෙන් ලොව පහළ වූ දෙව්ලොව වැඩ වසන 'ධ්‍යානී' බුදුන් වහන්සේ

අරහත් : *(සංස්කෘත),* **අරහන්ත්** : *(පාලි)* : මේ ජීවිත කාලය තුළදී සත්‍යය අවබෝධ කරගත්, එනිසාම මරණයෙන් පසු නැවත ඉපදීමක් නොලබන පුද්ගලයා / හීනයාන ගුරුකුලයේ (ථේරවාද) පරමාදර්ශී අපේක්ෂාව මෙම තත්වයට පත්වීමය. එය මහායාන බුදු දහමේ දැක්වෙන බෝධිසත්ව සංකල්පයට වඩා වෙනස්ය.

අවලෝකිතේශ්වර :*(සංස්කෘත)* දෙව් ලොව වැඩ වසන මහා කාරුණිකයාණෝ / සුඛාවතී පරාදීසයේ ආරක්ෂකයා / කරුණාවේ ප්‍රතිමූර්තිය / නැගෙනහිර ආසියානු රටවල බෞද්ධයින් විශ්වාස කරන, ඔවුන්ගේ මහත් ගෞරවයට පාත්‍රව සිටින දෙව් කෙනෙක් ලෙස ජීවත්වන මතු බුදුවන බෝධිසත්වයින් වහන්සේ

අවෙස්ත : *(පැරණි පර්සියානු වචනයකි)* පර්සියානු ශුද්ධ ලියවිලි වල එකතුවකි

ආත්මන් : *(සංස්කෘත),* **අත්ත** : *(පාලි)* හින්දු ආගමේ දැක්වෙන සදාකාලික ආත්මය / බ්‍රහ්මන් යනුවෙන් හැඳින්වෙන සමස්ත ආත්මය / එය මහා සමුද්‍රයේ ඇති ජල බිඳුවක් වැනිය.

ආර්ය : *(ඉන්දු ආර්ය, ඉන්දු ඉරාන)* ඉන්දියාවට වෛදික ආගම රැගෙන ආ අශ්වාරෝහක ඉන්දු-ජර්මානු සංචාරක එඬේරුන්

ඇන්කරයිට්ස් නම් වූ සන්‍යාසීන් : *(ග්‍රීක්)* තුන්වන ශතවර්ෂයේදී සිරියාවේ සහ ඊජිප්තුවේ කාන්තාර ප්‍රදේශවල (පාළුකරයේ) වාසය කළ ක්‍රිස්තියානි තාපසයින්

ඇපොක්‍රිෆා : *(ග්‍රීක්)* ශුද්ධග්‍රන්ථ වල ඇතුළත් කර නොමැති ආගමික ලියවිලි

ඉන්ද්‍ර : (සංස්කෘත) මුල් ඉන්දියානු දෙවියකි / වෛදික දේව සමූහයේ වඩා වැදගත්ම දෙවියා

උපනිෂද් : (සංස්කෘත) පැරණි ඉන්දීය චින්තනය තුළට කර්මය, පුනර්භවය, බ්‍රහ්මන් සහ ආත්මන් සමඟ සහචාරතාවයට පත්වීම වැනි සංකල්ප ඉතා සූක්ෂම ලෙස ඇතුළත් කරමින් සම්භාව්‍ය ඉන්දීය දර්ශනවාදය ස්ථාපිත කිරීමට හේතුවූ පසු වෛදික යුගයේදී රචනා කරන ලද ගුඪ ආගමික ග්‍රන්ථ

කර්මය : (සංස්කෘත) (පාලි) කම්ම / පුද්ගලයකුගේ ඉරණම සහ ඉදිරි ජන්මයන් තීරණය කරනු ලබන සිතුවිලි, හැඟීම් ඇතුළු සියලු ක්‍රියාකාරකම් සඳහා විපාකදීමේ නියමය.

ක්ෂත්‍රිය : (සංස්කෘත) (පාලි) ඛත්තිය / බ්‍රාහ්මණ කුලයට පසුව එන දෙවන උසස් ආර්ය කුලය. රදළයින් සහ රණ ශූරයින් එයට අයත් වේ.

ක්‍රිෂ්ණ : (සංස්කෘත) විශේෂයෙන්ම භක්තිය මුල් කරගත් නූතන හින්දු ආගමට අයත් ජනප්‍රිය දෙවියකි. භගවත්ගීතාවේ ප්‍රධාන චරිතය මොහුය.

කොරමැන්ඩල් වෙරළ : අද තමිල්නාඩු යනුවෙන් හැඳින්වෙන (මැඩ්‍රාස්) නැගෙනහිර ඉන්දියානු වෙරළේ දකුණු ප්‍රදේශය

ඛුද්දක නිකාය : ධම්මපදයද ඇතුළත් සූත්‍ර පිටකයේ කොටසකි.

ගන්ධාරී ධම්ම පදය : ධම්මපදය බලන්න

ජාතක කථා : බුදුන් වහන්සේගේ පූර්ව ජන්මයන් පිළිබඳව පවතින මුල් බෞද්ධ ජනප්‍රවාද

ජිම්නොසොෆිස්ට් : (ග්‍රීක්) ඉන්දියාවේ විසූ දාර්ශනිකයින්/බුද්ධිමතුන් හැඳින්වීම පිණිස පාවිච්චි කරනු ලැබූ ග්‍රීක් - රෝමන් වචනයකි.

ජෛනාගම : ක්‍රි. පූ. 8 වන ශතවර්ෂයේ විසූ පාර්ශ්ව (Parshva) සහ බුදුන් වහන්සේට සමකාලීනව විසූ මහාවීර විසින් ශ්‍රමණ සමාජයක් ලෙස සංවිධානය කරනු ලැබූ විමුක්තිය පිළිබඳ මුල් ඉන්දීය ආගම. මෙය බ්‍රාහ්මණ ආගම විරෝධී ශ්‍රමණ සමාජයක් ලෙස ගොඩ නගන ලදී.

ටැල්මුඩ් : (හීබෲ) 'ඉගැන්වීම' / බයිබල් යුගයට පසුකාලයේදී යුදෙව් ජාතිකයින්ට බලපෑ නීති රීති සහ ආගමික සම්ප්‍රදායන් වල එකතුවකි.

ටෝරා (Torah) : (හීබෲ) 'ඉගැන්වීම' / මෝසස්ගේ පොත් පහ / මෝසස්ගේ නීතිය

ඩයස්පෝරා : (ග්‍රීක්) පලස්තීනයෙන් පිට ලොව පුරා පැතිර වාසය කරන යුදෙව් ජාතික සුළු ජන කොටස්

තණ්හා : (පාලි) (සංස්කෘත) තෘෂ්ණාව / බලවත් ආශාව, ලෝභය, කැමැත්ත, ගිජුකම

ත්‍රිකාය : (සංස්කෘත) ත්‍රිවිධ කාය / මහායාන බුද්ධාගමට අනුව බුදුන්වහන්සේගේ ත්‍රිකාය - ධර්මකාය (විශ්ව ශරීරය) සම්භෝගකාය (අනුත්තර ශරීරය) සහ නිර්මාණකාය (ලෞකික ශරීරය) යනුවෙන් හැඳින්වේ

ත්‍රිපිටකය : (සංස්කෘත) (පාලි) ත්‍රිපිටකය 'තෙවදෑරුම් එකතුව' / සම්භාව්‍ය බුදු දහම ඇතුළත් සූත්‍ර, විනය සහ අභිධර්ම යනුවෙන් හැඳින්වෙන කොටස් තුනකට අනුව ලියා ඇති බුද්ධ ධර්මය

ත්‍රිරත්නය : (සංස්කෘත) 'තෙරුවන්' / බුද්ධ, ධම්ම, සංඝ

ත්‍රිශික්ෂා : (සංස්කෘත) ශීල, සමාධි, ප්‍රඥා යනුවෙන් හැඳින්වෙන බෞද්ධ භික්ෂූන් විසින් අනුගමනය කළයුතු ත්‍රිත්ව විනය හෙවත් ශීලය

ථෙර : (පාලි) (සංස්කෘත) ජ්‍යෙෂ්ඨ ස්ථවිර / පළපුරුදු භික්ෂුව / ථෙරවාද බුද්ධාගමේ පදවියකි

ථෙරවාද : (පාලි) (සංස්කෘත) ස්ථවිරවාදය / ජ්‍යෙෂ්ඨයින්ගේ ඉගැන්වීම / ගිනිකොණ දිග ආසියාවේ පැතිර පවතින හීනයාන ගුරුකුලයේ තොනැසී ආරක්ෂාවී පවතින මුල් ඉගැන්වීම

දීපවංශය : දිවයිනේ ඉතිහාසය / ක්‍රි. ව. 400 දී පමණ රචනා කරන ලද ශ්‍රී ලංකා දිවයින පිළිබඳ වංශ කථාවකි. ක්‍රි. ව. 500 දී පමණ මහානාම නමැති භික්ෂුවක් විසින් රචනා කරන ලද මහාවංශය (මහා වංශකථාව) ලියාතිබෙන්නේ මෙම දීපවංශය පදනම් කරගෙනය

දීඝනිකාය : සූත්‍ර පිටකයේ කොටසකි

දෙමළ : ලෝකයේ පැරණිතම ලිඛිත භාෂාවක්ව පැවති දකුණු ඉන්දියාවේ වාසය කළ ද්‍රවිඩ මිනිසුන් හැඳින්වීම සඳහා යොදාගත් වචනයකි

ද්‍රවිඩ : උසස් සංස්කෘතියක් පැවති ඉන්දියාවේ වාසය කළ ප්‍රාග්-ආර්ය ජන කොටසකි. අලුතින් පැමිණි ආර්ය ආක්‍රමණිකයින් විසින් ඔවුන් දකුණු දිග ප්‍රදේශවලට පලවා හරිනු ලැබූහ. නොඑසේනම් ඔවුන් පහත් කුල වලට අයත් පුද්ගලයින් ලෙස හැඳින්වූහ. දෙමළ, තෙලිඟු, කන්නඩ සහ මලයාලම් යනාදී භාෂා ද්‍රවිඩ භාෂා ලෙස සැලකේ

ධම්මපදය : *(පාලි) (සංස්කෘත)* ධර්මපද / සුත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් කොටසකි. බුදුන් වහන්සේගේ ප්‍රකාශ ඇතුළත් ගාථා සංග්‍රහයකි. මුල් බුදුදහමට සහ ථෙරවාද බුදුදහමට අයත් වැදගත් ධර්ම ග්‍රන්ථයක් ලෙස සැලකේ

ධර්මය : *(සංස්කෘත) (පාලි)* ධම්ම / සත්වල පාලනය වන සදාකාලික විශ්ව නියමය / සදාචාරාත්මක නීති සහ ආගමික ඉගැන්වීම් වශයෙන් මිනිසුන් අතර ප්‍රකාශයට පත්කරන ධර්මතාවය / බුදුන් වහන්සේගේ ඉගැන්වීම් හැඳින්වීම සඳහා ධර්මය යන වචනය යොදනු ලැබේ.

ධර්ම චක්‍රය : *(සංස්කෘත) (පාලි)* ධම්මචක්ක / ධර්මය සංකේතවත් කරන ගරාදි අටකින් යුක්ත රෝදය / බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වල සංකේතය

ධර්මකාය : *(සංස්කෘත)* සියලුම බුදුවරු සහ සත්වල ඇතුළත් බුදුන් වහන්සේගේ විශ්ව ශරීරය / ත්‍රිකාය සහ අධි-බුද්ධ යන වචන බලන්න.

ධ්‍යානි බුද්ධ : *(සංස්කෘත)* භාවනා කිරීමේදී අත්දැකිය හැකි 'සම්භෝගකාය' ට අයත් දෙව් ලොව වාසය කරන බුදුවරු පස් දෙනා

ධ්‍යානි බෝධිසත්ව : *(සංස්කෘත)* ධ්‍යානි බුදුන් වහන්සේගේ ආධ්‍යාත්මික පිළිබිඹුවක් ලෙස පහළවන බෝධිසත්වයන් වහන්සේ / උදාහරණ : අමිතාභ බුදුන්ගෙන් පිළිබිඹු වන අවලෝකිතේශ්වර බෝසතාණන් වහන්සේ දැක්විය හැකිය

නිධාන කථා *(පාලි)* : ක්‍රි. ව. පස්වන ශත වර්ෂයේදී බුද්ධඝෝෂ නමැති භික්ෂුවක් විසින් පාලි භාෂාවෙන් රචනා කරන ලද බුදුන්වහන්සේ පිළිබඳව පවතින පැරණිතම චරිතාපදාන ලෙස සැලකෙන කථා ප්‍රවෘත්ති

නිර්මාණ කාය : *(සංස්කෘත)* මෙලොව පහළවූ බුදුවරයකුගේ ශරීරය (උදා : ගෞතම බුදුන් වහන්සේ) ත්‍රිකාය සහ මනුෂි බුද්ධ පිළිබඳවද කියවන්න.

නිර්වාණය : *(සංස්කෘත) (පාලි)* නිබ්බාන : ලෝභ, ද්වේෂ සහ මෝහ යන ක්ලේශයන් සම්පූර්ණයෙන් ප්‍රහීන කිරීමෙන් ඇතිවන සත්‍යාවබෝධය

පයිතගරස් : ක්‍රි. පූ. 6 වන ශත වර්ෂයේ විසූ ඉන්දියානු දර්ශනයේ ආභාෂය ලැබූ ග්‍රීක් දාර්ශනිකයෙකි

පංච තන්ත්‍රය : *(සංස්කෘත)* ක්‍රි. ව. පළමුවන ශත වර්ෂයට අයත් ඉන්දීය කථා වස්තුවල එකතුවකි. එකොළොස්වන ශත වර්ෂය වනවිට එම කථා ප්‍රවෘත්ති එවකට දැන සිටි ලෝකයේ අස්සක් මුල්ලක් නැර පැතිර තිබුණු අතර එම කථා භාෂා 50ක් සහ අනුවර්තන 200 වඩා වැඩි ප්‍රමාණයකින් පැවතුණි

පංචශීලය : බුදු දහමේ ඇතුළත් මූලික සදාචාරාත්මක ශික්ෂාපද සහ / එය ගිහියන්වද බලපායි. එයට සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම සහ රහමෙර පානය කිරීම යන දුසිරිත් වලින් වැළකීම ඇතුළත් වේ

පාතිමොක්ඛ : *(පාලි) (සංස්කෘත)* ප්‍රාතිමෝක්ෂ විනය පිටකයේ කොටසකි. භික්ෂූන් වහන්සේලා විසින් සෑම දෙසතියකටම වරක් ඇවැත් ප්‍රකාශ කරමින් කියවනු ලබන ආගමික ජීවිතය පිළිබඳ නීති රීති සමූහයකි

පාලි : ථෙරවාදී බුදු දහමේ ත්‍රිපිටකය සම්පූර්ණයෙන්ම ලියා ඇති මධ්‍ය ඉන්දීය උප භාෂාවකි (ප්‍රාකෘත)

පාලි ත්‍රිපිටකය : ථෙරවාදී බෞද්ධයින් විසින් ගුරුකොට ගෙන සලකන ශ්‍රී ලංකාවේ භාවිතාවන ත්‍රිපිටකයේ පාලි අනුවර්තනය

පුරාණ : *(සංස්කෘත)* පුරාණෝක්ති, දාර්ශනික සහ ඓතිහාසික කථා ප්‍රවෘත්ති සංග්‍රහයකි

ප්‍රඥාව *(සංස්කෘත) (පාලි)* පඤ්ඤා : 'බුද්ධිය, දැනීම, අවබෝධය' / බුදුන් වහන්සේගේ ධර්මය අධ්‍යයනය කිරීම (ත්‍රිශික්ෂා පිළිබඳව බලන්න) මෛත්‍රිය, බුද්ධිය සහ අවබෝධය සලසා ගැනීමේ මාර්ගය ලෙස මහායානිකයින් සලකයි

ප්‍රාකෘත : ථෙරවාද (පාලි ත්‍රිපිටකය) සහ ජෛන ආගමේ පොත් ලිවීම සඳහා භාවිතා කරනු ලැබූ සංස්කෘත භාෂාවෙන් ප්‍රභවය වූ මධ්‍ය ඉන්දියානු භාෂා

බෝධි : අවබෝධය / සත්‍යය අවබෝධ කර ගැනීම

බෝධිසත්ව : *(සංස්කෘත)* සත්‍යය අවබෝධ කරගත් තැනැත්තා / දුක් විඳින සත්වයා කෙරෙහි අනුකම්පාවෙන් නිවන් සැප ලැබීම ප්‍රමාද කරනු ලැබූ සත්‍යය අවබෝධ කරගත් ධාර්මික පුද්ගලයා / මහායාන බුද්ධාගමේ අපේක්ෂිත උසස්ම තත්වය බෝධිසත්වයකු බවට පත්වීමය. මෙය හීනයාන බුදු දහමේ එන 'අරහත්' තත්වයට වඩා වෙනස්ය.

බ්‍රහ්ම : *(සංස්කෘත)* හින්දු ආගමේ දෙවියෙකි. බ්‍රහ්ම -විෂ්ණු-ශිව යනුවෙන් දැක්වෙන ත්‍රිමූර්තියේ ඇතුළත් ලෝකය මැවූ තැනැත්තා

බ්‍රහ්මන් : *(සංස්කෘත)* හින්දු ආගමේ (වේදාන්ත) දැක්වෙන පරමාත්මය සමස්ත ආත්මය - සමස්ත පැවැත්මේ ආරම්භය

බ්‍රාහ්මණ : *(සංස්කෘත)* ක්‍රි. පූ. 1000 දී පමණ වේද ග්‍රන්ථවලට එකතු කරන ලද පරිශිෂ්ට හෙවත් උපග්‍රන්ථ. පුදපූජා සහ අභිචාර විධි පිළිබඳ වට්ටෝරු මෙන්ම දේව ධර්මය පිළිබඳ කරුණු ඇතුළත් සූත්‍ර දේශනා

බ්‍රාහ්මණයින් : කුලභේදය මත පදනම් වූ ආර්ය සමාජයේ විශ්‍ව පූජකයින් සහ පණ්ඩිතයින් අයත් වූ උසස්ම කුලයට අයත් පුද්ගලයින්

බ්‍රාහ්මණ ආගම : සම්මත හින්දු ආගමේ වර්ධනයේ එක් අවස්ථාවකි. (වේද ග්‍රන්ථවල සඳහන් වන එළිදරව්ව පිළිබඳ අදහස් සහ බ්‍රාහ්මණ කුලයේ පූජකවරුන්ගේ අධිකාරිත්වය පිළිගත් ගුරුකුලය) ක්‍රි. පූ. 600 - ක්‍රි. ව. 400 කාලයේදී පමණ වෛදික දෙවිවරු හින්දු දර්ශන වාදයට අනුව වර්ග කරනු ලැබීය. එමෙන්ම හින්දු ආගමේ බ්‍රාහ්මණ මූලධර්ම වර්ධනය වීමද මෙකල සිදුවිය

භික්ඛු *(පාලි)* භික්ෂු *(සංස්කෘත)* (ස්ත්‍රී ලිංග - භික්ඛුණී/භික්ෂුණී) සංචාරක පැවිද්දන් - බෞද්ධ පැවිද්දන් හැඳින්වීම සඳහා යොදන නමකි

මජ්ඣිම නිකාය : සූත්‍ර පිටකයේ කොටසකි

මලබාර් වෙරළ : අද කේරල ප්‍රාන්තය නමින් හැඳින්වෙන ඉන්දියාවේ බටහිර වෙරළේ දකුණු කොටස

මහා පරිනිබ්බාන සූත්‍රය : *(පාලි)* සූත්‍ර පිටකයේ (දීඝ නිකාය) කොටසකි. බුදුන් වහන්සේගේ ජීවිතයේ අවසාන දින කීපය සහ උන්වහන්සේගේ පරිනිර්වාණය පිළිබඳ තොරතුරු එහි ඇතුළත් වේ

මහාභාරතය : *(සංස්කෘත)* හින්දු ආගමට අයත් ඉතා උසස් ආගමික කෘතියක් වන ඉන්දියානු වීර කාව්‍යයකි. එයට කීර්තිමත් 'භගවත් ගීතාව' ඇතුළු පොත් 18 ක් අයත් වේ.

මහාවග්ගය : ආශ්‍රමික ජීවිතය පිළිබඳ නීති රීති සහ අණ පනත් ඇතුළත් විනය පිටකයේ පළමු පොත

මහායානය : සියලු සත්වයින් දුකින් මුදවා ගැනීම සඳහා උත්සාහ කරනු ලබන බෞද්ධ ගුරුකුලය. මීට පටහැනිව පවතින 'හීනයානය' මගින් කටයුතු කරන්නේ පුද්ගල විමුක්තිය සලසා ගැනීම පිණිස පමණි.

මහාවංශය : දීපවංශය බලන්න

මහාසාංඝික : *(සංස්කෘත)* මහා සංඝයා යන අර්ථය දෙයි. බෞද්ධ ගුරුකුලයකි. මහාසාංඝික නිකාය මහායානය බිහිවීමට පුරෝගාමී විය.

මනුෂි බුද්ධ : *(සංස්කෘත)* නිර්මාණකාය පිළිබිඹු කරන මනුෂ්‍ය වේශයෙන් පෙනී සිටින බුදුන් වහන්සේ

මිත්‍ර : *(ග්‍රීක්)* ඉන්දු-ඉරාන දෙවිවරුන්ගෙන් කෙනෙකි. මොහු ක්‍රිස්තියානිය පැවති සමයෙහි රෝම අධිරාජ්‍යයේ ප්‍රචලිතව පැවති සංකලන ආගමේ ගැලවුම්කාරයා ලෙස සලකනු ලැබීය.

මුද්‍ර : *(සංස්කෘත)* සංකේතාත්මකව ගූඪ අර්ථ නිරූපණය කරන අයුරින් අත් සහ ඇඟිලි පිහිටුවීම

මෛත්‍රී බුදුන් : *(සංස්කෘත) (පාලි)* මෛත්‍රේ බුදුන් / මහා කාරුණික, අනාගතයේදී පහළවන බුදුන් වහන්සේ

යජුර් වේදය : *(සංස්කෘත)* වේද ග්‍රන්ථවල කොටසකි

යෝග : *(සංස්කෘත)* ප්‍රාග් ආර්ය යුගයේදී ආරම්භවූ ගූඪ අභ්‍යාස විධි. ආත්මයේ විමුක්තිය ලබාගැනීම සඳහා ආශ්වාස ප්‍රාශ්වාස කිරීමේ ක්‍රම, ශාරීරික ඉරියව් පිහිටුවීම, ඉන්ද්‍රිය පාලනය, සහ භාවනාව වැනි ක්‍රම විධි ඇතුළත් වේ.

රාමායනය : *(සංස්කෘත)* මහාභාරතයට පමණක් දෙවෙනි වන ඉන්දීය වීර කාව්‍යයකි

රිග් වේදය : *(සංස්කෘත)* සාග් වේදය දැනට ඉතිරිව ඇති පැරණිතම ඉන්දීය ආගමික ග්‍රන්ථය. වේදග්‍රන්ථ වල පළමුවන කොටස / දෙවියන් සඳහා ගායනා කරන ලද ස්තෝත්‍ර එහි ඇතුළත්ය

ලලිත විස්තරය : *(සංස්කෘත)* බුදුන් වහන්සේ යනු දෙව්ලොවින් පැමිණි ගැලවුම්කාරයකු බව විස්තර කරන, බුදුන් වහන්සේගේ ජීවිතය පිළිබඳ පුරා වෘත්තයකි

වරුණ : *(සංස්කෘත)* පුරාණ ඉන්දීය (වෛදික) දෙවියෙකි. පර්සියාවේ අහුර මස්ඩා සහ ග්‍රීසියේ සූඑස් වැනි දෙවිවරුන්ට බොහෝ දුරට සමානය

විනය පිටකය : 'භික්ෂු විනය පිළිබඳ කරුණු' / බෞද්ධ පැවැත්ම පිළිබඳ විනය නීති රීති ඇතුළත් ත්‍රිපිටකයේ පළමුවන කොටස

විෂ්ණු : *(සංස්කෘත)* හින්දු දෙවියෙකි. බ්‍රහ්ම, විෂ්ණු ශිව යනුවෙන් හැඳින්වෙන ත්‍රිමූර්තියේ කොටසකි. ඒකේශ්වර වෛශ්නව හින්දු ආගමට අනුව විෂ්ණු යනු රාමා සහ ක්‍රිෂ්ණාගේ ස්වරූපයෙන් ලොව පහළවූ දෙවියකු ලෙස සලකා වැඳුම් පිදුම් කරනු ලැබේ

විහාරය : බෞද්ධ ආශ්‍රමය

වේදය : *(සංස්කෘත)* 'දැනීම' / පුරාණ ඉන්දියාවේ පැවති සමස්ත ශුද්ධ ලියවිලි සම්භාරය. එය සාග් වේදය (දෙවියන්ට ගයන ස්තෝත්‍ර) සාම වේදය (ගීතිකා) යජුර්වේදය (බිලිපූජා කිරීමේදී ගායනා කරන ගීත) අතර්වවේදය යනුවෙන් කොටස් හතරකින් යුක්තවේ

වේදාන්ත : *(සංස්කෘත)* උපනිෂද් ග්‍රන්ථ මුලදී හඳුන්වනු ලැබූ නාමය / මධ්‍යතන යුගයේදී ආධ්‍යාත්මික විද්‍යා රාශියක් හැඳින්වීම සඳහා මෙම පදය යොදාගනු ලැබීය. ක්‍රි. ව. 18 වන ශත වර්ෂයේදී අද්වෛත වාදය - ද්විත්වයක් නොමැතිය යන අදහස එයට ඇතුළත් වේ

ශරතුස්ත්‍ර : සොරෝඇස්ටර් - ක්‍රි. පූ. 600 දී පමණ නැගෙනහිර ඉරානයේ විසූ පර්සියානි දිවැසිවරයෙකි. පර්සි ආගමේ නිර්මාතෘවරයා

ශාක්‍යමුණි : ශාක්‍ය වංශයේ බිහිවූ ප්‍රාඥයා / ඓතිහාසික වශයෙන් ලොව පහළ වූ බුදුන්වහන්සේ හැඳින්වීමට යොදා ගන්නා ගුණවාචී විශේෂණ පදයකි

ශීලය : බුදුදහම අනුව ප්‍රඥාව, අවබෝධය ඇතිකර ගැනීම පිණිස අනුගමනය කළයුතු සදාචාරාත්මක පැවතුම් ක්‍රමය (ත්‍රිශිකා පිළිබඳව බලන්න)

ශිව : *(සංස්කෘත)* හින්දු දෙවියකි. බ්‍රහ්ම, විෂ්ණු, ශිව යනුවෙන් හැඳින්වෙන දිව්‍යමය ත්‍රිමූර්තියේ කොටසකි

ශ්‍රමණ : *(සංස්කෘත)* *(පාලි)* සමණ / සංචාරක තවුසන් / බ්‍රාහ්මණ ආගමට පටහැනි ආගමකට අයත් සමාජිකයෙක් හෝ පුරාණ ඉන්දීය ප්‍රව්‍රජා සමාජයේ නියෝජිතයෙක්

සමාධි : *(සංස්කෘත)* අවලෝකනය, ධ්‍යානය, භාවනාව, ආධ්‍යාත්මික ඒකාග්‍රතාවය

සම්ඛාය : *(සංස්කෘත)* පුරුෂ සහ ප්‍රකිති යනුවෙන් විශ්වයේ පවතින එකිනෙකට ප්‍රතිවිරුද්ධ බලවේග පෙන්නුම් කරන ප්‍රාග් බෞද්ධ ඉන්දීය දර්ශනය

සම්භෝගකාය : *(සංස්කෘත)* ස්වර්ගයේ වැඩ වාසය කරන අනුත්තරවූ ධ්‍යානී බුදුන් වහන්සේගේ / ශරීරය විශ්ව ධර්මකායෙන් මිදීම

සවස්තික : *(සංස්කෘත)* පැරණි ඉන්දීය සංකේතයකි

සංකලනවාදය : විවිධ ආගමික බලපෑම් වල එකතුවෙන් සකස්වුනු දර්ශනයකි

සංඝ : බෞද්ධ ආශ්‍රමික සමාජය / ත්‍රිරත්නය

සංසාරය : *(සංස්කෘත)* දුකින් පිරුණු අනිත්‍ය ස්වභාවය උරුම කරගත් ලෝකය. නැවත නැවත ඉපදීම

සංස්කෘත : ලතින් සහ ග්‍රීක් භාෂාවලට සම්බන්ධ පැරණි ඉන්දියාවේ ඉහළ සමාජයේ භාවිතාවූ භාෂාව / ශාස්ත්‍රීය භාෂාවක් ලෙස අදත් ජීවමානව භාවිත වේ.

සාරාත්මක ශුභාරංචියේ පොත් : මතෙව්, මාක් සහ ලූක් විසින් රචිත ශුභාරංචියේ පොත්

සිබිල් : *(ලතින්)* සිබිල්ලා / ඉතා පුරාණයේ විසූ අනාගතයේදී සිදුවන

දේ කීමට හැකිවූ ජ්‍ය්‍රියකි.

සුඛාවතිය : *(සංස්කෘත)* 'ශුද්ධ දේශය' අමිතාභ බුදුන් වහන්සේ විසින් ගොඩ නගන ලද පාරාදීසය

සුත්ත පිටකය : *(පාලි) (සංස්කෘත)* සූත්‍ර පිටකය : බුදුන් වහන්සේගේ දේශනා එකතුවකි. බුදුන් වහන්සේගේ මූලික ඉගැන්වීම් පිළිබඳ ව්‍යාඛ්‍යාන ඇතුළත් ත්‍රිපිටකයේ දෙවන කොටස / 'නිකාය' යනුවෙන් හැඳින්වෙන ප්‍රධාන කොටස් 5 ක් ඊට ඇතුළත් වේ

සුල්ව සූත්‍රය : යාග හෝම පැවැත්වීම සඳහා ස්ථානයක් පිළියෙළ කළ යුතු ආකාරය පිළිබඳ විස්තර ඇතුළත් පැරණි ඉන්දිය සංග්‍රහයකි

සූත්‍ර : *(සංස්කෘත) (පාලි)* සුත්ත : බුදුදහමට අනුව බුදුන් වහන්සේගේ දේශනා සූත්‍ර වශයෙන් හැඳින්වේ. හින්දු ආගමට අයත් ආගමික සහ දාර්ශනික ඉගැන්වීම් ඇතුළත් කොටස් සූත්‍ර වශයෙන් හැඳින්වේ.

සෙන් : *(ජපන්)* සංස්කෘත ධ්‍යාන (චීන 'චාන්') 'භාවනාව' භාවනාව කේන්ද්‍ර කරගත් මහායාන ආගමික ක්‍රියාමාර්ගයකි.

ස්ථවිර, ස්ථවිරවාදය : *(සංස්කෘත)* ථෙර, ථෙරවාද යන වචන බලන්න

ස්තූප : *(සංස්කෘත) (පාලි)* ථූප : බුදුන්වහන්සේගේ හෝ වෙනත් ඕනෑම රහතන් වහන්සේ නමකගේ ධාතු නිධන් කර ගොඩනගා ඇති ගෝලාකාර ශිඛරයකි. පුරාණ ඉන්දියාවේ පැවති කඳු වන්දනා කිරීමේ අභිචාර ක්‍රම වලින් ප්‍රභවය වූ වන්දනා ක්‍රමයකි. පැරණි බෞද්ධ ස්තූප වලින් විශ්වය සංකේතවත් කර තිබේ.

හිත්තෝපදේශය : පංචතන්ත්‍රය නමැති කථා සංග්‍රහය අනුසාරයෙන් පසුකාලීනව රචනා කරන ලද පොතකි.

හීනයානය : 'කුඩා යානය, / මහායාන අදහස් ප්‍රතික්ෂේප කරනු ලැබූ මුල් බුදු දහම පිළිබඳ ගතානුගතික ගුරුකුලය / දැනට පවතින එකම හීනයාන ගුරුකුලය ථෙරවාදී බුදු දහමයි.

ස්ථාන නාම සූචිය

අ

අකාඩ් 48

අචිරවතී 145

අමරාවතී 142

අමිරි 48, 54

අම්රිත්සාර් 85

අයින්ෆෙස්කා 315

අරාබිය 62, 73, 101-103

අරිකමේඩු 105, 106

ආර්කෝසියාව 55

ආර්මේනියාව 73

ඇතන්ස් 74, 83, 106, 249

ඇනටෝලියාව 56, 59-61

ඇෆ්ගනිස්ථානය 55, 60, 67, 73, 85, 90, 95, 250, 251

ඇරෙසො 106

ඇලෙක්සැන්ඩ්‍රියාව 35, 39, 99-101, 107, 116, 127, 203, 244, 259-262, 264, 266, 269, 272, 273, 275, 280, 293, 299, 348

ඇසේනියාව 73

ඇරකෝසියාව 87

ඉ

ඉජිප්තුව 48, 49, 61, 67, 73, 77, 101, 109, 157, 161, 210, 258, 262, 272, 278, 280, 335, 336, 342, 360

ඉතියෝපියාව 103

ඉන්දු චීනය 103

ඉන්දු ගඟ 46, 48, 64, 66, 82, 97, 274, 276

ඉන්දු නිම්නය 31, 48, 51, 55, 56, 69, 72, 77, 83, 84, 87, 276, 279

ඉන්දුනීසියාව 103

ඉරානය 53, 57, 59, 67, 83, 98, 104, 260

ඉරාකය 55

ඉසිපතනය 20, 91, 233

ඊ

ඊජියන්-ගෝබර් 63

ඊස්ටර් දූපත් 59

ඊශ්‍රායලය 215

උ

උම්මා 50, 51

උරුවෙල 19, 21

ඌර් 50-52, 57, 65, 66, 68

එ

එදෙස්සා 108, 280, 353, 354

එන්ගෙඩි 304, 305, 315

එලම් 54, 53

එලාස් 63

එල්-ගුබ්ර් 315

එල්-බෙනිසා 162

ඒඩන් 73

එන් ෆෙස්කා 318

ඔ

ඔක්සස් 255, 276

ඔක්සිරින්කෝස් 162, 207

ඔෆීර් 62, 64-66

ඔරිස්සා 93

ඔලිව් කන්ද 211, 212

ඔහින්ඩ් 274

ක

කතියවාර් අර්ධද්වීපය 48

කන්දහාර් 55, 252-254

කපර්නවුම / කැපර්නෙම් 8, 214, 236

කපිලවස්තු 17
කපිසි 274
කප්පඩෝසියාව 260
කයිරෝ 157
කර්මානිය 101
කල්වන් 277
කාබුල් 254
කාර්තේජ් 98
කාර්පසස් 102
කාලිංග 93-95
කාශ්මීරය 274
කාසි 91, 274
කැම්බේ බොක්ක 55
කැලිකට්/කොසිකෝඩ් 101
කිෂ් 50
කුම්රාන් 157, 237, 245, 263, 284-287, 292, 299-304, 305-321, 323, 324, 326-328, 330, 331, 336
කල්ලි 54
කුසිනාරා 91
කේන් 73, 102, 338
කේරලය 107, 108
කොචින් 107
කොට්ඩිජි 54
කොන්ස්තන්තිනෝපල් 134
කොප්ටෝස් 101
කොප්හෙන් 55
කොරමැන්ඩල් වෙරළ 97, 103, 105
කෝසල 23, 237, 274, 275
ක්‍රොකැලා 86
ක්‍රීටය 52
කෑයිලෙනොපොලිස් 86

ග
ගන්ධාර 31, 83, 92, 97, 99, 105, 108, 135, 269, 273, 274, 276, 278, 279, 350, 353, 354
ගංගානම් ගඟ 14-16, 18, 89, 90, 100, 141, 246, 274, 279
ගැරිසිම් 148
ගැලීලි 11, 175, 209, 210, 215, 236, 237, 281, 296, 301
ගුජරාට් 28, 55
ගුන්ඩස්ට්‍රුප් 57
ගෙඩ්‍රෝසියාව 102
ගෙර්හා 72
ගෙර් 237
ගෝල් 57, 335
ග්‍රීසිය 33, 46, 89, 105, 251, 254, 255, 342

ච
චන්ද්‍රනගර් 39
චර්බට් මර්ඩ් 309
චේනාබ් 85
චීනය 45, 46, 68, 72, 102, 276, 358

ජ
ජුදා 70, 75, 209, 210, 236, 283, 293, 296, 299, 302
ජපානය 358
ජුලිමපෝලිස් 101
ජුලුන්දූර් 85
ජෙරුසලම 11, 70, 107, 120, 123, 125, 148, 149, 167, 208, 211, 212, 215, 222, 309, 310, 330
ජෙරිකෝ 211, 304, 308
ජෝර්දානය 211, 216, 233, 236, 242, 243

ට
ටයර් 63
ටයිග්‍රිස් 46, 48, 54, 72, 297
ටයිබීරියාව 8

ටර්ෆාන් 351
ටස්කනි 106
ටැඩ්මෝර් 254
ටැබනිසි 335
ටිල්මුන් 65
ටෙල් අෂ්මර් (අෂ්නු නැක්) 50

ඩ
ඩැමැස්කස් 11, 286, 300, 301, 306, 312, 316
ඩිමුරයික් 102
ඩෙකපොලිස් 296, 301, 329
ඩෙන්ඩෙරා 259, 335

ත
තරිම් නිම්නය 276, 351
තක්ෂිලා 84, 85, 87-89, 92, 99, 108, 252, 254, 260, 261, 273,-280, 350
තාකොට් 276
තාර් කාන්තාරය 59
තාර්ෂිස් 62, 63, 65
තිනායි 102
තුර්කිය 61
තෙපයහයා 53, 54
තිබෙට් 335

න
නම්මඩියෝස් 102
නයිල් 46, 48, 62, 77, 85, 99-101, 335
නහල් මිෂ්මාර් 309
නහල් හීවර් 309
නාසරත් 3, 4, 325
නාලන්දා 28
නැග් හැමඩි 159, 161-163
නිට්‍රින් 335
නිඩෝස් 67, 83
නිනාවේ 55
නෙල්කුණ්ඩා 101, 102
නෙවලි කෝරි 61
නේපාලය 17, 256
නේරන්ජනා 19, 229

ප
පන්ජාබ් 48, 49, 52, 83, 87, 89, 90, 104, 259
පර්සියාව 45, 61, 83, 88, 108, 113, 252, 255
පලස්තීනය 41, 47, 56, 61, 62, 70, 73, 104, 113, 116, 127, 129, 138, 139, 177, 178, 189, 194, 214, 220, 247, 254, 272, 283, 284, 287, 291, 293, 299, 302, 311, 318, 361
පාකිස්ථානය 48, 49, 55
පාටලීපුත්‍ර 88, 90, 92, 273
පාර්තියාව 98
පැල්මයිරා 254, 255, 279, 353
පැට්නා 88
පුල්-ඉ-ඩරුන්ටේ 253
පුෂ්කරවතී 273, 274
පීරු 62
පෙරේ 237
පෙෂවාර් 31, 273
පොන්ටෝස් ඉයුක්සිනෝස් 255
පොම්පෙයි 255
පොන්ඩිචෙරි 105

බ
බලුකිස්ථානය 53, 54, 90
බම්පූර් 54

බයිතානා 103
බරමුලා 274
බරණැස් 17, 20
බරුගාසා 102, 103
බර්ස් නිම්රුඩ් 55, 68
බහරේන් 65
බරාබර් 96
බාර්බරිකොන් 102, 280
බැක්ට්‍රියාව 55, 84, 102, 274, 302
බැග්ඩැඩ් 309
බැබිලෝනියාව 51, 52, 55, 60, 68- 70, 72, 73, 82, 86, 107, 111, 274, 302
බිත්නියාව 6
බිහාර් 17
බෙත්ලෙහෙම් 281, 330
බුද්ධගයාව 19, 20, 90, 96, 105, 256
බුරුමය 276
බෙරනයිස් 100, 101
බෙසිස්ලික් 277
බොගැස්කෝයි 60
බොම්බාය 55
බ්‍රෝච්/බහරුච් 102

ම

මක්කන් 65, 66
මගධ 17, 23, 29, 31, 89-91, 96, 138, 274, 275
මධ්‍යධරණී 12, 47, 55, 62, 65, 72, 74, 105, 106, 113, 253, 335
මන්සේහෙරා 274, 276
මයොසෝර්මෝස් 101
මලබාර් වෙරළ 97, 101, 103, 107
මවුසා 73, 101
මසාඩා 309, 316, 317
මහාරාෂ්ට්‍ර 89
මාර්සේ 58
මැඩ්‍රාස් 108, 109
මැරිබවිස් 261, 264, 272, 280, 282, 293
මැසෝතාලන්තය 73
මැංගලෝර් 101
මිතානිය 60
මින්නගර් 102
මියුසියෝන් 99, 100
මුන්ඩිගැක් 54
මුරබ්බා අත් 309
මුසිරිස් 101, 102, 107-109
මෙම්ෆිස් 258-260, 262
මෙරෙන්ටා 258
මෙලුහා 70
මෙසපොටේමියාව 49, 51, 52, 54, 56, 58, 65, 69, 71, 72, 83, 97, 108, 254, 255, 280
මොහෙන්දජාරෝ 51, 58

ය

යුප්‍රෙටීස් 52, 54, 56, 72, 88, 301

ර

රවී 85
රාජ්ග්‍රිහ / රජගහ 23, 24, 27, 91, 274
රාජස්ථාන් 28, 56
රූපාර් 48
රුවන්වැලි සෑය 261
රූපර්ටුස් 58
රෝමය 6, 34, 98, 105, 211, 215, 296, 339, 342

ල

ලක්සෝර් 161
ලැග්මන් නිම්නය 253, 254

ලියන්ටෝපොලිස් 335
ලිඩියා 72
ලුම්බිනි 17, 122
ලියුක් කෝම් 101
ලෝදල් 55

ව

වෛයිශාලි (විශාලා) 30, 91, 278
විදේහ 89
වීරපට්ටනම් 106

ශ

ශ්‍රී නගර් 31, 109, 274
ශ්‍රී ලංකාව 40, 89, 100, 103, 135, 276
ශ්‍රාවස්ති 23

ෂ

ෂාබස්ගාරි 255

ස

සට්කැජන්දෝර් 48
සමාරිය 148, 156, 283
සරස්වතී 59
සාර්-ඉ-සොක්තා 54
සාරානාත් 91
සාහ්-ඊ-ටුම්ප් 54
සාංචි 105, 142, 143
සිකාර් 148
සිම්ලා 48
සිරියාව 39, 41, 70, 83, 96, 104, 105, 108, 116, 247, 254, 261, 279, 284
සිසෙරස් 101
සිංකියෑං 278, 351
සුමේර් 48
සුආර්ග්‍රොස් 102
සුසා 50
සේද මාවත 276
සොකොට්‍රා 65, 103
ස්වොට් නිම්නය 85, 89, 276

හ

හයිඩැස්පස් 85
හයිදරාබාද් 60
හරිපූර් නිම්නය 274
හින්දුකුෂ් 54, 84
හිමාලය 276
හෝර්මුස් 65

පුද්ගල නාම සූචිය

අ

අක්බාර් 40
අගතාචයිඩිස් - නිඩෝස්හි 67
අජාසත් 23
අමුත් 335
අග්නි 84
අශෝක 30, 97-98, 100, 134, 135, 247, 251-255, 256-259, 262, 266, 269-273, 275-279, 283, 291, 292, 304, 353
අශ්වඝෝෂ 25
අසිත 121, 122-124, 230
ආකිමෙනිඩිස් 69, 255, 274
ආබ්‍රහම් 117, 148, 265
ආනන්ද 24, 25, 30, 147, 349
ඇපොලොඩෝටස් 104
ආර්ටැක්සර්ක්ස් II 83
ආලාර කාලාම 18
ඇනෙක්සගෝරස් 74
ඇනැක්සිමැන්ඩර් 75
ඇන්ටිමකස් 88, 96, 97, 100, 270, 294, 296
ඇන්ටිගෝනස් ගොනාටාස් 97
ඇන්ටිගෝනෝස් 297
ඇතෙනොයොස් 82
ඇම්මෝනියස් සක්කාස් 344
ඇමෝර්, ආර්. සී. 115, 178, 220, 221
ඇරිස්ටෝටල් 35, 82, 144
ඇරිස්ටොෆෙනස් 73
ඇරිස්ටොබියුලස් 35, 36, 296
ඇලෙක්සැන්ඩර්-එපිරස්හි 97
ඇලෙක්සැන්ඩර්-කොරින්ත්හි 97
ඇලෙක්සැන්ඩර් පොලිහිස්ටර් 77, 105
ඇලෙක්සැන්ඩර්, මහා 66, 82, 84-89, 92, 98, 106, 259, 293
ඇල්මනේසර් 70, 77

ඉ

ඉබ්-සින් 66
ඉක්ස්වාකු 17
ඉන්ද්‍ර 59, 60
ඉරැටෝස්තිනීස් 100
ඉරේනියස් 9, 11, 347

ඊ

ඊනොක් 265, 295, 324

උ

උද්දකරාම පුත්‍ර 18, 234
උපගුප්ත 256
උත්තර 276
උපදේශකයා 148

එ

එලිජා 43, 130, 349
එම්පිඩොක්ලීස් 74, 78, 330
එපමෙනයිඩ් 329
ඒලියස් ගැලුස් 101

ඔ

ඔගස්ටස් 105, 106, 279
ඔගස්ටින් - රුඩෝල්ෆ් 330
ඔනියස් 112, 300
ඔරිගන් 7, 203, 308, 343, 344, 346, 347, 355
ඕල්ඩන්බර්ග්, එච්. 25

ක

කලනෝස් 89, 106
කලාට්, එන්. 144
කබීර් 40
කපිල 80
කනිෂ්ක 344
කාශ්‍යප 142, 144
කැන්ටර්, එම් 80
කැරකැල්ලා 107
කැසියන් 335, 336
කැලිෆෝනියාව 170
කැස්පර් 354
කර්ටියස් රූෆස් 84
ක්ලෙමන්ට් 78, 203, 269, 343
ක්ලෝඩියස් 6
ක්ලොපන්බර්ග්, ජෝන් 168
කේස්මාන් 13
කොන්ෆියුසියස් 43
කොන්ස්ටන්ටයින් 341
කොන්සි, ඊ. 163
කෞටිල්‍ය 90
ක්ෂෙනොෆේන් 75

ග

ගාර්බි, ආර්. 42, 76, 123, 141
ගමාලියල් 11
ග්‍රෙන්ෆෙල් 11
ගාර්ෂියා මාටිනස්, එෆ්. 312
ගුන්ඩෝෆාර් 354
ගොතේ 3
ගොන්ඩොෆෝරස් 108, 354
ගෝර්ඩියන් 347
ග්‍රිම්, ඊ. 12

ච

චන්ද්‍රගුප්ත 88-91, 232
චැම්පෝලියන් 252
චිංෂි-හු-ඇන්-ටි - 276

ජ

ජස්ටස්-ටයිබීරියාවේ 8
ජස්ටින් 334
ජැකොලියට්, එල්. 39-41, 42
ජැස්පර්ස්, කේ 43-45, 47
ජෙරමියා 43, 130, 349
ජේම්ස් 7
ජින 27
ජීවක 276
ජෙන්ගිස් ඛාන් 40
ජොනතන් 312
ජොෂුවා 56, 211-212, 214, 349
ජොෂුවා බෙන්හන් 211
ජෝන්-ඩැමස්කීනස් 351
ජොහාන්-වඩාත් ප්‍රේමකළ ශ්‍රාවකයා 348-9
ජොහාන්-ස්නාවක 7, 130, 211, 224, 229, 233-238, 301, 312, 319, 335
ජූදාස් 190, 296

ට

ටයිවර්, ජේ. එල්. 323
ටයිබේරියස් 6
ටැසිටස් 6
ටිල්ගත් පිල්සර් 114 68, 70
ටිමූර් 40
ටේෂියන් 9, 347
ටොලමි 98-100, 254, 293
ටොලමි ෆිලඩෙල්ෆස් 96, 97, 100, 259, 262, 270
ටොලමි ෆිලොමීටර් 35

ඩ

ඩයනීසියස් 96, 275, 305
ඩයොජිනීස් 175
ඩිමිත්‍රියස් 104
ඩිමොක්‍රිටස් 74, 76
ඩෙයිමකෝස් 88, 275
ඩියොන් ක්‍රිසොස්ටොමස් 260

ඩූපොන්-සෝමර්, ඒ. 303-4
ඩේරියස් I 72, 86
ඩේරියස් හිස්ටැස්පස් 72, 82, 83
ඩේවිඩ් 62, 63, 65, 354
ඩේවිස්, රිස් 104
ඩෝජන් සෙන්ජි 205
ඩ්‍රොයිසන්, ජේ. ජී. 98

ත
තිමෝතියස් 309, 347
තුන්ඩ්, ඉසෙඩ්. පී. 115, 116, 15, 120, 121, 269
තේල්ස් 74, 75, 76
ටේසියාස් 55, 83, 269
තෝමස් 108, 109, 354

ද
දේවදත්ත 24, 190, 349
දුෂ්ට ගාමණි / දුටු ගැමුණු 261

න
නතානියෙල් 139, 152
නාගසේන 104
නිකදේමුස් 130, 132
නියර්කෝස් 86
නිග්‍රෝධ 93
නීරෝ 6
නෙබුචඩ්නේසර් 67, 68, 70, 107, 300
නෙස්ලේ, ඩබ්ලිව්. 12

ප
පයිතගරස් 42, 74, 76-78, 80, 81, 127, 155, 298, 330, 342
පසේනදී කෝසල 23, 275
පාතංජලී 140
පාර්මෙනයිඩීස් 76, 78
පැකෝමියස් 335, 336
පැජෙල්, ඊ. 163
පැපියස්-හියරාපෝලිස්හි 9
පැලේමොන් 335
පිලාත් 5, 7
ෆිලිප් 139
ෆිලිප්පෝස් 87
ෆ්ලින්ඩර්ස් පෙට්‍රි 259
ෆිලොස්ට්‍රේටෝස් 82
ෆිලෝ 5, 36, 262-264, 265-272, 284, 288, 299, 294, 307, 344, 346
පීටර් / පේදුරු 327, 145, 330
පීතොන් 87
පෙලෝටිනස් 347
ප්ලිනි 6, 86, 87, 103, 285, 299, 304, 305
ප්ලුටාර්ක් 107
ප්ලේටෝ 43, 74, 155, 330, 338, 339
ප්ලොවියස් ඇරියනෝස් 84
ප්ලොවියස් ජෝසෆස් 6, 7, 8, 210, 287, 289, 290, 298, 299, 307, 317, 335
පොරව 85, 87

බ
බන්දර්කාර් 256
බහර්ත්‍රිහාරි 37
බාර් කොච්බා 310
බානුස් 335
බෞන්ස්, එඩ්ගාර් 348, 350
බැසිල් 335
බැසිලිඩීස් 343
බින්දුසාර 88, 90, 92, 96, 275
බිම්බිසාර 23, 28, 274
බුද්ධඝෝෂ 251
බුල්ට්මාන්, ආර්. 13
බෙකට්, තෝමස් 217
බෙනඩික්ට්-නූර්සියාවේ 335, 336
බෙරෝසස් 69

බෝඅර් 4
බුද්ධායන 67
බ්‍රෙස්ට්වේඩ්, ජේ. එච්. 61

ම
මකාරියෝස් 335
මතෙව් 154, 156, 158, 160, 165, 184, 193, 203, 213, 215, 222, 223, 231, 237, 347
මැන්සෙල්, එච්. එල්. 262
මරියතුමිය 118, 119, 152, 281
මහාදේව 261
මහා ධම්මරක්ඛිත ථෙර 251, 261
මහා රක්ඛිත 251
මහා ප්‍රජාපතී 17
මහාවීර 27, 90
මහින්ද 276
මාක් 153, 154, 158, 160, 184, 223, 324, 325, 347
මාග 97
මානි 352, 353
මායා 17, 118
මාර්ෂල්, ජේ. 252, 275
මාර්මියෝන් 241, 333, 334, 345
මැක්, ඩී. එල්. 175, 179, 168, 153
මිචෙල් බෙජන්ට් 299
මැකියවෙලි 90
මෙගැස්තිනීස් 88-90, 273, 275
මෙනවම් 330
මෙනැන්ඩ්‍රෝස්/මිලිඳු 104, 105
මොග්ගලිපුත්තතිස්ස 251, 269
මෝසස් 80, 35, 36, 61, 124, 281, 294, 302, 349
මුලර්, එම්. 34
මුස්,පී. 121
මිත්‍රිඩේටස් 104

ය
යශෝධරා ගෝපා 17, 18
යස 30, 132
යෙසායා 62, 68, 71
යුජ් අසන් 109

ර
රාධක්‍රිෂ්ණන් 50
රාහුල 18, 142
රෝලන්ඩ් ඩි වෝ 310
රොවර්, ආර්. 60
රිචඩ් ලේ 299

ල
ලා-ඕ-සේ 43
ලාමා 358
ලැසන්, සී. 64
ලිලී, ආතර් 115
ලියු සාං 276
ලූක් 154, 158, 160-165, 203, 223, 230, 231, 324, 325
ලෙවි, එස්. 273, 280
ලූබක්, එච්. ඩී. 115, 346

ව
වැන් අයිසිංග, ඩබ්ලිව්. ඩී. පී. 42, 152, 245
විල්ෆෝඩ්, එෆ්. 36
වෝල්ටෙයාර් 3
වේබර්, ඇල්ෆ්‍රඩ් 57
වෙන්ඩ්‍රීස්, ජේ. 58

ස
සයිරස් 72
සර්මෙනොවේගස් 106, 251
සර්බීස් 83

ස්වයිසර්, ඒ. 4
සංඝමිත්තා 276
සැල්මනේෂර් 114
සිද්ධාර්ථ ගෞතම 14, 19, 114, 116, 124, 140, 146, 224, 226, 232, 246, 256, 279, 355, 342
සිදුහත් කුමරු 17, 18, 117, 120, 139, 226, 230, 234, 245, 354
සිමර්න් 302
සිමන් මාගස් 230
සිමියොන් 121, 123, 124, 152
සිරාක් 148, 317
සුවෝනියස් 6
සුමිත 93
සුසිම 92
සෙයිඩල් 41, 42
සෙලියුකස් නිකේටර් 114, 151, 154,
සෙමිරාමීස් 55
සොක්‍රටීස් 43, 76, 349
සොහෝමා 168
සෝන 276
ස්කයිලැක්ස් 82, 86
ස්ට්‍රැබෝ 73, 101
ස්ට්‍රවුස්, ඩී. එෆ්. 4
ස්මිට්, අයි. ජේ. 38, 271
ස්මිත්, ආර්. 266
ස්තෙපන් 216
ස්ට්‍රීටර්, බර්නට් හිල්මන් 189
සිද්ධාර්ථන්, බී. ජී. 60

ශ
ශරතුස්ත්‍ර 43, 71, 285, 302, 312, 319, 320, 339, 348, 351, 353
ශුද්ධෝදන 17
ශාරිපුත්ත 145
ශිලානිසංස ජාතකය 145

ෂ
ෂූමාන්, එච්. ඩබ්ලිව්. 330, 359
ෂ්වාර්ස්, ජී. 129
ෂ්‍රෝඩර්, එල්. වොන් 42, 77, 79, 81
ෂොපන්හවර්, ඒ. 38, 39, 41, 133

හ
හබකුක් 144
හබන් 108
හර්ඩර්, ජේ. ජී. 37
හාස්, එච්. 149, 151
හිපෝලයිටස් 301, 343, 347,
හිරාම් 62-66
හෙරැක්ලිටස් 75, 76, 355
හෙකටියස්-මිලිටස්හි 77, 82
හෙකටොයිස් 82, 83
හෙරඩෝටස් 77, 82, 83
හෙල්මුට් හම්බච් 253
හෙරෝද් 5, 7, 238, 281, 283, 297
හේඩ්‍රියන් 6
හෝමර් 36
හෝල්ඩච් 3

විෂයනාම සූචිය

අ
අග්ගික්ඛන්ධූපම සූත්‍රය 251
අඩි බුද්ධ 344
අභිධර්මය, අභිධර්ම පිටකය 25, 132, 277-279
අමිතාභ 355 - 358
අමරී සංස්කෘතිය 48, 53, 59
අම්බට්ඨ සූත්‍රය 140
අරහත් / රහත් 20, 25, 105, 232, 268, 278, 279,
අර්ථ ශාස්ත්‍රය 90
අවලෝකිතේශ්වර 355 - 359
අහුර මැස්ඩා 302
අවතාර් 219
අවෙස්තා 60, 285
ආකිමෙනිඩීස් 82, 83, 292
ආත්මන් 22
ආත්මය 16, 208, 212, 290, 339
ආත්මය සංක්‍රමණය වීම 74, 127, 128, 343
ඇක්ට්ස් ඔෆ් ජොහන් 141
ඇක්ට්ස් ඔෆ් තෝමස් 108, 346
ඇලෙක්සැන්ඩ්‍රියන්වරු 259
ඇටලිඩ්ස් 98
ඇන්කරයිට්ස් 201, 334
ඇන්ටිගොනිඩ්ස් 98
ඇමොනයිට්ස් 56
ඇසිරියන්වරු 67, 69, 72

ඉ
ඉන්දු ආර්ය 76
ඉන්දු නිම්න ශිෂ්ටාචාරය 48-52, 54, 55, 57, 59, 65
ඉන්දු 48
ඉල්ලීස ජාතකය 141

උ
උපනිෂද් 74-76, 131, 193, 207, 208
උදාන වග්ගය 135, 137, 146, 179, 182, 187-192, 193-196, 198, 205, 218, 221, 244

එ
එදෙම් 63
එබියොනයිට් ඉහාරංචිය 118, 241, 286
එලම් සංස්කෘතිය 53
එන්ක්‍රැටිස්ස් 347
එසීන් 243, 283, 285-289, 291, 292, 296-298, 302, 305, 306, 312, 313 316, 338

ක
කන්ද උඩ දේශනාව 13, 23, 136, 138, 168, 179, 189, 213, 258, 321, 327
කන්දහාර් ශිලා ලේඛනය 252
කර්මය 188
කථාකම් 59, 79
කරෝෂ්ඨි (අකුරු) 69, 87, 252
කාලකාරාම සූත්‍රය 251
කැස්පර් 354
කැසිස්ටස් 56
කෝන්ස් 200
ක්‍රිෂ්ණා 119, 281

ඛ
ඛුද්දක නිකාය 134

ග
ගම්බිරිස් 255

ගැලවුම්කාරයා 17, 71, 116, 123, 153, 166, 167, 192, 212, 216, 236-242, 263, 280, 292, 293, 297, 306, 316, 319, 320, 323, 325, 331, 334, 340, 342, 346, 351, 358, 361, 362
ගිල්ගමේෂ් වීරකාව්‍යය 49
ගිල්ගුල් 128
ගීතාවලිය 144

ච
චක්‍රවර්තී 17, 230, 232, 233
චැල්ඩියන්වරු 67-69, 72

ජ
ජාතක පොත / ජාතක 33, 141, 144
ජිම්නොසොෆිස්ට්ස් 298, 302, 347
ජීසස් ඉවැන්ජිලියම් 129, 130
ජු කුර් ශිෂ්ටාචාරය 49
ජේසුයිට්වරු 358
ජේම්ස්ගේ ලිපි / Epistle of James 133, 134, 136
ජේසුස් ඉවැන්ජලිසම් 186
ජේසුස්-ගැලවුම්කාරයා-සූත්‍රය 351
ජෝබ් 144
ජෛනයින් 27, 28
ජෛන ආගම 28, 75, 91, 93

ට
ටිබෙට් 135, 259, 358
ටොලමි 102

ඩ
ඩයටිසරන් 9, 347, 348

ත
තණ්හා / තණ්හාව 16, 20, 226, 244, 342, 343
තුසිත දෙව්ලොව 117
තෙරපියුටා/තෙරපියුටේ 258, 262-266, 268-272, 278, 280, 282, 283, 284, 286, 287, 290, 299, 306, 318, 333, 336, 340
තෙවිජ්ජ සූත්‍රය 184
ත්‍රිකාය 344, 346
ත්‍රිපිටකය 25, 354
ත්‍රිවේදය 184
ත්‍රිරත්නය 354
ත්‍රී ශික්ෂා 337, 354

ථ
ථෙර 267
ථෙරවාද / වාදීන් 206, 258, 267, 269, 270, 276, 279

ද
දිව්‍යාවදානය 147
දීඝනිකාය 141, 184
දීපවංශය 251
දෙකපොලිස් 217
ද්‍රවිඩ 29, 67
දේවනාගරී 69
දෙමළ 11

ධ
ධම්මපදය 94, 95, 133-139, 179,-181, 183-186, 189, 190, 197, 199, 201, 202, 204, 218-221, 231, 232, 244, 266,
ධම්මචක්කප්පවත්තන සූත්‍රය 20
ධර්මය 18, 21-26, 117, 197, 199-201, 204-206, 224, 226, 229, 232, 355, 357, 361
ධර්මකාය 345, 346
ධ්‍යානි බුද්ධ 344, 355
ධ්‍යානි බෝධිසත්ව 355

න
නව පයිතගරස්වාදය 342
නව ප්ලේටෝ වාදය 342, 347
නාලක සූත්‍රය 122
නෙබටියන්වරු 72, 255
නිධාන කථා 129, 230
නිර්මාණකාය 345, 346
නිර්වාණය 132, 199
නීති ශතකය 37
නෝසිස් / නෝස්ටික් 162, 341, 342

ප
පරිසිවරු 32, 144, 148, 167, 207, 242, 244, 245, 286, 287, 296, 311
පශුපති 58
පංචතන්ත්‍රය 33, 183
පංචෙන් ලාමා 358
පංච ශීලය 136, 327
පාති මොක්ඛ 26, 267, 291
පාප් වහන්සේ 226, 340
පාර්සිවාදය 284
පාර්තියන්වරු 261, 297, 316
පාලි ත්‍රිපිටකය 25
පිරමිඩ 49
පාවුළුතුමාගේ හසුන් 12, 345, 362
පුනර්භවය / පුනර්ජන්මය 58, 77, 127-129, 131, 132, 134, 156, 212, 342, 352
පුරාණ 40, 274
පෘතුගීසි 107, 109
ප්‍රාකෘති / Prakriti 75
පර්සියන්වරු 60
ෆිනීසියන්වරු 62-66

බ
බාර්ලාම් සහ ජෝසෆ් 351
බාවේරු ජාතකය 68
බැබිලෝනියන්වරු 32, 53, 71
බැබිලෝනියානු ශිෂ්ටාචාරය 48-50, 56
බෝධි 342
බෝධි සත්ව / බෝසතාණන් වහන්සේ 32, 234, 273-283, 291, 331, 346
බ්‍රහ්මන් 22
බ්‍රිහාඩ් අරණ්‍යක උපනිෂද් 208
බ්‍රහ්ම සහම්පති 225
බ්‍රහ්ම / බ්‍රහ්මත්වය 20, 22, 208
බ්‍රාහ්මණ 67 69, 78, 79, 91, 92, 136, 140, 192, 225, 347
බ්‍රාහ්මණ ආගම 40, 200, 207, 225
බ්‍රාහ්මණයින් 13, 14, 15, 26, 28, 30, 77, 89, 90, 97, 108, 147, 184, 185, 260
බ්‍රාහ්මී අක්ෂර 69, 252
බ්‍රිහාඩ් අරණ්‍යක උපනිෂද් 208

භ
භවිෂ්‍යත් පුරාණය 40
භාවනාව 16, 26, 31, 142, 194, 200, 206, 226, 256, 271, 277, 332, 336, 337
භෞතිකවාදීන් 16

ම
මකබිවරු 261, 292, 296-300, 307, 313
මජ්ඣිම නිකාය 141, 195, 196, 225
මනුෂි බුද්ධ 344
මහා පරිනිබ්බාන සූත්‍රය 201, 224, 257, 349
මහාභාරතය 33, 56, 183, 187, 346
මහායාන 30, 30-32, 116, 114, 132, 154, 224, 276, 278, 279, 334, 346, 355
මහා වග්ගය 141, 142, 156, 190, 226

මහාවංශය 251, 261
මහා සාංඝික 30, 278, 344
මංගල සූත්‍රය 133
මාගී 284
මාරයා 20, 222, 224, 226-230, 232
මාර සංයුත්තය 226-228
මායාවී ශරීරය 334, 345, 346
මැන්ඩියන්වරු 240, 242
මිත්‍ර 339-341
මිලුසෙසියොන් 99, 100
මෙඩිස් / මීඩිස් 67
මෙහාලිම් 176
මෙසපොටේමියානු ශිෂ්ටාචාරය 50
මෛත්‍රී-බෝධිසත්ව 339, 349, 54
මොනරු 61-64, 66, 68, 73, 100
මොංගෝලියන්වරු 259
මෝබයිට්ස්වරු 56
මෛත්‍රිය 178, 243, 251, 280, 319, 326, 332, 361, 362
මෛත්‍රියානි - උපනිෂද් 75
මෛත්‍රියානි - සම්හිතා 79
මෞර්ය 88, 90, 91-93, 99, 232, 254, 274, 275

ය
යෝග 76, 140
යක්ෂයා 222-224, 227, 229, 230, 232, 233

ර
රජ්ජ සූත්‍රය 127
රට්ඨපාල සූත්‍රය 196
රගා 226
රාම 60
රාමායනය 33, 56, 60
රිග්වේදය 66

රොසෙටා ස්ටෝන් 252
රෝමන්වරු 60, 107, 210, 216, 304, 307, 316, 330, 361

ල
ලලිත විස්තරය 124, 125, 230, 245, 246, 271, 330, 354
ලැග්මන් ශිලාලේඛනය 253
ලෝගෝස් 355

ව
විනය පිටකය 25, 26
විෂ්ණු 27
වේද ග්‍රන්ථ 41, 59, 66, 81, 140, 142, 185, 208
වේදාන්ත 76
වෛරාග්‍ය ශතකය 37
වේදාංග ජ්‍යෝතිෂ 60

ශ
ශරතුස්ත්‍රවාදය 285
ශ්වන වාදීන් 175-177
ශිව 133, 357-62
ශික්ෂා සමුච්චය 291
ශීලය 332
ශුභාරංචිය 43, 113-114, 116-118, 121, 129, 132, 135-137, 149, 150, 153, 154, 156-158, 165, 166, 176, 178, 209, 212, 215, 217, 218, 219, 222, 223, 231-233, 235, 238, 239, 341, 348
ශුභාරංචිය, ජොහන්ට අනුව 9, 10, 116, 117, 119, 128-130, 139, 144, 145, 148, 152, 156, 158, 167, 208, 229, 239, 348, 350
ශුභාරංචිය, තෝමස් 131, 161-163, 168, 176, 195, 203, 205-208, 218, 219, 221, 225, 322, 346

ශුභාරංචිය, මතෙව්ට අනුව 9, 10, 116, 117, 119, 120, 126, 130, 131, 136-138, 141, 145, 151, 153, 167, 202, 204, 212, 220, 230, 235, 243, 278
ශුභාරංචිය, මාක්ට අනුව 9, 10, 116, 126, 141, 143-145, 149, 152, 153, 159, 160, 167, 176
ශුභාරංචිය, හෙබ්‍රෙව්/හීබෘ 241, 242, 245
ශුභාරංචිය, ජේසුස් වහන්සේගේ 129, 186, 188
ශුභාරංචිය, ලූක්ට අනුව 9, 10, 116, 119-122, 123-126, 130, 136, 141, 149, 151-153, 203, 202

ස
සතිපට්ඨානය 186, 188
සතිපට්ඨාන සූත්‍රය 206, 207
සමාධි 199, 335
සම්බයා 75, 78, 80, 81
සම්බෝධිය 20, 256
සම්භෝගකාය 345-347
සර්නුසෝස් 57, 58
සලාවි 60
සංඝ 23
සංයුක්ත නිකාය 228
සංසාරය/සංසාර චක්‍රය 15, 22, 133, 193
සංස්කෘත 26, 33, 37, 40, 41, 184, 267
සත් කාර්ය වාදය 78
සර්වේශ්වරවාදීන් 16
සාර්වාස්තිවාදය 279
සැඩූසිවරු 287, 311, 313
සැන්හෙඩ්‍රින් 130, 297
සිකෑරියන්වරු 210, 330
සිදියන්වරු 106, 344
සිබිල් 36
සිංහලයෝ 105
සෙත් 200, 205
සෙමිටික් 12, 69
සෙරපියොන් 100
සෙලට් 210, 307, 309, 330
සෙවතාස්වතාර උපනිෂද් 75, 193
සෙලූසිඩ් 87, 98, 103, 254, 293, 296
සෙල්ට්ස් 60
සේබියන්වරු 67, 73, 102, 103
සේද මාර්ගය 276
සෝම 60
සොලමන් රජතුමා 61-66, 107, 113, 173, 204
සුබ වර්ගය
සුඛාවතිය දේශය 356, 357
සුඛාවතී ව්‍යුහ සූත්‍රය 356, 358
සුත්ත නිපාතය 122
සුත්ත විභංගය 251
සුමේරියන්වරු 49, 55, 59, 66, 259
සුමේර් සංස්කෘතිය 50
සුල්ව සූත්‍රය 81
සූත්‍ර 24-26, 135, 140, 179, 226
සූත්‍ර පිටකය 25
ස්ථවිරයින්ගේ නිකාය 278
සාමවේදය 60

හ
හබකුක් - ටීකාව 312, 314
හරප්පා සංස්කෘතිය 48, 49, 53-56, 59, 65
හැසිඩිම් 286, 295, 297, 313
හිට්ටිට්ස් වරු 56
හීනයානය 30-32, 224, 279
හිත්තෝපදේශය 33

THE ORIGINAL JESUS

Elmar R. Gruber & Holger Kersten

ජේසුස් වහන්සේ සහ බුදු දහම

පරිවර්තනය

එන්. ජී. එන්. පෙරේරා

ක්‍රිස්තියානි ආගමේ ප්‍රභවය පිළිබඳ විග්‍රහ කරනු ලබන මෙම පොත මගින් ක්‍රිස්තියානි ආගම සහ බුදු දහම අතර පවතින සමානකම් පිළිබඳ විචාරාත්මක ඇගයීමකි. විද්වතුන් සහ දේවධර්මවේදීන් අතර මතභේදයට තුඩු දිය හැකි කරුණු රාශියක් එයින් විස්තර කෙරේ. එම කරුණු එළඹෙයි බුද්ධිමත් සංවාදයක් ඇතිවීම කෙරෙහි බෙහෙවින් බලපානු ඇත. "ජේසුස් වහන්සේ සහ බුදු දහම" නැමැති මෙම කෘතියෙන් ජේසුස් වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම් කෙරෙහි බුදු දහම පුළුල් ලෙස බලපා ඇති බව පෙන්නුම් කරන කරුණු රාශියක් ඉදිරිපත් කර තිබේ.

අතීතයේ දී ථිපිස්තුවේ පැවැති බෞද්ධ ථෙරවාදී ගුරු කුලයට අයත් තෙරපිඩුටා ශ්‍රමණ සමාජයේත්, පසු කාලයේ දී බෞද්ධ ආභාෂයෙන් පැවැති එසීන් සහ මැන්ඩියන් ශ්‍රමණ සමාජවල බලපෑම ජේසුස් වහන්සේගේ ආධ්‍යාත්මික ජීවිතය හැඩ ගැස්වීම කෙරෙහි අඛණ්ඩ බලපෑමක් කර තිබෙන බව මෙම ග්‍රන්ථයෙන් විස්තර කෙරේ.

ISBN 955-573-173-X

Rs 550.00

9"789555"731737"

සරසවි ...

30 ස්ටැන්ලි තිලක...

00066215-2

SP 06.09

Rs. 550.00